# සප්තබොධ්‍යඞ්ගය.

# බාරස ධර්මය.

# ඉන්ද්‍රිය බල ධර්ම.

# අෂ්ටාර්ය මාර්ගය.

ආර්යවංශ ධර්ම පුස්තක මාලා

අඞ්ක 1. ~ අඞ්ක 4.

**Printed and donated by**

**The Corporate Body of the Buddha Educational Foundation**

**11th Floor, 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.**

**Tel: 886-2-23951198 , Fax: 886-2-23913415**

**Email: overseas@budaedu.org**

**Website: http://www.budaedu.org**

This book is strictly for free distribution, it is not to be sold.

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

# සප්තබොධ්‍යඞ්ගය.

## ආර්‍ය්‍යවංශ ධර්ම පුස්තකමාලා

අඞ්ක 1.

මොරටුමුල්ලේ සිරිසුධර්මාරාමාධිපති
මොරටුවේ සිරි
සාසනවංස ස්ථවිරපාදයන් වහන්සේ විසින්
— සම්පාදිතයි —

සිරි අරියවංස ගුණානුස්මරණ සභාව
විසින්

හොරණ විද්‍යාශෙඛර යන්ත්‍රාලයෙහි
මුද්‍රාපිතයි.

ශ්‍රී: බු: ව: 2492.
1948.

මිල ශ. 50

# සංඥාපනය.

සප්තබෝධ්‍යඞ්ගය නමින් හඳුන්වන මෙම ධර්ම පුස්තකය දේශනා විලාශයෙන්ම පුස්තකාරූඪ කිරීමට අදහස්කළේ කරුණු දෙකක් උදෙසා. සමිතිය මගින් කැරෙන වාර්ෂික පුණ්‍යෝත්සව වලදී සාරවත් ක්‍රියාවක් විද්‍යමාන කරලීම පිණිසත්, බෞද්ධ ධර්මාගත සාර ගර්භ ධර්ම අභාවයට යා නොදී ව්‍යාප්ත කරලීමෙන් රැකගැණීම පිණිසත්ය.

නවකථා ආදී නිෂ්ඵල පතපොත බැලීමෙන් පිරිහෙන්වගිය ධර්මඥානය නගාලීමට සම්බුද්ධ ධර්මයේ වටිනා කොටස් ලිහිල් අයුරින් සකස්කර පැතිරවීම වර්තමාන කාලයට අනුරූප ක්‍රියාවක් වනුයේ ධර්මගෞරවය ඇතැම් දේශකයන් වහන්සේලාම සිඳබිඳලන නිසයි. භාෂාදර්ශයෙන් හා මූලාරූඪවීත්ම අවිචාර අවබෝධයෙන් යුතුවැ පොත් සකස්විය යුතුය යන ග්‍රාම්‍ය හැඟීම ගැඹුරු ධර්මයට මෙන්ම පැරණි අධ්‍යාපනයටද මහත් සාපයකි. ස්වල්ප දැනුමකින් නමුදු පැරණි පැල්පත්වල කියවෙන වටිනා දේ අද ඉසුරෙන් දිසි රමණීය ගෘහයන්ගෙන් පිට නොවේ.

ධර්මයෙන් තුරන්වූ පත පොත කියවීමෙන් වර්තමාන ලෝකය මැද ඇත්තේ නිඃසාරබුද්ධියකි. එබැවින් අර්ථ ගම්භීරත්වයෙන් සමන්විත ධර්මරසය විඳීමට සැසඳෙන නුවන කොයින්ද, මෙලෙස තේරුන්ගත් නුවනැ'ති සාධුජනතාව ධර්මපුස්තක බැලීමේ ලීනත්වය දුරලා දුරවබෝධස්ථානවලදීද නැගීසිටි වීර්යයෙන් කීප විටක් නමුදු කියවා අවබෝධ කරගැණීමෙන් හිතවැඩ සලසා ගතයුතුයි. නිර්වාණ ලාභයටද ලක්වනුයේ එම වීර්යමැයි.

සක්විති රජක්හුගේ සප්තරත්නයට උපමා කළහැකි සප්ත බෝධ්‍යඞ්ගධර්මය භාවිතා කිරීම ගම්භීර ධර්ම භාවිතාකිරීමෙහිලා උසස්ම තැනක් ගණී. නිරාමිෂ සැපය කුළුගන්වන බෝධි නම් ලත් චතුරාර්යසත්‍යය නැතිනම් බුද්ධාදී ආර්යයන්ටම විෂයවූ සතර ආර්ය ධර්මය ප්‍රත්‍යක්ෂ කිරීමේ උසස්තම සප්තාඞ්ගයට සප්තබෝධ්‍යඞ්ගයයි කියනු ලැබේ එසේනම් සෑම බෞද්ධ සන්තානයකම ඉමහත් අයුරින් මෙම ධර්මසමුදාය නිධන් වී තිබිය යුතුයි.

නිර්වාණ රසාස්වාදනයෙහි යුහුසුළුවූ යෝගාවචරයෙකුට යායුතු, පිළිපැදියයුතු, සිහිකටයුතු, ප්‍රත්‍යක්ෂ කටයුතු සර්වරත්නම මාවත මෙය බැව් දූන දේශකයින් වහන්සේලාගේ අනුසස් අඩුවැඩිවීම නිසානැයි මේ ඇයින් සුගම දුර්ගමස්ථාන

විවේචනය සිය නැන තුලාවෙන් නොමැන ගැඹුරු බණදහම් නැඹුරු වන වන අතට සරසා ලිහිල්කරන්ට යැමේදී සාවද්‍යයට ලක්වන බැව්ද සලකා ශ්‍රුවමනා පහසුකම් නොපතා අපේ මේ ව්‍යාපාරයෙන් හැකිතාක් ධර්මරසය විඳ සුඛිතව මුදිතව නැන වඩා ගත යුතුයි.

මෙහි මතකතබාගතයුතු වචනා ධර්මපාඨයන්ට තළු අකුරු යෙදීමෙන් හා සංඛ්‍යා යොදා වෙන්කොට දක්වීමෙන්ද හඳුන්වා ලූයේ පොත බලා නුවන දියුණු කරගැණීමේ ආසා ඇතියනට අනුකම්පාවෙනි. වැඩිපරිශ්‍රමයකින් සිදුකරණලද ඉතුදු වැඩෙක්ම වෙත්වා.

මෙහිලා වෙසෙසින් පැසසිය යුත්තෝ මේ සපත ධර්මයන් ලියාදීමෙන් හා දෙශනා කිරීමෙන් සාධුකාමපිකවූ සම්භාවනීය ගරු මහා ස්ථවිර ධර්මවිනයධර සබ්‍රම්සරුන් වහන්සේලා වෙතයි. පරිවෙණාධිපතිත්ව හා පණ්ඩිත උපාධි හා නායක පදවි ආදියට පාත්‍රවූ පින්වතුන් වහන්සේලා වෙත අපේ පැසසීම වැඩෙක්ද, නැත, මින් ඇතීවතුයේ තත් තත් උතුමන්ගේ සිත්ගත් බෝසත් සිරි උදුවීමෙකි.

පරිසුඩ ශීලාදිගුණ සමුදායකින් හෙබි අසමත් ගුරුදෙවයන් වහන්සේව වර්ෂයක් පාසා සිහිකරණ සිරි අරියවංස ගුණානු-ස්මරණ සමිතියෙන් කැරෙන වාර්ෂික සත්ක්‍රියාවලින් මූලස්ථාන යට ගැණෙන, ආයර්වංශ ධර්මපුස්තක මාලාවේ 1. අඞ්කය. "සපතබොධ්‍යඞ්ගය" නමැති මෙම පොතට ලැබේ.


මෙය ඉතා හොඳින් සකස් කිරීමට කාරුණාවෙන් ඉඩ සලසා දුන් හොරණ විද්‍යාශෙඛර යන්ත්‍රාලය අයිතිකාර එහි ආධිපත්‍යය උසුලන ඒ. ඩී බර්නාඩ් අප්පුහාමිද, පැරණි වර්ණයොජකයෙකු වන මහයාලේ ඇම්. සයිමන් ප්‍රනාන්දු මහතාද අපේ කාරුණාවට පාත්‍රවිය.

මෙම සප්තබොධ්‍යඞ්ග ධර්මය භාවිතා කිරීමෙන් ශ්‍රී සද්ධර්මාලය වඩාගෙන පිරිසිදු බෞද්ධයන්වී චතුසසත්‍යාවබොධයෙන් තිවන් පසක් කරගැණීමට උත්සාහවත් වියයුතු.

මීට:-

සිරිසුධර්මාරාමය, සාසනාලයැ'ති,
මොරටුමුල්ල, මොරමුවෙ සාසනවංස ස්ථවිර.
මොරටුව.

2492 පොසොන් මස පුණුපොහෝ දිනදීය.
1948 ජූනි 20 රිවිදින.



සිරි අරියවංස මහා ස්ථවිර
පාදයන් වහන්සේ,

---

26. 10. 1881. - 9. 12. 1946.

# දේශනා සඟත් දායකත්වය ඉසුලූ පින්වතුන්.

1947. 12. 21.

1. ඩී. පී. ඇල්.ඩබ්ලිව්. සිරිසේන වෛද්‍යාචාර්‍ය්‍ය තුමා, "ද සොයිසා වලව්ව" රාවතාවත්ත.
2. ඇස්. එච්ස් සිංඤෝ මුදලාලි මහත්මයා, මොරටුමුල්ල.
   පී. ඒ. ජෝන් සිංඤෝ බාස් මහත්මයා, කටුබැද්ද.
3. ඇම්. පී. ජෝසී ප්‍රනාන්දු උපාසිකාව, ඇම්.කේ. නොන්නා ප්‍රනාන්දු උපාසිකාව, මොරටුමුල්ල.
4. කේ. ඩී. ප්‍රේරා නෝනා මහත්මිය, "සසිර නිවස" මොරටුමුල්ල (සවකීය මහනාණන්ට පින් අත්කරලීම පිණිස)
5. ඇම්. ඒ. මයිලෙන්තිනා ප්‍රනාන්දු, ඇම්. ඒ. රන්සා ප්‍රනාන්දු, ඇම්. අයි. සොපියා ප්‍රනාන්දු, ඇම්, මරිහාමි යන උපාසිකාවරු මොරටුමුල්ල,
6. කේ,ආර්,පී, ප්‍රේරා මිනින්ද්‍රෝරු මහත්මයා, මොරටුමුල්ල,
7. ඩී, ඒ. රණවීර මහත්මයා ඇතුලු සහෝදර පිරිස, ඉඩම, (සවකීය මෑනියන්වූ ඇසිලිනා උපාසිකා හාමිනේට පින් අත්කරලීම පිණිස)

# ශුද්ධි පත්‍රය.

| පිට | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 1 | 12 | සම්බාජ්ඣඞ්ගා | සම්බොජ්ඣඞ්ගා |
| 1 | 26 | ලැබිය හැති | ලැබීය හැකි |
| 11 | 5 | දූක්වෙත | දූක්වෙත |
| 20 | 17 | අද | ඇද |
| 21 | 35 | වද | වැද |
| 29 | 22 | සංසතාර | සංසකාර |
| 34 | 27 | සුකබනි | සුකබානි |
| 43 | 19 | මෙලෙසි | මෙලෙසින් |
| 45 | 17 | නිසෙසකී | නිසෙසාකී |
| 45 | 18 | වැඩීමේ | මැඩීමේ |
| 46 | 11 | සම්පගගත | සමපපගගාත |
| 53 | 28 | සවභාංයට | සවභාංවයට |
| 69 | 4 | විවෙකයම | වීවෙකය |
| 77 | 34 | ශ්‍රීභගගයෙන් | ශ්‍රී භගගයෙන් යුකත |
| 105 | 35 | අත අනුතධි | අනුත අතධි |
| 116 | 18 | තමුත් ඉතා කෙටී | නමුත් ඉතා කෙටි |
| 116 | 23 | බුජ්ඣනති'' | බුජ්ඣනති'' ති |
| 122 | 9 | විදශීතොවපෙක්ෂා | විදශීතොපෙක්ෂාව |
| 125 | 21 | තැවත | නැවත |

මේ හැර දීසී ඉස්පිලි කතිපයක්ද විද්‍යමානවෙත්.

# පටුන.


පිට.

1 සතිසම්බොජ්ඣඞ්ගය
1, 84, 113, බණ ඇසීමේ අනුසස්
2 සංග්‍රහ කථාව
5, 17, 42, 64, 85. 100, 116, සප්තබොධ්‍යඞ්ගයෝ
6 පටිපක්ඛ අඞ්ග
7 සබ්බත්ථිකඞ්ගය
8 සති හේතු (4)
සති සම්පජඤ්ඤය (1)
9 මුට්ඨස්සති ආදී දෙක (2, 3,)
අභයස්ථවිර තෙනම්ගේ පුවත්
11, 34, 62, 81, 92, 111, 130, තදධිමුත්තතාව
11 සක්කායදෘෂ්ටි ආදියේ ප්‍රභේද
,, මාර්ගඵලවලදී ප්‍රහීණ වන කෙලෙස්
12 බොදඟ තුදුස (14)
12, 36, 51, නිඃශ්‍රිත ධර්ම
13, 51, 68, විවේක ප්‍රභේද
13, 37, 52. වොස්සග්ග ප්‍රභේද
14 කාරුණික අවවාදයක්
16 ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය
17 ධම්මවිචයාඞ්ගයෝ
18 ධම්මවිචය හේතු (7)
පරිපුච්ඡ කථාව (1)
අඨාරස ධාතු (18)
දොළොස් ආයතන (12)
19 කම්ටහන් (40) ආදිය
20 වත්ථුවිසද කිරියතාව (2)
පිරිසිදුකම
21 ඉන්ද්‍රිය සමත්තතාව (3)
21, 106, වක්කලී තෙර පුවත
23 සොණ තෙර පුවත
24 නියම පැහැදීම
ශ්‍රද්ධා, ප්‍රඥා සම්බන්ධය

පිට.

25 දුෂ්ප්‍රාඥයන් නොසෙවුම (4
26 බාලයන් සෙවුමේ දොස්
පැනවතුන් සෙවුම (5)
27 ප්‍රඥා ප්‍රභේද
ඛණය උදයව්‍යය (50)
30 ගම්භීරඥාණප්‍රත්‍යවේක්ෂාව
ප්‍රඥාප්‍රභේද (16) එහි විස්තර
34 මෝහයට කරුණු-ධම්මවිචය
වඩන නොවඩන කාල
35 ධම්මවිචය ලැබීමට ආහාර
38 ධම්මවිචය ප්‍රභේද
39 උත්කෘෂ්ටතාව
40 ආනිසංස හා ඵල
41 විරිය සම්බොජ්ඣඞ්ගය
ආසංසනය
44 නික්කමාදී පරියාය
වචනයෝ (17)
45, 65, 124 ලක්ෂණාදී (4)
48 වීර්‍ය ප්‍රභේද
49 ධාතුත්‍රය, වීර්‍ය (4)
50 ප්‍රධන්වීර්‍ය (4)
සංවරප්පධානය
පහානප්පධානය
51 භාවනප්පධානය
52 අනුරක්ඛණප්පධානය,
අභීතාදී සඤ්ඤා (6)
54 වීර්‍යහෙතු (11) අපායභය
සිතුම (1) සතර අපායභය
56 ආනිසංස දස්සාවිතාදී තුන (2, 3, 4)
57 මිත්ත තෙර පුවත
58 සත්ථු මහත්තය (5)
සංක්ෂිප්ත දම්සක් පුතුර
59 දායජ්ජ මහත්තාදී දෙක (6, 7)
60 කුසීතයන් නොසෙවුම (8)

පිට.
61 වීරයන් සෙවුම (9)
ඉන්දගුත්තතෙර පුවත
මාතයට වන් පහරක්
62 සම්මප්පධාන ප්‍රත්‍යවෙක්ෂාව
63 පීති සම්බොජ්ඣඞ්ගය
66 ප්‍රීති පස (5) හා මහතිස්සතෙර
67 ආමිශත්‍රය [පුවත
69 ප්‍රීති හෙතු (11)
බුද්ධානුස්මෘතිය (1) අරහං i
70 සම්මා සම්බුද්ධො ii
72 විජ්ජාචරණ සම්පන්නො iii
විද්‍යා (8)
74 චරණ ධර්ම (15)
75 සුගතො iv ලොකවිදූ v
76 අනුත්තරො පුරිසදම්මසාරථි
සත්ථා දෙව මනුස්සානං vii
77 බුද්ධො viii භගවා ix අෂ්ටහඟ
78 ධම්ම, සඞ්ඝ, අනුස්මෘති (2, 3)
79 සීලාදී අනුස්මෘති (4, 5, 6)
80 උපසමාදී සතර (7, 8, 9, 10)
81 සවිකාර පුවත
84 පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය
86 වෙදනාත්‍රය, සත්ත්වප්‍රභෙද
88 පස්සද්ධිවය, පස්සද්ධි හෙතු (7)
ප්‍රණීත භොජන සෙවුම (1)
89 සෘතු සැපාදී තුන (2, 3, 4)
90 ඉවසීම හා- කර්මය සැලකීම
බුද්ධදාස රජ පුවත
91 සාරබ්ධ කායාදී දෙක (5, 6)
93 උපකාර ධර්මයක්
95 සමාධි සම්බොජ්ඣඞ්ගය

පිට.
96 සමාධියේ නිමිත්තාදී-
භාවාදී
97 සිතෙහි අයුරු
98 සමාධිය
99 සමාධි ප්‍රභෙද
102 අඞ්ග ශබ්දාදී
103 සමාධි සම්බොජ්ඣඞ්ගාදී
105 සමාධි හෙතු (11)
වත්ථුවිසදකිරියතාදී දෙක
108 නිමිත්තකුසලතාදී තුන
(3, 4, 5)
109 සමයෙ සම්පහංසකතාදී-
තුන (6, 7, 8)
110 හොරු යුවලගේ පුවත
110 සමාහිත පුග්ගලාදී
දෙක (9, 10)
111 ආනිසංසය
113 උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය
118 උපෙක්ෂාදී
119 උපෙක්ෂා ප්‍රභෙද (10)
ෂළඞ්ගාපෙක්ෂාව
120 බ්‍රහ්ම විහාරාදි සතර
121 අධිගම සමාපත්ති (10)
වෙදනොපෙක්ෂාව
122 විදර්ශනොපෙක්ෂාදී සතර
124 උපෙක්ෂා හෙතු (5)
125 සත්ත මජ්ඣත්තතාව (1)
126 සංඛාර මජ්ඣත්තතාව (2)
සත්ත සංඛාර-පෙ- (3)
128 සත්ත සංඛා-පෙ-(4)
129 උතුමන් ඇසුර
130 තිස්ස සාමණේර පුවත

# සප්තබොධ්‍යඞ්ගය.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

මාපලාණේ ඤාණාභිවංස සිරිධම්මරක්ඛිතාරාමාධිපති සද්ධර්ම
වාගීශ්වර මාපලාණේ ශ්‍රී පඤ්ඤාලඞ්කාර නායක
මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ විසින්
පවත්වන ලද ධර්මදේශනාව.

## 1. සතිසම්බොජ්ඣඞ්ගය.

සත්තබොජ්ඣඞ්ගා—

**සතිසම්බොජ්ඣඞ්ගො, ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො, විරිය සම්බොජ්ඣඞ්ගො, පීති සම්බොජ්ඣඞ්ගො, පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො, සමාධි සම්බොජ්ඣඞ්ගො, උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො—තත්ථ කතමො සතිස ම්බොජ්ඣඞ්ගො? ඉධ භික්ඛු සතිමා හොති, පරමෙන සතිනෙ පක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා හොති අනුස්සරිතා අයං වුච්චති සති සම්බොජ්ඣඞ්ගො—පඨමනයො—**

**සැදැහැති පින්වතුනි!**

අප දැන් මේ ප්‍රකාශ කළේ සකල ගුණ මණි නිධි ප්‍රතිභාග අනන්‍ය සාධාරණ සකල ලෝක පූජිත ගුණ මහිමෝපලක්ෂිත තථාගත සද්ධර්මවර චක්‍රවර්ති ස්වාමිවූ මාගේ හා යුෂ්මතුන්ලාගේ අමා මෑනියන්වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් සකල වෛනෙය ජනයන්ගේ දුක් ගිණි නිවා මොක් අමා රසයෙන් සනප්වනු සඳහා පවත්නාවූ සප්තබොධ්‍යඞ්ග ධර්මවිභාගය දෙශනා කරණු සඳහා මහාකරුණායෙන් වදාළ සද්ධර්මපාඨයකි—

ශ්‍රී සද්ධර්ම ශ්‍රවණාභිලාෂී පිනැතියෙනි තථාගත ධර්මශ්‍රවණයෙන් ලැබියහැකි ලැබියයුතු අනුසස් ලබාගන්නවනම්, සැදැහැයෙන්ම බණ ඇසිය යුතු වෙයි. අසන බණ නූගනී නම් ගේ කකට කරදරයක් පමණෙකි. අසන බණ ඉගෙන ගන්නවනම් එසේ සිතා සකස්ව බණ ඇසිය යුතුවෙයි. සකස්ව බණ ඇසීමනම්—උග්ගණ්හිතුකාමතාය සවනං සක්කච්ච සවනං— යනුවෙන්

පැහැදිලිවෙයි. කියවෙන බණ ඉගෙනගන්නටම ඕනෑය යන
දෘඪතර අධිෂ්ඨානයෙන්ම යෙදී ඇසීමට උවදුරුවන හිතකය
අලස බව අඟවන නිදාවැටීම, කතාබස්කිරීම, අතරතුර නැගිට
යාම, වෙනාවෙන දේ සිතා ඉඳීම, වටපිට බැලීම යන ආදියෙන්
වෙන්වී සිතත්, කයත්, ඇසත් බණ කියන මා දෙසට නමා
ගෙන නැතිනම් බණට යොමුකරගෙන, සැදැහැයෙන්ම බණ
ඇසිය යුතුයි. හොඳින් බණ අසා ඉගෙන ගත්තාට මදි හොඳින්ම
පිළිපදින්නටත් ඕනෑ පිළිනොපදිනවා නම් බණ ඉගෙණීම-හෙවත්
සිත තබාගැණීම හිතට බරක් පමණෙකි. ගොනු පිට පැටවූ
හකුරු-පොල්-වලරස ඌ කෙසේ දනීද? නොදනී. මන්ද? නො
කෑ බැවිනි. කාලම ඕනෑ රස දැනගන්න. එමෙන්ම හොඳින්
අසා බලා ඉගෙන කියාගත් අනට බණට අනුව පිළිපදින්නටම
ඕනෑ. පිළිපැදීමෙන්ම මෙලොව දියුණුවත් පරලොව අසිරිමත්
දෙව් සැපත් අන්තයේ සියලු දුක්ගිනි නිවාලන සදාකාලික ශාන්ත
සුව අමාමහ නිවන් සැපත් ලැබිය යුතු බැවිනි!

පිනැතියෙනි!

කරුණු මෙසේ බැවින් මේ පින්වතුන් දැන් මෙහි පැමිණියේ
බණ අසන්නට බැවින් කියන බණ ඉගෙන ගන්නටම් ඕනෑය
සිතා සැදැහැයෙන් හොඳට බණ අසන්න. අසා සිතට ගන්න.
ඉගෙනගන්න. උගෙන උගත්සේම පිළිපදින්න. පිළිපැද හෙවත්
බණට අනට අනුව හිතකය වච්නය අසුරුවාගෙන දැහැමි දිවි
පෙවෙතකින් රැකෙන්න. රැකී දුගියනට මගියනට පිදිය යුතු
තැනට දෙන්න! පුදන්න! තමනුත් කන්න! අඳින්න! දීමෙන්
පිදීමෙන් කෑමෙන් ඇඳීමෙන් මෙලොවත් සැපවත් වන්න! පැස
සුනුත් ලබන්න. මේ අතරම තමනට රැකිය හැකි රැකිය යුතු
නිති පන්සිල් පොහොය අටසිල් රකින්න. සියල්ලන් කෙරේ
මෙත් වඩන්න! මෙසෙයින් මෙලොවත් තමනුත් අසිරිමත්ව
සුඛිත මුදිත වෙමින් අනුනුත් සුඛිත මුදිත කොට කිත්සිරියෙන්
වැජඹී මින්සැව් දෙව්ලොව අසිරිමත් දෙව්සැපත් විඳ ඉක්ම
නින් දුක් නිමාකොට පමානොව අමා නිවන් සැනසුම ලබන්ට
දිරිවඩන්න!

පින්වතුනි!

බණ අසන රිසියෙන් දැන් මෙහි රැස්වී සුසික්ඛිතව සුවිනීතව
බලාඉන්න මේ පින්වතුන්ට අද මට කියන්නට සිදුවී තිබෙන්නේ
බණම පමණක්නොව අනත් සමග වෙනත් යමක් බව මේ
පින්වතුන්ම සලකනවා ඇති! දැන් මිලඟට ඒ ගැනයි මා
කියන්නේ. අද මෙහි මේ පින්වතුන් ඇරඹුමේ කල්යල් බලා

කලයුතුමවූ වටිනා මහගු පින්කමෙකි! එයට නිමිතිවූයේ මේ පින්වතුන්ගේ දෙලොවම දියුණුවට සැපයට සැදහැවම සැනසීම ලැබීමට හේතුවූ, සදහම් සඳුපදෙස් දෙමින් මේ පින්වතුන් හික්මවූ නොබෝද අපවත්වූ මෙම සිරිසුධර්මාරාමය ඇතුළුවූ තමන් වහන්සේම ඇතිකල ආරාම පසක අධිපතිවූ ගුණවත් සිරිඤාණාභිවංස ධම්මාධාර වංසපාල විනයාලඞ්කාර සිරි අරිය වංස මහාස්ථවිරයන් වහන්සේගේ නිසගයෙන් පිහිටි ගුණ සමුදාය සිහිකිරීමයි.

සුපින්වතුනි!

අන් ඇදුරෙකුගේ වහලක් නොමැතිව දතයුතු සියලු ඥෙය ධර්මයන් කරතලා මලකන්‍යායෙන් ස්වයම්භූඥානයෙන් ප්‍රත්‍යක්ෂ කොට දැන වදාළාවූ සර්වලෝකෛක දීපායමානවූ සිරි සද්ධර්මවර චක්‍රවර්ති ස්වාමිවූ මහාකාරුණිකවූ එහෙයින්ම මෙත් දියෙන් මුළුතුන්ලොව පුරවා වදාළාවූ යුෂ්මතුන්ගේ හා මාගේ බුදු පියානන් වහන්සේ ලොවැසි පුහුදුන් අතර සිද්ධාන්තයට පැමිණියාවූ ලොවට අනර්ථකරවූ ගැහැවි බමුණන්ගේ ඒ දුෂ්ටකෂ්ට මිථ්‍යා ඉගැන්වීම් නිසරු බව දක්වමින් පසින් ගලින් අගුරු ආදියෙන් වැසීගිය රත්නාකරයක් පාදා මහගු මිණිරුවන් ගොඩදමන්නාක් මෙන් ඇසීමෙන් කන පිනවන සිතීමෙන් සිත පිරිසිඳුවන පිළිපැදීමෙන් දෙලොව සැපයට පමුණුවන නිතර හිලෙන සසර දුක් සයුර නතර නොව එතරකොට සදහටම සාන්ත සුඛයවූ අමා මහ නිවන් පරතෙරට පමුණුවන පරම සත්‍ය ධර්මයක් ප්‍රකාශ කරනුයේ- "න ජච්චා වසලෝ හෝති" යන්න ආදි කොට ඇති දහම් සමූහය මෙත් සිතින් වදාළසේක. කෙනෙකුගේ උසස් පහත් බව මනින උපතින් ඇතිවන ලොව පැවති සම්මත සැඩොල් බමුණුකම් බොරු බවත්, මිනිසුන්ගේ උසස් පහත්කම් සැඩොල් බමුණුකම් ඇතිවනුයේ උපතින් හෝ කුල මලයෙන් නොව තම තමුන්ගේ ක්‍රියාකාරිත්වයෙන්ම බැවින් සැඩොලුන් වන පව්කම් දුරලා බාහිත පාපී බමුණන් වන පින්කම්ම කලයුතු බව වදාළසේක.

මේ පින්වතුන් විසින් සදා අනුස්මරණීය පූජ්‍ය ගුණසමුදායෙන් ලොවට ආදර්ශවත්ව වැඩවිසූ සිරි අරියවංස මහා ස්ථවිරයන් වහන්සේ වැදගත් පැවිදි ඇදුරු පරපුරකින් පැවත ආ බැවින් තම ඇදුරු උතුමන්ගෙන් ලත් අවවාද අනුශාසනා පරිදි තම නැවතුම් පැවතුම් ඇතිකොටගෙණ නිහතමානී සමදම් ගුණ සමුදායෙන් තමන් හැඩගැසී ලොවට වැඩකිරීමට සෑහෙන පමණට වියතෙක්ද වී සුපෙසල ශික්ෂාකාමිත්වයෙන් විනීතව ගමට

රටට ජාතියට ශාසනයට අනල්ප සේවයක් කරවදාළ පූජ්‍ය උතුමෙකි. උන්වහන්සේගේ සේවයෙහි විශිෂ්ටතමවූයේ සාසනයට කල සේවයවූ තමන් වහන්සේ හෙළිපෙහෙළිකළ මග වඩාත් පුළුල් කිරීමට තමන් වහන්සේ ගිය මග වඩාත් දුරයාමට හැම ලෙසින්ම ප්‍රතිබලසම්පන්නවූ මොරටුවේ සාසනවංස ස්ථවිරතුමා ප්‍රධාන භික්ෂු පිරිසක් ඇතිකරලීමයි. ඉනුත් සාසනවංස ස්ථවිර තුමා වනාහි අවිතීය ආචාර්‍ය පූජකවූ ස්ථවිර නාමක් වූවා පමනක් නොව තම ගුරුදේවයන් වහන්සේ උත්සාහයෙන් ඇතිකළ භික්ෂුවංශය හා විහාර පන්සල් දායක කාරකාදීන් හැම ලෙසින්ම විනූණ ත්‍රිගුණ කිරීමට ප්‍රතිබලසම්පන්න දූන උගත් කමත් වාක් චාතුර්‍යයත් මනා හික්මීමත් ක්‍රියායෙහි දක්ෂබවත් තැනට සරිලන නැන නුවනත් කලගුණ සැලකීමත් යන මේ සියල්ලෙන් පරිපූර්ණ නියනමානී ස්ථවිර තුමෙක්වීම මේ පින්වතුන්ගේ අනල්ප භාග්‍යයකි. මේ පින්කමත් ඒ ස්ථවිර තුමාගේ යෙදුමක් විය යුතුයි. ගුණවත් අශියවංස ස්ථවිරයන් වහන්සේ අපවත්වීමෙන් වසක් පිරීම නිමිතිකොට කලගුණ සැලකීමට පිදිය යුතු උතුමෙක් පිදීමට මේ පින්වතුන් සැදැහැයෙන් ඇරඹූ මේ පින්කම සැබවින්ම විශිෂ්ටතර පින්කමෙක්මැයි. මෙසේ මේ පිනැතියන් යුතුකම් දූන ඉටුකරණ කළුනූණ සලකන උසස් ගුණවතුන්ම බව සැලකිය හැකියි. එපමණක් නොව මේ පින්වතුන්ට මෙසීන්ම මෙලොව නම්බුවත් පරලොව සැපයත් කෙළවර සියලූ දුක් නසා ලබන අමාමහ නිවන් සැපයත් අත්පත් වෙනවා නියත බව සලකා සතුටුවන්නට අවවාද කරමි. ප්‍රකීර්ණක කථාව හෙවත් සංශුන කථාව මෙතෙකින් නවතා දූන් ඉතින් නියමිත බණ කියන්නටයි මා අදහස් කරන්නේ-

**පිනැතියෙනි!**

අද දින මේ සැදූහැවතුන්ට සතිසම්බොජ්ඣඞ්ග ය තෝරා බේරාදීමට කියාකරදීමටයි ආරාධනාකලේ ඒ පිණිස කිවයුතු මාතෘකා ධර්මපාඨයකි. මා මුලදී ප්‍රකාශ කළේ, එයනම් තෝරු බේරුදීමත් හිතේ තබාගැණීමත් යන මේ දෙකම බොහොමත් අසීරුයි–කොහොමත් අමාරුයි. පරම ගම්භීර විචිත්‍රතර ධර්මයක් බැවිනි. එහෙම වුනත් කාලවේලා ඇති පමණට තරමකටවත් ප්‍රයෝජනවත් වන අන්දමට සැකෙවින් එය තෝරා බේරා කියා කරදෙන්ට උත්සාහ කෙරෙමි. මේ පින්වතුනුත් කලකම්මැලි නොවී ඇසීමෙන් වැඩක්ම සිදුවන හැටියට උත්සාහවත්වී හොඳින් අහන්න හැකි පමණින් හිතටගන්න හිතටගත් පමණින් පිළිපදින්න භාවනා වශයෙන් නැවත නැවත මෙනෙහි කරන්න,

පිළිපැද්ද පමණට, භාවනා වශයෙන් සිහිකල පමණට මෙලොව ප්‍රීතියත් පරලොව සැපයත් කෙලවර මේ ධර්‍මයම යථා ස්වභාව යෙන් (ඇති සැටියෙන්) අවබෝධකොට සියලු දුක්ඛස්කන්ධය සහිත සදාකාලික අමාමහ නිවන් සැප ලැබීමත් ඒකාන්ත සත්‍ය බව සලකාගන්නාමෙන් කරුණායෙන් දෙවනු, තෙවනුවත් අවවාද දෙමි, අනුශාසනා කරමි.

**"සත්ත බොජ්ඣඞ්ගා-සති සම්බොජ්ඣඞ්ගො- පෙ-උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගොති"** සත්තිස්වූ බොධිපක්ඛිය ධර්‍ම සමූදයෙහි අන්තර්ගතවූ සති-ධම්මවිචය-විරිය-පීති පස්සද්ධි-සමාධි-උපෙක්ඛා-සඞ්ඛ්‍යාත බොධ්‍යඞ්ග ධර්‍ම සතක් තථාගතයන් වහන්සේ වදාළ සේක. ඒ බොධ්‍යඞ්ග සතෙන් අද අපි මේ පින්වතුන්ට තෝරා දීමට බලාපොරොත්තුවනුයේ-පළමුවැන්නවූ, සති සම්බොජ්ඣඞ්ග යයි. සතිසම්බොජ්ඣඞ්ග යන්නෙහි සති කියාද, සං, කියාද, බොධි කියාද, අඞ්ග, කියාද තේරුම් කරගත යුතුවූ වචන සතරෙක් වෙත්. එයට අර්ථ ප්‍රකාශ කළාවූ අර්ථකථාචාරීන් වහන්සේ විග්‍රහාර්ථ වශයෙන් මද මද වෙනස්කම් ඇති අර්ථ රාශියක් ප්‍රකාශ කලසේක:—

> **බොධියා බොධිස්ස වා අඞ්ගාති බොජ්ඣඞ්ගා බුජ්ඣති කිලෙස සන්තාන නිද්දාය උට්ඨහති චත්තාරිවා අරිය සච්චානි පටිවිජ්ඣති නිබ්බාන මෙවවා සච්ඡිකරොති තස්සා ධම්ම සාමග්ගි සංඛාතාය බොධියා අඞ්ගාතිපි බොජ්ඣඞ්ගා-තස්ස බොධිස්ස අඞ්ගානිපි, බොජ්ඣඞ්ගා-බුජ්ඣනස්ස පුග්ගලස්ස අඞ්ගාතිවා, බොජ්ඣඞ්ගා බොධාය සංවත්තන්තීති බොජ්ඣඞ්ගා-බුජ්ඣන්තීති, බොජ්ඣඞ්ගා-අනුබුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා-**

යනාදී නයින් ප්‍රකාශ වනුයේ බොජ්ඣඞ්ගාර්ථ විභාගයයි.

මාර්‍ගඥාන සංඛ්‍යාත බෝධිහුගේ අවබෝධයට හේතුභූත වෙත් නුයි හෝ බොධ්‍යඞ්ග නාමි. "සන්තානානුගත කෙලෙස් නිද්‍රාවෙන් නැගී සිටීනුයි හෝ බොධ්‍යඞ්ග නාමි. දුක්ඛ සමුදය නිරොධ, මග්ග යන චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්‍මය අවබෝධ කොට නිර්වාණයම ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධ කෙරේනුයි හෝ මේ ධර්‍ම සමූදය සංඛ්‍යාත බොධියට අඞ්ගවෙසිනුයි හෝ බොධ්‍යඞ්ග නාමි අවබෝධ කරණ පුද්ගලයාට අවබෝධවේනුයි බොධ්‍යඞ්ග නාමි. බොධිවුච්චති චතුසුමග්ගෙසු ඤාණං, සිව් මග නුවන බොධිනාමි. **අරියසාවකො බුජ්ඣතීති කත්වා බොධීති වුච්චති,** ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම අවබෝධ කොරේනුයි බෝධියයි කියනු ලැබේ. **සරණං සති**

සිහිකෙරේනුයි සතිනම්, පසත්ථා සුන්දරා බොජ්ඣඞ්ගා සම්බොජ්ඣඞ්ගා. ප්‍රශස්තවූ සුන්දරවූ බොධ්‍යඞ්ගය 'සම්බොධ්‍යඞ්ග නම්" සති එව සංබොජ්ඣඞ්ගා සතිසංබොජ්ඣඞ්ගා මනාකොට පිහිටුවන ලද සිහියම බොධ්‍යඞ්ගවේනුයි සතිසම්බොජ්ඣඞ්ග නම්. මේ ආදී නයින් අර්ථ අර්ථකථා ව්‍යාඛ්‍යාචාර්යයෝ පදගතාර්ථ නිර්වචනාර්ථ විග්‍රහාර්ථ සමුදායාර්ථ වශයෙන් බොධ්‍යඞ්ග ශබ්දය මද මද වෙනස්කම් ඇතිව අර්ථ වර්ණනය කළ නමුදු සියල්ල සම්පිණ්ඩනය කොට භාවාර්ථ වශයෙන් පැහැදිළි වනුයේ එකම අදහසකි. චතුස්සත්‍යාවබෝධයෙන් නිර්වාණය ප්‍රත්‍යක්ෂ කරන්නාවූ පුද්ගලයාහට අවයව වන හෙවත් උපකාර වන ධර්ම සමූහය බොධ්‍යඞ්ග නම්වේ යනුයි.

මීලඟට පැහැදිලි කරගත යුත්තේ අඩු වැඩි නැතිව බොධ්‍යඞ්ග ධර්ම සතක්ම තථාගතයන් වහන්සේ වදාළේ මන්ද යන්නයි- ලීනුද්ධච්ච පටිපක්ඛතො සබ්බත්ථිකතො ච- චිත්තයාගේ ලීන බව හා උඩඟු බවට ප්‍රතිපක්ෂ වසයෙන් සහ සියලු බොධ්‍යාඞ්ග ධර්මයන්ට සාධාරණ බැවින්ද අඩු වැඩි නොව බොධ්‍යඞ්ග ධර්ම සතක්ම වදාළ සේක.

**එත්ථහි තයො බොජ්ඣඞ්ගා ලීනස්ස පටිපක්ඛා යථාහ යස්මිංච ඛො භික්ඛවෙ සමයෙලීනං චිත්තං හොති කාලො තස්මිං සමයෙ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය කාලො- විරිය සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය කාලො පීති සම්බොජ්ඣඞ්ගස්ස භාවනායාති**

මෙහි චිත්තයාගේ පසුබටවීමක් අකර්මන්‍ය බවක්, හැකිලෙන බවක් යම් කලෙක වේද එකල්හි, ධම්මවිචය, විරිය, පීති, යන තුන් බොධ්‍යඞ්ග ධර්මයන්ගේ වැඩීමට කාලයයි—

**තයො උද්ධච්චස්ස පටිපක්ඛා යථාහ යස්මිංච ඛො භික්ඛවෙ සමයෙ උද්ධතං චිත්තං හොති, කාලො තස්මිං සමයෙ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය, කාලො සමාධි සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය, කාලො උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස භාවනායාති-**

**මහණෙනි,**

යම් කලෙක චිත්තයාගේ උඩඟු බවක් හෙවත් වික්ෂිප්ත බවක් නොතැන්පත් බවක් වේද එකල්හි පස්සද්ධි සමාධි උපෙක්ඛා යන බොධ්‍යඞ්ග ධර්ම තුන වැඩීමට හෙවත් භාවනා කිරීමට කාලයයි—

**එතෙකාපනෙත්ථ ලොන ධූපනංවිය සබ්බව්‍යඤ්ජනෙසු, සබ්බකම්මික අමච්චොවියච සබ්බෙසු රාජ කිච්චෙසු සබ්බ බොජ්ඣඞ්ගෙසු ඉච්ඡිතබ්බතො සබ්බත්ථිකතො යථාහ, සතිංච ඛ්වාහං භික්ඛවෙ සබ්බත්ථිකං වදාමීති—**

මෙහි වනාහී සතිසම්බොධ්‍යඞ්ගය සියලු බොධ්‍යඞ්ගයන්ට සාධාරණ වෙයි. සියලු ව්‍යඤ්ජනයන් රසවත් කිරීමට තෙම්පරාදුව අවශ්‍ය වන්නාක් මෙන්ද සබ්බකම්මික ඇමතියා සෑම සියලු රාජ කෘත්‍යයන්ටම අවශ්‍ය වන්නාක් මෙන්ද සියළු බොධ්‍යඞ්ග ධර්මයන්හී කැමතිවියයුතු බැවින් සිහිය හෙවත් සතිසම්බොධ්‍යඞ්ගය සබ්බත්ථිකයයි හෙවත් දෙපක්‍ෂයටම සාධාරණයයි තථාගතයන් වහන්සේ වදාළ සේක—

මේනයින් සිතෙහි ලීන බව හා උඬගු බව යන දෙකට ප්‍රති පක්‍ෂ වශයෙන් බොධ්‍යඞ්ග ධර්ම සයකුත් ඒ සියල්ලට සාධාරණ වශයෙන් සතිසම්බොධ්‍යඞ්ගයත් අඩු වැඩි නැතුව බොධ්‍යඞ්ග ධර්ම සතක්ම බුදුවරයන් වහන්සේලා වදාළ සේක—

මෙහි සති සම්බොජ්ඣඞ්ගය පළමු කොට කුමක් නිසා වදාරණ ලද ද?

**සතිංච ඛ්වාහං භික්ඛවෙ සබ්බත්ථිකං වදාමීති වචනතො සබ්බෙසං බොජ්ඣඞ්ගානං උපකාරකත්තා සති සම්බොජ්ඣඞ්ගො පඨමං වුත්තො.**

**මහණෙනි,**

සති සම්බොධ්‍යඞ්ගය සබ්බත්ථිකයයි කියමියි වදාළ හෙයින් සියලු බොධ්‍යඞ්ග ධර්මයන්ට සිහිය උපකාරක වන බැවින් සතිසම්බොජ්ඣඞ්ගය පළමු කොට වදාරණ ලදහයි, දතයුතුයි.

**පින්වත්නි,**

මෙතෙකින් බොජ්ඣඞ්ග යන්නෙහි තේරුම හා අනූනාධිකව බොධ්‍යඞ්ග ධර්ම සතක්ම දෙශනා කිරීමට හේතුවද සර්වාර්ථික භාවය හෙවත් ප්‍රථම කොට සති සම්බොජ්ඣඞ්ගය ප්‍රකාශ කිරීමට හේතුවද සැකෙවින් දක්වා මෙතැන් සිට සති සම්බොජ්ඣඞ්ගය පිළිබඳ දතයුතු දෙය ප්‍රකාශ කරණු ලැබේ.

**තත්ථ කතමො සති සම්බොජ්ඣඞ්ගො ඉධ භික්ඛු සතිමා හොති පරමෙන සති නෙපක්කෙන සමන්නාගතො චිරකතම්පි චිරභාසිතම්පි සරිතා හොති අනුස්සරිතා අයං වුච්චති සති සම්බොජ්ඣඞ්ගො.**

මෙහි සති සම්බොජ්ඣඞ්ගය නම් කවරහයත්?

මේ ශාසනයෙහි යොගාවචර මහණතෙම සිහියෙන් යුක්ත වනුයේ පරමාර්ථ සත්‍යයවූ නිර්වාණයටද මාර්ගයටද අනුලෝම වන නුවන සමග යෙදුනු සිහියෙන් යුක්තව තමාගේ හෝ අනුන්ගේ කයින් පෙර කරණ ලද වතාවත්. කිසුනු මඩුලු ආදී යමක් හෝ වචනයෙන් පෙර කියන ලද දහම් දෙසීම් හෝ කම්සථාන ආදියක් හෝ සිහි කිරීමේදී කාය විඤ්ඤත්ති වචී විඤ්ඤත්ති වශයෙන් උපදනා ලද අරූප ධර්ම කොටස් මෙසේ ඇතිවී මෙසේ නිරුද්ධවී යයි සිහිකරන්නේ වේද නැවත නැවත සිහි කරන්නේ වේද අවශේෂ බොජ්ඣඞ්ග ධර්ම ඉපදවීමට හෙතුභූතවූ විදර්ශනා සංඛ්‍යාත සිහිය සති සම්බොජ්ඣඞ්ගයයි කියනු ලැබේ—සිහිය වනාහි නුවනින් යුක්තවද වියුක්තවද උපදිති මෙහි වනාහී නොපක්ක සංඛ්‍යාත විදර්ශනා නුවන සමග යෙදුනාවූ සිහිය සති සම් බොජ්ඣඞ්ගය නම් වේ—

මෙසේ සූත්‍රාන්තික වශයෙන් කියන ලද සති සම්බොජ්ඣඞ්ගය උපදවීමට ධර්ම සතරක් හේතුවෙත්.

හේ කෙසේද යත්?

**සති සම්පජඤ්ඤං මුට්ඨස්සති පුග්ගල පරිවජ්ජනතා උපට්ඨිත සති පුග්ගල සෙවනතා තදධිමුත්තතාති යනුයි-**

මෙහි සති සම්පජඤ්ඤය නම් යහපත් නුවන සහගත සිහියයි—මුට්ඨස්සති පුග්ගල පරිවජ්ජනතා නම්, මුලා සිහි ඇති පුද්ගලයන් දුරු කිරීමයි: උපට්ඨිත සති පුග්ගල සෙවනතා නම්, එළඹ සිටි සිහි ඇති පුද්ගලයන් සේවනය කරණ බවයි—තදධිමුත්තතා නම් ඊට නැමුනු සිත් ඇති බවයි. යහපත් නුවන සහගත සිහිය ඇතිවිය යුත්තේ කොතැන්හිද?

**අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති- ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සමිඤ්ජිතෙ පසාරිතෙ සම්පජාන කාරීහොති, සංඝාටිපත්ත චීවර ධාරණෙ සම්පජානකාරී හොති- අසිතෙ, පීතෙ, ඛායිතෙ, සායිතෙ, සම්පජාන කාරීහොති- උච්චාරපස්සාවකම්මෙ සම්පජාන කාරීහොති- ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හී භාවෙ සම්පජාන කාරී හොතී යි,**

වදාල හෙයින් මෙකී ස්ථාන සතක සති සම්ප්‍රජාන භාවයෙන් යුක්ත විය යුතු බැව්—

අභික්කන්තාදිසුහි සත්තසු ඨානෙසු සති සම්පජඤ්ඤ සඞ්ඛාත-යනුවෙන් ප්‍රකාශවන්නේය. යෝගාවචර පුද්ගලතෙමේ තමා හෝ අනිකෙක් හෝ ඉදිරියට යෑමෙහිද ආපසු ඊමෙහිද-ප්‍රඥාවෙන් දැන හෙවත් සත්වනොවූකාය සම්මතවූ ඇටසැකිල්ලෙක් ඉදිරියට යාම් ඊම් ආදී ක්‍රියා කරන්නේයයි සලකා දැන කරන් නේය. ඉදිරි බැලීමෙහිද අනුදිග් බැලීමෙහිද හස්ත පාදයන් හැකිලීමෙහිද දිගු කිරීමෙහිද නුවනින් ඒ ඒ ප්‍රයෝජනය දැන සලකා කරන්නේය. සංඝාටි, පාසිවුරු දැරීමෙහිද ධාතු සමූහ යක්ම වැළඳ ගණිසි යන ආදීන් සැලකීමෙන් යෙදී වැළඳ ගන්නේය. අනුභව කිරීමෙහිද පානය කිරීමෙහිද ඛාද්‍ය ආදිය කෑමෙහිද මී සකුරු ආදියේ රස විඳීමෙහිද නුවනින් සලකා ප්‍රයෝජන විඳින්නේය. මල මූත්‍ර පැහැරීමෙහිද ප්‍රඥාවෙන් දැන ආදීනව සලකා මලමූත්‍ර පහරන්නේය. යෑම, සිටීම, ඉඳීම, නිදීම, නිදි දුරුකිරීම, කථා කිරීම, කථා නොකිරීම යන ආදියෙහිද නුවනින් සලකා දැන එකී ඉරියව් පවත්වන්නේයයි මෙසේ ඒ ඒ කටයුතු නුවනින් සලකා දැන කිරීම සතිසම්පජඤ්ඤ නම්වේ—

මුට්ඨස්සති පුග්ගල පරිවජ්ජනතාව නම්—

හත්ථ නික්ඛිත්ත කාකයන් වැනි මුලා සිහි ඇති පුද්ගලයන් හාත්පසින් දුරුකොට වාසය කිරීමයි. කවුඩො වනාහී බොහෝවූ ආහාර ලැබුනවිට හැකිතරම් තුඩින් ගෙනගොස් රුක් සිදුරු අතු පතර ආදියෙහි සඟවා තබයි. එසේ සඟවා තැබූ ආහාර නැවත සොයාගෙන කෑමට සිහි නැත්තාහු වෙත්. මෙසේ කපුටන් වැනි ඉක්මනින් මුලාවන සවභාව ඇති පුද්ගලයන්ගෙන් හාත් පසින් වෙන්ව සිටීම මුට්ඨස්සති පුග්ගල පරිවජ්ජනතා නම් වේ—

උපට්ඨිත සති පුග්ගලසෙවනතාවනම්- මහාගතිම්බ අභය සථ්විර, දීඝභාණක අභය සථ්විර, චූලාභය සථ්විර යන උතුමන් මෙන් චිරකෘතාදිය සිහිකිරීමෙහි එළඹ සිටි සිහිඇති පුද්ගලයන් සේවනය කිරීමයි. මහා ගතිම්බ අභය සථ්විර තෙමේ උත්පත්ති යෙන් පස්වන දිනයෙහි මඟුල හොජනය සඳහා පිළියෙලකල කිරිබත් කෑම පිණිස සේවකාදීන්ගේ පමාවක් බලා සැඟවී උන් කපුටෙකු කිරිබත් බඳුන මත වහනවා දැක සූ සූ යන අනුකරණ යෙන් හඬනැගූහ වැඩිවිය පැමිණි ඒ කුමාර තෙමේ බුදුසස්නෙහි මහන උපසම්පදා ලැබ සථ්විර නමක්වූවා-උපට්ඨිත සිහිය ගැණ සුප්‍රසිද්ධවූ දීඝභාණක අභය චූලාභය යන සථ්විර දෙනම හමුව එක් දිනක ඔවුනොවුන් පිළිසඳර කථායෙහි යෙදුනෝ ඔවුනො වුන්ගේ අනුසමරණ ශක්තිය දැනගනු රිසියෙන් එක් තෙර

නමක් මහාගතිම්බ අභය සථවිරයන් අතින් ඇවැත්නි ! නුඹ වහන්සේ කුඩාකල පටන් කල කී දෑය කොතැන් සිට සිහිකළ හැකිදැයි විචාලේය. ඊට පිළිතුරු දෙන උන්වහන්සේ ඇවැත්නි! මාගේ උපතපතනියෙන් පස්වැනි දිනයෙහි පැවැති මඞ්ගල භෝජනය සඳහා පිළිවෙළකරණ ලද කිරිබත කෑම පිණිස සැඟවී බලාවුන් කපුටුවෙක් සේවකාදීන්ගේ පමාවක් දැක කිරිබත් බඳුන මත වැසූයෙන් එය දුටු කුඩා මා සූ සූ යන අනුකාරණයෙන් හඬනැගුයෙමි. එතැන්සිට මා කල කී දේ සිහිකිරීමට හැකිවෙමියි ප්‍රකාශ කලහ එතරම් කුඩාකල පටන් කල කී දේ සිහිකරන්නට පුලුවන් එලඹසිටි සිහියක් ඒ මහාගතිම්බ අභය සථවිරයන් වහන්සේට ඇතිවූයෙන් උන්වහන්සේ එලඹ සිටි සිහිඇත්තෙක් විය.

එසේම අන් තෙරනමක් දීඝභාණක අභය සථවිරයන් වහන්සේ අතින්, ඇවැත්නි! නුඹවහන්සේ කුඩාකල පටන් කල කී දේ කොතැන් සිට කිව හැකිදැයි විචාලහ. එයට දීඝභාණක අභය සථවිරයන් වහන්සේ අවැත්නි, මා උපන් නවවැනි දින සුඹද පැණින් නාවා සතපපවානුබූ යහන ලඟට පැමිණි මාගේ මව්තොමෝ මා සිපගැණීමට නැමිනවූවා ඉස පැළඳි තිඹක් පමණවූ දෑසමන් මල්කලඹ මා පපුව මත පතිතවීමෙන් වේදනාවක් ඇතිවිය එතැන්සිට මා කල කී දේ සිහිකිරීමට පුලුවනැයි උන්වහන්සේ පිළිතුරු දුන්හ. උපන් නවවැනි දින සිට එලඹ සිටි සිහිනුවණින් යුත් උන්වහන්සේද උපට්ඨිත සති පුද්ගලයෙක් වූහ.

එසේම අන් තෙරනමක් ත්‍රිපිටක චූලාභය සථවිරයන් වහන්සේ අතින් අවැත්නි; නුඹවහන්සේගේ උපට්ඨිත සතිභාවය කෙසේ පවතීදැයි විචාලහ ඊට පිළිතුරුදෙන ත්‍රිපිටක චූලාභය සථවිරයන් වහන්සේ ඇවැත්නි; දොරටු සතරක් ඇති අනුරාධපුරයෙහි දොරටු තුනක් වසා එක දොරටුවකින්ම උදෑසන කාලයෙහි මහජනයා ඇතුල්කරවා නුඹ කීනම් ඇත්තෙක්ද නුඹ කිනම් ඇත්තෙක්දැයි නම් විචාරා දන සවස් කාලයෙහි ඒසා මහත් ජනකාය යථොක්ත පරිදි එක දොරටුවකින් බැහැර යන කල්හි මේ අසවල් නමැත්තාය, මේ අසවල් නමැත්තා යයි නොවරදවා ඔවුනොවුන්ගේ නම් කියන්නට සමර්ථයෙමියි ප්‍රකාශ කලහ. එහෙයින් උන්වහන්සේද සේවනය කළයුතු උපට්ඨිත සති ඇත්තෙකි.

මෙසේ උපට්ඨිත සතියෙන් යුක්තවූ පුද්ගලයන් සේවනය කිරීමද සති සම්බොජ්ඣඞ්ගොත්පාදයම හේතුවන්නේය.

තදධිමුත්තතාව නම් ඊට අධියුක්ත භාවය හෙවත් ස්ථාන නිෂද්‍යාදිය කිරීමෙහිදී ඊට නම්‍රවූ සිත් ඇති බවයි- ගච්ඡන්තෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ යන ආදීන්හි දක්වෙන පරිදි මම දැන් මේ මේ ඉරියව් පවත්වමි මේ මේ කටයුතු කරමියි කියා ඒ ඒ කටයුතු කෙරෙහි නැමුණු සිත් ඇති බවයි. මෙසේ සමෘති සම්බොධ්‍යඞ්ගොත්පාදයට හේතුභූතවූ හෙවත් උපකාරවූ කරුණු සතර දතයුතුයි.

සති සම්බොධ්‍යඞ්ගය උපදවා ගැණීමට උපකාරවූ මේකී සතරාකාර හේතු ධර්මයන්ගෙන් යුක්තවූ යොගාවචර කුලපුත්‍ර තෙමේ එහි පිහිටා මතු මත්තෙහි වැඩිය යුතු. සෙසු බොධ්‍යඞ්ග ධර්මයන්ද උපදවා අභිවෘද්ධි පැමිණිය යුත්තේය. ඒ අභිවෘද්ධිය ලැබීම වනාහී සෝවාන් ආදී මාර්ගඵල පිළිවෙලින් ගොස් ලැබිය යුතුමවෙයි. සති සම්බොධ්‍යඞ්ගය වැඩීමෙන් මුහුකුරාගිය නුවන ඇති යෝගාවචර පුද්ගල තෙමේ සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, යන සංයොජන ධර්මත්‍රය සහ මක්ඛ පලාස, ඉස්සා මච්ඡරිය, මායා, සාඨෙය්‍ය යන කෙලෙසයන්ද සමුච්ඡෙද ප්‍රහානයෙන් ප්‍රහීනකොට සෝවාන් වන්නේවෙයි. මෙහි සක්කාය දිට්ඨිය නම්-

රූපං අත්තතො සමනුපස්සති රූපවන්තං වා අත්තානං අත්තනි වා රූපං රූපස්මිං වා අත්තානං-

යනාදී නයින් රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන පස එකක් එකක් සතර සතර බැගින් ගත්කල ඇතිවන විංසති ආකාරය සක්කායදිට්ඨියයි.

විචිකිච්ඡාව නම්=

බුද්ධෙ කඞ්ඛති ධම්මෙ කඞ්ඛති සඞ්ඝෙ කඞ්ඛති-යනාදි නයින් බුදුරජාණන් වහන්සේ කෙරෙහි ධර්මය කෙරෙහි සඞ්ඝයා කෙරෙහි පවත්නාවූ සූවිසි තෙරුවන් ගුණ ඇතුළුකොට අවතැනක (ඇද්ද ඇද්දකියා) සැක කිරීමයි·

සීලබ්බත පරාමාසය නම්=

මේ සම්බුද්ධ ශාසනයෙන් පිට අන්‍යවූ සීලව්‍රත සමාදන් වීමෙන් සංසාරයෙන් මිදීම කලහැකියයි විස්වාසකරණ මිථ්‍යා කල්පනාවයි. සෝවාන්වූ පුද්ගල තෙමේ එහි පිහිටා මත්තෙහි වැඩිය යුතු ගුණදහම් වඩා කාමරාග ව්‍යාපාද යන සංයොජන දෙකෙහි හා ක්‍රොධ පටිඝ උපනාහ පමාද යන කෙලෙසයන්ගේ බලය

බිඳ සකෘදාගාමි වන්නේය. සකෘදාගාමි පුද්ගල තෙමේ වනාහී මත්තෙහි වැඩිය යුතු ගුණදහම් වඩා තිඳුනාවූ බල ඇති කාම රාග ව්‍යාපාද යන සංයෝජන දෙක සහ ක්‍රොධ පටිඝ උප නාහ පමාද යන කෙලශයන් සමුච්ඡේද ප්‍රහාණයෙන් නැතිකොට අනාගාමි වන්නේය. අනාගාමීවූ පුද්ගල තෙම වනාහී අර්හත්වය පිණිස මත්තෙහි වැඩියයුතු ගුණදහම් වඩා රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා සඞ්ඛ්‍යාත සංයෝජන පස සහ අභිජ්ඣා ථම්භ සාරම්භ මානාතිමාන මද යන කෙලශයන්ද සමුච්ඡේද ප්‍රහාණයෙන් නසා අර්හත් වන්නේය. එසේ අර්හත්වයට පැමිණි පුද්ගල තෙම සකල පරිනිර්වාණයෙන් සදාකාලික ශාන්ත සුඛ නිවන් සැනසුමෙන් සැනසෙන්නේය.

**දුතිය නයො- තත්‍ථ කතමො සති සම්බොජ්ඣඞ්ගො අත්‍ථි අජ්ඣත්තං ධම්මෙසු සති අත්‍ථි බහිද්ධා ධම්මෙසු සති යදපි අජ්ඣත්තං ධම්මෙසු සති තදපි සතිසම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. යදපි බහිද්ධා ධම්මෙසු සති තදපි සති සම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.**

බොධ්‍යඞ්ග ධර්ම අධ්‍යාත්මික බාහිර වශයෙන් තුදුසක් වන පරිදි දුතිය නයෙහි ප්‍රකාශකරණ බුදුරජාණන්වහන්සේ තත්‍ථ කතමො යනාදිය වදාළසේක. මෙතැන් සිට සැකෙවින් එය ප්‍රකාශ කරමි. තමාගේ ශරීරය පිළිබඳවූ කේසාදී කුණප කොටස් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් නුවණින් බලන්නාවූ පුද්ගලයා හටද එසේම අනුන්ගේ ශරීර පිළිබඳවූ කේසාදී කුණප කොටස් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් නුවණින් බලන්නාවූ පුද්ගලයාහටද ඒ පිළිබඳව ඇතිවන සිහිය සතිසම්බොජ්ඣඞ්ගයයි.

සතිසම්බොධ්‍යඞ්ග සඞ්ඛ්‍යාත එම සම්‍යක් සිහිය විශෙෂයෙන් දතයුතු ධර්මයන් දැනගැනීම පිණිසද මාර්ගඥාණ ප්‍රතිලාභය පිණිසද වාන සඞ්ඛ්‍යාත තෘෂ්ණාව නැති බැවින් නිර්වාණ යයි කියන ලද අසඞ්ඛත අමෘත ධාතුව ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද හේතුවන්නේය.

තතිය නයෙහි සතිසම්බොජ්ඣඞ්ගය භාවනා වශයෙන් ප්‍රකාශ කරණ බුදුරජාණන් වහන්සේ—

**විවෙකනිස්සිතං විරාග නිස්සිතං නිරොධ නිස්සිතං වොස්සග්ගපරිනාමිං සති සම්බොජ්ඣඞ්ගං භාවෙති ති.**

වදාළසේක.

මෙහි විවෙක නිස්සිතං යන්නෙන්, සති සම්බොජ්ඣඞ්ගය විවිත්ත ස්වභාව නිශ්‍රිත යයි ප්‍රකාශිතයි. විවේකය නම් කාය විවේක චිත්ත විවේක වශයෙන් දෙවැදෑරුම්. නැවත තදඞ්ග වික්ඛම්භන සමුච්ඡෙද පටිප්පස්සද්ධි නිස්සරණ වශයෙන් විවේකය පඤ්චප්‍රකාර වෙත්, සති සම්බොජ්ඣඞ්ගය වනාහී ඒ පඤ්චප්‍රකාර විවේකය අතුරෙන් තදඞ්ග සමුච්ඡෙද නිස්සරණ සඞ්ඛ්‍යාත විවේක ත්‍රය ඇසුරු කරණ ලද්දේ වෙයි. තදඞ්ග විවේකය නම් තත් තත් අඞ්ගයන්ගෙන් ඊට ප්‍රතිපක්‍ෂ අඞ්ගප්‍රහාණය කිරීමෙන් ලබන ලද විවේකයයි හෙවත් විදර්ශනාවයි. සමුච්ඡෙද විවේකය නම් ඒ ඒ මාර්ග ඥානවලින් ඒ ඒ කෙලශ ධර්මයන් නැවත නූපදින පරිද්දෙන් මුලිනුපුටා හැරීමෙන් ලබන ලද විවේකයයි. හෙවත් මාර්ගයයි. නිස්සරණ විවේකය නම් වේදනාදී සිව් වැදෑරුම් ස්කන්ධයන් සම්බන්ධ ඇතිවන්නාවූ මූලා සිහිය සහ රූප ස්කන්ධ සඞ්ඛ්‍යාත කයත් නැතිකොට ලබන යම් විවේකයක් වේද එයයි. හෙවත් නිර්වාණයයි.

සති සම්බොජ්ඣඞ්ගය වනාහී මෙකියන ලද ත්‍රිවිධ විවේකය ඇසුරු කරණ ලද්දේ වෙයි. විරාගනිශ්‍රිතය නම් රූප රාග අරූප රාග මාන උද්ධච්ච අවිජ්ජා යන සංයොජන පස ප්‍රහාණය කිරීමෙන් ලබන අර්හත්වයයි. නිරොධ නිශ්‍රිතය නම්, දුක්ඛ නිරොධයයි හෙවත් ජාත්‍යාදී දුක් නැති කිරීමෙන් ලබන නිර්වාන යයි. වොස්සග්ග පරිනාම නම්, පරිච්චාග වොස්සග්ගය පක්ඛන්දන වොස්සග්ගයයි දෙවැදෑරුම්. එහි පරිච්චාග වොස්සග්ගය වනාහී තදඞ්ග වශයෙන් විදර්ශනායෙහිද සමුච්ඡෙද වශයෙන් මාර්ගක්‍ෂණයෙහිද කෙලශ ප්‍රහාණය කරයි-පක්ඛන්දන වොස්සග්ගය වූකලී විදර්ශනාක්‍ෂණයෙහි තන්නින්න ස්වභාවයෙන් හා මාර්ගක්‍ෂණයෙහි ආරම්මණ කරණ වශයෙන්ද නිබ්බාන පක්ඛන්දනය හෙවත් අරමුණු කිරීම් වශයෙන් චිත්තය නිර්වාණයට පැනයැමද කරයි- මේ සති සම්බොජ්ඣඞ්ගය වනාහී උක්තප්‍රකාරයෙන් කෙලශ ප්‍රහාණයද නිර්වාන පක්ඛන්දනයද කරයි-එහෙයින් වොස්සග්ග පරිනාමය දක්වන ඇතැම් අර්ථ කථාචාරිහු සතිසම්බොජ්ඣඞ්ගය පඤ්චවිධ විවේකයම ඇසුරු කරණ ලදැයිද කියත්. මේ ස්ථානයෙහි මෙකී පඤ්චවිධ විවේකයෙන්ම නිර්වානය හා වොස්සග්ග පරිනාමින් යන්නෙන් මාර්ගයද දක්වූහ.

මෙතෙකින් සතිසම්බොධ්‍යඞ්ගය භාවනා වශයෙන් වැඩිය යුතුවූ තෙවෙනි නයක්‍රමය සැකෙවින් මෙසේ අවසාන කරමි. දැන් ඉතින් කාලය ඉක්ම ගිය බැවින් දෙශනාව අවසාන කරමි. මේ පින්වතුන්ට දැන් ඇසූ බණ සිත දරාගැණීමට අපහසු බැවින්

ධර්ම ධරයන් වෙත පැමිණ නැවත නැවතත් අසා බලා දැන ඉගෙනීමෙන්ද, මේ දෙසූ ක්‍රමය පොතක්කර සකස් කරන්ට බලාපොරොත්තු වන බැවින් එම පොත් පලවූවාම රැගෙණ බලා ද, මෙම සතිසම්බොධ්‍යඞ්ග ධර්මය ඇතුලු සෙසු බොධිපාක්ෂික ධර්මයන් වඩා මෙලොව දියුණුවත් පරලොව සැපයත් කෙලවර මේ ධර්මයම ප්‍රත්‍යක්ෂ කර ගැණිමෙන් ලැබිය යුතු අමාමහ නිවනත් ලැබීම පිණිස උත්සාහ වැඩිය යුතු බව කරුණාවෙන් දන්වමි.

**පිනැතියෙනි,**

බණ මෙතෙකින් අවසන් කොට බණටම අනුගත කාරුණික අවවාදයක් දීමට අදහස් කෙරෙමි. පිනැතියෙනි බණ ඇසීමේ ඵලය එය ඉගෙණීම බවත් ඉගෙණීමේ ප්‍රයෝජනය පිළිපැදීම බවත් මම මුලදීම මේ පින්වතුන්ට කියා දුනෙමි දැන් කියන්නේ එහිම අවසාන කොටසයි. සැදැහැති යෙනි අප බුදුපියාණන් වහන්සේ දවසකට තෙවිටක්ම භික්ෂූන්ට දේශනා කළාවූ අවිජනිත ධර්මය නම් "දුල්ලභංච මනුස්සත්තං" යනාදී ධර්මයයි. මේ පින්වතුන්ටද දැන් මා අනුශාසනා කිරීමට අදහස් කරන්නේ ඒ ධර්මයම මතක්කරමින් දුලීභව දුකසේ ලබා ගත් මේ මිනිසත් බව වැඩදායක කර ගැණිමට උපකාර වන කරුණු සවල්පයකි. එය නම්, පරපන නැසීම, සොරකම, අන් අඹුවන් මෙන්ම අන් හිමියන් සෙවුම (රහමෙර පානය) යන මේ පව්කම් වලින් වැලකීමෙන් කායිකසංයමයත්, බොරුබස් හිස්බස් ඵරුසබස් කේලාම් නොකීමෙන් වාක්සංයමයත්, අනුන් අයත් දෙයට ආසා කිරීම අනුනට විපත්වේවායි සිතීම විසමවූ මිථ්‍යා ආගම් ඇදහීම යන මෙයින් වැලකීමෙන් චිත්තසංයමයත් ඇති කර ගන්න මෙයින් තිදොර සංවරකොටගෙණ මත්තෙහිදු අනුන් පහත්කොට හෝ තමුන් උසස්කොට නොසිතන්න. තමුන්ට අයත් යසඉසුරෙන් මත්නොවන්න. මසුරු නොවන්න. අනුන්ගේ දියුණුවට යසඉසුරට ඊර්ෂ්‍යා නොකරන්න. පළිගැණීම කරණවා තබා සිතෙන්වත් සිහි නොකරන්න. අනුන්ට ක්‍රොධ නොකරන්න. අනුන්ගේ ගුණමකුවෙක් නොවන්න. රටට-ගමට-දෙයට-ආගමට-හතුරුකම් කරණ-තමන්ලග ගැවිලාවත් නැති සමසමාජයක් ගැණ කථා කරණ තමනට කරන්නට බැරි එලෙසම නොකරණ දෙය කරමි කරදෙමියි බොරු පොරොන්දු දීමෙන් මහ ජනයා මුලාවේ හෙලා තම යටි අදහස් ඉටුකර ගණිමින් දෙශපාලන බලතල ලබා ගැණිමට උත්සාහකරණ "රිකතාමුටසීසමාන" කෂට දුෂට අධම අසත්පුරුෂ කිම්පාකකාවැනි මකබලිගොසාල යන්ට නොරුවටී ඔවුන් දුරින්ම දුරලන්න. ඔවුන් ඇසුරින් ඈත්වන්න.

පිනැතියෙනි,

මෙහි කී නොකී දෙලොවම අවැඩට අනර්ථයට පරිහානියට හේතුවන දුසිරිත් පව්කම් වලින් හාත්පසින්ම වෙන්වී දුගියනට මගියනට යදියනට අසල්වැසියනට පිදිය යුතු තැනට ලද පමණින් දෙන්න. පුදන්න අනුන්ගේ දියුණුව යසඉසුරට සතුටු වන්න. අන් වැඩ පරවැඩ සමව සිතන්න. වැඳිය යුතු පිදිය යුතු මව් පියනට ගුරුනට වැඩිමහළු සොහොයුරු සොහොයුරියනට නැදිමයිලනට වැඩිහිටියනට ගුණවතුනට සුසිල්වතුනට වඳින්න පුදන්න. මග දියයුතු මහතුනට මග දෙන්න. දුනහුනස්නෙන් නැගිට අසුන දියයුතු පිනැතියනට අසුන දෙන්න. සැලකියයුතු තැනට සලකන්න. ගුණ වැනිය යුත්තන්ගේ ගුණ වනන්න. පාපයට ගරහන්න. දුටු වරද නොසඟවා අනුකම්පායෙන් මෙත් සිතින් රටට නොව වරද කරුට කියන්න. ගමට, රටට, දැයට, ආගමට මෙහෙකරන්න. නිරතුරු මෙත් කරුණා ගුණයෙන් යුක්ත වන්න. සසර අනිස බැවින් සියල්ල වෙනස්වෙතුදු සත්‍යය සදහටම එකම මුහුනුවරින් යුක්තව ජය ගන්න බවම අදහන්න. මෙහි කී නොකී දහසකටත් වැඩි සුසිරි වඩන්න පින්කම් කරන්න. මෙසේකොට තමුන් අයත් පැල්පතවූවත් දෙව් විමනක් කරගන්න සදහටම ප්‍රීතියෙන් යුක්ත වන්න. ලද පමණින් සතුටුවීමෙන් සදහටම ප්‍රීති විඳහැකියි-මිල මුදල් අඩු පාඩුකම් ඇතිවූවත් සැදැහැ සිල් ආදියෙන් ලොකුම පොහොසතුන්වී අනින්දිතව සදුසුඛිත මුදිතව කිත්සිරියෙන් වැජඹී මින් සැව දෙව්ලොව දෙව් සිරි සැපත් ලබමින් ගොස් මැදුම් පිළිවෙත සපුරා නිත්‍ය සදාකාලික අමාමහ නිවන් සුවයෙන් සුවපත් වන්න.

පින්වතුනි,

දැන් ඉතින් බණත් අනත් වෙනත්, කිවයුතු දෑයත් කාලවේලාවත් අවසානයි. එබැවින් අප සව්රැණුත් සියලු සත්වයෝ නිදුක් වෙත්වා නීරෝගී වෙත්වා සුවපත් වෙත්වායි සිතා මොහොතක් නිඃශබ්ද වෙමු.

ධම් ශ්‍රවණය කිරීමෙන් හා දහම් පඬුරු පිදීමෙන් ලබාගත් මහගු පින් අපමන්වූ සිරි අරියවංස මහා ස්ථවිරයන් වහන්සේටද මේ පින්වතුන්ගේ මිය ගිය සියලු ඥාති මිත්‍ර හිතවතුන්ටද ලොක පාලක සියලු දෙවියන්ටද මේ පින්වතුන්ටද අත්පත් වීමෙන් දෙව් මිනිස් සැප සහ අමාමහ නිවන් සැප සිඬවේවායි ප්‍රාර්ථනා කළයුතුයි—

**රන්දෙඹේ ශික්ෂාලඞ්කාර විද්‍යාලයෙහි ප්‍රධානාචාර්‍ය්‍ය කහවේ සිරි සොභනාරාමාධිපති සිරි සද්ධම්මවංසාලඞ්කාර විසුද්ධාචාර කවිධජ හක්මන සිරි සඞ්ඝතිස්ස නායක මහ ස්ථවිරපාදයන් වහන්සේ විසින් මොරටුවේ මොරටුමුල්ලේ සිරි සුධර්මාරාමයෙහි 1947 ක්වූ දෙසැම්බර් මස 22 වැනි දින පවත්වන ලද ධර්ම දේශනාව.**

---

## 2. ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය.

—(॰)—

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

---

**තත්ථ කතමො ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො? අත්ථි අජ්ඣත්තං ධම්මෙසු පවිචයො අත්ථි බහිද්ධා ධම්මෙසු පවිචයො, යදපි අජ්ඣත්තං ධම්මෙසු පවිචයො, තදපි ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති යදපි බහිද්ධා ධම්මෙසු පවිචයො තදපි ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.**

**පින්වත්නි,**

මේ දේශනා පාඨය මා විසින් ප්‍රකාශ කරන්නට යෙදුනේ අද නියම ධර්ම කථාවට මාතෘකා වශයෙනි. මෙය අභිධර්ම පිටකයට අයත් විභඞ්ග ප්‍රකරණාගත බොධ්‍යඞ්ග විභඞ්ගයෙහි වදාළ පාඨයෙකි. මෙය විස්තර කරදීමට පළමුව කියයුතුව තිබෙන්නේ ධර්මකථිකයන්ගේ චාරිත්‍රයක් වන බණ ඇසීමේ අනුසස් දක්වෙන ආරම්භ කථාවකි. නුමුත් මෙහි දිනපතා ධර්ම දේශනා පඞ්ක්තියක් පැවැත්වීමට නියමකරගෙණ තිබෙන බැවින් ඒ පිළිබඳව විස්තර කථාවක් වුවමනා නොවේ. එබැවින් මේ පිරිස බණ කියන මේ ටික වේලාවෙහි කිසිවක් ගැණ ඇස කණ නොමෙහෙයා සැදී පැහැදී සකසා බණ ඇසිය යුතුයි.

ඉතා ගැඹුරු ධර්මයක් එක් වරක් ඇසූ පමණින් ඉගෙණීම ඉතා දුෂ්කරය. එබැවින් කල්‍යාණ මිත්‍ර උගත් ශාසනවංශ ස්ථවිරයන්ගේ අනුශාසනා පරිදි ඒ ඇසූ ධර්මය නැවත නැවත බලා තේරුම් ගත හැකි වනසේ මුද්‍රණය කරවා විසුරුවා හැරීම

පමණ කළ නොහෙන තරම් ප්‍රයෝජනවත් ක්‍රියාවකි. සියලු දානයනට උතුම් ධර්ම දානමය පිණද ඉන් අත්පත් වන්නේය. එය නැවත නැවත බලා ඉගෙණ ගන්නා අදහසින් නිවන් සුව ලැබේවායි ධර්මාලම්බන ප්‍රීතියෙන් යෙදී බණ ඇසිය යුතුයි.

මෙතැන් පටන් ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය විස්තර කරමි. බොජ්ඣඞ්ග දෙශනාවද උද්දෙශ නිද්දෙශ වශයෙන් දෙයාකාරය, එහි සත්තබොජ්ඣඞ්ගා යනු උද්දෙශයයි. ''තත්ථ කතමො ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො'' යනු නිද්දෙශය වෙයි. මං මාතෘකා කාලේ නිද්දේශ පාඨය වේ. බොධ්‍යඞ්ග ධර්මයන්ගෙන් පළමුවන බොද්ධඞ්ග සමෘති සම්බොධ්‍යඞ්ගයයි. 'සම්බොජ්ඣඞ්ග' යන්නෙහි තේරුම ප්‍රථම ධර්මදෙශනාවෙහිද විස්තර කරන්නට ඇතැයි හැඟෙන හෙයින් මෙහිදී ඒ විස්තරය නොකරණු ලැබේ. ''චතුසච්චධම්මෙ විචිනාතීති ධම්මවිචයො'' දුඃඛ සමුදය නිරොධ මාර්ග යන චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් සොයානුයි විමසානුයි යන අර්ථයෙන් ධර්මවිචය නම්. බොධිනම්වූ චතුස්සත්‍ය ධර්මයන් අවබොධ කිරීමට ඉවහල් වන ධර්ම සමූදයගේ අවයව හෝ බොධිනම්වූ සතර අර්මග අවබොධ කාරණ ආර්‍ය්‍ය ශ්‍රාවකයාට අඞ්ග (කාරණය) හෝ බොධ්‍යඞ්ග නම් වෙයි. ධර්ම විචයම සුන්දරවූ බුද්ධාදීන් විසින් පසස්නාලද බොජ්ඣඞ්ගය නුයි සම්බොජ්ඣඞ්ග නම් වේ. පඤ්චොපාදානස්කන්ධ නාම රූපයන් ව්‍යවස්ථානොට එකි එකි නාම ධර්මයක් රූප ධර්මයක් පාසා අනිත්‍යය දුඃඛය අනාත්මයයි බලන ස්වභාවය වූ ප්‍රඥා චෛතසිකය ධර්මවිචය බව තේරුම් ගත යුතුයි. බොධ්‍යඞ්ග ධර්මයන් සිය සිත්සතන්හි උපදවා ගැණුමට නිරතුරුව සෙවිය යුතු කුශල ධර්ම තිබේ. යමෙක් ආනාපාන කර්මස්ථානය රෑ දවල්හි යුහුව දින ගණනක් වඩා කොළ පැමිණියේ නම් ඔහට බොධ්‍යඞ්ග භාවනාව නිරායාසයෙන් සිදුව විද්‍යා විමුක්තීන්ගේ ලැබීම වෙයි. තමා විසින් වඩන ලද භාවනා කර්මයට අයිතිවූ ධර්මයන් පිළිබඳවැ විචාරණ ප්‍රඥාව ක්‍රමයෙන් දියුණුවී යාම ධර්මවිචය සම්බොධ්‍යඞ්ග භාවනාවයි. ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය සත්බොද්ධඞ්ගයෙහි දෙවැනි බොද්ධඞ්ගය. පළමුව සමෘති සම්බොධ්‍යඞ්ග භාවනාවෙහි පුරුදුවූ ඒ මහණතෙමේ එකී අයුරෙන් උපදවාගත් සිහි ඇත්තෙක්ව තමා විසින් හෝ මෙරමා විසින් හෝ බොහෝකල් කරණ ලද්දාවූද බොහෝකල් කියන ලද්දාවූද සතිසම්බොජ්ඣඞ්ගයෙහි වදාරණ ලද ඒ ධර්මය විදර්ශනා ප්‍රඥාවෙන් අනිත්‍යය දුඃඛය අනාත්මයයි සොයාද, ප්‍රඥාව හසුරුවාද, සොයා බැලීමට පැමිණේද එබඳු විදර්ශනා ප්‍රඥාව ධර්මවිචය සම්බොධ්‍යඞ්ග යයි කියනු ලැබේ.

මේ ප්‍රකාශ කෙළේ අභිධර්ම භාජනියෙහි වදාළ පාලියෙහි කොට් අදහසය. අප මාතෘකාකළ සුත්‍රාන්තභාජනියෙහි "කතමො ධම්ම විචය සම්බොජ්ඣඞ්ගො?" එහි ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය කවරේද යනු කියනු කැමැත්තෙන් විචාරීමය. එසේ විචාළ පැනයට බුදුන්වහන්සේම "අත්ථි අජ්ඣත්තං ධම්මෙසු පවිචයො" යනාදීන් පිළිතුරු වදාළහ. අධ්‍යාත්මික (තමා පිළිබඳවූ) සංස්කාර ධර්මයන්හි පහළවෙන නුවණක් ද ඇති බැහැර සංස්කාර ධර්මයන්හි පහළ වෙන නුවණක් ද ඇති. ඒ දෙයාකාර වූම සංස්කාරයන් විමසීමෙන් උපදනා දෙයාකාරවූම ප්‍රඥාව අනිත්‍යාදි වශයෙන් විශෙෂයෙන් දැනගැණිම පිණිසත් චතුරාර්‍ය්‍ය සත්‍යය මනාව අවබොධ කර ගැණීම පිණිසත් නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසත් පවතිය යනු එහි අදහස ය ඒ පාඨයෙන් අධ්‍යාත්මික බාහිර සංස්කාරයන් අරමුණු කොට උපදනා විදර්ශනා ප්‍රඥාව ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය යි වදාළ සේක. ඒ ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය ඉපැදවීම පිණිස පවත්නා හේතු ධර්ම සතකි.

1. **පරිපුච්ඡකතා;** රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ සඞ්ඛ්‍යාත පස්කඳ පිළිබඳවද, සසර දුක් දරා සිටීමට ආධාරවූ හෝ හේතුවූ හෝ නිසත්ත්ව නිර්ජීව ස්වභාව මාත්‍රම වූ චක්ඛු ධාතු, රූප ධාතු, චක්ඛුවිඤ්ඤාණ ධාතු, සොත ධාතු. සද්ද ධාතු, සොතවිඤ්ඤාණ ධාතු, ඝාණ ධාතු, ගන්ධ ධාතු ඝාණවිඤ්ඤාණ ධාතු, ජිව්හා ධාතු, රස ධාතු, ජිව්හාවිඤ්ඤාණ ධාතු, කාය ධාතු, ඵොට්ඨබ්බ ධාතු, කායවිඤ්ඤාණ ධාතු, මනො ධාතු, ධම්ම ධාතු, මනොවිඤ්ඤාණ ධාතු, යන අටළොස් ධාතූන් පිළිබඳව ද, චක්ෂුර්විඥානාදීන්ට නිවාසස්ථාන වන හෙයින් ද, චක්ෂුර්විඥානාදීන් හටගන්නා ස්ථාන වන හෙයින් ද රැස්වීමට ස්ථාන වන හෙයින් ද දික්වූ සසර දුක පවත්වන හෙයින් ද, දික්වූ සසර දුක උපද්දවන හෙයින් ද ඒ ඒ ද්වාරයෙහි උපදනා චිත්ත චෛතසිකයන් අරමුණු රස විඳ කෑම් ආදිවූ තමන් තමන් පිළිබඳ කෘත්‍යයෙන් උත්සාහ කරණ අර්ථයෙන් ද ආයතන නම්වූ චක්ඛායතනය, සොතායතනය, ඝාණායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය, රූපායතනය, සද්දායතනය ගන්ධායතනය, රසායතනය, ඵොට්ඨබ්බායතනය, ධම්මායතනය, යන දොළොස් ආයතනයන් පිළිබඳව ද, අධිපති කර්ම කරණ විශෙෂයෙන් ආර්‍ය්‍ය මාර්ගය උපදනාවස්ථාවෙහි අධිපති වශයෙන් පහළවන සද්ධින්ද්‍රියය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධි-න්ද්‍රියය, පඤ්ඤින්ද්‍රියය, යන පඤ්චෙන්ද්‍රියයන් පිළිබඳව ද, අශ්‍රද්ධාදි ප්‍රතිපක්ෂ ධර්මයන්ගෙන් කම්පාකළ නොහෙක සද්ධා බලය, විරිය

බලය, සතිබලය, සමාධි බලය යන පඤ්ඤා බලය පිළිබඳව ද, සතර අවස්ථාවෙක්හි මාර්ග චිත්ත වීථියෙහි ලෝකෝත්තර කුසල් සිත් සතරෙහි අවයව වශයෙන් පහළවන සම්මා දිට්ඨි, සම්මා සඞ්කප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මාසති, සම්මාසමාධි, සඞ්ඛ්‍යාත මාර්ගාඞ්ග අට පිළිබඳවද චතුෂ්කනයින් ප්‍රථමධ්‍යාන, ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යාන, චතුර්ථ ධ්‍යාන, යන සතර හෝ පඤ්චකනයින් පඤ්චමධ්‍යානය සමග ධ්‍යානපස පිළිබඳවද, රාගාදි කෙලෙස් ආවරණයකරණ හෙයින් හා නීවරණයන් ප්‍රධාන කොට ඇති අකුශල ධර්මයන් සංසිඳුවන හෙයින් ද සමථනම් වූ පඨවිකසිණය, ආපොකසිණය, තේජෝ කසිණය, වායොකසිණය, නීලකසිණය, පීතකසිණය, ලෝහිත කසිණය, ඔදාතකසිණය, ආකාශකසිණය, ආලෝකකසිණය යන දසකසිණ කමටහන්ද උද්ධුමාතකය, විනීලකය, විපුබ්බකය, විච්ඡිද්දකය, වික්ඛායිතකය, වික්ඛිත්තකය, හතවික්ඛිත්තකය, ලෝහිතකය, පුලවකය, අට්ඨිකය, යන දස අසුභ භාවනාද, බුද්ධානුස්මෘති, ධර්මානුස්මෘති, සඞ්ඝානුස්මෘති ශීලානුස්මෘති, ත්‍යාගානුස්මෘති, දෙවතානුස්මෘති, උපසමානුස්මෘති, මරණානුස්මෘති, කායගතාසති, ආනාපානසති, යන අනුස්මෘති භාවනා දසය ද, මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා, යන සතර බ්‍රහ්ම විහාර භාවනාද, ආහාරෙ පටිකූල සඤ්ඤාව ද, චතු ධාතු ව්‍යවස්ථානය ද, ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන, සඞ්ඛ්‍යාත සතර ආරූප්‍යය ද මෙකී සමසතළිස් කමටහන් පිළිබඳව ද, නාම රූප ධර්මයන් ස්වභාවය, කෘත්‍යය වැටහෙන ආකාරය, ආසන්න කාරණය යන සතර අයුරෙන් එකක් පාසා බෙදා නුවණින් අල්ලාගෙණ ඊට අනතුරුව ඒ නාම රූපයන්ගේ පැවැත්මට හේතුවූ අවිද්‍යා, තෘෂ්ණා, උපාදාන, කර්ම, ආහාරා'දී උපකාරක ධර්මයන් ද නුවණින් විමසා තෙල්ය, පහන් කබලය, වැටිය, යන මේවා එක්රැස්වීමෙන් පහන්දැල්ල ඉපිද ඉපිද තෙල්හා වැටිය ගෙවී යාමෙන් පහන් සිළුව නිවී යන්නා සේ චක්‍ෂු රූපාදීන්ගේ එක්වීමෙන් චක්‍ෂුර්විඥානාදිය ඉපිද ඉපිද බිඳෙන හෙයින් අනිත්‍යය, එසේ ඇසිල්ලක්පාසා උපදමින් බිඳෙමින් පවත්නා හෙයින් දුකය, සදහටම එකහැටි පවතිවායි ආඥා හෝ යාඥාකළ නමුදු ඒ අණට හෝ යැදුමට අනුව නොපවත්නා හෙයින් අනාත්මය යන තිලකුණට නගා හැම සංස්කාරදහම් එකිනෙකකු පාසා හෝ ප්‍රකීර්ණක වශයෙන් විවිධාකාරයෙන් නුවණින් බැලීම යයි කියන ලද විදර්ශනාව පිළිබඳව ද මෙහි අර්ථය නොසද්දූ යි යනාදීන් දන්නා නැතින් වීචාරණ බව පරිපුච්ඡකතාවය යි

දතයුතු. උපාසක උපාසිකාවන් විසිනුදු බහුශ්‍රැතයන් කරා එළඹ වහන්ස, කුසල් කිම? අකුසල් කිම? කුමක් සාවද්‍යද? කුමක් කුමක් නිරවද්‍යද? කුමක් සේවනය කළයුතුද? කුමක් සේවනය නො කළ යුතු ද? මා විසින් කුමක් කරණු ලබන්නේ බොහෝ කලක් අවැඩ දුක් පිණිස පවත්නේ ද? කුමක් කරණ ලද්දේ හිත සැප පිණිස පවත්නේදැයි විචාරන්නේ වේද එය මහත් ප්‍රඥාව ලැබීම පිණිස පවත්නා පිණක් බව චූලකම්ම විභඞ්ගාදියෙහි වදාරා තිබේ.

**2. වත්ථු විසද කිරියා.** තමා පිළිබඳවූ ද බාහිරවූ ද වස්තූන් පිරිසිදුව තබාගැන්ම ද ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය ඉපැද වීමට දෙවැනි හේතුවයි. යම් කලෙක්හි ඒ භාවනානුයොගී පුද්ගලයාගේ කෙස්, ලොම්, නිය පමණට වඩා දික්වූවාහුද, සිරුර හෝ ඩහ මල වැකුණේවේද, උත්සන්නවූ වාපිත් සෙම් යන දෙසින් යුක්තවේ. එකල අනුන්ගේ පිළිකුලටවඩා තමාගේ සිත යථාස්ථානයෙහි තබා එකඟකරගැනීම උගහටය. එකල අධ්‍යාත්මික වත්ථු අපිරිසිදු වෙයි. යම් කලෙක පොරොනා සිවුර දිරා ගියේ හෝ කිලිටිව දුගඳවේ ද, වසන ගේ දොර හිඳිනා ඇඳ පුටු කොට්ට මෙට්ට ඇඳ ඇතිරිලි ආදිය කුණු කසලින් ගැවසී ගත්තේ හෝ මකුළු දැල් බැඳුනේ වේද, පරිභොග කරණ පාත්‍ර පඩික්කන් ආදිය හෝ අපිරිසිදුවේද, එකල්හි බාහිර වත්ථු අපිරිසිදු වෙයි. අධ්‍යාත්මික වස්තූන් හා බාහිර වස්තූන් අපිරිසිදුවූ කල්හි උපදනා චිත්ත චෛතසිකයන්හි යෙදෙන ඥාණයද අපිරිසිදු වෙයි. අපිරිසිදු පහන් කබල් තෙල් වැටි ආදිය නිසා උපදනා පහන් සිළුවෙහි එළිය අපිරිසිදු වන්නාක් මෙනි. අපිරිසිදු ඥාණයෙන් සංස්කාරයන් සම්මර්ශනය කරන්නාහට සංස්කාරයෝද අප්‍රකට වෙති. කමටහනෙහි යෙදෙන්නහුගේ කමටහනත් වැඩීමට විපුල භාවයට නො පැමිණේ. පිරිසිදු ප්‍රදීපාධාරයෙහි පිරිසිදු වැටි තෙල් නිසා දැල්වෙන පහන් සිළුවෙහි පැවති එළිය පිරිසිදු වන්නා සේ අධ්‍යාත්මික බාහිර වස්තූන් පිරිසිදුවූ කල්හි උපදනා චිත්ත චෛතසිකයන්හි පවත්නා ඥාණයත් පිරිසිදු වන්නේ ය. පිරිසිදු නුවණින් සංස්කාරයන් සම්මර්ශනය කරන්නාහට සකර දහම් ද ප්‍රකට වේ. කමටහන්හි යෙදෙන්නහුගේ කමටහනද වෘද්ධියට මහත් බවට පැමිණෙයි.

එබැවින් දික්වූ කෙස් ලොම් නිය කපා හැරීමෙන් ලය විරේක කුච්ඡි විරේක ආදියෙන් සිරුර සැහැල්ලු කිරීමෙන් ද, සිරුරෙහි ඩහ මල උලා නෑමෙන් ද කය පිරිසිදුව තබා ගතු

යුතු ය. එසේම කිලිටි සිවුරු සෝදා පඬු පොවා ගැනීමෙන් ද සෙනසුනෙහි කැලි කසල ඉවත්කර හැරීමෙන් ද මකුළුදැල් කැඩීමෙන් ද පරිභොග කාරණ හැම පිරිකරක් ම පිරිසිදුව තබා ගත යුතු. සියල්ල පිරිසිදුව තබා ගැණීමට උපදෙස් බුදු දහමෙහි නොයෙක් අයුරෙන් ප්‍රකාශව තිබේ. පිරිසිදු කමත් අපිරිසිදු කමත් ඔවුනොවුන්ගේ චරිත දැනගැණීමට ද හේතු වේ. පිරි සිදුව සිටීම සාමාන්‍යයෙන් ශිෂ්ටාචාරකම ද වන්නේ ය. කැලි කසල දැක දැක හිඳීමෙන් ඇවැත් සිදුවන බව විනය දෙශනා වෙහි පෙණේ.

**3. ඉන්ද්‍රිය සමතා සම්පාදනතා-** ශ්‍රද්ධා- වීර්‍ය්‍ය- ස්මෘති- සමාධි- ප්‍රඥා සඞ්ඛ්‍යාත පඤ්චෙන්ද්‍රියයන් නො අඩු නොවැඩි වශයෙන් සමබවට (එක මට්ටමට) පැමිණවීම ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය ඉපැදවීමට තුන් වැනි හේතුවයි. ඉදින් ඒ යෝගාවචරයාගේ ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වේ ද වීර්‍ය්‍යාදි සෙසු ඉඳුරෝ මදවූවාහු වෙත් ද, එකල්හි විරි- යින්ද්‍රියය තමා හා එක්ව යෙදුනු අවශෙෂ ධර්මයනට අනුබල දීමෙන් උත්සාහ ගැන්විය නො හෙයි. සතින්ද්‍රියය අරමුණෙට එළඹ සිටිනාවූ හෝ අරමුණ නො හරණාවූ කිස සිදුකිරීමට අසමර්ථවෙයි. සමාධින්ද්‍රියය තමා හා එක්ව යෙදුනු චිත්ත චෛතසික ධර්මයන් විසිරීමට ඉඩ නොදී කැටි කරණ කිස කිරීමට අපොහොසත් වෙයි. ප්‍රඥෙන්ද්‍රියය තත්වූ පරිද්දෙන් ආරම්මණ සවභාවය දක්නා කෘත්‍යය කරන්නට නො හැකි වේ. එසේ බලවත් ශ්‍රද්ධෙන්ද්‍රියයෙන් මඩනා ලද හෙයින් ධර්මයන්ගේ යථා සවභාවය පස්විකීමෙන් හෝ යම් ප්‍රකාරයකින් මෙනෙහි කරන්නාහට ඒ ශ්‍රද්ධෙන්ද්‍රිය බලවත් වෙද, ඒ ප්‍රකාරය මෙනෙහි නො කිරීමෙන් හෝ ශ්‍රද්ධෙන්ද්‍රිය පිරිහෙලිය යුතුය. ශ්‍රද්ධාධිමුක්තික ශ්‍රාවකයන් අතුරෙන් අගතැන්පත් වක්කලි මහතෙරුන්ගේ කථාව මීට කදිම නිදසුනකි.

සැවැත්නුවර වැසි ත්‍රිවේදයෙහි පරතෙරට ගිය වක්කලි නම් බමුණා එක් දිනක් බික් සඟුන් පිරිවරා පිඬුසිගා වඩනා බුදුන්ගේ දෙතිස් මහා පුරිස් ලකුණු අසූ අනු ව්‍යඤ්ජනයෙන් සැදුම් ලත් ශරීර සම්පත්තිය ඇසපුරා බලා සිත්හෙත් ඇදගත නොහී සිරුරු සිරි දැකීමෙන් තෘප්තිය නැත්තේ බුදුන් සමගම හැසිරෙ යි. වෙහෙරට වඩනා කල්හිත් උන්වහන්සේ සමග වෙහෙරට ව ද ශරීර ශොභාව බලමින් ම සිට දම් සභාවෙහි වැඩහිඳ දම් දෙසන කල්හි ද උන්වහන්සේගේ හමුවෙහි සිට

බණ අසයි. ඒ වක්කලී බමුණු තෙමේ මෙසේ ශ්‍රද්ධාව ලැබ ගිහිගෙයි වසනුයේ නිරතුරුව බුදුන් දැකීම් නොලබන්නෙම් යි සිතා බුදුන් දකින රිස්සෙන් ම පැවිද්ද ඉල්ලා බුදුන් වෙතැ පැවිදි විය. එතැන් පටන් පිඩු සිඟා අවුත් බොජුන් කිස කරණ වේලාව හැරදමා බුදුන් බලමින්ම සිටී යි. මෙසේ දීර්ඝකාලයක් තිස්සේ රූසපුව දකිමින් ම හැසිරෙතුදු බුදුහු ඔහුගේ නුවණ මුහුකුරා යන තෙක් කිසිවක් නො වදුරා සිට මාර්ගඵල ප්‍රතිවෙධයට නුවණ මේරූ නියාව දැන "වක්කලිය" මාගේ මේ දෙතිස් කුණපයෙන් ගැවසීගත් සිරුර බැලීමෙන් තට කවර ප්‍රයෝජනයෙක් ද? වක්කලිය යමෙක් නුවණැසින් දහම් බලා නම් හෙතෙම මා දක්නේය, යමෙක් මා දකී නම් හෙතෙම ධර්මය ද දක්නේ ය, ධර්මය දක්නේම මා දකී. මා දක්නේ ධර්මයත් දකී' යි වදාළ සේක. බුදුන් මෙසේ අවවාද කළ කල්හිත් තෙරහු බුද්ධ දර්ශනය හැරපියා අන්තෙනකට යාගත නොහෙයි. ඉක්බිති බුදුන් වහන්සේ මේ මහණ සංවෙගය නොලැබ මාර්ගාවබෝධය නො කරන්නේය යි සිතා පෙරවස් එළැඹීම ලංවූ විට රජගහ නුවරට වැඩ වස් එළඹෙන දා "පලායව වක්කලිය පලායව වක්කලිය"යි වදාරා විහාරයෙන් නෙරපූ සේක. බුදුවරයෝ වනාහී ගතයුතු වචන ඇත්තේ ය. එහෙයින් තෙරණුවෝ බුදුන් අභිභවා සිටින්නට නො හැක්කාහු බුදුහු මා හා කතා නො කරණ සේක. මේ තෙමසෙහි උන්වහන්සේ මට දැකගත නොහෙන්නේ ය, කයින් ලංවීම නො ලබමි. එහෙයින් මාගේ ජීවිතයෙන් කම් කිම් ද? පර්වතාග්‍රයකට නැග දිවි නසා ගන්නෙමැ'යි සිතා මහත් ශොකයෙන් එතැනින් ගොස් ගිජුකුළු පව්වට නැංගාහ, බුදුරජාණන් වහන්සේ ඔහු වෙසෙන නියාව දැන, මේ මහණ මා කෙරෙන් අස්වැසිල්ලක් නො ලදහොත් මාර්ගඵලයන්ට උපනිඃශ්‍රය නසාගන්නේ ය එසේ වුවහොත් නපුරයයි සිතා තමන් දක්නට රැස්කදක් විහිදුවාළූ සේක. බුදුන් දුටු කෙණෙහි ම ඇඹුලකින් ඉගිලී යන මලකඩක් මෙන් ඔහුගේ ලෙහි ඇණී තුබූ සෝක නමැති හුල ඉදිරී ගියේ ය. ශාස්තෘන් වහන්සේ වියලීගිය වැව්කට මහවතුරක් එළවන්නාසේ වක්කලී තෙරුන්ට බලවත් ප්‍රීති ප්‍රමොද්‍යය උපදවනු වස්-

"පාමොජ්ජ බහුලො භික්ඛු- පසන්නො බුද්ධසාසනෙ
අධිගච්ඡෙ පදං සන්තං - සඞ්ඛාරූපසමං සුඛං" යි

බුදුන් කෙරෙහි ප්‍රමොද්‍යය බහුලකොට ඇති ප්‍රසන්නවූ මහණ තෙම සියලු සංස්කාරයන් සංසිඳුවන එක්වන් සුවවූ ශාන්තවූ අමාමහනිවණ ලබන්නේ ය යන අදහස ප්‍රකාශ වන ගාථාව

වදරා නැවත "මෙහි එව වක්කලිය යයි ශ්‍රී හස්තය දික්කළ සේක. එකෙණෙහි තෙරහු මා විසින් බුදුහු දක්නා ලද්දහ 'එව' යන අමා තෙපුලෙන් කැඳවීමත් ලද්දේ" යි බලවත් ප්‍රීතිය උපදවා කොයින් යම්දෝයි තමන් වැටෙන බව නොදැනම බුදුන්ට අභිමුඛවූ අහසෙහි ප්‍රීතිවේගයෙන් නැගී පළමු පාදයෙන් පර්වත යෙහි සිටියේම බුදුන් වදාළ තෙලගය විමසමින් අහස්හිම ප්‍රීතිය මැඩ පවත්වා විදසුන් වඩා සිව් පිළිසිඹියාවන් සමග රහත් බවට පැමිණ බුදුන් වඳිමින් අහසින් බැස්සාහ.

ඉදින් ඒ යෝගීහුගේ වීර්‍යෙන්ද්‍රිය බලවත්වීද, එකල ශ්‍රද්ධෙන්ද්‍රියෙ අධිමොක්ෂ කෘත්‍යය කරන්නට අසමත් වෙයි. සෙසු ඉඳුරෝද ඒ ඒ කිස කරන්නට නොහැකිවෙති. එහෙයින් පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන සම්බොජ්ඣඞ්ගයන් වැඩීමෙන් අධිකවූ වීර්‍යෙන්ද්‍රිය පිරිහෙළිය යුතුය. මෙහිලා සෝණ මහතෙරුන් ගේ කතාව දැක්විය යුත්තීය

කාලචම්පා නගරයෙහි උසභ නම් සිටාණන් ගේ පුත් සෝණ කුමාරයෝ ඉතා සියුමැලියහ. සැපයෙන් අගතැන් පැමිණියෝ ය. ඔහු සැපවින්ද අයුරු ඉතා විස්තරය. ඔහු කිසිකලෙක පා බිම නො තැබූහ. එහෙයින් පතුල්වල රෝමයෝ හටගත්හ. පසුව ඔහු බුදුන්ගේ බණ අසා පැවිදි වූහ. උන්වහන්සේ රජගහ නුවර වසනකල බොහෝ නැයෝ නිතර පැමිණෙන්නාහ. රූ සපුව පිළිබඳ වැණුම්ද කෙරෙති. ඉක්බිති සෝණ තෙරණුවෝ මෙසේ සිතූහ. මාතරා බොහෝ දෙන එත්‍රඹෙති. එසේ හෙයින් කමටහන් හෝ විදර්ශනාවෙහි බැවුම් හෝ කෙසේ කරම්ද? බුදුන් වෙතින් කමටහන් කියවාගෙණ ශීතවනයෙහි සොහොනට ගොස් මහණුවම් පුරන්නෙම් නම් ඉතා යෙහෙක. එවිට සොහොන යයි පිළිකුල්කොට බොහෝ දෙන එහි නො පැමිණෙන්නාහු යයි සිතා කමටහන්ගෙණ ශීතවනයට ගොස් මගේ සිරුර ඉතා සියුමැලිය. සැපයෙන් සැපයට යාම නො පිළිවන, ආයාසයෙන් ලබාගත් මහණකම සිරුර වෙහෙසා රැක ගැණීම වටීයයි සිතා සිටීමය සක්මන් කිරීමය යන ඉරියව් දෙක පමණක් කරමියි ඉටාගෙණ වීර්‍යය කළහ. සක්මන් කරන්නාවූ උන්වහන්සේගේ සියුමැලි පතුල්වල හාත්පස ගඩපොළ නැගී බිඳීගියේ ය. සක්මන් මළුව එකම ලෙයින් තෙම්ගිය වධක ස්ථානයක් වැනි විය. පසින් සක්මන් කිරීමට අසමත්වූ කල්හි දණගාමින් මහත් වෑයමින් සක්මන් කෙරෙති. මෙසේ මහත් වෑයමින් බොහෝ කලක් භාවනාකොටත් ආලෝක මාත්‍රයකුත් උපදවාගත නොහී

මට මේ පැවිද්දෙන් නම් කිම්දැ යි. සිවුරු හැර ගිහිගෙට පැමිණ ගිහි සැපත් විඳිමින් පිණුත් කර ගන්නෙමැ යි සිතූහ. එවිට බුදුහු සොණතෙරුන්ගේ කලකිරීම දැන එදා සවස බික් සඟුන් පිරිවරා එතැනට වැඩ ලෙයින් වැකුණු සක්මන දැක අධික වීර්‍යයෙන් වැළකිය යුතුය යි අවවාද කොට වීර්‍යයාගේ සමබැව්හි යොදනු පිණිස යළිත් තමටගන් වදුරු ගිජුකුළු පව්වට වැඩිසේක. ඉන්පසු නොබෝ දිනකින් තෙරණුවෝ රහත් ඵලයට පැමිණියහ.

මෙසේ සෙසු ඉඳුරන් අතුරෙන් ද එකකුගේ බලවත් බව ඇති කල්හි අන්‍යයන්ගේ ද සවකීය කෘත්‍යයන් කරන්නට අසමර්ථ බව දත යුතුය. විශේෂයෙන් මේ පසිඳුරන් අතුරෙන් ශ්‍රද්ධා ප්‍රඥා දෙදෙනාගේ ද සමාධි වීර්‍ය දෙදෙනාගේ ද සම බව (එකමට්ටමට පැවතීම) ප්‍රශංසා කෙරෙති. මඳ ප්‍රඥා ඇති බලවත් සැදැහැවත් තෙමේ නිර්‍ථකාදී මුග්ධයන් කෙරෙහි පහ දින්නෙක් වන්නේ ය අවසතුවෙහි පහදියි- නො පැහැදිය යුතු තැනැ පහදිමින් පින් රැස්කර ගන්නා අදහස ම පෙරදැරි කර ගෙණ නො කටයුතු දැ කෙරෙයි, නොකිය යුතු දැ කියයි නො සිතිය යුතු දැ සිතයි. බුදුන් ගේ කෙස් ලොම් නිය දත් ආදිය පවා ලෝකෝත්තර යයි සිතා ගණී.

එසේ ගැණීම බුදුන්ට කරණ ගැරහීමකි, පැසසීමක් නො වේ. මුග්ධ ප්‍රසන්නතාවය අනර්ථදායීය. මඳවූ සැදැහැ ඇති බලවත් ප්‍රඥා ඇත්තේ "චිත්තුප්පාද මත්තම්පි ඛො චුන්ද බහුකාරං වදාමි කුසලෙසු ධම්මෙසු" චිත්තොත්පාද මාත්‍රය පවා කුශල ධර්මයන්හි බොහෝ උපකාරයයි කියමි යි වදාළ දේශනාවෙහි ලේශමාත්‍රයක් ගෙණ දන්දීම් දාගැප් විහාරාදිය කිරීම් ආදියෙන් කවර ප්‍රයෝජන ද පින් කිරීමට සිතූ පමණින් ම පින් රැස්වේ යයි අති ධාවනය කොට කෛරාටික පක්ෂය භජනය කරමින් මෙරමා ද නොමඟ යවමින් කය වචනය නො වෙහෙසා වසන්නේ ය. හැමදෑම බෞද්ධ නාමයෙන් ජනසමාජයෙහි පෙනී සිටින මෙබඳු කෛරාටිකයන් සොයා ගැණීම එතරම් අසීරු කරුණක් නොවේ. මෙබඳු කෛරාටික පුද්ගලයා බෙහෙදින් හටගත් රෝගයක් මෙන් පිළියම් කළ නොහැක්කේ ය.

කරුණු මෙසේ හෙයින් උරයෙන් උරය ගැටී සිටින ශක්තිවත් දෙදෙනකු ගෙන් මේ ශ්‍රද්ධා ප්‍රඥා දෙදෙනා ගේ සම බව ඇති කල්හි ම පැහැදිය යුතු තැන පහදින්නේ ය. බලවත් සමාධිය ඇති පුද්ගල තෙමේ ද වීර්‍යය ඇති පුද්ගල තෙමේ ද වීර්‍යය වැඩී නම් සමාධිය කුසීත පක්ෂයෙහි වූ

ධර්මයක් බැවින් කුසීත භාවයෙන් මැඩ අර්පණාවට නො පැමිණේ යි. එසේ ම බලවත් වීර්යය ඇති පුද්ගල තෙමේ මඳ සමාධියෙන් යුක්ත වී නම් සමාධිය තමා උද්ධච්චයට පක්ෂ බැවින් උදගස විසින් මඩනා ලැබේ. සමාධිය වීර්යය සමග යෙදුනේ නම් අලස බැව්හි ගැලෙන්නට අවකාශ නො ලැබේ. එසේ ම වීර්යය සමාධිය සමග යෙදුනේ නම් ඖද්ධත්‍යයෙහි නො වැටෙයි. එහෙයින් වීර්ය සමාධි දෙක ද සම කටයුතු ය. ඒ දෙදෙනාගේ සම භාවයෙන් ම අර්පණාව වෙයි. සම නොවූ ලොකු කුඩා රෝද දෙකකට රිය නිසිසේ පැදවිය නො හෙන් නාක් මෙන් මේ වීර්ය සමාධිදෙක අසමව පවතින තාක් අභිමත පරිදි ක්‍රියා සිද්ධිය සම්පූර්ණ නො වේ. තවද සමාධි කර්මිකයාහට බලවත් ශ්‍රද්ධාව වටනේ ය. එසේ ඇති කල්හි අදහමින් අර්පණා සමාධියට පැමිණේ.

සමාධි ප්‍රඥාවන් අතුරෙහි වනාහි සමාධිකර්මිකයා හට බලවත් වූ එකාග්‍රතාව වටනේ ය, එසේ ඇති කල්හි හෙතෙම ලක්ෂණ ප්‍රතිවේධයට පැමිණෙයි. විදර්ශනා කර්මිකයා හට බලවත් වූ ප්‍රඥාව වටනේය. සමාධි ප්‍රඥාදෙදෙනාගේ සම බැවිනිදු අර්පණාව වන්නේම ය සිහිය වනාහී හැම ඉඳුරන් කෙරෙහිම බලපවත්වන්නීය. ඒ එසේමැයි ඖද්ධත්‍ය පක්ෂයෙහිවූ ශ්‍රද්ධා වීර්ය ප්‍රඥාවන්ගේ වශයෙන් සිත උද්ධච්චයෙහි වැටෙන්නටද කුසීත භාවයාගේ පක්ෂයෙහි වූ සමාධියගේ වශයෙන් කුසීත පක්ෂයෙහි වැටෙන්නට ද අවසර නොදී රක්නේ ය. එහෙයින් සියලු ව්‍යඤ්ජනයන්හි යෙදිය යුතු "තෙම්පරාදු කිරීම" මෙන්ද සියලු රාජකාර්යයෙහි අග්‍රසරවූ සර්වකර්මික අමාත්‍යයා මෙන්ද ඕ ස්මෘති තොමෝ හැමතන්හි කැමතිවිය යුත්තීය. එහෙයින් බුදුන් විසින් කුසල් සිත තමා සිහිය පිහිටකොට ඇත්තී ය. නොපැමිණි විශේෂාධිගමයන්ට පමුණුවන්නීය, කුසල් දහම් රක්නේය, සිහියෙන් තොරව සිතේ සංග්‍රහයවත් නිග්‍රහයවත් නොවන්නේය යි වදාරණ ලදි.

**4. දුප්පඤ්ඤ පුග්ගල දුෂ්ප්‍රාඥයන් (මෝඩයන්) භජනය පරිවජ්ජනතා, නො කොට දුරුකිරීම ධම්මවිචය සම්බොජ්ඣඞ්ගයාගේ උත්පත්තියට**

හේතු වූ සතර වැනි කාරණය යි ස්කන්ධාදි ධර්මයන්හි බැස නො ගත් නුවණ නැති අන්ධබාල පෘථග්ජනයෝ දුෂ්ප්‍රාඥයෝ වෙති. බාල අඥාන අසත්පුරුෂ දුර්මේධ දුෂ්ප්‍රාඥ යන ආදි නම්වලින් හඳුන්වන පුගුලන් ඇසුරු කිරීමෙහි දෝෂයෝ බොහෝය. එහෙසින් හැමදෙනා විසින්ම බාලයන් සේවනය නො කට යුතු යි.

**"අසෙවනාච බාලානං"** යි මඞ්ගල සූත්‍රයෙහි වදාරා තිබේ. අඥාන සෙවනය පිරිහීමට දොරටුවකි. මනුෂ්‍යයකුගේ ගුණ නුවණ ආදිය දියුණුවීමට හා පිරිහීමට ආශ්‍රය ප්‍රධාන කාරණයකි. දුදනන් ඇසුරු කිරීමෙන් පැමිණිය හැකි විනාශය නිම්හිම් රහිත ය. නෛසර්ගික (ස්වභාවයෙන් පිහිටි) ගුණධර්ම පවා වඳ කරමින් දෙලොව පිරිහීමට පමුණුවන කරුණු වලින් නරක ආශ්‍රය තරම් බලපවත්වන අනෙක් කාරණයක් නැත්තේ ය. එය **"නිහීයති පුරිසො නිහීනසෙවී"** යන දෙශනාවෙන් ද පැහැදිලි වන්නේ ය. යම් පමණ බිය උවදුරු කරදර හිරිහැර විපත් නින්දා අපහාස අලාභ හානි පැමිණෙත් නම් ඒ සියල්ල අඥානයාගෙන් මිස පණ්ඩිතයාගෙන් නො වේ. මෝඩයා කුණු මස් පිඬක්සේ ද විෂඝෝර සර්පයකු මෙන් ද ඇවිදිනා අශුචි ගොඩක් මෙන් ද සලකා බත් සහවා තුබූ කවුඩන් වැනි වූද මස් සඟවා තුබූ සුනඛයන් වැනි වූද මොහ පටලයෙන් වැසී ගිය දුෂ්ප්‍රාඥයන් දුරින් ම දුරු කළ යුතු ය.

**5. පඤ්ඤවන්ත** ප්‍රඥාවත් පුද්ගලයන් සෙවනය කරණ බව **පුග්ගල සෙවනතා.** ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ ඉපැදීමට හේතු වූ පස්වැනි කාරණය යි. **"පණ්ඩිතානඤ්ච සෙවනා"** යන්නෙන් මඞ්ගල සූත්‍රයෙහි ද සාමාන්‍යයෙන් නුවණැත්තන් සේවනය කිරීම මහදුභිවෘද්ධි කාරණයකි. **"පජානනට්ඨෙන පඤ්ඤා"** හාත්පසින් අරමුණුවල යථාස්වභාවය (නියම තත්ත්වය) දැන ගැණීම ප්‍රඥාව යි. ඕතොමෝ මොහය නසමින් සම්ප්‍රයුක්ත ධර්මයන් දීප්තිමත් කරමින් ඇතැම් කුසල් සිත් සමඟ උපදින චෛතසික ධර්මයකි. දක්ෂ වෙදෙක් රොගියාහට පථ්‍යාපථ්‍ය ආහාර දැනගන්නාක් මෙන් සෙවිතව්‍ය අසෙවිතව්‍ය හීනප්‍රණීත කෘෂ්ණ ශුක්ල සප්‍රතිභාග අප්‍රතිභාග කුශල අකුශල ධර්මයන් මනාව දැන ගන්නා හෙයින් ප්‍රඥාතොමෝ ප්‍රකර්ෂයෙන් දැනීම ලක්ෂණකොට ඇත්තී ය. යථා ස්වභාවය මුවාකරණ මොහපටලය නැසීම කෘත්‍යයකොට හෝ ගොචර ධර්මයන් බැබලවීම සම්පත්කොට ඇත්තී ය. මුළා නො වීම වැටහීම කොට ඇත්තීය. සමාධිය (සිත එකඟ කිරීම) ආසන්න කාරණය කොට ඇත්තීය. ප්‍රඥාව සත්ත්වයන් ගේ රත්න යකි. මසැසින් දක්ක නො හෙන කරුණු පැණැසින් දකින විසඳන හෙයින් ප්‍රඥාව ඇස ය. මසැස තිබුනත් පැණැස නැත්තා අන්ධයකි. තවද ප්‍රඥාව ශ්‍රේෂ්ඨ ප්‍රාසාදයක් ලෙසද වදාරා තිබේ.

"පමාදං අප්පමාදෙන—යදා නුදති පණ්ඩිතො
පඤ්ඤා පාසාද මාරුය්හ—අසොකො සොකිනිං පජං
පබ්බතට්ඨොව භුම්මට්ඨෙ—ධීරො බාලෙ අවෙක්ඛති"

යම් ප්‍රාඥයෙක් යම් කලෙක සිහියෙන් වෙන්ව නො විසීමයයි කියන ලද අප්‍රමාදයෙන් ප්‍රමාදය දුරුකෙරේ ද, ප්‍රඥා නමැති පහය පිළිබඳ දිව්‍යචක්‍ෂුරභිඥාන නමැති මහලට නැගුනු (දිවැස් ලැබූ) ශොක නැත්තාවූ ඒ ප්‍රාඥතෙමේ පර්වතයක් මුදුනෙහි සිටි පුද්ගලයෙක් බිම සිටියවුන් දක්නාක් මෙන් සසර චුති ප්‍රතිසන්ධි වශයෙන් පෙරළෙන අඥාන සත්ත්වයන් දිවැසින් දක්නේය යන අදහස ඇති මේ ගයින් ප්‍රඥා නමැති ප්‍රාසාදයට නැංග පුද්ගලයා ප්‍රාඥයා යයි වදාළ සේක. ප්‍රාසාදය වූකලි එක් මහල් දෙමහල් ආදි නො යෙක් මහලින් යුක්තවූවකි. ප්‍රඥා නමැති පහයත් එක් මහල්, දෙමහල්, තෙමහල්, සිවුමහල්, පස්මහල්, සමහල්, දසමහල්, සොළොස්මහල්, තෙසැත්තෑමහල්, සත්සැත්තෑමහල්, වශයෙන් නො එක් ප්‍රභෙද ඇත්තේ ය. ශ්‍රැතමය ඥානයයි කියන ලද ධර්මශ්‍රවණය කිරීමෙහි හා නිරවද්‍ය ශාස්ත්‍ර හැදෑරීමෙහි හා පහළ වන චිත්ත වීථිවල ජවන චිත්ත පරම්පරාව සමග යෙදෙන ප්‍රඥා චෛතසිකය ප්‍රඥා ප්‍රාසාදය පිළිබඳ පළමුවන මහල්තලය බවත් මතුමහල්තලය සර්වඥතාඥානය බවත් තේරුම් ගත යුතුයි. ප්‍රඥා ප්‍රාසාදයාගේ සියලු මහල්තල හෙවත් ප්‍රඥා ප්‍රභෙදය විස්තර කරන්න ඇරඹුව හොත් මේ ලිපිය ඉතා දික්වෙන බැවින් නො දක්වමි. ඒවා ධර්මධරයන් විචාරා දතයුතුය. යථොක්ත ප්‍රඥා ප්‍රාසාදයට නැංගාවූ පුගුලන් සෙවනය භජනය පයුරුපාසනය කිරීම ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය ලැබීමට හිසි උපායකි. එබැවින් ශ්‍රැතමය ඥානය ආදි ප්‍රඥා ප්‍රාසාදය තමන් තමන්ගේ සිත්සතන්හි ගොඩනගා ගැණීමට උපදවා ගැණීමට හැම්දෙනා විසින් ම උනන්දු විය යුතු යි. මෙහිලා අටුවාවෙහි "පඤ්ඤවන්ත පුග්ගල සෙවනතා නාම සම්පඤ්ඤස ලක්ඛණ පරිග්ගාහිකාය උදයබ්බය පඤ්ඤාය සමන්නාගත පුග්ගල සෙවනතා" යි විස්තර කර තිබේ. එහි අදහස නම් ප්‍රඥාවත් පුද්ගල සෙවනය නම් සම්පණස් අයුරකින් පස්කඳ පිළිබඳ ලක්‍ෂණ පරිග්‍රාහික ස්වභාවය දක්නා උදයව්‍යය (පඤ්චස්කන්ධයන්ගේ) ඉපැදීම හා විනාශය දක්නා නුවණින් යුත් පුගුලන් ඇසුරු කිරීම ය යනු යි. ඒ පණස් ආකාරය "අවිජ්ජා සමුදයා රූප සමුදයො, තණ්හා සමුදයා, රූප සමුදයො, කම්ම සමුදයා, රූප සමුදයො, ආහාර සමුදයා, රූප සමුදයො යනාදි දෙශනාවෙන් ප්‍රකාශිත ය. යොගාවචරයාහට සංස්කාර සම්මර්ශන ඥානය පහළ වූ කල්හි

ත්‍රෛභූමක සංස්කාරයන් කෙරෙහි උදයව්‍යය දෙක සම්බන්ධවූ මේ අයුරෙන් පවත්නේ ය හෙවත් දැනගන්නේ ය. කෙසේදයත් චතුරාර්‍ය්‍යසත්‍යයන්ගේ සත්‍යාර්ථය නො දන්නා වූ ඥානයට ප්‍රතිපක්‍ෂවූ මූලාවශයෙන් පවත්නාවූ නොකටයුතු කායදුශ්චරිතා-දිය කරණ හෙයින් ද කටයුතු කාය සුචරිතාදිය නො කරණ හෙයින් ද අවිද්‍යා නම් වූ නුනුවණගේ රැස්වීමෙන් ශීතොෂ්ණාදි හෙතුවෙන් වෙනස් බවට පෙරළෙන බිඳෙන කැඩෙන සවභාව ඇති ද්‍රව්‍ය ධාතු සමූහය වූ රූපයාගේ පහළවීම වන්නේය, කාමාදි තෘෂ්ණාවගේ රැස්වීමෙන් රූපයාගේ පහළ වීම වන්නේ ය, භවගාමි කර්මයාගේ රැස්වීමෙන් රූපයාගේ පහළවීම වන්නේ ය, කබලීකාරාදි ආහාරයාගේ රැස්වීමෙන් රූපයාගේ පහළවීම වන්නේ ය, මෙසේ ප්‍රත්‍යය පරාමර්‍ශණය කිරීම් වශයෙන් සතර ආකාරයකින් ද, ප්‍රත්‍යය පරාමර්ශනය නො කොට හුදෙක් රූපයාගේ පහළවීම් සවභාවය පමණක් බැලීමෙන් එක් අයුරකින් දැයි රූපය පිළිබඳ උදය ඥානය පස් ආකාරයකින් පහළ වන්නේය. අවිජ්ජා නිරොධා රූපනිරොධො” යන ආදීන් අවිද්‍යාවගේ නිරොධයෙන් රූපයාගේ නිරොධය (නො පැවැත් ම) වේ, තෘෂ්ණා නිරොධයෙන් රූප නිරොධය වේ, කර්‍ම නිරොධයෙන් රූප නිරොධය වේ, ආහාර නිරොධයෙන් රූප නිරොධය වේ, මෙසේ නිරොධ හෙතුවෙන් සතර ආකාරයකින් ද ලක්‍ෂණ වශයෙන් එක ආකාරයකින් දැයි රූපස්කන්ධය පිළිබඳ වූ පස් ආකාරයකින් ව්‍යයඥානය පහළ වන්නේ ය. “අවිජ්ජා නිරොධා රූප නිරොධො” යන ආදීන් අවිද්‍යාවගේ නො පැවැත්ම හෙතු කොට ගෙණ රූප නිරොධය වේ. තෘෂ්ණා නිරොධයෙන් රූප නිරොධය වේ. කර්මයාගේ නො පැවැත්මෙන් රූපයාගේ නො පැවැත්ම වේ. ආහාරයාගේ නිරොධයෙන් රූප නිරොධය වේ යයි මෙසේ නිරොධ හෙතු වශයෙන් සතරෙක ලක්‍ෂණ වශයෙන් එකෙකැයි පස් ආකාරයකින් රූපස්කන්ධය පිළිබඳ ව්‍යයඥානය පහළ වන්නේ ය. අවිද්‍යාවගේ රැස්වීමෙන් වේදනාවගේ පහළවීම වේ, තෘෂ්ණාවගේ රැස්වීමෙන් වේදනාවගේ පහළවීම වේ, කර්මයගේ රැස්වීමෙන් වේදනාවගේ පහවීම වේ, ස්පර්‍ශයගේ රැස්වීමෙන් වේදනාවගේ පහළවීම වේය යි ප්‍රත්‍ය සතරගේ වශයෙන් සතර අයුරකින් ද ලක්‍ෂණ වශයෙන් එක් අයුරකින්දැයි වේදනාස්කන්ධය පිළිබඳව පස් ආකාරයකින් උදයඥානය පහළ වන්නේ ය. අවිද්‍යානිරොධයෙන් වේදනාවගේ නිරොධය වේ, තෘෂ්ණාවගේ නො පැවැත්මෙන් වේදනාවගේ නො පැවැත්ම වේ, කර්‍ම නිරොධයෙන් වේදනා නිරොධය වේ. ස්පර්‍ශයගේ නිරොධයෙන් වේදනාවගේ නිරොධය වේය යි ප්‍රත්‍යය සතර

නිරුද්ධවීම් වශයෙන් සතර අයුරකින් ද ලක්ෂණ වශයෙන් එක් අයුරකින්ද යි වේදනාස්කන්ධය පිළිබඳව පස්අයුරකින් ව්‍යයඥානය පහළ වන්නේ ය. අවිද්‍යාවගේ රැස්වීමෙන් සංඥාවගේ පහළවීම වේ, තෘෂ්ණා සමුදයයෙන් සංඥාවගේ රැස්වීම වේ, කර්ම සමුදයයෙන් සංඥාවගේ පහළවීම වේ, ස්පර්ශය පහළවීමෙන් සංඥාවගේ පහළවීම වේය යි ප්‍රත්‍යය වශයෙන් සිවු අයුරකින් ද ලක්ෂණ වශයෙන් එක් ආකාරයකින්ද යි පස්ආකාරයකින් සංඥාස්කන්ධය පිළිබඳව උදයඥානය පහළ වන්නේය.

අවිද්‍යාවගේ නො පැවැත්මෙන් සංඥාවගේ නො පැවැත්ම වේ, තෘෂ්ණාවගේ නොපැවැත්මෙන් සංඥාවගේ නොපැවැත්මවේ, කර්ම නිරෝධයෙන් සංඥා නිරෝධය වේ, ස්පර්ශ නිරෝධයෙන් සංඥා නිරෝධය වේය යි ප්‍රත්‍යය සතර නිරුද්ධවීම් වශයෙන් සතර අයුරකින් ද ලක්ෂණ මාත්‍රය බැලීම් වශයෙන් එක් ආකාරයකින් ද යි පස් අයුරකින් සංඥාස්කන්ධය පිළිබඳව ව්‍යයඥානය පහළ වන්නේ ය. අවිද්‍යාවෙන් පුණ්‍යාභිසංස්කාර අපුණ්‍යාභිසංස්කාර ආනෙඤ්ජාභිසංස්කාර සඞ්ඛ්‍යාත කුශලාකුශල චේතනාවන්ගේ රැස්වීම වේ, තෘෂ්ණාවෙන් සංස්කාරයන්ගේ පහළවීම වේ, කර්මයෙන් සංස්කාරයන්ගේ පහළවීම වේ, ස්පර්ශ හේතුවෙන් සංස්කාරයන්ගේ පහළවීම වේය යි ප්‍රත්‍යය වශයෙන් සතර ආකාරයකින් ද ලක්ෂණ වශයෙන් එක් ආකාරයකින්ද යි පස් අයුරකින් සංස්කාරස්කන්ධය පිළිබඳව උදයඥානය පහළ වන්නේය.

අවිද්‍යා නිරෝධයෙන් සංස්කාර නිරෝධය වේ, තෘෂ්ණා නිරෝධයෙන් සංස්කාර නිරෝධය වේ, කර්ම නිරෝධයෙන් සංස්කාර නිරෝධය වේ, ස්පර්ශ නිරෝධයෙන් සංස්කාර නිරෝධය වේය යි ප්‍රත්‍යය සතර නො පැවැත්මෙන් සතර අයුරකින් ද ලක්ෂණය පමණක් බැලීමෙන් එක් අයුරකින්ද යි පස් අයුරකින් සංස්කාර ස්කන්ධය පිළිබඳ ව්‍යය ඥානය පහළ වන්නේ ය.

අවිද්‍යා හේතුවෙන් විඥානයාගේ පහළවීම වේ, තෘෂ්ණා හේතුවෙන් විඥානයාගේ පහළවීම වේ, කර්ම හේතුවෙන් විඥානයාගේ පහළවීම වේ, නාමරූපයන්ගේ හේතුවෙන් විඥානයාගේ පහළවීම වේය යි ප්‍රත්‍යය වශයෙන් සතර ආකාරයකින් ද ලක්ෂණ මාත්‍ර වශයෙන් එක් ආකාරයකින්ද යි පස් අයුරකින් විඥාන ස්කන්ධය පිළිබඳ උදය ඥානය පහළ වන්නේ ය.

අවිද්‍යාවගේ නිරෝධයෙන් විඥානයාගේ නිරෝධය වේ, තෘෂ්ණා නිරෝධයෙන් විඥාන නිරෝධය වේ, කර්ම නිරෝධයෙන් විඥාන නිරෝධය වේ, නාමරූප නිරෝධයෙන් විඥාන නිරෝධය වේය යි

ප්‍රත්‍යයන්ගේ නො පැවැත්ම බැලීම් වශයෙන් සතර අයුරකින් ද, ලක්‍ෂණ මාත්‍රය ම බැලීම් වශයෙන් එක් අයුරකින්ද යි පස් අයුරකින් විඥාන ස්කන්ධය පිළිබඳ ව්‍යය ඥානය පහළ වන්නේය.

මෙසේ එක එක ස්කන්ධයෙකැ උදය වශයෙන් පසෙක ව්‍යය වශයෙන් පසෙකැ යි පස්කඳ පිළිබඳ දශ දශ ප්‍රභෙද වූ සමපණස් ආකාරයෙන් උපදනා උදයව්‍යයානුදර්ශන ඥානය උදයව්‍යය ප්‍රඥාවය යි සැලකියයුතු මෙබඳු නැණවතුන් සේවනය කිරීම ද ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය ඉපැදීමට හෙතුව වෙයි.

**ගම්භීර ඤාණචරිය පච්චවෙක්ඛනතා.** පඤ්චස්කන්ධ, අටළොස් ධාතු, දොළොස් ආයතන, චතුරාර්‍ය්‍ය සත්‍යය, ප්‍රතීත්‍ය සමුත්පාදාදි භෙදයෙන් භින්නවූ ගැඹුරු දහම් විෂයයෙහි පවත්නා ගම්භීර ප්‍රඥාව පිළිබඳ ප්‍රභෙද ප්‍රත්‍යවෙක්‍ෂා කිරීම ගම්භීර ඤාණචරිය පච්චවෙක්ඛනතාව යි. මෙහිලා

1. "පටිලාභ පඤ්ඤා
2. වුඩ්ඪි පඤ්ඤා
3. වෙපුල්ල පඤ්ඤා
4. මහා පඤ්ඤා
5. පුථු පඤ්ඤා
6. විපුල පඤ්ඤා
7. ගම්භීර පඤ්ඤා
8. අසාමන්ත පඤ්ඤා
9. භූරි පඤ්ඤා
10. බාහුල්ල පඤ්ඤා
11. සීඝ පඤ්ඤා
12. ලහු පඤ්ඤා
13. හාස පඤ්ඤා
14. ජවන පඤ්ඤා
15. තික්ඛ පඤ්ඤා
16. නිබ්බෙධික පඤ්ඤා"

යන සොළොස් ප්‍රඥාවන්ගේ ප්‍රභෙදය දැනගත යුතු ය. සත්පුරුෂ සෙවනය, සද්ධර්ම ශ්‍රවණය, යොනිසො මනස්කාරය, ධර්මානුධර්ම ප්‍රතිපත්තිය යන කාරුණු සතරින් මේ සොළොස්, ප්‍රඥාව සැප විය යුතු බව ප්‍රකාශව තිබේ. එහි

1. සතර ආර්‍ය්‍ය මාර්ග ඥානයන්ගේ ද, සතර ආර්‍ය්‍ය ඵල ඥානයන්ගේ ද, සතර ප්‍රතිසංවිද්ඥානයන්ගේ ද, ෂඩභිඥා ඥානයන්ගේ ද, තෙසැත්තෑ ඥානයන්ගේ ද, සත්සැත්තෑ ඥානයන්ගේ ද ලැබීම ප්‍රතිලාභ ප්‍රඥා" නම් වෙයි යථොක්ත ඥානයන්ගේ ප්‍රභෙදයන්ගේ විස්තරය මෙහි කිය යුතු වුවද ලිපිය දික්වන බැවින් නො ලියමි. ඒ විභාගය දැනගනු කැමැත්තන් විසින් පටිසම්භිදාමග්ග පාළිය හා එහි අට්ඨකථාවත් නිද්දේශ ආදියත් බැලීමෙන් හා ධර්මධරයන් විචාරීමෙන් ද ඉගෙණිය යුතුයි

2. ශෛක්‍ෂ පුද්ගලයන් සත්දෙනාගේත් කල්‍යාණ පෘථග්ජනයාගේත් වැඩෙන ප්‍රඥාව හා රහතුන් ගේ වැඩුණු ප්‍රඥාව ද වෘද්ධි ප්‍රඥා" නම් වෙයි.

3. සත් වදෑරුම් ශෛක්‍ෂයන් ගේ හා කල්‍යාණ පෘථග්ජන යාගේ විපුල බවට යන්නාවූ ද රහතුන්ගේ විපුලභාවයට ගියාවූද ප්‍රඥාව "වෙපුල්ල ප්‍රඥා" නම් වෙයි.

4. මහත්වූ අර්ථයන් ද, ධර්මයන්ද, නිරුක්තීන්ද, ප්‍රතිභාන යන්ද, ශීලස්කන්ධයන් ද, සමාධිස්කන්ධයන් ද, ප්‍රඥාස්කන්ධයන්ද, විමුක්තිස්කන්ධයන් ද, විමුක්ති ඥානදර්ශනස්කන්ධයන් ද, ස්ථානාස්ථානඥානස්කන්ධයන් ද, විහාර සමාපත්තීන් ද, චතුරාර්‍ය්‍ය සත්‍යයන් ද, සතර සිව්වටන් ද, සතර සම්‍යක්ප්‍රධානයන් ද, සතර ඍද්ධිපාදයන් ද, පඤ්චෙන්ද්‍රියයන් හා දෙවිසි ඉඳුරන් ද, පඤ්ච බලයන් හා දශබලයන් ද, බොධ්‍යඞ්ගයන් ද, ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයන්ද, සතර ආර්‍ය්‍ය මාර්ගයන්ද, සතර ශ්‍රාමණ්‍ය ඵලයන් ද, ෂඩභිඥාවන් ද, පරමාර්ථ නිර්වාණය ද දන්නා විමසන නුවණ "මහාප්‍රඥා" නම් වෙයි.

5. බොහෝ නානා ප්‍රකාර ස්කන්ධ ධාතු, ආයතන ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයන් කෙරෙහි ද, බොහෝ නානාප්‍රකාර ශුන්‍යතානුපලභ්‍යමාන ධර්මයන් කෙරෙහි ද, මහා ප්‍රඥා විභාගයෙහි දක්වූ බොහෝ නානප්‍රකාර අර්ථයන් ආදිකොට පරමාර්ථ නිර්වාණය කෙළවරකොට ඇති සියල්ලෙහි ද පවත්නා දැනීම "පුථුප්‍රඥා" නම් වෙයි.

6. මහා ප්‍රඥා විභාගයෙහි දක්වෙන විපුලවූ අර්ථයන් ආදි කොට ඇති විපුලවූ පරමාර්ථ නිර්වාණය කෙළවර කොට ඇති සියල්ල දක්නා නුවණ "විපුල ප්‍රඥා" නම් වෙයි.

7. ගැඹුරු ස්කන්ධයන් කෙරෙහි පවත්නාවූ ඥානය "ගම්භීර ප්‍රඥා" නම් වෙයි.

8. පහත් ප්‍රඥාව ඇත්තන්ගේ නුවණට වඩා උසස් ප්‍රාඥයන් ගේ නුවණ දුරවූ බැවින් සමීප නොවූ ප්‍රඥාව "අසාමන්ත ප්‍රඥා" නම් වෙයි. ඒ එසේ මැයි අනිච්චානුපස්සනා දුක්ඛානුපස්සනා අනත්තානුපස්සනා සඞ්ඛ්‍යාත ත්‍රිවිධ අනුපස්සනාවන් පළමු ප්‍රාඥයන්ට වඩා ආසෙවන ප්‍රත්‍යයෙන් බලයට පැමිණිය වුන්ගේ ප්‍රඥාව වෘද්ධතර අවස්ථා ඇති බැවින් ව්‍යය ලක්‍ෂණ වශයෙන් සියලු සංස්කාරයන් දුරලීමට සමර්ථව ද ලංවිය නොහෙන්නීය. යම් පුද්ගලයකු විසින් අර්ථව්‍යවස්ථාපනයෙන් අර්ථ කථාවෙහි ප්‍රභෙද ගතවූ අර්ථ ප්‍රතිසංවිද් ඥානයද, ධර්ම ව්‍යවස්ථාපනයෙන් පාළි ධර්මයෙහි ප්‍රභෙදගතවූ ධර්ම ප්‍රතිසංවිද් ඥානයද, අර්ථධර්මයන්හි නිරුක්තීන් නිශ්චය කිරීමෙන් නිරුක්ත්‍යාභි

ලාෂයෙහි ප්‍රභෙද ගතවූ නිරුක්ති ප්‍රතිසංවිද් ඥානයද ඥාන ප්‍රභෙදයන් නිශ්චය කිරීමෙන් ඥාණවිෂයන්හි ප්‍රභෙද ගතවූ (ප්‍රතිභාන ප්‍රභෙදයන් සැලකීමට - ප්‍රකාශ කිරීමට - නිශ්චය කිරීමට සමර්ථවූ) ප්‍රතිභාන ප්‍රතිසංවිද් ඥානයද ලබන ලදද, සාක්ෂාත් කරණ ලදද, ස්පර්ශ කරණ ලදද, ප්‍රඥාවෙන් ඔහුගේ අර්ථ, ධර්ම නිරුක්ති, ප්‍රතිභාන විෂයයන්හි අනෙකෙක් ඔහු මැඩ ලන්නට අපොහොසත් වෙයි. හෙතෙම අන්‍යයන් විසින් මැඩ පැවැත්විය නොහේකියි අසාමන්‍ය ප්‍රාඥ නමැයි පැවසේ. කල්‍යාණ පෘථග්ජනයාගේ ප්‍රඥාතොමෝ සෝවාන් මාර්ගස්ථ අටවැනි පුද්ගලයාගේ ප්‍රඥාවට දූරයෙහි පවතී එහෙයින් අටවැනි පුද්ගලයාගේ ප්‍රඥාව සඳහා සෝවාන් මාර්ගස්ථ තෙමේ අසාමන්‍ය ප්‍රාඥ වේ. මෙසේ සෝවාන් මාර්ගස්ථයාගේ ප්‍රඥාව ස්‍රොතාපන්නයාගේ ප්‍රඥාවටද ස්‍රොතාපන්නයාගේ ප්‍රඥාව සකෘදාගාමිහුගේ ප්‍රඥාවටද සකෘදාගාමිහුගේ ප්‍රඥාව අනාගාමිහුගේ ප්‍රඥාවටද අනාගාමිහුගේ ප්‍රඥාව රහතුන්ගේ ප්‍රඥාවට ද රහතුන්ගේ ප්‍රඥාව පසේ බුදුන්ගේ ප්‍රඥාවටද, ඉතා දූර පවතිතියි රහතුන් සඳහා ප්‍රත්‍යෙක බුද්ධ තෙමේ අසාමන්‍ය ප්‍රාඥ වෙයි. පසේ බුදුන්ද දෙවියන් සහිත මුළුලෝකයාද සඳහා සම්මා සම්බුදු රජානන් වහන්සේ අග්‍ර අසාමන්‍ය ප්‍රාඥ වෙයි. ප්‍රභෙද ප්‍රඥ ඇත්තෝ වේ. සියලු දෙන ප්‍රශ්නයන් සකස් කොට බුදුන් වෙතැ එළඹැ ගූඪවූද, ප්‍රච්ඡන්නවූද පැන විචාරත්. බුදුන් ඒ හැම පැන විසඳනා ලද්දුහ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේම අසාමන්‍ය ප්‍රඥාවෙන් අග්‍රවේ.

9. තමාගේ සතුරුවූ වරද, රාගය, ද්වෙෂය, මෝහය ක්‍රොධය, වෛරය, මකුබව, යුගග්‍රාහය, ඊර්ෂ්‍යාව, මසුරුකම මායාව, ශඨබව, තද බව, සාරම්භය, මානය, අතිමානය, මදය, ප්‍රමාදය, සියලු කෙලෙසුන්, සියලු දුසිරිත්, සියලු කුශලාකුශල චෙතනා, සියලු භවගාමී කර්මයන් මැඩලන ඒ සාමන්‍ය ප්‍රඥාව "භූරි ප්‍රඥ" යමැයි කියනු ලැබේ. භූරි ප්‍රඥාවෙන් අභිභවනාර්ථය කියන ලදී. පෘථිවිය මෙන් පතළාවූ ප්‍රඥාව හෝ භූරි ප්‍රඥා නමි.

10. යමෙක් ප්‍රඥා ගරුක වේද ප්‍රඥා චරිත-ප්‍රඥා අධ්‍යාශය ඇත්තේ වේද ඔහුගේ එබඳු බහුල වශයෙන් පවත්නා ප්‍රඥාව "බාහුල්ල ප්‍රඥ" නම් වෙයි.

11. වහ වහා සිල්රකින, එසේම යුහු යුහුව ඉන්ද්‍රිය සංවරය ආහාරයෙහි පමණ දන්නා බව, නිදි දුරුකිරීමේ යෙදීම, ශීල-සමාධි-ප්‍රඥ-විමුක්ති-විමුක්ති ඥාන දර්ශන සකන්ධය සම්පූර්ණ කරණ වහ වහා ස්ථානාස්ථානයන් ප්‍රතිවෙධ කරණ, වහ වහා විහාර

සමාපත්තීන් පරිපූර්ණය කරණ, වහ වහා ආර්‍යය සත්‍යයන් පිළි විදින, වහ වහා සතිපට්ඨානයන්-සම්‍යග්ප්‍රධානයන්-ඍද්ධිපාද-යන්-ඉන්‍ද්‍රියයන්-බලයන්-ආර්‍යමාර්ගයන් වඩන, වහ වහා ශ්‍රාමණ්‍ය ඵලයන් සාක්ෂාත් කරණ වහ වහා අභිඥාවන් ප්‍රතිවේධය කරණ වහ වහා පරමාර්ථ නිර්වාණය සාක්ෂාත් කරණ ප්‍රඥාව "සීඝ්‍ර ප්‍රඥා" නම් වෙයි.

12. ලඝු ලඝුව සිල්පුරණ -පෙ- ලුහු ලුහුව පරමාර්ථ නිර්වාණය සාක්ෂාත් කරණ ප්‍රඥාව "ලඝු ප්‍රඥා" නම් වෙයි.

13. යමෙක් මේ ශාසනයෙහි හාසු බහුලවූ, සතුටු බහුලවූ, දුනීම බහුලවූ, ප්‍රමොද්‍යය බහුලවූ සිල් පුරද -පෙ- පරමාර්ථ නිර්වාණය සාක්ෂාත් කෙරේද ඔහුගේ ප්‍රඥාව "හාසු ප්‍රඥා" නම්වෙයි.

14. අතීත අනාගත වර්තමානිකවූ හෝ අධ්‍යාත්මිකවූ හෝ බාහිරවූ හෝ ඖදාරිකවූ හෝ සූක්ෂමවූ හෝ හීනවූ හෝ ප්‍රණීත වූ හෝ යම්කිසි රූපයක්, වේදනාවක්, සංඥාවක්, සංස්කාරයක්, විඥානයක් වේද ඒ සියළු රූපය කරා, වේදනාව කරා; සංඥාව කරා, සංස්කාරය කරා, විඥානය කරා අනිත්‍ය වශයෙන්ද දුක් වශයෙන්ද අනාත්ම වශයෙන්ද වහා දිවන ප්‍රඥාව "ජවන ප්‍රඥා" නම් වෙයි.

15 රාගාදි සියලු කෙලෙසුන් සිඳින උපන් කාම විතර්ක ව්‍යාපාද විතර්ක, විහිංසා විතර්ක උපනුපන් අකුශල ධර්මයන්, සියලු භවගාමි කර්මයන් නොඉවසන, දුරුකරණ උත්සන්නවීමට නො දෙන, අනතිමයදිම නැතිකරණ, අභාවයට පමුණුවන තියුණු නුවණ "තීක්ෂණ ප්‍රඥ" නම් වෙයි.

16. මේ ශාසනයෙහි යමෙක් සියලු සංස්කාරයන් කෙරෙහි උද්වේගය, උත්‍රාසනය, කලකිරීම, අරතිය, අනභිරතිය බහුලකොට ඇත්තේ වේද අනභිමුඛ වේද, නො ඇලේද සියලු සංස්කාර යන්ගේ විනිවිද නොගිය සුළුවූ නො පළන ලද විරූවූ ලොභ ස්කන්ධය ද්වෙෂස්කන්ධය, මොහස්කන්ධය, ක්‍රොධය, උපනාහය -පෙ- සියලු භවගාමී කර්මයන් විනිවිදීද, ප්‍රදාලනය කෙරේද? ඔහුගේ ඒ ප්‍රඥව "නිබ්බේධික ප්‍රඥා" නම් වෙයි

මේ සොලොස් ප්‍රඥාවන්ගේ ප්‍රභෙද ප්‍රත්‍යවෙක්ෂා කිරීමද ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය පහළවීමට හේතුවන්නේය. ප්‍රඥාව සම්පාදනය කරණු කැමැත්තහු විසින් යම්හෙයකින් ආලොකය බඳු ප්‍රඥාව අන්ධකාරය වැනි මොහය සමග නොපවතීද, එහෙයින් මොහකාරණයෝ දුරුකළ යුත්තාහුය.

මෝහකාරණයෝ නම්:-

වනසෙනසුතෙහි හෝ සමථ විදර්ශනාදි අධිකුශල ධර්මයෙහි නො ඇලීමය, කුසීත බවය කය හිරිහැරීමය, ආගන්තුක ආලස්‍යය ගණ සඞ්ගණිකායෙහි ඇලෙන බවය, නිතර නිදන සුළු බවය, කටයුත්තෙහි නොකැමති සුළු බවය, ඥාණයෙහි කුතුහලය නැති බවය, මිථ්‍යා මානය, නොවිචාරණ බවය, කය මනාව පරිහරණය නොකිරීමය; එකඟ නොවූ සිත් ඇති බවය, තමහට පරිභව කරගැනීමය, මිථ්‍යා කල්පනාය, විපරීතාභිනිවෙසය, කායදළ්හි බහුලතාවය, සංවෙගසිලි නොවන බවය. පඤ්චනීවරණයෝය. සැකෙවින් යම් යම් කරුණු සෙවනය කරන්නාහට නොඋපන් ප්‍රඥාව නූපදීද, උපන් ප්‍රඥාව පිරිහේද ඒ සියල්ල මෝහ කාරණ යෝය. මේ අතිශයින් මූලාවන කරුණු දුරුකරන්නාහු විසින් බහුශ්‍රැත භාවයෙහි යෙදීම කටයුතුය.

**තදධිමුත්තතා** ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය උපදවා ගණු කැමැත්තහු පිළිබඳව ඇතිවිය යුතු සත් වැනි කාරණය තදධිමුත්තතාවයි. "සිටීම් හිඳීම් ආදී සතර ඉරියව් වෙහිම මම කෙසේ නමුත් ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය උපදවා ගන්නෙමි" යන අදහස ඇතිබව හෙවත් නිරතුරුවම එයට නැමී හැරී බරව පවත්නා චිත්තවේගය- ස්ථිර අධිෂ්ඨානය යොගා- වචරයා තුළ ඇතිවිය යුතුය. මෙය වනාහි උඨාන වීර්‍ය්‍යය නොවේ. ඒ සමගම යැවිය යුතුවූ ඵලය සම්බන්ධව උපදින කත්තුකම්‍යතා කුශලච්ඡන්දය (කරණු කැමැත්තයි) මෙබඳු අධිෂ්ඨානයක් නැත්තේ නම් පටන්ගත් කාර්‍ය්‍යය අතරකදී බිඳ වැටෙන්නට හැකිය.

ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය වැඩීමට අයොග්‍ය කාලය:—

> **"සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුකාමො අස්ස සො තත්‍ථ සුක්ඛ. නිචෙව තිණානි පක්ඛිපෙය්‍ය, -පෙ- නච පංසුකෙන ඔකිරෙය්‍ය, භබ්බො නුඛො සො භික්ඛවෙ පුරිසො මහන්තං අග්ගික්ඛන්ධං නිබ්බාපෙතුන්ති නො හෙතං භන්තෙති එවමෙව ඛො භික්ඛවෙ යස්මිං සමයෙ උද්ධතං චිත්තං හොති අකාලො තස්මිං සමයෙ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය"**

**යොගාවචරයා විසින් ධර්මවිචය සම්බොජ්ඣඞ්ග නො වැඩිය යුතු කාලයක් වැඩිය යුතු කාලයත් උපමාවකින් සූක්ත කොට වදාළ මේ දේශනා පාඨයෙන් ප්‍රකාශිතය. මහණෙනි,**

යම්සේ පුරුෂයෙක් මඳ ගිනි කඳක් නිවනු කැමැති වන්නේ ද හෙතෙම එහි වියළි තණ ද වියළි ගොම වැරටි ද වියළි දර ද බහා ලන්නේ වේද ජලය නොවත් කරන්නේ ද පසින් වසාලන්නේත් නොවේද, මහණෙනි, ඒ පුරුෂතෙමේ ඒ ගින්න නිවීමට සුදුස්සෙක් වන්නේදැයි අසා වදාළ සේක. එයට භික්ෂූන් වහන්සේ 'වහන්ස එසේ ඒ ගින්න නිවාලිය නො හෙන්නේය'යි උත්තර දුන්හ. මහණෙනි, එපරිද්දෙන් ම යම් කලෙක යෝගාවචරයාගේ සිත ඖද්ධත්‍යයෙන් යුක්ත වේද (අරමුණුවල විසිර ගියේ ද) එකල්හි ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය වැඩීමට කල් නො වන්නේ යයි වදාළ සේක.

ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය වැඩිය යුතු කාලය:—

**යස්මිං ච ඛො භික්ඛවෙ සමයෙ ලීනං චිත්තං හොති, කාලො තස්මිං සමයෙ ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය"**

මේ දෙශනා පාඨයෙන් මහණෙනි, යම් කලෙක වනාහි සිත හැකුළුණේවේද අකර්මණ්‍ය වේද, එකල්හි ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය බැවීමට කල්වන්නේය'යි වදාළ සේක. මෙයින් කාලයත් අකාලයත් දැන අකාලයෙහි නො වඩා නිසි කාලයෙහි වැඩීමෙන් ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය උපදවා ගත හැකි බව සැලකිය යුතුය.

ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයට ආහාරය:—

තමාට අයත් ආහාර වශයෙන් ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ භාවනාව දතයුත්තීය වදාළේ මැනෝ;

**"අත්ථි භික්ඛවෙ කුසලා'කුසලා ධම්මා, සාවජ්ජා'නවජ්ජා ධම්මා, හීනප්පණීතා ධම්මා, කණ්හසුක්ක සප්පටිභාගා ධම්මා, තත්ථ යොනිසො මනසිකාර බහුලීකාරො, අයමාහාරො අනුප්පන්නස්ස වා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදය, උප්පන්නස්ස වා ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තති"**

සත්ත්වයන්ගේ දිවිපැවැත්මට ආහාරයක් පවතින්නාසේ ඒ ඒ ධර්මයන්ගේ ද පැවැත්මට ආහාරයක් ඇති. මහණෙනි, කුශලා'කුශල ධර්ම කොතෙක්, සාවද්‍ය අනවද්‍ය ධර්ම කොතෙක්, හීන ප්‍රණීත ධර්ම කොතෙක්, කෘෂ්ණ ශුක්ල සප්‍රතිභාග ධර්ම කොතෙක් ඇත්තාහු ද ඒ ධර්මයන්හි යොනිසො මනස්කාරය (උපාය මෙනෙහි කිරීම) බහුල කිරීමෙක් වේද නො උපන් ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ ඉපැදීම පිණිස ද උපන් ධර්මවිචය සම්බො

ධ්‍යඞ්ගයාගේ බොහෝ බව පිණිස විපුලත්වය පිණිස වැඩීම පිණිස සම්පූර්ණ වීම පිණිස මේ උපාය මනස්කාරය බහුල කිරීම ආහාරය වේය යි වදාරා තිබේ.

නිඃශ්‍රිත ධර්ම:—

**“ඉධ භික්ඛු ධම්මවිචය සම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙක නිස්සිතං විරාග නිස්සිතං නිරොධ නිස්සිතං වොස්සග්ග පරිණාමිං”**

යන්නෙන් මේ ශාසනයෙහි මහණතෙමේ විවේකය ඇසුරු කළාවූ විරාගය ඇසුරු කළාවූ නිරෝධය ඇසුරු කළාවූ වෝස්සග්ගයට නැමුණු ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය වඩාය යි වදාළ මේ දෙශනාවෙන් ධර්මවිචය සම්බොධ්‍යඞ්ග භාවනාවට නිඃශ්‍රිත ධර්මයන් දෙසූහ. එහි විවේක නම් වෙන්වීම යි. හෙද කාය, චිත්ත, උපධි, යන මොවුන්ගේ වශයෙන් තුන් ප්‍රකාරයකින් ද තදඞ්ග, විෂ්කම්භන, සමුච්ඡේද, ප්‍රතිප්‍රස්සබ්ධි, නිඃශරණ යන මොවුන්ගේ වශයෙන් පස් ප්‍රකාරයකින් ද බෙදන ලදී.

නෛෂ්ක්‍රම්‍ය අධ්‍යාශයෙන් සමූහයෙන් වෙන්ව හුදකලාව වසන්නාහට කාය විවේකය ලැබේ. පඤ්චනීවරණයන් මඩිමින් පහළවන ධ්‍යාන සමාපත්ති චිත්ත විවේකය යි. තමන් ඇසුරු කොට පහළවන්නාවූ කෙලෙසුන් සමග පැවැති සුව සොම්නසුන්ට ආධාර වන අර්ථයෙන් උපධි නම්වූ රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ සඞ්ඛ්‍යාත කාමූපධිය අපාදුකට ආධාරවූ රාගාදි කෙලශොපධිය, ජාති ආදි සසර දුකට ආධාරවූ රූප වෙදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ සඞ්ඛ්‍යාත ස්කන්ධොපධිය, පුඤ්ඤාභිසඞ්ඛාර අපුඤ්ඤාභි සඞ්ඛාර ආනෙඤ්ජාභි සඞ්ඛාර සඞ්ඛ්‍යාත අභිසංස්කාරොපධිය යන උපධි සතරින් විදර්ශනා මාර්ග භාවනා බලයෙන් වෙන්වීම උපධි විවේකය වේ. එය නිර්වාණය යි.

පහන් එළි ආදියෙන් ඒ එළිය තිබෙනතුරු අඳුරු දුරු වන්නාක් මෙන් ඒ ඒ කුශලයෙන් ඒ ඒ කුශලයන්ට පටහැණිවූ අකුශලයන්ගෙන් කෙලෙසුන්ගෙන් වෙන්වීම තදඞ්ග විවේකය යි. ධර්මවිචය යෙන් ධර්මය නො දැනීම පිළිබඳ වූ අඥාන බව තාවකාලික වශයෙන් නැසීම මෙහිලා තදඞ්ග විවේකය වේ.

ප්‍රථම ධ්‍යානාදි අෂ්ටසමාපත්තියෙන් කෙලෙස් ඔබා තැබීම යටපත් කිරීම විෂ්කම්භන විවේක නම්. සෝවාන් ආදි ආර්ය මාර්ගාවස්ථාවෙහි කෙලශයන් නැවත නූපදනා පරිද්දෙන් සහමුලින් පහකිරීම සමුච්ඡේද විවේක නම් වේ.

මාර්ගයෙන් නැසූ කෙලෙසුන්ගේ උණුසුම ඵලයට පැමිණී මෙන් පහවීම නිවීම ප්‍රතිප්‍රස්සබ්ධි විවේකය වේ.

නිවන් අරමුණු කිරීමෙන් හැම කෙලෙසුන් කෙරෙන් සිත නික්මුණේ වේ. ඒ නික්මීම නිඃසරණ විවේකය යි.

ධම්මවිචය සම්බොධ්‍යඞ්ග භාවනාවෙහි යෙදුණු යොගීතෙමේ විදර්ශනාක්ෂණයෙහි කෘත්‍යය වශයෙන් තදඞ්ග විවේකය ද, ආරම්මණ වශයෙන් නිඃසරණ විවේකය ද ඇසුරු කෙරෙයි. විදර්ශනා පාදකධ්‍යානාවස්ථාවෙහි කෘත්‍යය වශයෙන් විෂ්කම්භන විවේකය ඇසුරු කෙරෙයි. මාර්ගාවස්ථාවෙහි කෘත්‍යය වශයෙන් සමුච්ඡෙද විවේකය ද, ආරම්මණ වශයෙන් නිඃසරණ විවේකය ද ඇසුරු කෙරෙයි ඵලාවස්ථාවෙහි කෘත්‍යය වශයෙන් ප්‍රතිප්‍රස්සබ්ධි විවේකය ද අරමුණු කිරීම් වශයෙන් නිස්සරණ විවේකය ද ඇසුරු කෙරෙයි. මෙසේ ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය පඤ්චවිධ විවේකය ඇසුරු කරණ අයුරු දතයුතු.

කෙලෙසුන් සමග නො ඇලීම විරාග නම්. කෙලෙසුන් නැවත නූපදනා පරිද්දෙන් නිරුද්ධ කිරීම නිරොධ නම් වෙයි. ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය විරාගය ද නිරොධය ද ඇසුරු කරයි.

වොස්සග්ගය වූකලී පරිච්චාග වොස්සග්ගය පක්ඛන්දන වොස්සග්ගය යි දෙයාකාරය. කෙලශයන්ගේ පරිත්‍යාගය (දුරලීම) පරිත්‍යාග ව්‍යවස්සර්ග නම්. එය විදර්ශනාඥානයන් උපදනාක්ෂණයෙහි තදඞ්ග වශයෙන් ද මාර්ගක්ෂණයෙහි සමුච්ඡෙද වශයෙන් ද කෙලශ ප්‍රහානය වෙයි.

නිවන කරා යන බව ප්‍රස්කන්දන ව්‍යවස්සර්ග නම් වෙයි. පක්ඛන්දන වොස්සග්ගය එකාහි විදර්ශනාක්ෂණයෙහි ඒ නිවණට නැමුණු බැවින් ද මාර්ගක්ෂණයෙහි අරමුණු කිරීමෙන් ද නිවනට ප්‍රවෙශ වෙයි. ඒ එසේ මැයි. ධම්මවිචය සම්බොධ්‍යඞ්ග භාවනාවෙහි යෙදුනු මහණතෙමේ යථොක්ත ප්‍රකාරයෙන් කෙලෙස් පහ කෙරෙයි. නිවනට ද වැද ගණී "වොස්සග්ගපරිණාමිං" යන මේ මුළු වචනයෙන් විදසුන් සිත් පහළවණවිට කෙලෙසුන් නැසීම සඳහා පිරිණමන්නාවූ ද, මාර්ගක්ෂණයෙහි පිරිණැමූ ද, විදර්ශනාක්ෂණයෙහි මුහුකුරන්නාවූද මාර්ගක්ෂණයෙහි මුහුකළාවූ ද ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය වඩයි. නැවැත නැවත තමාගේ සිත්සතන්හි උපදවාය යි වදාරණ ලදි. එහෙයින් ධම්මවිචය සම්බොධ්‍යඞ්ග භාවනාවෙහි යෙදුණු මහණතෙම කෙලෙස් නැසීම වූ "පරිච්චාග

වොස්සග්ගය" සඳහාත් නිවනට පැමිණීම වූ පක්ඛන්දන වොස්සග්ගය" සඳහාත් මුහුකුරුවා ද යම් පරිද්දකින් මූකලේත් වේද එපරිද්දෙන් ධම්මවිචය සම්බොධ්‍යඞ්ගයවඩයි.

**ධම්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ ප්‍රභෙද:—**

මෙහි මාතෘකා පාඨයෙන් ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය අධ්‍යාත්මිකය බාහිරය යි දෙයාකාරයකින් පැණේ. එහි සිය සතන්හි පවත්නා සංස්කාරයන් අනිත්‍යාදි වශයෙන් සම්මර්ශනය කරන්නාහට උපදනා විචාරණ ප්‍රඥව අධ්‍යාත්මික ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය යි මෙරමා සතන්හි පවත්නා සංස්කාරයන් සම්මර්ශනය කරන්නාහට උපදනා විචාරණ ප්‍රඥව බාහිර ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය වේ.

ලෞකික ලොකොත්තර භෙදයෙනුදු දෙයාකාරය, යොගාවචරතෙමේ යම්කලෙක්හි සසර සයුරෙන් එතෙරව නිවන් පසක් කරගන්නා අටියෙන් පළමුකොට ශීලවිශුද්ධියෙහි පිහිටා නාම රූප ධර්මයන්ගේ අනිත්‍යාදි ස්වභාවය විචාරණ ප්‍රඥවෙන් විමසමින් විදසුන් වඩාද එකල පහළවන විදර්ශනා කුශල චිත්තයන්හි සම්ප්‍රයුක්ත වශයෙන් යෙදෙන ධම්මවිචය ය සසර පැවැත්මට හෙතු නොවී සසරින් මිදීමට ඉවහල් වන බැවින් "වටටුපනිස්සය" නම් වූ පූර්වභාග ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය ලෞකික වෙයි.

රූපාරූප ධ්‍යාන කුශල චිත්තයන් භව සම්පත්තිය පිණිස නොවැ විදර්ශනාවට පාදක කර ගැන්ම සඳහා සකස් කරණ කල්හි ඒ සමග පහළ වන ධම්මවිචය ද පූර්වභාගය යි කිය හැකි වුවද මෙහිලා ප්‍රධාන වශයෙන් විදසුන් සිත් සමග යෙදුණු ධම්මවිචයම චතුස්සත්‍යාවබොධයට බලවත් ප්‍රත්‍යය වන හෙයින් පූර්වභාගය යි අදහස් කරණ ලදි. එය නොයෙක් වර තියුණු වෙමින් නැවත නැවත නානා ක්ෂණික වශයෙන් පහළ වේ. භව සම්පත් පිණිස පවත්නා කාමාවචර කුසල් සිත්හි ප්‍රඥ චෛතසිකය පහළ වතුදු ඕ චෙතනාවගේ අභිසංස්කරණයෙන් පිළියෙල කරණ ලද්දී සංසාර ප්‍රවෘත්තිය පිණිසමුත් සසරින් මිදීම පිණිස නො පවත්නී ය. එහෙයින් චෙතනා ප්‍රධානවූ "වට්ටූපනිස්සය" වූ කුසල් සිතේ යෙදෙන ප්‍රඥ චෛතසිකය බොධ්‍යඞ්ගය යන සම්මතය නොලබයි. එසේම බඹලොව සුව විඳිනු කැමැත්තෙන් රූපාවචර කුශල චිත්තයන් සකස් කරණ කල්හිද අරූතලවල සුව විඳිනු කැමැත්තෙන් අරූපධ්‍යාන කුශල චිත්තයෙන් සකස් කරණ කල්හි ද ඒ ඒ රූපාවචර අරූපාවචර කුශල චිත්තයන්හි පහළ වන ප්‍රඥ චෛතසිකය සංසාර විමුක්තිය පිණිස නො පවත්නා හෙයින් බොධ්‍යඞ්ග නාමය නො ලබයි.

ලෝකෝත්තර කුශල චිත්තයන් සමග යෙදෙන ධර්ම විචය ලෝකෝත්තර නම්. එකි එකී ලෝකෝත්තර චිත්තයෙක මේ ප්‍රඥා චෛතසිකය කෘත්‍ය පසක් සිදුකරමින් වීමංසිද්ධිපාදය, ප්‍රඥෙන්ද්‍රිය ය, ප්‍රඥා බලය, ධර්ම විචය සම්බොධ්‍යඞ්ගය, සම්‍යග්දෘෂ්ටිය යන නම්වලින් පස් අවස්ථාවෙක යෙදේ. තනතුරු පසක් උසුලන එකම මිනිසෙක් ඒ ඒ තනතුරට අයත් කිස කරණ කල්හි ඒ ඒ නමින් ව්‍යවහාර කරන්නාක් මෙනි. ලෝකෝත්තර ධර්ම විචය සම්බොධ්‍යඞ්ගය ද මාර්ග ඵල වශයෙන් දෙයාකාර වෙයි. ශ්‍රොතාපත්ති මාර්ග චිත්තය, සකෘදාගාමි මාර්ග චිත්තය, අනාගාමි මාර්ග චිත්තය, අර්හත්මාර්ග චිත්තය යන මාර්ග සිත් සතර සමග යෙදෙන ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය මාර්ග බොධ්‍යඞ්ග නම්. එකි එකී මග සිතෙක එක එක වරම පහළ වෙයි. ඒ මාර්ග චිත්ත වීථියෙහි ම මග සිතට අනතුරුව උපදනා ඵල සිත්වල යෙදෙන ධර්ම විචය සම්බොධ්‍යඞ්ගය ඵල බොධ්‍යඞ්ග නම් වෙයි.

එහි සෝවාන් සෙදගැමි අනගැමි යන මග සිත් ඵල සිත් සයෙහිත් රහත් මග සිතේ ත් පහළ වන ධර්ම විචය සම්බොධ්‍යඞ්ගය වැඩෙන බව ද රහත් ඵල සිතෙහි පහළ වන ධර්ම විචය සම්බොධ්‍යඞ්ගය වැඩුණු බව ද දත යුතු.

**ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ උත්කෘෂ්ට භාවය.**

සප්තබොජ්ඣඞ්ගයන් හිලා සමෘති සම්බොධ්‍යඞ්ගය පළමුව දෙශනා කළ නමුත් ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයම ප්‍රධාන බව මිලිඳු රජුන් විසින් ස්වාමීනි! නාගසෙනයන් වහන්ස! කොතෙක් බොධ්‍යඞ්ගයන් වඩා බුදු වන්නේදැයි විචාල පැනයට මහරහත් නාගසේනයන් වහන්සේ "මහරජාණනි! එකම ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය වඩා බුදුවන්නේ යයි පිළිතුරු දුන්හ.

යමෙක් කඩුව කොපුවේ ලමින් අල්ලාගෙණ කැපිය යුතු දෑයක් අතින් කපාලිය නොහෙන්නාසේ ප්‍රඥාවෙන් මිස අවශෙෂ බොධ්‍යඞ්ගයකින් කෙලෙසුන් නොසිඳිය හැකි බවත් කෙලෙස් සිඳීමෙහි ලා ඡේද්‍ය ලක්ෂණ ප්‍රඥාව ප්‍රධාන බවත්, සෙසු බොජ්ඣඞ්ග සය ධර්මවිචය සම්බොධ්‍යඞ්ගයට අනුව පවත්නා බවත් සැලකිය යුතුයි.

චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ සප්තවිධ රත්නය මෙන් සද්ධර්ම චක්‍රවර්තිවූ බුදුන්ගේ සප්තවිධ රත්නය බොධ්‍යඞ්ග සඞ්ඛ්‍යාත රත්නයි. එහෙයින් බොධ්‍යඞ්ගයන් වදාළ ක්‍රමයෙන් ධර්මවිචය බොධ්‍යඞ්ගය හස්තිරත්නය වැනියයි කිවහැකි වුවද කෙලෙස් සතුරන් සිඳීමට ප්‍රධානවූ හෙයින් චක්‍රරත්නය සමාන වන්නේය.

බොජ්ඣඞ්ගයන් අනගි මිණිරුවනින් කළ මාලාවක් වැනි බව:-
"බොජ්ඣඞ්ග රතනමාලස්ස-උපඨහනති සදෙවකා
කම්මට්ඨානං කිණිත්වාන-රතනං වො පිළන්ධථ"

යන්නෙන් දක්වේ- භොජඟ නමැති රුවන් මාලාවෙන් සැරසුණු මහණ හට දෙවියන් සහිත ලොකයා නැගීසිට ගරු බුහුමන් කෙරෙති. එහෙයින් කමටහන් නමැති මිළදී ගෙණ ඒ බොජඟ නමැති රුවන් මාල පළඳිව්. යනු එහි අදහසයි ධම්විචය සම්බොධ්‍යඞ්ගය එම බොජඟ නමැති රුවන් මාලය හොබවාලන අනගි රත්නයයි.

ආනිසංස- "අච්ඡරාසඞ්ඝාත මත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු ධම්ම
විචය සම්බොජ්ඣඞ්ගං භාවෙති අයං වුච්චති භික්ඛවෙ
භික්ඛු අරිත්තජ්ඣානො විහරති සත්ථුසාසන කරො
ඔවාද පතිකරො අමොඝං රට්ඨ පිණ්ඩං භුඤ්ජති කො-
පන වාදො යෙ නං බහුලී කරොන්ති"

'මහණෙනි ඉදින් යම් භික්ෂුවක් අසුරගසන පමණකුදු ධම් විචය සම්බොධ්‍යඞ්ගය වඩාද මහණෙනි මේ මහණ තෙමේ නො සිස් ධ්‍යාන ඇත්තෙක්වූ බුදුන්ගේ අනුශාසනාව කරන් නෙක්වූ අවවාදය පිළිපැදීම කරන්නෙක්වූ වාසය කෙරේයයි කියනු ලැබේ. ඔහුට පිළිගන්වන දානය මහත්ඵල මහානිසංස වන බැවින් රහතුන් සෙයින් හිමිව ණය නොවී නොසොරක්වූ රට වැසියා විසින් ශ්‍රද්ධාවෙන් දෙන ලද පිණ්ඩ භොජනය පරිභොග කරන්නේය. යම්කෙනෙක් ඒ දම්විචය බොජඟ නැවත නැවත වඩත්නම් ඔවුන්ට ලැබෙන අනුසස් කියනුම කවරේද? යන මේ අච්ඡරාසඞ්ඝාත සූත්‍රයෙහි අනුසස්වදාරා තිබේ.

ඵලය. සැකෙවින් ලොවුතුරා බුදු බවද පසේ බුදු බවද රහත් බවද මෙහි ඵලයයි සලකා- "පඤ්ඤවා හි පුරිසො විපස්සනං වඩ්ඪෙත්වා අරියමග්ගමාරං විවරිත්වා ;අමත මහා නිබ්බාණ පාසාදං පවිසති" යි.

පැණවත් පුරුෂ තෙමේ විදශීනා භාවනා නමැති යතුරෙන් අරිමග නමැති දොර හැර අමාමහ නිවන් නැමති පහයට වදීයයි වදාළ බැවින් ආදි කම්මික කුලපුත්‍ර තෙම යම්කිසි කරුණු සතින් රැස් කිරීම ලක්ෂණ කොට ඇති බැබලීම කෘත්‍යය කොට ඇති නුමූලා බව වැටහෙන ආකාරය කොට ඇති සමාධිය ආසන්න කාරණය කොට ඇති ධම්විචය සම්බොධ්‍යඞ්ගය උපදවා ගෙණ එයම ධුරකොට අනිත්‍යාදි වශයෙන් අභිනිවෙසය පිහිටුවා අනුක්‍රමයෙන් අග්‍රඵලය ලබාගන්නේය.

එබැවින් හැම බෞද්ධයන්ම මේ ධම්විචය සම්බොධ්‍යඞ්ගය උපදවා ගෙණ බලාපොරොත්තු වෙන බොධියකින් අවෙදසිත සුඛස්වරූපවූ අමාමහ නිවන් සාක්ෂාත් කිරීමට උත්සාහ කටයුතු.

සාධු! සාධු!! සාධු!!!

නමො සම්මා සම්බුද්ධස්ස.

මොරටුමුල්ලේ ශ්‍රී සුධර්මාරාමාධිපති මොරටුවේ
සිරි ශාසනවංශ ස්ථවිරයන් වහන්සේ විසින්
පවත්වන ලද ධර්මදෙශනාව

## 3. වීර්ය සම්බොධ්‍යඞ්ගය.

**තත්ථ කතමො විරිය සම්බොජ්ඣඞ්ගො, යො චෙතසිකො විරියාරම්භො නික්කමො, පරක්කමො, උය්‍යාමො, වායාමො, උස්සාහො, උස්සොළ්හී ථාමො ධිති, අසිථිලපරක්කමතා, අනික්ඛිත්ත ඡන්දතා අනික්ඛිත්ත ධුරතා, ධුරසම්පග්ගාහො විරියං, විරියින්ද්‍රියං, විරිය බලං, සම්මාවායාමො, විරිය සම්බොජ්ඣඞ්ගො, මග්ගඞ්ගං, මග්ගපරියාපන්නං, අයං වුච්චති විරිය සම්බොජ්ඣඞ්ගො**

සාධුනි !

සිරි අරියවංස ගුණානුස්මරණ සභාව මගින් ශ්‍රී බුද්ධ වර්ෂ 2491 ක්වූ උඳුවප් මස පුර අටවක් නම් තිථිය ලත් රිවිදින (1947 දෙසැම්බර් 21 වෙනි ඉරිදා) සිට මොරටුමුල්ලේ සිරි සුධර්මාරාමස්ථ සුධර්මා නම් ධර්මශාලාවේදී පවත්වාගෙණ යන සප්තබොධ්‍යඞ්ග ධර්මදෙශනා පඞ්ක්තියේ තුන්වන ධර්මදෙශනාව අපවෙත පැවරී තිබේ. මේ දෙශනා සත ලක්දිව කීර්තිමත් පණ්ඩිතයන් ලෙස සලකනු ලබන ධර්මවිනයධර පරිවෙණාධිපතීන් වහන්සේලා හා විචිත්‍ර ධර්මකථිකයන් වහන්සේලා ලවා දෙශනා කරවා එම දෙශනායන් උන්වහන්සේලා වෙතින්ම ලියවා මුද්‍රනය කොට වටිනා ධර්මපුස්තකයක් ලෙස සකස් කිරීමට මා අදහස් කළේ ගුරුදේවයන් පිදීමට හා දුක, ඊට හේතුව, සැප, ඊට මග යන ආර්ය සත්‍ය සතර අවබොධ කිරීමෙන් ලබන නිවන් නමැති අමාරස බුදීමට සතුටු සිත්වතුන් හට මෙය භාවිතා කිරීමෙන් ලබන හැකි විපුල ප්‍රයෝජනය සලකා ගෙනයි. ඒ අපේ ශ්‍රද්ධා පූර්වක කාරුණික ආරාධනා කරුණු බහුලත්වය නොසලකා පිළිගෙණ යථාකාලයෙහි ධර්මදෙශනාදියට වැඩමවා දෙශනා

පැවැත්වීමෙන් හා එම දෙශනයන් ලියාදීමෙන්ද උපසම්පන්නවූ උතුමන්ට මේ හේතුවෙන් සිව්සස් දහම් අවබොධවීමෙන් නිවන් සැප ලැබේවායි ආසංසනාය කරමු. මෙලෙසින් බොධිපාක්ෂික ධර්ම සතිසම පලකරවීමට බලාපොරොත්තුවෙමු.

බොධ්‍යඞ්ග ධර්ම වාරගණනක් ඇසීමෙන්වත් සිත තබාගැණීම දුෂ්කරංවි. නමුත් ශ්‍රද්ධාවෙන් හා බුද්ධාලම්බන ප්‍රීතියෙන් සිත සාධාගෙණ ඇසීමෙන් හා එම ඇසූදෙය සිත දරාගෙණ, පරිදි අප විසින් පිළියෙල කරණ ලද පොතක්ද ඇසුරුකරමින් හැකි පමණක්වත් අවබෝධ කරනැණීමට හා එය භාවනා වශයෙන් වැඩීමටද සිතට ගතයුතුයි. ඉන් සසරින් මිදීමට හා නිර්වාණය ලැබීමට මග සැලසෙනු නො අනුමානයි. සසරින් මිදීම පිණිස සප්‍රයෝජනවත්වූ මෙම ගම්භීර ධර්මය සිත තබාගෙණ පිළිපැදීම කාලනොහැකි දුෂ්කර කාරියකැයි, සිත ලීනභාවයට වහල්කොට පසුබට වුනිනම් සත්‍යාවබොධයෙන් නිවන් පසක් කරගැණීම නුපුළුවන් වනබැව් සැලකිය යුතුයි මෙසේ සලකමින් නිවන් සැප සාධානැනීමේ අභිලාෂයෙන් මෙම බොදග දහම් අසා දරා පිළිපෑදීමට දැඩිවීර්‍ය්‍යාධිෂ්ඨානයක් ඇතිකරගන්නා ලෙස සිහිපත් කරවමු.

මෙතැන් සිට වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගය ඉතා සංක්ෂෙපයෙන් විස්තර කරණු ලැබේ. සකල ලොකනායක අඞ්ගිරස ශාක්‍ය මුනින්ද්‍රයන් වහන්සේ විභඞ්ගප්‍රකරණයෙහිදී වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය සවිස්තරව දෙශනාකල ආකාරය අපි මුලදී මාතෘකා පාඨය වශයෙන් ප්‍රකාශ කොළෙමු. එම දෙශනා පාඨය ඉතා කෙටියෙන් තේරුම් ගැනීමට පහසු පරිද්දෙන් පදයක් පාසා අදහස් පවසමු.

**තත්ථ කතමො විරිය සම්බොජ්ඣඞ්ගො!** ඒ සප්තබොධ්‍යඞ්ග අතුරෙන් වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය කවරේද? මෙහි විරිය-සං-බොධි-අඞ්ග-යයි කියා වචන සතරකි. ඉන් විරිය-යන වචනයේ අදහස මෙසේයි. වීරස්ස භාවො විරියං, වීරයාගේ ස්වභාව විරිය නම් විධාණං වා කම්මතනි විරියං; වීරපුරුෂයා කරණු ලබන කර්මයට හෝ විරියයයි කියනු ලැබේ. වීරයාගේ විධිය, වීරයාගේ ගතිය, වීරයාගේ ක්‍රියාව යන අදහස්වලට විරියයයි ව්‍යවහාර කරත හැකියි. විධිවූ පරිදි උපාය ක්‍රමයෙන් සිය අදහස් සම්පාදනය කරගැණීම වීර්‍ය්‍යයයි- සං, සුන්දරය, යහපත්ය, ප්‍රශස්තය විශිෂ්ටය, යන අදහස් ප්‍රකාශනරයි- බොධි, මේ වචනය ඉතා විස්තරවේ බොධි ශබ්දය- රුක්ඛ- මග්ග- නිබ්බාණ ආදී නොයෙක් අදහස් වල යෙදේ. බොධිරුක්ඛො, ති තත්ථ බෝධි

යන වචනය ශසතට බව හැගේ. බොධිවුච්චති චතූසු මග්ගෙසු ඤාණං, කී තැන, සතර මග නුවනට බොධි ශබ්දය ව්‍යවහාර කරනු ලැබේ. පත්වාන බොධිං · කී තැන නිවනට බොධියයි ප්‍රකාශවේ. පප්පොති බොධිං වරභූරි මෙධසො– කී තැන බොධි ශබ්දය, සර්වඥතාඥානයට ව්‍යවහාරවේ. පැනවීමේදී හෝ ඇතැම් මෙහිදී බොධිශබ්දය ව්‍යවහාරවන්නේ– අරියසාවකො බොධි තිවුච්චති, යනාදි තැන්වලදීයි.

මේ ආදී නොයෙක් අර්ථ ගෙන දෙන බෝධි ශබ්දය බොජ්ඣ-ඞ්ග කී තැනදී යෙදෙන්නේ අදහස් දෙකක පමණයි. එනම්- සතර ආර්‍ය්‍ය සත්‍ය ධර්මය අවබොධ කරගැණීමට බොධ්‍යඞ්ග සත උපාය මාර්ගය වන අදහසින්ද– චතුරාර්‍ය්‍යසත්‍යය අවබොධ කරණ යොගාවචරයාට බොධියයි කියන අදහසින්ද යන දෙයාකාර යෙහිදී බොජ්ඣඞ්ගයයි කී තැන බොධි යන නම ව්‍යවහාරවේ. මීලඟට තේරුන් ගත යුත්තේ අඞ්ග, යන වචනයයි එය ඉතාම ලෙහෙසියෙන් තේරුන්ගත හැකියි. සේනාවක අවයව වලට සේනාඞ්ගයයිද, රථයක අවයව වලට රථඞ්ගයයිද කියනු ලබන් නාසේ බොධියගේ අවයවවූ– සති-ධම්මවිචය-විරිය-පීති-පස්සද්ධි-සමාධි-උපෙක්ඛා යන සතට බොජ්ඣඞ්ගයයි කියනු ලැබේ. මෙහිදී අඞ්ග යන වචනය අවයවය යන අර්ථය දවසයි මේලෙසි විරිය-සං-බොධි-අඞ්ග යන පද සතර තේරුන් ගත යුතුයි.

සිත සුදුසු තැනදී සුදුසු සේ ක්‍රියා නොකිරීම යයි කියන ලද ලීනයද හෙවත් මැලිකමද– සිත සාන්ත ගතියෙන් තුරන්වූ කලබල ස්වභාවය නොසන්සුන් බවයයි හඳුන්වන උද්ධච්චයද– රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍යයන් ගොචර කරගත් චක්ෂු-ශ්‍රොත-ඝ්‍රාන-ජිහ්වා–කාය යන ආයතනයන් පුරුදු ප්‍රමාද භාව යෙන් විසීමද නැතිනම් සිඛිලා සිටීමද– අළුත් අළුත් භවයන් පතමින් පැනයන ආයූහනයද හෙවත් විනව සඞ්ඛ්‍යාත නිර්වාණ මාර්ගයට බැසගැණීම සඳහා අවශ්‍ය අනිත්‍ය- දුඃඛ- අනාත්මාදී සංවේග සිතිවිලිවල නොගැටී අභිසංස්කරණය කිරීමට සැසදෙන ආයූහනයද–පැතයාමද– පස්කම්සැපයෙහි යෙදී බැඳී ලැගීමද තමාහට දුක්දීමේ අභිනත්තිය සත්‍යලෙස ගැණීමද, උච්ඡෙද ශාස්වත යන දෙසැට ප්‍රභෙද ගත උභය දෘෂ්ටියද යන මේ භව දුක් මෝරවන හෙවත් භවදුක් සාධාදෙන උවදුරුවලට ප්‍රතිවිරුද්ධ වූ ලෞකික මාර්ග ක්ෂණයෙහි හා ලොකොත්තර මාර්ග ක්ෂණයෙහි උපදනා සති ආදී සප්ත බොධ්‍යඞ්ගයයි කියනලද මේ ධර්ම සමුදායක් කාරණකොට ගෙණ චතුසසත්‍යය අවබොධ කර ගණිද, ඒ ධර්ම සමූහය බොධියයි කියනු ලැබේ.

මෙලෙසින් බෝධි යන අකුරු දෙකේ අදහස පිරිසිදුව දැන ගත් කල්හි සසර දුකින් මිදීමට නැඟී සිටි වීර්‍යය ඇති යෝගාවචර තෙම සුන්දරවූ ඒ බෝධිය ලබාගැණීමට සදුපාය සොයයි.

එහිදී- සත්තබොජ්ඣඞ්ග භාවෙත්වා අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුජ්ඣති- ආදී දේශනා ක්‍රම සලකා බෝධිය ලබාගැණීමට අවශ්‍ය කාරුණු සතක්ය. එම සප්තබොධ්‍යඞ්ගය වඩා නිරන්තරවූ සම්‍යක් සම්බොධියට මහාසේ පැමුණුනේය යන බුදු වදන් අසා දැන, ඒ සති- ධම්මවිචය- විරිය- පීති- පස්සද්ධි- සමාධි- උපෙක්ඛා යන සත් ආකාරය භාවනා වශයෙන් වැඩීමට නැවත නැවත වැඩීමට උත්සාහවත් වෙයි එසේවූ උත්සාහ ඇති යොගාවචරයා හට බෝධිය ප්‍රත්‍යක්ෂවේ. නිර්වාණාවබොධය වේ. මෙතැනට- තත්ථ කතමො විරිය සම්බොජ්ඣඞ්ගො- යන්නට අදහස් දී අවසානයැ.

යො චෙතසිකො විරියාරම්භො- යන්න විසඳමු! යම් චෛතසික වීර්‍යාරම්භයක් වේද- මෙහිදී චෛතසික වීර්‍යාරම්භයයි. කිතල කායික වීර්‍යාරම්භය නොවෙද්, නොකිය වේ- වීර්‍යය චෛතසිකයක් බව හැගේ. හෙවත් වීර්‍යය සිත්විල්ලක් බව හැගේ. එසේ නම් වීර්‍ය සම්බොධ්‍යඞ්ගයයි කියනු ලබන්නේ සිතෙහි වීර්‍ය මූල්කාරනෙණ උපදින සිතිවිල්ලටයි. මේ වීර්‍ය චෛතසිකය සෑම සිතිවිලිවලටම අනුබල දෙමින් ක්‍රියා කරත්. ඊට සමාන වචන රැසක්ම තිබේ. ඉන් එකක් පාසා මෙසේයි.

**නික්කමො.** මේ වීර්‍ය සිතිවිල්ලට නමකි. කුසිතභාවයෙන් නික්මීම් වශයෙන් හෝ මැලිකම ඉක්මවන අදහසින් වීර්‍යයට නික්කමයයි නම් වේ.

**පරක්කමො.** වීර්‍ය පිළිබඳ සතරාකාරය එකක් ඉක්මවීමෙන් අනික් තැනක් උසස්ලෙස ගැණීමෙන් බලවත් උත්සාහයක් දරත්නම් එම වීර්‍යයට පරක්කම යයි නම්වේ තවද කල්‍යාණ පෘථග්ජනයාගේ සිත්සතන්හී භවයක් පාසා නො හැර ගෙණ ආ නිරතුරුවම උපදින ඇසිල්ලක් පාසා අළුත්වන නොදිරණ කෙලෙස් බැම් සිඳ බිඳ ලෑමේ වීර්‍යයටද පරක්කම යයි නම්වේ.

**උය්‍යාමො.** රථයකට නැගී සිඟුව යන්නාසේ නැගී සිට ධාවන වීර්‍යයට හෝ කෙලෙස් සැඩපහරින් ගසාගෙන යෑමට නොදී එම සැඩපහර කපාලමින් සසර සයුරින් එතරවීම සඳහා පවත්නා වීර්‍යයට උය්‍යාමයයි නම් වේ.

**වායාමො.** වායමෙනෙන සබ්බදුක්ඛං අමෙචනති ති- වෑයමින් සියලු දුක් මඩින හැකි යයි කී අයුරු, සියලු දුක් පෑගීමේ මැඩීමේ වීර්‍ය්‍යයට හෝ සීඝ්‍රයෙන් පසුබස්වන සතුරු මූලක් (සතුරු සෙනගක්) පන්නා යනාතර පසෙකින් පැමිණි විශෙෂ සතුරන් සමූහයකට මූහුණපාන්නට වීමේදී නො පසුබට වික්‍රමාන්විත සෙබළෙකුට ඇති වීර්‍ය්‍යයුතු දෘඪචිත්තධෛර්‍ය්‍යී යසේ කෙලෙස් රුපුන් මැඩීමෙහි වීර්‍ය්‍යයෙන් සසරට බැසගත් යොගාවචරයාහට නොයෙක් දෙසින් පැමිණෙන බලාපොරොත්තු රහිත කෙලෙස් සතුරන් වැනසීමේ වීර්‍ය්‍යයට ව්‍යායාමයයි නම් වේ.

**උස්සාහො.** පැමිණි භාරය බැරිවූවද ඉසිලීමේ උනන්දුවෙන් ඔසවා පයනගා යන්නෙකු සේ කෙලෙසුන් මැඩීමේදුෂ්කර සංසාරභාරය බැරිමුද උසුලා ඉවත ලෑමේ අභිලාෂයෙන් පෙරටුවම ගමන්ගත් වීර්‍ය්‍යයට උස්සාහයයි නම් වේ.

**උස්සොළ්හී** දුකිම දුක් විඳ දරාගෙණ නොමගට නොබැස අභිමතාර්ථය සඵලවනතෙක් ඉවසීමෙන් වීර්‍ය්‍ය කිරීමට උස්සොළ්හියයි නම් වේ.

**ථාමො.** ශිලාස්ථම්භයක්මෙන් ස්ථිරව පැවැත්ම හා නිසෙසකී භාවය පෙන්වමින් කෙලෙසුන් මැඩීමේ ප්‍රොත්සාහී වූ වීර්‍ය්‍යයට ථාම යයි නම්වේ.

**ධිති.** පටන් ගත් වීර්‍ය්‍යයෙන් සඵලවූ කුසල් සහගත සිත් සහ සිතිවිලි නොසිඳ නොනබා වැඩීමට හෙත| යන අර්ථයෙන් හෝ නොනසා පවත්වන අර්ථයෙන් වීර්‍ය්‍යයට ධිති යයි නම් වේ.

**අසිථිල පරක්කමතා** කිසිද ක්‍රමයක සිථිලත්වයක් බුරුල් බවක් සැහැල්ලු බවක් නොමැති ස්ථිර දෘඪ වීර්‍ය්‍යයට අසිථිල පරක්කම තාවයයි නම් වේ. එය මෙසේ විස්තර වේ.

**කාමං තචොච නහාරුච අට්ඨිච අවසුස්සතු**
**උපසුස්සතු මෙනතෙන සබ්බනතං මංසලොහිතං**

යනුවෙන්- ඒකාන්තයෙන් මගේ සිරුරේ සම නහර සහ ඇට ඉතිරිවේවා සියලුම මස් ලේ වියලී සිඳීයේවා එනමුත් මාගත් වීර්‍ය්‍යාධිෂ්ඨානය නොබිඳේවායි වීර්‍ය්‍ය කරත්නම් එම වීර්‍ය්‍යයට අසිථිලපරක්කමතාවයයි නම් වේ.

**අනික්ඛිත්තඡන්දතා.** කුසල් වැඩීමේදි හා අකුසල් මැඩීමේදී වඩන්නටම ඕනෑය, මඩින්නටම ඕනෑයයි, යම්කිසි කත්තුකම්‍යතාවඡන්දයක් වේ නම් එම වීර්‍ය්‍යයට අනික්ඛිත්තඡන්දතාවයයි නම් වේ.

**අනික්ඛිත්ත ධුරතා.** සත්‍යාවබෝධය වනතුරු පටන්ගත් වීර්‍ය්‍ය භාරය බහා නොතබමියි යන ඉසිලීමක් දැරීමක් වේ නම් එම වීර්‍ය්‍යයට අනික්ඛිත්තධුරතායයි නම් වේ

**ධුරසම්පග්ගාහො.** පටන්ගත් කුසල සිත් භාරය බිඳකුදු සිඳ බිඳ ලැමව් හෝ පසුබැසීමට ඉඩ නොදී ඉසුලූ ධුරය මොනවට ගෙන යෑමෙ වීර්‍ය්‍යයට ධුරසම්පග්ගහයයි නම් වේ.

**විරියින්ද්‍රියං-** ප්‍රකෂීයෙන් ගැනීම ලක්ෂණකොට ඇති හෙවත් විශෙෂ උත්සාහවත් වීර්‍ය්‍යග්‍රහනයෙහිදී අධිපති භාවය කරණ වීර්‍ය්‍යයට විරියින්ද්‍රියයි නම් වේ

**විරියබලං-** කයේ කුවිලත්වය, සිතේ අලසබව බිඳකුදු වැද නොදී බලගන්වන නො සැලෙන වීර්‍ය්‍යයට විරියබලංයි නම්වේ.

**සම්මාවායාමො.** නිවන් දොර හැරගැණීමේ සම්‍යක් ව්‍යායාමය හෙවත් තමා සතුව තුබූ අකුසල් සහමුලින් නැතිකිරීමටත්, නොසිදුවූ අකුසල් වැද්දනොදීමටත්, සිදුනොවූ කුසල් වැඩීමටත්, සිදුවූ කුසල් දියුණු තියුණු කිරීමටත් කය, සිත, වචනය වෙහෙසත් නම් හෝ ශීල භාවනාදී ධර්‍මයන් ඔස්සේ ගමන්කර මාර්‍ගඵල රසවිඳ නිවන් පුරයට පැමිණීම දක්වා නොනැසෙනසුළු ව්‍යායාමයක් වේ නම් එම වීර්‍ය්‍යයට සම්‍යක් ව්‍යායාමය යයි නම් වේ

**මග්ගඞ්ගං-** සියලු කෙලෙසුන් උපුටා හැර මාර්‍ගඵලාවබෝධයෙහිදී ආධිපත්‍යය උසුලන වීර්‍ය්‍ය චෛතසිකය සාත්පසින්ම මාර්‍ගයට අවයව වේනුයි. වීර්‍ය්‍යයට මග්ගඞ්ගයයි නම් වේ.

**මග්ගපරියාපන්නං-** ආර්‍ය්‍ය මාර්‍ගයට (බැසගත්) පිළිපන් යොගාවචරයාහට අවශ්‍යම ඇතුළත්ම කාරණයක්ය යන අදහසින් වීර්‍ය්‍යයට මග්ගපරියාපන්නයයි නම්වේ.

මේ ආදී නොයෙකුත් ආකාර අර්‍ථ ගෙණ දෙන හෙයින් වීර්‍ය්‍ය නම් වනබව සැලකිය යුතුයි. මෙතෙක් වචනවලින් වීර්‍ය්‍ය තේරුම් කරදුන් බැවින්- සතර ආර්‍ය්‍ය සත්‍ය ධර්‍මයන් අවබෝධ කරනැණීමට වීර්‍ය්‍ය නැතිනම් වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය අතිශයෝපකාරී බැව් සලකා වීර්‍ය්‍යවැඩීමේ උත්සාහය ඇතිකරගත යුතුයි.

මෙතැන් පටන් වීර්‍ය්‍ය පිළිබඳව ලක්ඛණ, රස පච්චුපට්ඨාන, පදට්ඨාන යන සතරාකාරය දක්වනු ලැබේ. බුද්ධභාෂිත සෑම බණපදයකම ඇති මේ සතරාකාරය, මනාව ධර්මාවබොධය කිරීමට සතුටු පින්වතුන් හොඳින් සිහි නුවණින් සොයා තේරුම් ගත යුත්තකි. අමාරුවෙන් නමුත් මෙය අවබෝධ කරගැනීමෙන් අධික ප්‍රීතියක්ද ධර්මය පිළිබඳව පිරිසිදු දැනීමක්ද ඇතිවී සත්‍යාව බොධයටද මග් සැලසේ.

**ලක්ඛණ**— වීර්‍ය්‍යයේ ලක්ඛණය-ලක්ෂණය කියන්නේ-ආකාරය-විධිය හැඩහුරුකමය යන අර්ථයි. එසේනම් වීර්‍ය්‍යයේ-හැඩහුරුකම-කුසීත භාවයට වැටෙන්ට නොදී පැමිණෙන්ට ඉඩ නැර කය, සිත රැක ගැනීමයි. උපමා වශයෙන් මෙසේ කල්පනා කරගත යුතුය. මිහිරි අඹ ඵල බරවූ රුකක් ඇලවී වැටෙන්ට යනකල ඊට බල ඇති කරුවක් දීමෙන් අනුබලදී එම ගස රැකගෙණ ඵල රස විඳිද, එමෙන්ම, නිර්වාණ රසය විඳීමේ ආසාවෙන් ධ්‍යාන විදර්ශනා භාවනාදී ඵල රැක සාධාගත් යොගාවචරයා විසින්, කය සිත දෙකේ ලීනභාවය යි කියන ලද අලසකමින් ධ්‍යානාදිය වැටී යන බැව් දැක නැගී සිටි වීර්‍ය්‍ය නමැති බලකනුවක් තබා මාර්ගඵලාවබොධකර ගනිමින් නිර්වාන රසය විඳිද, එබඳු බලගැන්වීමක්, නැගිටුවාලීමක් වෙයි නම් එය වීර්‍ය්‍යයේ ලක්ෂණයයි—මේ ලක්ෂණය ආකාර දෙකකි උපසත්ථම්භක ලක්ෂණය, පග්ගහණ ලක්ෂණය යනුවෙනි-වීර්‍ය්‍යයට ආධාරදී රුකුල්දී උත්සාහවත් කරලීම, උපසත්ථම්භක ලක්ෂණයයි. වීර්‍ය්‍ය පිළිබඳ මැලිවීම් ආදී දුර්වල ස්ථාන දැක පෙර පසු නොවී එය ගෙණ ක්‍රියා කිරීම පග්ගහණ ලක්ෂණයයි-මේ වීර්‍ය්‍යයේ දෙආකාර ලක්ෂණයයි.

**රස**— රසය නම් කෘත්‍යය ය කටයුත්තයි-වීර්‍ය්‍යයේ රසය හෙවත් කෘත්‍යය කුමක්ද කම්මැලිව-දුර්වලව-අමාරුය-බැරිය-සිතමින් පසුබට වන සිය දහස් ගණන් සිතිවිලි පාගා මැඩ ඉදිරි ඉදිරියෙහි ම ක්‍රියා කරවා අළුත් කරවීම වීර්‍ය්‍යයේ රසයයි, කෘත්‍යයයි.

**පච්චුපට්ඨාන**— පච්චුපට්ඨානය නම්, වැටහෙන කාරණයයි, වීර්‍ය්‍ය පිළිබඳ ආසන්න කාරණයයි ද කිවහැකියි-එනම්, බැරිකම්-මැලිකම්-සහමුලින් සිඳලමින් සිතාගත් කාරණය ඒ හැටියටම මනානායට පැමිණීය යන ස්ථිරව වැටහෙන් නම්; ගේ වීර්‍ය්‍ය පිළිබඳව පච්චුපට්ඨානයයි-හෙවත් ආසන්න කාරණයයි-නැත්නම් වීර්‍ය්‍යයේ ඵලයයි—

පදට්ඨානය නම් හේතුවයි-වීර්‍ය්‍යයට හේතුව මූලකාරණයවන්නේ සංවේගයයි-සසර නිසරු බව හැගීමෙන් යමකිසි යෝගාවචරයෙකුට සංවේගයක්-කලකිරීමක් ඇතිවුනි නම් වීර්‍ය්‍ය කිරීමට එය හේතුවන බැවින්, සංවේගය වීර්‍ය්‍යයට හේතුවයි-පදස්ථානයයි-මෙසේ මේ ලක්ෂණාදී සතරාකාරය වීර්‍ය්‍ය පිළිබඳව තේරුන් ගත යුතුයි-මෙලෙසින් වීර්‍ය්‍යය තේරුන්ගත් වීර්‍ය්‍යවන්ත යාගට තමා බලාපොරොත්තු වන දගයක් කටයුතු මස්තකයට පමුණුවා ගණිමින් සැපවත් උසස් ජීවිතයක් ගතකිරීමටත් උසස්සේ සිතන සියලු තනතුරක්ම ලබා ගැණීමටත් දෙලොව සියලු සමපත් සාධාගැණීමටත් අවසානයෙහිදී ශාන්ත සුඛ අමාමහ නිවන් සිරි විඳීමටත් හැකිවේ. මෙම වීර්‍ය්‍යය කොටස් කිරීමේදී,

විරියං ච නං අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය ආරම්භනං විරියාරම්භො-සොයං-කායිකො චෙතසිකොචාති දුවිධො, ආරම්භධාතු, නික්කම ධාතු, පරක්කම ධාතූති තිවිධො-සම්මප්පධානවසෙන චතුබ්බිධො—

යනුවෙන් වීර්‍ය්‍යයේ භෙද විස්තරවේ-වීර්‍ය්‍ය නම් අකුසල ධර්ම යන්ගේ ප්‍රහානය පිණිසත්, නැති කිරීම පිණිසත්, කුසල ධර්ම යන්ගේ වැඩීම පිණිසත් රැස්කිරීම පිණිසත්, ආරම්භ කිරීමයි, පටන්ගැන්මයි-එම වීර්‍ය්‍යය-කයින් කරණ වීර්‍ය්‍යය-සිතින් කරණ වීර්‍ය්‍යයයි දෙආකාරයකට ද-ආරම්භ ධාතු-නික්කම ධාතු-පරක්කම ධාතුයයි තුන් ආකාරයකටද-සතරාකාර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍ය වශයෙන් සතරාකාරයකට ද වෙන් වෙන් කොට දක්වා තිබේ-ගේ මෙසේයි-දෙආකාර වීර්‍ය්‍ය නම්-

කායික වීර්‍ය්‍යය—නිර්වාණ සැප බලාපොරොත්තුවූ යෝගාව-චරයා තමා වෙහෙසා වීර්‍ය්‍ය වඩනුයේ, සක්මන් කිරීම අපහසුවූවිට, පලක්බැද හිඳගෙන ද, එය අපහසුවිට සිටගෙණ ද, ආදී ක්‍රමයෙන් ඉරියව් වෙනස් කරමින් වීර්‍ය්‍ය වඩාද-එය කායික වීර්‍ය්‍යයයි-මෙහිදී සැලකියයුතු කරුණකි—චෙතසිකො විරියා රම්භො-යයි මුලදී කියන ලදී-ඉන් කායික වීර්‍ය්‍යය නොයෙදේ. එනිසා කායික වීර්‍ය්‍යය මෙහිදී කිව යුතු නොවේයයි, සිතන්ට ඉඩ තිබෙ නමුත්. යාම ඒම ආදී ඉරියව් පැවැත්වීමෙන් වීර්‍ය්‍ය වැඩීම නිසා කායික වීර්‍ය්‍යයයි කිවත්, එම ඉරියව් පැවැත්ම හෝ නැවත්ම සිදුවන්නේ සිත ප්‍රධාන කරගෙණ බැවින් ව්‍යවහාරයට අනුව කායික වීර්‍ය්‍යයයි කිවත් සිතිවිල්ම අධිපති භාවය උසුලන බැව් දතයුතුයි—

**චෛතසික වීර්‍ය්‍ය**— සුරතින් අමෝරාගත් අසිපත් ඇත්තේ, තා මරමියි කපමියි යන බිහිසුනු බස් කියන වධකයෙකු ඉදිරියටවන් දුබලයෙකුට සිතතුල ඇතිවන මරණ භීතියගේ සසර බිය දූත භාවනානුයෝගී වූ යෝගාවචරයෙක් මා සිත කෙලෙසුන් කෙරෙන් මිදෙනාතුරු සත්‍යාවබොධය වනතුරු මේවනලැහැබින්-මේ රුක්මුලින්-මේ සූන්‍ය ගෙයින් නොනැගිටිමියි, නොම නික්මී යෙමියි, උග්‍රැබඩාසනගතව අධිෂ්ඨාන කරගත් සිත් ඇත්තේ වීර්‍ය්‍ය වඩාද, එම වීර්‍ය්‍යයට චෛතසික වීර්‍ය්‍යයයි කියනු ලැබේ—මෙසේ වීර්‍ය්‍ය දෙආකාරයෙකි.

**ආරම්භධාතු**—වීර්‍ය්‍යාරම්භයට පටන්ගැන්ම සංස්කාරයන් පිළිබඳව කලකිරුනු සිතින් කාමාදී ආසාවන් දුරලීමට දරණ වීර්‍ය්‍ය ආරම්භ ධාතුයයි ද, ආදිකරනං ආරම්භො යයි කී හෙයින් ප්‍රථමාරම්භ වීර්‍ය්‍ය-ආරම්භ ධාතුනමැයි දතයුතුයි—

**නික්කම ධාතු**— අයොනිසො මනසිකාර හේතුවෙන්-නුවනින් සලකා නො බැලීමෙන් කය සිත කුසීත භාවයට පත්වන අවස්ථාවන්හිදී, ඊට ඉඩනොදී වඩා බලවත් වීර්‍ය්‍යයකින් පටන්ගැන්මක් නුවනින් සැලකීමක් වේත් ද, එලෙසින් කෙලෙස් ගැට සිඳලීමේ අධික වෑයමට-නික්කම ධාතුයයි නම් වන බව දතයුතුයි.

**පරක්කම ධාතු**— වඩාම බලවත් වූ පරාක්‍රමයෙන් යුක්තවූ වීර්‍ය්‍ය නොහොත් කෙලෙස් බැමි පුපුරවා සිඳබිඳලමින් දරණ වීර්‍ය්‍ය පරක්කම ධාතු නමැයිද දතයුතුයි. මේ තුන් ආකාර වීර්‍ය්‍යයම අධික මාත්‍රා වීර්‍ය්‍යයයි පෙන්වා තිබේ—මෙලෙසින් වීර්‍ය්‍ය පිළිබඳ තුන් ආකාර භේදය දතයුතුයි—

**සතරාකාර වීර්‍ය්‍ය නම්-**

1 තමහට සිදුනොවූ අකුසල් වලින් වෙන්වී සිටීමට වෑයම් කිරීම,
2 සිදුවූ අකුසල් මැඩීමට-නැතිකිරීමට වෑයම් කිරීම,
3 සිදුනොවූ කුසල් වැඩිදියුණු කරගැණීමට වෑයම් කිරීම,
4 සිදුවූ කුසල් විපුල භාවයට සම්පූර්ණවා ගැණීමට වෑයම කිරීම

**යන සතරාකාර වීර්‍ය්‍ය තේරුන් ගතයුතුයි-කෘත්‍ය වශයෙන් සතරක් වූ මේ එකම වීර්‍ය්‍ය පධාන වසයෙන් අන් සතරාකාරය නාම ද බෙදා විස්තර කර තිබේ—ගේ මෙසේයි.**

**චත්තාරි මානි භික්ඛවෙ පධානා!! කතමානි චත්තාරි? සංවරප්පධානං- පහානප්පධානං- භාවනප්පධානං-අනුරක්ඛනප්පධානං-යනුවෙන්**

මහණෙනි මේ ප්‍රධන් වීර්‍ය්‍යයී සතරකි! ඒ කවර සතරක්ද? සංවර ප්‍රධානය-ප්‍රහාන ප්‍රධානය-භාවන ප්‍රධානය අනුරක්ඛන ප්‍රධානය කියායි-මේ සතරාකාර ප්‍රධන් වීර්‍ය්‍යයී විස්තර වශයෙන් මෙසේයි—

1. **සංවරප්පධානය— ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති, නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති -පෙ- සොතෙන -පෙ- ඝානෙන -පෙ- ජිව්හාය -පෙ- කායෙන -පෙ- මනසා-පෙ-**

යනුවෙන් විස්තර කරණු ලැබේ.

මහණෙනි, මේ සාසනයෙහි මහණතෙම ඇසින් රූප දක එම රූපය සුභ වශයෙන් නිමිති නොගෙන, සියුම් ආකාර සුභ නිමිති නොගෙන වෙසේද යම් හෙයකින් දක්නා රූපයට චක්ෂුර්විඥානය-අසංවරව වාසය කෙරෙත් නම්, ඒරූපයසඳහා ඇති වන විසම ලොභය-දොම්නස ආදී ලාමක අකුශල ධර්ම ඒ ඒ පාප සිත් අනුව වැගිරෙන්ට පහළවන්ට හටගන්ට පටන්ගනිත්-එනිසා, ඇස සංවර කරගැණීමට පිළිපැදියයුතුයි. ඇස ආරක්ෂා කරගත යුතුයි. චක්ෂුර් විඥානය ආරක්ෂා කරගත යුතුයි කියාද-සිතත් නම්, ප්‍රවේශම් වෙත් නම්, සංවර වෙත් නම්, එලෙස, කන-නාසය-දිව-කය-සිත සංවර වෙත්නම්, මහණෙනි මෙය සංවරප්පධානයයි කියනු ලැබේ.

2. **පහානප්පධානය— කතමඤ්ච භික්ඛවෙ පහානප්පධානං, ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති ව්‍යන්තීකරොති අනභාවං ගමෙති -පෙ-ව්‍යාපාද-පෙ-විහිංසා-පෙ-**

**යනුවෙන්, මහණෙනි පහානප්පධානය කවරේද? මහණෙනි මේ සස්නෙහි මහණතෙම තම සිත හටගත් කාම සහගත විතර්ක නො ඉවසාද බැහැර කරාවිද, පැහැර හරිවිද වැඳුගැණීමට ඉඩ නොදේද! තම සිත හටගත් ක්‍රොධ අදහස්-තම සිත හටගත්**

විහිංසා අදහස්-වැද්දගැණීමට ඉඩ නොදේද! උපදින උපදින අන්‍ය අකුසල ධර්මයන් ද එලෙසම නොඉවසාද හැරදමාද, පහ කෙරේද, විනාස සවභාවයට පමුණුවාද, නැවත ඉපදීමට නොතබා විනාශ කෙරේද-මහණෙනි, මෙය පහානප්පධාන යයි කියනු ලැබේ.

8. භාවනප්පධානය— කතමඤ්ච භික්ඛවෙ භාවනප්පධානං? ඉධ භික්ඛවෙ භික්ඛු සතිසම්බොජ්ඣඞ්ගං භාවෙති, විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධ නිස්සිතං වොස්සග්ගපරිණාමිං- ධම්මවිචය -පෙ- විරිය -පෙ- පීති -පෙ- පස්සද්ධි -පෙ- සමාධි -පෙ- උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගං භාවෙති-පෙ-

යනුවෙන්, මහණෙනි භාවනප්පධානය කවරේද? මහණෙනි මේ සස්නෙහි මහණතෙම සම්‍යක් සම්බෝධිය ලබා ගැණීමට අඞ්ගයක්වූ-නැතිනම්-චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කරගැණීමේ සදුපාය ධර්මයක්වූ සිහිය වඩාද-හෙවත්, සතිසම්බෝධ්‍යඞ්ගය වඩාද-නාම රූප ධර්මයන්ගේ අනිත්‍යාදී ලක්ෂණ මෙනෙහි කිරීම යයි කියන ලද ප්‍රඥා චෛතසිකය වඩාද හෙවත් ධම්මවිචය සම්බෝධ්‍යඞ්ගය වඩාද-කුසල් අකුසල් පිළිබඳව පැවති සතරාකාර වීර්‍ය්‍ය වඩාද හෙවත් වීර්‍ය්‍ය සම්බෝධ්‍යඞ්ගය වඩාද-පෙරලෙන සුලු සවල්ප ආස්වාදයක් ඇති කාමාමිසාදියෙහි නොනැවරී, නොම ලැග, සිතිවිලි පිණවමින් කය සිත සංසිඳුවන එහි පැතිර පවත්නා නිරාමිස ප්‍රීතිය වඩාද හෙවත් පීති සම්බෝධ්‍යඞ්ගය වඩාද-කෙලශ දහය සංසිඳුවා කෙලශ බරින් මුදවන කය සිත දෙකේ ලැහැල්ලු බව වඩාද-හෙවත් පස්සද්ධි සම්බෝධ්‍යඞ්ගය වඩාද-නොයෙක් අරමුණු තරු විසිරයානොදී එකම අරමුනෙක්හී එල්බ පවත්නා එකාග්‍රතාවය වඩාද හෙවත් සමාධි සම්බෝධ්‍යඞ්ගය වඩාද-විදර්ශනා කුශල ධර්මයන් පිළිබඳව අඩු වැඩි නොකොට සමව පැවති, මධ්‍යස්ථභාවය වඩාද-හෙවත් උපෙක්ඛා සම්බෝධ්‍යඞ්ගය වඩාද විවේකය ඇසුරුකලාවූ, විරාගය ඇසුරුකලාවූ, නිරොධය ඇසුරුකලාවූ තෘෂ්ණාක්ෂයට නැඹුරුවූ, සත් ආකාර මේ බොධ්‍යඞ්ග ධර්ම භාවනා වශයෙන් වැඩීම භාවනප්පධානයයි—

මෙහි විවෙකනිස්සිතං, විරාගනිස්සිතං, නිරොධනිස්සිතං-වොස්සග්ගපරිණාමිං කී වචන සවල්පයක් විස්තර කරමු. මෙහි විවේකය නම්- කෙලෙසුන්ගෙන් මිදුනු සිතට ඇති අවකාශයයි. එය, තදඞ්ග විවේකය- සමුච්ඡෙද විවේකය- නිස්සරණ විවේකයයි තුන් ආකාරවෙයි. එම ත්‍රිවිධ ආකාරය යෙදෙන්නේ- ආර්‍ය්‍ය

මාර්ග භාවනාවන්හි යෙදුනු යොගාවචරයානට විදර්ශනාක්ෂණයෙහි කෘත්‍යවශයෙන් තදඞ්ගවිවේකය ඇසුරු කෙරෙයි. අභිප්‍රාය වශයෙන් නිස්සරණ විවේකය ඇසුරු කෙරෙයි. මාර්ගක්ෂණයෙහි කෘත්‍ය වශයෙන් නිස්සරණ විවේකය ඇසුරු කෙරෙයි. අභිප්‍රාය වශයෙන් සමුච්ඡෙද විවේකය ඇසුරු කෙරෙයි. වැඩෙයි.

**එස නයො විරාග නිස්සිතාදිසු** - විරාගනිස්සිතං ආදී වචන පිළිබඳවද මේ ක්‍රමයටම සලකාගත යුතුයි. ඒ තදඞ්ගාදි විවේක යම නො ඇලීමය යන අර්ථයෙන් විරාගයයිද- රොධ නම් ලද කෙලශයන් නැත යන අර්ථයෙන් නිරොධයයිද, කෙලස පරිත්‍යාගය, අතහැරීම යන අර්ථයෙන් වොස්සග්ගයයිද, සැලකියයුතුයි. තවද කෙලශයන්ගෙන් නොගැවසී විවේක ඇති හෙයින් විවේක යයිද, කෙලශයන්හි නො ඇලෙන අදහසින් විරාගයයිද, කෙලශයන්ගේ නිරුද්ධිය ඇති හෙයින් නිරොධ යයිද; කෙලශයන් පරිත්‍යාගකල හෙයින් හා කෙලශයන් හළ හෙයින්ද වොස්සග්ගයයිද දතයුතු වොස්සග්ගය-පරිච්චාග-පක්ඛන්දන වශයෙන් දෙවැදෑරුම් වූන් විදර්ශනාක්ෂණයෙහි තදඞ්ග වශයෙන් හා මාර්ගක්ෂණයෙහි සමුච්ඡෙද වශයෙන් කෙලෙසුන් ප්‍රහාණය වෙත්නම් එය පරිච්චාග වොස්සග්ගයයිද විදර්ශනාක්ෂණයෙහි ඊට නැමුණු ස්වභාවයෙන් හා මාර්ගක්ෂණයෙහි අරමුණු කිරීම් වශයෙන් නිර්වාණයට බැස ගැන්ම වෙත්නුයි. පක්ඛන්දන වොස්සග්ගායයිද දතයුතුයි. මෙසේ විවේක නිස්සිතං ආදි පද සතරෙහි අදහස් අවබොධ කරගත යුතුයි.

මෙලෙසින් භාවනප්පධානය දතයුතුයි—

4. අනුරක්ඛනප්පධානය- **කතමංච භික්ඛවෙ අනුරක්ඛනප්පධානං? ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නං භද්දකං සමාධිනිමිත්තං අනුරක්ඛති අට්ඨික සඤ්ඤං පුළුවක සඤ්ඤං, විනීලක සඤ්ඤං විපුබ්බක සඤ්ඤං, විච්ඡිද්දක සඤ්ඤං, උද්ධුමාතක සඤ්ඤං, ඉදං වුච්චති භික්ඛවෙ අනුරක්ඛනප්පධානං**-යනුවෙන්-

මහණෙනි, අනුරක්ඛනප්පධානය කවරේද? මහණෙනි මේ සාසනයෙහි මහණතෙම, උපන්නාවූ යහපත් සමාධිනිමිත්ත අනුව සිත රකියි. ඒ යහපත් සමාධියට හිත නිමිත්තනම්--

1. අට්ඨිකසඤ්ඤං- පිළිකුල් කටයුතුවූ, නින්දිතවූ ඇටයක් හෝ ඇටසැකිල්ලක් දැක එය නුවණ මෙනෙහියා බලා ඇට යන හැඟීම ඇතිකරගෙණ එහි දුර්ගන්ධාදී

පිළිකුල් සවභාව අනිත්‍යාදි වශයෙන් වඩාද, සමාධියට යහපත් නිමිත්තක්සේ නුවනින් ගණීද.

2 පුලවකසඤ්ඤං- මෙහි පුලවායයි කීවේ පණුවන්ට යි පණුවෝ පුරාගැවසීගත් මලසිරුරක් දුක එහි සිත යොමුකොට අනිත්‍යාදි වශයෙන් සලකා සමාධියට යහපත් නිමිත්තක් කරගණීද-

3 විණීලක සඤ්ඤං- විණීලං වුච්චති විපරිභින්න වණ්ණං විනීලයයි කියන්නේ විශෙෂයෙන් වෙනස් වෙනස් වණීවලවය, ඇතුලත පිළිකුල් සවභාවයට පත්වූ බැවින්ද මලසිරුරට විනිලකයයි ව්‍යහාර කරත්. මස් ලේ ඇති සථානවල රතුපාටටද, සැරව එක්වූ තැන්වල සුදුපාටවීද බොහෝ සථානවල නිල්රෙද්දක් පෙරවූ ආකාර නීලවණීවද ඇති මල සිරුරට මේ කදිම නමනි. මෙබඳු සිරුර සමාධියට යහපත් නිමිත්තක්සේ නුවනින් සලකා අනිත්‍යාදි වශයෙන් ගණීද—

4. විපුබ්බක සඤ්ඤං- මලසිරුර දින කීපයකින් ඉදිමී බිඳීගියකල්හී ඒ තැන්වලින් සැරව වැගිරෙන කල විපුබ්බකයයි කියත්. පිළිකුල් කටයුතු නින්දිත එම සිරුරද දුක සමාධියට යහපත් නිමිත්තක් කරගෙන අනිත්‍යාදි වශයෙන් සිහිකෙරේද.

5. විච්ඡිද්දකසඤ්ඤං- විච්ඡිද්දංවුච්චති ද්විධා ඡින්නෙන අපධාරිතං, විච්ඡිද්දයයි කියන්නේ දෙකටපැලී දෙපසට වැටුන මලසිරුරකටයි. අතිශයින් පිළිකුල්වූ නින්දිතවූ මෙම සිරුර දුකීමෙන් සසර දෙස් දුක සමාධියට සොඳුරු නිමිත්තක් කරගෙණ භාවනා වශයෙන් වඩාද, ඊට අනුව සිත රැක තබාද—

6. උද්ධුමාතකසඤ්ඤං- වාතය පිරූ මසිනා හමක් සේ ඉදිමීගිය සිරුරක් දුක දිවි තොරවූ අවසථාවේ සිට අපගේ සිරුර ක්‍රමයෙන් පිළිකුල් සවභායට ඉදිමෙන ශවභාවයට යන අයුරු සලකමින් මෙය සමාධියට යහපත් නිමිත්තක්සේ ගෙන භාවනා වශයෙන් වඩාද මේ ආදී ක්‍රමයෙන් සිරුර පිළිබඳ සියලුම අවසථා ගැන සිතා ඒ අනුව ප්‍රධන් වීයඪී වඩාද ඊට අනුරක්ඛනප්පධානයයි කියනු ලැබේ—

මහනෙනි! මේ ප්‍රධන් වීයඪී සතරකියි, වීයඪී පිළිබඳ සතරකාරයක්ද දක්වා මෙසේද වදාළහ—

සංවරොච පහානංච භාවනා අනුරක්ඛණා
එතෙ පධානා චත්තාරො දෙසිතාදිච්චබන්ධුනා
යෙහි භික්ඛු ඉධාතාපී, ඛයං දුක්ඛස්ස පාපුණෙති.

සංවරප්පධානය- පහානප්පධානය- භාවනප්පධානය- අනුරක්ඛණප්පධානය යන සතරාකාර වීර්‍ය්‍යයන් වඩන යම් භික්ෂුවක් වේ නම් එම භික්ෂුව සියලු කෙලෙසුන් තවා සියලු දුක් වනසා නිර්වාණයට පැමිණේයයි, ආදිච්චබන්ධු ලොවුතුරු බුදුරජාණන් වහන්සේ වදාළසේක. එහෙයින් මේ සතරාකාර වීර්‍ය්‍යයන්ද ඇසුරු කිරීමට උත්සාහවත් විය යුතුයි,

මෙතැන්සිට වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගය උපදවාගැණීමට හේතු ධර්ම පවසමු—

**එකාදස ධම්මා විරිය සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති, අපාය භයපච්චවෙක්ඛණතා ආනිසංස දස්සාවිතා- ගමන වීථිපච්චවෙක්ඛණතා පිණ්ඩපාතාපචායනතා, දායජ්ජමහත්ත පච්චවෙක්ඛණතා සත්ථු මහත්ත පච්චවෙක්ඛණතා-ථිනමිද්ධවිනොදනතා කුසීතපුග්ගල පරිවජ්ජනතා-ආරද්ධවිරියපුග්ගල සෙවනතා සම්මප්පධාන පච්චවෙක්ඛනතා තදධිමුත්තතා-ති.**

අපාය භය පච්චවෙක්ඛනතාදී- එකොළොස් ආකාරයක් වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගය වඩාගැනීමට උපදවා ගැණීමට උපකාර ධර්ම වශයෙන් පවතිත්- එනම්-

1. අපායභය පච්චවෙක්ඛනතා - සතර අපාය භය සිහි කිරීමෙන් වීර්‍ය්‍ය දියුණු වන අයුරු—

**තමෙනං භික්ඛවෙ නිරයපාලා පඤ්චවිධ බන්ධනා නාම කාරණං කරොන්ති තත්තං අයොඛිලං හත්ථෙ ගමෙන්ති තත්තං අයොඛිලං දුතියෙ හත්ථෙ ගමෙන්ති තත්තං අයොඛිලං පාදෙ ගමෙන්ති තත්තං අයොඛිලං දුතියෙ පාදෙ ගමෙන්ති තත්තං අයොඛිලං මජ්ඣෙ උරස්මිං ගමෙන්ති සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති නච තාවකාලං කරොති යාව නතං පාපං කම්මං බ්‍යන්තීහොති,**

යනාදී ක්‍රමයට කල්පනා කලයුතුයි. දෙවදූත සූත්‍රයෙහි දක්වූ ආකාර, පව්කිරීම නැතිනම් පව්පිරීම නිසා යහපත් මිනිස් බැවින් පිරිහී නතර නොව නිතර දුක් ඇති අපායෙහි උපන් කල්හි නිරයපාලයෝ විෂඝෝර සර්පයන් මැදට වන් අසරණ මැඩියෙකු සේ මහා භයින් මිරිකී වියලීයෙත්ම මහාඝණ ගල්පර්වත පවා ඇසිල්ලකින් දූහළු කරන්ට තරම්වන ලෙහෙකැටිවන් ගිණිදල් මතින් දූ පුළුස්සවමින් ඇදගෙන ගොස්, එගිණි මතම සිටුවා නාබර තල්කඳන් විතර ගිණිගෙණ දිලිහෙන යකඩ හුලක් එක්

අත්ත අතීත්, දෙවෙනි අතෙහිද එලෙසම යහුලක් අතීත්. ගව් දෙගව් තුන්ගව්, පමණවූද, යොදුන් ගණන් පමණවූද ඉතාබොහො උස් සිරුර ඇති එම තිරිසනාගේ පාදයෙන්ද, දෙවෙනි පාදයෙන්ද, යහුල් දෙකක් අතීත්. ඉතුදු හතර කොටි එබඳුම යහුලක් පපුව මැද අතීත්. මෙසේ තම සිරුර සිදුරුව යතසේ ඇති යහුල් පස මත අපමණ දුක්ගී ගායමින් හඬමින් වැලපෙමින් මැරෙත්, උපදිත්. ගිණිදලින් වෙලී ද පිළිසසීවැටෙතුදු සිය දහස් ගණන් සියුම් හුල් ඇති යහුල් මතම වැටෙත් මියෙත්. උපදිත්, මෙලෙස දුක්විඳද රැස්කරගත් පාපකර්මය නිසා හුනුවීමක් නැති තිරිසතුන් නිරයපාලයෝ හුල්මතින් තැගිටූවා බිඳකුදු අවකාශ නොදී කල්ප සියදහස් ගණන් එකිනෙකට අසමානවූ දුක්දෙත්. අහෝ මෙම මිනිස් අත් බැව්හිදී මූලාවකරණ ලද පාපයන්ගේ රළු විසම්භාවයක ආකාරය. යනාදී අපාබිය සිතන්නෙහි නම් වීර්‍ය වැඩේ. පටන්ගත් වීර්‍ය දෙතුන් ගුණයෙන් අධික වේ.

තවද නිරයපාලයෝ තිරිසනාව ගිණිගෙණ දිළිසෙණ යහුල් මත ඇත පොරවෙන් පලත්. දෙකකුලෙන් හිස යටට සිටින්ට ඔසවා වැයෙන් සසිත් සම්, මස්, නහර සැස දමත්. ගිණිගත් යපොලොවෙහි රියෙහි බැඳ ගිණිමැලින් තලතලා දක්කවත්. ගිණිගෙණ දිළිසෙන අඟුරු පර්වතවලට තියුණු යහුලින් ඇත මරා නන්වත්. එලෙසම බස්සවත්, විල්වැනි විශාල ලෝහැළිවල ලෝදිය පෙනනැගෙමින් කකියද්දී රාසොඩක් දෙපයින් ගත් එළුපැටියෙකුසේ ගසාගෙණ එහි ඔබත්. එහි පෙනබුබුළුසේ පෙරලෙමින් මහා දුක්විඳ පැසෙත්. වරක් පැසි පැසී උඩටද වරක් පැසි පැසී යටටද වරක් පැසි පැසී සරසටද පෙරලෙත්. මෙසේ කටුක දුක්විඳිමින්, මැරෙමින්, උපදිමින් කල්පගනන් ගතකරණ තිරිසතුන් පිළිබඳව සිහිකිරීමේදී වීර්‍ය වැඩීමට සිත යෙදේ.

එලෙසම– කටුසැමිටි වැල් කස ආදියෙන් තලාපෙලා බර ඇද්දවීම–නාසාවිදීම–හනගැසීම–ලාඩම්ගැසීම ආදී දුක්විඳින තිරිසන් අපා බිය සිහිකරමින්ද, සා පිපාසා දුකින්පෙලෙමින්, හඬමින් වැලපෙමින්, ශොකකරමින් මහදුක් විඳින විශාල උදර සහ සමින් වැසුනු ඇටසැකිලිවලින් යුත් දෙතුන් ගව් උස්වූ පිළිකුල් දැකුම් ඇති ප්‍රේත අපාය සිහිකරමින්ද– සැටරියන් අසූරියන් උසැති සමින් පොරවූ ඇටම මිස බිදකුදු මස්නැති අවු, සුලන්, ශීත උෂණ ආදියෙන් තැවෙමින් ගිණිරැස්වැදුනු ලදලුමෙන් හැකිලෙමින් මිරිකෙමින් අපමණ දුක් විඳින අසුර අපාය සිහි කරමින්ද, යන සිව් අපා බිය සිහිකිරීමේදී පටන්ගත් වීර්‍යය, දියුණුවීමට හේතුවේත්.

**2. ආනිසංසදස්සිතා— විරියා යත්තලෝකිය ලෝකුත්තර විසෙසාධිගමානිසංසදස්සිතා**

යනුවෙන්, වීර්‍ය්‍ය කිරීමේ හේතුවෙන් ලෞකික ලෝකෝත්තර විශේෂ සැපයන්ට පැමිණීමට හැකිය යන ආනිසංස දක්නා සුළුබව=වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගය වැඩීමට හේතුවකි, **විරියෙන දුක්ඛං අච්චෙති**- වීර්‍ය්‍යයෙන් දුක් මඩිනහැක ඉක්මවිනහැක-යනාදී ආනිසංස දැකීම වීර්‍ය්‍ය වැඩීමට හේතුවෙක්—

**3. ගමනවීථිපච්චවෙක්ඛනතා—බුද්ධපච්චෙක බුද්ධමහාසාවකෙහි ගතම්මග්ග මයා ගන්තබ්බො සොපිනසක්කා කුසීතෙන ගන්තුන්ති එවං ගමනවීථි පච්චවෙක්ඛනතා.**

යනුවෙන්-බුදු පසේ-බුදු මහා ශ්‍රාවකයන් වහන්සේලා ගිය මාර්ගයෙහි මමද යායුතුයයි ද ඒ ගමන කුසීත භාවයෙන් තම නොගිය හැකියයි ද, මෙලෙසින් ගමන වීථි ප්‍රත්‍යවේක්‍ෂා කිරීම පුරුදුකල යුතුයි-මෙහිදී, මාර්ග නමින් හඳුන්වන්නේ, ගොඩ, දිය, අහස, යනාදී ස්ථානවල පා ගමනින් හෝ රථවාහනාදී ගමනින් හෝ යන එන මාර්ගයක් නොව, ප්‍රතිවේධයට හිතවූ සෙවන් බුදු පසේබුදු අගසව්=තනතුරු ආදිය අවබොධකර ගැණීමට හිතවූ ප්‍රතිපත්තියම, මෙහි මාර්ගයයි-සැලකියයුතුයි-ප්‍රතිපත්ති ධර්ම මාර්ග නමින් බොහෝවිට ධර්මයෙහිදී ප්‍රකාශවේ-

**දානං නාමෙතං මයා ගතම්මග්ගො=එකායනො අයං භික්ඛවෙ මග්ගො=සත්තානං විසුද්ධියා=අරියංචට්ඨඞ්ගිකංමග්ගං-**

යනුවෙහි-දාන-සීලභාවනා-ධ්‍යාන-විදර්ශනා-මාර්ග-යනාදී ප්‍රතිපදාවන්ගේ මාර්ගයෙන්ම-එහි වීර්‍ය්‍ය වඩමින්ම-බුද්ධාදී උතුම් තනතුරු ලාභයට පැමිණියායයි-සලකමින්, තමන්ද වීර්‍ය්‍ය වඩත් නම්, එම සිහිකිරීම වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගය වැඩීමට හේතු ධර්මයෙකි.

**4. පිණ්ඩපාතාපචායනතා— දායකානං මහප්ඵලාකාර කරණෙන පිණ්ඩපාතාපචායනතා-**

යනුවෙන්-දායකයින්ට මහත් ප්‍රයෝජන ලබාදෙන රිසියෙන් පිඬුසිඟා හැසිරීමද, වීර්‍ය්‍ය වඩිනයවීමට හේතු ධර්මයකි-මා පිඬු සිඟනකල ආහාරපානාදිය පුදන මේ පින්වතුන් මාගේ නෑයෝද සහලේ නෑයෝද නොවේ. මට යටත් පිරිසක් හෝ මගෙන් ලාභයක් බලාපොරොත්තු වන්නෝද නොවේ. එනමුත්, මාගේ උස් මිටිකම් හා සිල් ගුණ ඈ කිසිවක් නොසොයා, නොසලකා, නොවිමසා, සිවුරුද, පිණ්ඩපාතයද, සෙනසුන්ද, ගිලන්පසද දෙත්;

එසේ ශ්‍රද්ධාවෙන් පුදන ලද දෙය හිස්නොකොට, එම දින්වතුන්ට හිත වැඩ සැලසෙනසේ පරිභොග කිරීම සුදුසුයයි, සැලකීම වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගය වැඩීමට හේතු ධර්මයෙකි. මිත්ත ස්ථවිරයන් වහන්සේගේ ජීවිත කථාව මීට කදිම උදාහරණයකි-මේ ලක්දිව රුහුනු රට කසසක නම් ගල්ලෙනක මිත්ත නම් සිල්වත් තෙර නමක් විසූහ. පිඩුසිඟාවැඩිය මුන්වහන්සේ සැදුහැති උපාසිකාවක ගේ ගෙදෙර සිට ගත්හ-සංවර ගුණාදියෙන් විනීතවූ තෙරනුවෝ දුටු උවැසිය කුස උපන් දරුවෙකුටමෙන් ප්‍රේමය උපදවා, ගෙයිම වළඳවා=එලෙසම නිතර සංග්‍රහ කරන්ට වන. දිනක දර සා එලරස සොයන්ට අසල වනයට යන්ට පිටත්වූ උවැසිය, තම දුව අමතා-තවටිකකින් වඩින පුත් තෙරනුවන්ට, අසවල් පිරිසිදු සහල් සහ මී, සකුරු, ගිතෙල් ආදිය යෙදූ යහපත් අහර පිස පිළිගන්වා අපට ඇඹුල්කැඳක් පිසතබවයි කියමකලාය. තෙරනුවෝද කල්යල් ඇතිව වැඩමවන්නේ, මෙබස් අසා සිතනුයේ බොහෝදෙන ලොව තම ජීවිතයම ගරුකොට සලකති. මේ උපාසිකාවෝ මට නොතැවද මගෙන් යම් ප්‍රයෝජනයක් නො ඉවසාද, මා දිවිරැකීම තම දිවිරැකීමටත් වැඩිතරම් කොට සලකා මෙර වැයමෙන් මා පෝෂණය කිරීමෙහි උත්සාහවත්වන්නීය. එසේ බලාපොරොත්තු වන්නේ මාතුල සිල් ගුණ ඇතැය යන අදහසිනි. එනිසා මැයට දෙව්, මිනිස්, නිවන් යන තුන් සැපත ලබාදීම මට භාරවූවකි. අද මාගේ වීර්‍ය්‍යයේ තරම් බලමි. මේ දන මා අද වළඳන්නේ කෙලෙස් මල සෝධාමයයි, සිතා පෙරළා ගල්ලෙනට වැඩ, පා සිවුරු සකස්කොට තබා ලෙනතුලටවී පලක් බැඳ වැඩහිද රහත් නොවී නොනැගෙමියි- වීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් කෙලෙස් රුපුන් මඩින්ට භාවනා කරන්ට පටන්ගත්හ. වැඩි වේලා නොගොස්ම කාම-භව-දෘෂ්ටි-අවිද්‍යා යන සතරආශ්‍රව ධර්ම සිඳ බිඳදමා සෝවාන් ආදී සතර මාර්ගඵලාවබෝධය කොට නිවන් සිරි සාදුගත්හ-ඒට තුටු පහටුවූ, එම කසසක ලෙනට අරග්ගත් දෙවිතෙම, ප්‍රීතිමත්ව මේ ගය කීහ—

> නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම
> යස්සතෙ ආසවාඛීණා දක්ඛිණෙය්‍යොසි මාරිස

එහි අදහස-ශ්‍රේෂ්ඨ පුරුෂයාණනි, උත්තම පුරුෂයාණනි, ගෞරව පූර්වකව මාගේ නමස්කාරය ඔබට පිරිනමමි. තිඳුකාණෙනි, කාමාදී ආශ්‍රව ධර්ම සිඳලූ ඔබ දක්ෂිණාගී උතුමෙක්ය යනුයි-දෙව ප්‍රශාදය ලැබූ මේ වීරයන් වහන්සේ, කල්ඇතුවම සිතුසේම, කුළුපග උවසියගේ ගෙදෙරට සිඟා වැඩිසේක-මග බලමින් සිටි මහ උවැසියගේ දුවනියෝද දන් පිළිගැන්වූවාය-වළඳා පින්

අනුමෝදන් නොව තෙරනුවෝ අහසින් වැඩිසේක. මව්ගේ පැමිණීම ප්‍රීතියෙන් බලාපොරොත්තුවූ දුව, පැමිණි වහාම තෙරුන්ගේ අධිගමලාභය තුටුපහටුව දුන්වූවා, සාධු සාධු සිල්වත් අප පුත් තෙරණුවෝ දුක් කෙලවර කරගත්හයි, ප්‍රීතිමත්වූවාය- මෙලෙසින් පිඩු සිඟීමෙහිදී ඇතිවන යහපත් නිමිති ඇසුරු කිරීමෙන් දුක් කෙලවර කරගතහැකි හෙයින් පිඩුසිඟීමද වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගය වැඩීමට හේතු ධර්මයෙකි—

5. සත්ථුමහත්ත පච්චවෙක්ඛනතා— විරියාරම්භස්ස වණ්ණවාදී මෙ සත්ථා සොච අනතික්කමනීය සාසනො අම්හාකංච බහූපකාරො, පටිපත්තියාව පූජියමානො, පූජිතො හොති නාඤ්ඤථාති, එවං සත්ථුමහත්ත පච්චවෙක්ඛණතා—

යනුවෙන්, මාගේ ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ වීර්‍ය්‍යාරම්භයෙහි ගුණ වර්ණනා කරණ සේක බුදුන්වහන්සේ පවා වීර්‍ය්‍යාරම්භයෙන් බොධිය ලබාගත් බැවින්-තමන් වහන්සේද එය නොඉක්මවූ සේක. වැඩූසේක. අපටද බොහෝ උපකාරී අයුරු දහම් දෙසූ සේක. එබැවින් ඒ අපේ බුදුපියාණන් වහන්සේට පුදන්නම් ප්‍රතිපත්තියෙන්ම පිදිය යුතුයි. ආමිසාදියෙන් පිදීම ප්‍රමාණවත් නොවේ. මෙසේ බුදුගුණ මහත්වය ප්‍රත්‍යවෙක්ෂා කල යුතුයි. එසේ සිතන් සිතන්ම, වීර්‍ය්‍යාදී ප්‍රතිපත්ති ධර්ම වැඩීමට සිත යෙදේ=යම්කිසි යොගාවචරයෙක්-තමන්ම තමන්ට අමතා-තොපට අනුශාසකවූ බුදුරදුන්, සීලසමාධි, ප්‍රඥා විමුක්ති, විමුක්ති ඥාණ දර්ශනාදියෙන්ද-දෙතිස් මහා ලක්ෂණයන්ගෙන් හා අසූවක් කුඩා ලක්ෂයන්ගෙන් ද, අරහාදී නවගුණයකින් හා සමතිස් පෙරුම් දහමින් ද, සත්තිස් බොධිපාක්ෂික ධර්මයන් ආදී අනේක ලක්ෂණයන්ගෙන් සමන්විතය. උන්වහන්සේගේ මඞ්ගල ධර්මදෙශනයෙහිදීම දශසහශ්‍ර ලොක ධාතුව ප්‍රකම්පිත කලහ-ගේ සැකෙවින් මෙසේයි-පැවිද්ද මේකොන්දෙක සේවනය නොකටයුතුය-එනම්-ලාමකවූ, ග්‍රාම්‍යවූ, පුහු මිනිසුන්ට අයිතිවූ, ආර්‍ය්‍යයන් පිළිකුල් කරණ, අවැඩක්ම සිදුවන-ඇස්, කන්, නාස, දිව, කය, මනස යන සය ආයතනයන්ට ගොදුරුවූ, රූප. ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම යන අරමුණුවල ගිලී වෙලී පිරිසිදු සිත කිළුටු කරණ අනර්ථකර කාමය එක්කොනෙක, කිසිසේත් මොක්ෂයක් නොලබනහැකි දුක්වූ, අනාර්‍ය්‍යවූ අවැඩක්ම සැලසෙන තමහට පීඩා පමුණුවන්ට යෙදෙන අනික් කොනකි-යන දෙකොනට නොපැමිණ, මැදහත් පිළිවෙලවූ ආර්‍ය්‍ය මාර්ග අව ගෙණ පිළිපැද්ද යුතුයි. ඉන් නිර්වාණය අවබොධවේයයි ද, ජාති ජරා ව්‍යාධි මරණ

අප්‍රියයන් හා එක්වීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම සතුටුදෙය නොලැබීම රූප, වෙදනා, සඤ්ඤා සංස්කාර විඤ්ඤාණ යන පස්කඳ, සිරුර, ලැබීම යන සියල්ල දුක්ඛ සත්‍යයයිද-යම් තණ්හාවක් නැවත උත්පත්තිය ගෙණදෙමින්-ඒ ඒ භවයන්හි අලවයිද, ඒ කාම-භව-විභව යන තුන්වැදෑරුම් තණ්හාව, සමුදය සත්‍යයයි ද ඒ මේ ත්‍රිවිධ තණ්හා ලාවුවෙන් අලවන. කාම-භව-විභවයන්ගේ ගැලවීමක් මිදීමක් වේනම් එය, නිරොධ සත්‍යයයිද-සම්මාදිට්ඨි-සම්මාසංකප්ප-සම්මාවාචා- සම්මාකම්මන්ත- සම්මාආජීව- සම්මාවායාම- සම්මාසති-සම්මාසමාධි, යන අඞ්ග අට=මාර්ගී සත්‍යයයි ද-එම සතර සත්‍යය=සත්‍ය ඥාණ-කෘත්‍ය ඥාණ-කෘත ඥාණ-වශයෙන් පරිවෘත තුනකටද දොළොස් ආකාරයකටද=බෙදා-දම්සක් සූත්‍රය දෙසනා කොට දෙව් බඹුන් මරුන් සහිත සකල ලොකයෙහිම මම නිරුත්තරවූ සම්මාසම්බෝධිය අවබෝධ කළ සේකැයි ධර්මචක්‍රය නිමවා වදාළ සේක. මෙසේද තොපගේ ශාස්තෘන් වහන්සේගේ ප්‍රඥා මහත්වය සලකා වීර්‍ය්‍ය සම්බොධ්‍යඞ්ගයට සත්ථුමහත්වය සිහිකිරීම හේතු ධර්මයක් කොට ගතයුතුයි—

6. දායජ්ජ මහත්ත පච්චවෙක්ඛණතා- සද්ධම්මසංඛාතංමෙ මහා
දායජ්ජං ගහෙතබ්බං නචසක්කා කුසීතෙන ගහෙතුන්ති
එවං දායජ්ජ මහත්තපච්චවෙක්ඛණතා-

මවිසින් සද්ධර්මයයි කියන ලද මහා දායාදය ගතයුතුයි. සෙද, කුසීතකමින් යටපත්ව නොගතහැක-පටන්ගත් වීර්‍ය්‍ය ඇත්තහු හටම එය උරුමවේයයි, මෙසේ දායාද මහත්වය සලකා වීර්‍ය්‍ය වැඩිය යුතුයි. සද්ධා, සීල, හිරි ඔතප්, සුත, චාග, පඤ්ඤා වශයෙන් ලබනහැකි ආර්‍ය්‍ය ධනයට මා පොහොසතෙක්-උරුමක්කාරයෙක් වෙත්යි-දායාද මහත්වය සැලකීම ද වීර්‍ය්‍යයට හේතුවකි.

7. ථිනමිද්ධවිනොදනතා-ආලොක සඤ්ඤා මනසිකාර ඉරියා
පථ පරිවත්තන අබ්භොකාස සෙවනාදීහි ථිනමිද්ධ
විනොදනතා-

යනුවෙන් ආලොක සඥවන් මෙනෙහි කිරීම, යෑම, සිටීම, හිඳීම, ආදී ඉරියව් වෙනස් කිරීම, අභ්‍යවකාශ ස්ථානවල වැසීම ආදියෙන් කය සිත දෙකේ මැලිබව දුරුකර ගැණීම වීර්‍ය්‍ය වැඩීමට හේතුවෙයි.

ආලොකසඤ්ඤං මනසිකරොතීති දිවා වා රත්තිවා සූරිය
පජොති, චන්දමණි, ආලොකං ආලොකොති මනසිකරොති

යනුවෙන් දවල් හෝ රෑ සූර්‍ය්‍යාලෝකය හෝ චන්ද්‍රාලෝකය ආලොකයයි සිහිකරණ කල්හි ආලොකය යන හැඟීම සිතෙහි පවතීත්. ඉන්, මේ දවල් ආලොකය, මේ රාත්‍රි ආලොකය යනු

හැඟීම ද ඇතිවේත්-මෙසේ සිතත් සිතත්ම, දවල් ආලෝකය රාත්‍රියෙහිදීත් රාත්‍රි ආලෝකය දවාලේදීත්, සිතට වැටහේත්. මෙසේ නො වසන ලද සිතින් මෙනෙහිකරණ කල්හි භාත්පසින්ම ඔභාස චිත්තය වැඩෙත්. මෙලෙසින් දිවැසට පරිකර්මාලොක සිතද, චතුර්ථධ්‍යානාදියට හිත ආලොකකසිනාරම්මක සිතද කියනලදි-මෙසේ වඩන සිත අන්ධකාරය ආවරණ කිරීමෙන් ඕභාසය (ආලොකය) හට ගණීත්, මෙම ආලොකාදිය සිහිකිරීම වීර්‍ය්‍යයට හිතකාරී වෙත්-ඉරියව් වෙනස් කිරීමත්-අවකාශස්ථාන වල වැඩීමත් මෙලෙසම කය සිත ඇතිවන මැලිකම් දුරලා වීර්‍ය්‍ය වැඩීමට හේතු ධර්ම වෙත්.

**කුසීත පුග්ගලපරිවජ්ජනතා** - කුසීතයන් ආශ්‍රයෙන්, ඇත්කිරීම- දුලීනවූ බොධ්‍යඞ්ගාවබොධය කිරීමේදී, සිත කය දුබල කුසීතයන් හා, අසජ්ජනයන්ගේ ඇසුර වළකා ගතයුතුයි. ඒබව-

**නිහීයති පුරිසො නිහීන සෙවී, න ච හායෙථ කදාචි තුල්‍යසෙවී**
**සෙට්ඨමුපනමං උදෙති ඛිප්පං, තස්මා අත්තනො උත්තරිං භජෙථ.**

නිහීනයන් සේවනය කිරීමෙන් තමාද පිරිහේ සමානයන් සෙවීමෙන් ශ්‍රෙෂ්ඨ භාවයකට නොපැමිණේ. ශ්‍රෙෂ්ඨයන් ආශ්‍රය කිරීමෙන් වහාම දියුණුවට පැමිණේ. එබැවින් නිතරම තමාට වඩා උසස් අය භජනය සේවනය කරනු—නිහීනයෝ-යම්තම් දෙයකින් යැපෙමින් ගෙන්ගෙට යමින්, රජ, සොර, යුද, ආදී නිසරු බස් කියන, කේලාම්, උනුනුන් සිත් තවන බස් කියන, අසල්වැසියා බිඳියන බස් කියන, අසත්පුරුෂයන් ආශ්‍රය කරණ, ඊර්ෂ්‍යා, ක්‍රෝධාදීයෙන් හා- මැලිකමින්- නිද්‍රාවෙන් කල්යවන, අනුන්ගේ ඇද සොයන, තමන් උසස්කොට සිතන, අනුන්ව හෙලාදකින, අසජ්ජනයෝ නිහීනයෝයි. මොවුන්ගේ ඇසුර දුරලීම, වීර්‍ය්‍ය වැඩීමට මහත් උපකාර ධර්මයකී—

නිහීනයන් වටසර සිටියදීම, ආර්‍ය්‍යින්ගේ අවවාද පිළිගත් තිස්ස නම් තෙරණුවෝ, මහත් ධෛර්‍ය්‍යයෙන්, කෙලෙසුන් මැඩ ගත්හ. හේ මෙසේයි— සැවැත් නුවර තිස්ස නම් පොහොසතෙක්විය, ඔහු සිය බිරිඳ අතැර මහණවූහ. ඈ, තිස්සගේ මලනුවන් සමග වසනුයේ තම හිමි සිවුරුහැර එතැයි, සොරු මුලකට මිලදී මරණීනට කීවාය. තෙරුන් සොයා ගිය සොරු මූල ගල්ලෙනක භාවනා කරමින් සිටි තෙරුන් දැක ගෙණ මරන්ට තැත්කලෝය. තෙරනුවෝ ඊට කාරණා අසා දැන, අද එක රැයක් පමණක් නො මරණ ලෙස කීහ. මේ රෑ ඔබ පැන ගියොත් අපගේ අදහස් වෙනස්වේයයි කී සොරුන්ගේ බස් අසා-

අසල තිබුන ගලක් ගෙණ දෙදන පොඩිකර දෙපා සිඳී ගියම්, කොහේයෙම්දැයි එම රැයට අවසර ලබාගෙණ; දෙදන බිඳීගිය වේදනා දුකද විඳ දරාගෙණ විදසුන් වඩා එළිවනකොට රහත් ඵලයට පැමිණි සේක-මෙලෙසින් නිගීනයන් ඇසුරෙන් ඇත්වීම හිත වැඩ පිණිසම පවතිත්—

**ආරබ්ධවිරිය පුග්ගල සෙවනතා.** පටන්ගත් වීර්‍ය්‍ය ඇති සත්පුරුෂයන් සෙවනය කිරීමද වීර්‍ය්‍ය සංබොදඟ වැඩී-මට හේතු ධර්මයෙකි. නිකෙලශී හෝ කෙලශ දමනයෙහි නිඇලුනාවූ පුද්ගලයන්ගේ සෙවනය මෙහිදී දක්වත්. ඊට කදිම නිදසුන් බොහෝයි. බුධ, බුධ ශ්‍රාවකාදී උතු-මෝම මෙහි යහපත් ආශ්‍රයයි සැලකිය යුතුයි. අඞගුලිමාල සොරැද බුදුරජුගේ ඇසුර නිසාම ලෝකයෙහි ව්‍යාපතව තිවත්ද දුටහ. බුදුරදුන් සෙවීමෙන් අසූමහ සව්වන් ආදී උතුමෝද, එම උතුමන් සෙවීමෙන් අපමණ සත්වයෝද, තමතමන්ට රුචිවන බොධීන් මිස්තකයට පමුනුවා තිවත් දුටහ. ගුණවතුන් සෙවීමේ අනුසස් මේ ධර්මකථාවෙන් තේරුන්ගත යුතුයි. පැලලූප් නුවර රාජධානි කොට මුලු දඹදිවවිම අනසක පවත්වමින් රජකල ධර්මාශොක මහනිරිඳු පිදීමට පැමිණි දෙව්පුත් නුවර රජගෙන් ඉන්දගුත්ත නම් මහතෙරුන්ගේ ගුණ අසා මහපෙලහරින් (පැට්නා) පැලලූප් නුවරට වැඩමවන්නේ චන්ද්‍රභාගා නදී තොටුපලට පැමිණ තමන්ට දක්වන ගරුබුහුමනෙහි මත්වූ තෙරනුවෝ මහත් මානාහඞකාරයකට පැමිණ තමන්ගේ උසස්කම කල්පනා කරන්ට විය. සිල්වත් භික්ෂූන් දහස් ගණනක අධිපතිවූ මේ තෙරනුවෝ මෙසේ අහඞකාරවූයේ ඥත්‍යාවබෝධයක් නොමැති බැවිනැයි සැලකූ කල්‍යාණමිත්‍ර එක් රහතුන්වහන්සේ කෙනෙක් ඉන්දගුත්ත තෙරුන් වැද අවවාද වශයෙන් මෙසේ කීහ.

**මා මානස්ස වසීහොථ-මානං හන්තන වසීකතං**
**අනත්ථඤ්ච සදා හොති-පාතනඤ්චා භවාවටෙ**
**මානො පලාලිතො සන්තො-තණ්හා පවිස සඞ්ගතො**
**මක්කටො රඞ්ග සොණාදී ඛුද්දාජායතිජාතිසු**
**මාමානස්සාමිසූරෙහි අත්තානං පරිසොධය**
**අපරිසුද්ධා සයො භික්ඛු දයකානං නපරිතොසති**
**දදන්තානං සරන්තානං පූජෙන්තානං සචෙතුවං**
**මහප්ඵලං මහාජුතිං කාමස්ස හොථ නිම්මාණාති.**

**එහි කෙටි අදහස-**

ස්වාමීනි! මානයට අහඞකාරයට වසඟනොවනු මැනව, මානයෙන් යටපත්වූවෝ හැමකල්හි සසර අනර්ථයටම පැමිණෙත්, මානයෙන් කැලඹි, තෘෂ්ණා වෙෂ දෙකට පැමිණි සත්වයා වඳුරු'

නාග, බලු ආදී නීචභාවයට යෙත්- සවාමීනි! එනිසා මාන්නය වඩන්ට එපා සිත පිරිසිදුකරගන්න අපිරිසිදු භික්ෂුව දායකයන් සතුටුනොකරයි. ඔබ දායකයන්ට මහාඵල (නිර්වාණය) ලබාදෙන්ට සතුටු නම් මානය අත්හැරිය යුතුයි යනුයි- මේ සත්පුරුෂ බස ඇසූ තෙරුනුවෝ කලකිරුණේ- සිය කය කෙරෙහි කලකිරුනු සිහිකොට එතෙනෙහිම රහත්වූ සේක. සත්පුරුෂ ආශ්‍රය මේ ලෙසින් වීර්‍ය කිරීමට හේතු ධර්මයෙකි--

සම්මප්පධාන පච්චවෙක්ඛණතා. — සොභනං වා තං කිලෙස විරූපතන විර භතො පධානකුව කිතසුඛ නිප්ඵාද කා- තතතා සෙඨභාවා වහනතො පධාන භාවකරණතොවා සම්මප්පධානං විරියස්සෙතං අධිවචනං- යනුවෙන් කෙලශ මලින් කිළුටක් නැතිව සොභනව හෝ හිත සැප නිපදවාගැණීමේ ප්‍රධාන ශ්‍රෙෂ්ඨ භාවය උසුලමින් හෝ ප්‍රධාන භාවය කරණ හෙයින් හෝ සම්මප්පධානයයි කියනු ලැබේ. මෙ ලෙස තේරෙන කල සම්මප්පධාන යන වචනය වීර්‍යයට සුන්දර නමකි. මෙම නම සිහිකර එහි අර්ථය විමසා සිතට ගත් විට වීර්‍ය සම්බොධ්‍යඞ්ගය වැඩීමට වටිනා හේතුධර්මයක් වේ.—

තදධිමුත්තතා- සත්‍යාවබෝධයෙහි ආසාකරණ මා වීර්‍යය ගරුකොට භාවනාකල යුතුය. වීර්‍යයටම නැමිය යුතුය. වීර්‍යයෙන්ම මා පිණවිය යුතුය. වීර්‍යයටම බර විය යුතුයයි, ප්‍රධන් වීර්‍යය යහපත්සේ දියුණු කරගැණීනම් එය වීර්‍ය සම්බොධ්‍යඞ්ගය වැඩීමට, එකොළොස්වන හේතු ධර්මයයි. මේ තදධිමුත්තතාවය- සප්ත බොධ්‍යඞ්ගයනටම හේතුධර්මයෙකි. සප්තබොධ්‍යඞ්ගවලට පමණක් නොව, තමන් ආරම්භ කරණ සියලු කටයුත්තක්ම මස්තකයට පමුණුවා ගැණීමට ඒ පිළිබඳව දැඩි වෑයමක්, ඊට නැමීමක්, වෙසෙසින් එහි වැතිරීමක් ඊට බරව ක්‍රියාකිරීමක් නොමැතිව අභීසිද්ධියකට පැමිණිය නොහැකි වෙයි. අපි ආරම්භ කරණ ලෞකික කරුණක් වුවද, එහිදී මේ තදධි මුත්තතාවය පුරුදු කිරීමෙන් සෑම අභිවෘද්ධියක්ම සැලසේ එම පුරුදු තාවය ලොකොත්තර සැප සෑදීමේදීද ඉදිරිව ක්‍රියාවේ යෙදේ. ඒ තදධිමුත්තතාවය පැරණි අපට උරුමව තුබුන නිසා සිංහලයන් වශයෙන් නැගීසිට දෙවියන් පවා පැරදවූහ. ඒ බැව් සලකා ගන්නා ලෙස අවවාද කරමින් සසරදුක් නසා නිවන් සැප සාධාගැනීමේ ප්‍රබල වත්වූ සක්විති රජහුගේ අශ්වරත්නය වැනි සීඝ්‍රවූද, සැහැල්ලුවූද, ජවසම්පන්නවූද වීර්‍යමඩා අමාමහ නිවන් සිර සාධාගන්නා ලෙස සිහිපත් කරවමු.

**සියලු සත්වයෝ නිවී සැනසෙත්වා.**

## මොරටුමුල්ලේ තාපසාරාමාධිපති භදන්ත ශ්‍රී ආචාර්‍ය්‍ය මොරටුවේ ශ්‍රී පෙමරතන මහාස්ථවිර පාදයන් වහන්සේ විසින් පවත්වන ලද ධර්‍මදේශනාව.

---

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

---

# 4. පීති සම්බොජ්ඣඞ්ගය.

---

**තත්ථ කතමො පීති සම්බොජ්ඣඞ්ගො, යා පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති ඔදග්‍යං අත්තමනතා චිත්තස්ස පීති සම්බොජ්ඣඞ්ගො අයං වුච්චති පීති සම්බොජ්ඣඞ්ගො.**

මේ ප්‍රකාශ කරණ ලද්දේ විභඞ්ගප්‍රකරණයෙහි ආ ධර්‍ම කොට්ඨාසයකි. ප්‍රීති සම්බොධ්‍යඞ්ගය පිළිබඳ මේ ධර්‍මකොට්ඨාසය ලියාදෙන්ට අදහස් කෙළේ, මොරටුමුල්ලේ සිරිසුධර්‍මාරාමාධිපතිව වැඩ සිට දිවඞ්ගතවී වදාළ ඈම්, ශ්‍රී. අරියවංශ මහාස්ථවිර පාදයන් වහන්සේගේ ගුණසමරණය කරණුවස් ඇරඹූ ප්‍රථම සත්වත්සරයෙහිදී උන්වහන්සේගේ උගත් ශිෂ්‍ය අප හිතවත් මොරටුවේ ශ්‍රී සාසනවංශ ස්ථවිර පාදයන් වහන්සේ විසින් ඒකාන්ත ගුරු භක්තියෙන් ඇලලී ගිය සිත් ඇතිව කරණ ලද ආරාධනය නිසාය.

මෙහි මුලින් ප්‍රකාශ කළ ධර්‍මමාතෘකාවෙහි අදහසනම්-

එහි ප්‍රීති සම්බොධ්‍යඞ්ගය නම් කවරේද? චිත්තයාගේ යම් ප්‍රීතියක් වේද, ප්‍රමොද්‍යයක් වේද, තුටු පහටු වීමක් වේද, හස් පහස් ගතියක් වේද, තුෂ්ටි ධනයක් වේද, ඔදවැඩි ගතියක් වේද, සතුටු බවක් වේද, සම්බොධියට කරුණුවූ ප්‍රීතියක් වේද මෙය ප්‍රීති සම්බොධ්‍යඞ්ගයයි කියනු ලැබේ. මෙයින් දක්වන ලද්දේ ප්‍රීති සම්බොධ්‍යඞ්ගයෙහි අදහසයි. එහි ආමොදනා පමොදනා යනාදි පර්‍ය්‍යාය වචනයන්ගෙන් ප්‍රකාශ වන්නේ සිතෙහි පවත්නා නිරාමිෂ ප්‍රීති සැපයයි. එය වැඩි දුරටත් පැහැදිලි කරණුපිණිස "ප්‍රීතිය" යනු කුමක්ද? සම්බොධ්‍යඞ්ගය යනු කුමක්දැයි දතයුතුයි. මෙහි කියන ලද ප්‍රීතිය නම් මාර්‍ගඵලාවබොධයට උපකාර වන්නාවූ විදර්ශනාඥානය සමග යෙදුනාවූ ප්‍රීති චෛතසිකයයි.

බෝධි ශබ්දාර්ථ:-

මගපල නිවන් අවබෝධ කළහැකි ධර්ම සමූහයට හා එසේ අවබෝධකළ පුද්ගලයා හටත් බෝධියයි කියනු ලැබේ. ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි උපදනාවූ ඒ ධර්ම සමූහය කය සිත දෙකේ මැලිබව උඩඟු බව ආදී නොයෙක් උපද්‍රවයන්ට ප්‍රතිපක්ෂව පවත්නේය, ඔව්හු නම්! සමෘති, ඡන්‍දෘ, වීර්‍ය්‍ය, ප්‍රීති, ප්‍රශ්‍රබ්ධි, සමාධි, උපෙක්ෂා, යන ධර්ම සප්තකයයි. මේ ධර්ම සමූහය කරණකොට ගෙණ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම නිවන් අවබෝධ කෙරෙයි යන අර්ථයෙනුත් බෝධි නම් වේ.

යම් ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක් තෙම මෙකී ධර්මයන් කරණකොට ගෙණ සකල කෙලශයන් ප්‍රහීණ කොට සසර දුකින් නිදහස්වූ නිවන් අවබෝධ කෙරේද, ඒ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ බෝධි ශබ්දයෙන් කියවේ.

එබැවින් එකී ධර්ම සාමග්‍රියේ හෝ නිවන් අවබෝධ කළ ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ හෝ අවයවයෝ වෙත්නුයි. බොජ්ඣඞ්ගයයි කියනු ලැබේ. පසස්නා ලද සොඳුරුවූ බොජ්ඣඞ්ගය සම්බොජ්ඣඞ්ග නම් වේ. බොජ්ඣඞ්ග සියල්ලම සතකි. එයින් ධම්මවිචය, විරිය, ප්‍රීති යන බොජ්ඣඞ්ග තුන සිත අලස බවකට පත්වූ කල්හිද පස්සද්ධි, සමාධි උපෙක්ෂා, යන බොජ්ඣඞ්ග තුන සිත නොසන්සුන් බවකට පත්වුහු කල්හිද සති සම්බොජ්ඣඞ්ගය හැමකල්හිද යොගාවචරයා හට ප්‍රයෝජනවත් වන්නේය බුදුවරු පසේ බුදුවරු හා රහතන් වහන්සේලාත් බොධ්‍යඞ්ග ධර්ම වැඩීමෙන්ම දුක් කෙළවර කරගත්හ.

එබැවින් යම් භික්ෂුවක් අසුරක් ගසන කල්හි පවා බොධ්‍යඞ්ග ධර්මයක් වැඩුවහොත් ඒ භික්ෂු තෙම නොසිස්වූ ධ්‍යාන ඇත්තෙක්-ශාස්තෲ ශාසනය පරිදි කටයුතු කරන්නෙක්- රටවැසියාගේ නොසිස්වූ පිණ්ඩ භොජනය පරිභොග කරන්නෙක්ද වන්නේයයි බුදුරජාණන් වහන්සේ විසින්ම වදාරණ ලද්දේය. බොධ්‍යඞ්ග ධර්ම ගැන මෙතරම් වර්ණනා කරණ ලද්දේ ඒකාන්තයෙන්ම නිවන් සැප පිණිස පවත්නා හෙයිනි. භවගාමී සම්පත් පිණිස කාමාවචර කුශල චිත්තයන්හි මේ ධර්ම සන්තතිය යෙදුනත් බොජ්ඣඞ්ග නාමය නොලබන්නේ එහෙයිනි.

පූර්‍වභාග විදර්ශනා කුශල චිත්තයෝ කාමාවචර උවත් භවය පිළිකුල් කරමින් නිවණටම නැඹුරුව පවත්නා හෙයින් බොජ්ඣඞ්ග නාමය ලබන්නාහ. රූපා රූප ධ්‍යාන කුසල්ද විදර්ශනාවට

පාදක කරගණු පිණිස උපයන කල්හි පූර්වභාග බොධ්‍යඞ්ගයෝ නම් වෙති. නමුත් ඔව්හු ලෞකික සියලු සංස්කාර ධර්මයන්ගේ තත්ත්‍ව සලකා අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් ත්‍රිලක්‍ෂණ වඩා ඒ ඒ මාර්ගවලින් නියමිත කෙලෙස් ප්‍රහීණ කළවිට මාර්ග සිත්හි හා ඵල සිත්හිත් ඇතිවන සති ආදීහු ලොකොත්තර බොධ්‍යඞ්ගයෝ වෙති. එහෙත් අර්හත් මාර්ගය දක්වා බොධ්‍යඞ්ගයෝ වඩනු ලබන්නාහ. වඩන ලද බොධ්‍යඞ්ගයෝ සම්පූර්ණ වන්නාහු අර්හත් ඵල චිත්තයෙහිදීය.

මහකසුප් මහරහතන් වහන්සේ හා මහමුගලන් මහරහතන් වහන්සේත් ගිලන්ව වැඩවසන අවස්ථාවන්හි භාග්‍යවතුන් වහන්සේගෙන් බොධ්‍යඞ්ග ධර්ම අසා එකෙණෙහිම සුවය ලැබගත් බව මහා කස්සපත්ථෙර බොජ්ඣඞ්ගය හා මහා මොග්ගල්ලානත්ථෙර බොජ්ඣඞ්ගය යන පිරිත් සූත්‍රවලින්ද භාග්‍යවතුන් වහන්සේ පවා ගිලන්වූ සමයෙක්හි මහා චුන්ද තෙරණුවන් ලවා බොජ්ඣඞ්ග ධර්ම දෙශනා කරවාගෙණ සුවය ලබාගත් බව චුන්දත්ථෙර බොජ්ඣඞ්ගයෙහිද පෙනේ.

මෙසේ බලනකල බොධ්‍යඞ්ග ධර්ම වැඩීමෙන් හා ඇසීමෙනුත් කෙතරම් ගුණයක් ලැබිය හැකිද යනු දැනගත හැක්කේය. මේ ප්‍රකාශ කරණ ලද්දේ බොධ්‍යඞ්ග ධර්මයන්ගේ තත්ත්‍ව පිළිබඳ සංක්‍ෂෙප විස්තරයකි. දැන් අප මාතෘකාවට අයත් ප්‍රීති සම්බොධ්‍යඞ්ගය ගැන කරුණු ප්‍රකාශ කරණු ලැබේ.

ප්‍රීති සම්බොධ්‍යඞ්ග යනු මෙහි අදහස නම්? ප්‍රීතියම යම් තැනෙක සම්බොධියට කරුණුවී පවත්නේද ඒ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය නම් වේ යනුයි.

ප්‍රීතිහුගේ ලක්‍ෂණාදිය:–

පිණයතීති- "පීති" යනු පීති ශබ්දයෙහි නිරුක්ති හෙයින්
කාය සිත දෙක පිණවානුයි පීති නම් වේ.

ප්‍රීතිය සව්චිත්ත සාධාරණ චෛතසිකයෙකි. එහි ලක්‍ෂණය නම්? සම්පියායන යයි හෙවත් ප්‍රිය කිරීමයි. රසය නම් කාය සිත දෙක්හි පැතිර සිටීමයි.

එළඹ සිටි කරුණ නම් ඔදවැඩි බවයි. ඒ ප්‍රීතිය කුසල් වශයෙන්ද අකුසල් වශයෙන්ද අව්‍යාකෘත වශයෙන්ද විතර්ක විචාර සහිතවද විතර්ක විචාර රහිතවද අවස්ථානුරූප වශයෙන් පවත්නේය.

රන්රිදී මසු කහවනු වස්තුවක් ලැබුනු කල දුගියෙකු කෙබඳු ස්වභාවයක් ඇති වන්නේද ප්‍රීති තොමෝද ආරම්මණ ප්‍රතිලාභයෙහි එබඳු ස්වභාව ඇත්තීය. තමා සමග උපන් චිත්ත චෛතසික ධර්මයන් ඔදවැඩී බවට පමුණුවන්නීය. වාජීකරණ රසායන ඖෂධයකින් ශරීරාවයවයන් පුෂ්ටිමත් කරන්නාක්මෙනි.

පස්වණක් ප්‍රීතිය- ඒ ප්‍රීති තොමෝ ඛුද්දිකා, ඛණිකා, ඔක්කන්තිකා, උබ්බෙගා, ඵරණා යයි පස්වැදෑරුම් වන්නීය; එයින් ක්‍ෂුද්‍රිකා ප්‍රීතිය ශරීරයෙහි ලොමු ඩැහැගන්වන්නීය, හෙවත් මසිල් කෙලින් සිටුවන්නීය, ක්‍ෂණිකා ප්‍රීතිය විටින් විට විදුලි කොටන්නාක් මෙන් උපදින්නීය. ඔක්කන්තිකා ප්‍රීතිය සමුද්‍රතීරයෙහි ඉපිල නැඟ නැඟ බිඳියන් නාවූ රළපතරක් මෙන් ඇතිවන්නීය. උබ්බෙගා ප්‍රීතිය- ශරීරය ඔසවා අහස් කුසයෙහි බහාලන තරම් බලවත් වේ. ඵරණ ප්‍රීතිය පුලුනින් පිරුණු භස්ත්‍රාවක් සෙයින්ද මහවතුරෙන් පිරීගිය පර්වත කුක්‍ෂියක් මෙන්ද සකල ශරීරය පුරවා ඉතිර යන්නීය, උබ්බෙග ප්‍රීතියෙන් අහසින් පවා ගිය පින්වතුන්ගේ අප රට භාග්‍ය සම්පන්නය.

ලක්දිව පුන්වැලි නම් ගමක් විය, මහතිස් තෙරණුවෝ ඒ ගම වැඩවසන්නාහු ශ්‍රද්ධාවෙන් ඇලලී ගිය සිත් ඇත්තෝය. පසලොස්වක් දිනක් විය සවස් වේලෙහි සිය අරමහි සෑ මිදුලට ගිය විට රුවන්වැලිසෑය උන්වහන්සේගේ සිතට නැඟුණේය. එකෙණෙහිම උන්වහන්සේ එදෙසට හැරුණේය. දූත්තම සිවු පිරිසම ඉතා සතුටින් මහසෑය වඳිත්යයි සියැසට පෙණෙන්නාක් මෙන්විය. බුදුගුණ අරමුණු කර සිටිත්ම බලවත් උබ්බෙග ප්‍රීතිය උපන්නේය. එය අනුක්‍රමයෙන් දියුණුවූවා අහසින් ගොස් සෑ මිදුලෙහි පිහිටා සිටිනු දුක උන්වහන්සේම පුදුමයට පත්වූහ.

ගිරිහඬු වෙහෙර සමීපයෙහි වත්තකාලක නම් ගම් එක් කුල දුවකට එසේ අහසින් යා හැකිවිය. බුදුගුණ අරමුණුකොට උපන් බලවත් උබ්බෙග ප්‍රීතිය ඊට ඉවහල් විය. දිනක් ඈගේ මව්පිය වරු බණ අසනු පිණිස යන්ට සූදානම් වී තුඹ ගැබ්බර ඇත්තෙහිය එහෙයින් යා නොහැකිය තුඹට පින් අනුමෝදන් කරවිය හැකිසි. නවතුමයි කියා ඈ ගෙයි නවතා ගියහ. ඕ තොමෝ මවුපියන්ගේ වචනය ඉක්මවිය නොහැක්කී ගෙදර හැවහි සිටිය මුත් සඳපහනේ ගිරිහඬුවෙහි සෑ මිදුල බල බල, සිහියෙහි පමා නොවූවාය. චෛත්‍යයෙහි පහන් දැල්වීමද සුවඳ මල් ආදියෙන් සුදු පැදකුණුකරණ සිවුපිරිසද භික්‍ෂූන්වහන්සේගේ

ගණසජ්ඣායනා ශබ්දයද තමන් ලඟම මෙන් ඇට වැටහුනේය. සමෙතුට මෙබඳු මහොත්සවයකට යාහැකි විනම් හෙතෙම මහා පිණැත්තෙකැයි සිතූ ඇතට උබෙග ප්‍රීතිය හටගත්තේය.

එවිට ඕ තොමෝ අහසින් ගොස් මවුපියන්වත් පෙරාතුව සෑමළුවෙහි පිහිටියාය. ඊට පසු එහි වත් මවුපියවරු ඔණ අසමින් සිටි ඇ දුක, නුඹ කිනම් මගකින් මෙසේ ආවෑදුයි විචාලෝය. මම අහසින් ආමි. මගකින් නොවේයයි කීවාය. අහසින් රහ තන් වහන්සේ මිස නුඹ කෙසේ ආයෙහිද? මම සඳපානේ සෑය බලමින් සිටියෙමි එයින් බලවත් ප්‍රීතියක් ඇතිවිය. එහෙයින් අහසින් එවූනා මිස අනිකක් නොදනිමියි කීවාය මෙලෙසින් උබෙග ප්‍රීතිය අහසින් යන තරම් බලවත් වේ.

මේ පස්වණක් ප්‍රීතිය ඇතිවීමෙන් කය සිත දෙක සංසිදෙයි. එසේ සංසිඳීමෙන් චිත්ත චෛතසික සැපය ලැබේ. සැපවත්වූයේ ක්‍ෂණික උපචාර අර්පණා යන සමාධි ලබයි. එහෙයින් ප්‍රීතිය මහත් වැඩදායක බැව් සැලකිය යුතුය.

ප්‍රීති සම්බොධ්‍යඞ්ගයෙහි දක්වන ප්‍රීතියනම්- නිරාමිෂ ප්‍රීතියයි. එහෙයින් භාවනානුවහි යෙදී වාසය කරණ යම් යොගාවචරයෙක්හට කාමාමිෂ- ලොකාමිෂ- වට්ටාමිෂ රහිතවූ විදර්ශනා සහගත ප්‍රීතියක් උපදීනම් එය ප්‍රීති සම්බොධ්‍යඞ්ගය නමැයි දතයුතුයි.

**ආමිෂත්‍රය.** කාමාමිෂ නම කාමාස්වාද වශයෙන් පැවැත්තාවූ ලොභයයි. ලොකාමිෂ නම-භවවිශෙෂයන් ප්‍රාර්ථනා කිරීම් වශයෙන් පැවැත්තාවූ ලොභයයි වෘත්තාමිෂ නම සංසාරාස්වාද වශයෙන් පැවැත්තාවූ ලොභයයි, කාමාස්වාද වශයෙන් හා භවවිශෙෂයන් පැතීම වශයෙනුත් ලොකයාතුල පවත්නා ලොභය මහත්වේ. ලොකය දුක් කැටියක් නමුත් බොහෝ දෙනාගේ බලාපොරොත්තුව රැගුම් තලක් මෙනි. එහෙයින් චක්ෂුරාදියට ප්‍රියවූ රූපාදී අරමුණක් ලත්කල උපදින්නේ කෙලෙස්සහගත ප්‍රීතියකි. ලොකයා නොයෙක් දුක් විඳින්නේ ඒ පිළිබඳ ආසා වෙනි. කොතරම් ගැහැට ලැබුනත් පස්කම් සැපත ගැන ඇලෙන්නා එයින් නො නැවතෙයි. ඔහුගේ සිත නැමෙන්නේ අලුත් අලුත්වූ හෝ ප්‍රණීත ප්‍රණීතවූ හෝ පස්කම් සුව සෙවීමටයි. තමා කැමැති දේ ලද්දේනම් මහතම ප්‍රීතිමත් වෙයි. එබඳු ප්‍රීතියක් මෙහි අදහස් නොකරණ ලද්දේය.

මෙහි අදහස් කරණ ලද බොජ්ඣඞ්ග ප්‍රීතිය නම- කාම වස්තු සෙවීම ආදියෙන් තොරවූ නිරාමිෂ ප්‍රීතියයි. මේ ප්‍රීති සම්බොධ්‍යඞ්ගය වඩන්නහු විසින් එය විවේකයන් ඇසුරුකරණ

ලද්දක් කොටද කෙලෙසුන් කෙරෙන් නො ඇල්මවූ විරාගය හා තෘෂ්ණා නිරෝධයත් ඇසුරු කරණ ලද්දක්කොටද නිර්වාණයට පිරිණැමීම ඇත්තක්කොටද වැඩිය යුත්තේය. එහෙයින් භාග්‍ය වතුන් වහන්සේ විසින් වදාරණ ලදි-

**පීතිසම්බොජ්ඣඞ්ගං භාවෙති විවෙකනිස්සිතං විරාග නිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ග පරිණාමිං-** යනුයි.

විවෙකය වනාහී කාය විවේක, චිත්ත විවේක, උපධි විවේක යන මොවුන්ගේ වශයෙන් හා තදඞ්ග, විෂ්කම්භන, සමුච්ඡේද, ප්‍රතිප්‍රශ්‍රබ්ධි, නිඃශරණ යන මොවුන්ගේ වශයෙනුත් ප්‍රභෙද හතව පවත්නේය.

**ත්‍රිවිධ විවෙක.** කාය විවේකය නම්- සමාජයෙහි ගැවෙමින් මොහොතක්වත් සිතෙහි එකඟ බවක් නැතිව කෙලෙසුන් කැවිචන පරිද්දෙන් නොසිට සමූහයා කෙරෙන් නික්ම හුදකලාව විසීමයි. පැවිදි බැව් ආදියෙන් එය දියුණු කරගත හැක.

චිත්ත විවේකය නම්- කාමච්ඡන්දාදී කෙලෙසුන් කෙරෙන් දුරුව කසිණ වැඩීම් ආදී සම සතළිස් කමටහන් වැඩීමෙන් සිත කෙලෙසුන්ගෙන් මුදවා ගැණීමයි.

උපධි විවේකය නම්- කාමොපධි, කෙලශොපධි, ස්කන්ධොපධි, අභිසංස්කාරොපධි යන චතුර්විධ උපධීන්ගෙන් වැලකීමයි.

කාමොපධි නම්- කෙලශාශ්‍රිත සැපයට ආධාරවූ රූප ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, යන පඤ්චකාම ගුණයෝය.

කෙලශොපධි නම්- සතර අපාය දුකට ආධාරවත්ව පවත් නාවූ රාග ද්වෙෂ මොහාදී කෙලශයෝය.

ස්කන්ධොපධි නම්- ජාති ජරා මරණාදී දුඃඛයන්ට ආධාරව පවත්නා රූප, වේදනා සංඥා, සංස්කාර, විඥාන යන පඤ්චොපාදාන ස්කන්ධයෝය.

අභිසංස්කාරොපධි නම්- භවදුකට ආධාරවත්ව පවත්නා කුශලාභිසංස්කාර, අකුශලාභිසංස්කාර, ආනෙඤ්ජාභිසංස්කාර යන චේතනා රාශියයි. ත්‍රිලක්ෂණ භාවනා වඩා පූර්වභාග ප්‍රතිපදා බල යෙන් මෙකී චතුර්විධ උපධීන්ගෙන් වැලැක්ම උපධි විවෙක නම් වේ.

**පඤ්චවිධ විවෙකයෝ නම්-** තදඞ්ග, වික්ඛම්භන, සමුච්ඡේද, පටිප්පස්සද්ධි නිස්සරණ යන පසයි. එයින් තදඞ්ග විවෙකය නම්-කුසල් දහම් කරන්නාවූ ඒ ඒ අව ස්ථාවන්හිදී ඊට ප්‍රතිපක්ෂ අකුශලයන්ගෙන් එ[illegible]ට වැලකී

සිටීමයි. වික්ඛම්භන විවේකය නම්- රූපාවචරාදි ධ්‍යාන වඩා අට සමවත් බලයෙන් කෙලෙසුන් ඔබා තැබීමයි. සමුච්ඡෙද විවේකය නම්- සෝවාන් ආදී මාර්ගයන්ගෙන් නැවත නූපදනා පරිද්දෙන් කෙලෙසුන්ගෙන් වැළැක්මයි. ප්‍රති ප්‍රශ්‍රබධි විවේකයම නම්-මාර්ගයෙන් නැසූ කෙලෙසුන්ගේ යම් උණුසුමක්වී නම් එය ඵලයෙහිදී සිදදුවීමයි. නිඃසරණ විවේකය නම්- සියලු නිමිතීන් කෙරෙන් තොරවූ නිවන් අරමුණු කිරීමෙන් කෙලෙසුන්ගෙන් මිදීමයි.

මෙසේ විවේකය ඇසුරු කිරීමෙන් විදර්ශනා වඩා සිතෙහි ඇතිකරගන්නා නිරාමිෂ ප්‍රීතිය "ප්‍රීති සම්බොධ්‍යඞ්ගය" නමැයි දතයුතුයි.

ප්‍රීති සම්බොධ්‍යඞ්ගය උපදවා ගැණීමට හෙතුභූත වන කරුණු එකොලොසකි- එනම්-

බුද්ධානුස්සති; ධම්මානුස්සති, සඞ්ඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති, උපසමානුස්සති, ලූඛ පුග්ගල පරිවජ්ජනතා, සිනිද්ධපුග්ගල සෙවනතා, පසාදනීය සුත්තන්ත පච්චවෙක්ඛණතා තදධිමුත්තතා- යනුයි,

බුද්ධානුස්සතිය. බුදුන් අරමුණුකොට උපන් සිහියයි. සැදැහැති කුලපුත්‍රයාහට බුදුගුණ සිහිකිරීම ශීඝ්‍රාභිෂෙකයකි. බුදුරජුගේ රූපකාය සම්පත්තිය හා ධර්මකාය සම්පත්තියත් සැලකීමේදී බලවත් ශ්‍රද්ධාවක් ඇතිවේ. බුද්ධානුස්මෘතිය වඩන්නහු විසින් විවෙකස්ථානයකට වී මෙසේ සිහිකළ යුත්තේය.

අරහං- අප භාග්‍යවතුන් වහන්සේ සසර පුරුදුයයි කියන ලද වාසනා දෙෂ සහිත සකල කෙලෙසුන් කෙරෙන් දුරුවූ බැවින්ද,

පසේ බුදු අගසව් මහ සව්වන්ගේ රහත් මග නුවණට සම නොවන හෙයින් අසාධාරණවූ රහත් මග නුවණින් සියළු කෙලෙස් සතුරන් ඉතිරි නොකොට නැසූ හෙයින්ද කාම, රූප, අරූප, භව නමැති රියෙහි යෙදූ අවිද්‍යා භව තෘෂ්ණා නමැති නාභියක් ඇති කුශලා'කුශල කර්ම නමැති දූවි ඇති ජරා මරණ නමැති නිම්වළලු ඇති කාමාදී ආශ්‍රව නමැති කඩඇණයක් ඇති පටන්ගත් කාලසීමාවක් නැතිව පෙරළෙමින් පවත්නා සංසාර චක්‍රයාගේ කර්ම නමැති දූවි සියල්ල බෝමැඩ වජ්‍රාසනාරූඪව වීර්‍ය්‍ය නමැති පාදයෙන් සීල නමැති පොළෝ තලය මැඩ ගෙණ හුන්

සේක්. සමාධි නමැති සාණ ගලෙහි ගා මුවහත් තුඩු කර්මක්ෂයකාර ඥාන නමැති මහ පොරොව ප්‍රඥා නමැති දෙ අතින් ගෙණ සුණු විසුණු කළ බැවිනුදු.

තවද අවිද්‍යා නමැති නැබක් ඇති ජරා මරණ නමැති නිම් වළලු ඇති ඒ අතර සවිකළ සඞ්ඛාර විඤ්ඤාණ නාම රූප සළායතන ඵස්ස වේදනා තණ්හා උපාදාන භව ජාති නමැති දැවි දගයන් ඇති අවිද්‍යාමාන හෙයින්ම නොදන්නා ලද පූර්වකාල සීමාව ඇතිතාක් පෙරළෙමින් පැවත ආ පටිච්ච සමුප්පාද නම් වූ භවචක්‍රයාගේ සඞ්ඛාරාදිවූ සියළු දැවි සිඳ බිඳ දැමූ හෙයින්ද.

බ්‍රහ්ම දිව්‍ය මනුෂ්‍ය සිද්ධ විද්‍යාධර යක්ෂ රාක්ෂස නාග ගරුඩ ගන්ධර්වාදීන් විසින් කරණ ලද වන්දනාමාන පූජා සත්කාර ගරුකාරාදීන් ඉවසීමට හා චීවරාදි සිවුපසය පිළිගැණීමට සුදුසු බැවින් ද,

තමන් වහන්සේගේ සිවුරු කොණ අල්වා ගෙණ සිටියත් නරාධමයන් කෙරෙන් දුරුවූ බැවින් හා එසේම තමන් වහන්සේ කෙරෙන් නරාධමයන් දුරුවී ගිය හෙයින් ද,

සාධු ජනයන් කෙරෙන් තමන් වහන්සේ ඈත සිටියත් ඔවුන්ට ආසන්න බැවින් හා තමන් වහන්සේ කෙරෙන් සාධු ජනයන් ඈත්ව සිටියත් තමන් වහන්සේට ආසන්න බැවිනුදු,

කාම, රූප, අරූප, භව චක්‍රයෙහි ගමනා ගමන යයි කියන ලද නැවත නැවත ඉපදීම වැළැක්වූ බැවින් ද,

අසාධාරණවූ අධිශීලාදී ධර්මකාය සම්පත්තියෙන් හා පාරමිතා බලයෙන් සමෘද්ධවූ රූප කාය සම්පත්තියෙන් යුක්ත වන සේකැයි පැසසිය යුතු වන බැවින් ද අර්හත් නම් වන සේක.

සම්මා සම්බුද්ධො. අප සර්වඥ රාජෝත්තමයන් වහන්සේ අන් කිසිවක්හුගේ උපදෙස් නැතිව තුමූම මනා කොට සංස්කාර විකාර ලක්ෂණ නිර්වාණ ප්‍රඥප්ති යයි කියන ලද සර්ව ධර්මයන් අවබොධ කළ බැවින් ද,

ඒකාන්ත සත්‍යවූ චතුරාර්‍ය්‍ය සත්‍යයයි කියන ලද අභිඥෙය ධර්මයන් ද පිරිසිඳ දැනීම පමණක් කටයුතු වූ දුඃඛ සත්‍ය යයි කියන ලද පරිඥෙය ධර්මයන් ද ප්‍රහීණ කිරීම පමණක් කටයුතුවූ සමුදය සත්‍ය යයි කියන ලද ප්‍රහාතව්‍ය ධර්මයන් ද අත් පත් කිරීම පමණක් කටයුතුවූ නිරොධ සත්‍ය යයි කියන ලද

සාක්ෂාත් කර්තව්‍ය ධර්මයන් ද වැඩීම පමණක් කටයුතුවූ මාර්ග සත්‍යයයි කියන ලද භාවයිතව්‍ය ධර්මයන් ද පූර්වභාගයෙහි විදර්ශනා ඥානයෙන් අධිගම ක්ෂණයෙහි මාර්ග ඥානයෙන් අපරභාගයෙහි සර්වඥතා ඥානයෙන් තුමූම මනාසේ දැන වදාළ බැවින් හෝ සත්‍ය ඥාන කෘත්‍ය ඥාන කෘත ඥානයන්ගේ වශයෙන් තුමූම මනාසේ දැන වදාළ බැවින් ද,

මේ ඇස දුඃඛ සත්‍ය නමැයි ද ඇස උපදවාලීමට හේතුවූ පෙර අත්බැව්හී සතස් කළ ලොභය සමුදය සත්‍ය නමැයි ද තදුභය ධර්මයන් නොපැවැත්වීමට හෙතුවූයේ නිරොධ සත්‍ය නමැයි ද එය අත්පත් කිරීමට උපාය ප්‍රඥාදිය මාර්ග සත්‍ය නමැයි ද මෙසේ එක් එක් පදයක් පාසා චතුස්සත්‍ය ධර්මයන්හී නගා තුමූම මනාසේ දැන වදාළ බැවිනුදු,

ඇස, කණ, නාසය, දිව, ශරීරය යන දෙරටූ සයද රූපාදී අරමුනු සය ද චක්ෂුරාදී ටාරයන් හා රූපාදී ආලම්බණයන් නිසා උපදනා වෙදනා සයද එසේම සංඥ සයද චෙතනා සයද ස්පර්ශ සයද විතර්ක සයද විචාරාදී චෛතසිකයන් සදෙන සදෙන ද චක්ෂුර් විඥානාදී සිත් සයද යනාදී ධර්මයන් චතුස්සත්‍යයෙහි නගා තුමූම මනාසේ දැන වදාළ බැවින් ද,

පඤ්චස්කන්ධයන් ද දොළොස් ආයතනයන් ද අටළොස් ධාතූන් ද සතර රූපධ්‍යානයන් ද සතර අරූපධ්‍යානයන් ද දශවිධ අනුස්මෘතීන් ද පිළිකුල් භාවනාව ද සතර බඹ විහරණයද දශ අශුභය ද නවවිධ භවය ද පටිච්ච සමුප්පාදයෙහි දැක්වූ අවිද්‍යාදී දොළොස් අඞ්ගයන් ද චතුස්සත්‍යයෙහි නගා තුමූම මනාසේ දැන වදාළ බැවින් ද,

ක්ලේශ වාසනා දොෂ සහිතව මහත්වූ මොහ නමැති මහ නින්දෙන් මාර්ග ඥාන ප්‍රබොධයෙන් තුමූම මනාසේ පිබිදියාවූ බැවින්ද,

අප තථාගතයන් වහන්සේ බෝමැඩ වජ්‍රාසනාරූඪවූසේක් සූර්‍ය රශ්මිය වැදීමෙන් පිපී ඉබේම මහත් ශොභාවට පැමිණෙන්නාවූ නෙළුම් මලක් මෙන් අසාධාරණවූ අර්හත්මාර්ග ඥානාලොකය වැදීමෙන් පිපී ගියසේක් තුමූම මනාසේ සර්වඥතාඥාන ශොභාවට පැමිණ වදාළ බැවින්ද, සම්‍යක් සම්බුද්ධ නම් වනසේක-

**විජ්ජාචරණ සම්පන්නෝ.** අප සර්වඥ රාජෝත්තමයන් වහන්සේ අෂ්ට විද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්ත වන බැවින් විජ්ජාචරණ සම්පන්න නම් වන සේක.

**පූර්වේනිවාසානුස්මෘති ඥානය.** අප මුනීන්ද්‍රයාණෝ කල්ප අසංඛ්‍ය ගණනකින් මත්තෙහිදු අනුභව කළ විරූ සකන්ධයන් පෙය්‍යාලමෙන් සැඟවූ වාසගමක් මෙන් හකුළුවා සිංහරාජයක්හුගේ පැනපීමක් මෙන් උවමිනා අර මුණුම් අරමුණු කරන්නාවූ ශරභඞ්ග කුමාරයාගේ හීසස ඉලක්ක යෙහි නොවරදින්නාක් මෙන් අතීත ජාතියෙහි කිසි තැනෙක නොවරදින්නාවූ පූර්වේනිවාසානුස්මෘති ඥානයයි කියන ලද පළමු වන විද්‍යාවෙන් යුක්ත වන බැවින්ද විද්‍යාසම්පන්න නම් වනසේක.

**දිව්‍යචක්ෂුරභිඥානය.** අප මුනීන්ද්‍රයාණෝ දිව්‍ය මනුෂ්‍ය තිරශ්චීන ප්‍රෙත නිරය ගතීන්හි චුත වන්නාවූ උපදින්නාවූ හීන ප්‍රණීත සුගතික දුර්ගතික ප්‍රභේද වූ කර්මයට සුදුසු පරිදි විපාක විඳින්නාවූ සත්වයන්ද ප්‍රසාද ඇසට නොපෙණෙන්නාවූ රූපයන්ද දක්නා දිබ්බචක්ඛු ඥාණයයි කියන ලද දෙවන විද්‍යාවෙන් යුක්තවන බැවින්ද විද්‍යාසම්පන්න නම් වන සේක.

**ආශ්‍රවක්ෂයකර ඥානය.** මේ ආශ්‍රවය, මේ ආශ්‍රවයන්ගේ ඉපදීමට ඇති හෙතුය, මේ ආශ්‍රවයන් නැති නිර්වාණය මේ ඊට මාර්ගයයි තත්වූ පරිදි වැටහීම ඇත්තාවූද ජාතිතොම මාහට ප්‍රහීණවීයයිද මාර්ග බ්‍රහමචර්‍ය්‍යාව වැස නිමවීයයිද එක් එක් මාර්ගයක්හුගේ වශයෙන් සතරමඟ විසින් දුක පිරිසිඳ දන්නා පරිඥාභිසමය දුක් ඉපදීමේ හෙතුව නසන අයුරු දක්නා ප්‍රහාණාභිසමය දුක් නැති නිවන් අත් පත් කරණ අයුරු දන්නා සච්ඡිකිරියාභිසමය ඊට මාර්ගය වඩන අයුරු දන්නා භාවනාභිසමය යන සොළොස් කෘත්‍යය කොට නිමවීයයිද ඒ සඳහා මින් පිටත් කෘත්‍යයක් නැතැයි වැටහීම ඇති ආශ්‍රවක්ෂයකර ඥානයයි කියන ලද තුන්වන විද්‍යාවෙන් යුක්ත වන බැවින්ද විද්‍යාසම්පන්න නම් වන සේක.

**විදර්ශනාඥානය.** නාම රූප සකන්ධායතන ධාතු ධර්මයන් සිහිකිරීමෙන් පිළිවෙළින් ලත් දෘෂ්ටි විශුද්ධි නම් විදර්ශනා ඥානය, කඞ්ඛාවිතරණ විශුද්ධි නම් විදර්ශනා ඥානය මාර්ගාමාර්ගඥාන දර්ශන විශුද්ධි නම් විදර්ශනා ඥානය ප්‍රතිපදා ඥාන

දර්ශන විශුද්ධියට ඇතුළත්වූ උදයව්‍යයඥාන භයඥාන ආදීනවඥාන නිර්වේදඥාන මුඤ්චිතුකම්‍යතාඥාන පටිසඞ්ඛානඥාන සංස්කාරො-පෙක්ෂාඥාන අනුලොමඥාන නම්වූත් විදර්ශනාඥාන විද්‍යාවකින් යුක්තවන බැවින්ද විද්‍යාසම්පන්න නම් වන සේක.

**මනොමය ඍද්ධිය.** තවද අප මුනීන්ද්‍රයාණෝ කොපුවෙන් කඩුව අදින්නාක් මෙන් මේ ආත්ම භාවයෙන් සියලු අඟපසඟින් යුත් මනා ඉඳුරන් ඇති ධ්‍යාන චිත්තමය අන්‍යාත්මභාවයක් මවා පාන මනොමයර්ධිනම් විද්‍යාවෙන් යුක්ත වන බැවින්ද විද්‍යාසම්පන්න නම් වන සේක.

**ඍද්ධිවිකුර්වණඥානය.** තවද අප මුනීන්ද්‍රයාණෝ ඍද්ධිය පෑමට වන්නෙහි තමා එකෙකුව සිට බොහෝ දෙනෙකු වන ඍද්ධියද බොහෝ දෙනෙකු මවාපා තමා පමණක් ඉතුරු වන ඍද්ධියද ප්‍රකට භාවය හා අප්‍රකට භාවය කරණ ඍද්ධියද අහසෙහි මෙන් පර්වත ගෘහ භිත්ති විනිවිද නොපැකිළ යන්නාවූ ඍද්ධියද දියපිට කිමිදෙන්නාක් මෙන් පොළොව ගැලීම් ඉල්පීම් කරණ ඍද්ධියද පොළෝතලයෙහි මෙන් ජලයෙහි වඩින ඍද්ධියද අහසෙහි පළඟ බැඳ පක්ෂියකු මෙන් සක්මන් කරණ ඍද්ධියද බඹලොව දක්වා සිය අත්බැවින් වසඟ කරණ ඍද්ධියද යන මේ නානාවිධ ඍද්ධිවිකුර්වණ ඥානයයි කියන ලද විද්‍යාවෙන් යුක්ත වන බැවින්ද විද්‍යාසම්පන්න නම් වන සේක.

**දිව්‍යශ්‍රොත්‍ර ඥානය.** තවද අප මුනීන්ද්‍රයාණෝ දික්මඟකට වන් පුරුෂයෙක් මෙන් බෙර දවුල් වීණාදීන්ගේ ශබ්ද වෙන වෙන අසා දැනගන්නාක් මෙන් දුරවූද ළංවූද දිව්‍යවූද මනුෂ්‍යවූද සියුම්වූද දළවූද ශබ්ද විශේෂ දන්නා දිව්‍යශ්‍රොත ධාතු ඥාන සඞ්ඛ්‍යාත විද්‍යාවෙන් යුක්ත වන බැවින්ද විද්‍යාසම්පන්න නම් වන සේක.

**චෙතොපරිය ඥානය.** තවද අප මුනීන්ද්‍රයාණෝ රාග සහිත සිත් රාග රහිත සිත් ද්වෙෂ සහිත සිත් ද්වෙෂ රහිත සිත් මොහ සහිත සිත් මොහ රහිත සිත් ථීනමිද්ධාදීන් හැකුළුණු සිත් උද්ධච්චාදීන් විහිදුනු සිත් මහද්ගත සිත් අමහද්ගත සිත් ලෞකික සිත් ලොකොත්තර සිත් සමාහිත සිත් අසමාහිත සිත් විමුක්තවූ සිත් විමුක්ත නොවූ සිත් යන මේ සිත් සොළොස දන්නා චෙතොපරිය ඥාන නම් විද්‍යාවෙන් යුක්ත වන බැවින් විද්‍යාසම්පන්න නම් වන සේක.

**ශීලය.** තවද අප මුනීන්ද්‍රයාණෝ කුලයාගේ ශ්‍රද්ධාව කිලිටි කරණ කුලදූෂණ ක්‍රියායෙන් හා චාටු කර්මාදියෙන් වැලකීසේක් ආචාර ගොචර දෙක්හි හැසිරෙන සේක් අභිනමාර්ගී ඵල සමග සිද්ධවූ අධිශීල සඞ්ඛ්‍යාත චරණධර්මයෙන් යුක්තවන සේක.

**ඉන්ද්‍රිය සංවරය.** එසේම රූපාදී සාරම්මණෙහි කෙලෙසුන්ට වස්තුවූ ස්ත්‍රී පුරුෂාදී නිමිති ගැණීමෙන් හා අත්පා සිනා කිණුම් බැලීම් ආදී ආකාර මාත්‍ර ගැණීමෙන් වැලැක්කාවූ ඉන්ද්‍රිය සංවරයයි කියන ලද චරණ ධර්මයෙන් යුක්ත වන සේක.

**මාත්‍රඥතාව.** එසේම, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවන්ට වාල්වූ ඇතැම් මහණ බමුණන් මෙන් මූලින් සිවුපසය කම් නැතැයි කියා වඩ වඩා ලැබගෙණ පරිභොග කිරීම් ආදී මිථ්‍යා ජීවිකාවෙන් දිවිතොරුකා ගම් දරුවන් මෙන් කෙළිකවට පිණිස නොද වළඳා බලමද පුරුෂ මද සඳහා නොවළඳා ආත්මභාවයාගේ දිගු කලක් පැවැත්ම පිණිසත් කුසගිනි නිවීම පිණිස හා ශාසන බ්‍රහ්මචර්ය්‍යා මාර්ග බ්‍රහ්මචර්ය්‍යාවන්ට අනුග්‍රහ පිණිසත් අමුතු බඩගිනි නූපදවාලීම පිණිසත් ශරීර යාත්‍රාව නිවරද බව ඉරියව් යැපීම හා සැප විහරණ පිණිසත් කැප භොජනය පමණ දැන වැළඳීමයයි කියනලද භොජන මාත්‍රඥතා චරණ ධර්මයෙන්ද යුක්ත වන සේක.

**ජාගර්ය්‍යානුයොගය.** එසේම දහවල් වැඩ හිඳීමෙන් හා සක්මණින්ද රාත්‍රියෙහි පෙර පැදුළ යම්හී හිඳීමෙන් හා සක්මණින්ද ගතකොට පඤ්චනීවරණයන්ගෙන් මුක්තවූ පිරිසිදුවූ සිත් ඇතිවැ අළුයම් වේලෙහි නැඟී සිටීම් යන අදහසින් සිහිනුවණින් යෙදී මැදුම්යම්හී දකුණු සිරිපය මත්තෙහි වත් සිරිපය මදක් වකුවූකොට තබා දකුණැලයෙන් සැතපී වදාරණ ජාගර්ය්‍යානුයොගයනම් චරණ ධර්මයෙන් යුක්තවන සේක

**ශ්‍රද්ධාදිචරණධර්ම** අප මුනීන්ද්‍රයාණෝ සර්වඥතාඥානය ඇදහීමෙන් පිරිසිදුවූ ශ්‍රද්ධා චරණ ධර්මයෙන්ද, අශුචියක් මෙන් පවට පිළිකුල් කරණ ලජ්ජා චරණ ධර්මයෙන්ද පාපයට භයවන අපත්‍රපා චරණ ධර්මයෙන්ද අන් කිසිවකු හා සමනොවූ බහුශ්‍රැතභාව චරණ ධර්මයෙන්ද ඉතා දැඩිවූ වීර්ය්‍ය චරණ ධර්මයෙන්ද අතිශයින් තීක්ෂණවූ ස්මෘති චරණ ධර්මයෙන්ද අසාධාරණවූ ප්‍රඥා චරණ ධර්මයෙන්ද නිරායාසයෙන් ලත් ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ්‍යාන යන චරණ ධර්ම සතරින්ද යුක්ත වන සේක.

**සුගතො.** අප තථාගතයන් වහන්සේ රහත් මග නමැති ශොභන ගමනින් නිවණට වැඩ වදාළ බැවින්ද දිවකුරු පාමුල්හි පටන් බෝමැඩ බුදුවීම දක්වා සාරාසැකි කප් ලකක් මුළුල්ලෙහි පෙරුම් පුරණ සේක් ශාශ්වතාදි සතර අන්තයට නොබැස ආර්ය්‍ය ප්‍රතිපත්ති මාර්ගයෙන් වැඩ වදාළ බැවින්ද තරුණ හිරු රැස් සේ දිලිසෙන මහා පාංශුකූල චීවරය ශ්‍රී ශරීරයෙහි ගැටවටු ගන්වා පෙරවා ගෙණ ජාල ලක්ෂණයෙන් විරාජමාන ශ්‍රී හස්තයෙන් සෙල්මුවා පාත්‍රය ගෙණ දේදුනු පිරිවැරූ මේරගිර මෙන් වඩනා ශොභන ගමන් ඇති බැවින්ද බුද්ධවෙස් ලේසයකින් දෙවියන් සහිත ලොකයාගේ ශ්‍රී විලාසය මඩිමින් මගට බැස වඩිනා ශොභන ගමන් ඇති බැවින්ද ලොකොත්තරවූ නිර්වාණ ධාතුනම් සුන්දර ස්ථානයට වැඩමකළ බැවින්ද, බොධිමණ්ඩන භූමියවූ අචලස්ථානයට වැඩමකළ බැවින්ද, නැසූ කෙලෙසුන් නොපෙරලා එනසේ වැඩවදාළ බැවින්ද, සිවුපිරිස මැද කෙශරසිංහ රාජයකු මෙන් භය රහිතව අෂ්ටාංග ස්වරයෙන් බ්‍රහ්මස්වර විහිදුවා මූල භාෂානම් ලද මගධ භාෂාවෙන් දෙසන ලද වචන විලාස ඇති බැවින්ද සුගතනම් වන සේක.

**ලොකවිදූ.** නවද අප සර්වඥයන් වහන්සේ ලොක ලක්ෂණ යයි කියන ලද දුඃඛ ස්වභාවාදි වශයෙන් ලොව ඉතිරී නොකොට දත් හෙයින්ද මේ සවිඤ්ඤාණක ශරීරයෙහිම ලොකයත් ලොකසමුදයත් ලොකනිරොධයත් ලොකනිරොධ ගාමිනී ප්‍රතිපදාවත් දැන වදාළ බැවින්ද සත්වයන්ගේ චරිත නානත්වය හා අධිමුක්ති නානත්වාදියත් දැන වදාළ බැවින්ද

ආකාර සටිතිකවූ එක් වැදෑරුම් ලොකාදි සවිඤ්ඤාණක සංස්කාර ලොකයද රන්රිදී මුතුමැණික් ගස්වැල් ආදී අනින්ද්‍රියබද්ධ වස්තුන්ද යනාදි ස්වතුබිලයෙන් හටගත් අවිඤ්ඤාණක සංස්කාර ලොකයද හිමවත අටමහ නිරය ගුරුළු විමන් හා බ්‍රහ්ම දිව්‍ය භවනාදීන්ගේ ලොකප්‍රමාණයද පස් පොළොවෙහි ජල පොළොවෙහි වාපොළොවෙහි ප්‍රමාණයද දිවයින්, ගඞ්ගා, ඇළ, දොළ, මුහුදුවල ප්‍රමාණයද සත්කුලපව්, මහාමේරු පර්වතාදීන්ගේ හා කල්පවෘක්ෂ, සූර්ය්‍ය, චන්ද්‍ර, ග්‍රහ තාරකාවන්ගේ ප්‍රමාණයද උඩ යට සරස දිසානු දිසාවෙහි ඇතිතාක් භාජන ලොකගතවූ සියළු ධාතුධර්මයන් ඉතිරි නොකොට දත් හෙයින්ද

ආශයානුශයාදි වශයෙන් සත්වලොකයද ආහාරාදි වශයෙන් සංස්කාර ලොකයද දිගු පුළුල් ආදි වශයෙන් අවකාශ ලොකයද දැන වදාළ බැවින් ලොකවිදූ නම් වන සේක.

**අනුත්තරෝ පුරිසදම්ම සාරථී.** අප තථාගතයන් වහන්සේ අධිශීල අධි සමාධි අධි ප්‍රඥා සම්පත් මුල්කොට ඇති ගුණයෙන් තමන් හා සමවූ පුද්ගලකු නැති බැවින්ද අසමවූ බුදුවරයන් හා සමවූ හෙයින් අසම සමවූ අනන්ත ගුණයන්ගෙන් අනුත්තරවූ සේක් දමුනාවූ හා දමනය කටයුතුවූ පුද්ගලයන් දමනය කළ බැවින්ද අසුන් හික්ම වන්නකු මෙන් නොයෙක් උපායයන්ගෙන් සත්වයන් හික්මවන බැවින්ද,

කොසල බිම්බිසාරාදී නොයෙක් ක්ෂත්‍රිය රජවරුන්ද කූට දත් පොකුරු සඳු ආදී බ්‍රාහ්මණයන්ද උපාලි ආදී ගෘහපතීන්ද සච්චක ආදී නිගණ්ඨයන්ද සභිය සුභ ආදී ශ්‍රමණ/පරිබ්‍රාජකයන්ද උරුවෙල කසුප් ආදී ජටිලයන්ද ආලවක ආදී යක්ෂ රාක්ෂස යන්ද වෙපචිත්තිකාදී අසුරයන්ද ශක්‍රාදී දෙවියන්ද. බක බ්‍රහ්මාදී බ්‍රහ්මයන්ද, ධනපාල නම් හස්තිරාජය අපලාල නම් නාගරාජය අරවාලා නන්දෝපනන්ද චූලෝදර මහෝදර ධූම්ශිඛ අග්නිශිඛ යනාදී නාගරාජයන්ද හික්මවූ හෙයින්ද,

දක්ෂවූ රථාචාර්යයකු මෙන් වෛනෙය්‍ය බන්ධුජනයන් ආර්ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග වීථියෙන් බබලන්නාවූ නිර්වාණ ක්ෂෙම පුරයට ප්‍රතිපත්ති රථයෙහි නන්වා මෙහෙයූ බැවින් අනුත්තර පුරිසදම්ම සාරථි නම් වන සේක.

**සත්ථා දෙවමනුස්සානං.** අප භාග්‍යවතුන් වහන්සේ ජාතිකාන්තාරාදියෙන් එතර කිරීමෙහි දෙව් මිනිසුන්හට සාර්ථවාහකයකු මෙන් වන හෙයිනුදු දෙව් මිනිසුන්හට අනුශාසනා කොට ඔවුන්ගේ ජාත්‍යාදි දුක් නසන හෙයිනුදු,

අනුකම්පා ඇති සාත්තු නායකයෙක් චෞර කාන්තාර නිරුදක කාන්තාර අමනුෂ්‍ය කාන්තාර ව්‍යාල කාන්තාරයන්ට බටුවාවූ ජන සමූහයා එතර කොට ක්ෂෙම භූමියට පමුණුවන්නාක් මෙන් සංසාර දුඃඛයෙන් පීඩිත සත්වයන් ජාති, ජරා, ව්‍යාධි, මරණ ශොක කාන්තාරාදියෙන් එතර කොට නිර්වාණ ක්ෂෙම භූමියට පැමිණවූ හෙයින් ද,

බ්‍රහ්මයන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ මේ සත්ව ලොකයට මෙලෝ පරලෝ අර්ථයෙන් හා ලොකොත්තර අර්ථයෙනුත් අනුශාසනා කරණ හෙයින් ද,

බහා තබන ලද ශස්ත්‍ර ඇතිසේක් ශස්ත්‍ර ගත් පුරුෂයෙක් දුබලවූ සතුරන් වනසන්නාක් මෙන් සත්වයන්ගේ ජාති ජරා ව්‍යාධි මරණාදි දුඃඛයන් නිසා භවගත් භය සන්ත්‍රාසාදිය නැසූ බැවින්ද ශාස්තෘ නම් වන සේක.

බුද්ධෝ. අප භාග්‍යවතුන් වහන්සේ පූර්වජාතියෙහි නො ඇසූ විරූ සංස්කාර විකාර ලක්ෂණ නිර්වාණ ප්‍රඥප්ති යන පඤ්චවිධ ඥෙය මණ්ඩලයෙහි ලා ගුරූපදේශයක් නැතිව පළමුකොට චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබෝධකළ හෙයින්ද, ඒ පඤ්චවිධ ඥෙය මණ්ඩලයෙහි සර්වඥ බවට පැමිණ වදාළ බැවින්ද, දශවිධ තථාගත බලයන්හී වසඟ බවට පැමිණ වදාළ බැවින්ද, මෙරමා හට සිවුසස් අවබෝධ කරවන දේශනා ඥාන යක් ඇති බැවින්ද, තමන් එය දැන වදාළ අවබෝධ ඥානයක් ඇති බැවින්ද සියලු දතයුතු ධර්මයන් දැන්මෙහි සමර්ථ ප්‍රතිවෙධ ඥානයක් ඇති බැවින්ද අන්වර්ථ නිරුක්ති ව්‍යවහාරයෙන් බුද්ධ නම් වන සේක.

තවද තමන් ලත් රහත්මග නුවණින් කෙලෙස් සතුරන් සුන්කළ බැවින්ද නින්දෙන් පිබිදියෙක් මෙන් කෙලෙස් මහ නිදිබරින් පළමුකොට පිබිදි බැවින්ද බුද්ධ නම් වන සේක

භගවා. අප සුගතයන් වහන්සේ ලොවී ලොවුතුරා සැප සාදදෙන්නාවූ පාරමිතා සඞ්ඛ්‍යාත භාග්‍ය ධර්මයන් සකස් කළ බැවින්ද, දෙවපුත්‍ර මාරයාගේ බලය හා කෙලෙසුන් නැසූ බැවින්ද, ලොභාදී පාප ධර්මයන් භග්න කල බැවින් ද,

තවද මහත්වූ ආත්ම භාවයක් අනුමාත්‍රයක් කොට පානා අණිමා නම් ඓශ්වර්ය භගයෙන් ද සැහැල්ලු නොවූ ආත්ම භාවයක් අහස්හී යාහැකිසේ සැහැල්ලු කොට පානා ලඝිමා නම් ඓශ්වර්ය භගයෙන් ද ආත්ම භාවයාගේ මහත් බව ගෙණහැර පානා මහිමා නම් ඓශ්වර්ය භගයෙන් ද සෑදිය කිරීමෙහි වසත බව පානාවසිතා නම් ඓශ්වර්ය භග්යෙන් ද කැමැති තැනකට පැමිණීම යයි කියන ලද ප්‍රාප්ති නම් ඓශ්වර්ය භගයෙන් ද සුහුව අදහස් සාළ කටයුතු නිමා කොට පානා ප්‍රකාම්‍ය නම් ඓශ්වර්ය භගයෙන් ද සියල්ල වසඟ කිරීමේ පරමේශ්වරත්වය ඇති ඊශිතා නම් ඓශ්වර්ය භගයෙන් ද අහස් ගමනින් හෝ පියවි ගමනින් හෝ වඩනා කල අභිමත ක්‍රියාවන් නිමාකොට ගෙණ හැර පානා යත්‍ර කාමාවසායිතා නම් ඓශ්වර්ය භගයෙන් ද යන අෂ්ට ප්‍රකාර ඓශ්වර්ය භගයෙන් යුක්ත වන බැවින් ද,

සතර මග සතර ඵල නිවණ යන ලොකොත්තර ධර්මභගයෙන් යුක්ත බැවින් ද අසාධාරණ කීර්ති සඞ්ඛ්‍යාත යශස් භගයෙන් යුක්ත බැවින් ද නිරූපම රූප විලාසය සඞ්ඛ්‍යාත ශ්‍රී භගයෙන් බැවින් ද එසේම යථා කාමාර්ථ සිද්ධි භගය, පාරමිතා වීර්ය සම්‍යක්

ව්‍යායාම සඞ්ඛ්‍යාත ප්‍රයතන භගය යන මෙයින් හා ධර්ම කාය සම්පත්තිය රූප කාය සම්පත්තිය යන සුභාග්‍ය ගුණයෙන් යුක්ත බැවින් ද භගවත් නම් වන සේක.

**ධර්මානුස්මෘතිය.** අප භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කර වදාළ සූත්‍ර අභි ධර්ම විනය සඞ්ඛ්‍යාත ත්‍රිපිටක පර්‍ය්‍යාප්ති ධර්මය ද සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් යන සතර මග සතර ඵලය හා නිර්වාණ යන නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය ද මුල මැද අග යන තුන් තැන්හි යහපත්ය යනාදි සිය ගණන් ගුණාඞ්ගයන්ගෙන් සරසා මනා කොට දේශනාකළ බැවින් 'ස්වාක්ඛාත' නම් වන සේක.

අන් කෙනෙකුන් විසින් විශ්වාස කරවිය යුතු නොවූයෙන් මේ මේ ආර්‍ය්‍ය මාර්ගයෙන් මාගේ අභ්‍යන්තරයෙහි පැවැති රාගාදි කෙලශයෝ ප්‍රහීණවූහයි ආර්‍ය්‍ය පුද්ගලයන් තුමූම දතයුතු බැවින් 'සන්දිට්ඨික' නම් වන සේක.

ලෞකික කුශල ධර්ම මෙන් කල් නොයවා මාර්ග සිතට අනතුරුවම ඵල සිත ඇතිවන නිසා එකෙණෙහිම විපාක දෙන බැවින් අකාලික නම් වන සේක.

පහවූ වලා පටල ඇති අහසෙහි දිලිහෙන පුන්සඳ මඬලක් සෙයින් එව බලවයි කීමට සුදුසු බැවින් 'ඒහි පස්සික' නම් වන සේක.

භාවනා කිරීම් වශයෙන් තමාගේ සිත්හි උපදවා ගැණීමට ද අත්පත් කිරීම් වශයෙන් තම සිත්හි අරමුණු කිරීමට ද යොග්‍යවූ බැවින් 'ඕපනයික' නම් වන සේක.

උද්ඝටිතඥ විපඤ්චිතඥ නෙය්‍ය යන සියළු නැණවතුන් විසින් තම තමා කෙරෙහි එලවා මා විසින් මේ මේ මාර්ග ධර්මය වඩන ලදය මේ මේ ඵල ධර්මය අධිගතය; නිර්වාණය අත්පත් කරණ ලදූයි දතයුතු වන හෙයින් 'පච්චත්ත වෙදිතබ්බ' නම් වන සේක

**සඞ්ඝානුස්මෘතිය.** අප භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍රවූ ශ්‍රාවක සඞ්ඝතෙම පිළිවෙත් අනුව මනාකොට පිළිපැද වාසය කරණ හෙයින් 'සුපටිපන්න නම් වන සේක, කාය වංකාදියක් නැතිව සෘජුව පිළිපන් හෙයින් 'උජුපටිපන්න' නම් වන සේක, මිථ්‍යාජීවය ගිනිමෙන් දුරු කොට නිවන් පිණිස ආර්‍ය්‍ය මාර්ගයෙහි පිළිපන් හෙයින් 'ඤායපටිපන්න' නම් වන සේක, දුක හුනස්නෙන් නැගිටීම ආදී ආදර ක්‍රියාවන්ට සුදුසු ලෙස පිළිපදින හෙයින් 'සාමීචි පටිපන්න' නම් වන සේක.

යම් මේ පළමුවන මග පලලත් පුරිස් යුවලය දෙවන මගපල්ලත් පුරිස් යුවලය තුන්වන මග පලලත් පුරිස් යුවලය සතරවන මග පලලත් පුරිස් යුවලය යන පුරුෂ යුග ශ්‍රොතාපත්ති මාර්ගස්ථය, ඵලස්ථය, සකෘදාගාමි මාර්ගස්ථය ඵලස්ථය, අනාගාමි මාර්ගස්ථය ඵලස්ථය, අර්හත් මාර්ගස්ථය ඵලස්ථය යන පුරුෂ පුද්ගලයෝ අට කොටස් කෙනෙක් ඇද්ද භාග්‍යවතුන් වහන්සේගේ ඒ මේ ආර්‍ය්‍ය ශ්‍රාවක සඞ්ඝතෙම ඉතා දුර සිට පවා ගෙණවුත් සිල්වතුන්ට දිය යුතුවූ "ආහුන" නම් ලද චීවර පිණ්ඩපාත සෙනාසන ගිලාන ප්‍රත්‍යය යන සිවුපසය පිළිගැණීමට සුදුසු වූ හෙයින් ආහුනෙය්‍ය නම් වන සේක.

ආදරයෙන් කරණ ලද ආගන්තුක සත්කාරයට සුදුසු හෙයින් 'පාහුණෙය්‍ය' නම් වන සේක.

පරලොව සඳහා දෙන ලද සිවුපස සඞ්ඛ්‍යාත දක්ෂිණාව පිළිගැණීමට සුදුසු හෙයින් 'දක්ඛිණෙය්‍ය' නම් වන සේක.

සියළු ලෝවැස්සන් විසින් දොහොත් මුදුනෙහි තබා කරණ ලද නමස්කාරයට සුදුසු හෙයින් 'අඤ්ජලිකරණීය' නම් වන සේක.

සකල ලොකයාහට පින් නමැති බිජු වැපිරීමට කෙතක් සමාන හෙයින් ලොකයාගේ නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍රය වන්නේය,

සීලානුස්මෘතිය. තමන් විසින් රක්නා ලද ශීලයාගේ පිරිසිදු බව සිහි කිරීමයි, මාගේ ශීලය නොකැඩුනේය, සිදුරු නූනේය, අතරතුර වෙන් වෙන් වණී නැති බැවින් අසබලය කබර රහිය පණ්ඩිතයන් විසින් පසස්නා ලද්දේය. තෘෂ්ණා දෘෂ්ටින් පරාමර්ශනය නොකරණ ලදය යනාදි වශයෙන් ශීලයෙහි ගුණ සිහිකිරීමයි.

ත්‍යාගානුස්මෘතිය. දන් දීම සිත සතුටු කර ගතහැකි ගුණයකි. යොගාවචරයකු විසින් පවා ප්‍රතිග්‍රාහකයකු ලත් කල්හී එක් පිඩක්වත් දන් නොදී නොවළඳමියි ත්‍යාග ගුණයෙහි පිහිටා ගුණ විශිෂ්ටයෙකුට හැකි පමණින් දන් දී එහි අනුසස් සැලකීම ත්‍යාගානුස්මෘතිය නම් වේ. ත්‍යාගය වනාහි මසුරු මල දුරුකර ගැණීමෙන් භොග සාරය ලබා ගතහැකි ගුණයක් බැවින් දීමෙහි අනුසස් දක්නවුන් විසින් පුරුදු කර ගෙණ නිතර සිහි කළ යුත්තකි.

දෙවතානුස්මෘතිය දෙවියන් සාක්ෂිස්ථානයෙහි තබා ගෙණ තමාගේ ශ්‍රද්ධාදී ගුණයන් සිහි කිරීමයි, සැපතින් අග්‍ර හෙයින් දෙව්ලොව මිනිස් ලොවට වඩා උසස්

වන්නේය, චාතුර් මහාරාජිකය තාවතිංසය යාමය තුසිතය නිර්මාණ රතිය පරනිර්මිත වසවර්තියයි දෙව්ලෝ සයකි. එහි උපන් දෙවියන්ට බොහෝ ආයුෂ ඇත්තේය. එහි දෙව්ව ඉපිද සිටින්නෝ පෙර මිනිස් ලොවදී පින්කර ගත් මනුෂ්‍යයෝය. ඒ මනුෂ්‍යයෝ යම් බඳු ශ්‍රද්ධාවකින් ශීලයකින් එසේ දෙව්ව උපන්-නාහු නම් මටත් එබඳු ශ්‍රද්ධා ශීලාදි ගුණයෝ ඇත්තාහුය. මෙසේ දෙවියන් සාක්ෂිස්ථානයෙහි තබමින් ශ්‍රද්ධාදී ගුණ ධර්ම දියුණුවන සේ සිහි කිරීම දෙවතානුස්මෘතියයි.

**උපසමානුස්මෘතිය** රාග, ද්වේෂ, මෝහාදි කෙලෙසුන්ගේ සංසිඳීයෑම සිහි කරලීමයි. සමාපත්තියෙන් මැඩපැවැත්වූ කෙලෙස් වශී ගණන් යටපත්වී සිටිති. සියළු සංස්කාරයෝ සන්සිඳීම ඇති සියළු උපධීන්ගේ ප්‍රහාණය ඇති තෘෂ්ණාවගේ ක්ෂයවීම ඇති විරාගයයි කියන ලද යම් නිර්වාණයක් ඇද්ද මෙය ශාන්තය මෙය ප්‍රණීතයයි එසේ සැලකීමෙන් උපසමානුස්මෘතිය වැඩිය යුත්තේය.

**රූක්ෂ පුද්ගලයන් දුරලීම.** ශ්‍රද්ධාවෙන් තොරවූ ද චෛත්‍ය-බෝධි විහාරාරාමයන්හී නොසරුප් අඳමින් හැසිරෙන්නාවූ ද ඊට තිසි ගෞරව නොකිරීමෙන් විහාරමළු ආදියෙහි වහන් පයලා කුඩ ඉහලා ගෙණ යන්නාවූ ද බුද්ධාදී රත්නත්‍රය කෙරෙහි ප්‍රසාදයක් නැත්තාවූ මනුෂ්‍යයෝ රෞද්‍ර පුද්ගලයෝය. ඔවුන් හා ආශ්‍රය භජනය පයිරුපාසනාදියෙන් වෙන්වීම ද පීති සම්බොධ්‍යඞ්ගය දියුණු කර ගැණීමට මාර්ගයකි.

**සිනිඳු පුද්ගලයන් සේවනය කිරීම.** බුද්ධාදීන් කෙරෙහි භක්තිමත් ශ්‍රද්ධාවත් ගුණවතුන් සේවනය කිරීම කුසල ප්‍රීතිය දියුණුවීමට හේතුවකි.
අවවාදයට නැමෙන්නාවූ ද වැඩිහිටියන්ට ගරු කරන්නාවූ ද සන්සුන් කායවාක්ප්‍රයෝග ඇත්තාවූ ද පුද්ගලයන් සේවනය කිරීමෙන් තමාගේ සිත බොධ්‍යඞ්ග ධර්මයන් කරා නැමිය හැකි වන්නේය. සන්සුන් ඉඳුරන් ඇති මෘදු මොලොක් පුද්ගලයා මීයුමක් මෙන් සිනිඳු වන්නේය. තදත්‍යයා ගලක් මෙන් ගොරෝසුය. මෘදු ඉඳුරන් ඇති නැනැත්තා සඳ මඬලෙහි පවත්නා ප්‍රසාද ජනක සෞම්‍ය ගුණය පමා පරයා ලෝවැස්සාගේ සිත දිනා ගන්නේය.

**ප්‍රසාදය දියුණු වන සූත්‍ර ධර්ම සිහි කිරීම.** රත්නත්‍රයෙහි ගුණ ප්‍රකාශක සූත්‍ර ධර්මයන් ඇසීම ද ප්‍රීති සම්බොධ්‍යඞ්ගයාගේ ලැබීමට හේතුවකි. යමසේ

සක්විතිරජකු පහළවූ කල්හි මිනිස් ලෝමැස්සෝ සුවඳ මල් ආදිය ගෙණ යකුන් ඇදගීම දෙවියන් ඇදගීම පිණිස යක්ෂ භූත ස්ථාන වලට නොගොස් චක්‍රරත්නය වෙතම අවුත් පුදද්ද එසෙයින්ම ලොකයෙහි බුදුන් උපන් තැන් සිට මහානුභාව සම්පන්න මහෙ ශාක්‍ය දිව්‍ය මනුෂ්‍යයන් අන් නොනෙකුන්ට පූජා සත්කාර නොකොට බුද්ධ රත්නයටම පුද සිරිත් පවත්වති. මෙසේ බුද්ධාදී රත්නත්‍රයයෙහි ප්‍රසාදය දියුණු වන සූත්‍ර කොටස් සිහිකර බැලිය යුත්තේය.

**ධර්මයට නැඹුරුව විසීම** ඉඳුම් හිටුම් ආදී හැම ඉරියව්වෙහිම ප්‍රීති සම්බොධ්‍යඞ්ගය තමාගේ චිත්ත සන්තානයෙහි උපදවා ගැණිම පිණිස නැමුනු බැඳුනු බරවුනු සිත් ඇති බව තිවත් අවබොධ කරගැණීමට අතිශයින් ඉවහල්වේ.

මෙසේ මේ කරුණු එකොළොස දියුණු කර ගත්තාවුන්ගේ සිත රාග, ද්වෙෂ, මොහයෙන් මඬනා ලද්දේ නොවෙයි. බුදු සස් නෙහි ඍජුව පිහිටන්නේය. රාගාදීන් පහළ නොවනවිට යට කරණ ලද පසුව නීවරණ ඇත්තාහු බුද්ධ ගුණයට නැඹුරුවූ විතර්ක විචාරයෝ වෙති බුදු ගුණ සිතට නගනාවිට ප්‍රීතිය පහළ වෙයි. ප්‍රීති වන්නහුගේ කාය චිත්තදරථයෝ සංසිඳෙති. දරථ නැත්තහුව කාය චිත්ත සැපත පහළ වෙයි. සැප ඇත්තහුගේ සිත සමාධිගත වෙයි. සමාධි ගතවූයේ ධ්‍යාන ලැබීමෙන් හා මාර්ග ඵල උපදවා ගැණීමෙන් දුක් කෙළවර කර ගණියි. විශෙෂාධි ගමයක් නොලදහොත් ස්වර්ග සම්පත්තියට හිමිකාරයෙක් වෙයි.

එබැවින් සැදැහැතියන්ගේ ප්‍රසාද සංවර්ධනය පිණිස තෙරුවන් කෙරෙහි බලවත් ප්‍රසාදයෙන් උදාරතර ප්‍රීතියක් උපදවා ගත් උතුමෙකු පිළිබඳ කථා වස්තුවක් මීලඟට දක්වනු ලැබේ.

**ප්‍රීතියෙන් උසස් වූවෙක්.** පෙර සකල සම්පත්තියෙන් සමෘද්ධවූ වෙහලිඞ්ග නම් නියම්ගමෙක් විය. එක් කලෙකදී කාශ්‍යප බුදුරජාණන් වහන්සේ එනම ඇසුරුකොට විසූ සේක. උන්වහන්සේට ඉතා භක්තියෙන් උපස්ථාන කරන්නාවූ ඝටීකාර කුම්භකාර නම් අනාගාමී උපාසක කෙනෙක් එගම විසූහ. ජොතිපාල නම් ඕහුගේ මිත්‍රයෙක් විය. හෙතෙම ධන වතෙක් වෙදත්‍රයෙහි පරතෙරට පැමිණියේ භූමියෙහි මෙන්ම ආකාශයෙහිද ප්‍රසිද්ධ විය.

දිනක් ඝටීකාර උපාසක තෙමේ ජොතිපාල මානවකයා අමතා කසුප් බුදුරජ දකින්නට යම්හයි කීය. නමුත් ජොතිපාල මානවකතෙම ඊට අකමැතිවිය දෙවනු තෙවනුවත් ඇමතූ නමුත්

සතුටු කරවාගත නොහැකි විය. දිනක් සනානය සඳහා ගඟට ගොස් එන අතරද බුදුන් දකින්ට යම්හයි කථාකොට අසතුටු වූ යෙන් ඝටීකාර උපාසක තෙමේ ජොතිපාල මානවකයාගේ කෙස් පතින් අල්වා විහාරයට යම්හයි ඇද්දේය. ඉක්බිති ඔහුට මෙබඳු සිතක් විය. මෙය පුදුමයකි. මින්පෙර මෙබන්දක් කිසිදිනෙක මාහට නොවිය, මෙහි යහපතක් තිබිය හැක එහෙනම් යම්හයි කල්‍යාණ මිත්‍ර ඝටීකාර උපාසක තැන හා දෙදෙනම ගොස් බුදුන් වැඳ එකත්පසෙක හුන්හ.

ඝටීකාර තෙම බුදුරජුට මෙසේ කීය. ස්වාමීනි! මේ ජෝති පාල මානවක තෙම මාගේ යහලුවෙක! මොහුට ධර්මදෙශනා කළ මැනවැයි බුදුරජ තෙම දහම් දෙසී. දෙදෙනම බණ අසා සතුටුව බුදුන් වැඳ ගියහ. ජෝතිපාල මානවක තෙම සසරෙහි කළකිරුණේය. යහළුව! නුඹ මෙතරම් බණ අසාත් පැවිදි නොවී සිටින්නේ මන්දැයි යහලුවාගෙන් ඇසීය. ඇයි මිත්‍රය නොදන් නෙහිද? මම අන්ධවූ මව්පිය දෙදෙනා පොෂ්‍ය කරන්නෙමි එහෙනම් මම පැවිදි වන්නෙමියි ජෝතිපාල තෙම බුදුරදුන් සමීපයෙහි පැවිදිවිය.

ඉක්බිති බුදුරජ බරණැස් නුවරට වැඩ ඉසිපතනාරාමයෙහි වැඩවාසය කෙළේය. කසීරජ තෙම ඒ අසා උන්වහන්සේ වෙත එළඹ බණ අසා පසුවදා බුදුපාමොක් මහසඟහ සිය මැඳුරට වැඩමවා දන්දී එනුවර වස්වසන ලෙස බුදුරදුන්ගෙන් අයැද සිටියේය. බුදුරජ එය නො ඉවසූ කල්හි ස්වාමීනි! ඔබ වහන්සේට මා හා සමාන උපස්ථායකයෙක් ඇද්දැයි විචාළේය මහරජානෙනි! වෙහලිංග නම් නියම්ගම ඝටීකාර නම් උපාසක යෙක් වෙසෙසි. හෙතෙම මාගේ අග්‍රඋපස්ථායකයෙක් වේ. හෙතෙම ඇස් අන්ධව සිටින මව්පිය දෙදෙනා පොෂ්‍යකරන්නේය එක්දිනක් මම ඝටීකාරයාගේ නිවසට ගියෙමි අන්ධවූ මව්පිය දෙදෙ නාගෙන් ඝටීකාරයා කොහිදැයි විචාළෙමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස වැඩඉඳිනාසේක්වා මපුතනුවෝ ගමනක්ගියේය. මෙ ගෙයි ආහාර පිළියෙළකර ඇත. ස්වාමීනි! ඒ රැගෙණ වැළඳුව මැනවයි මම එබස පරිදි ගෙට වැඩ වළඳා නුකස්නෙන් නැඟිට ආයෙමි. ඝටීකාරයා ගෙට වන්විට ඒ බැව් දැන මෙසේ සිතුවේය. ඒකාන්තයෙන් මට ලාභයෙක. බුදුරජාණන් වහන්සේ මෙසේ අතිශය කරුණාවෙන් විශ්වාසවූයේයයි උපාසකතෙම අඩමාසයක් ප්‍රීති සැපය කොහළේය.

නැවත දිනක සවස් වේලෙහි වැඩමවූ කසුප් බුදුරජානෝ ඝටීකාර් උපාසක තෙම් නො හමුවී. අද මව්පියන්ගේ ආරාධනා

පරිදී- තමන්වහන්සේම ගෙට ගොස්- ගිතෙල්, මී, සකුරු ඈ වළඳ, වැඩිසේක ගෙට පැමිණි උපාසක තෙම පෙර සේම අසා ප්‍රීතිමත්ව; අඩමසක් ප්‍රීති සැපයෙන් කල්ගත කෙළේය.

මහරජ එක් කලෙක මම වෙහලිඞග නම් නියම්ගමෙහි විසූවෙමි එකල ගඳකිළිය වැස්සෙන් තෙමෙයි ඉක්බිති භික්ෂූන්ට ඝටීකාරයාගේ ගෙයින් තණ ගෙණවුත් ගඳකිළිය සෙවිලිකරන්ට යයි කීවෙමි. භික්ෂූහු එහි ගියහ. ඝටීකාරයා නොසිටියේය. අද මව්පිය දෙදෙනා ආමෝ! කවුදැයි විචාළහ. අපි භික්ෂූහු වෙමු. ලොවුතුරා බුදුරජුණේ ගඳකිළිය තෙමෙයි එබැවින් තණගෙණ යන්ට ආවෙමු. සවාමිනි! මෙහි තන තැන්පත් කර නැත. වහලෙහි අලුත සෙවිලිකරණ ලද තණ ඇත ඒ ලිහාගෙණ යනු මැනවැයි, ආදරයෙන් කීහ. භික්ෂූහු එසේ කළහ.

ඝටීකාර තෙම අවුත් කවුරුහු තෘණ ගෙණ ගියාහුදැයි විචාළේය. පුත! ලොවුතුරා බුදුන්ගේ ගඳකිළිය තෙමේයයි භික්ෂූන් අවුත් තණ ගෙණ ගියහයි කීහ. පුත්‍රඝටීකාර උවසුහට මෙබඳු සිතක් විය. එකාන්තයෙන් මට ලාභයෙකැ මහත් භාග්‍යයෙකැයි අඩමසක් ප්‍රීති සැපය නොහළේය. මවුපිය දෙපල සද්දවසක් ප්‍රීති සැපය නොහළහ. මහරජ! ඒ ගෙය තුන්මාසයක් මුලුල්ලෙහි අහසෙහි වසත්‍රයක් බැන්දක් මෙන් සිටියේය. කල්පාන්තය දක්වා ඒ ගෙය තිබුන තැන නොතෙමෙන්නේය. අනාගාමීවූ ඝටීකාර නම් කුම්භකාර තෙම මෙබඳු කෙනෙකැයි වදාළේය. කිකීනම්වූ කාසීරජ තෙම ඔහුට රත්හැල් සුවඳහැල් සහල් පුරවනලද හැල් පන්සියයක්ද ඊට සුදුසු ගිතෙල් ආදිය හා සූපයන්ද යැවීය.

එසමයෙහි ජෝතිපාල නම් මානවකයාණෝ මෙසම්යෙහි අප ලොවුතුරා බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේ මහණ වනද අවපිරිකර ගෙණැවිත් දුන් ඝටීකාර මහා බ්‍රහ්ම රාජයාණම් පූර්වෝක්ත කුම්භකාරයාය. මෛත්‍රෙය බුදුරජාණන් වහන්සේටත් අටපිරිකර ගෙණැවිත් දෙන්නේ ඔහු විසිනි. ශ්‍රද්ධාවෙන් හා භක්තියෙන්ද, කුසලයන්ගේ කම්ඵල සැලකීමෙන්ද පින්කරන්නවුන් අතර ඝටීකාර කුම්භකාර නම් අනාගාමී උපාසක තෙම අග්‍රස්ථානයක් ගණිසී. (කුසල ප්‍රීතියෙන් කල්ගත කළ මහිමය බලනු මැනවි)

මෙසේ පූර්වභාග ප්‍රතිපදා වශයෙන් නිරාමිස ප්‍රීතිය ලැබ ධ්‍යානමාගී ඵල වශයෙන් දියුණු කරගත හොත් දෙව් මිනිස් සැප කෙළවර නිවන් සැප ලැබෙන බැව් දතයුතුයි.

එබැවින් ප්‍රීති සම්බොධ්‍යඞගය නිතර පුරුදුකරගන්ට උත්සාහ වත් විය යුතුයි.

මීගහතැන්නේ විද්‍යාරාම පරිවෙනාධිපති පණ්ඩිත ඕපාත සරණඞ්කර ස්ථවිර පාදයන් වහන්සේ විසින් පවත්වන ලද ධර්මදෙශනාව.

## 5 පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

**තත්ථ කතමො පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො! යා වෙද-නාක්ඛන්ධස්ස සඤ්ඤාක්ඛන්ධස්ස සඞ්ඛාරක්ඛන්ධස්ස විඤ්ඤාණක්ඛන්ධස්ස පස්සද්ධි පටිප්පස්සද්ධි පස්සම්භනා පටිප්පස්සම්භනා පටිප්පස්සම්භිතත්තං පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො, අයං වුච්චති පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො, ති.**

සූසින්වත් බෞද්ධ සාධූනි!

මෙහි පවත්වාගෙන යනු ලබන බොධ්‍යඞ්ග ධර්මදෙශනා පඞ්ක්තියෙහි අද දිනට නියමව තිබෙන්නේ පස්සද්ධි සම්බොජ්ඣඞ්ග ධර්මදෙශනාවයි. දැන් මා විසින් ප්‍රකාශ කරණ ලද්දේ ඒ සඳහා ත්‍රිලෝකගුරු භාග්‍යවත් බුද්ධරජාණන් වහන්සේ විසින් වදාරණ ලද දෙශනා පාඨයකි. මෙම දෙශනා පාඨය අභිධර්ම සප්තප්‍රකරණයෙන් විභඞ්ග ප්‍රකරණයෙහි බොධ්‍යඞ්ග විභඞ්ගයෙහි අභිධර්ම භාජනියට ඇතුලත් වේ. මෙහි විස්තර විභාගාදිය ප්‍රකාශ කිරීමට ප්‍රථමයෙන් ධර්මශ්‍රවණය පිණිස පැමිණ සිටින ශ්‍රද්ධාවන්ත බෞද්ධ සමූහයාට ධර්මාවාද වශයෙන් කරුණු ටිකක් කියාදීමට බලාපොරොත්තු වෙමි.

බුදුපියාණන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය ඉතා සියුම්ය. ගැඹුරුය, තර්කයෙන් නිර්ණය කිරීමට පහසු නැත. ඥානවන්තයන් විසින් අවබොධ කටයුතුය. ධර්මය තේරුම් ගැණීම පමණක් නොව අසන්නවුන්ට වැටහෙන පරිදි දෙශනාකිරීමද ඉතාමත් දුෂ්කරය. "පඤ්ඤවන්තස්සායං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස" යන බුද්ධවචනයෙන් ප්‍රකාශ වන්නේත් මේ ධර්මයෙන් ප්‍රයොජනය ලැබිය හැක්කේ නුවණැත්තාට බවත් නුවණ නැත්තහුට මෙයින් සම්පූර්ණ ප්‍රයොජන නොලැබිය හැකි බවත්ය දැන් අප ඉදිරිපත්ව සිටින්නේ දුෂ්කර දෙයකටය. පින්වත්

බෞද්ධපිරිස දුෂ්කරවූ ධර්මශ්‍රවණයට ඉදිරිපත්ව සිටිති. මෙනිසා අප දෙපක්ෂයේම උත්සාහයත් තරමක්දුරට සඵලකරගැනීමටනම් දෙපක්ෂයම නුවණින්යුතුව ක්‍රියාකළයුතුය. අවබෝධයට සුකර නොවූ බොධ්‍යඞ්ග ධර්ම ශ්‍රවණය කිරීම පිණිස ඉදිරිපත්ව සිටින සැදැහැවත් පින්වතුන් හැකිතාක් නිශ්ශබ්දවිය යුතුයි. තම තමන්ගේ සිත් ලොභාදී කෙලෙස් වලට වසඟ වෙන්ට නොදී ආරක්ෂා කටයුතුයි. තෙරුවන් කෙරෙහි සම්පූර්ණ විශ්වාසයත් දෙශක ගෞරවයත් දක්වමින් ධර්මය කෙරෙහි සිතයොමු කරමින් ඇසිය යුතුය. එසේ අසනලද ධර්මය මනාව සිත්හි දරා ඒවූ පරිදි පිළිපැදීමෙන් මෙලොවදී ජීවිතයේ පිරිසිදුවත් දියුණුවත් සලසාගෙන පරලෝ වශයෙන් දෙව් මිනිස් සැප කෙළවර අමාමහ නිවන් සුව ප්‍රාර්ථනා කටයුතුයි.

දැන් නියමිත ධර්මදෙශනාව විස්තරකර දීමට අවස්ථාව එළඹ තිබේ. **"තත්ථ කතමො පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො"** ඒ බොධ්‍යඞ්ග ධර්මයන් අතුරෙන් ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගය කවරේද? වෙදනාක්ඛන්ධස්ස, වෙදනා සමූහයාගේ, සඤ්ඤාක්ඛන්ධස්ස, සංඥා සමූහයාගේ, සඞ්ඛාරක්ඛන්ධස්ස, සංස්කාර ධර්මසමූහයාගේ; විඤ්ඤාණක්ඛන්ධස්ස, අසූනවයක් හෝ එකසිය විසිඑකක් ප්‍රභෙද ඇති චිත්ත සමූහයාගේ; යා, යම් බඳුවූ; පස්සද්ධි, සංසිඳීමක් වේද; පටිප්පස්සද්ධි, විශෙෂයෙන් සංසිඳීමක් වේද, පස්සම්භනා, කෙලෙස් දුවිලි නිවීමක් වේද, පටිප්පස්සම්භනා, විශෙෂයෙන් නිවීමක් වේද, පටිප්පස්සම්භිතත්තං, කෙලෙස් දුවිලි සංසිඳුනු බවක් වේද පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො, ඒ ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ග නම් වන්නේය. අයං, මේ පස්සද්ධි සම්බොජ්ඣඞ්ගො, ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ග යයි; වුච්චති, කියනු ලැබේ.

මේ ප්‍රකාශ කරන්ට යෙදුනේ මා විසින් මාතෘකා පාඨය වශයෙන් තබාගන්නා ලද දෙශනා පාඨයෙහි පදගතාර්ථයයි. දැන් මෙතැන් සිට එකක් පාසා විස්තර වශයෙන් කියා දීමට අදහස් කරමි.

**බොධියා බොධිස්සවා අඞ්ගානි බොජ්ඣඞ්ගා,** යනුවෙන් 'බොජ්ඣඞ්ග'' යන වචනයෙහි අදහස දක්වා තිබේ. ''බොජ්ඣඞ්ග', යන වචනය අටුවාචාරීන් වහන්සේලා විසින් නොයෙක් අයුරින් වර්ණනාකොට තිබෙතත් මා මෙහිදී ප්‍රකාශ කිරීමට අදහස් කරණුයේ තේරුම් දෙකක් පමණකි. සෝවාන් ආදී සතර මග නුවණ අවබොධ කරගැනීමට උපකාරවන්නාවූ සමෘත් ආදීවූ යම් ධර්ම සමූහයක් නිසා ආර්ය ශ්‍රාවක තෙම චතුරාර්යසත්‍ය

ධර්මයන් අවබෝධ කෙරේනම් ඒ උපකාරක ධර්ම සමූහයට බෝධි යයි කියනු ලැබේ. එසේම එම උපකාරක ධර්ම සමූහය ඇසුරු කොට මාර්ගඥානය ලබන්නාවූ පුද්ගලයාද බෝධි නාමයෙන් හඳුන්වනු ලැබේ. අඞ්ග ශබ්දයේද අර්ථරාශියක් ඇතද මෙහිදී ප්‍රධාන වශයෙන් අර්ථදෙකක් සැලකිය හැක. කාරණය, අවයවය, යන අර්ථ දෙකයි. මෙසේ සලකන කල්හි චතුර් මාර්ග ඥාන සඞ්ඛ්‍යාත බෝධියට කාරණාවූ අවයවවූ ධර්ම සමූහය බොජ්ඣඞ්ග නම්. එසේ නැති නම් චතුර් මාර්ග ඥානය ලබන්නාවූ පුද්ගලයාට ඒ ඥානය ලැබීම පිණිස උපකාර වන්නාවූ ස්මෘති ආදී ධර්ම සමුදායය බොජ්ඣඞ්ග නම්. සං යන උපසර්ගය ප්‍රශස්ත, සුන්දර, යන තේරුම්වල යෙදී තිබේ. මේ නිසා බෝධි ඥානයට හෝ බෝධි ඥානය ලබන පුද්ගලයාට ඒ ලැබීම පිණිස තිබෙන සුන්දරවූ ප්‍රශස්තවූ කාරණා සමූහය හෝ අවයව සමූහය සම්බොජ්ඣඞ්ග නම්.

චිත්ත චෛතසිකයන් විඩාවට පමුණුවන උද්ධච්චය ආදී කෙලෙස් සංසිඳවීම පස්සද්ධි යයි මෙසේ උද්ධච්චය ආදී කෙලෙස් සංසිඳවීම මාර්ග ඥානය පහළවීමට හෝ මාර්ග ඥාන ලබන පුද්ගලයාට එය ලැබගැනීම පිණිස හෝ පවත්නා ප්‍රශස්ත කාරණයක් අවයවයක් වන බැවින් එයට පස්සද්ධි සම්බොජ්ඣඞ්ගයයි කියනු ලැබේ දැන් ප්‍රකාශ කරණ ලද්දේ පස්සද්ධි සම්බොජ්ඣඞ්ග යන වචන පිළිබඳ සාමාන්‍ය අදහසයි. "බොජ්ඣඞ්ග" යන වචන පිළිබඳ තව බොහෝ විස්තර ඇතද මෙපමණකින් එය නවතා "පස්සද්ධිය" පිළිබඳ කරුණු ටිකක් ප්‍රකාශ කිරීමට බලා පොරොත්තුවෙමි.

සිතට හෝ කයට ප්‍රිය ජනක අරමුණක් හමුවූ කල්හි එහි රසය විඳිමියි පහළවන සිතිවිල්ල සුඛ වේදනාවයි. අප්‍රිය අරමුණක් හමුවූ කල්හි පහළවනුයේ දුඃඛ වේදනාවයි. වඩා ප්‍රිය නොවූත් අප්‍රිය නොවූත් අරමුණෙහි පහළවනුයේ උපෙක්ෂා වේදනාවයි. සොම්නස පහළවීමට හේතුවූ අරමුණෙහි පහළ වනුයේ සොමනස්ස වේදනාවයි. සිත්හි නොසතුට ඇතිකරවන අරමුණෙහි පහළ වනුයේ දොම්නස් වේදනාවයි. මෙකී විඳ ගැනීම් අතීත වර්තමාන අනාගතාදී වශයෙන් ප්‍රභේදවූ කල්හි වේදනාවෝ අප්‍රමාණ වෙති. මෙසේ පහළවන විඳගැනීම් සමූහයට වේදනාස්කන්ධ යයි ව්‍යවහාර කරණු ලැබේ. අරමුණු හැඳින ගැනීමට උපකාර වනුයේ සංඥාවයි. විශේෂණ සහිතවූ හෝ රහිතවූ කිසිවක් හමුවූ කල්හි මේ අසවල් දේයයි හඳුන ගන්නේ සංඥා

වෙති. එක වරක් දුටු දෙය නැවත නැවත සියක් වරක් දහස් වරක් දුටුවත් ඒ සෑම වාරයකම සංඥවක් පහළ වෙයි. මෙසේ එහි විස්තර විභාගාදියක් තේරුම් ගැනීමට අපොහොසත්වූ සංඥව අරමුණු භේද කාල භේද වශයෙන් නොයෙක් ප්‍රභේද වලින් යුක්ත වේ. මෙසේ පහළවන සංඥ රාශියක් බැවින් ඒ සියල්ල එකතු කොට සංඥ ස්කන්ධයයි ව්‍යවහාර කරණු ලැබේ කිසියම් විපාක ඵලයක් ගෙන දීමෙහි ශක්තිය ඇත්තාවූ ද, එසේ ශක්තියක් නැත්තාවූ ද, කුශලා'කුශල ආනෙඤ්ජ වශයෙන් ප්‍රභේද ගතවූ, වේදනා, සංඥ දෙක හැර අවශේෂ සමපණස් චෛතසික යෝ සංස්කාර ස්කන්ධයට ඇතුලත් වෙති. ඔව්හු ආයති භවය සංස්කරණය කරණ හෙයින් සංස්කාර නම් වෙති. බොහෝ ප්‍රභේද වලින් යුත් බැවින් සංස්කාර ස්කන්ධයයි ව්‍යවහාර කරණු ලැබේ. මෙකී කොටස් තුනටම අයත්වූවෝ සිත්හි පහළ වන සිතිවිලි බැවින් චෛතසික නම් වෙති. විඥානය නම් චිත්තයයි. ඒ අරමුණු දැන ගැනීම් ආදී අර්ථ වලින් විඥානයයි කියනු ලැබේ. ඒ විඥාන සංඛ්‍යාත චිත්තය කාම භූමිය, රූප භූමිය, අරූප භූමිය, ලොකොත්තර භූමිය යන සතර භූමි වලට අයත් වීම් වශයෙන් එකසිය විසිඑකක් ප්‍රභේද වලින් යුතුය.

එකී ප්‍රභේදයන් අතීතාදීන්ගේ වශයෙන් ප්‍රභේදවූ කල්හි චිත්තයාගේ භේදයෝ අප්‍රමාණ වෙති. ඒ සියල්ල එකතු කොට විඥාන ස්කන්ධ යයි ව්‍යවහාර කරණු ලැබේ. මෙකී ස්කන්ධ සතරට අයත් චිත්ත චෛතසික ධර්ම සමූහය නාම කායයට ඇතුලත්ය. චිත්තයාගේ අවුපසම යයි කියන ලද විසිරීම, මාන්නය, රාගය, කොපය, ආදී සිත කිළුටු කරණ කරුණු වලින් සිත පීඩාවටත් පත් වෙයි කිළුටු වෙයි. අපිරිසිදු වෙයි. රත්වෙයි. එසේ දූවිලි සහිත චිත්ත චෛතසික වලින් යුක්ත වූවහුගේ සිත පිංකිරීමාදී හිත සැප ගෙන දෙන ආරම්මණයන්හි නො ඇලෙයි. බාහිර අරමුණු කරා සිත දුවයි. රත්වූ යකබලෙක්හි දැමූ මත්ස්‍ය යකු මෙන් ඔහුගේ සිත චඤ්චල වෙයි. එසේ චඤ්චල සිත් ඇත්තහුට සැපයක් නොලැබෙයි. සැපයක් ඇති කල්හි චිත්ත සමාධියක් නොලැබෙයි. සමාධියක් නැත්තහුට ලෞකික ලොකොත්තර ඵලයක් ලැබිය නොහැකි වෙයි. මෙසේ චිත්ත චෛතසිකයන්ගේ සංසිඳීමක් නැති කල්හි ලොව් ලොව්තුරා සැප යක් ලැබීමට නොහැක. මෙසේ අහිත කරවූ දූවිල්ල, අවුප සමය, චඤ්චල ගතිය මැඩ පවත්වා සිත සංසිඳවීමෙන් සැනැල්ලු බවම පැමිණ වීම පස්සද්ධියයි කියනු ලැබේ

මෙහි වේදනා සංඥා සංස්කාරයන්ගේ සංසිඳීම කාය පස්සද්ධි යයි ද විඥානස්කන්ධයාගේ සංසිඳීම චිත්ත පස්සද්ධි යයි ද කියනු ලැබේ. මෙකී චිත්ත චෛතසිකයන් කෙලෙස් දූවිලි යටපත්වී මෙන් සංසිඳුනු කල්හි රූපස්කන්ධයාගේ තිවීමද ඇතිවෙයි. එසේ කල්හි සිතට මෙන්ම කයටත් බලවත් සැපයක් පහළ වෙයි. ඒ සැපය නිසා සිත මනාව එක අරමුණෙක්හි පිහිටුවා ගැනීමටත් එයින්ම සමථ විදර්ශනා වැඩීමෙන් මාර්ග ඵල ප්‍රත්‍යක්ෂ කිරීමෙන් නිවන් සුව ලැබීමටත් හැකි වෙයි. මේ නිසා ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගය මාර්ග ඥානයට හා මාර්ග ඥානය ලබන පුද්ගලයාටත් ඒ සඳහා උපකාර වෙයි.

“කාය චිත්ත පස්සද්ධියො කාය චිත්ත දරථ වූපසම ලක්ඛණා” නාම, කායපස්සද්ධි චිත්තපස්සද්ධි වශයෙන් දෙපරිදිවූ පස්සද්ධි බොධ්‍යාඞ්ග ධර්මයෝ කාය චිත්තයන් දවන්නාවූ උද්ධච්චය ආදී කෙලෙස් දූවිලි සංසිඳවීම ලක්ෂණ කොට ඇත්තාහ—“කාය චිත්ත දරථ නිම්මද්දන රසා” කාය චිත්ත දූවිලි මැඩ පැවැත්වීම කෘත්‍යය කොට ඇත්තාහ— “කාය චිත්තානං අපරිප්ඵන්දසීති භාව පච්චුපට්ඨානා, කාය චිත්තයන්ගේ තැවීමෙන් සැලීමෙන් වෙන්ව පහළ වන සිසිල් භාවය වැටහීම් කොට ඇත්තාහ.” කාය චිත්ත සීතිභාව, පදට්ඨානා කාය චිත්ත දෙදෙනාගේ සිසිල් වීමම ආසන්න කාරණා කොට ඇත්තාහ.

මෙකී ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යාඞ්ගය උපදවා ගැනීමට උපකාර වන ධර්මයෝ සත්දෙනෙක් වෙති. “සත්ත ධම්මා පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති” යනුවෙන් ඒ බව ප්‍රකාශ කොට තිබේ. එකී සප්ත ධර්මයෝ කවරහුදයත්? “පණීත භොජන සෙවනතා, උතුසුඛ සෙවනතා, ඉරියාපථ සුඛ සෙවනතා, මජ්ඣත්ත පයොගතා, සාරද්ධ කාය පුග්ගල පරිවජ්ජනතා, පස්සද්ධකාය පුග්ගල සෙවනතා, තදධිමුත්තතා යන මොහුයි.

**පණීත භොජන සෙවනතා.** ප්‍රණීත ආහාර අනුභවකිරීම පළමුවන කාරණ යයි. අරුච්වූ හෝ රළු පරුෂවූ විරස ආහාර අනුභව කරන්නවුන්ගේ සිත තැවීමටත් සෙලවීමටත් පැමිණෙයි. සිතිදුවූ ඕජා සම්පන්න රස අහර අනුභව කරන්නහු ගේ සිත පිණයි. නොසැලෙයි. වේදනාදි නාම කායය පිණයි නොසැලෙයි. එහෙයින් ම ශරීරය ද පිණයි. දූවිලි සංසිඳෙයි. මේ නිසා සිතිදු මනවඩන ආහාර පාන වගී අනුභවය පස්සද්ධිය ලැබීමට උපකාර වෙයි.

**උතුසුඛ සෙවනතා.** සෘතු සැපලැබීම දෙවන කාරණයයි. ඇතැම් අයට උෂ්ණ සෘතුව ප්‍රිය වෙයි. ඇතැම් අයට ශීත සෘතුව ප්‍රිය වෙයි. ඇතැම් අයට සම ශීතොෂ්ණ ඇති කාලය ප්‍රිය වෙයි. තමතමන්ට ප්‍රිය නොවූ සෘතු ගුණය ඇතිවීමෙන් ඔවුන්ගේ සිත් දූවෙයි. චඤ්චල වෙයි. අරමුණෙහි මනාව පිහිටුවා ගැනීමට අපහසු වෙයි. තමතමන්ගේ සිතට ප්‍රියවූ කයට සැපවූ සෘතු ගුණය ලැබීමෙන් සිත පිණයි. නොසැලෙයි. අරමුණෙහි සිත පිහිටයි. මේ නිසා සෘතු සැපය ලැබීම පස්සද්ධියට දෙවන කාරණය වෙයි.

**ඉරියාපථ සුඛ සෙවනතා.** ඉරියව් සුව ලැබීම තුන්වන කාරණයයි. ඇතැම් අයට නිතර නිතර සක්මන් කිරීම කාය සිත දෙකට සුව වෙයි. ඇතැම් අයට වැඩි වශයෙන් නැගිට සිටීම කාය සිත දෙකට සුව ගෙන දෙයි. ඇතැම් අයට නිතර වාඩිවී සිටීම කාය සිත දෙකට සුව ගෙන දෙයි. ඇතැම් අයට නිතර නිතර ශයනය කිරීම සුව ගෙන දෙයි. මෙකී සතර ඉරියව් වලින් තමතමන්ගේ සිත කාය දෙකට ප්‍රිය නොවූ ඉරියව් පවත්වන කල්හි සිත කාය දෙක්හි දූවිලි වැඩිවෙයි. සිත කාය දෙක චඤ්චල වෙයි. දුක් වේදනා හටගනියි. එක අරමුණෙක්හි සිත තැන්පත් කොට ගැනීමට දුෂ්කර වෙයි. ඒ ඒ අවස්ථාවට තමන්ට පහසු ඉරියව් පවත්වන්ට ලැබීමෙන් චිත්ත චෛතසිකයන්ගේ සැපය ඇති වෙයි. සිත අරමුණෙහි මනාව පිහිටයි. සිත කාය දෙක්හි දූවිලි පහවෙයි. මේ නිසා ඉරියව් සුව ලැබීම පස්සද්ධිය ලැබීමට උපකාර වන තුන්වන කාරණය වෙයි.

**“මජ්ඣත්ත පයොගතා”** යනු සතරවන කාරණ යයි. **“මජ්ඣත්ත පයොගොවුච්චති අත්තනොච පරස්සච කම්මස්සකතා පච්චවෙක්ඛණා”** යනුවෙන් මජ්ඣත්ත පයොගතාව විස්තර කොට තිබේ. තමන්ගේත් අනුන්ගේත් කර්මය ස්වකීය කොට ඇති බව සිතීම මජ්ඣත්ත පයොගතා යයි කියනු ලැබේ. යනු එහි අදහසය. තමතමන් විසින් රැස් කරණ ලද කුශලාකුශල චේතනා සමූහය කර්මයයි. යමෙකු විසින් දශ පුණ්‍ය ක්‍රියාදියෙහි යෙදීමෙන් කුශල චේතනාවන් රැස් කළහොත් එහි විපාකයන්, දශ අකුශල ක්‍රියාදියෙහි යෙදීමෙන් අකුශල චේතනාවන් රැස් කළහොත් එහි විපාකයන් ඔහු විසින්ම විඳිය යුතුය. එහි විපාකය විඳීමට අන්‍ය සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් නැත. මෙය නිතර සිතන්නහුට සිත සංසිඳුවා ගැනීමට හැකිය. කිසියම් අවස්ථාවක කීකරුණේ අනුන්ගෙන් අලාභයක් සිදුවුවොත්

එකල්හි කළයුත්තේ ඔහු සමග අමනාප වීමක් හෝ ඔහුටත් අලාභයක් කිරීම නොව මොහුගෙන් මෙ බඳු අලාභයක් මට සිදු වූයේ මේආත්මයෙහි මා විසින් කරණ ලද දෙයක් නිසා නොව ඉහත ආත්ම භාවයකදී කරණ ලද්දක් නිසාය. මොහුට මා කිසි දිනක වැරැද්දක් කර නැත. මෙය මොහුගේ දොෂයක් නොවෙයි. මගේම පූර්වකර්ම දොෂය වෙයි. මේ නිසා මොහුට මා විසින් අලාභයක් හෝ වෙන වැරැද්දක් නොකළ යුතුය. මගේ කර්මයෙහි විපාකය මා විසින් ම විඳිය යුතුය යි මෙසේ සිතන්නහුගේ සිත සංසිඳෙයි. පලි ගැනීමේ චෙතනාවක් පහළ නො වෙයි.

එසේම තමන්ට නිකරුණේ නින්දාවක්, පරිභවයක්, බැණීමක්, කරණ කල්හි මොහු මට නින්දා පරිභවාදිය කරන්නේ මොහුට මා විසින් මෙලොවදී කරණ ලද වැරැද්දකට නොවෙයි. මොහුට මා සිහිනයෙන්වත් වැරැද්දක් කර නැත. පෙර ආත්මයකදී කාට නමුත් මා විසින් මෙබඳු අපරාධයක් අපහසයක් කරන්ට ඇත ඒ මා විසින් කරණ ලද නින්දාදියෙහි විපාකය මා පසුපස්සෙන් ගමන් කොට මෙලොවදී එහි විපාකය දෙන්ට පටන්ගෙන තිබේ. මේ ගැන මොහු සමග කොපවීමටත් මොහු නෙන් පලි ගැනීමටත් සුදුසු නැත. මා විසින් කරණ ලද කර්මයේ විපාකය මා විසින්ම විඳිය යුතු යයි සිතිය යුතුය. එසේ සිතන කල්හි අන්‍යයා කෙරෙහි තම සිතේ නපුරු අදහසක් පහළවී තිබුනේ නම් එය සංසිඳවා ගත හැක.

පෙර ලක්දිව ඉතා බලසම්පන්නවූ බුද්ධදාස නම් රජෙක් විසීය. එතුමා මහා කාරුණිකයෙකි. වෛද්‍ය ශාස්ත්‍රයෙහි අති දක්ෂයෙකි. කිසිවෙකුට කිසි විටකත් අපරාධයක් නොකෙළේය. මනුෂ්‍යයන්ට පමණක් නොව තිරිසනුන්ට පවා හිතවත්ව කටයුතු කෙළේය. වරක් විෂඝොර නාගයෙකුට වැළඳී තිබුනු රොගයක් සුව කෙළේය. මෙසේ සියලුසතා කෙරෙහි කරුණාවෙන් යුක්තවූ දශ රාජ ධර්මයෙන් යුක්තව රාජ්‍ය විචාරණය කරන්නාවූ රජතෙම එක් දිනක් ඇත් කඳ පිට නැගී දෙව්ශ්‍රියෙන් යුක්තව නගරයෙහි සැරිසැරීමට ගියේය මෙසේ ගමන් කරණ කල්හි එක්තරා කුෂ්ඨ රොගියෙක් ක්‍රොධයෙන් වෙවුලමින් රජුගේ ඉදිරියට පැමිණ රජතුමන්ට නොයෙක් අයුරින් අපහස කෙළේය. බැන්නේය. රජු තමන්ගේ දාසකු බව ප්‍රකාශ කළේය. මෙසේ බොහෝ වේලාවක් ඔහු විසින් කරණ ලද නින්දා පරිභවයන් අසා සිටි රජ තෙම මෙසේ සිතීය.

මා විසින් ඉහත ආත්මයකදී කිසියම් අපහාසයක් කරන්ට ඇත. අද මට මේ ලැබෙන්නේ එහි විපාකය වෙයි. මෙය මොහු

ගේ දෝෂයක් නො වෙයි. මගේ පූර්ව කර්ම දෝෂය මැයි. මොහු සමග කෝප වෙන්නටවත් මොහුට දඬුවම් කරන්නටවත් සුදුසු නැතැයි මෙසේ සිතා තමන්ගේ සිත සංසිඳුවා ගෙන පසුව උපක්‍රම යෙන් ඒ කුෂ්ඨ රෝගියාවද සලකවා ඔහුගේ රෝගයද සුවකර වීය. කර්මය ස්වකීය කොට ඇති බව සිතීමෙන් සිත සංසිඳුවා ගත හැකි බව මෙයින් මනාව වැටහේ. තමන්ට හෝ අන්‍ය කිසිවෙකුට හෝ දුක් පීඩාදියක් ඇතිවූ අවස්ථාවන්හි මෙසේ කර්ම ස්වකීයතා ඥානය පහළ කොට ගෙන ක්‍රියා කරන්නහුගේ සිත සම්පූර්ණයෙන් සැනසෙයි. සිත සංසිඳීම නිසා චෛතසිකයන්ගේ ද සංසිඳීම පහළ වෙයි. චිත්ත චෛතසිකයන්ගේ පස්සම්භනය ඇතිවූ කල්හි රූපස්කන්ධයාගේ සංසිඳීම ද පහළ වෙයි. මේ නිසා මධ්‍යස්ථ ප්‍රයොගතාව යයි කියන ලද කර්ම ස්වකීයතා ඥානය පස්සද්ධිය ලැබීමට උපකාර වන සතරවන කාරණය වෙයි.

"සාරද්ධකාය පුග්ගල පරිවජ්ජනතා" යනු පස්වන කාරණ යයි. සතුන්ට නිතර වධ හිංසා කිරීම, සොරකම් කිරීම, කම්සැප විඳීමෙහි ලොල්වීම, කලකොලාහල කිරීමෙහි යෙදීම, ආදී නොයෙක් දරුණු ක්‍රියාවල යෙදුනෝ සාරද්ධකාය පුද්ගලයෝය. ඔවුන්ගේ චිත්ත චෛතසිකයෝ නිතර දූවිලි සහිත වෙති ලොභ දොෂාදියෙන් මඩනා ලද්දෝ වෙති. ඔවුන්ගේ කායික ක්‍රියා දරුණුය. වාචසික ක්‍රියා අනනාපකාරය රෞද්‍රය. සිත නිතර ක්‍රොධාදියෙන් මඩනා ලදුව පවතියි තුන් දොර දරුණු ක්‍රියාවල යොදා වාසය කරණ එබඳු අයගේ සිත කාය දෙක නිතර දූවෙමින් පවතියි. කිසිම සැනසීමක් නිවීමක් ඇති නොවෙයි. රාගාදියෙන් පිළිස්සෙයි. එබඳු දූවිලි සහිත පුද්ගලයන් ඇසුරු කරන්නවුන්ටද එම ගතිගුණ පුහුණු වෙයි. එයින් ඔවුන්ගේද සිත දූවිලි සහිත වෙයි. මේ නිසා සාරද්ධ පුද්ගලයන් හෙවත් දූවිලි සහිත පුද්ගලයන් සෙවනය, භජනය, පයිරුපාසනය නොකොට දුරින්ම දුරු කිරීම කාය චිත්ත පස්සම්භනයට උපකාර වෙයි. මේ පස්සද්ධිය ලැබීමට උපයෝගී වන පස්වන කාරණයයි.

"පස්සද්ධකාය පුග්ගල සෙවනතා" යනු සයවන කාරණයයි. කාය සංවර, වාක් සංවර, මනො සංවර යන ත්‍රිවිධ සංවරණයෙන් යුක්ත පුද්ගලයන් ඇසුරු කිරීමයි. කයින් සිදුවෙන සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම යන තුන කයින් කෙරෙණ අකුශල කර්මයි. මෙකී අකුසල් වලින් වැලකී අතින් පයින් දඬුමුගුරු ආදියෙන් සතුන්ට කරණ හිංසා පීඩාදියෙන් ද වැලකී කය මනා කොට හසුරුවා ගැන්ම කාය සංවරණ යයි. හිමියන් අහිමි කිරීම අහිමියන් හිමි කිරීම ආදී

වශයෙන් ඇත්ත නැති සේත්, නැත්ත ඇති සේත් දක්වීම් සඞ්ඛ්‍යාත මුසාවාදයත්, අනුන්ගේ සිත් රිදෙන, කණට අමිහිරි රළු පරුෂ වචන ප්‍රකාශ කිරීම පරුෂ වචන කීමයි. අනුන් කලකිරවීම, ඔවුනොවුන් භෙද කරවීම ආදී කරන අදහස් පෙරදැරි කොට කේලාම්බස් කීම පිසුණාවාච යයි. ප්‍රයෝජනයක් නැති, වැදගත් අදහස් නැති හිස් වචන කථා කිරීම සම්ඵ ප්‍රලාප යයි. මෙකී මුසාවාදාදියෙන් තුරන්ව සත්‍ය ප්‍රිය අර්ථවත් වචන කීමත් ප්‍රමාණවත් ලෙස ශාන්තදාන්ත ලෙස කථා කිරීමත් වාක්සංවරයයි. සිත දැඩි ලෝබකම් ආදියෙන් වලකා ගැනීම, අනුන් කෙරෙහි ද්වෙෂ සහගත අදහස් පහළකර නොගැනීම, දෙසැටක් මිසදිටුවට අයත් වැරදි අදහස් වලින් සිත මුදා ගැනීම යන කරුණු තුනින් සිත සකස් කර ගැනීම මනො සංවරණ යයි. මෙකී ත්‍රිවිධ සංවරණයෙන් යුක්ත පුද්ගලයෝ පස්සද්ධකාය පුද්ගලයෝයි.

බුදු පසේබුදු මහ රහත්හු සම්පූර්ණ පස්සද්ධකාය පුද්ගලයෝ වෙති. උන්වහන්සේලා ලබා ගැනීම සුකර නැත. අවශෙෂ මාර්ගස්ථ ඵලස්ථ පුද්ගලයෝ ද පස්සද්ධ පුද්ගලයෝය. උන්වහන්සේලාද ඇසුරු කිරීමට ලබා ගැනීම අපහසුය. ඒ හැර සම්‍යක් ප්‍රතිපදාවෙහි ගමන් කරණ ශීලසමාධ්‍යාදී ගුණ ධර්ම වලින් හෙබි යාවූ කල්‍යාණ පෘථග්ජනයෝද පස්සද්ධකාය පුද්ගලයෝය. එබඳු පස්සද්ධකාය පුද්ගලයන් කලාතුරකින් සොයා ගත හැක. වෙහෙස මහන්සි වීමෙන්වත් එබඳු පුද්ගලයන් සොයාගෙන ඇසුරු කළ යුතුයි. එබඳු උතුමන් ඇසුරු කරන්නාවුන්ටද ඒ යහපත් ගති ගුණ පුරුදු පුහුණු වෙයි. එයින් ඔවුන්ගේද සිත් සංවරයට පැමිණෙයි. එසේ සංවරණය වීම නිසා චිත්ත චෛතසිකයෝ සංසිඳෙත් සිතෙන් කෙලෙස් දූවිලි දුරුවෙයි. මේ නිසා පස්සද්ධකාය පුද්ගලයන් ඇසුරු කිරීම ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගය ලැබීමට උපකාර වන සයවන කාරණ යයි.

"**තදධිමුත්තතා**" යනු සත්වන කාරණයයි. ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග ලාභය පිණිස බලවත් කැමැත්තක් ඇතිකර ගැනීම තදධි මුත්තතා නම්, ඉඳුම් හිටුම් ආදී සියලු ඉරියව්වලදීම ඒ ගැන සිත්හි බලවත් කැමැත්තක් ඇතිකර ගත යුතුය. ඒ ගැන සිත නැමිය යුතුය. කාය චිත්ත දරථයන් මැඩ පවත්වා වාසය කරණ උතුමන්ගේ චරිත පිළිබඳ සිහිය යෙදිය යුතුය. පස්සද්ධ පුද්ගල කථාවන් ඇසීමට කන් යොමුකළ යුතුය. තම ජීවිතයේ උසස්ම ප්‍රයොජනය චිත්ත චෛතසික දූවිලි සංසිඳුවා ගැනීම යයි සිතිය යුතුය. දූවිලි සංසිඳුවා ගැනීම පිණිස වෙහෙස විය යුතුය. මෙසේ

ඒ ගැන බලවත් කැමැත්තකින් කටයුතු කරන්නහුට පස්සද්ධිය ලැබීම පහසු වෙයි. එම නිසා මෙය පස්සද්ධි ලාභයෙහි සත්වන කාරණ යයි. මේ නිසා බොධ්‍යඞ්ග ධර්ම ලාභයෙහි බැඳුනු සිතැති ශාසනික යොගාවචර කුල පුත්‍රයා විසින් මෙකී කරුණු සත දියුණු කිරීමෙන් ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගය දියුණු කොට එයම පදනම් කොට ගෙන අග්‍රඵලය ලැබීම පිණිස උත්සුක විය යුතුය. පස්සද්ධි වඩිනය සම්පූර්ණ වන්නේ අර්හත් ඵල ලාභයෙනි.

යම්කිසි භික්ෂුවක් ඇඟිලි දෙක එකට ගවා ශබ්ද කරණ පමණ සුලු කාලයක්වත් (අසුරුසනක්) ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ගය වඩා නම් ඒ භික්ෂුව වඩන ලද ධ්‍යාන ඇත්තෙක් වන්නේය බුදුන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නෙක් වන්නේය. උන්වහන් සේගේ අවවාදය අනුව කටයුතු කරන්නෙක් වන්නේය. රට වැසියා විසින් දෙනු ලබන දානයට හිමි කාරයෙක්වී වළඳන්නෙක් වන්නේය. යම්කිසි භික්ෂුවක් නැවත නැවත මෙකී බොධ්‍යඞ්ග ධර්මය වඩන්නේ නම් හෙතෙම රට වැසියා සැදැහැයෙන් දෙන දානය වැළඳීමට සුදුසු වන බව කියන්ටම දෙයක් නැතැයි බුදුරජානන් වහන්සේ විසින් මෙහි වටිනාකම දෙශනා කොට තිබේ.

බුදුරජානන් වහන්සේ විසින් නොයෙක් අයුරින් වර්ණනා කරණ ලද මෙකී බොධ්‍යඞ්ග ධර්මය දියුණු කර ගැනීමට ඉවහල් වන්නාවූ මෙහි සඳහන් කළ කරුණු හතටත් වඩා අතිශයින්ම උපකාර වන ධර්මයක් ඇත්තෝය.

"අත්ථි භික්ඛවෙ කාය පස්සද්ධි චිත්ත පස්සද්ධි තත්ථ
යොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො
අනුප්පන්නස්ස වා පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස උප්පා
දාය උප්පන්නස්ස වා පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස භීයො
භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තතීති"

යනුවෙන් එය දක්වා තිබේ.

කාය පස්සද්ධියක් ද චිත්ත පස්සද්ධියක් ද ඇත්තේය. එහි යොනිසො මනසකාරය දියුණු කිරීම පළමුවෙන් හට නොගත් දෙයාකාර පස්සද්ධියගේ ඉපදීම පිණිසත් උපන් පස්සද්ධියගේ දියුණුව පිණිසත් වැඩීම වශයෙන් සම්පූර්ණ වීම පිණිසත් පවත් නේය යනු එහි අදහසය. ඒ ඒ පදාර්ථයන් පිළිබඳ ඇති තතතුව යෙන් මෙනෙහි කිරීම, උපාය වශයෙන් මෙනෙහි කිරීම, අනිත්‍යාදී ධර්මයන් අනිත්‍යාදී වශයෙන් මෙනෙහි කිරීම, යොනිසො මනසකා රයයි. මෙකී යොනිසො මනසිකාරය දියුණු කරන්නහුගේ කාය

චිත්ත සමථය වැඩෙයි. කාය චිත්ත සමථය දියුණු වීමෙන් පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය මුදුන් පමුණුවා ගත හැකි වෙයි. මාර්ග ඵලාධිගමයක් නොලත් කල්‍යාණ පෘථග්ජනයාගේ සිත්හි බොධ්‍යඞ්ග ධර්මයන්ගේ පහළවීම සම්පූර්ණ නොවෙයි. සොවාන් ආදී මාර්ග ඵල සිත්වල පහළවන පස්සද්ධි චෛතසිකයම අඞ්ග සම්පූර්ණ බොධ්‍යඞ්ග ධර්මය වන්නේය.

එබැවින් මෙම බොධ්‍යඞ්ග ධර්මය ලබන්ට බලාපොරොත්තු වන්නහු විසින් කාය චිත්ත විවෙකයන් දියුණු කොට ගෙන රාගාදී කෙලෙස් යටපත් කොට ගෙන නිවන් කරා යොමු කරණ ලද සිත් ඇතිව බොධ්‍යඞ්ග භාවනාවෙහි යෙදිය යුතුය. ශීලසමාධි ප්‍රඥාවන් දියුණු කර ගැනීමට ඉවහල්වූ දානාදී සුචරිත ධර්මයන්හි යෙදෙමින් ලෞකික සිත්හි පහළ කරගන්නාවූ පස්සද්ධි චෛතසිකය ක්‍රමයෙන් දියුණු තත්ත්වයට පමුණුවාගෙන සොවාන් ආදී මාර්ග ඵල පිළිවෙළින් ගොස් අර්හත් මාර්ග ඵල සිත් උපදවා ගැනීමෙන් බොධ්‍යඞ්ග ධර්මය කුළුගන්වා නිවන් පුරයට පිවිසීමට උත්සාහ වැඩිය යුතුයි.

පස්සද්ධි සම්බොධ්‍යඞ්ගය පිළිබඳව මට අයත් දේශනාව සංක්ෂෙප වශයෙන් විස්තර කර මෙතෙකින් අවසාන කරන්ට අදහස් කරමි.

බොධ්‍යඞ්ග ධර්මය ඉතා සියුම්ය, ඇසීමට මෙන්ම දේශනා කිරීමට ද ඉතාම අපහසුය, අර්ථ ගම්භීරත්වයෙන් යුක්ත බැවිනි. මේ නිසාම බොධ්‍යඞ්ග ධර්ම සිත්හිලා දැරීම දුෂ්කරය.

එසේ ද නමුත්, මේ ඇසීම ‘‘පරතොඝොෂ ප්‍රත්‍යය වන බැවින්, නිවන් පසක් කරණ අත්බැව්හිදී මාර්ග ඵලාධිගමයට හෙවත් බොධිය ලබා ගැණීමට මෙම ශ්‍රවනය අතිශයොපකාරීවේ.

තවද අපේ මේ දේශනයන් “සිරි අරියවංස ගුණානුස්මරණ සභාව” මගින් ධර්මපුස්තකයක්සේ සකස්කරණ බලාපොරොත්තුව තිබෙන බැවින් එම පොත ලබාගෙණ නැවත නැවත පරිභාවිතා කිරීමෙන් බොධ්‍යඞ්ග ධර්ම මනාසේ අවබොධ කරගෙණ මෙලොව වශයෙන් උසස් දියුණුවත් ලබාගෙණ පරලොව වශයෙන් දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ අවසාන වශයෙන් සොවාන් ආදී මාර්ග ඵල පිළිවෙළින් ප්‍රත්‍යක්ෂ කටයුතු පරම රමණීය නිවන් සුව ප්‍රාර්ථනා කට යුතුයි.

පානදුරේ, වලාණේ, ශ්‍රී විජය සෞගත විද්‍යාලයාධීශ්වර පණ්ඩිතාචාර්ය වලාණේ ශ්‍රී විජයනන්ද මහාස්ථවිරයන් වහන්සේ විසින් පවත්වන ලද ධර්මදේශනාව.

---

# 6. සමාධි සම්බොජ්ඣඞ්ගය.

---

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

“තත්ථ කතමො සමාධි සම්බොජ්ඣඞ්ගො? යා චිත්තස්ස ඨිති, -පෙ- සම්මාසමාධි, සමාධිසම්බොජ්ඣඞ්ගො, මග්ගඞ්ගං, මග්ගපරියාපන්නං, අයං වුච්චති සමාධිසම්බොජ්ඣඞ්ගො”ති-

පින්වත්නි,

දැන් මා විසින් ප්‍රකාශ කරන ලද්දේ, අද ධර්මදේශනාව පිළිබඳ මාතෘකාව වශයෙන් කිය යුතු පාලි ධර්මය යි. මේ මාතෘකාව විස්තර කරමින් ධර්මදේශනාව පැවැත්වීමට ප්‍රථම, මේ සැදැහැවත් පිරිසට මතක් කළයුතු එක්තරා කාරණයක් තිබේ.

අද මේ විහාරස්ථානයෙහි; ධර්මදේශනාවක් පවත්වන ලෙස උගත් මොරමුවෙ ශාසනවංස ස්ථවිර තුමා විසින් කරණ ලද ආරාධනාව භාරගත් නමුත්, මෙය අපට කිසිසේත් විවේක ඇති කාලයක් නො වේ. මේ පවත්වා ගෙන යන ධර්මදේශනා පඞ්ක්තිය අතිශයින් සැලකිය යුතු ක්‍රමයකට හෙවත් පුස්තකාරූඪ කරන ක්‍රමයම පවත්වා ගෙන යන ධර්මදේශනා පඞ්ක්තියක් ද වේ ඒ නිසා විවේකීව, හොඳට බණපොත් බලා පැමිණ කළයුතු ධර්මදේශනා පඞ්ක්තියෙකි.

ඉතින් අපට එතරම් විවේකයක් ගෙන, මේ ගැන ව්‍යාවෘත වීමට කිසිසේත් මේ දවස්වල පුළුවන්කමක් නැත.

එහෙත් ශාසනවංස ස්ථවිර තුමාගේ වචනය ප්‍රතික්ෂේප කළ නො හැකි නිසාම, මෙය බාර ගතිමූ. ශාසනවංස ස්ථවිර තුමා අපට හිතවත් භාවයක් දක්වන ස්ථවිර තුමෙකි. එසේම උගත්කමින් හා ගුණවත්කමින් යුක්තවූ, සබ්‍රහ්මචාරීන්ට ප්‍රිය වූ, ස්ථවිර තුමෙකි. මේ කරුණු නිස යි, ඒ ස්ථවිර තුමාගේ ආරාධනාව ප්‍රතික්ෂේප කළ නො හැකි වූයේ.

මෙසේ ඉමහත් සැලකිල්ලකින් යුක්තව, පැමිණ පවත්වන මේ ධර්මදේශනාව, මේ බණ, පිරිසද අප මෙන්ම ඉමහත් සැලකිල්ලකින් යුක්තව, මනාව ශ්‍රවණය කොට, එය සිත්හි තබා ගනිමින්; ඒ වූ පරිදි පිළිපැදීමෙන් දෙව්මිනිස් සැප කෙළවර ශාන්ත සුඛ ස්වරූප නිර්වාණය ප්‍රත්‍යක්ෂකර ගැනීමට උත්සාහ දැරිය යුතු.

මීළඟට මගේ අදහස, මට නියමිත ධර්ම කාලවේලාව අනුව ඉතා ලුහුඬින් විස්තර කිරීමට යි. අද මගේ දේශනාව "සමාධි සම්බොජ්ඣඞ්ගය" පිළිබඳව බව මේ සැම කෙනෙක්ම දනිති. එය විස්තර කිරීම පිණිස මාතෘකා වශයෙන්, "කතමො සමාධිසම්බොජ්ඣඞ්ගො?" යනාදීන් මා පළමුවෙන්ම ප්‍රකාශ කළේ බොජ්ඣඞ්ග විභඞ්ගා'ගත පාලිපාඨයෙකි. එහි අර්ථ වර්ණනාව කිරීමට ප්‍රථම 'සමාධිසම්බොජ්ඣඞ්ගය' යනු කුමක්දැයි පැහැදිලි කරදීම, මේ ශ්‍රාවක පිරිසට අද ධර්මය තේරුම් ගැනීමට පහසු වීමෙකැයි සිතමි.

යම්කිසි කරුණක් අවබෝධ කර ගැනීමෙහි ඉතාමත් පහසු ක්‍රමය, ඒ කරුණ ප්‍රකාශ වන පදය හෝ පද සමුදාය හෝ 'නිර්වචනාර්ථ' වශයෙන් හා 'භාවාර්ථ' වශයෙන් හා තේරුම් ගැණීමයි. එහි 'නිර්වචනාර්ථ' නම් අකුරක් හෝ පදයක් හෝ වචනයක් හෝ පිළිබඳ වැ අක්ෂර වාරයෙන් දැන ගතයුතු වූ අර්ථය යි. නැතහොත් ශබ්දලක්ෂණා'නුසාර වශයෙන් උගත යුතුවූ අර්ථයයි. එකී අකුරෙන් හෝ පදයෙන් හෝ වචනයෙන් සාමාන්‍ය වශයෙන් අවබෝධ කටයුතු වූයේ 'භාවාර්ථ' නමි.

ඔවුන'තුරෙන් මෙහි 'සමාධිසම්බොජ්ඣඞ්ගා' යනු පාලිභාෂා' නුගත එකම 'සමාස' පදයෙකි. හෙවත් එකාර්ථයක් දීම සඳහා එකට එකතුවූ නානාර්ථවත් ශබ්ද කිපයෙකි. මෙය වෙන් කොට, ගත් කල්හි 'සමාධි-සං-බොධි-අඞ්ග' යැයි ශබ්ද සතරක් ලැබෙත්. මේ එක එක ශබ්දයක් පාසා එකිනෙ'කට වෙනස් වූ නොයෙක් අර්ථයෝ ප්‍රකාශ වෙති. සියල්ලම එකතුවී සමානාර්ථයක් ප්‍රකාශ කරන්නේද වෙයි. මෙසේ නානාර්ථ වත්වූ ශබ්ද කිපයක් එකට එකතුකොට එකාර්ථයක් දීම සඳහා භාෂාවෙහි යෙදීම ශාබ්දිකයන් හට හෙවත් ව්‍යාකරණශාස්ත්‍රය දන්නවුන් හට අභිමත විය උපමාවක් වශයෙන් කියතොත් නානා වර්ණ වත් සායම් වර්ග කිපයක් එකතු කොට සාදාගත් යම්කිසි එනම් වර්ණයක්, අභිමත රූපය නිරූපණය කිරීම සඳහා චිත්‍ර ශිල්පියා ස්වකීය චිත්‍රකර්මයෙහි යොදන්නාක් මෙනි.

මෙසේ නොයෙක් අර්ථ ඇති බව ලක්‍ෂණ කොට පවත්නා "සමාධි-සං-බොධි-අඞ්ග" යන ශබ්ද සතරෙන් 'සමාධි' යන ශබ්දය නිර්වචනාර්ථ වශයෙන් ප්‍රථමයෙන් සලකා බලමු. "එකාලම්බණෙ සුට්ඨු ආධානං සමාධි" යනු එය පිළිබඳ එක්තරා නිර්වචනයෙකි. චිත්ත-චෛතසික ධර්මයන් එක් අරමුණෙක මනා කොට පිහිටැවීම සමාධි' නම් වෙ, යනු එහි ලුහුඬු තේරුමයි. ජලස්නානය කිරීම සඳහා ගනු ලබන සුවඳ සුණු වගී, වතුර ඉස තෙමීම නිසා සුළඟින් ඔබනො'බ නො විසිරී එකට බැඳී පවතී එසේ මැ ඇසිල්ලක් පාසා නොයෙක් නොයෙක් අරමුණු වල එල්බ ගැනීම් සඞ්ඛ්‍යාත විසිරයෑමේ ස්වභාවික ගතියෙන් වළක්වා චිත්ත-චෛතසික ධර්මයන් එක් අරමුණෙක්හි නිශ්චලව පිහිටැවීම සමාධියැයි. අපේ සිතත් ඒ අනුවැ පවත්නා සිතිවිලිත් පිළිබඳ ලක්‍ෂණය, උපමා වශයෙන්; හුළං මඳව හමන තැනෙක පවත්නා පහන් සිළුවකට සමානය. පහන් සිළුව හුළඟ හමන හමන අතට අනුව වැනෙයි. එසේම අප සිත සහ සිතිවිලිද හමුවන හමුවන අරමුණට අනුව ඒ මේ අත හැරෙති. එසේ සැලිය නොදී එක් තැනෙක නිසලව තබා ගැනීම යි 'සමාධි' නම් වනුයේ.

මෙසේ එක් තැනෙක සිත තබා ගැනීම ම, එය රැක ගැනීමයි. සිත රැක ගැනීම නිසා මාරබන්ධනයෙන් මිදෙන බව,

"දූරඞ්ගමං එකචරං – අසරීරං ගුහාසයං
යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති-මොක්ඛන්ති මාරබන්ධනා'

යනුවෙන් ත්‍රිලෝගුරු භාග්‍යවතුන් වහන්සේ විසින් ධම්මපද පාලියේ දී දේශනා කරන ලදි. යොදුන් සියදහස් ගණනින් ඉතා දුරැවූ ද අරමුණෙහි සිත එල්බ ගන්නා හෙයින්, දූරඞ්ගමන් යැම ඒ පිළිබඳ එක් ලක්‍ෂණයෙකි. එක් සිතක් ඉපැද, එය නැති වූ කල්හිම, අනිත් සිතක් උපදින නිසා හුදෙකලාව හැසිරීම තවත් ලක්‍ෂණයෙකි. අපේ මේ පියෙවි මසැ'සින් දැකිය හැකි, ස්ත්‍රී පුරුෂාදීන් ගේ හෝ, නීල පීතාදියෙහි හෝ මෙන්; යම් කිසි රූප සටහනක් නැති බව අනෙකකි. අපේ සිරුර තුළ පවත්නා ඉතා අප්‍රකට හෘදයවස්තුව ආශ්‍රය කරගෙන හැසිරෙන බැවින්, ගුහාවෙක ශයනය කිරීම සිත සම්බන්ධ සතර වන ලක්‍ෂණයයි. හෘදයවස්තුවත් චිත්තයත් පැහැදිලි කරන අනුබුද්ධ බුද්ධඝොස මහතෙරණුවෝ මෙසේ ප්‍රකාශ කෙරෙති.

"චිත්තයාගේ පැවැත්ම හෘදයරූපය ආශ්‍රය කොටගෙන වේ. ඒ සිරුර තුළ දෙතන මැද පිහිටියේ රත්පියුම් පෙත්තේ පිට පැත්තේ ඔණීයට ඔබු වණී ඇත්තේය. සටහන් වශයෙන් පිට

පෙති හැර යටිකුරු කොට තැබූ පියුම් කැකුළකට බඳු ය. පිටතින් මටය, ඇතුළත වැටකොළුපලයක ඇතුළකට බඳුය, පැණවතුන්ට මදක් විකසිතය, පැණනැතියන්ට මුකුළිතමය. එයැතුළ දෙඹ ඇට පිහිටන තැන් පමණ වළක් වෙයි. එහි අඬපතක් පමණ ලේ ඇත්තේය. චිත්තයාගේ පැවැත්ම ඒ ලෝහිතය ආශ්‍රය කොට ගෙනය.”

යනුවෙනි. මෙකී ලක්ෂණයෙන් ලක්ෂිතවූ සිත; නානාරම්මණ යන්හි එල්බීමෙන් රාගාදී කෙලශධර්මයන්ගේ වසඟයට යා නොදී යම්කිසිවකු විසින් රැක ගනු ලබන්නේ නම්, හෙතෙමේ කර්ම වෘත්ත, කෙලශවෘත්ත, විපාකවෘත්ත සඞ්ඛ්‍යාත මාරබන්ධන යෙන් මිදෙන්නේය. හෙවත් නිර්වාණධාතුව සාක්ෂාත් කර ගන් නේය. ඉහතකී ගාථාවෙන් ප්‍රකාශවන සාමාන්‍ය අදහසයි මේ. සමාධියෙන් හෙවත් සිත එක් තැනෙක්හි ලා රැක ගැනීමෙන්, ලැබෙන ප්‍රයෝජනය කුමක්දැයි, පින්වතුන් හට; සාමාන්‍ය වශ යෙන් මෙයින්ම සිතා ගත හැකියැයි මම කල්පනා කරමි.

‘‘කුශල චිත්තෙකග්ගතා සමාධි’’ යනුද ‘සමාධි’ යන පදය පිළිබඳ තවත් නිර්වචනයෙකි. නිරවද්‍යවූ සුඛ විපාක ලැබීම ලක්ෂණ කොට ඇති කුසල් සිතෙහි එකමුතුකම ‘සමාධිය යි’ හෙවත් එකුප්පාදාදි වශයෙන් තමා හා සම්ප්‍රයුක්තධර්මයන් අර මුණෙහි මනාකොට පිහිටුවීම ‘සමාධි’ නම්. මේ සමාධිය වූකලී ‘ප්‍රමුඛ ලක්ෂණ’ ඇත්තේද ‘අවික්ෂෙප ලක්ෂණ’ ඇත්තේද වෙයි. ලොකයෙහි යම්කිසි කුශලධර්මසමූහ කෙනෙක් ඇත්ද, ඒ ඒ සැම කුශලධර්ම කෙනෙක්ම සමාධිය ප්‍රධාන කොටැ පවත් නාහු වෙති. සැම කුශල ධර්මයකටම සමාධිය ප්‍රධානවේ. අනිත් කුශලධර්ම පවත්නේ සමාධියට පහතිනුයි. සමාධියට නිවිවයි එසේම සමාධිය යම් අතෙක ගමන් කෙරේ නම් අනික් කුශල ධර්මයෝද ඒ අනුව යෙති. චතුරඞ්ගික සේනාවෙන් යුක්තවූ මහාසඞ්ග්‍රාම භූමියකට බට රජෙකනකුට සමානයි. සමාධිය යම් සේ ඇත්- අස්- රිය- පාබල- යන සිව්රඟ සෙන් පිරිවරා ගෙන සටන් බිමකට පිවිසුණු රජ්ජුරුවෝ යම්කිසි අතකට යෙත් නම සිව්රඟ සේනාවත් ඒ අතටම යන්නාහු රජ්ජුරුවන්ට අනුව පවතිත්ද, රජ්ජුරුවන්ම ප්‍රධානත්වයෙහි ලා සලකත්ද, ඔවුන් හටම යටහත්ව පවතිත්ද, එසේමැ සියලු කුශලධර්මයෝ සමාධියට අනුව යෙති, සමාධිය ප්‍රධානත්වයෙහි ලා සලකත්. එයටම යට හත්ව පවතිත්, මේ රාජ-සේනා උපමා කථාවෙන් සමාධිය පිළිබඳ ‘ප්‍රමුඛ ලක්ෂණය’ පින්වතුන් සැම කෙනෙකුටම හොඳින් තේරුම් යන්නට ඇත.

එසේම චිත්ත-චෛතසිකයන් නො විසිරියදීම නම්වූ 'අවික්ෂේපය' සමාධියේ දෙවන ලක්ෂණයයි. ඒ ඒ අරමුණු කරා යන්නට ඉඩ නොදී චිත්ත-චෛතසිකධර්මයන් එක්තැනෙක බැඳ තබන්නේ සමාධියේ බලයෙනි. යම් කිසිවකුගේ සන්තානයෙහි සමාධිය නැත්නම්, එය උතුරන බත් නැළියක් මෙන් නිතරම සැලෙයි. හීලෑ නොකරනු ලැබ, රැහැණකින් බැඳ තැබූ වල් අලියෙක් වනයටම පැනයන්නට දඟලන්නාසේ අපේ චිත්ත-චෛතසික ධර්මය යම්කිසි අරමුණෙකැ එල්බැ ගැනීමටම දඟලති එසේ දඟලීමට, සැසලීමට, වික්ෂේපයට, විරුද්ධ වන්නේ සමාධියයි. එහෙයින් සමාධිය 'අවික්ෂේප ලක්ෂණ' ඇත්තේ යැයිදු දතයුතුයි. පරමාර්ථධර්මවිභාගයේදී හෙවත් අභිධර්මදේශනාවේදී 'ඒකග්ගතා' නාමයෙන් දේශනා කරන ලද්දේ මේ 'සමාධි' චෛතසිකයයි. මෙය සියලු සිත්හිම යෙදෙන බැවින් 'සබ්බචිත්තසාධාරණ' චෛතසික ධර්මයෙකි. ආර්ය අෂ්ටාඞ්ගික මාර්ග දේශනාවේ එන 'සම්මාසමාධිය' ද මෙය මිස අනෙකක් නො වේ.

මෙතන්හි 'සමාධි' නාමයෙන් හඳුන්වනු ලබන මේ චෛතසිකධර්මය; අන්‍යධර්මයන් ගෙන් වෙන්කොට දැනගැනීම සඳහා, පාලියෙහි එන; "හෙට්ඨිමම්හි සමුග්ගපටලෙ උපරිමං සමුග්ගපටලං විය ආරම්මණෙසු එකසිතං හුත්වා උප්පජ්ජති" යනවාක්‍ය ඛණ්ඩය තේරුම් ගැනීම සුදුසුයැයි සිතමි. සමාධිය වනාහී, කරඬුවෙක උඩුපියන යට පියනෙහි මනා කොට පැහැසී වැද ගන්නා සේ; අරමුණෙහි මනා සේ සපශී වූවක් වැ උපදී යනු එහි සිංහල අනුවාදය යි.

මෙ පරිද්දෙන් සමාධිය, චිත්ත-චෛතසිකධර්මයන් ඒ ඒ අරමුණෙහි නො බහාලීම සඞ්ඛ්‍යාත ලක්ෂණයෙන්; එකක් වූවද උපචාර-අප්පනා-ලෞකික-ලෝකෝත්තර ආදි වශයෙන් ද්විප්‍රකාර වන්නේය එසේම හීන-මධ්‍යම-ප්‍රණීතාදි වශයෙන් තුන් වැදෑරුම්ද, දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා යනාදි නොයෙක් ප්‍රභේදයෙන් සතර වැදෑරුම්ද වේ පඤ්චකධ්‍යානාදීන් ගේ වශයෙන් පඤ්චප්‍රකාර බවද දතයුතුයි. මෙසේ නානා ප්‍රභේදයෙන් යුක්තවූ සමාධිය සක්විති රජහුගේ ගෘහපති රත්නයට සමානය. ඒ ගෘහපති රත්නය, ධන ධාන්‍යාදී සම්පත් පිළිබඳ වික්ෂේපය මගහරවා රජහුගේ සිත එකඟ කරයි එ මෙන් මේ සමාධියද චිත්ත වික්ෂේපය නැතිකරමින් සිතේ එකමුතුකම ඇති කරයි. එහෙයිනි ගෘහපති රත්නයට සමාන වනුයේ.

නිර්වචනාර්ථ වශයෙන් සමාධිය හඳුන්වා ලීම පිණිස, මා මෙතෙක් කළ විස්තරය අවස්ථාවේ හැටියට ප්‍රමාණවත් යැයි

හැකිමි. මෙයට වඩා විස්තර දැන ගැනීමට උවමනා නම් "විසුද්ධි මාර්ගයේ, කර්මස්ථාන ග්‍රහණ නිර්දේශය" බලා හෝ, විවෙක වේලාවක ධර්මධරයාණ කෙනකුගෙන් අසා හෝ දැන ගන්නා ලෙස, මේ සභාවට ඉතා කරුණාවෙන් දන්වමි. මා මීලඟට බලාපොරොත්තු වන්නේ "සං" යන පදය පිළිබඳව වචනයක් දෙකක් කියන්ටයි.

සෑම භාෂාවෙක ම පද කොටස් හතරෙකි. නාම-ආඛ්‍යාත-උපසර්ග-නිපාත වශයෙනි. මේ සතර වැදෑරුම් පදයන් අතුරෙන් "සං" යනු උපසර්ග පදයෙකි. ස්වාභාවික ලක්ෂණ තුනකින් යුක්තවූ උපසර්ග පදයන් ද, නොයෙක් නොයෙක් අර්ථ ප්‍රකාශ කරන බව අප විසින් සැලැකිය යුතුයි. මේ "සං" යන උපසර්ග පදයෙන් තැනට ගැළපෙන සේ ප්‍රකාශ වන ඉතාමත් හොඳ තේරුම නම් "සඟපත්" යනු යි. 'මනා-සුන්දර' යනාදීහු ද එයට මෑ පර්‍යාය අර්ථයෝ යි. මෙසේ "සං" යන පදයෙන් 'සහපත්-මනා-සුන්දර-' යන තේරුම් ලැබෙන බව සිතට ගත යුතු යැ.

දැන්, 'සම්බොධි-සං-බොධි-අඞ්ග' යන තන්හි 'බොධි' යන පදය විවරණයට ගනිමු. 'බොධි' ශබ්දය ද නානාවිධ අර්ථයන්හි වැටේ.

"රුක්ඛෙ මග්ගෙ ච නිබ්බානෙ—ඤාණෙ සබ්බඤ්ඤුතාය ච
තථා පණ්ණත්තියඤ්චෙව—බොධි සද්දො පවත්තති."

යන්නෙන් ප්‍රකාශ වන්නේ එයින් සමහර අර්ථ කෙනෙකි. "වෘක්ෂාර්ථයෙහි" ද, මාර්ගාර්ථයෙහි ද, නිර්වාණාර්ථයෙහි ද, සර්වඥතා-ඥානාර්ථයෙහි ද, ප්‍රඥප්ත්‍යර්ථයෙහි ද, සාමාන්‍ය වශයෙන් 'බොධි ශබ්දය' පවතින බව මේ ගාථාවෙන් ප්‍රකාශ වේ. 'බොධි' ශබ්දයේ අර්ථ මෙසේ බහු ප්‍රකාර වුව ද, මෙහි ලා ගැනෙනුයේ 'මාර්ගාර්ථ-ප්‍රඥප්ත්‍යර්ථ' දෙක පමණි. මෙකී අර්ථ දෙක පමණක් බොධි ශබ්දයෙන් ගැනෙනුයේ මවිසින් මතු ප්‍රකාශ කරනු ලබන ක්‍රමයට අනුව යි.

"බුජ්ඣති එතායා'ති බොධි" යනු බොධි ශබ්දයෙහි එක් නිර්වචනයෙකි. යමක් කරණ කොට ගෙන 'දුක්ඛ-සමුදය-නිරොධ-මාර්ග-' යන චතුරාර්‍ය සත්‍යය අවබොධ කෙරේ නම්, ඒ 'බොධි' නමැයි මේ කරණකාරක වාක්‍යයෙන් ප්‍රකාශ වේ. මෙයින් කුමක් අදහස් කරන ලද ද? මේ ශ්‍රද්ධාවත් පිරිස මෙයට පෙර ශ්‍රවණය කරන ලද, අද ශ්‍රවණය කරන, මතුත් ශ්‍රවණය කරන, 'බොජ්ඣඞ්ග' යන අපරනාම ධෙයයකින් නැතහොත් නාමා'ඞ්ග

යකින් හැඳින්වෙන, "සති- ධම්මවිචය- විරිය- පීති-පස්සද්ධි-සමාධි-උපෙක්ඛා" නම් වූ ධර්ම සාමග්‍රිය යි මෙහි 'බෝධි' ශබ්දයෙන් ප්‍රකාශ වුණේ.

යටත් පිරිසෙයින් සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් හෝ; උඩත් පිරිසෙයින් සොළසාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක්, දාන සීලාදී දස පාරමිතා ධර්ම සමතිස් ආකාරයකට පුරා, චතුරාර්ය සත්‍යය ස්වයම්භූ ඥානයෙන්, පරොපකාර රහිතව, අවබෝධ කර ගන්නා සම්මා සම්බුදු වරුන් හට ද, දෙයාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමිතා ධර්ම පරිපූර්ණය කිරීමෙන් චතුස්සත්‍යාවබෝධය කර ගන්නා පසේබුදු වරුනට ද, එකාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පුරා සිව්සස් පිළිවිදූනා රහතුන් හට ද, උපකාරත්වයෙන් පවත්නේ මේ සප්තවිධ බොධ්‍යඞ්ග ධර්ම විනා අනෙකක් නොවේ. ඒ සැම කෙනෙක් ම චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගන්නේ, මේ බොධ්‍යඞ්ග ධර්ම මාර්ගයෙනි. එබැවින්, චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමෙහි ලා උපකාර වන්නේ, කරණ වන්නේ, යන අර්ථයෙන්, සති-ධම්මවිචය ආදී ධර්ම සමුදාය බෝධි ශබ්දයෙන් ප්‍රකාශ වුණු බව සැලැකිය යුතුයි. එසේ ම, මෙහි දී අර්හත්වය ලබා ගැනීමෙහි උපාය මාර්ගය ප්‍රකාශ වුණු බැවින්, බෝධි ශබ්දය 'මාර්ගාර්ථයෙහි' වැටුණු බව ද දතයුතු ය.

බෝධි ශබ්දය පිළිබඳ ප්‍රස්තාවෝචිත දෙවන අර්ථය ප්‍රඥප්ති ය යි. "බුජ්ඣතීති බෝධි" යන නිර්වචනයෙන් එය ප්‍රකාශ වේ. 'ප්‍රඥප්ති' නම් සවිඥානක හෝ අවිඥානක හෝ, හෙවත් පණ ඇති හෝ නැති හෝ යමක් හැඳින ගැනීමට තබන 'සංඥා' නාමය යි.

'කල පණත සත් නම්' යනු එක්තරා ප්‍රශස්ත ශාබ්දිකයකු ප්‍රකාශ කෙළේ එහෙයිනි.

චතුරාර්ය සත්‍යය අවබෝධ කරන තැනැත්තේ, 'බෝධි' නමැයි මා මුලින් කී වාක්‍යයෙන් පැහැදිලි කෙරෙයි. කාරක කර්තෘයෙහි නිපන් ඒ වාක්‍යාර්ථය සලකන කල, 'බුදු-පසේබුදු-මහ රහත්-' යන තුන් බුදුවරයන් හට 'බෝධි' යැයි කී බව වැටහේ. වෙන වචනයකින් කියතොත්, "බෝධි" නාමයෙන් හඳුන් වනු ලබන්නේ 'බුදු-පසේබුදු-මහ රහතුන්' වහන්සේ ය. සවිඥානක වූ උන්වහන්සේලා හැඳින්වීමට 'බෝධි' යනු 'සංඥා' නාමයෙකි. එහෙයින් ම ප්‍රඥප්තියෙකි. මේ ප්‍රඥප්ත්‍යර්ථයෙහි "බෝධි" ශබ්දය වැටිණ. මේ විස්තරයට අනුව 'බෝධි' යැයි කියනු ලබන්නේ බුදු-පසේබුදු මහ රහතුන් වහන්සේට බවත්, ඒ ප්‍රඥප්ත්‍යර්ථ වශයෙන් බවත්, ඔබ සැම කෙනකු ම සිතා ගත යුතු යි.

මේ දැක්වූයේ 'බොධි' ශබ්දය පිළිබඳව අර්ථ දෙකක් පමණි. තවද බොහෝ අර්ථයන් මේ ශබ්දය තුළ පර්යාය බව සැලකිය යුතුය.

> "බුජ්ඣති, කිලෙස සන්තාන නිද්දාය උට්ඨහති, චත්තාරි වා අරිය සච්චානි පටිවිජ්ඣති, නිබ්බානමෙව වා සච්ඡිකරොති."

යන මෙයින් ද, එ පිළිබඳ සමහර අර්ථ කෙනෙක් පැහැදිලි කෙරෙති. 'බොධි' නම් වූ 'සති' ආදී ධර්ම සමූහය හේතු කොට ගෙන ආර්ය ශ්‍රාවකතෙමේ ක්ලේශ නිද්‍රාවෙන් නැගී සිටී, සිව්සස් දහම් තත්වූ පරිදි දැනැ ගනී, අමාමහ+ නිවන් පසක් කර ගනී. යනු එහි සාමාන්‍ය අදහස යි.

මීළඟට අවසාන වශයෙන් විස්තර කළ යුත්තේ 'අඞ්ග' යන පදය යි. මෙය 'අවයවාර්ථ-හේත්වර්ථ-දේශාර්ථයන්හි' වැටෙන නාම පදයෙකි ඔවුනතුරෙන් මෙතැනට සුදුසු වන්නේ අවයවාර්ථය පමණ යි 'අවයව' නම් යම්කිසි ධාතුපුඤ්ජයක් පිළිබඳ ඒ ඒ කොටස් ය. නිදර්ශනයක් වශයෙන් මනුෂ්‍යයකු අරගෙන බලමු. මනුෂ්‍යයා ධාතු පුඤ්ජයෙකි 'පඨවි-ආපො-තෙජො-වායො-' යන සතර මහා ධාතූන්ගේ සමපිණ්ඩනයක් බැවිනි. ඔහු ගේ, අත්-පා-ඇස්-කන්-නාසා ආදී එකී එකී කොටස් ඔහු පිළිබඳ අවයව යි. මේ අවයව වලට 'අඞ්ග' යනු ද අපර නාමයෙකි. අත්-පා ආදී අවයව, හෙවත් අඞ්ග, ඇත්තේය යන අර්ථයෙන් සත්ත්වයාට 'අඞ්ගින්' කියා සංස්කෘත භාෂාවෙන් ප්‍රකාශ කරන්නේ මේ කාරණය නිස යි. සංස්කෘත භාෂාවෙන් පමණක් නො වේ, ද්‍රාවිඩාදී තවත් නොයෙක් භාෂාවන්ගෙන් ද, මෙයට සමානවූ ම; නාමයන් ව්‍යවහාර වන බව ප්‍රාප්තා'වසර වශයෙන් දන්වනු කැමැත්තෙමි.

ඉදින්, මෙ තන්හි 'අඞ්ග' යනුවෙන් ප්‍රකාශ වුණේ, කවරක හෝ කවරකු ගේ හෝ අවයව වලට දැයි සලකා බැලිම වටී. චතුරා'ර්ය සත්‍යය අවබොධ කර ගැනීමෙහි උපාය මාර්ගය වූ සති-ධම්මවිචය ආදී ධර්ම සමූහයා ගේ හෝ, සෝවාන්-සකෘදාගාමි-අනාගාමි-අර්හත් යන සතර මාර්ග ඥානා'වබොධය කරන ආර්ය ශ්‍රාවකයා ගේ නැතහොත් යොගාවචර පුද්ගලයා ගේ අවයවයන් සඳහා මෙහි 'අඞ්ග' යැයි කියන ලදී. මනුෂ්‍යයා ගේ 'අඞ්ග' යනුවෙන් හඳුන්වනු ලබන ඇස්-කන්-නාසාදී අවයවයන් හේතු කොට ගෙන, ඔහු කරන්නේ කුමක් ද යනු අපට ප්‍රත්‍යක්ෂ යි.

මනුෂ්‍යයා, රූප දර්ශනය-ශබ්ද ශ්‍රවණය-ගන්ධාඝ්‍රාණය, මෙ ආදිය කරන්නේ ඇස්-කන්-නාසාදී අවයවයන්-අඞ්ගයන් හේතු කොට ගෙනයි. එසේ ම, යොගාවචරයා සතරමග, සතරඵල, නිවන් යන නව ලොවිතුරා දහම් පසක් කර ගන්නේ 'සති' ආදී මේ ධර්ම සාමග්‍රිය හේතුවීනි. 'අඞ්ග' යන පදය පිළිබඳ තේරුම මේ විස්තරය අනුව දතයුතු යැ.

මේ වනතුරු, මවිසින් කරන ලද්දේ 'සමාධි සම්බොජ්ඣඞ්ගා' යන සමාස පදය, හුදෙකලා පද වශයෙන් කොටස් හතරකට කඩා, ඒ එකක් පාසා; නිර්වචනාර්ථ විසින් පැහැදිලි කර දීම යි. දැන්, එකී පද කොටස් හතර එකතු වන හැටිත්, එකතු වී, ඒ අනුසාරයෙන් ප්‍රකාශ කරන 'භාවාර්ථයත්,' ගැන වචනයක් කියන්නට කල්පනා කරමි. 'සමාධි-සං-බොධි-අඞ්ග' යන ශබ්ද සතර පිළිබඳ ව, වෙන් වශයෙන්; මනා අවබොධය ද මේ සත්පුරුෂ ජනතාවට දැන් ඇතිවී තිබෙනවාට සැකයෙක් නැත.

> මේ ශබ්ද සතර එකතු වන්නේ, "අඞ්ගා'ව-අඞ්ගා, බොධියා බොධිස්ස වා අඞ්ගා-බොජ්ඣඞ්ගා, පසත්ථා සුන්දරා වා බොජ්ඣඞ්ගා-සම්බොජ්ඣඞ්ගා, සමාධි එව සම්බොජ්ඣඞ්ගා-සමාධි සම්බොජ්ඣඞ්ගා"

යන ආකාරයෙනි. අත්-පා-කන්-නාසාදී අවයව-අඞ්ග, වැනි නිසා 'අඞ්ග' නම් ද, සිව්සස් පිළිවිදුනා උපාය මාර්ගය හෝ ආර්ය ශ්‍රාවකයා හෝ පිළිබඳ අඞ්ග 'බොජ්ඣඞ්ග' නම් ද, ප්‍රශස්ත වූ, සුන්දර වූ, බොජ්ඣඞ්ග 'සම්බොජ්ඣඞ්ග' නම් ද, සමාධිය ම සම්බොජ්ඣඞ්ග වූයේ, 'සමාධි සම්බොජ්ඣඞ්ග' නම්ද වේ යනු එහි නොපැහැදිලි තේරුමයි.

මෙහි පැහැදිලි තේරුම ලබා ගන්නට නම්, සම්පූර්ණ පදය කොටස් දෙකකට කඩා සැලකිය යුතු ය. 'සමාධි' යනු එක් කොටසකටත්, 'සම්බොජ්ඣඞ්ගා' යනු තවත් කොටසකටත් වශයෙනි. මනුෂ්‍යයා ගේ අත්-පා ආදී අඞ්ගවලට-අවයව වලට 'මනුෂ්‍යාඞ්ග'-නැතහොත් 'මනුෂ්‍යාවයව' යැයි කියනු ලැබේ. එය සර්වසාධාරණ නාමයෙකි. හෙවත් හස්තපාදාදී සියලු මැ කොටස් වලට පොදුවේ ව්‍යවහාර කරන නාමයෙකි. එමෙන් ම, 'බොජ්ඣඞ්ග' යනු ද පොදු නාමයෙකි. යම්කිසි ධර්මසාමග්‍රියක උපකාරයෙන් චතුරාර්ය සත්‍ය අවබොධ කරනු ලැබේ නම්, ඒ ධර්ම සාමග්‍රිය සඞ්ඛ්‍යාත උපාය මාර්ගයාගේ අවයව-අඞ්ග-වලට සාමාන්‍යයෙන් 'බොජ්ඣඞ්ග' යැයි කියනු ලැබේ.

"තස්සා ධම්මසාමග්ගි සංඛාතාය බොධියා අඞ්ගානි බොජ්ඣඞ්ගා"

යනුවෙන් ප්‍රකාශ වුණේ මේ අදහස යි. නැතහොත් එකී උපාය මාර්ගයෙන් චතුරාර්ය සත්‍යය අවබොධ කර ගන්නා ආර්ය ශ්‍රාවකයාගේ අවයව-අඞ්ග-වලට හෝ 'බොජ්ඣඞ්ග' යනු අවිශෙෂ ව්‍යවහාරයක් බව කල්පනා කළ යුතුය.

මේ අදහස,

"එතාය ධම්මසාමග්ගියා බුජ්ඣන්තීති කත්වා අරියසාවකො බොධීති වුච්චති. (තස්ස) බොධිස්ස අඞ්ගා බොජ්ඣඞ්ගා"

යන පාලි වාක්‍යයෙන් පැහැදිලි තෙරෙයි (මෙහි ද පළමු වැන්න මාර්ගාර්ථ වශයෙනි. දෙවැන්න ප්‍රඥප්ත්‍යර්ථ වශයෙනි.) එම 'බොජ්ඣඞ්ග' ප්‍රශස්තවූයේ, සුන්දරවූයේ, ශ්‍රෙෂ්ඨවූයේ "සම්බො-ජ්ඣඞ්ග" යැයි හඳුන්වනු ලැබේ.

'මනුෂ්‍ය'ඞ්ග' යන පොදු ව්‍යවහාරයෙන් කියැවෙන අවයව අතුරෙන් යම්කිසි එකක් වෙන් කොට ගැනීමේ දී "හස්තය නමැති මනුෂ්‍ය'ඞ්ගය-පාදය නමැති මනුෂ්‍ය'ඞ්ගය" යනාදී වශයෙන් කිව මනා ය. එසේ ම මෙහිදීත්, 'සම්බොජ්ඣඞ්ග' යන සාමාන්‍ය නාමයෙන් කියැවෙන අවයව ධර්ම සමූහයෙන් එකක් වෙන් කොට ගැනීම සඳහා "සමාධි සම්බොජ්ඣඞ්ගො" යැයි කියන ලදි. මේ උපමා කථාවෙන්, හස්තපාදාදී සියලු අවයව වලට 'මනුෂ්‍යඞ්ග' යනු සාමාන්‍ය ව්‍යවහාරය වන්නාසේ, 'සම්බොජ්ඣඞ්ග' යනු ද 'සති-ධම්මවිචය-විරිය-පීති-පස්සද්ධි-සමාධි-උපෙක්ඛා' යන මුළුල්ලට ම පොදු නාමයක් බවත්, 'සමාධි සම්බොජ්ඣඞ්ගො' යනු 'හස්තය නමැති මනුෂ්‍යඞ්ගයැ' යි කියන්නා සේ විශෙෂ නාමයක් බවත්, පින්වතුන්හට ඉතා හොඳින් අවබොධ වී ඇත.

මීලඟට මේ සියලු පදයෙන් ප්‍රකාශයට පැමිණෙන, 'භාවා[illegible]ය' කුමක්දැයි සැලකීම ප්‍රස්තා'වොචිත යි. එහිලා, නිරවද්‍ය සුඛ විපාක ලක්ෂණ වූ චිත්තෙකාග්‍රතාව, සති ආදී උපාය මාර්ගයා ගේ නොහොත් ආර්ය ශ්‍රාවකයා ගේ; අවයවයෙකි, අඞ්ගයෙකි, යනු 'සමාධි සම්බොජ්ඣඞ්ගො' යන සමස්ත පදයෙහි භාවාර්ථය වශයෙන් දත යුතු යි.

මෙසේ, නිර්වචනාර්ථවශයෙන් හා භාවාර්ථවශයෙන් හා සාමාන්‍ය යෙන් විස්තර කළ 'සමාධි සම්බොජ්ඣඞ්ගය' ලබා ගැනීමේ ක්‍රමයත්

උපැදවීමේ හේතූන් පිළිබඳවත්, එහි ආනිසංස පිළිබඳවත් යමක් කියන්නට මෙ තැන් සිට ආරම්භ කරමි. එද ඉතා මැ ලුහුඬින් ප්‍රකාශ කරන බව කල්පනා කළ යුතුයි.

“එකාදසධම්මා සමාධි සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති, 1 වත්ථුවිසද කිරියතා- 2. ඉන්ද්‍රිය සමත්තපටිපාදනතා- 3. නිමිත්ත කුසලතා- 4. සමයෙ චිත්තස්ස පග්ගණ්හනතා- 5. සමයෙ චිත්තස්ස නිග්ගණ්හනතා 6. සමයෙ සම්පහංසනතා- 7. සමයෙ අජ්ඣුපෙක්ඛනතා- 8 අසමාහිත පුග්ගල පරිවජ්ජනතා- 9 සමාහිත පුග්ගල සෙවනතා- 10. ඣානවිමොක්ඛ පච්චවෙක්ඛනතා- 11 තදධිමුත්තතා” ති.

මේ ප්‍රකාශ කෙළේ සමාධි සම්බොධ්‍යඞ්ගය උපදවා ගැනීමෙහි හෙතුභූතයෙන් පවත්නා එකොළොස් ධර්ම කෙනෙකි. එයින්

1. ‘වත්ථුවිසද කිරීයතා’ව පළමු වැන්නයි. මෙකී බොධ්‍යඞ්ග ධර්මය උපදවනු කැමැත්තහු විසින්, අභ්‍යන්තර-බාහිර වස්තූන් පිරිසුදු කටයුතු ය. දික්වූ කෙස් ලොම් නිය ආදිය නොකපා ඛනදියෙන් වැකුණු ශරීරයෙන් දුගඳ වහනය වෙමින් සිටීම, අනුන්ගේ පිළිකුලටමෙන්මැ; තමන්ගේ චිත්තවික්ෂෙපයට ද කාරණයෙකි. එසේ සිටීමෙන් සිත සමාධිගත කර ගැනීම හෙවත් එකඟකරගැනීමදුෂ්කරය. එබැවින් දික්වූ කෙස් ලොම් නිය ආදිය කපා හැර ස්නානය කිරීමාදියෙන් අභ්‍යන්තරික වස්තූන් පිරිසිදු කටයුතු යි. එපමණක් ද නොවේ, යොගාවචරයා පරිභොග කරන සිවුරු පිරිකර ඉතාමත් දිරා ගොස් හෝ තිබේ ද, දූවිලි-දූලි-කුණු ආදිය තැවරීමෙන් අතිශයින් කිළිටිව ගෙන හෝ තිබේ ද, එය බැහැරලීමෙන් හෝ සේදීමෙන් හෝ අළුත්වැඩියා කර ගැනීමෙන් සහ, කොල-රොඩු-කුණු-කසළ පිරුණු සෙනාසනයක් නම් ඇමැදලීමෙන් ද බාහ්‍ය වස්තූන් පිළිබඳ පිරිසිදු බව ලබා ගත යුතු ය. මෙසේ අධ්‍යාත්මික බාහිර වස්තූන් පරිශුද්ධ භාවයට පැමිණැවීම වත්ථුවිසද කිරියතා නම්.

2 ඉන්ද්‍රියසමත්ත පටිපාදනතා. ඉන්ද්‍රිය ධර්මයන් ඉතාම ශක්තිමත් වන්නටද, ඉතාම දුර්වල වන්නටද නොදී සමබැවෙහි තබාගැන්ම, දෙවන හෙතුවවූ; ඉන්ද්‍රිය සමත්ත පටිපාදනතාවයි. මෙහි ඉන්ද්‍රිය ධර්මයෝ නම්, “ශ්‍රද්ධා-වීර්‍ය්‍ය-සති-සමාධි-ප්‍රඥා” යන පඤ්චධර්මයෝය. මොවුන් අන අනුපාතිකත්වයෙන් සම බැවෙහි පිහිටුවා ගැනීමද ‘සමාධිසම්බොධ්‍යඞ්ගය’ උපදවාලීමට අවශ්‍යයයි. යම්කිසි යොගාවචරයකුගේ සද්ධින්ද්‍රිය බලවත්වී, අනික් ඉන්ද්‍රියයෝ දුර්වල වෙත්ද,

එවිට; තමා සමග එක්ව යෙදුණු සෙසු ඉන්ද්‍රියයන්ට අනුබලදී ඔවුන් උත්සාහවත් කරවීමට විරියින්ද්‍රිය අසමර්ථ වේ. සති-සමාධි-පඤ්ඤා යන ත්‍රිවිධ ඉන්ද්‍රියෝ ද ස්වකීය ස්වකීය කෘත්‍යයෙහි, මෙසේම; පසුබට වෙති. එහෙයින්, අභිමුඛීභූත ආරම්මණය; යථාස්වභාවයෙන් මෙනෙහි කිරීමෙන් සද්ධින්ද්‍රිය දුර්වල වේ නම් එසේ කිරීමෙන් හෝ, මෙනෙහි නොකිරීමෙන් දුර්වල වේ නම්, මෙනෙහි නොකර අත් හැරීමෙන් හෝ ශක්තිසම්පන්න ශ්‍රද්ධෙන්ද්‍රිය පිළිබඳ වෙගය අඩුකළ යුතුවේ. එසේ අඩුනොට සමබවට පමුණුවා නො ගතහොත් කිසිම විටෙක සමාධිය ලැබිය නොහැක. ''වක්කලි'' තෙරණුවන්ගේ ජීවනචරිතය, මෙහි ලා ඉතාම හොඳ නිදර්ශනයෙකි.

ස්වභාව වශයෙන්ම බොහෝ දෙනකුගේ ශ්‍රද්ධාසම්පත්තිය වැඩි කර විය යුතු වන නමුදු, එදා වැඩසිටි වක්කලි ස්ථවිරයන් වහන්සේ ගේ ශ්‍රද්ධාව අඩු කරගන්නට සිදුවූණේය. උන්වහන්සේ තරම් ශ්‍රද්ධාවෙන් අග තැන් පැමිණි කෙනෙක්, එදා භික්ෂූන් අතර නොවූහ ශ්‍රද්ධා'ධිමුක්තිය පිළිබඳව අග්‍රස්ථානාන්තරයක් පවා බුදුරදුන්ගෙන් ඒ තෙරණුවන්ට ලැබුණේ එහෙයිනි.

'වක්කලි' තෙරණුවෝ, අප බුදුරදුන් දවස සැවැත්නුවර බමුණු කුලයෙක උපන් මානවකයාණ කෙනෙකි ගිහි කාලයෙහිද 'වක්කලි' නාමයෙන්ම ප්‍රසිද්ධවූ ඔවුහු, ත්‍රිවේදයෙහි කෙළ පැමිණ; තන් ගිහි සැපත් විඳිමින් පසුවෙත අතර; දවසෙක පිඬු සිඟා වඩනා සපිරිවර බුදුරදුන් දුටහ. ලොකයෙහි ඇති තාක් පැහැය එක්කොට තබන ලද්දක් වැනි වූ, ලොව්තුරා බුදුරදුන්ගේ දෙතිස් මහාපුරුෂලක්ෂණයෙන් ශොභමානවූ රූප කායසම්පත්තිය දුටු, වක්කලිමානවකයාණෝ, උන්වහන්සේ පසු පස්සේම ඇදුනාහ. ඇස පුරා දක්නා බුදුසිරුරු සිරි දම්වැලේ වෙලී විහාරයටම ගියහ, එදා බොහෝ වේලා යනතුරු, රූප ශොභාව බලමින්; සිට, පෙරළා බමුණු ගෙදරට පැමිණි වක්කලි මානවකයාණෝ, නිරන්තරයෙන් මැ විහාරයට ගොස්, බුදුරදුන් දම් දෙසන විටත්; පසෙකට වී උන්වහන්සේ දෙස බලාගත් මනම සිටිති, ඉතුදු සැඟීමකට පත්නොවී, සෑම මොහොතක් පාසාම බුදුරදුන් බැලීමේ පරම ආශාවෙන්, කෙළවර මහණව ගත්හ,

මෙසේ මහණව ගත්දා පටන්මැ, වක්කලි තෙරණුවන්ගේ සිහින, බුදුරදුන් පසෙකින් යම්කිසි නිසොල්මක් නැතකට වී, උන්වහන්සේම බල බලා සිටීමකි,

හිත උතුරා යන ශ්‍රද්ධාවෙන් පැතුරුණු වක්කලී තෙරණුවන් හට, ''දෙතිස් කුණු කොටසකින් පිරී මගේ මේ පිළිකුල් වෙර කුඩුව බලනුවෙනුවට, මගේ නවලොව්තුරා සදහම් නුවණැසින් බලනු මැනවැ''යි; බුදුරජාණෝ නොයෙක්විට අවවාද කළහ. නමුත් බුදුරදුන් දැකීම පිළිබඳව; වක්කලී තෙරණුවන්ගේ සිතෙහි පැවැති බලවත් ප්‍රීතිය දුරු කරන්නට, ඒ අවවාද අසමත් විය

ඉක්බිති බුදුරජාණන් වහන්සේ, සැවැත්නුවරින් බැහැරව ගොස් රජගහ නුවර වේළුවනාරාමයෙහි පෙරවස් එළඹීමට සූදානම්වූසේක. වක්කලී තෙරණුවෝ එතැනට ද පැමිණියහ. එවිට බුදුරජාණෝ, ''පලා යව, වක්කලිය! පලා යව, වක්කලිය! මෙහි නොනවතුව, වක්කලියැ'' යි තෙරණුවන් විහාරයෙන් නෙරපා දැමූහ. එයින් බලවත් ශෝකයට පත් වක්කලී තෙරණුවෝ, අද බුදුපියාණෝ මා නෙරපූහ, ඉදින් උන්වහන්සේ මා හා කථා නොකරන සේක, උන්වහන්සේ නොදැක මොහොතකුදු සිටින මගේ මේ ජීවිතයෙන් වැඩක් නැතැ''යි එදිනම සවස ''ගිජ්ඣකූළ පව්වට'' නැග, එයින් පැන පණ නසා ගන්නට තැත් කළහ.

එබව දිවැසින් දුටු භාග්‍යවතුන් වහන්සේ, තෙරණුවන් වෙත රස් කඳක් විහිදුවා, තමන් වහන්සේ දක්වමින්; උනට ප්‍රීතිප්‍රමොද්‍යය උපදවනු සඳහා සුදුසු ධර්මදේශනාවක් කළ සේක. ''වක්කලිය මෙහි එව''යි ශ්‍රී හස්තය ද එදෙසට දිගු කළහ. එයින්ම පිනා ගිය වක්කලී තෙරණුවෝ, ධර්මදේශනාවත් මෙනෙහිකොට අහසෙහි දීම සිව්පිළිසිඹියාවෙන් අර්හත්වයට පැමිණ බුදුරදුන් වඳිමින් බිමට බටහ.

මෙයින්, වක්කලී තෙරණුවන්ගේ ශ්‍රද්ධේන්ද්‍රිය අතිශයින් බලසම්පන්නාවූ බවත්, සමාධි සමධිගමයට එය දුර්වල කරවිය යුතු වූ බවත්, එහි ලා අභිමුඛීකෘත ආරම්මණය හෙවත් බුදු සිරුර පිළිබඳ ව යථා ස්වභාව වශයෙන් මෙනෙහි කරන්නට සිදුවූ බවත්, මනාව පැහැදිලි වේ. (''මනොරථපූරණී'' ආදී ධර්මග්‍රන්ථයන් ගෙන්, වක්කලී තෙරුන්ගේ අපදානය විස්තර සහිතව දතහැක.)

විරියාදී අනිකුදු ඉන්ද්‍රියධර්මයන් අතිශයින් බලසම්පන්න වූ විට, දුර්වල කිරීමෙන්; මෙසේම සම බැවෙහි තබාගැනීම අවශ්‍ය බව සැලකිය යුතුය. එයට, කෝළිවිස ගොත්‍රයෙහි උපන්

''සොණාදි'' ස්ථවිර වරුන්ගේ අපදාන නිදර්ශන වශයෙන්; දක්විය හැකි වූවත් දේශනාව දීර්ඝ වන බැවින් මෙතෙකින් නවතිමි.

ලුණු-මිරිස්-දුරු-කිරි-කහ සම පමණට යෙදුණු ව්‍යඤ්ජනයම මධුරරසෝත්පාදනයෙහි සමර්ථ වන්නා සේ, ''සද්ධා-විරිය-සති-සමාධි-පඤ්ඤා'' සම බැවෙහි සිටි සිත ම, සමාධිසුඛෝත්පාද නයෙහි සමර්ථ වන බවත්, එය ''ඉන්ද්‍රියසමත්තපටිපාදනතා'' නම් දෙවන හෙතුව වන බවත් පමණක් අවශාන වශයෙන් පින්වතුන් හට දන්වනු කැමැත්තෙමි.

තුන්වන හෙතුව:-

3. **නිමිත්තකුසලතා.** යනුවෙන් දක්වෙන්නේ, කසිණාරම්මණයෙන්, භාවනා වශයෙන්; වඩා ගත් ''උද්ග්‍රහ නිමිත්ත'' ආරක්ෂා කිරීමෙහි දක්ෂභාවය සඞ්ඛ්‍යාත ''රක්ෂණ කෞශල්‍යය'' යි. එද, සමාධිසම්බොධ්‍යඞ්ගධර්මය ඉපැදවීමෙහි ලා හෙතුවක් වශයෙන් පවතී.

දුදුසු අවස්ථාවෙහි සිත සිටුවාලීම:-

4. **සමයෙ චිත්තස්ස පග්ගණ්හනතා.** නම් සතර වනහෙතුව යි. යම්කිසි විටෙක හීන වීර්යාදියෙන් යොගාවචරයාගේ සිත හැකිළී යේනම් එවිට ''ප්‍රශ්‍රබ්ධි'' ආදී බොධ්‍යඞ්ග ධර්ම වැඩීමෙන් උත්සාහවත් කොට නගා සිටුවිය යුතුය. වියැලි තණකොළ ආදිය එකතුකිරීමෙන්, නිවී නෙන යන ගින්නක් බෝකරගන්නාක් මෙන් එසේ ඇති කල්හිම සමාධිසම්බොධ්‍යඞ්ගය පහළ කරගත හැක

පස්වන හෙතුව:-

5. **සමයෙ චිත්තස්ස නිග්ගණ්හනතා.** නම්. යම් කාලෙක සිත නිග්‍රහ කළ යුතු නම්, එකල නිග්‍රහ කටයුතු වේ. **''යස්මිං සමයෙ චිත්තං නිග්ගහෙතබ්බං, තස්මිං සමයෙ චිත්තස්ස නිග්ගණ්හා හොති''** යන්නෙන් එ බව ප්‍රකාශිතය. යම්කිසිවිටෙක යොගාවචරයාගේ සිත, පටන්ගත් කාලද අධික වීර්යාදිය නිසා නොසන්සුන් වේද, සමාධිය ඉක්මවා යේද, එවිට 'ප්‍රශ්‍රබ්ධි-සමාධි-උපෙක්ෂා' යන ත්‍රිවිධ බොධ්‍යඞ්ග ධර්ම පමණක් වැඩීමෙන් සිතේ වීර්යාධික්‍යය මැඩලීම මෙහිදී

අදහස් කරණ ලදී. හාත්පසින් දැල්වී දිලිසෙන ගින්නක් අමු ගොම-පස්-දිය ආදිය ඉසීමෙන් නිවාලන්නාක් මෙනි. මෙසේ සුදුසු අවස්ථාවෙහි සිත නිග්‍රහවීට පැමිණැවීමෙන්ම සමාධිසම්බො-ධ්‍යඞ්ගධර්ම ප්‍රතිලාභයෙන් අභීෂ්ටය ලබාගත හැක.

මිලගව දතසුත්තේ-

6. සමයෙ සම්පහංසනා. නම් හය වන හෙතුව පිළිබඳව යි. සිත සතුටු කළ යුතු අවස්ථාවෙහි එය කළ යුතු බව මෙයින් ප්‍රකාශයට පැමිණේ. සමාධි භාවනා වඩන්නහුගේ ප්‍රඥාව පිළිබඳ ප්‍රභෙද මද බැවින් හෝ සිත එකඟ කිරීමෙන් ලැබිය යුතු සැප නො ලැබීමෙන් හෝ, සිත ආස්වාද රහිතවූ කල්හි ජාත්‍යාදි මහා සංවෙග වස්තූ අට මෙනෙහි කිරීමෙන්, ප්‍රථමකොට සිත සංවෙගයට පැමිණැවිය යුතුය. ඊටපසු බුද්ධාදී රත්නත්‍රය පිළිබඳ ගුණානුස්මරණ යෙන් සිත ප්‍රීතිමත් කළයුතු වේ. එසේ කිරීමෙන් අභිමතාර්ථ සිද්ධියට පැමිණේ.

තවද සුදුසු කාලයෙහි සිත මැදහත් ලෙස සලකා බැලීම ප්‍රයෝජනවත්ය,

7. සමයෙ අජ්ඣුපෙක්ඛනතා. යනුවෙන් ප්‍රකාශ වන සත්වන හෙතු වයි ඒ. භාවනානුයොගී පුද්ගලයාගේ සිත කුසීතකම නිසා නො හැකිළී; උඩඟුකම නිසා අසංවර නොවී පවතීද, එසේම; ප්‍රයොග සම්පත්ති ආදියෙන් ආශ්වාද රහිත නොවී; අරමුණෙහි සමව පවතිමින්; සමාධි චිත්ත වීථියට බැසැ ගනීද, එකල්හි ඒ සිත වැඩීමට හෝ; සතුටු කරවීමටහෝ නොමගොස් මැදහත්ව බැලිය යුතුයි, සමව ගමන් ගත් අසුන් යෙදූ රථයෙක රියැදුරකුගේ විලාශයෙනි,

එකඟ නොවූ සිත් ඇති පුද්ගලයන් ආශ්‍රය කිරීම සමාධි සම්බොධ්‍යඞ්ගධර්මොත්පාදයට බාධක යි, එහෙයින් ඔවුන් දුරු කිරීම වටී,

8 අසමාහිතපුග්ගල පරිවජ්ජනතා. යන අටවන හෙතුධර්මයෙන් සූචිත වූයේ මේ අදහසයි, අසමාහිත පුද්ගලයන් ආශ්‍රය කිරීම බොදුග වැඩීමට විපත්තිකර ධර්මයෙකැ, යනු සිතා ගැනීමට මතු දක්වනු ලබන ප්‍රවෘත්තිය හොඳම සාධකයෙකි

"පෙර සැවැත් නුවර වීසූ හොරු දෙදෙනෙක්, එක්තරා සවස් වේලාවෙක; බණ අසනු සඳහා ජේතවනාරාමයට ගියහ. ඔවුන්'තුරෙන් එකෙක් සාමාන්‍ය හොරෙකි, අනිකා පල්හොරෙකි, සාමාන්‍ය තැනැත්තා ගිය කටයුත්ත ඉටුකර ගනු පිණිස, පල් හොරාගෙන් ඈත්වී හිඳ; සිත මනාසේ එකඟ කරගෙන බණ ඇසීය. අනිකා-පල්හොරා, මුණින් නැවූ කලයකට දිය පුරවන් නාසේ; "බණත් ඔංහ් කණේ දම්මින්ම" සොරකම් කරන්නට සුදුසු දූයක් සොයන්නට විය.

ධර්මදෙශනාව කෙළවර, සකසා බණ ඇසූ සාමාන්‍ය සොර තෙමේ 'සෝවාන් ඵලයෙහි' පිහිටා ගෙට ගියේය. පල් හොරා හුත් හැතින් නැගිටියේ, පිරිස් මැද හිඳ බණ ඇසූ එක්තරා මහලු උපාසකයකුගේ ඉනේ බැඳි "රන් කවඩියත්" සෙමෙන්ම පන්නා ගෙනයි."

එකඟ නොවූ සිත් ඇති අර පල්හොරාගෙන්, මොහොතක්; ඈත්වී සකසා බණ ඇසීම නිසා සාමාන්‍ය චෞරයා ලද ලෝකොත්තර සම්පත්තිය ගැන සලකා, "අසමාහිතපුග්ගලපරිවජ්ජනතාව" කළ යුතුයි.

නව වන හෙතුව වශයෙන් සඳහන් වන්නේ:-

9. **සමාහිතපුග්ගල සේවනතා.** වාදු– එකඟවූ සිතැ'ති පුගුලන් ඇසුරු කිරීම එයින් අදහස් කැරිණ. සමාධි සම්බොධ්‍යඞ්ගොත්පාදයට එද අවශ්‍යයයි. එබැවින් ධ්‍යාන භාවනා වැඩීමෙන් හෝ ධ්‍යාන ප්‍රතිපත්තියට පැමිණීමෙන් හෝ, සිත එක් අරමුණෙක තබා ගැනීමේ බලය ලබාගත් උතුමන් සේවනයකිරීම කටයුතුයැ. සම්මාසම්බුදුවරුනුත් පසේබුදුවරුනුත් හැරැ ලොකයෙහි යම්කිසි කෙනෙක්, රාගාදී කෙලෙස් ගිනි නිවා, අමාමහ නිවන් රස පානය කෙළෝ නම් ඒ සැමදෙනෙක්ම 'සමාහිතපුග්ගලසේවනතාවය' කළහ. එහෙයින් මෙහි ලා නිදර්ශන දැක්වීම නිශ්ඵල යැ.

10. **ඣානවිමොක්ඛ පච්චවෙක්ඛනතා.** මේ නම් දසවන හෙතුව මිලඟට පැමිණේ. විමොක්ෂය පිළිබඳව දීර්ඝ විස්තරයක් කළ යුතු නමුදු කාලානුරූපව, එය ඉතාම සංක්ෂේප කරමි. "විමොක්ඛ" යන්නෙහි කොටම තේරුම 'මනාකොට මිදීම' යනුයි එහෙත් මෙතන්හි ප්‍රකාශයට පැමිණෙන්නේ ධ්‍යානවිමොක්ෂය' බැවින්

විෂ්කම්භණ වශයෙන් වුවත්; කාමච්ඡන්දාදී පඤ්චවිධ නීවරණ ධර්මයන්ගෙන් මිදී පැමිණෙන සමවත නැමති විය යුතුය. අට වැදෑරුම් වූ ඒ ධ්‍යානවිමොක්ෂය ප්‍රත්‍යවේක්ෂා කිරීම "ඣානවිමො-ක්ඛපච්චවෙක්ඛනතා" නම් ඉහුදු සමාධිය ලැබේ

**දහන් ඉතුරුව පවත්නේ:-**

**11 තදධිමුත්තතා.** නම් එකොළොස් වන හෙතුව පමණි. යැම්-ඊම්-ඉඳීම්-සිටීම් යන සතර ඉරියව්වල යෙදෙමින්ම, මා "කෙසේ නමුත් සමාධිසම්බොධ්‍ය-ඞ්ගය උපදවා ගත යුතුයැ" යන ප්‍රබල හැඟීමට අවනතවූ චිත්ත ස්වභාවය 'තදධිමුත්තතා' නම්. මෙබඳු බලසම්පන්න චිත්ත වේග යක් නැතිව ඉෂ්ටාර්ථ සිද්ධිය නොවන නිසා, එයත් හෙතු ධර්ම යක් වශයෙන් දක්වූහ.

මෙකී එකොළොස් වැදෑරුම් ධර්මයෝ සමාධිසම්බොධ්‍යඞ්ගය පහළවීමට හෙතුනු වෙති. ඔවුන් එකක් පාසා ලුහුඬු තේරුම් මෙ නයින් දත යුතුයි.

ආනිසංස කථනයෙන්, මගේ දෙශනාව හමාර කරන්නට පළමු, මා ප්‍රථමයෙන්ම ප්‍රකාශ කළ 'විභඞ්ගපාඨය' පිළිබඳව ද යමක් කිව යුතුව තිබේ.

**"තත්ථ කතමො සමාධිසම්බොජ්ඣඞ්ගො? යා චිත්තස්සඨිති, -පෙ-සම්මා සමාධි, සමාධිසම්බොජ්ඣඞ්ගො, මග්ගඞ්ගං මග්ග-පරියාපන්නං, අයං වුච්චති සමාධිසම්බොජ්ඣඞ්ගො" ති.**

යනු ඒ පාඨයි. "එහි ලා සමාධිසම්බොජ්ඣඞ්ගය නම් කවරේද? සිත පිළිබඳ යම් පැවැත්මක්, සිත අරමුණෙහි මනාකොට පිහිටීමක්, සමාධිසම්බොධ්‍යඞ්ගයක් වේද; මාර්ගාඞ්ගය ද, මාර්ගයට ඇතුළත්ද, මෙය සමාධිසම්බොධ්‍යඞ්ගයැයි කියනු ලැබේ."

ඉහතකී විභඞ්ගපාඨය සිංහලෙන් කියහැකි ආකාරයයි මේ. මෙයින් නැගුණු අදහස් ඔස්සේ කළයුතු විස්තරය; ප්‍රමාණවත් පරිදි මුලින්ම ප්‍රකාශවී ඇත. එබැවින් නැවතත් එය විස්තර කරන්නට කල්පනා නොකරමි.

**"සං, ආ, පූර්ව ධා ධාරණෙ" යන ධාතුවෙන් සිද්ධව, එක් අරමුණෙක සිත මනාකොට පිහිටුවීම ප්‍රකාශ කරන්නාවූ, කුශල චිත්තෛකාග්‍රතාවය සඞ්ඛ්‍යාත 'සමාධිය' පිළිබඳ ආනිසංස දත හැකීමට, 'රතනසූත්‍රයෙහි' එන එකම වගන්තියක් ප්‍රමාණවත්ය.**

"යම්බුධ සෙට්ඨො පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තෙන සමො න විජ්ජති,"

යන මේ රතනසූත්‍රා'ගත පාඨය බෞඩජනතාවට එතරම් අප්‍රකට නොවේ. "යම්කිසි චෛතසිකධර්මයක්, අනුබුඩ- පච්චෙක බුඩ සඞ්ඛ්‍යාත සියලුම බුදුවරුනට ශ්‍රේෂ්ඨවූ; සම්මාසම්බුදුරජාණන් වහන්සේ විසින් බොහෝ සෙයින් වර්ණනා කරන ලද ද රාගාදී කෙලෙස් මල සමුච්ඡෙද වශයෙන් ප්‍රහීණ කරන බැවින් අතිශයින් පිරිසුදු ද, තමාගේ ප්‍රවෘත්තියට අනතුරුව නියම වශයෙන්ම ඵලප්‍රාප්තිය සිදුවන හෙයින් 'ආනන්තරික' යැයි දෙශනා කරන ලද්දේද, ඒ මේ 'සමාධියට' සමානවූ අන්‍ය ධර්මයෙක් ලොකයෙහි විද්‍යමාන නො වේ" යැයි ලොව්තුරා භාග්‍යවතුන් වහන්සේ ඒ පාලි වාක්‍යයෙන් දෙශනා කළ සේක.

අවිද්‍යාන්ධකාරයෙන් වසාලන ලද පෘථජ්ජන චිත්තසන්තානය ඇසිල්ලක් පාසා කිළිටි කරන, රාගාදී කෙලශධර්ම සමුච්ඡෙද වශයෙන් ප්‍රහීණය කරන බවත්, තමාගේ උත්පත්තියට අනතුරුව ඒකාන්තයෙන්ම ඵලප්‍රාප්තිය සිදුකරන බවත්, සමාධිය පිළිබඳ කෘත්‍යය වශයෙන් මෙහිදී ප්‍රකාශයට පැමිණේ. එයම මෙහි ආනිසංසයයි. 'ආනන්තරිය' සඞ්ඛ්‍යාත "මාර්ගසමාධිය" උපන් විට, එහි ඵලොත්පත්තිය වලක්වාලන අන්‍යතර විපත්තිකර ධර්මයෙක් නැත එහෙයින් ඵලො'ත්පත්තිය ඒකාන්තයෙන්ම සිදුවේ.

එසේම මිථ්‍යාදෘෂ්ටිකයන් විසින් වර්ණනා කරනලද රූපාවචර-අරූපාවචර සමාධි බලයෙන් බ්‍රහමලොකයෙහි උපනත් යළි නිරයාදියෙහි ඉපදිය හැක. එහෙත් මේ ආර්‍ය්‍ය සමාධිය වඩා ලන පුද්ගලයා සියලු උත්පත්තීන් වනසා පියන බැවින් එබඳු දුගතියෙක කිසිවිටෙක නූපදී.

මෙසේ අභිඥාය ලබාදීම අවසාන ඵලයකොට පවත්නා, අනන්‍යසාධාරණත්වයෙන් බුඩාදී සත්පුරුෂයන් විසින් වර්ණණා කරණ ලද, "සමාධිසම්බොධ්‍යඞ්ගධර්ම" ශ්‍රවණමය කුශල ධර්මයෙන් උතුම්වූ අමාමහ නිවන් දහම් පසක් කර ගත යුතු.

සාධු! සාධු!! සාධු!!!

**පින්වත් සද්ධර්මාකර පිරුවන්හි ආචාර්ය පණ්ඩිත පින්වත් විජයනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් පවත්වන ලද ධර්මදේශනාව.**

## 7. උපේක්ෂා සම්බොධ්‍යඞ්ගය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

**"තත්ථ කතමො උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො යා උපෙක්ඛා උපෙක්ඛනා අජ්ඣුපෙක්ඛනා මජ්ඣත්තතා චිත්තස්ස උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො, අයං වුච්චති උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො"**

**පින්වත්නි !**

මෙහිදී මවිසින් මාතෘකා වශයෙන් ප්‍රකාශ කරණලද්දේ තථාගත අඞ්ගීරස බුදුපියාණන් වහන්සේ උපෙක්ඛාසම්බොජ්ඣ-ඞ්ගය විස්තර කිරීම පිණිස විභඞ්ගප්‍රකරණයෙහිදී බොජ්ඣඞ්ග විභඞ්ගයට ඇතුළත්කොට දෙශනාකර වදාළ ශ්‍රීමුඛ පාඨයකි.

යථොක්ත මාතෘකා පාඨයට අයත් ධර්මය එනම්- උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය කුමක්දැයි විස්තර කරදීමට ප්‍රථමයෙන් මෙහි රැස්ව සිටින ධර්මශ්‍රවණාභිලාෂී පින්වතුන්ට බණ ඇසීම පිළිබඳ වද මවිසින් කරුණු ස්වල්පයක් කියාදිය යුතුව තිබේ. මනුෂ්‍යයෙකුට ආගමක් උවමනා කරණුයේ උභයලොකාර්ථ සිද්ධිය සලසා ගැණීමටයි. විශෙෂ වශයෙන් බෞද්ධවූ අපි ඒ පරම සුන්දර ශාන්ති නායක අමාමෑණියන් වහන්සේගේ ධර්මමාර්ගය අදහන්නේ මෙලොව පරලොව යන උභය ලොකාර්ථ සිද්ධිය මෙන්ම අවසාන වශයෙන් සියලූ දුක් නැතිකිරීමෙන් ලැබිය යුතුවූ සදාකාලික ඒකාන්ත සුන්දර අමාමහ නිර්වාණ ධාතුවද ප්‍රාර්ථනාකර ගෙනයි. අද අපේ බොහොමයක් බෞද්ධ පින්වතුන් මේ බව තේරුම්ගෙන ඇති බවක් නොපෙනේ.

බණ ඇසීමටයයි පන්සලට පැමිණෙන ඇතැම් අය එසේ පැමිණෙන්නේ විනෝද ක්‍රියාවක් වශයෙන් මිස ඒ අන්දමේ උසස් උපේක්ෂාවන්ගෙන් යුක්තවයයි ඔවුන්ගේ හැසිරීමෙන් නම් සිතාගත නොහැක. පොහෝ දිනකටවත් පන්සලකට පැමිණ බුදුන් වැඳීමට හෝ බණ ටිකක් ඇසීමට හෝ ඔවුන්ට පුරුදු නැත.

එබඳු දේ කිරීම තමන්ගේ තත්වයට මදිකමක් යයි සිතනවා විය හැක. බෞද්ධ ජනසමාජයෙහි මෙබන්දන් සිටිනු දැක්ම බලවත් සංවේගයට කාරණෙකි. ලෝකය කලින් කල වෙනස් වන නිසා ආගමද ඒ අනුව වෙනස්කර ගත යුතුයයි කියන්නෝද අප අතර සිටිත්, ආගම් තමන්ට උවමනා හැටියට වෙනස්කර ගැනීමට තැතනීම ලොකු පාපයක් හා සාවද්‍ය ක්‍රියාවක් බැව්ද ඔවුන්ට නොවැටහෙති.

අප බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරණු ලැබූ නවලොකුත්තර ශ්‍රී සද්ධර්මය එසේ තමන්ගේ කැමැත්තලෙස කිසිවෙකුවත් වෙනස් කළ නොහැක, එහෙත් උන්වහන්සේ එම ධර්මය සියලු කාලයටම සරිලන ලෙස දේශනාකර තිබෙන බැව් ඥාණවන්ත ලෝකයා පිළිගෙණ තිබෙන පරම සත්‍යයෙකි. ඒ මහාකාරුණිකයින් වහන්සේගේ ධර්මය ප්‍රතිපත්තිය නිසාම පවතින්නක් බැව් පළමුකොටම තේරුම් ගතයුතුයි, නියම විධියට ආගමික ප්‍රතිපත්තිය ආරක්ෂා කිරීමට නොසමත් සැදැහැතියන්ගේ එබඳු පුහුකථාවලින් ඇති ඵලයක් නැත.

දැන් අපි බණ ඇසීම පිළිබඳවත් කරුණු ස්වල්පයක් ප්‍රකාශ කරමු. බණ ඇසිය යුතු පිළිවෙළ දේශනා කරන බුදුරජාණන් වහන්සේ "සුණාථ ධාරේථ චරාථ ධම්මෙ" යයි වදාළසේක. එයින් උගන්වන්නේ "සුණාථ" මනාකොට අසව් 'ධාරේථ' ඒ අසන ලද ධර්මය සිත්හිලා ධරාගනිව්, 'ධම්මෙ' ඒ ධර්මයෙහි 'චරාථ' මනාකොට හැසිරෙව් යනුයි මෙහි 'සුණාථ' යන්නෙන් ප්‍රකාශ වන්නේ බුද්ධ ගෞරවය, ධර්ම ගෞරවය දේශක ගෞරවය යන ත්‍රිවිධ ගෞරවයෙන් යුක්තව නොයෙක් අරමුණුවල විසිරයා නොදී ධර්මාරම්මනයෙහිම එල්බ පැවැති සිත් ඇතිව ශ්‍රද්ධාවෙන් බණ ඇසිය යුතු බවයි. බණ ඇසීම ශ්‍රොතාපත්ති මාර්ගඥානය ලබාගැණීමට අවශ්‍යයෙන්ම උවමනා උපකාරක ධර්මයකි. ඒ බැව් "සද්ධම්ම සවණං සොතාපත්ති අඞ්ගං" යන දේශනා පාඨයෙන් ඔප්පුවෙයි. ශ්‍රොත විඥානය නැති බැවින් අරූතල වාසීන්ට සෝවාන් මාර්ගඥානය නො ලැබෙණ බව වදාළේ ඔවුන්ට ධර්මශ්‍රවණය නොකළහැකි බැවිනි. එබැවින් නිවන් ලැබීමට කැමැති වන්නෙකු එම ජාතියේ සහ එයට පූර්වජාතිවලදීත් පුරුදු කළයුතු මූලික ධර්මය ලෙස සැලකිය යුත්තේ බණ ඇසීමයි.

පූර්වභාග ප්‍රතිපත්ති සම්බන්ධයේදී ධර්මශ්‍රවණය නොකළ තැනැත්තේ සංසාරයෙහි දුක හා නිර්වාණයෙහි ඇති ශාන්ත සුවයද නොදනී,

එහිවූ දුක් සැප දෙක නොදන්නා තැනැත්තේ නොපිළිපදියි. නොපිළිපදිනා තැනැත්තේ සසරින් නොමිදෙයි. එහෙයින් බණ ඇසීම සසර දුක් නැසීමටත් නිවන් සුව ලැබීමටත් උපකාර වන අතිශ්‍රේෂ්ඨතර ක්‍රියාවක් බව සළකා හොඳින් බණ ඇසිය යුතුයි.

“ධාරෙථ” යන්නෙන් කියන ලද සිත්හිලා ධරාගැණීම නම් මුලින් කී ක්‍රමයට අසනු ලැබූ ධර්මය අමතක විය නොදී සිත තබා ගැණීමයි. එයටද එකඟ බැවින් හා විවේකයෙන්ද ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්මයන්ගේ බලයෙන් මනාකොට සිත පිහිටුවා ගතයුතුයි. නොයෙක් අරමුණු කරා දුවනලද එකඟ නොවූ සිතින් හෝ රාගාදී පාප ධර්මයන්ගෙන් දූෂිතවූ සිතින් හෝ යුක්තවූවන්ට අසන ලද ධර්මය සිත් හිලා ධරාගැණීම කළ නොහැක දහම් නැමැති රුවන් පුරවා චක්ෂුරාදී සදොර වසා අරමුණු නැමැති සොරුන්ට පිවිසිය නොහැකි ලෙස සිහි නමැති යතුරලා එම දහම් නැමැති රුවන් සමූහය මනාකොට රැකබලා ධරාගත යුතුයි.

‘චරාථ ධම්මං’ මෙයින් ප්‍රකාශ වන්නේ මුලින් කී ක්‍රමයට අසාබලා, සිත්හිලා ධරාගත් ධර්මයට අනුව පිළිපැදිය යුතු බවයි. මෙය මුලින් කී දෙකරුණටම වඩා ඉතා වැදගත්ය. කුමක් හෙයින්දයත් ? කොපමණ බණ ඇසුවත් ඇසූ දේ සිතේ තබා ගත්තත් ඒ අනුව පිළිනොපදිත් නම් ඒ බණ ඇසීමවත් දැරීම වත් යන දෙකම නිෂ්ඵලය, එහෙයින් බොහෝවිට බණ අසත්තෝත් සිත්හි දරන්නෝත් ඇති නමුත් පිළිපදින්නන් විරළ බව කණගාටුවෙන් නමුත් කිය යුතුම කරුණකි. බෞද්ධවූ අප කාගේත් එකම බලාපොරොත්තුව වියයුත්තේ පරම සන්තුෂ්ට බෙමාති සුන්දර නිර්වාණය ලබාගැණීමය, එය බුදු, පසේබුදු-රහත් යන ත්‍රිවිධ යානයෙන් නොහොත් බෝධිතුනෙන් එකකට පැමිණී මෙන් ලබාගත යුතුයි.

යටත් පිරිසෙයින් රහත් ඵලයට පැමිණ නිවන් ලැබීමට නම් අඩුම ගණනේ කල්පලක්ෂයක් ගුණධර්ම පුරුදු කළ යුතුයි. අද බොහෝ අය අනික් සැම කටයුතුවලදී මෙන්ම ආගමික කටයුත්තේදීත් වංක කමින් රැවටීමටය බලාපොරොත්තුවන්නේ, මෙයින් රැවටෙන්නේත් පසුතැවිල්ලට පැමිණෙන්නේත් තමන්ම මිස අනිකෙක් නොවන බව නොසලකති. බොහෝවිට දනාදී පිංකම් කරන්නේ නියම ශ්‍රද්ධාවෙන් නොව ලෝකයා ඉදිරියෙහි තමා උසස්කර පෙන්වීමටය. එබඳු ක්‍රියාවලින් නියම ඵලය

ලැබීම උගහට බැව් අමුතුවෙන් කියයුතු නොවේ. ඒ නිසා මා මේ පින්වතුන්ට මතක්කර සිටින්නේ ලොවැ සියල්ලෝම මැරෙණ සුලු බවත් සඳකල්හි පවත්නා කිසිවක් ලොව නැති බවත් නුවණින් සලකා දුසිරිතෙන් වෙන්ව ධර්මයෙහි මනාව හැසිරිය යුතු බවත්ය. එසේම තම තමන් කරණු ලබන සුසිරිත් දුසිරිත් දෙක්හි හොඳ නරක විපාකද තම තමන් විසින්ම විඳිය යුතු බව විශෙෂයෙන් සිත තබාගෙන මේ කියා දෙන ධර්මය ශ්‍රද්ධාවෙන් හා එකඟ සිතින් යුක්තව බුද්ධාදී තුන් තන්හි ගෞරව උපදවා ගෙන මනාකොට ශ්‍රවණය කර ඒ හේතුවෙන් ජාත්‍යාදී සංසාර දුකින් නිදහස්ව ලබන අජරාමර උතුම් නිවන් සැප ප්‍රාර්ථනා කරගත යුතුයි.

මෙතැන් සිට මට අයත් මාතෘකාව අනුව ඒ ධර්මය යථා ශක්තියෙන් විස්තරකර දීමට උත්සාහ කරමි උපෙක්ඛා සම්බො-ජ්ඣඞ්ගයෙහි උපෙක්ඛා යන වචනය විස්තර කිරීමට මත්තෙන් 'බොජ්ඣඞ්ග' යන වචනය විස්තර කරදිය යුතුව තිබේ. එහෙත් මීට ප්‍රථමයෙන් බොජ්ඣඞ්ග ධර්ම හයක් ගැණම ධර්මශ්‍රවණය කර තිබෙන මේ පිරිසට ඒ ගැණ දීර්ඝ විස්තරයක් කියාදීමට උවමණා නැත යනු මගේ හැඟීමයි. නමුත් ඉතා කෙටි වශයෙන්වත් එය කියා නොදීම මෙහිදී අඩුවක් මෙන් පෙනෙන හෙයින්ද මුලින් අසා ඇති දෑ තව තවත් පිරිසිඳු වීම සඳහාද ඒ ගැණ කරුණු ස්වල්පයක් ප්‍රකාශ කරමි.

"බොජ්ඣඞ්ගාති" කෙනඨෙන බොජ්ඣඞ්ගා?
බොධාය සංවත්තන්තී ති බොජ්ඣඞ්ගා-බුජ්ඣන්ති"
බොජ්ඣඞ්ගා සම්බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා,"

යන අඨකථා වචනය පරිදි බොජ්ඣඞ්ග යන මෙහි කවර අර්ථයකින් බොජ්ඣඞ්ග නම් වේදයත්? මාර්ගචිත්තයෙහි යෙදෙන විදර්ශනා පාදක පූර්වභාග ලෞකික, පරිකර්ම, උපචාර, අනුලොම, ගොත්‍රභූචිත්තයන්හි නානාලම්බනික වශයෙන් නානා ක්ෂණිකවද, අපරභාගයෙහි මාර්ගචිත්තයෙහි නිර්වාණාලම්බනක වශයෙන් එක ක්ෂණිකවද, පහළවෙමින් නිර්වාණාවබොධයට හේතුව පවතිත්නුයි බොජ්ඣඞ්ග නම් වෙයි. සෝවාන් මාර්ගක්ෂණයෙහිදී නිර්වාණය ප්‍රත්‍යක්ෂකෙරෙත්නුයි බොජ්ඣඞ්ග නම්. සකෘදාගාමි මාර්ගක්ෂණයෙහි නිර්වාණය අනුබොධනය කෙරේනුයි බොජ්ඣඞ්ග නම්. අනාගාමි මාර්ගක්ෂණයෙහි නිර්වාණය ප්‍රතිබොධනය කෙරේනුයි. බො-ජ්ඣඞ්ග නම්. තොහොත් "බොධිවුච්චති චතූසු මග්ගෙසු ඤාණං" යන්නෙන් ප්‍රකාශවන පරිදි මෙහි බොධිය නම් සෝවාන් ආදී

සතර මාර්ගඥානයයි, "බොධියා බොධිස්සවා අඞ්ගාති බොජ්ඣඞ්ගා යි' දක්වෙන පරිදි උපාය මාර්ගයාගේ හෝ සෝවාන්, සකෘදාගාමි, අනාගාමි අර්හත්, යන සතරමාර්ගඥානාවබොධය කරණ ආර්යශ්‍රාවකයාගේ හෝ එසේ අවබොධකිරීමට අඞ්ගවශයෙන් හේතු වශයෙන් පවත්නා ධර්මයෝ බොජ්ඣඞ්ග නම් වෙත්.

> "යා එසා ධම්ම සාමග්ගියා ලොකිය ලොකුත්තර මග්ගක්ඛණෙ උප්පජ්ජමානාය ලීනුද්ධච්ච පතිට්ඨානා යූහන කාමසුඛත්ත කිලමථානුයොග උච්ඡෙදසස්සතාභිනිවෙසාදීනං අනෙකෙසං උපද්දවානං පටිපක්ඛ භූතාය සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා, සංඛාතාය ධම්ම සාමග්ගියා අරිය සාවකො බුජ්ඣතීති කත්වා බොධීති වුච්චති"

විදර්ශනාවස්ථාවෙහි හා සත්‍යප්‍රතිවෙධ කරණ මාර්ගාවස්ථාවෙහි එයට විරුද්ධවූ සිත පිළිබඳ සැඟවුනු බව නම්වූ ලීනාවස්ථාවය- ඇවිස්සුනු බව නම් වූ උද්ධච්චාවස්ථාවය-කාමසුඛල්ලිකානුයොගය-අත්තකිලමථානුයොගය-උච්ඡෙද දෘෂ්ටිය-ශාශ්වත දෘෂ්ටිය යන මේ ආදී නොයෙක් උපද්‍රවයන්ට ප්‍රතිපක්ෂ වශයෙන් උපදනාවූ සති ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන ධර්මයන්ගේ සමූදය එක් සිතක එකට පහළවීම "බොධියා අඞ්ගා බොජ්ඣඞ්ගා" යන විග්‍රහ වාක්‍යයෙහි බොධිය නමැයි දතයුතුයි.

> "බුජ්ඣති කිලෙස සන්තාන නිද්දාය උට්ඨහති චත්තාරිවා අරිය සච්චානි පටිවිජ්ඣති නිබ්බානමෙවවා සච්ඡිකරොති, තස්සා ධම්ම සාමග්ගි සංඛාතාය බොධියා අඞ්ගාතිපි බොජ්ඣඞ්ගා"—

තවද මාර්ගාඞ්ග අටදෙනාගේ සමූහය එක චිත්තයක එකවර පහළවී මාර්ගය වඩන්නාක් මෙන් අවබොධයට උපාය මාර්ගයවීම් අර්ථයෙන් බොධිය නම්වූ මේ 'සති' ආදී ධර්ම සමූහය හේතු කොට ගෙන ආර්ය ශ්‍රාවකතෙම ක්ලෙශ නිද්‍රාවෙන් නැගී සිටියි, චතුරාර්ය සත්‍ය ධර්මයන් තත්වූ පරිදි ලක්ඛණ-රස, පච්චුපට්ඨානාදී වශයෙන් අවබොධ කෙරෙයි. අමෘත මහා නිර්වාණය ප්‍රත්‍යක්ෂ කෙරෙයි, එහෙයින් ඒ ධර්ම සමූදය නම්වූ බොධියෙහි අඞ්ග නොහොත් අවයවනුයි බොජ්ඣඞ්ග නම්.

දැන් මේ අවස්ථාවේ හැටියට 'බොජ්ඣඞ්ග' ශබ්දය ගැන මීට වඩා විස්තර කිරීම අනුචිත බැවින් ඒ ගැන කරුණු කීම මෙතෙකින් නවතා "උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය" ගැන විස්තර කර දීමට අදහස් කරමි.

**"තත්ථ කතමො උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො -පෙ- අයං වුච්චති උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගො"**

**එහි උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය නම් කවරේදයත්?**

සුඛ දුක්ඛයන්ට අවිරුද්ධවූ බැලීම උපෙක්ෂා නමි. සුඛ දුක්ඛයන්ට අවිරුද්ධාකාරයෙන් බැලීම් උපෙක්ෂා නමි, මැදහත්ව බැලිය යුතු සම්ප්‍රයුක්තවූ ධර්මයන් බලයි වොදනා නොකරයි, යන අර්ථයෙන් ද උපෙක්ෂා නමි. පුද්ගලයා මධ්‍යස්තව බලවානුයි උපෙක්ෂණ නමි. බොධ්‍යඞ්ග භාවයට පැමිණීමෙන් ලෞකික උපෙක්ෂාවට වඩා අධිකවූ උපෙක්ෂණය අජ්ඣුපෙක්ඛණා නමි. සැප දුක් දෙකට නොපැමිණීමෙන් පහළවන මැදහත් ස්වභාවය මජ්ඣත්තතා නමි. එයද සිත අයත්ය යනු මේ මාතෘකා පාඨයෙහි සංක්‍ෂෙප අදහසයි

**'ඡළු උපපත්තිතො ඉක්ඛතීති උපෙක්ඛා'** යන නිරුක්ති නයින් පක්ෂපාත කමක් හෝ විරුද්ධ කමක් හෝ නොමැතිව ඡන්ද දීන් අගතියට නොගොස් සියල්ලන් එකාකාරයෙන් සමසේ දක්නා ස්වභාවය උපෙක්ඛා නමැයි කියන ලදී, **'සමං පස්සති අපක්ඛ පාතී හුත්වා පස්සතීති අත්ථො'** යන අටුවා වචනයෙන්ද ඒ බැව් පැහැදිලි වේ. තමන් කෙරෙහි ද්වේෂවන අවමන් බුහුමන් නොසතුටු හා සතුටු ආදී කිසිවක් ගැණ වෙනසක් ඇති නොකට අවමන් බුහුමන් කරණ සියල්ලන් කෙරෙහිද ලාභ-අලාභ-යස-අයස-නින්‍ද-පසංසා-සුඛ දුක්ඛ-යන අෂ්ටලොක ධර්මයෙහි ද වෙනසක් නැතිව සම සිත් ඇති බව සාධාරණ ගතිය එකාකාර බව නොහොත් යුක්තිය ඉක්මවා පක්ෂග්‍රාහී නොවී අපක්ෂපාතව යුතුකම බලන මැදහත් ගුණය උපෙක්ෂා නම්වේ.

සැකෙවින් කියතොත් සුචි-අසූචි-කැපුම්-කෙටුම්-ආදී සියලු කරුණෙහි මහා පෘථිවිය යම්සේ මධ්‍යස්තද එමෙන්ම, සැප-දුක් සොමනස්-දොම්නස් ආදී ඒ සියලු කරුණෙහිදී පවත්නා මැදහත් සිතම උපෙක්ෂාවයයි දතයුතුයි, පරමාර්ථ ධර්ම විභාගයේදී මැදහත් සිතිවිල්ලම උපෙක්ෂා නාමයෙන් කියන ලදී.

**"වධකෙ දෙවදත්තම්හි, චොරෙ අඞ්ගුලි මාලකෙ**
**ධනපාලෙ රාහුලෙචෙව, සබ්බත්ථ සම මානසො"**

අප බුදුරජාණන් වහන්සේ වනාහි තමන් වහන්සේ නසන්නට නානා ප්‍රකාරයෙන් උපක්‍රම යෙදූ දෙව්දත් තෙරුන් කෙරෙහි ද, එසේම තමන් වහන්සේ මරා ඇඟිලි කපාමැයි දුව ආ අඟුල්මල් නම් මහ සොරහු කෙරෙහි ද, රාඛී මත්ව මනමේකුලක්සේ

බෙරුසන් දෙමින් මරන්ට ඉදිරියට දුවආ ධනපාල නම් හස්ති රාජයා කෙරෙහි ද, තමන් වහන්සේ ගිහි කල්හී (සිඩාර්ථ කුමාර අවස්ථාවෙහි) ලත් රහල් නම් පුත් රුවන කෙරෙහි ද, සම සිත් ඇතිසේකැයි වදාළ සේක. මෙයින් ඒ මහා කාරුණිකයන් වහන්සේ කොටිප්‍රාප්ත උපෙක්ෂාවෙන් යුක්ත බව පෙනේ. මෛත්‍රී, කරුණා-උපෙක්ෂා-යන මේ චෛතසිකයෝ තුමූ අන්‍යොන්‍යාන්‍ය ප්‍රතිබඩ ධර්මයෝ යි.

"මෙත්තා සිනෙහෙන සිතෙහිකෙ චිතෙත උපෙක්ඛායවිනා සමභාරානං පාරිසුඩි නහොති"

මෛත්‍රී නැමැති තෙලින් සෙනහවත්වූ සිතෙහි හවගන්නා උපෙක්ෂාවෙන් තොරව බොධි සම්භාරයන්ගේ පරිසුඩතාවයක් නැතැයි දෙශනාවෙහි සඳහන් වන හෙයින් ද? උපෙක්ෂාව විසින් කරුණාවද කරුණාව විසින් උපෙක්ෂාවද පරිගෘහිත බැවි "උපෙක්ඛා පන කරුණා පරිග්ගහිතා කරුණාචපන උපෙක්ඛා පරිග්ගහිතා'ති වෙදිතබ්බා" යන දෙශනා පාඨයෙන් ද ඔවු-නොවුන්ගේ ඇති සම්බන්ධය මනාව පැහැදිලි වේ, එහෙයින් කරුණා-උපෙක්ෂා-දෙක ඔවුනොවුන් හා බැඳී පවත්නා චෛත-සික දෙකක් බැවී ද දතයුතු යි.

උපෙක්ෂා ප්‍රභෙද. "උපෙක්ඛාපන දසවිධා හොති ඡළඞ්ගු පෙක්ඛා, බ්‍රහ්ම විහාරුපෙක්ඛා, බොජ්ඣඞ්ගු පෙක්ඛා, වීරියු පෙක්ඛා-සඞ්ඛාරු පෙක්ඛා-වෙදනානු පෙක්ඛා-විපස්සනානු පෙක්ඛා-තත්‍ර මජ්ඣත්තු පෙක්ඛා-ඣානු පෙක්ඛා-පරිසුඩු පෙක්ඛා'ති" යනුවෙන් 1. ඡළඞ්ගු පෙක්ෂාවය, 2 බ්‍රහ්ම විහාරු පෙක්ෂාවය, 3 බොධ්‍යඞ්ගු පෙක්ෂාවය, 4 විරියු පෙක්ෂාවය, 5 සංස්කාරු පෙක්ෂාවය, 6 වෙදනානු පෙක්ෂාවය 7 විපස්සනානු පෙක්ෂාවය. 8 තත්‍ර මජ්ඣත්තු පෙක්ෂාවය, 9 ඣානු පෙක්ෂාවය, 10 පාරිසුඩි උපෙක්ෂාව යයි උපෙක්ෂාවෙහි ප්‍රභෙද දසයෙකි.

(1) ඡළඞ්ගු පෙක්ෂාව නම්- මේ ශාසනයෙහි රහතන් වහන්සේ නමක් ඇසින් රූපයක් දුටුවිට කනින් ශබ්දයක් ඇසූවිට නැහැයට ඉෂ්ටානිෂ්ට ගන්ධයක් දැනුන විට දිවට රසයක් දැනුනුවිට, කයට ස්පර්ශයක් ස්පර්ශවූවිට සිතට ධර්මාරම්මනයක් හමුවූවිට එහි ඇලුම් වශයෙන් සොම්නසකට හෝ ද්වේෂ වශයෙන් දොම්නසකට හෝ නොපැමිණ මැදහත් සිත් ඇතිව සිහි නුවණින් යෙදී වෙසේද? මෙලෙසින් රහතන් වහන්සේගේ චක්ෂුරාදි සදෙරට රූපාදී ඉෂ්ටානිෂ්ට ආරම්මණයන් හමුවූ කල්හි විපරීතභාවයට නොපැමිණෙන ස්ව සන්තානයෙහි

පවත්නා නිකෙලෙසිවූ පිරිසිදු බව නම්වූ ප්‍රකෘති ගතිය අත්නොහරිණ ඇයුරින් පවත්නා මධ්‍යස්ථතාව ෂඩඞ්ගොපෙක්ෂා නම් වේ.

(2) බ්‍රහ්මවිහාරුපෙක්ෂා නම්- "උපෙක්ඛා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති තථා දුතියං, තතියං චතුත්ථං" යනාදීන් වදාළ ලෙස උපෙක්ෂා සහගත චිත්තයෙන් එක් දිසාවක් පතුරුවා වෙසෙයි. එසේම දෙවෙනි තුන්වෙනි ආදී වසයෙන් දසදිසාවන්ද සියලු සක්වල වෙසෙන සියලු සතුන් ද උපෙක්ෂා සහගත චිත්තයෙන් පතුරුවා වාසය කෙරේනම් හෙවත් සියලු සක්වල සියලු සත්වයන් කෙරෙහි පවත්වන සවභාව යයි නම් ලද යම් සිතක්වේ නම් හේ බ්‍රහ්ම විහාරුපෙක්ෂා නම් වේ.

3. බොජ්ඣඞ්ගුපෙක්ෂා නම්:- කෙලෙසුන් කෙරෙන් සිත වෙන්කිරීමයයි කියන ලද විවේකය නිසා පැවැති උපෙක්ෂා සම්බොජ්ඣඞ්ගය වඩන්නේ යයි යනුවෙන් දක්වන ලද තමා සමග පහළවූ ධර්මයන් කෙරෙහි මධ්‍යස්ථ ආකාරයෙන් පවත්නා යම් උපෙක්ෂාවක් වේද, හෙවත් මාර්ගචිත්තයෙහි ශ්‍රද්ධා-ප්‍රඥා ආදී සෙසු ධර්මයන්ගේ අලීන-අනුද්ධත අනිරාසවාද-භාවය හේතුකොට ගෙන ප්‍රග්‍රහ, නිග්‍රහ, සම්ප්‍රහර්ෂණ යෙහි උත්සාහයක් නැතිව මැදහත් ආකාරයෙන් පවත්නා උපෙක්ෂාව බොජ්ඣඞ්ගුපෙක්ෂා නම් වේ.

4. විරියුපෙක්ෂා නම්. "ශාපන කාලෙන කාලං උපෙක්ඛා නිමිත්තං මනසි කරොති එවමාගතා අනච්චාරද්ධ නාතිසිථිල විරිය සංඛාත උපෙක්ඛා යි වදාළ හෙයින් යම් උපෙක්ෂාවක් වනාහී මධ්‍යස්ථව පහළවූ වීර්‍ය නිමිත්ත සාලින්කල මෙනෙහි කරයිද මෙසේ දක්වන එද ඉතා දැඩි නොවූත් ඉතා ලිහිල් නොවූත් වීර්‍යසඞ්ඛ්‍යාත යම් උත්සාහ යක් වේ නම් හේ වීර්‍යෝපෙක්ෂා නම් වේ.

5. සඞ්ඛාරුපෙක්ඛා නම් "යා පන අට්ඨසංඛාරුපෙක්ඛා සමාධි වසෙන උප්පජ්ජන්ති, දස සංඛාරුපෙක්ඛා විපස්සනා වසෙන උප්පජ්ජන්ති" යනාදීන් ප්‍රකාශ කළ පරිදි සමාධි වශයෙන් උපදනා සංඛාරුපෙක්ඛා අටක්ද, විදර්ශනා වශයෙන් උපදනා සංඛාරොපෙක්ෂා දසයක්ද කියන ලදී. ප්‍රථමධ්‍යානය ලැබීම පිණිස කාමච්ඡන්දාදි නීවරණ පසද ද්විතීය ධ්‍යාන ලාභය පිණිස විතර්ක, විචාර, දෙකද, තෘතීය ධ්‍යාන ලාභය පිණිස ප්‍රීතියද, චතුර්ථධ්‍යාන ලාභය පිණිස සුව, දුක් දෙකද, ආකාසානඤ්චායතන සමාපත්ති ලාභය පිණිස

රූප, ප්‍රතිඝ, නානත්ව යන ත්‍රිවිධ සංඥාවන්ද, විඤ්ඤාණඤ්චා-යතන සමාපත්ති ලාභය පිණිස ආකාසානඤ්චායතන සංඥාවද-නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති ලාභය පිණිස ආකිඤ්චඤ්ඤායතන සංඥාවද, ඒ ඒ ධ්‍යානයන් විසින් ඔබා තබනු ලැබේ.

එසේ එකී අෂ්ටසමාපත්තීන් විසින් ඔබා තබන ලද පඤ්ච නීවරණ, විතර්ක, විචාරාදී ධර්මයන් ඔවුන්ගේ ස්වභාවය ලෙස පරීක්ෂාකොට මේ ධර්ම මෙබඳු ස්වභාව ඇත්තේයයි සනිටුහන් කිරීම් වශයෙන් එකී රූපාරූපධ්‍යාන අට පිළිබඳව පවත්නා අටවැදෑරුම්වූ ප්‍රඥාව අෂ්ටවිධ සංස්කාරෝපෙක්ෂාඥාන නමි.

සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් යන සතරමග සතරඵල හා ශූන්‍යතා විහාර සමාපත්තිය හා අනිමිත්ත විහාර සමාපත්තියද, යන දසවිධ අධිගම සමාපත්තීන් ලැබීම පිණිස උපදවන දසවිධ විදර්ශනාවෙහි පූර්වකර්ම ප්‍රත්‍යයෙන් මේ භවයෙහි පංචස්කන්ධයාගේ උත්පත්තියද, උපන් ස්කන්ධ පංචකයාගේ පැවැත්මද, මතු භවයෙහි ඉපදීම පිණිස රැස්කරන්නාවූ කර්මද මතු භව යෙහි උත්පත්තියද, ප්‍රතිසන්ධි වශයෙන් උපදනා ගතියද ස්කන්ධ යන්ගේ පහළවීමද, පහළවූ ස්කන්ධයන්ගේ විපාක ප්‍රවෘත්තියද ජාති ජරා-මරණ-ව්‍යාධි-සොක-පරිදෙව, උපායාසයන්ද, යන මෙතෙක් ධර්මයන් තතුසේ පරීක්ෂාකොට දැන මේ ධර්ම මෙබඳු ස්වභාව ඇත්තේයයි සනිටුහන් කිරීම් වශයෙන් යථෝක්ත සෝවාන් ආදී දසාකාර අධිගම සමාපත්තීන්ගේ ලැබීමෙහි පවත් නාවූ දස ආකාර ප්‍රඥාව දසවිධ සංස්කාරෝපෙක්ෂාඥාණ නම් වේ.

මේ ආකාරයෙන් පවත්නා ප්‍රථම ධ්‍යානාදීන් විසින් ඔබා තබන ලද පංචනීවරණාදී ඒ ඒ ප්‍රතිපක්ෂ ධර්මයන්ගේ ආදීනව යන් පරීක්ෂාකොට නිශ්චයට පැමිණි කල්හි එම නීවරණයන් නැවත ඉපදීමෙහි පවත්නා මැදහත් බව සංස්කාරෝපෙක්ෂා නමැයි දත යුතුයි.

6. වෙදනොපෙක්ෂාවනම්. "යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති උපෙක්ඛා සහගතන්ති, එව මාගතා අදුක්ඛමසුඛ සඤ්ඤිතා උපෙක්ඛා අයං වෙදනූපෙක්ඛා නාම" යම් කලෙක උපෙක්ෂා සහගත කාමාවචර කුසල් චිත්තයක් උපන්නේ වේද? යන ආදී ක්‍රමයෙන් ප්‍රකාශිත අදුක්ඛ මසුඛ වෙදනා නම්වූ යම් උපෙක්ෂා වක් වේනම් ඕතොමෝ වෙදනොපෙක්ෂාව නම් වන්නීය

7. විදර්ශනොපෙක්ෂාව නම්. "යදත්ථි යං භූතං තං පජහති, උපෙක්ඛං පටිලභති, යනාදී ක්‍රමයෙන් දැක්වෙන පංචස්කන්ධය පිළිබඳ අනිත්‍ය දුක්ඛ, අනාත්ම, යන ත්‍රිලක්ෂණ විදර්ශනා භාවනාවෙහි යෙදුනු යොගාවචරයාට එකී භාවනාව දියුණුවූ විට නිත්‍ය, සුඛ, ආත්ම, යන වැරදි හැඟීම් දුරුවී එම ස්කන්ධයන් පිළිබඳ ආදීනවයන් හොඳ හැටි අවබොධවූ කල්හි නැවත එම ස්කන්ධපඤ්චකය ගැණ ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීම පිළිබඳව පවත්නා මධ්‍යස්ථාකාරයකී කියනලද් යම්බදු උපෙක්ෂාවක් වේද? ඕතොමෝ විදර්ශනොපෙක්ෂා නම් වන්නීය.

8. තත්‍රමධ්‍යස්ථතොපෙක්ෂාව නම්. "යා පන ඡන්දාදිසු යෙ වා පන කෙසු ආගතා සහජාතානං සම වාහිත භූතා උපෙක්ඛා අයං තත්‍රමජ්ඣත්තුපෙක්ඛා නාම" උදුනෙහි ගිනි දලුව සමව ඇතිකල නොපිඹ නොනිවා බලා ඉන්නා අරක්කැමියෙකු මෙන් තමන් හා එක්ව යෙදුනාවූ ඡන්දාදි චෛතසික ධර්මයන් තම තමන්ගේ කෘත්‍යයන් කිරීමෙහි එලෙසම අවිරුද්ධාකාරයෙන් පැවැත්ම ලක්ෂණකොට ඇති යම් උපෙක්ෂාවක් වේද එය තත්‍රමධ්‍යස්ථතොපෙක්ෂා නම් වේ.

9 ධ්‍යානොපෙක්ෂාව. "යා උපෙක්ඛකොච විහරතීති එවමාගතා අග්ගසුඛෙ'පි තස්මිං අපක්ඛපාත ජනනී උපෙක්ඛා අයං ඣානුපෙක්ඛා නාම" යම්බදු උපෙක්ෂා ඇත්තෙක්වමම වාසය කෙරේද යනාදීන් ප්‍රකාශ වන යම් අග්‍ර සැපතක් වේ නම් අග්‍රවූ ඒ සැපතෙහිද අපක්ෂපාත ස්වභාවය උපදවන උපෙක්ෂා තොමෝ ධ්‍යානොපෙක්ෂා නම්.

10. පාරිශුද්ධ්‍යුපෙක්ෂාව. "යා පන උපෙක්ඛාසති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානන්ති එව මාගතා සබ්බ පච්චනීක පරිසුද්ධා පච්චනීකවූපසමනෙපි අබ්‍යා පාරභූතා උපෙක්ඛා අයං පාරිසුද්ධු පෙක්ඛා නාම" උපෙක්ෂා සම්ප්‍රයුක්ත සම්පත්තියෙන් පිරිසිදුවූ චතුර්ථධ්‍යානයයි කියනලද විතර්ක විචාරාදි සියලු ප්‍රතිපක්ෂ ධර්මයන්ගෙන් මිදුනු හෙයින් ඒ විරුද්ධ ධර්මයන් සංසිඳ වීමෙහි නැවත උත්සාහයක් නැත්තාවූ චතුර්ථ ධ්‍යාන සහගත යම් උපෙක්ෂාවක් වේනම ඕතොමෝ පාරිශුද්ධ්‍යු පෙක්ෂා නම් වන්නීය.

මෙකී ඡළඞ්ගුපෙක්ඛා, බ්‍රහමවිහාරුපෙක්ඛා, බොජ්ඣඞ්ගු පෙක්ඛා, ඣානුපෙක්ඛා, පාරිසුද්ධි උපෙක්ඛා, යනාදී සියල්ල එකම

තත්‍ර මධ්‍යස්තතොපෙක්ෂාවෙහි අනන්තගීතය, නොහොත් එකම තත්‍රමධ්‍යස්තතොපෙක්ෂාවමැයි. ඒ ඒ අවස්ථා විශෙෂය සලකා ළදරුවාය, තරුණයාය. මහල්ලාය, රජය යනාදීන් කරනු ලබන ව්‍යවහාරය මෙන් ඒ ඒ ප්‍රත්‍ය විශෙෂය නිසා ඇතිවන අවස්ථා භෙදය සලකා උපෙක්ඛාව සම්බන්ධව යවනී නම් ලැබේ. එහෙයින් යම් සිතක ෂඩඞ්ගොපෙක්ෂාව ලැබේනම් එහි අනික් බොධ්‍ය-ඞ්ගොපෙක්ෂාදීහු නොලැබෙති. යම් සිතක බොධ්‍යඞ්ගොපෙක්ෂාව පහලවේනම ඒ සිතෙහි ෂඩඞ්ගොපෙක්ෂාව පහල නොවේ. වෙන වෙනම පහළ වේ. එසේම සඞ්ඛාරුපෙක්ඛා, විපස්සනුපෙක්ඛා දෙකද අර්ථවශයෙන් එකක්මැයි දතයුතුයි.

කෘත්‍යවශයෙන් එකම ප්‍රඥා චෛතසිකය දෙපරිදිකොට කියනලදි ඒ එසේමැයි. සැන්දෑකාලයෙහි ගෙයකට වැදුනු සර්පයෙකු දැක ඔහු ගෙයින් පිටකරනු සඳහා එළුකුරයකට බඳු කෙළවර ඇති දණ්ඩක් ගෙන ඒ ඒ තැන සොයමින් ඇවිදිනා ගෙයිවසන්නෝ දහයියා ගොඩක හෝ දෙරමුල්ලේ හෝ දරණ ගසාගෙන සිටින බැව් දැක සර්පයාද නැද්දැයි පරීක්ෂාකරණවිට සෝවැතිතුන දැකීමෙන් සර්පයා බව නිසැකව දැනගත් කල්හි නැවත සර්පයෙක්ද නැද්දැයි පරීක්ෂා කිරීමෙහි මධ්‍යස්ථවෙති. එසේම සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය-දුක්ඛ-අනාත්ම-වශයෙන් සලකා විදර්ශනා වැඩීමට පටන්ගත් යොගාවචරයාට: එසේ වැඩීමේදී පහළවන විදර්ශනා ඥානයෙන් අනිත්‍යාදී ත්‍රිලක්ෂණය ප්‍රත්‍යක්ෂව පෙනුනු කල්හි නැවත ඒ සංස්කාරයන්ගේ අනිත්‍යාදී ත්‍රිලක්ෂණයන් සෙවීම ගැන අනපෙක්ෂිත බැවින් මධ්‍යස්ථසංඛ්‍යාත උපෙක්ෂාවම පහල වේ. මේ ආකාරයෙන් සංස්කාරයන් කෙරෙහි පවත්නා අනිත්‍යාදි ත්‍රිලක්ෂණය විදර්ශනා ඥානයෙන් ප්‍රත්‍යක්ෂව හැඟිගිය කල්හි නැවත ඒ සංස්කාරයන්ගේ අනිත්‍යාදිය සෙවීමක් ගැන යෝගීහුගේ සිත්හි පහලවන මධ්‍යස්ථතාවයට මෙහිදී විදර්ශනොපෙක්ෂාවයයි කියති.

යම්සේ ඒ පුරිස්තෙම එම එළුකුර සටහන් අක්ඇති දණ්ඩෙන් සර්පයා දැඩිකොට අල්වාගෙන සර්පයාත් නොපෙලමින් සර්පයා ලවා දෂ්ටකරවාත් නොගෙන කෙසේනම් උගෙන් මිදෙම්දැයි මිදීමට උපායක් සොයන විට ඔහු අල්වා ගැනීම ගැන මධ්‍යස්ථවේද එපරිද්දෙන් සංස්කාරයන්ගේ අනිත්‍යාදී ත්‍රිලක්ෂණයන් දුටුවිට භවත්‍රයම ගිනි හැවිලීගිය කාලක්මෙන් වැටහෙන යොගාවචරයාට නැවත භවොත්පත්තිය ගැන ඇල්මක් නොවී මධ්‍යස්ථතාව උපදී. එසේ පහලවන විදර්ශනා ප්‍රඥාව සංස්කාරොපෙක්ෂානම්. මේ ආකාරයෙන් විදර්ශනොපෙක්ෂාව උපන් කල්හි සංස්කාරොපෙක්ෂාවද

පහල වේමය. එනම් ප්‍රඥාචෛතසිකය සෙවීමය, හැනීමය යන දෙවැදෑරුම් කටයුත්තක යෙදීමේදී ප්‍රවෘත්තවන එනම් චෛතසිකයාගේ අවස්ථාභෙදයද දෙවැදෑරුම්ය, වීර්‍ය්‍යොපෙක්ෂා, වෙදනොපෙක්ෂා වශයෙන් දක්වෙන උපෙක්ෂා දෙක වනාහී තම තමන් හා අන්‍යයන් සමගද එකිනෙකට වෙනස්වූවෝ වෙති. මෙසේ හෙදභින්නාවූ දශවිධ උපෙක්ෂා අතුරෙන් "බොධ්‍යඞ්ගොපෙක්ෂාවම" මෙහිලා අභිමත වියයුතුය, චතුරාර්‍ය්‍යසත්‍යාවබොධයෙහිදී එයට යහපත් අඞ්ගයක් වශයෙන් පවතින මේ උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය විදර්ශනාවස්ථාවෙහි ලෞකික වශයෙන්ද, මාර්ගාවස්ථාවෙහි ලොකොත්තර වශයෙන්ද පහළවේ.

යම් සිතක් සමඟ තත්‍රමධ්‍යස්ථතොපෙක්ෂාව පහළවූයේ නම්; එහිදී තමා හා එක්ව උපන් ධර්මයන් මැදහත් බවට පමුණුවයි උපෙක්ෂාව, ලක්ෂණ, රස, ප්‍රත්‍යුපස්ථාන, පදස්ථානාදී වශයෙන් සලකන කල්හි-

"සත්තෙසු මජ්ඣත්තාකාර පවත්තිලක්ඛණා උපෙ-ක්ඛා," සත්තෙසු සමභාවදස්සනරසා, පටිඝානුනය වූප සමපච්චුපට්ඨානා, කම්මස්සකා සත්තා තෙ කස්සරුචියා සුඛිතා වා භවිස්සන්ති දුක්ඛතො මුච්චිස්සන්ති පත්ත සම්පත්තිතො වා න පරිහායිස්සන්තීති එවං පවත්ත කම්මස්සකතා දස්සනපදට්ඨානා"

යනාදීන් දක්වෙන පරිදි ඕ තොමෝ සියල්ලන් කෙරෙහි මැදහත්සේ පැවැත්ම ලක්ෂණකොට ඇත්තීය, සමභාවයෙන් දක්ම රසය හෙවත් කෘත්‍යය කොට ඇත්තීය, වෙෂය හා ප්‍රෙමය යන දෙදෙනාගේ සංසිඳීම වැටහීම්කොට ඇත්තීය. කර්ම ස්වකතාදී දර්ශනය ආසන්න කාරණය කොට ඇත්තීය, බොධිනම් වූ සතරමාර්ගඥානය අවබොධයට සුන්දරතර අඞ්ගයක්වූ උපෙක්ෂාව පිළිබඳ දෙශනාවෙහි සඳහන් පරිදි මෙහි ඉතා කෙටි හා ඉතා දීඝීද නොවූ විස්තරයක් ප්‍රකාශ කෙළෙන් තදනන්තරව යථොක්ත උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය සත්තමජ්ඣත්තතාදී අඞ්ග පඤ්චකයක් හේතුකොටගෙනම පහළවන බැවින් මෙතැන්සිට ඒ සම්බන්ධ කරුණු ස්වල්පයක් විස්තරකර දෙන්නෙමු.

"පඤ්ච ධම්මා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදාය සංවත්තන්ති සත්ත මජ්ඣත්තතා සංඛාර මජ්ඣත්තතා සත්ත සංඛාර කෙලායන පුග්ගල පරිවජ්ජනතා, සත්ත සංඛාර මජ්ඣත්ත පුග්ගල සෙවනතා තදධිමුත්තතාති"

යන පාඨයෙන් ප්‍රකාශිත පරිදි- 1. සත්තමජ්ඣත්තතාවය, 2. සංඛාර මජ්ඣත්තතාවය, 3. සත්තසංඛාර කෙලායන පුග්ගල පරිවජ්ජනතාවය 4, සත්ත සංඛාරමජ්ඣත්ත පුග්ගල, සෙවනතාවය, 5. තදධිමුත්තතාවය, යනු ඒ අඞ්ග පසයි මෙසේ කියන ලද අඞ්ගපස පුරුදුපුහුණු කිරීමෙන් යොගාවචරයා හට උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගය උපදවාගත හැකිවේ:-

**සත්තමජ්ඣත්තතා නම් කුමක්ද?** සත්තමජ්ඣත්තතා නම් සත්ත්වයන් කෙරෙහි පටිසංඛ්‍යානාදියෙන් තොරව මැදහත්ව පැවතීමයි. "ද්වීහාකාරෙහි සත්තමජ්ඣත්තං සමුට්ඨාපෙති, ත්වං අත්තනො කම්මෙන ආගන්ත්වා අත්තනොව කම්මෙන ගමිස්සසි, එසොපි අත්තනො කම්මෙන ආගන්ත්වා අත්තනොව කම්මෙන ගමිස්සති, ත්වං කං කෙලායසීති එවං කම්මස්සකත පච්චවෙක්ඛණෙන තාව, පරමත්ථතො සත්තොයෙව නත්ථි, සො ත්වං කං කෙලායසීති, එවං නිස්සත්ත පච්චවෙක්ඛණෙනතාව" යනු අටුවා වචන හෙයින් සත්ත්වමධ්‍යස්ථතාවය හෙවත් ප්‍රිය පුද්ගලයන් කෙරෙහි මැදහත් වීම වනාහි කර්මප්‍රත්‍යවෙක්ෂාවය, පරමාර්ථප්‍රත්‍යවෙක්ෂාවය හෙවත් පරමාර්ථ වශයෙන් සැලකීමය යන දෙයාකාරයෙන් උපදනේය, නුඹ තමන්ගේ කර්මයෙන්ම හෙවත් තමා විසින් කරන ලද කුශලාකුශල කර්මයාගේ හේතුවෙන්ම මිනිසෙක් වශයෙන් අප අතර පහළව කර්මනියමය අනුව ඵල අනුභව කරමින් සිට නැවත මෙහිදීත් කුශලාකුශල කර්ම රැස්කරගෙන එම කර්මශක්තියෙන් පුනරුත්පත්ති වශයෙන් පරලොව යන්නෙහිය.

එසේම මේ තෙමේත් තමන් විසින්ම කරනලද කර්මයාගේ හේතුවෙන් මෙහි අවුත් ටික කලක් සිට නැවත එම පිං පව් දෙකට අනුව පරලොව යන්නේය, එසේ ඇතිකල්හි නුඹ කවරෙකු තලවන්නෙහිදැයි යන මේ ආකාරයෙන් කර්මය ස්වකීය දායාද වශයෙන් පවත්නා බැව් ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන්ද පරමාර්ථ වශයෙන් ස්කන්ධරාසියක් ධාතුපුඤ්ජයක් මිස සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ නැත යනාදීන් පරමාර්ථ වශයෙන් ගෙන එසේවූ නුඹ කවරෙකු ලාලනය කරන්නෙහිදැයි මෙසේ නිස්සත්ත්ව නිර්ජීවතාවය සැලකීමෙන්ද යන මේ දෙයාකාරයෙන් සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථතාවය උපදවයි. මෙසේ මේ දෙයාකාරයෙන් හෝ එක් ආකාරයකින් හෝ ප්‍රිය අප්‍රිය පුද්ගලයන් කෙරෙහි මධ්‍යස්ථතාවය උපදවා ගැනීමෙහි පළමුවන හේතුව වේ.

**සංඛාර මජ්ඣත්තතාවය නම් කුමක්ද?**

“විභාගාකාරෙන සංඛාරමජ්ඣත්තං සමුට්ඨාපෙති ඉදං චීවරං අනුපුබ්බෙන වණ්ණ විකාරංචෙව ජිණ්ණභාවංච උපගන්ත්වා පාදපුඤ්ඡන චොලකං හුත්වා යට්ඨි කොටියා ඡඩ්ඩනීයං භවිස්සති. සචෙපනස්ස සාමිකො භවිස්ස නාස්ස එවං විනස්සිතුං දදෙය්‍යාති එවං අස්සාමික භාව පච්චවෙක්ඛණෙනවාති” යනාදීන් ප්‍රකාශවෙන පරිදි සංස්කාර යෝ ඉන්ද්‍රිය ප්‍රතිබද්ධය අනින්ද්‍රිය ප්‍රතිබද්ධයයි දෙකොටසකි. නමුත් මෙතැන්හි අනින්ද්‍රිය ප්‍රතිබද්ධ චීවර-පිණ්ඩපාත-සේනාසන-ගිලාන ප්‍රත්‍යය යන සතර ප්‍රත්‍යයද තදනුවර්තීක හෙවත් එයට අනු ලොම්වූ අන්දෙයද සංස්කාර නමැයි තැමැතිවිය යුතුයි. මේ සංස්කාරයන් කෙරෙහි සස්වාමිකභාවය සිතීමෙන් හා තාවකා ලික භාවය සැලකීමෙන්ද යන දෙයාකාරයෙන් මධ්‍යස්ථතාවය උපදවයි.

මේ චීවරය දූනට වර්ණවත්වූ නමුත් ක්‍රමයෙන් වර්ණවිකාර යටද ජීර්ණ භාවයටද හෙවත් කිළුටුවීමටද කඩරෙදි වීමටද පැමිණ කෙලවර පාපිස්නා කඩක්ව සැරයටි කෙළවරින් ගෙන බැහැර කට යුත්තක් වන්නේය. යම් හෙයකින් මේ සිවුරට ස්වාමි යෙක් විද්‍යමානවන්නේ නම් මෙසේ විනාශවෙන්ට අවසර නොදෙන්නේය. අස්වාමික හෙයින්ම මෙසේ විනාශවී යන්නේය කියා අස්වාමිකත්වය ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන්ද මේ චීවරය කල්පවතින එකක් නොවේ. එනිසා තාවකාලිකය මේ ආකාරයෙන් තාව කාලිකත්වය ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන්ද යන ක්‍රමයෙනි.

පිණ්ඩපාත-සේනාසන ගිලාන ප්‍රත්‍ය සම්බන්ධයෙන්ද උක්ත ප්‍රකාරයෙන් සැලකීමෙන් සංඛාරමජ්ඣත්තතාවය උපදියි. ඒ වනාහි උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය ඉපදවීමේ දෙවන හේතුවයි.

**සත්තසංඛාර කෙලායන පුග්ගල පරිවජ්ජනතාව කුමක්ද?**

එත්ථ යො පුග්ගලො ගිහීවා අත්තනො පුත්තධීතාදිකෙ පබ්බජිතොවා අත්තනො අන්තෙවාසික සමානුපජ්ඣායකාදිකෙ මමායති සහත්ථෙනෙව තෙසං කෙසච්ඡෙදන සූචිකම්ම චීවර ධොවන රජන පත්ත පචනාදීනි කරොති මුහුත්තම්පි අපස්ස- න්තො අමුකො සාමණෙරො කුහිං අමුකො දහරො කුහින්ති භන්තමිගොවිය ඉතො චිතොච ඔලොකෙති අඤ්ඤෙන කෙස- ච්ඡෙදනාදීනං අත්ථාය මුහුත්තං තාව අමුකං පෙසෙථාති යාචිය

**මාතාපි අම්හෙපි තං අත්තනො කම්මං නකරොම තුම්හෙ තං ගහෙත්වා කිලමෙස්සථාති නදෙති අයං සත්ත කෙලායනො නාම යොපන චීවර පත්තථාලක කත්තරයට්ඨි ආදීනි මමායති. අඤ්ඤස්ස හත්ථෙන පරාමසිතුම්පි නදෙති, තාවකාලිකං යාචිතො එවම්පි ඉදං මමායන්ති නපරිභුඤ්ජාමි තුම්හාකං කිං දස්සාමාති වදති අයං, සංඛාර කෙලායනො නාම, යොපනෙතෙසු ද්වීසුපි වත්ථුසු මජ්ඣත්තො උදාසිනො අයං සත්තසංඛාර මජ්ඣත්තො නාම:—**

සැමත ඉන්ද්‍රිය ප්‍රතිබද්ධ සංස්කාරවූ සත්ත්වයන්ද අනින්ද්‍රිය ප්‍රතිබද්ධ සංස්කාරයන්වූ චීවරාදි ප්‍රත්‍යයන්ද යන මේ දෙකොටස කෙරෙහිම මමත්වය කරන පුද්ගලයන් සේවනය නොකිරීම මෙයින් අදහස් කෙරේ.

එබැවින් සත්ත්වසංස්කාරයන් මමායනය කරණ පුද්ගලයන් දුරුකටයුත්තාහ ආශ්‍රය නොකටයුත්තාහ. මෙහිදී පළමුකොට 'සත්තසංඛාරකෙලායන, පුද්ගලයන් හැඳින ගත යුතුව තිබේ. අඨකථාවන්හි සඳහන් පරිදි ඔවුන්ගේ ලක්‍ෂණය මෙසේයි,

මෙහි යම් පුද්ගලයෙක් තෙම තමාගේ දරුවන් කෙරෙහි මමත්වය කරණ ගිහියෙක් හෝ වේවා සවකීය අනෙතවාසිකායන් හා සාමානොපධ්‍යායයන් කෙරෙහි මමත්වය කරණ ප්‍රව්‍රජිතයෙක් හෝ වේවා තම අතවැසි ආදීන්ගේ කෙස් කැපීම්- සිවුරු මැසීම්- සිවුරු දෙවීම්–පඬු පෙවීම්–පාත්‍ර පිසීම් ආදීවූ කුඩුමහත් කටයුතු දෘඪ ප්‍රෙමබන්ධනයෙන් වෙළී සියතින්ම කෙරේද.

තවද මොහොතකුදු ඔවුන්ගේ දර්ශනයෙන් තොරව වාසය කිරීමට අසමර්ථව ප්‍රෙමයෙන් මුසපත්වූ හෙයින් ගොඩනැගුණු ශොකයෙන් යෙදී අසවල් සාමණෙර තෙම කොහි ගියේද? අසවල් ළදරුවා කොහිදැයි යනාදි වශයෙන් සිහිසන් නොමැතිව වන පෙදෙස සිසාරා දුවන ත්‍රස්ත මෘගයෙකු මෙන් ඔබ නොබ දුවපැන බලාද? එමෙන්ම අපගේ' කෙශච්ඡෙදනය කරවා ගැනීමට මේ හෙරණ තැන සවල්ප වේලාවකට මෙහි පිටත්කර එවනු මැනවැයි අන්‍ය සබ්‍රම්හරුන් වහන්සේ නමකගේ ඉල්ලීම ඇතිකල්හිදු අනේ! මේ හෙරණ ලවා එබඳු කටයුත්තක් මමද කරවා නොගත්තෙමි. තොපගේ කෙශච්ඡෙදනයෙන් හෙතෙම වෙහෙසට පත්වන්නේය. යනාදී කිසිවක් ගෙනහැර පාමින් එහි ගොස් ඒ කටයුත්තකිරීමට අවසර නොදේද එසේම අන්‍ය යෙකුට ඒ හෙරණ ආදීන්ගේ කෙස් කැපීම් ආදියකට අවසර

නොදී තෙමේම හරයිද එබඳු ස්වභාවයෙන් යුක්ත තැනැත්තා සත්වකෙලායන පුද්ගලයා නම් වේ. සත්වයන් කෙරෙහි අධික ප්‍රේමයෙන් ඇලී ගැලී බැඳී මෛත්‍රී වාසය කරණ ප්‍රව්‍රජිතයෙක් හෝ වේවා ඔව්හු සත්වකෙලායන පුද්ගලයෝයි. ඒ හැර යම්කිසි ශ්‍රමණයෙක් වනාහී තමා සන්තක චීවර-පාත්‍ර-තලි-සැරයටි ආදියෙහි මමත්වය කෙරෙයිද, අන්‍යයෙකුට එය අල්ලන්ටවත් ඉඩ නොදේද, යම් හෙයකින් කිසිවෙක් සිවුරක් හෝ තාවකාලික වශයෙන් ඉල්ලූවිට අපිත් තවම එය පරිභොග නොකෙළෙමු. එය ඉතා පරෙස්සමෙන් තබාගෙන සිටිමු. එසේ ඇති කල්හී නොපට එය පළමුවෙන් කෙසේ දෙන්නෙමුදැයි, කියමින් එය පරිභොග කිරීමට අවසර නොදේද, පරිභොගයට තබා ඇල්ලීමටවත් ඉඩනොදේද, මේ ආකාරයෙන්ම සේනාසනාදිය පිළිබඳවත් ගෙධත්වයට පැමිණි ශ්‍රමණතෙමේ සංඛාර කෙලායන පුද්ගලයා වෙයි. මෙපරිද්දෙන් සත්වසංස්කාර දෙකොටස කෙරෙහි මමත්වය කරණ පුද්ගලයන් හැඳින ගෙන හාත්පසින් ඔවුන් දුරුකිරීම උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය උපදවා ගැණීමේ තෙවන අඞ්ගය වේ—

**සත්තසංඛාර මජ්ඣත්ත පුග්ගල සෙවනතාව.** උපෙක්ඛාසම්බොධ්‍යඞ්ගය උපදවා ගැණීමට සත්ව-සංස්කාර දෙකොටස කෙරෙහි මමත්වය කරණ පුද්ගලයන් සේවනයෙන් දුරුකිරීම හා සත්වසංඛාර මජ්ඣත්ත පුද්ගලයන් සෙවනය කිරීමද උවමනා කෙරෙයි.

**„යො පන තෙසු ද්වීසුපි වත්ථූසු මජ්ඣත්තො උදාසීනො**
**අයං සත්තසංඛාර මජ්ඣත්තො නාම”**

යමෙක් සත්ව - සංඛාර යන දෙකොටස කෙරෙහි මධ්‍යස්ථද උදාසීනද හෙතෙම සත්ව සංස්කාර මධ්‍යස්ථ පුද්ගල නම්. යමෙක් යථොක්ත සත්ව සංස්කාර දෙකොටස කෙරෙහි නොමනා ප්‍රේමයෙන් ඇල්මෙන් යුක්ත නොවේද? හෙතෙම සාන්ත දාන්ත ගති පැවතුම් ඇත්තේ ගුණධර්මයෙන් බබලනුයේ සියල්ලන් විසින් ආශ්‍රය කිරීමට සුදුස්සෙක් වේ

කොයි කෙනෙක් හෝ කොයි දෙයක් පිළිබඳවත් ආසාවක් නොදක්වන සියලු කල්හී මධ්‍යස්ථ පැවැතුම් ඇති අය ආශ්‍රය කිරීම නිසා තමා ලඟ ඇති නරක ගතිගුණ නැතිවීමත් ඇත්තාවූ හොඳ ගතිගුණ දියුණු වීමත් නොවැලැක් විය හැකිසේ

සිදුවන්නකි. තවද එබඳු පුද්ගලයන් ආශ්‍රය කරන්නා ගුණ ධර්මයෙන් දියුණුවීමට ඒකාන්තයෙන් පැමිණේ. එමෙන්ම එය උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය උපදවා ගැණීමේ අසහාය හේතුවක්ද වේ.—

පෙර රජගහ නුවර ඉතා දිළිඳු බමුණෙක් විය, දිනක් සැරියුත් තෙරණුවෝ මේ බමුණාගේ ගෙදරට පිඩු පිණිස වැඩිසේක. උන්වහන්සේට පිළිගැන්වීමට සුදුසු කිසිවක් ඔහු වෙත නොතබුණු බැවින් බමුණා සැඟවුනේය. කිසිවක් නොලැබ ආපසු විහාරයට වැඩි සැරියුත් තෙරණුවෝ පසුදිනද ඔහුගේ ගෙදරටම පිඩු පිණිස වැඩියහ. පිළිගැන්වීමට කිසිවක් සපයා ගැනීමට උත්සාහ කොටත් නොලත් බැවින් එදිනද බමුණා සැඟවුනේය. උන්වහන්සේත් එදිනද කිසිවක් නොලැබ පෙරලා වෙහෙරටම වැඩිසේක.

ටික දිනකට පසු මේ බමුණාට යාගහෝම කරණ තැනකින් දළුවස්ත්‍රයක් හා කිරිබත් තලියක්ද ලැබී එය පිළිගැන්වීමට එදින උන්වහන්සේ වැඩියොත් මැනවයි සිතීය. තෙරුන් වහන්සේද බමුණාගේ අදහස දැන එකෙනෙහිම එතැනට පිඩු පිණිස වැඩියහ.

එකල්හි තෙරුන් වහන්සේට සැදූසිතින් සුකනව තම ගෙයිදී එම කිරිපිඩු වළඳවා අවසානයෙහිදී හෙතෙම එම දළු සාටකයත් පිදුවේය. මෙසේ පුදා ස්වාමීනි! නුඹවහන්සේ විසින් අවබොධ කරණලද ධර්මයට මමද පැමිණෙම්වායි, ප්‍රාර්ථනාවක්ද තබා ප්‍රීතියෙන් පුන පුනා සිටිනාතර හදිසියෙන්ම කළුරිය කොට සැවැත් නුවර කුලගෙයක පිළිසිඳගත්තේය, ඔහු පිළිසිඳගත් නොබෝ දිනකින්ම මෑණියන්ට මෙබඳු සිතක් දොළදුකක් ඇතිවිය.

එනම්, සැරියුත් තෙරුන් ප්‍රධාන පන්සියයක් භික්ෂූන් ගෙදරට වැඩම්වා ක්ෂීරපායාස පුදා භික්ෂූන් වහන්සේ වළඳා ඉතුරු කරණ කිරිබත් ටිකක් තමන්ද කහවත් හැඳ පොරවා අසුන් කෙළවර ඉඳගෙන වැළඳීමටය. ගෘහපති තෙමේද මේ අභිරුචිය එසේම ඉටු කොළේය.

මඳකලකට පසු එතුමියට මනහර පුත්‍රුවනක් ලැබිණ. නම්තරණ මඞ්ගලයේදීද, ඉඳුල්කට ගෑමේදීද, කන්විදීමේදීද; පිළිහැන්දවීමේදීද, ඉසකෙස් කැපීමේදීද, යන මේ මඞ්ගල

අට අවස්ථාවන්හිදී සැරියුත්තෙරුන් ප්‍රමුඛ පන්සියයක් භික්ෂූන්ට අල්ලෝපාදක ක්ෂීරපායාසය පිළිගැන්වීය.

මෙසේ මේ ළදරුවා සත් අවුරුදු කාලයේදී මවුපියන්ගෙන් අවසර ගෙන සැරියුත් තෙරුන් වෙත පැවිදිවිය. මෙසේ පැවිදිවූ සත්අවුරුදු කුඩා සාමණේර නමට පිණ්ඩපාතයෙන් හා නම්බල සාටකාදී වස්ත්‍රයෙන්ද සැදූහැතියෝ පුද සිරිත් පවත්වන්ට වූහ. උන්වහන්සේගේ නෑයෝ නිතර නිතර වෙහෙරට පැමිණ මේ කුඩා සාමණේරයන් වහන්සේ සමග කථාසල්ලාපයේ යෙදී ඉන් නවද පටන් ගත්හ. මේ ආකාරයෙන් කල්යමන අතර මේ සියල්ල ශ්‍රමණ ධර්මය සම්පූර්ණකර ගැණීමට මහත් බාධාවක් සේ සළකා ඒ සියල්ල කෙරෙහි ආසාව නැතිකරගෙන ආරණ්‍ය යෙහි වාසය පිණිස යෑමට ඉටාගෙන බුදුන් වහන්සේ වෙත පැමිණ අභීෂ්ඨය දක්වා කමටහන් ඉගෙණ ගෙන සමීප ප්‍රදෙශ යන විසූවොත් නැවතත් මේ සම්බාධ පැමිණේයයි සිතා එක් සිය විසියොදුනක් දුරකතර ගෙවා ඈත ප්‍රදෙශයක්හි ආරණ්‍ය සේනාසනයක වසමින් පුරුදු කම්ස්ථාන වඩනාතර එහි වැඩ තෙමසක් ඉක්මගිය සඳ සියලු කෙලෙස් නසා අභීෂ්ඨයට පැමිණියේයි.

තිස්ස සාමණේරයන් වහන්සේ අභීෂ්ඨයට පැමිණි බැව් දුටු භාග්‍යවතුන් වහන්සේ වස්සාන කාලය අවසානයේදී අසූමහා ශ්‍රාවකයින් වහන්සේලාද උන්වහන්සේලාගේ පිරිවර දහස් ගනනක් භික්ෂූන් වහන්සේලාද සමග මේ තිස්ස සාමණේරයන් වහන්සේගේ ආරණ්‍ය සේනාසනයට වැඩ සතුටුව ආපසු දෙව්රමට වැඩියහ. තිස්ස සාමණේරයන් වහන්සේ ආරණ්‍යයෙහිම නැවතින.

මේ තිස්ස සාමණේරයන් වහන්සේගේ කථා ප්‍රවෘතියෙන් 'සත්තසංඛාර මජ්ඣත්තතාවය' හොඳින් තේරුම් ගතහැක. කිසි කෙනෙකුන් කෙරෙහි හෝ කිසිවක් කෙරෙහි ඇලුම් නොකල උන්වහන්සේ සියලු සංසාර දුකින් එතරවිය. මේ ආකාර ශ්‍රෙෂ්ඨතර සත්වසංස්කාර මධ්‍යස්ථතාවයෙන් යුත් පුද්ගලයන් සේවනය කිරීම උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය උපදවා ගැණීමේ හතරවන හේතුව බව දතයුතුයි.

තදධිමුත්තතාව. "තදධිමුත්තතා නාම ඨාන නිසජ්ජාදිසු
බොජ්ඣඞ්ග සමුට්ඨාපනත්ථං නින්න
පොන පබ්භාර චිත්තතා"

සිටීම හිඳීම් ආදීවූ ඉරියව් පවත්වන අවස්ථාවන්හී හෙවත් ඉරියව් පවත්වමින්ම බොජ්ඣඞ්ග ධර්ම උපදවා ගැනීම සම්බන්ධව අභිමුඛතවූ නම්තවූ ප්‍රනම්තවූ හෙවත් සියලු ආකාරයෙන් එයට නැමුණු- නැරුණු-යොමුවුණු-අදහස ඇතිබව තදධිමුත්තතාවය නම්වේ. මෙකී තදධිමුත්තතාවය සප්තබොධ්‍යඞ්ග ධර්මයන්ම ඉපදවීම සම්බන්ධයෙන් නොවෙනස්ව පැවතෙන අඞ්ගයකි. ලෞකික ලොකොත්තර සංඛ්‍යාත උභයාර්ථ සිද්ධිය පිණිස එබඳු අධිෂ්ඨානයකින් බැඳුණු සිතක් නොහොත් නොපමණ බාධා පැමිණියත් අතරමග නතර නොකොට අභිමතාර්ථ සිද්ධිය දක්වා කටයුතු කිරීමට සියල්ලන් විසින්ම පුරුදුවිය යුතුයි. මේ කියන යහපත් ගුණධර්මය අද අපෙන් ඈත්වී තිබෙන හෙයින් අපි ජාතියක් වශයෙන් පිරිහීමට පත්ව සිටිමු.

මෙකී තදධිමුත්තතාවයෙන් තොර කිසිම කෙනෙකුට ලොවුතුරු සැපයක් තබා ලෞකික දියුණුවකටද: පැමිණිය නොහැකි බැව් විශෙෂයෙන් සැලකිය යුතුයි,

මේ වනාහී උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය උපදවා ගැණීමේ පස්වන අඞ්ගයයි, අද මවිසින් දෙශනා කරන ලද උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය පිළිබඳව මේ පුණ්‍යකාමී සැදැහැවතුන්ට ශ්‍රවණය කරන්ට ලැබුණු ධර්ම සිත්හී ධාරණය කරගැනීමෙන් හා එය නැවත නැවත මෙනෙහි කිරීමෙන්ද ඒ අනුව පිළිපැදීමෙන්ද සියලු සංසාර දුක් කෙළවර කිරීමෙන් ලබන අමාමහ නිවන් සැප ලබාගැණීමට උත්සාහවත් වියයුතුබව මතක්කරමි. එසේම ධර්මශ්‍රවණය කිරීමෙන් ජනිත කුශල ධර්මය හේතුකොටගෙන ජාත්‍යාදී සියලුම සංසාර දුකින් එතරව ලබන ශාන්ත සුඛ අමාමහ නිවන් සැප ලැබේවායිද ප්‍රාර්ථනාකරගත යුතුයි.

සාධු ! සාධු !! සාධු !!!

## සප්තබොධ්‍යඞ්ගය නිමි.

# භාරස ධර්මය.

## ආර්‍ය්‍යවංශ ධර්ම පුස්තක මාලා

අඞ්ක 2

මොරමුල්ලේ සිරි සුධර්මාරාමාධිපති

මොරටුවේ සිරි සාසනවංස

ස්ථවිරපාදයන් වහන්සේ

විසින්

සම්පාදිතයි.

සිරි අරියවංස ගුණානුස්මරණ සභාව

විසින්

19 වෙනි පෝර්මයේ පටන් ඉදිරි කොටස

කොළඹ

ශූ. පී. ඒකනායක සහ සමාගමේ මුද්‍රණාලයෙහි

මුද්‍රාපිතයි.

ශ්‍රී බු: ව: 2493

ක්‍රි: ව: 1949

මිල රු: 2. 50.

# සංඥාපනය.

බාරස ධර්මය නමින් හඳුන්වන මෙම ධර්මපුස්තකය ආර්‍යවංශ ධර්මපුස්තක මාලාවේ දෙවන අංකයට ගැණේ. බොධිපාක්ෂික ධර්ම සතිසෙන් ප්‍රථම ධර්ම දොළස අවබොධ කරගැණීමට පහසු පරිදි කෙටි විස්තරයක් මෙහි විද්‍යමාන වෙත්. අංක 1 දරණ සප්ත බොධ්‍යංගය මෙන්ම මෙම ධර්ම පුස්තකයද විසුරුවාලීමට "සිරි අරියවංශ ගුණානුස්මරණ සමිතිය" නොපසුබටව ආධාරදීම පැසසිය යුත්තකි, සමිතියේ මූලික අදහස් අනුව මෙම ධර්ම පුස්තක මාලාව ව්‍යාප්තකරලීමෙන්, එහි ධර්ම රශය පානයකළ පින්වතුන් ගෙන් ලැබෙන ප්‍රසංසා බොහෝවීම සමිතියේ උද්‍යොගයට හේතුවී තිබෙන බැව් කෘතඥතාපූර්වකව සිහිකරමු.

ධර්මපුස්තක භාවිතා කිරීමෙන් නොමිනිසා මිනිසෙක්වී මිනිසා ශ්‍රේෂ්ටභාවයට පත්වීමෙන් ලොව ව්‍යාප්තවේ. එපමණක් නොව උපනුපන් සැම අත්බවම විශිෂ්ට ඥාණාදියෙන් ගහනවූ කල්‍යාණ ආත්ම ප්‍රවේණියක්ද ඔහුට ලැබෙත්. එහිනුදු නොනැවත නිර්වාණ රශයද ලබාදෙත්.

ලොව කාලත්‍රයෙහිම බොහෝ ශාස්තෘවරු පහළවෙත්. එලෙ සම, ඔවුනොවුන්ගේ මතානුගත ධර්මයන්ද දෙශනා කරත්. ඇත මෙක්, දර්ශන විෂයට වහල්ව ලොව දර්ශනයෙන් මැන පුනරුත්පත්ත්‍යාදියක් නොමැතැයි සත්වයා මූලාකර පස්කම්හි ගිජුකරත්. ඇතමෙක් නිර්මාන දෛවබලයක් පෙන්වමින් ලොව මූලාකරත්. හේ කෙසේවුවද, සත්වයා පිළිබඳව යථාස්වභාවත් නිරවුල්ව පැහැ දිළි කරමින්, සත්වයාගේ උන්නතියත් අවසානයේදී නිත්‍ය ශාන්ති යත් විදහා මෙහි සමර්ථතම දෙශකයෙක් ඇත්නම් එතුමා නියම ශාස්තෘවරයෙක්යයි නුවනින් සලකන සැම කෙනෙකුටම කියන හැක. එතුමා බොහෝ ඈතක සිට බොහෝ ක්‍රමවලින් සකස් කරණලද චිත්තබලයකින් පරිපූර්ණ විය යුතුයි. අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභානාදී නයදර්ශී අප්‍රතිහත ඥාණාදියෙන්ද සමන් විත වියයුතුයි, සර්වඥතාඥාණයෙන් සමලංකෘත එබඳු ශාස්තෘවර යෙකුටම ලොක තත්වය විදහාපෑමට සකතිය ඇතිවෙත්. එබඳු ශාස්තෘවරයෙකුගේම මතානතරයන්ට මැදිවීම සත්වයා සුඛිත විය යුතුයි. නො එසේනම්, කෙසේ මෙම සසර දුක් ගෙවා සැනසෙම්ද? නො හැක්කේමැයි!

මෙලෙසින් බුද්ධියෙන් පරීක්ෂණය කරන්නන් හට, නියම ශාස්තෘවරයාණෝ කවුදැයි නිරවුල්ව වටහාගත හැක. නොගිණිය නොමිනිය හැකි ආත්ම සංඛ්‍යාවක සිට, පාරමී ධර්ම සපුරා, සත්

තිස්බෝධිපාක්ෂික ධර්ම- සතර සත්‍ය- අෂ්ටාකාර- මාර්ගඵල- නිර්වාණය යන මෙයින් වැඩිය. සර්වඥතාඥානය සපිරූවෝ බුදුවරයෝමැයි. අන්කිසිද ශාස්තෘවරයෙක් මේ කී නයවිෂයන් අවබෝධකොට නිර්වාණ සැපය තෙක් නිරවුල්ව ගමන් කිරීමට සදුපායමාර්ගය නොදෙසූසේක. එබැවින් නානා ලබ්ධි ගෙණ සිත අවුල්කර නොගෙන ශාක්‍යමුනීන්ද්‍රයාණන් වහන්සේ අවබෝධකොට අපටද සකස්කර ගැණීම සඳහා දේශනාකළ මෙම සත්තිස්බෝධිපාක්ෂික ධර්ම සමූහය ඉතා ආදරයෙන් භාවිතා කිරීමෙන් සියලු අභිවෘද්ධිය සාධාගැණීමට උත්සාහවත් වියයුතුයි.

වර්තමාන ලෝකය පිළිබඳ පිරිසිදු දැනීමක් ඇති ධර්මඥානයෙන් ප්‍රමානවට හැඩගැසුනු උසස් සංකල්පනාවන්ගෙන් සපිරුණු ව්‍යක්ත ස්වාමිපාදයන් වහන්සේලා විසින් ලියනලද මෙම ධර්මයන් මනුෂ්‍ය ජීවිතය ස්වර්ණාවස්ථාවට පැමිණවීමේ කරුණා අදහසින්ම සකස්කර තිබෙන බැවි භාවිතා කිරීමෙන් අවබෝධ වෙනවා ඇත.

මෙබඳු පොත් අද විරල බැවින්, ධර්මාවබෝධය කරගැණීම දුෂ්කර වෙත්. එනිසාම, බාහිර පත පොත කියවීමට බොහෝදෙන හැඩගැසී තිබෙත්. ඉතිදු මුදවාලිමේ අදහසින් සකස් කරණලද මෙම ධර්මපුස්තක පඞ්ක්තිය භාවිතාකිරීමට වෙසෙසින් මතක්කරමු.


මෙහි ඌනාතිරේක අක්ෂරයන්ගේ සංශෝධනය සඳහා අපට විශේෂ කාලයක් යොදවන්ට නොහැකිවීමෙන් ඒතිබෙන දෝෂයන් සුද්ධිපත්‍රාවලෝකනයෙන් සාධාගන්නා ලෙසද අතිරික්තාදිය සඳහා මැදහත්ව භාවිතා කිරීමෙන් ධර්මරසය ලබාගන්නා ලෙසද මතක් කරමු.

මීට-සසුන් වැඩකැමති,

මොරටුවේ සාසනවංශ ස්ථවිර.

සිරි සුධර්මාරාමය,
මොරටුමුල්ල.

2493
———
1950



සිරි ඤාණාභිවංස ධමමාධාර වංසපාල විනයාලඞකාර

මොරටුවේ සිරි අරියවංසාභිධාන

ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

# ශුද්ධිපත්‍රය.

| පිට. | පේළි. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 12 | 36 | වැඹෙහි | වැඹෙහි |
| 14 | 2 | ප්‍රාශ්වාදගස | ප්‍රාශ්වාස |
| ,, | 2 | පුලාදි | පුද්ගලාදී |
| 17 | 12 | කථා ඒ. ඒ, | ඒ, ඒ, කථා |
| 24 | 33 | සවෙසම්මසදයො | සවෙසමමද්දෙසො |
| 27 | 26 | පිසුද්ධි | විසුද්ධි |
| 41 | 30 | මණ්ඩ | වණ්ඩ |
| 41 | 33 | තව් අසාත | නව ආඝාත |
| 42 | 17 | තවයෙන් තුවයට | භවයෙන් භවයට |
| 44 | 24 | වීතිය සඛ්‍යාත | විතීයඛ්‍යානය |
| 46 | 7 | විටාකාසය | විකෘකාසය |
| 46 | 10 | අභසට | අභසසි |
| ,, | 19 | තිසුණු | තිසුනු |
| ,, | 23 | වදනත | වයානත |
| 60 | 5 | මෛත්‍රී | මෙත්තා |
| 62 | 3 | තේවා | ගෙවත්වා |
| ,, | 6 | වසඹැවූ | වයඹවූ |
| ,, | 19 | සසෙබ්බනතා | සබ්බ සතතා |
| ,, | 23 | වහමෙතේ | වශයෙන් |
| ,, | 25 | එරණමරෙහි | එරණමයහි |
| ,, | 26 | සත්සදුරෙහි සයත | සත්අයුරෙහි, සතර |
| 64 | 31 | උණ්ඩිකකතා | උක්කණ්ඩිතා |
| 65 | 9 | විෂමාන | විද්‍යමාන |
| 66 | 12 | අවුපසස්සනත | අවූපසනත |
| 67 | 9 | එතං , තිරුකාකි | එතා – නිරුක්ති |
| 69 | 5 | අභිධම්මා | අභිධම් |
| 80 | 17 | පාමකානා | පාපකානං |
| 87 | 5 | ව්‍යඤ්ජග්‍රාහී | ව්‍යඤ්ජනග්‍රාහී |
| 91 | 14 | පරිසානුසය | පටිසානුසය |
| 92 | 10 | ප්‍රභිකෘති | ප්‍රකෘති |
| 108 | 2 | එමතන | එතෙන |

| | | | |
|---|---|---|---|
| 108 | 35 | ප්‍රත්‍යස-සනතා-සීලම | ප්‍රත්‍යය- සනති-සීලය |
| 109 | 33 | එකතුව | එකෙකුව |
| 111 | 10 | හැනීම් | හැඟීම් |
| 118 | 23 | චතුබබිධයං | චතුබබිධං |
| 121 | 10 | විළිබඳවූ | පිළිබඳව |
| 127 | 18 | අතතපිචචකතිරජජතං | චකකවතති රජජතං අපි |
| 129 | 24 | නගත | දූනගත |
| 140 | 24 | චුතවි | චුතවී |
| 143 | 12 | විනතිඞි | විනතිඞි |
| ,, | 20 | දෙශතං | දෙශනා |

# දේශනා පිළිබඳ දායකත්වය ඉසුලූ පින්වතුන්.

1. ඩී පී විජයසුන්දර මයා, ඩී ඇල් විජයසුන්දර මුදලාලි මයා, ඩී ජේ විජයසුන්දර වීරසේකර මයා- රෙමුන.
2. ජී නිකෝරිස් බාස් මයා- මග්ගොන, එච් ගුණේරිස් ප්‍රනාන්දු මයා, ආර්. මනුවෙල් ප්‍රනාන්දු මයා, ජී. මාටින් ප්‍රනාන්දු මයා මහයාල.
5. මහයාලේ පොට්‍රිසැන්ට්‍රියේ ආදිශිෂ්‍ය සමූහයා.
7. ඒ. ආතර්. සිල්වා මයා අඟුරුවාතොට, කේ. ඩී. අගොස්සිංඤෝ මුදලාලි මයා, ඒ. ඩී. තෝමස් සිංඤෝ මුදලාලි මයා- යාල.
8. ඇම්. ඇලිස් කුලවීර මහත්මිය, ඩබ්ලිව්. සම්පොහාමි මහත්මිය, ඩබ්ලිව්. ඇසිලින් ප්‍රනාන්දු මහත්මිය, ලූසී වීරසේකර මහත්මිය, මහයාල.
10. බී. ඩබ්ලිව්. දිනෙස්හාමි මයා උඩුගමමන, ටී. ඇල්බින් ප්‍රනාන්දු මයා, ආර්. තේනිස් ප්‍රනාන්දු මයා මහයාල.
11. එච්. පොඩිනෝරිස් ප්‍රනාන්දු මයා, ඩබ්ලිව්. දනියෙල් ප්‍රනාන්දු මයා ආර්. විලියම් ප්‍රනාන්දු මයා, ආර්. මානිස් ප්‍රනාන්දු මයා මහයාල.
12. කුඩායාලේ සිට පරලෝසැපත්- එච්. කැරොලිස් පෙරේරා වෛද්‍යාචාර්යතුමා හා එම මැතිනිය අනුස්මරණය කිරීම සඳහා සිය දූ පුත්‍රාදී පින්වතුන් විසිනි.

මෙහි නොදැක්වෙන පින්කම් සතර පිළිබඳව සාමාන්‍යාධාරකළ පින්වතුන්වද කෘතඥතා පෙරටුව සිහිකරමු.

මට,

සිරි අරියවංස ගුණානුස්මරණ සමිතිය.

# ධාරණ ධර්මය.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

## කායානුපස්සනා සතිපට්ඨානය.

අමරපුර සිරි සද්ධම්මවංශ මහානිකායේ ලේඛකාධිකාරී මාදම්පේ
ශාස්ත්‍රාලෝක පිරුවන්හි ප්‍රධානාචාර්ය මලවැන්නේ පුෂ්පා
රාමාධිපති ධර්මකීර්තිශ්‍රී තෙල්වත්තේ පණ්ඩිත
පඤ්ඤාවංස අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ
විසින් පවත්වන ලද දේශනාව.

එකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා සොක පරිද්දවානං සමතික්කමාය දුක්ඛ දොමනස්සානං අත්ථගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා! කතමෙ චත්තාරො! ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලෝකෙ අභිජ්ඣා දොමනස්සං.

සාධු සත්රුෂ භවතුනි!

මා විසින් දැන් මෙහි ප්‍රකාශ කරනලද්දේ කායානුපස්සනාසති පට්ඨානය විස්තර කිරීමට මාතෘකාවක් වශයෙන් තැබියයුතු සූත්‍රාන්තික දේශනා පාඨයකි. එහි අර්ථ වර්ණනාව කරන්නට මත්තෙන් සියලු ධර්මදේශකයන් වහන්සේලාගේ ආවේණික (චාරිත්‍ර) ධර්මයක්වූ අවවාද මාත්‍රයක් කරන්ට අදහස් කරමි. එය කරන්නේ ඉතා සංක්ෂෙපයෙනි–

“සබ්බදානං ධම්මදානං ජිනාති”

මේ වනාහි තථාගත සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේ විසින්ම දේශනාකර වදාළ ගාථාවක එක පදයකි. එහි අර්ථනම සබ්බදානං! සියලු දාන පරදවා; ධම්මදානං! ධර්මදානමය පුණ්‍ය

ණිම්ය ජිනාති! ජයගනී යනුයි. මෙයින් ධර්මදානමය පින්කම සියලු දානමය පින්කම් පරදවා ජයගන්නා බව උගන්වයි. බණකීම බණ ඇසීම, සහ බණ කියවීම ධර්මදානමය පින්කම නම් වේ.

ඉදින් වනාහී සක්වල ගැබ මුලුල්ලෙහි බ්‍රහ්ම ලෝකය දක්වා අතුරු නැතිකොට වැඩහුන්නාවූ බුදු පසේ බුදු මහරහතන් වහන්සේලාට කොසෙල්ගොබ වැනි සිවුරු පූජාකරන්නේද; එම සමාගමයෙහි සතරපද ගාථාවකින් කළ අනුමෝදනාවම ශ්‍රේෂ්ඨ වන්නේය, ඉහතකී දානය වනාහී ඒ ගාථා ධර්මදේශනාවගේ සොළොස්වෙනි කලාවෙන් කලාවද නොවටින්නේය. ඊට කාරුණු කවරේදයත්?

මෙබඳු පින්කම් කරන්නෝ වනාහී බණ අසාලාම් කරත්. නො අසා නොකරත්. ඉදින් වනාහි සත්වයෝ බණ නො අසත් නාහුද? ඔවුහු කිණිස්සක් පමණ කැඳද- හැන්දක් පමණ බත්ද නොදෙන්නාහුය; බණ අසාම දෙන්නාහුය; මේ කාරණයෙන් සියලු දානයන්ට වඩා ධර්මදානයම ශ්‍රේෂ්ඨවන්නේයයි දතයුතුයි.

මැලිදු සර්වඥ බුදුවරුද පසේබුදුවරුද හැර කල්පයක් මුලුල්ලෙහි වසිනා වර්ෂාවේ දියබිඳු ගණනාව ගණන් කොට කියන්ට සමර්ථවූ සාරිපුත්‍ර ස්ථවිරාදීහුද තමන්ගේ ඥානශක්තියෙන් සෝවාන් මාර්ගඥානාදිය ප්‍රත්‍යක්ෂ නොකළහ. අස්සජි මහා ස්ථවිරාදීන් විසින් කියනලද බණ අසාම සෝවාන් මාර්ගඥානය ප්‍රත්‍යක්ෂ කළහ. පසුව ශාස්තෘන් වහන්සේගේ ධර්මදේශනාවෙන් ශ්‍රාවක පාරමී ඥානය ප්‍රත්‍යක්ෂ කළහ; මේ කාරණයෙනුදු ධර්මදානයම ශ්‍රේෂ්ඨවන්නේයයි දතයුතුයි- "සබ්බදානං ධම්මදානං ජිනාති" යි වදාළේ එහෙයිනි.

ධර්මදානමය පින්කම සියලු දානවලට වඩා ආනිසංස ඇතිව ශ්‍රේෂ්ඨත්වයට පැමිණීමට තවත් හේතුවක්නම් ශාසනික සියලු දානාදි පින්කම්වලින් බලාපොරොත්තු වියයුතු එකම ස්ථානය නම් සෝවාන් මාර්ගඥානයයි. සෝවාන් මාර්ගඥානය වූකලී අවබෝධ කරගැනීම පිණිස ශාසනික සියලු දානාදි පින්කම් උපකාරවෙති. එහෙත් පරතොඝෝෂ ප්‍රත්‍යයයි කියන ලද අනුන්ගෙන් උපදෙස් නොලැබීමෙන් තොරවූ හෙවත් බණ ඇසීමෙන් තොරවූ බුදු පසේබුදු දෙපක්ෂය හැරුණාම කිසිවෙකුටවත් සෝවාන් මාර්ගඥානය ප්‍රත්‍යක්ෂකළ නොහැකිවේ. සෝවාන් මාර්ගඥානය වනාහී ප්‍රත්‍යක්ෂ කරණු පිණිස ප්‍රධාන වශයෙන් හේතුවන්නේ ධර්මශ්‍රවණමය පුණ්‍යකර්මයයි, මේ කාරණයෙන්ද ධර්මශ්‍රවණමය පුණ්‍යකර්මයාගේ ශ්‍රේෂ්ඨභාවය අවබෝධකරගත යුතුයි.

දැන් ඉතින් මේ ශ්‍රද්ධාසම්පන්න බණ පිරිස බලාපොරොත්තු වන්නේ යටකී පරිද්දෙන් සියලු දානමය පින්කම් පරදවා ආනිශංස ලැබිය හැකි ධර්මදානමය පින්කම රැස්කරගැනීමටයි. බණකියන ධර්මකථිකයන්වද බණකියවන භවතුන්වද බණ අහනා සැමදෙනාටමද ඒකාකාරයෙන් ධර්මදානමය පින්කම රැස්වන්නේය, ඒ පින්කම මෙහිදී සෝවාන් මාර්ගඥානය ලැබිය හැකි ශ්‍රේෂ්ඨ පින්කමක් බව සිත්හිලා දරිය යුත්තේය.

තවද මේ පින්කම හේතුකොටගෙන ලැබිය හැකි අවශේෂ විපාක ගැන කියනුම් කවරේද? එබඳු පින්කමක් සිද්ධකරගැනීමට බලාපොරොත්තුවන බණපිරිස කෙබඳු ප්‍රතිපත්තියක් උඩ පිහිටා මේ පින්කම සිද්ධකරගත යුතුද? මේ ලඟට විස්තරකරදිය යුතුවේ.

සියලු අවස්ථාවලදීම බුදුහු බණ පිරිසට අවවාද දෙන්නේ සකස්ව බණ අසන්ට කියායි= සකස්ව බණඇසීම නම් “උග්ගණ්හිස්සාමීති ඨත්වා සුණන්තෝ කිර සක්කච්චං සුණාති නාම, එවං ච කිර සුණන්තානං ධම්මෝ සෝතාපත්ති මග්ගාදයෝ දේති” යනුවෙන් උගන්වා තිබේ. එහි තේරුම නම් “ඉගෙනගන්නෙමැයි සිට අසනා තැනැත්තේ සකස්ව බණ අසන තැනැත්තේ නම්වෙයි. මෙසේ වනාහී බණ අසන්නාවුන්ට ඒ ධර්මය තෙම සෝවාන් මාර්ගඥානාදිය දෙයි යනුයි.

මෙහි වනාහි සකස්ව බණ ඇසීමේ ක්‍රමය මොනවට පැහැදිලිකරතිබේ. බණ කියන ස්ථානයකට බණ ඇසීම පිණ පැමිණෙන සැමදෙනා විසින්ම ඇතිකර ගතයුතු එනම් අධිෂ්ඨානය නම් මේ බණ ඉගෙනගන්ට ඕනෑය, යන අධිෂ්ඨානයයි; එසේ අධිෂ්ඨානකොටගෙන බණ ඇසීම සකස්ව බණ ඇසීමයයි දත යුතුයි.

බණ ඇසීම පිණිස පැමිණෙන සැමදෙනා විසින්ම මේ අදහස ඉදිරිපත්කොටගෙන කය වචනය හිත යන තුන්දොර සන්සිඳුවා ගෙන බණ ඇසීමට සූදානම් විය යුතුයි; එහි කය සංවරකර ගැනීමනම් කාය විකාරාදිය නොකිරීමයි, වචනය සංවරකරගැනීමනම් ඔවුනොවුන් අතර කථාබස් ආදිය නොපැවැත්වීමයි. සිත සංවර කරගැනීම නම්= අන් අරමුණු කරා හිත ගමන්කරවන්නේ නැතිව ධර්මයම අරමුණුකොටගෙන බණ ඇසීමයි. මෙසේ වනාහී බණ අසන සත්පුරුෂයන්ට බණ ඇසීමෙන් ලැබිය හැකි ලෞකික ලෝකෝත්තර සැප ලැබිය හැකිවේයයි දතයුතුයි.

## අද ධර්මදේශනාව.

මහයාලේ ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථානයෙහි අද ආරම්භකරන්ට යන ධර්මදේශනා පඞ්ක්තිය වූකලී බෞද්ධ ලෝකයාගේ දැනගැනීම පිණිස අතිශය ප්‍රයෝජනවත් ධර්මදේශනා පඞ්ක්තියකි. සතර සතිපට්ඨානය වනාහී සියලු බෞද්ධයන් විසින් විශේෂයෙන් ඉගෙන ගතයුතුවූ විශිෂ්ට ධර්මකොට්ඨාශයක් බව කියයුතු නොවේ. ආගම් භක්තිය උපදවන ගැඹුරු ධර්මදේශනා අතරෙන් මේ වනාහී අද්විතීය ධර්ම කොට්ඨාශයකි.

මෙම විහාරාධිපති ගෞරවාර්හ උගත් මොරටුවේ සාසනවංස ස්ථවිර පාදයන් වහන්සේගේ උපදෙස් අනුව එම විහාරස්ථානයේ දායක මහතුන් විසින් ආරම්භකරන ලද ධර්මදේශනාවලියෙහි ප්‍රථම ධර්මදේශනාව මෙය වේ. මෙය අප වෙත පැවරීම ගැන අපගේ කෘතඥතා පූර්වක ගෞරවාදර ස්තුතිය ඒ ස්ථවිර තුමන් ප්‍රධාන දායක සභාවට සමර්පණය කරමු.

---

## මේ පින්කමේ නිමිත්ත.

මේ පින්කමේ නිමිත්තද වනාහි ඉතා උසස් ගුණධර්මයක් ඇසුරුකල එකකි. කෙලෙහිගුණ සැලකීම වූකලී ලෝකයෙහි දුර්ලභ ගුණධර්මයකි.

මේ මහයාලේ පුෂ්පාරාමය, මොරටුමුල්ලේ සිරි සුධර්මාරාමය, ආදී ස්ථාන පසක ආදිකර්තෘභූත සිරි ඤාණාභිවංස ධම්මාධාර වංසපාල විනයාලඞ්කාර සිරි අරියවංස මහා ස්ථවිරයන් වහන්සේ වනාහී බෞද්ධ ලෝකයාගේ ගරු සම්මානයට භාජනවූ වැඩිහිටි සිල්වත් ගුණවත් මහෝත්තමයෙකි. විශේෂයෙන් මූන් වහන්සේ විනයධරයෙකි. ඒ බැව් සැලකූ ස්වනිකායේ (අමරපුර සිරිසද්ධම්මවංස මහානිකායේ) මහානායක ස්වාමීන්ද්‍ර ප්‍රමුඛ ගරුතර කාරක මහා සංඝසභාව විසින් මූන්වහන්සේට ඉහත සඳහන් කල ගරුනාම සම්මුතියෙන් ගෞරව කරනු ලැබීය.

මෙබඳු ගුණසම්පන්න උතුමෙකු සිහිපත්කොට ප්‍රාප්තිදානය කිරීම දශපුණ්‍යක්‍රියාවට ඇතුලත් පින්කමක් වෙයි.

ධර්මානුශාසනය මෙයින් අවසන් කරනු ලැබේ.

-( 5 )-

# කායානුපස්සනා සතිපට්ඨානය.

**මෙතැන්සිට අද ධර්මදේශනාවට නියමිත මාතෘකාව යථාශක්තීන් විස්තර කරනු ලැබේ.**

---

**මාතෘකාව = උද්දෙස වාරය.**

**ඒකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා සොක පරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථංගමාය ඤායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා-**

**එහි භාවය:-**

මහණෙනි· රාගාදී කෙලෙශ ධර්මයන්ගෙන් කිලිටු සිත් ඇති සත්ත්වයන්ගේ පිරිසිදුවීම පිණිසද, ශොක පරිදෙව දුක්ඛයන්ගේ ඉක්මවීම පිණිසද දුක්දොම්නස් දෙදෙනාගේ නැසීම පිණිසද, ආර්ය අෂ්ටාංගික මාර්ගයාගේ පැමිණීම පිණිසද නිර්වාණ නම්වූ උතුම් අමෘතයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද යම් මේ සතර සතිපට්ඨාන කෙනෙක් වෙත්ද, මේතෙම අයනසංඛ්‍යාතවූ ඒ එකම මාර්ගය වන්නේයයි වදාළසේක.

මේ වනාහි මේ ධර්මයාගේ උද්දෙශවාරයයි සතර සතිපට්ඨාන යන් අතුරෙහි එකී එකී සතිපට්ඨානයෙන් ඇතිවන ප්‍රයෝජනය මෙහි දක්වා තිබේ. වෙන් වෙන් වශයෙන් සම්බන්ධකොට ගත් කල්හි කායානුපස්සනා සතිපට්ඨානයෙන් ඇතිවන ප්‍රයෝජනය මෙසේ දතයුතුයි. එනම්; කායානුපස්සනා සතිපට්ඨාන නමැති මේ එකම මාර්ගය තෙම රාගාදී කෙලෙශයන්ගෙන් කිලිටු සිත් ඇති සත්ත්වයාගේ පිරිසිදුවීම පිණිසද ශොක පරිදෙව දුක්ඛයන්ගේ ඉක්මවීම පිණිසද දුක්දොම්නස් දෙදෙනාගේ නැසීම පිණිසද ආර්ය අෂ්ටාංගික මාර්ගයාගේ පැමිණීම පිණිසද නිර්වාණ නම්වූ උතුම් අමෘතයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිසද හෙතුවන්නේය.

"මෙකිඒකායනො මග්ගො" යනුවෙන් එකායන මාර්ගය ප්‍රකාශකොට දක්වා වදාරන භාග්‍යවතුන්වහන්සේ සත්ත්වයන්ට නිවන්පුර වැදීමට මේ සතිපට්ඨාන භාවනා මාර්ගය හැර මීට දෙවැනි වූ අන්කිසි මාර්ගයක් නැති හෙයින්ද ගණසඞ්ග නිකායෙන් දුරුව විවෙකව හුදකලාව පිළිපැද්දයුතු භාවනා මාර්ගය හෙයින්ද එකම බුදුරජාණන් වහන්සේගේ මාර්ගය හෙයින්ද ධර්ම විනය වශයෙන් ද්විප්‍රකාරව සිටි මේ එකම බුද්ධශාසනයෙහි මුත් අනික් තැනක

නැති හෙයින්ද මේ භාවනා මගට වඩා එකම නිවන්පුරයට පැමිණීමට අන්කිසි මගක් නැති හෙයින්දැයි යනාදී නොයෙක් අර්ථයන් හේතුකොටගෙන එකායන මාර්ගයයි වදාරණ ලද මේ පදයෙහි අර්ථ හේතුකොටගෙන පූර්වයෙහිද මහතෙරුන්වහන්සේලාගේ ධර්මසාකච්ඡා පහළවිය. ඒ කෙසේදයත්? ත්‍රිපිටක චුල්ලනාග තෙරුන්නාන්සේ වදාරනසේක් සතිපට්ඨාන සූත්‍රදේශනාවෙහි "එකායනො මග්ගො" යන මේ පදයෙන් ප්‍රකාශවූයේ ශ්‍රොතාපත්ති මාර්ගාදීන්ට පූර්වභාගවූ කායානුපස්සනාදී සතර සතිපට්ඨානයන් අරමුණුකොට පවත්නා භාවනා මාර්ගයයි වදාළසේක. උන්වහන්සේගේ ආචාර්යවූ ත්‍රිපිටක චුල්ලසුමන නම් තෙරුන් වහන්සේ ඒ අසා, ඇඳෑත්ති! ඒ මාර්ගයන් හා සතිපට්ඨාන භාවනා සහිතවූ මිශ්‍රක මාර්ගයයි වදාළසේක.

එවිට ශිෂ්‍යවූ එම ත්‍රිපිටක චුල්ලනාග තෙරුන්වහන්සේ ස්වාමීන් වහන්ස! ලොකොත්තරවූ ආර්ය මාර්ගයට පැමිණෙන්නහු විසින් මේ සතිපට්ඨාන භාවනාමාර්ගය වැඩීමෙන්ම භාවනාකොට ආර්යමාර්ගයට පැමිණිය යුතුය. එහෙයින්ම පූර්වභාග නම්ලද මේ සතිපට්ඨාන භාවනා මාර්ගයම මෙහි අභිප්‍රායයි නැවතත් දැන්වූසේක. ඒ අසා ආචාර්යයන් වහන්සේ නැවතත් මිශ්‍රක මාර්ගයයි වදාළසේක. එකල්හී ශිෂ්‍යවූ චුල්ලනාග තෙරුන්නාන්සේ කිසිවක් නොවදාරා තුෂ්ණීම්භූත වූසේක. එහෙයින් ප්‍රශ්නය නොනිමි කල්හිම දෙදෙනා වහන්සේම නැගී වැඩිසේක. නැවත ඒ ආචාර්ය තෙරුන්නාන්සේ සවස්වේලෙහි නහනා තොටුවට වඩිමින් සිතන සේක්, මම වනාහි එකායන මාර්ගයම නිවණට මාර්ගය වන බැවින් ලොකොත්තර මාර්ගයයි කීමි; චුල්ලනාගයෝ ඒ පූර්වභාග සතිපට්ඨාන භාවනා මාර්ගයයි කියති. එයින් කවර අර්ථයක් ගත යුතුදෝහෝයි සිතා සූත්‍රාන්තය මුලපටන් අර්ථපරිවර්තනයෙන් අලලා බලමින් ගොස් "යොහි කොචි භික්ඛවෙ ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ එවං භාවෙය්‍ය සත්තවස්සානීති" යන මේ ස්ථානයට පැමිණ එහි අර්ථ සලකනසේක් යොහිකොචි,, යන්නෙන් ප්‍රකාශවූ සියලුම සිව්වනක් පිරිස් අතුරෙන් ගිහිව වසන්නෙක් ලොකොත්තරවූ රහත්මගට පැමිණ සත්වර්ෂයක් ගෘහ වාසයෙහි එම ආර්ය ගුණයෙන් යෙදී සිටීමක් නැත. එහෙයින් මාවිසින් මිශ්‍රක මාර්ගයයි දැක්වූ අර්ථය ගතයුතු නොවෙයි. මාගේ ශිෂ්‍යවූ චුල්ලනාගයන් විසින් දැක්වූ අර්ථයම ගතයුතු යයි සිතා එම්දෑම අටවක් දීනයෙහි ධර්මදේශනාවාරය චුල්ලනාගයන්ට පැමිණ මෙම සතිපට්ඨාන සූත්‍රදේශනාවට ප්‍රාරම්භව ධර්මාසනාරූඪව හුන්කල්හි ධර්මශ්‍රවණ කාලඝොෂා ශබ්දය අසා ආචාර්ය ඒ මහතෙරුන් වහන්සේ එතැනට

පැමිණි ඊර්ෂ්‍යා මාන නැතිවම ඇවැත්වූ චූලනාගයෙනි! මා විසින් දක්වූ මිශ්‍රක මාර්ගයයි යන වචනය හැර තොපි දක්වූ පූර්වභාග මාර්ගයයි යන වචනයම ගෙන ඒකායන මාර්ගයෙහි අර්ථ කියයුතුයයි වදාළසේක; ඒ වචනය අසා උන්වහන්සේ මැනවැයි සියා පිළිගෙන සිතනසේක්; අපගේ ආචාර්යවූ සියලු ත්‍රිපිටක පර්යාප්ති ධර ශ්‍රැතබුද්ධවූ මෙබඳු බහුශ්‍රැත භික්ෂූන්වහන්සේට පවා මේ ප්‍රශ්නය ඇලලී හැඹුරුව පෙනීගියේය එහෙයින් අනාගතයෙහි පැමිදිවන මාගේ මිලණුවරුන්ට මේ ප්‍රශ්නය ඇලලීමක් නොවනසේ සූත්‍රය ගෙනහැර දක්වා නිශ්චය කෙරෙමියි. සිතාවදාරා පටිසම්භිදා මාර්ගයෙන් උදාහරණයක් ගෙන පූර්වභාගයෙහි සතිපට්ඨාන භාවනා මාර්ගයම ඒකායන මාර්ගයයි කියනු ලැබේයි වදාරා එම අර්ථයම සපිර කරනු පිණිස-

මග්ගානට්ඨඞ්ගිකො සෙට්ඨො, සච්චානං චතුරොපදා
විරාගො සෙට්ඨො ධම්මානං, ද්විපදානඤ්ච චක්ඛුමා-
එසොව මග්ගො නත්ථඤ්ඤො, දස්සනස්ස විසුද්ධියා,
එතම්හි තුම්හෙ පටිපජ්ජථ, මාරසෙනප්පමද්දනං
එතම්හි තුම්හෙ පටිපන්නා, දුක්ඛස්සන්තං කරිස්සථ-

යනුවෙන් ප්‍රකාශවූ සම්‍යක්දෘෂ්ටි ආදිවූ ආර්ය අෂ්ටාංගික මාර්ග-යම් ඇතුළත් "සම්මාසති" යන පදාර්ථයෙහි පෙනීසිටි මෙම සතිපට්ඨාන භාවනාවම නිර්වාණයට භාවනා මාර්ග නම්වෙයි. මෙයින් පිටත් අන්කිසි මාර්ගයක් නැතැයි යනමේ පාලික්‍රමය දක්වීමෙන් මෙසේ ප්‍රශ්නය නිශ්චය කොට විසඳූසේක.

## නිර්දේශ වාරය.

එහෙයින්ම ඒකායන මාර්ග නම්වූ මේ භාවනා මාර්ගය හේතු කොටගෙන සියලු සත්වයන් නිවන් පුර වදනා අර්ථයෙන් ඒකායන මාර්ගය නම්ලද මේ සතිපට්ඨාන සූත්‍රදේශනාවට ප්‍රශංසාකොට දක්වා වදාරණ භාග්‍යවතුන් වහන්සේ; සියලු සත්වයන්ට ක්ලේශ රාගාදී පාපමල විෂම ලොභාදී ක්ලේශයන් කෙරෙන් දුරුව පිරිසිදු වන බව අන්පරිද්දෙකින් නොව අතීතාදී කාලත්‍රයෙහිම බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ ආර්යශ්‍රාවක සංඛ්‍යාපථාතික්‍රාන්ත පරමභාවනා විශුද්ධිප්‍රාප්ත උත්තම සත්වයෝ රූපාදීන්ගේ ආදීනව දර්ශනවූ මේ බලයෙන් ශුද්ධවූ හෙයින් එසේ සත්වයන්ගේ සුද්ධියද සන්තති මහාමාත්‍ය පටාචාරාදීන්සේ ශොකසන්තාප හැඬීම් වැළපීම් හික්මවා මෙම භාවනා මාර්ගයෙන් දුරුකිරීමද කයෙහි උපදනා දුක්ඛ

වේදනාවෝය සිත්හි උපදනා දොම්නස්හුය යන මේ දුක් දොම්නස් දෙදෙනාගේ නිසානම් සප්විරාදීන්ට මෙම භාවනා බලයෙන්ම අස්තඞ්ගමයෙන් අතුරුදහන්වීමද සම්‍යක්දෘෂ්ටි ආදී ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයාගේ පැමිණීමද අමෘත මහා නිර්වාණ ධර්‍මයාගේ ප්‍රත්‍යක්ෂ කිරීමද යන මේ ආනිශංස කාරණයන්ගේ ප්‍රතිලාභයට මේ ඒකායන මාර්ගවූ සතිපට්ඨාන භාවනා මාර්ගය භාවිතා කල තැනැත්තේ පැමිණෙන්නේයයි කියා සත්පදයකින් මේ සූත්‍රයෙහි ගුණවර්ණනා කරණසේක.

යම්සේ කම්බල වාණිජ තෙම ගන්ධාර දේශයෙහි උපන් ඉතා සිනිඳු උජ්ජ්වලාම්බ නම්වූ මහා සපර්‍ඝ ඇති ලක්ෂයක් වටිනා රත්නකම්බිලි ගණුවයි කියා අඬගා කියන්නේය. එසේ කී කල පොහොසත්හු මිලදී ගණිති නොපොහොසත්හු ඒ දක්නා කැමැති වෙති. ජාම්බූනද රන් මුතු මැණික් ආදී රත්න වෙළෙන්දෝද ඒ ඒ රත්නයන්ගේ ගුණ එසේම වර්ණනා කරන්නාහුය; එමෙන් බුදුරජාණන් වහන්සේද ඒකායන මාර්ගයයි විදාල වචනය පමණකින් මේ සතිපට්ඨාන සූත්‍රයෙහි ගුණ ප්‍රකාශ නොවන හෙයින් "සත්තානං විසුද්ධියා" යනාදීන් ශෝකය පරිදේවය දුක්ඛය දෞර්මනස්‍යය යන මේ උපද්‍රව සතරක් දුරුවීමද සිත් පිරිසිදුවීමය ආර්‍ය්‍ය මාර්ගයට පැමිණීමය නිවන්පුර වැදීමය යන මේ තුන් ප්‍රකාර ගුණ විශේෂයන් ප්‍රතිලාභයද, මෙසේ සත් වැදෑරුම් ආනිශංස කාරණයන් ප්‍රකාශ කිරීමෙන් ශ්‍රවණෝද්ග්‍රහණාදී වශයෙන් මේ සතිපට්ඨාන සූත්‍රදේශනාව උගත යුතුය ප්‍රගුණ කටයුතුය කියයුතුය කියවිය යුතුය ඇසිය යුතුය දැරිය යුතුය භාවිතා කටයුතුයයි සිතා දැන හැඳින අර්ථී සහිතවූ ඉමහත් සාදරවූ, භාවිතා කිරීමට උත්සාහ උපදවා වදාරමින් ඊට අනතුරුව "කතමෙ චත්තාරො සතිපට්ඨානා" යනාදි ක්‍රමයෙන් ප්‍රශ්නකොට ඒකායන මාර්ගය සතර සතිපට්ඨාන ධර්මයන් උද්දේශ විසින් දේශනාවට පටන්ගත්සේක.

## උද්දේශ වාරය.

කතමෙ චත්තාරො? ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං"

මේ )වනාහි කායානුපස්සනා සතිපට්ඨානය උද්දේශ වශයෙන් දේශනාකිරීමට පටන්ගත් දේශනාපාඨයයි. එහි භාවාර්ථය පළමු කොට දක්වනු ලැබේ· ඒ සතර සතිපට්ඨානයෝ නම් කවරගණක්?

මහණෙනි මේ ශාසනයෙහි මහණතෙම විශෙෂයෙන් පිළිකුල් කටයුතු ව්‍යාම මාත්‍රවූ මේ ශරීරයෙහි එකාන්ත අසුභ බව දැන කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇති සම්පජඤ්ඤයයි කියන ලද ඥාණයෙන් සමන්විතවූ කායපරිග්‍රාහික සතියයි කියන ලද ශරීරයාගේ අසාර අසුභ වශයෙන් කාය සිහිකරන්නාවූ සිහියෙන් යුක්ත වූයේ ලුජ්ජන පලුජ්ජනාර්ථයෙන් ලොකනම්වූ මේ ශරීරයෙහි කාමච්ඡන්දයයි කියනලද ලොභයද ව්‍යාපාදයයි කියනලද නොසතුටු බවද යන මේ පාප ධර්මයන් අනිත්‍යාදි නොයෙක් ආදීනව කාරණයන් සිහිකිරීමෙන් පාපයට අවකාශ නොදීමය යන තදඞ්ගද වශයෙන්ද ප්‍රථමධ්‍යානාදි සමාධිභාවනා බලයෙන් සිත එකඟකොට පාපයට අවකාශ නොදීමය යන විෂ්කම්භන වශයෙන්ද යන මේ ද්විප්‍රකාරයෙන් පාපමූලවූ කෙලෙසුන් සංසිඳුවාගෙන මෙසේ කායගතාසති භාවනාව සිත්හි කරමින් වාසය කරන්නේය යනුයි.

තවද මේ කායානුපස්සනා සතිපට්ඨානය තෘෂ්ණා චරිතය, සඳහා දෙශනා කරන ලද්දේය. ලොකසත්වයන් අතුරෙහි තෘෂ්ණා චරිතයෝය, දෘෂ්ටි චරිතයෝය සමථයානිකයෝය, විදර්ශනායානිකයෝයයි කියා සත්වයෝ සතර ප්‍රකාරයක් වන්නාහුය: ඔවුන් කෙරෙහි ප්‍රඥාවගේම මන්ද තීක්ෂණ වශයෙන් ද්විප්‍රකාරවූ විනෙය ජනයන් කෙරෙන් මන්දබුද්ධිවූ තෘෂ්ණා චරිතයාට මාංශ චක්ෂුසින්ද දක්ක යුතුවූ මහත්වූ කායානුපස්සනා සතිපට්ඨාන භාවනාවම නිර්වාණයට මාර්ග වන හෙයින් හේ විසුද්ධිමාර්ග නම්වෙයි.

ලොකයෙහි සත්වයන්ගේ වැද සැනසීමට නිසි අමෘත මහා නිර්වාණය නගරයක් වැන්න. ලොකොත්තරවූ ආර්‍ය්‍ය මාර්ගයෝ නම් ඒ නුවරට වදනා මහදොරටු වැනියහ. "කායානුපස්සනා සතිපට්ඨානය නම් පෙරදිග රටවල් වැන්න. යම්සේ පෙරදිග රටවල හැසිරෙන මිනිස්සු ඒ ඒ තැන උපදනා නොයෙක් භාණ්ඩ ගෙන එකම නුවරකට වදිද්ද! එසේම ලොකයෙහි දක්වන ලද ක්‍රමයෙන්ම චතුෂ් ප්‍රමාණවූ විනෙය ජනයන් අතුරෙන් ආත්මභාව, සොභනය, සැපය නිත්‍යයයි කියා මේ කුණපයන්ගේම රාශිවූ එකාන්ත අශුභ ශරීර නිසා උපදනා ලොභ සිතින් මූල, වූ විරුඬ විපර්‍ය්‍යාශ කල්පනා ඇති මන්දබුද්ධිවූ තෘෂ්ණා චරිත සත්වයන්ට එම ශරීරයාගේම අනෙකප්‍රකාරවූ කුණප අසුභ ආදීනව ලක්ෂණ ප්‍රකාශකොට දක්වීමෙන් ඔවුන්ගේ එම විපරීත ග්‍රහණයෙන් දුරුවීමය හුදෙක් විපරීත ග්‍රහණයාගේ දුරුවීම, පමණක් නොවකාමෝඝාදී චතුරොඝය කාමරාග සංයොජනාදී දසවිධ සංයොජනය කාමාශ්‍රවාදී චතුරාශ්‍රවය කායග්‍රන්ථාදී ග්‍රන්ථය කාමූපාදානාදී උපාදානය ඡන්දාදී අගතිගමනය යන පාප මලයන්

යථාක්‍රමානුරූපවූ පරිච්ඡෙදන් භාවනානුයොග බලයාගේ ආනුභාවයන්ම දූරීකරණයෙන් විධ්වංශනය වන්නාහුයයි යනාදිවූ ප්‍රමාණාතික්‍රාන්තා ආනිශංසකාරණයන් විශිෂ්ටවූ බුද්ධඥානයෙන්ම දැන වදාරා ඒ මන්දබුද්ධිවූ තෘෂ්ණාලොභය දුරුකොට ඒ සිත එලවාගැනීමට පහසුකාරණයවූ ශුභරූපවූ එහෙයින්ම මාංශචක්ෂුසටද විෂයවෙමින් සිටි මහත් ඔලාරිකාරම්මණවූ නුවරට පූර්වදිශාභාගය වැනි පළමුවැනි කායානුපස්සනා සතිපට්ඨාන භාවනාවෙහි හැසිරෙන්නාහු නොයෙක් ප්‍රභෙද භාණ්ඩවැනිවූ චුද්දසවිධවූ එම කායානුපස්සනා භාවනාවෙන් උපදනා ආර්‍යමාර්ගද්වාරයෙන් එනම නිර්වාණ පුරයට වදනාහුය.

මෙසේ ලොකයෙහි තෘෂ්ණා චරිතය දෘෂ්ටිචරිතය යන දෙදෙනාගේම මන්දතීක්ෂණ බුද්ධි වශයෙන් චතුෂ්ප්‍රකාරවූ සත්වයන්ද සමථයානිකයයි කියනලද සමාධි බලයෙන්ම සිත් එකඟව සංසිඳී වසනා සත්වයෝය. විදර්ශනායානිකයයි කියනලද චිත්තෛකාග්‍රතායෙහි සිහිටා පඤ්චස්කන්ධාදී ධර්මයන්ගේ ස්වලක්ෂණාදී විසින් බලය විදර්ශනාඥානයෙහි යෙදී වසන සත්වයෝය යන ද්විප්‍රකාරවූ සත්වයන්ගේද මන්දතීක්ෂණවූ බුද්ධිවශයෙන්ම සත්වයෝ සතර කොටසක් වන්නාහුය.

එසේම චතුෂ්ප්‍රකාරවූ සත්වයන්ගේද යට කියනලද ක්‍රමයෙන් වරදවා ගන්නා ලද විපරීත ග්‍රහණය හා සියලු පාපමල විධ්වංශනය කිරීමෙන් නිවන් පුර වැදීමට යථොක්ත ක්‍රමයෙන්ම මේ කායානුපස්සනාව ආදිවූ සතර සතිපට්ඨාන භාවනායෙන්ම ඔවුනොවුන්ගේ චරිත ලෙස හිතාරම්මණ වන්නාහුය.

එබැවින් හැම සතුන් වෙත පතළ මහාකරුණා ඇති ත්‍රෛලොක්‍යෛකතිලක සකලඥෙය මණ්ඩලය කරතලාමලකයක්සේ අවබොධකලාවූ අනාවරණ ඥාන ප්‍රභාධර අප භාග්‍යවතුන් වහන්සේ ලොකසත්වයන් මෙසේ චතුෂ්ප්‍රකාර විනෙයජන පුද්ගල ප්‍රමාණ වශයෙන්ම සතරකොටසක්ව ඌනාතිරෙක නොව ඔවුනොවුන්ගේ චරිත වශයෙන්ම දැනවදාරා “පධානං ඨානන්ති වා සති පට්ඨානං” යනාදි අට්ඨුවායෙහි කීහෙයින් සත්වයන්ගේ සිහිය තැබීමටම සුදුසුවූ ප්‍රධානස්ථාන හෙයින් හෝ “පක්ඛන්දිත්වා පක්ඛන්දිත්වා තිට්ඨතීති පට්ඨානං” යි ටීකායෙහි ආ හෙයින් යොගාවචරයාගේ සිහිතොමෝ රූපාදී ඒ ඒ අරමුණුවලට ක්ෂණ ක්ෂණයෙහි පැන පැන සිටිනුයි “පට්ඨාන” නම් වූ සතිපට්ඨානයෝ මෙහි සතර දෙනෙක්ම නියමකොට දක්වා වදාරණ ලද්දාහුයයි දතයුතු.

# නිර්දේශ වාරය.

## කථඤ්ච භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති?

මෙසේ උද්දේශ වශයෙන් සතර සතිපට්ඨාන දේශනාව සංක්ෂෙපකොට දක්වා වදාරා නිර්දේශ වශයෙන් විස්තර දේශනා කරන ධර්මරාජන්වූ සර්වඥරාජොත්තමයාණන් වහන්සේ කථඤ්ච භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති'' යනාදීන් තමන් වහන්සේම ප්‍රශ්නකොට මතු දක්වන ක්‍රමයෙන් විස්තරවූ කායානුපස්සනා සතිපට්ඨාන දේශනාව පවත්ගත්සේක.

### නිර්දේශවාරයෙහි භාවය.

මහණෙනි! සසර භය දක්නා අර්ථයෙන් භික්ෂුනම්වූ යම්කිසි යොගාවචරයෙක් තෙම කෙසාදි දෙතිස්කුණු කොටසින් යුත් රූපකායෙහි කායගතාසති සිත්හි කරමින් කෙසේ වාසයකරන්නේද? යනු මෙහි භාවයයි.

ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤගතොවා රුක්ඛමූලගතොවා සුඤ්ඤාගාරගතොවා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා සො සතොව අස්සසති සතො පස්සසති දීඝංවා අස්සසන්තොදීඝං අස්සසාමීති පජානාති දීඝංවා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති -පෙ- එවංපි භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති.

### භාවය.

මහණෙනි! මේ ශාසනයෙහි යථොක්තාර්ථයෙන් භික්ෂු නම්ලද යොගාවචර තෙම අරණ්‍යයකට ගියේ හෝ භාවනාවට සුදුසුවූ වෘක්ෂමූලයකට ගියේ හෝ එසේම භාවනානුරූපවූ ජනයන්ගෙන් හිස්ව තිබෙන ගෙයකට ගියේ හෝ හෙතෙම පළක් බැඳ ශරීරය ඍජුකොට අෂ්ටදශ ප්‍රමාණවූ කොඳු ඇට සන්ධි කොතැම් ඔවුනොවුන් කෙළවරහි පිහිටා තිබෙනසේ අවස්ථාව පිහිටුවාගෙන නිර්වාණ සැපයෙහිම සිත එළඹ සිටුවා එම නිවනම අරමුණු කරමින් සිහි අභිමුඛකොට පිහිටුවාගෙන හිඳින්නේය. ඒ භාවනාවට නිසිලෙස මෙසේ සිහිය ඔබිනොබ යා නොදී වැදගෙන හුන්නාවූ හෙතෙම සිහියෙන්ම ආශ්වාසය පවත්වන්නේය. සිහියෙන්ම ප්‍රාශ්වාසය පවත්වන්නේය. දීර්ඝකොට ආශ්වාස කරන්නේ හෝ දීර්ඝකොට ආශ්වාස කරන්නෙමියි දන්නේය. දීර්ඝකොට ආශ්වාස කරන්නේ හෝ දීර්ඝකොට ප්‍රාශ්වාස කරන්නෙමියි දන්නේය -පෙ- දන්නේය- මහණෙනි! මහණතෙම මෙසේද ආශ්වාස ප්‍රාශ්වාසයෙහි කායගතාසති භාවනා සිහිකරමින් වාසය කරන්නේය.

මෙසේ ආශ්වාස ගමන් ක්‍රම සිහිකිරීමය. යන මේ ආනාපාන සති භාවනා වශයෙන් කායානුපස්සනා සතිපට්ඨාන භාවනාවෙහි දක්වනලද ක්‍රමයෙන් යෙදී වසන යොගාවචරයාගේ බොහෝ දිඝී කාලයක් මුළුල්ලෙහි රූපාදි නොයෙක් අරමුණුවල ව්‍යාප්තව සිටි සියලු දුකට කාරණ හෙයින් විෂ නම් ලද පඤ්ච කාම විෂයම පුරුදුවීමෙන් දුර්මුඛවූ සිත කර්මස්ථාන භාවනා මාර්ගයට බස්නට නොකැමැතිවූ අහිතවූ අකෘතඥවූ ඒ සිත කුළුගොන් බැඳ අදනා රථය සම්ප්‍රාප්ත මාර්ගයෙන් පහව විෂම මාර්ගයට වදනාසේ අහිතවූ අපායවට කාරණවූ අමාර්ගයෙහිම දිවන්නේය.

නොයෙක් නොයෙක් ජාතිවල ඒ ඒ පාපකර්මවල හැසිරීමෙන් පව්පුරා නොයෙක් ව්‍යසන ව්‍යාප්තවූ බොහෝ කාලයක් කායික චෛතසික දුඃඛානුශොචන ලක්ෂණවූ කුලුගොණෙකු වැනි නොහික්මුණු සත්ත්වයාගේ නොදන්මෙන් අතිශයින් චංචලවූ දිය තොලදින් නැවෙන මත්ස්‍යයෙකුමෙන් නැවෙන ස්වභාව ඇත්තාවූ ඒ සිත නුවණැත්තන් විසින් නිශ්චල වනසේ දමනය කටයුත්තේය. කෙසේ දමනය කටයුත්තේදයත්?

යම්සේ කුළුදෙනෙකුගේ කිරි පානයකොට වැඩුණු කුළුවස්සෙකු දමනය කරනු කැමැති ගොපළුතෙම ප්‍රචණ්ඩවූ නොහික්මුණු ඒ කුළුවස්සා කුළුදෙන කෙරෙන් වෙන්කොටගෙන එක් පාර්ශ්වයෙක්හි වලක් කැණ මහත් ටැඹක් හිඳුවා එහි බලසහිත රැහැණකින් බඳනේය; එසේ බඳින ලද කුළුවස්සා ඔබිනොබ පැන වැටී වෙහෙසීමෙන් රැහැණ සිඳගෙන අනික් තැනකට පලායන්ට නොහැකිව එම ටැඹ නිසාම හිඳින්නේ හෝ හෝනේ හෝ වෙයි.

එපරිද්දෙන්ම බොහෝ දිඝීකාලයක් මුළුල්ලෙහි රූපාරම්මණාදි පංචකාම විෂ නමැති රසයම පානය කිරීමෙන් වැඩෙන ලද නුසුදුසු අරමුණවම තමා පෙර පුරුදුලෙස යුහුව දිවන කුළුගොණෙකු වැනි නොහික්මුණු නපුරු චිත්තය දමනය කොට වැඩෙහි යොදනු කැමති භාවනාවෙහි යෙදී වසන යොගාවචරය විසින් නුවණින් යෙදී සැලකීමෙන් තමහට වන වැඩ සලකාම යම්කිසි අරමුණක්ම ගෙන කුළුවූ ඒ චිත්තය පංචකාම විෂ නම් ලද නුසුදුසු රූපාදි ආරම්මණයන් කෙරෙන් වෙන්කොටගෙන යට කියන ලද ක්‍රමයෙන් ආරණ්‍යයකට හෝ රුක්මුලකට හෝ මිනිසුන්ගෙන් හිස්වූ භාවනානුරූප ගේකට හෝ ප්‍රවිෂ්ටව ඒද සත්ත්වයාගේ චිත්තය පිහිටුවාලීමට සුදුසුවූ සතිපට්ඨාන භාවනා ආරම්මණ නමැති මහා ටැඹෙහි සිහි නමැති රැහැණින්ම නිශ්චල කොට චිත්තය නමැති කුළුගොණා බැඳ සිටුවාලිය යුත්තේය.

එසේ ඇතිකල්හි පෙර පුරුදු රූපාදියට කාමිච්ඡ නමැති ඒ අරමුණු නොලැබීමෙන් තැවෙන්නාවූ කුළු ගොණෙකු අසෙකු වැනි දුර්දම්වූ නපුරු චිත්තය ඔබිනොබ චංචලව වෙහෙසීමෙන් ශ්‍රද්ධා ප්‍රඥාදී බලසහිතවූ ඒ සිහි නමැති රැහැණ බිඳගෙන සිත්ලෙස ඒ ඒ තැන හැසිරීමට හිරි ඔතප් නමැති අගලෙන් (පව්රෙන් වටකල ගෙයින්) යා නොහැකිව එම භාවනා ආරම්මණයට උපචාර අර්පණා වශයෙන් සිත්හිම තරකොට ගැන්මෙන් සානතවූ දමනයෙහි පිහිටා එකඟවීමෙන් එම චිත්තය තෙම එහිම හිඳිනේයි. එහෙයින් මෙම කියනලදී. පුරාතනයන් විසින්!-

යථා ථම්භෙ නිබන්ධෙය්‍ය වච්ඡං දම්මං නරො ඉධ
බන්ධෙය්‍ය වා සකං චිත්තං සතියාරම්මණෙ දළ්හං ති.

මෙසේ චිත්තයාගේ දමනය කිරීම අනුසස් විසින් දක්නා යොගාවචර තොම ආදර ඇතිව මේ භාවනාවෙහි වූක්තප්‍රකාරයෙන්ම යෙදී අප්‍රමාදව උත්සාහ කටයුත්තේය.

ඉති අජ්ඣත්තං වා කායෙ කායානුපස්සී විහරති. බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති. අජ්ඣත්තං බහිද්ධා වා කායෙ කායානුපස්සී විහරති සමුදය වයධම්මානුපස්සී වා කායස්මිං විහරති. වයධම්මානුපස්සී වා කායස්මිං විහරති සමුදය වයධම්මානුපස්සී වා කායස්මිං විහරති අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය අනිස්සිතො ච විහරති න ච කිඤ්චි ලොකෙ උපාදියති. එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති.

මෙසේ තමාගේ හෝ (ආශ්වාස ප්‍රාශ්වාස) කායානුපස්සනාව සිත්හි කරමින් ආනිශංස වශයෙන් සලකාගෙන වාසය කරන්නේය. අනුන්ගේ හෝ (ආශ්වාස ප්‍රාශ්වාස) කයෙහි කායගතාසති කම්ස්ථානය මෙනෙහි කරමින් වාසයකරන්නේය.

කියන ලද ක්‍රමයෙන් ආධ්‍යාත්මිකවූ හෝ බාහ්‍යවූ හෝ (ආශ්වාස ප්‍රාශ්වාස) කයෙහි කායගතාසති භාවනාව මෙනෙහි කරමින් අප්‍රමාදව වාසය කරන්නේය. යම්සේ කම්මාරයින්ගේ කඹුරු සමය-නලය- ඊට කරන ව්‍යායාමය, යන කාරණා නිසා, වාතය ඔබිනොබ යම්සේ හැසිරේද එපරිද්දෙන් මේ භාවනාවෙහි යෙදුණු යොගාවචර භික්ෂුනුගේ ශරීරයද කායපුවයද චිත්තයද නිසා ආශ්වාස ප්‍රාශ්වාසයන්ගේ උත්පත්ති ධර්මයන් දක්නේ හෝ කය සිහිකරමින් වාසයකරන්නේය. යථොක්තක්‍රමයෙන් ඔවුන්ගේ විනාස ස්වභාව දක්නේ හෝ කය සිහිකරමින් වාසයකරන්නේය. කාලෙක උත්පත්තිය කාලෙක විනාසය දක්නේ හෝ ආශ්වාස

ප්‍රශ්වාස කායයාගේ ඉපදීම නැසීම සිහිකරමින් වාසයකරන්නේය ආශ්වාස ප්‍රාශ්වාසාදිගස කය ඇත්තේය සත්ව පුලාදි කිසිවෙක් නැත්තේය කියා සිහිය පිහිටුවන ලද්දේය.

යම්සිහියක් එසේ මනාකොට පිහිටුවන ලද්දේද ඒ සිහිය මතු මත්තෙහි ඥානයාගේ වෘද්ධිය පිණිසද සමෘතියයි කියනලද සිහියගේ වැඩීම පිණිසද තෘෂ්ණා දෘෂ්ටි යන මේ නිශ්‍රයන් දෙදෙනාගේ වසඟයෙන් දුරුව අනිශ්‍රිතවූ වසන්නේය; හෙවත් තෘෂ්ණා දෘෂ්ටි යන අකුශලයන් දෙදෙනාගෙන් දුරුව වාසයකරන්නේය. එහෙයින් සත්වලොකයෙහි කිසි රූපාදියක් ආත්මාදි වශයෙන් වර දවා ගැන්මක් නොකරන්නේය.

මහණෙනි! මෙසේද ආශ්වාස ප්‍රශ්වාස කයෙහි කායගතාසති භාවනා සිහිකරමින් වාසයකරන්නේය.

### ආනාපාන සති ඛාණ්ඩයයි.

මෙසේ ආනාපානසති පර්වය ඊර්‍යාපථපර්වය චතුසම්පජන්‍යපර්වය පටික්කූලමනසිකාර පර්වය, ධාතුමනසිකාර පර්වය, නවසීවථික පර්වයෝය, යන මේ තුදුස් පර්වයන්ගේ වශයෙන් කායගතාසති කර්මස්ථානය දක්වන ලද්දේය.

ඔවුන් අතුරෙහි යම්හෙයකින් ඊර්‍යාපථ පර්වය, චතුසම්පජන්‍ය පර්වය, ධාතුමනසිකාර පර්වය, යන මේ තුන්පර්වයෝ විදර්ශනා වශයෙන් කියන ලද්දාහුය. නවසීවථික පර්වයෝ විදර්ශනා ඥානයෙහිම ආදීනවානුපස්සනා වශයෙන් කියනලද්දාහුය. (මෙහි උද්ධුමාතකාදීන් විෂයෙහි යම් සමාධි භාවනාවක් සම්බන්ධ වන්නේද- ඕතොමෝ අසුභ නිර්දෙශයෙහි ප්‍රකාශකරන ලද්දීමය.

ආනාපාන පර්වයද පටික්කූලමනසිකාරපර්වයද යන මේ පර්වය සමාධි වශයෙන් කියන ලද්දාහුය. ඔවුන් අතුරෙහි ආනාපාන සති වශයෙන් වෙනම කර්මස්ථානයක් වේමැයි: මෙසේ කායානුපස්සනා සතිපට්ඨානය සැකෙවින් මෙහි දක්වනලද්දේය. ආනාපානසති කර්මස්ථානයට කියනලද පරිද්දෙන් අනික් තෙළෙස් පර්වයන්ගේ විස්තර කියනලද ක්‍රමානුසාරයෙන් දතයුතුයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ මහණෙනි! මාගේ ශාසනය මෙසේ නෛර්‍යාණිකයයි දක්වා වදාරා එක්විසි තැනෙක්හි රහත්ඵලය කුළුනැන්වීමෙන් දෙශනා කරනලද දෙශනාව පාමා දෙමින්- "ඒකායනො අයං භික්ඛවෙ මග්ගො -පෙ- ඉති,: මෙසේ යමක් වදාරන ලද්දේද? එය මේ සඳහා වදාරන ලද්දේය.

---

මෙසේ කායානුපස්සනා සතිපට්ඨානය සැකවින් දතයුතුය.

සාධු ! සාධු !! සාධු !!!

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

මොරටුමුල්ලේ සිරි සුධර්මාරාමාධිපති මොරටුවේ සිරි සාසනවංස
මහාස්ථවිරයන් වහන්සේ විසින් මහගාලේ පුෂ්පාරාම
යෙහිදී ශ්‍රී බුද්ධවර්ෂ 2492 ක්වූ උඳුවප් මස පුර
නවවක් දින පවත්වන ලද
ධර්මදෙශනාව.

## 2. වෙදනානුපස්සනා සතිපට්ඨානය.

කථංච භික්ඛු අජ්ඣත්තං වෙදනාසු වෙදනානු පස්සී විහරති? ඉධ භික්ඛු සුඛං වෙදනං වෙදියමානො සුඛං වෙදනං වෙදියාමීති පජානාති, දුක්ඛං වෙදනං වෙදිය මානො දුක්ඛං වෙදනං වෙදියාමීති පජානාති, අදුක්ඛ මසුඛං වෙදනං වෙදිය මානො අදුක්ඛ මසුඛං වෙදනං වෙදියාමීති පජානාති= සාමිසං වා සුඛං වෙදනං වෙදිය මානො සාමිසං සුඛං වෙදනං වෙදියාමීති පජානාති, නිරාමිසං වා සුඛං වෙදනං වෙදිය මානො නිරාමිසං සුඛං වෙදනං වෙදියාමීති පජානාති, සාමිසං වා දුක්ඛං වෙදනං වෙදිය මානො සාමිසං දුක්ඛං වෙදනං වෙදියාමීති පජානාති නිරාමිසං වා දුක්ඛං වෙදනං වෙදියමානො නිරාමිසං දුක්ඛං වෙදනං වෙදයාමීති පජානාති,= සාමිසං වා අදුක්ඛ මසුඛං වෙදනං වෙදිය මානො සාමිසං අදුක්ඛ මසුඛං වෙදනං වෙදයාමීති පජානාති, නිරාමිසං වා අදුක්ඛ මසුඛං වෙදනං වෙදියමානො නිරාමිසං අදුක්ඛ මසුඛං වෙදනං වෙදියාමීති පජානාති= සොතං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරොති ස්වාවත්ථිතං වවත්ථපෙති- සොතං නිමිත්තං ආසෙවිත්වා භාවෙත්වා බහුලීකරිත්වා ස්වාවත්ථිතං වවත්ථපෙත්වා බහිද්ධා වෙදනාසු චිත්තං උපසංහරති, කථංච භික්ඛු =පෙ= අජ්ඣත්ත බහිද්ධා වෙදනාසු චිත්තං උපසංහරති, කථංච=පෙ= එවං භික්ඛු අජ්ඣත්ත බහිද්ධා වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං ති.

**පින්වතුනි,**

සිරි අරියවංස ගුණානුස්මරණය ඇරඹූ සත්පුරුෂ මහතුන් විසින් මහයාලේ පුෂ්පාරාමයෙහිදී දෙවෙනි අවුරුද්දේ උත්සවය පවත්ගෙණ බොධිපාක්ෂික ධර්ම ශතිසේ ප්‍රථම ධර්ම දෙළස දෙශනා කරවා එලෙසම පුස්තකගත කිරීමේ ආශාවෙන් අප වෙතද දෙවෙනි වේදනානුපස්සනා සතිපට්ඨානය දෙශනා කිරීමට ආරාධනා කර තිබේ. එය යථාශක්තියෙන් විසඳා දෙනු පිණිස විභඞ්ගප්‍රකරණගත වේදනානුපස්සනා සතිපට්ඨානය, විසඳීමට සැසඳෙන ධර්මපර්යායයන් අතරෙන් කොටසක් ප්‍රථමකොට මාතෘකා වශයෙන් තැබිමූ බොධිපාක්ෂික ධර්මසමුදාය පුස්තකගත කිරීමට සිතූ මෙම සත්සමාගම සත්බොධ්‍යාඞ්ග දහම ප්‍රථම වර්ෂයේ පැවැත්වූ උත්සවයේදී සකස් කරවා වටිනා ධර්මපුස්තකයක් කොට විසුරුවා හැර තිබේ එය බොහෝ උතුමන් විසින් එයි ඇති ප්‍රයොජන සමිතියට දන්වා එවා තිබෙන බැවින් එබඳු සතුටුවූ සිරි අරියවංස ගුණානුස්මරණ මහා සභාව උනන්දුවෙන් හා ශ්‍රද්ධාවෙන් මේ දෙවෙනි වාර්ෂික උත්සවයේදීද සතර සතිපට්ඨානය, සතර සම්‍යක්ප්‍රධානය සතර ඉර්ධිපාදය යන ධර්ම දෙළස පුස්තකගත කිරීමට අදහස්කර තිබේ. එම උසස් අදහසද බාහිර උවදුරුවලින්වැලකී සඵල වීමට පැමිණෙත්වායි අපි ආසංසනය කරමූ.

මෙම ධර්ම සත්සම මෙලෙසින් සකස්කිරීමේ භාරය අපවෙත පැවරී තිබේ. එබැවින් සමිතියට ඉතා කෙටි අවවාදයක් කරමූ. පොත් සතරකින් අවසන් වන මෙම සත්ක්‍රියාව පිළිබඳව කොතෙක් බාහිර උපද්‍රව ඇතිවුවද ඊට වහල්නොවී අවසානයතෙක් නොපසුබැස ක්‍රියාකරණලෙස අවවාද කරමූ. උත්සාහවත් පින්වතුන්ට සසර දුක් මැඩ ලබන නිර්වාණාවබොධයද පහසුවෙන් ලබත හැකිවේ.

**නැණවතුනි,**

බණ ඇසීම්ද, බණපොත් කැලීම්ද, බණ කථාකිරීමත් අද බොහෝ දෙනෙකුට නොරුස්නා ක්‍රියාවක් බවට පෙරලී තිබේ. එය එසේ වීම ස්ථිර සැපතක් බලාපොරොත්තු නොවන අඥ බාලයන්ගේ අවාසනාවකි. ඒ ඒ අය නුරුස්නා ධර්ම බුදුරදුන් දෙශනාකර තිබේ. එනම්:- තුණුරුවන් කෙරෙහි විස්වාසයක් නැති තැනැත්තාට තුණුරුවන්ගේ ගුණකියා ශ්‍රද්ධාසම්පත්තියේ පිහිටුවන්ට උත්සාහ කිරීම ඔහුට විෂ සහිත කථාවකි. සතුන් මැරීම සොරකම් කිරීම් ආදි පාප සඛනාවය පුරුදුකරණ අයවළුන්ට

සිල්සමාදන්වීමේ අනුසස් කීමෙන් එහි පිහිටුවන්ට වෑයම්කිරීම මහත් විෂ සහිත කථාවකි. කිසිදැනීමක් නැති සාමාන්‍ය අයෙකුට බොහෝ ඇසූ පිරූ තැන් ඇති පණ්ඩිතයන්ගේ ගැඹුරු හරසර කථා නොවැටහෙන බැවින් විෂම කථාවකි, (අද ධර්මයන් අතරද ගැඹුරු කථාවන් ඇසීමට මැලිව සිටින්නේ තමතමන්ගේ නොදැනීමේ, නොවැටහීමේ උත්සාහවත් නොවීමේ වරද බව මෙහිදී තේරුන්ගත යුතුයි. එසේ තේරුන්ගත් විට තමන් නුවනම්ද අඥ බාලයන්ගේ සඞ්ඛ්‍යාවට නොවැටී නුවනින් යෙදී බොහෝ ඇසූ පිරූ තැන් ඇතිව විසීමට හැකිවෙනවා ඇත) මසුරු අයට ත්‍යාග කථාව නපුරු ඇසීමකි. මසුරා දීමට විරුඩ බැවිනි. මෝඩයින්ට පණ්ඩිත වදන් නපුරු ඇසීමකි නොවැටහෙන නොතේරෙන බැවිනි. මේ කථා ඒ ඒ අයට විෂ සහිත බැවින් කථා ඒ ඒ ඇසෙන කොට ශරීරයද දඟදමවා කිපී ක්‍රොධ සහගතව බලමින් රොස් පරොස් බස් කියමින් අමනාපය අසන්තෝෂයම පහළ කරත් මන්ද ඒ ඒ අයට ඒ ඒ කථා පිළිබඳව කිසිද විශ්වාසයක් හෝ ඒ ඒ කථාවල වටිනාකමක් හෝ ප්‍රීතියක් හෝ නූපදින නිසයි මේ පස් ආකාර විරුඩ අයගැන සලකා තමන් සැදැහැතියන්වීමෙන්ද සිල්වතුන් වීමෙන්ද බොහෝ බණ දහම් අසා දැනීම දියුණුකර ගැනීමෙන්ද මසුරු කමින් දුරුවීමෙන්ද නුවනැතියන් වීමෙන්ද උසස් ජීවිතයක් ගතකිරීමට උත්සාහවත් වනලෙස මතක්කරමු.

මෙතැන් සිට වෙදනානුපස්සනා සතිපට්ඨානය හැකි තරම් ලිහිල් අඳමින් විසඳීමට අදහස් කරමු.

කථඤ්ච භික්ඛු අජ්ඣත්ත° වෙදනාසු වෙදනානුපස්සී විහරති? භික්ෂුව (යම්කිසි යොගාවචරයෙක්) තමන් තුල පවතින (නව ආකාර) වේදනාවන්හී එම වේදනා අනුව බලමින් වාසය කරන්නේ කෙසේද? බුදුපියාණන් වහන්සේම වෙදනානුපස්සනාව පිළිබඳ මෙසේ ප්‍රශ්නයක් අසා උත්තරත්සේම විසඳීම සඳහා ඉධ භික්ඛු සුඛං වෙදනං -පෙ- යනාදිය දෙශනා කළසේක. එය වෙන්වසයෙන් දෙශනාකළ අයුරු මෙසේ දතයුතුයි.

I, සුඛං වෙදනං වෙදියමානො සුඛං වෙදනං වෙදියාමීති පජානාති.

සැපවේදනාවක් විඳින කල්හී මේ මම විඳින්නේ සැපවේදනාවකැයි දැනගණිද.

2. දුක්ඛං වේදනං වේදියමානො දුක්ඛං වේදනං වේදියාමීති පජානාති,

දුක් වේදනාවක් විඳින කල්හි මේ මම විඳින්නේ දුක්වේදනාවකැයි දූතගණීද;

3. අදුක්ඛ මසුඛං වේදනං වේදියමානො අදුක්ඛ මසුඛං වේදනං වේදියාමීති පජානාති.

සැපදුක් දෙකින් වෙන්වූ මැදහත් වේදනාවක් විඳිනකල්හි මම මේ විඳින්නේ දුක් සැප දෙකින් වෙන්වූ මැදහත් වේදනාවකැයි දූතගණීද;

4. සාමිසං වා සුඛං වේදනං වේදියමානො සාමිසං සුඛං වේදනං වේදියාමීති පජානාති,

සාමිස සැප වේදනාවක් හෝ විඳින කල්හි මේ මම විඳින්නේ සාමිස සැප වේදනාවකැයි දූතගණීද- මෙහි සාමිස, යන පදයෙන් උගන්වන්නේ, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පස්වැදෑරුම් කාම සම්පත් විඳින කල්හි ඇතිවන වේදනා වන්වයි.

5. නිරාමිසංවා සුඛං වේදනං වේදියමානො නිරාමිසං සුඛං වේදනං වේදියාමීති පජානාති,

නිරාමිස සැප වේදනාවක් හෝ විඳිනු ලබන කල්හි මේ මම විඳින්නේ නිරාමිස සැප වේදනාවකැයි දූතගණීද;

6. සාමිසං වා දුක්ඛං වේදනං වේදියමානො සාමිසං දුක්ඛං වේදනං වේදියාමීති පජානාති,

පස්කම් සැප මුල්කරගෙණ ඇතිවන යම් දුක් වේදනාවක් හෝ විඳින කල්හි මම මේ විඳින්නේ පස්කම් සැප මුල්කරගෙණ උපන් දුක් වේදනාවකැයි දූතගණීද,

7. නිරාමිසං වා දුක්ඛං වේදනං වේදියමානො නිරාමිසං දුක්ඛං වේදනං වේදියාමීති පජානාති,

පස්කම් සැපතින් වෙන්ව ඇතිවන යම් දුක් වේදනාවක් හෝ විඳින කල්හි මම මේ විඳින්නේ පස්කම් සැපතින් වෙන්වූ දුක් වේදනාවකැයි දූතගණීද,

8. සාමිසං වා අදුක්ඛ මසුඛං වේදනං වේදියමානො සාමිසං අදුක්ඛ මසුඛං වේදනං වේදියාමීති පජානාති,

සාමිස දුකින් හෝ සැපින් තුරන්වූ මැදහත් වේදනාවක් විඳිනු ලබන කල්හි මම මේ විඳින්නේ සාමිස දුකත් නොවේය. සැපත් නොවේය මැදහත් වේදනාවකැයි දැනගණීද,

9. නිරාමිසංවා අදුක්ඛ මසුඛං වේදනං වෙදියමානො නිරාමිසං අදුක්ඛ මසුඛං වේදනං වෙදියාමීති පජානාති;
නිරාමිස දුකින් හෝ සැපින් තුරන්වූ මැදහත් වේදනාවක් විඳිනු ලබන කල්හි මම මේ විඳින්නේ නිරාමිස දුකත් නොවේය සැපත් නොවේය මැදහත් වේදනාවකැයි දැනගණීද;
යන නව ආකාරය තේරුන් ගෙණ

මෙම නව වැදෑරුම් වේදනාවන් නුවන යොදා අනුව බලමින් එකී එකී වේදනාවන් ඒ ඒ අවස්ථාවලදී අනිත්‍යාදි වශයෙන් සේවනය කරයිද, වඩයිද බහුලව වඩයිද, සිත්හිලා ස්ථිරසේ තබා ගණීද; හෙතෙම එම වේදනාව සෙවනය කොට වඩා බහුලව වඩා සිත්හීලා ස්ථිරසේ නොනැසෙනසේ තබා, ඊට පසුව අන් සතු අන්‍යයන් තුල පවත්නා නාවවැදෑරුම් වේදනාවන් පිළිබඳව සිත එලවා බලන්ද කෙසේද? (මෙරමා තුල) අන්‍යයන් තුල මෙබදු වෙලාවේදී උපදින්නේ සැපවේදනාවෙක. මෙවෙලෙහි දුක් වෙදනාවෙක– මෙවෙලෙහි මැදහත් වේදනාවෙක, මේ අවස්ථාවේ සාමිස සැපවේදනාවෙක, නිරාමිස සැපවේදනාවෙක, මෙවෙලෙහි සාමිස දුක්වේදනාවෙක, නිරාමිස දුක්වේදනාවෙක, මෙතැනදී උපදින්නේ, සාමිස මැදහත් වේදනාවෙක, නිරාමිස මැදහත් වේදනාවෙකැයි අන්‍යයන් පිළිබඳව උපදින නවවැදෑරුම් වේදනාවන් පිරිසිදුව දැන පසුව, තමන් හා අනුන් තුලත් උපදින සැපවේදනා ආදි නවවැදෑරුම් වේදනාවන් පිළිවෙළින් සිතා එකී සත් විසි ආකාර වේදනාවන් අනුව බලමින් කෙලෙසුන් මඩින වීර්‍ය්‍යයෙන් යුක්තවූයේ යහපත් නුවනින් දකිමින් සිහියෙන් යුක්තව පඤ්චස්කන්ධ නමැති ලොකයෙහි හටගන්නා අභිධ්‍යා ව්‍යාපාද ආදී නීවරණ ධර්‍මයන් හික්මවා වාසයකරයි යනුයි.

මෙහිදී වෙදනාවය කීවාම කාටත් එය පහසුවෙන් අවබෝධ වේ. තමන් තුලය, අනුන් තුලය තමා හා අනුන් තුලයයි කියා වේදනාව උපදින ස්ථාන පිළිබඳවද පහසුවෙන් තේරුන් ගත හැකි වේ. මෙහිදී පිරිසිදුව තේරුන් නොගත හැකි වචනයක් තිබේ එනම්–

**අනුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං,** මේ වචන සය පහසුවෙන් තේරුම් ගත නොහැකිය. එබැවින් එතක්පාඨ පහසුවෙන් තේරුම් ගැණීමට විසඳමු.

මෙම වචනයේ තේරුම, වේදනාව අනුව බැලීම, නුවන මෙහෙයා බැලීම නුවන මෙහෙසා දනගැණීම, නො අනුපස්සී වරදින ලෙස දනගැණීම, ධර්මානුකූලව සොයාබලා තේරුම් ගැණීම, වෙසෙසා කියතොත් සියලු මිථ්‍යා දෘෂ්ටීම් වලින් වෙන්ව සම්‍යක්දෘෂ්ටියෙන් යුක්තවීම, අනුපස්සනා යයි කියත්, ඒ මේ අනුපස්සනාවෙන් යම් යොගාවචරයෙක් යුක්තද හෙතෙම එහි සෙදී ව්‍යාසය කරයිද? තමා සිත තුලින් උපදවා බලයිද? සැම ආකාරයෙන්ම පුරුදු පුහුණු කර ගණීද; එනිසා ඔහුට අනුපස්සීයයි කියනු ලැබේ. මෙකියන අනුපස්සනාව වැඩීම් වශයෙන් සත් ආකාර වෙත්. එනම්! අනිච්චානුපස්සනා දුක්ඛානුපස්සනා, අනත්තානුපස්සනා, නිබ්බිදානුපස්සනා, විරාගානුපස්සනා, නිරොධානුපස්සනා, පටිනිස්සග්ගානුපස්සනා යනුයි. මෙම සත් ආකාරය වඩනා ආකාරය=

1. **අනිච්චතො අනුපස්සති, නො නිච්චතො, සොතං අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති=** යම යොගියෙක් වේදනාව ගෙණ වේදනාව අරමුණුකර මේ වේදනාව නිත්‍යවූ විදීමක් නොවේ. මෙහි නිත්‍ය වශයෙන් පැවැත්වීය යුත්තක් නැත. මේ වේදනාව අනිත්‍යමය. හෙතෙම එම වේදනාව මෙලෙසින් අනිත්‍ය වශයෙන් සිහිකරණ කල්හී ඔහුගේ සිත තුල පැවැතුන නිත්‍ය යන සංඥව අතහරියි. අනිත්‍ය බව සත්‍යලෙස සිතෙහි පදිංචි වෙයි.

2. **දුක්ඛතො අනුපස්සති නො සුඛතො! දුක්ඛතො අනුපස්සන්තො සුඛසඤ්ඤං පජහති.** යමෙක් වෙදනාව සැපවශයෙන් නොගෙන එය ඒකාන්තයෙන් දුකයයි වේදනාවම අනුව බලයිද එසේ නුවනින් යුක්තව දුක් වශයෙන් බලන්නහුට වේදනාවේ සැපය යන හැඟීම් දුරුවෙයි.

3. **අනත්තතො අනුපස්සති ;නො අත්තතො අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති;**

යම් වේදකයෙක් විඳිම ආත්මයක්යයි නොගෙන විඳින්නෙක් නැත. වේදනාවම, වේදනාව උපදවා විඳී: එනිසා වේදනාව අනාත්මය. මෙසේ අනාත්ම වශයෙන් ගන්නාහු ආත්මය යන හැඟීම අතහරී.

4. නිබ්බින්දතිනො නන්දති! නිබ්බින්දන්තො නන්දිං පජහති- යම් කෙනෙක් වේදනාව පිළිබඳව සන්තොෂය දුරලා කල කිරේද? එය අනුව බලා කල කිරීමේ හේතුවෙන් සන්තුෂ්ටිය අතහරී.

5. විරජ්ජති නො රජ්ජති! විරජ්ජන්තො රාගං පජහති-
යම් යෝගියෙක් වේදනාව කෙරෙහි ඇලීම අතහරියි, නො ඇලෙයි. එම නො ඇලීම නිසා; රාගය අතහරී.

6. නිරොධෙති නො සමුදෙති! නිරොධෙන්තො සමුදයං පජහති- යමෙක් වේදනාව බිහිනොකරවයිද රැස්කිරීම වලක්වයිද වේදනාව නිරුද්ධ කරයිද, විනාශ කරයිද; එසේ නිරුද්ධ කිරීම නිසා හටගැන්ම අතහරී.

7. පටිනිස්සජ්ජතිනො ආදියති! පටිනිස්සජ්ජන්තො ආදානං පජහති- යමෙක් වේදනාව නොගනීද, දුරින්ම දුරලාද එසේ වේදනාව දුරින්ම දුරලාද! එසේ වේදනාව දුරින්ම දුරලීම නිසා, ගැනීම අතහරී. මෙකී සත් අයුරින් අනුපස්සනාව වැඩීමට පුරුදු කර ගත යුතුයි.

**විහරති.** පවත්වයි, පාලනය කරයි, හැසිරෙයි, වාසය කරයි, යනාදීයෙන් විහරතියි කියන ලදී. මෙම විහරණයද ආකාර තුනකි. තමන්තුල උපන් නවාකාර වේදනාවන් පැවැත්ම වාසය, පාලනය අනුන්තුල උපන් වේදනාවන් පාලනය විහරණය, පැවැත්ම, තමන් හා අනුන්තුල උපන් වේදනාවන් පාලනය, විහරණය, පැවැත්ම ය, යනුවෙනි- මෙකියන ක්‍රමතුනම හෝ එකක් ගෙන භාවනා කරණ තැනැත්තා ඉඳිමින් අනිත්‍යාදි වශයෙන් වඩනාතර, එම ඉඳිම වෙනස්කොට සිටිමින්ද එම භාවනාව නොපිරිහෙලා වඩයිද, එසේම සිටීම වෙනස්කර යනාකල්හිද එය වෙනස්කොට එනකල්හිද. මෙසේ සතර ඉරියව් එකින් එක වෙනස් කරමින් භාවනාව නොබිඳ වඩයිද, අනිත්‍යාදී ලක්ෂණ මෙනෙහි කරයිද, එය විහරති, යන්නෙන් තේරුන්කරදෙයි.

**ආතාපී** මෙහි ආතාප යන්නෙන් චෛතසික වීර්‍ය්‍යාරම්භය දක්වයි. එනම් මැලිකම්ව හිත සිතිවිලි මැඬලන වීර්‍ය්‍ය චෛතසිකය

දක්වත්. සම්‍යක්ව්‍යායාමයයි සිදුවේ එම ආතප්‍යෙන් මැලිකම් වඩන චෛතසික මැඩ, තවා, සුණුකර නැඟීසිටි වීර්‍ය්‍ය චෛතසික (සිත් වීලි) වලින් යුක්තද, එහි මෝහවට යෙදී පවතීද, භාත්පසින් ලීනත්වය මඩීද එබඳු තැනැත්තා ආතාපී නම් වේ. මෙය ප්‍රභේද, වශයෙන් කොටස් වශයෙන් වෙන්කර නැතද යොගාවචරයා විසින් නුවණින් දැන නා නා අයුරින් සිතිතාව වීර්‍ය්‍ය දියුණුකර ගතයුතුයි· වේදනාව සත්වයෙකුත් නොවේ. ජීවිතයකුත් නොවේ: යම් යම් වස්තු එල්ලකරගෙන උපදින එම වේදනාවන් නොයෙකුත් කෙලෙසුන් කිහිකිරීමට, එක්කිරීමට, හිතකාරී ධර්මයෙත්. එබැවින් එම වේදනා මූල්කරගෙන උපදින යම් පමණ කෙලෙසුන් ඇත්නම් ඒ සියල්ල තැවීම, මැඩීම, වැනසීම; සුදුසුමය එබඳු වේදනා සන්තාපය කලයුත්තේ ආතාපී නමින් හඳුන්වන කෙලෙස් තවන වීර්‍ය්‍ය චෛතසිකවලිනි. එසේ සිතා එම වීර්‍ය්‍යයෙන් යුක්ත තැනැත්තා ආතාපී නම් වේ. මෙසේ නොයෙක් ආකාරයෙන් සිතා වීර්‍ය්‍ය වඩා කෙලෙස් රුපුන් මැඩීමට උත්සාහවත් විය යුතුයි.

**සම්පජානො.** සම්පජඤ්ඤ යන්නෙන් ප්‍රඥාව විසිතුරු දැනීම, මෝහනොවන බව ධර්මවිචය සම්‍යක්දෘෂ්ටිය දක්වයි එම සම්පජඤ්ඤයෙන් යුක්තද ප්‍රයුක්තද, සම්ප්‍රයුක්තද ඔහු සම්පජානො යනු වෙයි. මෙහිද ප්‍රභේද නොපෙනේ. සුඛ දුඃඛාදී වෙදනා සත්විස්ස නානා ක්‍රමවලින් ගෙණ බලා දැන අනිත්‍යාදී අනුපස්සනා ධර්මයන් නුවනින් මෙනෙහි කරන්නහුට සමපජානොයයි කියනු ලැබේ.

**සතිමා** මෙහි සති යන්නෙන් සිහිය, සිහිකිරිම, සම්‍යක් සතිය කියත් එම සිහියෙන් යුක්තද සම්ප්‍රයුක්තද, එම යොගාවචරය සතිමා නම් වේ. සත්වජීව ආදී වශයෙන් නොතකා සැප දුක් උපෙක්ෂා ආදී වෙදනා සවභාවත් අනිත්‍යාදී වශයෙන් බලන සිහි ඇත්තහු සතිමා නම් වේ. සම්‍යක්සතිය ඇති තැනැත්තාය යනුයි. සැම යොගියෝම සිහිය තිබෘම සිහියෙහි යෙදීම, වේදනාවන් පරීක්ෂාකර බලාද, සිහිය නැතිව අනුපස්සනාවක් නම් නැද්ද! එනිසා සතිය අනුපස්සනාව සම්පූර්ණකරන සනස්තරණ ආරක්ෂාකරණ ධර්මයක් බව තේරුම්ගත යුතුයි. සිහිය සැම අවස්ථාවන්හිදීම යෙදෙන බව සතිංචඛ්වාහං සබ්බත්ථිකං වදාමි යි, බුදුපියාණන් වහන්සේ වදාළසේක. එබැවින් සිහිය සතිස් බෝධිපාක්ෂික ධර්ම සමුදාය කෙරෙහිම බලපවත්වන ධර්මයකි. එබැවින් අසරින් මිදෙන, මිදුන සැම යෝගියෙකුටම යොගක්ෂමප්‍රාප් යෙකුටම සිහිය අතලඬකට තිබිය යුතුයි,

මේ වචන සතරද එකක් පාසා තේරුම්ගත යුතුයි. මෙහි

**විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං**

විනෙය්‍ය යන්නෙන්, තදඞ්ග වශයෙන් හෝ විෂ්කම්භන වශයෙන් සිත හික්මවීම් දක්වත්. ලොක යන්නෙන්, තමන්ගේ හෝ අනුන්ගේ හෝ තමන් හා අන්‍යයන් සතුවූ හෝ ශරීරය පඤ්චස්කන්ධය දක්වත්. අභිජ්ඣා යන්නෙන් දලලොභයත් දොමනස්ස යන්නෙන්; සිතෙහි දුෂ්‍යභාවයත් (දොම්නසත්) දක්වත්. එතකොට ඉන් උගන්වන්නේ, පඤ්චස්කන්ධ නමැති ලොකය තුල ඇතිවන දලලොභයත්, දොම්නසත්, හික්මවියයුතු බවයි මේය මදක් විස්තර වශයෙන් මෙසේ සැලකිය යුතුයි. සත්විසි ආකාරයකින් පෙන්වූ වෙදනාවන් වැනසීමට යෙදිය යුතු සම්ප්‍රයෝග අඞ්ග, අනුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා යන පද වලින් දක්වා ඊට අනතුරුව, එම වේදනාවන් ප්‍රහානයට වැනසීමට හෙතුවන අඞ්ග දක්වනු පිණිස විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං යන පද කීහ. ශේ මෙසේයි; අභිජ්ඣා යන පදයෙන් කාමච්ඡන්ද (කාමයන්හි ඇලීම) නීවරණයද දොමනස්ස යන පදයෙන් ව්‍යාපාද නීවරණයද ගතයුතුබව උගන්වා තිබේ. නීවාරණය ආවරණය කරණ අර්ථයෙන් නීවරණයයයි නම් ලත් නීවරණයන් අතර ප්‍රධාන නීවරණ දෙක දැක්වූ බැවින් අනිකුත් සක්කාය දෘෂ්ටි ආදී නීවරණ සියල්ලම ගත යුතුයි. මෙසේ හෙණ මේ අභිධ්‍යාව නමැති ලොභයත් දොම්නස නමැති සිතෙහි කොසන්සුන බවත් හික්මවීමෙන් පඤ්චස්කන්ධ නමැති ලොකය සන්සුන්කොට එය අනිත්‍යාදී වශයෙන් මෙනෙහි කිරීමෙන් සියලු කෙලෙසුන්ගේ ප්‍රහානය සිදුවන බව සිදුකට හැකිබව අවබොධකර ගැනීමට විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං යි; කියන ලදී.

මෙලෙසින් අභිධ්‍යාවත් දොම්නසත් අවබොධකරගත් සසර බිය දුටු යොගාවචරයා කම්මටහන්ගෙන බවන්නේ, මේ කමටහනට විෂමලොභයෙන් ඇතිවන වැරදිය, මේ කමටහනට දොම්නසින් ඇතිවන වැරදිය, මේ ධර්ම කැමතිවිය යුතුය, ආශ්‍රයකල යුතුය, පිළිපැදිය යුතුය, වැඩිය යුතුය. මේ ධර්ම කැමති නොවිය යුතුය ආශ්‍රය නොකල යුතුය. නොපිළිපැදිය යුතුය, නොවැඩිය යුතුය, යනාදීය මෙනෙහිකොට නො පෙණෙන නොවැටහෙන ධර්ම අවබෝධකර ගැන්මෙන්ද, දකීමින්ද, පෙනෙන වැටහෙන සබහාවන් දුරලෑමෙන්ද භාවනාවන්හි යෙදී යොගයන්ගේ සම්ඵයට සංසිඳුවීමට උත්සාහවත් විය යුතුයි.

නැවතද- අනුපස්සී-යනුවෙන් අනුදැනීම, අනුව බැලීම, නම්වූ කම්ස්ථානය දක්වයි.

විහරති- යනුවෙන් සතර ඉරියව්වල සංවරය දක්වයි
ආතාපී- යනුවෙන් සතර සම්‍යක්ප්‍රධාන වීර්‍යය දක්වයි
සතී- සම්පජානෝ= යන දෙකින් සැමතැන්හි වැඩියයුතු සබ්බත්ථික කම්ස්ථානයන් කියයි කමටහන පරිහරණය කිරීමේ උපාය හෝ කියයි. තවද සති යන්නෙන් සමථයද (සංසිඳීමද) සම්පජඤ්ඤයන්නෙන් විදර්ශනාවද (විශෙෂදර්ශනය) කියයි.

අභිජ්ඣා දෝමනස්ස යන දෙපදයේ විනයෙන් හෙවත් හික්මීමෙන් භාවනාවගේ ප්‍රයෝජනය කියයි. මෙලෙසින් වේදනාව පිළිබඳව වෙදනානුපස්සනා සතිපට්ඨානයෙහි අර්ථාවබොධය කර ගතයුතුයි. මෙහි දුරවබොධස්ථාන ධර්මධරයන් වෙතින් දැනගතයුතුයි. මෙහි සබ්බත්ථික කම්ස්ථාන නම්, කවරේද?

බුද්ධානුස්මෘති භාවනාව මෛත්‍රී භාවනාව
මරණානුස්මෘති භාවනාව අසුභානුස්මෘති භාවනාව

යන සතරයි. මෙම භාවනා සතරට සබ්බත්ථික කම්ස්ථානය යි කියන්නේ මන්ද? යෝගාවචරයන් විසින් සිත්තුවණින් යෙදී සිතිනුවණ නිසාම පරිහරණය කරනු ලබන කම්ස්ථාන සතර නිසාද සිතියක් පිරිසිදු දැනීමක් ඇති යොගාවචරයාගේ සිතට විරුද්ධව පැනනගින ලොභාදී අකුශල ධර්මයන් විසින් අවහිර නොකළ හැකි භාවනා සතරක් බැවින්ද වෙයි.

කථංච වෙදනා අනුපස්සිතබ්බානි සුඛාහාව වෙදනා දුක්ඛතො දුක්ඛා සල්ලතො අදුක්ඛමසුඛා අනිච්චතො, වේදනාව අනුව බලන්නේ කෙසේද? සැපවේදනාව, දුක්වශයෙන්ද දුක් වේදනාව සල්ලවශයෙන්ද හෙවත් (සිතින් තියුණු හුල්වලින් අනිත්‍යඅවස්ථාවන්හි දැනෙන බලවත් දුකක් හැටියටද,) දුක් සැප දෙකින් වෙන්වූ මැදහත් වේදනාව, අනිත්‍ය වශයෙන්ද බැලීම අනුපස්සනා නම්.

එනිසා කියනලදී-

යො සුඛං දුක්ඛතො අද්ද දුක්ඛමද්දක්ඛි සල්ලතො
අදුක්ඛමසුඛං සන්තං අද්දක්ඛිං නං අනිච්චතො
සවෙසම්මද්දසො භික්ඛු උපසන්තො චරිස්සති ති.

මෙහි අදහස- යමෙක් සැප වේදනාව දුක් වශයෙන් දකීද දුක්වේදනාව දුඃඛදුක් වශයෙන් දකීද? දුක්සැප දෙකින් වෙන්වූ, මැදහත් වේදනාව අනිත්‍ය වශයෙන් දකීද එම දැකීම බුද්ධාදී උතුමන් ප්‍රසංසා කරණ දැකීමකි. එසේ දකින යෝගාවචරයා සංසිඳෙයි. එසේ සංසිඳී සියලුම කෙලෙස් කණව දුරලා සතුටින් හැසිරෙයි- යනුයි.

නුවනැති තැනැත්තහු කිසිම සැප වේදනාවක් සැපයක් හැටියට නොසලකයි. සැප දුක් උපෙක්ෂා ආදී වේදනා සියල්ල දුක් වේදනා වශයෙන්ම නුවණින් සලකයි ඒ බව; යං කිංචි වෙදයිතං සබ්බං තං දුක්ඛස්මිං ති වදාමි, යනුවෙන් වදාරා තිබේ. යම් කිසි වස්තුවක එල්බගැණීම් ආදී වශයෙන් හෝ යම් දෙයක් අනුභව කිරීම් වශයෙන් හෝ යම්බඳු වේදනා රසක් ඇද්ද ඒ සියලුම වේදනාවන් දුකෙහිම ඇතුලත්ව පවතීයයි බුදුපියාණන් වහන්සේ දේශනාකර තිබේ.

මේ වේදනානුපස්සනාවගේ උද්දෙශ වාරයයි.

මීලඟට නිර්දේශවාරයෙන්ද කරුණු ස්වල්පයක් දක්වමු.

සුඛං වෙදනං වෙදිය මානො- වේදනානුපස්සනාව දේශනා කරනු ලබන සර්වඥයන් වහන්සේ පළමුකොට ආරම්භකළේ- සුඛං වෙදනං, යනාදී පාඨයයි. ඉන් උගන්වා වදාළේ= තමන් සැපවේදනාවක් කයින් හෝ සිතින් විඳින කල්හි මම මේ සැප වේදනා කයින් විඳිනවාය. මේ වේලාවේදී මේ සැප වේදනාව සිතින් විඳිනවාය. කියා දැනගැණීමයි, ඒ දැනගැණීම ළදරුවෙකුගේ දැනගැණීම බඳු නොවේ. ළදරුවෙක් උඩුකුරුව නිදාගෙණ තම ආදරණීය මවගේ තනපුඩුව කටින් ගෙන කිරි උරණ කල්හි ඒ කුඩා බිළිඳුට සැප වේදනාවක් විඳින බවනම් වැටහේ. නමුත් ඔහුට මේ වේදනාව කිරි උරණකොට බොනකොට සැපයයි තේරුණේවී නමුත් මේ සැපය අනිත්‍යය, දුකය, අනාත්මය යි කියා නොවැටහේ. එනිසා එබඳු සැප වේදනාදීන්ගේ විඳීම අනුපස්සනාවක් නොවේ. එබඳු විඳීමක් නිසා සත්ව පුද්ගල වශයෙන් ගත් ආත්ම දෘෂ්ටි ජාලය වැනසීමට මෝරා ගිය සිහිනුවනක් ළදරුවාට පහලකොටන බැරිනි. මෙහිදී උගන්වන්නේ මුහුකුරා ගිය නුවන ඇති සසර බිය දුටු යෝගාවචරයෙක් යම්බඳු සැප වේදනාවක් විඳිනකල්හි මෙම සැප වේදනාව විඳින්නේ කවරෙක්ද? කාගේ අයිතියක් ඇති වේදනාවක්ද කුමක් නිසා විඳීද? යනාදී වශයෙන් සැලකීමකින් විමසීමකින් යුක්ත වේදනාව පිළිබඳව විඳීමයි. එබඳු විඳීමකින් ඇතිවන්නේ තමන් සත්ව පුද්ගල වශ

ශයෙන් නොමගට ගත් ආත්ම දෘෂ්ටිය උදුරාදමා තමන් තුල උපදින ආශාව, ඇදහීම, මමත්වය, අතහැර දැමීමයි, එසේ කිරීමෙන් කම්සථානද නැගෙයි, සතිපට්ඨාන භාවනාවද තහවුරු වෙයි.

මෙහි වේදනාව කවරෙක් විඳීද? කියා සිතන්නහුට වේදනාව විඳීමට සත්වයෙක් හෝ පුද්ගලයෙක් හෝ නැතයයිද වේදනාව කාගේ අයිතියක් උඹ පවතීද? යන්නට! වේදනාවට අයිතිකම් කීමට සමර්ථ සත්ව පුද්ගලාදී කිසිම කෙනෙක් නම් නැතයයිද කුමන කාරණයකින් වේදනාව හටගැනේද? යන්නට යම් වස්තුවක් අරමුණුකරගෙන වේදනාව ඇතිවේයයිද එනිසා ඒ ඒ සැපදුක් උපෙක්ෂා ආදී වේදනාවන්ම වස්තුකොටගෙන වේදනාවම විඳියි. එම විඳීම ව්‍යවහාරය කටයුතු බැවින් (වේදනාවය විඳිනවාය විඳ මන්ට බැරිය, ආදී ව්‍යවහාරය ඕනෑ බැවින්) සත්වයෙක් ගෙණ මම විඳිනවාය ඔහු වින්දය, ආදී වශයෙන් කථාකරත්. එසේ කථාකරන්නේ ලෝකය අතර කථාකල යුතු බැවිනි.

වේදනාව යමෙකුගෙන් හෝ යම් තැනකින් හෝ නූපදින බවට කදිම නිදසුනක් ඇසුම මැනව. ලක්දිව සිතුල්පව් වෙහෙර එක් මහතෙරකෙනෙකුන් වහන්සේ වාතාබාධයකින් තැවෙන්නෝ වාත වෙදනාව බලවත්වූවිට විඳගත නොහැකිව ඒ මේ අත පෙර ලෙමින් දුක් විඳිත්. ඒ දුටු එක් ලදරු භික්ෂුවක් ස්වාමීනි! තමන් වහන්සේගේ කොයි ස්ථානයක් රිදේදැයි ඇසීය. මහතෙරණුවෝ ඇවැත්නි! රිදීමට වෙන්කර කියන්ට තැනක් නැත. දුක් වේදනා නමැති වස්තුවම අරමුණුකරගෙන ඉන් රිදේයයි කීහ. ස්වාමීනි! මෙලෙස දූනීමක් ඇතිවූ තැන්සිටමත් ඉවසීම පුරුදුකර ගතයුතු නොවේද? එසේද ඇවැත්නි! එසේනම් ඉවසමි. ස්වාමීනි! ඉවසීම නම් සැපයි. ගිලන් තෙරුණුවෝ ඉවසූහ. මුහත් කඩුවැනි ශස්ත්‍රක වාතය තෙමේ බලවත්වීමෙන් තෙරණුවන්ගේ බඩේ සිට හෘදවස්තුව තෙක් පැලී සියලුම බඩවැල් ඇඳමත වැටුනෝය. තෙරුන් වහන් සේ ලදරු භික්ෂුවට පෙන්වා මෙපමණ ඉවසුවා ඇද්දැයි ඇසූහ. භික්ෂුව විස්මයට පත්වී නිශ්ශබ්දවීය එවෙලෙහි සිල්වත් මහතෙරණුවෝ වීර්‍ය සමාධිය යොදා (අර්ථ, ධර්ම, නිරුක්ති ප්‍රතිභාන) යන පිළිසිඹියා පත් සතරින් යුක්ත උතුම් රහත් ඵලයට පැමිණ සම සීසිව පිරිනිවන් පෑ වදාළසේක.

මේ නිදගීත කථාවෙන් වෙදනාව කෙනෙක් නොවන බවත්, කෙනෙක් විසින් තැනකින් නිපදවනු නොවන්නක් බවත් දැන ගෙණ වේදනාවට උත්පත්ති වස්තුවන්නේද වේදනාවය එම වේද නාව විඳිනු ලබන්නේත් වේදනාවමයයි, තේරුන්ගත යුතුයි. එසේ තේරුන් ගැනීමෙන් වේදනාව කෙරෙහි කළකිරී ඒ අනුව

බැලීමෙන් අනුපස්සනාවගේ දියුණුවද, එම අනුපස්සනාව සම්‍යක් සිහියෙන් වැඩීමෙන් වේදනානුපස්සනා සතිපට්ඨානයද දියුණු කරගත යුතුයි.

මෙම කථාවේ අවසානයෙහිදී තිලන් තෙරනුවෝ) සමසීසීව පිරිනිවන් පෑබව ප්‍රකාශවිය. ඒ සමසීසී යන වචනයෙන් දක්වන්නේ උසස් සතියත් සම්පජඤ්ඤයත් (සිහියත් නුවනත්) පුරුදු කරගත් උතුමන්ගේ මරණාසනමයි සිතුල්පව් වෙහෙර විසූ මෙබඳු ආබාධ නැති මහා තෙරවරුන් වේදනානුපස්සනාදි සතිපට්ඨාන භාවනාවල යෙදී අර්හත්ඵල ලබා විමුක්ති සැපයට පැමිණ පිරිනිවන් පානා සමයෙහි සමවතට වැද ඉන් නැගී තමන් පැමිණි මාර්ගී සිහිකොට අනතුරුව ඵලද සිහිකොට ඊට අනතුරුව ලැබූ නිර්වාණ රසයද සිහා නැවතද තමාතුල සියලු කෙලෙසුන් නැසිගියේයයි දසිහිකොට අවසන පිරිනිවන් පෑසේක්ද එලෙසම මේ තෙරනුවෝද අපමණ දුක් වේදනාවන්ගෙන් මැඩී, නැවී සිටගෙණද වීර්‍ය සමාධීන්ගේ බලමහිමයෙන් එකී තෙරවරුන් සිහිපත් කරණ ලද සියල්ල පිළිවෙලින් සිහිකොට පිරිනිවන් පෑ වදාළ බැවින් සමසීසීව පිරිනිවන් පෑහයි කීහ.

එහෙයින් සමසීසී වාරසමසීසීහූතවා පච්චවෙක්ඛණවාරස්ස අනන්තරවාරෙ පරිනිබ්බායීති අත්‍ථො යි. ප්‍රකාශ කලහ.

මිලඟට කර්මස්ථානය පිළිබඳව විස්තරයක් දැනගත යුතුයි. භාග්‍යවතුන් වහන්සේ කර්මස්ථානය දෙකකට බෙදා තිබේ. එනම්– රූපකර්මස්ථානය, අරූපකර්මස්ථානය, කියායි. මීට රූපපරිග්‍රහය අරූප පරිග්‍රහයයිද නම් වේ. මෙහි රූප කර්මස්ථානය ධාතු සතර මුල්කර තබමින් සංක්ෂෙප වශයෙන්ද, විස්තර වශයෙන්ද, දේශනා කරණ ලදී. එය මෙහි විස්තර කිරීමට අවකාශ නොමැත. විස්තර බලාපොරොත්තුවන්නන් විසින් විසුද්ධිමාර්ගයෙහි කර්මස්ථානග්‍රහණ නිර්දේශයෙන් බලා අවබෝධ කරගත යුතුයි.

අරූපකර්මස්ථානය දේශනා කරණ භාග්‍යවතුන් වහන්සේ බොහෝ සෙයින් වේදනාව මුල්කරගෙන දේශනාකර තිබේ. අරූප කමටහන ස්පර්ශ වශයෙන් ය. වේදනා වශයෙන්ය චිත්තවශයෙන් යයි තුන් ආකාරයක් ඇත්තේය. ඒ තුන් ආකාරය, පිරිසිදු මෙසේ අවබෝධ කරගත යුතුයි. යම් යෝගාවචරයෙකුට සංක්ෂෙප වශයෙන් හෝ විස්තර වශයෙන් හෝ රූපකමට–හන පරීක්ෂාකරණ කල්හි ඒ කර්මස්ථානයට හිත එය වැඩෙන අරමුණෙහි සිතත් සිතිවිලි රැසත් පලමුකොට බැසගැන්මක් ඇතිවීමක් වේද ඒ අරමුණ ස්පර්ශකරමින් උපදින ස්පර්ශය තෙම ප්‍රකට වේයිද, ඒ අවස්ථාවෙහිදී අරූපකර්මස්ථානය ස්පර්ශවශයෙන්

ඇතිවූ ආකාරයයි. ඇතමෙකුට එම අරමුන විඳින කල්හි උපදින වේදනාව ප්‍රකටවේද ඒ අවස්ථාවෙහිදී අරූප කර්මස්ථානය, වේදනා වශයෙන් ඇතිවූ ආකාරයයි. ඇතැම් කෙනෙකුට ඒ අරමුණ පරීක්ෂාකර දන්නේවැ උපදනාවූ සිත ප්‍රකට වේද? ඒ අවස්ථාවේදී අරූප කර්මස්ථානය චිත්ත වශයෙන් ඇතිවූ ආකාරයයි.

මේ තුන් ක්‍රමයට අයත් පුද්ගලයන් අතුරෙන් යමෙකුට ස්පර්ශය ප්‍රකටව පහළවේද එය එසේද නමුත් ස්පර්ශය පමණක්ම නූපදියි. ඒ ස්පර්ශයත් සමග එම අරමුණම විඳිමින් වේදනාවත් එම අරමුණ හඳුන්වමින්, සඥ්ඥාවත් එම අරමුණම සිතමින් අරමුණු ගෙන ඉදිරියට පැමිණ තමා හා එක්වූ ධර්මයන් අරමුණු කරගෙන කර්මය සකස්කරන්නාවූ චේතනාවද එම අරමුණම වෙසෙසින් දන්වන්නාවූ විඥ්ඥාණයද උපදී. මෙසේ ස්පර්ශයද, වේදනාවද සඥ්ඥාවද, චේතනාවද, විඥ්ඥාණයද යන පඥ්ච ධර්මයන්ම පිරිහණියි හෙවත් සමමගීනය කෙරෙයි. යම් කෙනෙකුට වේදනාව ප්‍රකටව පහළවේද, ඒ පුද්ගලයාවද තනිකර වේදනාව පමණක් නූපදී. ඒ වේදනාව සමග එම වේදනාවම අරමුණු කරමින් ස්පර්ශයද අරමුණ හඳුනන්නාවූ සඥ්ඥාවද අරමුණෙහි යොදවන චේතනාවද අරමුණ දැනගන්නාවූ විඥ්ඥානයද උපදී. මෙසේ ස්පර්ශය සමග පස්වැදෑරුම් ධර්මයන්ම සමමගීනය කෙරෙයි. යම් පුද්ගලයෙකුට විඥ්ඥාණය ප්‍රකටව වැටහේද, ඒ පුද්ගලයා හටද විඥ්ඥාණය පමණක්ම නූපදී. ඒ විඥ්ඥාණය හා සමග එම අරමුණුම ස්පර්ශ කරමින් ස්පර්ශයද අරමුණු අනුභව කරන්නාවූ වේදනාවද අරමුණු හඳුනන්නාවූ සඥ්ඥාවද, අරමුණෙහි යොදා කර්ම සකස්කරණ චේතනාවද උපදී. මෙසේ ස්පර්ශය පස්වෙනිකොට ඇති ධර්මපසක්ම මොනවට ග්‍රහණය කරයි. මෙසේ මේ ත්‍රිවිධාකාරයෙන් යෙදෙන පඥ්ච ධර්මයෝ කුමක් ආශ්‍රය කරයිද මෙසේ පරීක්ෂාවෙන් බලන කල්හි මේ ශරීරය ඇසුරු කරණ ලදූයි දැනගණී. මෙහි මේ ශරීරය (කරජකාය) තෙමේ ස්වරූප වශයෙන් පඨවි, ආපෝ තේජෝ වායෝ යන මහභූත සතරින්ද උපාදාය රූපයන්ගෙන්ද ගොඩනැගුන වස්තුසංඛ්‍යාත මේ සිරුර රූප ධර්මනම්වෙත්. ඵස්ස වේදනා සඥ්ඥා චේතනා විඥ්ඥාන යන පඥ්ච ධර්මයෝ නාම ධර්මනම් වෙත්, මෙලෙසින් නාම; රූප දෙකක්ම වෙත්. මෙදෙකින් රූප ධර්ම රූපස්කන්ධ නම්. වේදනා සඥ්ඥා, සංස්කාර, විඥ්ඥාණ යන අරූප ස්කන්ධ සතර නාම ධර්ම නම්. මෙලෙසින් පඥ්චස්කන්ධ මාත්‍රයක් වේ. ඒ හැබව, නාම රූප දෙකින් වෙන්වූ පංචස්කන්ධයක්වත් පංචස්කන්ධයෙන් වෙන්වූ නාම රූප දෙකක්වත් නැත්තේමය. නාම රූප දෙකය කියන්නේත් පංචස්කන්ධයයි කියන්නේත් ඒ කරජකායම්මය,

මිලඟට පංචස්කන්ධය කුමක් හේතුකොටගෙන ඇත්තේදැයි යෝගාවචරයා විසින් අනුපස්සනා කට යුතුයි. එසේ පරීක්ෂාකරණ කල්හී අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝද සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණයද, ආදී වශයෙන් මේ මේ ප්‍රත්‍ය ශක්තියෙන් මේ මේ ප්‍රත්‍යයන්ගේ උත්පත්තිය වේයයිද මින්පිට අන්සතෙක් හෝ පුගුලෙක් අවිද්‍යමානයයිද නැතිනම් නැත්තේයයිද මෙයහුදු සංස්කාර ධර්මමාත්‍රයන් මයයිද දැන උපන්නා ප්‍රත්‍යයෙන් උපන් නාමරූප ධර්මයෙකැමේ. මේ නාමරූප ධර්ම අනිත්‍යය, දුඃඛය, අනාත්මයයි සම්මර්ශනය කරමින් වාසයකරයිද, ඒ යෝගාවචර තෙම අනිත්‍යාදී සම්මර්ශන ඥාණය කුළුගැන්වීමේ බලයෙන් මාර්ගාධිගමය අද ලැබෙයි. අද ලැබෙයි යයි කැමති වෙමින් සිටිනා අතර සත්ප්‍රාය ඍතු ගුණ ලැබීමකින් හෝ සත්ප්‍රායවූ කල්‍යාණ මිත්‍රයකු ලැබීමෙන් හෝ සත්ප්‍රායවූ ආහාරපාන ලැබීමකින් හෝ සත්ප්‍රායවූ ධර්මයක් ශ්‍රවනය කිරීමකින් හෝ එක් තැනක බඩ පර්‍යංකයෙන් හිඳගෙන විදර්ශනා කමටහන මුදුන් පමුණුවාගෙණ උතුම්වූ අර්හත් ඵලයෙහි පිහිටත් මේ ලෙසින් අරූපකර්මස්ථානය වේදනාව මුල්කරගෙන ස්පර්ශ වශයෙන්ද වේදනා, වශයෙන්ද, චිත්ත වශයෙන්ද ප්‍රකාශවූ තුන් වැදෑරුම් පුද්ගලයන්ට අර්හත්ඵල ලාභය දක්වා කමටහන් කියන ලද්දේ වේ.

වේදනානුපස්සනා සතිපට්ඨාන විභඞ්ගයෙහි අරූපකර්මස්ථානය වදාරන්නාවූ බුදුරජාණන් වහන්සේ වේදනාව බහුලව යෙදෙන අයුරු වදාළසේක.

ස්පර්ශ වශයෙන් හෝ විඤ්ඤාණ වශයෙන් හෝ අරූපකම්මටහන කියන කල්හි ප්‍රකටව නොවැටහේ. අඳුරෙහි සිටින්නෙකුට රූපාදිය යම්කලෙක ප්‍රත්‍යක්ෂව නොපෙනෙන්නා මෙනි. වේදනා වශයෙන් නම් කමටහන ප්‍රත්‍යක්ෂවම වැටහේ. මන්ද, වේදනාව හටගැන්ම ප්‍රකටව පෙනෙන බැවිනි. හේ කෙසේද=

යම් කලක තමා සිරුරට සැප වේදනාවක් වන්කල්හි මුළුසිරුරම කලම්බවමින් මඩිමින් සිරුර පුරා පැතිරෙමින් ශරීරයට යහපත් දෙයක් අලවන්නාක් මෙන්ද මනාප යමක් ඉසින්නාක් මෙන්ද සියක් වතාවක් හුනුකර හුනුකර දිය ගිලා කලතාගෙන ගත් ගිතෙලක් කවන්නාක් මෙන්ද සියක් වර පෙරාගත් පවිත්‍ර තෙලක් ශරීරය ඇතුලට කවන්නාක් මෙන්ද දිය කල දහසකින් ශිරුරට වත් ග්‍රිෂ්මය සංසිඳුවන්නාක් මෙන්ද, අහෝ සුඛං අහෝ සුඛං- අනේ සැපයි අනේ සැපයි කියා ගඩනගා කියවමින්ම සැපවේදනාව උපදීයි.

යම් කලෙක දුක් වේදනාවක් උපදීද, එකල මුළු ශරීර කලම්බ වමින් මඩිමින් ශරීර පුරා පතුරවමින් ශරීරට ගල්වන්නාක් මෙන් දුසින්නාක් මෙන්ද, අඟවමින් ගිණිගම්කල ශීවූලක් ශරීරෙහි ඔබන්නාක් මෙන්ද තකියාපු තඹලෝදිය දුසින්නාක් මෙන්ද වියළිගිය රුක් තන වැල් ආදිය ඇති වනයකට දර ගිණිහුලක් ඔබන්නාක්හු මෙන්ද, අහෝ දුක්ඛං අහෝ දුක්ඛං– අනේ දුකයි. අනේ දුකයි කියා හඬවමින්ම දුක් වේදනාව උපදවයි.

උපේක්ෂා වේදනාව පෙන්නුම් කිරීමට දුෂ්කරය, අඳුරුගතියක් වැනිය, ප්‍රත්‍යක්ෂව ප්‍රකාශකිරීමට අපහසුය. ඒ උපේක්ෂා වේදනාව සැප වේදනාවත් දුක් වේදනාවත් පහව ගියකල එයේක් ප්‍රතික්ෂේප කරමින් මැදහත් ආකාරව උපදින වේදනාවයි. මෙය තේරුන් ගැනීමට උපමාවක් දක්වමි. මුවාගේ පියවර දැක දුවගිය පාර තේරුන්ගන්නා මෙනි. හේ කෙසේද? උස් ගල්තලාවක් උඩින් පැනයන මුවෙක් පස්සෙන් එලවාගෙන යන වැද්දෙක්, ගල්තලාව මුදුනේ පාසටහන් පෙනෙන්ට නැතත් නැගගිය තැන පියවර හා බැසගිය තැන පියවර දැක, මෙතනින් නැගී මුදුනට පැමිණ මෙතනින් බැස ගියේ වනැයි නිසැකව සිතාගන්නේ යම්සේද, එලෙස එම උපමාව දැනගත් ආකාර සැප දුක් උපේක්ෂා වේදනාවන් දතයුතු නැගී පිය සටහන් දැනගන්නාසේ සැප වේදනාවද, බැසිපිය සටහන් දැනගන්නාසේ දුක් වේදනාවද දැන ගල මුදුනත පාසටහන් නැතද මෙදෙසින් පැනගිය හයි දැනගන්නාසේ සැප දුක් නැතද මැදහත් විඳීමක් ඇතැයි දැනගතයුතුයි.

මේ ක්‍රමය දේශනා කාලේ මේ වේදනානුපස්සනා සතිපට්ඨාන විභඞ්ගයෙහි පමණක් නොවේ දික්සඟියේ, මහානිදාන, සක්ක පඤ්ඤ මහා සතිපට්ඨාන යන සූත්‍රයන්හිද, මැදුම්සඟියෙහි සති පට්ඨාන චූලතණ්හාසඞ්ඛය මහාතණ්හාසංඛය චූලවෙදල්ල, මහා වෙදල්ල, රට්ඨපාල මාගන්දිය; ධාතුවිභඞ්ග, ආනෙඤ්ජසප්පාය, යන සූත්‍රයන්හිද, සන්යුත් සඟියෙහි චූලනිදාන රුක්කොපම. පරිවීමංසන සියලු වේදනා සංයුත්තකයෙහිද මේ ක්‍රමය මෙලෙසින්ම දේශනා කළසේක එය බලා අවබෝධ කටයුතුයි,

අනික් ක්‍රමයකුදු මෙසේ සැලකිය යුතුය, සැප වේදනාවක් විඳිමියි දැනගත්විට ඊට මත්තෙන් ඇතිව තිබුන දුක් හෝ උපේක්ෂා වේදනාව නැතිවීමෙන් මේ සැප වේදනාව හටගත්තේයයිද එම සැප වේදනාව නැතිවූ විට ඇතිවන්නේ දුක් හෝ මැදහත් වේදනාවෙකැයිද තේරුන් ගත්විට වේදනා සියල්ලම අනිත්‍ය බවත් ඒකාන්ත නොවන බවත්, පෙරලෙන ධර්මයක් බවත් වැටහේ. මෙසේ තේරුන් ගැනීමෙන් සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තව භාවනා වැඩිය යුතුයි.

බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළසේක-

> යස්මිං අග්ගි වෙස්සන සමයෙ සුඛං වෙදනං වෙදෙති නෙව තස්මිං සමයෙ දුක්ඛං වෙදනං වෙදෙති, න අදුක්ඛමසුඛං වෙදනං වෙදෙති–පෙ සුඛාපි ඛො අග්ගි වෙස්සන වෙදනා අනිච්චා සංඛතා පටිච්ච සමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධ ධම්මා –පෙ– එවං පස්සං සුතවා අරියසාවකො සුඛාය වෙදනාය නිබ්බින්දති –පෙ– නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති විරාගා විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කර-ණීයං නාපරං ඉත්ථත්තායාති පජානාතීති.

අග්ගිවෙස්සනය යම් වේලාවක යමෙක් සැප වේදනාවක් විඳීද-එවේලෙහි ඔහු දුක් වේදනාවක් හෝ මැදහත් වේදනාවක් හෝ නොවිඳී. යම් වේලාවක දුක් වේදනාවක් විඳීද එවේලෙහි සැප වේදනාවක් හෝ මධ්‍යස්ථ වේදනාවක් නොවිඳී. යම් වේලාවක මැදහත් වේදනාවක් විඳීද, එවේලෙහි සැප දුක් වේදනා නොවිඳී. එසේ වෙන් වශයෙන්ම විඳින සැප වේදනාවක් අනිත්‍යය. ප්‍රත්‍යයන් විසින් සකස්කරණලදය. ප්‍රත්‍යන් නිසා හටගන්නාලදය. ක්‍ෂයවන ස්වභාවය, විනාශවන ස්වභාවය, නො ඇලෙන ස්වභාවය. නිරුද්ධවන ස්වභාවය, මධ්‍යස්ත වේදනාවන් අනිත්‍යය. ප්‍රත්‍යයන් විසින් සකස්කරණ ලදය, ප්‍රත්‍යයන් නිසා හටගන්නා ලදය. ක්‍ෂය වන ස්වභාවය, නො ඇලෙන ස්වභාවය. නිරුද්ධවන ස්වභාවයයි. මේ ආකාරයෙන් දක්නාවූ චතුස්සත්‍යය අසා දැන සිටියාවූ ආර්‍ය්‍යශ්‍රාවක තෙම සැප වේදනාව කෙරෙහිද, දුක් වේදනාව කෙරෙහිද මැදහත් වේදනාව කෙරෙහිද, කලකිරෙයි, කලකිරුණ පසු නොඇලෙයි. වේදනාවෙහි නො ඇලීම නිසා ඉන් මිදෙයි. (වේදනා තණ්හා)දෙකින් මිදුනාවූපසු මම මිදුනෙමියි යන අර්හත්ඵලය ලැබ තෘෂ්ණාවෙන් මිදුනෙමියි ප්‍රත්‍යවෙක්‍ෂා ඥානය පහළවෙයි, නැවත (ප්‍රතිසන්ධිය) ඉපදීම ක්‍ෂයකළේයයිද මාර්ගී බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිම කරනලදූයිද කටයුතුවූ මාර්ගී භාවනා කර අවශාන කළේයයිද මේ අත්බව සමූලඝාතනය සඳහා අන් කටයුත්තක් මට නැතැයිද අවශාන වශයෙන් දැනගණී. සාමිස, සැප, දුක්, මැදහත් වේදනා පිළිබඳවද- නිරාමිස සැප දුක් මැදහත් වේදනා පිළිබඳවද, මේ ක්‍රමයෙන්ම දැනගත යුතු යි. මෙහි අවබොධ නොවක දැ ධර්මධර යන්ගෙන් අසා දැනගත යුතුයි.

සියළු සත්වයෝ දුකින් මිදෙත්වා.

මොරටුමුල්ලේ තාපසාරාම මහා විහාරාධිපති භදන්ත ශ්‍රී ආචාර්ය්‍ය මොරටුවේ පේමරතන මහා ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ විසින් පවත්වන ලද ධර්ම දේශනාව.

---

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

## 3. චිත්තානුපස්සනා සතිපට්ඨානය.

කථංච භික්ඛු අජ්ඣත්තං චිත්තෙ චිත්තානුපස්සී විහරති? ඉධ භික්ඛු සරාගං වා චිත්තං සරාගං මෙ චිත්තන්ති පජානාති, වීතරාගං වා චිත්තං වීතරාගං මෙ චිත්තන්ති පජානාති, සදොසං වා චිත්තං සදොසං මෙ චිත්තන්ති පජානාති, වීතදොසං වා චිත්තං වීතදොසං මෙ චිත්තන්ති පජානාති, සමොහං වා චිත්තං සමොහං මෙ චිත්තන්ති පජානාති, වීතමොහං වා චිත්තං වීතමොහං මෙ චිත්තන්ති පජානාති, සංඛිත්තං වා චිත්තං සංඛිත්තං මෙ චිත්තන්ති පජානාති, වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං මෙ චිත්තන්ති පජානාති, මහග්ගතං වා චිත්තං මහග්ගතං මෙ චිත්තන්ති පජානාති, අමහග්ගතං වා චිත්තං අමහග්ගතං මෙ චිත්තන්ති පජානාති, ස උත්තරං වා චිත්තං ස උත්තරං මෙ චිත්තන්ති පජානාති, අනුත්තරං වා චිත්තං අනුත්තරං මෙ චිත්තන්ති පජානාති, සමාහිතං වා චිත්තං සමාහිතං මෙ චිත්තන්ති පජානාති, අසමාහිතං වා චිත්තං අසමාහිතං මෙ චිත්තන්ති පජානාති, විමුත්තං වා චිත්තං විමුත්තං මෙ චිත්තන්ති පජානාති, අවිමුත්තං වා චිත්තං අවිමුත්තං මෙ චිත්තන්ති පජානාති, සො තං නිමිත්තං ආසෙවති භාවෙති බහුලීකරොති ස්වාවත්ථිතං වවත්ථපෙති, සො තං නිමිත්තං ආසෙවිත්වා භාවෙත්වා බහුලීකරිත්වා ස්වාවත්ථිතං වවත්ථපෙත්වා බහිද්ධා චිත්තෙ චිත්තං උපසංහරති.

---

පින්වත්නි,

මේ ප්‍රකාශ කරන්ට යෙදුණේ අද ධර්මදේශනාවට ඇතුලත් මාතෘකාව පිළිබඳ ධර්මකොට්ඨාසයකි. මෙය චිත්තානුපස්සනාව පිළිබඳව විභඞ්ග ප්‍රකරණයෙහි සතිපට්ඨාන විභඞ්ගයෙහි ආයේය.

මෙහි අදහස කියාදෙන්ට මත්තෙන් මේ සද්ව්‍යාපාරය ගැන කරුණු ස්වල්පයක් ප්‍රකාශ කරණු කැමැත්තෙමි. මේ ධර්මදෙශනාව කරවන්ට අදහස් කර තිබෙන්නේ මොරටුමුල්ලේ සිරිසුධර්මාරාමයෙහි සහ මහගාලේ මේ පුෂ්පාරාමයෙහිත් ආධිපත්‍යය උසුලමින් ලෝ සසුන් දෙකට මහත් වැඩ සිද්ධකළාවූ “සිරි ඤාණාභිවංස ධම්මාධාර වංශපාල විනයාලඞ්කාර සිරි අරියවංස මහා ස්ථවිර පාදයන් වහන්සේ ගැන ගුණ සිහිකරලීමක් වශයෙනි. මීට කලිනුත් මේ සඳහා බොධ්‍යඞ්ග ධර්මයන් දෙශනා කරවා ඒ ධර්මපොතක් වශයෙන් විසුරුවා හැර තිබෙන බවත් එයින් ධර්මරසිකයන් හට බොහෝ ප්‍රයෝජන අත්වී තිබෙන බවත් දනිමි. මේ වරත් සඩොකත ස්වාමිපාදයන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය ධර්ම ශාස්ත්‍ර උගත් මොරටුවේ සිරි සාසනවංශ ස්ථවිරයන් වහන්සේ විසින් කරණ ලද ඇයැදුමේ පරිදි චිත්තානුපස්සනාව පිළිබඳව ධර්මකොට්ඨාශයක් කරන්ට අදහස් කරමි.

මාතෘකා වශයෙන් තබන ලද ධර්මකොට්ඨාශයේ අදහසනම්:—

මේ බුද්ධ ශාසනයෙහි තිවත් පසක් කරණු කැමැති භාවනානුයෝගී භික්ෂුතෙම කෙසේනම් තමන්ගේ සිතෙහි සිත අනුව බලමින් වාසය කෙරේද? මේ බුදුසසුන්හි තිවන් සොයන්නාවූ යොගාවචර භික්ෂුතෙම රාග සහිත සිත මාගේ මේ රාග සහිත සිතයයි දනියි රාග රහිතවූ සිත මාගේ මේ රාග රහිත (කුශල අව්‍යාකෘත) සිතයයි දනියි. ද්වෙෂ සහිත සිත මාගේ මේ ද්වෙෂ සහිත සිතයයි දනියි ද්වෙෂ රහිත සිත මාගේ මේ ද්වෙෂ රහිත (කුසල අව්‍යාකෘත) සිතයයි දනියි. මොහ සහිත සිත මාගේ මේ මොහ සහිත සිතයයි දනියි. මොහ රහිතවූ සිත මාගේ මේ මොහ රහිත (කුශල අව්‍යාකෘත) සිතයයි දනියි. කාය සිත දෙකේ මැලි බැවින් හැකුළුනාවූ සිත මාගේ මේ හැකිලී ගිය සිතයයි දනියි. එසේ නොහැකුළුනාවූ සිත මාගේ මේ නොහැකුළුනු සිතයයි දනියි. මහද්ගතවූ සිත හෙවත් රූපාවචරවූද අරූපාවචරවූද සිත මාගේ මේ මහද්ගත සිතයයි දනියි. එසේ මහද්ගත නොවූ සිත මාගේ මේ අමහද්ගත සිතයයි දනියි. කාමාවචර සිත මාගේ මේ කාමාවචර සිතයයි දනියි. කාමාවචර නොවූ සිත මාගේ මේ රූපාවචරවූද අරූපාවචරවූද සිතයයි දනියි, අර්පණා උපචාර වශයෙන් සමාධිගතවූ සිත මාගේ මේ සමාධිගත සිතයයි දනියි. එසේ සමාධිගත නොවූ සිත මාගේ මේ සමාධිගත නොවූ සිතයයි දනියි. තදඞ්ග විමුක්ති විෂ්කම්භන විමුක්තීන්ගේ වශයෙන් මිදුනාවූ සිත මාගේ මේ නීවරණයන්ගෙන් මිදුනාවූ සිතයයි දනියි. එසේ නොමිදුන සිත

ඕහුගේ මේ නීවරණයන් කෙරෙන් නොමිදුනු සිතයයි දනියි. ඒ යෝගාවචර භික්ෂුතෙම ඒ නිමිත්ත සෙවය චිත්ත සංඛ්‍යාත අරමුණ ආසෙවනය කරයි. සිය්ගිලා වඩයි; බහුල වශයෙන් මෙනෙහි කරයි. මොනොවට නිශ්චය කරණ ලද්දක් කරයි. මේ මුලින් කියන ලද ධර්ම කොට්ඨාශයෙහි අදහසයි.

මෙසේම භික්ෂු තෙම අනුන්ගේ සිත කෙරෙහිද තමන්ගේ හා අනුන්ගේ සිත කෙරෙහිද සිහිකර බලයි. මේ සැකෙවින් පිරිසිඳ දැන්වීමකි.

විස්තර වශයෙන් චිත්තානුපස්සනා "සතිපට්ඨාන" යන වචනය ගැන සලකා බැලිය යුතුයි.

අරමුණ සිහිකිරීමයයි කියන ලද අර්ථයෙන් "සති" යයිද අරමුණ වෙත එළඹ සිටියකු මෙන් පැවැත්මයයි කියන ලද අර්ථයෙන් "පට්ඨාන" යයිද කියනු ලැබේ. එසින් අරමුණ සිහිකරණ අරමුණ වෙත එළඹ සිටින යම් ගතියක් වේ නම් ඒ "සතිපට්ඨාන" නමැයි සැලකිය යුතුයි. එසින් චිත්තානු පස්සනා සතිපට්ඨානයෙහිදී සිත ගැන සිහිකර බැලිය යුතුයි.

සතිපට්ඨානය වඩන්නාවූ යෝගාවචරයා කෙලෙස් තවන වීර්යයෙන් යුක්ත බව මනා නුවණින් යුක්ත බව සිහි ඇතිබව ආලය හා දොම්නස නැතිකරණ බව යන අඞ්ග සතරින් යුක්ත විය යුතුයි.

මේ භාවනාව වැඩීමේදී වනයකට හෝ රුක්මුලකට හෝ ජන සමූහයාගෙන් වෙන්වූ විවේක ඇති තැනකට හෝ එළඹ සිටිය යුතුයි.

මෙසේ වඩන්නහු විසින් වැඩිය යුත්තේ එකම සතිපට්ඨාන යයි. එය සතරක් වී තිබෙන්නේ කාය වේදනාව, සිත හා ධර්මය යන අරමුණු සතර නිසාය, යම්සේ නැගෙනහිර දකුණ බටහිර උතුර යන දික්හි උපන් බඩු විකුණනු කැමැති වෙළෙන්දෝ ඒ ඒ දොරටුවලින් එකම නුවරකට පිවිසෙද්ද එමෙන් සති පට්ඨාන සතර වඩන්නාවූ යෝගාවචරයෝ ඒ ඒ සතිපට්ඨාන භාවනාවෙන් නිපදවා ගත් ආර්ය මාර්ගයෙන් එකම නිවන් පුර යට පිවිසෙත්. මෙසේ අරමුණු වශයෙන් සතරක් නමුත් මේ සතිපට්ඨාන භාවනාවෙහිදී භාග්‍යවතුන් වහන්සේ විසින් විසි එක්ඵලක නිවන් කුළුගන්වා තිබේ.

එනම්-

1. ආනාපාන සතිය
2. චතු ඉරියාපථය
9. චතුසම්පජඤ්ඤය
4. පටික්කූල මනසිකාරය
5. ධාතු මනසිකාරය
6 සිට 14 තෙක් නවසීවථිකය
15. වේදනානුපස්සනාවය
19. චිත්තානුපස්සනාවය
17. නීවරණ නිද්දේශය
18. ඛන්ධ නිද්දේශය
19. ආයතන නිද්දේශය
20. බොජ්ඣඞ්ග නිද්දේශය
21. සච්චනිද්දේශය යන මොව්හුය.

මේ විසිඑක්පලම රහත් බැව්හි ඔස්වා භාග්‍යවතුන් වහන්සේ දේශනා කාර තිබේ. මෙය භාවිතා කිරීමෙන් සත්‍වයන්ගේ පිරිසිදුවීම ශෝක කිරීම වැලපීම යන මොවුන්ගේ ඉක්මවීම දුක් දෙම්නස් දෙක සංසාලීම ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයාගේ ලැබීම නිවන් පසක්කර ගැණීම යන අනුසස් රාශියක් ලැබෙන බැව් දතයුතුයි.

මේ සතිපට්ඨාන භාවනාව සඳහා මනුෂ්‍ය වර්ගයා අතුරෙන් නුවණ දියුණු කුරුරට වැස්සන්වම භාග්‍යවතුන් වහන්සේ තෝරා ගත්තාක් මෙන් දෙපනස් චෛතසික ධර්මයන් අතුරෙන් මේ සඳහා සිහියම කුමක් හෙයින් මුල්කර ගත්සේක්ද? සිහිය හැම දෙයක වම උවමනා කරණ හෙයිනි. "සතිඤ්ච ඛො හං භික්ඛවෙ සබ්බත්ථිකං වදාමි" යන බුද්ධ වචනයෙන් එය පැහැදිලි වෙයි. මේ සිහිය අපිලාපනය උපගණ්හනය යන ලක්ෂණ දෙකකින් යුක්තයි. එයින් අපිලාපනය නම් තණ පරඬලා ආදී දෙය ගඟේ ගහගෙන යන්නාක් මෙන් ඇසූ දුටු දෙය ගහගෙණ යා නොදී දරාගෙණ සිටිය හැකි බවයි. යම් අරමුණක් ගත්තානම් එය අමතකවී යා නොදී රැකගෙන සිටිය හැකිබවයි. උපමා වශයෙන් බලනවා නම් සක්විති රජුගේ ගෘහපති රත්නය මෙනි. ඒ භාණ්ඩාගාරික අමාත්‍ය තෙම දෙවියන් වහන්ස! ඔබ වහන්සේගේ ඇත් අස් රථ පාබල යන සිවුරඟ සේනාග මෙපමණය, රන්රුවන් මුතුමැණික් මෙපමණයයි සක්විති රජහට සිහිකරවන්නේය. එමෙන් යොගාවචරයාහට උපදනා සමෘති තොමෝ මේ සතර සතිපට්ඨානයෝය, මේ සතර සම්‍යක් ප්‍රධානයෝය යනාදි වශයෙන් ධර්මයන් අරමුණු කරවන්නීය. එබැවින් යොගාවචර තෙම සෙවනය භජනය කට යුතු ධර්මයන් ඉවත යා නොදී අල්වා ගනියි.

සිහියේ අනිත් ලක්ෂණයවූ උපගණ්හනය නම්? හිතාහිත ධර්මයන් පරීක්ෂාකර බලා අහිත ධර්මයන් දුරුකොට හිත ධර්මයන් අල්වා ගැනීමයි. එය හරියට සක්විති රජුගේ පරිනායක

රත්නය මෙනි. සක්විති රජුගේ පුත්‍රයාහට පුදුම ඥාණයක් ඇත්තේය. එනම්- සක්විති රජහට හිතවත්වූද අහිතවත්වූද විරුද්ධවූද අවිරුද්ධවූද ජනයන් දැනගත හැකි නුවණයි. එබැවින් හෙතෙම උපකාර ඇත්තාවූ හිතවත් ජනයන් ලංකොට අනුප කාරීවූ විරුද්ධකාරයන් හා කුමන්ත්‍රණ කාරයින් වත් දුරුකරන් නේය. එමෙන් සමෘති තොමෝ මේ ධර්මයෝ හිතයෝය, මේ ධර්ම යෝ අහිතයෝය, මේ ධර්මයෝ උපකාරීහුය මේ ධර්මයෝ අනුප කාරීහුයයි දැන භාවිතාවට සම්බන්ධකර නරුණු දුරුකොට උප කාරී ධර්මයන් ලංකරගන්නේය.

මෙසේ මේ සිහිය පස්කම් රස අනුභව කිරීමෙන් දීඝකලක් මුළුල්ලෙහි නපුරටම දිව්වාවූ සිත නමැති කුළුවස්සා සතිපට්ඨාන නමැති වැඹෙහි බැඳ තැබීමට රැහැනක් හා සමානය. ඉතා චණ්ඩ වූ නොහික්මුනු කුළුවස්සා හික්මවීම අමාරුය. උග දෙනගෙන් වෙන්කොට ශක්තිමත් වැඹක් හිඳුවා රැහැණකින් බැඳ තැබුව හොත් ඒ මේ අත දුවත් යාගත නොහැකිවූවිට හික්මී සිටියි. එමෙන් පුහුදුන් සිතද දමනය කිරීම ඉතා දුෂ්කරය. භවගති යෙහිම පුරුදු අරමුණුවලම ඒ සිත දුවන්නේය. එබැවින් ඒ සිත නමැති කුළුවස්සා හිරිඔතප් නමැති ප්‍රාකාර මධ්‍යයෙහි සතිපට්ඨාන නමැති වැඹෙහි සිහි නමැති රැහැනින් බැඳ තැබුව හොත් ශීල විශුද්ධි ආදී ප්‍රතිපත්ති විධිවලින් දමනය කරගත හැකිවන්නේය.

සිහියෙන් යුක්තව බලන්නාහට මුළු භවත්‍රයම බන්ධනාගාරයකි. හෙතෙම සිරකරුවෙකි. සිහියෙන් තොරව බලන්නාහට ලෝකය රඟමඩලකි. හෙතෙම නෘත්‍ය කරුවෙකි. සත්වයෝ භවයෙහි උපදිති. නුමුත් සිහියෙන් යුක්තව බැලුවොත් මිස නැතිනම් භව-යෝනි-ගති-ඨිති-සත්වාවාස යන මෙකී තන්හි රූපාදී පඤ්චස්කන්ධයන්ගේ පහලවීමද චක්ෂුරාදී ආයතනයන්ගේ ප්‍රතිලාභයද නොපෙණෙන් නේය. එසේම ජරා ව්‍යාධි මරණාදීයද නො වැටහෙන්නේය. එබැවින් ඔහුට සසර කෙරෙහි කලකිරීමක් ඇතිනොවන්නේය. නමුත් සිහියෙන් යුක්තව භවය ගැන බලන්නා හට එහි කිසි හරයක් නැති බවත් ඉන් මිදීමට පස්කම් විෂයෙහි ඇලීගිය සිත දමනය කටයුතු බවත් වැටහෙයි. ඊට හොඳම මාර්ගය සතිපට්ඨාන යයි. එය කාය පිළිබඳව සිහිකර බැලීම, වේදනා පිළිබඳව සිහිකර සිත පිළිබඳව සිහිකර බැලීම, නීවරණාදී ධර්ම පිළිබඳව සිහිකර බැලීමයයි සතර වැදෑරුම් වෙයි. එයින් අද විස්තර කරන්ට තිබෙන් නේ චිත්තානුපස්සනාවයි. හෙවත් සිත පිළිබඳව සිහිකර බැලීමයි,

එම්නිසා පළමුකොට සිත කෙබඳු දෙයක්දැයි සලප්‍රනාකර බැලිය යුතුයි. “චින්තෙතීති චිත්තං” යන විග්‍රහයේ හැටියට රූපාදී අරමුණු සිතානුයි චිත්ත නම් වේ. අරමුණු ගන්නා ස්වභාව ධර්මය චිත්ත යනුවෙන් ප්‍රකාශ කරණු ලැබේ. භවාංග කාලය සිතේ විඩාහැරීමක් මෙන්ද විසංඥ කාලය සිතට වූ ආබාධයක් හැටියටද සැලකිය හැක. සාමාන්‍යයෙන් සිතේ ස්වභාව නම් අරමුණු ගැණීමයි. සිතනම් ඉතා විසිතුරු ධර්මයෙකි. ඒ බැව් සංයුත්ත නිකායෙහි මෙසේ සදහන් වේ.

> දිට්ඨං නො භික්ඛවෙ චරණං නාම චිත්තන්ති, එවං
> භන්තෙ තම්පි ඛො භික්ඛවෙ චරණං චිත්තං චිත්තෙන
> නෙව චින්තිතන්ති, තෙ නා පිඛො භික්ඛවෙ චර
> ණෙන චිත්තෙන චිත්තඤ්ඤෙව චිත්තතරං යි.

මහණෙනි! තොප විසින් චරණ නම් චිත්‍රය (සිතුයම) දක්නා ලද්දේද? එසේය ස්වාමීනි! මහණෙනි! චරණ චිත්‍රයද සිතින් සිතන ලද්දකි. මහණෙනි ඒ චරණ චිත්‍රයට වඩා සිතම අතිශයින් විසිතුරුයි.

> නාහං භික්ඛවෙ අඤ්ඤං එක නිකායම්පි සමනුපස්සාමි,
> යං එවං චිත්තං යථයිදං භික්ඛවෙ තිරච්ඡාන ගතා
> පාණා තෙහිපි ඛො භික්ඛවෙ තිරච්ඡාන ගතෙහි
> පාණෙහි චිත්තඤ්ඤෙව චිත්ත තරං,, යි

මහණෙනි! යම් මේ තිරිසන් සත්තු ඇද්ද? ඒ තිරිසන් ගත සත්ව නිකායයන් මෙන් විසිතුරු වූ අන්‍ය එකම සත්ව යොනියකුදු මම මාගේ සර්වඥතාඥානයෙන් නොදක්නෙමි. මහණෙනි! ඒ තිරිසන් ගත සත්තුද චිත්තයෙන්ම විසිතුරු කරණ ලද්දෝය. මහණෙනි! ඒ තිරිසන් ගත සතුන්ටත් වඩා චිත්තයම අතිශයින් විසිතුරුය. යනු එහි භාවයි.

චරණ නම් චිත්‍රය ඉතා විසිතුරුවූ සිතියමකි. තිරිසන්ගත සත්වයොනීහු ඉතා විසිතුරුයහ. තුමූත් චිත්තය ඒ දෙකටම වඩා විසිතුරුය. දිව්‍ය විමාන මල්මාලා යාන වාහන ඉර සඳ ගංගා ආකාශාදිය ඇඳීමෙන් චරණ චිත්‍රයාගේ විචිත්‍රභාවය ඇතිවන්නේ සිත්තරහුගේ සිත විසිතුරු බැවිනි. තිරිසන්ගත ප්‍රාණීන් සම්බන්ධ නොයෙකුත් විචිත්‍රභාවයෝ සත්වයින්ගේ සිත විසිතුරු බැවින්ම වෙත්. සිත විසිතුරු බැවින් හැඟීම් තොමෝ විසිතුරු වන්නීය. ඒ හැඟීමයයි කියන ලද සංඥව විසිතුරු බැවින් තෘෂ්ණාව විසිතුරු වන්නීය. තෘෂ්ණාව විසිතුරු බැවින් කර්මය විසිතුරු

වන්නේය. කර්මය විසිතුරු බැවින් සත්ව ජාතිහු විසිතුරු වන්නාහුය. ලොකයෙහි යම් පමණ විසිතුරු දේ වෙත්නම් ඒ සියල්ලටම වඩා සිතේ විචිත්‍ර භාවය ඇත්තේය. ලෙව්හි පවත්නා අරුම පුදුම දේ සියල්ලමත් සිතින්ම නිපදවන ලද්දේය.

චිත්තයාගේ ලක්ෂණාදිය:-

ආරම්මණ විජානන ලක්ඛණං චිත්තං"සි, කී බැවින් චිත්තය තෙම රූපාදි අරමුණු විශෙෂයෙන් දැනගැනීම ලක්ෂණ කොට ඇත්තේය. "පුබ්බඞ්ගම රසං"සි කී බැවින් චිත්තය තෙම වේදනාදි චෛතසිකයන්ගේ පෙරමුණ බව කෘත්‍යකොට ඇත්තේය. "සන්ධාන පච්චුපට්ඨානං"සි කී හෙයින් පසුපසුව උපදිනු ලබන සිත් පළමු පළමු උපන් චිත්තය හා අතුරු නැතිකොට හැළපීම චිත්තයාගේ වැටහෙන ආකාරය වන්නේය. "නාම රූප පදට්ඨානං" සි කී බැවින් චිත්තය තෙම නාම රූප දෙක ආසන්න කාරණ කොට ඇත්තේය. පඤ්චවොකාර භවයෙහි නාම රූප දෙකමත් චතුවොකාර භවයෙහි නාමය පමණක්මත් සිතට ආසන්න කාරණා වේයයි සැලකිය යුතුයි.

බොහෝ දුර ගමන් කරවිය හැකි ශක්තියක් මේ සිතෙහි ඇත්තේය. නමුත් එය නිසි ආකාරයෙන් රැකගන්ට නොදන්නා නිසා බොහෝ සෙයින් ලඟම තිබෙන දේ පවා නොපෙනී යන්නේය. සිත පවතින්නේ. හුදකලාව නමුත් සිත අයිතිකාරයා නිතරම කැමැති වන්නේ බොහෝ දෙනා පිරිවරා ගෙන සිටීම වය. මේ සිත අපේ මසැසින් දක්නහැකි නොවේ. ස්ත්‍රී පුරුෂාදීන් වශයෙන් හෝ නීල පීතාදී වශයෙන් යම්කිසි රූප සටහනක් නැත්තේය. අපේ සිරුර තුළ පවත්නා හෘදය වස්තුව මොහුගේ වාසස්ථානය වන්නේය. එබැවින් ශයනය කරන්නේ ගුහාවකය. ඒ හෘදය වස්තුව සිරුර තුළ දෙතන මැද පිහිටියේය. රත් පියුම් බඳු පැහැ ඇත්තේය. සටකන් වශයෙන් පිට පෙති හැර යටිකුරු කොට තැබූ පියුම් කැකුළකට බඳුය. පිටතින් වටය, ඇතුලත වැටකොලු පලයක ඇතුලට බඳුය. පැණවතුන්ට මදක් විකසිතය පැණ නැතියනට හැකිළී පවත්නේය. එයැතුළ දෙඹ ඇටයක් පිහිටන තැන් පමණ වලක් වෙයි. එහි අඩපතක් පමණ ලේ ඇත්තේය. ඒ ලෙය ඇසුරු කරගෙණ සිත පවත්නේය. ඒ සිතෙන් වෙන්ව පවත්නා ඉර හඳ තාරකා වෘක්ෂ පර්වතාදී වස්තූවල නිශ්චල ද්‍රේපලාදියට මෙලොව නිදහස හෝ පරලොව නිදහස උවමනා නැතත් සිත සමග පවත්නා සෑම සත්වයෙකුටම මොක අන්දමේ උවත් නිදහසක් උවමනා කෙරේ නියම නිදහස නම්

සංසාර වෘත්ත දුක්ඛයෙන් මුලුමනින් වෙන්වී ලබින්නාවූ නිවන් සැපතයි. එය භාවනා මාර්ග වශයෙන් නුවණැස දියුණු කර ගැණීමෙන්ම ලැබිය යුතුවෙයි. ඒ භාවනාවෝ සමථ විදර්ශනා වශයෙන් ද්විප්‍රභෙද වෙත්, සමථ භාවනාවෙන් සිත දියුණුකර ගන්නා පිළිවෙලද විදර්ශනා භාවනාවෙන් නුවණ දියුණු කරගන්නා පිළිවෙලද දක්වෙත්. කාමච්ඡන්ද නීවරණාදි කෙලෙසුනට යටහත්ව සිටිනගෙණ සිතවත් නුවණවත් දියුණුකරගත නොහැක්කේය: ඒ දෙක දියුණුකර නොගතහොත් බුද්ධොත්පාද කාලයකින් ලැබිය යුතු ප්‍රයෝජනය ලබාගන්නා නොවෙයි, එබැවින් සමථ භාවනාවක් හෝ විදර්ශනාවක් නිතර වැඩීමට පුරුදුවිය යුත්තේය. චිත්තානුපස්සනා භාවනා මාර්ගයද බුදුරජාණන් වහන්සේ විසින් විදර්ශනාවෙහි බස්වා දෙශනා කරණ ලද්දකි.

එහි "සරාගංවා චිත්තං" යනුවෙන් ප්‍රකාශ කරණ ලද්දේ අකුසල් සිත් දොළසින් ලොභ සහගත සිත් අටකි.

එනම් =

1. සොම්නසින් හා වැරදි ලබ්ධියෙන් යුක්තවූ සවභාවයෙන් තියුණුවූ තමා විසින් හෝ අනුන් විසින් නොමෙහෙයන ලද සිතින් යුක්තව සොරකම් ආදිය කරණ කල්හි පළමුවැනි ලොභමූල අකුශල චිත්තය උපදී.

2. සොම්නසින් හා වැරදි ලබ්ධියෙන් යුක්තවූ සවභාවයෙන් නොතියුණුවූ මෙහෙයන ලද සිතින් සොරකම් ආදිය කරණ කල්හි දෙවැනි ලොභ මූල අකුසල චිත්තය උපදී.

3. සොම්නසින් යුක්තවූ වැරදි ලබ්ධියෙන් තොරවූ සවභාවයෙන් තියුණුවූ නොමෙහෙයන ලද සිතින් සුක්තවූ සොරකම් ආදිය කරණ කල්හි තෙවැනි ලොභමූල අකුසල චිත්තය උපදී.

4. සොම්නසින් යුක්තවූ වැරදි ලබ්ධියෙන් තොරවූ සවභාවයෙන් නොතියුණුවූ මෙහෙයන ලද සිතින් සොරකම් ආදිය කරණ කල්හි සතරවන ලොභමූල අකුසල චිත්තය උපදී.

5, උපෙක්ෂාවෙන් හා වැරදි ලබ්ධියෙන් යුක්තවූ සවභාවයෙන් තියුණුවූ නොමෙහෙයන ලද සිතින් සොරකම් ආදිය කරණ කල්හි පස්වැනි ලොභමූල අකුසල චිත්තය උපදී.

6. උපෙක්ෂාවෙන් හා වැරදි ලබ්ධියෙන් යුක්තව සවභාවයෙන් නොතියුණුවූ මෙහෙයන ලද සිතින් සොරකම් ආදිය කරණ කල්හි සවැනි ලොභමූල අකුසල චිත්තය උපදී.

7. උපෙක්ෂාවෙන් යුක්තවූ වැරදි ලබ්ධියෙන් තොරවූ ස්වභාවයෙන් තියුණුවූ නො මෙහෙයන ලද සිතින් සොරකම් ආදිය කරණ කල්හි සත්වැනි ලොභමූල අකුසල චිත්තය උපදී.

8. උපෙක්ෂාවෙන් යුක්තවූ වැරදි ලබ්ධියෙන් තොරවූ ස්වභාවයෙන් නොතියුණුවූ මෙහෙයන ලද සිතින් සොරකම් ආදිය කරණ කල්හි අටවැනි ලොභමූල අකුසල චිත්තය උපදී.

යම් කලෙක පස්කම්රස කොපමණ වින්දත් අවැඩක් වරදක් නැත යන ලාමක විශ්වාසය පෙරදැරිකරගෙණ තුටුපහටුව අනිකෙකු විසින් කරවන ලද මෙහෙයීමක් නොමැතිව ස්වභාවයෙන්ම තියුණුවූ සිතින් කාම සැප අනුභව කෙරේද පස්පව් දසඅකුසල් කෙරේද, ඉටුදෙයක් දැකීම මිහිරි ශබ්දයක් ඇසීම මඞ්ගල්‍යෙක යනාදී වශයෙන් ඉඳුරන් පිණවීම පසස්නේ වේද එකල ප්‍රථම අකුසල චිත්තය උපදී. යම් කලෙක අනිකෙකු විසින් උත්සාහවත් කරවන ලදුව යටකී අන්දමින් හැසිරේද එකල දෙවැනි අකුසල් සිත උපදී. යම් කලෙක කාමසැප විඳීමෙන් අවැඩක් නැත යන වැරදි විස්වාසයක් පෙරදැරිනොකොට හුදෙක් තුටුපහටුව උනන්දුකරවීමක් නොමැති ස්වභාවයෙන්ම තියුණුවූ සිතින් මෛථුන සේවනය හෝ අනුන්ගේ සම්පත්තියෙහි බලවත් ලෝභය උපදවාද සොරකම් හෝ කෙරේද, එකල්හි තුන්වැනි අකුසල් සිත උපදී. යම් කලෙක යටකී පරිද්දෙන් උත්සාහ ගන්වන ලද සිතින් ඒ අකුසල් කෙරේද එකල සතරවැනි අකුසල් සිත උපදී. යම් කලෙක්හි කාමයන්ගේ සමෘධියක් නොමැතිව සොම්නසට හේතුවූ අන්‍ය කරුණු හෝ නැතිව සතර අර්ථ විකල්පයෙහිම සොම්නස් රහිතවූවාහුම උපදිද්ද එසමයෙහි අවශේෂ සතර සිතම උපෙක්ෂා සහගතව උපදනේය.

මේ ලොභමූල චිත්තය සොම්නස්සහගතය උපෙක්ෂා සහගතය දෘෂ්ටිගත සම්ප්‍රයුක්තය දෘෂ්ටිගත විප්‍රයුක්තයයි සතරකට බෙදී එය නැවත අසංඛාර සසංඛාර භේදයෙන් ගිණුකල්හි අට අයුරකින් බෙදීයයි.

මේ සිත් සොම්නස්සහගතවීමට ප්‍රිය මනාප අරමුණක් හෝ අනිෂ්ටවූවත් ඉෂ්ටයයි සලකන අරමුණක් ලැබීම, සොම්නස් සහගත සිතින් ප්‍රතිසන්ධි ඇතිබව නොගැඹුරු ස්වභාව ඇතිබව ඥාතිව්‍යසන භොගව්‍යසනාදී විපත්තියෙන් මිදීම යන කරුණු සතර ඉවහල් වෙයි.

සිත මිසදිටුවිමට කාරුණු පසකි එනම්:-

විපරීත දෘෂ්ටි ඇති පුද්ගලයන් ඇසුරු කිරීම, වැරදි ලබ්ධි ඇතිබව ධර්මයට පිටුපෑම අකුසල විතර්ක බහුල කොට ඇතිබව නුනුවණින් මෙනෙහි කිරීම යන මොව්හුය.

යෝග්‍යවූ ඍතුව යෝග්‍යවූ වාසය යෝග්‍යවූ භෝජනය යෝග්‍ය වූ වස්ත්‍රාදිය යන මේ කාරුණු පස සිත් අසංකාරික (තියුණු විමට හේතුවෙත්.

සිත් උපෙක්ෂා සහගතවීමට කාරුණු සතරකි. එනම්= උපෙක්ෂා සහගත සිතින් ප්‍රතිසන්ධිය ඇතිබව ගැඹුරු අදහස් ඇති බව මධ්‍යස්ථ අරමුණ හා එක්වීම දුක් ව්‍යසනාදියෙන් මිදීම යන මොව්හුය.

“වීතරාගං චිත්තං” යනුවෙන් ප්‍රකාශකරන්නේ පහවූ රාග ඇති ලෞකික කුසල අව්‍යාකෘත චිත්ත රාශියයි. අව්‍යාකෘත සිත්නම් විපාක සිත් හා ක්‍රියා සිත් රාශියයි. ලෝකෝත්තර සිත් මෙහි ලා ගණු නොලැබේ. මේ භාවනා හරිහැටි වැඩූවිට ලෝකෝත්තර සිත ලැබෙන්නේය.

ද්වේෂ සහගත සිත් දෙකනම්:-

දෞර්මනස් වේදනාව හා යෙදුනාවූ ද්වේෂය හා එක්වූ අසංස්කාරික චිත්තය දෞර්මනස් වේදනාව හා යෙදුනාවූ ද්වේෂය හා එක්වූ සසංස්කාරික චිත්තය යන මොව්හුය. මෙහි දෞර්මනස්‍යයයි ප්‍රකාශ කරණ ලද්දේ දුෂ්ටවූ සිත් ඇතියහුගේ ස්වභාවයි. නොහොත් සතෙහි ඇතිවන දුක් වේදනාවයි. ද්වේෂය නම් ක්‍රෝධයයි. එය හටගත් කල්හි ඒ හා යෙදෙන චිත්ත චෛතසිකයන්ටද හිංසාවකි. ක්‍රෝධය හෘදය වස්තුවෙහි හැපී දුමයද ගිනිගන්නා ලද්දක් මෙන් කරයි. දෞර්මනස් වේදනාවෙන් යුක්ත පුද්ගලයා දුර්මුඛ වෙයි, ඔහුගේ සිත වෙනස්වී මුහුණද විකාරවෙයි. මේ ද්වේෂයට “පටිඝ” යයි කියනු ලබන්නේ අරමුණෙහි හැපී වෙහෙසවී පවත්නා හෙයිනි. දෞර්මනස්‍ය ප්‍රතිඝයෙන් වෙන්ව නොයෙදේ. දෞර්මනස නම් නොකැමැති අරමුණු අනුභව කිරීම ලක්ෂණකොට ඇති වේදනාස්කන්ධයට ඇතුලත් ධර්මයකි. ප්‍රතිඝය නම් චණ්ඩ ස්වභාවය ලක්ෂණකොට ඇති සංස්කාරස්කන්ධයට ඇතුලත් එක්තරා ධර්මයකි.

සිත දෞර්මනස් සහගත වීමට හා පටිඝ සම්ප්‍රයුක්ත වීමට හේතු හතරකි. එනම්- ද්වේෂ අදහස් ඇති බව නව අසාත වස්තු අතුරෙන් යම් අනිෂ්ටාරම්මණයක් හා එක්වීම පසත් අදහස් ඇති බව හා තුඟත් බවයි.

දොම්නසින් හා පටිඝයෙන් යුක්තව ස්වභාවයෙන් තියුණුවූ තමන් විසින් හෝ අනුන් විසින් නොමෙහෙයන ලද සිතින් ප්‍රාණඝාතාදිය කරණ කල්හි පළමුවැනි දොසමූල චිත්තය උපදී.

දොම්නසින් හා ප්‍රතිඝයෙන් යුක්තව ස්වභාවයෙන් නොතියුණු වූ තමන් විසින් හෝ අනුන් විසින් නොමෙහෙයන ලද සිතින් ප්‍රාණඝාතාදිය කරණ කල්හි දෙවැනි දොසමූල අකුසල චිත්තය උපදී.

“විත්තදෙසං විත්තං” යනුවෙන් වදාරා තිබෙන්නේ ද්වේෂ රහිත සිත් සමූහයයි එනම්- ලෞකික කුශල අව්‍යාකෘත සිතයි.

මෝහසහගත සිත් දෙකනම්-

උපෙක්ෂා වේදනාවෙන් යුක්තවූ විචිකිච්ඡාව හා එක්ව යෙදුනාවූ සිත හා උපෙක්ෂා වේදනාවෙන් යුක්තවූ උද්ධච්චය හා එක්ව යෙදුනාවූ සිතයි.

ධර්ම ස්වභාව සොයන්නහුගේ මෙහෙයීමට කරුණුවූ සැකය විචිකිච්ඡා නම් වේ. ඥාන නමැති පිළියමින් පහවූ හෙයින් කරුණු සොයා ක්ලාන්ත වන ගතියයි.

බුදුන්, දහම්, සඟුන්, ශික්ෂා ප. භවයෙන් භවයට සැරිසරා ආ පූර්ව කෙළවර. භවයෙන් භවයට සැරිසරා යන්නාවූ අපර කෙළවර පූර්වාපර දෙකෙළවර යම් යම් හෙතු නිසා යම් යම් ඵල ඇතිවීයයි. කියන ලද ප්‍රතීත්‍ය සමුත්පාදය යන අට තැන සැක කිරීම විචිකිච්ඡා නම්.

මෝහමූල දෙවෙනි සිතෙහි සඳහන් උද්ධච්චය නම් සිත එක අරමුණෙක්හි පිහිටුවාගත නොහැකි වනසේ ඇතිවන නොසන්සුන් බවයි. මෙය ඇතිවූ කල්හි ඉවසීමක් නොමැත්තේය. දුරදිග නොබලා තදැවන පරුෂ වචන කියයි. මුහුනේ රතුපසු එබිකර ගති ඇතිවේ. සිතුවිලි ක්‍රියා හා වචනවල අගමුල නැත උතුමන්ට ඇවා ගැරහිය හැකිවන්නේ මේ චෛතසිකයේ බලයෙනි උද්ධච්චය සියලු අකුසල චිත්තයන් හා යෙදේ. ඒතාක් මේ සිතෙහිම බලවත්ය, මේ මෝහ මූල සිත් දෙක අන්‍යහෙතූන් හා මිශ්‍ර නොවූ බලවත් මෝහ හෙතුව සම්භව යෙදෙන බැවින් අතිශයින් අරමුණෙහි මුළාවෙයි. විචිකිච්ඡා ඖද්ධත්‍යයන් හා නිරන්තරයෙන් යුක්ත බැවින් අරමුණෙහි සැලෙන්නේ වෙයි. එහෙයින් උපෙක්ෂා සහගතම වෙයි. ඒ මෝහ මූලික චිත්තයාගේ කිසි කලෙකත් ස්වභාවයෙන් තියුණු බවක් නැත්තේය. අරමුණෙහි බැසගන්ට අසමර්ථ

බැවින් නිශ්චය නොකළැකි හෙයින්ද අරමුණෙහි වික්ෂිප්ත වන හෙයින්ද මේ චිත්තයන් දෙදෙනාගේ ස්වභාවයෙන් තියුණු බවක් හෝ උත්සාහ කටයුතු බවක් හෝ නැත්තේය. එහෙයින් මේ දෙසිත්හි සංස්කාර භේදයක් නැත්තේය. මේ දෙසිත සොම්නස් දොම්නස් වේදනාවන් සමග නොයෙදේ උපෙක්ෂා වේදනාව සමගම යෙදේ මේ මෝහ මූලික සිත්දෙක යම්කිසි ප්‍රයෝගයකින් තොරව ප්‍රකෘති ස්වභාවක්ම සත්වයන් තුළ ඇතිවේ.

උපෙක්ෂාවෙන් හා විචිකිච්ඡාවෙන් යුක්තව ස්වභාවයෙන් තියුණුවූ නොමෙහෙයන ලද සිතින් ප්‍රාණඝාතාදී අකුසලයක් කරණ කල්හි පළමුවැනි මෝහමූල අකුසල චිත්තය උපදී.

උපෙක්ෂාවෙන් හා උද්ධච්චයෙන් යුක්තව ස්වභාවයෙන් තියුණු වූ නොමෙහෙයන ලද සිතින් ප්‍රාණඝාතාදි අකුසලයන් කරණ කල්හි දෙවැනි මෝහමූල අකුසල චිත්තය උපදී,

“වීත මෝහං චිත්තං” යනුවෙන් වදාරණ ලද්දේ පහවූ මෝහයන් යුක්තවූ සිතයි හෙවත් ලෞකික කුසල අව්‍යාකෘත සිතයි.

“සංඛිත්තං වා චිත්තං” යනුවෙන් වදාරණ ලද්දේ ථීන මිද්ධය හා එක්ව යෙදුනාවූ හැකුළුනාවූ සිතයි. ථීන නම් සිතේ අලස භාවයයි. චිත්තයාගේ අරමුණු ගැන්මෙහි බලවත් භාවය මද මද කොට පසුබැස්වීමයි. චිත්තයාගේ දුර්වලත්වය ඇතිවන්නේ එවිටය. මේ චෛතසිකයෙන් යුත් තැනැත්තා මන්දෝත්සාහිකයෙක්වේ යම් චෛතසිකයක උත්සාහ රහිතබව ලක්ෂණකොට ඇත්තේද වීර්‍යය දුරුකිරීම කෘත්‍යකොට ඇත්තේද නුනුවතින් මෙනෙහිකිරීම ආසන්න කාරණා කොට ඇත්තේද එය ථීනනමි. ඒ චෛතසිකය හැම කල්හිම කුශල ධර්මයන්හි සිත පසුබස්වයි, හකුළුවයි.

මිද්ධය නම් චෛතසික ධර්මයන් කර්මයට නොපොහොනවුන් කොට හිංසාකරලන ශක්තියයි. මේ චෛතසිකය උපන්කල්හි රූප ශබ්දාදි අරමුණු හැඳිනීම ඉන් ඇතිවන සැපදුක් සොම්නස් දොම්නස් වශයෙන් විඳීම කුසල් රැස්කිරීම දුබල කරලයි නොහොත් වේදනා සංඥා සංස්කාර යන ස්කන්ධ තුන අලස බවට පත්කරයි. මිද්ධය තෙමේ කර්මයට නොපොහොනා බව ලක්ෂණ කොට ඇත්තේය. සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ බැඳීම කෘත්‍යකොට ඇත්තේය, අරමුණෙහි හැකිළෙන බව හෝ කෘත්‍ය කොටවූ

ඇත්තේය. කුසල ධර්මයන්හි නො ඇලීමයයි කියන ලද අරතියද සමථ විදර්ශනා සංඛ්‍යාත අධිකුසලයෙහි අලසබවයයි කියන ලද තන්ද්‍රියද ඇඟමැලිකිරීමයයි කියන ලද විජම්භිතාවද යනාදී ධර්ම නුනුවණින් මෙනෙහි කරනැණීම ආසන්න කාරණාකොට ඇත්තේය.

ථින චෛතසිකය උපන්කල සිත් සමූහය අලසවෙයි. මිද්ධ චෛතසිකයෙන් අද්‍රව්‍ය ස්කන්ධ තුන අලස වෙත්. ඉන් සිරුරත් අලස බවට පත්වෙයි. යමෙක් කැමකා බඩපිරී ඉන්නේවීද, එවිට ඔහු වෙත ථින චෛතසිකය ලංවී ඔහුගේ සිත් අලස භාවයට පමුණුවයි. නැවත ටික ටික ථිනය දියුණුවත්ම ඇස්දෙක පියවී ගෙණයයි. එවිට මිද්ධ චෛතසිකය ලංවී අනිත් ස්කන්ධත්‍රය අලස කරවයි. එවිට නිද්‍රිබර ගතිය වැඩිවෙයි. රූප කය ඊට යටත්වූවා හාම ඇඳේ දිගාවී නිදයි මෙලෙසින් මේ ථිනමිද්ධ චෛතසික දෙක හා එක්ව යෙදුන චිත්තයට කැකුළුනාවූ සිත යයි කියන ලද්දේය.

“වික්ඛිත්තං චිත්තං” යනුවෙන් ප්‍රකාශ කරණ ලද්දේ ඖද්ධත්‍ය සහගතවූ සිතයි. මීට මුලින් මෝහ මූලික සිත් විස්තර කරණ අවස්ථාවෙහිදී එය දක්වන ලද්දේය.

“මහග්ගතං චිත්තං” යනුවෙන් ප්‍රකාශ කරණ ලද්දේ රූපාවචර අරූපාවචර චිත්තයයි.

රූපාවචර කුසල් සිත් පසකි. එනම්– විතර්කය, විචාරය, ප්‍රීතිය සුඛය, එකාග්‍රතාය යන අඞ්ග පසින් යුතකවූ ප්‍රථමධ්‍යාන කුසල චිත්තය, විචාරය, ප්‍රීතිය, සුඛය, එකාග්‍රතාය යන අඞ්ග සතරින් යුක්තවූ ද්විතීය සඞ්ඛ්‍යාත කුශල චිත්තය, ප්‍රීතිය, සුඛය, එකාග්‍රතාය, යන අඞ්ග තුනකින් යුක්තවූ තෘතීයධ්‍යාන කුශල චිත්තය සුඛය, එකාග්‍රතාය යන අඞ්ග දෙකින් යුතකවූ චතුර්ථධ්‍යාන කුශල චිත්තය උපෙක්ෂාවය, එකාග්‍රතාය යන අඞ්ග දෙකින් යුක්තවූ පඤ්චමධ්‍යාන කුසල චිත්තය යන පසයි.

විතර්ක විචාර ප්‍රීති සුඛ එකාග්‍රතා යන චෛතසික වෙන් වෙන් වශයෙන් ධ්‍යානය පිළිබඳ අවයවයයිද ඒ ධ්‍යානාඞ්ගයන්ගේ සමූහය ධ්‍යානයයිද කියනු ලැබේ. ඔවුන් අතුරෙන් චිත්ත චෛතසික ධර්මයන් අරමුණුව නංවන්නේ විතර්කයයි. පිටිසර ගම්වැසියෙකුට රජ මාළිගාව දක්වීම මෙනි. පිටිසර ගම්වැසියා රජමාළිගාව යනු කැමැති වූවත් මුරකරුවාගේ සහාය නැතිව

නොහැකිය මුරකරු තෙම ගම්වැසියා මාලිගයට පමුණුවයි. මෙහි ගම්වැසියා මෙන් චිත්තචෛතසික ධර්මද මුරකරුවාමෙන් විතර්කයද මාලිගාව මෙන් ධ්‍යානයද දතයුතුයි ඒ විනර්කය විසින් නංවන ලද චිත්තචෛතසික ධර්මයන් හැසිරවීම් සවභාව විචාරනම්. රජහු මුහුන හැඳින පිටිසර වැසියන් රජගෙහි හැසිරීමක් සෙයින් අරමුණු පිරිමදිනා ගතියයි. ආරම්මණ රසයෙහි චිත්ත චෛතසික ධර්මයන් පිණවන සවභාවය ප්‍රීති නම් වේ. අරමුණෙහි සම්ප්‍රයුක්ත ධර්මයන් සුවපහසු විඳින සවභාව සුව නම් වේ. නානාරම්මණයන්හි වික්ෂේපවිය නොදී එක අරමුණෙක්හි සම්ප්‍රයුක්ත ධර්මයන් පිහිටුවන සවභාව එකාග්‍රතා නම්

"ආරම්මණං උපගන්ත්වා ඣායති උපනිජ්ඣායතීති ඣානං,
පච්චනීකධම්මෙ ඣාපෙතීතිවා ඣානං"

යනු නීම්වන හෙයින් කසිණාදී අරමුණු කරා එළඹ චින්තනය කරයි නොහොත් කාමච්ඡන්දාදිවූ ප්‍රතිවිරුඬ ධර්මයන් දවයි යන අර්ථයෙනුත් මේ ධර්මපඤ්චකය ධ්‍යාන නම් වේ.

විතර්කය තෙම සිත ථීන මිද්ධයාගේ වශයෙන් පසුබස්නට ඉඩ නොදේ. එය ථිනමිද්ධ නීවරණයට ඉඳුරාම විරුඬය! විචාරය තෙම සිත කම්පාවන්ට ඉඩ නොදී දැඩිව අරමුණෙහි ලුහුබැඳීම කෙරෙයි. ප්‍රඥ ප්‍රතිරූපකවූ එය විචිකිච්ඡා නිවරණයට ඉඳුරාම විරුඬය. ප්‍රීතිතොමෝ සිත කලකිරෙන්ට ඉඩනොදී අරමුණෙහි සන්තෘෂ්ටිය ඇතිකරයි. ඕ තොමෝ ව්‍යාපාද නීවරණයට ඉඳුරාම විරුද්ධය. සුඛය සිත නොසංසිඳෙන්ට ඉඩනොදී අරමුණෙහි ආසවාදය ඇති කරයි. හේ උද්ධච්චකුක්කුච්චනීවරණයට ඉඳුරාම විරුඬය. උපෙක්ෂා වද ශාන්ත සවභාව ඇති හෙයින් සුඛයෙහිම සංග්‍රහ කරණ ලදී. විතර්කාදි ධර්මයන් තමන්ගේ ලක්ෂණවලින් පවත්නා කල්හි ප්‍රතිවිරුඬවූ නීවරණ ධර්මයෝ නැගිටින්ට අවකාශ නොලබති. ඔව්හු දවා භෂ්ම කරණ ලද්දාහු වෙති එහෙයින් විතර්කාදි ධර්මයෝ ප්‍රතිවිරුඬ ධර්මයන් දවන අර්ථයෙන්ද ධ්‍යානයයි කියනලදහ.

ධ්‍යානය ආරම්මණොපධ්‍යානයයි දෙවැදෑරුම් වෙයි එහි අටවැදෑරුම් වූ නවවැදෑරුම්වූ සමාපත්තිහු කසිණාදි ආරම්මණය උපනිධ්‍යානය (එළඹබැලීම) කරණ හෙයින් ආරම්මණොපනිධ්‍යානයයිද විදර්ශනා මාර්ගඵලයෝ ත්‍රිලක්ෂණය උපනිධ්‍යානය කරණ හෙයින් ලක්ෂණොපනිධ්‍යානයයිද කියනු ලැබෙත්. මෙහි අදහස්කරණුයේ ආරම්මණොපනිධ්‍යානයයි එනම්- සිත එක අරමුණෙක්හි නිශ්චලව පිහිටුවීමය.

## අරූපාවචර කුසල් සිත්

ආකාසානඤ්චායතන කුසල චිත්තය. විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තය ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තය නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තයයි සතරාකාරයි.

ආකාසානඤ්චායතන— ආකාස × අනන්ත + ආයතන කියවේ. මෙහි ආකාසය වනාහි අජටාකාසය පරිච්ඡින්නාකාසය කසිණුග්ඝාටිමාකාසය රූපපරිච්ඡේදාකාසයයි සිවුවැදෑරුම්වේ එයින් අජටාකාසය වාතපාලොවෙන් යටත් භවාග්‍රයෙන් උඩත් ද්‍රව්‍යයෙන් තොරවූ තන්හි පැතිර පවත්නා ආකාශයයි පරිච්ඡින්නාකාසය නම් භවාග්‍රයේ පටන් එක එක ලෝකයක් පාසා මායිම්ව තිබෙන අහසට කසිණුග්ඝාටිමාකාසය නම් කසිණ නිමිත්ත ඉක්මවා ලබන ලද අහසයි. රූපපරිච්ඡේදාකාශය නම් අටවිසිරූපයන්ගේ එකක් හා එකක අතර පිහිටි අහසයි.

මෙහි සිවුවැදෑරුම් ආකාශයන් අතුරෙන් මෙහි කසිණුග්ඝාටිමාකාශය අදහස් කරණ ලදී. ඒ කිසුණු ඉගුළු අහස අතරක් නැත්තාවූ අජටාකාශය හා එක්වූවාක් මෙන් අනන්තව පෙණෙන බැවින් උත්පාදනන්ත ව්‍යානන්ත සඞ්ඛ්‍යාන අනන්තයක් නැති බැවින් හෝ අනන්තාකාශයයි කියයුතු නමුත් නිරුක්ති නයින් ආකාසානඤ්ච යයි කියන ලදී. මේ කිසුණු ඉගුළු අහස මෙනෙහි කරන්නාවූ යොගාවචර තෙම ඒ ආකාශයාගේ පරිච්ඡේද සංඛ්‍යාන අනන්තය නොගණී එනකුදු උවත් රූපයෙන් වෙන්කළ මාත්‍රයක් ගැණීමෙන් අනන්ත බව පැතිරවීම් ආකාරයෙන්ම පරිකර්ම මනස්කාරය පවත්වයි. එහෙයින් උත්පාදන්ත ව්‍යාන්ත නැති බැවින් අනන්ත හෙයින් මෙනෙහි කිරීම් වසයෙන්ම මේ කිසුණු ඉගුළු අහස අනන්තයයි දතයුතුයි, යම්සේ දෙවියන්ට අධිෂ්ඨාන වස්තුව දෙවායතනයයි කියනු ලබන්නේද එමෙන් ආකාසානඤ්චායම (එය අරමුණුකොට උපදනා සම්ප්‍රයුක්ත ධර්මසහිත) ධ්‍යානයට ආධාරස්ථානය වන බැවින් ආකාසානඤ්චායතනයයි කියනු ලැබේ එනම්- කසිණුග්ඝාටිමාකාසයමැයි. එය අරමුණුකොට "අනන්තො ආකාසො අනන්තො ආකාසො" අනන්තාකාසය අනන්තාකාසය භාවනා කරන්නහුගේ එම භාවනාව අර්පිණ අවස්ථාවට පැමිණීමෙන් පහළවන ආකාසානඤ්චායතන ධ්‍යානය හා යෙදී උපදින කුසල් සිත ආකාසානංචායතන කුසල චිත්තයයි.

විඤ්ඤාණඤ්චායතන යන මෙහි විඤ්ඤාණමෙව අනන්තං විඤ්ඤාණානන්තං යනුවෙන් අනන්තවූ විඤ්ඤාණයම විඤ්ඤාණානන්තයයි කියනු ලැබේ. එහි උත්පාදස්ථිති භඞ්ගයන් පෙනෙති

එසේනම් කුමක් හෙයින් අනන්තනම් වන්නේද? අනන්ත වශයෙන් අරමුණු කරණ ලද අහසෙහි උපදනා තමන් අරමුණු කොට උපන් භාවනාවගේ උත්පාදද්දී අන්තය නොගෙණ අනන්ත වශයෙන් පැතිරීම නිසා අනන්තයයි කියනු ලැබේ. අනන්තාකාශය අරමුණුකොට පවත්නා විඤ්ඤාණය අනන්ත විඤ්ඤාණ නම් වේය. යට දැක්වූ නයින් එය විඤ්ඤාණඤ්චායතනයයිද ධ්‍යානයට ආධාරස්ථානය වන බැවින් විඤ්ඤානංචායතනයයිද කියනු ලැබේ. එනම් ආකාශානංචායතන චිත්තයයි, එය අරමුණු කොට "විඤ්ඤාණං අනන්තං විඤ්ඤාණං අනන්තං" විඤ්ඤාණය අනන්තය විඤ්ඤාණය අනන්තයයි භාවනා කරන්නහුන් එම භාවනාවට සුදුසු අර්පණා අවස්ථාවට පැමිණීමෙන් පහළ වන විඤ්ඤාණංචායතන ධ්‍යානය හා යෙදී උපදින කුසල් සිත විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තයයි.

තුන්වැනි අරූපාවචර චිත්තය ආකිඤ්චඤ්ඤායතන නමි. මෙහි කිංචන ශබ්දයෙන් ස්වල්ප මාත්‍රයක් යන අර්ථය කියයි. මේ සිතට කිසිවක් නැත. යටත් පිරිසෙයින් භඞ්ග මාත්‍රයකුදු නැත යනු "ආකිංචන" යන්නෙහි අදහසයි. කිසිවක් නැතිබව ආකිඤ්චඤ්ඤ නම්. ආකාසානංචායතන චිත්තයාගේ කිසිවක් නැතිබව යනු භාවනානුයෝගියා විසින් කල්පනා කොට ගන්නා ලද අභාව ප්‍රඥප්තියයි. එය අරමුණුකොට "නත්ථි කිඤ්චි නත්ථි කිංචි" කිසිවක් නැත කිසිවක් නැතැයි භාවනා කරන්නහුගේ එම භාවනාව සුදුසු පරිදි අර්පණාවස්ථාවට පැමිණීමෙන් පහළවන ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය හා යෙදී උපදින කුසල් සිත ආකිංචඤ්ඤායතන කුසල චිත්තයයි.

හතරවෙනි අරූපාවචර චිත්තය නෛවසඤ්ඤානාසඤ්ඤායතනයයි මෙහි නෛවසඤ්ඤ නම් ඖදාරික සංඥාවක් නැත යන අර්ථයි. (න—න—සඤ්ඤා) නාසඤ්ඤා නම්. සඤ්ඤාවක් නැත්තේ නොවේ, සූක්ෂ්ම සංඥාවක් ඇත්තේය යන අර්ථයි. සම්ප්‍රයුක්ත ධර්ම සහිත) යම් ධ්‍යානයකට ඖදාරික සංඥාවක් නැත්තේද සූක්ෂ්ම සංඥාවක් පමණක් ඇත්තේද එය නෛවසඤ්ඤා නාසඤ්ඤා නම්. එයම විශේෂ සුඛයන්ට ආධාරස්ථාන වන බැවින් නෛවසඤ්ඤා නාසඤ්ඤා නමි· ආකිංචඤ්ඤායතන චිත්තය අරමුණු කොට සන්තමෙතං මෙය ශාන්තය මෙය ප්‍රණීතයයි භාවනා කරන්නහුගේ එම්භාවනාව සුදුසු පරිදි අර්පණා අවස්ථාවට පැමිණීමෙන් පහළවන නෛවසඤ්ඤානාසඤ්ඤාධ්‍යානය හා යෙදී උපදින කුසල් සිත නෛවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තයයි.

"අමහග්ගතං චිත්ත' යනුවෙන් වදාරණ ලද්දේ කාමාවචර සිතයි. එනම්- රූපාවචර අරූපාවචරයන්හි මෙන් මහත් භාවයට නොගියාවූ සිතයි.

"සඋත්තරං චිත්තං" යනුවෙන් වදාරණ ලද්දේ වැඩියක් සහිත වූ සිතයි හෙවත් කාමාවචර සිතයි. කාමාවචර කුසල් සිත් අටකි. එනම්- සොමනසින් හෙවත් මානසික සුඛවේදනාවෙන් යුක්තවූ නුවණ හා එක්ව යෙදුනාවූ මෙහෙයුම් රහිතවූ එක් සිතෙක. එසේම මෙහෙයුම් සහිතවූ එක් සිතෙක. සොම්නසින් හෙවත් මානසික සුඛවේදනාවෙන් යුක්තවූ නුවණ හා එක්ව නොයෙදුනාවූ මෙහෙයුම් රහිතවූ එක් සිතෙක එසේම මෙහෙයුම් සහිතවූ එක් සිතෙක. උපෙක්ෂා වේදනාවෙන් යුක්තවූ නුවණ හා එක්ව යෙදුනාවූ මෙහෙයුම් රහිතවූ එක්සිතෙක, එසේම මෙහෙයුම් සහිතවූ එක් සිතෙක. උපෙක්ෂාවේදනාවෙන් යුක්තවූ නුවණ හා එක්ව නොයෙදුනාවූ මෙහෙයුම් රහිතවූ එක් සිතෙක. එසේම මෙහෙයුම් සහිතවූ එක් සිතෙකැයි යන මොනු අටදෙනා කාමාවචර කුසල චිත්තයෝ නම් වෙති. මෙය මහා කුසල නාමයෙන්ද හඳුන්වනු ලැබේ.

මහා කුසල චිත්තය සෞම්නස් සහගතවීමට කාරණු සයකි.

එනම්- සොමනස්ස පටිසන්ධි ඇතිබව ශ්‍රද්ධාව බහුල කොට ඇති බව පිරිසිදු සම්‍යක් දෘෂ්ටිය ඇති බව කුසල කර්මයෙහි අනුසස් දැකීමය දානවස්තු ප්‍රතිග්‍රාහකාදී ඉෂ්ටාරම්මණය හා එක්වීමය. පීඩා රහිත බවය යන මොහුය.

මහා කුසල චිත්තය ඥාණසම්පයුත්තවීමට කාරණු සයකි. එනම්= ත්‍රිහෙතුක ප්‍රතිසන්ධිය ඇතිබව දොම්නස් නැති භවයක ඉපදීමය. ඉඳුරන් මුහුකිරීමය, කෙලෙසුන් කෙරෙන් දුරුවීමය. නුවණ වැඩෙන කටයුතුය යන මොව්හු වෙත්.

මහා කුසල චිත්තය උපෙක්ෂාසහගතවීමට කාරණු සයකි, එනම්- උපෙක්ෂා සහගත ප්‍රතිසන්ධියෙන් යුක්ත බව ශ්‍රද්ධාව මඳ බව දෘෂ්ටිය අපිරිසිදු බව කුසල කර්මයෙහි අනුසස් නොදැකීමය මධ්‍යස්ථාරම්මණය හා එක්වීමය පීඩා සහිත බවය යන මොව්හුය.
මහ කුසල් සිත අසංඛාරික වීමට කාරණු සයකි.

අසංඛාරික කර්මයන් හටගත් ප්‍රතිසන්ධි ඇති බවය. පුනී පුනී භවයන්හි පින්කොට පුරුද්ද ඇතිබවය; සුදුසු සෘතු භෝජනාදීන්ගේ උපකාරයෙන් කාය චිත්ත දෙක සුවපත් බවය. නුවණ මෝරන වයසට පැමිණීමය. ශ්‍රද්ධා ප්‍රඥාවන් සම්පූර්ණ වීමය.

ශ්‍රද්ධා ප්‍රඥාවන් සම්පූර්ණවීමය සිතට ගැලපෙන දනවස්තු ආදිය හා ප්‍රතිග්‍රාහකයන් ලැබීමය යන මොව්හු වෙත්. මෙසේ මේ කාමාවචර කුසල් සිත් වේදනා ඥාන සංස්කාර යන මොවුන් ගේ වශයෙන් ප්‍රභෙදගතවී තිබෙන බැව් සැලකිය යුතුයි.

'අනුත්තරං චිත්තං" යනුවෙන් විදූරා තිබෙන්නේ රූපාවචර සිත හා අරූපාවචර සිතයි. එය මුලින් සඳහන් කරණ ලදී.

"සමාහිතං චිත්තං" යනුවෙන් දෙශනාකරණ ලද්දේ අර්පණා, සමාධියෙන් හෝ යුක්ත සිතයි. අර්පණා සමාධිය නම් පඤ්චනීවරණ යන් යටපත් කර කාමාවචරය ඉක්මි රූපාවචර අරූපාවචර යන්හි සිත පිහිටුවා ගැණීමෙන් ඇතිකර ගත් සමාධියයි. උප චාර සමාධිය නම් පංචනීවරණයන් යටපත්කර ධ්‍යාන සිත ඉපදීම දක්වා භාවනාකරගෙන යැමේදී ඇතිවන සමාධියයි. හෙවත් අර්පණාවට පූර්වභාග චෙතනාවයි.

"අසමාහිතං චිත්තං" යනු එසේ සමාධිගත නොවූ සිතයි. "විමුත්තං චිත්තං" යනු තදඞ්ග විමුක්ති විෂ්කම්භන විමුක්තීන් ගේ වශයෙන් නීවරණයන් කෙරෙන් මිදුනාසේ මනාවූ සිතයි. කුශල කර්මයක් කරණ විට ඊට ප්‍රතිපක්ෂ අකුශලයන්ගෙන් එවේලාවට පමණක් මත් මිදීමයි. දියසෙවෙල් තිබෙන ගඟකින් කවෙකු යනවිට දියසෙවෙල් අහකට යයි' නැවත නැවත ගවයා ගියපසු දියසෙවෙල් එක්වෙයි, එමෙන් යමකු දනක් දෙනවිට ඒ දනවස්තුව කෙරෙහි තිබෙන ලොභකම දුරන් වෙයි. එසේ ඒ ලෝභකම දුරන්වූයේ තාවකාලික වශයෙනි. එලෙසින් කෙලෙසුන්ගෙන් මිදීම තදඞ්ග විමුක්තියයි.

විෂ්කම්භන විමුක්තිය නම්- රූපාවචරාදිධ්‍යාන වැඩීමෙන් රාගාදි කෙලෙසුන් ඔබා තබා ඒ කෙලෙසුන්ගෙන් මිදීසිටීමයි එය තාවකාලික වශයෙන් කෙලෙසුන් මුද තැබීමක් නොව ධ්‍යාන බලය පවතින තුරුම කෙලෙසුන් මුද තැබීමයි ධ්‍යාන බලය නැතිවූ පසු නැවත කෙලෙස් ඇතිවිය හැකියි. එබැවින් එය සම්පූර්ණයෙන් කෙලෙසුන් නැතිකර ලීමක් නොව යටපත්කර තැබීමකි.

"අවිමුත්තං චිත්තං" යනු එසේ තදඞ්ග විමුක්ති විෂ්කම්භන විමුක්තීන්ගේ වශයෙන් නීවරණයන් කෙරෙන් නොමිදුනාවූ සිතයි.

චිත්තානුපස්සනාවෙහිදී සිත මෙසේ දෙලොස් අයුරකින් ප්‍රභෙදගත වූයේ වෙයි. එබැවින් යොගාවචර තෙම චිත්තසඞ්ඛ්‍යාත කර්මස්ථාන නිමිත්ත සෙවනය කරයි. භාවනා කිරීම් වශයෙන් වඩයි. නැවත නැවත සිහිකරයි. මොනවට නිශ්චය කරණ ලද් දක් කරයි. මෙසේ තමන්ගේ සිතෙහි මෙන් අනුන්ගේ සිතෙහිද

හැවත තමන්ගේ හා අනුන්ගේ සිතෙහිද මෙලෙසින් සිහිකර බලයි. මෙසේ සිහියෙන් චිත්තය විසිරයන්ට ඉඩ නොදී මනා කොට පිහිටුවාගෙන මෙනෙහිකර බැලිය යුතුයි. අවිද්‍යාදී හේතු ප්‍රත්‍ය බලයෙන් සිත හටගණීය. එසේ හටගත් සිත වැඩිකල් නොපවතී. ඒ හටගත්ක්ෂණයෙහිම නැතිවෙයි. මෙසේ හිත්ඇති වෙමින් නැති වෙමින් සන්තති වශයෙන් පවතිනු විනා සත්ව පුද්ගල ආත්මාදී වශයෙන් ගතයුතු කිසිවක් නැතැයි දතයුතුයි.

### චිත්තයාගේ පහළවීම.

අවිද්‍යාවන් හටගැණීමෙන් චිත්තයාගේ පහළවීම වේ. තෘෂ්ණාවගේම හටගැණීමෙන් චිත්තයාගේ පහළවීම වේ. කර්මයාගේ හට ගැණීමෙන් චිත්තයාගේ පහළවීම වේ. නාමරූප දෙදෙනාගේ හටගැණීමෙන් චිත්තයාගේ පහළවීම් වේයයි ප්‍රත්‍යවශයෙන් සතර ආකාරයකින්ද ලක්ෂණ මාත්‍ර වශයෙන් එක් (ආකාරයකින්දැයි පස් අයුරකින් චිත්තයාගේ පහළවීම දතයුතුය.

### චිත්තයාගේ නිරොධය.

අවිද්‍යාවගේ නිරොධයෙන් චිත්තයාගේ නිරොධය වේ. තෘෂ්ණාවගේ නිරොධයෙන් චිත්තයාගේ නිරොධය වේ. කර්මයාගේ නිරොධයෙන් චිත්තයාගේ නිරොධයවේ. නාමරූපයාගේ නිරොධයෙන් චිත්තයාගේ නිරොධය වේයයි. ප්‍රත්‍යයන්ගේ නොහට ගැණීම් බැලීම් වශයෙන් සතර අයුරකින්ද ලක්ෂණ මාත්‍රයම බැලීම වශයෙන් එක් අයුරකින්දැයි පස් අයුරකින් චිත්තයාගේ විනාශය දතයුතුයි.

### චිත්තය ත්‍රිලක්ෂණයට නගාබැලීම.

සරාග චිත්තිය යනාදී වශයෙන් වදාරණ ලද සිත් නාම ධර්මවේ. ඒ සිත් මෙනෙහි කරන්නාවූ සිහියද නාම ධර්මවේ. ඒ නාමධර්මයන්ගේ ක්ෂණයක් පාසා බිඳීම අනිත්‍ය ස්වභාවය. උත්පාද භඞ්ගයන්ගෙන් නොමිදීම දුඃඛස්වභාවයි. තමාගේ කැමැත්තට අනුව නොපැවැත්ම අනාත්ම ස්වභාවයි මෙසේ චිත්තය විදර්ශනාවට නගා බැලිය යුතුයි.

### චිත්තය සත්‍යඥාන වශයෙන් නගා බැලීම

රාග සහිත චිත්තය ආදී සිත් හා ඒ සිත් මෙනෙහිකර බලන සිහියත් යන නාමධර්මය දුඃඛසත්‍යය වේ. ඒ නාම ධර්මයන්ට හා සංසාර වෘත්තයම මූල හෙතුවූ තෘෂ්ණාව සමුදය සත්‍යය වේ. දුක්ඛයාගේ හා තෘෂ්ණාහුගේත් පැවැත්මක් නැති නිර්වාණධර්මය නිරොධ සත්‍යයවේ. ඒ දුක දැනගන්නාවූද සමුදය සඞ්ඛ්‍යාත තෘෂ්ණාව දුර ලන්නාවූද නිවන් අරමුණු කරන්නාවූද ආර්‍ය්‍යමාර්ගය තෙම මාර්ග සත්‍යයයි මෙසේ සිවුසස් වශයෙන් නුවණ මුදුන් පමුණුවා ගැණීමෙන් නිවන් සැප සාදාගැණීමට උත්සාහවත් විය යුතුයි.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

2492 ක්වූ උඳුවප් පුර එකොළොස්වක් ලත් ශනි දින රාත්‍රියෙහි මහගාලේ ශ්‍රී පුෂ්පාරාමියෙහිදී රත්දෙණේ ශික්ෂාලඞ්කාර විද්‍යාලයාධිපති "සිරි සද්ධම්ම වංසාලඞ්කාර විසුද්ධාචාර කවිධජ විනයාචරිය හක්මන සිරි සඞ්ඝතිස්ස නායක ස්ථවිර පාදයන් වහන්සේ විසින් පවත්වන ලද ධර්මදෙශනාව.

# ධම්මානුපස්සනා.

කථංච භික්ඛු අජ්ඣත්තං ධම්මෙසු ධම්මානුපස්සී විහරති! ඉධ භික්ඛු සන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං අත්ථි මෙ අජ්ඣත්තං කාමච්ඡන්දොති පජානාති. අසන්තං වා අජ්ඣත්තං කාමච්ඡන්දං නත්ථි මෙ අජ්ඣත්තං කාමච්ඡන්දොති පජානාති යථාච අනුප්පන්නස්ස කාමච්ඡන්දස්ස උප්පාදො හොති' තඤ්ච පජානාති යථාච උප්පන්නස්ස කාමච්ඡන්දස්ස පහාණං හොති. තඤ්ච පජානාති යථාච පහීණස්ස කාමච්ඡන්දස්ස ආයතිං අනුප්පාදො හොති තඤ්ච පජානාති, සන්තං වා අජ්ඣත්තං ව්‍යාපාදං -පෙ- සන්තං වා අජ්ඣත්තං ථිනමිද්ධං -පෙ- සන්තං වා අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චස්ස -පෙ- සන්තං වා අජ්ඣත්තං විචිකිච්ඡං අත්ථි මෙ අජ්ඣත්තං විචිකිච්ඡාති පජානාති අසන්තං වා අජ්ඣත්තං විචිකිච්ඡං නත්ථි මෙ අජ්ඣත්තං විචිකිච්ඡාති පජානාති යථාච අනුප්පන්නාය විචිකිච්ඡාය උප්පාදො හොති තංච පජානාති යථාච උප්පන්නාය විචිකිච්ඡාය පහාණං හොති තංච පජානාති යථාච පහීණාය විචිකිච්ඡාය ආයතිං' අනුප්පාදො හොති තංච පජානාති.

පින්වත්නි! දැන් මේ පාඨය මා මාතෘකා කළේ අද දෙශනා කිරීමට නියමිත "ධර්මානුපස්සනා" සතිපට්ඨානය විස්තර කිරීමටයි. මේ පාඨය අභිධර්ම පිටකයට අයත් විභඞ්ග ප්‍රකරණයෙහි සති පට්ඨාන විභඞ්ග සූත්‍රාන්ත භාජනීයෙහි ආ පාළි ප්‍රදෙශයෙකි. එය සතොසා ඇසිය යුතුයි.

"සතිපට්ඨාන" යන්නෙහි තේරුම පළමු ධර්මදෙශනාවෙහි විස්තර කළ ක්‍රමයෙන් දත යුතුයි. තව්තිසා දෙව්ලොව සක්දෙව් රජහුගේ පඬුඇඹුල් සලස්නෙහි වැඩහිඳ මාතෘදිව්‍යරාජයා ප්‍රධාන

දෙවියනට විජම් වදාරණ බුදුරජාණන් වහන්සේ කායානුපස්සනා සතිපට්ඨානයෙන් රූපස්කන්ධ පරිග්‍රහ (රූපස්කන්ධ සන්මර්ශනයද වේදනානුපස්සනා සතිපට්ඨානයෙන් වේදනාස්කන්ධය සන්මර්ශනය කිරීමද චිත්තානුපස්සනා සතිපට්ඨානයෙන් විඥානස්කන්ධය සන්මර්ශනය කිරීමද, වදාරා සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ වශයෙන් සංඥාස්කන්ධය සංස්කාරස්කන්ධයන්ගේ පිරිගාව මෙනෙහි කිරීමද) දක්වනු වස් ධම්මානුපස්සනා සතිපට්ඨානය වදාළසේක.

**එහි ලුහුඬු තේරුම්:-**

කෙසේනම් මහණතෙම අධ්‍යාත්මික (තමාපිළිබඳ) වූ සංඥාස්කන්ධය සංස්කාරස්කන්ධ ධර්මයන්හි ධර්මයන් අනුව බලමින් වාසය කෙරේද? මේ සස්නෙහි යොගාවචරතෙම ස්වසන්තානයෙහි (විටින් විට පැවතීම් විසින් ඇත්තාවූද කාමච්ඡන්දය (කාමාශාව) මාගේ සන්තානයෙහි කාමච්ඡන්දය ඇතැයි ප්‍රකර්ෂයෙන් දැන ගන්නේය. සියසතන්හි (නොහැඟීම් වශයෙන් හෝ පහව ගිය බැවින් හෝ) අවිද්‍යමානවූද කාමච්ඡන්දය මා සතන්හි කාමසඳ නැතැයි විශෙෂයෙන් දැනගන්නේය. යම් ප්‍රකාරයකින් නො උපන් කාමසඳය ඉපදීම වේද? එයද විශෙෂයෙන් දැනගණී. යම් කාරණයකින් උපන් කාමච්ඡන්දය ප්‍රහාණය වේද ඒ කාරණයද විශෙෂයෙන් දැනගණී. යම් කාරණයකින් ප්‍රහීණ වූ කාමච්ඡන්දයගේ මත්තෙහි නො ඉපදීම වේද? එයද විශෙෂයෙන් දැනගණී. තමාකෙරෙහි විද්‍යමානවූ ව්‍යාපාදයද -පෙ- තමා කෙරෙහි විද්‍යමානවූ උද්ධච්චකුක්කුච්චයද -පෙ- සිය සතන්හි ඇත්තාවූ විචිකිච්ඡාව (සැකය) ද අධ්‍යාත්මයෙහි මාගේ විචිකිච්ඡාව ඇතැයි විශෙෂයෙන් දැනගණී. තමාතුළ නැත්තාවූ සැකය මා තුළ සැකය නැතැයි විශෙෂයෙන් දැනගණී. යම් කාරණයකින් නො උපන් සැකය ඉපදීම වේද ඒ කාරණයද විශෙෂයෙන් දැනගණී. යම් කාරණයකින් උපන් සැකය හැගීම වේද එයද විශෙෂයෙන් දැනගණී යම් කාරණයකින් ප්‍රහීණවූ සැකයගේ මත්තෙහි නොහටගැණීම වේද ඒ කාරණයද විශෙෂයෙන් දැනගණී. මේ කියන ලද්දේ මැයෙහි පදනුගත භාවයයි.

"තත්ථ කතමො කාමච්ඡන්දො? යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දි කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං අයං වුච්චති කාමච්ඡන්දො- යන්නෙන් කාමච්ඡන්දය දෙශනා කරණ බුදුන් වහන්සේ එහි කාමසඳ කවරේද? (රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ සංඛ්‍යාත) පඤ්චකාම ගුණයන්හි යම් කාම සංඛ්‍යාත ඡන්දයක් කාමරාගයක් කාමසන්තොෂයක් කාමතෘෂ්ණාවක් කාමස්නෙහයෙක් කාමපරිදාහයෙක් කාමමූර්ඡාවක් කාම වශයෙන් බැස ගැන්මක් වේද මේ කාමච්ඡන්දයයි වදාළ සේක,

**"සන්නිමිත්තා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා නො අනිමිත්තා"** යි වදාළ බැවින් කාමච්ඡන්දාදි ලාමක අකුසල ධර්මයෝ නිමිත්තක් [ප්‍රත්‍යයක්] ඇත්තාහු උපදිතියි වදාළහ. කාම ච්ඡන්දය ඉපැදීමට නිමිත්ත ශුභාරම්මණය යි, එහෙයින් සර්වඥයන් වහන්සේ අංගුත්තර සඟියෙහි:- **"නාහං භික්ඛවෙ එක ධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නො වා කාමච්ඡන්දො උප්පජ්ජති උප්පන්නො වා කාමච්ඡන්දො, භිය්‍යොභාවාය වෙපු- ල්ලාය සංවත්තති යථයිදං භික්ඛවෙ සුභනිමිත්තං"** යන්නෙන් මහණෙනි! යම් හෙතුවකින් නො උපන්නාවූද කාමච්ඡන්ද නීව රණය උපදී ද උපන්නාවූ ද කාමච්ඡන්දනීවරණය බොහෝ බව (නැවත නැවත වීම) පිණිස විපුලත්වය (රැස්වීම) පිණිස පවතීද යම් මේ ශුභ නිමිත්තක් වේද මෙයින් අන්‍ය වූ එකද කාරණ යක් මම නුවණැසින් නොම දක්නෙමියි වදාළසේක. මෙහි කාම රාගයන් රාගය ඉපදීමට හෙතුවූ රූපාදි අරමුණුත් ශුභ නිමිත් තයයි අදහස් කරණ ලදී.

ඒ ශුභ නිමිත්තෙහි අයොනිසොමනස්කාරයෙන් කාමච්ඡන්ද යාගේ ඉපදීමවේ. අයොනිසොමනස්කාරය නම් අනිත්‍යයෙහි නිත්‍ය කියා හෝ අනාත්මයෙහි ආත්මය කියා හෝ අශුභයෙහි ශුභය කියා හෝ අනුපායමනස්කාරයයි (නොමඟ මෙනෙහි කිරීමයි.) ඒ ශුභ නිමිත්තෙහි අයොනිසොමනස්කාරය බොහෝසේ පුරුදු කිරීමක් වේද, මේ ප්‍රත්‍යය නො උපන් කාමඡන්දේ ඉපැදීම පිණිසද උපන් කාමඡන්දයගේ නැවත නැවත වැඩීම පිණිසද විපුලත්වය පිණිසද පවතී ඒ මේ ඉපැදීම වනාහී සිත්සතන්හි නොපැමිනීම් වශයෙන් හෝ පෙර නොලැබූ අරමුණක් ලැබීමෙන් හෝ නො උපන් කෙ- ලෙස් උපදී. අනික් ප්‍රකාරයකින් අනවරාග්‍ර සංසාරයෙහි නො උපන් කෙලෙශයෙක් නම් නැත එහි සමහර කෙනකුට වත්පිළි වෙත් වශයෙන් ද ඇතමෙකුට ග්‍රන්ථ විශයෙන් ද සමහරෙකුට ධූතාඞ්ග වශයෙන් ද සමහරෙකුට සමාධි වශයෙන් ද සමහරෙකුට විදර්ශනා වශයෙන් ද සම්හරෙකුට නවකර්ම වශයෙන් ද සමහරෙ කුට භව වශයෙන් ද කෙලෙස් නො උපදී. ඒ කෙසේද? සමහර කෙනෙක් සම්පූර්ණවත් ඇත්තේ වෙයි. දෙයාසූවක් කුඩාවත්ද ආචාර්‍ය්‍යවත් උපාධ්‍යායවත් චෛත්‍යාඞ්ගණවත් බොධ්‍යාඞ්ගණ වත් පානියමාළකවත් උපොසථාගාරවත් ආගන්තුක වත් ගමිකවත් ගිලන්වත් ග්ලානොපස්ථායක වත් වැසිකිළි වත් කෙසකිළි වත් ආදී තුදුස් මහවත් ද කරන්නාවූ ඔහට කෙලෙස් අවකාශ නො ලබයි. මෑතභාගයෙහි වනාහි වත් සැපයීම හැරදමා බුන්වත් ඇතිව හැසිරෙන්නාවූ ඔහුගේ අයොනිසොමනස්කාරයවද සිහිය

විසුරුවීමට ද පැමිණ කෙලෙස් උපදී. මෙසේත් අසමුදාචාර වශයෙන් නූපන් කෙලෙස් උපදින්නේ වෙයි. සමහර කෙනෙක් ගුරු පුහුණු කිරීමෙහි යෙදුනේ වේ. එක් සතියක් හෝ දෙකක් තුනක් සතරක් හෝ සති පසම හෝ ඉගෙණ ගණිද තෙවලා බුදුවදන් අර්ථ වශයෙන් පාළි වශයෙන් අනුසන්ධි වශයෙන් පූර්වාපර වශයෙන් ඉගෙණ ගන්නාවූ ද හදරන්නාවූ ද කියවන්නාවූ ද අරුත් පවසන්නාවූ ද ඕහුගේ කෙලෙස් (ඉපදීමට] ඉඩ නොලබයි. මෑතභාගයෙහි ගුරු කර්ම හැරපියා කුසීතව හැසිරෙන්නාවූ ඔහුට අයොනිසොමනස්කාරයෙන් හා සිහියෙන් තොරව විසීමට පැමිණ කෙලෙස් උපදී. මෙසේද නොපැමිනී කෙලෙස් උපදින්නේ වෙයි.

සමහර කෙනෙක් ධුතඟ දරන්නේ වේද පාංශුකූලිකාඞ්ගාදී තෙළෙස් ධුතඟ ගුණයන් සමාදන්ව පම්තීද ධුතගුණ පරිහරණය කරන්නාවූ ඔහුගේ කෙලෙස් අවසර නොලබයි. මෑත භාගයෙහි ධුතඟ හැර දමා ප්‍රත්‍යය බාහුල්‍යය (සිවුපසය බොහෝසේ ලබා ගැණිම) පිණිස පෙරළී හැසිරෙන්නාවූ ඕහට අයොනිසොමනස්කාරය හා සමෘති විප්‍රවාසයට පැමිණ කෙලෙස් උපදී. මෙසේත් අසමුදාචාර වශයෙන් නො උපන් කෙලෙස් උපදනේ වේ.

සමහර කෙනෙක් පුරුදු වසඟ ඇත්තේ වේද ප්‍රථමධ්‍යානාදීයෙහි ආවර්ජනාදි පංචවශීන්ගේ වශයෙන් වසන්නාවූ ඕහට කෙලෙස් අවකාශ නොලබයි. මෑතභාගයෙහි පිරිහුණු දැහැන ඇත්තාවූ හෝ ගණසඞ්ගණිකාදීයෙහි ගෙදි වසන්නාවූ හෝ ඔහුගේ අයොනිසොමනස්කාරයට හා සිහියෙන් වෙන්ව විසීමටද පැමිණ කෙලෙස් උපදී. මෙසේ ද අසමුදාචාර වශයෙන් නූපන් කෙලෙස් උපදින්නේ නම් වේ.

සමහර කෙනෙක් විදර්ශන වේද සත්වැදෑරුම්අනුපස්සනාවන්හි හෝ අටලොස් වැදෑරුම් මහ විදසුන්හි හෝ ක්‍රියා කරමින් මෙසේද ඔහුට කෙලෙස් අවකාශ නො ලබයි. මෑතකාලයෙහි විදර්ශනා කර්ම හැර කය දැඩිකිරීමෙහි බහුල පැවතුම් ඇතිව වසන්නාවූ ඔහුගේ අයොනිසොමනස්කාර ස්මෘතිවිප්‍රවාසයන් නිසා කෙලෙස් උපදී. මෙසේත් අසමුදාචාර වශයෙන් නූපන් කෙලෙස්, උපදනේ වේ.

සමහර කෙනෙක් නවකර්මයෙහි නියුක්ත වේද පොහොය ගෙවල් බොජුන් හල් ආදිය කරවාද ඊට ගෙබඩාල් දඹුපත් ආදිය (සොයාගැණීමට) සිතන්නාවූ ඕහට කෙලෙස් අවකාශ නො ලබයි. මෑතභාගයෙහි නවාම් නිමිකල්හි වේවයි හැරදමූ කල්හි වේවයි.

නුනුවණින් මෙනෙහි කිරීම හා සිහියෙන් වියොව විසීමද නිසා ඕ හට කෙලෙස් උපදී. මෙසේත් අසමුදාචාර වශයෙන් නූපන් කෙලෙස් උපදනේ වෙයි.

ඇතමෙක් බඹලොවින් ආ ශුඩ සත්ත්වයෙක් වේද ඕහට කාමසෙවනයක් නැති හෙයින් කෙලෙස් අවකාශ නොලැබෙයි. ඉන් මෙදතුරෙහි ලබන ලද සෙවනය ඇති ඕහට නුනුවණින් මෙනෙහි කිරීමත් සිහියෙන් වියෝව විසීමත් නිසා කෙලෙස් උපදී. මෙසේද අසමුදාචාර නො උපන් කෙලෙස් උපදිනබව දතයුතු.

අනනුභූතාරම්මණ වශයෙන් කෙසේ කෙලෙස් උපදීද යත්? ඇතමෙක් පෙර අනුභව නොකළ මනවඩන රූපාදි අරමුණක් ලැබද එහි නුනුවණින් මෙනෙහි කිරීමත් සිහියෙන් වියෝව විසීමත් නිසා ඕහට රාගය උපදී. මෙසේ අනනුභූතාරම්මණ වශයෙන් නූපන් කෙලෙස් උපදනේ වෙයි.

මෙහි නූපන්හයි කියයුතු බවට පැමිණි අකුශල ධර්මයෝ නම්! භූමිලබ්ධොත්පන්නයෝය, ආලම්බනාධිගෘහිතොත්පන්නයෝය, අවික්ඛම්භිතොත්පන්නයෝය, අසමූද්ඝාතිතොත්පන්නයෝයයි සිව්වැදෑරුම් වෙති. ඔවුන් අතුරෙන් "තාසු තාසු භූමිසු අසමුග්ඝාතගතාකිලෙසා භූමිලද්ධුප්පන්නං නාමාති සංඛං ගච්ඡන්ති" යන්නෙන් විදර්ශනාවට භූමිවූ අතීතාදි ප්‍රභේද ඇති පඤ්චස්කන්ධයන්හි අනුශයාවස්ථාවට පැමිණි කෙලෙස් ආර්‍ය්‍යමාර්ගයෙන් නොපහව ගියාහු වෙද්ද, ඔව්හු භූමිලබ්ධොත්පන්න නමැයි ගණනට යෙති· එක් වරක් ඇස් දල්වා අරමුණක් නිමිත්තක් ගත් කල්හි ආලම්බනාධිගෘහිත වන බැවින් සිහිකළ කළ විට කෙලෙස් නූපදිත්යයි නොකියයුතුද මාර්ගයෙන් පහනොකළ ඒ කෙලෙස් ආලම්බනාධිගෘහිතොත්පන්නයෝය, සමවතින් යට පත් නොකළ කෙලෙස් මෙනම් තැන නූපදින්නාහයි නොකියයුත්තාහුද, ඒ කෙලෙස් අවික්ඛම්භිතොත්පන්නයෝය, මාර්ගයෙන් සහමුලින් නොනැසූ කෙලෙස් බවගෙහි උපන්නාහට ද උපදිති. එහෙත් ඒ කෙලෙස් අසමූද්ඝාතිතොත්පන්නයෝය, මෙසේ උපන් කාමඡද ඈ කෙලෙසුන්ගේ ප්‍රහාණය වන අයුරු දත යුතුයි.

උපන් කාමච්ඡන්දයගේ ප්‍රහාණයවේ. යන්නෙහි අසුභ නිමිත්තෙහි යොනිසොමනස්කාරයෙන් ප්‍රහානයවෙයි. අශුභනිමිත්ත නම් දශ අසුභයන්හි අරමුණු සහිත ප්‍රථමධ්‍යානයයි- දශඅසුභයෝ නම්- 1. උද්ධුමාතකනය,= මැරී දවසක් ගිය ඉදිමුණු මළසිරුරය, 2. විනීලකය,= මැරී දෙදවසක් ගිය නිල්වූ මළසිරුරය, 3. විපුබ්බකය,= මැරී තුන්දවසක් ගිය නවදොරින් පූයා වැගිරෙන

මළසිරුර) ය. 4. විච්ඡිද්දක,= සොහොනෙහි දමන ලද ඇතුලත් සිදුරු ඇති මස් ලේ සහිත නහරින් බැඳුනු මළසිරුර) ය, 5. විකඛායිතක,= සොහොනෙහි දමන ලදුව බලු කැනහිල් ආදී සතුන් විසින් කනු ලබන මළසිරුර) ය; 6. වික්ඛිත්තක,= සොහොනෙහි කඩ කඩ කොට දමන ලද මළසිරුර) ය, 7. හතවික්ඛිත්තක,= කවුඩු පා වැනි ආකාරයෙන් ඇඟ දමන ලද මළසිරුර) ය, 8. ලොහිතක,= මස්කඩ නැමෙන් ලෙයින් වැකීගිය මළසිරුර) ය, 9. පුළුවක,= නොයෙක් පණුකැලින් ගැවසීගත් මළසිරුර) ය, 10. අට්ඨික,= සොහොනෙහි දමන ලද මස් ලේ නැති ඇටසැකිල්ල) ය, යන දශයයි. අශුභධ්‍යානයත් අශුභ නිමිත්තයි, අශුභාලම්බනයත් අශුභ නිමිත්ත නම්.

යොනිසොමනස්කාරය නම්:- උපාය මනස්කාරයයි, පත්මඟී මනස්කාරයයි, අනිත්‍යවූ ධර්මයෙහි අනිත්‍යය කියා හෝ දුඃඛවූ ධර්මයෙහි දුඃඛය කියා හෝ අනාත්ම වූ ධර්මයෙහි අනාත්ම යයි කියා හෝ අශුභවූ ධර්මයෙහි අශුභයයි කියා හෝ මෙනෙහි කිරීමයි ඒ යොනිසොමනස්කාරය ඒ අශුභ නිමිත්තයි බොහෝසේ පවත්වන්නාහට කාමච්ඡන්දය තෙම ප්‍රහීන වෙයි. එහෙයින් බුදුරජාණන් වහන්සේ:-

"අත්ථි භික්ඛවෙ අශුභනිමිත්තං තත්ථ යොනිසොමනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස අනුප්පාදාය උප්පන්නස්ස වා කාමච්ඡන්දස්ස පහානාය න භිය්‍යොභාවාය න වෙපුල්ලායාති" යන්නෙන් මහණෙනි! (යම්) ශුභ නිමිත්තක් ඇද්ද, එහි නුවණින් මෙනෙහි කිරීමෙක් වේද, මේ ප්‍රත්‍යය නූපන් කාමඡන්දේ නො ඉපදීම පිණිසද උපන් කාමච්ඡන්දය ගේ ප්‍රහාණය පිණිසද නැවත නැවත නොවැඩීම පිණිසද මහත් බව නොවන පිණිසද පවත්නේ යයි වදාළසේක.

කාමච්ඡන්දයාගේ ප්‍රහාණය පිණිස අතිකුදු කරුණු සයක් පවත්නාහ. ඔහු කවරහුදයත්? අශුභාලම්බනය උගැණීමය, අශුභ භාවනාවෙහි නැවත නැවත යෙදීමය, චක්ෂුරාදි පංචේන්ද්‍රිය යන්හි වසන ලද දොර ඇතිබවය, බොජුනෙහි පමණ දන්නා බවය, කල්‍යාණ මිත්‍රයන් ඇතිබවය, සත්ප්‍රාය කථා ඇතිබවය යනු කරුණු සයයි. ඒ එසේමැයි; අශුභ නිමිත්ත උගන්නා යොගාවචරයාගේ ද කාමච්ඡන්දය ප්‍රහීන වෙයි. අශුභ කර්මස්ථානය වඩන්නහුගේද චක්ෂුරාදී ඉන්ද්‍රියයන්හි පියනලද දොර ඇත්තහුගේද බත් පිඩු හතරක් පසක් පමණ අනුභව කිරීමට ඉඩතබාගෙණ පැන් බොන්නහුගේ ද කාමච්ඡන්දය ප්‍රහීන වෙයි. එහෙයින්:-

"චත්තාරො පඤ්ච ආලොපෙ අභුත්වා උදකං පිවෙ
අලං ඵාසු විහාරාය පහිතත්තස්ස භික්ඛුනො, ති"

යන නයින් ද බඩපුරා අනුභව නොකොට අහර පිඩු සතරක් පසක් පමණ අනුභව කිරීමට ඉඩ තිබියදී පැන් බොන්නේ නම් නිවන් පිණිස මෙහෙයන ලද සිතැති මහණහුගේ සැපවිහරණයට සුදුසු වේයයි ප්‍රකාශව තිබේ. මෙසේ පමණ දැන වළඳන්නහුගේ කාමච්ඡන්දය කෙසේ ප්‍රහීන වේදයත්? බොජුනෙහි පමණ දත්තහුට ස්ත්‍යානමිද්ධවශයෙන් මැඬීමක් නැති හෙයිනුත් අවසර නොලබන්නාවූ කාමරාගය ප්‍රහීන වෙයි. යළිත් භොජනයෙහි පමණ දන්නා පුද්ගල තෙමේ භොජනය ඇසුරුකළ ආහාර ප්‍රතිකූල සංඥාව ද උපදවයි. භොජන පරිණාමයයි කියන ලද මලමූ හා, ඇසේ කබ කණේ කැදුරු ආදී අසූචි වැගිරීමේද අකරයට ආධාර වූ උදරයගේ කෝ කයේ ද අනුභව කළ බොජුනේ ද අශුභ භාවාදි දර්ශනයද උපදවයි. එහෙයින් භොජනයෙහි මාත්‍රඥ පුද්ගලයාගේ කාමරාගය ප්‍රහීන වේ යයි දතයුතු, පමණ දැන වැළඳීම සතිපාරක්ෂාවට ද අතිශයින් ඉවහල් වේ.

අශුභ කම්ස්ථානය වැඩීමෙහි යෙදුනේ "අශුභකම්මික" යන නමින් ප්‍රසිද්ධවූ තිස්ස තෙරුන් වැනි අශුභ භාවනාවෙහි ඇලුනු සිතැති කල්‍යාණ මිත්‍රන් සෙවනය කරන්නහුගේ ද කාමච්ඡන්දය ප්‍රහීන වන්නේය. ඉඳීම් සිටීම් ආ ඉරියව්වල දශ අශුභයන් පිළිබඳ සත්ප්‍රාය කථාවෙනුදු කාමසද ප්‍රහීන වෙයි. මෙකී කරුණු සය උපන් කාමච්ඡන්දය ප්‍රහීන වීමට හෙතුබැව් සැලකිය යුතුයි.

ප්‍රහාන වූකලී තදඞ්ග ප්‍රහානය විෂ්කම්භන ප්‍රහානය සමුච්ඡේද ප්‍රහානය නිඃශරණ ප්‍රහානය ප්‍රතිප්‍රශ්‍රබ්ධි ප්‍රහාන යයි පස් වැදෑරුම්. එහි විදර්ශනාවෙන් පටහැණි (= විරුද්ධ) කෙලෙස් ප්‍රහීන වෙයි. අනිත්‍ය සංඥාවෙන් නිත්‍යය යන සංඥාව ද දුඃඛසංඥාවෙන් සැපය යන හැඟීම්ද අනාත්ම සංඥාවෙන් ආත්මය යන හැඟීමද යනාදීන් ඒ ඒ ඥාණාඞ්ගයෙන් ඊට විරුද්ධ අකුසල් ප්‍රහානය වන හෙයින් විදර්ශනා ඥානය තදඞ්ග ප්‍රහානය වෙයි. ඞිල් ආදියෙන් ජලය ගැණීමෙහි කළය වැදීමෙන් දියසෙවෙල් ආදිය ඉවත් වන්නාසේ සමාපත්තිලාභී පුද්ගලයාගේ කෙලෙස් යටපත් වේ. නුයි අෂ්ට සමාපත්ති තොමෝ විෂ්කම්භන ප්‍රහාන යයි. දතයුතු. හෙන ගැසූ ගසක් පැළනොවන්නාසේ ආර්ය මාර්ගයෙන් ඒ ඒ සමූල ඝාතනය කරණ හෙයින් (සහමුලින් නසන හෙයින්) ආර්යමාර්ගය සමුච්ඡේද ප්‍රහාණයයි ගිනිඅඟුරු රැසක ජලය වත්කිරීමෙන් ගිනි නිවුණ ද මදවේලාවක් උණුසුම පවත්නාසේ මාර්ගයෙන්

ප්‍රහීනවූ කෙලශොත්පත්තිය ආර්‍ය්‍යඵලයට පැමිණීමෙන් සංසිඳෙන හෙයින් ආර්‍ය්‍ය ඵලය ප්‍රතිප්‍රශ්‍රබ්ධිප්‍රහාණයයි වදාරණලදී. හැම කෙලෙසුන්ගෙන් බැහැරවූ හෙයින් නිර්‍වාණය නිඃශරණ ප්‍රහාණයයි දතයුතු. මේ පඤ්චප්‍රකාරවූ ලෞකික ලොකොත්තර ප්‍රහාණයන්හෙන් මෙහි ප්‍රධාන වශයෙන් අදහස් කරණ ලද්දේ සමුච්ඡේද ප්‍රහාණයයි. එහෙයින් යටකී පංචධර්මයන් හෙතුකොටගෙන ප්‍රහීන කාමච්ඡන්දයාගේ මත්තෙහි නො ඉපදීම රහත් මගින් වේ යයි යොගාවචර තෙම දැනගණී. "අභිධම්ම පරියායෙන සබ්බොපි ලොභො කාමච්ඡන්දනීවරණන්ති ආහ අරහත්ත මග්ගෙනාති" යන ටීකාපාඨයෙන් අභිධර්මදෙශනා නයින් සියලුම ලොභය කාමච්ඡන්ද නීවරණයයි පට්ඨානප්‍රකරණයෙහි වදාළ බැවින් කාමරාගය අනාගාමි මගින් ප්‍රහීනවතුදු භවරාගය රහත්මගින්යයි කී බව දතයුතු.

"සන්තං වා අජ්ඣත්තං ව්‍යාපාදං අත්ථිමෙ අජ්ඣත්තං ව්‍යාපාදොති පජානාති, අසන්තං වා අජ්ඣත්තං ව්‍යාපාදං නත්ථිමෙ අජ්ඣත්තං ව්‍යාපාදොති පජානාති, යථාච අනුප්පන්නස්ස ව්‍යාපාදස්ස උප්පාදො හොති තඤ්ච පජානාති යථාච පහීනස්ස ව්‍යාපාදස්ස ආයතිං අනුප්පාදො හොති තඤ්ච පජානාති- අනතුරුව භාවනානුයොගී පුද්ගල තෙම තමාගේ සන්තානයෙහි ඇත්තාවූ ව්‍යාපාදනීවරණය ද මාගේ සන්තානයෙහි ව්‍යාපාද නීවරණය ඇතැයි දන්නේය, සිය සතන්හි අවිද්‍යමානවූ ව්‍යාපාද නීවරණයද මා සතන්හි ව්‍යාපාද නීවරණය නැතැයි දැනගන්නේය. යම් අයුරකින් නූපන් ව්‍යාපාද නීවරණයගේ ඉපදීම වේද එයත් දැනගන්නේය. යම් අයුරකින් උපන් ව්‍යාපාදයගේ ප්‍රහානය වේද එයද දැනගන්නේය. යම් අයුරකින් ප්‍රහීනවූ ව්‍යාපාදයාගේ මත්තෙහි නො ඉපදීම වේද එයත් දැනගන්නේය.

ව්‍යාපාදය නම් දාහකාරයාගේ වෙනසට පැමිණීම මෙන් සිතේ විකාරයට පැමිණීමයි. ප්‍රකෘතිහුගේ දුරුවූ බවයි පරමාර්ථවශයෙන් ද්වෙෂ චෛතසිකයයි. ඒ ද්වෙෂය රළුවශයෙන් පැවැත්ම ලක්ෂණකොට ඇත්තේය. ගස්බෙනයක හෝනා උග්‍රවූ දරුණු විෂ ඇති සර්පයකු වැනිය. යම් සේ ගස්බෙනේ සයනයකරණ සර්පයාට දඬුමුගුරු කැට කැබිලිති ආදියෙන් ගැසූ කල්හි රැක්බිලෙන් ඔවකම අඩුත් පහර දුන්නහු දෂ්ටකොට දිවි තොර කෙරේද? එපරිද්දෙන් හෘදයාභ්‍යන්තර නමැති ගස්බෙනෙහි අනුශය වශයෙන් සයනය කරන්නාවූ ද්වේෂ නමැති සර්පයා ආඝාතවස්තු නමැති

දඬු මුගුරු කැට කැබිලිති ආදියෙන් පහර ලත් කල්හි හෘදයාභ්‍යන්තරයෙන් පිටතට අවුත් අනුන්ගේ ජීවිත හානිය පවා කෙරෙයි.

"ආඝාතවත්ථු නම්" "අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති" යන ආදියෙන් වදාළ ද්වේෂය උපදින කරුණුයි. අහවලා මට අනර්ථ කෙළේ යයි දැන් අනර්ථ කෙරේයයිද මතු අවැඩ කරන්නේ යයිද මගේ ප්‍රිය මනාපවූ නෑනැත්තාට අවැඩ කෙළේ යයිද දැන් අනර්ථ කෙරේයයිද මතු අනර්ථ කරන්නේයයිද මට අප්‍රිය අමනාපවූ සතුරා හට අභිවෘද්ධියෙහි හැසුරුනේ යයිද දැන් උපකාර කෙරේ යයිද මතු අභිවෘද්ධියක් කරන්නේ යයිද යන මේ නව අයුරකින් උපදින ආඝාතවත්ථු නවයකි. අස්ථාන කෝපය සමග දශයෙකි. අස්ථාන කෝපය නම් නිකරුනේ කිපීමයි. සමහරෙක් බොහෝ වැසි වසී යයි කිපේ, වැසි නොවසී යයිද කිපේ. සුළං හමා යයිද කිපේ. හමදින්නට නොහැකිව මිදුල වල්වේ යයි කොළවලට කිපේ. පාරේ යමින් ගලක මුලක පය හැපීමෙන් කිපේ. මෙසේ කොප නොවිය යුතු කරුණෙහි තරහ වීම අස්ථාන කොපය වේ. අස්ථාන කොපය කර්මපථය නොවන බැවින් අපායගාමී නොවේ. නවාඝාත වස්තුව කර්මපථය නොවේ. මේ ද්වේෂය යකඩෙහි නැංගාවූ මලය යකඩය විනාශ කරන්නාක් මෙන්ද ගස්බෙනයෙන් හටගත් ගින්න ඒ ගස දවන්නාක් මෙන්ද ගිනිගානා දණ්ඩෙන් හටගත් ගින්න එය දවන්නාක් මෙන්ද සත්ත්වයාගේ අධ්‍යාත්මික සන්තානයෙහි හටගත් ද්වේෂය ඇසුරු කොට ඉපිද බලවත් වූ ද්වේෂයාගේ අවසාන ඵලය ස්වකීය ජීවිත විනාශය බැවින් මේ ජාතියෙහි තමාගේ ජීවිතය විනාශකොට මරණින් මත්තෙහි සතර අපාය දුකටද පමුණුවයි.

ප්‍රතිඝ නිමිත්තෙහි අයොනිසොමනස්කාර වශයෙන් ව්‍යාපාදයාගේ පහළවීම වන්නේය. ප්‍රතිඝයයි කියනලද ද්වේෂයත් ප්‍රතිඝයට හෙතුවූ අරමුණත් ප්‍රතිඝනිමිත්ත නම්, ඒ ප්‍රතිඝනිමිත්තෙහි අනුපායමනස්කාරය බොහෝසේ පවත්නාහට නූපන් ව්‍යාපාදය උපදී. උපන් ව්‍යාපාදය බොහෝ බව පිණිස විපුලත්වය පිණිස පවතී. එහෙයින් බුදුන් වහන්සේ:-

"අත්ථි භික්ඛවෙ පටිඝනිමිත්තං, තත්ථ අයොනිසොමනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා බ්‍යාපාදස්ස උප්පාදාය උප්පන්නස්ස වා ව්‍යාපාදස්ස භිය්‍යොභාවාය වෙපුල්ලාය" යන දෙශනාවෙන් මහණෙනි! ප්‍රතිඝ නිමිත්තෙක් ඇත, එහි

නුණුවණින් මෙනෙහි කිරීමෙක් වේද, මේ ප්‍රත්‍යය නූපන් ව්‍යාපාද නීවරණයාගේ ඉපදීම පිණිසද උපන් ව්‍යාපාද නීවරණයාගේ බොහෝ බව පිණිසද විපුල භාවය පිණිසද පවතීයයි වදාළසේක.

මෛත්‍රී චෙතො විමුත්තියෙහි නුවණින් මෙනෙහි කිරීම් වශයෙන් මේ ව්‍යාපාදය ප්‍රහාණය වේයි. "මෛත්‍රී චෙතො විමුත්ති" නම් සියලු සත්ත්වයන් කෙරෙහි හිත පතුරුවන මෛත්‍රී යයි. යම් හෙයකින් මෛත්‍රී සම්ප්‍රයුක්තවූ හිත නීවරණාදි විරුද්ධ ධර්මයන් ගෙන් මිදේද. එහෙයින් ඒ මෛත්‍රී තොමෝ චෙතොවිමුත්තියයි කියන ලදී. එහෙයින් ව්‍යාපදපරියුට්ඨානයෙන් මිදෙන බැවින්ද මෛත්‍රී තොමෝ චෙතොවිමුත්තියයි දතයුත්තීය. අවිශෙෂයෙන් මෛත්‍රියයි කීකල්හි අර්පණාවත් උපචාරයත් ගන්නට වටනේය චෙතො විමුත්තියයි වදාළ බැවින් මෛත්‍රී ත්‍රිකචතුෂ්කධ්‍යානයන්ගේ වශයෙන් අර්පණාවම ගැණේ. එහෙයින් සර්වඥයන් වහන්සේ:-

"අත්ථි භික්ඛවෙ මෙත්තා චෙතොවිමුත්ති තත්ථ යොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා බ්‍යාපාදස්ස අනුප්පාදය උප්පන්නස්ස වා බ්‍යාපාදස්ස පහානාය න භිය්‍යොභාවාය න වෙපුල්ලාය" යන දෙශනා පාඨයෙන් මහණෙනි! මෛත්‍රී සහගතවූ චේතොවිමුත්ති නම්වූ අර්පණා සමාපත්තියක් ඇත. ඒ මෛත්‍රී සහගත අර්පණාසමාපත්තියෙහි යොනිසොමනස්කාරය බොහෝසේ පුරුදු කිරීමෙක් ඇද්ද මේ ප්‍රත්‍යය තෙමේ නූපන් ව්‍යාපාදයගේ නො ඉපදීම පිණිසද උපන් ව්‍යාපාදයගේ පැසීම පිණිසද නැවත නැවත නො වැඩීම පිණිසද මහත් බව නොවන පිණිසද පවතී යයි| වදාළසේක.

තවද ව්‍යාපාදයාගේ ප්‍රහාණය පිණිස මෛත්‍රකම්මට්ඨාන ඉගෙණීමය මෛත්‍රිය වැඩීමෙහි නැවත නැවත වැරකිරීමය, තමාගේ හා මෙර මාගේද කර්මය ස්වකීය කොට ඇතිබව පස්විහිමය, වැටහෙන නුවණ බහුලකොට ඇතිබවය, කල්‍යාණ මිත්‍රයන් ඇතිබවය, සත්ප්‍රාය කථාවය, යන කරුණු සයක් ව්‍යාපාදයාගේ ප්‍රහාණය පිණිස පවතී. ඒ එසේමැයි. ඔදිස්සක අනොදිස්සක දිසාඵරණ මෙත්තා චෙතො විමුක්තීන් අතුරෙන් ඒකක්හුගේ වශයෙන් මෙ ත්‍රිභාවනාව ඉගෙණ ගන්නහුගේ ව්‍යාපාදය ප්‍රහීන වන්නේය.

"ඔදිස්සක ඵරණ මෙත්තා චෙතො විමුත්ති" නම්:- පුද්ගලාන්තරයක්හු උදෙසා පතුරණ මෛත්‍රියයි ඕ වනාහි "සබ්බා ඉත්ථියො අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී

අත්තානං පරිහරන්තු" සියලු ස්ත්‍රීහු වෛර නැත්තෝ වේත්වා, ව්‍යාපාද නැත්තෝ වෙත්වා, නිදුක් වෙත්වා, සුවපත්වූවාහු ආත්මය පරිහරණය කෙරෙත්වා. "සබ්බෙ පුරිසා- සබ්බෙ අරියා- සබ්බෙ අනරියා- සබ්බෙ දෙවා- සබ්බෙ මනුස්සා- සබ්බෙ විනිපාතිකා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු" සියලු පිරිමි- සැම ආර්‍යයෝ-සැම පෘථග්ජනයෝ- සියලු දෙවියෝ- සියලු මිනිස්සු- අපාය වලට ඇතුළත් සියල්ලෝ වෛර නැත්තෝ වෙත්වා, නිදුක් වෙත්වා, නීරෝග වෙත්වා, සුවපත්ව ආත්මය පරිහරණය කෙරෙත්වා යි මෙසේ පුද්ගලයන්ගේ වශයෙන් සීමා භේදය කොට සත් අයුරකින් පතුරණ මෛත්‍රිය ඔදිස්සක මෙත්තා චෙතො විමුත්තියයි සැලකිය යුතු.

අනොදිස්සක මෙත්තා චෙතො විමුත්ති නම් අවධිවශයෙන් පුද්ගල විශෙෂයක් නොකොට "සබ්බෙ සත්තා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු" සියලු සත්ත්‍වයෝ අවෛර වෙත්වා, නීරෝග වෙත්වා, සුවපත් ආත්මය පරිහරණය කෙරෙත්වා. සබ්බෙ පාණා- සබ්බෙ භූතා- සබ්බෙ පුග්ගලා- සබ්බෙ අත්තභාවපරියාපන්නා අවෙරා හොන්තු අබ්‍යාපජ්ජා හොන්තු අනීඝා හොන්තු සුඛීඅත්තානං පරිහරන්තු" සියළු ප්‍රාණීහු- සියලු භූතයෝ- සියලු පුහුලෝ- සියලු ආත්මභාවයට ඇතුළත්වූවෝ අවෛර වෙත්වා නිදුක් වෙත්වා නීරෝග වෙත්වා සුවපත්ව අත්බැව් පරිහරණය කෙරෙත්වා, සත්ත්‍වපර්‍යායවූ 'ජන්තු; ජීව" යන ඈ නම් ඇතද සත්ත්‍වයනට ප්‍රකටවූ මේ නාමයන්ගේ වශයෙන් පස් අයුරකින් පොදු වශයෙන් සියල් සතුන් කෙරෙහි පතුරණ මෛත්‍රිය අනොදිස්සක මෙත්තා චෙතො විමුත්ති නමි.

දිසාඵරණ මෙත්තා චෙතො විමුත්ති නම්:- සබ්බෙ පුරත්ථිමාය දිසාය සත්තා අවෙරා හොන්තු -පෙ- සුඛී අත්තානං පරිහරන්තු, සබ්බෙ පච්ඡිමාය දිසාය- සබ්බෙ උත්තරාය දිසාය- සබ්බෙ දක්ඛිණාය දිසාය- සබ්බෙ පුරත්ථිමාය අනු දිසාය= සබ්බෙ පච්ඡිමාය අනුදිසාය- සබ්බෙ උත්තරාය අනුදිසාය= සබ්බෙ දක්ඛිණාය අනුදිසාය= සබ්බෙ හෙට්ඨිමාය දිසාය= සබ්බෙ උපරිමාය දිසාය සත්තා අවෙරා හොන්තු -පෙ= සුඛීඅත්තානං පරිහරන්තු සබ්බෙ පුරත්ථිමාය දිසාය- පාණා -පෙ- භූතා-පුග්ගලා අත්තභාවපරියාපන්නා අවෙරා -පෙ- පරිහරන්තු, සබ්බා පුරත්ථිමාය දිසාය ඉත්ථියො -පෙ- සබ්බෙ පුරිසා- සබ්බෙ අරියා සබ්බෙ අනරියා- සබ්බෙ

දේවා- සබ්බේ මනුස්සා සබ්බෙ විනිපාතිකා අවේරා හොන්තු -පෙ- පරිහරන්තු" පෙරදිගැවූ සියලු සත්තු අවෛර වෙත්වා නිදුක් වෙත්වා, නීරෝග වෙත්වා, සුව ඇත්තෝව ආත්ම භාවය පරිහරණය කෙරෙත්වා පැළදිගැවූ සියලු සත්තු- උතුරු දිගැවූ සියලු සත්තු, දකුණු දිගැවූ සියලු සත්තු, ගිනිකොණෙහිවූ හැම සත්තු, වයඹැවූ සියලු සත්තු, ඊසානයෙහිවූ හැම සත්තු, නිරිතෙහිවූ හැමසත්තු, යටදිශාවෙහිවූ හැම සත්තු, මතු දිසාවෙහිවූ හැම සත්තු, අවෛර වෙත්වා නිදුක් වෙත්වා, නිරෝග වෙත්වා සැප ඇත්තෝව ආත්මය පරිහරණය කෙරෙත්වා, පැදුම් දිගැවූ හැම ප්‍රාණීහු, භූතයෝ, පුහුලෝ. අත්බැවට ඇතුළත්වූවෝ, වෛර නැත්තෝ වෙත්වා, නිදුක් වෙත්වා, නීරෝග වෙත්වා සුව ඇත්තෝව ආත්මය පරිහරණය කෙරෙත්වා ඉදුරු දිගැවූ සියලු ස්ත්‍රීහු, පිරිමි, සියලු ආර්‍ය්‍යයෝ, සියලු අනාර්‍ය්‍යයෝ, සියලු දෙවියෝ, සියලු මනුෂ්‍යයෝ සියලු විනිපාතිකයෝ |වෛරනැත්තෝ වෙත්වා නීරෝග වෙත්වා, සුව ඇතිව ආත්මය පරිහරණය කෙරෙත්වා යන දශදිශාවන්ගේ වශයෙන් දශාකාරයකින් පතුරණ මෛත්‍රිය දිසාඵරණ අමනෙතා චෙතො විමුත්ති යයි දතයුතු

මෙහි ""සබ්බෙ සත්තා අවෙරාහොන්තු" යනු එක් අර්පණාවකි, අබ්‍යාපජ්ජා හොන්ති" එක් අර්පණාවයි. "අනීඝාහොන්තු" යනුද එක් අර්පණාවකි. 'සුඛී අත්තානං පරිහරන්තු'! යනුත් එක් අර්පණාවක්ය. එබැවින් මේ පදවලින් තමාට යමක් යමක් ප්‍රකට වේ නම් ඒ ඒ පදයාගේ වශයෙන් මෛත්‍රිය පැතිරිය යුත්තේය. මේ සතර පදයාගේ වශයෙන් මෛත්‍රිය පැතිරිය යුත්තේය. මේ සතර පදයන්ගේ වශයෙන් අනොධිසෝ ඵරණයෙහි අර්පණා විස්සක් වේ. ඔධිසො ඵරණය වනාහි සත් අයුරෙහි සයන පදයන්ගේ වශයෙන් අර්පණා අට විස්සකි., දිසාඵරණයෙහි වූකලී "සබ්බෙ පුරත්ථිමාය දිසාය සත්තා" යන ආ නයින් එකී එකී දිශාවෙක විස්සක් විස්සක් බැගින් අර්පණා 200 කි. "සබ්බා පුරත්ථිමාය දිසාය ඉත්ථියො" යන ආ නයින් එකී එකී දිගැ විසි අටක් විසි අටක් බැගින් 280 ක් දැයි 480 ක් අර්පණාවෝ වෙති. සියලුම අර්පණාවෝ 528 කැයි පිළිසිඹියාවෙහි කියන ලද්දහුය.

මෙහි තුන් අයුරෙන් එක්තරා එකක්හුගේ වශයෙන් මෙත් වඩන සැටි ඉගෙණ ගත්තහුගේද ව්‍යාපාදය ප්‍රහීණවන්නේය. සත්වැදෑරුම්වූ හෝ අටවිසි වැදෑරුම්වූ පරිච්ඡෙද සහිත කොට පතුරණ ඔධිසො ඵරණ මෛත්‍රියය, පස්වැදෑරුම්වූ හෝ විසිවැදෑරුම්වූ පරිච්ඡෙද රහිතකොට පතුරණ අනොධිසො ඵරණ මෛත්‍රියය

දීනුන් සීමාසීරීමෙන් පවත්නා දශවිධවූ දිශාඵරණ මෛත්‍රිය යන මොවුන්ගේ වශයෙන් මෙත් බවත්නහුගේ ව්‍යාපාදය ප්‍රහීන වෙයි. මෛත්‍රිය වඩන අයුරු විශුද්ධිමාර්ග බ්‍රහ්ම විහාර නිර්දේශයෙන් විස්තර දත යුතු.

තෝ අර පුහුලා හට කිපියේය කුමක් කරන්නෙහිද? ඔහුගේ ශීලාදි ගුණයන් වනසාලන්නට හැකි වන්නෙහිද? තෝ තමාගේ කර්මයෙන් අවුත් තමාගේ කර්මයෙන්ම යන්නෙහි නොවේද? මෙර මාහට කිපීම නම් පහවූ ගිනිදැල් ඇති ගිනි අඟුරුය, රත් කළ යවුල්ය, අශුචිය යන ආදිය ගෙන අන්‍යයනට ගසනු කැමති පුද්ගලයකුගේ ස්වභාවය බඳු වෙයි. තෙල පුරුෂ තොමේත් තට කිපුණේ කුමක් කරන්නේද? තාගේ ශීලාදි ගුණයන් වනසන්නට පොහොසත් වන්නේද? තෙල පුහුලා සමාගේ කර්මයෙන්ම යන්නේය. නොපිළිගත් පඬුරක් තමාවෙත නොපැමිණෙන්නාක් මෙන්ද උඩුසුළඟට දමානැසූ දූලි මිටක් තමාකරා එන්නාක් මෙන්ද තෙල පුහුලාගේ මත්තෙහි ඒ ක්‍රොධය නසන්නේයයි මේ නයින් තමාගේ හා මෙර මාගේද කර්මය තමා අයත්කොට පැවැති බව ප්‍රත්‍යවෙක්ෂා කරන්නහුගේ ද ව්‍යාපාදය ප්‍රහීන වේ

තමාය අන්‍යයාය යන දෙදෙනාගේ කර්මය තමන් තමන් අයත් කොට ඇතිබව පස්විකා වැටහෙන නුවණෙහි නොහොත් කම්මස්සකතා ඥාණයෙහි සිටියහුගේද ව්‍යාපාදය ප්‍රහීන වේ. අසඝුජ්ජ තොරතුන් වැනි මෛත්‍රී භාවනාවෙහි ඇලුණු කල්‍යාණ මිත්‍රයන් සෙවනය කරන්නහුගේද ව්‍යාපාදය ප්‍රහීනවේ. සිටීම්, හිඳීම් ආ සතර ඊර්යාව්වෙහි මෛත්‍රී පිළිබඳවූ සත්ප්‍රාය කථා ඇති බැවිනුදු ව්‍යාපාදය ප්‍රහීන වන්නේය. මෙසේ සැමැදෑරුම් ධර්මයන්ගෙන් ප්‍රහීනවූ ව්‍යාපාදයගේ මත්තෙහි නො ඉපද අනාගාමි මාර්ගය" හේතුකොට ගෙන වේවයි ධර්මානුපස්සනා සතිපට්ඨාන භාවනාවෙහි යෙදුනු මහණ තෙම දැනගන්නේය

“ සන්තං වා අජ්ඣත්තං ථිනමිද්ධං අත්ථි මෙ අජ්ඣත්තං ථිනමිද්ධන්ති පජානාති” ඉක්බිති යෝගී තෙම සිය සතන්හි ඇත්තාවූ ථිනමිද්ධය ද මා සතන්හි ථිනය හා මිද්ධයද ඇතැයි දන්නේය, අවිද්‍යමාන වූ ස්ත්‍යානමිද්ධය ද. මා සතන්හි ස්ත්‍යානමිද්ධය නැතැයි දන්නේය. යම් අයුරකින් නූපන් ථීන මිද්ධයන්ගේ ඉපදීම වේද ඒ ඉපදීමද දන්නේය. යම් අයුරකින් උපන් ථීනමිද්ධ දෙකේ ප්‍රහාණය වේද ඒ පැහීමද දන්නේය. යම් අයුරකින් ප්‍රහීනවූ ථීනමිද්ධ දෙකේ මත්තෙහි නො ඉපදීම වේද, එයද දන්නේය.

ථීනචෛතසිකය තමා හා පවත්නාවූ සිත හැකිළවීම් සවභාව කොට ඇත්තේය. මිද්ධචෛතසිකය තමා හා එක්ව යෙදෙන වේදනා සඤ්ඤා සංඛාර යන ස්කන්ධත්‍රය හැකිළවීම් සවභාව කොට ඇත්තේය. එහෙයින් මේ තැන මිදු දෙක ගින්නට බඳු වෙයි. චිත්ත චෛතසිකයෝ කුකුළු පිහාටු වැනි වෙත්. යම්සේ ගින්නට පාන ලද කුකුළුපිහාටුව හැකිළේද, එසේ ථීනමිද්ධ චෛතසික දෙක හා සමග යෙදෙන චිත්ත චෛතසිකයෝ හැකිළෙති. චිත්තචෛතසිකයන්ගේ සැඟවෙන බව ථීනමිද්ධ දෙකේ කෘත්‍යයයි. මේ දෙකටම ප්‍රතිපක්ෂ ධර්මය වීර්‍ය්‍ය චෛතසිකය වේ. මෙසේ කෘත්‍යය හා ප්‍රතිපක්ෂ ධර්මයන් සමාන බැවින් ද්වන්ද්වසමාස වශයෙන් හැමතන්හි දෙසනලදී.

මේ දෙකින් මිද්ධය වූකලී නාමමිද්ධය රූපමිද්ධයයි දෙවැදෑරුම් වූ. රූපමිද්ධය අකුශල ධර්මයන්හි ඇතුළත් නොවේ. නාමමිද්ධය අකුශලයකට ඇතුළත්. දහවල් ඉරට වෙන් තැඹිගිය තෙලුම් මහනෙල් මල් ආදිය රෑ හැකිලී පවත්නාක් මෙන් දවල් නොයෙක් කටයුතුවල යෙදුනු මනුෂ්‍යයන්ගේ රූපස්කන්ධය රාත්‍රියෙහි හැකිලීමට පැමිණෙයි. එය රූපමිද්ධය හෙවත් නිද්‍රාවයයි කියනු ලැබේ. ඒ රූපමිද්ධ මාවගවූ මිද්ධ ශබ්දය ථීන ශබ්දය සමග සමාස නොවී "සෙය්‍ය සුඛං මිද්ධසුඛං" යන ආදීන් හුදකලාවම යෙදේ. එසේද වූවත් අකුශලයන්හි ඇතුළත් මිද්ධය හෙතුකොට රූපස්කන්ධයෙහි හටගන්නා නිද්‍රාවක්ද ඇත, ථීනමිද්ධ නීවරණයෙන් යුක්ත සසංඛාරික අකුශල චිත්තයන් නැවත නැවත නිතර උපදනා කල්හිං නාමමිද්ධය පිළිබඳවූ අලසභාවය හේතු හොත් සසංඛාරික අකුශල චිත්තයන් පස සමග චිත්තජ රූපධර්මයන් සිරුරෙහි පැතිරයා මෙන් රූපස්කන්ධය ද නිද්‍රාවට පැමිණේ. ඒ නිද්‍රාවට හේතුව ථීනමිද්ධනීවරණය බැවින් දම්සඟුණු අටුවාවෙහි "පචලායිකානිද්දා පච්චුපට්ඨානං" යන්නෙන් නිදාවැටීම එළඹසිටින කාරණයයි කීහ.

අරති ආදියෙහි අයොනිසොමනස්කාරයෙන් ථීනමිද්ධනීවරණයාගේ ඉපදීම වන්නේය, "තත්ථ කතමා අරති? පන්තෙසු වා සෙනාසනෙසු අඤ්ඤතරඤ්ඤතරෙසු වා අධිකුසලෙසු ධම්මෙසු අරති අරතිතා අනභිරති අනභිරමනා උක්කණ්ඨිතා පරිතස්සිතා අයං වුච්චති අරති" එහි අරති තොමෝ කවරිද? වන පරියන්ත සෙනාසනයන්හි හෝ එක්තරා සමථ විදර්ශනාදි අධිකුසල ධර්මයන්හි හෝ නොඇලීමත් අනභිරතියක් විශෙෂයෙන් නොඇලීමක් උකටලී බවක් තලකිරීම් වශයෙන් ඒ ඒ තන්හි තෘෂ්ණාවක් ඇද්ද මෝ තොමෝ අරති නමු ආදි ශබ්දයෙන් අලසබව

කායේ යම් සැලීමක් පුන පුනා සැලීමක් ඉදිරියට නැමීමක් ඔබ මොබ නැමීමක් හාත්පස නැමීමක් ප්‍රකම්පයෙන් නැමීමක් පීඩිත බවක් වේ නම් එයද, වැලඳුවහුගේ බතින් වූ මූර්ඡාවක් භත්ත කලාන්තයක් බත් වෙහෙසක් ශරීරයාගේ අකර්මණ්‍යතාවයක් ඇද්ද? ඒ බත් මතයද සිත හැකිලගිය බවද යන මේ ධර්මයන්හි අනුපාය මනස්කාරය බොහෝ සේ පවත්වන්නා හට ස්ත්‍යානමිද්ධය උපදී.

“සන්තං වා අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චං අත්ථි මෙ අජ්ඣත්තං උද්ධච්චකුක්කුච්චන්ති පජානාති” නැවත මේ භාවනාවෙහි යෙදුනු භික්ෂුතෙම තමාගේ සන්තානයෙහි විද්‍යමානවූ උද්ධච්චකුක්කුච්චනීවරණය මාගේ සන්තානයෙහි උදහස හා කුකුසද අතැයි දැනගණී, අධ්‍යාත්මයෙහි නැත්තාවූ උදහස හා කුකුසද මාගේ සන්තානයෙහි උද්ධච්චකුක්කුච්චය නැතැයි දන්නේය යම් ආකාරයකින් නූපන් ඖද්ධත්‍ය කෞකෘත්‍ය දෙදෙනාගේ ඉපදීමවේද එයද දැනගණී. යම්අයුරකින් උපන් උද්ධච්චකුක්කුච්ච දෙදෙනාගේ ප්‍රහානයවේද එයත් දැනගණී යම අයුරකින් පහවූ උදහස් කුකුස් දෙකේ මත්තෙහි නො ඉපදීම වේද එයද දැනගණී.

උද්ධච්චය වනාහි අළුගොඩකට කැටයකින් ගැසීමට බඳු උපම් ඇත්තේය. අළුරැසකට කැටයකින් ගැසීමෙන් ඒ අළු අහසට නැග බමමින් පවත්නේය. ඒ පරිද්දෙන්ම මේ උදහස නැමැති කැටයෙන් සසම්ප්‍රයුක්ත චිත්ත නමැති අළුගොඩට පහර දුන්විට ඒ චිත්තචෛතසිකයෝ නොසන්සුන් බැවින් හා වික්ෂිප්තභාව යෙන් යුක්තව පවතිත්.

කුක්කුච්චය වූකලී කරණලද පව්කම් ඇත්තහුගේද නො කරණ ලද පින්කම් ඇත්තහුගේද ඒ හෙද හේතුකොටගෙණ වන්නාවූ විපිලිසර බවයි. ඒ කෞකෘත්‍ය පසුගිය කාලයෙහි රැස් කළාවූ දුශ්චරිතයන් කල්පනා කරමින්ද ඉකුත් කල්හි රැස්නොක ළාවූ කුශල ධර්මයන් කල්පනා කරමින්ද නැවත නැවත පසුතැවීම ලක්ෂණකොට ඇති චෛතසිකයෙකි. කපනිය සූත්‍රාදියෙහි කප නිය ධර්මනාමයෙන්ද වදාළේ මේ කෞකෘත්‍යය මැයි. පව්කළ තැනැත්තේ පව්වල මෙලෝ පරලෝ දෙක්හි ලැබෙන විපාක ඇසීමෙන් හෝ නුවණින් සැලැකීමෙන් හෝ මේ මේ පව්කෙළෙමි. මට පරලොව මෙ මේ දුක් විඳින්නට ලැබේ යයි පසුතැවිලිවෙයි. පින් නොකළ තැනැත්තේද පින්වල විපාක ඇසීමෙන් හෝ නුව ණින් සැලකීමෙන් හෝ මම පින් නොකෙළෙමි. එහෙයින් මට පරලෝ සැපයක් නොලැබේයයි පසුතැවිලි වෙයි.

මේ කුක්කුච්චය අතීතකාලයම අරමුණුකොට ඇත්තේය. වර්තමාන අනාගත කාලයන් අරමුණු නොවේ. මේ කෞකෘත්‍යය ස්වාමියෙකු යටතේ සිටින දාසයෙකු බඳු වේ. දාසයා සියකැමැත්තෙන් කිසිවක් කළ නොහේ. ස්වාමියා විසින් මෙය කරව මෙය නොකරවයි අණවන ලද්දේම කළහැක්කේය. එපරිද්දෙන්ම ඉතා බලවත්වූ කුක්කුච්චයෙන් යුත් පුද්ගල තෙම සිය කැමැත්තෙන් සුචරිතයෙහි නොයෙදේ. සත්පුරුෂාශ්‍රය ඇතිකල්හිම පින් රැස් කෙරේ. දාසයෙකු බඳුයයි කියනලද්දේ එහෙයිනි.

“නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නං වා උද්ධච්චකුක්කුච්චං උප්පජ්ජති. උප්පන්නං වා උද්ධච්චකුක්කුච්චං භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති, යථයිදං භික්ඛවෙ චෙතසො අවූපසමො, අවූපසන්තචිත්තස්ස භික්ඛවෙ අනුප්පන්නං වා උද්ධච්චකුක්කුච්චං උප්පජ්ජති උප්පන්නං වා උද්ධච්චකුක්කුච්චං භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති”

මහණෙනි! යම් හෙතුවකින් නූපන් උද්ධච්චකුක්කුච්චය උපදීද උපන් උද්ධච්චකුක්කුච්චය නැවත නැවත ඉපදීම පිණිස විපුලත්වය පිණිස පවතීද, යම් මේ චිත්තය පිළිබඳ නොසන්සුන් බවක් වේද මින් අන්‍යවූ එකද ස්වභාවයක් මම නුවණැසින් නොදක්නෙමි. මහණෙනි නොසන්සුන් සිත් ඇත්තාහට නූපන් උද්ධච්චකුක්කුච්චය උපදී උපන් උද්ධච්චකුක්කුච්චය නැවත නැවත ඉපදීම පිණිස මහත්බව පිණිස පවතීයයි වදාළ හෙයින් චිත්තයාගේ නොසන්සුන් බැව්හි අයෝනිසොමනස්කාරයෙන් ඖද්ධත්‍ය කෞකෘත්‍යයාගේ ඉපදීම වන්නේය. ‘අවූසම’ නම නොසන්සුන් ස්වභාවයයි. එය ස්වරූප වශයෙන් උද්ධච්චකුක්කුච්චය මැයි. ඒ සිතේ නොසන්සිඳීමෙහි නුවණින් මෙනෙහි කිරීම බොහෝසේ පවත්නාහට ඖද්ධත්‍ය කෞකෘත්‍යය උපදී.

තවද බොහෝ ඇසූ පිරූතැන් ඇති බවය, පැන පිළිවිසීම ඇතිබවය, විනය ප්‍රඥප්තියෙහි තතු දැනීම් ඇතිබවය, ශීලාදි ගුණයෙන් වැඩිහිටියන් සෙවුනා සුළුබවය. කලණ මිතුරන් ඇතිබවය, සත්ප්‍රාය කථාය යන මේ කරුණු සය ඖද්ධත්‍ය කෞකෘත්‍යයාගේ ප්‍රහාණය පිණිස පවතී. ඒ එසේමැයි. බහුශ්‍රැත භාවයෙනුදු එක් සඟියක් හෝ පසම හෝ පෙළ හැදෑරීම් අරුත් ඇසීම උගන්නා මහණහුගේ උද්ධච්චකුක්කුච්චය ප්‍රහීන වේ.

“සන්තං වා අජ්ඣත්තං විචිකිච්ඡං අත්ථි මෙ අජ්ඣත්තං විචිකිච්ඡාති පජානාති” -පෙ-

මීට අනතුරුව ඒ භික්‍ෂුතෙම තමාගේ සන්තානයෙහි විද්‍යමානවූ විචිකිච්ඡානීවරණයද මාගේ සන්තානයෙහි (විචිකිච්ඡානීවරණය) ඇතැයි දැනගණී. සිය සතන්හි නැත්තාවූ විචිකිච්ඡානීවරණයද මාගේ සන්තානයෙහි විචිකිච්ඡානීවරණය නැතැයි දැනගණී යම් අයුරකින් නූපන් විචිකිච්ඡාවගේ ඉපදීම වේද එයත් දැනගණී යම් අයුරකින් උපන් විචිකිච්ඡාවගේ ප්‍රහාණයවේද එයත් දැනගණී, යම් අයුරකින් පහවූ විචිකිච්ඡාවගේ මත්තෙහි නො ඉපදීම වේද එයත් දැනගණී.

'විගතා චිකිච්ඡාතිවා සභාවං විචිනන්තො විචිකිච්ඡති කිල මති එතං යාතිවා විචිකිච්ඡා'' යනු නිරුක්ති බැවින් පහවූ පිළියම් ඇත්තී හෝ සවභාවය පිරික්සමින් මේ කරණකොට වෙහෙසේ නුයි හෝ විචිකිච්ඡා නමු. ඕ තොමෝ අරමුණු නිශ්චයකොට නො ගත හැකි බව ලක්‍ෂණකොට ඇත්තීය. විචිකිච්ඡාව මහාභී දෙමං සන්ධියක් වැනිය. ඒ මාර්ගයෙහි කිසිකෙලක නොගිය විරූ පුරුෂයකු දෙමංසන්ධියකට වන්විට මේ මගින් යා යුතුද? අනික් මගින් යා යුතුදැයි යායුතු මාර්ගය නිශ්චයකොට ගතනොහෙයි. තවද විචිකිච්ඡාතොමෝ සොහෙනෙක දෙදන තමාගෙණ උඩබලා හෝනා පුරුෂයකු වැනිද වේ. ඒ පුරුෂයා රෑ නින්දෙන් පිබිදී බලනුයේ තමාගේම දෙදන යකුන් දෙදෙනෙකැයි රැවටී බිය පත් වේ. එසේම නිතර විචිකිච්ඡා සම්ප්‍රයුක්තවූ සිතින් යුත් පුද්ගල තෙම අකුසල් නොවන ක්‍රියාවෙහි අකුසල් යයි හය වෙයි, කුසල් නොවන ක්‍රියාවෙහි කුසල් යයි වරදවා පිළිපදී මේ විචිකිච්ඡා තොමෝ සැලීම කෘත්‍යය කොට ඇත්තීය, නිශ්චය නොකිරීම එලඹ සිටීම කරුණුකොට ඇත්තීය, එකාන්තයෙන් නොගැන්ම හෝ වැටහීම ඇත්තීය. අයොනිසොමනස්කාරය ආසන්න කාරණකොට ඇත්තීය, ප්‍රතිපත්තියට අන්තරාය කරන්නීයයි දතයුත්තීය.

"අත්ථි භික්ඛවෙ විචිකිච්ඡා ඨානීයා ධම්මා, තත්ථ අයොනිසොමනසිකාරා බහුලීකාරො අයමාහාරො අනුප්පන්නාය වා විචිකිච්ඡාය උප්පාදාය උප්පන්නායවා විචිකිච්ඡාය භිය්‍යොභාවාය වෙපුල්ලායාති''යන්නෙන් [illegible] විචිකිත්සාවම ප්‍රවෘත්තිස්ථාන වූ ධර්මකෙනෙක් ඇත්තාහ, ඒ ධර්මයන්හි අයොනිසොමනස්කාරය බොහෝසේ පුරුදු කිරීම යයි කියන ලද මේ ප්‍රත්‍යය නූපන් විචිකිත්සාවගේ ඉපැදීම පිණිසද උපන් විචිකිච්ඡාවගේ නැවත නැවත වැඩීම පිණිසද විපුලත්වය පිණිසද පවතී.

"සන්තං වා අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගං, අත්ථි මෙ අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගොති පජානාති"-පෙ-ඒ භාවනානුයොගී පුද්ගල තෙම් පිළිවැඩිම විසින් සිය සතන්හි ඇත්තාවූ සමෘති, ධර්මවිචය, වීර්‍ය්‍ය, ප්‍රීති ප්‍රශ්‍රබ්ධි, සමාධි, උපෙක්‍ෂා යන සප්ත බොධ්‍යඞ්ගයද මාගේ සන්තානයෙහි සප්තබොධ්‍යඞ්ග ඇතැයි

දනගණී. නොලැබීම් වශයෙන් අවිද්‍යමානවූ සප්තබොධ්‍යඞ්ගයද නූපන් සප්තබොධ්‍යඞ්ගයන්ගේ ඉපදීම වේද උපන් සප්තබොධ්‍යඞ්ගයන්ගේ වැඩීමෙන් සම්පූර්ණ වේද එයද දනගණී. බොධ්‍යඞ්ගයක් පාසා සිසලූ විස්තරය පළමු සප්තබොධ්‍යඞ්ග ධර්මදෙශනාවෙහි ප්‍රකාශවූ ක්‍රමයෙන් දතයුතු.

මේ ධම්මානුපස්සනා සතිපට්ඨානය මහාසතිපට්ඨාන චූලසතිපට්ඨාන සූත්‍රයන්හි නීවරණපර්ව, ස්කන්ධපර්ව, ආයතනපර්ව, බොධ්‍යඞ්ගපර්ව, චතුරාර්‍ය්‍යසත්‍යපර්ව යයි පර්ව පසකින් යුක්තකොට වදළසේක. ග්‍රන්ථය විශාලවන හෙයින් ඒවා මෙහි විස්තර නොකරමි. ඒ ඇතැම් කරුණුවල දෙවියනට කම්ටහන සම්බන්ධ නොවන බැවින් අභිධර්ම දෙශනායෙහි නීවරණ බොධ්‍යඞ්ගපර්වදෙකින් යුක්තකොට ධම්මානුපස්සනා සතිපට්ඨානය වදාරණ ලදී.

මේ ධර්මානුදස්සනා සමෘති ප්‍රස්ථාන කර්මස්ථානය වඩා රහත් ඵලයට පැමිණෙනු කැමැති යොගාවචරයා විසින් පළමුකොට සිව්පිරිසිදු සිල් සෝද පිරිසිදු ශීලයෙහි පිහිටා දසපළිබොධයන් අතුරෙන් යම් පළිබොධයක් ඇද්ද එය පසිඳ විශුද්ධමාර්ගයෙහි කීක්‍රමයෙන් කමටහන් වැඩිය යුතුය. ඒ යොගාවචරයා විසින් නීවරණාදී ධර්මයෝ ස්වකීය ලක්ෂණ සාධාරණ ලක්ෂණයන්ගේ වශයෙන්ද, ශූන්‍යත්ව සඞ්ඛ්‍යාත ස්වභාවධර්මයාගේ වශයෙන්ද අනිත්‍යාදි සප්තානුදර්ශනයාගේ වශයෙන්ද, නිර්දේශවාරයෙහි ආවාවූ සනත අසන්තාදි ප්‍රභෙදයන්ගේ වශයෙන්ද සම්මර්ශනය කටයුත්තාහ.

මේ නීවරණ බොධ්‍යඞ්ග පර්වදෙක්හි සමථභාවනාව හා මිශ්‍ර නොවූ විදර්ශනා භාවනාවම වදාරණ ලද්දීය. එහෙයින් මේ සතර සිවටත් ලොකොත්තර මාර්ගයට පූර්වභාගයෙහි නො එක් සිත්හි ලැබෙති. ඒ එසේමැයි අන් සිතකින් රූපය පිරිසිඳ දැනගණී අන්‍යවූම සිතකින් වෙදනා සමූහය පිරිසිඳ දනගනී. අන් සිතකින් චිත්තය සමූහය පිරිසිඳ දැනගණී. අන් සිතෙකින් සංඥ, සංස්කාර ස්කන්ධයනට ඇතුළත්වූ නීවරණාදි ධර්මයන් පිරිසිඳ දැනගණී. ලොකොත්තර මාර්ග චිත්තක්ෂණයෙහි වනාහි එකලාවූ සිතෙහිම ලැබේ. ඒ කෙසේදයත්?

සංස්කාරස්කන්ධයට ඇතුළත් ධර්මයන්හි ආත්මාය යන විපර්‍ය්‍යසය, අවිද්‍යෞඝය, අවිද්‍යායොගය. අවිද්‍යාශ්‍රවය. ඉදංසත්‍යාභිනිවෙශ කාය ග්‍රන්ථය; ආත්මවාදෙපාදනය, මොහාගතිය යන මොවුන් ප්‍රහාණය කරන්නාවූ ධර්මයන් පිරිසිඳ සිහිකරන්නාවූ සිහිය ලොකොත්තර මාර්ගය හෙතුකොටගෙණ සම්බන්ධ වේද, එහෙයින් ධර්මානුපස්සනා නම් වේ. යථොක්ත ක්‍රමයෙන් එකම මාර්ග සම්ප්‍රයුක්ත සමෘති තොමෝ සිව්වැදෑරුම් කිස සැපයීමෙන් කායානුපස්සනා

වේදනානුපස්සනා චිත්තානුපස්සනා ධම්මානුපස්සනා යයි නම් සතරක් ලබයි. එහෙයින් මේ සතරම ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි එකසිතෙහිම ලැබේයයි වදාළ සේක.

සර්වඥයන් වහන්සේ සූත්‍රාන්තභාජනීයෙහි ලොවී ලොවුතුරා විසින්ද අභිධර්මභාජනීයෙහි ලෝකෝත්තර මාර්ග වශයෙන්ද සතර සිව්වටන් වදාළසේක. එහෙයින් සැකෙවින් නය විභාගයද මෙහි කිව යුතුය. ඒ මෙසේය;-

ධම්මානුපස්සනා වශයෙන් පැවැති සෝවාන් මඟෙහි ධ්‍යානාභිශූන්‍යතා නිවේසයෙහිලා ශුද්ධික ප්‍රතිපදාය, ශුද්ධිකශූන්‍යතාය, ප්‍රතිපදාය, ශුද්ධික අප්‍රණිහිතය අප්‍රණිහිත ප්‍රතිපදාය යන මේ පස්තන්හි චතුෂ්ක පඤ්චක නය වශයෙන් දශනයෙක, එසේම මාර්ගාභිනිවේශයෙහිලා දශනයෙක, සමෘති ප්‍රස්ථානාභිනිවේශයෙහිලා දශනයෙක, සම්‍යක් ප්‍රධානාභිනිවේශයෙහිලා දශනයෙක, සෘද්ධිපාදාභිනිවේශයෙහිල, දශනයෙක ඉන්ද්‍රියාභිනිවේශයෙහිලා දශනයෙක, බලාභිනිවේශයෙහිලා දශනයෙක, බොධ්‍යඞ්ගාභිනිවේශයෙහිලා දශනයෙක, දසත්‍යාභිනිවේශයෙහිලා දශනයෙක, සමථවිදර්ශනාභිනිවේශයෙලා දශනයෙක: ධර්මාභිනිවේශයෙහිලා දශනයෙක, ස්කන්ධාභිනිවේශයෙහිලා දශනයෙක, ආයතනාභිනිවේශයෙහිලා දශනයෙක, ධාත්වාභිනිවේශයෙහිලා දශනයෙක, ආහාරාභිනිවේශයෙහිලා දශනයෙක, ස්පර්ශාභිනිවේසයෙහිලා දශනයෙක වේදනාභිනිවේශයෙහිලා දශනයෙක, සංඥාභිනිවේශයෙහිලා දශනයෙක, චේතනාභිනිවේශයෙහිලා දශනයෙක චිත්තාභිනිවේශයෙහිලා දශනයෙකැයි මෙසේ විසිවැදෑරුම් අභිනිවේශයන්හි මුළුල්ල නය දෙසිය [200) යක් වෙත්. ඒවා සතර අධිපතීන්ගේ වශයෙන් ගුණකිරීමෙන් නය (800) ක් වෙයි දෙකොටස පිඩුකළ කල්හි නය දහසෙකි. ශුද්ධික සතිපට්ඨානයෙහිද යට කී නියායෙන්ම නය දහසෙක් වේ. සකෘදාගාමී මාර්ග අනාගාමී මාර්ග අර්හත්මාර්ගයන්හිද නය දහස දහස බැගින් පන්දහසක් (5000) වේ. විපාකවාරයෙහිදු මෙපරිද්දෙන් ලැබෙන නය පන්දහස(5000 සුඤ්ඤත, අප්පණිහිත අනිමිත්ත යන ත්‍රිවිධ විමෝක්ෂයන්ගේ වශයෙන් ත්‍රිගුණිතවූ ලෝකෝත්තර විපාක සතරෙහි නය 15000 කි. මෙසේ ධම්මානුපස්සනා වසයෙන් ලෝකෝත්තර කුසල නය 5000 හා විපාක නය 15000 දැයි නය 20000 කි අනික් සතිපට්ඨාන තුනෙහිද මේ නියායෙන් ගත් කල නය 80000 කැයි දතයුතු.

නිවන්පුර වැදීමට මෙ සතිපට්ඨානභාවනාමාර්ගය හැර අන් මඟක් නැති හෙයින්ද ශ්‍රවණසඞ්ගණිකාවෙන් වෙන්ව හුදකලාව හිඳ පිළිපැදිය යුතු හෙයින්ද මේ සස්නෙහි මිස අනික් තැනැක නැති හෙයින්ද යන ආදී නොයෙක් අර්ථයෙන් මේ සතිප ඨානය එකායන මාර්ගයයි වදාළසේක. සාධු! සාධු! සාධු!

පින්වත්තේ සද්ධර්මාකර පිරුවන්හි ආචාර්ය ශාස්ත්‍ර විශාරද පණ්ඩිත පින්වත්තේ දේවානන්ද ස්වාමිපාදයන් වහන්සේ විසින් පවත්වන ලද ධර්මදේශනාව.

---

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

# සතර සම්‍යක් ප්‍රධානයෝ.

---

## 1 ප්‍රධන් වීර්‍ය්‍යය
### (සංවර ප්‍රධානය)

"චත්තාරො සම්මප්පධානා ඉධ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති, පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහාණාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති, වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති."

සැදැහැවත් පින්වතුනි;

දූන් මවිසින් මාතෘකා කරන්ට යෙදුනේ අප තිලොගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් සකල ලෝකසත්ත්වයා කෙරෙහි පතල මහා කරුණාවෙන් දේශනාකර වදාළාවූ "විභඞ්ග ප්‍රකරණයේ" සම්මප්පධාන විභඞ්ගයට අයත් ධර්මපාඨයකි. මා මේ ධර්මකොට්ඨාසය විස්තර කිරීමට පළමුව ධර්මාවවාද වශයෙන් යමක් කිය යුතුව තිබේ

පින්වතුනි!

ත්‍රිවර්ග සම්පත්තියම ලබාකර දීමේ අසහාය කාරණය නම් ධර්ම යයි ධර්මය දන්නා නැතැත්තා සසර බිය දැක විමුක්තිය සඳහා නිතර උත්සාහ වඩයි. එබඳු උත්සාහයක් ධර්මය නොදත්තාහට නැත. දහම් නොදන්නා උභයාර්ථයම විනාශකර ගනියි. එහෙයින් ධර්මය ඉගෙණගන්නා අදහසින් ශ්‍රවණය කළයුතුයි. දහම් පොත, පත බැලිය යුතුයි. සිතකය වචනය යන තිදොර මනාව සංවර කරගෙණ ඉතා හොඳින් ධර්මශ්‍රවණය කරණ මෙන් කරුණාවෙන් මතක් කරමි.

## ත්‍රිවිධ පුග්ගලයෝ.

කරුණා නිධානවූ භාග්‍යවතුන් වහන්සේ එක් තැනකදී පුද්ගලයන් තුන්කොටසකට බෙදූසේක. එනම්- "තයො මෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං කතමෙ තයො? අවකුජ්ජපඤ්ඤො පුග්ගලො උච්ඡඞ්ගපඤ්ඤො පුග්ගලො පුථුපඤ්ඤො පුග්ගලො" යනාදි වශයෙනි. පුද්ගලයෝ තිදෙනෙකි. ඔවුන් අතුරෙන් සමහරපුද්ගල කෙනෙක් අවකුජ්ජ ප්‍රාඥය සමහර කෙනෙක් උච්ඡඞ්ග ප්‍රාඥය, සමහර කෙනෙක් පුථු ප්‍රාඥය යනුයි.

## අවකුජ්ජ ප්‍රාඥ පුද්ගලයා.

සමහර පුද්ගලයෝ ධර්මශ්‍රවණය සඳහා පැමිණෙති. එහෙත් ඒ දෙශනා කරනු ලබන ධර්මයේ මුල - මැද - අග සිහිකරන්ට සමත් නොවෙති. දහම් දෙශනා කරණ කාලයෙහි නා නා ලම්බන යන්හි යෙදුනු සිතිවිලි වලින් යුක්තව දහම් අසන නිසා එසේ ආදි, මධ්‍ය, පරියොසානයන් සිහිකරන්ට අසමත් වෙති එවැනි අයට "අවකුජ්ජපඤ්ඤ" පුග්ගලයයි නම්කර තිබේ.

යටිකුරුකර තබනලද භාජනයකට කොයිතරම් වැසිවැස්සත් එක ජලබිඳ කුදු ඒ භාජනය තුලට නො වැටේ. එසේ යටිකුරු කර තබන ලද භාජනයකට සමාන නුවණ ඇති පුද්ගලයා යන තේරුම "අවකුජ්ජපඤ්ඤ" යන වචනයෙන් කියවේ.

## "උච්ඡඞ්ග ප්‍රාඥ පුද්ගලයා"

සමහර කෙනෙක් ධර්මශ්‍රවණයට පැමිණ එහි ප්‍රකාශ වන ධර්මයේ මුලත් සිහිකරති. මැදත් සිහිකරති. අගත් සිහිකරති. දහම් දෙසනවිට සිත එකඟකර දහම් අසති. එහෙත් එතනින් නැගිට්ට විගස ඒ සියල්ලක්ම සිහිනොකරති. එබඳු පුද්ගලයා උච්ඡංග ප්‍රාඥ නම්. යම් කිසි කෙනෙක් ඔඩොක්කුවෙහි මඤන් මොර ආදි යමක් බහා ඉඳගෙන සිට එය සිහි නොකර නැගිටීනම් ඒ මඤන් මොර ආදී සියල්ලම බිම වැටී විසිරී යයි එමෙන් දහම් දෙසනතෙක් අසාසිට ඒ ඉරියව්ව වෙනස් කෙරූ සැණියේ එය සිහිකිරීමට අසමර්ථ නම් එවැනි පුද්ගලයාට ඔඩොක්කුවට සමාන නුවණ ඇති උච්ඡංග ප්‍රාඥ පුද්ගලයායයි කියනු ලැබේ.

## "පුථුප්‍රාඥ පුද්ගලයා"

සමහර කෙනෙක් ධර්මශ්‍රවණය සඳහා පැමිණ එහි ආදි මධ්‍ය පරියොසානයන් හොඳට ශ්‍රවණය කර එයින් පසුවත් එය නිධානයක් සේ මනාසේ සිත් සතන්හි තැන්පත්කර ගනීනම් එබඳු

පුද්ගලයාට "පුථුප්‍රඥ" යයි කියනු ලැබේ. උඩුකුරුකර තබන ලද කළයට වැටෙන තරම් වැසිධාරා පිටත යානොදී රැකගන්නාසේ ධර්මය හොඳට ධාරාගනීනම්! ඒ කැනැත්තාට උඩුකුරු කරණ ලද භාජනයකට සමාන නුවණැති පුද්ගලයායයි කියනු ලැබේ.

දැන් මේ පුද්ගලයන් තිදෙනා අතරෙන් වඩා හොඳ 'පුථු ප්‍රාඥ" පුද්ගලයා බව මේ පින්වතුන්ට වැටහී ඇති. එබැවින් අවකුජ්ජ ප්‍රාඥ' උච්ඡඞ්ගප්‍රාඥ පුද්ගලයන් නොවී පුථු ප්‍රාඥ පුද්ගලයන් වී. ධර්මශ්‍රවණය කර ස්වර්ගමොක්ෂ සම්පත් ප්‍රතිලාභය කරගැනීම සඳහා හොඳින් ධර්මශ්‍රවණය කළ යුතුයි.

---

සුපින්වත්නි!

අද මට ධර්මදෙශනා කිරීමට නියමවී තිබෙන්නේ සතර සම්‍යක් ප්‍රධාන වීර්‍යයන් ගෙන් ප්‍රථම ප්‍රධාන වීර්‍යය පිළිබඳවයි. එයට පළමුව සම්‍යක් ප්‍රධානයන් ගැණ අවබෝධයක් මේ පින්වතුන්ට ලබාදිය යුතුව තිබේ. මා ප්‍රථමයෙන් මාතෘකා කළ සද්ධර්මපාඨයේ අදහස කුමක්?-

සම්‍යක් ප්‍රධානයෝ සතරදෙනෙක් වෙති. මේ ශාසනයෙහි යම්කිසි භික්ෂුවක් නූපන් අකුසල ධර්මයන්ගේ නූපදීම පිණිසද, උපන්නාවූ අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිසද, නූපන් කුසල ධර්මයන්ගේ ඉපදීම පිණිසද, උපන් කුසල ධර්මයන්ගේ වැඩීම පිණිසද, කතෘ කාම්‍යතා කුසල ඡන්දයන් උපදවාද, වීර්‍ය කෙරේද? දැඩි උත්සාහ කෙරේද. කායික චෛතසිකවීර්‍ය කෙරේද, එබඳු සම්‍යක් ප්‍රධානයෝ සතරෙක් වෙති කියායි. එබැවින් සසර බියදන්නා සුළුවූ භාවනානුයොගී භික්ෂුව විසින් ආශ්‍රවක්ෂය පිණිස මෙකියන ලද චතුර්විධ ක්‍රමයට අනුව උත්සාහ කළ යුතුයි.

මේ සිව්වැදෑරුම් වීර්‍යයෙන් තොරව ලෞකිකවූද, ලොකොත්තරවූද, කිසිම ගුණ විශෙෂයක් ලබාගැණීමට නොහැකිය. එහෙයින් උසස් දියුණුවක් බලාපොරොත්තු වන්නන් විසින් ඒකී වීර්‍ය වැඩිය යුතුය.

"විරියෙන දුක්ඛං අච්චෙති" වීර්‍යයෙන් දුක් ඉක්මවයි. කියා බුදුන් වහන්සේ වදාළේ එහෙයිනි. ඒ මේ වීර්‍ය නොයෙක් තැන් වලදී නොයෙක් නාමයන්ගෙන් ප්‍රකාශකර තිබේ.

සත්තිස් බොධිපාක්ෂික ධර්මයන්ට අයත් මේ සතර සම්‍යක් ප්‍රධානයන්ගෙන් කියනු ලබන්නේද වීර්‍යමය අභීෂ්ටාර්ථ සිද්ධ කරුගැණීමට ඉවහල් වන හෙයින් වීර්‍යය සතර ඍද්ධිපාදයන් ගෙන්ද එකකි.

අවිද්‍යාදි විරුද්ධ ධර්මයන් මැඩ පැවැත්වීමේ ප්‍රධානත්වයන් දරණ හෙයින් පඤ්චින්ද්‍රියන්ගෙන්ද එකකි වීර්‍ය්‍යය, අවිද්‍යාදි කෙලෙශ ධර්මයන් විසින් නොසෙල්විය හැකි හෙයින් වීර්‍ය්‍යය පඤ්ච බලයන් අතරෙන්ද එක් බලයකි.

ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහිදී සම්මා වායාම යනුවෙන් කියන ලද්දෙත් මේ වීර්‍ය්‍යය, සප්තබොධ්‍යඞ්ගයන්ගෙන් මේ වීර්‍ය්‍යයද එක් බොධ්‍යඞ්ගයකි සත්තිස්බොධිපාක්ෂිකයන්හි නව මඟා කෘත්‍යයක් මේ වීර්‍ය්‍යය සිද්ධකරයි. මෝක්ෂය ලබාගැනීමට නම් මෙම වීර්‍ය්‍යය ඇතිකර ගත යුතුය. ලෝකයේ මොනම දෙවිබ්‍රහ්මකුට වත් කෙනෙකුගේ විමුක්තිය ලබාදිය නොහැක්ක' තම තමන්ගේ උත්සාහය අනුවම එය සිද්ධකර ගතයුතුය.

“තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතා” තොප විසින් උත්සාහ කටයුතුයි. තථාගතයෝ මඟකියාදෙන්නාහ. මේ බුදුන් වහන්සේගේ ඉගැන්වීමයි. නිරායාසයෙන් කිසිම දෙයක් ලබාගත නොහැක. ප්‍රඥාවෙන් යුක්තව කරණ ඒ මේ උත්සාහය සම්පූර්ණ සිද්ධිය ඇතිකර දෙයි. එහෙයින්ම වදාළේ-

“පඤ්ඤාතුසාහං විරියං වදන්ති - සබ්බත්ථ සිද්ධිග්ගහණග්ගහත්ථං” නුවණින් කරණ වීර්‍ය්‍යයෙන් යහපත් ප්‍රතිඵල දෙලොවදීම ලබාගත හැක. යහපත් කටයුතුවල නියැලී අයට නිතරනිතර බාධාවන්ට මුහුණ පාන්ට සිදුවේ. එහෙත් දැඩි ධෛර්‍ය්‍යයෙන් යුත් කැනැත්තෝ ඒ කිසිවෙකුදුත් පසුනොබසී.

“සඞ්ගාමෙ මෙ මතං සෙය්‍යො යඤ්චෙ ජීවෙ පරාජිතො” කෙලෙස් සටනට ගොස් පරදිනවාට වඩා මියෑම යෙහෙක. මෙය දිනක් මරහුට වදාළ පාඨයකි.

බෝසත්තුමා ඇටසැකිල්ලක් වන්තුරු දුෂ්කර ක්‍රියා කළ සමයේ දිනක් මර දෙව්පුත් පැමිණ පින්වත! ශරීරය බොහෝ කෘශවූයෙහිය. ජීවිත විනාශය ඉතා ආසන්නය. මැරෙණවට වඩා ජීවත්වීම ශ්‍රේෂ්ටය ජීවත්වී පින්කරවයි අවවාද කෙළේය. එවිට බෝසත්තුමා තමාගේ නොපසුබට උත්සාහය දක්වනු පිණිස.

ලොහිතෙ සුස්සමානම්හි - පිත්තං සෙම්හඤ්ච සුස්සති
මංසෙසු ඛීයමානෙසු - භීය්‍යො චිත්තං පසීදති
භීය්‍යො සතිච පඤ්ඤාච - සමාධි මම තිට්ඨති.

ධෛර්‍ය!

ලේ වියළී යන කල්හි පිත් සෙම්ද වියලේ. මස් ක්ෂය වන කල්හි වඩ වඩාත් මගේ සිත ප්‍රසන්න වේ. සමෘතියද, ප්‍රඥාවද, සමාධියද වඩ වඩාත් පිහිටයි. මෙසේ මරහුට අවවාද කළහ. සසර දුක් නැතිකළ සියළුම උත්තමයෝ වීර්‍ය නිසාම ඒ සියලු දුක් නැති කළහ.

කාමං තචො ච නහරු ච- අට්ඨි ච අවසුස්සතු
උප සුස්සතු මෙ ගතෙත - සබ්බං තං මංස ලොහිතං

"මගේ ශරීරයෙහි එකාන්තයෙන් සම්- මස්- නහර- ඇට ඉතිරිවේවා! සියලුම මස් ලේ වියලේවා! මාගේ අධිෂ්ඨානය මුදුන් පමුණුවා මිස ආසනයෙන් නොනැගිටිමි" යන එහි අදහසයි.

මෙසේ දෘඪ අධිෂ්ඨාන බලවීර්‍යයෙන් යුක්තව ක්‍රියාකරන්නා හට ලොකයේ නොලැබිය හැකි සම්පතෙක් නැති බැව් සැලකිය යුතුයි. වීර්‍යයට වීර්‍ය වශයෙන් බොහෝ නාම ව්‍යවහාර කරති.

"යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො- උය්‍යාමො- වායාමො- උස්සාහො උස්සොළ්හී ථාමො, ධිති- අසිථිල පරක්කමතා අනික්ඛිත්ත ඡන්දතා= අනික්ඛිත්ත ධුරතා- ධුර සම්පග්ගාහො- විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මා වායාමො ඉදං තස්මිං සමයෙ විරිය බලං හොති යන ධම්ම සඞ්ගණී පාඨයෙන් වීර්‍ය පිළිබඳ දෙශිත පර්‍යාය නම්කීපයක් අවබොධ කරගත හැක. සම්මප්පධාන යන මෙයින් උගන්වන්නේද, මනා වීර්‍යයයි: පධාන යනු වීර්‍යයට නමකි. සම්මා යන පදයෙන් මනා උතුම් පරිපූර්ණ, කාරණ උපාය, නිවණින් යන අර්ථ ගෙනදෙයි.

"සම්මා පධානානීති, සුන්දර පධානානි, උත්තම විරියානි සම්මප්පධානානීති, පරිපුණ්ණ විරියා (අඞ්ගුත්තර නිකායට්ඨකථා) සම්මප්පධානානීති. කාරණප්පධානා, උපායප්පධානා යොනිසොප්පධානා [සම්මොහ විනොදනී)

චත්තාරො යනු සතරය එයින් සම්‍යක් ප්‍රධානයෝ අඩුවැඩි නැතිව සතරක්ම බව දැක්වූහ. මේ සතර සම්‍යක් ප්‍රධානයෝ නිවනට නැඹුරුවූ ජීවත ලංකාරදීමට හැක්කාවූ ධර්මයෝය.

"සෙය්‍යථාපි භික්ඛවෙ ගඞ්ගා නදී, පාචීන නින්නා පාචීන පොණා පාචීන පබ්භාරා, එව මෙව ඛො භික්ඛවෙ චත්තාරො සම්මප්පධානා භාවෙන්තො චත්තාරො සම්මප්පධානා බහුලීකාරොන්තො නිබ්බාණ නින්නො හොති, නිබ්බාණ පොණො නිබ්බාණ පබ්භාරො= (සංයුත්ත නිකාය)

යම්සේ ගංගා නම් නදියේ ජලප්‍රවාහය නැගෙනහිර සමුද්‍රකරා ගලාබසීනේද එමෙන් සතර සම්‍යක්ප්‍රධානයන් වඩන තැනැත්තාගේ සිතද නිවණ කරා නැඹුරුවෙන බව නිවණ අරමුණු කොට පවත්නා බව මෙයින් ප්‍රකාශ වෙයි.

මෝක්‍ෂාර්ථීවූ අපි සියලු දෙනාම නිවණ බලාපොරොත්තු වන්නෝ වෙමු. ශාන්තවූ නිවණ මේ සතර සම්‍යක්ප්‍රධාන සඞ්ඛ්‍යාත මහාවූ වීර්‍ය්‍යයෙන්ම ලබාගත යුත්තය කාමේෂණා භවේෂණා, බ්‍රහ්මචරියෛෂණා යයි කියන ලද ත්‍රිවිධ එෂණාවන්ගේ ප්‍රහාණය පිණිසද උද්ධම්භාගීය සංයෝජනයන්ගේ ප්‍රහාණය පිණිසද මේ සතර සම්‍යක්ප්‍රධානයන් වැඩිය යුතු බව නොයෙක් සූත්‍ර දේශනාවන්හි වදාරා තිබේ. වීර්‍ය්‍ය වඩන භික්ෂුව හට අඞ්ග පසක් පිහිටිය යුතු බව අඞ්ගුත්තර පඤ්චක නිපාතයෙහි දක්වේ.

“පඤ්චිමානි භික්ඛවෙ පධානියඞ්ගානි කතමානි පඤ්ච ඉධ භික්ඛවෙ භික්ඛු සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං ඉති පි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජා චරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති’’ අප්පාබාධො හොති, අප්පාතඞ්කො සමවෙපාකිණියා, ගහණියා, සමන්නාගතො නාතිසීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය, පධානක්ඛමාය අසඨො හොති අමායාවී යථාභූතං අත්තානං ආවිකත්තා සත්ථරිවා විඤ්ඤූසු සබ්‍රහ්මචාරීසු ආරද්ධ විරියො හොති අකුසලානං ධම්මානං පහාණාය කුසලානං ධම්මානං උපසම්පදාය ථාමවා දළ්හ පරක්කමො අනික්ඛිත්ත ධුරො කුසලෙසු ධම්මෙසු පඤ්ඤවා හොති උදයත්ථ ගාමිණියො පඤ්ඤාය සමන්නාගතො අරියා නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛය ගාමිණියා ඉමානි ඛො පඤ්ච පධානියඞ්ගානි’’

මහණෙනි! උත්සාහ වඩන්නාවූ භික්ෂුවට අඞ්ග පසක් පිහිටිය යුතුය. ඒ පස කවරේද? මහණෙනි; මේ ශාසනයෙහි භික්ෂු තෙමේ සැදැහැයෙන් යුක්තවේද? බුදුන් වහන්සේ නව අරහාදි බුදුගුණයෙන් යුක්තයයිද උන්වහන්සේ විසින් චතුර් මාර්ගඥානය මනාසේ අවබොධ කරණ ලද්දේයයි අදහාද ස්වල්පාබාධ ඇත්තෝ නිදුක් වූයේ නාති සීත නාති උෂ්ණ මධ්‍යම ප්‍රමාණ සෘතු ගන්නා ස්වභාව ඇත්තේ වේද;

ශ්‍රද්ධා- සද්දහතීති සද්ධා, බුද්ධාදි රත්නත්‍රය කෙරෙහි ඇති භක්ති යට ශ්‍රද්ධාවයයි කියනු ලැබේ. එය සක්විති රජුගේ උදක ප්‍රසාද මැණික මෙන්, බුද්ධාදි රත්නත්‍රය කෙරෙහි ගුණ විශ්වාස කිරීමෙන් කාමච්ඡන්දාදි චෛතසිකයන් පැහැ වීම ස්වභාවකොට ඇත්තේය,

**ශ්‍රද්ධා ප්‍රභේද-** "සද්ධාපනෙසා ආගම සද්ධා, අධිගම සද්ධා, ඔකප්පන සද්ධා, ප්‍රසාද සද්ධාති චතුබ්බිධා" මේ ශ්‍රද්ධා තොමෝ ආගම අධිගම, ඔකප්පන ප්‍රසාද වශයෙන් සිව් වැදෑරුම් වන්නීය.

**ආගම ශ්‍රද්ධා-** බුද්ධ ඥානය, ප්‍රත්‍යෙක ඥානය, අර්හත් ඥානය, යන තුන්තරා බෝධියෙන් එක්තරා බෝධියක් අපේක්ෂාවෙන් පින්රැස්කරමින් භවයෙන් භවයට එන ශ්‍රද්ධාව ආගම ශ්‍රද්ධා නම්. එහෙයින් සර්වඥ බෝධිසත්ත්වවරයන්ගේ ශ්‍රද්ධාව අභිනීහාරයේ පටන් පැමිණි හෙයින් ආගම ශ්‍රද්ධාවයයි කියනු ලැබේ. එබඳු උත්තම යන්ට කර්මඵලාදිය හා බුද්ධාඞ්කුර ධර්මාදිය පිළිබඳ යහපත් විශ්වාසය සසර පුරුද්දක් වශයෙන්ම පවත්නේය.

**අධිගම ශ්‍රද්ධා-** "අරියසාවකානං පටිවෙධෙන අධිගතත්තා අධිගම සද්ධානාම" චතුරාර්ය සත්‍යාවබෝධයෙන් ආශ්‍රවක්ෂය කළාවූ රහතුන් වහන්සේ පිළිබඳ ශ්‍රද්ධාව අධිගම ශ්‍රද්ධාවයයි කියනු ලැබේ. අනිකෙකුගේ කීමක් නිසාවත් අනිකෙකුගෙන් ඇසූවාටවත් නොව තෙමේ නිර්වාණ ප්‍රත්‍යක්ෂව අවබෝධ කළ හෙයිනි.

**ඔකප්පන සද්ධා-** "බුද්ධො ධම්මො සංඝොති වුත්තෙ අචල භාවෙන ඔකප්පනං ඔකප්පන සද්ධානාම" බුද්ධ ධම්ම සංඝ යන රත්නත්‍රය කෙරෙහි අචල භාවයෙන් පිහිටි ශ්‍රද්ධා තොමෝ ඔකප්පන ශ්‍රද්ධා නම්. යමක් තර්කානුකූලව හේතු සහිතව කල්පනා කිරීමෙන් අවබෝධ කරගත් කල්හි ඒ ගැන කිසි සැලකීමක්, කල්පනා කිරීමක් ඇතිනොකර ගනියි. එය සිද්ධාන්තයක් වශයෙන්ම රැකගනියි. එමෙන්ම කිසිවෙකුවත් නොබිඳිය හැකි නොසෙල්විය හැකි ශ්‍රද්ධාව ඔකප්පන ශ්‍රද්ධා නම්.. මේයට අචල ශ්‍රද්ධාවයයි කියනු ලැබේ

**ප්‍රසාද ශ්‍රද්ධා-** "පසාදුප්පත්ති පසාද සද්ධානාම" සක්විති රජහුගේ උදක ප්‍රසාද මැණික බොරදියෙහි දැමූවිට වහා එම ජලය පිරිසිදු කරණ ස්වභාවයක් එහි පවත්නේය. එමෙන්මේ ප්‍රසාද ශ්‍රද්ධාවද තමා හා යෙදුනු සෙසු චෛතසික ධර්මයන් බුද්ධාදි රත්නත්‍රය කෙරෙහි පහදවන ස්වභාවය ඇති හෙයින් මේයට ප්‍රසාද ශ්‍රද්ධාව යයි ව්‍යවහාර කරනු ලැබේ.

**නිරෝගී බවද ප්‍රධන් වීර්‍යාංගයකි.**

නිතර නිතර යමෙක් රෝග දුක්ඛයෙන් පෙළේනම් ඔහුට ප්‍රධන් වීර්‍ය වැඩීමට අවකාශයක් නො ලැබේ. ශීතාධික ප්‍රදෙශයන් හා කාලයන් සෙවුමෙන් ශීත හීරුක වීමද, ඌෂ්ණාධික ප්‍රදෙශයන් හා කාලයන් සෙවුමෙන් ඌෂ්ණ හීරුක වීමද සිදුවේ. සම්

ප්‍රමාණ සෘතූන් හා කාලයන් නොසෙවුමෙන් ප්‍රධන් වීර්‍ය වැඩීමක් කළනොහැක. එබැවින් මධ්‍යම ප්‍රමාණයෙන් පවත්නා ශීතොෂ්ණ ප්‍රදෙශයන් හා කාලයන් සෙවුම ප්‍රධන් වීර්‍යයට සප්‍රායවේ. එසෙයින්ම එය ප්‍රධන් වීර්‍යයට අඞ්ගයකි.

**අසඨ අමායාවී ස්වභාවයද ප්‍රධන් වීර්‍යාඞ්ගයකි:—**

සඨ නම් තමාගේ අවිද්‍යමාන ගුණදක්වීමයි. සමහර වෙළඳුන් බඩුවල නැතිගුණ දක්වමින් භාණ්ඩ විකුණන්නාසේ තමාකෙරෙහි අවිද්‍යමාන ගුණ ඇතිසේ දක්වමින් ක්‍රියාකිරීම සඨනම් වේ. එනම්: හොරාටික භාවයයි එබඳු සඨකමින්-හොරාටික කමින් තොර වූයේ අසඨ නම් වේ. මායා නම් තමාගේ වරද සඟවන ස්වභාවයයි. එවැනි වරද සඟවන සවභාවයෙන් තොරවූයේ අමායාවී නම් වේ. මෙසේ බුදුන් වහන්සේ ඉදිරියෙහි හෝ නුවණැත්තන් ඉදිරියෙහි හෝ සබ්බ්‍රම්සරුන් ඉදිරියෙහි හෝ තමා කෙරෙහි හෝ විද්‍යමාන ගුණම දක්වන තමාගේ වරදවල් නොසඟවන සවභාවයක් වේනම් එයද ප්‍රධන් වීර්‍යයට කාරණයක් වේ

**ආරබ්භවීර්‍යද ප්‍රධන් වීර්‍ය වඩන්නහුගේ අඞ්ගයකි.**

අකුසල ධර්‍මයන්ගේ වැඩීම පිණිසද කුසල ධර්‍මයන්ගේ වැඩීම පිණිසද යම් දෘඪවීර්‍යයක් පරාක්‍රමයක් වේනම් එද ප්‍රධන් වීර්‍ය වඩන භික්ෂුවගේ අඞ්ගයකි.

**විදර්ශනා ප්‍රඥාවෙන් යුක්තවීමද ප්‍රධන් වීර්‍යාඞ්ගයකි.**

නාමරූප ධර්‍මයන් ලක්ෂණ රස පච්චුපට්ඨාන පදට්ඨාන වශයෙන් එකක් පාසා බෙදා එය නුවණින් දත නාම රූපධර්‍මයන්ගේ පැවැත්මට හේතුවූ අවිද්‍යා- තෘෂ්ණා - කර්‍ම- උපාදාන - ආහාරාදි හේතු ධර්‍මයන්ද අවබොධකරනෙන එකී සියල්ලක්ම ඉපිද ඉපිද බිඳී බිඳී යන හෙයින් අනිත්‍යයයිද යමක් වහ වහා ඉපෙදෙමින් විනාශ වෙමින් පවතින්නේ නම් එය දුඃඛයයිද යමක් දුක නම් හර වශයෙන් ගතයුතු කිසිවක් නැති හෙයින් අනාත්මයයිද මෙසේ ත්‍රිලක්ෂණයට නගා සියලු සංස්කාර ධර්‍මයන් දක්නා සවභාවය විදර්ශනා ඥාන නමි. පහන් කබලත් පහන් වැටියත් තෙලත් යන මොවුන්ගේ සම්වායෙන් පහන් ශිඛාව (පහන් දැල්ල) ඉපද ඉපද තෙල් හා පහන් වැටියත් ගෙවීයාමෙන් පහන්සිලුව නිවෙන්නාක් මෙන් චක්ෂුරාදි ෂඩායතනයන්ට රූපාදි ෂඩාරම්මණයන්ගේ සම්වායෙන් චක්ෂුර් විඥනාදීහු ඉපිද ඉපිද නිරුඩවෙවී යති. එයින් නිත්‍ය වශයෙන් ගතයුතු යමක් නැත. යමක් නිත්‍ය නොවේනම් නිතර වෙනස් වන සුළුනම්, එය දුකය, යමක් දුක නම් එය අනාත්මය; සත්‍ව, පුරුෂ, මාර, දෙව වශයෙන් පවත්

නාවූ මේ ස්කන්ධයන්ගේ යථා සවභාවය මෝහාන්ධකාරයෙන් වැසී තිබෙන හෙයින් එය සාමාන්‍ය ඇසට අවබෝධකරගත නොහැක. ප්‍රඥා ඇසින් සම්මුති පරමාර්ථ ධර්මයන් අවබොධකරගෙන එකී නාමරූප ධර්මයන්ගේ පරිණාම සවභාවය යථා තත්වයෙන් වටහා ගැනීම විදර්ශනා නම්.

විශෙෂයෙන් දක්නා සුලුවූයේය යන තේරුම්සි, ඒ මේ විදර්ශනා ප්‍රඥාව නවවිධවේ. උදයව්‍යය ඥානය- භඞ්ගඥානය- භය ඥානය= ආදීනව ඥානය= නිබ්බිද ඥානය- මුඤ්චිතුකම්‍යතාඥානය. පටිසඞ්ඛාන ඥානය සඞ්ඛාරුපෙක්ඛා ඥානය- අනුලෝම ඥානය- යන වසයෙන්.

උදයව්‍යයඥානය සියලුම සසකාර ධර්මයන් අනිත්‍ය- දුක්ඛ- අනාත්ම යන ත්‍රිලක්ෂණයට නගා මෙනෙහි කරන ඥානය උදව්‍යය ඥාන නම්. මෙය සම්පූර්ණ ආකාරයකින් පහළවේ.

භඞ්ගඥානය- ජලය මතුපිට නැගි නැගී බිඳී බිඳී යන දියබුබුළු මෙන් සියලුම සංස්කාරයෝ ඉපිද ඉපිදවහ වහා බිඳී බිඳී යෙත්යයි,, සංස්කාරයන්ගේ භඞ්ග සවභාවය දන්නා නුවණ භඞ්ගඥාන නම්.

භය ඥානය- ඒ මේ සංස්කාරයන්ගේ භඞ්ග සවභාවය දුක් මෙන් ත්‍රිවිධ භවය පිළිබඳ දක්නා බියජනක සවභාවය භය ඥාන නම්,

ආදීනව ඥානය- ත්‍රිවිධ භවය පිළිබඳ සංස්කාරයන්ගේ බියජනක තත්වය දුකීම මෙන් එහි ආදීනවදෙස්) දක්නා නුවණ ආදීනව ඥාන නම්.

නිර්වේද ඥානය- එසේ ආදීනව වශයෙන් දක්නා ඒ සංස් කාරයන් විෂයෙහි කලකිරීම් වශයෙන් උපදනා නුවණ නිර්වේද ඥාන නම්.

මුඤ්චිතුකම්‍යතා ඥානය- කලකිරීමට පැමිණි සංස්කාරයන් ගෙන් මිදීමේ ආකාරයෙන් උපදනා ।නුවණ මුඤ්චිතු කම්‍යතා ඥානය නම්.

පටිසංඛ්‍යාන ඥානය- ඒ සංස්කාරයන්ගෙන් මිදෙනු කැමැ තිවනැවත නැවත අනිත්‍යාදි වසයෙන් එකීසංස්කාරයන් මෙනෙහි කිරීම් වසයෙන් පහළවන නුවණ පටිසංඛ්‍යාන ඥානය නම්.

සංස්කාරුපෙක්ෂා ඥානය- සංස්කාරයන්ගේ අනිත්‍යතාදිය නැවත නැවත නුවණින් සලකාබලුන් කෙරෙහි ඇල්ම හා භීතිය දුරුකිරීම් වසයෙන් මධ්‍යස්ථාකාරයෙන් දක්නා නුවණ, සංස්කා රුපෙක්ෂා ඥාන නම්.

**අනුලෝම ඥානය-** මෙසේ අටවැදෑරුම් මේ උදයව්‍යයාදි ඥානයනටත් සත්තිස්බෝපැකි දම්වලටත් අනුකූල වසයෙන් පවත්නා ඥානය අනුලෝම ඥාන නමි.

මේ සතර වැදෑරුම් සම්‍යක් ප්‍රධානයෝ ලෞකික ලෝකොත්තර වසයෙන් ද්විධවෙත්. "අයං කදු සි සම්මප්පධාන කථානාම දු ධා ලොකිය ලොකුත්තර වසෙන' යනුමෙන් ඒ බව දක්වන ලදී.

**ලෞකික සම්‍යක්ප්‍රධානය-** මාර්ග චිත්තය පහළවන්නාව ප්‍රථමයෙන් නොයෙක් සිත් සමග නානා ක්‍ෂණික වසයෙන් ලෞකික ප්‍රධන් වීර්‍ය්‍යයෝ පහලවෙති එකසිතක් සමග පහලව නූපන් අකුසල ධර්මයන්ගේ ප්‍රහාණය පිණිස උත්සාහ කෙරෙයි. තවත් චිත්තයක් සමග පහලව නූපන් කුශල ධර්මයන්ගේ ඉපදීම පිණිස වීර්‍ය්‍යකෙරෙයි අන්‍යචිත්තයෙක්හි පහළව උපන් කුසලධර්මයන් නොනැසී පවත්වා හැනීමට උත්සාහ කෙරෙයි. මෙසේ ලෞකික අවසථාවන්හිදී වරින් වර ඒ ඒ චිත්තයන් සමග මේ සතර සම්‍යක් ප්‍රධානයන් වෙන වෙනම යෙදෙන බව දතයුතුයි.

ලෞකික සමථ විදර්ශනාලාභී අය වුවද ඒ සමථ විදර්ශනාවන් ගෙන් පිරිහීමටද, අවසථා සැලසෙන බව, එවමපි උප්පන්නා සමථ විපස්සනා නිරුජ්ඣමානා අනත්ථාය සංවත්තන්තීති වෙදිතබ්බා, යනුමෙන් දක්වන ලදහ. මේ කථාවස්තුවෙන්ද එය මනාව වටහා ගත හැක.

පෙර ලක්දිව තිසක් පමණ භික්ෂූන් වහන්සේලා කැලණි මහ විහාරය වැඳ වනමාර්ගයෙන් ගොස් මහා මාර්ගයකට පිළිපන්හ. එසේ වඩින්නාවූ උන්වහන්සේලා ඉදිරිපසින් දවන ලද පෝන් කර්මාන්ත කොට එන්නාවූ මගියෙකු දුටුහ. එතෙමේ අඩක් දැවුණු දරමිටි යකුත් කරතබාගෙන දැලිවැකුණු තනවන් කඩක් ඇඳගෙන දැවුණු කනුවක්මෙන් පෙනෙන්ටවිය: සාමණේර භික්ෂූන් වහන්සේලා ඔහු දැක ඔවුනොවුන් කෙළිකවට කම් කරන්ටද පටන්ගත්හ. ඒ පුරුෂ තෙමේද මහ තෙරුන් වහන්සේගේ ඉදිරියට පැමිණ නමස්කාර කෙළේය. ඔහු ඉදිරිපිටදීද ඒ සෙරණෝ කෙළිකාවට වදන් කීහ. එවිට ඒ පුරුෂ තෙමේ මෙසේ කියන්ට විය. ඔබව හන්සේලා මහණකම ලද පමණින් සියල්ලම සම්පූර්ණ වූවාහුයයි සිතන්නාහුද, ඔබවහන්සේලා එකනාමකවද විශේෂ ඝාග්‍රතාවයක් පමණ කුදු නැත. මමද ඔබවහන්සේලා වගේම මහණව සිටි කෙනෙක්මි. මාගේ දැත දෙස බලන්න· දැන්නම් මේ දැත වඳුරු අත්මෙන්ය. මගේ මේ අතින් සඳහිරු දෙදෙන සපර්ශකළ වාර ගණන් නැත. ඒ සඳහිරු දෙදෙනා මාගේ පාපුටුව කරගෙණ සිටියෙමි. අහස

පොළොව කැළෙම් පොළොව අහස කළෙමි. දසදහසක් සක්වළ විනිවිද ගියෙමි. එවැනි මාගේ මේ සෘඩිය සුළු ප්‍රමාදයකින් අතුරු දහන්විය. එබැවින් ප්‍රමාදවීම හොඳ නැත. ඔබවහන්සේලා වහ වහා අප්‍රමාදවනු මැනවැයි තර්ජනාත්මක අවවාදයක් දුන්නේය. ඒ අසාසිටි තිස්නම සංවේග උපදවා විදසුන් වඩා එහිදීම රහත්වූහ.

මේ කථා ප්‍රවෘත්තියෙන්ද ලෞකික සමථ විදර්ශනාවන් සුළු ප්‍රමාදයෙන් නමුත් විනාශවන්ට හැකි බව තේරුම් ගතයුතුය.

**ලෝකෝත්තර සම්‍යක් ප්‍රධානය=**

ලෝකෝත්තර සම්‍යක් ප්‍රධානය වනාහි මේ සතර වැඩ-රුම් කෘත්‍යයම එකවිටම සිඩ කෙරෙයි. එහිදී මාර්ග සම්ප්‍රයුක්ත මේ එකම වීර්‍ය චෛතසිකය කෘත්‍ය සතරක් සිද්ධ කරණ බැවින් යථෝක්ත අභිධාන සතර ලබනබව සිහි කටයුතුය.

ඒ සම්‍යක් ප්‍රධානයන් අතරෙන් අද විස්තර කළයුතුව තිබෙන්නේ ප්‍රථම සම්‍යක් ප්‍රධානය ගැනය- ''අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති'' යනු ඒ පිළිබඳ දේශනා පාඨයකි.

අනුප්පන්නානං- නූපන්නාවූ- පාපකානං- ලාමකවූ- අකුස-ලානං ධම්මානං- අකුසල ධර්මයන්ගේ නූපදීම පිණිස- ඡන්දං- කරණු කැමති බවයයි කියන ලද කුසල ඡන්දය- ජනෙති- උප දියි. වායමති දැඩි උත්සාහ කෙරෙයි. විරියං ආරභති- කායික චෛතසික වීර්‍ය කෙරෙයි. චිත්තං පග්ගණ්හාති සිත ඔසවා තබයි පදහති ප්‍රධන් වීර්‍ය කෙරෙයි යනු මෙහි තේරුමයි. මෙහි භාවය නම නූපන් අකුසල ධර්මයන්ගේ නූපදීම පිණිස වීර්‍ය වැඩීමයි

අකුසලධර්මයන්ගේ නූපදීම අසමුදාචාර වශයෙන් හෝ අනනු භූතාරම්මණ වශයෙන් හෝ සිදුවන්නේය. මේ අනවරාග්‍ර සංසාරයෙහි භ්‍රමණය කරන්නාවූ සත්වයන්ට නූපන් අකුසල ධර්මයක් නම් නැත. යම් අකුසල ධර්මයෙක් උපදින්නාහුනම් ඔව්හු පෙර අනවරාග්‍ර සංසාරයෙහි උපන් අකුසල ධර්මයෝම වෙත් ප්‍රහීන වන්නාහුද අනවරාග්‍ර සංසාරයෙහිවූ අකුසල ධර්මයෝම ප්‍රහීන වෙත්. කීයේ මැනෝ.

**''තත්ථ අනුප්පන්නා නාම අසමුදාචාර වසෙන වා අනනුභූතාරම්මණවසෙන වා අනුප්පන්නානං අභාවෙ නාසි අනමතග්ගෙ සංසාරෙ අනුප්පන්නා පාපකා අකුසලා ධම්මා නාම නත්ථි අනු-ප්පන්නා පන උප්පජ්ජමානාපි එතෙ යෙව උප්පජ්ජන්ති පහීය මානාපි එතෙයෙව පහීයන්ති''**

මේ සස්නෙහි මහණවූ භික්ෂුතෙමේ සසර බිය දක්නේ ක්ලේශයන්ගේ අනුත්පාදය සඳහා වීර්‍ය්‍ය වඩයි. වත් පිළිවෙත් පිරීම් ආදී වශයෙන් කටයුතු කරණ ඒ මහණ හට ක්ලේශයන්ගේ උත්පාදයට අවසරයෙක් නොලැබේ එසේ ක්ලේශයන්ගේ අනුත්පාදය සඳහා කටයුතු කරණ ඒ භික්ෂුව හට අසමුදාචාර වශයෙන් ක්ලේශයෝ නූපදිති.

“තස්ස එකචජස්ස වත්ත වසෙනවා කිලෙසාන සමුදච-රන්ති එකච්චස්ස ගන්ථ, ධුතඞ්ග, සමාධි, විපස්සනා, නවකම්මිකානං අඤ්ඤතරවසෙන” යනාදී වශයෙන් විභඞ්ගට්ඨ කථාවෙහි අසමුදාචාර වශයෙන් කෙලෙසයන් නූපදින කරුණු කීපයෙක් දක්වා තිබේ. එනම්,= ඇතමෙකුට වත්පිළිවෙත් පිරීම් වශයෙන්ද ඇතමෙකුට ග්‍රන්ථ ධුරය පිරීම් වශයෙන්ද, තවකෙනෙකුට ධුතාඞ්ග සමාදාන වශයෙන්ද, තවත් සමහරෙකුට නවකර්මාන්ත කිරීම් වශයෙන්ද, කෙලෙසයන් උපදීමට අවසථා නොලැබේත්.

වත් පිළිවෙත් පිරීම් වසයෙන් කෙසේ කෙලෙශයන් නූපදිත්ද, ඇතැම් භික්ෂුවක් වත්ත සම්පන්නවූයේ දෙයාසූවක් කුඩාවත් හා තුදුසක් මහාවත්ද, දාගැබ් මළුවෙහි කළයුතු වත්ද, බෝමළුවේ කළයුතු වත්ද, පැන්හලෙයෙහි කළයුතු වත්ද, පොහොගෙහි කළ යුතු වත්ද, ආගන්තුක මහණුන්ට කළයුතු වත්ද, ගමික මහ-ණුන්ට කළයුතු වත්ද යනාදී වශයෙන් වත් පිළිවෙත්හි යෙදීම නිසා කෙලෙසොත්පාදයට අවසථා නොලැබේ.

දෙඅසූ කුඩාවත් නම්:- තර්ජනීය කර්මකෘතාදිය කළ කල්හිද පරිවාස කර්ම කළ කල්හිදු ඔවුන් විසින් පිළිපැදිය යුතු තුදුස්මහාවත් කෙරෙන් අන්‍යවූ වත් නොයෙක් වෙත්ද, ඔව්හු දෙඅසූ කුඩාවත් නම් වෙත්.

තුදුස් මහා වත් නම්:- ආගන්තුක වත්. ආවාසිකවත්, ගමික වත්, අනුමෝදනාවත්, භත්තගගවත්, පිණ්ඩචාරිකවත්, ආරඤ්ඤක වත් සේනාසන වත්, ජන්තාඝර වත්, වච්චකුටි වත්, ආචරිය වත්, උපජ්ඣාය වත්, සද්ධිවිහාරික වත්, අන්තේවාසික වත් යන මොව්හුය.

ග්‍රන්ථධුරය පිරීම් වසයෙන්ද කෙලෙසුන්ට අවකාශ නොලැබේ ග්‍රන්ථධුරය නම් සාර්ථ කථා ත්‍රිපිටක ධර්මය ධාරණ උද්ග්‍රහණාදිය කිරීමයි. යම්කිසි භික්ෂුවක් උද්ග්‍රහණ ධාරණාදියෙහි යෙදී සිටීනම් ඔහුට කෙලෙස් ඉපදීමට අවකාස නොලැබේ. යම් විධියකින් නානාරම්මණ ගෙන කෙලසුන්ට වසඟව විසුවහොත් එබඳු තැනැත්තාට උද්ග්‍රහණ ධාරණාදිය කිරීමට අපහසුවේ ඉගෙනගන්නා

සැනැත්තා ඉසගිනිගත්තෙකු සේ නිතර නිතර පොතපත හැදෑරීමෙහි යෙදෙයි නම් ඔහුට කාමවිතර්කාදී සිතිවිලි පහල නොවෙයි.

සාට්ඨකථා ත්‍රිපිටක ධර්මය වළගම්බා රජු දවස ග්‍රන්ථාරූඪ කරන තෙක් බුදුන් වහන්සේ දවස පටන් එතෙක් කල් මුඛපාඨයෙන්ම ත්‍රිපිටක ධර්මය රැකගෙණ ආහ. දීඝභාණක, සංයුත්තභාණක, අංගුත්තරභාණක, ඛුද්දකභාණක, මජ්ඣිමභාණක වසයෙන් ඒ ඒ සඟි අට්ඨකථා සහිතව වාචොද්ගත කරගත් මහා තෙරවරුන් වහන්සේලා ඒ ඒ නම්වලින් ඇඳුන්වූහ. මෙසේ එක අකුර කුඩු ඇලපිල්ලකුදු අඩු වැඩි නැතිව ත්‍රිපිටක ධර්මය රැකගැනීමට උන් වහන්සේලා දිවා රෑ දෙක්හි අනල්ප උත්සාහයකින් හා සමෘතියෙන් යුක්තව විසූහ. මේ ආකාරයෙන් ග්‍රන්ථධුරයෙහි යෙදුන භික්ෂුවට කෙලෙස් සිතිවිලි පහලවීමට අවකාශ නොලැබේ.

මලියදෙව තෙරුන් වහන්සේගේ කථාවද මෙහිලා නිදර්ශනයක් වසයෙන් සැලකිය යුතුය. මේලක සසුනඹර එකලූ කල රහතන් වහන්සේලා අතරෙන් මලියදේව තෙරණුවෝද උසස් තැනක් ගත්තාහ. මුන්වහන්සේ ලදරු අවදියේ බණ දහම් ඉගෙනීම සඳහා කාලලගමට වැඩියහ. එගම වෙහෙරෙහි නැවතී ආචාර්යවරයන් වහන්සේලාට වත් දක්වා බණ දහම් ඉගෙණ ගනිමින් වදශීනා වඩමින් වසනකල්හි එක්දිනක් සැදැහැති උපාසිකාවක් මේ ලදරු හෙරණපාණන් දැක පුත්‍ර ප්‍රේමය උපදවා තොරතුරු විචාලාය, බණ දහම් ඉගෙණීමට පැමිණිබව දැන්වූ කල්හි එසේ වීනම් ඉගෙණගන යනතෙක් මම සිව්පසයෙන් උපස්ථාන කරමි.

පිඬු පිණිස මගේම ගෙදරට වැඩමවනු මැනවයි ආරාධනාවක්ද කළාය. දැන් මලියදේව ස්ථවිරයන් වහන්සේ දිනපතා එහිම වැඩමකර භික්ෂාව වළඳා භුක්තානුමෝදනා වසයෙන් "සුව පත් වෙත්වා" නිදුක් වෙත්වායි" පමණක් වදාරති. මහාපවාරණ දිනයෙහි මලියදේව ස්ථවිරයන් වහන්සෙ උත්සාහ වඩා භාවනා කොට සිව්පිළිසිඹියාපත් රහත් බවට පැමිණියහ. වෙහෙර වැසි මහා තෙරණුවෝද එදින දම්දෙසුම මලියදේව මහරහතන් වහන්සේට නියම කළහ. සෙසු වහන්දෑ අර උපාසිකාව කරා ගොස් තොපගේ පුතණුවෝ අද දම් දෙසෙති. බණ අසන්ට නොයන්නෙහිදූයි විචාළහ. ඒ උපාසිකාවද සොම්නස්ව ධර්මශ්‍රවණය සඳහා කොයෙකුත් පූජා භාණ්ඩයන්ද රැගෙන පැමිණියාය. මලියදේව තෙරුන් වහන්සේද මුළු තුන්යම් රෑ මුළුල්ලෙහි සුවපත් වෙත්වා නිදුක් වෙත්වායි යන වචන දෙක මාතෘකා කොට ත්‍රිපිටකයම අලලා ධර්මදේශනා කළහ. දේශනාවසානයේදී උපාසිකාව සොවාන්

එලයට පැමිණියාය. මෙසේ ග්‍රන්ථධුරය පිරීම් වශයෙන්ද ක්ලේශයන්ට අවකාශ නොලැබෙන බව සැලකිය යුතුයි. ධුතාඞ්ග පිරීම් වශයෙන්ද කෙලෙස් ඉපදීමට අවකාශ නොලැබේ.

ඉමිනා පන තෙන තෙන සමාදානෙන ධුතකිලෙසත්තා ධුතස්ස භික්ඛුනො අඞ්ගානි කිලෙස ධුනනතො වා ධුතන්ති ලද්ධවොහාරං ඤාණං අඞ්ගමෙතෙසන්ති ධුතඞ්ගානි අථවා ධුතානිච තානි පටිපක්ඛනිද්ධුනනතො අඞ්ගානිච පටිපත්තියාතිපි ධුතඞ්ගානීති වුත්තං.]- ධුතඞ්ගයෝ නම් ඒ ඒ අංග සමාදානයෙන් කම්පාකරණ ලද කෙලෙස් ඇති බැවින් ධූතනම් භික්ෂුවගේ අංගයෝනුයි කියා හෝ කෙලෙස් කම්පාකරණ අර්ථයෙන් ධූතයයි ලබන ලද නම ඇති ප්‍රඥා නමැති අඞ්ගය ඇති බැවින් හෝ ධූතාංග නම් වෙත්මය.

තම තමන්ට විරුද්ධ ධර්මයන් නසන අර්ථයෙන් ධූතනම් වූද, ප්‍රතිපත්තියට කාරණා බැවින් අංගනම්වූද ධර්මයෝ ධූතාංග නම් වෙති. ඒ ධූතාංගයෝ තෙලෙසකි. එනම්- පංසුකූලිකාංගය, තෙචීවරිකාංගය පත්තපිණ්ඩිකාංගය, ඛලුපච්ඡාභත්තිකාංගය, ආරඤ්ඤකාංගය, රුක්ඛමූලිකාංගය, අබ්භොකාසිකාංගය. සොසානිකාංගය යථාසන්ථතිකාංගය, නෙසජ්ජිකාංගය. යනුයි. විස්තර කැමැත්තන් විසින් විසුද්ධිමාර්ගයේ ධූතාංග නිර්දේශය බලා දතයුතුයි. මෙසේ තෙලෙස් ධූතඞ්ගයන්ගෙන් එකක් හෝ කීපයක් හෝ තෙලෙස් ධූතාංගම හෝ ආරක්ෂාකරණ භික්ෂුවටද කෙලෙස් ඉපදීමට අවකාශ නොලැබෙන්නේය. මහාසීව තෙරුන්වහන්සේ මෙන් හිවත් දක්වා සිත දුවවමින් විදර්ශනා වඩා අර්හත්වයට පැමිණෙන්නේය. ගාමන්ත පබ්භාරවාසී මහාසීව ස්ථවිරයන් වහන්සේ ත්‍රිපිටක බුද්ධ ධර්මය භික්ෂූන්ට උගන්වමින් අවවාද කරමින් මාගම තිස්සමහාරාමයෙහි වැඩවිසූ සේක. උන්වහන්සේගේ අවවාදයෙහි පිහිටා තිස්දහසක් පමණ භික්ෂූහු රහත්වූහ. අරහත් බවට පැමිණි එක් අතවැසි තෙරනමක් තමා අවබොධ කරගත් ධර්මය පිළිබඳ සොම්නසින් සිතනුවෝ මෙවැනි සැපයක් මාගේ ගුරුවරයාට ඇත්තෝ දෝහෝයි ආවර්ජනා කර බැලූහ. එවිට උන්වහන්සේට සංවේග උපදවන්නෙමියි අදහස්කොට තෙරුන් වහන්සේ වසන තැනට වැඩ විත් දක්වා හුන්නාහ.

ඇවැත්නි! කුමක් නිසා පැමිණියෙහිදැයි තෙරුන් වහන්සේ විචාල කල්හි ස්වාමීනි! අවසර ඇතොත් ධර්මපදයක් ඉගෙණීමට පැමිණියෙමියි කීහ. ඉගෙණගන්නා ගණයා බොහෝ ඇත. අවසර නැතැයි තෙරුන් වහන්සේ උත්තර දුන්හ. රෑ දවල් දෙකේහි අවකාශයක් නොලබන ඔබවහන්සේට මරණයටත් අවකාශයක් තිබේදැයි අතවැසි තෙරණුවෝ කීහ. ඒ අසා ඇදුරු තෙරණුවෝ

මේ තෙමේ ඉගෙනීම පිණිස නොපැමිණියේය. මට සංවේග උපදවීම පිණිස පැමිණියේයයි සිතුවාහුය. අනතුරුව අනැවැසි තෙරණුවෝද ස්වාමීනි! පැවිද්දහු විසින් මාවැනි විය යුතුයයි කියන්මී අඟසට පැන නැගී ගියහ.

තෙරුන් වහන්සේ සංවේග උපදවා ග්‍රාමන්ත පබ්භාරයකට ගොස් තෙලෙස් ධුතගුණයන් සමාදන්ව තිස්වසක් මුළුල්ලෙහි වියසී වඩා රහත්ඵලයට පැමිණීමට අපොහොසත්වූහු දවසක්ද පූර්ණිමන්ද්‍රයා දැක මේ පුන්සඳද පිරිසිදු, මාගේ සීලයදැයි සිතන්ට වූහ. එසේ සිතන් සිතත්ම උන්වහන්සේට තමන් වහන්සේගේ සීලයෙහි උපසම්පදාවෙහි පටන් අල්පමාත්‍ර දෝෂයකුදු නොදුටු මෙන් චන්ද්‍රයාට වඩා තමාගේ සීලයෙහි පරිශුද්ධතාවය සිහිකිරීමෙන් බලවත් සොම්නසක් ඇතිවිය. පිරිපුන් ඥානය ඇතිබැවින් ඒ මොහොතේ සිව්පිළිසිඹියා රහත්ඵලයට පැමිණියහ. එසෙයින් ධුතාංග පිරිම් වසයෙන්ද කෙලෙස් ඉපදීමට අවකාශ නොලැබේ. ප්‍රථමධ්‍යානාදී සමාපත්තීන්ට සමවැදීම් බහුලභාවයෙන්ද, කෙලෙස් ඉපදීමට අවකාශයක් නොලැබේ. ප්‍රථමධ්‍යාන, ද්විතීයධ්‍යාන; තෘතීයධ්‍යාන, චතුර්ථධ්‍යාන, ආකාශානඤ්චායතන, විඥානඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන අටසමවත නිතර නිතර සමවැදීම් හේතුකොටගෙනද කෙලෙශයෝ යටපත් වෙති. එසේ කෙලෙස් විෂ්කම්භන කොට තිබෙන් දක්වා සිත් දුවවමින් අර්හත්වයද සිද්ධකර ගතියි. මහා තිස්ස තෙරුන් මෙනි. මේ තෙරුන් වහන්සේ වනාහි කුඩාකල පටන් අටසමවත්ලාභිවූහ. සමාපත්තීන්ට සමවැදීම් වසයෙන් උන්වහන්ස්ගේ ක්ලේශ ධර්මයෝ යටපත් වූහ. උන්වහන්සේ සැටවස් කාලයේදීද තමන් වහන්සේ පුහුදුන් බව නොදත්හ. එක් දිනක් මාගම තිස්සමහාරාමයේ භික්ෂු සඞ්ඝයා ධර්මදේශනාවක් සඳහා තරඟරවාසී ධම්මදින්න තෙරුන් වහන්සේට හස්නක් එව්වේය. උන්වහන්සේ ආරාධනාව පිළිගෙන මා විසින් සඞ්ඝ ස්ථවිරයන් වහන්සේ නමක් ප්‍රධාන කොට යා යුතුයයි කල්පනාකොට තමන් වහන්සේගේ කර්මස්ථානාචාර්‍ය්‍ය මහතිස්ස තෙරුන් සිහිකොට එහි වැඩියහ.

පැමිණ පිළිසඳර කථාබස්කොට පැමිණි ප්‍රවෘත්තියද දන්වා ඔබවහන්සේ කවරකල ධර්මය අධිගත කරණ ලද්දේදැයි ඇසූහ. ඇවැත්නි! සැටවස් පමණ කාලයක පටන් ධර්මය අධිගත කරණ ලද්දේයයි උන්වහන්සේ කීහ. ඒ අසා ධම්මදින්න තෙරුන් වහන්සේ එසේවීනම් සමාපත්තීන්ට පැමිණිය හැකිදැයි විචාලෙන් හැකි බව උන්වහන්සේ දන්වූහ. ස්වාමීනි එසේනම් පොකුණක්

මවනු මැනවි: එසේ කළහ. එහි පියුම් ගසක් මවනු මැන. එයද ඉටුවිය. එහි මහත් කුසුමයෙක්හි භද්‍රා යෞවනයෙන් යුත් ඉතිරි රුවක් මවනු මැන. එයද සමෘද්ධවිය ස්වාමීනි දුන් මේ ඉත්‍රීරුව කෙරෙහි සුභ වසයෙන් පුන පුනා බලනු මැනවයි කීහ. තෙරුන් වහන්සේ තමා විසින් මවන ලද ස්ත්‍රී රූපය කෙරෙහි ලොභ උපදවන්ට වූහ. එවිට උන්වහන්සේගේ පුහුදුන් බව දැන වහාම කමටහන් ගෙන බවුන් වඩා රහත් ඵලයට පැමිණියහ.

මෙසේ සම්පත්තීන්ට සම්වැදීම් වසයෙන් ක්ලේශයන් විෂ්කම්භනය වන බව දතයුතුයි. විදර්ශනා වැඩීම හේතුකොටගෙනද ඇතමෙකුගේ කෙලෙස් යටපත්වෙයි. යම්කිසි භික්ෂුවක් සත්වැදෑරුම් අනුපස්සනාවන්හි හෝ අටළොස් වැදෑරුම් මහා විදර්ශනාවන්හි හෝ කටයුතු කෙරෙමින් වෙසෙයිද ඒ නිසා ඒ භික්ෂුවගේ කෙලෙස් විෂ්කම්භිත වෙයි. කෙලෙස් යටපත්කොට තිබෙන් හීම් කොට සිත යොදවා රහත් ඵලය මුදුන් පමුණුවා ගන්නේය. බුදුන් වහන්සේ ධර්මාන කාලයෙහි ආරබ්ධ විදර්ශනා භික්ෂුන් ඇට නමක් පිළිබඳ කථාවද මෙහිලා කැමති වියයුතුයි. ඇතමෙකුට තවසාමී කිරීම් වසයෙන්ද ක්ලේශයෝ නූපදිති.

උපොසථාගාර, භෝජනසාලා ආදිය කරවන්නාවූ මහණහට ඒ පිළිබඳ සිතයුය යෙදවීම් නිසා කෙලෙස් ඉපදීමට අවකාශයක් නොලැබේ. එසේ කෙලෙස් යටපත් කොට තිබෙන් අරමුණුකොට විදසුන් වඩා අර්හත් ඵලය සිඩකර ගන්නේය. සිතුල්පව් වෙහෙර තිස්ස තෙරුන් මෙනි, බ්‍රහ්ම ලොකයෙන් චුති ප්‍රතිසන්ධි වසයෙන් පැමිණි සමහර සත්ව කෙනෙක් වෙති- ආනාසෙවන භාවයෙන් ඔහුටද කෙලෙස් නූපදියි. භවවසයෙන් කෙලෙස් යටපත් කළ හෙතෙම එසේ කෙලෙස් යටපය් කොටම විදසුන් වඩා රහත් ඵලය සාක්ෂාත් කරනතියි. මහා කාශ්‍යප ස්ථවිරයන් මෙනි.

අනනුභූතාරම්මණ වසයෙන්ද ක්ලේසයන්ගේ නූපදීම වෙයි. කෙලෙස් උපදීමට හේතුවන්නාවූ යම් ඉෂ්ටාදී ආරම්මණයෙක් නොලැබීමෙන් කෙලෙසුන්ගේ අනුත්පාදය වේ. චක්ඛු ආදී ෂඩින්ද්‍රියන්ට රූපාදීන් අරමුණු නොවීම හේතුකොට කෙලෙස් සිතිවිලි පහල නොවෙයි. එබඳු ආරම්මණයන්ගේ අභාවය නිසා අනනුභූතාරම්මණ වසයෙන්ද ක්ලේස යටපත් වන බව කියයුතුයි.

**තත්‍ථ කතමෙ අනුසසනනා පාපකා අකුසලා ධම්මා තීණි අකුසල මූලානි. ලොභො, දොසො, මොහො, තදෙකට්ඨාච කිලෙසා තං සම්පයුත්තො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො, සඞ්ඛාරක්ඛන්ධො, විඤ්ඤාණක්ඛන්ධො, තං සමුට්ඨානං කායකම්මං, වචීකම්මං මනොකම්මං ඉමෙ වුච්චන්ති පාපකා අකුසලා ධම්මා (විභඞ්ග ප්‍රකරණය)**

නූපන්නාවූ ලාමක අකුසල ධර්මයෝ නම් කවරහුද? අකුසල මූලයන්වූ ලොභ ද්වේෂ, මෝහයන්ද තදෙකස්ථ ක්ලේශයෝද තත් සම්ප්‍රයුක්තවූ වේදනාස්කන්ධය සංඥාස්කන්ධය සංස්කාරස්කන්ධය, විඥානස්කන්ධය යන මොව්හුද ඒ නිසා උපන් කාය කර්ම වාග්කර්ම මනොකර්මයෝද වෙත්. මේ අකුසල ධර්මයන් පිළිබඳ දීර්ඝ විස්තරයක් කියයුතු හෙයින් මෙහිලා අපි උපෙක්‍ෂක වම්හ විස්තර කැමතියන් විශුද්ධිමාර්ගාදිය බැලිය යුතුයි.

ඡන්දං ජනෙති– තත්ථ කතමො ඡන්දො. යො ඡන්දො ඡන්දිකතා. කත්තුකම්‍යතා කුසලො ධම්මච්ඡන්දො අයං වුච්චති ඡන්දො ඉමං ඡන්දං ජනෙති උපෙති සමුට්ඨාපෙති නිබ්බත්තෙති අභිනිබ්බත්තෙති තෙන වුච්චති ඡන්දං ජනෙති.

ඡන්දය නම් කවරේද? යම් ධර්මයෙක් කැමතිවිය යුතු අර්ථයෙන් කැමති ඇත්තහුගේ බවය හෙවත් කැමති කරන අයුරුය යන අර්ථයෙන්ද කරනු කැමතිබවය යන අර්ථයෙන්ද දක්‍ෂවූ යන අර්ථයෙන්ද පියවී කැමති බව යන අර්ථයෙන්ද ඡන්ද නම් වේ. මේ ඡන්දය තෙමේ තෘෂ්ණා ඡන්දය දෘෂ්ටි ඡන්දය වීර්‍ය්‍ය ඡන්දය ධර්මච්ඡන්දය මෙසේ බහුප්‍රකාරවේ ඒ නානාප්‍රකාර ඡන්දයන් අතරෙන් මෙහි කර්තෘ කාම්‍යතා කුසලධර්ම ඡන්දයම කැමතිවන ලදී. ඒ කර්තෘ කාම්‍යතා, කුසලධර්ම ඡන්දය උපදවයි. වඩයි ඔසවා තබයි. නිපදවයි. යන මේ තේරුමයි. මේ ඡන්දය නම් කිසියම් අනතුරක් කරණකොට ගෙන භ්‍රෂ්ට වූ කුසලච්ඡන්දය නැවත ඔසවා තබා නැවත නැවත කුසල ධර්ම ඡන්දයෙහි යොදවන සවභාවී කොට ඇත්තේය. වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති යන පදයන්ගෙන් චෛතසික වීර්‍ය්‍යාරම්භය වූ සම්‍යක් ව්‍යායාමයම කියවේ, මේ සතර සම්‍යක් ප්‍රධානයන්ගෙන් ප්‍රථම ප්‍රධන් වීර්‍ය්‍යය සංවර ප්‍රධාන නමින්ද දෙවෙනි ප්‍රධන් වීර්‍ය්‍යය ප්‍රහාණ ප්‍රධාන නමින්ද තෙවෙනි ප්‍රධන් වීර්‍ය්‍යය භාවනා ප්‍රධාන නමින්ද සිව්වැනි ප්‍රධන් වීර්‍ය්‍යය අනුරක්‍ෂණ ප්‍රධාන නමින්ද ව්‍යවහාර කරණු ලැබෙත්.

ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, ඉදං වුච්චති භික්ඛවෙ සංවරප්පධානං (අංගුත්තර නිකාය) යනුවෙන් නූපන් අකුසල ධර්මයන්ගේ අනුප්පාදය පිණිස වීර්‍ය්‍ය වැඩීම සංවර ප්‍රධාන නමැයි කියන ලදී.

සංවරප්‍රධානය නම්- කතමඤ්ච භික්ඛවෙ සංවරප්පධානං ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති- නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං

අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති -පෙ- මහණෙනි! සංවරප්‍රධානය නම් කවරේද? මේ ශාසනයෙහි යම්කිසි භික්ෂුවක් ඇසින් රූපයක් දැක නිමිත්තග්‍රාහී නොවෙයි. අනුව්‍යඤ්ජනග්‍රාහී නොවෙයි. යම් අසංවරයක් හේතුකොට ගෙණ චක්ෂුරින්ද්‍රිය අසංවරව වාසයකරන්නාවූ ඔහු කරා අභිධ්‍යාව දෞර්මනස්‍ය යන ලාමක අකුසල ධර්මයෝ ලුහුබඳනාහුද ඒ චක්ෂුරින්ද්‍රියාගේ සංවරය පිණිස පිළිපදියි. චක්ෂුරින්ද්‍රියෙහි සංවරණයට පැමිණෙන්නේය එසෙන් ශ්‍රොත- ඝ්‍රාණ- ජිව්හා කාය මනස් යන මොහුද සංවර කරගන්නේය. යනුයි.

චක්ෂුප්‍රසාදය ආධාර කොට පවත්නා සිතින් රූප දක්නේයයි. තේරුම් ගතයුතුයි. අනිකුත් ඉන්ද්‍රියන් ගැනද මේ ක්‍රමයෙන් සලකා බැලිය යුතුයි, මෙසේ ඒ චක්ෂුර්විඥානයෙන් ගන්නා ලද රූපයෙහි ස්ත්‍රී ලක්ෂණ වශයෙන් හෝ පුරුෂ ලක්ෂණවශයෙන් හෝ රාගය ඉපදීමට හේතුවූ ඉෂ්ට ලක්ෂණයක් හෝ ද්වේෂයන්ගේ උත්පත්තියට හෙතුවූ ප්‍රතිඝ නිමිත්තක් හෝ මෝහයාගේ ඉපදීමට හේතුවූ උපෙක්ෂා නිමිත්තක් හෝ ලෝභයට හෝ ද්වේෂයට හෝ මෝකයට හෝ හේතුවූ නිමිත්තක් නොගන්නේය.

ඒ ඒ අරමුණු ගැන ජවන් සිත් වීසින් නැවත නැවත සුභ වශයෙන් හෝ ද්වේෂවශයෙන් හෝ සිත නොයොදවිය යුතුය. ගන්නා ලද ආරම්මණයන් නැවත නැවත ඉපදීමට හැකි නිසා මදහිනා අත්පා වශයෙන්අනුව්‍යංජනයන් ගැනද නොසිතිය යුතුයි. මේ චක්ෂුරින්ද්‍රිය නැමති ද්වාරයන් සිහි නැමති කවුළුවෙන් නොවසා ගෙන වසන පුද්ගලයාගේ ආත්ම භාවය නමැති ගෘහය කරා අභිධ්‍යාදී ලාමක අකුසල නැමති පල්හොරුන් ඇතුල්වී ශීලාදී ගුණධර්ම නැමති ආභරණ පැහැර ගෙන යන බව සිහිකට යුතුයි, චක්ෂුරින්ද්‍රියයාගේ සංවරයසිහි නැමති දොරටුවෙන් කළ යුතුය. චක්ෂුර්ද්වාරයෙහි සංවරයෙක් හෝ අසංවරයෙක් හෝ නොවේ චක්ෂුර් ප්‍රසාදය නිසා සමාතියක්හෝ මුලාසිහියෙක් හෝ නොපින්නේය. රූපාදි අරමුණක් යම්කලක ඇසට හමුවූකල්හි භවාඞ්ගසිත දෙවරක් ඉපද නිරුද්ධවෙයි එසේ නිරුද්ධවන්නා සමගම ක්‍රියාමනොධාතු සිත ආවර්ජනකෘත්‍ය සිද්ධකරමින් එක්වරක් ඉපද නිරුද්ධවේ. අනතුරුව චක්ෂුර් විඥාන චිත්තය දර්ශනකෘත්‍ය සිද්ධකරමින් එක්වරෙක්ද, අනතුරුව විපාක මනොධාතුනම් චිත්තය අරමුණු පිළිගැනීම සිද්ධකරමින් එක්වරෙක්ද ඉක්බිතිව විපාකාහේතුක මනො විඥාන ධාතුනම් චිත්තය අරමුණු තීරණය කරමින් එක්වරෙක්ද ඉක්බිති ක්‍රියාහෙතුක මනොවිඥාණ ධාතුනම් සිත අරමුණ නියමකරමින් එක්වරෙක්ද ඉපිද නිරුද්ධවේ

අනතුරුව සත්වරක් ජවන් සිත් ඉපදී නිරුද්ධවන්නේය. මෙ කියන ලද සිත් අතරෙන් භවාඞ්ගසිත් උපදින කල්හිද අතීත් ආවර්ජනාදි සිතක් උපදින කල්හිද සංවරයෙක්හෝ අසංවරයෙක් හෝ නොවන්නේය. ඒ ජවන් සිත් උපදින කල්හි මෙනෙහි නොකිරීම හේතුකොටගෙන ලෝභ, ද්වේෂ, මෝහ, අහිරික අනොත්තප්පාදි අකුසල ධර්ම ජවන් සිත් හා එක්ව යෙදීම හේතුකොටගෙන දුසිල් බවක් හෝ සිහිමුලාවක් හෝ නොදන්මක් හෝ කුසීතබවක් හෝ උපදීද? එය අසංවරනම මේ නිසා ජවන් සිත්වලදී වන්නාවූ අසංවරයම චක්ෂුරින්ද්‍රියෙ අසංවරයයි කියනු ලැබේ. ජවන් අවස්ථාවේදී නුවණින් මෙනෙහි කිරීමෙන් සිත සංවර නොකළේ නම් චක්ෂුරාදි ද්වාරයෝද භවාඞ්ගයෝද : ආවර්ජනාදි සිත්හුද නො:ක්නා ලද්දහු මය පවුරු පදනම් ආදියෙන් පිරිසෙවී කරනලද යම්කිසි නුවරක සතරවාසල් වෙත්ද, ඒ සතර වාසල් නොවසා අතික් ඇතුළු නුවර ගේ දොර කොටු ආදිය වැසූ තරමින් ඇතුළු නුවර ආරක්ෂා වූයේ නොවේ. සොරුනට නුවරට වැද හමනට රිසිරිසි දෑ ඇරගැනීමට ඉන් අනවකාශයෙක් නොවෙයි. ප්‍රධාන දොරටු නොවැසූ හෙයිනි. එමෙන්ම ජවන් අවස්ථාවෙහි දුසිල් බැව් ආදිය ඉපදීම නිසා ජවන් සිත්ද අසංවරවේ. එවිට චක්ෂුරාදී දොරටුද ආවර්ජනාදි සෙසු වීථි සිත්ද නොරැකියාහු වෙති. සතර වාසල් මනාසේ වසන ලද කල්හි ඇතුළු ගේදොරාදි නොවැසුවාහුද නගරභ්‍යන්තරයේ සියලු බඩුබාහිරාදිය මනාව ආරක්ෂාවේ. එමෙන් ජවන් සිත් අවස්ථාවෙහි සීලසංවර, සතිසංවර, ඥාණසංවර, ඛන්ති සංවර, විරිය සංවර, යන මොව්හු උපන්නාහු වෙත් ද එවිට සෙසු චක්ෂුරාදි ද්වාරයෝද ආවර්ජනාදි සිත්ද රැකියාහුම වෙති ඒ නිසා ජවන් මොහොතෙහි හට ගන්නා සීලාදි සංවරයෝම චක්ෂුරින්ද්‍රියාගේ සංවරයයි කියනු ලැබේ. සෙසු ශ්‍රොතාදි ඉන්ද්‍රියන් පිළිබඳ සංවරයද මෙම ක්‍රමයෙන් කල් පතාකළ යුතුයි. මේ චක්ෂුරාදි ඉන්ද්‍රියන්ගේ සංවරය ප්‍රධන් වීර්යයෙන්ම කළයුතුයි. එහෙයින්ම ප්‍රථම ප්‍රධන් වීර්යවූ නූපන් අකුශල ධර්මයන් නූපදීම පිණිස වෑයම් කිරීම සංවර ප්‍රධානයයි කියන ලදී.

සාධුනි!

අපේ අනන්තාරයෙහි හටගන්නාවූ රාගාදි ක්ලේශ ධර්මයන් තුනීකිරීම සඳහා අප නිතරනිතර උත්සාහ කළ යුතුයි. ඒ නිසා මේ ජීවිතයේදී කළහැකි දාන ශීල භාවනාදි හැම සුචරිත ක්‍රියාවක්ම සිඩකොට ස්වර්ගමෝක්ෂ සම්පත් ප්‍රතිලාභය කරගැනීමට උත්සාහ වඩත්වා

සාදු! සාදු! සාදු!

# දෙවන සම්මප්පධානය.

දඹල්ලේ වාලුකාරාමාධිපති සිරිසුගත සද්ධම්මවංසපාල ගණාචරිය රත්ගම 'පඤ්ඤාශෙඛරාභිධාන දඹුළු පාර්ශවයේ ප්‍රධාන සඞ්ඝනායක මහා ස්ථවිරයන් වහන්සේ විසින් පවත්වන ලද ධර්මදේශනාව.

කතමො ච භික්ඛවෙ සම්මා වායාමො ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය -පෙ- පදහති, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය -පෙ- පදහති, උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං -පෙ- පදහති අයං වුච්චති භික්ඛවෙ සම්මා වායාමො-

පින්වත්නි,

කියවාංගන යනු ලබන ධර්මදේශනා පඞ්ක්තියෙහි අද දින නියමිව තිබෙන්නේ චතුර්විධ සම්‍යක් වීර්‍ය්‍යයන් අතුරෙන් දෙවැනි සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයයි. එය මාතෘකාකොට ධර්මදේශනාවක් කරන්නවයයි අප වෙත කරණු ලැබූ ඇරයුම් පරිදි ඒ පිළිබඳ විස්තරය සැකෙවින් කිරීමට අදහස් කරන්නෙමු.

මේ අවස්ථාවෙහි අන්‍යුන අනතිරික්ත වශයෙන් ධර්මානිශංසයක් ප්‍රකාශ කිරීම අපේ යුතුකමෙකි. "සුනාථ ධාරෙථ චරාථ ධම්මෙ" යනුවෙන් බුදුපියාණන් වහන්සේ බණ ඇසීමේ ක්‍රමය දෙශනාකොට වදාළසේක. එයින් ඉඟැන්වෙන කෙටි අදහස නම් බණ ඇසීමෙන් ඇසූ බණ සිතෙහි දරාගැනීමත් බණවූ පරිද්දෙන් පිළිපැදීමත් කළයුතුයයනුයි මේ සැදැහැවතුන් බණ ඇසීමට සතුටු බවත් බණ සිත්හි දරානැනීමට උත්සාහ කරණ බවත් බණවූ පරිද්දෙන් පිළිපදින බවත් අපේ අවංක විස්වාසයයි. එබැවින් කලිනුත් බණ අසා පරිචයක් ඇති මේ සැදැහැවත්හු ධර්ම නමැති අරමුණෙහිම යෙදී මේ ස්වල්ප වේලාව කල්යවන්නාහු

නම් මේ මහත් පිනෙන් මෙලොව සැප හා පරලොව සැපත් විඳ සකල ක්ලෙසයන් නසා තුන්තරා බෝධියෙන් එක්තරා බෝධිය කට පැමිණ අජරාමර නිවන් සැප ලබාගත හැකිවේ.

මෙතැන් පටන් අද දිනට අයත් ධර්ම සංවිභාගය පැහැදිලි කරන්නෙමු. තවද කිවයුත්තෙකි. කීර්ති ශෙෂගත සිරි අරියවංස මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ අනුස්මරණය කිරීම් වස් අනුජාත පුත්‍රානුමාන මොරමුළුවේ සිරි සාසනවංස යතිවරේණ්‍යයන්ගේ සදුත්සාහය මේ කෘත්‍යයෙහි ප්‍රධාන බවද ඒ පිනෙන් අප මහා නිකායේ ඉහත නම් සඳහන් ස්වාමීන්ද්‍රයන් වහන්සේට නිවන් සැප ලැබෙත්වා යන මාගේ ප්‍රෙමණීය අදහස යථොක්ත ශිෂ්‍ය ප්‍රශිෂ්‍ය යන්ට සහ දායක දායිකාවන්ටද කාරුණාවෙන් ප්‍රදානය කරමු.

මීලඟට ඉහත සඳහන් මාතෘකා පාඨයෙහි අප විසින් කටයුත්තේ දෙවැනි වීර්‍යයවූ- උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. යන කොටස පිළිබඳව ප්‍රථම යෙන් මෙහි භාවය (අදහස) මෙසේ දතයුතුය.

උපන්නාවූ පාපක අකුසල ධර්මයන්ගේ ප්‍රහානය පිණිස ඒ ඒ පාපකර්මයන් නූපදනා පිළිවෙත් කිරීමට යම් කිසි යොගාවචර යෙක් තෙමේ ආලය උපදවන්නේය. ඊට නිසි ව්‍යායාම කරන්නේය. එබඳු පව් කමා කරා නොපැමිනෙන පිළිවෙත් සාධක වීර්‍යය පවත්වන්නේය- මුලාවූවත් මෙන් සිතට වසඟ නොවී උත්සාහ කිරීමෙන් චිත්ත පරිග්‍රහණය කරන්නේය. (සිත දැඩිව ගන්නේය) සම් නහර ඇට ඉතුරුවී සිරුරෙහි සෙසු මස් ලේ වියැලෙතුදු මම සදුත්සාහය නොහරින්නෙමියි අධිෂ්ඨානකොට කළ මනා වීර්‍යය පවත්වන්නේය.

උපන් පව් නැතිකිරීමට ආලය නැතිකිරීමත් ඊට නිසි උත්සාහය යෙදීමත් පව් කමා කරා නොපැමිණෙන පිළිවෙත් පිරීමත් ඒ පිණිස දැඩි චිත්ත පරිග්‍රහනයත් ඉටාගත් කටයුතු වීර්‍යය නමා ඉටානත් නැතට පැමිණීමිස අත් නොහරින්නෙමියි යන දැඩි අධිෂ්ඨානයත් මෙම සම්‍යක් ප්‍රධාන දෙවැනි වැයම ඇතිකරගත් යෝගාවචරයාගේ සවභාවයය.

සිතෙහි අකුශල ධර්මාදිය උපදින බවත් ඒ අකුසල ධර්මයන් නැතිකිරීම සඳහා සම්‍යක් වීර්‍යය කටයුතු බවත් මෙහි ඉතා කෙටි සාර පහී අදහසය දැන් මීලඟට ''උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං'' යන්නෙහි උපන් අකුශල ධර්මයෝ කවරහුද යනු ප්‍රකාශකළ යුත්තෙකි.

ලොභය ද්වේෂය මෝහය කියා අකුසල් මුල් තුනකි. එයින් ලොභය මුල්කොට උපදනා අකුසල් සිත් අටක්ද ද්වේෂය මුල් කොට උපදනා අකුසල් සිත් දෙකක්දැයි අකුසල් චිත්තයෝ දොළොසකි. ඒ ඒ හේතුන් මුල්කොට උපදනා ලොභ මූලික ද්වේෂ මූලික මෝහ මූලික චිත්තයන්හි යෙදෙන ස්පර්ශය, චේතනාය, චිත්තෙකාග්‍රතාය, ජීවිතෙන්ද්‍රිය, මනස්කාරය, විතර්කය, විචාරය, අධිමොක්ෂය, වීර්යය. ඡන්දය, මෝහය, අහිරිකය, අනොත්තප්පය, ඖද්ධත්‍යය, ලොභය, දෘෂ්ටිය, මානය ද්වේෂය, ඊර්ෂ්‍යාය, මාත්සර්යය, කුක්කුච්චය, ථිනමිද්ධය, යන මොවුහු අකුසල ධර්මයෝ වෙති.

එපමණක්ද නොවේ. කාමච්ඡන්දය, ව්‍යාපාදය, ථිනමිද්ධය, උද්ධච්චකුක්කුච්චය, විචිකිච්ඡාය, යන පංචනීවරණද- කාමුපාදාන, දිට්ඨුපාදාන, සීලබ්බතුපාදාන, අත්තවාදුපාදාන යන චතුර්විධ උපාදානද, කාමරාගානුශය, භවරාගානුශය, පටිඝානුසය. මානානුසය, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය, අවිජ්ජානුසය, යන සප්ත අනුසයද, කාමරාගසංයොජනය, භවරාගසංයොජනය, පටිඝසංයොජනය, මානසංයොජනය. දිට්ඨිසංයොජනය, සීලබ්බතපරාමාසසංයොජනය, විචිකිච්ඡාසංයොජනය, ඉස්සාසංයොජනය, මච්ඡරියසංයොජනය, අවිජ්ජාසංයොජනය,- යන දසසංයොජනාදීහුද, අකුසල ධර්මයො වෙති. මේ අකුශල ධර්ම සමූහය, උප්පන්නානං අකුසලානං ධම්මානං යනාදි පාඨයෙහි අකුසල ධර්මයෝ කවරහුදැයි තේරුම් ගැණීමට ප්‍රමාණවත්ය. මේ ලඟට මෙහි දැක්වුනු එක් එක් අකුශල ධර්මයන් විස්තරකොට බලමු.

එයින් මුලින්ම කියවුනු ලොභයයි කියන්නේ රූපාදී අරමුණුවල දැඩිවශයෙන් ඇලීමයි. රූපයෙහි ඇලුනු බවට උම්මත්තක චිත්ත තෙරුන් පිළිබඳ නිදර්ශනයද ශබ්දයෙහි ඇලුනු බවට සුවණ්ණ කක්කට ජාතකයද, ගන්ධයෙහි ඇලුනු බවට මූධයෙන් මහනෙල් මල්සුවඳ හැමූ තෙරුන්ගේ වස්තුවද නිදර්ශන කල හැකිය මෙහිදී අපි ඒ පිළිබඳ කථාව ඉතා කෙටියෙන් ප්‍රකාශ කරන්නට කැමැත්තෙමු. සැවැත්නුවර එක් කෙලඹි පුත්‍රයෙක් බුදුරදුන්ගෙන් බණ අසා පැහැද පැවිදිවිය ඔහුගේ භාර්‍යාව අශ්‍රාමික හෙයින් කොසොල් රජ තම අන්තඃපුරයට ඇය ගෙන්වාගත්තේය. දිනෙක අන්තඃපුර ස්ත්‍රීන්ට රජතුමා නිලුපුල් මල් පරිත්‍යාග කොළේය. එහි සුවඳ ආඝ්‍රාණයෙන් යථොක්ත ස්ත්‍රිය වරෙක හඬන්නටද වරෙක සිනාසෙන්නටද වූවාය. මේ විප්‍රකාරය දුටු රජතුමා එයට කරුණු විචාලේය. ඉද්වගහ් වගන්නු,

මාගේ පෙර සැමියාගේ මුවින් හමන සුවඳ මේ නිලුපුල් මල් සුවඳ හා සමාන හෙයින් ඔහු සිහිව හඬන්නෙමි මල් ලැබීම නිසා ප්‍රීති වන්නෙමි. ඈය කීමාය. මේ කෙටි නිදර්ශනයෙන් තේරුම් ගත යුත්තේ ඇතමෙක් ගන්ධාදියෙහිද ගිජුවශයෙන් ඇලෙන බවය අනෙක් රස ස්පර්ශයන් පිළිබඳවද පතපොතින් කරුණු සොයා දතයුතුය මේ ලෝභය වස්තූන් කෙරෙහිද ඇබ්බැහිවශයෙන් පවත්නා හෙයින් සමහර තෙනෙගුන් මෙලොව මහා දරුණු විසඟතිව ලමද මරණින් මතු තිරිසන් ප්‍රේතාදි අපායවලටද භාජනවන බව පොත පතින් පේරේ.

වෙෂය- නම් සිතෙ ප්‍රතිඝාතී බව වෙනස්වීමය මෙයට ක්‍රෝධය ව්‍යාපාදය පටිඝය තරහව, ක්ෂාන්තිය යනුද පර්යාය නම් වශයෙන් සැලකිය හැකිය ඒ මේ වෙෂය දශාකාරයකින් උපදී අසවලා මට අනර්ථ පිණිස පෙර හැසුරුණේය දැනුදු හැසිරෙයි මත්තෙහිද හැසිරෙන්නේය අසවලා මගේ මිත්‍ර ඥාතීන්ට අනර්ථ පිණිස පෙර හැසුරුණේය. දැනුදු හැසිරෙයි, මත්තෙහිදු හැසරෙන්නේය. අසවලාගේ සතුරාට වැඩ පිණිස හැසුරුණේය, දැනුදු හැසිරෙයි, මත්තෙහිද හැසිරෙන්නේය යන වශයෙන්ද සලකා පාහැපීමෙන් උපදින ක්‍රෝධය වැනි අස්ථාන වෙෂය වශයෙන් දැයි යන දශ අයුරෙනි.

මෝහය, නම් යම්කිසි දෙයක පවත්නා තත්වය මුවහ කරණ සවභාවය ය. ග්‍රීසම කාලයෙහි පිපාසායෙන් යුක්ත වූවෝ ඈත පෙනෙන චණ්ඩ සූර්ය රස්මිය දියධාරායයි සිතා දිවෙති. මේ මෝහයෙන් යුක්ත වූවෝද එබඳුය. දෙතිස් කුණප කොට්ඨාශයකින් සෙබි ස්ත්‍රී පුරුෂයන් ඔවුනොවුන් අත්පත් කර ගැණීම සඳහා ආශා කරණුයේද, ඇත්ත ඇති සැටි වළහන මේ මෝහය නිසාය අනෙක් අනෙක් වස්තූන් කෙරෙහි ද මෝහය පවත්නා සැටි මේ අයුරින්ම සලකන්න.

ස්පර්ශය, නම්, චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය, මන යන ෂඩින්ද්‍රියන්හී පිළිවෙළින් රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ ධම්ම යන මොවුන් එකට හැපීමෙන් ඇතිවන රශාසවාද සවභාවය එක් අනෙකින් අත් පොළසන් දීමට නොහැක්කාක් මෙන් හුදකලාවූ චක්ඛුසෝතාදීන් විසිනුදු ස්පර්ශයක් ලැබිය නොහැකිය එබැවින් යථොක්ත උපමාවෙන්ද තේරුම් ගතයුත්තේ චක්ඛු රූපාදීන් ගේ එකට හැපීමෙන් ස්පර්ශය උපදනා බවය. මේ අයුරින් උපදනා ස්පර්ශයද නොයෙක් දුක් පහළවීමට හේතුවකි.

**චේතනා** නම් සිතෙහි උපදින සියලු සිතුවිලි සමූහය අරමුණෙහි යෙදෙන යම් කිසි කෘත්‍යයක යොදවන ප්‍රධානයකු වැනි ස්වභාවයෙකි. හේ සිතෙහි ඉපදී උපදින සෙසු චෛතසිකයන් වැඩෙහි යොදන්නෙකි. කර්මාන්ත ශාලාවක ප්‍රධාන කාර්මිකයා තමනුත් වැඩෙහි යෙදෙමින් සෙසු කම්කරුවන්ද එහි නියුක්ත කරවන්නාක් මෙනි. එමෙන්ම මේ චේතනාවද තමන්ට අයත් කටයුතු කෙරෙමින් සෙස්සන්ගේ කෘත්‍යයද සිඩකෙරේ යයි දත යුතුයි.

**ඒකාග්‍රතා** නම් සිත නොයෙක් අරමුණු කරා යානොදී එක් අරමුණෙක පැවැත්වීමය. කැඩපතකින් මුහුණ බලන්නහු කැඩපතේ ස්වභාවය නොබලා එහි සිත නොරඳවා තමන් මුහුනම බලති. කැඩපතත් ඡායාවත් යන වස්තු දෙකක් වුවද සිත රැඳවූයේ මුහුණ ගැණ පමණය එමෙන් ලොක ධාතුවෙහි නොයෙක් අරමුණු කරා දුවන සිත එසේ යානොදී ධ්‍යානාදී කාරණයකින් එක්තැනෙක පැවැත්වීම එක අරමුණෙක යෙදීම ඒකාග්‍රතා නම්.

**ජීවිතේන්ද්‍රිය** නාමේන්ද්‍රියය, රූපේන්ද්‍රියයයි දෙව දූරුම්වේ. මෝහු දෙදෙන චිත්ත චෛතසිකයන් පාලනය කිරිමේ ආධිපත්‍යය දරති. මවක විසින් තමන් කුස පිළිසිඳුනු දරුවා පිළිබඳ සංරක්ෂණය සුදුසු සුදුසු කැම්බීම් ආදිය අනුභව කිරීමෙන් ආධිපත්‍ය යෙහි යෙදෙන්නාක් මෙනි.

**මනසිකාරය** නම් ආජානීය අසුන් යෙදූ රියේ රථාචාර්‍යයා අසුන් නොමෙහෙයා බලා සිටින්නාක් මෙන් චිත්ත චෛතසික ධර්මයන් අරමුණට නොනගත ස්වභාවයයි.

**විතර්කය** නම් ඝණ්ඨාවකට ගැසූ පහරක් මෙන් අරමුණට සිත නැන්වීම ස්වභාවයෙන් යුත් චෛතසිකයෙකි.

**විචාරය** නම් ඝණ්ඨාවකට ගැසීමෙන් නැගුණ දොංකාරය මෙන් අරමුණෙහි සිත හැසිරවීම විචාරය නම්.

**අධිමොක්ෂය** නම් සිව් දිගින් හමනා සුලඟින් කම්පා නොකල හැකි මහ පර්වතයක් මෙන් එක් අරමුණෙක සිත ස්ථිරව පැවැත්වීම ස්වභාවයෙන් යුතු චෛතසිකයෙකි.

**වීර්‍යය** නම් ඒකාන්තයෙන් නහර ඇට ඉතුරුවී සිරුරෙහි සෙසු සම් මස් ලේ වියැලෙතුදු මේ සදුත්සාහය නොහරින්නෙමියි අධිෂ්ඨාන කොට කලමනා උත්සාහය ය ඒ මේ උත්සාහය ලෞකික, ලොකොත්තර වශයෙන් දෙවැදෑරුම් වේ. හොඳ දේ කිරීමෙහි පැවති මේ උත්සාහය සම්‍යක් ව්‍යායාම නමුදු වේ.

ප්‍රීතිය නම් පිපාසයෙන් පීඩිත මගියෙකුට පැන් විලක් පිළිබඳ ඇසීමෙන් උපදින ප්‍රීතිය මෙන් අරමුණු පිළිබඳව සටගන්නා සන්තෝෂ ස්වභාවයෙන් යුත් චෛතසික යෙකි.

ඡන්දය නම් සිතට අරමුණු ගැණීමෙහි පමණක් ඇතිවන කැමැත්තය.

අහිරිකය නම් දශ අකුශල ධර්මයට ලජ්ජා නොවන ස්වභාවයයි. දශ අකුශලය නම් ප්‍රාණඝාත, අදත්තා දානය, කාමමිථ්‍යාචාර, මුසාවාද; පිසුනාවාචා ඵරුසාවාචා, සම්ඵප්පලාප, අභිජ්ඣා ව්‍යාපාද, මිච්ඡාදිට්ඨි යන දශය ය ප්‍රථමයෙන් දැක්වූ අකුසල් තුන සිදුවන්නේ කයිනි. ඊලඟ අකුසල් සතර සිදුවන්නේ වචනයෙනි ඊලඟ අකුසල් තුන සිදු වන්නේ සිතිනි.

අනොත්තප්පය නම් පහන් සිළුවට බිය නොවන පලගැටියන් මෙන් කායදුශ්චරිත, වාක් දුශ්චරිත, මනඃ දුශ්චරිත යන ත්‍රිවිධ දුශ්චරිතයනට බිය නොවන ස්වභාවය ය.

දිට්ඨිය නම් ඇස් බැන්දුම් කාරයකුගේ විජ්ජාවක් මෙන් අරමුණු වරදවා දැකීමේ ස්වභාව ය ය.

මානය නම් මම කිසිවෙකින් කිසිවෙකුට දෙවෙනි නොවෙමියි ඔවුනොවුන් හා උසස් බැව් ආදී වශයෙන් මැන බැලීම් ස්වභාවයය

ඊර්ෂ්‍යාව නම් අනුන්ගේ සම්පත්තිය නො ඉවසන සුළු ස්වභාවය යි බුදු රදුන්ගේ ඉදු පෙළහර මිසදිටුවන් නොඉවසන් නාමෙනි.

මච්ඡරිය නම් අනුන්ගේ සම්පත්තිය තමන්ටවේවා තමසම්පත්තිය අනුන්ට නොවේවායි සම්පත් සඟවන ස්වභාව ලක්ෂණ කොට ඇත්තේ වේ.

කුක්කුච්චය නම් නොකරණ ලද පින් ඇති කරණ ලද පව් නැති තැනැත්තහුගේ සිත්හි ඒ හේතුවෙන් උපදින විපිළිසර භාවයයි.

ථිනමිද්ධය නම් කටයුත්තෙක නොයෙදිය හැකි පරිදි ඇති වන චිත්තයාගේ අලස බව හා වේදනා, සඤ්ඤා, සංඛාර යන පංචස්කන්ධත්‍රයාගේ අලස බවය. දුන් මේ දක්වා අප විසින් විස්තර කරණ ලද්දේ උපන් අකුසල් පිළිබඳ කෙටි විස්තරයෙකි, මේ

අකුශල ධර්මයන් ප්‍රහීන වන අයුරු මිලහට ප්‍රකාශ කලයුතුව තිබේ. ඒ මේ ප්‍රහානය තෙම තදඞ්ග, විෂ්කම්භන, සමුච්ඡේද, පටිප්පස්සද්ධි, නිස්සරණ යන වශයෙන් පස් වැදෑරුම් වේ.

රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණාදී ධර්මයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් තිලකුණු වඩා විදසුන් නුවනින් අවිද්‍යාදී ක්ලේශ ධර්මයන් ඒ නිමිත්තකර ගෙණ ප්‍රහාණය කිරීම තදඞ්ග ප්‍රහාණ නම් වේ.

කාමච්ඡන්දාදි නීවරණ ධර්මයෙන් වෙන්වූ විතක්ක විචාරාදී පස්දෙන කාමච්ඡන්දාදීන් ඔබා ප්‍රථමධ්‍යානාදී අෂ්ට සමාපත්තියට පැමිණෙන හෙයින් විෂ්කම්භන ප්‍රහාණ යයි කියනු ලැබේ.

සක්කාය දිට්ඨි විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන තිදෙනාද අනුසය යන් අතුරෙන් විචිකිච්ඡානුසය දිට්ඨානුසය යන දෙදෙනාද සංයෝජන යන්හෙන් දිට්ඨි සංයොජන විචිකිච්ඡා සංයෝජන සීලබ්බත පරාමාස සංයොජන යන තිදෙනාද යන ඈ කෙලෙසුන් නැඩූ ශ්‍රොතාපත්ති මාර්ගය ය කාම රාගය ව්‍යාපාදය කාම රාගානුශය පටිඝානුසය කාමරාග සංයොජනය පටිඝ සංයොජනය යන මේ කෙලෙසුන් තුනී කල සකෘදාගාමි මාර්ගය ය, ඒ සකෘදාගාමි මාර්ගයෙන් තුනිකල ක්ලේශයන් සපිරිය ඡේදනය කලාවූ අනාගාමි මාර්ගය, රූප රාග, මාන, උද්ධච්ච අවිජ්ජා භවරාගානුසය මානානුසය, අවිජ්ජානුසය, භවරාග සංයෝජනය, මාන සංයොජනය අවිජ්ජා සංයොජනය, ඉස්සා සංයෝජනය මච්ඡරිය සංයොජනය යන කෙලෙසුන් නැසූ අර්හත් මාර්ගයයි මෙකී චතුර්විධ මාර්ගයන් කෙලෙසුන් මුල්සිඳ නැති කළ බව සමුච්ඡේද ප්‍රහාන නම් වේ.

මග්ගඞ්ගිකො ඵලඞ්ගිකො යෙව යනු වෙන් සොවාන් ආදී මාර්ගඥනයට පැමිණියේම ඵලඥණයට පැමිණියේ වේ. ඒ සතර ඵල චිත්තය ප්‍රති ප්‍රශ්‍රබ්ධි ප්‍රහාන නම් වේ.

පඤ්ච මහා ගතියෙන්ද චතුර්විධ යෝනී යෙන්ද සප්ත විඤ්ඤාණස්ථිතියෙන්ද යන ආදී අක් මුල් නැති සසර හා නොහැනී සිටි අජරාමර සඞ්ඛ්‍යාත නිර්වාණය තෙම නිස්සරණ නම් වේ.

මෙතෙකින් අපට නියමිත මාතෘකාව සමාප්ත කරණවත් හැර සියලු සත්වයන්ට ධර්මශ්‍රවනමය පිනින් අජර අමර සංඛ්‍යාත නිර්වාණ ධර්මය ලැබේවායි ප්‍රාර්ථනය කරමු.

# තෙවන සම්මප්පධානය.

(පානදුරේ, වලාණේ ශ්‍රී විජය සෞගත විද්‍යාලයේ උප ප්‍රධානාචාර්‍ය
පණ්ඩිත මාදුපිටියේ සෝමධානන්ද ස්ථවිරයන්
වහන්සේ විසිනි)

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

පුනච පරං උදායි අක්ඛාතා මයා සාවකානං පටිපදා යථා පටිපන්නා මෙ සාවකා චත්තාරො සම්මප්පධානෙ භාවෙන්ති ඉධුදායි භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති. වීරියං ආරභති, චිත්තං පග්ගණ්හාති, පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහාණාය ඡන්දං ජනෙති, වීරියං ආරභති, චිත්තං පග්ගණ්හාති, පදහති; අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති, වීරියං ආරභති, චිත්තං පග්ගණ්හාති, පදහති, උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා, අසම්මොසාය, භිය්‍යොභාවාය, වෙපුල්ලාය, භාවනාය, පාරිපූරියා, ඡන්දං ජනෙති, වීරියං ආරභති, චිත්තං පග්ගණ්හාති පදහති, තත්‍ර ච පන මෙ සාවකා බහූ අභිඤ්ඤාවොසාන පාරමිප්පත්තා විහරන්ති.

පින්වත්නි,

අපවත් වී වදාළ ගෞරවාස්පද ආශීවංසාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ගුණානුස්මරණය කිරීම සඳහා තච්ඡිෂ්‍ය මොරටුමුල්ලේ ශ්‍රී සුධර්මාරාමාධිපති ගරු මොරටුවේ ශ්‍රී සාසනවංස මහා ස්ථවිරයන් වහන්සේගේ අනුශාසනාවෙන් පවත්නා ආශීවංස ගුණානුස්මරණ සභාව මගින් මේ විහාරස්ථානයෙහි පැවැත්වෙන ප්‍රාප්තිදූතමාග මහා පුණ්‍යොත්සවය පිළිබඳ සත්වන ධර්මදේශනා වාරයයි මේ.

මෙයට කලින් මේ පින්වත් පිරිස විසින් සතිපට්ඨාන ධර්ම සතරෙක, සම්මප්පධාන ධර්ම දෙකකැයි සත්තිස් බෝධිපාක්ෂික ධර්ම අතුරෙන් සයක් ශ්‍රවණය කරන්ට ඇත. දුක්ඛ, සමුදය නිරොධ, මග්ග යන

සිව්සස් දහම් ඉතිරි නොකොට අවබෝධකර ගැනීමෙන්, ඉතිරි නොකොට සියලු සසර දුක් නැතිකර ගැනීමට කැමති සියල්ලන් විසින් පිළිවෙත් සත්තිසක් පිරිය යුතු වන්නේය. එකී පිළිවෙත් දහම් නොපුරා බෞද්ධවූ අපගේ පරමාර්ථය ඉෂ්ට කරගත හැකි නොවන්නේමය. එකී පිළිවෙතද පර්‍ය්‍යාප්ති (අසා බලා උගතයුතු) ධර්මය මුල්කොට ඇති බැවින් පිළිවෙත් පිරීමට කලින් එකී, බොධිපාක්ෂික ධර්මගැන සියල්ලන් විසින් ම මනා දැනීමක් ඇති කරගත යුතුය මෙලෙසින් බෞද්ධයන් විසින් හොඳින් අසාබලා දැන උගතයුතුවන ධර්මස්කන්ධයන් මාතෘකා කොටගෙන මේ දේශනා පංතිය ආරම්භ කරලීමට අවවාදානුශාසනා කිරීම ගැන යථොක්ත ගරු ශාසනවංස ස්ථවිරයන් වහන්සේට කෘතඥ විය යුතුයි.

බොධිපක්ඛිය යන මෙය උද්දෙස, නිද්දෙස, පටිනිද්දෙස විවරණ විභජන, උත්තානී, කරණ යනාදී නෙත්ති ක්‍රමයන්ගෙන් පැහැදිලි කෙරෙමින් අදහස දක්වාලීමට තරම් කාලයක් නොවන හෙයින්ද, එකී විස්තර කථා කිසිවක් නොකියන්නෙමි. එතකුදු වුවත් මේ කාලයෙහි බොහෝදෙනා බණ අසන්නේ නියම ධර්මගෞරවයෙහි පිහිටා නොවනබව අපදුනගෙන තිබෙනසෙයින් මේ පින්වතුන් තුළ ධර්ම ගෞරවය ඇතිකරලීම සඳහා කරුණු ස්වල්පයක් ප්‍රකාශ නොකරම බැරිය.

ලෝකයෙහි සියල්ලටම වඩා ධර්මයම ශ්‍රේෂ්ඨ බව අප විසින් විශ්වාස කටයුතුව තිබේ. ධර්මයට අනුකූල පැවතුම් ඇති තැන සැනසිල්ල ද, ධර්මයට විරොධ පැවතුම් ඇති තැන වැනසිල්ල ද, ඇතිවනු නියතයි ධර්මයෙහි හැසිරෙන්නහු ධර්මයම රක්‍ෂාකෙරෙයි මනාව පුරුදු කළ ධර්මය සැපය ගෙන දෙයි. මනාව පුරුදු කළ ධර්මයෙහි මේ ආනිසංසය වේ. ධර්මයෙහි හැසිරෙන්නේ දුගතියට නො යෙයි.

එහෙයින් වදාළ සේක-

ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී.

කරදර, කම්කටොළු, හිරිහැර සියල්ලම ධර්මයෙන් ඈත්වන් නවුන්ට ලංවන අතර ධර්මයට ලං වන්නවුන්ට ඒ කරදර ආදිය ඈත්වන්නාහ. "සුඛංච න විනා ධම්මා" යි ධර්මයෙන් තොරව සැපතක් නැත්තේයයි ප්‍රකාශ කරණ ලද්දේද එහෙයිනි.

බුදුරජාණන් වහන්සේ පවා සදේවක ලෝකයාගේ ගෞරවාදර සත්කාරයන්ට පාත්‍රව තුන්ලොවට අසහාය නායක වූයේය ධර්මයේ බලයෙන් මිස අන් කිසි බලයකින් නොවේ. ධර්මකාය සම්පත්තියේම අනුගතයින් උන්වහන්සේ රූපකාය සම්පත්තිය දුටුවන් මන නුවන් පහදනේ විය. ධර්මයේ වටිනාකම නොසලකන අයට එහි තත්වය තේරුම් නොගියද ධර්ම තත්වය තේරුම් ගත් උත්තමයෝ සඳහටම ධර්මදූතවම විසූහ. බුදුවැ තිත්තිත නගන්නෝ නම් කාලාන්තර ව්‍යවහිත දෝෂාදියෙන් වැසීගිය ධර්මයම යළිත් සොයාගෙන නතා සිටුවා ලන්නෝය. එබඳු උත්තමයෝම අනන්ත ගුරු භක්තියෙන් යෙදී සම්භාවනා කොළෝත් ධර්මයමැයි එයට මේ ප්‍රවෘත්තිය නිදර්ශන කළ හැකිය

බුදුරජාණන්වහන්සේ බුදුවූ අළුත නේරංජරා ගඟබඩ උරුවෙලායෙහි අජපාල නම් නුගරුක මුල වැඩවසන සේක් මෙසේ සිතා වදාළ සේක. "ගුරුවරයෙකු නැතිවැ සගෞරව යටහත් පහත් පැවතුම් නැතිව විසීම වූකලී දුකය. එබැවින් කවර නම් මහණකු හෝ බමුණකු ගුරුකොට ගෙන, ඇසිරුකොටගෙන වාසය කෙරෙම්දැ"යි මෙසේ සිතා වදාරා තුන්ලොවම පිරික්සා බලනසේක් ශීල, සමාධි, ප්‍රඥා, විමුක්ති යන මේ ගුණ ධර්මයන්ගෙන් තමන්වහන්සේට වැඩි තරම් වූ කිසිවකු නොදැක අවසානයෙහිදී "මා විසින් අවබෝධ කරණ ලද්දාවූ යම් ධර්මයක් වේද, ඊටම සත්කාර කොට, එයම ගුරුකොට, එයම ඇසිරු කොට වාසය කරන්නෙමි" යි නිශ්චය කරගත් සේක.

බුදුරජාණන් වහන්සේගේ යටකී විතර්කය දැනගත් සහම්පතී නම් මහා බ්‍රහ්ම තෙම දික්කළ අතක් වක්කරන්නාවූද වක් කළ අතක් දික්කරන්නාවූද ඇසිල්ලක් තුළ බඹලොවින් අතුරුදහන්ව බුදුරදුන් කරා පැමිණියේ, උතුරු සළුව එකස්කොට පෙරළා දකුණු දණමඬල බිම ඇනගෙන බුදුන් වෙත ඇඳිලි බැඳ මෙසේ කීය- "එව මෙතං භගවා, එව මෙතං සුගත, යෙපි තෙ භන්තෙ අහෙසුං අතීත මද්ධානං අරහන්තො සම්මා සම්බුද්ධා, තෙපි භගවන්තො ධම්මං යෙව සක්කත්වා ගරු කත්වා උපනිස්සාය විහරිංසු යෙපි තෙ භවිස්සන්ති අනාගත මද්ධානං අරහන්තො සම්මා සම්බුද්ධා, තෙපි භගවන්තො ධම්මං යෙව සක්කත්වා ගරු කත්වා උපනිස්සාය විහරිස්සන්ති, භගවාපි භන්තෙ එතරහි අරහන් සම්මා සම්බුද්ධො ධම්මං යෙව සක්කත්වා ගරු කත්වා උපනිස්සාය විහරතූති"

තෙල කාරණය එසේය, පින්වතුන් වහන්ස, තෙල කාරණය එසේය, සුගතයන් වහන්ස, ස්වාමීනි ඉකුත් කල අරහත් වූ සම්මා සම්බුදුවරු විසූහුද. ඒ පින්වත්හුද දහමට සලකා දහමම

ගරු කොට දහම්ම ඇසිරු කොටවිසූහ. අනාගත යම් අරහත් සම්මා සම්බුදුවරු වන්නාහුද, ඒ පින්වත්හු ද දහම්වටම සලකා දහම්ම ගරුකොට දහම්ම ඇසිරු කොට වසන්නාහ සවාමිනි· මෙකල අරහත් සම්මා සම්බුදුවූ පින්වතුන් වහන්සේද දහම්වටම සලකා දහම්ම ගරුකොට වාසය කරණ සේක්වා! යි, මෙසේ කියා නැවතද මෙසේ කීය:-

යෙ චබ්භතීතා සම්බුද්ධා - යෙච බුද්ධා අනාගතා
යො චෙතරහි සම්බුද්ධො - බහුන්නං සොකනාසනො

සබ්බෙ සද්ධම්ම ගරුනො - විහංසු විහරන්ති ච
අථොපි විහරිස්සන්ති = එසා බුද්ධාන ධම්මතා

තස්මා හි අත්ත කාමෙන - මහත්තමභිකංඛතා
සද්ධම්මො ගරු කාතබ්බො - සරං බුද්ධාන සාසනං

ඒ ගාථාවල අදහස මෙසේයි- යම් අතීත බුදුවරයෝ වූද අනාගත බුදුවරු වන්නාහුද බොහෝ දෙනාගේ ශොක දුරුකරණ දැන් යම් සම්බුදුවරයෙක් වේද ඒ සියලු දෙනාම සද්ධර්මය ගරුකොට ඇත්තාහු, වාසය කළහ. වාසය කරන්නාහ, වාසය කෙරෙති. එබැවින් තමහට හිතවැඩ කැමති, මහත් බව රිසිවන, බුද්ධාවවාදය මෙනෙහි කරන තැනැත්තහු විසින් සද්ධර්මය ගරුකටයුත්තේ වෙයි.

කරුණු මෙසේ හෙයින් අප විසින් මේ සුළු කාලය තුල කරනු ලබන තුන්වන සම්මප්පධාන මාතෘකාන්විත දේශනාව මහත් ගෞරව උපදවා ශ්‍රවණය කොට අමාමහ නිවන් සුව සාධාගැනීමට වෑයම් කරණ ලෙස මේ පින්වතුන් වෙත මහත් කරුණාවෙන් දන්වා සිටිමි.

මුලින් අප විසින් ප්‍රකාශ කරණ ලද්දේ සම්මප්පධාන ගැන මහා සකුළුදායි සූත්‍රයෙහි එන පාඨයෙකි. එහි සාමාන්‍ය අදහස මෙසේයි!- "උදායිය, නැවතද අනිකක් කියමි. යම් සේ, පිළිපන් මාගේ ශ්‍රාවකයෝ සතර සම්‍යක් ප්‍රධානයන් වඩත්ද, මා විසින් ශ්‍රාවකයන්ට එබදු ප්‍රතිපදාවක් කියන ලද්දීය. උදායිය, මේ සස්නෙහි මහණ තෙම හටනොගත්තාවූ ලාමකවූ අකොසලල සම්භූත ධර්මයන් හටනොගැනීම පිණිසද හටගත්තාවූ ලාමකවූ අකොසලල සම්භූත ධර්මයන් හටනොගැනීම පිණිසද, හටගත්තාවූ ලාමක වූ අකොසලල සම්භූත ධර්මයන් දුරුකිරීම පිණිසද, හටනොගත්තාවූ කොසලල සම්භූත ධර්මයන් හටගැනීම පිණිසද, හටගත්තාවූ කොසලල සම්භූත ධර්මයන් පැවැත්ම නොනැසීම, නැවත නැවත වීම විපුල බව වැඩීම සපුරාළීම යන මේවා පිණිස ද කැමැත්ත උපදවයි

වීර්‍යය පවත්ගනී. සිත දැඩිකොට ගනී. ප්‍රධන් වීර්‍ය කෙරෙයි. එබඳු මාගේ බොහෝ ශ්‍රාවකයෝ අභිඤ්ඤා වෝසාන නම් වූද අභිඤ්ඤා පාරමී නම් වූ රහත් බවට පැමිණ වාසය කෙරෙති.

යථෝක්ත දේශනා පාඨය ගැන හොඳින් සලකා බලන විට සතර සම්මප්පධාන යනු කවරේද? ඉන් ලැබෙන ප්‍රතිඵල කවරේද යනු මොනවට දක්වා වදාරණ ලද බව පෙනී යයි. මේ පාඨයෙන් තථාගතයෝ තුමූ පූර්වභාග ප්‍රතිපදාවත් එහි ආනිසංසයත් දෙසනා කළසේක.

1. නූපන් අකුසල් නූපදීමට ගන්නා වීර්‍යය, 2 උපන් අකුසල් දුරුකිරීමට ගන්නා වීර්‍යය; 3 නූපන් කුසල් ඉපදීමට ගන්නා වීර්‍යය. 4. උපන් කුසල් වඩ ගැනීමට ගන්නා වීර්‍යය යන මේ සතර වැදෑරුම් උත්සාහය සතර සම්මප්පධාන බව කොටින් සැලකුව මනායි.. මේ චතුර්විධ ප්‍රධානය සත්තිස් බෝපැකි දහම් අතරෙහි නොයෙක් මුණු වරින් එළඹ සිටින්නේ වෙයි. සතර සතිපට්ඨානයන්හි ධම්මානුපස්සනාවෙහි එක දෙයකට ඇතුළත්ව ද, සතර ඉද්ධිපාදයන්හි විරියිද්ධිපාදයට ඇතුළත් වද, පංචඉන්ද්‍රියන්හි විරියින්ද්‍රියට ඇතුළත් වද, පංචබලයන්හි විරිය බලයට ඇතුළත්වද, සත්ත බොජ්ඣඞ්ගයන්හි විරිය සම්බොජ්ඣඞ්ගයට ඇතුළත්වද, ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහිදී සම්මාවායාමයට ඇතුළත්වද, මේ සිව්වැදෑරුම් පදන්විරිය පවතී.

මේ සිව් වැදෑරුම් ප්‍රධන් වීර්‍යයන් අතුරෙන් තුන්වන ප්‍රධන් වීර්‍යය එනම්, නූපන් කුසල් ඉපදීමට ගන්නා වීර්‍යය ගැන මෙ දින කරුණු කියා දිය යුතුව තිබේ. අනුප්පන්නානං කුස-ලානං ධම්මානං උප්පාදාය යන මේ පාඨයෙහි එන කුසල ධම්ම යනු කවරේ දැයි පළමු කොට සලකා බැලිය යුතු යි.

මෙහි දී කුසල ධම්ම යැයි කියන්නේ කුසල් සිත්වලට බව හොඳින් සිත්වලට ගත යුතුයි. ධම්ම යන්නෙන් නිස්සත්ව නිජ්ජීව සවභාවය යන අර්ථය ලැබේ. සිත් යනු නාම ධර්මයෙකි. රූප ධර්මයෙක් නොවේ. හැම සිත්වලට කුසල යැයි නොකියැවෙන්නේ යි. කුසල ලකුණු ඇති සිත්වලට පමණක් කුසලයැයි කියනු ලැබේ. එබැවින් මෙහි දී අර්ථ කථානයින් කුසල ලකුණු පිළිබඳ විස්තරයක් කියා දෙනු කැමැත්තෙමි.

පොදු වසයෙන් ගෙන කියන කල කුච්ඡිතානං සලනාදීහි අත්ථෙහි කුසලං' යනාදි හෙයින් කුත්සිත පාප ධර්මයන් කම්පා කිරීම ආදියෙන් කුසල නම් ලබතුදු මෙහි ලා ආරෝග්‍යාර්ථය

අනවද්‍යාර්ථය, කොසල්ල සම්භූතාර්ථ යැයි ප්‍රධානාර්ථ තුනක් වේ. එ බැවින් කුසල යන මෙහි එක් තේරුමක් නම් නිරෝග බවයැ. තවෙකක් නම් නිවැරදි බව යැ. අනික නම් නුවණින් හටගත් බව යැ. යම් සිතක් කෙලෙස් ආතුර බැවින් ද, කෙලෙස් ගිලන් බැවින් ද, දුරු වූයේ නම් එම සිත කුසල් සිතකි. එයට කුසල නාමය ලැබෙන්නේ යට කියන ලද ආරෝග්‍යාර්ථයෙනි. යම් සිතක් කෙලෙස් දොසින් ද, කෙලෙස් දුගඳයෙන් ද, දුරු වූයේ නම් එම සිත ද කුසල් සිතකි එයට කුසල නාමය ලැබෙන්නේ යට කියන ලද අනවද්‍යාර්ථයෙනි. යම් සිතක් ප්‍රඥාවෙන් හටගත්තේ නම් ඒ සිතද කුසල් සිතකි. එයට කුසල නාමය ලැබෙන්නේ යට කියන ලද කොසල්ල සම්භූතාර්ථ යෙනි.

එහි කොසල්ල නම් ප්‍රඥාවයි. නුවණින් නිපන් සිත්ම කුසල් නම් වෙතොත් ඥාණ සම්ප්‍රයුක්ත සිත් පමණක් ම කුසල් සිත් වුව මනා යි. එවිට ඥාණ විප්‍රයුක්ත සිත්වලට කුසල නාමය නො ලැබේද? යනු මෙහි ලා නැගෙන පැණයෙකි. එහි විනිශ්චය මෙසේ යි: ඥාණ විප්‍රයුක්ත සිත්වලටද කුසල නාමය ලැබේ. ඒ නාමය ලැබෙන්නේ රූඪී වශයෙනි. යම් සේ තල් අතුවලින් නො කරන ලද නමුත් ඒ ආකාරයට කලාල පැදුරු ආදියෙන් කරන ලද අවානවද රූඪී වශයෙන් තල් වැටයැ යි කියනු ලැබේද එමෙන් ඥාණ විප්‍රයුක්ත සිතට ද කුසල නාමය රූඪී වශයෙන් ව්‍යවහාර කරනු ලැබේ. ඥාණ සම්ප්‍රයුක්ත සිත ම ප්‍රධාන වශයෙන් යට කියන ලද අර්ථ තුනෙන් ම කුසල නාමය ලබන අතර ඥාණ විප්‍රයුක්ත සිත ආරෝග්‍යාර්ථය, අනවද්‍යාර්ථය යන අර්ථ දෙකෙන් පමණක් කුසල නාමය ලබයි. යට කියන ලද අර්ථයන් මෙසේ සංග්‍රහ කොට තිබේ.

කුච්ඡිතානං සලනතො - කුසානං ලාවනෙන වා
කුසෙන ලාතබ්බතො වා - කුසලන්ති පවුච්චති

ආරොග්‍යට්ඨාන වජ්ජට්ඨ සුඛ පාකට්ඨතො තථා
කොසල්ල සම්භවට්ඨෙන - කුසලන්ති පවුච්චති

නින්දිත වූ පාප ධර්මයන් කම්පා කරන හෙයින් ද, තපුරු කොට සන්තානයෙහි සයනය කරන පාප ධර්මයන් සිඳලන හෙයින් ද, කුසල යැයි කියනු ලැබේ යනු පළමුවන ගාථාවේ අදහසයි. ආරෝග්‍යාර්ථ, අනවද්‍යාර්ථ, සුඛ විපාකාර්ථ, කොසල්ල සම්භූතාර්ථ යන මෙකී අර්ථයන්ගෙන් කුසල යැයි කියනු ලැබේ යනු දෙවන ගාථාවේ අදහස යි.

මේ කියන ලද කුසලයාගේ ලක්ෂණය හෙවත් සවභාවය නම් නිවැරදි සුඛ විපාකය යි. රසය හෙවත් කෘත්‍යය නම් අකුසලය නැති කිරීම යි. පච්චුපට්ඨානය හෙවත් වැටහීම් ආකාරය නම් පිරිසිදු බව යි පදට්ඨානය හෙවත් ආසන්න කාරණය නම් යොනිසො මනසිකාරය යි. මෙ කියන ලද සියලු කරුණු කැටි කොට ගත් කල, කෙලෙස් ලෙඩ නැති, කෙලෙස් දොස් නැති, නුවණින් හටගත්, සැප විපාකය සැබවින් ගෙන දෙන, අකුසල් නැති කරන්නා වූ, පිරිසිදු ආකාරයෙන් වැටහෙන්නා වූ, යොනිසො මනසි කාරයට ලං වැ පවත්නාවූ අරූපී ධර්ම සමූහය කුසල ධම්ම නම් වෙ.

මෙකියන ලද අර්ථයන්ගෙන් විස්තර කරනු ලැබූ කුසල් සිත් ද කාමාවචර යැ, රූපාවචර යැ, අරූපාවචර යැ ලොකොත්තරයැ යි චතුර්විධය හ. ඉන් පූර්වභාග ප්‍රතිපදා සංඛ්‍යාත ලොකිය සම්මප්ප ධාන අවසරයෙහි ආදි වූ ත්‍රිවිධ කාමාවචරාදි චිත්තයන් කුසල ධම්ම වසයෙන් ගිණිය හැකි වූවද, අභිසඤ්ඤා වොසාන, අභිසඤ්ඤා පාරමී, සංඛ්‍යාත ලොකුත්තර සම්මප්පධාන අවසරයෙහිදී කුසල ධම්මං වසයෙන් ගත හැක්කේ ලොකොත්තර සිත් ය. එ බැවින් නිෂ්ඨාර්ථ වසයෙන් නූපන් කුසල ධර්ම ඉපදීමට වීර්‍ය්‍ය කිරීම නම් තම සතන්හි නූපන් සමථ-විදර්ශනා මාර්ග-ඵල සිත් උපදවා ගැනීමට කරන්නා ප්‍රබල වීර්‍ය්‍යයි.

ලෞකික වූ ද රූපාවචර වූද, අරූපාවචර වූද කෙතෙක් කුසල ධර්මයන් වඩා වවාගත්තද ලොකොත්තර මාර්ග ඵල සිත් උපදවා ගන්නතුරු භවයේ අවසානයක් දකින්ට බැරියැ. එබැවින් කරන්ට තිබෙන හොඳම හොඳ උත්සාහය, වීර්‍ය්‍යය, පරාක්‍රමය ව්‍යායාමය, ථාමය, ධිතිය. උස්සොල්හිය නමින් සතන් තුළ නූපන් සමථ විදර්ශනා. මාර්ගඵල සිත් ඉපදීම් සඳහා කරනු ලබන උත්සාහ දියයි. විවට්ටගාමි කුසලයන් සඳහා බොධිසත්වයන් වහන්සේ පධාන නොකල සැටිද, වට්ටගාමී කුසලයන් සඳහාම ජීවිතය පවා නො සලකා පධාන කළ අයුරු පධාන සූත්‍රයෙහි මොනවට සඳහන්වා ඇත-එය මෙතැන්සිට දක්වනු ලැබේ.

සමන් වහන්සේ සය වසක් දුෂ්කර ක්‍රියා කළ අයුරු ශ්‍රාවක සමූහයාට දන්වනු රිසි තථාගතයන් වහන්සේ දිනක් දම්සභා මඬුවට වැඩි භික්ෂූන් අමතා මෙසේ වදළ සේක "මහණෙනි නිවන් සඳහා! යොමුකරන ලද සිතැත්තා වූ නොකොත් කරනා ලද ආත්මාලය ඇත්තාවූ චතුර්විධ යොගයන්ගෙන් නිර්භය වූ නිවණට එළැඹීමු සිදහා නෙරංජරා ගඟබඩ මහත් උත්සාහයෙන

අප්‍රාණක ධ්‍යානය වඩන්නා වූ මා කරා මාරතෙම කුළුණු තෙපුල් කියමින් එළැඹ මෙසේ කීය. ඔබ කෙට්ටුය. දුර්වර්ණය, ඔබට මරණභය ළඟය. මරණයට ඔබ කොටස් දහසක් ඇත්තෙකි. ජීවත්වීමට එක කොටසක් ඇත්තෙහි, පින්වත ජීවත්වනු මැනව ජීවත්වීම ශ්‍රේෂ්ඨය ජීවත්වෙමින් පින් කරනු මැනව, බඹසර නම්වූ තපස්කරන්නාවූද ගිනිපුදන්නා වූද, ඔබටපින් රැස්කරගත හැකිය විධානයෙන් කුමක් කරන්නෙහිද? පධන් මඟ දුකසේ යායුත්තකි. දුකසේ කටයුත්තකි." ලැබීමට දුෂ්කරයැ මෙසේ කියමින් මාරයා මා ළඟ සිටියේය.

එසේ කියන්නාවූ මාරයාට මම මෙසේ කීමි. පමාවූවන්ට නෑවූ පාපීවූ මාරය, මෙරමාට අනර්ථ කරණු සඳහා තෝ පැමිණියේ වෙහිය. අල්පමාත්‍ර වූ ද වට්ටගාමී කුසලයකින් මට ප්‍රයෝජනයක් නැත. යම් කෙනෙකුන්ට එබඳු කුසලයකින් ප්‍රයෝජනයක් වේද? ඔවුන්ට එසේ කියන්ට වටනේය. මට ඔකප්පන නම්වූ නොසැලෙන ශ්‍රද්ධාව ඇත. එසේම කාය පිළිබඳවූ ද සිත පිළිබඳවූද නොලිහිල් වූ යත පැරකුම් බව නම්වූ වීර්යයද මට ඇත. වජ්‍රෝපමවූ ප්‍රඥාවද ඇත. එසේම සමාපත්තිය හා සමාධියද මට ඇත. මෙසේ හරනා ලද ජීවිතාශා ඇති මට ජීවත්වීම ගැන කුමට කියෙහිද? මේ අප්‍රාණක ධ්‍යාන වීර්ය වෙගයෙන් හටගත්තාවූ වාතය තෙම ගංදිය පහර හමුදු වියලවන්නේය. හරිනලද ආත්මාලය ඇති මාගේ ලේය කිම නොවියලවන්නේද? ලේය වියලෙන කල බඩා බද්ධ පිත හා සිව් නැළියක් පමණ සෙම්ද වියලෙන්නේය. ලේ පිත් සෙම් වියලෙන කල මස්ද වැහැරෙයි. මස් වැහැරෙන කල බෙහෙවින් මගේ සිත පහදී. බෙහෙවින්මගේ සිහිය ද නුවණද සමාධියද එළඹ සිටීත්.

**ලොහිතෙ සුස්සමානම්හි - පිත්තං සෙම්හං ච සුස්සති**
**මංසෙසු ඛීයමානෙසු - භීයො චිත්තං පසීදති**
**භීයො සතිච පඤ්ඤා ච සමාධි මම තිට්ඨති"**

මෙසේ අන්තිම වෙදනාවට පැමිණ වසන්නාවූ මාගේ සිත පංචකාමයන් අපෙක්ෂා නොකරයි සත්වයෙකුගේ පිරිසිදුකම බලව මාරය තොපගේ පළමුවන සේනාව වස්තු කාම ක්ලේශ කාමයෝය (කාමා); දෙවන සේනාව අධි කුසල ධර්මයන්හි නො ඇලීමය (අරති); තෙවන සේනාව බඩගින්න හා පිපාසාවය (ඛුප්පිපාසා); සතරවන සේනාව තෘෂ්ණාවය (තණ්හා); පස්වන සේනාව වෙදනාදී ස්කන්ධත්‍රයාගේ සහ විඤ්ඤාණයාගේ ගිලන්බවය (ථිනමිද්ධ); හයවන සේනාව භය ය (භිරු); සත්වන සේනාව ප්‍රතිපදාව

පිළිබඳ සැකය (විචිකිච්ඡා); අටවන සේනාව මකු බව හා තද බව (මක්ඛ-ථම්භ); නවවන සේනාව නම් ලාභය ප්‍රශංසාව, සත්කාරය, මිථ්‍යාවෙන් ලබන ලද යසස, යන මොහුස්, (ලාභ) සිලෝක, සක්කාර, මිච්ඡාලද්ධ යස), දසවන සේනාව නම් තමන් හුවා දැක්වීම හා අනුන් හෙළා දැකීමය (අත්තුක්කංසන- පරවම්භනා) මේ කියන ලද්දේ මහණ බමුණන්ට පහර දෙන්නාවූ තෘෂ්ණාවූ තොපගේ සේනාවය. නාය ජීවිත දෙක්හි බලාපොරොත්තු ඇති නිවටයා තොප සේනාව ජය නොගනී: තොප සේනාව ජයගෙනම සැප ලැබිය හැකිය. නැති නම් නොහැකිය.

යුධයෙහිදී පලා නොයන බවට ලකුණක්වූ මුඤ්ජ තෘණය දරන්නකු කොට මා සලකව. තාගේ සේනාවෙන් පරාජිත වූ මාගේ ජීවිතයට නින්දාවේවා., ඒ නිසා ක්ලේශ යුධයෙහිදී පැරද ජීවත්වීමට වඩා යුධයෙහිදී මිය යාම මට උතුම්. මේ තාගේ සේනාවෙහි ගැලුණාවූ ගැටුණාවූ ඇතුලත්වූ සමහර මහණ බමුණෝ සීලාදී ගුණයන්ගෙන් නො බබලත්. තලාතුරකින් පමුන් ශ්‍රද්ධාදිය මැනවයි කෙන ඉන් මිදීමට උත්සාහ ගන්නාහු තමුදු තාගේ සේනාවෙන් වසාගන්නා ලද හෙයින් බුධාදී ආර්යයන් පලාගිය මඟ නොදනිති.''

**පගාළ්හා එත්ථ නදිස්සන්ති එකෙ සමණ බ්‍රාහ්මණා**
**තඤ්ච මග්ගං නජානන්ති=යෙන ගච්ඡන්ති සුබ්බතා**

බුදුන් වදාළ යථොක්ත ගාථාව ඇසූ මාරයා ඉන් පසු කිසිත් නො බැණ පලා ගියේ ය. උන් ගිය කල මහසත් තෙමේ ඒ දුෂ්කර ක්‍රියාවෙන් කිසි දු විශෙෂයකට නො පැමිණෙන්නේ පිළිවෙළින් සිව් සස් දැන ගැනීමට අන් මගක් ඇත්දෝ යි සිතා ඔළඳුරික ආහාර වළඳා බලය ගෙන වෙසක් පුන් පොහෝ දින පළමු වෙන් ම සුජාතාවන් දුන් කිරිපිඩු වළඳා හද්‍ර වන ලැහැබෙහි දිවා විහාර කොට, එහි දී අවසම්වත් උපදවමින් දවස් ගෙවා සවස් කල මහ බෝ මැඩට අබිමුඛ වැ ගොස් සොත්ථිය බමුණා විසින් දුන් තණ මිටි අට බෝ මුල සලා වතුරැවා දස දහස් ලෝ දැහි දෙවතාවන් විසින් කළ සත්කාර හා බුහුමන් ඇත්තෝ, එකැකින් සිව් ද නහර ද ඇට ද ඉතිරි වේවා! සිරුරෙහි මස් ලේ වියැලි යේවා! බුඩත්වයට නො පැමිණ මේ පලග නො බිදින්නෙම් යි ප්‍රතිඥා කොට සිව් රඟ වීරිය ඉටා වැඩ හුන් සේක.

පාපී මාර තෙම එය දැන අද සිදුහත් තෙමේ පිළිණ කොට හොත්තේ වෙයි, අද ම ඔහුගේ පිළිණ දුරු කටයුත්තේ යැයි බෝ මැඩ පටන් සක්වල කෙක් දික් වූ පූළුලින් දෙලොස්

යොදුන් වූ, උඩින් නව යොදුන් වූ මර සෙනඟ සද ගෙන යොදුන් සෙළසියයක් පමණ වූ ගිරිමෙවුල් ඇත් රජු නැඟ අත් දහසක් මවා නන් ආයුධ ගෙන ගනිව්! නසව්! පහරව්! යැයි කියමින් පැමිණ නව මහ වැසි වැස් වී. ඉනුදු පලක් නොවූ සේ දුන වජ්රඹ කුසයෙන් ඇතූ පහරවා මහ පුරිසා වෙතට පමුණුවා "සිදුහත පලඟින් නැගී සිටුව"යි කිය. මහ පුරිස්තෙම "මාරය! නො නැගිටිමි"යි කියා ඒ සෙනඟ බලා පිළිපන් අසුරු මෙතැන් සිට බිඳුහු වදරති.

"හාත්පසැ යුධාය සදහා ඉදිරිපත් ව සිටින මාරයා සහිත සේනාව දැක යුධය පිණිස පෙර මුණම ගනිමි. යුධ සජ්ජිත ව මාරයාට මෙසේ කිමි. මාරය තට මා නොසෙල්විය හැකිය. දෙවියන් සහිත ලොකයා යම් මාරසෙනනක් මඩිනු නො හැකි වේද මැටි පාත්‍රයක් ගලකින් පොඩි කරන්නාක් මෙන් ඒ මාර සෙනඟ මැඩ පියෙමි. මාගී භාවනාවෙන් සියලු මිථ්‍යා සංකල්ප දුරුකොට සම්මා සඞ්කප්පයෙහි පැවැත්වීම් වසයෙන් කල්පනා වසඟ කොට කෙන, සායාදී සතර තැන සිහිය මනාව පිහිටුවා ගෙන, බොහෝ ශ්‍රාවකයන් හික්මවමින් රටින් රට හැසිරෙන්නෙමි. මාගේ අවවාද කරන්නා වූද අප්‍රමාද වූ, ගරනා ලද ආත්මාලය ඇති ඔවුහු යම් තැනකට ගොස් නො සොවිත් ද, එබඳු වූ කාම රහිත වූ නිවණට යන්නාහ"

මේ දක්වනලද පධාන සූත්‍රානුසාරයෙන් සිඩාර්ථ කුමාරයන් වහන්සේ නූපන් කුසලයන්ගේ ඉපදීම පිණිස කරණ ලද වීර්‍ය කොතරම්දැයි සිතාගත හැකිය. එසේම නූපන් කුශලධර්මයන්ගෙන් අදහස් කරනු ලබන්නේ වට්ටගාමි කුසල් නොව විවට්ටගාමී කුසලයන් බවද නරයේ සිත්වලට ගතයුතුය. එහෙත් අකුසල ධර්මයන් උපදවාගැනීමට වඩා කාමාවචර වුවද කුසල ධර්මයන් උපදවාගැනීමද, කාමාවචර කුසල ධර්මයන් උපදවාගැනීමට වඩා රූපාවචර කුසල ධර්මයන් උපදවාගැනීමද; රූපාවචර කුසල ධර්ම යන් උපදවාගැනීමට වඩා අරූපාවචර කුසල ධර්මයන් උපදවා ගැනීමද ශ්‍රේෂ්ඨ බැවින්, කාමාවචරාදී කුසල ධර්ම උපදවා ගැනීමට උත්සාහ වැඩීම නරක යැයි තේරුම් ගතයුතු නැත. තම තමන්ගේ ශක්ති පමණින් උසස් උසස් කුසල ධර්මයන් රැස්කර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම දැරීම නුවණැත්තවුන්ගේ යුතු කමයි එහෙත් සම්පූර්ණයෙන් භවයෙන් නිදහස් වනතුරු ජාත්‍යාදී දුඃඛයන්ගෙන් නිදහසක් නොලැබෙන බැවින් මොනයම් පිංයී

සක් නොව හෝ භව නිර්මුක්තිය ම සාධාහතු ප්‍රතුවන නිසා ඒව ශුවකල් වන ශමථ විදර්ශනා. මාර්ගඵල උපදවා ගැනීමෙහිලා අති ලාභ ඇත්තන් විමම මටනෝයි

සෝවාන් ආදි මාර්ග සතරය, ඵල සතරය නිර්වාණය යන මේ නව ලොවුතුරා දහම තම සිතින් සාත් කිරීම් වශයෙන් පමුණුවා ගැනීමට යොග්‍ය වන හෙයින් ඕපනයික නම ද වෙති. රාගාදීන් ගේ අභාව කරණයෙන් තමන් විසින් දතයුතු වන හෙයින් සංදිට්ඨික නමුදු වෙති. මෙකී යන ලද නව ලොවුතුරු දහම් තබා එකම සොතාපත්ති ඵලය උපදවා ගැනීම පවා කොතරම් උසස් වේද යනු පහත සඳහන් ප්‍රවෘත්තියෙන් පැහැදිලි වේ.

සරුසාරවුවද ඇතැම් ගමෙක සල සරුසාර කොවන්තායේ ශ්‍රද්ධාදීන් සරුවූ අනේපිඩු සිටුතුමාට සැදෑ බිඳකුදු නැති කාල නම් එක්සරා පුතෙක් විය. හෙතෙම බුදුන් දකිනු පිණිස වෙහෙරට යනු තබා වැලැත තමන්ගේ ගෙදොරට වැඩියාවූ නමුත් බුදුන් දක්තට හෝ බණ පදයක් ඇසීමට හෝ නොයෙයි: වතාවත් කිරීම ගැන කවර නම් කථාද? සිය පුතු කෙරෙහි කුළුණු බර පියතෙම මේ විරූ ලාමක අදහස් ගෙන සරනා ම පුතු, මාවැනි පියකු සිටියදී මියෑ ගොස් නිරා දුකෙහි වැටෙනු දෙනු නො යෙදේ යැ'යි, සිතා පුතු වෙහෙරට යවන්ට හා පුතු ලවා බණ පදයක් අස්වා ලන්නට උපායක් යෙදීය. දිනෙක පුතු අමතා 'දරුව! පෙහෙව් ගෙනැ වෙහෙරට ගොස් බණ අසා එව, කහවණු සියයක් දෙන්නේ ම වේදැයි නුන්වරක් ගිවිස්වා ගෙන, දන්නා පෙහෙවසක් නැතත් කහවණු කෙරෙහි ඇලුණු ලොබින් පෙහෙව ගෙන බණෙන් කම්කට වන වැඩක් නැතිවද, වෙහෙර බලා ගියේය, වෙහෙරට වැද සිල් සොරුන් විසින් ගෙන යන්නට තරම් සීලයෝ නමන්ට නැතිසේ දන්නා හෙයින් හෝ, පහසු තැනකට වැද ගෙන නිදා හිඳ අලුයම නැගිට ගෙදොර පලා ගියේය. මෑණියෝ ද 'මපුතු' පෙහෙව නොවැ ආයේ යැයි වෙලෙවුව කැඳ ආදිය ගෙනෙතැයි දුස්සන් බණවාලා දෙවූය බඩගින්නටද වඩාලා පුතුට ඇත්තේ කහවණු ගින්න හෙයින් ගෙන ගෙනා කැම් පිම් නොගෙනව කහවණුව ඉල්ලා පෙරළි කෙළේය. පුතු නොවෙනෙන වනු රිසි සිටුතුමා පොරොන්දුව ඉටු කෙළේ යි.

නැවත දිනෙක පුතු බණවාලා 'දරුව, බුදුන් වෙත ගොස් එක බණ පදයක් උගෙණ එව කහවණු දහක් දෙන්නෙමැයි කීය. පෙරටද වඩා දහගුණයකින් වැඩීගිය කහවණු ලොබින් විහාරයට ගොස් බුදුන් වෙත සිට එකම බණ පදයක් උගෙන පලා යනු කැමති වූවද උගන්නා පදය නොසිටීමයි බුදුහු ඉටූහ.

උගත් මුල් පදය නවසේ දහ ඊලඟ පදය වත් සිහිනබා ගනිමියි ඕනෑකමින් අසන්නේ දෙශනා අතරපූර සෝවාන් පෙලෙහි පිහිටි යේය. හෙතෙම පසුදා උදෑසන බුදුපාමොක් බික් සඟන ගමගම සියගෙට ගියේය. පියතෙම එන්නාවූ පුතු දැක අද මගේ පුතුගේ ආකාර හොබනේයැයි සිතුදය. පුතාද, පිය තෙමේ ඉදින් බුදුන් වෙතදී පොරොන්දු තහවණු නොදෙන්නේ නම් මැනව. තහවණු ඉණිස ඊයේ පෙහෙව ගත් නිසා නොකියන්නේ නම් මැනවැයි සිතී.

සිටු තුමා බුදුපාමොක් මහ සඟනට කැඳ පිළිගන්වා ඉක්බිති පුතාටද දෙවීය. පුතුද වෙනදා මෙන් ගාල ගෝට්ටි නොකර සත් සුන්ව කැඳ බී කැවිලි කෑවේය. බුදුන් හා සඟන දන් වළඳ නිම කල තහවනු දනසක් බැඳි පියල්ල පුතුට දී 'මෙන්න පුත' බණ අසා එතුවට පොරොන්දුවූ දහස ගන්නැ!යි කීයේ ය. බුදුන් ඉදිරි යෙහිදී සිදුවීම නිසා මහත්සේ ලජ්ජිතවැ ගොස් තහවණුවෙන් මට කම්නැතැයි ප්‍රතික්‍ෂෙප කෙළේය. ඉක්බිති සිටුතෙමේ බුදුන් වැඳ අද මාගේ පුතුගේ ආකාරය හොබනේ යැ ස්වාමීනියි කීයෙය. බුදුහු කිමද මහසිටුනු යි විචාරණ ලද්දේ සියලු තොරතුරු කියා එවිට බුදුරජාණෝ අද ඔබගේ පුතුහට සක්විති සැපතිනුදු දෙව් ලෝ බඹලෝ සැපතිනුදු සෝවාන් පල සැපයම වඩා උතුමැයි වදරා මේ ගාථාව වදාළ සේක;-

'පඨව්‍යා එකරජ්ජෙන - සග්ගස්ස ගමනෙන වා
සබ්බලොකාධිපච්චෙන - සොතාපත්තිඵලං වරං'

සක්විති රජය ලැබීමටත් සවිසි වැදැරුම් සවර්ගයට උත්පත්ති වශයෙන් යෑමටත්, මුලුලොවට අධිපති වීමටත් වඩා සොතාපත්ති ඵලයට පැමිණීම උතුම් වේ. ඒ එසේමැයි. යට කියන ලද සියලු තැන රාජ්‍යය කොට නමුදු සතර අපායෙන් නොමිදුනෝම වෙයි. සෝවාන් වූයේ පියූ අපාය දොර ඇත්තේ වෙයි. අන්තිම දුර්වල සෝවාන් පුද්ගලයා වුවද අට වන භවයෙක්හි නම් නූපදින්නේ මැයි. කියන ලද්දේය. රුවන් සූත්‍රෙහි:-

සහාවස්ස දස්සන සම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති

සක්කාය දිට්ඨි විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි

චතූහපායෙහි ච විප්පමුත්තො
ඡචාභිඨානානි අභබ්බො කාතුං

## ඉදම්පි සංඝෙ රතනං පණීතං
## එතෙන සචෙචන සුවත්ථි හොතු.

මෙතෙකින් නූපන් කුශල ධර්මයා ඒ නූපන් කුශල ධර්මයන් ගේ ඉපදීමට උත්සාහ වැඩීමේ අගය පෙරුම් ගැනීමට සුදුසු විස්තරයක් කරන ලද්දේය. දැන් නූපන් කුසල ධර්ම ඉපදීම පිණිස ක්‍රියා කළයුතු පරිදි ඉතා සැකෙවින් වුවද සඳහන් කිරීම වට නේය. භවයෙන් මිදෙනු කැමති සැදැහැති කුල පුත්‍රයෙකු වෙතොත් ඔහු විසින් පළමුකොට වස්තුකාම කෙලශ කාමයන්ගේ ආදීනව හා නෙක්ඛම්මයෙහි (කාම කෙලෙස් අතැර පිටමෙහි) ආනිසංස විශෙෂද නොයෙක් අයුරින් කල්පනා කර බලා, භව නිරෝධය (කලකිරීම) ඇතිකොටගෙන, විමුක්ති කාමියකු විසින් සපයා ගත යුතු අධිකුශල ධර්මයන් නිසිසේ රැස්කර ගැනීමට අතිශයින් සම්බාධ වූ, කෙලෙස් රජසුන්ට මහවත්වූ, නා නා දීනවයෙන් ගහණවූ, ගිහිගෙය අතැර දමා, බුදු පසේ බුදු මහ රහතුන් විසින් වර්ණනා කරණ ලද. අධිකුසල ධර්ම පූර්ණයට මහත් අවකාශ ඇති ශාසනික ප්‍රව්‍රජ්‍යාව මහත් ආදරයෙන් ලැබගත යුත්තේය. එසේ ලබාගත් දුලීභ ප්‍රව්‍රජ්‍යා ඇති බුඩ පුත්‍ර තෙම දසධම්ම සූත්‍රයෙහි සඳහන් වන පරිදි "පරපටිබඬා මෙ ජීවිකා, අඤ්ඤො මෙ ආකප්පො කරණීයො" මා දිවි අනුන් පිළිබඳවයැ, අන්‍යවූ ආකල්පයක් මා විසින් කටයුත්තේය. යනාදි වශයෙන් නිතර දෙමෙහි සිහි කෙරෙමින්, ශාසනානුලොම් නො වැ දුරාචාර සම්පන්නව සෙරිචාරී වැ වැඩෙම්වයි මියෙම්වයි කම් කිම? ඇපි සිතුවක්ම කරම්හයි දුප්පටි නිස්සග්ග වැ, සබ්‍රම්සරුන්ට අහිතකාමීවූ නරක නපුරු දුර්දාන්ත ශ්‍රමණ ප්‍රතිරූපකයන් සෙවනය භජනය පරියුපාසනය නො කොට, ආචාරශිලීවූ ගුණ නැණයෙන් වැඩී ගිය පරලෝ බිය දක්නා සුළු ශාන්ත දාන්ත පැවතුම් ඇති අගති විරහිත වූ මැඩිහිරි ශික්ෂාකාමී භික්ෂුවරයන් ආශ්‍රය කරමින් සුනත වූයේ මක්ඛිකාදූහි හොඳින් සලකා බලා නාන පිණිස පොකුණට බැස මඩ හා ගඳ නා මෝඩයන් සේ දුසිරිත් මඩ ඇඟ ගා නො ගෙන, සීලයම සියලු ගුණධර්මයන්ට එකාන්ත ප්‍රතිෂ්ඨාය මූල යැයි සිතා සිල් පිරිය යුත්තේය.

"ඝොාචාදී හො කුසලානං ධම්මානං සීලං ච සුවිසුඩා" 'යි වදාල අයුරු පිරිසිදු සීලයම හැම කුශල ධර්මන්ට ආදි වන හෙයින් පාතිමොක්ඛ සංවර සීලය, ඉන්ද්‍රිය සංවර සීලය. ආජීව ප්‍රත්‍යය සන්නිශ්‍රිත සීලම, පාරිශුඬි සීලය යන සතර වැදෑරුම් පිරිසිදු සිල් පුරන්නේ ඛණ්ඩච්ඡිද්‍රාදි සංකිලෙශයන් ගෙන් දුරුව අඛණ්ඩ අච්ඡිද්‍රාදි භාවයෙන් ගෙන්

සමුපේතව සන්තුට්ඨිතා අප්පිච්ඡතාදි ගුණයන් ලැබ වැඩිදුරත් සීලයේ ·තානන්තිය ගන්වනු සිදහා පංසුකූලිකඞ්ගාදි තෙළෙස් ධුතාඞ්ග ද පිරිය යුත්තේය. මෙසෙයින් සරාසඳ මඬලසේ පූරාසත් පිරිසිදු සිල් කැළුමෙන් චොරජන මහණනුගේ කායද්වාරයෙහි නො විසුරුණු බඩ ඇති කමුදු මනෝද්වාරය එහෙත වැ. චංචලවූ, දූරඞ්ගතවූ, දුන්නිවාරයවූ, අදමිතවූ පවත්නා හෙයින් ඒ චිත්තයාගේද විනයනය සඳහා කටයුතු කළයුත්තේය. කායවාක්ද්වාර දමනයට වඩා චිත්තද්වාර දමනය දුෂ්කර බැවින් ආවාසාදි දසවැදෑරුම් පලිබොධ සිඳදමා කමටහන් (භාවනා)දෙන, ප්‍රිය ගරු, භාවනීය යනාදි ගුණ රැඳි අසහාය කල්‍යාණ මිත්‍රයෙකු වෙත එළඹ, රාගචරියා දොෂචරියා, මොහචරියා, සද්ධාචරියා, බුද්ධිචරියා, විතක්කචරියා යි මෙසේ දක්වන ලද ෂඩ්විධ චරිතයන්ගෙන් තමාගේ චරිතයට ගැලපෙන සතළිස් කමටහන් අතුරෙන් එක්තරා කමටහනක් ගෙන, සමාධි භාවනාවට නුසුදුසු විහාර හැරපියා සුදුසු වෙහෙර වසමින් කුඩා පලිබොධද සිඳලා සියලු බවුන් පිළිවෙළ නොඉකුම් වමින් භාවනා වැඩිය යුතුයි.

එහිලා දස කසිණය, දස අසුභය, දස අනුස්සතිය, සතර බ්‍රහ්ම විහාරය, සතර ආරූප්‍යය, එක් සංඥාය, එක් ව්‍යවස්ථාන යැයි කම්ස්ථාන සතළිස දත යුතුවේ. මොවුන් අතර කායගතා සතිය, ආනාපාන සතිය හැර අටවැදෑරුම් අනුස්සතිද, ආහාරයෙහි පටික්කූල සංඥාවද, චතුධාතු ව්‍යවස්ථානයද යන මේ දසකමටහන්නු උපචාර සමාධිය ගෙනදෙන්නෝ යැයිද සෙසු කමටහන්නු අර්පණා සමාධිය ගෙන දෙන්නෝ යැයිද සැලකිය යුතුය. මේ සතළිස් කමටහන් අතුරෙන් එක්තරා කමටහනක් ගත් යොගාවචරයා විසින් ධ්‍යාන වඩාලිය යුතු. පරිදි අති විස්තාරිත හෙයින් ඒ සියල්ල මෙහි දක්වනු බැරිය.

යට දක්වන ලද දස කසිනාදීන්ගේ වසයෙන් චිත්තවසීය ලබා සමාධි පිරිපුන් කළ යොගාවචරයා විසින් සමාධි භාවනායෙහි ලෞකිකානිසංස පඤ්චාභිඥා හෙයින් එයද ලබාහැනීමට වෙර වැඩිම යෙහෙකි. ඒ අභිඥා සම්පාදනය කිරීම චතුත්ථජ්ඣාන ලාභී යොගියා විසින් ඇරඹිය යුත්තේ වෙයි. අභිඥාලාභයෙන් සමාධිය ස්ථිර සාර වන හෙයිනි. පළමුවෙන් ලබාගතයුත්තේ ඉද්ධිවිධඥානය යි. ඉද්ධිවිධ නම් ඉද්ධි කොට්ඨාශයැ ඉද්ධිවිධ ඥාන ලාභයෙන් එකතුව බොහෝවීම, බොහෝවැ එකකුවීම, සමුදුරේ බිම යන්නාසේ යැම පොළොව සමුදුර කිමිදින්නාසේ කිමිදීම, සඳ හිරු පවා ස්පර්ශ කිරීම යනාදි ඇසු දුටුවන් විස්මය පත් කරවන සුළු සියල්ලක්

කලහැකිය. වශීකෘත චිත්තයාගේ ආශවශීය බලනු මැනව ඉද්ධිවිධ ඥානලාභයෙන් පසු. දිබ්බසෝත යෑ, පරචිත්ත විජානන යෑ, පුබ්බෙනිවාසානුස්සති යෑ, දිබ්බචක්ඛු යෑ යන ඥාණ විශේෂයන්ද පිළිවෙලින් උපදවාගෙන සම්පාදනය කල සමාධිය ඇත්තේ විප-ස්සනා වැඩිය යුත්තීය.

විපස්සනා භාවනා නම් පඤ්ඤා භාවනාය. මෙහි පඤ්ඤා නම් කුශල චිත්තය හා යෙදුණු විදසුන් නුවණයි. විදසුන් නුවණින් සිද්ධ කරන්නේ සියළු සංස්කාරයන්ගේ ඇති සැටිය ඇති සැටියෙන්ම දක්වාලීමය, සංස්කාරයන්ගේ තතු අප දක්නේ ඇති සැටියෙන්ම නොවේ: නැති සැටියෙනි. නැති සැටියෙන් සංස්කාර ධර්මයන් ගන්නාඅපි සංස්කාරයන් විසින් රවටනු ලබන්නෝ වෙමු. වැලි සීනි කොටද ජලය රිදී කොටද සල්කැට රුවන් කොටද පෙන්වන ඉන්ද්‍රජාලිකයාගේ ඉන්ද්‍රජාලම්වලට රැවටෙන බාලයන්සේ අපිදු සංස්කාරයන් ඇති සැටියෙන් නොව නැති සැටියෙන් නගා දක්වා ලන්නාවූ රූපාදිය. සුභ, සුඛ, ආත්ම, වශයෙන් ගෙන එහිම ලොභ කොට අපමණ ජරා ව්‍යාධි මරණාදි සසර දුකටම වැටෙමු. සංස්කාරයන්ගේ තතු නියම හැටියට වටහාගන්නාතුරු සැබවින් සසර ගැලවීමක් නොවන හෙයින් විදසුන් නුවණ ලබා ගැණීම ඉතාමත් අවශ්‍යය.

විපස්සනා භාවනාවට කලින් එහි භූමි ආදිය දතයුතු වේ. ස්කන්ධය, ධාතුය, ඉන්ද්‍රියය, සත්‍යය, පටිච්චසමුප්පාදය යනාදී ධර්මයෝ විපස්සනාභූමි නම් වෙති. සීලවිශුද්ධි චිත්ත විශුද්ධි, යන දෙක විපස්සනාභූමි නම් වෙති. දිට්ඨි විශුද්ධි, කංඛාවිතරණ විශුද්ධි මග්ගාමග්ගඤාණ දස්සන විසුද්ධි, පටිපදා ඤාණ දස්සන විශුද්ධි ඤාණදස්සන විශුද්ධි යන මේ පස විපස්සනා ශරීර නම් වෙති එබැවින් එහි භූමිධර්මයන් උද්ග්‍රහ පරිපෘච්ඡාදි වශයෙන් හොඳට දැන ඉගෙන, මැනවින් නුවණට හොඳුරුකොට ගෙන, විපස්සනා මූලවූ විවිධ විසුද්ධීන් සපයාගෙන, විපස්සනා ශරීරවූ පංච විසුද්ධීන්ද සම්පාදනය කෙරෙමින් විදර්ශනා වැඩිය යුත්තේය,

විපස්සනා භූමි නම්වූ ස්කන්ධාදී කථාද ඉතා විස්තර කටයුත්තෝය. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පස මිස සත්වපුද්ගලාදියක් නො ලැබෙන හැටි හොඳින් ස්කන්ධ කථාව උගැනීමෙන් දතහැකි වේ. ඒ ස්කන්ධ පංචකයම නාම රූප විසින් දෙකට බෙදූ බැලූ කල නාම-රූප ධර්මයන් මිස සත්ව පුද්ගලාදියක් නොලැබෙන බව පෙනීයාමෙන් සත්වසංඥාදිය දුරුව යන්නේය. තවද පංචුපාදානක්ඛන්ධයන් ඔසවාගත් කඩු ඇති

සතුරෙක යනාදීන් දක්නේ ස්කන්ධයන්ගෙන් නොකැමේ රූපාදිය පෙණ පිඩුමෙන් දක්නා තැනැත්තේ අසාරවූ දය සාරයැයි දක්නේ නොවේ. වෙසෙසින් අධ්‍යාත්මික රූප අසුභ වශයෙන් දක්නේ කබලිඞ්කාරාහාර පිරිසිඳ දැනගනී.. අසුභයෙහි සුභය යන වැරදි ගැනීම දුරුකෙරේ. වේදනාව දුක වශයෙන් සලකන්නේ ස්පර්ශාහාරය දැනගෙන දුකෙහි සැපය යන වැරදි ගැනීම දුරුකෙරේ. සඤ්ඤා සංඛාරයන් අනාත්ම වශයෙන් දක්නේ මනෝ සංචේතනාහාරය පිරිසිඳ දැනගනී· අනාත්මයෙහි ආත්මය යන වැරදි ගැනීම දුරු කෙරේ. විඤ්ඤාණය අනිත්‍ය වශයෙන් දක්නේ. විඤ්ඤාණාහාරය පිරිසිඳ දැනගනී අනිත්‍යයෙහි නිත්‍යය යන වැරදි ගැනීම දුරු කෙරේ. එපමණක් නොව යථොක්ත ස්කන්ධයන් තත්වාකාරයෙන් දන්නේ ආශ්‍රව, උපාදාන, ඕඝ, යෝග යන මොවුනු ද නූපදවයි.

ආයතන නම් චක්ෂුරාදි අධ්‍යාත්මික ආයතන සයයැ, රූපාදි බාහිරායතන සයයැ යන දෙළොසයි මේ දෙළොස් ආයතනද අනාගමන, අනිග්ගමන වශයෙන් දක්ක යුතුයි. ඔවුන් පළමු කොතැනකවත් සිට නො ආබවද, නැතිවීමෙන් පසුව කොතැනකටවත් නොයන බවද දැකීම අනාගමන අනිග්ගමන වශයෙන් දැකීම නම් වේ. යටකී සොළොස් ආයතන දැ ධාතු නාමයෙන් ගෙනැ බාහිර අජ්ඣත්තික ධාතු අතරට චක්ඛු විඤ්ඤාණාදී ධාතූනුත් සත්කල අටළොස් ධාතු ලැබේ. ඉන්ද්‍රිය විසි දෙකැයි. සත්‍ය දුක්ඛාදී සතරෙකි. මේවා ගැනද විශේෂ විභාග දැන ඉගෙන යථා ස්වභාවය මෙනෙහි කිරීමෙන් විපස්සනා ලැබේ. මේ අයුරින් යට දැක්වූ සප්ත විශුද්ධින් ද බවාලා සොවාන් ආදි මගපල ලිපිවෙළින් නිවනද ලැබිය යුතුවන්නේය.

මෙතෙකින් තෙවන සම්මප්පධානය ගැන අප විසින් ඉතා සැකෙවින් පවත්වන ලද දේශනාව සමාප්ත කරනු ලැබේ ධර්ම දේශනාවට ආරාධනා කිරීම ගැන අප හිතවත් ගරු මොරමුවේ සිරි සාසනවංස ස්වාමිපාදයන් වහන්සේට පින් දෙමින් මේ පින්වත් පිරිස විසින්ද නූපන් කුසල ධර්ම ඉපදීම පිණිස වෑයම්කොට අජරාමර නිවන් සුව සිද්ධකර ගැනීමට කල්පනා කටයුතු බව දන්වමි.

**නිබ්බාණ පච්චයො හොතු !**

**නමො තස්ස සම්මා සම්බුද්ධස්ස**

**මහගාලේ පුෂ්පාරාමාධිපති මොරටුවෙ සිරි සාසන වංස මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ විසින් පවත් වන ලද ධර්ම දේශනාව**

---

## සතරවන සම්මප්පධානය

**උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මො-සාය භියෝ භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. කථඤ්ච භික්ඛු උප්පන්නානං කුසලානං-පෙ- චිත්තං පග්ගණ්හාති පදහති? තත්ථ කතමෙ උප්පන්නා කුසලාධම්මා, තිණි කුසලමූලානි, අලොභො අදොසො අමොහො තං සම්පයුත්තො වෙදනාක්ඛන්ධො සඤ්ඤාක්ඛන්ධො සඞ්ඛාරක්ඛන්ධො විඤ්ඤාණක්ඛන්ධො තං සමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං ඉමෙ වුච්චන්ති උප්පන්නා කුසලා ධම්මා ඉති ඉමෙසං උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භියෝ භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති.**

නැනවතුනි,

බෝධිපාක්ෂික ධර්ම සතිසෙහි ප්‍රථම ධර්ම දෙළස මහගාලෙ පුෂ්පාරාමයෙහිදී දෙසනා කරවා දේශකයන්වහන්සේලා වෙතින්ම එසේ ලියවා පොත්කොට විශුරුවා උසස් සාසන සංග්‍රහයක් කරන්ට අදහස්කළ කෘතගුණ සම්පූර්ණ සිරි අරියවංස ගුණානුස්මරණ සමිතිය සතර වැනි සම්මප්පධානය' මාතෘකා කොට කරන්ට නියමිත දේශනාවද අප වෙත ආරාධනා කර තිබේ,

එය ඉටුකරණු වස් අරඹන මේ අවස්ථාවේදී මේ පින්වත් පිරිසට උසස් කරුණාවකින් කළ යුතු අවවාදයක් ' වෙසෙසින් සිහිපත් කරවමු. ඉන් ඇතිවිය යුතු ප්‍රයෝජනය නම් කුමක්ද ධර්ම ශ්‍රවණයෙහිද ධර්මය උගෙණීමෙහිද ධර්මය අනුව පිළිපැදීමෙහිද ආසාව දියුණුතර ලීමයි. ධර්මය පිළිබඳ ඉටුවිය යුතු මේ කාරණ ත්‍රයම අද බෞද්ධ ජනතාව වෙතින් නොසිදු වේ. අද බහුතර සංඛ්‍යාවකටම ධර්මඥානය දියුණුකර ගැණීමෙන් වැඩක් නැතය

යන හැඟීම පහළවී තිබේ. ඊට කරුණු පරීක්ෂා කිරීමේදී ලැබෙන පිළිතුරු බොහෝයි. අගී සූත්‍රය එම ගිස්බස් වලින් වැඩක් නම් නැත. එබැවින් ම එම බස දුරින්ම දුරලිය යුතුයි. දුර්මත වලින් පිරුණු එබන්දන් අනාගතයේදී නිතුල වන බව දුටු බුදුරදුනෝ දුරාතිදූර කරුණු වලින් මෙකරුණ මූලස්ථානයෙහි ලා දෙශනා කර තිබේ. හේ මෙසේයි:-

දිනක් බුදුපියාණෝ භික්ෂූන් වහන්සේ අමතා මහණෙනි! මේ ලොකයෙහි එකිනෙකට ලංකළ නොහැකි. අතිශයින්ම දුරව පවතින සතර කරුණක් ඇත. එය අහසද අහසට පොළොවද බොහෝ දුරය. බොහොමත් දුරය! මේ පළමුවැන්නය. මහා සමුද්‍රයෙහි දෙගොඩ එකකට එකක් බොහෝ දුරය. බොහෝම දුරය! මේ දෙවැන්නය. ඉර නගින දිසාවට බසින දිසාව එලෙසම දුරාති දූරයි: මේ තෙවැන්නය. සතර වැනි කරුණ නම්; බුඩාදි මහෝත්තමයන්ගේ සත්තිස් බොධිපාක්ෂික ධර්ම සමුදය, අසජ්ජනයන්ගේ හෙවත් දුර්බුද්ධීන්ගේ දෙසැටක් ප්‍රභෙද ගත මිථ්‍යා ඉගැන්වීම් වලට අතිශයින්ම දූරය, යන කරුණු සතරයි.

පින්වතුනි! මෙකී කරුණුවලින් සතර වන කාරණය ගැන සිතා බලමු. සිසිනුවණ එළවා බලන්නෙකුට බෞද්ධයන්සේ පෙනී සිටමින්, සධර්මය කෙරෙහි ඇති විශ්වාසය පැත්තක තබා අන් දෙවිවරුන් පුදමින් ගුණ ධර්මයන්ගෙන් ඈත්ව බාහිර අන්‍යසූත්‍ර අදහස් වලින් සිත් පුරවාගෙණ ධර්මයට සිත් කන් නොදී වසන ජනතාව දෘෂ්‍යමාන වේ. මෙබන්දන්ගෙන් දිනෙන් දින පැයින් පැය සිදුවන්නේ ධර්මයෙන් දුරස්වීම බැව් සලකා ඉන් සිදුවන ස්වර්ගමොක්ෂ අනතුරු පැහැසින් දැක එබඳු අසජ්ජන සංසර්ගයෙන් තුරන්ව ධර්මය කෙරෙහි තුන්දොරම මෙහෙයා බලවත් ශ්‍රද්ධාවෙන් සදහම් අසා දැන පිළිපැද නිත්‍ය සුන්දර පරම රමණීය නිවන් සිරි සාධා ගන්නා ලෙස සිහිපත් කරවමු,

මීළඟට අපි මාතෘකා වසයෙන් ප්‍රකාශකළ විභඞ්ග ප්‍රකරණාගත සූත්‍රාන්ත භාජනියෙහි ආ දෙශනා පාඨයෙහි අදහස පවසමු.

සතර සම්‍යක් ප්‍රධානයන් අතුරෙන් සතරවන සම්‍යක් ප්‍රධානය කවරේද? උපන්නාවූ කුශල ධර්මයන්ගේ සචිරව පැවැත්ම පිණිසත් මුලානොනාවී රැකගැන්ම පිණිසත්, බොහෝ කොට වඩාගැණීම පිණිසත්, විපුලත්වයට පමුණුවාගැණීම පිණිසත්, භාවනා වසයෙන් වඩා පරිපූර්ණ කරගැණීම පිණිසත්, කැමැත්ත උපදවාද, වෑයම් කෙරේද වීර්‍ය්‍ය වඩාද, දැඩිකොට සිතට ගණීද, ප්‍රධාන වීර්‍ය්‍ය කෙරේද, එය සතරවන සම්‍යක් ප්‍රධානයයි.

කෙසේ නම් භික්ෂුව විසින් (යෝගියෙක් විසින්) උපන්නාවූ කුසල ධර්මයන්ගේ ස්ථිතිය පිණිසත් නො මුලාබව පිණිසත් බොහෝ කරගැණිම පිණිසත් විපුලත්වයට පමුණුවාගැණිම පිණිසත් භාවනා වශයෙන් වඩා සම්පූර්ණ කරගැණිම පිණිසත්, කැමැත්ත උපදවාද වෑයම් කෙරේද, වෙරවඩාද, දුඃඛිසිත ගනීද, ප්‍රධන් වියර්‍ය කෙරේද? (මෙය ප්‍රශ්නයක්ලෙස අසා ඉන් මුල් භාගය ගෙන මෙසේ අසත්) එහි උපන් කුසල ධර්ම නම් කවරේද?' කුසල් මුල් තුනක්ය, එනම්-අලොභ කුසල් මූලය, අද්වෙෂ කුසල් මූලය, අමොහ කුසල් මූලය යනුවෙනි. එම කුසල් මුල් තුන සමග මොනවට යෙදුන වේදනාස්කන්ධය, සංඥස්කන්ධය, සංස්කාරස්කන්ධය, විඥාණස්කන්ධය යන ස්කන්ධ සතරද, ඒ කඳු සතරින් පැන නැගුණ කායකර්මය, වාක්කර්මය, මනොකර්මය, යන කර්ම තුනද, මෙකී ධර්ම දශය උපන් කුසල ධර්මයයි. දක්වත්. මෙකී දශප්‍රකාර උපන් කුසල ධර්මයන්ගේ ස්ථිතියත් නොමුලා බවත් බොහෝ බවත් විපුල බවත්, භාවනා වශයෙන් පරිපූර්ණියත් සඳහා ඡන්දය, වෑයම වියර්‍යාරම්භය, දුඃඛි සිතගේ ගැන්ම! ප්‍රධන් වෙර උපදවාද එය සතරවන සම්‍යක් ප්‍රධානයයි සංක්ෂෙපයෙන් දතයුතුයි.

මීට ප්‍රථම ප්‍රධන් වියර්‍ය තුනක්ම විස්තර සහිතව දෙශනා කර තිබෙන බැවින් මුලින් විස්තර කරණ ලද සමාකාර ඉන් බලා දතයුතුයි. අපට අයත් වචනවලට පමණක් අදහස් පවසමු. උප්පන්නානංති නිබ්බත්තානං උපන්නානං කිවේ හටගත් නිප දුන (කුසල්ය) යන අදහස යි. කුසලානං ධම්මානංති කොසල්ල සම්භූතානං ධම්මානං, කෞශල්‍ය සම්භූතවූ ධර්මයන්ගේ හෙවත් ඉතා දක්ෂ අඥමින් හටගත් ධර්මයන්ගේ යයි හැඳින්වීමට එසේ කියන ලදී. පුහුදුන් සිතෙහි උපදින්නේ අකුසල්ම බැවින් එම අකුසල් සලමින් කම්පා කරමින් උපදින බැවින් කුසල යන්නෙන් දක්ෂ භාවය සහ අර්ථය ගෙණ දේ.

ඨිතියාති, ඨිතත්ථාය, ඨිතියා යන්නෙන්, ස්ථිතිය, ස්ථිරව පැවැත්ම, සහවුරු භාවය, දක්වයි. අසම්මොසායාති, අනස්සනත්ථං යි කී හෙයින් (කුසලයන්ගේ) නොනැසීම විනාශ නොවී පැවැත්ම දක්වයි. භීයො භාවායාති පුනප්පුන භාවාය යනුවෙන් නැවත නැවත වීම හෝ වැඩිවීම කියයි. වෙපුල්ලායා'ති විපුල භාවාය- වෙපුල්ලාය යන්නෙන්, විශාල භාවය, පැතිර පවත්නා භාවය දක්වයි. භාවනායාති වඩ්ඪියා, භාවනාය යන්නෙන් වැඩීම, බෝවීම, අවබොධ කරයි. පාරිපූරියාති පරිපූරණත්ථාය

සතුමෙන් පරිපූර්ණත්වය, අධිකතැන් නොමැති බව සඳහන්මයි. ඡන්දං ජනෙති; ආදී පදයන්ගේ විස්තර මූලින් පලවී තිබෙන අයුරින් බලාගත යුතුයි.

## මේ උද්දෙශ වාරයයි.

### මෙතැන් සිට නිර්දෙශ වාරයට බැස ගතානි පමණින් විස්තර කරමු.

---

උප්පන්නානං කුසලානං ධම්මානං,, මේ පදයන මූලින් ගතිමු මෙයි උප්පන්නානං කිංවේ සිතෙහි නිපදුන, හටගත්ත බවය. ධම්මානං, කිංවේ සවභාවයය, එස්තොම බැලුවිට අකිලෙස්මෙන්නේ සිතෙහි නිපදුන කුසල සවභාවය යනු වෙනුයි. ඉදින් මෙහි වැඩි දුර තේරුන් කරගත යුතු වචනය කුසල යන්නයි. හේ මෙසේ දැනගත යුතුයි,

කුසලං භූමි භෙදතො චතුබ්බිධං කාමාවචරං රූපාවචරං. අරූපාවචරං ලොකුත්තරඤ්ච කුසල යන මෙ පදය, භූමි වශයෙන් බෙදන තැන සතරකට බෙදේ. එනම්- කාමාවචර කුසල භූමිය රූපාවචර කුසල භූමිය, අරූපාවචර කුසල භූමිය ලොකොත්තර කුසල භූමිය යනුවෙනි.

තත්ථ කාමාවචරං සොමනස්සුපෙක්ඛා ඤාණසංඛාර භෙදතො අට්ඨවිධං- එහි කාමාවචර කුශල භූමිය, සොමනස්ස සහගත උපෙක්ඛා සහගත ඤාණසම්පයුත්ත ඤාණවිප්පයුත්ත අසංඛාරික, සසංඛාරික භෙදවශයෙන් සිත් අටකට වෙන්ව පවතී.

හේ මෙසේයි-

සොම්නස සමග හැවසුන නුවන මනාසේ යෙදුන අනිකෙකු ගේ උනන්දුකරවීම් වලින් තොරවූ කුසල් සිතෙක. 1

සොම්නස, සමග යෙදුන මනාසේ නුවන හැවසුන අන්‍යයන් ගේ මෙහෙයීම්වලින් උනන්දුවූ කුසල් සිතෙක. 2

සොම්නස සමග හැවසුන නුවනින් තුරන්ව යෙදුන අනිකෙකු ගේ උනන්දු කරවීම් වලින් තොරවූ කුසල් සිතෙක 3

සොම්නස සමග හැවසුන නුවනින් තුරන්ව යෙදුන අන්‍ය මෙහෙයීම්වලින් උනන්දුවූ කුසල් සිතෙක 4

මැදහත් බව සමග යෙදුන නුවනින් හැවසුන අනික් මෙහෙයීම්වලින් තුරන්වූ කුසල් සිතෙක 5

මැදහත් බව සමඟ යෙදුන නුවණින් ගැවසුන අන්‍ය මෙහෙයීම් වලින් උනන්දුවූ කුසල් සිතෙක. 6

මැදහත් බව සමඟ යෙදුන නුවණින් නොගැවසුන අන්‍ය මෙහෙයීම්වලින් තුරන්වූ කුසල් සිතෙක 7

මැදහත් බව සමඟ යෙදුන නුවණින් නො ගැවසුන අන්‍ය මෙහෙයීම් වලින් උනන්දුවූ කුසල් සිතෙක 8

මෙසේ කාමාවචර කුසල භූමිය සිත් අටකට බෙදී පවතීත් මේ අට වැදෑරුම් කුසල් සිත් උපදින ආකාරය මෙසේ සැලකිය යුතුයි

1 යම්කිසි පින්වතෙකුට දන්දීමට සුදුසු ආහාර පාන වස්ත්‍රාදී යමක් ඇතිකල්හි හෝ සිල්වත් ගුණවත් උතුමෝ මුහුණගැසීමෙන් හෝ මඞ්ගලාදී අන්කිසි සතුටු අවස්ථාවක් එළඹ සිටි කල්හි හෝ සිත අතිශයින්ම සතුටට පමුණුවාගෙණ ලොභ ද්වෙෂ මෝහ යන අකුසල් දුරලමින් අභිඩිත්‍යානංකී දුන්නොත් එහි යහපත් විපාක යන් ඒකාන්තයෙන්ම ලැබෙනවායයි සම්‍යක් දෘෂ්ටිම්වලින් යුක්තව කම්මඵල අදහා සිත සාධාගෙණ අන් කෙනෙකුගේ මෙහෙයීමෙක් නොමැතිව සිය අදහස් අනුවම පින්කරයිද, එම පින්කමෙන් ඔහුතුල ඇතිවන කුසල් සිත පළමුවන කාමාවචර කුසල් සිතයි. ඊට සොම්නස්සහගත ඥාණ සම්ප්‍රයුක්ත අසංස්කාරික කුසල් සිත යයි නම වේ.

2 යම්විටෙක මුලින් කී පරිදි අනුපහටුව නුවණින් යෙදී සම්‍යක් දෘෂ්ටිම්වලින්ද සම්පූර්ණව සිටද දන්දීම් ආදියෙහි පමාවනුයේ ස්වකීය සිතින්ම නැගුණ අදහස් වලින් කරුණු ගන්වා හෝ අන්කිසි කල්‍යාණ මිත්‍රයෙක් විසින් දෙන ලද අවවාදයක් පිළිගනිමින් හෝ පින්කෙරේද? එම පින්කමෙන් ඔහු තුළ දෙවෙනි සිත පහළවේ. ඊට සොම්නස්සහගත ඥාණ සම්ප්‍රයුක්ත සසංස්කාරික කුසල් සිත යයි; නම වේ.

මෙහි සසංස්කාරික සිත පිළිබඳව කිවයුත්තක් තිබේ.

එනම් ඉමස්මිං අත්ථෙ සසංඛාරෙනාති අත්තනො වා පරෙසං වා වසෙන පවත්තස්ස පුබ්බ පයොගස්සාධිවචනං යනුයි. ඉන් දක්වන්නේ සසංඛාරික භාවය, තමන්ගේම සිතිනුත් අනුන්ගේ උනන්දු කරවීමෙනුත් සිදුවිය හැකි බවයි. කුසල් සිතඇතිවීමට යොදන පූර්ව ප්‍රයෝගයට (කුසල්සිත නගා සිටුවීමට) කිවහැකි විශිෂ්ට වචනය නම් සසංඛාරික යන්නයි.

3 යම් කලෙක බාලදරුවෙක් මව්පිය නෑ හිතමිතුරන්ගේ ක්‍රියාවන් දකිමින් හවගත් පුරුද්දෙන් භික්ෂූන් වහන්සේලා දැක සොම්නස්ව කිසිත් මෙහෙයීමක් නොමැතිව සිය කැමැත්තෙන්

තමාගේ අත තිබුන කිසිවක් දෙත්ද නැතිනම් සාධු සාධු කියා වඳිත්ද එකල්හි එම ළදරුවා තුල හටගන්නේ තුන්වන කුසල් සිතය, ඒව සොම්නස්සසහගත ඤාණවිප්පයුත්ත අසංස්කාරික කුසල් සිතයයි නම් වේ.

4 යම් විටෙක එම ළදරුවාට භික්ෂූන් වහන්සේ පෙන්වා, මව්පියාදී කිසිවෙක් පුත්‍රය නුඹේ අතේ තිබෙන දෑය දෙන්න-වඳින්න- සාධුකියන්නයයි කියා කරවාද, එවිට එම ළදරුවා තුළ උපදින්නේ සතරවැනි සිතය. ඊට සොම්නස්සසහගත ඤාණවිප්පයුත්ත සසංස්කාරික කුසල් සිත යයි නම් වේ.

5 යම් විටෙක පින්වතෙකුට පිදියයුතු ආහාරපාන වස්ත්‍ර යනාදියක් නොලැබ ප්‍රතිග්‍රාහකයන් වහන්සේලාද නොලැබ වෙන අන්කිසි සොම්නසට හේතුවක්ද සිදුනොවී දුන්දෙයෙහි විපාක නොවැලැක්වී ලැබේයයි සම්‍යක් දෘෂ්ටියෙහිණ සියකැමැත්ත උපන් සේම කුසල් කෙරේද ඒ කුසල් සිත පස්වැන්නයි. ඊට උපෙක්ෂා සහගත ඤාණසම්ප්‍රයුක්ත අසංස්කාරික සිතයයි නම් වේ.

6 යම් විටක පිනැතියෙකුට පූජා කිරීමට අවශ්‍ය දෑ නොලැබ ප්‍රතිග්‍රාහක සම්පත්තියද නොලැබීමෙන් අන්කිසිවෙකුතුදු සොම්නසක් නොවුපදීම කර්මඵල ඇදහීම සවිරලෙස පවත්නා අතරම තමන් තුලම උපන් සම්‍යක්කල්පනා වලින් උනන්දුවී හෝ අනුන්ගේ ඔවදන් ලැබීමෙන් උනන්දුවී හෝ කුසල් වඩයිද එකල්හි ඔහු තුළ සයවෙනි කුසල් සිත පහළ වේ ඊට උපෙක්ෂා සහගත ඤාණ සම්ප්‍රයුක්ත සසංස්කාරික සිතයයි නම් වේ.

7. යම්විටක මව්පිය නෑ මිතුරන්ගේ වතාවත් දැක පුරුද්ද ඇතිවී ළදරුවෙක් භික්ෂූන් වහන්සේලා දැක සොම්නස් නූපදීම කිසිත් අත්මෙහෙයීමක් නොලබා කැමැත්තපරිද්දෙන් අත තිබුන යමක්දේද, සාධු කියා හෝ වඳිත්ද, එකල එම දරුවාතුල සත්වෙනි සිතඋපදියි. ඊට, උපෙක්ෂාසහගත ඤාණ විප්පයුත්ත අසංස්කාරික කුසල් සිතයයි නම්වේ.

8. යම් විටක මව්පියාදීන්ගේ වතාවත් දැකීමෙන් හටගත් පුරුද්ද ඇති කල්හි භික්ෂූන් වහන්සේලා දැකද, සොම්නසක් නොමැතිවම සිටිනාතර, අත තිබුන යමක් දැක මව් පියාදි කෙනෙක් දරුව මෙය භික්ෂූන්වහන්සේට දෙන්න සාධුකියා වඳින්න යයි උනන්දු කරවීම නිසා එසේමදේද වදීද එවෙලෙහි උපදින්නේ අටවන කුසල් සිතය. ඊට උපෙක්ෂාසහගත ඤාණවිප්පයුත්ත සසංස්කාරික කුසල් සිතයයි නම්වේ

මේලසින් මෙම කාමාවචර කුසල් සිත් අටත් එම්සිත් උපදින ආකාරත් දැන හැඳින සැම පින්වතුන් ම කුසල් වඩා ගත යුතුයි මේ අපින් තුරත්ව සිදුවන කුසල් වලින් ත්‍රිහේතුකව උපතක් නොසිදුවන බැවින්ද ත්‍රිහේතුකව නූපන් හොත් නැවත භවයෙහි පින් වඩා ගැණීමට නො හැකිවන බැවින්ද එසේ පින්වැඩී නොයෑමෙන් අග්මුල් නොමැති සසරින් හොඹයෑමක් නොලැබෙන බවද සලකා සංසාරදුකින් මිදීමට පූර්ව භාග පුණ්‍ය ක්‍රියාවන් බැව් සලකා කුසල් සිත් අටට ඇතුලත්ව පින් සිදුකර ගත යුතුයි.

මීලගට කුසලය භූමි වශයෙන් වෙන්කරපු දෙවෙනි රූපාවචර කුසල භූමියද පිළිබඳව විසඳා බලමු.

රූපාවචරං පන ඣානඞ්ගයොග භෙදතො පඤ්චවිධං හොති. රූපාවචර කුසල භූමිය ධ්‍යානාඞ්ගයොග භෙද වශයෙන් පස් ආකාරයකට බිඳී පවතිත්.

ඒ මෙසේයි. විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා (සමාධි) සහිත පළමු වැනි සිතය.

විචාර ප්‍රීතිසුඛ ඒකාග්‍රතා සහිත දෙවැනි සිතය
ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත තෙවැනි සිතය
සුඛ ඒකාග්‍රතා සහිත සිවුවැනි සිතය
උපෙක්ෂා ඒකාග්‍රතා සහිත පස්වැනි සිතය

යනුවෙන් රූපාවචර කුසල් සිත්පස දතයුතු අනතුරුව කුසලය බෙදු තුන් වන අරූපාවචර කුශල භූමිය පවසමු. අරූපාවචරං චතුන්නං ආරුප්පානං යොගවසෙන චතුබ්බිධං

අරූපාවචර කුසලභූමිය අරූපාවචර බඹලෝ තලයන්හී යෙදීම් වශයෙන් සතරකට බෙදේ, ඒ නම් වසයෙන් මෙසේයි.

ආකාසානඤ්චායතනය සමග යෙදුන පළමුවන සිතය
විඤ්ඤාණඤ්චායතනය සමග යෙදුන දෙවන සිතය
ආකිඤ්චඤ්ඤායතනය සමග යෙදුන තෙවන සිතය
නෙවසඤ්ඤානාසඤ්ඤායතනය සමග යෙදුන සතරවන

සිතය කියායි: අනතුරුව කුසලය භූමිවශයෙන් කීතැන සතර වෙනි භූමියවූ ලොකොත්තර කුසල භූමිය පිළිබඳව කියමු.

ලොකුත්තරං චතුමග්ග සම්පයොගතො චතුබ්බිධං ලොකෝත්තර කුසල භූමිය සතර මාර්ග සමග යෙදුනු සිත් වශයෙන් සතරාකාරවෙත්. ඒ මෙසේයි,

සෝවාන් මාර්ගය සමග යෙදෙන කුසල් සිතය,
සකෘදාගාමි මාර්ගය සමග යෙදෙන කුසල් සිතය,
අනාගාමි මාර්ගය සමග යෙදෙන කුසල් සිතය,
අර්හත් මාර්ගය සමග යෙදෙන කුශල් සිතය යනුවෙනි.

මේ අයුරින් කාමාවචර අටෙක. රූපාවචර පසෙක. අරූපාවචරසතරෙක. ලොකොත්තර සතරෙකැයි භූමි වසයෙන් සත රකට බෙදූ කුශලය. විසිඑක් ආකාරයකින් විද්‍යමාන වේ.

මෙලෙසින් මතු මත්තෙහි සතර තැනක හටගක් විසිඑකක් අතුපතරින් සැදුම් ලත් ලෞකික ලොකොත්තර අමෘත ඵල ලබාදෙන කප්රුකකට සමකල හැකි කුසල් වෘක්‍ෂයට මුල් තුනක්ද විද්‍යමානවේ. එනම්= අලොභ කුසල් මූලය අද්වෙෂ කුසල් මූලය අමෝහ කුසල් මූලය යනුවෙනි. ඒ කුසල් මුල් සමගම යෙදුන එම කැතිත්ම පැන නැගුණ ස්කන්ධ සතරකි.

එනම්- වෙදනාස්කන්ධය සංඥාස්කන්ධය සංස්කාරස්කන්ධය විඥානස්කන්ධය යන සතර කඳුයි· එම ස්කන්ධයන් පොෂණය කරණකර්මද තුනකි එනම්= කායකර්මය, වාක්කර්මය, මනොකර්මය යන තුනයි. මේ සියල්ල පිඩුකොට ගත්විට උපසම්පාදනං කුසලානං ධම්මානං කී වචනවලින් තේරුන් කරදුන් අර්ථය සලකා ගත හැකි වේ. තවද මෙය දුරවබොධයයි හැගෙන බැවින් උපමා උපමෙය සංසන්දනයකින් වටහාදීමට අදහස් කරමු.

සේ මෙසේයි.

කුසලය, ප්‍රභෙද කල භූමි සතර, පොළොව මෙන්ද! රූපස්කන්ධය සාරහාරව වැඩීගිය ප්‍රිය උපදවන ගසක කාඬර කදමෙන්ද වෙදනාස්කන්ධය, වෘක්‍ෂයේ, සොරස (ලාටු) මෙන්ද! සංඥාස්කන්ධය ඵලය මෙන්ද! සංස්කාරස්කන්ධය, අරටුව මෙන්ද, විඥානස්කන්ධය වෘක්‍ෂයේ පොතු, සිවි, සොරස, එල, අරටු, තරකරමින් හරි මැද පවතින ඉරිබඩය මෙන්ද, අලොභ, අද්වෙස, අමෝහ නමැති මහා කුසල් තුන, වෘක්‍ෂය රඳා සිටීමට පොළොව සිහාරා තුන්පැත්තට ඇදගත් මහමුල් තුනක් මෙන්ද සෙසු කුසලයන් සිහින් මුල් රැස මෙන්ද, කායකර්ම, වාක්කර්ම, මනොකර්ම පෝර, ජලය, පෑවුම් රශ්මාදිය මෙන්ද: කාමාවචර කුශල් සිත් අට ස්කන්ධ පසින් සැදුන රුක්කදෙහි හටගත් මුල් අතුපෙල මෙන්ද, සත් වැදෑරුම් සුගති භවයන්හි ඉපිද කාමසම්පත් රස විදගැනීම (සදිව්‍යලොකය හා මිනිස් ලොව) මුලින් ඇදීගිය සාඛාවන්හි හට ගත් පැසුනු ඵල රස විඳීම වෙද්ද! රූපාවචර කුසල් සිත් පස, සවැනි කදෙහි ඊමත්තෙහි හටගත් දෙවෙනි අතුපෙල මෙන්ද:

දහසයක් බඹලෙ තලවල ඉපිද බ්‍රහ්ම සම්පත් රසවිඳීම එම අතු පසෙහි හටගත් ඵලරසවිඳීම මෙන්ද අරූපාවචර කුසල් සිත් සතර ඊමත්තෙහි සතර දිග්හි පැතිර හටගත් සිත්සාළු අතුසතරක් මෙන්ද අරූපාවචර බඹලෝ සතරෙහි විවේක සැපමෙන් කල් යැවීම එම අතු සතරෙහි හටගත් සුමිහිරි ඵල රසවිඳීම මෙන්ද ලෝකෝත්තර කුසල් සිත් සතර රුක මුදුනෙහි බෙදීගිය සතර දිග් සිසාරා සැදුම් ගත් අතිශයින් රම්‍ය සාඛාසතරක් මෙන්ද? ලෝකෝත්තර භූමියෙහිදී ලබන නිරාමිස සැපය එම අතු සතරෙහි හටගත් අමෘත මය ඵල රසයක් විඳීම මෙන්ද. සිතාගත යුතුයි.

මින් මත්තෙහි පඤ්චස්කන්ධ වෘක්ෂය නොවැඩෙන බැවින් අතුද හට නොගනිත්, ඵලද නොදරත්? එබැවින් කළයුත්තේ මේ පංචස්කන්ධ නැමති රුකදෙස තියුණු නුවනින් මූලසිට බැලීමය හේ මෙසේ කටයුතුයි. සතරවන සම්මප්පධානයෙහිදී උප්පන්නානං කුසලානං ධම්මානං යි තැන කුසල යන පදය භූමි සතරකට බෙදන ලදී. එම භූමියෙහි පිත්බිජුවක් වපුළ කල්හි රූපස්කන්ධය නැමැති රුක් කඳ සැදී වේදනාස්කන්ධය නැමැති සොරසද (ලාටු) සංඥාස්කන්ධය නැමැති ඵලයද සංස්කාර ස්කන්ධ නැමැති අරටුව ද, විඤ්ඤානස්කන්ධය නැමැති ඉරිබඩයද සහිත්වී පංචස්කන්ධ රුක සැදී ඊට

අලෝභ අද්වේෂ අමෝහ නමැති මහමුල්තුනක් සහ සෙසුකුසල් නමැති සිහින් මුල් ගෝනුවක්ද පොළව සිසාරා සැදී පංචස්කන්ධ රුක පෙරලෙන්ම ඉඩ නොදී කායකර්ම නමැති සත්‍ප්‍රායෝද වාක්කර්ම නමැති ජලයද, මනෝකර්ම නමැති පෘථුවි රසයද යථා කාලයන්හිදී ලැබ අතිරම්‍ය අයුරින් කඳ වැඩීගොස් මදක් උස් තැනකින් අටදිග් පුරා අට දිසාවට ඇදීගිය අතු අටක් මෙන් කාමාවචර මහා කුසල් සිත් අට ඇතිවී හටගත් අතු අටෙහි බරවූ ඵල රස විඳීමමෙන්, සදිව්‍යලෝකය මිනිස් ලොව යන සප්තකාම ස්වර්ගයෙහි, ආයු, වර්ණ, සැප බල, නුවණ, යන පස් අනුසස් රස සහ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පංචකාම රස විඳ එහි හරයක් නොමැති බව දැක රුක අවලෝකනය කොට රූපාවචර සිත්පස වැනි මත්තෙහි වැඩුන අතුපස දැක එහි හටගත් ඵලරස වැනි සොළසක් ප්‍රභේදව පවතින බඹතලවල නා නා රස විඳ එහිද සදාකාලිකව ලබන හැකි සැපක් නොමැති බව දැන ඊමත්තෙහි වෘක්ෂය දෙස බලා අරූපාවචර කුසල් සිත් සතර නමැති සතර දික් පුරා සැදුම් ලත් අතු සතර දැක එහි ඵලරස විඳින්නාසේ අරූතලවල විද්‍යමාන විවෙක සුවවිඳ ඉතුදු තෘප්ති යකට නොපැමිණ භවග්ගනම්පි සම්පත්තා පුනාගච්ඡන්ති දුග්ගතිං යනුවෙන් භවාග්‍රය දක්වා සැප විඳගියත් කුසල නාමී අවසානවූ

එසේම නැවත දුගතියට එන බව වදාළ බැවින් අතිසපිර අරූපල වල ලබන විශේෂ සුවයද හැරපියා ඒ මතුයෙහි ඔලනුයේ ලෝකොත්තර කුසල් සිත් සතර නමැති රුක්මුදුනෙහි වෙදීගිය අතිරමණීය අතුශතරදන එහි ඵලරස විඳින්නාගේ ලෝකෝත්තරවූ නිරාමිස සැපය විඳිමින් නිර්වාණ නමැති අමෘත රශාස්වාදනය කර සැනසේද, මෙලෙසින් සංසාර විමුක්තිය ලබාගැණීමෙහි සතුටු සෑම පින්වතුන්ම මෙකී ක්‍රමය ගෙනයෑමට උපන් කුසල් වඩා සථිරව පවත්වා ගත යුතුය. යන සතරවන ප්‍රධන් වීර්‍ය්‍යය වැඩීමට ප්‍රොත්සාහී විය යුතුයි.

සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයන් පිළිබඳව සම්මෝහ විනෝදනීයෙහිදී විනිශ්චයකර වදාරණසේක් ලෞකික ලෝකොත්තර යන දෙ ආකාරය විස්තර කර තිබේ. මෙය සතර සම්‍යක් ප්‍රධානයන් ගැනම කිවයුතු වූවත් දෙසනා තුනකින්ම විස්තරවී ඇතැයි සිතනබැවින් එසේ නොකරමු.

ලෞකික සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයයි සැළකිය යුත්තේ විමුක්තිය ලබනතුරු වීර්‍ය්‍ය යොදා ගමින් ගත් යොගාවචරයා විසින් සතර මාර්ග අවස්ථාවට පැමිණෙනතුරු හෙවත් සමථ විදර්ශනාවන් දක්මා දරණ වෙර වෑයමක් ඇද්ද ඒ සියල්ල ලෞකික ප්‍රධන් වීර්‍ය්‍යයයිද මාර්ගඵලාධිගමයට දරණ ප්‍රධන් වීර්‍ය්‍යය ලෝකොත්තරයයිද පැවසේ. මෙහි මාර්ගාවස්ථාවන් ලෞකිකයයි සම්හර උතුමන් දක්වන්නේ සොවාන් මාර්ගයට පැමිණියහුගේ උනවලී භාවයක් ඇති විනම් සකෘදගාමි මාර්ගය ලබාගැණීමට නොහැකි වන බැවි කියා එහෙයින් සොවාන් මගද පිරිහෙන්ට ඉඩතිබෙන බව අදහස්කළ හෙයිනි එය නොගත යුතුයයි කියන්නේ මාර්ගාවස්ථාව ඵලාවස්ථාවට නොපැමිණ නිරුද්ධවීමක් සිදුනොවන්නේයයි අන් උතුමන් පවසන නිසයි. මෙය සැල්පනාවට ගත් කල මාර්ගාවස්ථාවේද නිරුද්ධවීමක් නොමැති නිසා හෙද ලෝකොත්තරයයි අවබෝධකර ගැණීමයි. මේ ආකාර විසදීම් දැනගැනීම සඳහා ධම්මයෙහි ආ තැනක් ගෙන හැර දක්වමු.

මේ ලෞකික සම්‍යක් ප්‍රධානය තේරුන්ගැනීමට සංයුත්සගියෙහි කාස්සපසංයුත්තකයෙහි ආ විනිශ්චය මැනවැයි සම්මොහ විනොදනියෙහි පැවසේ එනිසා සංයුත්තය මෙසේ දතයුතු.

එක් සමයෙක මහා කාශ්‍යප සාරිපුත්‍ර යන මහ පැනැත්තන් වහන්සේලා දෙනම බරණැස ඉසිපතනාරාමයෙහි විසූහ, දිනක් සැරියුත් මහතෙරපාණෝ මහකසුප් මහතෙරුන් වෙත එළඹ සතුටු

බිස් බැන පැන නැඟුවේ නිවන් පසක් කරණ බණ කථාවකි: එනම්- අනාතාපී අනොත්තාපී අභබ්බො සම්බොධාය අභබ්බො නිබ්බානාය අභබ්බො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය යනුවෙන් මහකසුප් හිමියනි! කෙලෙසුන් මඩින තවන ප්‍රධන් වියසී නැතිව තම තමන් සිත්තුල උපදනා කෙලසුන් පිළිබඳව බියගන්නේ නැතිව කල්යවන්නෙකුට සම්බොධිය (සතර සත්‍යය) ලබාගත නොහැක. නිර්වාණය ලබාගත නොහැක. කාමයොගාදී යොගයන් ක්ෂයකොට ලබන නිරුත්තර අධිගමයකට පැමිණ ගත නොහැක. එසේම එම කෙලෙසුන් තවන ප්‍රධන් වියසීය සහ පාපභීරුක භාවය ඇතියතට නිවන් පසක් කරගත හැකිය. එය ඇසූ මහකසුප් හිමියෝ ඇවැත්නි! සාරිපුත්‍රයෙනි, කෙසේනම මෙම වියසී සහ බිය එලවා තබන්නෙහිද? මහකසුප් හිමිපාණෙනි! (යම් කෙනෙක්) නූපන්නාවූ පවිටු අකුසල ධර්මයන් උපන්නොත් අනර්ථය පිණිස පවතින්නේයයි ප්‍රධන් වියසීයෙන් මැඩපවත්වා ගණීද. සිතතුල බිය උපදවා ගණීද, උපන්නාවූ පවිටු අකුසල ධර්මයන් විනාශ නොකොළොත් අනර්ථය පිණිස පවතීයයි ප්‍රධන් වියසීයෙන් මැඩලයිද සිතට බියගෙණ දුරලාගණීද, නූපන්නාවූ කුශල ධර්මයන් වඩානොගත්තොත් අවැඩ පිණිස පවත්නේයයි වඩාගැණීමට ප්‍රධන් වියසීකරයිද, සිතට බියගෙන එම කුසල් වඩාගණීද,

උපන්නාවූ කුශල ධර්මයෝ වැනසීගියේ විනම් අනර්ථය පිණිස පවත්නේයයි රැකගැණීමට තහවුරු කරගැණීමට ප්‍රධන් වියසී වඩාද, සිතට බියගෙණ රැකගණීද කසුප් මහහිමියෙනි මෙලෙසින් ආතප, ඔත්තප යන ක්‍රම දෙකින් ප්‍රධන් වියසී රැකගැණීමෙන් නිවන් ලබාගත හැකියයි පැවසූ සේක. මෙහි අනාතාපී, අනොත්තාපී යන දෙපදය විසඳගත යුතුයි.

> අනාතාපීති, යං විරියං කිලෙසෙ ආතපති තෙන රහිතො යනුවෙන් යම් ප්‍රධන් වියසීයකින් කෙලෙසුන් තවාද, මඩීද එබඳු ප්‍රධන් වියසීය නැතය, යනු දක්වයි.

අනොත්තාපීති නිබ්භයො කිලෙසුප්පත්තිතොකුසලානුප්පත්තිතොච භයරහිතො, යනුවෙන් නිර්භීය බව හෙවත් කෙලෙසුන් උපදින කල්හිද කුසල් නූපදින කල්හිද ඊට බියවීමක් නොමැති බව දක්වයි: මෙම සූත්‍ර ධර්මයෙන් පෙන්වූ මැයම සහ බිය ලෞකික සම්‍යක් ප්‍රධානයයි. මෙහි ලෞකික කුසලයන් වැඩීමට ගන්න ප්‍රධන් වියසීයෙන් සහ බියෙන්ද යුක්තවීමෙන් නිවන් ප්‍රත්‍යක්ෂකර ගතහැකි වග වදාලසේක්මය.

උප්පන්නානං තෙයෙව පටිබද්ධා, උප්පන්නා සත්වයෙන් අන් අයුරක් දක්වතොත් නූපන් කුසල් උපදවා ගත්විට ඒ කුසල් සමග බැඳී වැඩෙන කුසල් යයි ගත හැකියි. නිරුජ්ඣමානා අනපායා සංවත්තෙයුං ති,, එම කුසල් නිරුද්ධවීමෙන්' අවැඩ පිණිස අනර්ථය පිණිස පවතී. විසඳා කියන කල මුලින් රක්ෂාකල සීල භාවනාදීන්ගෙන් හටගත් කුසල් සිත් ප්‍රමාදවීමේ දෝෂයෙන් පිරිහෙන්ට වන් කල්හි එසේ පිරිහෙන්ට ඉඩනොදී නැවත නැවත වඩානොගත්තොත් අවැඩ පිණිස පවතින බව සලකා උපදවා ගත් කුසල් සමග ප්‍රතිබද්ධව වෙසෙසින් බැඳී ක්‍රියාකරන්නම් එයයි. මේ පරිහානිය සිදුවන ආකාර දක්වූ හෙයින් මෙහි ප්‍රධන් වීර්‍ය්‍ය සියල්ලම ලෞකිකයි. මන්ද ලොකොත්තර ප්‍රධන් වීර්‍ය්‍යයේ පිරිහීමක් නොලබන බැවිනි. එත්තාම උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා" යනාදී ක්‍රමයෙන් සම්‍යක් ප්‍රධාන දේශනාව ආරම්භ කරණ ලදී.

මේ දේශනා ක්‍රමවලින් ලෞකික සම්‍යක් ප්‍රධානය තේරුන් ගතයුත්තේ යම්කිසි යොගාවචරයෙක් සංසාර සාගරයෙන් එතර වීය යුතුයයි සිතා ප්‍රධන් වීර්‍ය්‍ය කිරීමට බැස දන්දීම සිල්රැකීම භාවනාකිරීම් ආදියෙහි පවත් ක්‍රමක්‍රමයෙන් පින්රැස්කරගෙණ ගොස් කම්සථානාදියද ගෙන එහිද යෙදී වෑයමෙන් ප්‍රධන් වීර්‍ය්‍ය කොට සමථ විදර්ශනාවන් දක්වා සිත දියුණු කරණ්ද ඒ දක්වා ඇතිවූ සම්‍යක් ව්‍යායාමයක් ඇද්ද ඒ සියල්ල ලෞකික සම්‍යක් ප්‍රධානයයි, ලොකොත්තර සම්‍යක් ප්‍රධානයයි කියනු ලබන්නේ සෝවාන් සකෘදාගාමී අනාගාමී අර්හත් මාර්ගයන්ට පැමිණීමේදී දරණ සම්‍යක් ව්‍යායාමවලටය: පැමිණද නැගෙන සුළු වීර්‍ය්‍ය සියලු ලෞකිකය, නොනැසී වැඩෙන සියල්ල ලෝකොත්තරයයි. මෙලෙසින් සම්‍යක් ප්‍රධාන පිළිබඳ ලෞකික ලොකොත්තරයයි ප්‍රභේද දෙක අවබෝධ කරගත යුතුයි.

මග්ගො ඵලස්ස පච්චයං දත්වා ච නිරුජ්ඣති යනු වදාළ බැවින් මාර්ගය ඵලයට ප්‍රත්‍ය දීම හෙවත් ආධාරදීම වැනසෙන බැවින් මාර්ගී අවස්ථාවද ලෞකිකයයි කී වචනය පිළිගත නොහැකි වෙත්. මාර්ගයට පූර්වභාගයයි කීවේ. සමථ විදර්ශනා අවස්ථාවට පැමිණෙන තුරුයි සමථ විදර්ශනා බලයෙන් ලබාගත් සියලුම ඉර්ධිබල මහිමාදිය ලෞකික බැවින් විසභාග රූපාදි අරමුණුවල ගැටීම වලින් පිරිහී බ්‍රහ්මචරිය වාසයන්ගෙන් අස්ව් ආර්‍ය්‍ය භූමියෙන්ද තුරන්වී පරම අවාසනාවන් භාවයට පෙරළේ. එබැවින් ප්‍රධන් වීර්‍ය්‍ය ලෝකොත්තර පුර්වයු ලබනතුරු

තහවුරු කරගැනීමට ඨිතියා, අසම්මොසාය, භිය්‍යො භාවාය වෙපුල්ලාය, භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති- යනාදී නය සමුදය එකිනෙකට අල්ලා කිහ. හේ මෙසේයි.

ඨිතියාති ඨාතිති යො අසම්මොසො යො අසම්මොසෙ[3] සො භිය්‍යො භාවො යො භිය්‍යො භාවො තං වෙපුල්ලං යං වෙපුල්ලං සා භාවනා යා භාවනා සා පාරිපූරි-

යනුවෙන් උපන් කුසලධර්ම ස්ථිතිය පිණිස පවත්නාබව කිහුද ඒ මේ ස්ථිතියක් ස්ථිරව පැවැත්මක් වේද? එය අසම්මොස යයි නොමුලාව පවත්වා ගැණීමයි. යම් මුලා නොවන බවක් වේද එය භිය්‍යො භාවයයි. බොහෝ කර වඩාගැණීමයි. යම් බොහෝ කර ගැණීමක් වේද, එය විපුල භාවයයි. යම් විපුල භාවයක් වේද ඕ තොමෝ භාවනාවයි. වැඩීමයි, යම් වැඩීමක් වේද. ඕ තොමෝ පරිපූර්ණභාවයයි මෙලෙසින් පරිපූර්ණත්වයට කැමැත්ත උපදවාද වෑයම් කෙරේද වීර්‍ය්‍යාරම්භ කෙරේද සිත දැඩිව ගණිද ප්‍රධන්වීර්‍ය්‍ය වඩාද එය සම්‍යක් ප්‍රධානයයි මෙහි පධාන යයි කීවේ යම් චෛතසික වීර්‍ය්‍යාරම්භයන් ඇත්නම් ඒ සියල්ලවයි. සම්‍යක් ව්‍යායාමයවයි මෙකී ප්‍රධානයෙන් මොනවට යුක්තනම් සම්පූර්ණයෙන් ගැවසුනීනම් ඊට පදහති යයි කියනු ලැබේ.

ප්‍රථග්ජන ද්වේෂය නිර්වාණය වලක්වාලීමට බොහෝ දුරටම බල පවත්වයි. කොපමණ දුරටදයත් සෝවාන් මාර්ගාවස්ථාවට පැමිණෙන තුරුයි. කොපමණ වීර්‍ය්‍යාදීයෙන් යුක්ත යොගියෙක් වුවද භික්ෂුවක්වුවද සෝවාන් මාර්ගයට පැමිණෙන තුරුම කොපමණ ඉර්ධිබල මහිමයන් පා ඉරහඳයේ බැබලූවත් ඉතාම සුළුක්ෂණයකින් ඇතිවන ද්වේෂයකින් ඒ සියලු බලමහිම බිඳහෙලී අපමණ සසර දුක්විඳීමට සිදුවෙත්.

ඊට කදිම නිදසුනක් දක්වමු. පෙර මෙම ලක්දිව විසූ රහතන් වහන්සේ නමක් ලෞකික ඉර්ධිය ලබාගත් සාමණේර නමක් සමග පිටිසර ප්‍රදෙශයක සිට අනුරාධපුරයෙහි මහාවිහාරය තුල පිහිටි "පියඞ්ගන" පිරුවනට වැඩිසේක. සවස්භාගයෙහි එහි වැඩසිටි සියලු භික්ෂූන් වහන්සේ රුවන්වැලි මහාසෑයට වැඩ වත් සපයා වැඳ නැගීසිට සිය නිවාස ස්ථානයන් කරා වැඩියාට පසු මහජනයාද මේ ආහාරඝන්තාගේ විල්‍යාවය මෙවෙලෙහි සෑමළුව විවේකයැයි දුන ශිෂ්‍ය සාමණේරයන්වද නොදන්වා හුදකලාවම මහ සෑයට පිවිසිසේක. එය දුටු ශිෂ්‍යයන් වහන්සේ මාගේ උපාධ්‍යායයන් වහන්සේ හුදකලාවම අවේලාවේ කොහි යෙත්දැයි සිතා

නොපෙනී පසු පසින් වැඩියේය. ස්ථවිරයන් වහන්සේද, පසුපස එන සාමණේර තැනගේ ගමන සිහිනොකළ බැවින් නොදුනම් වඩිනුයේ දකුණු දොරටුවෙන් මහ සෑමළුවට නැග මහාචෛත්‍යරාජයාදෙස බලා බුද්ධාලම්බන ප්‍රීතිය උපදවාගෙණ චෛත්‍යරාජයා පිළිබඳව ඇති ඉතිහාසගත සියලු කරුණු සලකා අතිශයින් තුටුපහටුව වඩින්ට වන එය දුටු සාමණේරයෝ මාගේ උපාධ්‍යායන් වහන්සේ මහත් භක්ත්‍යාදරයෙන් මහසෑය වඳිත්. යම් හෙයකින් පිදීමට මල්ගොමුවක් ලැබුනොත් වඳින ප්‍රීතියේ ප්‍රමාණය පමණ කළ නොහැකි යයි සිතා උපාධ්‍යායන් වහන්සේ වැතිර වැද නැගී ඉත හිසමින තබාගෙණ මහසෑ ගැබ බලමින් සිටින කලැ කාරා ශබ්දකිරීමෙන් තමා ආබව දැන්විය තෙරණුවෝද හෙරනුන්ද දූන ආ වේලාව් අසා දූන කථාන්තරණාතර සාමණේරයෝ මල් ලැබුනොත් පිදීමට හොඳ නොවෙදැයි ඇසූයේය.

සාමණේරය, මහාසෑයේ තරම් සජීවී ධාතු නිධන්වූ අන්චෛත්‍යරාජයෙක් නොමැති හෙයින් අශාදූස මෙම මහාසෑයට මල්ලැබුනොත්පුද නොසිටින්නේ කවිරුදැයි කීකල්හි මැනවයි පිළිගත් හෙරණතෙම සුළු වේලාවක් ඉවසාවදාරනු මැනවැයි සමුදීධ්‍යාන සමවතනට පැමිණ ඉර්ධියෙන් හිමවතට ගොස් වණී,ගන්ධ සම්පන්න මල්පෙරහනක් පුරා මහතෙරණුවෝ දකුණු දොරටුවේසිට බස්නා හිර දොරටුව තෙක් ගමන්කරන්ට ප්‍රථම ගෙනැවිත් පිළිගැන්වීය. ඒ දුටු තෙරණුවෝ මල් පිකබව කීකල්හි සවාමීනි වැඩ බුදුගුණම සිහිකරමින් පුදනු මැනවැයි හෙරණුන් කී බස්හෙන බුදුගුණ සිහිකරමින් මල් පුදනුයේ ඉහල මාලය වටකරම සිදූ මලින් පිරිගිය කල්හි දෙවෙනි මාලයෙහිද පුදනුයේ එහිද දනක් පමණ උසට පිරී ඉතිරීගියේ පඩිපෙළෙහිද පුදන්ට විය.

එහිද පිරී යට මාලයෙහිත් විසුරුණේ නමුත් නොනිමෙනමල් පෙරහන දූත හෙරණුන්දුට කථාකොට මල් නොනිමෙන නියාව කී කල්හිපෙරහන යටිකුරුව හරවා ශලන්වයයි හෙරනහුගේ බස් අසා, එසේ කොට පෙරහන හෙරනුන්ද අතටදී ඇත් පුවරුව උඩින් (ගජන්මිලුව)මහසෑය තුන්විටක් ප්‍රදක්ෂිණාකොටසතරදිසාවන්හිසිට වැද පියඹගත පිරුවන් බලා වඩිමින් හෙරණුන්දු ගැන සිතනුයේ මේ සාමණේර තැනගේ ලෞකික ඉර්ධිය ඉතා මහත්ය. මොහුට මෙම ඉර්ධිය මෙලෙසින් අවසානය තෙක් ගෙන යාහැකිදැයි බල' නොහැකි බව දිවනැනට වැටහී අනුකම්පා උපදවා කථාකොට සාමණේරය නුඹට මහත් ඉර්ධි බලයක් ඇත,

නමුත් මින්ප්‍රමාදව ක්‍රියාකලොත් පසුකාලයකදී රෙදිවිවීමෙන් ජීවත්වන තනපේසකාරියෙකුගේ අතින් ලබාගත් කෑදක් කා ජීවත්වන්ට සිදුවෙනවා ඇත.

එබැවින් ලදරු සිතට වැටහෙන අයුරින්ම පමාණනොවෙව අමාරස විඳීමට නොපමාව මගපල අවබොධකර ගනුවයි ඔවදන් දුන් හ. එබස ඇසූ හෙරනුන්ද මගේ උපාධ්‍යායයෝ කුමක්නම් මේ කියසිදුයි කීබස් පිළිනොගෙන තමටහත් ආදිනක් ස්යවා ගෙන විනිසි නොවඩා එම ලෞකික ඉර්ධියටම වහල්ව සිටීයේය. මහතෙරණුවෝද මහසෑ වැඳ මහබෝ ආදියද වැඳපුදා සාමණේර යන් ලවා පාසිවුරු ගෙන්වාගෙණ කුටෙලීතිස්ස මහාවිහාරයට වැඩියේය. සාමණේරයෝද පෙරමෙන් උපාධ්‍යායන් වහන්සේගේ පාසිවුරු ගෙන සමග නොවැඩ උපාධ්‍යායයෝ මේ වේලාවට ගම් දුරට වැඩියාවතැයි සිතා අහසින් එතැනට වැඩ පාසිවුරු පිළිගන්වති. මේ ක්‍රියාවට අවවාද දෙන තෙරපාණෝ සාමණේරය පෘථග්ජන ඉර්ධිය සැලෙන වැනසෙන එකකි. අසත්ප්‍රාය රූපාදී අරමුණක් දුටු විගසම බිඳී කැඩී පියාපත් බිදුනු කවුඩෙක් මෙන් වන්නේය, එපමණක්ද නොව නැවත බඹසර වාසයද විනාශ වන්නේය. ආදී වශයෙන් දුන් ඔවාද නොපිළිගෙන කල්යවනුයේ චන්ද්‍රනාගම්තෙහි යෙදුන එම් දෙදෙනා වහන්සේ ක්‍රමයෙන් චෛත්‍ය යන් වැදපුදාගෙණ කම්මපෙඩ නම් වෙහෙරට වැඩ එහි විසූයේය.

නිතර අහස්ගමනෙහි යෙදුන හෙරණුන්දෑගට දිනක් රූපසම්පන්න පෙසකාර තරුණියක් තෙළුම් විලක මල්නෙලමින් ගී කියන්නී ඇගේ නාදය අසා එදෙස බලා රූසපුවට නෙත් සිත් ඇදගියේ උක්පැණි පතෙහිවැටුන කනමැස්සෙකුගේ තටුසිදුන කවුඩෙකුගේ ඉර්ධියෙන් පිරිහී විලෙහිම ඇද නොවැටී ලබාගත් සමවත්වල බලය නිසා ඉඹුල් පුලුන් රොදක් මෙන් විල්තෙරට පාත්වුයේය.

පොළවට වත් නොනෙගිම දුවගොස් උපාධ්‍යායයන් වහන්සේට පාසිවුරු දී නැවතුණේය. මේ කරුණ දුටු උපාධ්‍යායයන් වහන්සේද කිසිවක් නොකී.හ හෙරණද විල්තෙරට වී මල්නෙලන ඈ ගොඩ එනතුරු බලාසිටියේය. පේසකාරියද අහසින් යන්නාවූද බිමට වන්නාවූද, දිවගොස් නැවත එන්නාවූද සිටින්නාවූද හෙරණහුගේ ඉරියව් දැක වහන්ස ඉවතට යනු මැනවයි ඉවත් කොට විලෙන් නැග වස්ත්‍ර හැඳ හෙරණුන්දෑගෙන් කරුණු විමසා තමා පිළිබඳ සිත් ඇළුනු බව දැන ඈ දන්නා පමණින් ගිහිගෙයි ඇති දුක් කම්කටුළු දන්වා ඉන් එලක් නොලත් බැවින් මව්පියන් වෙත පැමිණ මෙපුවත් දන්වා උනුනුත් කැටිව පැමිණ නොයෙක් අයුරින් අවවාද කොටද එලක් නොලැබ අනතුරුවමෙමයේද කිවාහුය.

ස්වාමිනි! අපි ඔබ හා සමාන උසස් කුල ඇත්තවුන් නොවෙමු. අපි පේසකාරයෝය. අපට බැඳීමෙන් පේසකාරකම් කර ජීවිතය දුකසේ රක්ෂා කටයුතු වෙත්යයි කී බස අසා උපාසක වරැති පේසකාර කම්නොව ගිහිවූවිට කුළුපොතු කම් කිරීමට අසතු වක් නම් කොයින්ද මේ බස්වලින් මට වැඩක් නැත. පැමිණෙන දුක් පැණියේ විඳිමි. ලොහොබ නොවී ඇඳගන්ට වස්ත්‍ර කැල්ලක් දෙන්නැයි ඉල්ලීය. (අහෝ ස්ත්‍රී රූපය පුරුෂයෙක් විලන්ගුලන අයුරු පැකසින් බලනු මැනව. බුදුපියාණෝ මේ සඳහා ඉත්ථි රූපං සිකඛමෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති යි වදාළහ) ඉක්බිති කෙරණ හව පෙසකාරයාගේ ඉන බැඳ තුබූ රෙදිකඩදී ගිහිවෙස් ගන්වාගෙණ ගෙට කැඳවා ධීතෘව පාවාදුන්හ. එතැන්සිට ගිහි බැම්මෙන් බැඳී දුබලව පෙහෙකම් උගෙන කම්හලක අන් පෙහෙ කම්කරුවනුත් සමඟ වැඩකරන්නේ, අන් පෙහෙකරු අඹුවෝ කල් යල් ඇතිව පැමිණ සිය සැමියන්ට කැඳ බත් එලවති. මොහුගේ අඹු එසේ නොවඩනී. දිනක් අන් පේසකාරයන් බත් බුදින කල තමාගේ පමා ඔත ගැන සිතමින් කොපිව තසරයට (වකාවට) නුල්වඩමින් සිටිනාකර පමාව ආ අඹුදෙස රවා පමාවූයේ මන්දැයි තර්ජනය කෙළේය.

(මාතුගාමාවනාම අතතපි චවතතිරාජානං අතතනිපපි බඩ චිතතංසුකඩා දුසංවි සසල්ලකෙඛමි සත්‍රීහුනම් සක්විතිරජක් වුවද තමාට වසගවූ බවදූතගත් තැන්සිට තමස්වාමියාට සල කන්නේ දූසයෙක් මෙනි) මෙම උපදෙශය සැබෑකරවන්නාසේ ඈ තමහිමියා හෙලාදකිමින් කියනුයේ අන්ගෙවල සැමියෝ දරපලා ලුනුරස්කොට තබාවැඩෙහියෙදෙත් ඔවුන්ගේ නැයෝද සලකත් මා තනිව ඒසියල්ල රැස්කර ගතයුතුය නුඹගෙයි ඇතිනැති ද සපයන්නෙද තුටුනම් කන්න අයතුටුනම් නොකා ඉවතලන්නැයි වැරෙන් කිවාය වඩාත්කොපවූ සැමියා මෙතෙක් වෙලා බඩගින්නෙන් තැවිදසිට දෙමනුවමාගේ රළුවචන පහරවලින්ද මට තැවෙන්ටවූයේවතැයි නොසන්සුන්ව වළව්ව බලා කටු සැමිටි කස ආදියක් නොලත් හෙයින් අත තුබූ තසර නුල කඩා දමාහැසුමේය. තසරයේ අග මුවහත් බැවින් ඇයගේ ඇසමුල එම හුල ඇනී ලේ ගලන්ටවීය. මදක් හැරී වකාව එලතා, ගන්ට නොහැකිවූ ඇය තසරයේ හුලවත් නැත අතින් වසා දුක්වෙදනාවෙන් තැවෙන්ට වුවාය. මෙය දුටු පුරුෂයා උපාධ්‍යා යයන් වහන්සේ කල් දූතකී කතපේසකාරියෙකුගේ අතින් පිසූ කැඳ බත් බුදින්ට වෙතැයි යන බස සලකා දීඝීදර්ශීවූ ආචාර්‍ය්‍යා යන් වහන්සේලාගේ අවවාද පිළිනොගැන්මෙන් මා පත්වූ විපත

මහතැයි මහ හඬින් හඬන්ට විය. තම්භංලහි සිටි අන් පෙසෙ කරුවෝ ලඟට පැමිණ යහළුව කතාකාවූ නොවෙම් තොප දුන් පහරින් අඹුගේ ඇස කනවිය. ඊට දූත් හඬා නො වැලපෙව ඉන් වැඩෙක්නම් නැතැයි කී වචන අසා සිය මිතුරන්ට මෙපවත් හැලකරණ්ඩුයේ තමන් සිල්රැකී හැටිද ඉර්ධිඑල පෑ හැටිද කියා උපාධ්‍යායයන් වහන්සේගේ බස් නොගෙනවූ වරද නිසා මම හඬ මියි පැවසූහ. මේ නිදර්ශන කථාවෙන් උපන්නාවූ සමථවිදර්ශනාවන් මාර්ගඵලාවස්ථාවට නැගෙනතුරු වීර්‍ය්‍යනොවැඩීමෙන් පිරිහෙන බැව් සලකා මාර්ගඵලාවස්ථාවෙන් මෙපිට ප්‍රධන් වීර්‍ය්‍යබලයෙන් ලබාගත් සියලුම ධ්‍යානයන් පිරිහෙන බැවින් ලෞකිකයයි දතයුතුයි. මීලඟට ලෝකොත්තර සම්‍යක් ප්‍රධානය තේරුන් කරමු- සතරාකාර ප්‍රධන් වීර්‍ය්‍යයම ලෝකොත්තර මාර්ගක්ෂණයෙහිදී |එකක්ම වී පවතීත් ලෝකොත්තර එකම සම්‍යක් ප්‍රධානවීර්‍ය්‍යය ලෞකිකාවස්ථාවන්හිදී සතරාකාරයකින් සම්පාදනය වියයුතු බැවින් සතරක් වශයෙන් ප්‍රකට වෙත්· ඒ සතරාකාරය සොවාන් ආදී මාර්ගාවස්ථාවට එළඹ සිටිකල්හී කෙලෙස් බිඳ හැරීමක් නම් නැත, මාර්ග අවස්ථාවන්ට පැමිණෙන්ට ප්‍රථම සමථ විදර්ශනාඅවස්ථාවන්හිදී කෙ=ලෙස් බිඳ උදුරාලූහ. එනිසා මාර්ගාවස්ථාවෙහිදී නූපන් අකුසල් වැද්දගැණීමටවත් උපන් අකුසල් වදකිරීමටවත් නූපන් කුසල් බැඹීමටවත් උපන් කුසල් තහවුරු කිරීමටවත් අවස්ථාවක් නො ලබයි. මන්ද මාර්ගාවස්ථාවට පැමිණෙනකොට ඒ සියලු කුසල් සහ අකුසල් වනසාලූ බැවිනි. එනිසාම මාර්ගාවස්ථාව ලෝකොත්තර වේ.

තවද මාර්ගාවස්ථාව ප්‍රගිතවත්මත් ඵලාවස්ථාව තහවුරු කර දී බැවින් මාර්ගාවස්ථාව ප්‍රගිතවීමෙන් විමුක්තියට බාධා නොමැති බැවින්ද ලෝකොත්තර වේ. ලෝකොත්තර සම්‍යක් ප්‍රධානයයි කියනකොටසින් සිදුවන ප්‍රධන් වීර්‍ය්‍යනම් නැවත හටගැනීමක් නොවන නොසිඳුවන පරිදි සන්තතිය වනසාලීමයි. එසේ වැන සීමවද ප්‍රධන් වීර්‍ය්‍යයක් අවශ්‍ය බැවින් ඊට ලෝකොත්තර ප්‍රධන් වීර්‍ය්‍යයි නම් වේ.

උපමාවකින් මෙය අවබෝධකර දෙන හැක්කියි. ගේ මෙසේයි ඵල හරිත අඹ රුකක් උපමාවට ගනිමු. එම අඹගස ළඟට පැමිණි අය ඉදුනු අඹ දූන බඩපුරා කඩා කා ඉතුරු කොටස පැසන දූ කෙණයත්. ඊට පසු අනිකෙක් පැමිණ අඹ නැති බැවින් නැවත කන්ට නොතබම්යයි අඹරුක කපා වනසාලයි. මින් තේරුන් ගත

යුත්තේ එම ගස කැපූ අය හටගත් අඹවලටවත් නෑ අඹවල්ලුවවත් ගෙණගිය අඹවලටවත් හානියක් කලාද නැත. අඹගස තිබූ තැනම් අඹ ඉදිරිකාලයේදී පලනන්ට ඉඩ තිබේ. නමුත් නූපන් අඹ විනාශ කලාය කීවාම එයද පිළිගත නොහැක. අඹගස කැපීමෙන් හටගෙන කලින් තිබුනාවූ හෝ හටගෙන කපන්ට ප්‍රථම තිබුනාවූ හෝ හටගන්න තිබෙන්නාවූ හෝ කිසිම අඹ ඵලයකට බාධාවක් විනාසයක් නූනාසේ සන්තතිය වනසාලනු වස් ස්කන්ධපංචකය වනසාලීමෙන් එහිඋපන් කුසලා කුසල කර්මඵල වනසාලිමක්නොකී දුවූ බව සැලකිය යුතුයි.

එසේනම් මාර්ගඵලවලින් වැනසෙක් නම්නැතැයි යමෙකිසි වෙතූව අසන්නට පුළුවන. එසේ අසන්නහුට කිව යුත්තේ ඵල නැවත දුරිමට ඉඩ නොතබා ගස සිඳලූවා සේ කුසලා කුසලයන් නැවත හටගැනිමට උපකාරිවූ කෙලෙසුන් හටගැනීමට ඉඩ ඇති සංස්කාරයන්ගේ විනාශය කිරිම නමැති නාශය මාර්ගඵලයන්ගෙන් සිදුකලබවයි ලොකෝත්තර ප්‍රබන්ධ විගසී මෙසේ විමසා දතයුතුයි.

මෙතෙකින් සතර වන සම්‍යක් ප්‍රධානය කියා අවසන් කරන්නේ ලිපිය දික්වන නිසයි.

මෙම ප්‍රබන්ධ විගසී පිළිබඳව කිවයුතු කරුණු බොහෝවේත්, මෙතෙකින් නවතාළුමද, ප්‍රබන්ධ විගසී සැකෙවින් තේරුන් ගැණීමට මෙය ප්‍රමාණ වේත් යයි සිතමු.

මීත් ප්‍රයොජන ගැණීමට උත්සාහවත් වන්නන්ට මෙතෙක් කරුණු අවබොධකොට ගෙන ධර්මධරයන් වෙතින් වැඩිදුර අසා නගත හැකි වේත්

මේ ප්‍රබන්ධ විගසීයන්ගෙන් වෙන්ව නිවන් අවබොධ කරගැනීමට බලාපොරොත්තුවන්නන් අවිද්‍යමානවේත්. එබැවින් නිර්වාණාභිලාෂයෙන් මෙම ප්‍රබන්ධ විගසීයන් දැන උගෙන වඩා සසරින් එතරවී නිවන් සිරි සාධාගන්නා ලෙස සිකීපත් කරවමූ.

සියලු සත්නට නිවන් සිරි අත්වේවා.

මිගහතැන්නේ වීදුරාම පරිවෙණාධිපති රාජකීය පණ්ඩිත ඕපාත සරණංකර මහා ස්ථවිර පාදයන් වහන්සේ විසින් පවත්වන ලද ධර්මදේශනාව.

---

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

---

## ඡන්දිද්ධිපාදය.

කථංච භික්ඛු ඡන්ද සමාධි පධාන සඞ්ඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති? ඡන්දං චෙ භික්ඛු අධිපතිං කරිත්වා ලභති සමාධිං ලභති චිත්තස්ස එකග්ගතං අයං වුච්චති ඡන්ද සමාධි සො අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති අනුප්පන්නානං අකුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති ඉමෙ වුච්චන්ති පධාන සංඛාරා ඉති අයං ඡන්ද සමාධි ඉමෙ ච පධාන සංඛාරා තදෙකජ්ඣං අභිසඤ්ඤුහිත්වා අභිසංඛිපිත්වා ඡන්දසමාධි පධාන සංඛාරොතෙව සංඛං ගච්ඡතීති;

සුපින්වත් බෞද්ධ සාධුනි,

ඡන්දිද්ධිපාදය මාතෘකා කොට ධම්මදෙශනාවක් කිරීමට අද දිනට මට නියමකොට තිබේ. දැන් මා විසින් ප්‍රකාශ කරණ ලද්දේ ඒ සඳහා ත්‍රිපිටක ධර්මයේ සඳහන් එක්තරා දේශනා පාඨයකි. මෙම ධර්ම පාඨය විස්තර කරදීමට ප්‍රථමයෙන් පැමිණ සිටින සත්පුරුෂ බෞද්ධ සමූහයාට ධර්මශ්‍රවණය පිළිබඳව අවවාදයක් කළයුතුව තිබේ. බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඉතා සියුම්ය ගැඹුරුය, තර්කයෙන් නිශ්චයකළ නොහැක. මහා ප්‍රාඥයන්ගේ නුවණටම ගොදුරුය. මේ නිසා උන්වහන්සේගේ ධර්මයෙන් උසස් ලෙස ප්‍රයෝජන ලැබිය හැක්කේ දියුණුවූ නුවණැති ජනයා විසින්මය.

“පඤ්ඤවන්තස්සායං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස, යන දෙශනා පාඨයෙන්ම එය පැහැදිලි වේ. මේනිසා ධර්මශ්‍රවණය පිණිස පැමිණ සිටින මෙම පිරිස නුවණැත්තවුන් විය යුතුය. සාමාන්‍ය මහජනයාගේ පමණක් නොව ශාස්ත්‍රාභ්‍යාසාදියෙන් ස්වකීය නුවණ මෝරවාගත් බුද්ධිමතුන්ගේ බුද්ධිය පවා යහපත් මාර්ගයෙහි ගමන් කරවන්ට අවකාශ නොතබා යටපත් කරණ භයානක කෙලෙස් සමූහයකින් පෘථග්ජනයාගේසිත පිරී පවතී.

එම කෙලෙස් සමූහයෙන් හාත්පසින් ග්‍රහණය කොට පවත්නා සිතකින් බුදු දහම් තබා සාමාන්‍ය කරුණක්වත් වටහා ගැන්ම පහසු නැත. එසේ නුවණ මුවහ කරණ කාරණා පසක් පඤ්චනීවරණ නමින් හඳුන්වනු ලැබේ. වස්තු කාම ක්ලේශ කාමයන් පිළිබඳව සිත්හි පහළවන බලවත් ඇල්ම කාමච්ඡන්දයය. සිත්හි ප්‍රකෘති ගතිය වෙනස්ව චණ්ඩ ගතියකට රෞද්‍ර ගතියකට පත්වීම ද්වේෂයයි. ව්‍යාපාද නීවරණ නම්වූ මෙය ඥානය වසන දෙවන කාරණයයි. චිත්තයාගේ සහ වේදනාදි ස්කන්ධත්‍රයයේත් අරමුණක පිහිටීමට අසමර්ථවූ හැකිළීම ගතිය යයි කියන ලද ථීනමිද්ධ නීවරණය තුන්වන කාරණයයි. සිත විසිරීමයයි කියන උද්ධච්චය සහ කළ නොකළ කුසලාකුසලයන් පිළිබඳ තැවීමයයි කියන ලද කුක්කුච්චයද යන චෛතසික දෙක එක්කොට බැලීමෙන් සතර වන නීවරණ ධර්මය උද්ධච්චකුක්කුච්ච යයි කියනු ලැබේ. ඒ ඒ ධර්මයන් පිළිබඳ කරුණු සිතා නිශ්චයකට බැස ගැනීමට නොහැකිවීමෙන් සිත වෙහෙසට පැමිණීම කියන ලද විචිකිච්ඡාව පස්වන නීවරණ කරුණය. මෙකී පඤ්ච නීවරණයන්ගෙන් වැසුණු සිතින් යුක්තව බණ අසා සිත්හි තබා ගත නොහැකිය.

මේ නිසා අසනු ලබන ධර්මයෙන් සුළු කොටසක්වත් සිත්හි තැන්පත්කර ගැනීමට බලාපොරොත්තු වන සාධුන් විසින් පළමු නීවරණයන්, තාවකාලික වශයෙන්වත් යටපත් කොට බණ ඇසිය යුතුය. තමතමන්ගේ බාහිර කටයුතු සියල්ලක්ද ගෙදර දොර තිබෙන සියලු රත්රුවන් මුතු මැණික් ආදී වස්තු සමූහයද අතහැරදමා දැන් මෙහි පැමිණ සිටින්නේද වැදගත් බලාපොරොත්තුවක් ඇතිවම විය යුතුය. එනම් බලාපොරොත්තුව බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මයෙන් ස්වල්පයක්වත් අසා දැනගැනීමේ කැමැත්තම විය යුතුය: එම බලාපොරොත්තුව මුදුන් පමුණුවා ගත හැක්කේ පළමු සඳහන් කළ නීවරණ නැමැති බල සතුරන් යටකිරීමෙන්මය.

මේ නිසා බණ ඇසීමට සූදානම්ව සිටින මේ පිරිස බණ හමාර වන තුරු තමන්ගේ ගේදොර වතුපිටි මුතු මැණික් අන් කිසිදෙයක් ගැන සිත ගමන් නොකර විය යුතුය. එසේම මේ කාලය තුළ සිත මොනම කාරණයක් නිසාවත් කෝපයකට සැඩ ගතියකට නොපමුණුවාගෙන විසිය යුතුය. එසේම චිත්ත චෛතසිකයන් අලසකම් නැමැති සතුරාගෙන් බේරාගෙන නොසෙල්වෙන කණුවක් මෙන් ධර්මයෙහිම පිහිටුවාගෙන හැකිලෙන්ට අවකාශ නොදී ආරක්ෂා කළයුතුය. ගල්කැට ආදී කිසිවකින් ගසනු ලැබූ අලුගොඩක් මෙන් සිත එහා මෙහා විසිරෙන්ට නොදිය යුතුය.

කිසිම පසුතැවිලි ගතියකට සිතට අවකාශ නොදිය යුතුය. සැකයක් සිතට වදින්ට අවකාශ නොතබා බණ ඇසිය යුතුය. මෙසේ සඳහන් කළ පඤ්චනීවරණයන් යටපත්කොට ප්‍රීතිසහගත සිතින් තෙරුවන් ගුණ සිත්හි තබාගෙන ධර්මාර්ථයන් ගැන සිත යොමු කරමින්, බණ ඇසූවොත් නිසැකයෙන්ම පින්වතුන් මෙහි පැමිණීමේ අදහස මුදුන් පැමිණෙනවා ඇත. ශාන්තදාන්ත මෙම පිරිස සිහිනුවණින් යුතුව ධර්ම ගෞරවය දේශක ගෞරවය පෙරදැරිකොට බණ ඇසිය යුතුය. එසේ අසා අසන ලද ධර්මය සිත්හි තබාගෙන ඒ වූ පරිද්දෙන් පිළිපැද දෙව්මිනිස් සැප කෙළවර අමා මහ නිවන් සුව ලැබීම පිණිස ප්‍රාර්ථනා පිහිටුවාගෙන බණ ඇසිය යුතුයි.

නිතර බණ අසා පලපුරුදු ඇති මේ පිරිසට විස්තර ධර්මාවවාදයක් නොවුවමනා හෙයින් ධර්ම අවවාදය මෙපමණකින් අවසන්කොට මෙතැන්සිට නියමිත ධර්මමාතෘකාව විස්තරකර දීමට බලාපොරොත්තු වෙමි.

“ඡන්දිද්ධිපාද” යනු මාතෘකාපාඨයයි. මෙය ශබ්ද තුනක් එකතුවීමෙන් සිද්ධ සමාස පදයකි. ඡන්ද, ඉද්ධි, පාද යනුවෙන් ඒ වචන තුන වෙන්කළ හැකිය. මේ ශබ්ද තුනේ අදහස පැහැදිලිලෙස අවබෝධ කරගත්විට ඡන්දිද්ධිපාදය යනු කුමක්දැයි පහසුවෙන් තේරුම්ගත හැකි වෙයි. මෙහි “ඡන්ද” නම් කත්තු කම්‍යතා කුශලච්ඡන්දයයි.

“තත්ථ කතමො ඡන්දො? යො ඡන්දො, ඡන්දිකතා කත්තු කම්‍යතා කුසලච්ඡන්දො, අයං වුච්චති ඡන්දො” යනුවෙන් ඒ බව විස්තර කොට තිබේ.

එහි පළමුවන ඍද්ධිපාදයෙහි ඡන්දය යනු කවරේද? කිසියම් කැමැත්තෙක්වේද, කැමතිවීම් බවක්වේද, කුසල්කිරීමෙහි කැමැත්තක් වේද, මේ ඡන්දයයි කියනු ලැබේ. යනු එහි අදහස වෙයි,

මෙහි ඡන්ද නාමයෙන් ප්‍රකාශිත වූ කැමැත්ත තණ්හා ඡන්දය දිට්ඨිඡන්දය, වීරිය ඡන්දය, ධම්මඡන්දය, යනාදී වශයෙන් ප්‍රභේද රාශියකින් යුක්ත වේ. මෙහිදී අදහස් කරණු ලබන්නේ කුශල් දහම් දියුණු කිරීම පිණිස පවත්නා කත්තුකම්‍යතා කුශලච්ඡන්ද නැමැති ධම්මඡන්දයයි. ලෝකෝත්තර චිත්තයෙහි යෙදුනාවූ කත්තුකම්‍යතා කුසලච්ඡන්දයම අදහස සම්බන්ධ කරණ අර්ථයෙන් සෘද්ධිපාද කොටසට අයත් වෙයි. මේ ඡන්දය අරමුණු ගැනීම් මාත්‍රයම ලකුණු කොට ඇත්තේය. "ඡන්ද" යන වචනයද ලෝභයට ව්‍යවහාර කරණ නමකි. එසේ වුවත් ඡන්දය අරමුණු ගැනීම් මාත්‍රය පමණක් කෙරෙයි ලෝභය ඒ අරමුණෙහි ඇලෙන ගතියෙන් යුක්ත වෙයි, මෙය කිසියම් කළාලයක දමනලද කැට කැබිලිති ආදියකට සමාන කළ හැක. ලෝභය, එහි දමන ලද ලකටු වර්ගයකට සමකල හැක. කැට කැබිලිති ආදිය කළාලයෙන් ගන්ට කැමති විටක හැකිය එහෙත් ලකටු ගැනීම අපහසුය. එමෙන් ඡන්දය අස්කර ගැනීම පහසුය. ලෝභය ලකටුව මෙන් ඉවත්කර ගැනීම අපහසුය. මෙසේ ලෝභ ඡන්ද දෙකේ වෙනස දතයුතුය.

මේ නිසා කුසල් කිරීම පිණිස පහළවන කැමැත්ත මෙහිදී ඡන්ද" යන වචනයෙන් අදහස් කළ යුතුය. එය සෘද්ධිපාද වනුයේ ලෝකෝත්තර චිත්තයන්හි යෙදෙන කල්හි බව විශේෂයෙන් සිහි කටයුතු ය.

"ඉද්ධීති යා තෙසං ධම්මානං ඉද්ධි සමිද්ධි ඉජ්ඣනා සමිජ්ඣනා ලාභො පටිලාභො පත්ති සම්පත්ති ඵුසනා සච්ඡිකිරියා උපසම්පදා යනුවෙන් "ඉද්ධි' යන වචනය විභඞ්ගයෙහි විස්තර කොට තිබේ ඒ ඡන්දාදි ධර්මයන්ගේ සිද්ධවීමක් වේද සම්පූර්ණ වීමෙක් වේද සමෘද්ධවීමක් වේද, ලැබීමක් වේද, පැමිණීමක් වේද, ස්පර්ශවීමක් ප්‍රත්‍යක්‍ෂ කිරීමක් වේද එයට පැමිණීමක් වේද(, ඒ සෘද්ධිනම් වේ. යනු එහි සාමාන්‍ය අදහසය. එම පාඨයෙහි සඳහන් වචන සමූහයම එකම "ඉද්ධි" යන වචනය තේරුම්කර දීම පිණිස යෙදී තිබේ. කෙටියෙන් සලකතොත් ඡන්දාදි ධර්මයන්ගේ සමෘද්ධ වීමම සෘද්ධි නාමයෙන් ප්‍රකාශිත වේ. මේ වචනයේ ප්‍රභේදයන් පිළිබඳ වද මෙහිදීම කරුණු ටිකක් සඳහන් කිරීම සුදුසු වෙයි.

සක්විති රජදරුවන්ට තමන් කැමති පරිදි අහසින් යා හැකි වෙයි. තමන්ට කැමති තාක් පිරිස ගෙනයන්ට හැකිවෙයි. මෙසේ පින්වතුන්ට පුණ්‍ය මහිමය නිසා සිදුවන අභිවෘද්ධිය පුණ්‍යර්ද්ධි නම් වේ· ජෝතිය ගෘහපතියාට පොළෙව පලාගෙන මැණික් පහයක් මතුවිය. කප්රුක් සැටසතරක්ද පහළවූහ. ජටිල ගෘහපතියාට

අසුරියන් රුවන් පළිනයක් පහලවිය. ඝොෂිත සිටුවරයා මැරීමට සත්වාරයක් උපක්‍රම යොදද නොහැකිවිය. මෙණ්ඩක සිටුවරයා ඔහුගේ දෙවිය, පුත්‍රයා, ලේලි පුණ්ණක දාසයා යන මොවුන්ට පුදුම දෙය පහලවිය. දුටුගැමුණු රජතුමන්ට රත්රුවන් මුතු මැණික් ආදිය පහලවිය. මෙසේ පුණ්‍යවන්තයන්ට පින්මෙරීම නිසා ලැබෙන විශෙෂවෘද්ධි පුණ්‍යර්ධි නම් වේ.

විද්‍යාධරයන්ට සවකීය විද්‍යාබලයෙන් අහසින් යාම නොයෙක් රූප මැවීම, වෙනත් නොයෙක් පුදුම දෙය සිදුකිරීමටද හැකිවෙයි. මෙසේ විද්‍යාබලයෙන් ලැබෙන විශෙෂ අභිවෘද්ධි සියල්ලක්ම විද්‍යාමය ඍද්ධි නාමයට ඇතුලත් වෙයි. මෙසේ ප්‍රභෙද වශයෙන් දක්වා තිබෙන සියලු ඍද්ධි වලින්ද ප්‍රකාශවන්නේ සවකීයාර්ථයන් සමෘද්ධ වීම ඍද්ධි යනුවෙන් කියවෙන බවය,, මෙකී ඍද්ධි පිළිබඳ ඉතා දීර්ඝ විස්තරයක් ඇත. මෙහිදී මා අදහස්කලේ "ඍද්ධි" යන වචනය තේරුම් කිරීම සඳහා කරුණු සවල්පයක් පමණක් දක්වීමටය. ඒ පිළිබඳ මීට වඩා විස්තරයක් කිරීමට අදහස් නොකරමි. සවකීය අභිමතාර්ථයන් සමෘද්ධවීමම ඍද්ධියයි සැලකිය යුතුයි.

දැන් කියයුතුව තිබෙන්නේ "පාද" යන වචනය ගැන විස්තරයකි. පාද යන වචනය ක්‍රම කීපයකට විස්තරකොට තිබේ. ඉද්ධි එවපාදෙ ඉද්ධිපාදෙ" යන විග්‍රහයෙන් ප්‍රකාශ වන්නේ ඍද්ධියම ඍද්ධිපාද යනුයි: එය තවත් තේරුම් කිරීම ඉද්ධි කොට්ඨාසොති අත්‍ථො අටුවාචාරීන් වහන්සේ දක්වූහ. ඍද්ධිකොටසක් යන තේරුමය යනුයි. ඉද්ධියා පාදෙ ඉද්ධිපාදෙ " යනුවෙන් "පාද" සබ්දයෙහි තවත් අර්ථයක් දක්වති. ඉර්ධියට පිහිටවූ දෙය යනු එහි තේරුමයි. අධිගමූපායොති අත්‍ථො" යනුවෙන් ඒ අදහස තවත් පැහැදිළි කෙරෙති: අධිගමයට උපාය යනු එහි අදහසය.

තෙනහි යස්මා උපරූපරි විසෙස සඞ්ඛාතං ඉද්ධිං පජ්ජන්ති පාපුනන්ති තස්මා පාදොති වුච්චති" යනුවෙන්ද එයම පැහැදිලි කෙරෙති. එම අධිගම උපාය කාරණකොට ගෙන යම් හෙයකින් යොගාවචර භික්ෂූහු මතුමත්තෙහි විශෙෂ දියුණුවකට පැමිණෙත්ද විත්තාදියුණු කෙරෙත්ද, එහෙයින් පාදයයි කියනුලැබේ මේ තේරුම්වලට අනුව සලකන කල්හි පෙනීයන්නේ උපචාර අර්පණා කුශල චිත්තයන් හා යෙදුනාවූ ඡන්ද සමාධි, ප්‍රධාන සංස්කාරයන් හා එක්ව යෙදුනාවූ මතුමත්තෙහි විශෙෂ ඵල ලාභයට උපකාරවූ චෛතසික සමූහය පාද යනුවෙන් ප්‍රකාශිත බවය.

"ඉද්ධිපාදෙති තථාභූතස්ස වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො" යනුවෙන් ඒ පිළිබඳ තවත් අදහසක් දක්වා තිබේ.

වේදනාස්කන්ධ, සංඥාස්කන්ධ, සංස්කාරස්කන්ධ, විඥානස්කන්ධ' යන අරූපස්කන්ධ සතරවම අයත් සියලු චිත්ත චෛතසික සමූහ යම් ඍද්ධි ලාභයට උපාය මාර්ගය බව ප්‍රකාශිතයි. මෙය විභඞ්ග ප්‍රකරණයෙහි විස්තර කොට දක්වා තිබෙන ක්‍රමය අනුව මෙසේ විස්තර කළ හැකිවෙයි.

දස ඍද්ධීයො= " අධිට්ඨානා ඉද්ධි, විකුබ්බනා ඉද්ධි, මනොමයා ඉද්ධි ඤාණ විප්ඵාරා ඉද්ධි, සමාධි විප්ඵාරා ඉද්ධි, අරියා ඉද්ධි කම්මවිපාක ජා ඉද්ධි, පුඤ්ඤවතො ඉද්ධි, විජ්ජාමයා ඉද්ධි, තත්‍ථ තත්‍ථ සම්මප්පයොගප්පච්චයා ඉද්ධි යි මෙසේ සෘද්ධිහු දස දෙනෙක් දක්වූහ. කිසියම් භාවනානුයෝගී පුද්ගලයෙක් සියයක් හෝ දහසක් හෝ ලක්‍ෂගණනක් හෝ වෙම්යි සිතින් සිතා එසේ වීමට අධිෂ්ඨාන කෙරේද, එසේ අධිෂ්ඨාන කිරීමෙන් ඔහුට සිතූ පරිදි රූපයන් ඇතිකිරීමට හැකිය. අධිෂ්ඨාන බලයෙන් එසේ ඉපද වීම අධිෂ්ඨාන සෘද්ධියයි. චූලපන්ථක තෙරුන් වහන්සේ රහත්වී අධිෂ්ඨාන බලයෙන් තමන් වැනි රූපදහසක් මවාගෙන අඹවන යෙහි වැඩසිටිසේක. එහි විස්තර කථාව චූලපන්ථක වස්තුවෙන් දතයුතුය. ප්‍රකෘතිය වෙනස්කොට නාග යක්‍ෂ රාක්‍ෂ ගරුඩාදි නොයෙක් රූපයන් මැවීමට සමත්වූ සෘද්ධිය විකුර්වන සෘද්ධිනම්. දෙව්දත් තෙරුන්වහන්සේ විශාල රකුස් විලාශයක් මවාගෙන ගොස් අජාසත් රජහුගේ ඇකයෙහි එල්(?) බියගැන්වීමෙන් රජු පහදවා ගත්සේක. මුගලන් මහරහතන් වහන්සේ විශාල ගුරුළු වෙසක් මවාගෙන නාගභවනයට වැඩීසේක. මෙසේ නොයෙක් වෙස් මවනුයේ විකුර්වණා සෘද්ධිබලයෙනි.

ශරීරාභ්‍යන්තරයෙහිම අන්‍යවූ මනොමය ශරීරයන් මැවීමට සමර්ථවූ සෘද්ධිය මනොමය සෘද්ධි නම්. මනොමය කායයන් මැවීමෙන් චූලපන්ථක තෙරුන් වහන්සේ අග්‍රස්ථානයට පත්වූසේක. මනොමය රූපයෝ සෘද්ධි ඇත්තහු සමානවෙති. මාර්ගඥානය ලබන්ට පළමුවෙන් හෝ ලබන අවස්ථාවෙහි හෝ ලැබීමෙන් පසුව හෝ ඥාන බලය නිසා පහළවන විශෙෂත්වය ඥාන විස්ඵාර සෘද්ධිනම් වේ. බක්කුල ළදරු තෙම මසෙකු විසින් ගිලින ලද්දේය. පසු දිනක මසුන් අල්වන්නකුගේ දැලට එම මසු අසුවී සිටු ගෙදරට ගෙනගොස් මසුන් බඩපැලූ කල්හි කිසි අනතුරක් නැතිව එම ළදරු තෙම මසුගේ උදරයෙහි සිටියේය. මෙය එම කුමරුට ඒ අත් බැව්හි අර්හත්වය ලැබීමට තිබුණු ඥාන බලයේ මහිමයෙන් සිදුවූ ඥාණ විස්ඵාර සෘද්ධියකි. සමාධිලාභයට පළමු හෝ ලබන අවස්ථාවෙහි හෝ ඉන් පසුව හෝ සමාධි බලය නිසා ලැබෙන

විශේෂය සමාධි විස්ඵාරසෘද්ධි නම්. සැරියුත් මහ සව්තෙම එක් දව සක් මුගලන් තෙරුන් සමඟ පරවී කඳුරු නම් ස්ථානයෙහි වාසය කළසේක. එක් දිනක් රාත්‍රියෙහි සමාධියකට සමවැදී සිටි සැරියුත් තෙරුන් වහන්සේගේ හිසට දරුණු යක්ෂයෙකු විසින් පහරක් ගසන ලදී ඉතා වේගයෙන් හිසට පහර වැදුන නමුත් උන්වහන්සේට එය නොදැනුනේය. සමාධියෙන් නැගිට සිටියාට පසුවද එයින් ඇතිවූ කිසි වේදනාවක් නොදැනුනේය. මෙය සමාධි විස්ඵාර සෘද්ධියේ බලමහිමයෙකි.

පිළිකුල් කටයුතු දෙය ගැන පිළිකුල් නොකර සිටීම: පිළිකුල් නොකටයුතු දෙය ගැන එසේ පිළිකුල් කිරීම. ඒ දෙපක්ෂයම ගැන මධ්‍යස්ථව සිටීම, ආදිය කිරීමට සමර්ථවූ ආර්‍ය්‍ය ශ්‍රාවකයන් වහන්සේලාට පමණක් පහළවන සෘද්ධිය ආර්‍ය්‍ය සෘද්ධි නම් වේ

පක්ෂි ආදීන්ට අහසින් යා හැකිවීම කණමැදිරියන්ට ආලෝකයක් පතුරුවන්ට හැකිවීම, මසුන්ට දියේ පිහිනීමාදිය කරන්ට හැකිවීම්, යක්ෂාදීන්ට නොපෙනී ගමන්කරන්ට හැකිවීම ආදිය කර්ම විපාක බලයෙන් නිපන් සෘද්ධි නම් වේ.

කෙසේදයත්? ඡන්දය, සෘද්ධි නාමයට ඇතුලත් වෙයි. ඒ ඡන්දය මුල්කොට භාවනා වැඩීමෙන් දියුණු බවට පමුණුවා ගත් වෙදනාස්කන්ධ සතරට අයත් චිත්ත චෛතසික ධර්ම සමූහය එම සෘද්ධියට උපාය මාර්ග සංඛ්‍යාත පාදය වෙයි. සමාධි පධාන සංස්කාර දෙක සංස්කාර ස්කන්ධයට ඇතුලත්ය. එසේම සමාධිය සෘද්ධි නම් වේ ඒ සමාධි මුල්කොට වර්ධනයට පමුණුවාගත් වෙදනාදි ස්කන්ධ සතර එම සෘද්ධියට උපායමාර්ගයවූ පාදය වෙයි. පධාන සංස්කාරය ඡන්දය යන දෙක සංස්කාරස්කන්ධයට ඇතුළත්වීම් වශයෙන් පාදයටම ඇතුලත්ය, එසේම පධාන සංස්කාරය සෘද්ධිනාම් වෙයි. ඒ පධාන සංස්කාර සංඛ්‍යාත ඍද්ධිය නිසා දියුණු කරගත් වෙදනාදී ස්කන්ධ සතර පාද නම් ඡන්ද සමාධි දෙක සංස්කාරස්කන්ධ වශයෙන් පාදයටම ඇතුලත්වෙයි මෙම දෙශනා ක්‍රමය අනුව සලකන කල්හී ඡන්ද සමාධි පධාන සංස්කාර යන ධර්ම තුනම සෘද්ධිනාමයටද පාදනාමයටද, ඇතුලත් වෙයි. ඒ ධර්මයන් උපකාරකොට ඇති වෙදනාදී ස්කන්ධ සතරට අයත් චිත්ත චෛතසික ධර්ම සමූහයම සෘද්ධියට උපකාරවූ පාද නාමයෙන් ප්‍රකාශිත අධිගමෝපාය මාර්ගයටම ඇතුලති.

ඡන්ද සමාධිපධාන සංස්කාරයෝ වැඩෙන්නාහු පාදභූතවූ වෙදනාදී ස්කන්ධ සතරින් යුක්තවම වැඩෙත්. එයින් තොරව කිසිලෙසකින් නොවැඩෙත්.:

“ඉද්ධි ච ඉද්ධිපාදෙති වා න අඤ්ඤස්ස කස්සචි අධිවචනං සම්පයුත්තකානං චතුන්නං ඛන්ධානං යෙව අධිවචනං”

යන අටුවා වචනයෙන් මෙකී කාරණ පැහැදිලි වෙයි. ඍද්ධි යනුද, ඍද්ධිපාද යනුද වෙන කිසිවකට ව්‍යවහාර කරණ වචනයක් නොවෙයි. ඡන්දාදි කාරණා සතර සමග යෙදුනාවූ වේදනා සංඥා සංස්කාර විඥානය යන ස්කන්ධ සතරටම ව්‍යවහාර කරණ නාමයකි. යනු එම අටුවා පාඨයේ අදහසය.

සිත විසිරෙන්ට නොදී පැවැත්ම සමාධි ලක්‍ෂණයි. සිත විසිරෙන්ට නොදී තැන්පත් කොට තැබීම සමාධියේ කෘත්‍යයයි. සිත චංචල නොවන ගතිය වැටහෙන ආකාරයයි. කාය චිත්ත සැපය, මෙයට ආසන්න කාරණයයි. මෙම සමාධිය පිළිබඳ දීර්ඝ විස්තරයක් ඇතද මෙහිදීම සියල්ලක් විස්තර කිරීම අවශ්‍ය නැත. මෙය උපචාර අර්පණා වශයෙන් ප්‍රධාන කොටස් දෙකකින් යුක්තවේ. ලෞකික ධ්‍යානයන්ගේ වශයෙන් හෝ ලෝකෝත්තර මාර්ග ඵලයන්ගේ වශයෙන් හෝ සිත්හි ඇතිවන බලවත්වූ එකාග්‍රතාය අර්පණා සමාධියයි. උපචාර සමාධිය ලෞකික සිත්වල පහළ වන එකී භාවයයි. අර්පණා සිත්වල සමීපචාරිව අර්පණාවට ප්‍රථමයෙන් පහළ වන බැවින් උපචාර සමාධියයි කියනු ලැබේ. අකුසල් සහගත සංඥා මනස්කාරයෙන් මෙකී සමාධි චෛතසිකයාගේ පිරිහීමට හේතුවෙත්. කුසල් සහගතවූ විතර්ක රහිතවූ සංඥා මනස්කාරයෝ මෙකී සමාධින්ගේ දියුණුවට හේතුවෙත් සමාධින් පිළිබඳ මීට වඩා විස්තර කිරීමට බලාපොරොත්තු නොවෙයි.

දැන් විස්තර කටයුතුව තිබෙන්නේ පධාන සංඛාර යන්න ඇතයි. “තත්ථ කතමො පධාන සංඛාරො යො චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිල පරක්කමතා අනික්ඛිත්ත ඡන්දතා අනික්ඛිත්ත ධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරිය බලං සම්මාවායාමො අයං වුච්චති පධාන සංඛාරො” යනුවෙන් එය විභඞ්ගයෙහි විස්තර කොට තිබේ.

එහි පධාන සංඛාර යනු කවරේද. චෛතසිකවූ කිසියම් වීර්‍ය්‍යාරම්භයක් වේද කුසීත භාවයෙන් නික්මීමක් වේද උසස් උසස්වූ ධ්‍යාන විදර්ශනා මාර්ග ඵලාදි තැන්වලට පැමිණීමක් වේද උත්සාහයක් වේද, ගුණධර්මයන් වැඩිදියුණු කිරීමෙහි වෑයමක් වේද, උත්සුක බවක් වේද, ශක්තිමත් බවක් වේද, ධෛර්‍ය්‍යයක්

වේද, බුරුල් නොවූ හෙයින් බලවත් වූ පරාක්‍රම ඇති බවක් වේද, බැහැර නොකරණ ලද වීර්‍ය්‍ය ධුර ඇති බවක් වේද, වීරයන්ගේ ක්‍රියාවක් වේද, වීර්‍ය්‍ය නැමැති ඉන්ද්‍රියයක් වේද, වීර්‍ය්‍ය නැමැති බල යක් වේද, අකුශල ධර්මයන් නැසීමෙන් කුසල ධර්මයන් දියුණු කිරීම පිණිස මාර්ගඵල ධ්‍යාන චිත්තයන් ලැබීම පිණිස පවත්නා චෛතසික උත්සුක බවක් වේද, මේ ප්‍රධාන සංඛාරයයි කියනු ලැබේ.

මෙහි වචන සමූහයෙන් ම ප්‍රකාශිතවූයේ එකම බලවත් වීර්‍ය්‍ය චෛතසිකයයි. මෙය සතර සම්‍යක් ප්‍රධානයන්ගේ වශයෙන් සතර පරිදි වේ. පළමුවෙන් 'සවකීය චිත්තයෙහි නුපන්නාවූ ලෝභාදි අකුශල ධර්මයන් උපදින්ට අවකාශ නොතබා වීර්‍ය්‍ය වැඩීම පළමුවෙන් තමන්ගේ සිතෙහි පහළවී තිබෙන නොයෙක් ලාමක අකුසල ධර්මයන් තදඞ්ගප්‍රහාණාදීන්ගේ වශයෙන් විනාශ කර දැමීමට වීර්‍ය්‍ය වැඩීම, පළමුවෙන් සිත්හි උපදවාගෙන නැති ධ්‍යානවිදර්ශනා මාර්ගඵලාදිවූ උසස්ගුණධර්මයන් උපදවාගැනීම පිණිස වීර්‍ය්‍ය වැඩීම, පළමු සිත තුළ පහළවී තිබෙන ධ්‍යානාදී උසස් ගුණ දහම් පිරිහීමට අවකාශ නොතබා නැවත නැවත දියුණුකිරීමෙන් මාර්ගඵලයන් ලබා කෙලෙස් නැතිකර නිවන් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්‍ය්‍ය වැඩීම යන කරුණු සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයයි කියනු ලැබේ: මෙසේ සතරාකාර කෘත්‍ය සම්පාදනයෙහි සමර්ථවූ බලවත්වූ වීර්‍ය්‍ය චෛතසිකයම පධාන සංඛාර යන වචනයෙන් ප්‍රකාශිතයි.

"ඉති ඉමිනාච ඡන්දේන ඉමිනාච සමාධිනා ඉමිනාච පධාන සංඛාරේන උපෙතො හොති සමුපෙතො උපාගතො සමුපාගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො තෙන වුච්චති ඡන්ද සමාධි පධාන සංඛාරෙනාති" මෙසේ ප්‍රථමයෙන් සඳහන් කළ කත්තුකම්‍යතා ලක්ෂණ ඡන්ද චෛතසිකයෙහිද එසේම සඳහන් කළ චිත්තෙකාග්‍රතා නමැති චෛතසිකයෙන්ද, චතුර් කෘත්‍ය සාධක වීර්‍ය්‍ය චෛතසිකයෙන්දැයි අඞ්ග තුනකින් සම්පූර්ණවූ ඍද්ධිපාදය "ඡන්දිද්ධිපාදයයි කියනු ලැබේ. ධ්‍යාන මාර්ගඵලා දී උසස් උසස් ගුණයන් ලැබීමට උපාය මාර්ග වශයෙන් සලකන මේ ඍද්ධි පාදයට ඡන්දචෛතසිකය මුල්වන හෙයින් ඡන්දිද්ධිපාද නාමය ව්‍යවහාර කෙරෙයි,

ඒ ඒ යොගාවචර භික්ෂූහු තමන් තමන්ට අභිමතවූත් චරිතානුකූලවූත් කරුණක් මුල්කර ගැන්මෙන් භාවනා වඩා අදහස් මුදුන් පමුණුවා ගනිති. කිසියම් භික්ෂුවක් ඡන්ද චෛතසිකයමුල්

කරගෙන එය ප්‍රධානතරගෙන සිත්හි එකඟ බවක් ඇතිකොට ගෙන චතුසච්චසාධක වීර්‍යයෙන් යුක්තව ගුණ දම් පිරීමෙන් මාර්ගඵලාදිය ලබයිද ඒ භික්ෂුවට එකී උසස්වූ මාර්ගඵල සංඛ්‍යාත සෘද්ධිලාභයට මූලිකවූයේ ඡන්දය බැවින් ඡන්දිද්ධිපාදයයි කියනු ලැබේ.

විශේෂ ඍද්ධිපාදයන් පිළිබඳ මෙබඳුය.

ඉද්ධියා චතස්සො භූමියො චත්තාරො පාදා අට්ඨපාදභාවො සොළසමූලානි සම්පාදෙන්තො ඤාණෙන අධිට්ඨහන්තො" යන වචන වලින් ඍද්ධි ලාභයට අවශ්‍ය අංගකීපයක් ඇතිබව ප්‍රකාශිතයි. මෙහි ඍද්ධියට පිහිටිවූ භූමි සතර නම් ප්‍රථම, ද්විතීය, තෘතීය. චතුර්ථ යන ධ්‍යාන භූමි සතරමැයි. සතරපාද නම් මෙහි සඳහන් කළ "ඡන්දය" සහ චිත්ත, විරිය, විමංස, යන තුනද යි මෙහි චෛතසික සතරයි. "ඡන්දෙ අරොසඳු ජනෙ සමාධි, යනාදීන්ගේ ශයෙන් සඳහන් පරිදි ඡන්ද චිත්ත විරිය විමංස යන සතරත් ඒ සතර සමඟ බැඳී පවත්නා සමාධි සතරත් යන අට අෂ්ටපාද නාමයෙන් දක්වූහ. මේ ඡන්දාදී චෛතසිකයෙන් තොරව ඍද්ධි ලාභය පිණිස අසමර්ථ වන හෙයින් මෙසේ දක්වූහ. සොළස මූලයෝ නම් චිත්තය කම්පාවීමට අවකාශ නොදෙන කරුණු දහයක් වේත්. සිත යටපත් නොවීම, උඩඟු නොවීම, රාගාවනත නොවීම ක්‍රෝධ සහිත නොවීම, දෘෂ්ටිනිශ්‍රිත නොවීම, රාගයෙන් දුර්ජ භයයෙන් නොබැඳීම, කෙලෙස් සීමා නැති කිරීම, එකඟවීම, ශ්‍රද්ධාවෙන් යුක්තවීම, වීර්‍යයෙන් යුක්තවීම සමාධියෙන් යුක්තවීමා ප්‍රඥාවෙන් යුක්තවීම, ධ්‍යානාලෝකයෙන් යුක්තවීම, යන මෙකී කරුණු දහසයක් සම්පූර්ණවූ සිත ආනෙඤ්ජාවෙයි. එබැවින් මේ සොළස මූලයෝ වෙති.

මේ සතර සෘද්ධිපාදයෝ තනතුරු බලාපොරොත්තුවෙන් හැසිරෙන පුරුෂයන් සතර දෙනෙකුන් වැනි වේත්. එම පුරුෂයන් සතරදෙනා අතුරෙන් එකෙක් උපස්ථාන කිරීමෙහි සමර්ථවෙයි. ස්වාමියකුගේ සිත් ඇදගන්නා පරිද්දෙන් උපස්ථාන කිරීමට පුරුද්ද ඇත්තේය. එකෙක් යුධකිරීමෙහි දක්ෂ වෙයි. සතුරන් පරදවා ස්වාමියාට ජයලබාදීමට සමර්ථ වෙයි. එකෙක් උසස් ජාති ඇත්තෙක් වේ. රාජ්‍යතනතුරු ලැබීමට සුදුසු සම් ඇත්තේය එකෙක් මන්ත්‍රණයෙහි දක්ෂ වෙයි. ගුප්තමන්ත්‍රණාදියෙහි යෙදීමෙන් ස්වාමියා වසඟකර ගැනීමෙහි සමර්ථ ඥනයක් ඇත්තේ වෙයි. මේ සතර දෙනාගෙන් උපස්ථානයෙහි දක්ෂ පුරුෂයාමෙන් "ඡන්ද" චෛතසිකය මෙහිදී අපි සිතමු. අනික් තුන්දෙනා මෙන් පිළිවෙලින් චිත්ත. විරිය, විමංස චෛතසික තුන සලකමු.

එහි උපස්ථානයෙහි දක්ෂ නැහැත්තේ නිතර නිතර රජුට උපස්ථාන කිරීමට පැමිණෙයි. උපස්ථාන යෙන් රජු සතුටු කොට තමන් අභිමත තනතුර ලැබීමට බලාපොරොත්තුවෙන් සැලකිල්ලෙන් උපස්ථාන කෙරෙයි. මෙසේ හෙතෙම ඒක සැලකිල්ම එයින් රජු සතුටු කර තමන් බලාපොරොත්තුවූ පදවි ලබාගෙන උසස් බවටද පැමිණෙයි. එමෙන් කත්තුකම්‍යතා කුසලච්ඡන්ද යැයි සිත පුරුදු වූ එහි ඇලුනාවූ යෝගාවචර තෙම මට මෙම ඡන්දචෛතසිකය මුල්කරගෙන භාවනා වැඩීමාදිය කිරීමෙන් මාර්ග ඵලාදි උසස් තත්වයට පැමිණීම අපහසු නැත. එයින් ඍද්ධි ලාභය කළහැකිය. සිතා ඡන්දය මුල්කොටගෙන භාවනා වැඩීමෙහි යෙදෙයි. නොබෝ කලකින් හෙතෙම තමන් අදහස් කළ පරිදි ධ්‍යාන විදර්ශනා මාර්ගඵල ලැබිය හැකිවෙයි, එසේ ඍද්ධි ලබාගත් ඔහුට එයට මුල්වූයේ ඡන්දිද්ධිපාදය යි අවශේෂ ඍද්ධිපාදයන් පිළිබඳවද උපමා සංසන්දනය මේ නයින්ම අවබොධ කළයුතුය

මෙසේ ඒ ඒ යෝගාවචර භික්ෂූන්ට ඒ උසස් විත්තයවෙත සිත ධර්මයන් ලැබීමට මූලිකවූ ඡන්දාදි ධර්මයෝ ඍද්ධිපාද නාම යෙන් හඳුන්වනු ලැබෙත්. රට්ඨපාල තෙරුන් එහන්සේ ඡන්දිද්ධිපාදය මුල්කොට රහත්වූ සේක. රට්ඨපාල තෙරුන්ගේ චරිතය සංක්ෂෙප වශයෙන් වත් මෙහිදී දැක්වීම සුදුසුය. රටක් පාලනයට සුදුසු කුලයක උපන් හෙයින් රට්ඨපාලයයි ප්‍රසිද්ධවූ ක්ෂීණාශ්‍රව තෙම පූර්වයෙහි පියුම්තුරා බුදුන් සමයෙහි ගෘහපති කුලයක ඉපද වැඩිවිය පැමිණ තමන්ගේ යහළුවකු සමඟ පින් කිරීමෙහි යෙදුනේය.

ඍද්ධිසම්පන්න තවුසෙකුට සංග්‍රහකොට එම තවුසාගේ සීම පරිදි ශක්‍ර භවනයෙහි ඉපදීම ගැන සිත පිහිටුවා නිතර පින් කෙලේය. එසේ පින්කොට මරණින් මතු ශක්‍රභවනයෙහි උත්පත්තිය ලැබුවේය. තමන් සමඟ එකට පිංකළ යහළු තෙම තවුසාගේ සීම පරිදීම නාග භවනය ගැන සිත පිහිටුවා පිංරැස් කොට දිව්‍ය නාගයෙක්ව උපන්නේය. විරූපාක්ෂ නාගරාජයාගේ පිරිසෙහි වූ හෙතෙම නාගයෝනිය ගැන කලකිරී සිටියේය, එක් දිනක් විරූපාක්ෂ නාගරාජයාත් සමඟ ශක්‍රයාට උපස්ථානය සඳහා ශක්‍රභවනයට ගියේ පූර්ව සම්බන්ධයෙන් ශක්‍රව ඉපද සිටි මිත්‍රයාව හඳුනාගත්තේය. ශක්‍ර තෙමේද හඳුනා තොරතුරු අසා එම නාග යෝනියෙන් චුතව පියුම්තුරා බුදුන්ට දන්දී පින් රැස්කිරීමට අවවාද කෙළේය. නාගරාජ තෙමේද එම අවවාදය බාරගෙන

පිසුම්තුරා බුදුන් වඩාහිඳුවා දන්දී පින්රැස්කොට අනාගතයෙහි බුදුවරයෙකුගේ පුත්‍රවීමට ප්‍රාර්ථනා කෙළේය.

නැවත දිනක් ශක්‍ර තෙම එම මිත්‍රයාගෙන් තොරතුරු අසා මිත්‍රයා ප්‍රාර්ථනා කළ කරුණට සතුටුව තමන් අනාගතයෙහි බුදුවරයෙකුගේ ශාසනයෙහි ශ්‍රද්ධාවෙන් පැවිදිවූවන් අතුරෙන් අග්‍රවෙවායි පැතීය. මෙසේ ප්‍රාර්ථනා කොට සසර සැරිසරමින් බොහෝ පිං රැස්කොට මෙතුම බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලබා සත්වයන්ට දම්දෙසමින් වැඩ සිටින සමයෙහි කුරුරට ථුල්ලකොට්ඨිත නගරයෙහි උසස් කුලයෙක්හි උපන්නේය.

රට්ඨපාල නාමයෙන් ප්‍රසිද්ධවූ හෙතෙම ක්‍රමයෙන් වැඩිවියට පැමිණ බාසයකරණ සමයෙහි බුදුරජාණන් වහන්සේ ථුල්ලකොට්ඨිත නගරයට වැඩිසේක. රට්ඨපාල කුලපුත්‍ර තෙමේ එහිදී බුදුන්ගෙන් බණඅසා පැහැදුනේය ශාසනයෙහි ඉතාමත් ප්‍රසන්න භාවයට පැමිණියේ මහණවීමට දෙමව්පියන්ගෙන් අවසර ඉල්විය. පළමුවෙන් මව්පියන් අකමැතිවූ නමුත් බොහෝ වාරයක් යාඥකොට මව්පියන්ගේ කැමැත්ත ලබාගෙන පැවිදිවිය. මහණවූ දින සිට කුසල් දහම් වැඩීමෙහි බලවත් වෙහෙසක් දැරීය. නිතර යෝනිසෝමනස්කාරයෙන් යුක්තව කත්තුකම්‍යතා කුශලච්ඡන්දය මුල් කොට වියහිමැඩීමෙන් සියලු කෙලෙස් නසා රහත්වූයේය. පසු කාලයෙහි බුදුරජාණන් වහන්සේ ඒ ඒ භික්ෂූන් උසස් තනතුරුවල පිහිටුවන සේක් රට්ඨපාලතෙරුන් ශ්‍රද්ධාවෙන් පැවිදිවූවන් අතුරෙන් අග්‍රස්ථානයෙහි තැබූසේක. මෙසේ රට්ඨපාල තෙරුන්ට ඍද්ධිලාභයට මුල්වූයේ ඡන්දිද්ධිපාදයයි.

විභඞ්ගයෙහි සඳහන් ප්‍රභේද කථාවන්ද මෙහිදී කෙටියෙන් වත් සඳහන්කිරීම සුදුසුය. ඡන්දය, සමාධිය, පධාන සංස්කාරය යන චෛතසික තුන ඍද්ධ ඍද්ධිපාදයෝද වෙති. එක්ව පැවති වේදනා සංඥා සංස්කාර, විඥාන යන ස්කන්ධ සතරට අයත් චිත්තචෛතසිකයෝහු ඍද්ධිපාදයෝම වෙති. චිත්ත විරිය විමංස යන කරුණු සමග යෙදුනු සමාධි පධානයෝද එසේම ඍද්ධිහුද පාදයෝද වෙති. ඒවා සමග යෙදුනු වේදනාදි ස්කන්ධ සතර අයත්වූ චිත්ත චෛතසිකයෝ ඍද්ධිපාදයෝද වෙති.

අටුවාචාරීන් වහන්සේලාගේ මතයක් අනුව සලකන කල්හි මුල් මුල් අවස්ථා ඍද්ධිපාද වශයෙන්ද පසුව දියුණුවූ අවස්ථාව හුදු ඍද්ධි වශයෙන්ද දැක්විය හැක. "පඨමජ්ඣාන පරිකම්මං ඉද්ධිපාදෙ නාම පඨමජ්ඣානං ඉද්ධිනාම දුතිය තතිය චතුත්ථ ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන

නෙවසඤ්ඤානාසඤ්ඤායතන පරිකම්මං ඉද්ධිපාදො නාම නෙවසඤ්ඤානාසඤ්ඤායතනං ඉද්ධිනාම. සොතාපත්ති මග්ගස්ස විපස්සනා ඉද්ධිපාදො නාම, සොතාපත්තිමග්ගො ඉද්ධිනාම සකදාගාමි අනාගාමි අරහත්ත මග්ගස්ස විපස්සනා ඉද්ධිපාදො නාම] අරහත්ත මග්ගො ඉද්ධිනාම" යනුවෙන් ඒබව අටුවාවෙහි විස්තරකොට තිබේ. ප්‍රථම ධ්‍යාන සතරෙහිත් ආකාසානඤ්චායතනාදී අරූපධ්‍යාන සතරෙහිත් පරිකර්ම භාවනා අවස්ථාවෝ සෘද්ධිපාදයෝ වෙති. ඒ භාවනාවෙන් ලත් ප්‍රථමාදී ධ්‍යානයෝ සෘද්ධි නම් වෙත්. එසේම සෝවාන් ආදී මාර්ගඵලයන් ලැබීම පිණිස විදර්ශනා භාවනා වඩන අවස්ථාව සෘද්ධිපාදයයිද එයින් සොවාන් ආදී මාර්ගයින් ලැබීම සෘද්ධියයිද දක්වා තිබේ.

ඒ ඒ ධ්‍යානයන් ලැබීම් ක්‍රමයෙන්ද විශේෂයක් අටුවාචාරීන් වහන්සේ දක්වූහ.

එනම්- ප්‍රථමධ්‍යානය සෘද්ධිපාදය, ද්විතීයධ්‍යානය, සෘද්ධිපාදය තෘතීයධ්‍යානය සෘද්ධිපාදයයි චතුර්ථධ්‍යානය සෘද්ධියයි චතුර්ථධ්‍යානය සෘද්ධිපාදයයි සොවාන් මාර්ග චිත්තය සෘද්ධියි, සොවාන් මාර්ගය සෘද්ධිපාදයි. සකෘදාගාමි මාර්ගය සෘද්ධියි. සකෘදාගාමි මාර්ගය සෘද්ධිපාදයි, අනාගාමි මාර්ගය සෘද්ධියයි අනාගාමි මාර්ගය සෘද්ධිපාදයි අර්හත්මාර්ගය, සෘද්ධියයි. මේ ක්‍රමයෙන් පූර්ව පූර්ව ධර්මයෝ සෘද්ධිපාදයෝ යයිද පසුව පසුව ලැබෙන ධර්මයෝ සෘද්ධියයිද අටුවාචාරීන් වහන්සේලාගේ මතයක් වශයෙන් විස්තර ලෙස දක්වූහ.

මෙසේ සඳහන් කල සෘද්ධිපාදයන් පිළිබඳ අභිධර්ම දේශනා අනුව එක එක සෘද්ධිපාදය පිළිබඳ ක්‍රම අටදහස බැගින් හෙන සෘද්ධිපාද සතර පිළිබඳව නය දෙතිස් දහසක් දක්වූහ. මෙසේ ප්‍රභේද කථාවලින් යුත් සෘද්ධි පාදයන් අතුරෙන් අපට අයත් ඡන්දිද්ධිපාදය පිළිබඳ විස්තරය මෙපමණකින් අවසන්කිරීමට බලාපොරොත්තු වෙමි.

සැදැහැවත් බෞද්ධ පිරිස හැකිතාක් මෙකී ගුණ ධර්මයන් දියුණුකොට ලොවී ලොවිතුරා සැපත් සිද්ධකරගැනීමට උත්සාහ කටයුතුයි.

පානදුරේ රන්කොත් විහාරස්ථ සෞගත විද්‍යාලයාධිපති පණ්ඩිත මොරටුවේ සාසනරතන ස්ථවිරයන් වහන්සේ විසින් පවත්වන ලද ධර්මදේශනාව.

---

# චිත්තිද්ධිපාදය.

---

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

---

"තත්ථ කතමො චිත්තිද්ධිපාදො? ඉධ භික්ඛු යස්මිං සමයෙ ලොකුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං, දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා විවිච්චෙව කාමෙහි -පෙ- පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං යං තස්මිං සමයෙ චිත්තං මනො මානසං -පෙ- තජ්ජා මනොවිඤ්ඤාණධාතු අයං වුච්චති චිත්තිද්ධිපාදො අවසෙසා ධම්මා චිත්තිද්ධිපාද සම්පයුත්තා"

පින්වත්නි; දැන් මේ සැදැහැති පිරිස ඉදිරියෙහි මවිසින් මාතෘකා වශයෙන් දේශනා කරණලද්දේ අද අපේ ධර්මදේශනාවට නියමිත මාතෘකාවවූ "චිත්තිද්ධිපාදය" විස්තර කරමින් බුදුරජාණන් වහන්සේ විසින් විභඞ්ග පාළියෙහි වදාරණ ලද දේශනා පාඨයකී, සාමාන්‍යයෙන් මෙබඳු පාළිදේශනා පාඨවල තේරුම් ගිහි පින්වතුන්ට නොතේරෙන "චිත්තිද්ධිපාදය" පිළිබඳ විස්තරයක් දැනගනු කැමැති සිංහල දෙනා විසින් මේ දේශනා පාඨයේ කෙටි තේරුම් පළමුවෙන් දැනගත යුතුය. මෙයින් ප්‍රකාශ වන අදහස මෙසේය.

"යම් සමයෙක්හි මේ ශාසනයෙහි භික්ෂුතෙම දෙසැටක් මිථ්‍යා දෘෂ්ටීන් හා සත්කාය දෘෂ්ටි; විචිකිත්සා, ශීලව්‍රත, පරාමර්ශ. රාග ද්වේෂ, මෝහ, යන දිට්ඨිගතයන් දුරුකිරීම පිණිසද, ප්‍රථම ශ්‍රාමණ්‍ය ඵලයවූ ශ්‍රොතාපත්ති ඵලය ලබාගැණීම පිණිස ද, ලෝකයෙන් නික්ම යන හෙයින් නෛර්‍යාණික වූ, ත්‍රෛභූමක කුශලයන් විසින් වඩනා ලද ච්‍යුතිය හා ප්‍රතිසන්ධිය දෙක විකල කරමින් විද්වංශනය කරමින් යන හෙයින් අපචයගාමීවූ, ලෝකය ඉක්මවා වැඩසිටි සෙයින් ලෝකෝත්තරවූ එක චිත්ත ක්ෂණික අර්පණාධ්‍යානය වඩාද සමුච්ඡෙද විවේක වශයෙන් වස්තුකාම ක්ලේශ කාම

යන්ගෙන් වෙන්වීම විතර්කය හා විචාරය සමග පවත්නා නීවරණයන්ගෙන් පහවූ ධ්‍යානයන් ගෙන් යුක්ත ධර්මයන්ගෙන් කවගත් සමාධිය හා එක්ව පැවැත්මට ගිය ස්ඵරණ ප්‍රීතිය හා සැපය ඇති, මුලදීම දුකින් ක්ලාන්ත වෙමින් ක්ලෙශ යන් විෂ්කම්භනය කරණ හෙයින් දුක් පිළිවෙත් ඇති, ඔබාගත් කෙලෙස් ඇත්තනු විදර්ශනා පරිවාසයෙහි වෙසෙමින් කලකින් මාර්ගය ලබාගන්නා හෙයින් දන්ධාභිඥවූ හෙවත් ලස් නුවණ ඇති ප්‍රථම ලොකොත්තර ධ්‍යානය ලබා වසයිද, එසමයෙහි යම් සිතක් -පෙ- විඥ්ඥාණ ධාතුවක් වෙයිද, එය චිත්තිඩිපාද නම් වේ. අව ශෙෂවූ ස්පර්ශ, වෙදනා, සංඥදි ධර්මයෝ චිත්තිඩිපාද සම්ප්‍රයුක්තයෝ වෙත් යනු මෙහි කෙටි තේරුමයි.

මෙබඳු ගැඹුරු ධර්ම කොටඨාශයන් තේරුම් ගැනීමට ප්‍රමාණ වත් ධර්ශාස්ත්‍රාවබොධයක් තිබිය යුතුය. එසේ නැතිව එක වරක් ඇසූ පමණින් තේරුම ගැනීම දුෂ්කර වේ. නිතර නිතර ධර්ම ශ්‍රවණය කිරීමත් එය භාවිත කිරිමත් මෙබඳු ගැඹුරු කරුණු තේරුම් ගැනීමට ශීඝ්‍ර පින්වතුන්ට ඇති එකම මාර්ගය වේ. මේ සැදැහැති පිරිස ඍද්ධිපාදයන්ගෙන් පළමුවන "ඡන්දිඩිපාදය පිළි බඳව ඊයේ ධර්මශ්‍රවණ කළ බැවින් අද දෙශනා කරණ "චිත්තිඩිපා දය" තේරුම් ගැනීම පහසු වන්නට පුළුවන. එබැවින් පැයක් පමණවූ සුළු කාලයක් තුල දෙශනා කරණ මේ ධර්මය සාවධානව අසනවා ඇතැයි මම ඉතා ඕනෑකමින් බලාපොරොත්තු වෙමි.

"චිත්තිඩිපාදය" යන මේ වචනය සෑදී තිබෙනුයේ චිත්ත, ඉඩි, පාද, යන වචන තුන එක්වීමෙනි. එහි චිත්ත නම් සිතයි. ඉඩි නම්, තම තමන් ලබන ධ්‍යාන මාර්ගඵල ධර්ම සමූහයයි. පාද යනුයෙහි තේරුම නම් පිහිටයි. මේ වචන තුන එකතුකොට ගත් චිත්තිඩිපාද ශබ්දයෙන් කියනුයේ සත්ත්වයන්ගේ අභිවෘඩියට ඉවහල්වන ධර්ශනය ලබාගැනීමට යම් සිතක් පිහිට වේද එය 'චිත්තිඩිපාද නම් වේ. යනුයි. "චිත්තමෙව ඉඩිපාදො" චිත්තිඩි පාදෙ යනුවෙන් රූපක සමාස විධීන් දක්වන ලද්දේ එයමය.

ලොකොත්තර ධ්‍යානය ලබන සමයෙහි යම් විඥ්ඥාණයක් වේද, එය චිත්තිඩිපාද නමැයි සැකෙවින් දතයුතුය. චිත්ත, මනෝ මානස, විඥ්ඥාණය මේ ශබ්ද පාලියෙහි පර්යාය, සබ්දයෝ වෙති. එබැවින් මේ දෙශනා පාඨයෙහි සඳගත් මනො මානස විඥ්ඥාණ, යන ශබ්දයන්ගෙන්ද හඳුන්වන, චිත්තය නම් කුමක් දැයි පළමුවෙන් දැනගත යුතුය. එසේම යම් කිසිවක් නිවරැදිව

අවබොධ කරගැනීමට ඉතා පහසු ක්‍රමය මෙන් පැරැණි ආචාර්‍ය්‍ය පරම්පරාවේ එක, ලක්ඛණ, රස, පච්චුපට්ඨාන යන්ගෙන්ද චිත්ත ශබ්දයාගේ යථාර්ථය අප විසින් දතගත යුතුය.

"චිත්ත නම් සිතයි. චිත්තයට ඒ නම ව්‍යවහාර කරණුයේ "ආරම්මණං චින්තෙතීති චිත්තං" යන විග්‍රහය අනුව අරමුණ සිතන නිසාය චක්ෂුරාදි ඉන්ද්‍රිය ගොචරවූ අරමුණු යමකින් සිතා නම්; චිත්තය එය ය. තවත් නොයෙකුත් තේරුම් අනුවද චිත්ත යන නාමය ව්‍යවහාර වේ. ඒ බැවි-

"විචිත්ත කරණං චිත්ත-මත්තනො චිත්තතායවා
චිත්තං කම්ම කිලෙසෙහි-චිත්තං තායති වා තථා
චිනොති අත්ත සන්තානං-විචිත්තාරම්මණන්ති ච"

යන ගාථාවෙන්ද, පෙනේ. එයින් චිත්තය පිළිබඳව නිරුක්ති කීපයක්ම දක්වන නමුදු මෙහි අප විසින් මුලින් දක්වූ 'ආරම්මණං' චින්තෙතීති= චිත්තං යන නිරුක්තිය මෙහිදී ප්‍රමාණවේ. අරමුණ සිතීම චිත්තයෙන්ම කරණ බැවිනි. ඊළඟට අප විසින් දතයුත්තේ "චිත්තය" පිළිබඳ ලක්ෂණයයි. "විසය විජානන ලක්ඛණං චිත්තං" යනුවෙන් විෂය සංඛ්‍යාත අරමුණ දැනගැනීම චිත්තයාගේ ලක්ෂණ යයි. විෂය යනුත් අරමුණ යනුත් එක තේරුමයි. චිත්තයාගේ ලක්ෂණ කියූ මේ විග්‍රහ වාක්‍යය අනුව නිශ්‍රය සමනන්තරාදි ප්‍රත්‍ය යන් ඇති කල්හිදු ආලම්බනයන් නැතිව චිත්තය නො උපදනා හෙයින් චිත්තයාගේ ආලම්බන විජානන ලක්ෂණයම කියන ලද්දේය. මෙයින් චිත්තය නිරාලම්බනිකය යන වාදය බැහැර කරන් නේය. චිත්තයාගේ රසය හෙවත් කෘත්‍යය නම්; චෛතසික ධර්ම යන්ට පෙරටුව යාමයි. "පුබ්බඞ්ගම රසං" යනුවෙන් එය දක්වන ලදී. චිත්තය ද්වාරයට පැමිණ අරමුණ ප්‍රකාශ කරන හෙයින් චෛතසික ධර්මයන්ට පෙරටුව යන්නේය.

චිත්තයාගේ ප්‍රත්‍යුපස්ථානය හෙවත් වැටහෙණ කාරණය නම් අතුරු නැතිකොට අන් සිතක් හා ගැලපීමයි. "සංසන්දන පච්චු පට්ඨානං" යනුවෙන් එය කීහ. පඤ්චවොකාර භවයෙහි නාමරූප දෙක හා චතුවොකාර භවයෙහි නාමයද, චිත්තයාගේ පදස්ථානයයි මෙතෙකින් චිත්තය පිළිබඳව දක්වූ විස්තරය ප්‍රමාණ වේයයි සිතමි.

ඊළඟට දතගත යුත්තේ ඉඩි, පාද යන ශබ්ද දෙකේ විස්තර යයි. "ඉජ්ඣතීති" ඉඩි සමිජ්ඣති නිප්පජ්ජතීති අත්ථො යනුවෙන් යම ධර්ම ජාතියක් සිඩ වේද ලැබේද, ඒ ධර්ම ජාතිය ඍඩි නම් වේයයි දක්වන ලදී. සිතින් දක්වනලද සිතින් අදහස් කර යම් අභිමතාර්ථ

යක් ලබාතම්, ඒ අර්ථය ඍද්ධි නම් වේ යනු මෙහි යථාර්ථයයි. මෙසින් උපරිම වශයෙන් තම තමන් ලබන ධ්‍යාන- මාර්ග- ඵල ධර්ම සමුදය ඍද්ධි නම් වන බව දතයුතු.

“පජ්ජති අවයව භාවෙන ඤායතීති- පාදො” යනුවෙන් අවයව වශයෙන් දැනගනු ලබන දෙය පාද නම් වේ. මෙසින් කොට සක්‍ය යන අර්ථය ලැබේ.

“ඉද්ධි එව පාදො, ඉද්ධිපාදො” යනුවෙන් නිපදවනු ලබන අභිමතාර්ථ කොට්ඨාසය ඍද්ධිපාද නම්. “ඉද්ධිපාද ශබ්දයන් පිළිබඳ තවත් විස්තර දක්වන්නට පුළුවන. “ඉජ්ඣන්ති, සත්තා, ඉද්ධා වුද්ධා, උක්කංසගතා හොන්තීති, ඉද්ධි යනුවෙන් යම් ධර්ම ජාතියක් කාරණ කොට ගෙන සත්වයෝ සමෘද්ධ වෙද්ද, අභිවෘද්ධියට පැමිණෙද්ද උසස් බවට පැමිණෙද්ද, ඒ කාරණභූතවූ ධර්මජාතිය ඉද්ධි නම්. පජ්ජන්ති පාපුණන්ති. එතෙනාති= පාදො යනුවෙන් යමක් කාරණ කොටගෙන වෘද්ධියට පැමිණෙත්ද, ඒ කාරණභූතවූ ධර්මය “පාද” නම්. මෙසින් ‘පිහිටය’ යන අර්ථය වාච්‍යවේ. විභාවිනී ටීකාවෙහි මෙය මෙසේ විස්තර කරයි. “ඉජ්ඣති අධිට්ඨානාදිකං එතායාති. “ඉද්ධි ඉද්ධිවිධ ඤාණං ඉද්ධියා පාදොති= ඉද්ධිපාදො” යනුවෙන් යමකින් අධිෂ්ඨානාදිය සමෘද්ධ වේ නම්, ඒ ඍද්ධිය ද, ඒ ඍද්ධිවිධ ඥාන සංඛ්‍යාත ඍද්ධියට පැමිණීමට පාදවූයේ හෙවත් පිහිටවූයේ ඍද්ධිපාද යයි ද, කියනලදී. පුද්ගලයකුගේ ගුණ ගෞරවයට පිහිට වන ධර්ම ඍද්ධිපාද නමැයි සැකෙවින් දැනගත යුතුය.

ඒ ඍද්ධිපාද ධර්මයෝ සංඛ්‍යා වශයෙන් සතරකි. ඒ බැව් “චත්තාරො ඉද්ධිපාදා ඡන්දිද්ධිපාදො චිත්තිද්ධිපාදො විරියිද්ධිපාදො වීමංසිද්ධිපාදො යනුවෙන් දෙශනා කළහ. අභිධර්ම භාජනියෙහි දක්වන ලදී. සප්තත්‍රිංශත් බොධිපාක්ෂික ධර්මයන්ට අයත් මේ ඍද්ධිපාද චතුෂ්කය ඒ ලොකොත්තර ධර්ම හෙයින් සතර මාර්ගඥාන උපදින කාලයෙහිම නිවන් අරමුණුකොට අන්‍ය බොධිපාක්ෂික ධර්මයන් සමග එන මාර්ගාංගයන් සමග එක මාර්ග චිත්තයෙහිම ලැබේ. ලක්ෂණයෙහිද එසේමය.

පූර්වභාගයෙහි ලෞකික විදර්ශනා අවස්ථාවෙහි පවත්නා කල්හි ඡන්දය ධුරකොට කුසලයන් උපදවන කල ඡන්දිද්ධිපාදයයිද, වීර්ය ධුරකොට උපදනා කල වීරියිද්ධිපාදයයිද, චිත්තය ධුරකොට උපදනා කල චිත්තිද්ධිපාදයයිද, විමංසාව ධුරකොට උපදවනකල වීමංසිද්ධිපාදයයිද, මෙසේ නානා චිත්තයන්හි ලැබෙති. මේ ලොකොත්තර ධර්ම ලෞකික වශයෙන් පවත්නා කල්හි “ඡන්දං” චෙ භික්ඛු අධිපතිං කරිත්වා ලභති සමාධිං ලභති චිත්තස්ස එකග්ගතං අයං

වුච්චති ඡන්දං සමාධි යනාදිය වදාල හෙයින් අධිපති නාමයද ලබති.
සුත්තන්ත භාජනියෙහි මේ ඍද්ධිපාද ධර්මයෝ ඉධ භික්ඛු ඡන්ද සමාධි
පධාන සඞ්ඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති විරිය සමාධි -පෙ-
චිත්ත සමාධි පධාන සඞ්ඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති යනා
දීන් ලෞකික ලොකොත්තර වශයෙන් ම වදාරණ ලදහ. එහි ඡන්ද
සමාධියෙන් හා ප්‍රධාන සංස්කාරයෙන් සමන්විත ඍද්ධිපාදය, වීර්‍ය්‍ය
-පෙ- වීමංසාදියෙන් හා ප්‍රධාන සංස්කාරයෙන් සමන්විත ඍද්ධි
පාදය යන මෙහි විස්තර විභාග එසේමය. පූර්වභාග ඡන්ද වශයෙන්
ඡන්දය හෙතුකොට ඇති හෝ එකාග්‍රතා සඞ්ඛ්‍යාත සමාධිය ඡන්ද
සමාධි නම් වේ. කත්තුකම්‍යතා ඡන්දය අධිපතිකොට ලබන ලද
සමාධියට මේ නමෙකි. මෙහි වනාහි සමාධියට පූර්වභාගයෙහි
ඍද්ධිය ලබම්හයි යන පූර්වභාගයෙහි පැවැති කත්තුකම්‍යතා ඡන්ද
යාගේ වශයෙන් ඡන්දය හෙතුකොට ඇති බවද, උපචාර ධ්‍යානාදි
කුශල චිත්ත සම්ප්‍රයුක්ත ඡන්දයාගේ වශයෙන් ඡන්දාධික වන බවද
පූර්වාභිසංස්කාර වශයෙන්ම සහජාත ඡන්දයාගේ අධික බවද දත
යුතු. ප්‍රධාන භූතවූ සංස්කාරයෝ ප්‍රධාන සංස්කාර නම් වෙත්.
උපන් අකුසලයන්ගේ ප්‍රහාණයද නූපන් අකුසලයන්ගේ අනුත්
පත්ති කෘත්‍යය නූපන් කුශලයන්ගේ උත්පත්ති කෘත්‍යය උපන්
කුශලයන්ගේ ස්ථිති කෘත්‍යය යන චතුර්විධ කෘත්‍යය සිඬකරන
සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයට මේ නමකි.

ඒ ඒ විශෙෂාර්ථය සකස්කරණ හෙයින් සියලුම වීර්‍ය්‍යය ම සංස්
කාරයයි කියනු ලැබේ. චතුර්විධ කෘත්‍ය සාධක සම්‍යක් ප්‍රධාන
වීර්‍ය්‍යයෙන් අන්‍යවූ වීර්‍ය්‍යය මෙහි සංග්‍රහ නොකරණු පිණිස ප්‍රධාන
ශබ්දය වදාලේය. ඒ ඡන්ද සමාධියෙන් හා ප්‍රධාන සංස්කාරයෙන්
යුක්තවූ ඍද්ධිපාදය නම් සවාභිමතය සමෘද්ධවන අර්ථයෙන් හා මේ
ධර්ම ජාතිය නිසා සත්වයෝ අභිවෘද්ධියගේ උසස් භාවයට ගියාහුය
යන මේ ක්‍රමයෙන් හෝ ඍද්ධි" නම් ලබන උපචාර, ධ්‍යානාදී කුශල
චිත්ත සම්ප්‍රයුක්ත ඡන්ද සමාධි පධාන සංස්කාරයන්ට පිහිටවන
අර්ථයෙන් පාදවූ, ඡන්ද සමාධීන් කෙරෙන් බාහිරවූ අවශෙෂ චිත්ත
චෛතසික රාශියයි මෙය විභඞ්ග පාලියෙහි "ඉද්ධිපාදොති" තථා
භූතස්ස වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො" යනුවෙන් වදා
රණ ලදී. සෙසු ඍද්ධිපාදයන්හිද, මේ ක්‍රමය මැයි චිත්තිද්ධිපාදයෙහි
චිත්තාදී ධර්මයන් හැර අවශෙෂ ස්පර්ශ, වෙදනාදි ධර්ම වෙදනාදි
චතුස්කන්ධ වන්නාහු දෙසිතක් එකවරනූපදනා හෙයින් වෙදනාක්ඛ
න්ධො -පෙ-විඤ්ඤාණක්ඛන්ධොයි කීහ. විඥානස්කන්ධය දෙශනාන්තරන
ලද්දේ ඍද්ධි නමින් හඳුන්වන ලද සිත නැවත ඒ ධර්මයට බැඳකවන
බව දන්වනු පිණිස විරියිද්ධිපාදයෙහි විරිය සමාධිපධාන සංඛාර

සමන්නාගතං" යි දෙවරක් වීය්‍යීය සමාධියට විශය නුවූ වීය්‍යාධිපතියයිද දෙවන ප්‍රධාන වීය්‍යීය ඍද්ධිපාදය සමග යෙදෙන අඞ්ගයයිද දක්වනු පිණිසය. හැම තන්හිම යෙදෙන අඞ්ගයෝ සමාධිය ප්‍රධාන සංස්කාරයයි දෙදෙනෙකි. සමාධියට පමණක් විශෙෂණවූ ඡන්දාදීන්ගේ වශයෙන් චතුරිද්ධි පාදයෝ දෙශනා කරණ ලද්දහ. ඡන්දාදීන්ගේ විශෙෂත්වයද ඒ ඒ ඍද්ධිපාද ධම්‍ය්‍යාගේ අවශ්‍ය වශයෙන් ආශ්‍රය කිරීමෙන් වන්නේය.

ඍද්ධිය පිළිබඳ මේ පාද චතුෂ්කය මෙන්ම මේ පිළිබඳව දියයුතු තවත් කරුණු කීපයක්ද ඇත, ඒ නම්:- ඍද්ධිභූමි ඍද්ධිපාද සහ ඍද්ධිමූලයෝද වෙත්. එයින් ඍද්ධිභූමි සතරකි. ඍද්ධිපාද අටකි. ඍද්ධිමූල සොළසකි. එයින් ඍද්ධිභූමි සතර නම්= විවෙකජ භූමියවූ ප්‍රථමධ්‍යානය, ප්‍රීති සුඛභූමියවූ ද්විතීයධ්‍යානය, උපෙක්‍ෂා සුඛභූමිය වූ තෘතීයධ්‍යානය අදුක්ඛ අසුඛ භූමියවූ චතුර්ථධ්‍යානයද වෙත්. මෙයින් ප්‍රථම භූමිත්‍රය සම්භාර භූමිද සතරවැන්න ප්‍රකෘති භූමිද වේ. ඍද්ධිපාද අටකි. ඒ බැවි ඉද්ධියා කතමානි අට්ඨපදානි? ඡන්දඤ්චෙ භික්ඛවෙ භික්ඛුනිස්සාය ලභති සමාධිං ලභති චිත්තස්සෙකග්ගතං ඡන්දො න සමාධි න ඡන්දො, අඤ්ඤො ඡන්දො, අඤ්ඤො සමාධි, විරියඤ්චෙ භික්ඛු -පෙ- චිත්තඤ්චෙ භික්ඛු -පෙ- විමංසඤ්චෙ භික්ඛු නිස්සාය ලභති. සමාධිං ලභති චිත්තස්සෙකග්ගතං විමංසා න සමාධි න විමංසා අඤ්ඤා විමංසා අඤ්ඤො සමාධි ඉමානි අට්ඨපදානි ඉද්ධි ලාභාය -පෙ- ඉද්ධිවෙසාරජ්ජාය සංවත්තන්තීති යනුවෙන් වදරණ ලදී! එනම්- ඡන්ද සමාධි, විරිය සමාධි, චිත්ත සමාධි, විමංසාසමාධි යන අටයි. සොළොස් වැදෑරුම් මූලයන් නම් සොළොස් ආකාරයකින් වන චිත්තයාගේ අකම්පයතායි. ඒ බැවි මෙසේ වදරණ ලදී.

"ඉද්ධියා කතී මූලානි සොළස මූලානි අනොණතං චිත්තං කොසජ්ජෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං අනුන්නතං චිත්තං උද්ධච්චෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං අනභිනතං චිත්තං රාගෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං අනපනතං චිත්තං බ්‍යාපාදෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං අනිස්සිතං චිත්තං දිට්ඨියා න ඉඤ්ජතීති ආනෙඤ්ජං අප්පටිබද්ධං චිත්තං ඡන්දරාගෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං විප්පමුත්තං චිත්තං කාමරාගෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං විසංයුත්තං චිත්තං කිලෙසෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං විමරියාදිකතං චිත්තං කිලෙස මරියාදෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, එකත්ත ගතං චිත්තං නානත්ත කිලෙසෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං සද්ධාය පරිග්ගහිතං චිත්තං අස්සද්ධියෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං විරියෙන පරිග්ගහිතං චිත්තං

කොසජ්ජෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං සතියා පරිග්ගහිතං චිත්තං පමාදෙන ඉඤ්ජතීති ආනෙඤ්ජං, සමාධිනා පරිග්ගහිතං චිත්තං උද්ධච්චෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං පඤ්ඤාය පරිග්ගහිතං චිත්තං අවිජ්ජාය න ඉඤ්ජතීති ආනෙඤ්ජං ඔභාසගතං චිත්තං අවිජ්ජන්ධකාරෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං ඉද්ධියා ඉමානි සොළසමූලානි ඉද්ධිලාභාය -පෙ- ඉද්ධිවෙසාරජ්ජාය සංවත්තන්තීති යනු දෙශනාකළ බැවින්–

1. අනොණත, 2. අනුණ්ණත, 3. අනභිණත, 4. අනුපණත, 5. අනිස්සිත, 6. අප්පටිබද්ධ, 7 විප්පමුත්ත, 8. විසංයුත්ත, 9. විමරියාදිකත, 10. එකත්තගත, 11. සද්ධා, 12. විරිය, 13. සති, 14. සමාධි 15. පඤ්ඤා, 16. ඔභාසගත යන මේ සොළස ඍද්ධි මූලයෝයි.

මෙසේ ඍද්ධීන් පිළිබඳ භූමි, පාද, පාද මූලය යන මේ ධර්මයන් සම්පූර්ණකළ තැනැත්තේ අභිඥා පාදක ධ්‍යානයට සමවැද එයින් නැගිට "සතං හොමි– සතං හොමි (සියයක් වෙමි. සියයක් වෙමි. පරිකර්මකොට නැවත අභිඥාපාදකධ්‍යානයට සමවැද එයින් නැගිට අධිෂ්ඨාන කෙරේද, ඒ අධිෂ්ඨාන චිත්තය සමග සියයක් වෙයි. දහසක් දෙනා මවා ගතයුතුවූ නමුත් එය මේ ක්‍රමයෙන්මය. එය යම් විධියකින් නොසිදුවේ නම් නැවත පරිකර්ම කොට ද්විතීය ධ්‍යානයට සමවැද එයින් නැගිට අධිෂ්ඨාන කටයුතු.

සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධා හොති බහුධාපි හුත්වා එකොහොති ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ පඨවියාපි උම්මුජ්ජ නිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ උදකෙපි අභිජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි පක්ඛී සකුණො ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ මහානුභාවෙ පාණිනා පරාමසති පරිමජ්ජති යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙතීති."

යනුවෙන් දක්වන ලද්දේ ඒ ඍද්ධි විධීහු වෙත්. චූලපන්ථක මහරහතන් වහන්සේගේ කථාව, දේවොරොහණ කථාව, නන්දොපනන්ද නාගරාජ දමනය පිළිබඳ කථාව, මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ කථාව ආදිය මේ ඍද්ධි විධීන් පිළිබඳ නිදර්ශනයෝ

වෙත්, ඡන්ද, විරිය, චිත්ත, විමංසා යන මේ සතර සෘද්ධිපාදයන්ම ධුරකොට ලොකොත්තර ධර්මය නිපදවන්නාහු නොවෙති. සමහර කෙනෙක් කත්තුකම්‍යතා කුසලච්ඡන්දය අවශ්‍ය වශයෙන් නිශ්චය කිරීමට එය ධුරකොටද, සමහර කෙනෙක් වීර්ය්‍ය ධුරකොටද අන් සමහර කෙනෙක් චිත්තය ධුරකොටද, අන් සමහර කෙනෙක් විමංසාව ධුරකොටද, ලොකොත්තර ධර්මය නිපදවති. එයින් රට්ඨපාල ස්ථවිරයන් වහන්සේ ඡන්දය ද, සොණ ස්ථවිරයන් මහන්සේ වීර්ය්‍ය ද, සම්භූත ස්ථවිරයන් වහන්සේ චිත්තයද; මොඝරාජ ස්ථවිරයන් වහන්සේ විමංසාව ද, මේ ලොකොත්තර ධර්මය නිපදවාලීමට ධුර කරගත්හ, යම්සේ තනතුරක් පතා රජ්ජුරුවන් ඇසුරු කොට වසන ඇමතියන් සතර දෙනකුගෙන් එක් ඇමතියෙක් නිතර උපස්ථානයෙහි හටගත් ඡන්දබල ඇත්තේ ඡන්දය නිසා රජු සතුටු කරන්නේ ද, එමෙන් ඡන්දය ධුරකොට ලොකොත්තර ධර්මය උපදවන පුද්ගලයා දතයුතුයි.

එක් ඇමතියෙක් නිතර උපස්ථානය අපහසුය. කෘත්‍යයක් උපන් කල පරුක්‍රමයෙන් සිත්ගනිමියි සිතා ප්‍රත්‍යන්තයක් කිපුණු විට සිය පරුක්‍රමයෙන් සතුරන් මැඩ තනතුරට පැමිණියේ ද එමෙන් වීර්ය්‍ය පූර්වාංගම කොට ලොවුතුරු දහම උපදවන පුහුල් තෙම දතයුතුය. එක් ඇමතියෙක් උපස්ථානයත් ශූරභාවයත් බරෙක්මය, මන්ත්‍ර බලයෙන් සිත් ගනිමියි සිතා මන්ත්‍ර සංවිධානයෙන් රජුන් සිත් ගෙන තනතුරට පැමිණේ ද, එමෙන් චිත්තය අධිපතිකොට ලොකොත්තර ධර්මය උපදවන පුද්ගල තෙම දතයුතුයි. අනෙක් ඇමැති තෙම මේ උපස්ථානාදිය කිරීමෙන් කිසි වැඩක් නැත. රජවරු නම් ජාතිසම්පන්නයාට තනතුරු දෙති. එබඳු අයකුට දෙනුයේ මට දේයයි ජාති සම්පන්නයාම නිශ්‍රයකොට තනතුරට පැමිණියේ ද, එමෙන් විමංසාව ධුරකොට ලොකොත් තර ධර්මය නිපදවන පුද්ගලයා දතයුත්තේය.

යම් කිසිවකු විසින් මේ සෘද්ධිපාද ධර්මයන් වඩනා ලද්දේ නම් කැමැති නම් ආයුෂකල්පයක් ද, වැඩියක් ද, ජීවත්විය හැකි බැවි යස්ස කස්සචි'' ආනන්ද චත්තාරෝ ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා, වත්ථු කථා, අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා සො ආකඞ්ඛමානො ආනන්ද තථාගතො කප්පංවා තිට්ඨෙය්‍ය කප්පාවසෙසංවා'' යන දෙශනාවෙන් පෙනේ. තවද මේ සෘද්ධිපාද ධර්මයන්ගේ ආනුභාවය නන්දෝපනන්ද නාගරාජ දමනයෙන් පැහැදිලි වන බැවින් එය සියල්ලන් විසින් දතගත යුතුයයි කල්පනා කරමි. එබැවින් දැන් අපි ඒ කථාව අසමු.

එක් දවසක් අනේපිඩු සිටුතුමා බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා සවාමීනි! පන්සියයක් දෙනා වහන්සේ සමග සෙට මගේ ගෙදර වලදන්න වඩිනු මැනවයි ආරාධනා කෙළේය. ඒ ආරාධනය පිළිගත් බුදුරජාණන් වහන්සේ පසුදා අළුයම ලොකය බලා වදාල සේක. එසේ ලොකය බලා වදාල උන්වහන්සේගේ ඥාන පථයෙහි නන්දොපනන්ද නම් නාගරාජයා හමුවිය. මේ නාරජුට උපනිශ්‍රය සම්පත්ද ඇති බැව් දැන වදාල උන්වහන්සේ මිථ්‍යාදෘෂ්ටිකයකුවූ නන්දොපනන්දයා දමනය කිරීමට මහමුගලන් රහතන් වහන්සේ සමර්ථබැව් දුටුවේය. එබැවින් පහන්වූ කල්හි පන්සියයක් භික්ෂූන් සමග බුදුරජාණන් වහන්සේ දෙව්ලොව චාරිකාමට වැඩිසේක. මේ දිනයෙහි නන්දොපනන්ද නාගරාජයාගේ ක්‍රීඩා දිනය වෙයි. එබැවින් ආපාන භූමියද සරසන ලද්දේය. දිව්‍යමය රත්න පර්‍ය්‍යංකයක දිව සේසත්යට හිඳගත් නන්දොපනන්ද නාරජු තුන්වැදෑරුම් නළුවන් විසින්ද නාගයන් විසින්ද පිරිවරණ ලදුව දිව්‍යමය භාජනයන්හි එලවා තැබූ නොයෙකුත් ආහාර පානවර්ග බලමින් සිටියේය. එකල බුදුරදුන් තමන් සහ භික්ෂු පිරිස මේ නාගරාජයාට පෙනෙන පරිදි ඔහුගේ විමන මතුයෙන් දෙව්ලොවට වඩනා ලදී.

බුදුන් ඇතුලු භික්ෂු පිරිස දුටු නාරජ මේ හිසමුඩුකල ශ්‍රමණයෝ අප හිස්මුදුනින් දෙව්ලොවට වඩිති, පෙරළාද වඩිති. අද පටන් මොවුන්ට අපේ හිස උඩ පියපස් වගුරුවන්ට නොදෙමියි රැහැණිව සවකීය ආත්මභාවය අත්හැර මහාමේරු පර්‍වතය සිය දරණ වැලින් සත්වරක් වෙලා මහාමෙර මුදුනෙහි පෙණය තබා තව්තිසා දෙව්ලොව වසාගෙණ සිටියේය. මෙහිදී රට්ඨපාල මහරහතන් වහන්සේ තව්තිසා දෙව්ලොව නොදැක බුදුරදුන්ගෙන් සවාමීනි පෙරදවස්වල නම් මෙහි පැමිණිවිට මහමෙර, තව්තිසාව, වෛජයන්ත ප්‍රාසාදය, දුටුයෙමි. එහෙත් අද එය නොපෙනේ. එයට පිළිතුරු දුන් උන්වහන්සේ රට්ඨපාලය! මේ නන්දොපනන්දයා තොපට අපට කිපී මහමෙර සත්වරක් වෙලා හොත්තේ යයි පිළිතුරු දුන්හ. රට්ඨපාල මහරහතන් වහන්සේ නන්දොපනන්ද නාගරාජයා දමනය කිරීමට අවසර ඉල්ලූ නමුදු බුදුරජාණන් වහන්සේ අවසර නුදුන්හ. සෙසු සියලුම භික්ෂූන් වහන්සේලාද එසේම අවසර ඉල්ලූහ. එහෙත් ඒ කිසිවකුට අවසර නුදුන්හ. අන්තිමේදී මහර්ධිමත් මහ මුගලන් රහතන් වහන්සේ අවසර ඉල්ලූවිට "දමෙහි මොග්ගල්ලාන" යනුවෙන් උන්වහන්සේට අවසර දුන්හ. උන්වහන්සේගේ සිය අත්බැව අත්හැර විශාල නාගරාජ වෙශයක් මවා නන්දොපනන්දයා පෙලන්නට විය. මෙහිදී නාගරාජයා දුමන්නට විය. මුගලන් තෙරණුවෝද දුමන්නටවූහ. මුගලන් මහ තෙරුන්ගේ දුමින් නාරජුට විනා නාරජුගේ දුමින් තෙරණුවන්ට කිසි පීඩාවක් නැත

ඉක්බිති නාරජ ගිනි පිටකෙළේය. තෙරණුවෝද ගිනි පිට කළහ. මුගලන් මහ තෙරුන්ගේ ගින්නෙන් නාරජුට පීඩා නාරජුගේ ගින්නෙන් තෙරණුවන්ට කිසි පීඩාවක් නොවිය. මෙසේ පෙළීමට පත් නාරජ ඔබ කවරෙක්දැයි විචාළේය. එවිට තෙරණුවෝ මම මුගලන්යයි පිළිතුරු දුන්හ. එසේනම් ස්වකීය වේශයෙන් සිටින්නැයි එවිට නාරජ කීය. මහ මුගලන් තෙරණුවෝද ඒ නාග වේශය අත්හැර භික්ෂු වේශයෙන් සිට නාරජුගේ දකුණු කන් සිදුරෙන් ඇතුලුව වම් කන්සිදුරෙන් නික්මෙන්නවද, වම් කන්සිදුරෙන් ඇතුලුව දකුණු කන්සිදුරෙන් නික්මෙන්නවද වූහ. මෙසේ දෙනාසාපුටයන්ගෙන්ද, පිවිසෙන්නටත් නික්මෙන්නටත් වූහ. එවිට නාරජ මුඛය විවෘත කෙළේය. එකෙණෙහිම තෙරණුවෝ නාරජුගේ මුවදෙරින් පිවිසි කුස ඇතුලෙහි ඔබ මොබ සක්මන් කරන්නටවූහ. මෙහිදී බුදුරජාණන් වහන්සේ මුගලන් තෙරණුවන්ට කල්පනාකාරීවිය යුතුය. නාරජ මහාසෘද්ධි ඇත්තේයයි වදාළසේක. එවිට මුගලන් තෙරණුවෝ බුදුරදුන්ට මෙසේ පිළිතුරු දුන්හ.

මය්හං බො භන්තෙ චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා, පරිචිතා සුසමාරද්ධා, තිට්ඨතු භන්තෙ නන්දොපනන්දො, අහං නන්දොපනන්ද සදිසානං නාගරාජානං සතමපිසහස්සමපි සතසහස්සමපි දමෙය්‍යං"

යනුවෙන් ස්වාමීනි! මවිසින් සතර ඍද්ධිපාදයෝ වඩන ලදහ. එබැවින් නන්දෝපනන්දයා නොව ඔහු වැනියන් සියයක්, දහසක්, ලක්ෂයක් වුවත් දමනය කරන්නෙමියි පිළිතුරු දුන්හ. පසුව මුගලන් හිමියන් සිය මුවතුලින් නික්මෙන විට දළ අතරෙහිලා තෙරපන්නෙමියි සිතූ නාගරාජයා නික්මෙවයි මගේ කුසතුළ ඔබමොබ සක්මන් නොකරවයි කීහ. තෙරණුවෝද, ඔහු මුවතුළින් නික්මී ඉදිරියෙහි සිටියහ. එවිට නාරජ දරුණු විසවාතයක් නිකුත් කෙළේය. මුගලන් තෙරණුවෝ චතුර්ථධ්‍යානයට සමවැදුණේය. එබැවින් උන්වහන්සේගේ ලොම්කූපයකුදු සොලවන්නට නාරජුට නොහැකිවිය. තමන්ගේ ඒ දරුණු විසවාතයෙන් ලොම්කූපයකුදු නොසෙල්වෙන බැවින් උන්වහන්සේ මහර්ධිමත්යයි නාරජ සිතීය පසුව උන්වහන්සේ ගුරුළු වෙසයක් මවාගෙන නන්දෝපනන්දයා ලුහුබැන්දේය. නාරජ බියවී "භන්තෙ තුම්හාකං සරණං ගච්ඡාමි" තුඹවහන්සේ සරණ යමියි කීය. එවිට උන්වහන්සේ බුදුන් වැඩිය බැව් දන්වා උන්වහන්සේ සරණ යන්නට කීහ. පසුව නන්දෝපනන්ද බුදුන් සරණ ගියේය. "සුඛීහොහි නාගරාජ"යි බුදුහු නාරජුට සුවපැතූහ. එද දන්වැළදීමට අනේපිඩු සිටාණන්ගේ ගෙදරට

බුදුරජාණන් වහන්සේ සහපිරිවරින් වඩින විට කාලය වෙනදාට වඩා දවල්විය. මෙසේ දවල්වීමට හේතුව කිම්දැයි ඇසූ අනේපිඬු සිටාණන්ට බුදුරජාණන් වහන්සේ මොග්ගල්ලාන නන්දෝපනන්ද සටන එයට හේතුව බැව්ද, එයින් නන්දෝපනන්දයා පැරදුනු බවද, මුගලන් තෙරහු ජයගත් බැව්ද දන්වූහ. එයින් සතුටුවූ අනේපිඬු සිටුතුමා සත්දවසක් බුදුපාමොක් පිරිසට මහදන් පැවැත්විය, මේ නන්දෝපනන්ද නාගරාජ දමනය චතුර්විධ ඍද්ධිපාදයන් වැඩීම නිසා කළහැකිවිය. මෙහිදී මහා ආත්මභාවයන් මුගලන් මහ රහතන් වහන්සේ මවාගන්නා ලදී. එය ඍද්ධිපාදයන් වැඩීම භාවිත කිරීම් ආදිය නිසාය.

මේ ඍද්ධි නාමය හා ඍද්ධිපාදනාමය ද සම්මෝහ විනෝදනී විභඞ්ග අටුවාහි දක්වන ක්‍රමය මීලඟට අප විසින් දත යුතුය. එහි ඡන්ද සමාධි පධාන සංඛාරයන ධර්මත්‍රය ඍද්ධිපාදද වෙත්. අව ශෙෂ සම්ප්‍රයුක්තක වෙදනාස්කන්ධ සතර ඍද්ධිපාදයෝ මැයි, වීර්‍ය -පෙ- චිත්ත -පෙ- වීමංසා සමාධි පධාන සඞ්ඛාර යන ධර්ම තුන ඍද්ධිද ඍද්ධිපාදද වෙත්. සෙසු එක්ව යෙදෙන ස්කන්ධ සතර ඍද්ධිපාදයෝ වන්නාහුය. මේ වනාහි අභෙදයෙන්වූ පිළිවෙළයි භෙද වශයෙන් වනාහී ඡන්දය ඍද්ධිය වේ. ඡන්ද ධුරයෙන් වඩනා ලද භාවිතා කරනලද බහුලීකෘත ස්කන්ධ සතර ඍද්ධිපාදයි. සමාධි පධාන සංඛාර යන ධර්මදෙක සංස්කාර ස්කන්ධ වශයෙන් සතර ඡන්දිද්ධිපාදයෙහි ඇතුලත්වේ. ඍද්ධියව පධාන සංඛාර යන ධර්මදෙක සංස්කාර ස්කන්ධ වශයෙන් ඡන්දිද්ධිපාදයෙහි ඇතුළත් වේ. එහි සමාධිය ඍද්ධිය වේ. සමාධි ධුරයෙන් වඩනා ලද ස්කන්ධ සතර සමාධිර්ද්ධිපාදයයි ඡන්දය ප්‍රධාන සංස්කාරය යන දෙක සංස්කාර ස්කන්ධ වශයෙන් සමාධිර්ද්ධිපාදයෙහි වැළඳ ගනී.

එහිම පධානසංඛාරය ඍද්ධියයි පධාන සංඛාර ධුරයෙන් වඩ නාලද වෙදනාදි අරූපස්කන්ධ සතර පධාන සංඛාරිද්ධිපාදයි. ඡන්ද සමාධි ධර්මදෙක සංස්කාරස්කන්ධ සමන්විත ඍද්ධිපාදයාගේ භෙද කථාව මෙන් අන්‍ය ඍද්ධිපාදයන් බේද, භෙද ය පිළිබඳ විස්තරය මෙසේම දතගන්නේය. ඡන්දාදීන් හා එක්ව යෙදෙන වෙදනාදි ස්කන්ධ සතර ඍද්ධිපාදයෝම වෙත්මැයි.

එසේම පූර්වභාගය ඍද්ධිපාදය කියාද, ප්‍රතිලාභය ඍද්ධිය කියාද දතයුතුයි. ඍද්ධිය ලැබීමට ඍද්ධිපාදය පිහිට වෙන බැවිනි මේ අර්ථය උපචාරයෙන් හෝ විදර්ශනාවෙන් දක්විය යුත්තේය ප්‍රථමධ්‍යාන පරිකර්මය ඍද්ධිපාද නම් වේ. ප්‍රථමධ්‍යානය ඍද්ධි නම් වේ. විතීයධ්‍යානය, තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානය, ආකාශා

නඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය, සෘද්ධි නම්. ශ්‍රොතාපත්ති මාර්ගයට විදර්ශනාව සෘද්ධිපාද වේ. ශ්‍රොතාපත්ති මාර්ගය සෘද්ධිය වේ. සකෘදාගාමී, අනාගාමී, අර්හත් මාර්ගවලට විදර්ශනාව සෘද්ධිපාද වේ. සකෘදාගාමී මාර්ගය, අනාගාමී මාර්ගය, අර්හත් මාර්ගය සෘද්ධි නම් වේ. මෙසේම මීට සමාන අර්ථයෙක් "උපචාරජ්ඣානය" පාදෙ පඨමජ්ඣානා ඉද්ධි ස උපචාර පඨමජ්ඣානං පාදෙ දුතියජ්ඣානං ඉද්ධීති එවං පුබ්බභාගෙ පාදෙ, අපරභාගෙ ඉද්ධීතියි සුමඞ්ගල විලාසිනී ජනවසභ සූත්‍ර අටුවාවෙහි දක්වනලදි. හැමතැනම සමෘද්ධිවීම අර්ථයෙන් සෘද්ධිය කියාද, ඒ අර්ථය ලබාගැනීමට පිහිටවීම අර්ථයෙන් පාද කියාද කියනු ලැබේ. මේ සෘද්ධියට කී පාද සතර මෙන්ම අභිඥා නම්වූ සෘද්ධිය භේද භූමිවූ සතර දෙනෙක්ද, පාද අටදෙනෙක්ද, සොළොස් මුල් කෙනෙක්ද වදුරණ ලදී. විස්තරාර්ථීන් විසින් පටිසම්භිදා මාර්ගයෙන් හෝ විශුද්ධි මාර්ගයෙන් දතයුතුයි. මෙහිද, එය මීට පෙර සැකෙවින් දක්වන ලදී. මේ සෘද්ධිපාද අතුරෙන් ඡන්දය හා චිත්තය බොධිපාක්ෂික ධර්මයන් අතුරෙහි ඡන්දිද්ධිපාදය චිත්තිද්ධිපාදය වශයෙන් එක් වැදෑරුම්වේ. අන් කොටසක් ආශ්‍රය නො කරයි. වීර්‍ය්‍ය වනාහි සෘද්ධිපාද වශයෙන් හා චතුසම්මප්පධාන ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මග්ගඞ්ග වශයෙන්දැයි නවවැදෑරුම්වේ.

මේ සෘද්ධිපාද ධර්මයන් බුද්ධත්වය ලබාදීමෙහි ආධාර වන සප්ත ත්‍රිංසද් බොධිපාක්ෂික ධර්මයන්ට අයත් බැවින් බුද්ධත්වය ලබා ගැනීමට ද ඉවහල් වේ ඒ ආර්‍ය්‍යමාර්ග ඥානාවබොධයට උපකාර කරන මේ සෘද්ධිපාදයින්ගෙන් අද අපට නියමිත චිත්තිද්ධිපාදය පිළිබඳ මේ වනතුරු ප්‍රමාණවත් විස්තරයක් අප විසින් ප්‍රකාශකළ බැවින් එය මේ පිරිසට වැටහෙන්නට ඇතැයි සිතමි. චිත්තිද්ධිපාදය පිළිබඳව මෙන්ම සෙසු සෘද්ධිපාදයන් පිළිබඳවද මෙහි දැක්වූ විස්තරය අසාබලා දැනගැනීමෙන් සහ නොදන්නා කරුණු ධර්මධර මහාස්ථවිරයන් වහන්සේලාගෙන් සහ ධර්ම පුස්තක මගින් දැනගැනීමෙන් මේ පිළිබඳ විස්තරය දතයුතුය. එසේම මෙබඳු ගැඹුරු කරුණු පැයක් පමණ සුළුකාලයක් තුළ ඇසීමෙන් පමණක් තේරුම් ගැනීම අපහසුයයි සිතමි. එබැවින් මේ ගැඹුරු ධර්මකොට්ඨාශයන් පිළිබඳව චිර භාවිතය අවශ්‍යයෙන් උවමනාය. සෘද්ධිපාද ධර්මයන් පිළිබඳ වැඩි විස්තර විශුද්ධිමාර්ගයේ ඉද්ධිපාද විස්තරයෙන් හෝ විභංග ප්‍රකරණයෙන් සහ එහි අටුවාවෙන්ද උගත යුතුය.

එසේ උගෙන මෙලොව ජීවිතය සහ පරලොව ජීවිතය සාර්ථක කරගෙන ත්‍රිවිධ බොධීන්ගෙන් එක්තරා බොධියකින් නිවන් සැප පතාගත යුතුයි. මෙපමණකින් චිත්තිද්ධිපාදය පිළිබඳ අපේ ධර්ම දේශනාව අවසාන කරමි.

සියලු සත්වයෝ සුවපත් වෙත්වා.

මොරටුවේ සුධර්‍මාරාම වාසී ගොරකානෙ පණ්ඩිත ශ්‍රී
පෙමරතන ස්වාමිපාදයන් වහන්සේ විසින්
පවත්වනලද ධර්‍මදෙශනාව.

## විරියිද්ධිපාදය.

**කථඤ්ච භික්ඛු විරිය සමාධි පධානසඞ්ඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති? විරියං චෙ භික්ඛු අධිපතිං කරිත්වා ලභති සමාධිං ලභති චිත්තස්ස එකග්ගතා අයං වුච්චති විරිය සමාධි, සො අනුප්පන්නානං -පෙ- චිත්තං පග්ගණ්හාති පදහති.**

**ඉමෙ වුච්චති පධාන සංඛාරා ඉති අයංච විරිය සමාධි ඉමෙච පධාන සංඛාරා, තදෙකජ්ඣං අභිසඤ්ඤූහිත්වා අභිසංඛිපිත්වා විරිය සමාධි පධාන සංඛාරො තෙවච සංඛං ගච්ඡති.**

සුපින්වතුනි, ධර්‍මශ්‍රවණය සඳහා සන්සුන් අයුරින් සැරසී සිටින මෙම පිනැතියන් බණ ඇසීමේ ඇති අගය දන්නවාට සැක නැත. එනමුදු මේ වේලාවේදී ධර්‍මශ්‍රවණයෙන් ලැබෙන ප්‍රයෝජනය ඇසීමෙන් නිදිමත ආදී කෙලශයනට වසඟ නොවී බණ ඇසීමටද අසන බණ සිත්හි ධාරණය කරගැනීමටද හේතුවන බැවින් එයට රුචිකරවීමේ අදහසින් කරුණු ටිකක් ප්‍රකාශ කිරීමට කල් පනා කරමි.

**පරියත්තිං විනා ධම්මො න තිට්ඨති කුදාචනං**
**සවනං විනා පරියත්තිං තස්මාහි සවනංවර.**

යන ගාථාවෙන් ප්‍රතිපත්ති ප්‍රතිවේධ යයි කියන ලද ධර්‍මය පර්‍ය්‍යාප්තියෙන් තොරව කිසිකලෙකත් නොපවතියි. ශ්‍රවනයෙන් වෙන්ව පර්‍ය්‍යාප්තිය නොපවතියි. එබැවින් ඇසුම උතුමැයි වදාළහ.

පරියත්ති යනු සූත්‍ර අභිධර්‍ම විනය යන පිටකත්‍රයට නමකි. පෙරවූසු ලක්වැසි පිනැති බෞද්ධයෝ සියදිවි පුදා ධර්‍මය ආරක්‍ෂා කළහ. දහස් ගණන් ලැබූ මිසදිටු පරසතුරු උවදුරු වලින් නොනැසී මේ තාක් ධර්‍මය පවත්නේ පෙර විසූවන්ගේ ආත්ම පරිත්‍යාග යන් නිසාමය.

කම්පල අදහන උපාසක උපාසිකා පිරිසද ඒකාන්තයෙන්ම ධර්‍මයාගේ චිරස්ථිතිය සිය දිවි නොතකා වුවද පතනවා ඇත. එසේ

සද්ධර්මයාගේ බොහෝ කල් පැවැත්ම රුචිකරන්නන් විසින් රාගාදී කෙලෙසුන්ගෙන් දුරුවී සසර දුකින් නිදහස්වීමේ අදහසින්ම ධර්ම ශ්‍රවණය කළයුතුය. බණ දහම් ඉගෙනගත යුතුය. එය නිස්සරණ පර්‍ය්‍යාප්තියට වැටෙයි. මෙ වැනි අදහසින් යුතුව අසා උගෙන ගන්නා සියලු දෙනාටම දෙව් මිනිස් සැප හා නිවන් සැප ලබා ගැනීම දුෂ්කර වූවක් නොවේ.

ධර්මයෙන් වෙන්ව සමස්ත ලෝකයටම එකම අධිරාජයා වුවද වැඩක් නැත. සමහරවිට මෙලොවදීම දුක්ඛ දෞර්මනස්‍ය අවස්ථාවන් රැසකට මුහුණපාන්ටද පරලොවදී එකාන්තයෙන් ඔහුට අපායගාමී වන්නට සිදුවනු නො අනුමානය. ධර්මයට එකගව රුක්මුලක විසු මද, අධර්මරාජ්‍යයට වඩා දෙලොවම සැපදායකය, දෙලොවම වැඩ සලසන සසර දුකින් නිදහස් කරණ මෙම උතුම් ධර්මය හොඳින් ඇසීම, පුරුදු පුහුණු කිරීම, ධර්මය බොහෝ කල් පැවැත්මට දෙන බලවත් රුකුලකි.

පර්‍ය්‍යාප්තිය නම්වූ සම්බුද්ධ ධර්මය ලොව පැතිරවීම නම් දහම් දෙසුම් ඇසුම් පැවැත්වීමෙන් හෝ දහම් පොත් ඉගැන්වීම් දහම් පොත් මුද්‍රණවාරයෙන් විසුරුවා හැරීම වශයෙන් හෝ පුවත්පත් සගරා මගින් සදහම් ලිපි පලකිරීමෙන් හෝ පෙලපොත් හෙල බසින් හෝ අන් බසකින් රටවැසියනට පහසුවෙන් තේරුන්ගත හැකි පරිදි පරිවර්තනය කරවීම් ආදියෙන් හෝ කළහැකිය.

දහස්ගනන් චෛත්‍යයෝ වත් ප්‍රතිමාගෘහයෝවත් ශ්‍රද්ධාවනන යන්ගේ වන්දන මානනාදියට උපකාර වනු මිස ලෙව්වැසියා දහම් හී යෙදීමට සැදුහැවත් කිරීමට නොපොහොසත් වෙති. ධර්මදානය වූකලි ඒ සෑම ක්‍රමයකින්ම සැලසීමෙහි අතිශයින් සමර්ථ වේ. එහෙයින්ම:-

අක්ඛරං එක මේකංච–බුද්ධරූප සමංසියා
තස්මාහි පණ්ඩිතො පොසො–ලිඛෙය්‍ය පිටකත්තයං හි.

පුරාතන පිටකත්‍රය ධාරීන් වහන්සේ කීහ. බණ පොතක එක අකුරක් බුද්ධරූපයක් හා සමානය. එබැවින් නුවණැති තැනැත්තේ ත්‍රිපිටක ධර්මය ලියා තබන්නේය යනු ඒ ගාථාවේ භාවයයි. මේ ගසින් මහා චෛත්‍යයන් තැනීමට වඩා පර්‍ය්‍යාප්ති වර්ධනය ලොවැස් සතට දෙලොවින්ම අභිවෘද්ධදායක බව වැටහෙනවා ඇත. කාරුණ්‍ය මෙසේ බැවින් දෙශනා කරුණු ලබන මෙම ධර්මයන් මුද්‍රණය කොට ධර්මපුස්තකයක් මෙන් සකස්කොට විසුරුවා හැරීම පර්‍ය්‍යාප්ති ධර්මය වර්ධනය කිරීමට උදාර සේවයක් කලානම් වෙනවා ඇත. ධර්මශ්‍රවණ යෙන් ලැබෙන ප්‍රයෝජනය සඳහා මා අදහස්කළ කරුණු ටික මෙතෙකින් අවසාන කරමි.

අනතුරුව මුලින් මා ප්‍රකාශ කල මාතෘකාවේ අදහස සැකෙවින් පවසමි. ඒ මෙසේයි.

යෝගාවචර භික්ෂු තෙමේ වීර්‍ය්‍ය නිසා පැවති සමාධිය ප්‍රධාන කොට ඇති සංස්කාරයන්ගෙන් යුක්තවූ ඍද්ධිපාදය කෙසේ නම් වඩයිද? ඉදින් යෝගාවචර භික්ෂු තෙමේ වීර්‍ය්‍යය අධිපති ප්‍රත්‍යය කොට මනාව පිහිටුවීම නම්වූ සමාධියක් ලබයිද, කුසල් සිතේ එකඟ බවක් ලබයිද මෙය විරිය සමාධියයි කියනු ලැබේ. ඒ යෝගාවචර භික්ෂු තෙමේ තමාගේ සිත් සතන්හි නූපන්නාවූ ලෝභාදී ලාමක අකුසල ධර්මයන්ගේ නූපදවීම පිණිසද සව සන්තානයෙහි නූපන් කුසල් උපදනා පිණිසද, තම සිත්සතන්හි පහළවූ අලෝභාදී කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිසද, වීර්‍ය්‍ය පටන් ගනීද, සහජාත වීර්‍ය්‍යයෙන් සිත ඔසවා ගණීද, ප්‍රධන් වීර්‍ය්‍ය කෙරෙයිද.

මොව්හු (මේ සතර සම්‍යප්‍රධාන වීර්‍ය්‍යයෝ) ප්‍රධාන සංඛාරයයි කියනු ලැබේ. මෙසේ මේ විරිය සමාධියද මේ චතුර්විධ සංඛාරයෝ යන මේ සියල්ල එක්රැස්කොට විශේෂයෙන් හකුළුවා විරිය සමාධි ප්‍රධාන සංඛාරයයි යන ව්‍යවහාරයට යෙයි.

එහි වීර්‍ය්‍යය නම් කවරේද? චෛතසිකය පිළිබඳවූ යම් වීර්‍ය්‍යාරම්භයක් වේද පීනම්ඩාදී නීවරණයන්ගෙන් මිදීම වශයෙන් පවත්වන යම් නික්ඛමයක් වෙයිද? කෙලෙස් බැඳුම් සිඳීම වශයෙන් පවත්නා යම් පරක්කම යක් වෙයිද කෙලෙස් සැඩපහරින් එතර වීම් වශයෙන් පවත්නා යම් උය්‍යාමයක් වේද, බව සයුරින් එතරව පරතෙරට යාම වශයෙන් පවත්නා යම් වායාමයෙක් වෙයිද, පෙරටුකොට යාම් වශයෙන් පවත්නා යම් උස්සොල්හියක් වෙයිද, සපිරව පවත්නා හෙයින් හෝ සෝක නැමැති කනයම ගැලවීම් වශයෙන් හෝ පවත්නා යම් ථාමයක් වේද, නොසිඳ පැවතීම වශයෙන් කුසල සන්තානයක් දරන්නේනුයි පවත්නා යම් ධිතියක් වෙයිද ලිහිල් නොවූ දැඩ වීර්‍ය්‍යය යන අර්ථයෙන් පවත්නා යම් අසිථිලපරක්කමතාවයක් වෙයිද කුසලකර්ම කිරීමට පටන්ගත් අවස්ථාවේ පටන් එම වීර්‍ය්‍ය ධුරය බිම නොතබා පවත්නා යම් අනික්ඛිත්තධුරතාවයක් වෙයිද නොපසුබස්නා සිත් ඇති බවට පමුණුවන හෙයින් පවත්නා යම් ධුරසම්පග්ගාහයක් වෙයිද, කුසීත කමින් තොසැලීම වසයෙන් පවත්නා යම් විරිය බලයක් වෙයිද නිවැරදි උත්සාහයන් කිරීම් වශයෙන් පවත්නා සම්මාවායාමයක් වෙයිද! මේ වීර්‍ය්‍ය යයි කියනු ලැබේ.

එහි සමාධිනම් කවරේද චිත්තයාගේ යම් පැවැත්මක් අරමුණෙහි සිත මනාකොට පිහිටුවීමක් අරමුණ මැඩගෙන උඩවට

විචිකිච්ඡා වශයෙන් පැවැත්තාවූ වශ ආහාර ප්‍රතික්ෂෙප කිරීම් වශයෙන් පැවැත්මක් එක අරමුණෙක චිත්තචෛතසිකයන් මනාකොට පැවැත්මක් විවේකයයි කියනලද නොයෙක් ආලම්බනයන්හි බහාලන බව නැසීමක් නො විසිරෙන සිත් ඇති බවක් චිත්ත අධිකරණ සබ්බසඞ්ඛාර යන ත්‍රිවිධ සමථයන්ගෙන් චිත්ත සමථයක් චිත්ත සමාධියෙහි ප්‍රධාන බවක් සිත කම්පා නොවන බවක් නෛර්‍යාණික සමාධියක් වෙයිද, මෙය සමාධියයි කියනු ලැබේ.

එහි ප්‍රධාන සඞ්ඛාර නම් කවරේද; චෛතසිකයන් පිළිබඳවූ යම් වීර්‍යාරම්භයක් වේද; -පෙ- සම්‍යක් ව්‍යායාමයක් වේද; මෙය පධානසංඛාරයයි කියනු ලැබේ. මෙසේ මේ වීර්‍යයෙන්ද, සමාධියෙන්ද; පධාන සඞ්ඛාරයෙන්ද යුක්ත වූයේ වෙයි, සම්පූර්ණවූයේ වෙයි, එළඹියේ වෙයි, මොනවට එළඹියේ වෙයි, උපන්නේ වෙයි, මොනවට උපන්නේ වෙයි, සමන්විතවූයේ වෙයිද? එබැවින් විරිය සමාධි පධාන සඞ්ඛාරයෙන් සමන්විත වූයේ යයි කියනු ලැබේ.

ඉද්ධි යනු යම්බඳු ඒ අභිමත ධර්මයන්ගේ ඉටුවීම්, සිදුවීම් අර්ථයෙන් ඉද්ධි නම්. ලැබීමට බලාපොරොත්තුවූ ධර්මයන්ගේ නො අඩුව ලැබීම සමෘද්ධි නම්. ලැබීම, නැවත නැවත ලැබීම, අධිගමය හෝ පැමිණීමක් වේද, ප්‍රතිලාභ වශයෙන් වැඩියක් එළඹීමක් වේද, එය සෘද්ධි නම්.

ඉද්ධිපාද- යනු එබඳු වූවහුගේ වේදනාස්කන්ධය සංඥාස්කන්ධය සංස්කාරස්කන්ධය, විඥානස්කන්ධය යන මොහු වෙති.

ඉද්ධිපාදං භාවෙති යනු, ඒ ධර්මයන් සේවනය කරයිද, වඩයිද නැවත නැවත වඩයිද එබැවින් ඉද්ධිපාද වඩායයි කියනු ලැබේ.

විභඞ්ගප්‍රකරණයෙහි "විරියිද්ධිපාදය" පිළිබඳව විස්තර වන දෙශනා පාළිය පළමුකොට මාතෘකා වශයෙන් ප්‍රකාශ කෙළෙමි. එම ධර්මකොට්ඨාශයේ භාවාර්ථයද ප්‍රකාශ කෙළෙමි. එයට වඩා මද විස්තරයක් කිරීමට දැන් අවස්ථාවය.

විරියං චෙ භික්ඛු අධිපතිං කරිත්වා- යනාදී වශයෙන් විරිය අධිපතිකොට ලබන කුසල් සිතේ එකඟ බවයයි ප්‍රකට සමාධියට විරිය සමාධියයි වදාළසේක. සමාධියේ ප්‍රභෙදයන් දක්වෙන විසුද්ධිමාර්ගයෙහි චිත්තෛකාග්‍රතා වශයෙන් එක්වැදෑරුම් යයිද; ලෞකික ලෝකොත්තර උපචාර, අර්පණා යනාදි වශයෙන් දෙවැදෑරුම්යයිද දක්වා පිළිවෙලින් සිව්වැදෑරුම් ප්‍රභෙදයන් දක්වීමෙහිදී සැවැනි චතුෂ්කයෙහි විරිය අධිපතිකොට සිතේ යම් එකඟ බවක් ලබාද එය විරිය සමාධියයි සඳහන් විය සමාධිය නොමැතිව කිසිසේත් සමථවිපස්සනා භාවනාවන්ගෙන් ලෞකික ලෝකොත්තරවූ හෝ ඵලයක් ලබාගැනීමට නුපුළුවන.

යෙසා අනුප්පන්නානං පාපකානං– යනාදී වශයෙන් විස්තර වෙන සතර සම්‍යක් ප්‍රධාන වීර්‍යයට පධාන සංඛාරයයි මෙහි නම් කළහ. සිය සිත්සතන්හි පහළනොවූ, ලාමක වූ, අදක්‍ෂ බැවින් උපන් රාගාදී තුන් අකුසල් මුල්ද, කාමච්ඡන්දාදී පඤ්ච නීවරණ අකුශලයන්ද සිත්හි පහළ නොවීම පිණිස කැමැත්තක් උපදවා ගනීද ප්‍රයොගයක් කෙරෙයිද, කායික චෛතසික වීර්‍යාරම්භයක් කෙරෙයිද, එම සහජාත වීර්‍යයෙන් සිත ඔසවා තබා ගනියිද පධන් වීර්‍ය කෙරෙයිද, සිත්හි පහළවූ ලාමකවූ ලොභාදි අකුසලයන්ගේ පහ කිරීම පිණිස කුසල් සිතේ යම් කැමැත්තක් උපදවා ගනීද ඒ සඳහා යම් ව්‍යායාමයක් කෙරේද; –පෙ– සිත්සතන්හි පහළ නොවූ අලොභාදි අකුශල ධර්මයන්ගේ පහළවීම පිණිස කුසල් සිත්හි කැමැත්තක් උපදවයිද උත්සාහ කරයිද; –පෙ– සිත්හි පහළවූ ලොභාදී අකුශල ධර්මයන්ගේ පැවැත්ම පිණිසද නොනස්නා පිණිසද නැවත නැවත වැඩීම පිණිසද කුසලච්ඡන්දයක් උපදවාගණීද, ප්‍රයොග පරාක්‍රමයක් කරයිද –පෙ– යන මෙබඳු ගුණයන්ගෙන්යුත් ධර්මයන් සතරට පධාන සංඛාරයයි වදාළහ.

මෙම ප්‍රධන් වීර්‍යය ලෞකික ලොකොත්තර වශයෙන්*දෙවැදෑරුම් වේ. මෙහි නූපන් අකුසල් නම් අසමුදාචාර වශයෙන් හෙවත් කෙලෙසුන්ගේ හැසිරීමට අවකාශ නොලැබීමෙන් නූපන් අකුසල්ය. කෙලෙසුන්ගේ හැසිරීමට අවකාශ නොලැබෙන්නේ වත්පිළිවෙත්හි යෙදීම් ග්‍රන්ථධුර විපස්සනා ධුරයන්හි යෙදීම් ආදී වශයෙනි ඒ ඒ අවස්ථායෙහි කෙලෙසුන්ගේ හැසිරීමට අවකාශ නොලැබීමෙන් නූපන් අකුශල් මිස අනමතග්‍ර සංසාරයෙහි නූපන් අකුසල් නම් නැතැයි කිවහැකිය.

නූපන් කුසල් නම් සමථ විදර්ශනාමාර්ග ධර්මයෝයි. ලෞකිකවූ සමථ විදර්ශනාමාර්ග වශයෙන් උපන් කුසල ධර්මයන්ගේ වැනසීම පිරිහෙයි. නිදසුන් වශයෙන් කැලණි වෙහෙර මැද වැඩමකළ භික්ෂූන් තිස්නමට වනමගදී හමුවූ කාලීන් ධ්‍යානලාභීව සිට පිරිහී ගිහිවූ දුගී මිනිසාගේ පුවත ආදී කථාවන් දතගත යුතුය. සතර සම්‍යක් ප්‍රධාන වීර්‍යය පිළිබඳව වෙන වෙනම අසා ඇත.

එකී පධාන සංඛාරයද කලින් ප්‍රකාශකළ විරිය සමාධියද එකතුකලවිට විරියසමාධි පධාන සංඛාර යන ව්‍යවහාරයට යෙයි.

මෙම දෙශනා පාළියෙහි විරිය පිළිබඳව විශෙෂ විස්තරයක් කිරීමට ආරම්භකොට “යො චෙතසිකො විරියාරම්භො –පෙ– සම්මා වායාමො ඉදං වුච්චති විරියං” යනුවෙන් දෙශනාන්තර වදාළහ. මෙහි එක එක පදයක් පාසා පිතෑතියනට අදහස ලුහුඬින්

වටහාගතහැකි පරිදි මුලින් ප්‍රකාශ කෙළෙමි. ලෝවැසි ජනතාව අතුරෙන් යම්කෙනෙක් සෙසු අයට වඩා කාර්‍ය්‍යසූරවීමෙන් තම අදහස් මුදුන් පමුණුවා ගැනුමේ රිසින් නොපසුබටව උත්සාහවත් ව යෑම් රීම් ආදී නොයෙක් ක්‍රියාවන්හි යෙදෙත්ද? ඔවුනට වීරයන් යයි කියති. එබඳු අයගේ ස්වභාවයද කර්මයද වීරිය නම් වේ. සතුරන් වනසා ලොව ආධිපත්‍යය පැතිරීමෙහි සමත් අයවද වෙනත් නොයෙක් කරුණු වලින් එඩිතරව ඉදිරියට ආ අයවද විරයෝයයි කියති.

නමුත් බෞද්ධ සමයට අනුව නම්- යො චෙතසිකො විරියාරම්භො යනාදී වශයෙන් දෙශනාකර වදාළේ නිවන්සැප තරකැරුමට මාරසතුරන් වැනසීමට සමත් අයටම වීරයන්ය කියායි. මෙහි විරිය කියනුයේද කෙලෙස් වැනසීමෙහි යෙදෙන අයගේ ගතියටය ක්‍රියාවටය.

දෙශනාපාලියෙහි නොයෙක් තැන- වීර, මහාවීර යන නම් වලින් බුදුරජානන් වහන්සේට ආමන්ත්‍රණයකොට තිබෙනුපෙනේ. විරිය පිළිබඳ ලක්ෂණ රසාදිය ප්‍රකාශ නොකරන්නේ මෙයට ප්‍රථම ධර්මදේශනයෙහිදී විස්තරවූ බැවිනි. මෙම වීර්‍ය්‍යය උපන් අකුශලයන්ගේ ප්‍රහාණයටද, නූපන් කුශල ධර්මයන් උපදවීමටද හේතුවූ එකම ධර්මයයි වදාළහ.

විරියෙන දුක්ඛං අච්චෙති- යනුවෙන් වීර්‍ය්‍යයෙන් සියලු දුක් නැතිකෙරේයයිද, වදාළහ. ඥාණසම්ප්‍රයුක්තව වැඩූ වීර්‍ය්‍යය සියලු සම්පත්තීනට මුල්වෙයි. ඒ මේ වීර්‍ය්‍යචෛතසිකය කාමාවචර රූපාවචර අරූපාවචර සිත්හි යෙදෙන කල්හි ලෞකික වීර්‍ය්‍යයයිද ලෝකෝත්තර සිත්හි යෙදෙන කල ලෝකෝත්තරයයිද ව්‍යවහාරවේ. පකිණ්ණක අඤ්ඤසමානයන්හි යෙදෙන මෙම වීර්‍ය්‍යචෛතසිකය, පඤ්චද්වාරාවජ්ජනය, දෙපස්විඤ්ඤාණය, සම්පටිච්ඡන දෙකය, සන්තීරණත්‍රය යන සොළොස්(16) සිත්හැර තෙසැත්තෑවක් චිත්තොත්පාදයන්හිම යෙදේ. මෙම වීර්‍ය්‍යය සංස්කාරස්කන්ධයෙහි අන්තර්ගත වේ. චෛතසික ධර්මබැවින් ධර්මායතනද ධර්මධාතුදවේ. දුක්ඛසත්‍ය මාර්ගසත්‍ය දෙක්හි ඇතුලත්වේ. කුශලාකුශල අව්‍යාකෘත වශයෙන් ත්‍රිවිධය.

රාජකාර්‍ය්‍යාදී කටයුතු කීපයක යෙදීසිටින එකම තැනැත්තෙකුට ඒ ඒ අවස්ථාවන්හිදී කරණ වැඩට අනුව නම් දෙති. සමහරවිට ගම්මුලාදෑනිකම, වෙදකම, රෙජිෂ්ට්‍රා (විවාහ ලේකම්) ධුරය යෙදී සිටින එකම තැනැත්තාට රාළහාමි, ඔපිසර මහත්මයා, වෙදමහත්මයා, රෙජිෂටර් රාළහාමි යනාදී නාමින් ඒ ඒ තැන්වලදී ව්‍යවහාර කරති.

එමෙන් එකම වීර්‍ය චෛතසිකය සත්තිස්බොධිපාක්ෂික ධර්මයන්හිදී ඒ ඒ නමට සුදුසු කෘත්‍යයන් සිද්ධකරණ අවස්ථාවන්ගේ වශයෙන් නම් නවයකින් නවතැනක යෙදේ. ඒ මෙසේය, සතර සම්‍යක් ප්‍රධාන, විරියිද්ධිපාද, විරියින්ද්‍රිය, විරියබලය, විරියසම්බොජ්ඣඞ්ගය, සම්මාවායාම යනුමෙනි. බොධිසත්ත්වවරු මෙම විරියපාරමී, විරිය උපපාරමී, විරිය පරමත්ථපාරමී යනුවෙන් වඩති.

සුපින්වතුනි, විරිය පිළිබඳ විස්තර ඇසීමට අනතුරුව ඍද්ධිය පිළිබඳවද දැනගැණීම අවස්ථානුරූපය, ඍද්ධිය විස්තරව පෙන්වන තන්හි නානාර්ථ වශයෙන් දක්වේ. හේ මෙසේයි. ලෞකික වශයෙන් හෝ ලෝකෝත්තර වශයෙන් හෝ ඒ ඒ ධර්මයන්ගේ වැඩීමට ඉවහල්වූ ගුණ විශෙෂයට ඍද්ධියයි කරණාර්ථ වශයෙන්ද, එසේ වැඩුනු හෝ වැඩෙන ගුණ විශෙෂයට ඍද්ධියයි කර්තෘ අර්ථවශයෙන්ද ගුණවශයෙන් ඒ ඒ ධර්මයන්ගේ වැඩීම ඍද්ධියයි භාවාර්ථ වශයෙන්ද දක්වේ නොයෙක් අර්ථයන්හි යෙදුන නමුදු බෙහෙවින් කරණාර්ථයම භජනය කරණ බව පෙනේ.

ඉජ්ඣන්ති සත්තා එතාය ඉද්ධා වුද්ධා උක්කංසගතා හොන්තීති ඉද්ධි යනුවෙන් මේ කාරණකොටගෙණ සත්ත්වයෝ වැඩෙත් උසස් බවට පැමිණෙත් නුයි ඉද්ධි නම්වේ යනුවෙන් අර්ථදෙයි, (යමෙකු කෙරෙහි පිහිටි කිසියම් උතුම් ගුණ විශෙෂයක් ලෞකික වශයෙන් හෝ ලෝකෝත්තර වශයෙන් හෝ ඔහුගේ අභිවෘද්ධියට හේතුවේ නම් ඒ ගුණ වෙසෙස ඉද්ධි නම්වේ) දිනක් ආනන්ද හාමුදුරුවන් වහන්සේ "ඍද්ධිය" යනු කිමදැයි විමසූවිට- ඉධානන්ද භික්ඛු අනෙකවිධං ඉද්ධිවිධං පච්චනුභොති එකොපිහුත්වා බහුධා හොති -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති අයං වුච්චතානන්ද ඉද්ධි යනුවෙන් වදාළ හෙයින් අධිට්ඨානාදී සෘද්ධීන් ප්‍රකාශවෙයි. සෘද්ධිය දසවැදෑරුම්වේ- ඒ මෙසේය.

අධිට්ඨානිද්ධි, විකුබ්බනිද්ධි, මනොමයිද්ධි, ඤාණවිප්ඵාරිද්ධි, සමාධි විප්ඵාරිද්ධි, අරියිද්ධි, කම්මවිපාකජිද්ධි, පුඤ්ඤවතොඉද්ධි, විජ්ජාමයිද්ධි, තත්ථ තත්ථ සම්මාපයොග පච්චයිද්ධි යි කියාවේ.

1 අධිට්ඨානිද්ධි, පකතියා එකො බහුකං ආවජ්ජති -පෙ- අධිට්ඨාන වසෙන නිප්ඵන්නත්තා අධිට්ඨාන ඉද්ධිනාම යනුවෙන් චිත්තපාරිශුද්ධිය ලැබූ යොගාවචරයා ප්‍රකෘතියෙන් එකශර ඇතිව සියයක්, දහසක් යනාදී වශයෙන් බොහෝ ගණනක් ආවර්ජනා කොට, බොහෝවූ රූප ඇතියෙක් වෙමියි ඥානයෙන් අධිෂ්ඨාන කෙරේ නම් එය එසේ වෙයි. මෙය වනාහී අධිෂ්ඨානයෙන් නිපන් බැවින් අධිට්ඨානිද්ධි නම් වේ.

2 **විකුබ්බණ ඉද්ධි- පකතිවණ්ණං විජහිත්වා කුමාර වණ්ණං වා දස්සෙති -පෙ- විවිධම්පි සේනාබ්‍යූහං දස්සෙතීති -පෙ- විකුබ්බණ ඉද්ධිනාම**-ප්‍රකෘති රූපය අතහැර කුමාර රූපයක් හෝ, දෙව, ගරුඬ- නාග ආදී රූපයක් හෝ තමා කැමති කැමති පරිදි ආවර්ජනා කොට ඉටාතම් ඒ එසේම වේ. මෙයද එක්තරා සෘද්ධියකි. මෙසේ පැවති සෘද්ධිය වනාහී ප්‍රකෘති රූපය අතහැර විකෘති රූපයක් මැවීම් වශයෙන් පැවති බැවින් විකුර්වන සෘද්ධිය නම්.

3 **මනෝමය ඉද්ධි- ඉධ භික්ඛු ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති- රූපිං මනෝමයන්ති -පෙ- නිප්ඵත්ති වසෙන පවත්තා මනෝමයා ඉද්ධිනාම**- යෝගාවචර භික්ෂූතෙමේ දෘශ්‍යමාන කයින් අන්‍යවූ තවත් මනෝමය (සිතින් නිපදවනලද) රූපයක් නිර්මිත කෙරෙයි. මේ ක්‍රමයෙන් පැවත ආ සෘද්ධිය ශරීරාභ්‍යන්තරයෙහි අන්‍යවූ මනෝමය ශරීරයක්හුගේ නිපැද්මෙන් පැවති බැවින් මනෝමය සෘද්ධි නම්.

4 **ඤාණ විප්ඵාර ඉද්ධි- ඤාණුප්පත්තිතො පන පුබ්බෙ වා පච්ඡා වා තඞ්ඛණෙ වා ඤාණානුභාව නිබ්බත්තො විසෙසො ඤාණ විප්ඵාරඉද්ධිනාම**- අහීත්මාගී ඥානයෙන් පෙර හෝ පසු හෝ එකෙණෙහි ඤාණානුභාවයෙන් උපන් ගුණ විශෙෂය ඥාණවිප්ඵාර සෘද්ධියයි. බක්කුල ස්ථවිරයන් වහන්සේ ළදරු වියෙහිදී මසෙකුට බිලි වූහ. දළකට අසුවූ ඒ මසුගේ උදරය සිටුබිරිය පැලූවිට කුමරු නීරෝගව විසීය. මෙය උන්වහන්සේගේ අහීත්මාගීඥානයෙන් පෙර තත් ඥාණවිප්ඵාර ඇතිවීමෙන් උපන් ගුණයයි.

5 **සමාධිවිප්ඵාර ඉද්ධි- සමාධිතො පුබ්බෙවා පච්ඡාවා තඞ්ඛණෙවා සමථානුභාව නිබ්බත්තො විසෙසො සමාධි විප්ඵාර ඉද්ධි නාම**- සමාධියෙන් පෙර හෝ පසු හෝ එකෙණෙහි හෝ චිත්ත සමථානුභාවයෙන් (සිත සංසිඳීමේ ආනුභාවයෙන්) උපන් ගුණ විශෙෂය සමාධිවිප්ඵාර ඉද්ධි නම්- සැරියුත් මහ තෙරුන් වහන්සේ කපොත කඳුරැළියෙහිදී නන්දයකු ඇන්න මොකු පහරින් කිසි පීඩාවක් නොවිඳීමට හේතුවූයේ සමාධිවිප්ඵාර ඉද්ධිය නිසාමය.

6 **අරියා ඉද්ධි- පටික්කූලාදීසු අප්පටික්කූලසඤ්ඤී විහාරාදිකා පන අරියා ඉද්ධිනාම**- අනිටු අරමුණු අතුරෙන් නොකැමැති අරමුණු හා, නොකන්තාළ අරමුණද ප්‍රතිකූල අරමුණයයි කියනලද් දේය. එසේ පිළිකුල් කටයුතු වස්තූන්හි පිළිකුල් නැතැ යන සංඥා තොමෝ ආයෂී සෘද්ධි නම් වේ. මෙය වනාහී චිත්ත වසීතාවයට පත් රහතන් වහන්සේටම ලැබෙන හෙයින් ආයෂී සෘද්ධි නම් වේ.

7 **කම්මවිපාකජා ඉද්ධි- පක්ඛි ආදීනාං වෙහාසගමනාදිකා කම්මවිපාකජා ඉද්ධි නාම-** පක්ෂීන්, දෙවියන් හා ආදිකල්පික **මනුෂ්‍යාදීන්ගේ යම් ආකාශගමනාදියක් වේද එය කර්මවිපාකජ ඍද්ධි නම් වේ.**

8 **පුඤ්ඤවතො ඉද්ධි- චක්කවත්ති ආදීනං වෙහාසගමනාදිකා පන පුඤ්ඤවතො ඉද්ධි නාම-සක්විති රජු ආදීන්ගේ ආකාශ** ගමනාදිය පුණ්‍යවන්ත ඍද්ධිය නම්. සාමාන්‍යයෙන් කවරෙකුගේ නමුදු පින මේරුකල්හි යමක් සමෘද්ධවේද? එය මේ ඍද්ධි විශේෂයට ඇතුලත්වේ. ජොතිය, ජටිල ආදීන්ට මිණිපහය, රන්පව්ව ආදීගේ පහලවීම පුඤ්ඤවතො ඉද්ධියෙන් සිදුවූයේය.

9 **විජ්ජාමය ඉද්ධි- විජ්ජාධරාදීනං වෙහාස ගමනාදිකාපන විජ්ජාමයා ඉද්ධි-** විද්‍යාධරයෝ මන්ත්‍රාදි විද්‍යාවන් ජපකොට අහසින් යෑම අහසේ ඇත් අස් රූප දක්වීමාදිය කෙරෙත්. ඔවුන්ගේ අහස් ගමන් ආදිය විද්‍යාමය ඍද්ධි නම්.

10 **සම්මාපයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධිනාම- තෙන තෙන සම්මා පයොගෙන තස්ස තස්ස කම්මස්ස ඉජ්ඣනං තත්ථ තත්ථ සම්මා පයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි- ඒ ඒ සම්‍යක්** ප්‍රයෝගයෙන් ඒ ඒ කර්මයන්ගේ සමෘද්ධිය වන හෙයින් ඍද්ධිය නම්.

එනම් නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්ද ප්‍රහාණයද අව්‍යාපාදයෙන් ව්‍යාපාද ප්‍රහාණයද යනාදි වශයෙනි. තවද ගණිත ගන්ධර්වාදී යම්කිසි ශිල්ප කර්මයක් හෝ ශල්‍යකර්මා ආදී යම්කිසි වෛද්‍යකර්මයක් හෝ ත්‍රිපිටක ධර්මාදීන්ගේ ඉගෙනීම හෝ යටත් පිරිසෙයින් සීසෑම් වැපිරීම් ආදිය පටන් ඒ ඒ කර්මය කොට හටගන්නාවූ විශේෂයතෙමේ ඒ ඒ කර්තව්‍යයෙහි සම්‍යක් ප්‍රයෝගයෙන් සමෘද්ධවන අර්ථයෙන් ඍද්ධි නම් වෙයි.

සාධුනි, දැන් "විරියිද්ධිපාද" යන්නෙහි විරිය, ඉද්ධි යන ධර්මයන් පිළිබඳව කරුණු මදක් ඇසූ බැවින් "පාද" යන්න හා එම පද තුනම එකතුවීමෙන් සෑදෙන විරියිද්ධිපාදය පිළිබඳව දැනගතයුතුය පාද ශබ්දයේ අර්ථයන් දක්වන අභිධානප්පදීපිකා කර්තෘහු **චතුත්ථංසෙ පදෙපාදො- පච්චන්තසෙලරාසිසු-** යනුවෙන් සතරෙන් කොටස පාදය, පර්වත ප්‍රාන්තය, රශ්මිය යන අර්ථයන්හි යෙදේයයි දක්වූහ. මෙතැන්හි ඉද්ධිපාද, යනු කෙබඳු අර්ථයන්හි යෙදේදැයි දැනගත යුතුය.

"**පජ්ජන්ති පාපුනන්ති එතෙනාති පාදො**" යමක් කරණකොට ඍද්ධියට පැමිණේද? ඒ කාරණභූතවූ ධර්මය පාද නම් වේයයි දක්වෙන අතර, **ඉද්ධි එවපාදො ඉද්ධිපාදො ඉද්ධිකොට්ඨාසොති අත්ථො**

යන තැන්හි සෘද්ධියගේම කොටස සෘද්ධිපාදයයි කියාද "ඉද්ධියා පාදොති අධිගමූපායොති අත්ථො" යොගාවචරයන්ගේ අභිවෘද්ධියට හේතුවූ ධර්මජාතිය ලබාගැණුමට යමක් ප්‍රතිෂ්ඨාවේද, ධ්‍යාන මාර්ගාදී අධිගමයට උපායවේද එය සෘද්ධිපාද නමැයි කියාද ව්‍යවහාරවේ.

විභාවිනී ටීකාවෙහි යමකින් අධිෂ්ඨානාදිය සමෘද්ධවේනම් එය සෘද්ධියයිද ඒ සෘද්ධිවිධඥාණ සංඛ්‍යාත සෘද්ධියට පාදවූයේ සෘද්ධිපාදයයිද දක්වේ. පුද්ගලයෙකුගේ ගුණ සමෘද්ධියට හේතුවන ධර්මය සෘද්ධිපාද නමි.

දිනක් සෘද්ධිපාදයනු කුමක්දැයි ආනන්ද හාමුදුරුවන්වහන්සේ විචාලවිට භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

"යො ආනන්ද! මග්ගො යා පටිපදා ඉද්ධිපාද භාවනාය ඉද්ධිපටිලාභාය සංවත්තති. අයං වුච්චතානන්ද! ඉද්ධිපාදො" "ආනන්ද" සෘද්ධිපාදයාගේ වැඩීම පිණිස පිළිලැබීම පිණිස යම්ප්‍රතිපදාවක් පවතිත්ද, "ආනන්ද" එය සෘද්ධිපාදයයි දක්වා "ආයසීංෂ්ඨාඛගිතමාගීය" සෘද්ධිපාද භාවනා ගාමිනී ප්‍රතිපදාව බව පෙන්වනලදී.

ඉද්ධිපාදොති තථාභූතස්ස වෙදනාක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො-යනුවෙන් වෙදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤානයන-සකන්ධ සතර, සෘද්ධිලැබූවහුගේ ධ්‍යානාදියට පිහිට වන අරුතින් සෘද්ධිපාදයයි වදාළහ.

යම්සේ තනතුරක් පතා රජු ඇසුරුකොට වෙසෙන ඇමතිපුතුන් සතරදෙනෙකුගෙන් එක්කෙනෙක් නිසිසේ උවටැන්කිරීම අපහසුයයි වැඩක් ඇතිවූකල පරාක්‍රමයෙන් සිත් ගණිමියි සිතා පසල්දනව්වක් කුපිතවූවිට සතුරන්මැඩ අභිමත තනතුරට පැමිණියේද එමෙන් වීර්‍යය පෙරටුකොට ලොවුතුරු දහම් උපදවන පුද්ගලතෙම දතයුතුයි.

සූර බැවින් රජුන් සිත්ගෙන උසස් තනතුරකටපත් ඇමතියාමෙන් වීර්‍යය ජ්‍යෙෂ්ඨ කොට වීර්‍යය ධුරකොට වීර්‍යය පූර්වාංගම කොට ලොකොත්තර දහම් උපදවන තැනැත්තේ දතයුතුයි. සොණ ස්ථවිර චරිතය ඊට නිදසුනකි.

මීට අනතුරුව සෘද්ධිය හා සෘද්ධිපාදය ලබන ක්‍රමය විභඞ්ගඅටුවාවෙහි ආ නයින් මෙසේ දතයුතුයි. වීර්‍යයසමාධි පධාන සඞ්ඛාරයයි කියනලද ධර්මත්‍රය සෘද්ධිහු නමුදු වෙත්, සෘද්ධිපාදයෝද වෙත්, අවශෙෂ සම්ප්‍රයුක්ත වෙදනාදී සකන්ධ සතර සෘද්ධිපාදයෝම වෙත්, අවශෙෂ සම්ප්‍රයුක්ත වෙදනාදී සකන්ධ සතර සෘද්ධිපාදයෝම වෙත්, මෙය අභෙද වශයෙන් කීමයි.

භෙද වශයෙන් වනාහි- වීර්‍ය්‍යය, ඍද්ධි නම් වේ. වීර්‍ය්‍ය ධුරයෙන් වඩනාලද වේදනාදී ස්කන්‍ධ සතර වීර්‍ය්‍යිද්ධිපාදයි, සමාධි, පධාන සංඛාර- යන ධර්‍මදෙක සංස්කාරස්කන්‍ධ වශයෙන් වීර්‍ය්‍යිද්ධිපාදයෙහි වැටෙත්. එහිම සමාධිය, ඍද්ධියයි, සමාධිධුරයෙන් වඩනලද වේද නාදී ස්කන්‍ධ සතර සමාධිද්ධිපාදයයි- වීර්‍ය්‍යය, පධාන සංඛාරදෙක සංස්කාරස්කන්‍ධ වශයෙන් සමාධිද්ධිපාදයෙහි ප්‍රවෙශවෙත්.

මේ භෙද කථාවෙහි වනාහි අභිනවවූවක් නැත. ගත්නාලද වචනයම් භාග්‍යවතුන් වහන්සේ ප්‍රකටවූ ස්වභාව ඇත්තහු නො හොත් ගෘහීතවූම ධර්‍මස්වභාවය තෙමේ ප්‍රකටවූවහු කරණලදයැ. ඒ කෙසේදයත්? වීර්‍ය්‍ය, සමාධි, පධාන සංඛාර යන මේ ධර්‍මයෝ තුමූ, ඍද්ධීහු නමුදු වෙති, ඍද්ධිපාදයෝ නමුදු වෙති, අවශෙෂ සම්ප්‍රයුක්තවූ චතුස්කන්‍ධයෝ තුමූ ඍද්ධිපාදයෝම වෙති. ඒ සැබව, මේ ධර්‍මයෝ තුන්දෙන සමෘද්ධ වන්නාහු නම් තමා හා යෙදුන කඳු සතර හා සමඟමැ සිද්ධවෙත්, වෙන්වැ නොසිද්ධවෙත්, සමෘද්ධ නොවෙත්.

අනික් නයෙකුදු දක්වේ: පූර්‍ව, පූර්‍වභාගවූ, ධර්‍මජාතය ඍද්ධිපාද නම්, පිළිලැබූ පිළිලැබූ ධර්‍මජාතය, ඍද්ධි නමැයි දතයුතුයි. මේ අර්‍ථය උපචාර වශයෙන් හෝ විදර්‍ශනා වශයෙන් හෝ දක්විය යුතුයි. ප්‍රථමධ්‍යානයාගේ පරිකර්‍මය තෙම ඍද්ධිපාද නම්, ප්‍රථමධ්‍යානය ඍද්ධි නම්, පූර්‍වොක්ත පරිදි ද්විතීයධ්‍යානාදීන්ගේද -පෙ- නෙවසඤ්ඤා නාසඤ්ඤා යතන පරිකර්‍මය ඍද්ධිපාද නම්, නෙවසඤ්ඤා නාසඤ්ඤා යතනය ඍද්ධිනම්, ශ්‍රොතාපත්ති මාර්ගයාගේ විදර්‍ශනාතොමෝ ඍද්ධිපාද නම්, සොතාපත්තිමාර්ගය ඍද්ධි නම්, -පෙ- අර්හත් මාර්ගයා ගේ විදර්‍ශනාතොමෝ ඍද්ධිපාද නම්, අර්හත් මාර්ගය ඍද්ධිනම් ලබන ලද ධර්‍මයන්ගේ වශයෙන් දක්වන්නට වටීමැයි. ප්‍රථමධ්‍යානය ඍද්ධි පාදනම්, ද්විතීයධ්‍යානය ඍද්ධිනම්, -පෙ- අනාගාමි මාර්ගය ඍද්ධිපාද නම්, අර්හත්මාර්ගය ඍද්ධිනම්, කවර අර්‍ථයකින් ඍද්ධිනම්වේද? කවර අර්‍ථයකින් පාදනම්වෙද? සිද්ධකරණ සමෘද්ධකරණ අර්‍ථයෙන් ම නොහොත් සිද්ධවීම් සමෘද්ධවීම් අර්‍ථයෙන්ම ඍද්ධි නම්, පිහිටන අර්‍ථයෙන් පාදනම්. මෙතයින් මේතැන්හිදු ඍද්ධි යන නම හෝ පාද යන නම හෝ සම්ප්‍රයුක්ත ධර්‍මයන් කෙරෙන් අන්‍යවූ කිසි ධර්‍ම යක්හුගේ නමෙක් නොවේ, තමා හා සම්ප්‍රයුක්තවූ චතුඃස්කන්‍ධයන් ගේම නමෙකි.

කිසි ආචාර්‍ය්‍ය කෙනෙක් ඍද්ධි නම් නොනිපන් ධර්‍ම සමූහයයි, ඍද්ධිපාදනම් නිපන් ධර්‍ම සමූහයයි පැවසූහ. එම වචනය පිළිකෙව් කොට ඍද්ධියද ඍද්ධිපාදයද අනිත්‍යාදී ත්‍රිලක්‍ෂණයෙන් මඩනාලද ධර්‍මයෙකැයි සනිටුහන් කරණලදී. මෙකී පරිදි සූත්‍රාන්ත භාජනී යෙහි ලෞකික ලොකොත්තර මිශ්‍රවූ ඍද්ධිපාදයෝ දෙශනාකරණ ලදී.

අභිධම්මභාජනීයෙහි- විරිය සමාධි පධාන සංඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති- යනුවෙන් වදාළ තැන ලොකොත්තරනය සාරදගසකින් බෙදන ලද්දේය. උත්තරචූලල භාජනීයෙහිද නය සාරදගසකැයි බෙදිනි. පඤ්හපුච්ඡකයෙහි ඉද්ධිපාදයන් ලොකොත්තරමයයි කියනලදී. සම්මාසම්බුද්ධෙන සුත්තන්ත භාජනීයස්මිං යෙව ලොකිය ලොකුත්තරමිස්සකා ඉද්ධිපාදා කථිතා අභිධම්ම භාජනීය පඤ්හපුච්ඡකෙසු පන ලොකුත්තරායෙවාති. සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් සුත්තන්ත භාජනීයෙහි ලෞකික ලොකොත්තර වශයෙන්ද අභිධම්ම භාජනීය පඤ්හපුච්ඡකයන්හි ලොකොත්තරමයයිද දෙශනාකරණ ලදහ.

යම්කිසි යොගාවචරයෙක් මේ ඍද්ධිපාදයන් භාවිතා කරණ ලද්දේද, බහුලීකෘත කරණ ලද්දේද, ඕහට එය සංසාර සාගරයෙන් පරතෙරට යෑම සඳහා පවතීයයිද, දුක්ඛක්ඛය ගාමිනී ප්‍රතිපදාවක්යයිද (දුක් නැතිකිරීමේ පිළිවෙතක් යයිද) කාලත්‍රයෙහි යම් කිසි ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් ඍද්ධියක් පහළ කිරීමට සමර්ථ වූවාහුද සමර්ථවෙත්ද ඒ සියල්ලෝම ඍද්ධිපාදයන්ගේ වැඩීම නිසාම එයට සමර්ථවූවාහුයයිද සමර්ථයයිද, ආශ්‍රවයන්ගේ ක්‍ෂය කිරීමෙන් අනාශ්‍රව සංඛ්‍යාත චිත්ත විමුක්තියකටද ප්‍රඥා විමුක්තියකටද අභිඥාවන්ගේ ලාභයකටද පත්වූවාහුද ඍද්ධිපාදයන් වැඩූ බැවින්මෙ ඒ බවට පත්වූවාහුයයිද මෙම ඍද්ධිපාදයන් වැඩූ බැවින්ම "අරහං සම්මාසම්බුද්ධයයි" කියනු ලැබේයයිද, සතර ඍද්ධිපාදයන් මොනවට වැඩූවහු විසින් එකල මිනිසුනට ජීවත්වියහැකි සම්පූර්ණ ආයු කාලය හෝ ඊට වැඩියක්කල් හෝ ජීවත් වියහැකිබව තෙවරක්ම පැවසූසේක.

බුද්ධවචනයට අනුව දිනක් මුගලන් මහරහතන් වහන්සේ, උඩගු මුඛරි භික්ෂූන් දමනය සඳහා මිගාරමාතු පාසාදය (විශාඛා මහා උපාසිකාවගේ සංඝාවාසය) පයැඟිල්ලෙන් ගසා වලනය කළහ. නන්දෝපනන්ද නාරජු දමනය කළහ. මේ සියලු ඍද්ධීන් පැවැත්මට සමර්ථවූයේ සතර ඍද්ධිපාදයන් මොනවට පුරුදුකළ බැවිනි. මෙම ධර්මදේශනාවට අනුව වීර්යයෙහිද වීර්ය ඍද්ධිපාදයෙහිද අගය මැනවින් වැටහෙන්නට ඇත. ඍද්ධිපාදයන් ලෞකික වශයෙන් හා ලොකොත්තර වශයෙන් ලදහැකි බවද ප්‍රකාශ විය. ඍද්ධිපාදයන් ලබා නිවන්පසක් කළහොත් මුගලන් ආදී මහා රහතන් වහන්සේට මෙන් සදෙවක ලොකයා අතර පූජ්‍යභාවයෙන් සුප්‍රකට බවට පත්වීමටද පුළුවන් වෙනවා ඇත.

එබැවින් සියලු පිනැතියන් ඍද්ධිපාදයන් වැඩීමට පුරුදුපුහුනු කර ගැණීමට අධිෂ්ඨාන කරගනිමින්- මෙතෙක්වේලා බණඇසීම් ආදි වශයෙන් ලබාගත් කුශලානු භාවයෙන් මෙම ස්ථානයෙහි ආදි කතෘන් වහන්සේටද මෙම සියලු දෙනාටම්ද ශාන්ත සැප ඇති අමාමහ නිවන්සැප ලැබේවායි ප්‍රාර්ථනාකළ යුතුයි.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

මොරටුවේ ඉදිබැද්දේ සුධර්මරත්නාරාමාධිපති අභිධම්මික
මොරටුවේ සාසනධජ ස්ථවිරපාදයන් වහන්සේ
විසින් පවත්වනලද ධර්මදේශනාව.

# වීමංසිද්ධිපාදය.

**කතමඤ්ච භික්ඛු වීමංසා සමාධි පධාන සඞ්ඛාර සමන්නාගතං ඉද්ධිපාදං භාවෙති? වීමංසඤ්චෙ භික්ඛු අධිපතිං කරිත්වා ලභති සමාධිං ලභති චිත්තස්ස එකග්ගතං අයං වුච්චති වීමංසා සමාධි.**

පින්වතුනි, මෙහි දැක්වූයේ අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ තව්තිසා දෙව්ලොව පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි වැඩහිඳ මාතෘ දිව්‍යරාජයා ප්‍රමුඛ කොට ඇති දශදහසක් සක්වළින් රැස්වූ දිව්‍ය බ්‍රහ්ම මහාසභාවෙහිදී දේශනාකර වදාළ අභිධර්ම දේශනාවට අන්තර්ගත විභඞ්ග ප්‍රකරණාගත වීමංසිද්ධිපාදය විස්තර කිරීම සඳහා දේශනාකරණලද ධර්මපාඨයකි.

(මේ ලිපිය ලියාදෙන්ට අදහස් කළේ 1948 දෙසැම්බර් 19 වැනි දින මහයාලේ පුෂ්පාරාම විහාරස්ථානයේදී මා විසින් පවත්වනලද ධර්මදේශනාව පිඩුකොට ලියාදෙනු මැනවැයි අප හිතෛෂී මිත්‍ර මොරටුවේ සිරි ශාසනවංශ ස්ථවිරපාදයන් වහන්සේ විසින් කරණලද ආරාධනය නිසා බැව් සැලකිය යුතුය.)

මීළඟට මාතෘකා පාඨයේ අදහස සැකෙවින් දක්වමි. කෙසේ නම් භික්ෂුතෙම වීමංසා සමාධි පධාන සංඛාර සමන්නාගතවූ ඉර්ධි පාදය වඩාද? ඉදින් භික්ෂුතෙම ප්‍රඥාව අධිපති කොට සමාධිය ලබාද, චිත්තෛකාග්‍රතාව ලබාද, මෙය වීමංසා සමාධියයි කියනු ලැබේ.

ඉද්ධිපාද ධර්ම- ඡන්ද, විරිය, චිත්ත, විමංසා කියා සෘද්ධිපාද ධර්ම කොටස් සතරකි. එයින් මෙහි ලියනු ලබන්නේ වීමංසිද්ධි පාදය පිළිබඳ විස්තරය පමණකි.

පළමුකොට ඉද්ධි- පාද යන වචන දෙකේ තේරුම සොයා බලමු. "ඉජ්ඣතීති ඉද්ධි, සමිජ්ඣති නිප්ඵජ්ජතීති අත්ථො" යම් ස්වභාව ධර්මයක් තොමෝ ඉටුවේද, ඒ ස්වභාව ධර්මතොමෝ සෘද්ධි නම්, සමෘද්ධ වෙයි, නිපැද්ම වෙයි යන අර්ථයි. වෙනත් ක්‍රමයකට නිර්වචනාර්ථ මෙසේ දැක්වේ.

"ඉජ්ඣනතිච එතාය සත්තා ඉද්ධා වුද්ධා උක්කංසගතා හොන්තීති ඉද්ධි" යම් ස්වභාව ධර්මයක් කරණකොටගෙන සත්වයෝ සෘද්ධ වූවාහු වැඩිදියුණු වූවාහු උත්කර්ෂභාවයට ගියාහු වෙත්ද, ඒ ධර්ම ස්වභාව තොමෝ සෘද්ධි නම්. "පජ්ජතෙ අනෙනාති පාදො පාපුණීයතීති අත්‍ථො" මේ කරණකොටගෙන පැමිණෙනු ලැබේනුයි පාද නම්. පාද ශබ්දයෙහි කොට්ඨාසය, අධිගමූපාය යන අර්ථ දෙකක් ඇත්තේය. ඉද්ධි එව පාදො- ඉද්ධිපාදො- ඉද්ධියාපාදො ඉද්ධිපාදො'යි දෙපරිද්දකින් සමාස කළහැක. මෙසේ ගත්කල ඉද්ධිපාද යන මෙහි තේරුම- සෘද්ධි කොට්ඨාසය හෝ සෘද්ධියගේ ප්‍රතිෂ්ඨාස්ථානය යනුයි. ඔව්හු නම්- ලෞකික ලෝකෝත්තර සමාධිය සිද්ධකර දෙන ඡන්ද- වීරිය-චිත්ත-වීමංසා සංඛ්‍යාත ධර්මයෝය, නැතහොත් ඒ ලෞකික ලෝකොත්තර සමාධි අධිගමයට උපායවූ ඡන්ද වීරිය- චිත්ත- වීමංසා යන ධර්මයෝය.

වීමංසා නම් කවරිද?

තත්‍ථ කතමා වීමංසා? යාපඤ්ඤා පජානනා —පෙ— සම්මා දිට්ඨි අයං වුච්චති වීමංසා, යම් ප්‍රඥාවක් වේද, ප්‍රකර්ෂයෙන් (අනිත්‍යාදී වශයෙන්) දැනීමක් වේද, -පෙ- සම්‍යක් දෘෂ්ටියක් වේද, මෙය වීමංසා යයි කියනු ලැබේ. ප්‍රඥා සංඛ්‍යාත වීමංසාව අධිපති කොටගෙන ලබණ සෘද්ධිපාදය- වීමංසිද්ධිපාද නම් වේ. ඒවම වීමංසා සමාධියයිද කියනු ලැබේ.

දේශනාපාඨයේ ආ "පධාන සඞ්ඛාර සමන්නාගතං" යන්නේ තේරුම නම්- නූපන් පාපධර්මයන් නූපදීම පිණිසත්, උපන් පාප ධර්මයන් නැසීම පිණිසත්, (ප්‍රහීන කිරීම) නූපන් කුශල ධර්මයන් ඉපදීම පිණිසත්, උපන් කුශල ධර්මයන් වැඩිදියුණුවීම පිණිසත් කරන සතර සම්‍යක් ප්‍රධාන වීර්යයට පධාන සඞ්ඛාර කියා ව්‍යවහාරයි, ඒ වීර්යයෙන් යුක්තවූයේ පධාන සඞ්ඛාර සමන්නාගත නම් වේ.

මෙහිදී, සෘද්ධිපාදයන් පිළිබඳව මේ විස්තරය හොඳින් ඉගෙණ ගතයුතුය. එනම්:- ඉද්ධියා චතස්සො භූමියො, චත්තාරො පාදා අට්ඨපදානි, සොළසමූලානි වෙදිතබ්බානි.

සෘද්ධි පිළිබඳ භූමිසතරය, පාද සතරය, පද අටය, සොළොස් මූලය යන මේ කරුණු දතයුත්තාහ.

භූමිසතර නම්- ප්‍රථමධ්‍යාන භූමි, ද්විතීයධ්‍යාන භූමි, තෘතීය ධ්‍යාන භූමි, චතුර්ථධ්‍යාන භූමි යන සතරයි. ප්‍රථමධ්‍යාන භූමියට විවේකජභූමි කියාද නමෙකි, ඒ ලබණ සැටිය මඳක් විස්තරකරමි.

ධ්‍යාන ලබණු කැමති යොගාවචර තෙම පළමුකොට පිරිසිදු ශීලයෙහි පිහිටා දශවිධ පලිබොධයන් අතුරෙන් යම් යම් පළිබොධයක් විද්‍යමාන නම් ඒ ඒ පළිබොධයන් සිඳ බිඳ දමා කම්සථාන දෙන කල්‍යාණ මිත්‍රයෙකු කරා පැමිණ තමාගේ චාරිත්‍රානුකූල කම්සථානයක් උගෙණ සමාධි භාවනාවට ගැලපෙන සථානයක් සොයාගෙන කෙස් නිය කපාගැනීම් ආදී වශයෙන් කුඩා පළිබොධයන් දුරුකරගෙන තමාගත් කම්ස්ථානය වැඩිය යුතුය.

කම්සථාන වඩනහැටි– තමා වඩනුයේ පෘථිවිකසිණය නම් අරුණුවන් මැටියෙන් තනාගත් එක්වියත් සතරඟුල් ප්‍රමාණ කසිණ මණ්ඩලය අභිමුඛයෙහි තබාගෙන සුදුසු ආසනයක වාඩිවී බලවත් චිත්ත ධෛර්‍ය්‍ය උපදවා පඤ්චකාමයන්හි ආදීනව හා නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිසංස සිහිකොට දුන් මාවිසින් කරන්ට ආරම්භ කරන්නේ බුඩාදී උතුමන් විසින් පුරුදු පුහුණු කළ උතුම් ප්‍රතිපත්ති ධර්මයක්යයි සිහිකර "පඨවි පඨවි" කියමින් කසිණමණ්ඩලය දිහා බලාගෙන භාවනා කළයුතුය. මෙසේ බොහෝ වේලාවක් භාවනා කිරීමෙන් පසු වරින්වර ඇස් පියාගෙනද, භාවනා කළ යුතුය. මේ විදියට ඇස් දල්වා බලාගත් කසිණ මණ්ඩලය සිතින් බලාගෙන ඇස් පියාගෙන භාවනා කරනවිට යම්තාක් උග්ගහ නිමිත්ත නූපදීද ඒතාක් බොහෝ දින ගණනක් හෝ මාසගණනක් අවුරුදු ගණනක් උවද භාවනා කරන්නේය, මේ අන්දමින් අනලස්ව භාවනාකරනවිට ඇස් පියාගත් විටද කසිණ නිමිත්ත ඇස් ඇරගෙන බලාසිටි කල්හිමෙන් පෙනේ. එවිට උග්ගහ නිමිත්ත පහළවූයේ නම් වේ.

උග්ගහ නිමිත්ත පහළවූ බැව් දැනගත්විට ප්‍රවේසම්කරගෙන නැවත නැවතත් සිතින් සිතමින් වැඩිය යුතුය. මෙසේ වඩනවිට ක්‍රමයෙන් පඤ්චනීවරණ ධර්ම විෂ්කම්භණය වෙති, කෙලෙස් යටපත් වෙති, උග්ගහනිමිත්තට වඩා පැහැදිලිවූද ඊටවඩා සියගුණයකින් දහස්ගුණයකින් පිරිසිදුවූද ප්‍රතිභාග නිමිත්ත උපදී. ඒ ප්‍රතිභාග නිමිත්තොත්පාදය හා සමග සිත්හි හටගන්නා සමාධිය අර්පණා සමාධි නම් වේ.

ධ්‍යානලැබීම– විතර්ක විචාර ප්‍රීතිසුඛ එකාග්‍රතා යන අඞ්ගපසකින් යුක්තවූ ප්‍රථමධ්‍යාන සිත ලැබෙන්නේ යටකී අර්පණා සමාධිය ලැබීමට අනතුරුවය.

ප්‍රථමධ්‍යානලාභී යොගාවචරතෙම එපමණකින් නොනැවතී ධ්‍යානාඞ්ග මෙනෙහි කරමින් විතර්කයෙහි ආදීනව සලකා එය දුරුකොට ද්විතීයධ්‍යානයවද විචාරයෙහි දොස් සලකා එය දුරුකොට

තෘතීයධ්‍යානයටද ප්‍රීතියෙහි දෙස් සලකා එය දුරුකොට චතුර්ථ ධ්‍යානයටද පැමිණේ. මෙලෙසින් ප්‍රථමාදි භූමිසතර ලබන අයුරු කෙටියෙන් තේරුම්ගත යුතුයි.

**පාද සතර-** ඡන්දිද්ධිපාද, විරියිද්ධිපාද, චිත්තිද්ධිපාද, වීමංසිද්ධිපාද යන සතරයි. මේ චතුර්විධ ඉද්ධිපාද අතුරෙන් වීමංසිද්ධිපාද නම්- ප්‍රඥාව අධිපති ප්‍රත්‍යයකොටගෙන ලබණ ලෞකික ලෝකෝත්තර සමාධියයි. මෙතැන්හි චතුර්ථධ්‍යාන සමාධියම ගතයුතු බැව්, "සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති" යනාදීන් දෙශනාකාරණලද ධර්මයන්ගෙන් ප්‍රකාශවේ. එහි තේරුම- ඒ යොගාවචර තෙම චතුර්ථධ්‍යානයෙන් සිත එකඟකොට පිරිසුදුකල කල්හි කාත් පසින් පාපධර්මයන්ගෙන් සිත පිරිසිදු කිරීමෙන් කෙලෙසුන් ගෙන් දුරුවූ කල්හි පහවූ උපක්ලෙශයන් ඇති බැවින් මොලොක්ව ඍද්ධිවිධකර්මයට සුදුසුව සිටි කල්හි කෙලෙසුන් කරණකොටගෙන නො සැලෙන බවට පැමිණි කල්හි ඍද්ධිවිධ ඥාණය පිණිස සිත විශෙෂයෙන් මෙහෙයයි, විශෙෂයෙන් නමයි.

**පඤ්චාභිඥා-**

ඉද්ධිවිධං දිබ්බසොතං-පරචිත්ත විජානනා
පුබ්බෙ නිවාසානුස්සති-දිබ්බචක්ඛූති පඤ්චධා

යන්නෙන් ලෞකික පඤ්චාභිඥාවන් දක්වේ. 1 ඍද්ධිවිධ ඥාණය, 2 දිව්‍යශොත්‍රධාතු ඥාණය, 3 පරචිත්තවිජානන ඥාණය, 4 පූර්වේනිවාසානුස්සති ඥාණය, 5 දිබ්බචක්ඛු ඥාණය යන පසයි. මේ පස අතුරෙන් එකෙක්ව බොහෝ ප්‍රකාරවීම් සංඛ්‍යාත විකුර්වණ ඍද්ධිය කරණු කැමති යොගියා විසින් තුදුස් ක්‍රමයකින් සිත දමනය කාට යුතුය.

## (14) තුදුස් චිත්තදමනයෝ.

(1) කසිණානුලොමතො, (2) කසිණ පටිලොමතො, (3) කසිණානුලොම පටිලොමතො, (4) ඣානානුලොමතො, (5) ඣාන පටිලොමතො, (6) ඣානානුලොම පටිලොමතො, (7) ඣානුක්කන්තිකතො, (8) කසිනුක්කන්තිකතො, (9) ඣානකසිණුක්කන්තිකතො, (10) අඞ්ගසඞ්කන්තිතො, (11) ආරම්මණ සඞ්කන්තිතො, (12) අඞ්ගාරම්මණ සඞ්කන්තිතො, (13) අඞ්ගවවත්ථාපනතො, (14) ආරම්මණ වවත්ථාපනතො.

(1) කසිණානුලොම ක්‍රමය නම්:- පඨවිකසිණ, ආපොකසිණ, තෙජොකසිණ, වායොකසිණ, නීලකසිණ, පීතකසිණ, ලොහිත

කසිණ, ඔදාතකසිණ යන ක්‍රමයෙන් එක් එක් කසිණයෙහි සියක් වර දහස්වර ධ්‍යානයට සමවැදීම කසිණානුලොම නම් වේ. (මෙහි ආලොක, ආකාස යන ;කසිණදෙක ඔදාත කසිණයෙහි ඇතුළත් බැවින් හා අරූපසමාපත්තීහු නොලැබෙණ බැවින් අත්හරිනලදී.)

(2) කසිණ පටිලොම ක්‍රමය- අවදාත කසිණයෙහි පටන් පඨවි කසිණය දක්වා ප්‍රතිලොම ක්‍රමයෙන් සියක්වර දහස්වර හෝ ධ්‍යානයට සමවැදීම කසිණ පටිලොම ක්‍රම නම් වේ.

(3) කසිණානුලොම පටිලොම ක්‍රමය- පඨවි කසිණයේ පටන් ඔදාත කසිණය තෙක්ද, ඔදාත කසිණයේ පටන් පඨවි කසිණය තෙක්ද මෙසේ අනුලොම ප්‍රතිලොම වශයෙන් නැවත නැවතත් ධ්‍යානයට සමවැදීම කසිණානුලොම පටිලොම ක්‍රම නම් වේ.

(4) ඣානානුලොම ක්‍රමය නම්- ප්‍රථමධ්‍යානයේ සිට පිළිවෙළින් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානයට සියක්වර දහස්වර සමවැදීම ඣානානුලොම ක්‍රම නම් වේ.

(5) ධ්‍යාන පටිලොම ක්‍රමය නම්- නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානයේ සිට ප්‍රථමධ්‍යානයතෙක් නැවත නැවතත් සමවැදීම ධ්‍යාන පටිලොම ක්‍රම නම් වේ.

(6) ධ්‍යානානුලොම පටිලොම ක්‍රමය නම්- ප්‍රථමධ්‍යානයේ සිට නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානය තෙක්ද, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානයේ සිට ප්‍රථමධ්‍යානය තෙක්ද, මෙසේ අනුලොම ප්‍රතිලොම වශයෙන් නැවත නැවතත් සමවැදීම ධ්‍යානානුලොම පටිලොම ක්‍රම නම් වේ.

(7) ධ්‍යානුක්කන්තික ක්‍රමය නම්- පෘථිවි කසිණයෙහි ප්‍රථම ධ්‍යානයට සමවැද ඒ පෘථිවි කසිණයෙහිම තෘතීයධ්‍යානයටද සම වදනේය. ඊට අනතුරුව ඒ පෘථිවි කසිණය ආකාශයෙහි කැමති පමණ ප්‍රදෙශයක පතුරුවා, ඒ කසිණාලොකය උගුළුවා කිසුණු ඉගුළු අහස අරමුණුකොට "ආකාසො අනන්තො" යනාදීන් පරිකම්භාවනාකොට ආකාශානඤ්චායතන ධ්‍යානයට සමවදනේය. ඊට අනතුරුව විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයට සමනොවැද ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට සමවදනේය. මෙසේ කසිණය නොඉක්මවා එකක්හැර එකකට සමවැදීම වශයෙන් ධ්‍යානයාගේම පැණයාම ධ්‍යානුක්කන්තික ක්‍රම නම් වේ.

(8) කසිණුක්කන්තික ක්‍රමය නම්- පෘථිවිකසිණයෙහි ප්‍රථම ධ්‍යානයට සමවැද නැවත තෙජොකසිණයෙහිද එම ධ්‍යානයට සම වැද ඊට අනතුරුව නීලකසිණයෙහිද ඊට අනතුරුව ලොහිත

කසිණයෙහිදැයි යන මේ ක්‍රමයෙන් ධ්‍යානය නොඉක්මවා කසිණයෙන්ම එකක්හැර එකකට සමවැදීම කසිණුක්කාන්තික ක්‍රම නම් වේ.

(9) ධ්‍යාන කසිණුක්කාන්තික ක්‍රමය නම්– පෘථිවිකසිණයෙහි ප්‍රථම ධ්‍යානයට සම්වැද ඊට අනතුරුව තෙජෝ කසිණයෙහි තෘතීය ධ්‍යානයට සමවැද ඊට අනතුරුව නීලකසිණය උගුළුවා ලබණලද අහස්හි ආකාසානඤ්චායතන ධ්‍යානයටද ලොහිතකසිණයෙන් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයටදැයි යන මේ ක්‍රමයෙන් ධ්‍යානයාගේද කසිණයාගේද එකක් පැණ එකකට සමවැදීම ධ්‍යානකසිණොල්ලංඝන ක්‍රම නම් වේ.

(10) අඞ්ග සඞ්කන්තික ක්‍රමය නම්–පෘථිවිකසිණයෙහි ප්‍රථම ධ්‍යානයට සමවැද ඒ පෘථිවි කසිණයෙහිම සෙසු ධ්‍යානයන්ටත් සමවැදීම අඞ්ගසඞ්කන්තික ක්‍රමය නම් වේ.

(11) ආරම්මණ සඞ්කන්තික ක්‍රමය නම්– පෘථුවි කසිණයෙහි ප්‍රථමධ්‍යානයට සමවැද ආපොකසිණයෙහිත් එම ධ්‍යානයටද අවදාතකසිණයෙහිත් එම ධ්‍යානයටදැයි මෙසේ සියළු කිසුණෙහි එකම ධ්‍යානයකට සමවැදීම ආලම්බන සංක්‍රමණ ක්‍රම නම් වේ.

(12) අඞ්ගාලම්බණ සංක්‍රමණ ක්‍රමය නම්– පෘථුවි කසිණයෙහි විතීයධ්‍යානයටද තෙජෝ කසිණයෙහි තෘතීයධ්‍යානයටද වායොකසිණයෙහි චතුර්ථධ්‍යානයටද සමවැද ඊට අනතුරුව නීලකසිණය උගුළුවා ලබණලද අහස්හි ආකාසානඤ්චායතන ධ්‍යානයට සමවැද ඊටඅනතුරුව පීතකසිණයෙන් විඤ්ඤාණඤ්චායතන ධ්‍යානයටද ලොහිත කසිණයෙන් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයටද අවදාත කිසුණෙන් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානයටදැයි මෙසේ එකු එක අඞ්ගයක් හා එක එක අරමුණක්ද පැණ පැණ ධ්‍යානයන්ට සමවැදීම් අඞ්ගාලම්බණ සංක්‍රමණ ක්‍රම නම් වේ.

(13) අඞ්ගවවත්ථාපන ක්‍රමය නම්– ප්‍රථමධ්‍යානය අඞ්ගපසකින් යුක්තයයි ව්‍යවස්ථාකොට විතීයධ්‍යානය අඞ්ගත්‍රයකින් යුක්තය, තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානය, ආකාසානඤ්චායතනධ්‍යානය විඤ්ඤාණඤ්චායතනධ්‍යානය, ආකිඤ්චඤ්ඤායතනධ්‍යානය, නෙවසඤ්ඤානාසඤ්ඤායතනධ්‍යානය යනමේ රූපාරූප ධ්‍යානයෝ පස්දෙනත් එසේම දෙඅඟබැගින් යුක්තයයි මෙසේ ධ්‍යානාඞ්ගමාත්‍රයක් නියමකිරීම අඞ්ග ව්‍යවස්ථාපන ක්‍රමය නම් වේ.

(14) ආලම්බන වවත්ථාපන ක්‍රමය නම්– මේ පෘථිවිකසිණයයි නියමකොටගෙන මේ ආපොකසිණය, මේ තෙජෝකසිණය, මේ වායොකසිණය, මේ නීලකසිණය, මේ පීතකසිණය, මේ ලොහිත

කසිණය, මේ ඕදාතකසිණයයි මෙසේ ආලම්බණ මාත්‍රයක් නියම කිරීම ආලම්බණ ව්‍යවස්ථාපන ක්‍රමයනම් වේ. මේ තුදුස් ආකාර යෙන් සිත දමනය නොකොට පෙරඅත්බැව්හිදී පුරුදු නොකරණ ලද ආදිකර්මික යෝගාවචරයා ඉද්ධිවිකුබ්බණය සම්පාදනය කරන් නේය යන මේ කාරණය විද්‍යමානනොවේ. (සිදුනොවිය යුත්තකි )

ආදිකර්මික යෝගාවචරයාහට කසිණ පරිකර්ම භාවනාවද අති ශයින් බැරෑරුම් වන්නේය. කිසුණු පිරියම් කරන්නාවූ යෝගීන් සියක් දෙනෙකු දහස් දෙනෙකු අතුරෙන් එකෙක්ම කිසුණු පිරිය මෙහි පොහොසත් වන්නේය.

කිසුණු පිරියම් නම්- දෝෂ විවර්ජිතය පටින් උග්ගහනිමිත්ත උපදිනතැන් දක්වා කසිණමණ්ඩලයෙහි පිළිපැදියයුතු ප්‍රතිපත්ති යයි. ඒ කසිණ පරිකර්මය පවා බැරෑරුම් වන්නේ නම් විකුර්වණ සෘද්ධිය ඉපදවීම ගැන කියනුම කිම? අමාරුවෙන් හෝ කිසුණුපිරි යම් සම්පාදනය කොට ප්‍රතිභාග නිමිත්තෝත්පාදනය අතිශයින් දුෂ්කරවේ. ප්‍රතිභාග නිමිත්ත නම්, යටකී උග්ගහ නිමිත්ත වඩා දියුණු කිරීමෙන් ලබාගන්නා ආලෝකයයි. ඒ ආලෝකය වනාහි වලාගැබකින් නික්මෙන චන්ද්‍රමණ්ඩලයක් මෙන්ද, පසුම්බියකින් මැත්කොට ගන්නා කැඩපතක් මෙන්ද ඉතා සියුම්වූ දෙසැත්තෑ වක් වස්තු ධර්මයන්ගෙන් තොරවූවකි. ඒ ප්‍රතිභාගනිමිත්ත ඉපද වීම අතිශයින් දුෂ්කර වැඩකි. යෝගීන් සියක්දෙන දහසක්දෙනා ගෙන් එක්කෙනෙකුටම සිඩවේ.

ප්‍රතිභාග නිමිත්ත පහලවීමෙන් පසු භාවනාව හා ප්‍රතිභාග නිමිත්තද වඩා අර්පණාවට පැමිණීමද අතිශයින් දුෂ්කර කාර්‍ය්‍යයකි ඊට හේතුව- ඇතමෙකුට උපචාර සමාධිය ලැබුවත් අර්පණා සමා ධිය ලබන්නට නොහැකිවීමයි. එබඳු අයම බහුල වෙති. එබැවින් අර්පණාධිගමයයි කියනලද අෂ්ටසමාපත්ති ප්‍රතිලාභය අතිශයින් දුෂ්කර බැව් කිහ. අර්පණා ලාභියාටද තුදුස් අයුරකින් සිත දමනය කරගැනීම බැරෑරුම් වේ. අර්පණාලාභීන් සියක් දෙනෙකුගෙන් දහසක් දෙනෙකුගෙන් එකෙකුටම එසේ තුදුස් අයුරින් සිත දම නය කරගැනීම හැකිවේ. එසේ දමනයකරගත් යෝගියාටද සෘද්ධි විකුර්වණය නම් අතිශයින් බැරෑරුම් වේ සියයකින් දහසකින් එකෙකුටම ඉර්ධි විකුර්වණය කටහැකිවේ. විකුර්වණ සෘද්ධිලාභියා වුවත් වහා ධ්‍යානයට සමවැදීම පිළිබඳ දක්‍ෂබව අතිශයින් බැරෑ රුම්වේ. යෝගීන් සියක්දහසක් ඇති තැනත් වහා ධ්‍යානයට සම වැදීමට දක්‍ෂවන්නේ එක්අයෙකි. උදාහරණ කථා පුවතක් දක්වමි.

ලක්දිව මිහින්තලා විහාරයෙහි වැඩහුන් මහාරොහණගුප්ත ස්ථවිරයන් වහන්සේට ගිලන් උපස්ථාන කරණු සඳහා එක්තරා

දිව්‍ය නාගරාජයෙක් මාණවක වේශයක් මවාගෙන අවුත් මහා තෙරුන්ට කැඳ අවුලුපත් පිළිගන්වමින් ලඟසිටියේය. එවිට අහසින් යන දිව්‍ය ගරුඬරාජයෙක් යටකී නාරජු දැක අල්වාගැනීම සඳහා පහතට බසින්ට පටන්ගත්හ. දිව්‍ය ගුරුළුරාජයන්ට ස්වකීය ගොදුරවන නාරජුන් යොදුන් සියයක් දුරදී වුවත් පෙනීම ස්වභාවයකි. ඒ අවස්ථාවෙහි යටකී තෙරුන්ගේ උපස්ථානය සඳහා රැස්වීහුන් තිස්දහසක් පමණ සෘඩිමත් භික්ෂූන් අතුරෙන් උපසම්පදාවෙන් අටවස් පමණවූ රක්‍ඛිත නම් ස්ථවිරතෙම නාරජු අල්වාගන්ට එන ගුරුළු රජු දැක ඇසිපියහෙලන කාලයක් තුළ විකුර්වණ සෘඩියට සමවැද මහත් ගල්පර්වතයක් මවා නාරජුගේ බාහුවෙන් අල්වා පර්වතය තුළට දැමීය. ඒ දුටු ගුරුළුරජතෙම තමන්ගේ පියාපතින් පර්වතය පැහැර අහසට නැගී ගුරුළු භවනය බලා ගියේය.

මේ ආශ්චර්‍ය්‍ය දුටු රොහණගුප්ත ස්ථවිරතෙම ඇවැත්නි, අද අපගේ සහමැද ඉඳින් මේ රක්‍ඛිත ස්ථවිර තුමන් නොසිටියේ නම් නාරජ රැකගත නොහැක්කමහ. අප හැමදෙන ගර්හාවට පත්වන්නමෝ නොවෙමුදැයි කීසේක. එබැවින් සතුරන් ජයගන්නා පිණිස යුද්ධකරන්නාවූ යෝධාජීවයෝ මලරහිතවූම කඩුදුනු ආදිය රැගෙන හැසිරෙත්ද එසේම භික්ෂූන් විසිනුත් කෙලෙශ විජය පිණිස නිර්මලවූම ධ්‍යානාභිඥාවන් වලඤ්ජනය කටයුත්තාහුයයි ඒ භික්ෂූන්ට අවවාද කළසේක. ඒ තිස්දහසක් භික්ෂූහුද තෙරුන්ගේ අවවාදයෙහි පිහිටා වන වහා ධ්‍යානයට සමවැදීමෙහි සමර්ථයෝ වූහ. බිපප නියාමතභාවය ඇත්තේ නමුදු අනුන්ට පැමිණියහැකි උපද්‍රවයකදී පිහිටාධාරවන බව අතිශයින් බැරෑරුම් වන්නේය, පෙර මෙම ලක්දිව ගිරිභණ්ඩවාහන පූජානම් මහාපූජෝත්සවයක් විය. ඒ උත්සවයේදී මුළු ලංකාද්වීපයම ප්‍රදීප සියදහස් ලක්‍ෂගණන් දැල්වීමෙන් හා සමුද්‍රයෙහි යොදුනක් තැන්ද පහන්වැම් පහන් ඇගෑයෙන් එකාබද්ධ කොට විශේෂ දීප්තිමත් ප්‍රදීප පූජාවක් පවත්වන්ට සූදානම්වූ කල්හි වසවර්ති මාරතෙම ඒ පූජාව හා මනුෂ්‍යයන්ද දවා භස්මකරන්ට අඟුරු වැස්සක් මවාපෑකල්හි එක්තරා අභිඥලාභී මහතෙරුන් වහන්සේ තමක් එකම ගිනිපුපුරක්වත් මිනිසුන් කරා පැමිණෙන්නට මත්තෙන් අහසෙහි පෘථිවියක් මවා අඟුරුවැස්ස නවතාලූයේය.

මෙතැන්හි වසවර්ති මාරයාගේ අඟුරුවැස්ස වස්වනබව කලින් නොදැනම ඒ අඟුරුවැස්ස අහසින් පහතට බස්නාබව දුටු ක්‍ෂණයකින්ම ඇසිපිය හෙළීමකටත් වඩා මඳ ඇසිල්ලෙක්හි පඤ්චමධ්‍යානයෙන් විකුර්වණර්ද්ධිය උපදවා පෘථුවියක් මවා අඟුරුවැස්ස ආකාශයේදීම නවත්වාලූබව ඉතා ආශ්චර්‍ය්‍ය නොවේද?

මෙසෙයින් අනුන්ට පැමිණෙන උපද්‍රව නිවාරණය පිණිස ප්‍රතිසංධාරවීම අතිශයින් බැරෑරුම් වන්නේය.

බලවත් පූර්ව ප්‍රාර්ථනා ඇත්තාවූ බුද්ධ පසේබුද්ධ අගසව් මහසව් වන් වහන්සේලාට මේ ක්‍රමයෙන් තොරවද විදර්ශනා ක්‍රමයෙහි කියනලද භාවනා පිළිවෙළින් අර්හත්ඵල ප්‍රතිලාභයෙන්ම මේ ඉර්ධි විකුර්වණයද අනික් ප්‍රතිසම්භිදාදී ගුණයෝද සමෘද්ධවෙත්මය. යම්සේ පලඳනා විකෘතියක් කරනු කැමතිවූ රන්කරුතෙමේ ගිනිපිඹීම් ආදියෙන් රත්රන් මොලොක්කොට කර්මාන්තයට නිසිසේ කොටම ඒ පලඳනා විකෘතිය කරන්නේවේද යම්සේ මැටිභාජන තනන කුඹල්කරුතෙම කරමැට්ට මනාකොට මැඩ මොලොක්කොට ඒ භාජන තනන්නේ වේද එපරිද්දෙන්ම යොගාවචරතෙම මේ තුදුස් ආකාරයෙන් සිත දමනයකොට "ඉදින් අභිඥාවන් උපදවනු කැමති තැනැත්තහුට අභිඥාවන් සමෘද්ධවේනම් මටද එකාන්ත යෙන්ම සමෘද්ධවිය යුත්තේය යන කත්තුකම්‍යතා ඡන්දය ධූරකොට (ජ්‍යෙෂ්ඨකොට) පෙරටුකොට ගෙණ හෝ ඡන්දය උපදවා ඒ ඡන්දය භාවනාවට වාරයක් කොටගෙන හෝ ධ්‍යානයට සමවැදීම් වශයෙන්ද- චිත්ත, විරිය, වීමංසා යන තුනද මෙසේම එකිනෙක පෙරටුකොට ධ්‍යානයට සමවැදීම් වශයෙන්ද ආවජ්ජන සමාපජ්ජන අධිට්ඨාන උට්ඨාන පච්චවෙක්ඛන යන පස් ආකාරයෙන් වසඟබවට පැමිණවීම වශයෙන්ද මොලොක්කොට කර්මයට නිසිසේකොට ඉද්ධිවිධඥාණය ලබනු පිණිස භාවනා කටයුත්තේය.

අෂ්ටපදයෝ නම්- ඡන්දය, විරිය, චිත්ත, වීමංසා යන සතර හා ඒ සතර සමග යෙදුන සමාධි සතරදෙනද යන පද අට ගත යුතුය. එහි වනාහි ඉර්ධිය උපදවනු කැමති ඡන්දය සමාධිය හා එකවර නියුක්තවූයේම ඉර්ධි ප්‍රතිලාභය පිණිස පවත්නේය. විරිය, චිත්ත, වීමංසා යන තුන්දෙනද සමාධිය හා එකවර නියුක්තවූවාහුම ඉර්ධිප්‍රතිලාභය පිණිස පවත්නාහ. මේ ධර්මයන් අටදෙන කාරණකොටගෙන ඉර්ධියට පැමිණෙන හෙයින් සෘද්ධිප්‍රතිලාභය පිණිස පවත්නා හෙයින් සෘද්ධිපාදයෝ යයි කියනු ලැබෙත්.

සොළොස් මූලයෝ නම්- සොළොස් අයුරකින් ධ්‍යානචිත්තයාගේ නොසැලෙන බව සිද්ධකරන ධර්මයි. ඒ සොළොස් ආකාරයෝ දේශනාවෙහි මෙසේ සඳහන් වේ.

(1) කුසීතභාව වශයෙන් නොනැමුනාවූ, වීර්යයෙන් වඩන ලද බැවින් නොසැඟවුනු චිත්තය කුසීතභාව නිමිත්තෙන් නොසැලෙන්නේනුයි ආනෙඤ්ජ නම් වේ.

(2) ඖද්ධත්‍යයෙන් උඩට නොනගනලද, සන්හුන් චිත්තය ඖද්ධත්‍ය නිමිත්තෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම් වේ

(3) රාගවශයෙන් අරමුණෙහි ඇලීමෙන් නොනැමුණු සිත රාගහේතුවෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම.

(4) ක්‍රොධවශයෙන් දූෂ්‍යනුවූ සිත ව්‍යාපාද හේතුවෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම් වේ,

(5) මමය මාගේ යයි මිථ්‍යාදෘෂ්ටිවශයෙන් අල්වා නොගත් කාලද සිත මිථ්‍යාදෘෂ්ටියෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම් වේ,

(6) බලවත් ඡන්දරාගවශයෙන් දුරපවත්නාවූද ලඟපවත්නාවූද අරමුණු පිළිබඳ නොවූ සිත බහල ඡන්දරාග හෙතුවෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම් වේ,

(7) විශෙෂයෙන් කාමරාගයෙන් මිදුනාවූ ධ්‍යානචිත්තය කාම රාග හෙතුවෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම් වේ,

(8) කෙලෙසුන් කෙරෙන් හෝ චතුර්විධ යොගයෙන් විසංයුක්තවූ චිත්තය කෙලශ හෙතුවෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම් වේ.

(9) කෙලෙස් හිමි නොකරනලද හෙවත් සවලපවූද කෙලෙස් කොටසින් අකප්‍යවූ සිත කෙලශසීමාවෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම් වේ,

(10) එකාග්‍රබවට පැමිණීමෙන් අතිශයින් සන්හුන් සිත නොයෙක් සවභාව ඇත්තාවූ කෙලෙස් හෙතුවෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම් වේ.

(11) ශ්‍රද්ධාවෙන් රැකුල් දෙනලද චිත්තය අශ්‍රද්ධාවෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම් වේ.

(12) වීය්‍ය්‍යීයෙන් රැකුල්දෙනලද චිත්තය කුසීතභාව හෙතුවෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම් වේ.

(13) සමෘතියෙන් රැකුල්දෙනලද චිත්තය ප්‍රමාද හෙතුවෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම් වේ.

(14) සමාධියෙන් රැකුල්දෙනලද චිත්තය ඖද්ධත්‍ය හෙතුවෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම් වේ.

(15) ප්‍රඥාවෙන් රැකුල්දෙනලද චිත්තය අවිද්‍යාහෙතුවෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම් වේ.

(16) ඔභාසගත චිත්තය අවිද්‍යාන්ධකාරයෙන් නොසැලේනුයි ආනෙඤ්ජ නම් වේ.

මේ ධම් සොළස සෘද්ධිහුගේ මූලයෝ නම් වෙත්. මේ සොළස ඍද්ධිප්‍රතිලාභය පිණිස එහි නොපැකිළීම පිණිස පවත්නාහ.

අනතුරුව දශවිධ ඍද්ධි පිළිබඳ විස්තර දක්වමි.

| | |
|---|---|
| (1) අධිෂ්ඨානා ඉද්ධි | (6) අරියා ඉද්ධි |
| (2) විකුර්වණා ,, | (7) කර්මවිපාකජා ,, |
| (3) මනෝමයා ,, | (8) පුඤ්ඤවතො ,, |
| (4) ඤාණවිප්ඵාරා ,, | (9) විජ්ජාමයා ,, |
| (5) සමාධි විප්ඵාරා ,, | (10) තත්ථ තත්ථ සම්මාපයොග පච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි. |

මේ දශවිධ ඍද්ධි අතුරෙන්

(1) අධිෂ්ඨාන ඉර්ධි නම්: එකෙක්ව බොහෝ දෙනෙක්වීම පිණිස ආවර්ජනාකොට අධිෂ්ඨාන කිරීම– අධිෂ්ඨාන ඉර්ධි නම් වේ.

(2) විකුර්වණා ඉර්ධිය නම්: අනෙකප්‍රකාර රූපනිර්මාණාදී විකාර සංඛ්‍යාත කුර්වණ ඇත්තාවූ ඉර්ධිය විකුර්වණ ඍද්ධිනම්

(3) මනොමය ඍද්ධි නම්: මේ ශරීරයෙන් අන්‍යවූ සිතින් නිපදවනලද රූපීවූ ශරීරයක් මවාපෑම මනොමය ඍද්ධි නම්. මේ ත්‍රිවිධ ඍද්ධීන් පිළිබඳව චූලපන්ථක තෙරුන්ගේ කථාව නිදර්ශනය කටයුතුය.

(4) ඥානවිස්ඵාරා ඍද්ධි නම්: පශ්චිම භවිකයාහට අර්හත්මාර්ග ඥානය ලැබීමට පූර්වභාගයෙහි හෝ විදර්ශනාක්ෂණයෙහි නැතහොත් ප්‍රතිසන්ධිග්‍රහණය දක්වා හෝ පසුව ස්කන්ධ පරිනිර්වාණය දක්වා හෝ නො එසේ නම් අර්හත්මාර්ගෝත්පත්තික්ෂණයෙහි හෝ එම අර්හත් මාර්ගඥානයාගේ ආනුභාවයෙන් පැතිර පවත්නා ඥාන විශෙෂය ඥානවිප්ඵාරා ඉද්ධිනම්. අනිච්චානුපස්සනාවෙන් (සංස්කාරයන් අනිත්‍ය වශයෙන් බලන්නාවූ බලව විදර්ශනාවෙන්) නිත්‍ය සංඥාවගේ ප්‍රහාණාර්ථය සිද්ධවේනුයි ඥානවිප්ඵාරා ඉද්ධි නම් වේ. ඥාන විප්ඵාර ඍද්ධිය පිළිබඳව බක්කුල ස්ථවිරයන් වහන්සේගේ කථාව නිදර්ශනයකි.

**බක්කුල ස්ථවිර කථාව.** කොසඹෑනුවර ධනවත් සිටුපවුලක් විය. කල්යෑමෙන් සිටුදේවිය කුස කෘතපුණ්‍ය දරුබීජයක් ඇතිවිය. කුසහොත් දරුවාගේ පුණ්‍යතෙජසින් එම සිටුකුලය දිනෙන්දින ලාභයෙන් යසසින් බබලන්ට විය. දසමස් ඇවෑමෙන් දරුලාභය ලත් මවුතොම මෙසේ සිතුවාය. මගේ මේ පුත්රුවන පුණ්‍යවන්තය. යම්තාක් නීරොගිව දීර්ඝායුෂ්කව ජීවත්වේද; ඒතාක් අපට මහත් සම්පත්තිදායක වන්නේය. 'ඉපදී දින පසකින් යමුනා නදියෙහි ස්නානය කරවූ දරුවෝ නීරෝග වෙත්”යි ජනසම්මතයකුදු පවතී.

(උපන් දිනම යයි ද කියත්) එබැවින් මගේ දරුවා නීරොගවීම සඳහා ස්නානය කරවමැයි සිතා කිරිමවුව දරුවා දී යමුනා නදී තීරයට ගොස් ස්නානය කරවාගෙන එවයි යැවූවාය.

කිරිමවුතොම දරුවා නාවන කල්හි එක් මහා මත්ස්‍යයෙක් දුරතීක්ෂා දුටු මස්වැදැල්ලක් වැනි දරුවා ඩැහැගැනීම සඳහා මුඛය විවෘත කොට ගෙන ක්‍ෂණයකින් පැමිණ දරුවා ගිල පලාගියේය. කදිසියේම හයට පත් කිරිමවු දරුවා බේරාගත නොහැකිව මහත් වූ දුකින් සහ හයින් වෙවුලා ගෙදර ගොස් එපුවත සැලකලාය.

විස්මයකි, පුණ්‍යවන්ත දරුවා දුකකට නොපැමිණ යහන් ගැබට ප්‍රවිෂ්ටව නිදාගත්තාක් මෙන් මත්ස්‍යයාගේ කුසතුළ නීරෝගීව විසුවේය.

මත්ස්‍යයා දරුවාගේ පින්බලෙන් සිටිය නොහැකිව වේගයෙන් තිස්යොදුනක් ගොස් බරණැස් නුවර මසුන් මරන මිනිසුන් විසින් දැමූ දැලක බැඳුනේය. කෙවුලන් අතට අසුවුන මත්ස්‍යයා දුටු ඔව්හු නොකපා කදබැඳගෙන කහවණු දහසකට විකුණමහයි නුවර හැසුරුණාහ.

බරණැස අසූකෙළක් ධන ඇති පුත්‍රයන් නැති සිටුකුලයක් වෙත පැමිණිවිට යටකී මත්ස්‍යයා කහවණුවකට විකුණා ඒ මිනිස්සු යන්ටගියහ.

මහා මත්ස්‍යයාගේ කුසින් නීරොගී පුත්‍රුවන ලබාගත් ඒ සිටුපවුල ඉතා සතුටින් ඒ පුත්‍රයා ඇතිදැඩිකරන කල්හි කොසඹෑ නුවර විජාතමාතෘවටද දැනගන්ට ලැබී, බරණැස ගොස් බලා ඒ තමන්ගේ පුත්‍රයා බවත් මත්ස්‍යයා ගිලගත් පුවත කියා උරුම කීවිට– මේ අපගේ පුත්‍රයා මත්ස්‍යයාගේ කුසින් ලැබුණ බැවින් අපට අයිතිය. මිලදීගත් හෙයින් ද අපට අයිතියයි එක් පක්‍ෂයක් කීය. අනෙක් පක්‍ෂය දසමසක් කුසේ දරිමෙන් හා විජායනයෙනුත් අයිති අපටමයයි වාදකළෝය. අධිකරණ නායකයෝ දෙපක්‍ෂයටම අයිතියයි තීන්දුකරමින් සාරමසක් විජාත මාතෘව ළඟද, සාරමසක් බරණැස් සිටුපවුල ළඟද ඇතිදැඩිවන ලෙස විධිවිධාන කළෝය. දෙකුලයෙහි හැදුන වැඩුනබැවින් බක්කුල නමින් ප්‍රකට විය. මහා පිරිවර සම්පත් ඇති අසූවියට පත් බක්කුල සිටුතෙම බුදුරජානන් වහන්සේගෙන් බණඅසා පැහැද පැවිදි විය. පැවිද්දෙන් අටවැනි දින සිවුපිළිසිඹියා සමඟ රහත් බවට පත්ව පසුකලක නීරොගී ජීවිතලාභීන් අතුරෙන් අග්‍රස්ථානාන්තරය ලබා එක්සිය හැටවසක් ආයුවළඳා අනුපාදිසෙස නිර්වාණ ධාතුවෙන් පිරිනිවිසේක.

මේ කථාවෙහි බක්කුල සිටුපුත්‍රයා මත්ස්‍යයාගේ කුසෙහි නොමැරී ජීවත්වූයේ එම අත්බැව ලබණ අර්හත්මාර්ගඥාන විස්ඵාරය නිසා බැවින් එය ඥාණවිප්ඵාර ඉද්ධි නම්.

**සංකිච්ච තෙරුන්ගේ කථා පුවත.**

මේ සංකිච්ච තෙරුන් මවුකුස ඉන්දදීම මව කාලක්‍රියා කළාය. ඇගේ මෘතශරීරය දරසෑයට නංවා හුලින් ඇන දවනු ලබන්නේ, බඩතුළ කොත් ළදරුවාගේ ඇස්බැම කෙළවර වැදුනු හුලින් පහර ලැබ හැඹුවේය. එවිට ළදරුවා ජීවත් වන බව දත් සොහොන්ගොවුවෝ වහාම දරසෑයෙන් ඉවත්කර ගත් මෘතශරීරයේ කුස පළා දරුවාගෙන මුත්තනියන්ට පාවා දුන්නෝය. මුත්තනියන් විසින් පොෂ්‍යය කරනලද ඒ ළදරුතෙම වැඩිවියට පැමිණ බුදුසසුන්හි පැවිදිව සිවුපිළිසිඹියා සමග රහත් ඵලයට පැමිණියේය. මේ කියනලද දරසෑයෙහිදී නීරෝගීව සිටීම ඥාණවිප්ඵාර සෘද්ධි නම් වේ.

(5) **සමාධිවිප්ඵාර සෘද්ධිය නම්**– ප්‍රථමධ්‍යානාදී සමාධියෙන් පෙර උපචාරධ්‍යානක්ෂණයෙහි හෝ සමාපත්තිහුගේ විණණ පයසීනතායෙහි හෝ සමවතට සමවත් ක්ෂණයෙහි හෝ ප්‍රථමධ්‍යානාදී ඒ ඒ ධ්‍යානයෙහි සමාධිතෙජසින් නිර්ඝාතිතවූ නීවරණ විෂ්කම්භණය විතර්කාදී සමතික්‍රමය නිරොධක්ෂණයෙහි උපද්‍රව නොවීමය යනාදී විශෙෂය සමාධිවිප්ඵාර සෘද්ධි නම් වේ. මේ පිළිබඳව දෙශනාවෙහි මෙසේ කියන ලදී.

ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන්ගේ ප්‍රහාණාර්ථය සමෘද්ධවේනුයි සමාධිවිප්ඵාර සෘද්ධිනම්. මේ පිළිවෙලට නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යාන සමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතන සංඥාවගේ ප්‍රහාණාර්ථය සමෘද්ධවේනුයි සමාධිවිප්ඵාර සෘද්ධි නම වන්නේය. මෙසෙයින් අෂ්ටසමාපත්තිහුම සමාධිවිප්ඵාර සෘද්ධි නම්.

ආයුෂ්මත් සාරිපුත්‍ර ස්ථවිරයන්ගේ සෘද්ධිය, ආයුෂ්මත් සඤ්ජීව ස්ථවිරයන්ගේ සෘද්ධිය, ආයුෂ්මත් ඛාණුකොණ්ඩඤ්ඤ ස්ථවිරයන්ගේ සෘද්ධිය, උත්තර නම් උපාසිකාවගේ හා සාමාවතී නම් උපාසිකාවගේ සෘද්ධිය සමාධිවිප්ඵාර සෘද්ධි නමැයි දන්නේය.

**සැරියුත් තෙරුන්ගේ සමාධි විප්ඵාර සෘද්ධිය.**

මහමුගලන් තෙරුන් සමග කපොත කන්දරා නම් ආරණ්‍ය සෙනාසනයක සඳපානින් ආලොකමත් වූ රාත්‍රියක එදවස් බානාලද හිසකේ ඇතිව අභ්‍යවකාශයෙහි වැඩහුන් සැරියුත් මහතෙරුන්ගේ හිසට එක්තරා දුෂ්ට වූ යකෙක් මිත්‍ර යක්ෂයා විසින් වලකද්දීත් ඒ නොගිනිස පහරක්

හැසීය. ඒ ප්‍රහාර ශබ්දය මේඝ ගර්ජනාවක් මෙන් දශදිසාවෙහි ඇසුනේය. ඒ යක්ෂයා විසින් පහරණු ලබණ කල්හි වහා දැනැනට සම වැදීමෙහි උත්කෘෂ්ට බවට පැමිණ සිටි බැවින් එකෙණෙහිම දැනැනට සමවැදුනේය. එබැවින් උන්වහන්සේට කිසිම ආබාධයක් හෝ පීඩාවක් නොවීයැ. මෙය සමාධිවිප්ඵාර ඍද්ධියගේ ආනුභාවයයි.

### ගින්නෙන් භයක් සිදුනොවන්නාවූ සමාධිවිප්ඵාර ඍද්ධිය.

කකුසඳ බුදුරජානන් වහන්සේගේ ශාසනයෙහි එක් ස්ථවිර නමක් ආරණ්‍යයක රුකක්මුල නිරොධයට සමවැද හුන්හ. එතනට පැමිණි ගොපලු දරුවෝ යටකී තෙරුන් කළුරිය කලහයි සිතා තණ පරණලා දර ගොම ආදිය රැස්කොට ගොඩක්ගසා ගිනි තැබූහ. මහතෙරුන්ගේ සිවුරෙහි නූල්පටක් පමණකුදු නොදැවිණ. එතැන්පටන් උන්වහන්සේ සඤ්ජීව ස්ථවිර නමින් ප්‍රසිඬවිය. මෙය ඒ තෙරුන්ගේ නිරොධ සමාපත්ති බලයෙන් ගිනිභය නොවීම සංඛ්‍යාතවූ සමාධිවිප්ඵාර ඍද්ධි නම් වේ.

### ඛාණුකොණ්ඩඤ්ඤ ස්ථවිරයන්ගේ සමාධිවිප්ඵාර ඍද්ධිය.

මේ ස්ථවිරතුමා ස්වභාවයෙන්ම සමාපත්ති බහුල කෙනෙකි. දිනක් උන්වහන්සේ රාත්‍රිකාලයෙහි එක් වනයක සමවතට සමවැද හුන්නේය. ගම්පැහැර උමංබිඳ බඩු සොරාගත් සොරුන් පන්සියයක් යටකී තෙරුන් වැඩසිටි තැනට පැමිණ, දැන් අප ලුහුබැඳ එන්නෝ නැත්තාහයි නිසැකව සැතපෙනු කැමතිව තම තමන් ගෙන ආ බඩුපොදි බහා තබන්නාහු යටකී තෙරුන් කණුවක් යයි සිතා තෙරුන් මතුයෙහි බඩුපොදි ගොඩගැසුවාහ. එසේතබා නිදා හිඳ විඩා සංසිඳුවා ගෙන නැඟිට පිටත්ව යනු පිණිස බඩුපොදි ඉවත්කර ගන්නාහු අවසාන බඩුපොදිය ගන්නවිට සැලෙන බව දැක යකෙකැයි භයින් මහත් ශබ්ද නගා කෑගැසූහ. ස්ථවිරතුමාගේ සමවත් කාලපරිච්ඡේදය අවසාන වීමත් අන්තිම බඩුපොදිය ගැනීමත් එකවර සිදුවීම නිසා උන්වහන්සේ චංචලවූහ.

තෙරණුවෝ භයටපත් සොරුන් අස්වසා භයනොවවු මම බුඬ ශ්‍රාවකයෙක්මියි තමන් හඳුන්වා දී සොරුන්ට බණ කියා පහදවා ඒ පන්සියදෙනාම පසුව මහණකරවිය. පසුකාලයේදී ඒ පන්සියයම කම්ටහන් වඩා සිවුපිළිසිඹියාපත් රහත් වූහ.

මේ කථාවෙහි බඩුපොදි පන්සියයක් ස්වකීය හිස මතුපිට පටවාතිබියදීත් තෙරුන් වහන්සේ කිසි වෙහෙසකට නොපැමිණ නීරොගිවීම සමාධිවිප්ඵාර ඍද්ධියගේ ආනුභාවයෙන්ම සිඬවිය.

**උත්තරා උවැසියගේ සමාධි විප්ඵාර ඍද්ධිය.**

පෙර පූර්ණක සිටුදියණියවූ උත්තරා නම් සැදැහැවත් උවැසියක් විය. ඈ කෙරේ ඊර්ෂ්‍යා කළ සිරිමා නම් වෙසඟක දිනක් රත්වූ තලතෙල් හැන්දක් ගෙන හිසෙහි වත්කළාය. උත්තරා උවැසිය එකෙණෙහිම මෛත්‍රී භාවනා කොට උපචාරධ්‍යානයට සමවැදුනාය. වත්කළ ඝාකියන තෙල් නෙළුම් පත තොරැඳි දියබිඳක් මෙන් බිම පතිත විය. මේ උපචාරධ්‍යාන සමාධිවිප්ඵාර ඍද්ධියගේ බලයෙන් සිඬවිය.

සාමාවතියගේ කථාව දම්පියා අටුවාවෙහි ඇ බැවින් එයින් බලා ගතයුතු.

**ආයසී ඍද්ධිය නම්**– ප්‍රතිකූල වස්තූන්හි අප්‍රතිකූල සංඥ ඇතිව වාසයකිරීම් ආදිය ආයසී ඍද්ධි නම් වන්නීය. මේ ඍද්ධිය රහතුන්ටම ඇතිවන බැවින් ආයසී ඍද්ධි නම් වේ.

**කම්මවිපාකජා ඍද්ධි**– සියලු පක්ෂි ආදීන්ගේ අහසින් ගමන් කිරීම් ආදිය කර්මවිපාකයෙන් සිඬවන බැවින් කර්මවිපාකජ ඍද්ධි නම් වේ. සියලුම දෙවියන්ගේද සමහර මිනිසුන්ගේද, සමහර විනිපාතික යන්ගේද අහසින් ගමන් කිරීම් ආදිය කර්මවිපාකයෙන් සිදුවන බැවින් කර්මවිපාකජ ඍද්ධි නම් වේ.

**පුඤ්ඤවතො ඉද්ධි නම්**- පින් මුහුකිරීමෙන් සිඬවන ඍද්ධිය පුණ්‍යවන්ත ඍද්ධි නම් වේ.

ජොතිය සිටාණන්ට මහා පෘථිවිය බිඳගෙන මාණික්‍යමය ප්‍රාසාදයක් පහළවිය. කප්රුක් සුසැටක් පැනැංගාහ.

ජටිල සිටාණන්ට අසූරියන් උසඇති ඝණරන් පර්වතයක් පොළව පළාගෙන පැනනැංගේය. ඒ රන් පර්වතය කොතෙක් ගත් තත් නොගෙවන්නේය. නොහිමෙන්නේය.

ඝොසක සිටාණන් සත් තැනක මරණු පිණිස උපක්‍රම යෙදූ කල්හි පවා කිසි දුකකට නොපැමිණ නීරොගිභාවයෙන් යුක්ත වීම පුණ්‍යවන්ත ඍද්ධි නම් වන්නීය.

මෙණ්ඩක සිටාණන්ට එක් කිරියක් පමණ ප්‍රදෙශයෙහි සත් රුවන්මුවා එළුවන් පහළවීම පුණ්‍යවන්ත ඍද්ධි නම් වී- මහපිනැති යන් පස්දෙනෙකි- මෙණ්ඩක සිටුතුමා, ඔහුගේ භාර්‍ය්‍යාවූ චන්ද පදම ශ්‍රී දේවිය, පුත්‍රවූ ධනඤ්ජය සිටුතුමා, යෙහෙළි වන සුමනා දේවිය, පූර්ණක දාසයාය, යන පස්දෙන වෙත්. ඔවුන්ගෙන් මෙණ්ඩක සිටුතුමා ජලස්නානය කොට අහසාදෙස බැලූකල්හි ඔහු ගේ දෙළොස් දහස් පන්සියක් කොටුගුල් අහසින් ඇ රත්හැල්

වළින් පිරියයි. එක් අතුල්තලයක චන්ද්‍රමණ්ඩලයට බඳු රේඛාවක් හා එක් අතුල්තලයක පද්මයක් බඳු රේඛාවක්ද ඇති බැවින් චන්ද්‍ර පද්ම ශ්‍රී නම් සිටු භාර්‍යාව සහල් නැළියකින් පිසූ බත් සැලියක් ගෙන සියලු දඹදිව් වාසීන් වළඳවන්නීද බත කෙලවර නොවෙයි. පුත්‍රවූ ධනඤ්ජය සිටුතුමා දහසින් බඳ පියල්ලක්ගෙණ සියලු දඹ දිව් වාසීන්ට බෙදාදෙන්නේ නමුත් කහවනු නිමාවට නොයයි. යෙහෙළිවූ සුමනාදේවී තොමෝ එක් වී තිඹක් ගෙණ සියලු දඹදිව් වාසීන්ට බෙදාදෙන්නී නමුත් වී නිමාවට නොයයි. පූර්ණක දාස තෙමේ එක් නඟුලකින් සීසාන කල්හි ඔබින් සතෙක මොබින් සතෙකැයි හීවිටිමං තුදුසක් වෙති. ඒ මේ පස් පුණ්‍යවන්තයින්ගේ සෘද්ධියයි.

විජ්ජාමය ඍද්ධි නම්- විද්‍යාධරයන්ගේ මන්ත්‍ර බලයෙන් සිඬවන අහස් ගමන් ආදිය විජ්ජාමය සෘද්ධි නම් වේ. සම්‍යක්ප්‍රයොග ප්‍රත්‍යයෙන් යුක්තිපූර්වක ආරම්භයෙන් ඒ ඒ කර්මය හටගන්නා සෘද්ධිය සමෘද්ධිවීම ඒ ඒ කටයුත්තෙහි මොනවට යෙදීමෙන් සමෘද්ධ වන හෙයින් සෘද්ධි නම් වන්නීය. නෛෂ්ක්‍රම්‍ය සංඛ්‍යාත ප්‍රථම ධ්‍යානයෙන් කාමච්ඡන්ද නීවරණයාගේ ප්‍රහාණාර්ථය සමෘද්ධවෙයි. විතීයධ්‍යානාදියද මෙසේම දතයුතු රහත් මගින් සියලු කෙලෙසුන්ගේ ප්‍රහාණාර්ථය සිඬවේනුයි සම්මාපයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි නම්වේ.

තවද ගණිත ගන්ධර්වාදී යම්කිසි ශිල්පකර්මයක් හෝ ශල්‍යකර්‍ම ආදී වෛද්‍ය කර්මයක් හෝ යටත්පිරියෙසින් සීසෑම් වැපිරීම් ආදිය පටන් ඒ ඒ කර්මයකොට හටගන්නාවූ විශෙෂය ඒ ඒ කර්තව්‍යයෙහි සම්‍යක්ප්‍රයොග ප්‍රත්‍යයෙන් සමෘද්ධ වන අර්ථයෙන් ඍර්ද්ධි නම් වේ. මෙසේ දශවිධ ඍර්ද්ධීන් දතයුතුය. මෙතැන්හි අධිෂ්ඨාන ඍර්ද්ධිය හා විකුර්වණ ඍර්ද්ධියද මනොමය ඍර්ද්ධියද අභිප්‍රේතය.

නිමි.

# සැලකිය යුතුයි.

"සිරි අරියවංස ගුණානුස්මරණ සමිතිය" මගින් වර්ෂයක් පාසා පලකරවනු ලබන ආයර්ෂවංශ ධර්මපුස්තකමාලාවේ, අංක 1 දරණ "සප්තබොධ්‍යාංගය" නමැති පොත ඔබතෑ පින්වතුන් අප වෙත දන්වන්න.

ඔබකරණ සියලු පින්කම් වලදී පූජාකිරීමට සහ ඔබට නිතර බැලීමටද, සුදුසු මෙම පොත්පෙල ඔබගේ දූ පුත්‍රාදීන් යහමගට ගෙණයන කල්‍යාණ මිත්‍රයෙකි.

**මිල 2. 50 සි. තැපැල්ගාස්තුවක් නොමැතිසි.**

පොත් සතරකින් බොධිපාක්ෂික ධර්ම තිස්හත අවසන් කිරීමට බලාපොරොත්තු වන අප සමිතියට ඔබද බැඳී, නොවැම්බර් මාස වලදී පමණක් රු: 2. 50 ක් ගෙවීමෙන් වර්ෂයක් පාසා පොත් සහ සමාජික මහතුන්ගේ නම් ගම් ඇතුලත් "සිරි අරියවංස" ලිත්ද, "ජනවාරි මාසයේදී ඔබහට ලබාගන්න" "වැඩිදුර කරුණු විමසන්න."

එකවර රු: 7. 50 ක් ගෙවීමෙන් දැනට අච්චුගැසී තිබෙන "අංක 1, 2 දරණ- සප්ත බොධ්‍යාංගය- බාරස ධර්මය- යන පොත් දෙකද" 50- 51 වර්ෂවලදී- "ඉන්ද්‍රියබල ධර්ම, අරිඅටගි මග" යන පොත් දෙකද, ලිත්ද එවිනු ලැබෙත්.

පුණ්‍යකටයුතුවලදී පූජා සඳහාද- පොත් වෙළඳුන්ටද
පහසු මිලට දෙනු ලැබේ.

මීට,

**ඩී. අර්නෝලිස් කුලතිලක**
සිරි අරියවංස ගුණානුස්මරණ සමිතිකාර්යාලය
සිරි සුධර්මාරාමය- මොරටුමුල්ල.

# ඉන්ද්‍රිය බල ධර්ම.

ආර්‍යවංශ ධර්ම පුස්තකමාලා

අංක 3.

මොරටුමුල්ලේ සිරි සුධර්මාරාමාධිපති

මොරටුවේ සිරි සාසනවංස

මහා ස්ථවිරපාදයන් වහන්සේ

විසින්

සම්පාදිතයි

සිරි අරියවංස ගුණානුස්මරණ සභාව

විසින්

කොළඹ යූ. පී. ඒකනායක සහ සමාගමේ

මුද්‍රණාලයෙහි මුද්‍රාපිතයි.

ශ්‍රී බු: ව: 2494

ක්‍රි: ව: 1950

මිල රු: 2–50 යි.

# සංඥපනය.

ආර්යවංශ ධර්ම පුස්තක මාලාවේ අංක 3 දරණ මෙම පොත ඉන්ද්‍රිය බල ධර්ම නමින් හැඳින්වේ. බෝධිපාක්ෂික ධර්ම සතිසට අයත් "පඤ්චෙන්ද්‍රිය හා පඤ්චබල" මීට ඇතුලත් වෙත්. සිරි අරිය වංස ගුණානුස්මරණ සභාව මගින් වර්ෂයක් පාසා සිදුකරගෙණයන පුණ්‍යෝත්සවයන්හිදී උගත් දේශකයන් වහන්සේලා පවසන ධර්මයන් ලියවා ඇතුලත් කොට මෙම පුස්තකයන් ව්‍යාප්තකරලීම සමිතියේ ඉටාගත් මුල් අදහසයි. එය නොකඩවා කරගෙනයනු දක්ම අපට ද සතුටකි. මෙම උතුම් ධර්මප්‍රචාරය පිළිබඳව වර්ෂයන් වර්ෂය බොහෝ සාධූන් විසින් ආධාරත් සමග කර එවන ප්‍රසංසා ආදිය සමිතියේ උද්‍යෝගයට අත්‍යන්තෝපකාරී වෙත්. ඒ පිළිබඳව අපි කෘතඥ වෙමු.

මෙම පොත් පෙළෙහි ගැබ්වී තිබෙන්නේ ලොවුතුරු බුදුරදුන් වහන්සේලා ස්වකීය බුද්ධඥානය අවබෝධකර ගැණීමට කාත්පසින්ම තුඩුදෙන බෝධිපාක්ෂික ධර්ම සතිසයි. හිරු නිසා රශ්මිත් රැස් නිසා හිරුත් තේජසින් හා ශෝභාවෙන් බබලන්නාසේ බුදුන් වහන්සේ නිසා සතිස්බෝධිපාක්ෂික ධර්මත්, එම ධර්මරසමිය නිසා බුදුන් වහන්සේත්, සියලු බඹ, සුර, නරිඳුරජුන්ගේ තෙද විකුම් මැඩ ඔවුනට වැඩ වඩා තෙලොවම තෙදින් හා ශෝභාවෙන් බැබලූසේක. අසංඛ්‍ය කල්ප ගණනක් නමුදු දිරිවඩා මෙම ධර්මයන් අවබෝධ කරගෙණ තමන් වහන්සේ පැමිණි බුද්ධරාජ්‍යයට පැමිණීම සඳහා බොහෝ සෙයින් අවවාද දී තිබෙන්නේ පරම කාරුණ්‍ය ගුණය කිති. කිසිද ශාස්තෘවරයෙකුගේ මුවින් නොගිළිහුන තමන් වහන්සේ ලත් බුද්ධ රාජ්‍යශ්‍රී සම්පත්තිය අප හැමදෙනෙකුටම ලබාදීමට උගැන්වූ මාර්ගය නම් සත්තිස්බෝධිපාක්ෂිකධර්ම සමුදායයි. ඉන් එකිනෙක පින්වතාට අසිති බුද්ධත්වය ලබාගැණීමට වීර්යවැඩීම කුමන් සතු ක්‍රියාවකි. එම තත්වය ලබාගැණීමට උත්සාහවත් වන ඔබට අවශ්‍ය ධර්ම සතිස මේ බණ පොත් පෙළෙන් තේරුම් කරදෙත්. එනිසා මෙම පොත් පෙළ බුදුබව පෙන්වන කැඩපතකි, බුදුබවට ගෙණයන දිව්‍ය රථයකි, බුදුබව නමැති මහා සමුද්‍රයට ගලාබස්සවන ජලශ්‍රොතසකි, උගත් නූගත් කාහටත් භාවිතා කරන්ට හැකිවන පරිදි දේශකයන් වහන්සේලා ලවාම සකස්කරවනලද මෙම ධර්මයන් ගෙන් ඇතිවන ප්‍රයෝජනය තෙවලා දහම් පොත් රැසක් ඇසුරුකරද ලබාගැණීම දුෂ්කර කාරුණකි. එබැවින් මෙම පොත් භාවිතා කිරීමෙන් එම දුෂ්කරත්වය බොහෝදුරට මැඩගෙණ ධර්මඥාණය නිපුණ

කරගැණීමට උත්සාහවත්වන ලෙස මතක්කරමු. බොහෝ නැනවතුන්ගේ පැනසට පවා පාත්‍රනොවන නොඇලෙන මෙම සතිස් දහම් ශ්‍රද්ධා වීර්‍ය්‍යාදියෙන් තොරවූවෙකුහට කෙසේ නම් පියකරන්ද විනෝදය මව්පියන්සේද, ආගමේද සලකන සියයට අනූවක් පමණ විද්‍යමාන වර්තමාන අවදියෙහි ශේෂවන දසදෙනාගේවත් බුද්ධ ආගම ධර්මාදියෙන් වැඩීයාම ලෙහෙසැයි පතන අපි මෙම ධර්මප්‍රචාරයෙහි උත්සුකවීමු. මිරිගුවට දුවඑන මෘගයන්සේද ජපයට රැවටෙන භූතයන්සේද, සුවඳට දුවන බිඟුන්සේද, රසයට තුටුවන සොඬුන්සේද, පහසට තුටුවන කාමුකයන්සේද, මනසට වශල්වන මිසදිටුවන්සේද නොමග ගෙන සසරට මුලානොවී දහම ගෙණ වහම සසරින් මිදීමේ උපාය මග බැස ගමන්ගත යුතුයි. ජාත්‍යාදී දුක්ගැහැට දැක දැන මිදෙන්ට යන්න දරන්නෙකුට යායුතු යහමග මෙම සතිස් දහම් මගම බැව් අර්ථකල්පයෙන් සලකා මෙම පොත්පෙළ නිතර භාවිතා කිරීමට සිතාගත යුතුයි. සිය ගෙදර ස්වාමියාගේ සුදු අදහස් ඉවතලා දූ පුත් දාසි දසුන් නොමගට හැරියන්නේ බොහෝවිට විවේක කාලයෙහිදී ඔවුන් භාවිතා කරණ පත පොත අනුව බැව් කියයුතු නොවේ. එය මව්පිය ගුරු ඇදුරු ඈ දෙටුවන් නිතැතින් සිහිනුවනින් සොයා ඊට පිළියම් කළයුතුයි. අද බොහෝ නැනවතුන් නුහුරට හැරී යහපතට එරෙහිව ක්‍රියාකිරීමට තැත්කරණ ක්‍රම අතර පළමුවැන්න අසභ්‍ය හිස් බොරු මාලාවලින් ගැවසුන පොත්පත් ඈ ප්‍රචාරය බැව් රහසක් නොවේ. ඉන් මිදී මපිනා ජීවිතය ස්වර්ණමය අවස්ථාවට ගෙණැමට සැම අතකින්ම පොහොසත් උතුම් සම්බුද්ධ ධර්මය සැම දරුවෙකුගේම සිතෙහි ඇලවීමට සැම ශිෂ්‍යයෙකුගේ අභ්‍යාසයට යාකිරීමට මව්පිය ඇදුරු උවැදුරෝ වහා දිරිවැඩිය යුතුයි.

මේවර මෙහි දේශනා කීපයක්ම අපට ලියන්ට වීමෙන් ඇතිවූ අවහිරය කල්‍යාණ මිත්‍ර මොරටුමුල්ලේ තපසරු රාමාධිපති භදන්ත ශ්‍රී ආචාර්‍ය්‍ය පෙමරතන මහා ස්ථවිරපාදයන් වහන්සේ විසින් වැඩිපුර දේශනා දෙකක්ම ලියාදීම නිසා මගහැරීගිය බව කෘතඥතා පූර්වකව මෙහිලා සිහි කරමු. ගුණ නැන දෙකින් හෙබි මිතුරන්ගේ ඇසුර සදා සන්තුෂ්ටිකර බැව් මින් ඔප්පුවේ.


මේවර පොත සකස්කරදුන් ලක්දිව විරප්‍රසිද්ධ ශූ. පී. ඒකනායක සහ සමාගමේ කාර්‍ය්‍යාධිකාර මහතුන්ටද මෙහිදී අපි ප්‍රසංසා කරන්නේ සැම පින්වතුන්ගේම ශාස්ත්‍රීය කටයුතු කලට සපයා ගැණීමෙන් ඇතිවන ප්‍රීතිය සතුකර ගැණීම සඳහායි.

මෙහි පළවන ධර්මයන් ලිහිල්කරන්ට යෑමේදී ඇතිවී තිබෙන සාවද්‍යස්ථාන පිළිබඳව යම්කිසි විමති ආදියක් ඇතිවුනි නම් එය අපෙන් විමසන ලෙසද මින් අපි බලාපොරොත්තුවන ධර්මඥතාව බොධය බොහෝ උත්සාහයෙන් හමුදු ලබාගන්නා ලෙසද කරුණාවෙන් සෑම පින්වතුන් වෙත දැනුම්දී සිටින්නේ,

හිතසැප කැමති,

මොරටුවෙ ශාසනවංශ ස්ථවිර,

2494
—— සිරි සුධර්මාරාමය,
1950 මොරටුමුල්ල.



සිරි සඥාණාභිවංස ධම්මාධාර වංසපාල විනයාලඞ්කාර

මොරටුවේ සිරි අරියවංසාභිධාන

ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

# දේශනා පිළිබඳ දායකත්වය දැරූ පින්වතුන්.

1 පරලෝ සැපත් ඇම්. ඒතිස් ප්‍රනාන්දු උපාසක මහතාට පින් පිණිස ටී. සොපියා ප්‍රනාන්දු, ඇම්. දනෝරිස් ප්‍රනාන්දු මෂ, ඇම්. සිලී ප්‍රනාන්දු, ඇම්. ඉසබලා ප්‍රනාන්දු, ඇම්. රොසලින් ප්‍රනාන්දු යන මහත්මියන්- පැල්පොළ.

2 ජී. මිසියා ප්‍රනාන්දු, කේ. එලිසා ප්‍රනාන්දු, ජී. මිසියා ප්‍රනාන්දු, ටී. ලෑසිසා ප්‍රනාන්දු යන මහත්මියන්- පැල්පොළ.

3 ඇම්. ඇසිලින් ප්‍රනාන්දු, ටී. අංගො ප්‍රනාන්දු, ඇම්. තොන්නා ප්‍රනාන්දු, ජී. රන්සා ප්‍රනාන්දු යන මහත්මියන්- පැල්පොළ.

4 ටී. පී. ප්‍රනාන්දු, ඇම්. මැගිලින් ප්‍රනාන්දු, ජී. බබානෝනා, ඒ. පොඩිනෝනා යන මහත්මියන්- පැල්පොළ.

5 ඇම්. සෙලෙස්තිනා ප්‍රනාන්දු, ජී. ජෙන්ගි ප්‍රනාන්දු, කේ. එසියා ප්‍රනාන්දු, ඇඩිලින් වීරසේකර යන මහත්මියන්- පැල්පොළ.

6 කේ. එමියා ප්‍රනාන්දු, ජී. ජැන්සි ප්‍රනාන්දු, ඊ. ලෑසිසා ප්‍රනාන්දු ඇම්. සිසිලින් ප්‍රනාන්දු යන මහත්මියන්-

7 ඇම්. මිසියා ප්‍රනාන්දු, ජී. ඇසිලින් ප්‍රනාන්දු, ඇම්. ලූසියා ප්‍රනාන්දු, ටී. ජැසිලින් ප්‍රනාන්දු යන මහත්මියන්-පැල්පොළ

8 ජී. ජයෙන්රිස් ප්‍රනාන්දු, කේ. සෝදිරිස් ප්‍රනාන්දු, ඇට්මින් වීරසේකර, කේ. මාටින් ප්‍රනාන්දු, ඇම්. ආරොන් ප්‍රනාන්දු, ඇම්. ඇඩ්මන් ප්‍රනාන්දු, ජී. උඩරිස් ප්‍රනාන්දු යන බාස් මහතුන්.

9 ඇම්. මේරි ප්‍රනාන්දු, ඒ. බී. මිසිලින්, ඇම්. සොපියා ප්‍රනාන්දු, කේ. රන්සා ප්‍රනාන්දු යන මහත්මියන්- පරදූව.

10 ඇම්. එමියා ප්‍රනාන්දු, කේ. මංගෝ ප්‍රනාන්දු, ඩී. ඇල්පිනා බර්බෝස්, කේ. ඇලිස් ප්‍රනාන්දු යන මහත්මියන්- පැල්පොළ.

**මෙ-සතුන්වැඩකැමති,**

**සිරි අරියවංස ගුණානුස්මරණ සමිතිය.**

# ඉන්ද්‍රිය බල ධර්ම.

රන්දොඹේ ශික්ෂාලඞ්කාර විද්‍යාලයයෙහි ප්‍රධානාචාර්‍ය්‍යවූද කහවේ සිරි සෝභිතාරාමය, හක්මන කන්දේගොඩ බණ්ඩාරාමය, තාරුපේරියේ සිරි විජයාරාමය යන විහාරත්‍රයාධිපතිවූද "සිරි සද්ධම්මවංසාලඞ්කාර විසුද්ධාචාර කවිධජ විනයාචරිය" හක්මන සිරි සඞ්ඝතිස්ස නායක මහාස්ථවිර පාදයන් වහන්සේ විසින් ශ්‍රී බුද්ධ වර්ෂ 2493 දුරුතු මස පුර අටවක් ලත් ගුරු දින පැල්පොල ඉසිපතනාරාමයෙහි පවත්වනලද ධර්මදේශනාව.

## සද්ධින්ද්‍රිය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

**තත්ථ කතමං සද්ධින්ද්‍රියං? යා සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදො සද්ධා සද්ධින්ද්‍රියං සද්ධාබලං, ඉදං වුච්චති සද්ධින්ද්‍රියං.**

**පින්වතුනි!**

දැන් මා මාතෘකා කළේ අද මෙහි ධර්මදේශනාවට නියමිත මාතෘකාවයි. මෙය අභිධර්ම පිටකයෙහි විභඞ්ගප්‍රකරණයෙහි ඉන්ද්‍රිය විභඞ්ගාගත සූත්‍රාන්ත භාජනීයෙහි ඇතුළත් පාඨයෙකි. එය විස්තර කරදීමට මුලින් හැම ධර්මකථිකයන් විසින් පවත්වාගෙනඑනු ලබන චාරිත්‍රයක් වන ධර්මානිශංසය පිළිබඳවත් කරුණු ස්වල්පයක් කියයුතුව තිබේ.

බණ ඇසීම සියලු ලොවී ලොවුතුරු සැප ලැබීමට ඉවහල් වන පිණකි. ධර්මශ්‍රවණය කරන්නහුගේ මෙලෝ පරලෝ දෙක්හිම ඥානය දියුණුවේ.

"**සොතාවධානෙ පඤ්ඤා සුතමයෙ ඤාණං**" යන පටිසම්භිදා මග්ග පාළිපාඨයෙන් ඒ බව ප්‍රකාශයි. එහි අදහස කන්යොමුකොට දහම් ඇසීමෙහි පැවැති ප්‍රඥාව ශ්‍රැතමය ඥානය බවයි. ශ්‍රැතමය ඥානය බණ ඇසීමෙන්ම ලැබිය යුතුය. ධර්මශ්‍රවණයෙන් තොරව කිසි ශ්‍රාවකයෙකුට මාර්ගඵල ප්‍රත්‍යක්ෂ කරගැනීම උගහටය. එසෙ සිත් බණ ඇසීමෙන් මේ ජාතියෙහි මාර්ගඵලාවබොධය නොකළද

මතු මාර්ගඵලාවබෝධයට උපනිඃශ්‍රය වේ. ශ්‍රොතාවධානයෙහි පැවැති ප්‍රඥාව ඒ ඒ අර්ථයන් ප්‍රකටකොට දැනගැණීමටද අනිත්‍යාදි ප්‍රකාරයෙන් දැන ගැණීමටද සමර්ථය. හොඳට බණ ඇසීමෙන් ඒ ප්‍රඥාව දියුණු වේ. ඥාණය දියුණුවූ තරමට සත්‍වයන් ගේ උසස් බව ඇතිවන්නේය. සකස් කොට බණ අසනවාය කියන්නේද කන් යොමු කොට ඇසීමටයි. “ඉගෙණ ගන්නෙමි” යි සිතා ඇසීම සකසා ඇසීමය. සිත නොයෙක් අරමුණු කරා යා නොදී බණ ඇසීමෙන් අසන ධර්මය සිත්හි ලා දරා ගත හැකිය. බණ ඇසීමට රිසි නොවන්නෝ ධර්මයෙහි අගය නොදත් අයයි. එහි වටිනා ප්‍රයෝජනය දනිත් නම් කිසිසේත් මැලි නොවෙති. ඕනෑකමින් අසත් නම් එක බණ පදයක් නමුත් ඉගෙණ ගැණීම අපහසු නොවේ. එක බණපදයක් පවා ඉගෙණීමෙන් ශ්‍රැතමය ඥානය ලැබී දියුණුවක්ම සැලැසේ.

මෙවැනි ගැඹුරු දහමක් එක්වරක් ඇසීමෙන් ඉගෙණීම උගහටය. එහෙත් කීර්තිශ්‍රී භාවොපගත සැදැහැවත් “ඥාණාභිවංස ධම්මාධාර වංසපාල විනයාලඞ්කාර” මොරටුවේ සිරි අරියවංස මහ ස්ථවිරපාදයන් වහන්සේගේ ගුණ සිහිකරණු වස් ආචාර්ය්‍ය පූජක තදීය ශිෂ්‍ය උගත් මොරටුවේ සිරි ශාසනවංශ ස්ථවිරයන් ප්‍රධාන ශිෂ්‍යයන්ගේ උපදෙශයෙන් කෙළෙහි ගුණ සලකන ‘ශ්‍රී ආර්ය්‍යවංශ” ගුණානුසමරණ සභාව විසින් දෙශනා කරවනු ලබන මේ ධර්මදෙශනා පඞ්ක්තිය ඒ ඒ දෙශකයන් ලවාම ලියවා ගෙණ මුද්‍රණය කරවා මහජනයා අතර ප්‍රචාරයට පැමිණ වීමට සලස්වා තිබෙන හෙයින් නැවත නැවත කියවා බලා තේරෙන තැන් ධර්මධරයන් විචාරා ඉගෙණ ගන්නට පුළුවන්බව සලකා දෙව්මිනිස් සැපත් කෙළවර ශාන්ත නිර්වාණ සම්පත්තියත් සාදගන්න බලාපොරොත්තුවෙන් සාවධානව ඇසියයුතුයි.

මේ විහාරස්ථානයෙහි පටන්ගත් ධර්මදෙශනා පඞ්ක්තියෙහි පළමුවැනි දෙශනාවයි මේ. මෙය අපට පැවරීම ගැන කෘතඥවෙමු.

අප ධර්ම ස්වාමිවූ භගවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ තව්තිසා දෙව්ලොවැ සක්දෙව් රජහුගේ පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි වස් වැස මාතෘ දිව්‍යරාජයා කායශාක්ෂිකොට දෙවියනට ඉතා ගැඹුරු නානානයින් සැදුම්ලද් අභිධර්ම පිටකය දෙශා වදාළසේක. ඒ විජම් ප්‍රකරණ වශයෙන් සතකි. අටලෙස් විභඞ්ගය කින් යුත් විභඞ්ගප්‍රකරණය වදාරණ සර්වඥයන් වහන්සේ ඉන්ද්‍රිය විභඞ්ගයෙහි සූත්‍රාන්ත භාජනියෙහි “ශ්‍රද්ධෙන්ද්‍රියය විස්තර කරණු පිණිස මේ පාඨය වදාළසේක.

"තත්ථ කතමං සද්ධින්ද්‍රියං" යන්න මාතෘකාවේ මුල් කොටසයි. ශ්‍රද්ධෙන්ද්‍රියය කවරේද? යනු එහි තේරුමයි. මෙසේ ප්‍රශ්නකරණ ලද්දේ නැවත විස්තර වශයෙන් දේශනා කරණු කැමැත්තෙති. මීට කථෙතු කම්‍යතා පුච්ඡාව යයි කියනු ලැබේ.

"යා සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදො සද්ධා සද්ධින්ද්‍රියං සද්ධාබලං, ඉදං වුච්චති සද්ධින්ද්‍රියං" යනු නිද්දේශවාර යයි. බුද්ධාදි තෙරුවන් ගුණ ඇදහීම් වශයෙන් යම් ශ්‍රද්ධාවක් වේද, අදහන ආකාරයක් වේද, තුණුරුවන්ගේ ගුණ බිඳගෙණ මෙන් අනුප්‍රවේශයක් (සිතට වැදගැන්මෙක්) වේද, වෙසෙසින් පැහැදීමෙක්වේද, තෙරුවන් ගුණ අදහන යම් ශ්‍රද්ධාවක් තොමෝ අධිපති අර්ථයෙන් ශ්‍රද්ධෙන්ද්‍රිය වේද, අකම්ප්‍යාර්ථයෙන් ශ්‍රද්ධාබලයක් වේද, මේ ශ්‍රද්ධෙන්ද්‍රිය නම්වේ යයි කියනු ලැබේ යනු සංක්‍ෂෙප අදහසයි.

"අත්ථතො ලක්ඛණාදීහි-කමතොච විජානියා,
භෙද භෙද තථා කිච්චා-භූමිතො ච විජානියා."

යනු අටුවා හෙයින් ඉන්ද්‍රියයෝ අර්ථ වශයෙන්ද ලක්‍ෂණ රස ප්‍රත්‍යුපස්ථානයන්ගේ වශයෙන්ද පිළිවෙළ වශයෙන්ද භෙදාභෙද වශයෙන්ද කෘත්‍යය වශයෙන්ද භූමිවශයෙන්ද විස්තරකළ යුත්තාහුය.

ප්‍රස්තාවෝචිත වශයෙන් මෙහි ශ්‍රද්ධෙන්ද්‍රිය පිළිබඳ විස්තර යථොක්ත ක්‍රමයෙන් කියනු ලැබේ. අර්ථවශයෙන් එනම් මෙසේය.

"සද්දහන්ති එතාය සයං වා සද්දහති සද්දහන මත්තමේව වා එසාති සද්ධා" යනු නිර්වචනයි. මේ ශ්‍රද්ධා චෛතසිකය කාරණ කොට ගෙණ සත්ත්වයෝ තෙරුවන්ගුණ හා කර්මඵලයන්ද අදහත් නුයි (විශ්වාස කෙරෙත්නුයි) හෝ තොමෝම අදහානුයි හෝ මෝ තොමෝ ඇදහීම මාත්‍රය වනුයි හෝ ශ්‍රද්ධා නම්වේ යන අර්ථයි, "සද්දහන්තීති වා සද්ධා" මනාකොට පිහිටානුයි හෝ ශ්‍රද්ධා නමු. යම්සේ නිර්මල ප්‍රසන්න ජලයෙහි සඳකිරු ආදි නිමිති පිහිටාද, එසේම මේ ශ්‍රද්ධාතොමෝ බුද්ධගුණාදීන් සිතෙහි මනාකොට පිහි ටයි, දරයි, තමා කෙරෙහි හොඳින් පිහිටුවා ගණී. ඇදහියයුතු බුද්ධාදි රත්නත්‍රයෙහි නො කිළිටි බැවින් පවිත්‍රවූම විශ්වාසය ශ්‍රද්ධාව බව සැලකිය යුතුයි.

ලෝකයෙහි ජනයෝ නොයෙක් ශාස්තෘවරයන් සරණයති, ඔවුන්ගේ ධර්මය මහාජනයා පිළිගණී. එසේ කරන්නේ ඔවුන්ගේ විශ්වාසය පිටයි. ඒ විශ්වාසය ශ්‍රද්ධාව නොවේ. එය ශ්‍රද්ධා ප්‍රතිරූපිකා

(ශ්‍රද්ධා) වේ. මුනිවරින් යුත් ශ්‍රද්ධාවේ හැඩහුරු සවභා) වයි. ඕතොමෝ අර්ථවශයෙන් මිථ්‍යාධිමොක්ෂයවේ. ඇතිසැටි වරදවා අරමුණු නිශ්චය කරගන්නා සවභාවය මිථ්‍යාධිමොක්ෂයයි කියනු ලැබේ.

අශ්‍රමණයාහට ශ්‍රමණය යන ව්‍යවහාරය මෙන් සම්මුති වශයෙන් කිසිතැනෙකැ ඒ මිථ්‍යාධිමොක්ෂයට ද ශ්‍රද්ධාව යයි ප්‍රකාශව තිබේ. එය අනර්ථ පිණිස පවත්නේයයි දතයුතු

"ඉන්ද්‍රිය" යන්නෙහි තේරුම දූන් කියයුතුව තිබේ. 'ඉන්ද්‍ර' යයි බුදුන් වහන්සේට නමෙකි. ඒ ඉන්ද නම්වූ බුදුන් විසින් අවබොධ කරණ (දක්නා) ලද හෙයින්ද සෙවුනාලද හෙයින්ද දෙශනාකල හෙයින්ද 'ඉන්ද්‍රිය' යයි නම් වීය.

"සද්ධාව අත්තනො සද්ධාධුරෙ ඉන්දට්ඨං කාරෙතීති සද්ධින්ද්‍රියං" ශ්‍රද්ධා තොමෝම අශ්‍රද්ධාභාවය මැඩපැවැත්වීමෙන් තමාගේ ශ්‍රද්ධාධුරයෙහි අධිපති භාවය කෙරේනුයි ශ්‍රද්ධෙන්ද්‍රියයයි කියනු ලැබේ.

ලක්ෂණ වශයෙන් වනාහි අර්ථ මෙසේය:-

"සා පනෙසා සම්පසාදන ලක්ඛණා ච සද්ධා සම්පක්ඛන්දන ලක්ඛණා ච" ඒ මේ ශ්‍රද්ධාතොමෝ බුද්ධාදි ඉෂ්ටාලම්බනයෙහි තමා හා එක්ව යෙදෙන චිත්තචෛතසික ධර්මයන් මනාව පැහැදවීම ලක්ෂණ කොට ඇත්තීය. බැසගැණීම ලක්ෂණ කොට ඇත්තී හෝ වෙයි. ඒ සම්ප්‍රසාදන ලක්ෂණ ශ්‍රද්ධාතොමෝ සක්විති රජහුගේ උදකප්‍රසාදක (ජලය පහදවාලන) මාණික්‍ය රත්නය මෙනි. කෙසේදයත්?

යම්සේ සක්විතිරජ ඇත් අස් රිය පාබල යන සිව්රඟ සෙනඟ සමග දීර්ඝමාර්ගයට පිළිපන්නේ ඇළකින් එගොඩ වේද, ඒ දිය කඩිත්ත ඇත් සෙනඟින්ද අස්සෙනඟින්ද රියසෙනඟින්ද පාබල සෙනඟින්ද ඇලලීගියේ කැලැත්වූයේ ලෙලදෙන්නේත් වෙයි. බොරවූයේත් වෙයි. එතෙරවූ, සක්විති රජතෙමේ තමාගේ මිණිරුවනෙහි මහිමය බලනු කැමැතිව මෙසේ කියන්නේය. කොලෙනි! පැන් ගෙණඑව්, පවස් ඇත්තෙමියි, මිනිසුන්ට අණවයි. එවිට මනුෂ්‍යයෝ දෙවයන් වහන්ස! මේ ඇලේ දිය සමාරවී ගියේය, පානය කල නොහෙයි කියති. රජ්ජුරුවන්ගේ උදකප්‍රසාදක මාණික්‍යය ඇත්තේය. කොලෙනි! එසේවීනම් මේ මිණිරුවන දියේ බහාලවයි දෙන්නේය. එසේය දෙවයන් වහන්සැයි කියා මිනිස්සු රජහට පිළිවදන්දී ඒ මැණික දියේ බහාලන්නාහුය. ඒ මිණිරුවන දියේ බහාලූ කෙණෙහිම වහා මඩ සෙවෙල් දිය පඬරලා

බොර සන්සිඳී යන්නේය, ජලය නිර්මල වන්නේය, මෙසෙසින් පහන් වන්නේය, නො කැලැත් වන්නේය, ඉක්බිති දෙවයන් වහන්සේ පැන් පානය කරණසේක්වායි පිරිසිදු පැන් එලවාලති. මේ උපමාවකි. උපමා උපමෙයයන්ගේ සැසැඳීම මෙසේ දතයුතුයි. එහි ජලය මෙන් සිතද, ඒ මිනිසුන් මෙන් යොගාවචරයාද, දියෙහිවූ මඩසෙවෙල් දියපඩරලා බොරමෙන් සිතේ උපදනා රාගාදී කෙලශයෝද, උදකප්‍රසාද මාණික්‍යය මෙන් ශ්‍රද්ධාවද දතයුත්තාහ.

යම්සේ උදකප්‍රසාදක මාණික්‍යය ජලයෙහි බහාලූ කෙණෙහිම ජලය විශෙෂයෙන් ප්‍රසන්නවේද, එපරිද්දෙන් ශ්‍රද්ධාව උපදින්නී පඤ්චනීවරණයන් යටපත් කෙරෙයි, සිත නීවරණයන්ගෙන් පහ වේ. කෙලෙස් සන්සිඳුවාලයි. සිත පහදී, නිර්මලවේ, පිරිසිදු වේ, පහන්සිතින් යොගාවචර තෙමේ දන්දෙයි, සිල් සමාදන් වෙයි, පෙහෙවස් කම් කෙරෙයි, භාවනාවට පටන්ගණී.

මෙහි අන්‍ය ක්‍රමයකිනුදු උපමා උපමෙය සංසන්දනය වේ:-

එහි සක්විතිරජ මෙන් සම්‍යග්දෘෂ්ටිය ද, සක්විතිරජ පිරිස මෙන් ස්පර්ශාදි චෛතසික ධර්මයෝද, දියෙහි සෙවෙල් මඩ ආදිය මෙන් කෙලශයෝද, දියවිල මෙන් සිතද දතයුතුයි. විල මැදින් කෙළගණන් ඒ මිනිසුන්ගේ ගමන මෙන් අසුරුසනක් ගසනපමණ කෙණෙහි කෙලලක්ෂගණන් චිත්ත චෛතසිකධර්මයෝ ඉපිද නිරුද්ධ වෙති, නිරුද්ධව ඒ අරමුණෙහි නැවත උපදිත්, උදකප්‍රසාදක මාණික්‍යය මෙන් සම්ප්‍රසාදන ලක්ෂණ ශ්‍රද්ධාව දතයුත්තීය. ඒ සම්පසාද ලක්ෂණ ශ්‍රද්ධාවෙන් යුක්තවූවහුගේ කෙලෙස් යටපත් වීමෙන් පඤ්චවිධ ප්‍රීතිප්‍රමොද්‍යය උපදවයි, සිතද විශෙෂයෙන් ප්‍රසන්න වෙයි, නිර්මල වෙයි, දෘරගම්ණක් මෙන් දීප්තිමත් වෙයි. මෙහිලා සුමනමාලාකාර ඒකසාටක බ්‍රාහමණ මහාකප්පිණ පුක්කුසාති කුලපුත්‍රාදීන්ගේ කථා නිදසුන් කට යුතුයි.

ශ්‍රද්ධාතොමෝ කෙසේ සම්පක්ඛන්දනය (අනුප්‍රවෙශය) ලක්ෂණ කොට ඇත්තීද යත්? යම්සේ වනාහි කිඹුල් මෝරු දියරකුස් ආදීන්ගෙන් ගැවසීගත් පිරීකිය මහ ගඟක් වෙත අවුත් බියසුලු ජනසමූහයා ගඟින් එතෙරවීගත නොහී දෙගොඩ සිටීද, එවිට යුද්ධයෙහි දක්ෂ මහායොධයෙක් එතැනට අවුත් කුමක්හෙයින් සිටීදැයි විචාරා ප්‍රතිභය සහිත බැවින් ගඟටබැස ගන්නට නොහැක්කෙමුයි කීකල මනාව මුවහත් තබනලද කඩුවක් අතින් ගෙණ "මා පසු පස්සේ නොබා එව"යි කියා තරකොට අමුඩගසාගෙණ ගඟටබැස ආ ආ කිඹුල් ඈ මසුන් පිළිබහා එගොඩ රඳන මිනිසුන්ට සුව පහ සුව සලසමින් මෙගොඩට පමුණුවාලයි. මෙගොඩ මිනිසුන්ට සැප

පහසුව කරමින් එගොඩට පමුණුවාලයි, පරතෙරින්ද සුවසේ මෙතෙරට ගෙණඑයි, එපරිද්දෙන්ම දන් දෙන්නාහටද සිල් රක්නාහටද පෙහෙවස් සමාදන් වන්නාහටද භාවනාව අරඹන්නාහටද ශ්‍රද්ධාව පූර්වාංගම වෙයි, පෙරමුණෙණි යන්නී වෙයි, එහෙයින් ශ්‍රද්ධාතොමෝ සම්පක්ඛන්දනය ලක්ෂණකොට ඇත්තීයයි කියනලදී.

යම්සේ කන්දක් මතු වසින්නාවූ ජලය එහි තොරද ඇල දොළවල් පිරී බැස මහගඟට පැමිණ දෙගොඩ ගලායන කල්හි අා ශක්තිමත් පුරුෂයා දැඩිකොට අමුඩගසා කිසිභයක් චකිතයක් නැතිව තමාගේ කායශක්තිබලය දක්වමින් පීණා එතෙරවේද ඔහු එගොඩට පැමිණියා දැක ගඟෙහි ගැඹුරු බව හෝ නොගැඹුරුබව හෝ දැනගත නොහී බියසුලුව දෙගොඩ රැස්වී සිටි ජනසමූහයාත් එතෙර වන්නේද, එපරිද්දෙන්ම යෝගාවචර තෙම අන්‍යයන්ගේ සිත කෙලෙසුන්ගෙන් මිදුනා දැක සෝවාන් පෙළෙහි හෝ සකෘදාගාමී ඵලයෙහි හෝ අනාගාමී ඵලයෙහි හෝ අර්හත් ඵලයෙහි හෝ පැන වැදුනාමෙන් සිත පිහිටුවා නොපැමිණි මාර්ගඵලයාගේ පැමිණීම පිණිස ප්‍රත්‍යක්ෂ නොකළ මාර්ගඵලයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස අවබොධ නොකළ මාර්ගඵලයාගේ අවබොධය පිණිස උත්සාහ කෙරෙයි. මෙසේ ශ්‍රද්ධාව සම්පක්ඛන්දනය ලක්ෂණ කොට ඇත්තී යයි දතයුතුයි.

තවද මේ සම්පක්ඛන්දන ලක්ෂණ ශ්‍රද්ධාව උපදින්නී කාමාවචර කුශල චෙතනා අටය, රූපාවචර කුශලචෙතනා පසය, අරූපාවචර කුශලචෙතනා සතරය, ලොකොත්තර කුශලචෙතනා සතරය යන එක්විසි කුශලචෙතනාවෝ කාමෞඝය භවෞඝය දෘෂ්ටිඕඝය අවිද්‍යාඕඝය යන සතර ඕඝයන් ඉක්මවා පරමරමණීය නිර්වාණපුරයට පැනවැදුනාක් මෙන් අරමුණු කෙරෙයි. එබඳු මේ උපමාව දතයුතුයි:—

යම්සේ එක්විසි දෙනෙක් ගඟගාවෙහි මෙගොඩ නොයෙක් භය ඇති බැවින් නිර්භීයවූ පරතෙරට යනු කැමැත්තාහු ගඟේ තොටුපොලට බසිද්ද, එකල්හි කිඹුල් මෝරු ආදි චණ්ඩමත්ස්‍යයෝ මතුවී ඔවුන්ට යන්ට නොදෙද්ද, ඔහු මසුන් දැක සිතප්‍රසන්නවූවාහුම මෙගොඩම ප්‍රමාදබවට පැමිණෙද්ද, ඔවුන් සමග පැමිණි ශූරවූ එක් ශක්තිමත් පුරුෂයෙක් බිය නොවව්යයි සියල්ලන් අස්වසා දැඩිව අමුඩගසාගෙණ හෙතෙමම පලමුකොට බැස අල්වා ගැණීමට එන කිඹුල් මෝරු ආ සැඩ මසුන්ට අතින් පයින් ගසමින් පලවාපියා සියල්ලන්ම පරතෙරට පැමිණවිය. ඒ හැමෝම නිර්භීය ස්ථානයට ගොසින් සුවසේ ම විසූහ. මේ උපමා උපමෙයයන්ගේ ගැලපීම මෙසේය.

එහි එක්විසි ජනයන් මෙන් යථොක්ත එක්විසි කුසල්සිත්වල යෙදෙන එක්විසි චේතනා චෛතසිකයෝ දතයුත්තාහ. ගඟේ මෙගොඩමෙන් විසිආකාර සක්කායදෘෂ්ටිය දතයුත්තීය. ගඞ්ගාව මෙන් ස්කන්ධධාතු ආයතනයන්ගේ පිළිවෙළයයි කියනලද මේ සංසාරය දතයුතුයි, ගඞ්ගාවෙහි සැඩපහරමෙන් කාමෞඝාදි සතරඕඝය දතයුතුයි, කිඹුල් මෝරු ඈ සැඩමසුන් මෙන් කෙලෙශයෝ දතයුත්තාහුය, පරතෙර මෙන් නිර්වාණය දතයුතුයි. ගඟේ තොට මෙන් දාන සීල භාවනා සඞ්ඛ්‍යාත ත්‍රිවිධ කුශල මාර්ගය දතයුතුයි. ශූරවූ ශක්තිමත් පුරුෂයා මෙන් සම්පක්ඛන්දන ලක්ෂණ ශ්‍රද්ධාව දතයුත්තීය.

"අපරො ච, සද්දහන ලක්ඛණා සද්ධා ඔකප්පනලක්ඛණා චා" යනු අටුවා බැවින් මේ ශ්‍රද්ධාවගේ ලක්ෂණය පිළිබඳ අන්‍ය ක්‍රමයෙන් මේ ශ්‍රද්ධා තොමෝ ඇදහීම ලක්ෂණ කොට ඇත්තී හෝ ඔකප්පනය (බුද්ධාදීන්ගේ ගුණයට වැද ගැණීම හෝ ලක්ෂණකොට ඇත්තිය. ඒ සද්දහන ලක්ෂණ ශ්‍රද්ධාව කවරීදයත්?)

"ඵොකමමත්තනම්පි සංසයං අකත්වා නවඅරහාදි බුද්ධගුණෙ සද්දහති" යන ආදියෙන් සද්දහන ලක්ෂණ ශ්‍රද්ධාව හඳුන්වා තිබේ. ස්වල්පමාත්‍රයකුදු සැක නොකොට අර්හත් සම්‍යක් සම්බුද්ධ යනාදීන් දක්වෙන නවඅරහාදි බුදුගුණද, ස්වාක්ඛාතතාදි ධර්මගුණද, සුප්‍රතිපන්නතාදි සඞ්ඝයාගේ ගුණද අදහාද, ඕතොමෝ සද්දහනලක්ෂණ ශ්‍රද්ධා නම් වේ.

අශ්‍රද්ධාදි ප්‍රත්විරුද්ධ ධර්මයන් ගෙන් නොසැලෙන මාර්ගයෙන් ආ ශ්‍රද්ධාතොමෝ ඔකප්පන ලක්ෂණ ශ්‍රද්ධාවයයි කියනු ලැබේ. මේ සෝවාන් පුද්ගලයාගේ ශ්‍රද්ධාවයි, අචල ශ්‍රද්ධාව යයිද මේ ශ්‍රද්ධාවට නමෙකි, නොසෙල්වියහැකි ශ්‍රද්ධාව යන අර්ථයි. එහෙයින් කීහ:-

"මග්ගෙන ආගත සද්ධානාම සිලාපථවියං පතිට්ඨිත සිනෙරු විය අචලා හොති, සා පනෙසා මනුස්සෙ ඨපෙත්වා දෙවමාරාදීහිපි චාලෙතුං න සක්කා." සෝවාන් මගින් ආ ශ්‍රද්ධාතොමෝ සලපොළොවෙහි පිහිටි මහමෙර මෙන් සොලවාලිය නොහේ. ඒ මේ ශ්‍රද්ධාතොමෝ මිනිසුන් තබා දිව්‍යමාරාදීන් විසින්ද සොලොවා ලන්නට චෙතන් කරන්නට නොහැකිය. එහි සුප්‍රබුද්ධකුෂ්ඨි ශූරම්බට්ඨාදීන්ගේ කථාවස්තු නිදසුන් කටයුතුයි.

රජගහනුවර දරුණු කුෂ්ඨරොගයකින් පෙළෙන ගෙදොරකට වැද්ද නොදෙන දුරදීම එනවා දක බත් සහල් ආදී කිහමන් දී එලවා ගන්නාවූ මිනිසුන්ට අප්‍රියවූ බැගෑපත් දීන මිනිසෙක්වූ සුප්‍ර

බුද්ධ නම් කුෂ්ඨරෝගියෙක් විය. හෙතෙම එක් දිනක් සිඟායන්නේ එක් තැනෙක මහජනයා එක්රැස්ව හුන්නා දැක යම්කිසි කැවිලි පෙවිලි ආදී ආහාර දෙන තැනකැයි සිතා මටත් අහරක් ලබාගත හැකියයි සලකා ළංවිය. එහෙත් ඒ කෑමදෙන තැනක් නොවීය. බුදුරජාණන් වහන්සේ දහම්දෙසනසේකැයි දැන පිරිස් කෙළවර එකත්පස්ව හිඳ බණ ඇසීය. බුදුන්වහන්සේ මිනිසුන් කාලකණ්ණියෙකැයි සලකන ඒ සුප්‍රබුද්ධ කුෂ්ඨියා දැක කළයක්තුළ දල්වෙන පහනක් සේ ඔහුගේ අභ්‍යන්තරයෙහි සෝවාන්වීමට උපනිශ්‍රය දැක ඔහුට සුදුසු දහමක් වදාළසේක. හෙතෙම සෝවාන් පෙලෙහි පිහිටා තමාලද් ගුණය බුදුන්ට දන්වා වැද යනු කැමති වූවද මහා ජනයා අතරෙන් යාගත නොහී ඔවුන් බුදුන්ට පසු ගමන් කොට වැද ගියකල්හි වෙළුවනාරාමයට ගියේය.

සක්දෙව්රජ ඔහු දැක "මෙතෙම තමාලද්ගුණය ප්‍රකට කරනු කැමැත්තේය. ඔහුගේ ශ්‍රද්ධාව විමසන්නෙමැ"යි සිතා අහසෙහි සිට මෙසේ කීය. "සුප්‍රබුද්ධ කුෂ්ඨිය! තෝ මිනිස් දිළින්දෙක, බැගෑපත් මිනිසෙක, මම තොපට අප්‍රමාණ ධනය දෙන්නෙමි, බුදුරජ බුද්ධ නොවේය, හෙවත් චතුස්සත්‍යය අවබෝධ නොකෙළේය, ධර්මය අධර්මය නෛර්යාණික නොවේය, සංඝයා සුප්‍රතිපන්න නොවේය, බුදුන්ගෙන් මට කම්නැත, යනආදි වචනයක් කියව"යි කීයේය. එවිට සුප්‍රබුද්ධ කුෂ්ඨික තෙමේ ඔබ කවරෙක්දැයි අසා "මම ශක්‍ර වෙමි"යි කීකල්හි ලජ්ජානැති අන්ධබාලය! තෝ මාහා කථාකරන්නට නුසුදුස්සෙහිය, තෝ මා දිළින්දෙක, දීනයෙකැයි කියන්නෙහිය. මම දිළින්දෙක් බැගෑපතෙක් හීනයෙක් නොවෙමි, සුවපත් වීමි, මම ශ්‍රද්ධාදි සප්තාර්ය්‍යධනය ඇති මහා ධනවතෙක්මි. තා වැනි එක ශක්‍රයකු තබා ශක්‍රයන් දහසක් විසිනුදු මාගේ ශ්‍රද්ධාව වෙනස් කරවිය නොහැක්කැයි කීයේය. මින් මාර්ගාගත ශ්‍රද්ධාව දෙවියන් විසින් සොලොවාලිය නොහෙන බව සලකා ගතයුතුයි.

මාරයා විසිනුත් සෝවාන් පුගුලාගේ ශ්‍රද්ධාව වෙනස්කළ නොහැකි නියාවට සූරම්බට්ඨවස්තුව නිදසුනකි. ඒ මෙසේය:- සැවැත් නුවර අන්‍යතීර්ථකයන්ගේ උපස්ථායකවූ සූරම්බට්ඨ නම් සිටුපුතෙක් විය. එක්දිනක් සර්වඥයන් වහන්සේ අලුයම්වේලෙහි මහකුළුණු සමවතින් නැගී ලොවබලා වදාරණසේක් ඔහු සෝවාන් වන්නට උපනිශ්‍රය ඇති නියාව දැක වදුරා පිඬුසිඟන වේලෙහි ඔහුගේ ගෙදොරට වැඩිසේක. සූරම්බට්ඨතෙම බුදුන් වැඩියා දැක "මේ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ වූකලී මහාකුලයෙක උපන් ලොකයෙහි ඉතා ප්‍රසිද්ධ කෙනෙක, එහෙයින් උන්වහන්සේ වෙතට

නොයාම මාවැනි ශිෂ්‍යයෙකුට තරම් නොවේයයි සිතා සමීපයට ගොස් පාමුල වැදවැටී ගෙට වැඩමවාගෙණ ගොස් මාහැඟි පල ගෙක්හි වඩාහිඳුවා දන්දී වළඳා අවසානයෙහි එකත්පසෙක හිඳ ගත. බුදුන්වහන්සේ ඔහුගේ චරිත වශයෙන් දහම් දෙසූසේක. සූරම්බට්ඨතෙමේ දේශනාවසානයෙහි සෝවාන් ඵලෙහි පිහිටියේය. තථාගතයන් වහන්සේ ඔහු දමනය කොට විහාරයට වැඩිය පසු වශවර්තිමාරයා මෙසේ සිතීය:- මේ සූරම්බට්ඨතෙමේ අපසතුය ශාස්තෘන් වහන්සේ අද ඔහුගේ ගෙට වැඩිසේක. "කිමෙක්දෝ බුදුන්ගේ බණ අසා මාර්ගඵලාවබෝධය කෙළේදැයි" යම්තාක් ඔහු මාගේ විෂය ඉක්මවූ නියාව හෝ නොයික්මවූ නියාව හෝ දැන ගන්නෙමැ"යි තමා කාමරූපී (කැමති රුවක් මවාගතහැකි) බැවින් බුදුන් හා සමාන රූපයක් මවාගෙණ බුදුන් මෙන් සිවුරු පොරොවා පාත්‍රය ගෙණ දෙතිස්මහපුරිස් ලකුණු දරන්නෙක්ව සූරම්බට්ඨගේ ගෙදොර වැඩසිටියේය සූරම්බට්ඨතෙමේද නැවත දශබලධාරීන් වහන්සේ වැඩිසේකැයි අසා බුදුවරයන්ගේ අනෛර්‍යාණික ගමන් නම් නැත. කවර කරුණකින් වැඩිසේක්දෝයි සුහුවගොස් බුදුරජණෝය යන සංඥාවෙන් වැඳ එකත් පසෙක සිට "ස්වාමීනි! නුඹ වහන්සේ දන් මෙගෙයි වළඳා වෙහෙරට වැඩිසේක. කුමන කරුණකින් පෙරළා වැඩිසේක්දැ"යි ඇසීය. එවිට මාරයා "සූරම්බට්ඨය! මා තොපට දහම් දෙසද්දී එක් කාරණයක් අපරීක්ෂාවෙන් කියන ලද්දේය. සියලුම් පඤ්චස්කන්ධයෝ අනිත්‍යයහ, දුඃඛයහ, අනාත්මයහ"යි මාවිසින් කියන ලද්දේය, එය එසේ නොවෙයි, නිත්‍යවූ සැපවූ ස්ථිරවූ සදාකාලිකවූ සමහර ස්කන්ධයෝ වෙතියි කීයේය. එකල්හි සූරම්බට්ඨතෙම මෙසේ සිතී:-

මේ කථාව ඉතා බැරෑරුම්ය, බුදුවරයන්ගේ නොවිමසා කීමෙක් නම් නැත, ධර්මරජයන් වහන්සේට මාරයා ප්‍රතිපක්ෂය (විරුද්ධකාරයෙක) ඒකාන්තයෙන් මේ මාරයා වන්නේයයි සිතා "නුඹ මාරයාදැයි ඇසීය. ආර්‍ය ශ්‍රාවකයා විසින් කියනලද කථාව ඔහුට පොරෝ පහරක් වැනි විය. එහෙයින් ස්වකීය ස්වභාවයෙන් සිටගත නොහී බොරු නොකියා එසේය අම්බට්ඨයනි! "මම මාර වෙමි"යි කීයේය. තාබදු මරුන් දහසකුදු අවුත් මාගේ ශ්‍රද්ධාව සොළවාලිය නොහැක්ක, මහාගෞතම සර්වඥයන් වහන්සේ මට දහම්දෙසනසේක් සියලු සංස්කාරයෝම අනිත්‍යය වන්නාහයි අවබෝධ කරවා දෙසූසේක. "මාගේ ගෙදොර නොසිටුව"යි අසුරක් ගැසීය. මාරතෙම ඔහුගේ බස් අසා ප්‍රතිවිරුද්ධව කියාගත නොහී එහිම අතුරුදහන් විය.

"පසාදනරසා උදකප්පසාදකමණී විය, පක්ඛන්දනරසා වා ඔඝුත්තරණෝ විය, අකාලුසිය පච්චුපට්ඨානා, අධිමුත්තිපච්චුපට්ඨානා වා" යනු අටුවා හෙයින් රසවශයෙන් ශ්‍රද්ධාව උදකප්‍රසාදක මාණික්‍යය මෙන් තමා හා එක්ව යෙදෙන චිත්තචෛතසික ධර්මයන් පහදවාලීම කෘත්‍යය කොට ඇත්තීය, මහවතුරකින් පීණී මෙහි මෙන් පක්ඛන්ධනය පැනීම හෝ කෘත්‍යය කොට ඇත්තීය, තමා හා එක්ව යෙදෙන චිත්තචෛතසික ධර්මයන්ගේ නොකිලිටි බව ඵලකොට ඇත්තීය, අධිමුක්තිය මනාව නිශ්චය කිරීම ඵල කොට ඇත්තී හෝ වෙයි, ඇදහියයුතු වස්තුව ආසන්නකාරණ කොට ඇත්තීය, ස්‍රොතාපත්තිමාර්ගාඞ්ගයන් ආසන්නකාරණකොට ඇත්තී හෝ වෙයි.

ක්‍රමවශයෙන් මේ දේශනා පිළිවෙලයි, නිරොධය (නිවන්) පිණිස මේ ශ්‍රද්ධාදි පඤ්චෙන්ද්‍රියයෝ වැඩිය යුත්තාහුයයි ප්‍රතිපත්තිය දක්වනු පිණිස පිළිවෙළින් ශ්‍රද්ධා වීර්‍ය්‍ය ස්මෘති සමාධි ප්‍රඥා යන පසිඳුරන් වදාළබව සැලකිය යුතුයි.

මීට අනතුරුව භෙදාභෙද වශයෙන් සැලකිය යුතුය. ඉන්ද්‍රිය යන් අතුරෙන් භෙදය පවත්නේ ජීවිතින්ද්‍රියයේ පමණකි, සෙසු ඉඳුරන්ගේ භෙදයෙක් (වෙනසෙක්) නැත්තේමැයි.

එසේවුවද මේ ශ්‍රද්ධා චෛතසිකයට ආධාරවූ චිත්තයන්ගේ භෙදය ගෙණ අභෙදෝපචාර වශයෙන් අර්ථකථාචාර්‍ය්‍යවරයෝ ශ්‍රද්ධාවගේ ප්‍රභෙද දක්වූහ. හේ මෙසේය:-

ලෞකික ශ්‍රද්ධාවය ලොකොත්තර ශ්‍රද්ධාවයයි භෙද දෙකකි. එහි කාමාවචර රූපාවචර අරූපාවචර යන සියලු ලෞකික සිත්වල යෙදෙන ශ්‍රද්ධාචෛතසිකය ලෞකික ශ්‍රද්ධා නම් වෙයි. ලොකොත්තර සිත්වල යෙදෙන ශ්‍රද්ධා චෛතසිකය ලොකොත්තරය.

"සද්ධා පනෙසා ඔකප්පනසද්ධා පච්චක්ඛසද්ධාති දුවිධා, තත්ථ දානසීලාදීනං ඵලං සද්දහිත්වා දානාදි පුඤ්ඤකරණෙ සද්ධා ඔකප්පන සද්ධා නාම, මග්ගෙන ආගතසද්ධා පච්චක්ඛසද්ධා නාම" ඔකප්පන ශ්‍රද්ධාවය ප්‍රත්‍යක්ෂ ශ්‍රද්ධාවයයිද භෙද දෙකක්වේ. එහි දානශීලාදීන්ගේ විපාකය විශ්වාස කොට දානාදී පින්කිරීමෙහි උපදින ශ්‍රද්ධාව ඔකප්පන ශ්‍රද්ධා නම් වේ. ආර්‍ය්‍යමාර්ගයෙන් ආ ශ්‍රද්ධාව ප්‍රත්‍යක්ෂශ්‍රද්ධා නමු. මේ ලොකොත්තර ශ්‍රද්ධාව මැයි, ප්‍රසාද ශ්‍රද්ධාව යසිදු මීටම නමෙකි.

"සද්ධා පනෙසා ආගමනසද්ධා අධිගමසද්ධා ඔකප්පනසද්ධා පසාදසද්ධාති චතුබ්බිධා හොති" යනු අඞ්ගුත්තර අටුවාහි කී

පරිදී මේ ශ්‍රද්ධාව ආගමන ශ්‍රද්ධාවය අධිගම ශ්‍රද්ධාවය ඔකප්පන ශ්‍රද්ධාවය ප්‍රසාද ශ්‍රද්ධාවයයිද සිව්වැදෑරුම් වේ.

**“තත්ථ සබ්බඤ්ඤු බොධිසත්තානං අභිනීහාරතො පට්ඨාය ආගතා ආගමනසද්ධා නාම”** එහි සර්වඥ බොධිසත්ත්වයන්ගේ අභිනීහාරයෙහි (මූලප්‍රණිධියෙහි) පටන් ආවාවූ ශ්‍රද්ධාව ආගමන ශ්‍රද්ධාව යයි කියනු ලැබේ. මේ ශ්‍රද්ධාව ඇතිහෙයින් ලොවුතුරු බුදුබව පතන බොධිසත්ත්වයෝ නියතවිවරණයෙන් පසු නියත මිථ්‍යාදෘෂ්ටිම නොඋපදිත්. තිරිසන් ජාතියෙහි උපනත් පැරුම්දම් පුරති. මෙහි සර්වඥ බොධිසත්ත්වයන්ගේ ශ්‍රද්ධාව ආගමන ශ්‍රද්ධායයි කියන ලද්දේ දෙශනාශීර්ෂ වශයෙනි හෙවත් ප්‍රධාන වශයෙන් සැලකීමෙනි, එහෙයින් සමහර තැනෙක ‘තිවිධබොධියා පාපුණිතුං පත්ථෙන්තානං සද්ධා ආගමන සද්ධා නාම’ යනුවෙන් ලොවුතුරු බුදුබවය, පසේ බුදුබවය, රහත්බවය යන තුන්තරා බොධිය පතන්නවුන්ගේ ශ්‍රද්ධාව ආගමන ශ්‍රද්ධා නමැයි කීහ. ඒ ඒ බොධිවලට නියතවූ තැන් පටන් හැම බෝසතුන්ගේම ශ්‍රද්ධාව ආගමන ශ්‍රද්ධාව බව සැලකිය යුතුයි. මීට ‘ආගම’ ශ්‍රද්ධාව යයිද කියනු ලැබේ.

**“අරියසාවකානං පටිවෙධෙන ආගතා අධිගමසද්ධා නාම”** ආර්‍ය්‍ය ශ්‍රාවකයන්ගේ මාර්ගඵල ප්‍රතිවෙධයෙන් ආ ශ්‍රද්ධාම අධිගම ශ්‍රද්ධා නමැයි කියනු ලැබේ. ‘ඛීණාසවානං සද්ධායෙතං අධිවචනං’ යනු කීහෙයින් රහතුන්ගේ ශ්‍රද්ධාවට ‘අධිගම’ ශ්‍රද්ධාවය යනු නමෙකි

**“බුද්ධො ධම්මො සංඝොති වුත්තෙ අචලභාවෙන ඔකප්පනං ඔකප්පනසද්ධා නාම”** බුද්ධය ධර්මය සඞ්ඝයායයි කීකල්හි නිශ්චල භාවයෙන් පිහිටි ශ්‍රද්ධාව ඔකප්පන ශ්‍රද්ධා නම් වේ. මේ සෝවාන් පුගුලාගේ සැදෑයයි දතයුතුයි.

**“අසිනාපි සීසං ඡිජ්ජමානෙනාපි බුද්ධො අබුද්ධොති වා ධම්මො අධම්මොති වා සංඝො න සංඝොති වා න වදති පතිට්ඨිත සද්ධො’ව හොති”** ඔකප්පන ශ්‍රද්ධාවෙන් යුත් සෝවාන් පුගුල් තෙමේ යම්හෙයකින් කඩුවෙන් හිස සිඳුනා ලබන්නේද බුදුරජ චතුස්සත්‍යය අවබොධ නොකෙළේය කියා හෝ ධර්මය අධර්මයයි කියා හෝ ආර්‍ය්‍යපුද්ගල සඞ්ඝතෙම කෙලෙස් ප්‍රහීන නොකෙළේයයි කියා හෝ නොකියන්නේය. සැදෑහැවත්වූ පෘථග්ජන පුද්ගල තෙම එබඳු අවස්ථාවෙක ජීවිතාශාවෙන් වේවයි ලාභකීර්ති ප්‍රශංසාදිය තැකීමෙන් මේවයි එබඳු වචන නොකියන්නේ නොවේ. කියන්නේමය. බුදුන් සරණ බිඳගෙණ අන්තොටුවත් සරණගිය අනේපිඬු මහසිටාණන්ගේ යහළුවන්ගේ කථාව මීට නිදසුන් කළ යුතුය.

“අට්ඨාන මෙතං භික්ඛවෙ අනවකාසො යං දිට්ඨිසම්පන්නො පුග්ගලො අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍ය, නෙතං ඨානං විජ්ජති, ඨාන මෙතං භික්ඛවෙ විජ්ජති, යං පුථුජ්ජනො අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍ය” යන අට්ඨානපාළියෙන්ද මේ බව ප්‍රකාශව තිබේ. මහණෙනි! යම්හෙයකින් දෘෂ්ටිසම්පන්න (සෝවාන්) පුද්ගලතෙම අන්‍ය ශාස්තෘවරයෙකු උදෙසන්නේය; (සරණ යන්නේය) යන මේ කාරණය විද්‍යමාන නොවේ. (නොලැබේ) ඊට අවසර (ඉඩ) නැත, යම්හෙයකින් බුදුන් සරණගිය පුහුදුන්තෙම අන්‍යශාස්තෘවරයෙකු උදෙසන්නේය යන මේ කාරණය ලැබේමයයි වදාළසේක.

මෙහි විප්‍රකාර ශ්‍රද්ධාවෙහි දානාදි පින්කිරීමෙහි කර්මය හා කර්ම පල විශ්වාස කරණ ශ්‍රද්ධාවටද, චතුර්විධ ශ්‍රද්ධාවෙහි සෝවාන් පුද්ගලයාගේ ශ්‍රද්ධාවටද ඔකප්පන නාමය යෙදෙන බව් පෙණේ. එහි වෙනස මෙසේය:- පින්කරන්නහුගේ අශ්‍රද්ධාදි ප්‍රතිපක්ෂ ධර්මයන් ගෙන් නොසැලෙන ශ්‍රද්ධාවට ඔකප්පන ශ්‍රද්ධාවයයි කියන ලද්දේ පර්‍ය්‍යාය වශයෙන් බව සැලකිය යුතුයි. දුන් දූය පිළිබඳව පුහුදුන් ගේ ශ්‍රද්ධාව මාත්සර්‍ය්‍යාදිය ඉපදීමෙන් පසුව සැලියහැකි හෙයිනි. සෝවාන් පුගුලාගේ සැදූය කිසිවිටෙක එසේ නොසැලෙන හෙයින් නිෂ්පර්‍ය්‍යාය වශයෙන් ඔකප්පන ශ්‍රද්ධාවයයි කීබව සලකාගතයුතුයි ඒ සෝවාන් පුගුලාගේ ශ්‍රද්ධාවට කිසිතැනක ‘ආකාරවතී’ ශ්‍රද්ධාවය යන නාමයද ව්‍යවහාරකර තිබෙනබව මේ දෙශනාවෙන් ප්‍රකාශ වේ:-

“යස්ස කස්සචි භික්ඛවෙ ඉමෙහි ආකාරෙහි ඉමෙහි පදෙහි ඉමෙහි ව්‍යඤ්ජනෙහි තථාගතෙ සද්ධා නිවිට්ඨා හොති මූලජාතා පතිට්ඨිතා, අයං වුච්චති භික්ඛවෙ ආකාරවතී සද්ධා දස්සන මූලිකා දළ්හා අසං හාරියා සමණෙනවා බ්‍රාහ්මණෙනවා දෙවෙනවා මාරෙනවා බ්‍රහ්මුනාවා කෙනචිවා ලොකස්මිං”.

මහණෙනි! ශාස්තෘන් විමසන මේ කරුණු වලින් මේ අක්ෂර සමුදායයෙන්වූ පදවලින් මේ අකුරුවලින් තථාගතයන් වහන්සේ කෙරෙහි යම්කිසිවෙකුගේ ශ්‍රද්ධාව නොසැලීමෙණ් පිහිටියාවේද, ස්‍රොතාපත්තිමාර්ග වශයෙන් හටගත් මූල් ඇත්තීවේද, මාර්ගයෙන් තිරනතරව පිහිටියාවේද, මහණෙනි! ශ්‍රමණයෙකු විසිණ් හෝ බ්‍රාහමණයකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ වසවත් මරු විසින් හෝ බඹෙකු විසින් හෝ ලොව අන්කිසිවෙකු විසින් හෝ හැර ගන්නට නොහැකිවූ දෘඪ (ස්ථිරවූ) දර්ශනය (සෝවාන්මග) මූල්කොට ඇත්තාවූ මේ ශ්‍රද්ධාතොමෝ කරුණු පිරික්සා ගත් බැවින් ආකාරවත් (කරුණු සහිත) වූ ශ්‍රද්ධාව යයි කියනු ලැබේ. යයි වදාළසේක.

**"පසාදුප්පත්ති පසාද සද්ධා නාම"** චතුර්විධ ශ්‍රද්ධාවන් අතුරෙන් සතරවැනි ශ්‍රද්ධාව ප්‍රසාද ශ්‍රද්ධාවය. සිතේ යම් පැහැදීමෙක් වේනම් ඒ ප්‍රසාදෝත්පත්තිය ප්‍රසාද ශ්‍රද්ධා නමැයි පැවසේ. ඒ පැහැදීම වනාහි රූපය කෙරෙහි පැහැදීමය ශබ්දය කෙරෙහි පැහැදීමය රූක්‍ෂප්‍රතිපත්තියෙහි පැහැදීමය, ධර්මය කෙරෙහි පැහැදීමයයි සිව්වැදෑරුම්. සමහරෙක් රූපයෙහි ප්‍රමාණය ගෙණ රූපය කෙරෙහි පහදී, සමහරෙක් ශබ්දය ප්‍රමාණකොටගෙණ ශබ්දයෙහි පහදී, සමහරෙක් රළු පිළිපැදීම ප්‍රමාණකොටගෙණ රළු පිළිපැදීමෙහි පහදී, සමහරෙක් ධර්මය ප්‍රමාණකොටගෙණ ධර්මයෙහි පහදී, රූපය ප්‍රමාණකොට සලකන්නාහට දෙතිස්මහපුරිස් ලකුණු අසූඅනුව්‍යඤ්ජන්ගෙන් සැදුම්ලද් බුද්ධරූපය හා සමාන ප්‍රසාදය එලවන අන්රූපයක් නම් නැත. එහෙයින් මට්ටකුණ්ඩලී මාණවකයා දානාදි කිසි පිනක් නොකොට බුදුන් දැක සිත පහදමා ගත් පමණින් කළුරිය කොට තව්තිසා දෙව්ලොව උපන.

ශබ්දය ප්‍රමාණකොට සලකන්නාහට බ්‍රහ්මස්වරය වැනි බුදුන්ගේ හඬට හා කීර්ති ඝෝෂයට වැඩිතරම් ප්‍රසාද එලවන අන් හඬක් නම් නැත්තේය. රූක්‍ෂප්‍රතිපත්තිය ප්‍රමාණ කොට සලකන්නාහට ගිහිකාලයෙහි මහැඟි කසීසළු ද, රන්බඳුන් ද, තුන්සෘතුන්ට යොග්‍යවූ සියලු සැපතින්යුත් පස්මාල් සත්මාල් නවමාල් ප්‍රාසාදයන් හැරදමා පැවිදිව, අගය අඩුකිරීමට කඩකැපීමෙන් ද රළුවීමට කැපූ කැබලි එක්කොට මැසීමෙන් ද වර්ණය වෙනස්කිරීමට පඬු පෙවීමෙන් ද යන තුන්ආකාර ශස්ත්‍ර සූත්‍ර රජන රූක්‍ෂයන්ගෙන් රළුවූ පාංශුකූල සිවුරුය, ශෛලමය පාත්‍රය, වෘක්‍ෂමූල සේනාසනය යන මේවා සෙවුනාවූ බුදුන්ගේ රූක්‍ෂප්‍රතිපදාවට වැඩියෙන් ප්‍රසාදය එලවන අන්‍යයෙකුගේ රූක්‍ෂප්‍රතිපදාවක් නම් නැත, ධර්මය ප්‍රමාණකොට සලකන්නාහට තථාගතයන් වහන්සේගේ ශීලාදි ගුණයට වඩා ප්‍රසාදය එලවන අන්‍යයෙකුගේ ශීලාදි ගුණයෙක් නම් නැත්තේය.

අපගේ අසවල් ඤාති භික්ෂූන් වහන්සේ සිල්වත් වෙති, ගුණවත් වෙතියි ප්‍රේතයෝනියෙහි උපන්නෙකුගේ පවා සිත පැහැදුණේ නම් ඔහුගේ ඒ පැහැදීමද මහත්ඵලවනබව ප්‍රේතාත්මයෙන් මිදීමටද හේතුවනබව ප්‍රකාශව තිබේ. එහෙයින් කීහ:-

බුද්ධෙ චිත්තප්පසාදෙන-ධම්මෙ සඞ්ඝෙච යො නරො,
කප්පානි සතසහස්සානි-දුග්ගතිං සො න ගච්ඡති.

යම් සත්ත්වයෙක් බුදුන් කෙරෙහිද ධර්මය කෙරෙහිද සඞ්ඝයා කෙරෙහිද සිත පහදවා ගණිද, ඒ චිත්තප්‍රසාදය හේතුකොට හෙතෙම කල්පලක්‍ෂයක් දුගතියට නොයයි යනාදීන් පැහැදීමෙහි අනුසස් ප්‍රකාශයි.

මෙහි විවිධ ශ්‍රද්ධාවෙහි ප්‍රසාද ශ්‍රද්ධාවයයි දක්වුනේ නිෂ්පර්‍ය්‍යාය වශයෙන් කිසිසේත් වෙනස් නොවන ආර්‍ය්‍යයන්ගේ ශ්‍රද්ධාවයි. චතුර්විධ ශ්‍රද්ධාවෙහි පුහුදුන්ගේ ප්‍රසාදොත්පත්තිය ප්‍රසාද ශ්‍රද්ධාවයයි කියනලදී. එය වෙනස්වන හෙයින් පර්‍ය්‍යාය වශයෙන් ප්‍රසාද ශ්‍රද්ධාව යයි කීබව සැලකිය යුතුයි. කීයේ මැනෝ:-

“ථොකෙනෙ'ව තුලාකොටි-යාති උන්නති මොනතිං,
තථා පුථුජ්ජනො ලොකෙ-යාති කොපප්පසාදනං.”

යම්සේ තරාදි කොණ මදකින් උස් පහත් විමව යේද, එසේම ලොකයෙහි පෘථග්ජන තෙම මදකින් කොපයවද මදකින් පැහැදීමවද යේ, කිසි කලෙක්හි යමෙකු කෙරෙහි පැහැදුනේ නම් පසුව ඒ පැහැදීම වෙනස්විය හැකිද වේ.

ඇතැම් ආචාර්‍ය්‍ය කෙනෙක් “සම්පසාදන ලක්ඛණා සද්ධා සම්පක්ඛන්දන ලක්ඛනා සද්ධා සද්දහන ලක්ඛණා සද්ධා ඔකප්පන ලක්ඛණා සද්ධා ආගමසද්ධා අධිගමසද්ධා” යයි ශ්‍රද්ධාවගේ සවැදෑරුම් බවක්ද කියති. ලක්ෂණ සමග එසේ ශ්‍රද්ධාවේ භෙදය ගැණීම යුතු යයි නොවැටහේ. එසේ වුවද ඒවා ගැන විස්තරයද යවකි නියායෙන් දතයුතුයි.

කෘත්‍යය වශයෙන් ඉන්ද්‍රියයන්ගේ විභාගය මෙසේය:-

අශ්‍රද්ධාදි ප්‍රතිපක්ෂ ධර්‍මයන් මැඩලීමද තමා හා එක්ව යෙදෙන චිත්ත චෛතසික ධර්‍මයන් ප්‍රසන්නාකාරයෙන් පිළියෙළ කිරීමද ශ්‍රද්ධෙන්ද්‍රියයේ කෘත්‍යය වේ.

භූමි වශයෙන් විනිශ්චය මෙසේය:- ශ්‍රද්ධෙන්ද්‍රියය කාමාවචර රූපාවචර අරූපාවචර ලොකොත්තර යන චතුර්භූමියට ඇතුලත් වේයයි සැලකිය යුතුයි.

තවද මෙහිලා ශ්‍රද්ධාවගේ මූලද නිමිත්තද ආකාරයද අනුධර්‍මයද කියයුතුයි.

“සද්ධාමූලං නාම සද්ධාය වත්ථුස්මිං ඔකප්පනහෙතු භූතො උපායමනසිකාරො, අපිච සප්පුරිසූප සෙවනං සද්ධම්ම සවනං යොනිසො මනසිකාරො ධම්මානුධම්ම පටිපත්ති'ති චත්තාරි සොතාපත්ති අඞ්ගානි සද්ධාමූලං නාම.”

ශ්‍රද්ධාව පිළිබඳ මූල නම් ඇදහියයුතු වස්තුවවූ තෙරුවන් ගුණෙහි අශ්‍රද්ධාවෙන් නොසැලෙන සේ සිත පිහිටුවාලීමට හෙතුවූ උපාය මනසිකාරය (ඇතිහැටියට තුණුරුවන්ගේ ගුණ මෙනෙහි කිරීමය) යහපත් සත්පුරුෂයන් සේවන භජන පර්‍ය්‍යුපාසනය කිරී

මය සද්ධර්ම ශ්‍රවණය උපාය මනසිකාරය නවලොවුතුරු දහමට අනුකූල පිළිපැදීමය යන ස්‍රෝතාපත්ති මාර්ගාඞ්ග සතර ශ්‍රද්ධාවේ මූලයයි දතයුතුයි.

සිල්වතුන් දකිනු කැමති බවය බණ අසනු කැමති බවය මසුරුමල දුරුකොට දන්දීමෙහි හා තමාගේ කොටස අනුන්ට බෙදාදීමෙහි ඇලුනු බවය යන කරුණු තුණ ශ්‍රද්ධාවට නිමිත්තයයි දක්වා තිබේ.

“කොචාහාරො සද්ධාය සද්ධම්මසවනන්තිස්ස වචනීයං”

ශ්‍රද්ධාවගේ ආහාරය කවරේදැයි විචාලහොත් සද්ධර්මශ්‍රවනය ශ්‍රද්ධාවට ආහාරවේයයි ඔහුට පිළිතුරු වශයෙන් කියයුතුයයි වදාළසේක.

සත්ත්වයන්ගේ දිවිපැවැත්මට ආහාරය ප්‍රත්‍යය වේද, එසේම ඒ ඒ ධර්මයන්ගේ නොපිරිහෙලී පැවැත්මටද හේතුවන ධර්ම තිබේ. ශ්‍රද්ධාවට ධර්මශ්‍රවනය ආහාර වේ, බණ නොඅසන්නාගේ ශ්‍රද්ධාව නොපවතින බව මෙයින් තේරුම්ගත යුතුයි. එහෙයින් “කාලෙන ධම්මසවනං එතං මඞ්ගලමුත්තමං” යි මඞ්ගල සූත්‍රයෙහි සුදුසු කාලයෙහි බණ ඇසීම උතුම් මඞ්ගල (අභිවෘද්ධි කාරණය)කැයි වදාළසේක.

“සද්ධා පබ්බජිතස්ස භික්ඛවෙ භික්ඛුනො අයමනුධම්මො හොති යං රූපෙ නිබ්බිදා බහුලො විහරිස්සතීති” යන දෙශනාවෙන් ශ්‍රද්ධාවගේ අනුකූල ධර්මය ප්‍රකාශව තිබේ. මහණෙනි! සැදැහැයෙන් පැවිදිවූ මහණහුගේ යම්හෙයකින් රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන පඤ්චස්කන්ධයෙහි නිර්වේදය (කලකිරීම) බහුල කොට ඇත්තෙක්ම වාසය කෙරේද, මේ ශ්‍රද්ධාව පිළිබඳ අනුධර්මයයි වදාළසේක.

තවද “සද්ධා හත්ථො මහානාගො, සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං සද්ධා බීජං තපොවුට්ඨි” යන දෙශනාවන් එකට සම්බන්ධ කොට අටුවාවල “එසා හත්ථ විත්ත බීජානි විය දට්ඨබ්බා” *යන්නෙන් මේ ශ්‍රද්ධා තොමෝ අතමෙන්ද වස්තුව මෙන්ද බීජය මෙන්ද දත යුත්තීයයි කිහ.

---

*මෙහි යථාර්ථය පරීක්ෂා නොකිරීමෙන් ශුද්ධියෙන් ප්‍රචාරයට පමුණුවා තිබෙන අටුවා කීපයක මේ පාඨය “සමහාචිත්ත බීජචිත්තානි විය, සමහත්ථචිත්තබීජානි විය, සහත්ථචිත්ත බීජානි විය, සාහත්ථ චිත්තබීජානි විය” යි ලිපිදෝෂවලින් දූෂිත වැරදිපාඨ යොදා තිබේ. නැවත මුද්‍රණයේදී වත් එය ශුද්ධ කෙරෙත්වා.

යම්සේ අත නැති කල්හි මනුෂ්‍යයෝ රුවන් ආ අගනා වස්තු දුටත් ගත නොහැකි වෙත්ද, අතින් අභිමත සියල්ල ගණිද්ද, එපරිද්දෙන්ම නිරවද්‍ය ධර්මයන් ගන්නා හෙයින් ශ්‍රද්ධාව අත වැනි යයි වදාළසේක.

යම්සේ හිරණ්‍ය සුවර්ණාදි ධනය සත්ත්වයන්ට උපභොග පරිභොග සැපය එළවාද, සා පවස් ආ දුක් පිළිබඳාද, දිළිඳුකම සන්සිඳුවාද, මුතු මැණික් ආදි අනගි වස්තු ලැබීමට හෙතුවේද, ලොක සන්තතිය සදවාර සම්පන්නභාවය එළවාද, එසේම ලෞකික ලොකොත්තර ශ්‍රද්ධාවද ලොවී ලොවුතුරු විපාක සැප එළවයි, ශ්‍රද්ධා ධුරයෙන් පිළිපන්නවුන්ගේ ජාතිජරා මරණාදි සසරදුක් වළකයි, අගුණ නැමති දිළිඳුබව සන්සිඳුවයි, සප්තබොධ්‍යඞ්ගාදි රත්න ප්‍රතිලාභයට හෙතුවෙයි, ලොකසන්තතියද එළවයි, මේ ශ්‍රද්ධා නමැති ධනය තමා හා නැවිව යන අනුගාමික ධනයයි, අන්‍යයන්ට සාධාරණ නොවේ, සැම සැපතටම හෙතුවේ, ලෞකික හිරණ්‍ය සුවර්ණාදිය ලැබීමට හෙතුවේ. සැදැහැ ඇත්තේම දන්දී පින්කම් කොට මහත් මහත් වස්තුපකරණ ලබයි, ඒවායින් තමාවද අනුන්ටද වැඩක්ම සැලසේ.

"අස්සද්ධස්ස පන තානි අනත්ථාවහානි හොන්ති" යන ඉතිවුත්තක අටුවා පාඨයෙන් සැදැහැ නැත්තහුගේ ඒ වස්තු මෙලෝ පරලෝ දෙක්හි බොහෝ අනර්ථ එළවන්නාහු වෙත්යයි ප්‍රකාශ කොට තිබේ. යළිත් සැදැහැවත් තෙමේ චිත්තගෘහපති ආදීන් මෙන් ඉහාත්මභාවයෙහිම දිව්‍යමනුෂ්‍යාදීන් ගෙන්ද බොහෝ ධන සම්පත් හා සැලකිලිද ලබයි.

එහෙයින් සැදැහැවත් තෙමේ මුක්තාමාණික්‍යාදි වස්තුවද ශ්‍රද්ධා ශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥා හිරිඔත්තප්ප සඞ්ඛ්‍යාත සප්තාර්‍ය්‍ය ධනයද ලබයි. ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය යන ත්‍රිවිධ කුලසම්පත්තියද ෂඩ්කාම ස්වර්ගයද බ්‍රහ්මලොකසම්පත්තියද අවසානයෙහි අමාමහ නිවණද ලබයි. ශ්‍රද්ධාව නිරුත්තර ලාභයයි වදාළේත් එහෙයිනි. වදාරණලදමැයි:-

"යො ච ඛො භික්ඛවෙ තථාගතෙ වා තථාගත සාවකෙ වා සද්ධං පටිලභති, නිවිට්ඨසද්ධො නිවිට්ඨපෙමො එකන්තගතො අභිප්පසන්නො එතදනුත්තරියං භික්ඛවෙ ලාභානං, සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථඞ්ගමාය ඤායස්ස අධිගමාය නිබ්බාණස්ස සච්ඡිකිරියාය යදිදං තථාගතෙ වා —පෙ— අභිප්පසන්නො, ඉදං වුච්චති භික්ඛවෙ ලාභානුත්තරියං"

මහණෙනි! යමෙක් වනාහි තථාගතයන් කෙරෙහි හෝ තථාගත ශ්‍රාවකයන් කෙරෙහි හෝ චිත්තසන්තානයෙහි බැසගත් ශ්‍රද්ධාව ඇත්තේක්ව පිහිටි ප්‍රේමය ඇත්තේක්ව "බුදුහු පරෝපදේශ රහිතව මනාව ස්වයංධර්මයන් අවබෝධ කළසේක. ධර්මය සුධර්මය වෙයි, සඞ්ඝයා සුප්‍රතිපන්නයයි ඒකාන්තබවට ගියේ, මනාව පැහැදුනේ ශ්‍රද්ධාව පිළිලබාද, මහණෙනි! පුත්‍රලාභාදී සෑම ලාභයටම වඩා මේ ශ්‍රද්ධාප්‍රතිලාභය සත්ත්වයන්ගේ විශුද්ධිය පිණිස ශෝකපරිදේවයන්ගේ ඉක්මවාලීම පිණිස දුක් දොම්නස් දෙදෙනාගේ දුරුකිරීම පිණිස මාර්ගයගේ ලැබීම පිණිස නිවන් පසක් කිරීම පිණිස වේද, මේ නිරුත්තර ලාභයයි වදාළසේක.

ශ්‍රද්ධාව බීජය වැනියයි වදාළේ කවරහෙයින්ද? යම්සේ බීජය නැතිකල්හි සස්‍යාදිය නො සැපයේද, එසේම ශ්‍රද්ධාව නැතිකල්හි දසපින්කිරියවත් සමෘද්ධ නොවේ. එහෙයින් රුහනාර්ථයෙන් ශ්‍රද්ධාව ඇහැ නොවූ බීජයක් වැනි වේ. බීජයවූකලී යටමුල්වලින් පිහිටයි, මත්තෙහි අඞ්කුරය (හිරිය) හටගණී, එසේම ශ්‍රද්ධා නමැති බීජය යට ශීල නමැති මුලෙන් පිහිටයි, මත්තෙහි සමථවිදර්ශනා නමැති අඞ්කුර නගාලයි, යම්සේ බීජය මුලෙන් පෘථිවීරසය හා ආපෝරසය ද ඇදගෙණ නාලයෙන් ධාන්‍යය මේරීම පිණිස වැඩේද, එපරිද්දෙන් මේ ශ්‍රද්ධාබීජය ශීල නමැති මුලෙන් සමථ විදර්ශනා රසය ඇදගෙණ ආර්‍ය්‍යමාර්ග නමැති නාලයෙන් ආර්‍ය්‍යඵල නමැති ධාන්‍යය මුහුකුරුයාම පිණිස වැඩෙයි. යම්සේ බීජය බිම පිහිටා මුල් අඞ්කුරු පත් නල පුරුක් සමූහයෙන් වැඩීමට (උස්ව නැගීමට) පඳුරුලෑමට පැමිණ කිරිවැදී නොයෙක් හැල් ඵලයෙන් බරවූ කරල් නිපදවාද, එසේම මේ ශ්‍රද්ධා බීජය චිත්තසන්තානයෙහි පිහිටා ශීල චිත්ත දෘෂ්ටි කාංක්ෂාවිතරණ මාර්ගාමාර්ගඥාණදර්ශන ප්‍රතිපදාඥාණදර්ශන විශුද්ධීන්ගෙන් වැඩීමට විශේෂයෙන් නැගීමට විපුලත්වයට පැමිණ ඥානදර්ශනවිශුද්ධිසංඛ්‍යාත කිරිවැදී නොයෙක් ප්‍රතිසංවිද් අභිඥාභරිත අර්හත්ඵලය නිපදවයි. එහෙයින් ශ්‍රද්ධාව බීජය වැනියයි වදාළසේක.

තවද "සද්ධං බන්ධති පාථෙය්‍යං" යන්නෙන් සංසාර නමැති දීර්ඝමාර්ගයෙහි සැරිසරණ මහාජනතාවට ශ්‍රද්ධාව මාර්ගෝපකරණ කොට බැඳගන්නේයයි සංයුත් සඟියෙහි වදාළසේක. මගවියදම ඇත්තාහට සුවසේ ගමන යාහැකිබව කවුරුත් දනිති. ශ්‍රද්ධා නමැති මාර්ගෝපකරණ ඇත්තාහට භවයෝනි ගති විඥානස්ථිති සත්ත්වාවාසයන්හි සැප සැලසෙන්නේය.

"සද්ධා දුතියා පුරිසස්ස හොති" යන්නෙන්ද සුගතියට හා නිවන්පුරයට වදනා පුරුෂයාහට ශ්‍රද්ධාව දෙවන්නා වේයයි වදාරතිබේ.

**"සද්ධාය තරතී ඔඝං"** යන ගාථාපාදයෙන් ශ්‍රද්ධාව කරණ කොටගෙණ කාමෝඝය භවෝඝය දෘෂ්ටිඔඝය අවිද්‍යාඔඝය යන සතර ඔඝය තරණය කෙරේයයි වදාළහ. එහි පඤ්චකාමගුණයෙහි ඡන්දරාගය කාමෝඝයයිද, රූපාරූපභවයන්හි ඡන්දරාගයද ධ්‍යාන නිකාන්තියද භවෝඝයයිද දෙසැටක් මිථ්‍යාදෘෂ්ටිය දෘෂ්ටිඔඝයයිද චතුරාර්ය්‍යසත්‍යයන්හි නො දැනීම අවිද්‍යාඔඝයයිද සැකෙවින් දතයුතුයි. යටපත්කරණ අර්ථයෙනුත් මහත් අර්ථයෙනුත් මේවා ඔඝයයි කියනු ලැබේ. යම්සේ දියසුලියට අසුවූවෙකු මතුවිය නොදී යටපත් කෙරේද, එසේම මේ ඔඝය වනාහි තමාගේ වශයට ගිය සත්ත්වයන් යටට යවයි. නිරයාදි දුගතියටම පමුණුවයි. මතු භව යටද නිවනටද යන්ට නොදී යට තුන්භවයෙහිද සතරයෝනියෙහිද පඤ්චගතියෙහිද සප්තවිඥානස්ථිතියෙහිද නව සත්ත්වාවාසයෙහිද උපදවයි. මහත් අර්ථයෙන් මහත් කෙලෙශ රාශියෙකි. අවීචියෙහි පටන් භවාග්‍රයතෙක් පැතුරුණේය, මෙසේ රාශ්‍යර්ථයෙන්ද ඔඝයයි සැලකිය යුතුයි. යටකීපරිදි සම්පක්ඛන්දන ලක්ෂණ ශ්‍රද්ධාව කරණ කොට ගෙණ මේ සතර ඔඝයන් තරණය කරණ බව තේරුම්ගත යුතුයි.

නගරෝපම සූත්‍රයෙහි ශ්‍රද්ධාව ඉන්ද්‍රඛීලය වැනියයි වදාළහ. යම්සේ සොළොස්රියන් යට වළකැණ සිටුවනලද ඉන්ද්‍රඛීලය නොසැලී ස්ථිරව සිටීද, එසේම ශ්‍රද්ධාව විරුද්ධ ධර්මයන්ගෙන් නොසැලී පවත්නීද ඒ ශ්‍රද්ධාව ඉන්ද්‍රඛීලය වැනි බව සැලකිය යුතුයි. වදාළේ මැනෙවි.

**"සද්ධෙසිකො භික්ඛවෙ අරියසාවකො අකුසලං පජහති, කුසලං භාවෙති, සාවජ්ජං පජහති, අනවජ්ජං භාවෙති, සුද්ධමත්තානං පරිහරති.'**

මහණෙනි! ශ්‍රද්ධාව නමැති ඉන්ද්‍රඛීලය ඇති ආර්ය්‍යශ්‍රාවක තෙම අකුසල් පහකෙරෙයි, කුසල් වඩයි, සාවද්‍යය පහකෙරෙයි, නිරවද්‍යය වඩයි, පිරිසිදු සිත පරිහරණය කෙරෙයි, මේ දෙශනාවලින් ශ්‍රද්ධාවේ විභාග තේරුම් ගෙණ මේ ලඟට ශ්‍රද්ධේන්ද්‍රිය වඩන අයුරු දතයුතුයි:-

**"අච්ඡරාසඞ්ඝාතමත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු සද්ධින්ද්‍රියං භාවෙති, සො අරිත්තජ්ඣානො විහරති සත්ථුසාසනකරො ඔවාදපතිකරො අමොඝං රට්ඨපිණ්ඩං භුඤ්ජති, කො පන වාදො යෙ නං බහුලීකරොන්ති."**

මහණෙනි! අසුරුසනක් ගසන පමණකුදු මහණතෙම ශ්‍රද්ධෙන්ද්‍රිය වඩාද, ඒ මහණතෙම නොසිස් ධ්‍යාන ඇත්තෙක්ව ශාස්තෘන් වහන්සේ ගේ අනුශාසනය කරන්නෙක්ව අවවාදය කරන්නෙක්ව වාසය කෙරෙයි, නො සිස්වූ රටවැස්සන් කම්පල අදහා දෙනලද පිණ්ඩභොජනය වළඳවයි, යම්කෙනෙක් එය බහුල කෙරෙද්ද, ඔවුන්ට ලැබෙන අනුසස් කියනුම කවරේද? යන ආදීන් වදාල අනුසස් සලකා ආදිකර්මික යොගාවචර කුලපුත්‍රතෙම කරුණු තුණකින් ශ්‍රද්ධෙන්ද්‍රියය පිරිසිදු කරන්නේය, වඩන්නේය.

"අස්සද්ධෙ පුග්ගලෙ පරිවජ්ජයතො සද්ධෙ පුග්ගලෙ සෙවතො භජතො පයිරුපාසතො පසාදනීයෙ සුත්තන්තෙ පච්චවෙක්ඛතොති ඉමෙහි තීහි කාරණෙහි සද්ධින්ද්‍රියං විසුජ්ඣති."

රත්නත්‍රය කෙරෙහි පැහැදීමක් නැති අශ්‍රද්ධාවත් පුද්ගලයන් සෙවනය භජනය පයිර්‍යුපාසනය නොකොට දුරුකරන්නහුගේද, වක්කලි තෙරණුවන් වැනි සැදැහැඇති පුගුලන් සෙවනය භජනය පයිරුපාසනය කරන්නහුගේද, ලක්ෂණසූත්‍ර කාලකාරාමසූත්‍ර අග්‍ර ප්‍රසාද සූත්‍ර ආර්‍යවංශ සූත්‍රාදි තෙරුවන්හි ප්‍රසාදභාවය එලවන තෙරුවන් ගුණ ප්‍රකාශවන සූත්‍රයන් නුවණින් මෙනෙහි කරන්නහුගේද යන මේ තුන් කරුණෙන් ශ්‍රද්ධෙන්ද්‍රියය පිරිසිදු වන්නේය, ඒ යොගාවචරතෙමේ අර්හත් ඵලය දක්වා ශ්‍රද්ධෙන්ද්‍රිය වඩන්නේය, රහත්පලයට පැමිණිකල්හි වඩා අවසන්කල ශ්‍රද්ධෙන්ද්‍රියය ඇත්තේ නම් වේ යයි දතයුතුයි.

පින්වත්නි! මෙතෙකින් අද නියමිත මාතෘකාව සැකෙවින් ප්‍රකාශ කෙළෙමු. බෞද්ධ අප කාගේත් බලාපොරොත්තුව නිවන් ලැබීමට බැවින් ඒ නිවන් පසක් කරණු කැමැතියන් විසින් මේ ශ්‍රද්ධෙන්ද්‍රිය හා අවශෙෂ ඉන්ද්‍රියයන්ද වඩා දියුණුකරගෙණ සතර මග සතරපල පිළිබඳ අමාමහ නිවන් පසක් කිරීමට උත්සාහ කළ යුතුයි.

සාධු! සාධු!! සාධු!!!

# වීර්‍යෙන්ද්‍රිය.

මොරටුමුල්ලේ තපසරාරාමාධිපති
භදන්ත ශ්‍රී ආචාර්‍ය මොරටුවේ ශ්‍රී පෙමරතන
මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ විසින් ලියන ලදී.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

කතමං තස්මිං සමයෙ විරියින්ද්‍රියං හොති? යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිල පරක්කමතා අනික්ඛිත්ත ඡන්දතා අනික්ඛිත්ත ධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො ඉදං තස්මිං සමයෙ විරියින්ද්‍රියං හොති.

මේ ප්‍රකාශ කරණ ලද්දේ අද දින ධර්මදේශනාවට නියමිත මාතෘකාවවූ වීර්‍යෙන්ද්‍රිය පිළිබඳව ධම්මසඞ්ගණී ප්‍රකරණයෙහි ආවාවූ පාඨයකි. මේ වනාහී මොරටුමුල්ලේ ශ්‍රී සුධර්මාරාමාධිපතිව වැඩවිසූ ගෞරවාර්හ ඈම්. ශ්‍රී. අරියවංශ මහාස්ථවිරපාදයන් වහන්සේගේ ගුණානුස්මරණය කිරීම් වශයෙන් උන්වහන්සේගේ උගත් ශිෂ්‍ය මොරටුවේ ශාසනවංශ ස්ථවිරයන් වහන්සේ විසින් පළකරවාගෙණ යන්නාවූ පොත් පඞ්ක්තිය අතුරෙන් තුන්වන වරට අප වෙත කරණලද ආරාධනයේ පරිදි ලියනු ලබන්නකි.

මෙහි මුලින් කියනලද ධර්මකොට්ඨාසයේ අදහස නම්:-

ඉන්ද්‍රිය ධර්ම ප්‍රකාශිත එසමයෙහි වීර්‍යෙන්ද්‍රිය යනු කවරෙක් වේද? එසමයෙහි යම් චෛතසික වීර්‍යාරම්භයෙක් වේද, මැලි බැවින් නික්මීමෙක් වේද, පරාක්‍රමයක් වේද, උද්‍යාමයක් වේද, ව්‍යායාමයක් වේද, උත්සාහයක් වේද, අභිමතාර්ථය තෙක් කරණ "උස්සොළ්හී" සංඛ්‍යාත වීර්‍යයක්වේද, ශක්තියක්වේද, ධෛර්‍යයක්වේද, නොලිහිල් පැරකුම් බවෙක් වේද, කුසල් සඳහා බහා නොතබනලද කැමැති බවක් වේද, බහා නොතබනලද වීර්‍යධුර ඇති බවක්වේද, ඉසිළු ධුරය ගෙණයෑමෙක් වේද, වීර්‍යයෙක්වේද වීර්‍යෙන්ද්‍රියයක්වේද, වීර්‍යබලයක්වේද, සම්‍යක් ව්‍යායාමයක්වේද, මේ එසමයෙහි වීර්‍යෙන්ද්‍රිය නම්වේ යනුයි.

මෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් වීර්‍ය්‍යෙන්ද්‍රිය හඟවනු පිණිස පර්‍ය්‍යායට වචන රාශියක් යොදනලදී. මේ වීර්‍ය්‍යය තරම් බොහෝ තැන්වල යෙදෙන චෛතසිකයක් තවත් නැත්තේය. බොධිපාක්ෂික ධර්ම විෂයෙහි සැමතැනකම මේ වීර්‍ය්‍යය යෙදුනේය. සම්‍යක් ප්‍රධාන සතර, විරියිද්ධිපාදය, විරියින්ද්‍රිය, විරියබලය, විරිය සම්බොජ්ඣඞ්ගය, සම්‍යක් ව්‍යායාමය යන නවතන්හිම ආවේ මේ එකම වීර්‍ය්‍යයයි. එකම මනුෂ්‍යයා තනතුරු කීපයක් උසුලනකල ඒ ඒ තනතුරුවලට අනුව නම් ලබන්නාක් මෙන් එකම වීර්‍ය්‍යය ඒ ඒ කෘත්‍යවල යෙදෙනකල ඊට සුදුසු නම් ලබයි. ඒ හැම තැන් වලම පාහේ වීර්‍ය්‍යය විස්තරව තිබෙන්නේ එකම අයුරකිනි. එබැවින් වීර්‍ය්‍යය පිළිබඳව මුලින් කියවුනු මාතෘකාවලදී එම විස්තර ප්‍රකාශවන්ට ඇතැයි සිතමි. විශෙෂ විභාග පමණක් බෙහෙවින් මෙහි සඳහන් කරණු ලැබේ.

විරියින්ද්‍රිය යන තන්හි විරිය ශබ්දයෙහි හා ඉන්ද්‍රිය ශබ්දයෙහි පළමුකොට අර්ථ දතයුතුයි.

වීරස්සභාවො-විරියං, වීරානං වා කම්මං- විරියං, විධිනා වා නයෙන උපායෙන ඊරයිතබ්බං පවත්තයිතබ්බන්ති- විරියං, තදෙවකො සජ්ජස්ස අභිභවනතො අධිපතියට්ඨෙන ඉන්ද්‍රියං, පග්ගහලක්ඛණෙ වා ඉන්දට්ඨං කාරෙතීති ඉන්ද්‍රියං, විරියමෙව ඉන්ද්‍රියං විරියින්ද්‍රියං තං පනෙතං උපත්ථම්භන ලක්ඛණංච විරියං පග්ගහ ලක්ඛණං ච.

මෙහි අදහස නම්? වීරයාගේ ස්වභාවය හෝ වීරයාගේ කර්මය හෝ විධිවූ වශයෙන් පැවැත්විය යුත්ත හෝ වීර්‍ය්‍යය නම්වේ යනුයි. එයම මැලිබව මැඩපවත්වන හෙයින් අධිපති අර්ථයෙන් ඉන්ද්‍රිය නම්වේ. රැකුල්දෙන ස්වභාවයෙහි අධිපතිබව කෙරේනුයි හෝ ඉන්ද්‍රිය නම් වේ. වීර්‍ය්‍යයම ඉන්ද්‍රියවූයේ වීර්‍ය්‍යෙන්ද්‍රියයයි. එය වනාහි උපස්තම්භනය හෙවත් රැකුල්දීම හා ප්‍රග්‍රහණය හෙවත් අනුබලදීමද ලක්ෂණකොට ඇත්තේය.

වීර්‍ය්‍යයෙහි ලක්ෂණය, කෘත්‍යය, වැටහීමය, ආසන්නකාරණය යන මොව්හු මෙසේය.

උස්සාහන ලක්ඛණං විරියං, සහජාතානං උපත්ථම්භනරසං, අසංසීදනභාව පච්චුපට්ඨානං, විරියාරම්භවත්ථු පදට්ඨානං වා සම්මා ආරද්ධං සබ්බාසං සම්පත්තීනං මූලං හොතීති වෙදිතබ්බං යනු හෙයින් වීර්‍ය්‍යය උත්සාහවත් කිරීම ලක්ෂණකොට ඇත්තේය සහජාත ධර්මයන්ට රැකුල්දීම හෝ කෘත්‍යකොට ඇත්තේය.

නො හැකිලෙන බව වැටහීම කොට ඇත්තේය. වීර්‍යාරම්භ වස්තු ආසන්නකාරණකොට ඇත්තේය. එය වනාහි සියලු සම්පත්තීන්ට මූලවේයයි දතයුතුයි.

"ඉන්ද්‍රිය" යන්නෙහි තවත් අදහසක් නම්:-

**"සබ්බානෙව පනතානි භගවතා යථාභූතතො පකාසිතානි ච අභිසම්බුද්ධානි චාති ඉන්ද දෙසිතත්ථෙන ඉන්ද දිට්ඨත්ථෙන ච ඉන්ද්‍රියානි"**

යනුහෙයින් මේ සියළු ඉන්ද්‍රිය ධර්මයෝම භාග්‍යවතුන් වහන්සේ විසින් තත්වූ පරිද්දෙන් ප්‍රකාශකරණ ලද්දාහුද අවබෝධකරණ ලද්දාහුද වෙත්. එහෙයින් ඉන්ද්‍ර නම් ලද භාග්‍යවතුන් වහන්සේ විසින් වදාලාවූ අර්ථයෙන්ද අවබෝධකලාවූ අර්ථයෙන්ද ඉන්ද්‍රිය නම් වෙති.

මෙසේ වීර්‍යෙන්ද්‍රිය ගැන සලකනවිට එයින් ඉගෙණගත යුත්තේ කෙලෙසුන් ගෙන් නික්මීමට විනා ඇගමැලි ගතියෙන් හා නිදිබර ගතියෙන් යුක්තව වසන්ට නොවෙයි. අද ලක්වැසියන්ට මිනිසුන් මගයෙන් දියුණුවන්ට බැරිවී තිබෙන්නේ කුසීතකම නිසාය.

අදහස මුදුන්පත්වනතුරු පසු නොබැස වීර්‍යකිරීම බෝසත් ගුණයකි. සිය සිත කෙලෙස් සැඩපහරින් ගසාගෙණයන්ට ඉඩදුන හොත් සතර අපායෙන් මෙහා නැවතීය නොහැක. දසදිසාභාගයෙන්ම එන කෙලෙස් සතුරෝ කුසීත පුද්ගලයා පිරිවරා ගනිති. පුරුෂවීර්‍යයෙන් යුක්තව කෙලෙස් කඳවුරු බිඳින්ට පුරුදුවිය යුතුය. නොයෙක් දුක් ලදත් අභිමතාර්ථය සිද්ධවනතුරු ඉදිරියටම යා යුතුය. ලෝ දහමින් කම්පානොවී කෙලෙස් සතුරන් ජයගත හැකිවන්නේ එවිටය. මෙසේ වීර්‍ය පුරුදු කරන්නාහට උපන් කුසල් සිත යටපත්විය නොදී රැකගතහැකි වන්නේය. සම් මස් ලේ නහර වියලී ගියත් අධිෂ්ඨානය නොබිඳින්ට පුරුදුකරගත යුතුය. කුසල් වැඩීම හා අකුසල් මැඩීමත් ධර්මචර්‍යාවෙහි නොයෙදෙන්නාහට කල නොහැක. දහම්හි යෙදෙන්නාහට ප්‍රතිඵලදකින තුරු පටන්ගත් වීර්‍යය ගෙණගිය හැක්කේය. කෙතරම් කරදර පැමිණියත් ඉසිළු ධුරය ඉවත නොදමන්නෝ ඔව්හුය. මගපල රසවිඳ නිවන්පුර වැදගන්නට මේ වීර්‍ය චෛතසිකය අතිසයින්ම උපකාර වන්නේය. අරමුණු ගැන්මෙහි පසුබස්නට ඉඩනොදී අනුබලදීම් රැකුල්දීම් තල්ලුකිරීම්ගතිය ඇත්තේ වීර්‍ය චෛතසික යෙහිය. මගපල සෙවෙති ආදිය ගිලිහිය නොදී රැකුල් දෙන්නාවූ

අංධාර කණුවක් මෙන් එය දතයුතුයි. මේ චෛතසිකය උපන් කල්හි මහත්වූ කටයුත්ත අල්පවශයෙන්ද කරන්ට නොහැකිදෙය කිරීමට පහසු දෙයක් කොටද බැරෑරුම් ක්‍රියාම ලුහුකොටද සලකනු පමණක් නොවෙයි. චිත්ත චෛතසිකයන්ගේ අරමුණු බර උසිලීමෙහි උත්සාහය බලවත් කරන්නේය යම් යම් සත්ත්වයන්ගේ බර ඇදීම් බර උසිලීම් පොරබැදීම් සරඹ කිරීම් ආදී කායික වීර්‍ය්‍යයයි කියනලද හස්තපාදාදී ශරීරාවයවයන්ගේ දඹු මුගුරු අයුරින් පැවැත්මට කාරුණුවූ පෘථිවි ආපෝ ආදී ධාතූන්ගේ තැලඹීමෙක් වේද ඊට ශරීර බලය ඔජාරූපයයි කියනු මිස පරමාර්ථ ධර්ම විභාගයෙහිලා වීර්‍ය්‍යයයි ව්‍යවහාර නොකෙරේ.

මීලඟට ලිවියයුතු වීර්‍ය්‍ය චෛතසිකයෙහි ලක්ෂණ, කෘත්‍ය, වැටහීම, ආසන්න කාරණය යන මේ කාරුණු හා වීර්‍ය්‍යයන්ගේ ප්‍රභේදද මූල් ධර්ම කලාපවල විස්තරව ඇති බැවින් ඒ මෙහි නොදක්වනු ලැබේ.

වීර්‍ය්‍යෙන්ද්‍රිය පිරිසිදුකරගතහැකි ක්‍රමය.

කුසීතෙ පුග්ගලෙ පරිවජ්ජයතො, ආරද්ධවිරිය පුග්ගලෙ සෙවතො භජතො පයිරුපාසතො සම්මප්පධානෙ පච්චවෙක්ඛතො ඉමෙහි තීහි කාරණෙහි විරියින්ද්‍රියං විසුජ්ඣති.

කුසීත පුද්ගලයන් දුරුකරන්නාහටද පටන්ගත් වීර්‍ය්‍ය ඇති පුද්ගලයන් සේවනය භජනය පයිරුපාසනය කරන්නාහටද සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයන් ප්‍රත්‍යවේක්ෂා කරන්නාහටද මේ තුන් කාරුණින් වීර්‍ය්‍යෙන්ද්‍රිය පිරිසිදු වෙයි.

වීර්‍ය්‍යයෙහි ප්‍රයෝජන.

"විරියෙන දුක්ඛං අච්චෙති" යනු වදාළ හෙයින් දුක් ඉක්ම විය හැක්කේ වීර්‍ය්‍යයෙනි, සකෘදාගාමි ඵල ප්‍රාප්තයා විසින් තෘතීය මාර්ගය සඳහා පටන්ගන්නාලද වීර්‍ය්‍ය කාරණකොට ගෙණ සකෘදාගාමි ඵලයෙන් නොඉක්මවූ වස්තුකාම කෙලශ කාමයන්ගේ ප්‍රහාණය පිණිස කාම විරාග භාවනා කොට කාමෝඝ සංඛ්‍යාතවූ සර්ව දුඃඛයන් ඉක්මවා අනාගාමි ඵලයට පැමිණෙන්නේය යනු එහි භාවයි.

"තුම්හෙහි කිච්චං ආතප්පං–අක්ඛාතාරො තථාගතා" නොප විසින්ම උත්සාහ කළයුතුයි. තථාගතවරයෝ මග පාදා දෙන්නාහුය.

විරියං මෙ ධුර ධොරය්හං–යොගක්ඛෙමාධි වාහනං
ගච්ඡති අනිවත්තන්තං–යත්ථ ගන්ත්වා න සොචති.

මෙය කසීභාරවාජ බ්‍රාහ්මණයාහට බුදුරජානන් වහන්සේ විසින් වදාරණ ලද්දකි. එහි අදහස නම්;- ප්‍රඥාව නමැති වියදණ්ඩ උසුලන්නාවූ මාගේ කායික චෛතසික වීර්‍ය්‍යාරම්භය නිවන් අභිමුඛව පමුණුවනු ලබන්නේ යම්තැනකට ගොස් ශෝක නො කෙරේනම් ඒ නිවනට නො නැවතී ගමන් කරයි යනුයි.

මෙහි ප්‍රදන් වීර්‍ය්‍යය සඳහන් කරණලදී. ගවයා විසින් අදින ලද නගුල සහ භූමිය බිඳීද, මූල්තැදලිත් පලාද මෙසේ බුදුරජුගේ වීර්‍ය්‍යයෙන් අදිනලද ප්‍රඥා නමැති නගුල කෙලෙසුන්ගේ ඝන බහල ගතිය බිඳදමයි. කෙලෙස් පරම්පරාවද පලයි.

කාමයෝග භවයෝග දිට්ඨියෝග අවිජ්ජායෝග යන චතුර්විධ යෝගයන් ගෙන් මිදුන හෙයින් නිර්වාණය යෝගක්ෂේමයයි කියනු ලැබේ. එය අධිපතිකොට හෝ අභිමුඛකොට ප්‍රඥාධුර උසුලාගෙණ යන්නේ වීර්‍ය්‍යයයි. ප්‍රකෘති නගුල උසුලන්නාවූ ගවයා කෙත් කොණට පැමිණ නවතීද, අප බුදුරජුගේ වීර්‍ය්‍යය දීපඞ්කර බුඩකාලයේ පටන් එසේ නොනැවතීම ආශ්චර්‍ය්‍යය. ප්‍රකෘති නගුලෙන් සිඳිනලද තණ නැවත නැවතත් සිඳියයුතු වේත්. නමුත් ඒ ඒ මාර්ගයෙන් ප්‍රහීණකල කෙලෙස් නැවත පහකටයුතු නොවේත්. ප්‍රථම මාර්ග වශයෙන් දෘෂ්ටිසහගත කෙලෙස්ද විතීයමාර්ග වශයෙන් ඖදාරික කෙලෙස්ද තෘතීය මාර්ග වශයෙන් අනුසහගත කෙලෙස්ද චතුර්ථ මාර්ග වශයෙන් සියළු කෙලෙස්ද අත්හරිමින් වීර්‍ය්‍යය නො නැවතීම ගමන් කරයි.

මෙලොව වශයෙන් උවත් කෙනෙකුට දියුණුවිය හැක්කේ උත්සාහයෙනි. ගොවිතැන් වෙලහෙළඳම් ආදියෙන් ප්‍රයෝජන ලැබිය හැක්කේ එවිටය. බීජවර්ගයක් පස්යටකර දැමූපමණින් ගොවිතැන සාර්ථක නොවේ. වරින්වර ජලය දැමීම සතුන්ගෙන් ප්‍රවේසම්කර ගැණීම අලසයෙකුට කළනොහේ. බොහෝ පලාත් වල බිම්පෙදෙස් පාළුගතියෙන් යුක්තව තිබෙන්නේ උත්සාහවන්තයන්ගේ විරලත්වය නිසාය. සම්පත් ලබන්නහුගේ සිහිල්වූ තොතැන්නය කියයුත්තේ වෙළඳාමටය. එයද විමසීමෙන් යුක්තව සූරම කටයුත්තකි. දවසකින් දෙකකින් වෙළඳාමෙන් දියුණුවිය නොහේ. වේයන්ගේ තුඹස් බැඳීම හා මීමැස්සන්ගේ මීවද සෑදීමත් ආදර්ශයටගෙණ දියුණුවිය යුත්තේය. සුළුවෙන් පටන්ගත් වෙළඳම දියුණුකරගත හැක්කේ එවිටය. ගවයන් ඕගාකරගැණීමද වීර්‍ය්‍යයෙන්ම කළයුත්තකි. කෘෂිකර්මයට ගවයාගෙන් ලැබෙන ප්‍රයෝජන බොහොමය. ගවයන් රක්නා තැනැත්තා සතුන්ගෙන් හා රෝගයන්ගෙන් ඔවුන් ආරක්ෂාකර ගැණීමද සම විසම මාර්ග

දූත යැවීමද පැවවුන් පොෂ්‍යකර ගැණීමද උත්සාහයෙන් කටයුතුය. ගවයන්ගේ රොග හැඳින විශේෂයෙන් පරීක්ෂාකර බැලිය යුත්තේය. ඔවුන්ගේ ශරීරවල වණ සෑදී තිබේ නම් එහි නිලමැසි පණු බිජුවට අස්කොට බෙහෙත්ලා සුවකල යුතුය. කථාකරන්ට බැරි අසරණ සතුන්ට ඔහැළපෑකම් කියාගන්ට බැරිබැව් සලකා ඒවා උත්සාහයෙන් පරීක්ෂාකල යුතුය. එසේ නොකලහොත් රෝග බෝවී ගවරැළ පිරිහෙයි. මැසි මදුරුවන්ගෙන් වන පීඩාම මිනිසුන්ට පමණක් නොව ගවයන්ටද වන බැව් සලකා ගාල්වල දුම්ගැසිය යුතුය. පිපාසායෙන් නොමිරිකෙනසේ සුදුසු කාලයෙහි ඔවුන්ට පැන් දියයුතුය. මෙසේ නුවණින් දූත කටයුතු කිරීමෙන් ගවරැළ දියුණුකරගෙණ එයින් මහත්වූම ඵලයක් ලැබගත හැක්කේය. වීර්‍යෙන්ද්‍රිය ඇත්තා සතුන් ගැනද මෙසේ කරුණාවෙන් කටයුතු කරන්නේය. අත්තම්, ගෙත්තම් ආදියද මෙසේ උත්සාහයෙන්ම කරගත යුත්තේය. මනුෂ්‍යයින්ගේ දියුණුවට දොරටුව විවෘතවන්නේ එවිටය. මනුෂ්‍යයෙක් උවහොත් ජීවිකාව සඳහා රක්ෂාවක් ඉගෙණගත යුතුය. දෙවියන් මෙන් පින්බලයෙන් උපදිනතුරු බලාසිටියහොත් කාලකන්නියෙක් වේ. ගොවිතැන, වෙළඳම, ගවයන් රැකීම, රාජසේවය, ධනුශ්ශිල්පය ආදී යමක් ජීවිකාවෘත්තිය සඳහා යොදා ගතයුතුය, තමන් කරණ කොයිවැඩෙ උවත් නොමැලිව කලයුතුය, ආවට ගියාට යන්තමින් කිරීමෙන් දියුණුවිය නොහේ. අද බොහෝ දෙනාට වැරදී තිබෙන්නේ එනිසාය. සමහරු රක්ෂාවක් නොදනිති, නැතිනම් දූනගත්තත් නොකරති, කන්ට තිබේනම් දිවිහිමියෙන්ම එසේ සිටිති, කරතත් කලට වෙලාවට නොකරති, එබඳු මනුෂ්‍යයෙක් වීර්‍යෙන්ද්‍රිය වඩන්නේ කෙසේද?

හරණලද වීර්‍යය ඇති එක්තරා භික්ෂුවක් දූත බුදුරජාණන් වහන්සේ–

“භික්ඛු ඒවං එවරූපෙ මග්ගඵලදායකෙ සාසනෙ පබ්බජිත්වා විරියං ඔස්සජන්තො සතසහස්සග්ඝනිකාය කඤ්චනපාතියා පරිහීනො සෙරිවාණිජෝ විය චිරං සොචෙය්‍යාසි” යනුවෙන් මහණ! ඔබ මෙබඳු මාර්ගඵල දෙන්නාවූ සස්නෙහි පැවිදිව වීර්‍යය අත්හරින්නේ ලක්ෂයක් වටිනා රන්තලියෙන් පිරිහුනාවූ සෙරිවාණිජ වෙළෙන්දාමෙන් බොහෝ කලක් ශොක කරන්නෙහියයි, එය නිමිති කොට සෙරිවාණිජ ජාතකය වදාළ සේක.

පෙර අප මහ බෝසතාණන් වහන්සේ මහාසීලව නම් රජව උපන්හ. දැහැමින් රජකල එතුමා දිනක් වරදක් අසුවී තම ඇමති

යකු රටින් නෙරපීය. රජුට හා ඇමතියන් දහසකටත් අමුසොහොනෙහි වැලලී සිටීමට එය හේතුවිය. රටින් නෙරපූ ඇමතියා කොසොල් රජ හා එක්ව ඒ කල පලිගැණීමයි. සොහොනෙහි සිටි රජු හා පිරිස අල්වා කෑමට ආවේ සිවල් සමූහයකි. ප්‍රධාන සිවලා රජුකරුම පැමිණියේය. රජුගේ වීර්‍ය්‍යබලය පෙන්වීමට එය හොඳ අවස්ථාවක් විය. ගෙලගන්ට ඉඹදීමක් මෙන් රජ හිස එසෙව්වේය සිවලා යන්ත්‍රයකට අසුවූනාක් මෙන් හනු ඇටයටත් පොළොවටත් තදවීය. හිවලාගේ පහුරුගැහීමෙන් පොළොව බුරුල්විය. රජුට ගොඩඊමටත් අනිත් ඇමතියන්ගේ ගැලවීමටත් එම වීර්‍ය්‍යය හේතු විය. හිවලුන්ට දුවන්ට තැලැව මදිවිය. කොසොල්රජ තබා මුළු දඹදිව සැම රජුන් ආවත් ජයගත නොහැකිව සිටි සීලව රජු ගැන යක්ෂයෝ පවා පැහැදී සිටියහ. මලමිනියක් බෙදාගත නොහැකිව සිටි යකුන් දෙදෙනෙකුට සීලව රජතුමා එය බෙදාදුන්නේය, යකුන්ගේ ආනුභාවයෙන් සතුරු රජුගේ මගුල් කඩුවත් ගෙන්වා ගෙණ සිරියහන් ගබඩාවට ගොස් කඩුවෙන් ඇගේ තට්ටුකරණ තුරුත් සතුරු රජතෙමේ නිදීය. හදිසියෙන් ත්‍රස්තවී නැගිටි සතුරු රජතෙමේ සීලව රජුදුටු භයට හා පුදුමයට පත්ව තොර තුරු අසා සතුටුව පසුවද සෙනඟ රැස්කොට ඔවුන් මැද රජුගේ ගුණ කියා සීලව රජුටම රටභාරදී වැද සමුගෙණ සියරට බලා ගියේය. සීලව රජතෙමේ තමාගේ යසිසුරු බලා මෙබඳු සම්පත කුත් ඇමති දහසගේ ජීවිතත් මා වීර්‍ය්‍ය නොකළා නම් නැතැයි ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කරන්නේ–

ආසිං සෙථෙව පුරිසො–න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො
පස්සාමි වොහං අත්තානං–යථා ඉච්ඡිං තථා අහු.

පිරිමියෙක් නම් බලාපොරොත්තුවන්නේමය, හෙවත් මම මෙසේ වීර්‍ය්‍යකළොත් දුකින් මිදෙන්නෙමි. අභිමතාර්ථය සිදුවන්නේමයයි බලාපොරොත්තු වන්නේමය. නුවණැති පුද්ගලතෙම උපායෙහි දක්ෂවූයේ සුදුසුතැන වීර්‍ය්‍යකරමින් මම මේ වීර්‍ය්‍යයෙහි ඵලය නොලබන්නෙමියි නොකල කිරෙන්නේය. බලාපොරොත්තු කඩකර නොගන්නේය. මම අද තමන් ලද සම්පත දකිමි, මම වළෙහි බැඳී සිටියෙමි කෙසේ නම් මේ දුකින් මිදී තමන්ගේ රාජ්‍ය සම්පත්තිය ලබම්දැයි සිතීමි. ඒ මම සිතූ අන්දමටම මේ සැපත ලදිමි. පිටත්තර නිදසුන් උවමනා නැත. මගෙන්ම මට එය හෙළිවිය. කලින් මම යම්සේ සිතුවෙම්ද එසේමවීයයි සතුටු විය.

පෙර එක්තරා සැදැහැති කුලපුත්‍රයෙක් සස්නෙහි පැවිදිවිය. හෙතෙම වතින් සමන්විත විය ආචාර්‍ය්‍ය උපාධ්‍යායවත් පිරියුතු

පරිභොග නොකටයුතු ජලය පොහොය ගෙය ගිනිහල්ගෙය යනාදියෙහිමත් නොපිරිහෙලා කරයි. තුදුස් මහවත් අසූවක් කඳු වත් සම්පූර්ණ කරන්නෙක් විය. විහාරය පිරිවෙණ චිත්‍රකර්මාලංකාර විහාරමාර්ගය හමදියි, මිනිසුන්වද පැන්දෙයි, මනුෂ්‍යයෝ ඔහුගේ වත්‍ත සම්පත්තිය දුක පැහැදී පන්සියයක් පමණ නිති බත් දුන්හ. මහත් ලාභ සත්කාර උපන්නේය, එනිසා බොහෝ දෙනෙකුන්ගේ සැප විහරණය ඇතිවිය, එක් දිනක් දම්සභාමඩුවෙහිද ඒ කථාව ඇති විය. එහෙයින් ඔහුගේ පූර්වචරිතයද බුදුරජානන් වහන්සේගෙන් දැනගත හැකිවිය.

පෙර අප මහබෝසතානන් වහන්සේ උසස් බ්‍රාහ්මණ කුල යක ඉපිද තරුණ වයසට පැමිණිකල්හි සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පන්සියයක් තවුසන් පිරිවරාගෙණ පර්වත පාදයෙක්හි විසූසේක. එකල හිමවතෙහිද නියගක් විය. ඒ ඒ තැන්වල පැන් සිඳීගියහ. තිරිසන්හු පැන් නොලබන්නාහු කලානත වෙති. ඉක්බිති ඒ තවු සන් අතුරෙන් එක් තවුසෙක් ඔවුන්ගේ පිපාසා දුක දැක එක් රුකක් සිඳ ඔරුවක්තර එහි පැන් වත්කොට පුරවා ඔවුන්ට පැන් දුන්නේය. බොහෝ දෙනෙක් රැස්ව පැන්බොන කල්හි තවුසා හට පලාපල පිණිස යෑමට ඉඩනැතිවිය. හෙතෙම නිරාහාරව ඉදත් පැන්දෙයි. මෘග සමූහයා මෙසේ සිතී. මෙතෙම අපට පැන්දෙන් නේ නිරාහාරව වෙසෙයි. එබැවින් කලානතමෝයයි ඔව්හු කතිකා වතක් කළාහුය. මෙතැන්පටන් පැන්බොන්නට එන්නහු විසින් තමන්ගේ ශක්ති පමණින් පලාපල රැගෙණ ආයුතුය යනුයි. එතැන්පටන් එක එකා තම තමාගේ ශක්තිපරිද්දෙන් මිහිරි මිහිරි අඹ දඹ කොස් ආදිය රැගෙණම එයි. එක්කෙනෙකු සඳහා ගෙණෙන පලාපල දෙගැල්සමාරක් පමණ වෙයි. පන්සියයක් තවුසෝ ඒ පලමැලම වළඳිත්. වැඩිහරිය අහකදමයි. බෝසත්තෙම ඒ දැක මතීන් පිරුණ එක් තවුසකු නිසා මෙතෙක් තවුසන්ට පලමැල පිණිස නොගොස් එයින්ම යැපෙන්ට හැකිවිය. වීර්‍ය්‍යය නම් කට යුතුයයි වදුරු ගාථාවක්ද කීයේය. මෙසේ බෝසත්කල පවත් වීර්‍ය්‍යයෙහි ඵල බුදුරජානන් වහන්සේ විසින් බොහෝසේ වර්ණනා කොට තිබේ.

චිත්තාහං භික්ඛවෙ ධම්මානං උපඤ්ඤාසිං. යාව අසන්තුට්ඨිතා කුසලෙසු ධම්මෙසු, යාව අප්පටිවානිතා පධානස්මිං, අප්පටිවානී සුදහං භික්ඛවෙ පදහාමි කාමං තචො ච නහාරු ච අට්ඨි ච අව සිස්සතු. සරීරෙ උපසුස්සතු මංසලොහිතං, යං තං පුරිසථාමෙන පුරිස විරියෙන පුරිස පරක්කමෙන පත්තබ්බං නතං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතීති, තස්ස මය්හං භික්ඛවෙ අප්පමාදධි

ගතා සම්බොධි, අප්පමාදාධිගතො අනුත්තරො යොගක්ඛෙමො, තුම්හෙපි භික්ඛවෙ අප්පටිවානං පදහෙය්‍යාථ, කාමං තචො ච නහාරු ච අට්ඨි ච අවසිස්සතු, සරීරෙ උපසුස්සතු මංසලොහිතං යං තං පුරිසථාමෙන පුරිස විරියෙන පුරිස පරක්කමෙන පත්තබ්බං, න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතීති, තුම්හෙපි භික්ඛවෙ න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරිය පරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථ, තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං අප්පටිවානං පදහිස්සාම කාමං තචො ච නහාරු ච අට්ඨි ච අවසිස්සතු සරීරෙ උපසුස්සතු මංසලොහිතං, යන්තං පුරිස ථාමෙන පුරිස විරියෙන පුරිස පරක්කමෙන පත්තබ්බං න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතීති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

මහණෙනි! මම උතුම් ධර්ම දෙකක් හැණ දැන දැනගතිමි. එනම්:- කුසලධර්ම විෂයෙහි සුළු පිණක් කරගත් පමණින් මේ ඇතැයි සෑහීමකට නොපැමිණීමද වීර්‍ය්‍ය වැඩීමෙහිදී (කෙතරම් ගැහැට ලැබුනත් ඵලසිද්ධිය ඇතිවනතුරු) නොපසු බැසීමද යන දෙකයි. මහණෙනි! මම බෝධිසත්වකාලයෙහි සර්වඥතාඥානය පතමින් ධ්‍යානමාත්‍රාදියකින් සෑහීමකට නොපැමිණ බුද්ධත්වය ලැබෙනතුරුම වීර්‍ය්‍ය වැඩුවෙමි. එකාන්තයෙන් සමද නහරද ඇටද ඉතිරිවේවා ශරීරයෙහි මස් ලේ වියලේවා, පුරුෂොත්සාහයෙන් පුරුෂ වීර්‍ය්‍යයෙන් පුරුෂ පරාක්‍රමයෙන් යම් ඒ අග්‍රමාර්ගයක් ලැබියයුතු වේද ඊට නොපැමිණ වීර්‍ය්‍යයාගේ නැවැත්මක් නොවන්නේයයි.

මහණෙනි! ඒ මාවිසින් සිවුවග නුවණ හා සර්වඥත නුවණ දැයි කියනලද සම්‍යක් සම්බෝධිය අප්‍රමාදය හේතුකොටගෙණම ලබන ලද්දීය. නිද නිදා පමාව සිටීමෙන් නොලබන ලද්දීය. රහත් ඵලය හා නිවණත් එසේම ලබන ලද්දේය. මහණෙනි! තෙපිත් නොපසුබැස වීර්‍ය්‍යකරව්. ඒකාන්තයෙන් සමද නහරද ඇටද ඉතිරිමේවා ඇගේ මස් ලේ වියලීයේවා, පුරුෂොත්සාහයෙන් යම් අග්‍රඵලයක් ලැබියයුතු නම් ඊට නොපැමිණ වීර්‍ය්‍යයාගේ නැවතීමක් නොවන්නේයයි. මහණෙනි! තෙපිද නොබෝ කලකින්ම යමක් පිණිස කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි වෙත්ද බඹසර කෙළවරකොට ඇති ඒ උතුම් අග්‍රඵලය හා නිවන් සැපත ඉහාත්මයෙහිම තමමේ විශිෂ්ට ඥානයෙන් දැන සාත්කොට ඊට පැමිණ වසන්නහුය. එබැවින් මහණෙනි මෙසේ හික්මියයුතුයි. නොපසුබැසම වීර්‍ය්‍ය වඩන්නෙමු. සම් නහර ඇට පමණක් ඉතිරිවේවා මස් ලේ වියලීයේවා පුරුෂ වීර්‍ය්‍යයෙන් අග්‍රඵලය සහිත

යම් නිර්වාණයක් ලැබියයුතු නම් ඊට නොපැමිණ වීර්‍ය්‍යයාගේ සිටීමක් නොවන්නේය. මහණෙනි! මෙසේ හික්මිය යුතුය. පසුබට නොවී නොනැවතීම වීර්‍ය්‍යකරන්නෙමු. සම් නහර ඇට ඉතිරිවුනත් මස් ලේ සිඳීගියත් පුරුෂෝත්සාහයෙන් යම් ඒ රහත්ඵලය සහිත නිවණක් ලැබියයුතු නම් ඊට නොපැමිණ වීර්‍ය්‍යයාගේ නැවතීමක් නොවන්නේයයි තොප විසින් මෙසේ හික්මිය යුතුයයි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

අප මහබෝසතාණන් වහන්සේ වරක් මහාසුතසෝම නම් රජව උපන්හ. දිනක් නැව් නැගී යන කල්හි නැව ගිලාබැසීමෙන් එතුමාහට මුහුදෙහි වැටෙන්ට සිදුවිය. නැවේ සිටි සෙස්සෝ මුදු බත්වූහ. නමුත් බෝසතාණන් වහන්සේ උත්සාහය අත්නැර පිණන්ට වූහ. මුහුදෙහි වසන මණිමෙඛලා නම් දෙව්දුව ඔහු දැක එම්බා පුරුෂය! මේ එතරක් නොපෙණෙන මුහුදෙහි කෙළවරක් දකින්ට තොපට නොහැකිය. තොපගේ වෙහෙස පමණෙක. මේ මොන මෝඩකමක්දැයි ඇසීය. ධීරෝදාර අදහස් ඇති මහ බෝසතාණෝ දෙව්දුව බලා කුමක් කියන්නෙහිද? සෙසු පුරුෂයෝ කිසි උත්සාහයක් නොකොටම මුහුදුබත් වූහ. නමුත් තොප වැනි දෙව්දුවක් හා මෙසේ කථාකළ හැකිවූයේ මාගේ වීර්‍ය්‍යය නිසාය. මාගේ උත්සාහයට මෙයවත් ප්‍රමාණයයි කීහ. එයින් පැහැදුනු දෙව්දුව බෝසතාණන් තමන්ගේ ආනුභාවයෙන් සිය රටට ගෙණගොස් රාජ්‍යයෙහි පිහිටවූවාය. මෙයින් පෙණීයන්නේ ලෝකයෙහි උත්සාහයෙන් නොකළහැකි දෙයක් නැතය කියාය. අපි කවුරුත් උසස් සැපතක් බලාපොරොත්තු වන්නෝය. දුර්වල සිත් ඇත්තවුන්ට උතුම් සැප ලැබිය නොහැක්කේය. සිත මහත් වනවිට ඊට සුදුසු අදහස්ද පහළවන්නේය. සුමේධ තාපසයන් වහන්සේ විසින් සිතන ලද්දේ මහත් සිතිවිල්ලකි. ලක්‍ෂ කෝටි ගණන් ජනකාව සිටියදී ඒ කිසිවෙකුටවත් එවැනි සිතිවිල්ලක් පහළනූනේය. මෙතරම් විසාල ජනකායක් සසර කතර දුක් විඳියදී මම කෙසේ නම් නිවන්පුර පැමිණෙම්දැයි යනු ඒ උත්තමයාගේ සිතිවිල්ලයි. උන්වහන්සේගේ ඒ ප්‍රඥානුගත වීර්‍ය්‍යය නොතිබුනා නම් අද අපි කවුරුත් මෝහාන්ධකාරයෙහි නිමග්නවූවෝ වම්හ. මහබෝසතුන් තුළ ඇතිවන අදහස් සාර්ථක වෙති. එබැවින් සිතූ වාක් මෙන් එය මුදුන්පත්කර ගන්ටත් උන්වහන්සේට හැකිවිය. ඒ අතරතුර කෙතරම් ගැහැට ඇතිවීදැයි කෙනෙකුට ප්‍රමාණකර කිය නොහැක්කේය. යමෙක් එකම ජලාශයක්වූ සකල චක්‍රවාට ගර්භය තමන්ගේ බාහු බලයෙන් පීනා එතරයන්ට සමත්වේද, ඒ තරම් වීර්‍ය්‍යවත් පුද්ගලයෙකුට පමණක් බුදුබව පැතීමට තරම්

උසස් අදහස් උපදින්නේය. ඉන් මෙහා දුබල සිතැතියන්හට බුදුබව පැතීමෙහි සිත උපන්නේ නමුත් විවරණ ලැබිය නොහැක්කේය. අප මහබෝසත් තෙම සුමෙධ තාපස කාලයෙන් එහාසිටමත් වීර්‍යය පුරුදුකරගෙණ ආ උතුමෙකි. සයුරමැද වැටී සිය මැණියන් කරපිනවාගෙණ පීනීමට තරම් වේගවත් වීර්‍යයක් උන්වහන්සේ තුළ තිබුණේය. තමාගේවත් දිවි ගලවා ගැණීමට නොහැකි අවස්ථාවක මැණියන්වත් රැගෙණ මුහුද තරණය කරන්ට සිතූ ඒ වීරපුරුෂයා කෙතරම් උත්තමයෙක් වියයුතුද? එවක්පටන් දෘඪ සිත් ඇති බෝසතාණෝ සත්අසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි එක්ලක්ෂ විසිපන්දහසක් බුදුවරුන් හමුවෙහි සිතින් පමණක් බුදුබව පැතූහ. ඉනුත් නොනැවතී නවාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි තුන්ලක්ෂ අසූහත්දහක් බුදුවරුන් හමුවෙහි වචනයෙන් බුදුබව පැතූහ. සුමෙධ තාපස කාලය වනවිට මහසත්තෙම සොළසාසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් මුළුල්ලෙහි සිතින් හා වචනයෙනුත් බුදුබවපැතූ උතුමෙක්ව සිටියේය. එබැවින් දීපඞ්කර බුදුරජාණන් වහන්සේගේ කාලයේදී පහසුවෙන්ම උන්වහන්සේට නියතවිවරණ ලැබිය හැකිවිය. මේසාමහත් දීර්ඝකාලය මුළුල්ලෙහි උන්වහන්සේ මුලින් ඇතිකරගත් වීර්‍යාධිෂ්ඨානය දුර්වලකර නොගත්තේය. තමන් විසින් පෙරැම්දහම් පුරණ කාලයෙහි කීර්තිප්‍රශංසාදියට වහල්වීමෙන් හෝ දෙව්මිනිස් දෙගතියෙහි භවභෝගසම්පත් පැතීමෙන් හෝ ස්වකීය චිත්තය තෘෂ්ණාවෙන් කිලිටිකර නොගත්සේක. හැමටම වඩා අධිකලෙස වීර්‍යකළමුත් අන්‍යයෝ කෙසේ නම් මා මෙන් ලෝවැඩ කෙරෙද්දැයි මානයෙන් නො ඉල්පුනසේක කර්මවිපාක නො ඇදහීමෙන් දෘෂ්ටියෙන් මුවහ නොවූසේක. කරුණාවෙන් හා උපාය කෞශල්‍යයයි කියනලද ඥානයෙනුත් උන්වහන්සේ වීර්‍යයේ කෙළවරටම පැමිණිසේක.

එබැවින් පින්වතුනි! තෘෂ්ණාවෙන් හෝ දෘෂ්ටියෙන් හෝ මානයෙන් හෝ සිය සිත කිලිටිකර නොගෙණ වීර්‍යෙන්ද්‍රිය දියුණුකර ගැණීමෙන් ලොව් ලොවුතුරු සැප ලැබීමට උත්සාහවත් වියයුතුයි.

මොරටුවේ මොරටුමුල්ලේ සිරි සුධර්මාරාමාධිපති
මොරටුවේ සිරි ශාසනවංශ මහාස්ථවිර
ස්වාමිපාදයන් වහන්සේ විසින් පවත්වනලද දේශනාව.

---

**නමෝතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

---

# ස ති න්ද්‍රි ය.

---

**තත්ථ කතමං සතින්ද්‍රියං? යා සති, අනුස්සති, පටිස්සති, සති සරණතා, ධාරණතා, අපිලාපනතා, අසම්මුස්සනතා, සති, සතින්ද්‍රියං, සතිබලං, සම්මාසති, ඉදං වුච්චති සතින්ද්‍රියං.**

ගුණැතියෙනි! ආර්‍යවංශ ධර්මපුස්තක මාලාවේ තුන්වන පොතද ලිවීමට ලැබීමේ ප්‍රමෝදය පහල කරමින් බෝධිපාක්ෂික ධර්ම පිළිබඳ පසලොස් වන ධර්මය වන "සතින්ද්‍රිය" පිළිබඳ ඉතාකෙටි විස්තරයක් කිරීමට අදහස් කරමු. සාරමත් මෙම ධර්මයන් පහසුවෙන් වටහා ගැණීම අපහසුවාක් මෙන්ම ඉතාම ලිහිල්කර ප්‍රකාශ කිරීමද අපහසු කාරණයකි. එබැවින් යුතුකමව තිබෙන්නේ මෙම ධර්මයන් අසාබලා තේරුන් ගැණීමට ආසා ඇතියනට, සැදැහැසිත දියුණු කරගැණීමට උපකාරවන ධර්මාවවාදයක් මුලින් කියාදීමයි. එම අවවාදයෙහි පිහිටීමෙන් ධර්මය ගැඹුරු වුවද උගෙණීමෙහි උනන්දුව දුබල නොවී පිහිටා සිටීත්. එනිසා පළමුව ධර්මාවවාදයක් කරන් නෙමු. එය අසා දරා සැදැහැසිත වවාගන්න.

අවවාදය– පින්වතුනි! බුදුරජානන් වහන්සේ ධර්මය බොහෝම හොඳට දේශනාකර තිබේ. කිසිම ඥාණවන්තයෙකුට දෙස් දක්වා කියන්ට බැරි ආකාරයෙන් දේශනාකර තිබීම හොඳට දේශනා කිරීමයයි සැලකිය යුතුයි. එම ධර්මය අසා, සිතෙහි දරා, වෙහෙසී පිළිපදින පින්වතුන්ට මෙම ආත්මභාවයෙහිම ඇස් ඉදිරියේම යහපත සලසා දෙත්. මැරුණාට පසු අනිත් ආත්මවලදී ප්‍රයෝජන ලබාදෙනවා ඇතැයි නොසිතන්න. කල් නොගොස් මෙහිදීම යහපත් විපාක දෙත්. ධර්මය ආශ්‍රය කරමින් සිත දරාගත් පින්වතාට, එම ධර්මයම ලඟට කැඳවා මෙසේ කියයි. පින්වත, ඔබට කථාකරන්නේ මමයි. හෙවත් ධර්මයයි. එන්න ධර්ම නමැති මං බලන්න, මා ප්‍රකාශ කරණ යහපත් අවවාද පිළිගන්න, පිළිගෙණ ඒ අනුව පිළිපදින්න, එසේ කරණ ඔබට, මම සියලු සම්පත් ලඟා

කරදෙමි. මිනිස්සැප සියල්ල දෙමි. දෙව්සැප මුලුල්ලදෙමි, බඹ
සැප සේරම දෙමි, නිවන් සැපද ලබාදෙමි. මෙසේ කල්‍යාණමිත්‍ර
යෙකුසේ ඔබට ධර්මය ලගාවී කියත්. වැලි එකෙක් ඇත, ධර්මය
කියා නොනෙක් නැත. බණ අසා, සිත දරාගෙන, නිදහස් සිතින්
උසස් නුවන යොදා නුවන ඇසඇර ධර්මයදෙස බැලුවාම ඔබව යහ
පතට, සම්පතට, දියුණුවට, උන්නතියට ගෙණයන ධර්ම නමැති
හොඳ මිත්‍රයා ඉදිරියෙහි සිටින බව පෙනෙනවා ඇත. එනිසා ජීවි
තය කෙලවරවනතුරුම ධර්මයෙහි උපකාර සොයන්න, පිහිට
සොයන්න, එසේ සෙවීමෙන් ධර්ම නමැති මිත්‍රයාගේ ඇසුරින් දිව්‍ය,
මනුෂ්‍ය, නිර්වාන යන සැපතුන ලබාගෙන සැනසෙනලෙස ප්‍රථම
අවවාදය කරමු.

"ධම්මං විනානත්ථි නරස්ස අඤ්ඤං" මිනිසාට ආශ්‍රය කිරීමට
එකම ධර්මය විනා දෙවැන්නෙක් නැත ඔබට සියලු සැප ලඟාකර
දෙන්නේද ධර්මයයි. ඒකාන්තයෙන් ඒ සියලු සැපත් සමග ඔබව
ආරක්ෂාකර ගන්නේත් ධර්මයයි. එසේනම් ඔබ බනගැණ නොප
මණ ආලය කරන්ට ඕනෑද, සිහිකරන්න, මෙතැන්සිට අපි බණ
කියමු.

'සතින්ද්‍රිය' මේ අපට පැවරුන මාතෘකාවයි. එය කොටියෙන්
මෙසේ අවබෝධකරගත යුතුයි. තත්ථ කතමං සතින්ද්‍රියං?, සතින්ද්‍රි
යයි කියන්නේ කුමකටද?; (එහි සතින්ද්‍රිය කුමක්ද?) යාසති, යම්
සිහියක්වේද; අනුස්සති, අනුස්සතියක් වේද; (සිහිය අනුව නැවත
නැවත සිතීම) පටිස්සති, පටිස්සතියක් වේද; (හෙවත් ප්‍රකෘතිසිහිය
වෙසෙසා බලාද; සතිසරණතා, සති සරණතාවයක්වේද නැතිනම්
තමාතුල උපන් සිහිය තමහට පිහිටවන ආකාරයෙන් සිහිකරද;
ධාරණතා, සිහිය දරාගණිද, තමහට උපකාරීව පැවති සිහිය නො
හැර දරාගණීද; අපිලාපනතා, තමා උසස් කරවීමට සමත් සිහිය
ඔසවා තබාගණිද, වෙනස්මන්ට ප්‍රථම ගෙණ ඔසවා තබාගණීද,
පාතොකර හරිද; අසම්මුස්සනතා, ඒ උතුම් සිහිය මුසපත් නොක
රද, අමතක නොකරද; සති, යම් උතුම් සිහියක් වේද; සතින්ද්‍රියං,
යම් අධිපති සිහියක් වේද; සතිබලං, සිහිය නමැති යම් බලමහිම
යක් වේද; සම්මාසති, යම්බඳු සම්‍යක් සිහියක් වේද; ඉදං වුච්චති
සතින්ද්‍රියං, මෙලෙසින් ප්‍රකාශවන්නේ සතින්ද්‍රියයි සැලකිය යුතුයි.

මෙහි කැටිවූ (එක්කොටගත්කල) අදහස, සතින්ද්‍රියයි කියන්
නේ සිහියට, නැවත නැවත සිහිකිරීමට, සිහිය සොයාබැලීමට.
තවද, සිහියේ පිහිට සෙවීමට, සිහිය දැරීමට, සිහිය ඔසවා තැබීමට
අමතක නොකරණ සිහියට, සමෘතියට, අධිපති සිහියට, සිහිබල

යම්, යහපත් සිහියට, සතින්ද්‍රියයයි කියනු ලැබෙත්. දැන් සතින්ද්‍රිය කේරුතානේද? මේ සති කියන වචනයට ඉන්ද්‍රිය යන වචනය යෙදුවේ මන්ද?, සතියන්නෙන් උගන්වන්නේ යම් යම්දේ සිතට වැටහෙන බවයි. "උපට්ඨාන ලක්ඛණා සති" යන්නෙන් එය පැහැදිලි කරයි. එම වැටහීම ඉන්ද්‍රභාවයෙන් පරමේසවර භාව යෙන් සිහිවෙත් නම් හෝ සිහිකරත්නම් හෝ සතින්ද්‍රියයයි කියන හැක. මුලුලොවට පරමේසවරවූ බුදුන් වහන්සේ විසින්ම ප්‍රකාශ කල හෙයින්ද සතින්ද්‍රියයයි කියනු ලැබේ. මේ ආදී නොයෙක් අර්ථයෙන් ඉන්ද්‍රත්වයට භාජන බැවින් සතින්ද්‍රියයයි නම් වේ.

සතින්ද්‍රිය පිරිසිදුවන අඞ්ග තුනකි. එනම්- මුට්ඨස්සති පුග්ගල පරිවජ්ජනතො, උපට්ඨිත සතිපුග්ගල සෙවනතා භජනතා පසුරුපාසනතා, සතිපට්ඨානෙ පච්චවෙක්ඛනතා, ඉමෙහි තීහාකාරෙහි සතින්ද්‍රියං විසුජ්ඣති.

1 "මුට්ඨස්සති නී නට්ඨසතිකෙ" මෙහි මුඨස්සති යන්නෙන්, සිහිය නැතියන් පවසත්, අන්ධබාල පුථුජ්ජනයා සෙවනය කිරි මෙන් සසර බිය දක්නාවූ නියම සිහිය එලවා සසරදුකින් නිවීමම උත්සාහ කරන්නාවූ පින්වතාහට සවකීය නියම හොඳ පිරිසිදු ශ්‍රෙෂ්ඨ සිහිය නිසිමග හසුරුවා ගැණීමට නොයෙකුත් බාධා පැමිණෙත්. එනිසාම ලොවී ලොවුතුරු සැප සියල්ලටම බාධා සිදුවෙත් මන්ද? අන්ධබාලයා තමා සේවනය කරන්නන් නිතර ගෙණයැමට උත්සාහ කරන්නේ නොනිසිමගෙහිම බැවිනි. ඉන් ඔහු ඇසුරු කරන්නන්හට පිරිහීමක්ම සිදුවේ. නියම සිහියෙන් තොර අසත් ජනයන්ගේ ඇසුරින් මෙලොව ලෞකික සියලු සැපතින් පිරිහෙන බැවි අප අපේ ඇස්වලටම නොයෙක්විට දක්මට ලැබේ. එය එසේ නම්, ලොවුතුරු සැපතින් පිරිහෙනවායයි කීම සත්‍යතම නොවේද? එබැවින් සතින්ද්‍රිය ආදී උසස්ධර්මයන්ගේ විසුද්ධිය බලාපොරොත්තු වන්නන් විසින් නටුවාවූ සිහි ඇතියන්ගේ ඇසුර දුරලා ඔවුන් ගෙන් ප්‍රවේසම්විය යුතුයි. එපමණක්ද නොව තමන් මෙලොව වැඩිදියුණුවන රිසියෙන් කටයුතු කිරීමට යම්දිනක් පටන්ගත්තා නම්, එදිනම අධිෂ්ඨාන කරගත යුත්තේ සිහිනුවනින් තොර අධම යන් තමන්ගේ ආශ්‍රයට නොගැණීමටයි. බෝධිසත්වයන් වහන්සේ ලාටද සසර සැරිසරණ අවස්ථාවන්හිදී අසත්පුරුෂ ආශ්‍රයෙන් මහත් කරදර ආදියට මූනපාන්ටවී තිබේ. බුදු, පසේබුදු රහතුන් වහන්සේලාට පවා අසත්පුරුෂයන් ගෙන් පීඩා පැමිණි තිබෙන බව පොතපතින් මොනවට ඔප්පුවේ. එබැවින් දෙලොව දියුණුව පතා කටයුතු කරණ කිසිම පින්වතෙක් සිහිනුවනින් පිරිහුන,

නොමගයන, මත්පැන් බොන, සූදු ක්‍රීඩාකරණ, කාමුකව හැසි රෙන, කිසිම අසත්පුරුෂයෙක් ආශ්‍රය නොකිරීමට සම්පූර්ණයෙන්ම සිත තබාගත යුතුයි.

2 උපට්ඨිත සති පුග්ගල සෙවනතා භජනතා පයිරුපාසනතා- එළඹසිටි සිහිඇති පුද්ගලයන් සේවනය කිරීම, භජනය කිරීම, පයුරුපාසනය කිරීම, සතින්ද්‍රිය පිරිසිදුවීමට දෙවෙනි උපායයි. මෙහි එළඹසිටි සිහි ඇති පුද්ගලයන් ලෙස නියම වශයෙන් ගැණෙන්නේ බුද්ධාදී සත්පුරුෂයෝයි. ඊට අනුරූපව ක්‍රියාකරණ සියලුම නැනවතුන්ගේ ඇසුරද සුදුසුයයි කියමු. මාගීඵලාවබොධය බලාපොරොත්තුවෙන් පිපාසිතව ප්‍රධන්වීයෂී කරමින් සතිය ඉන්ද්‍රත්‍වයට පරමේසවරත්‍වයට නන්වා යුහුසුලුව ක්‍රියාකරන්නෙකුට එම පිපාසය සංසිඳුවා ගැණීමට ආශ්‍රය කළයුත්තේ එබඳුම නුවනින් වැඩිගිය සතින්ද්‍රිය අසා දරු පිළිපන් කෙනෙක්මය. යොගියෙක්මය. ඒ උතුමන්ගේ ආශ්‍රයත් ඉතා කිට්ටු ලෑදි ආශ්‍රයක්, සියලු ඉරියව්වක් සියලු සංකල්පනාවක් නොහැර ඇගැලිව ඇසුරක් අවශ්‍යමය. මන්ද? ඉන් තමන්තුලවන් පිපාසය සංසිඳුවා ගැණීමට සෑම අයුරකින්ම උපකාරවන බැවිනි, සාක්‍ෂිකවන බැවිනි. හේ එසේවේවා.

මෙලොව වශයෙනුදු අපි සිතා බලමු. යම්කිසි පින්වතෙක් තමන්ගේ වැඩිදියුණුවක් බලාපොරොත්තු වෙමින් ඊට කය, සිත, වචනය යොදා කටයුතුකරණාතර මිල මුදලටත් වඩා තම ක්‍රියාකලාපයටත් වඩා එය දියුණුභාවයට ගෙණයෑමට උපකාරවන්නෝ තමන් ඇසුරට ගත් මිත්‍රයා හෝ මිත්‍රයන් හිතවත් භාවයෙන් කරණ කියන යහපත් අනුශාසනා ආදියයි. යහපත් අදහස් අනුව පිටකරණ සියලු වචනයක්ම ක්‍රියාවක්ම තම අදහස් මුදුන්පමුණුවා, ගැණීමට ඉක්මනින් හැකිවෙත්. එසේ මෙලොව අභිවෘධියට යහපත් මිත්‍රයන්ගේ ඇසුර උපකාරීවන්නාසේම පරලොව වැඩ පිණිසත් ලොවුතුරු දහම් අවබොධකර ගැණීම පිණිසත් කල්‍යාණ මිත්‍රයන් එළඹසිටි සිහිනුවන ඇත්තවුන්ගේ ඇසුර සාකල්‍යයෙන් ම පිහිට පිණිස පවතිත්. එබැවින් දෙලොම වැඩිදියුණුවට හිත ඇති සෑමදෙනෙක්ම එළඹසිටි සිහි ඇති යහපත් මිත්‍රයන්ගේ ආශ්‍රය භජනය පයුරුපාසනය ලබාගත යුතුයි.

3 සතිපට්ඨාන පච්චවෙක්ඛනතා, සතිපට්ඨානනි, සතිපට්ඨානාධිකාරණ සූත්‍රාන්තන, සතිපට්ඨාන ධර්මයන් ප්‍රත්‍යවෙක්‍ෂා කිරීමද, සතින්ද්‍රිය පිරිසිදුවීමට පිළිපැදියයුතු තුන්වන කාරණයයි. මෙහිදී සතිපට්ඨානයයි කීවේ සතිපට්ඨාන සූත්‍රයට පමණක් නොව

ත්‍රිපිටක බුද්ධවචනයෙහි සතිය පිහිටුවා ගැනීමට දීතිබෙන අවවාද ඇතුළත්කොට දෙශනා කරණලද සියලු සූත්‍ර ධර්මයන් පිළිබඳව බව සැලකිය යුතුයි. මෙලෙසින් සතිය ඉන්ද්‍රභාවයට පිරිසිදු භාවයට පමුණුවන කරුණු තුනක් ඇතිබව සැලකිය යුතුයි.

මිලඟට සතින්ද්‍රිය වැඩෙනා ක්‍රමදෙක පවසමු. පමාදං පජහනෙතා සතින්ද්‍රියං භාවෙති, සතින්ද්‍රියං භාවෙන්තො පමාදං පජහති, ඉමෙහි ද්විහාකාරෙහි සතින්ද්‍රියං භාවියති, ඉමෙහි ද්විහාකාරෙහි සතින්ද්‍රියෙ භාවනා හොති- යනුවෙන් ප්‍රමාදභාවය අතහැර අප්‍රමාදව ක්‍රියාකිරීමෙන් සතින්ද්‍රිය වැඩේ. සමෘතෙන්ද්‍රිය වඩත් වඩත්ම ප්‍රමාදය අතහැරීයෙති. මේ ක්‍රම දෙකින් සතින්ද්‍රිය වැඩියෙයි. මේ ආකාර දෙකින්ම සතින්ද්‍රිය පිළිබඳ භාවනාවද සමෘද්ධවෙයි.

මෙහිදී අප්‍රමාදය, සතින්ද්‍රිය වැඩීමත් සතින්ද්‍රිය වැඩීමෙන් ප්‍රමාදය වැනසීයන බවත් පැවසේ. සමෘතිය- සිහිය ඉන්ද්‍රත්වයට නගාගැන්මට නොහැකිවීමෙන් ප්‍රමාදවූ පසුබැස්සාවූ චූලපන්ථක තෙරුන්හට ප්‍රමාදය අතහැර සතියෙහි ඉන්ද්‍රත්වය ලබාගැනීමට බුදුරදුන් මෙසේ දෙසූසේක.

**උට්ඨානෙනප්පමාදෙන සඤ්ඤමෙන දමෙන ච**
**දීපං කයිරාථ මෙධාවී යං ඔඝො නාභිකීරති.**

මෙහි අදහස- වීර්‍ය්‍ය සංඛ්‍යාතවූ නැගීසිටීම, අප්‍රමාදය, සීලසංයමය, ඉන්ද්‍රිය දමනය යන සතර ධර්මයන්ගෙන් යුත් සතිවිතල භාවයට නොවත් යොගියා, සතර ඔඝයන් තරණය කරමින් ඉන්ද්‍රත්වයට, ශ්‍රෙෂ්ඨත්වයට, රහත්ඵලය නමැති ප්‍රදීප දල්වා ඒකාලෝකකිරීමට පැමිණෙත්. එම අභීත්වය කාමෞඝාදීයෙන් විසුරුවාලිය නොහැකිවෙත් යනුයි. මින් අප්‍රමාදයෙහි අනුසස් පැවසේ.

"අප්පමත්තොහි ඣායන්තො පප්පොති විපුලං සුඛං" යන තන්හි අප්පමත්තොහීති, උපට්ඨිත සතිතායහි අප්පමත්තොහි -පෙ- යනුවෙන් එළඹසිටි නැගිටසිටි සිහිය ඇතිබැවින්ම සතිය ඉන්ද්‍රත්වයට පත් බැවින්ම අප්‍රමාදවූ පුද්ගලයා සියලු කෙලෙස් දවා මහත්වූ උළාරවූ නිර්වාණ සැපයට පැමිණෙතියි වදාළසේක. මෙහි නුදු අප්‍රමාදය සතියේ ඉන්ද්‍රත්වය වඩනබවද- සතින්ද්‍රිය, අප්‍රමාදය වඩනබවද ප්‍රකාශවේ. වැඩිදුරටත් අප්‍රමාදයෙහි වටිනාකම දැන ගැනීමට ධම්මපදයෙහි අප්‍රමාද වර්ගය බලා දතයුතුයි. වැලිදු පමාදස්ස පහීනත්තා සුප්පහීනත්තා සතින්ද්‍රියං භාවිතං හොති සුභාවිතං- සතින්ද්‍රියස්ස භාවිතත්තා සුභාවිතත්තා පමාදො පහීනො හොති සුප්පහීනො ඉමෙහි ද්විහාකාරෙහි සතින්ද්‍රියං භාවි

තං හොති සුභාවිතං– මින් උගන්වන්නේ ප්‍රමාදයාගේ සම්පූර්ණ ප්‍රහාණයයි. බිඳකුදු නොතබා විනාශ කිරීමයි. ප්‍රමාදය සමූලඝාතනය කරණලද කල්හිම සතින්ද්‍රිය වැඩේ. මොනවට වැඩේ. සතින්ද්‍රිය වැඩුම්ාය. මොනවට වර්ධනය කලායයි සැලකියයුත්තේ ප්‍රමාදය නැවත ඇති නොවනා පරිදි වනසාලූ කල්හි යි. මොනවට වනසාලූ කල්හියි, ප්‍රමාදය පිළිබඳව මෙම දෙවෙනි වාරයෙහිදී සැලකියයුතුවන්නේ සතින්ද්‍රිය වැඩීමට අත්‍යන්තයෙන්ම (නීතරම) බාධාකර ධර්මය ප්‍රමාදය බවයි. පමණෙනා ගරහිතො සදා යන්නෙන් එය පැහැදිළිවේ. ප්‍රමාදවනසුලු තැනැත්තා නිතරම ගරිහාවට භාජනවෙත් යනු එහි අදහසයි. එබඳු ගර්හිත ප්‍රමාදය යමෙකුගේ සිත්තුල බිඳකුදු ඇත්නම් ඔහට සතින්ද්‍රිය වැනි බොධිපාක්ෂික ධර්මයක් නොව ඉතා සවල්ප කරුණකුදු සාධාගැණීමට දුෂ්කර වෙත්. උසස් ධර්මාවබොධ ගැණ කියනුම් කවරේද? ප්‍රමාද පුගුලා සදා ගර්හිතයෙකි.

දැන් අපි මෙතෙක් ප්‍රකාශකලේ පඤ්චන්ද්‍රියන් අතරින් සතින්ද්‍රිය වෙන්කර එම සතින්ද්‍රිය වර්ධා ගැනීමේ ක්‍රමයි. අනතුරුව අපට ප්‍රකාශකරන්ට වීතිබෙන්නේ පඤ්චන්ද්‍රියයන් එක්ව භාවිතා වන ක්‍රමයකි. එය මෙසේ සිත්වලව ගතයුතුයි.

"කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවීයන්ති? කතිහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවිතානි චෙව හොන්ති සුභාවිතානි ච පටිපස්සද්ධානි ච සුපටිපස්සද්ධානි ච? චතූහාකාරෙහි පඤ්චින්ද්‍රියානි භාවීයන්ති" –පෙ– ආකාරවිධි කීයකින් පස්ඉන්ද්‍රියන් වැඩීයෙත්ද? කී අයුරකින් පස්ඉඳුරන් වැඩෙත්ද? මොනවට වැඩෙත්ද? සැහැල්ලුවෙත්ද? මොනවට කෙලෙස්බර ඔසවා තබා වෙසෙත්ද? හේසතරකාරයකිනි. එම සතරකාරය මෙසේයි.

1 සොතාපත්ති මාර්ගයට වන් ක්ෂණයෙහි පස්ඉඳුරන් වැඩෙන්නටවේ. සොතාපත්තිඵල ක්ෂණයෙහි පස් ඉන්ද්‍රියයන් වැඩුනීවේ, මොනවට වැඩුනීදවේ, සැහැල්ලුවූවාද වේ, මනාකොට කෙලෙස්බරින් වෙන්වී සැහැල්ලු වූවාදවේ.

2 සකෘදාගාමි මාර්ගයටවන් ක්ෂණයෙහි සඩා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන පස් ඉඳුරන් කෙලෙස් කසටින් බේරී වැඩෙන්නීවේ. සකෘදාගාමි ඵලාවස්ථාවෙහිදී පසිඳුරන් වැඩුනීද වේ, මොනවට වැඩුනීදවේ, සැහැල්ලුදවේ, කෙලෙසුන් කෙරෙන් වෙන්ව මොනවට සැහැල්ලුවූවාද වේ.

3 අනාගාමි මාර්ගයටවන් ක්ෂණයෙහි, පඤ්චන්ද්‍රියන් වැඩෙන්නීවේ, අනාගාමි ඵලක්ෂණයෙහි පස්ඉන්ද්‍රියන් වැඩුනීවේ, මොනවට වැඩුනීවේ, සැහැල්ලුදවේ, මොනවට සැහැල්ලුදවේ.

4 අරහත්තමාර්ගාවස්ථාවෙහි පඤ්චෙන්ද්‍රියන් වැඩෙන්නීවේ, අරහත්ත ඵලාවස්ථාවට පැමිණි කල්හි පස්වැදෑරුම් ඉන්ද්‍රියන් වැඩී ගියේ වේ, හොඳකාර වැඩීගියේ වේ, කෙලෙසුන් කෙරෙන් දුරුව සැහැල්වූයේද වේ, සම්පූර්ණ සංසිඳී මොනවට සැහැල්ලුවූයේදවේ.

මෙසේ පඤ්චෙන්ද්‍රියන් පිළිබඳව මාර්ගවිසුද්ධි සතරෙක, ඵලවිසුද්ධි සතරෙක, සමුච්ඡේද විසුද්ධි සතරෙක, පටිප්පස්සද්ධි විසුද්ධි සතරෙකැයි භාවිතාදීක්‍රම චතුෂ්කය දතයුතුයි.

කතීනං පුග්ගලානං ඉන්ද්‍රියභාවනා? කති පුග්ගලා භාවිතින්ද්‍රියා? අට්ඨන්නං පුග්ගලානං ඉන්ද්‍රිය භාවනා, තයො පුග්ගලා භාවිතින්ද්‍රියා- පුද්ගලයෝ කීදෙනෙක්, ශ්‍රද්ධෙන්ද්‍රිය ආදී පඤ්චඉන්ද්‍රියන් වඩාද? අටදෙනෙකි. පුද්ගලයෝ කීදෙනෙක් පඤ්චෙන්ද්‍රියන් වඩා නිමකරණ ලද්දෝද? තිදෙනෙකි. පසිඳුරන් වඩන පුද්ගලයන් අටදෙනා කවුද? සෝවාන් මාර්ගයටවත් තැනැත්තාය 1, සෝවාන් ඵලයට වත් තැනැත්තාය 2, සකෘදාගාමි මාර්ගයට පැමිණි තැනැත්තාය 3, සකෘදාගාමි ඵලයට පැමිණි තැනැත්තාය 4, අනාගාමි මාර්ගයට පැමිණි තැනැත්තාය 5, අනාගාමි ඵලයට පැමිණි තැනැත්තාය 6, අර්හත් මාර්ගයට පැමිණි තැනැත්තාය 7, කල්‍යාණ පෘථග්ජනයාය 8, යන අටදෙනායි. පසිඳුරන් වඩා අවසන් කල පුද්ගලයන් තිදෙනා නම්, ලොව්තුරා භාග්‍යවතුන් වහන්සේ කෙනෙකුගෙන් අසා දැන භාවිතාකරණලද ඉන්ද්‍රියන් ඇති රහතුන් වහන්සේය 1, තමන් වහන්සේම දැන දැන අවබොධ කරගත් හෙයින් පසේබුදුන් වහන්සේය 2, අනන්ත ගුණ සමූහයෙන් සම්පූර්ණවූ, තථාගත අරහං සම්මා සම්බුදුන් වහන්සේයයි 3, භාවිතින්ද්‍රිය පුද්ගලයන් තිදෙනෙකි. මෙසේ පසිඳුරන් වඩන පුද්ගලයෝ අටදෙනෙක්යයිද වඩා අවසන්කල පුද්ගලයෝ තිදෙනෙක් යයිද දැනගත යුතුයි.

පඤ්චෙන්ද්‍රියයන්ගේ අගය- යෙ හි කෙචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා ඉමෙසං පඤ්චන්නං ඉන්ද්‍රියානං, සමුදයඤ්ච. අත්ථඞ්ගමංච අස්සාදංච ආදීනවංච නිස්සරණංච යථාභූතං නප්පජානන්ති, නමෙ තෙ භික්ඛවෙ සමණාවා බ්‍රාහ්මණාවා. සමණෙසුචෙව සමණ සම්මතා, බ්‍රාහ්මණෙසු ච බ්‍රාහ්මණ සම්මතා නච පන තෙ ආයස්මන්තො සාමඤ්ඤත්ථං වා බ්‍රාහ්මඤ්ඤත්ථං වා දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරන්ති. -පෙ-

මහණෙනි, සද්ධා, විරිය, සති, සමාධි පඤ්ඤා යන පඤ්චින්ද්‍රියන් පිළිබඳව යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ හටගැනීමද, නැතිවීමද, විඳීමද, දෝෂයද, නිදහස්වීමද තත්වාකාරයෙන්

නොදනිත් නම් ඔහු ශ්‍රමණයෙක්ද නොවේ, බ්‍රාහමණයෙක්ද නොවේ. ශ්‍රමණයන් වහන්සේලා ශ්‍රමණයෙක්යයි සම්මතකරගත් කෙනෙක්ද නොවේ බ්‍රාහමණයන් වහන්සේලා බ්‍රාහමණයෙක්යයි සම්මත කරගත් කෙනෙක්ද නොවේ.

යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහමණයෙක් මෙකී සඬාදී පඤ්චින්ද්‍රියන් පිළිබඳව හටගැණීමද, නැතිවීමද, විඳීමද, දෝෂයද, නිදහස් වීමද, තත්‍වාකාරයෙන් දනිත් නම්, ඔහු ශ්‍රමණයෙකි, ඔහු බ්‍රාහමණයෙකි. ශ්‍රමණයන් වහන්සේලා ශ්‍රමණයකැයි සම්මතකරගත් කෙනෙකි. බ්‍රාහමණයන් වහන්සේලා බ්‍රාහමණයකැයි සම්මත කරගත් කෙනෙකි.

(මෙහි ශ්‍රමණයෝ නම් "සමිතපාපත්තා සමනා" යනුවෙන් පව් සංසිඳවූවාය යන අදහසින් ශ්‍රමණ නම් වෙයි. බ්‍රාහමනයෝ නම්– "බාහිත පාපත්තා බ්‍රාහමනා" පව් බහාතැබූවාය යන අදහසින් බ්‍රාහමණ නම් වෙයි.)

මිලඟට තේරුන් ගතයුත්තේ මේ පඤ්චේන්ද්‍රියයන්ගේ සමුදය, අත්ථඞ්ගමය, අස්සාදය, ආදීනවය, නිස්සරණය යන කාරුණු පස පිළිබඳවයි. එය පටිසම්භිදා මාර්ගයෙහි මෙසේ ප්‍රකාශවෙත්.

කී ආකාරයකින් පඤ්චේන්ද්‍රියයන්ගේ
සමුදය (හටගැණීම) වේද? සතලිස් ආකාරයකිනි
කී ආකාරයකින් පඤ්චේන්ද්‍රියයන්ගේ
සමුදය දැනගත හැකිද? සතලිස් ආකාරයකිනි
කී ආකාරයකින් පඤ්චේන්ද්‍රියයන්ගේ
අත්ථඞ්ගමය (නැතිවීම) වේද? සතලිස් ආකාරයකිනි
කී ආකාරයකින් පඤ්චේන්ද්‍රියයන්ගේ
අත්ථඞ්ගමය දැනගතහැකිද? සතලිස් ආකාරයකිනි
කී ආකාරයකින් පඤ්චේන්ද්‍රියයන්ගේ
ආස්වාදය (විඳගැනීම) වේද? විසිපස් ආකාරයකිනි
කී ආකාරයකින් පඤ්චේන්ද්‍රියයන්ගේ
ආස්වාදය දැනගතහැකිද? විසිපස් ආකාරයකිනි
කී ආකාරයකින් පඤ්චේන්ද්‍රියයන්ගේ
ආදීනවය (දෝෂය) වේද? විසිපස්ආකාරයකිනි
කී ආකාරයකින් පඤ්චේන්ද්‍රියයන්ගේ
ආදීනවය දැනගතහැකිද? විසිපස් ආකාරයකිනි
කී ආකාරයකින් පඤ්චේන්ද්‍රියයන්ගේ
නිඃසරණය (පිහිට) වේද? එකසිය අසූ අයුරකිනි
කී ආකාරයකින් පඤ්චේන්ද්‍රියයන්ගේ
නිඃසරණය දතහැකිද? එකසිය අසූ අයුරකිනි

හේ මෙමෙය්‍යී! පඤ්චවින්ද්‍රියන්ගේ හටගැනීම සතලිස් ආකාරයකි. එනම්! අධිමොක්ඛට්ඨාය ආවජ්ජනාය සමුදයො සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති 1, අධිමොක්ඛවසෙන ඡන්දස්ස සමුදයො සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති 2, අධිමොක්ඛවසෙන මනසිකාරස්ස සමුදයො සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති 3, සද්ධින්ද්‍රියස්ස වසෙන එකත්තුපට්ඨානං සද්ධින්ද්‍රියස්ස සමුදයො හොති 4.

පග්ගහට්ඨාය ආවජ්ජනාය සමුදයො විරියින්ද්‍රියස්ස
සමුදයො හොති -පෙ- 1, 2, 3, 4,
උපට්ඨානට්ඨාය ආවජ්ජනාය සමුදයො සතින්ද්‍රියස්ස
සමුදයොහොති -පෙ- 1, 2, 3, 4,
අවික්ඛෙපට්ඨාය ආවජ්ජනාය සමුදයො සමාධින්ද්‍රියස්ස
සමුදයොහොති -පෙ- 1, 2, 3, 4,
අස්සාදට්ඨාය ආවජ්ජනාය සමුදයො පඤ්ඤින්ද්‍රියස්ස
සමුදයොහොති -පෙ- 1, 2, 3, 4,

මෙසේ විස්සකි, මේ විසිආකාර ඉන්ද්‍රියන්ගේ හටගැනීමට කීවචනවල අදහස් පළමුකොට තේරුන්ගත යුතුයි. එහි "අධිමොක්ඛ" නම් ස්ථිර අධිෂ්ඨානයෙන්යුත් සිතයි. ආවජ්ජන නම්, නොයෙක් ක්‍රමවලින් සිතීමයි. සමුදය නම් හටගැනීමයි.

අධිෂ්ඨානය තහවුරු (ස්ථිර) කරගැනීමට කල්පනාව යෙදවීම 1, ඉටුම් (සිතුම්) ස්ථිරකරගැනීමට සඣ්ඣයන්ගේ හටගැනීම් ආදිය සිතීම 2, අධිෂ්ඨාන ස්ථිරකර ගැනීමට මෙනෙහි කිරීම 3, උතුම් ශ්‍රද්ධාව සේවනය කිරීම වශයෙන් ඒකාන්ත වැටහීම 4 යන සතර සද්ධින්ද්‍රිය හටගැනීම සිදුකරත්.

පග්ගහට්ඨ වසයෙන් සතරකි, (පග්ගහ නම් උත්සාහයයි, නැති නම් උපකාරයයි.) එනම්- උත්සාහය තහවුරුකර ගැනීමට කල්පනාව යෙදීම 1, උත්සාහය ස්ථිරකර ගැනීමට සඣ්ඣයන්ගේ හටගැනීම් ආදිය සිතීම 2, උත්සාහය ස්ථිරකර ගැනීමට මෙනෙහි කිරීම 3, දැඩි වියර්ය සේවනය කිරීම් වශයෙන් ඒකාන්ත වැටහීම 4 යන සතර විරියින්ද්‍රිය හටගැනීම සිදුකරත්.

උපට්ඨාන වශයෙන් සතරකි- (උපට්ඨාන නම්, වැටහීම- නැති නම් මෙනෙහිකිරීම) එනම් වැටහීම තහවුරු කරගැනීමට කල්පනාව යෙදීම 1, වැටහීම ස්ථිරකර ගැනීමට සඣ්ඣයන්ගේ හටගැනීම් ආදිය සිතීම 2, වැටහීම් තහවුරු කරගැනීමට මෙනෙහි කිරීම 3, දැඩි සිහිය සේවනය කිරීම් වශයෙන් ඒකාන්ත වැටහීම 4 යන සතර සතින්ද්‍රිය හටගැනීම් සිදුකරත්.

අවික්ඛෙපත්‍ථ වශයෙන් සතරකි. (අවික්ඛෙප නම්, චංචල නොවීම්, සිත අවුල්කර නොගැණීම) අවික්ෂෙපය තහවුරුකර ගැණීමට කල්පනාව යෙදීම, අවික්ෂෙපය සපිරකර ගැණීමට සකන්‍ධ යන් පිළිබඳ සිතීම 2, අවික්ෂෙපය සපිරකර ගැණීමට මෙනෙහි කිරීම 3, දුකි සමාධිය සෙවීම් වශයෙන් එකාග්‍රතා වැටහීම් 4 යන සතර සමාධින්ද්‍රිය හටගැණීම සිදුකරත්.

අස්සාද වශයෙන් සතරකි (අස්සාද නම්, රසවිඳීමයි. තෘප්ති යට පැමිණීමයි.) ආස්වාදය තහවුරු කරගැණීමට කල්පනාව යෙදීම 1, අවික්ෂෙපය සපිරකරගැණීමට සකන්‍ධයන් පිළිබඳ සිතීම2, අවික්ෂෙපය සපිරකරගැණීමට මෙනෙහි කිරීම 3, දුකි ප්‍රඥාව සෙවීම් වශයෙන් එකාග්‍රතා වැටහීම 4 යන සතර සමාධින්ද්‍රිය හටගැණීම සිදුකරත් යන ආකාර විස්සද,

අධිමොක්ඛ, පග්ගහ, උපට්ඨාන, අවික්ඛෙප, අස්සාද යන පඤ්ච ප්‍රඥාවන්ද්‍රියන් පිළිබඳව ආවජ්ජන, ඛන්ධ, මනසිකාර, එකත්තු පට්ඨාන යන සතරාකාරයෙන් වැඩූනකල්හි විස්සක්දුයි මේ සතලිස් ආකාරයෙන් පඤ්චවන්ද්‍රියයන්ගේ සමුදයද, සමුදය දූතගැණීමද වෙත්. කවර නම් සතලිස් ආකාරයකින් පසිදුරන්ගේ අත්‍ථඞ්ගමය වේද, මෙකී සතලිස්ආකාර සමුදය ධර්මයන්ම, අත්‍ථඞ්ගමය වශයෙන්- (නැතිවීම් වශයෙන්) සලකා ගැණීමෙන් පසිදුරන් පිළිබඳ අත්‍ථඞ්ගමයද, අත්‍ථඞ්ගමය දූතගැණීමද වෙත්.

කී ආකාරයකින් පඤ්චවන්ද්‍රියන්ගේ රසවිඳ ගැණීම (ආස්වාදය) වේද, විසිපස් (25) ආකාරයකිනි. කී අයුරකින් දූතගැණීමට හැකිවේද, විසිපස් අයුරකිණි. යේ මෙසේ යි.

සමාදස්ස අනුපට්ඨානං, සතින්ද්‍රියස්ස අස්සාදො හොති 1, සමාද පටිලාභස්ස අනුපට්ඨානං සතින්ද්‍රියස්ස අස්සාදො හොති2 උපට්ඨාන චරියාය වෙසාරජ්ජං සතින්ද්‍රියස්ස අස්සාදොහොති 3, සන්තො ච විහාරාධිගමො සතින්ද්‍රියස්ස අස්සාදො හොති 4, යං සතින්ද්‍රියං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං සතින්ද්‍රියස්ස අස්සාදො 5 ආදිවශයෙන්.

"සමාදස්ස -පෙ- හොති" යනුවෙන් නොසන්සුන් සිත් ඇති, පුද්ගලයන් සෙවනය නොකිරීමෙන්, සන්සුන් සිත් ඇතියන් සෙවීමෙන්, සන්සුන් භාවයට හිත සූත්‍රධර්ම ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් එහි නුවණින් නිතර සලකාබැලීමෙන්, බහුල වශයෙන් කල්පනා කිරීමෙන් පුරුදු කිරීමෙන් නොසන්සුන්බව නොවැටහී සන්සුන් භාවය දියුණුවෙත් 1.

'සමාද -පෙ- හොති' යනුවෙන් නොසන්සුන් (කලබල) සිත් ඇති පුද්ගලයන්ට සමාධිකථාව කරණකොට, සිතට දුකත් සොම්නසත් උපදියි. මෙසේ නමහට තුරුස්නා බැවින් සිතතුල පරිලාහයක් උපදියි. එසේම, සමාධිකථාව ශ්‍රවනය කිරීමෙන් ඊට රුචි පුද්ගලයා පරිලාහය දුරුකොට සතින්ද්‍රිය පිළිබඳ ආස්වාදය (රසවිඳීම) ලබාගණියි- 2.

"උපඨාන -පෙ- හොති" යනුවෙන්, වැටහීම් වස්තු වශයෙන් හෝ භාවනා වශයෙන් හෝ වසඟාව පැමිණියාහට, වැටහීම සවභාවකොට විශාරද භාවයක් වේද එයද සතින්ද්‍රියයාගේ රස විඳීමවේ, 3.

"සනතා ච -පෙ-" යනුවෙන් සමථ විදර්ශනාවන්ට පැමිණිමද සතින්ද්‍රියයාගේ රසවිඳීම වේ. 4.

"යං සතින්ද්‍රියං -පෙ- යනුවෙන්" යම්කිසි සතින්ද්‍රියක් නිසා යම්කිසි කායික සැපයක් ලැබේමය. ඒ සැප සොම්නස් ප්‍රධාන රසවිඳ ගැන්මක් ඇත්නම් එයද සතින්ද්‍රිය පිළිබඳව රසවිඳීම වේ5. මෙහි සතින්ද්‍රිය පිළිබඳව ඇතිවන ආස්වාද පසමෙන්ම, සද්ධා, විරිය, සමාධි, පඤ්ඤ යන ඉඳුරන් පිළිබඳවද රසවිඳීමවේ. එලෙසින් බැලූවිට විසිපස්ආකාර ආස්වාදයවේ. විසිපස් ආකාර ආස්වාදය දත හැකිවේ.

කතමෙහි පඤ්චවීසතියා කාරෙහි -පෙ- පමාදස්ස උපට්ඨානං සතින්ද්‍රියස්ස ආදීනවො හොති 1, පමාද පරිළාහස්ස උපඨානං සතින්ද්‍රියස්ස ආදීනවො හොති 2, අනිච්චටෙඨන සතින්ද්‍රියස්ස ආදීනවො හොති 3, දුක්ඛටෙඨන සතින්ද්‍රියස්ස ආදීනවො හොති 4, අනත්තටෙඨන සතින්ද්‍රියස්ස ආදීනවො හොති 5 යනුවෙන්, ප්‍රමාදයට වැටහීම සතිඉන්ද්‍රියගේ ආදීනවය දතුයේවේ 1, පමාද දැහය වැටහීම සතිඉන්ද්‍රියගේ ආදීනවය දැන ගත්තේවේ 2, අනිත්‍ය වශයෙන් මෙනෙහි කිරීමෙන්ද 3, දුක් වශයෙන් මෙනෙහි කිරීමෙන්ද 4, අනාත්ම වශයෙන් මෙනෙහි කිරීමෙන්ද5 සමාතින්ද්‍රියගේ ආදීනවය දත්තේවේ. මෙසේ පසිඳුරන් පිළිබඳව පස් පස් ආකාර ආදීනවයන් සැලකීමෙන් විසිපස්ආකාර ආදීනවය දතහැකිවේ.

මේ සමුදයාදීන්හි- සමුදය සතළිසද, අත්ථඞ්ගම සතලිසද, අස්සාද විසිපසද, අත්ථඞ්ගම විසිපසද, ලෞකික ඉන්ද්‍රියයයි දතයුතුයි.

කතමෙහි අසීති සත, ආකාරෙහි පඤ්චින්ද්‍රියානං නිස්සරණං හොති? කතමෙහි -පෙ- පජානාති? -පෙ- උපට්ඨානට්ඨෙන සතින්ද්‍රියං පමාද නිස්සටං හොති, පමාද පරිළාහා නිස්සටං හොති, තදනුවත්තක කිලෙසෙහි ච ඛන්ධෙහි ච නිස්සටං හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි නිස්සටං හොති, තතො පණීතතර සතින්ද්‍රියස්ස පටිලාභා පුරිමතර සතින්ද්‍රියා නිස්සටං හොති. -පෙ-

කවර නම් එකාසිය අසූ ආකාරයකින් පඤ්චෙන්ද්‍රියයන්ගේ නිස්සරණය වේද-පෙ-නිස්සරණය දැනගණීද? අධිමොක්ඛ, පග්ගහ උපට්ඨාන, අවික්ඛෙප, අස්සාද යන පස්ආකාරයෙන් සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා, යන පස් ඉන්ද්‍රියන් පසපස එක්කලව්ව මාර්ග ඵල වශයෙන් නිස්සරණ විසිපහක්ද,

ප්‍රථමධ්‍යාන, ද්විතීයධ්‍යාන, තෘතීයධ්‍යාන, චතුර්ථධ්‍යාන, ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන යන අෂ්ට සමාපත්ති වශයෙන් නිස්සරණ අටක්ද.

අනිච්චානුපස්සනා- දුක්ඛානු- අනත්තානු- නිබ්බිදානු- විරාගානු- නිරොධානු- පටිනිස්සග්ගානු- ඛයානු- වයානු- විපරිනාමානු- අනිමිත්තානු- අප්පණිහිතානු- සුඤ්ඤතානු- අධිපඤ්ඤානු- යථාභූතඤාණදස්සනානු- ආදීනවානු- පටිසංඛානු- විවට්ටානු පස්සනා යන මහාවිපස්සනා නිස්සරණ දසඅටක්ද,

සොතාපත්ති මග්ග- ඵල- සකෘදාගාමි මග්ග- ඵල- අනාගාමි මග්ග- ඵල- අරහත්ත මග්ග- ඵල සහ ලොකොත්තර නිස්සරණ අටක් දැයි- සමතික්කම වශයෙන් නිස්සරණ තිස්හතරක්ද-

මෙසේ තිස්හතරට සමතික්කම නිස්සරණයයි කියන්නේ- ප්‍රථම ධ්‍යාන උපචාරය මොනාවට ඉක්මවා, ප්‍රථමධ්‍යානයටද- එම ප්‍රථම ධ්‍යානය, සොඳහැරි ඉක්මවා, ද්විතීයධ්‍යානයටද -පෙ-ආදීවශයෙන් අරහත්තඵලාවස්ථාව දක්වාවූ ප්‍රථම ප්‍රථම අවස්ථාවන් මොනාවට ඉක්මවා පැමිණෙන හෙයින් සමතික්කම වශයෙන් නිස්සරණ තිස් හතරක් ප්‍රකාශවේක්.

“නෙක්ඛම්මෙන පඤ්චින්ද්‍රියානි කාමච්ඡන්දතො නිස්සටානි හොන්ති” ආදිවශයෙන් නිස්සරණ තිස්හතක්, ප්‍රතිපක්ෂධර්ම ප්‍රහාන වශයෙන් දක්වනලදී. එම තිස්හත නම් මෙසේයි. නෙක්ඛම්මයෙන් කාමච්ඡන්දයද, අබ්‍යාපාදයෙන්- ව්‍යාපාදයද, ආලොකසංඥාවෙන් ථීනමිද්ධයද, අවික්ෂෙපයෙන් උද්ධච්චයද, ධම්මව්‍යවස්ථානයෙන් විචිකිච්ඡාවද, ඥානයෙන් අවිද්‍යාවද, ප්‍රාමොජ්ජයෙන් අරතියද, මේ සත් නිස්සරණ උපචාරභූමි වශයෙන් කියනලදී.

ප්‍රථමධ්‍යානයෙන්- නීවරණයන්ද, ද්විතීයධ්‍යානයෙන්- විතර්ක විචාරයන්ද, තෘතීයධ්‍යානයෙන්- ප්‍රීතියද, චතුර්ථධ්‍යානයෙන්- සැපදුක්ද, ආකාසානඤ්චායතනයෙන්- රූපසඤ්ඤා, පටිඝසඤ්ඤා, නානත්තසඤ්ඤාද, විඤ්ඤාණඤ්චායතනයෙන්- ආකාසානඤ්චායතනයද, ආකිඤ්චඤ්ඤායතනයෙන්- ආකාසානඤ්චායතනයද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙන්- ආකිඤ්චඤ්ඤායතනයද, අනිච්චානුපස්සනාවෙන්- නිත්‍ය සංඥාවද, දුක්ඛානුපස්සනාවෙන්- සුඛසංඥාවද, අනත්තානුපස්සනාවෙන්- ආත්මසංඥාවද, නිබ්බිදානුපස්සනාවෙන්- නන්දියද, විරාගානුපස්සනාවෙන්- රාගයද, නිරෝධානුපස්සනාවෙන්- සමුදයද, පටිනිස්සග්ගානුපස්සනාවෙන්- ආදානයද, (ගැණීම) ඛයානුපස්සනාවෙන්- ඝනසංඥාවද, වයානුපස්සනාවෙන්- ආයූහනයද, (රැස්කිරීම) විපරිණාමානුපස්සනාවෙන්- ධ්‍රැව සංඥාවද, අනිමිත්තානු පස්සනාවෙන්- නිමිත්තද, අප්පණිහිත අනු පස්සනාවෙන්- ප්‍රණිධියද, සුඤ්ඤතානු පස්සනාවෙන්- අභිනිවෙස යද, (ආසාකිරීමද) අධිපඤ්ඤා ධම්මානුපස්සනාවෙන්- සාරාභිනිවෙසයද, (හැසිරීම් වශයෙන් ආසාකිරීම) යථාභූතඤාණ දස්සනායෙන් සම්මොහ අභිනිවේසයද, (මුලාවී ආසාකිරීමද) ආදීනවානුපස්සනාවෙන්- ආලයාභිනිවේසයද, (ඇලී ආසාකිරීමද) පටිසඞ්ඛානුපස්සනාවෙන්- අප්පටිසංඛාවද, (නුනුවනද) විවට්ටානුපස්සනාවෙන්- සංයෝගාභිනිවේසයද, සෝවාන්මඟින්- දෘෂ්ටිගත සමහර කෙලෙසුන්ද, සකෘදාගාමි මඟින්- ඕලාරික කෙලෙස්ද, අනාගාමි මඟින්- අනුසහගත කෙලෙසුන්ද, අරහත්ත මඟින්- සියලු කෙලෙසුන්ද, මුලින් කී සතද, මේ තිසද යන තිස්හත, ප්‍රතිපක්ෂධර්ම ප්‍රහාන වශයෙන් නිස්සරණ තිස්හත වෙත්. මෙහි සෝවාන්ඵලය -පෙ- යන පලසතර නොකීවේ, ඵල සතරට ප්‍රතිපක්ෂ ධර්ම නැති නිසයි. මෙලෙසින් (25 + 34 + 37 + 96) නිස්සරණ අනූසයක්වෙත්. දෙවෙනි වාරයෙහි ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාගේ වශයෙන් මෙහි අනූසයෙන් දොළසක් අත්හැර අසූහතරක් වෙත්. එතකොට මුලින් 96 ත්, පසුව 84 රත් එක්තළවිට 180 වක් වෙත්.

ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාගේ වශයෙන් අත්හැරියයුතු දොළස කවරේද? සමුච්ඡෙදකම්ම වශයෙන් කී තිස්හතරින්- මාර්ග- පල- වශයෙන් කී අටද, පටිපක්ඛ වශයෙන් කී තිස්හතින්- මාර්ග වශයෙන් කී සතරද- යන දොළස, ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාගේ වශයෙන් කී දෙවෙනි වාරයෙහිදී අස්කර 84 ක්ම ගතයුතුයි. කුමක් හෙයින් ඒ දොළස අස්කරන්නේද? සියල්ලට පළමු කී පස්විස්ස- මාර්ගඵල වශයෙන් ලබන බැවින්, අභීත්ඵල වශයෙන් නිස්සරණ කියන ලද්දේමය. පහත් පහත් ඵල සමාපත්ති උසස් උසස් ඵල

සමාපත්ති වලින් සම්පාදනය නොවෙත්. (සකෘදාගාමිඵල සම වතින් සෝවාන්ඵල සමවත සම්පාදනය නොවේයැයි එහි අද හසයි.) යටකීතැන්වල රහත්ඵලයෙන් නොසැපයේ. ධ්‍යාන සමාපත්ති, විදර්ශනා, නෙක්ඛම්ම ආදිය පවා ක්‍රියා වශයෙන්ම ලබත්. මෙසේ මේ සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන පස්ඉන්ද්‍රියයෝ පෙරටුකොටම ප්‍රතිපක්ෂ ධර්මයන්ගේ සැහැල්ලු භාවය සිදුකල හෙයින් ප්‍රතිපක්ෂ ධර්මයන් ගෙන් ඉවත් කරණ ලද්දේ වෙත්, වෙන් කරණ ලද්දේ වෙත්.

"පඤ්චිමානි භික්ඛවෙ ඉන්ද්‍රියානි -පෙ- කත්ථ ච භික්ඛවෙ සතින්ද්‍රියං දට්ඨබ්බං. චතූසු සතිපට්ඨානෙසු එත්ථ සතින්ද්‍රියං දට්ඨබ්බං. -පෙ- චතූසු සතිපට්ඨානෙසු සතින්ද්‍රියස්ස වසෙන තතීභාකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි. -පෙ- චතූසු සතිපට්ඨානෙසු සතින්ද්‍රියස්ස වසෙන වීසතියා ආකාරෙහි පඤ්චින්ද්‍රියානි දට්ඨබ්බානි" යනුවෙන් මහතෙති මේ ඉන්ද්‍රිය පසෙක, ඒපස අතුරෙන් සතින්ද්‍රිය කෙසේ දතහැකිද? මෙහි සතරාකාර සතිපට්ඨානයන් අතරෙහි සතින්ද්‍රිය දතයුතුයි. සතර සතිපට්ඨාන පිළිබඳව සතින්ද්‍රිය වශයෙන් කී ආකාරයකින් පස් ඉඳුරන් දැනගතහැකිද? සතර සිව්වන් පිළිබඳව සතින්ද්‍රිය වශයෙන් විසිආකාරයකින් පසිඳුරන් දතහැකියි. කවරනම් ආකාර විස්සක්ද? කායානුපස්සනා, වෙදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා, යන සතර උපට්ඨානාධිපතෙය්‍ය වශයෙන් සතින්ද්‍රියයද, අවික්ෂෙපාර්ථයෙන් සමාධින්ද්‍රියයද, දර්ශනාර්ථයෙන් පඤ්ඤින්ද්‍රියද, අධිමොක්ෂාර්ථයෙන් සද්ධින්ද්‍රියද, පග්ගහ අර්ථයෙන් විරියින්ද්‍රියයද යන පසිඳුරන් පිළිබඳව දැනගතයුතු ක්‍රමයෙන් විසතික්‍රමය දතයුතුයි. අනිත් ඉන්ද්‍රියන් පිළිබඳවද එසේයි. තවත් පැහැදිලි කරණවා නම් මෙසේයි. කායානුපස්සනාව, උපට්ඨානාධිපතෙය්‍ය, අවික්ෂෙපාර්ථය, දර්ශනාර්ථය, අධිමොක්ෂාර්ථය, පග්ගහාර්ථය යනාකාරයෙන් පසක්ද, වෙදනා, චිත්ත, ධම්ම යන තුනද මෙසේ පස් පස් ආකාරයෙන් ගත්කල විසිආකාරය තේරුන් ගතහැක.

එම විසිආකාරය මෙසේ තේරුන්ගන්න. ශරීරය අනුව බලනකල වැටහීම අධිපති භාවයට වන් අවස්ථාවක් වීනම්, ඒ අවස්ථාව සතින්ද්‍රියයි, විපිළිසරනොවී එකඟබවක් වැටහීයෙන් නම්, එය සමාධින්ද්‍රියයි. අනිත්‍යාදී වශයෙන් දැකීමක් වෙත් නම්, එය ප්‍රඥෙන්ද්‍රියයි. කය පිළිබඳව සිතෙහි සථිරභාවයකට පැමිණීම වෙත් නම්, එය ශ්‍රද්ධෙන්ද්‍රියයි. කය පිළිබඳව අනුපස්සනා කරණ අවස්ථාවෙහි තමහට සිතන ආකාර ඔසවා තැබීමක්, දැඩිකොට ගැණීමක් වෙත්නම්, එය විරියින්ද්‍රියයි. වෙදනා, චිත්ත, ධම්ම, පිළිබඳවද මෙලෙසින් දැන විසිආකාරය තේරුන් ගතයුතුයි.

සද්ධින්ද්‍රිය සතර ශ්‍රොතාපත්ති අඞ්ග වශයෙන්ද,
විරියින්ද්‍රිය සතර සම්මප්පධාන වශයෙන්ද,
සතින්ද්‍රිය සතර සතිපට්ඨාන වශයෙන්ද,
සමාධින්ද්‍රිය සතරධ්‍යාන වශයෙන්ද,
පඤ්ඤින්ද්‍රිය සතර ආයසීධම් වශයෙන්ද,

මෙම පඤ්චඉන්ද්‍රියන් හඳුන්වාදීමට සද්ධම්මප්පකාසනී නම් පටිසම්භිදා අටුවාවෙහි මෙසේ උපමාවක් දෙයි. මේ පසිඳුරන් සිටුවරු සතරදෙනෙක් හා රජ කෙනෙක්ය, යන යහළුවෝ පස්දෙනෙක් සමානය. මේ පස්දෙන උත්සව දිනක සෙල්ලම් කිරීම සඳහා වීථියට (මහාමාර්ගයට නැතිනම් වඩුම්මට) බැස යන අතර එක සිටුවරයෙකුගේ ගෙය හමුවෙයි. එකල ඔහු තමගෙදරට හැඳවාගෙණ ගොස් අනිත් සතරදෙනාට ඉඳගන්ට ආසනදී, ඔවුන්ට ඇප උපස්ථානාදිය ඔහු විසින්ම කරත්. වැඩකරුවන් ලවා කරවත්. අනික් සතරදෙනා ඒ උපස්ථානාදී කටයුතුවල නොයෙදී ලැබෙන සත්කාර විඳිමින් සංසුන්ව හිඳිත්. මේ සතරදෙනාට සුවඳ මල් ආදිය දෙව්, කෑයුතු, පියයුතු දෑය දෙව්, යනාදිය කියමින් කරවන්නේ ගෙසුවාමියා විසින්මය. අනිත් සිටුවරු තුන්දෙනාගේ ගෙවලටවන් කල්හිද ඒ ඒ සිටුවරුන්ම තමතමන්ගේ ගෙවලදී උවැටැන් කරත් මෙලෙසින් ගොස් සියල්ලට පසුව රජගෙදරට ගිය කල්හිද රජතෙම සියලුදෙනාට ප්‍රධානයයි නිකන් හොසිට මේ තැනැත්තන්ට කෑයුතුදෙය දෙව, පියයුතුදෙයදෙව, සුවඳමල්දෙව යනාදී වශයෙන් කියා රජවිසින්ම කරවත්, සිටුවරු නිහඬව කරණ සංග්‍රහ විඳිත්. එලෙසම සද්ධා, වීරිය, සති, සමාධි, යන සතර සිටුවරු සතරදෙනාමෙන්ද, පඤ්ඤින්ද්‍රිය රජමෙන්ද, සැලකිය යුතුයි. රජසහ සිටුවරු සිව්දෙන වීථියට බැස ගමන්ගන්නාසේ එක්අරමුණක සද්ධාදී පසිඳුරන් ක්‍රියා කරණ ආකාරය දතයුතුයි. එසේ ක්‍රියාකරණාතර පළමුවැනි සිටුහුගේ ගෙදරට පැමිණිවිට අනික් සතරදෙනාට ඉඳගන්ටදී ආගන්තුග සත්කාරයෙහි තමා යෙදෙන්නාසේ සොතාපත්ති අඞ්ග නැමැති ගෙට පැමිණ එම ගෙය හිමියාවූ අධිමොක්ෂ ලක්ෂණ (ස්ථිර භාව ලක්ෂණ) ශ්‍රද්ධෙන්ද්‍රියම ශ්‍රෙෂ්ඨව ක්‍රියාකරත්. පූර්වාඞ්ගමව ක්‍රියා කරත්. සෙසු සතර සන්ද්‍රියයෝ ඒ අනුව යෙදෙත්. එලෙසම දෙවැන්නාගේ ගෙට ගිය කල්හී ඉතුරු සතරදෙන නිහඬව සිටිත්ද ගෙසුවාමියාම විචාරු කටයුතු කරත්ද? එලෙසම සතර සම්මපධාන නැමැති ගෙය හිමියා වීන විරියින්ද්‍රියම ප්‍රධානවෙත්, පූර්වාඞ්ගමවෙත්, සෙසු සතරදෙන ඒ අනුව යෙදෙත්. යම්සේ තුන්වැනියාගේ ගෙටගියකල්හී ඉතුරු සතරදෙන තුෂ්ණීම්භාවයෙන් හිඳිත්ද, ගෙසුවාමියාම විචාරු කටයුතු කරත්ද, එසේම සතර සතිපට්ඨාන

නමැති ගෙය හිමියාවන සතින්ද්‍රියම ප්‍රධානවෙත්, පූර්වාංගම්වෙත්, සෙසු සතරදෙන ඒ අනුව යෙදෙත්. යම්සේ සතරවැනියාගේ ගෙට ගියකල්හී ඉතුරු සතරදෙන තුෂ්ණිම්භූතව හිඳිත්ද, ගෙස්වාමියාම විචාරා කටයුතු කරත්ද, එසේම සතරධ්‍යාන නමැති ගෙය හිමියාවන සමාධින්ද්‍රියම ප්‍රධාන වෙත්. පූර්වාංගම වෙත්, සෙසු සතරදෙන ඒ අනුව යෙදෙත්. සියල්ලට පසුව රජහුගේ ගෙට ගිය කල්හී වනාහී යම්සේ ඉතුරු සතරදෙනා නිහඬව සිටිත්ද, රජුම විචාරා කටයුතු කරත්ද, එසේම චතුරාර්‍ය්‍යසත්‍යය නමැති ගෙහිමියාවන ප්‍රඥෙන්ද්‍රියම ප්‍රධාන වෙත්, පූර්වාංගම වෙත්, සෙසු සතරදෙනා ඒ අනුව යෙදෙත්යයි දතයුතුයි.

මේ පසිඳුරන් වඩා ගැණීමට වැඩියයුතු කරුණු සත්පුරුෂයන් මොනවට සේවනය කිරීම, බණ ඇසීම, නුවණින් මෙනෙහි කිරීම, ධර්මානුධර්ම ප්‍රතිපත්තිය යන කරුණුයි. "සොභනානං පුරිසානං සම්මා සෙවනෙ" යනුවෙන් සප්පුරිස සංසෙවනය නම් සොභනවූ යහපත්වූ පුරිෂයන් සමග මොනවට සෙවනය භජනය පයුරුපාසනය කිරීමද, සතං ධම්මො සොභනෙවා ධම්මොති, සද්ධම්මො. තස්ස සද්ධම්මස්ස සවණෙ" සත්පුරුෂවූ බුද්ධාදීන්ගේ ධර්මය හෝ සියලු දුක් නසා නිර්වාණ රසය ලභාකරදෙන හෙයින් සොභනවූ ධර්මය හෝ සද්ධර්මයයි. එබඳු උතුම් ධර්මය ශ්‍රවනය කිරීමද "උපායෙන මනසිකාරො" යොනිසො මනසිකාරය නම් උපායෙන් උපාය අනුව මෙනෙහි කිරීමයි. අනිත්‍යවූ ස්වභාවය, අනිත්‍ය ලෙසද, දුක්ඛස්වභාවය, දුක්ලෙසද, අනාත්ම ස්වභාව, අනාත්ම ලෙසද, මෙනෙහි කිරීම, සිත්හි වැඩීම යොනිසොමනසිකාරයයිද, "නවලොකුත්තර ධම්ම අනුගතො ධම්මො ධම්මානු ධම්මො සීලසමාධිපඤ්ඤා, සඞ්ඛාතස්ස ධම්මානුධම්මස්ස පටිපත්ති, පටිපජ්ජනං ධම්මානුධම්ම පටිපත්ති" සොවාන් මාර්ග ඵලය, සකෘදාගාමි මාර්ග ඵලය, අනාගාමි මාර්ග ඵලය, අරහත්ත මාර්ග ඵලය, නිර්වාණය යන නවලොකොත්තර ධර්මයන් අනුවගිය ස්වභාවය, ධර්මානුධර්මයයි. සීල, සමාධි පඤ්ඤා යන ත්‍රිවිධාකාර ධර්මයන් පිරීම් වශයෙන් පූරණ ප්‍රතිපත්ති ආදියද, පිළිපැදීමද, ධර්මානුධර්ම ප්‍රතිපත්තියයිද සැලකිය යුතුයි. වැඩිදුර කරුණු අවබොධකර ගැණීමට පටිසම්භිදාමාර්ගය බැලිය යුතුයි.

තවද පඤ්චින්ද්‍රියන් පිළිබඳ ආනිසංස මාත්‍රයක් පවසමු. "චත්තාරො මෙ භික්ඛවෙ පුග්ගලා -පෙ- කතමෙ චත්තාරො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො දිට්ඨෙව ධම්මෙ සසංඛාර පරිනිබ්බායී හොති. ඉධ -පෙ- කායස්සභෙදා සසඞ්ඛාර පරිනිබ්බායි හොති. ඉධ -පෙ- දිට්ඨෙව ධම්මෙ අසඞ්ඛාර පරිනිබ්බායී හොති. ඉධ -පෙ- කායස්සභෙදා අසංඛාර පරිනිබ්බායී හොති" යනුවෙන්

1 දිට්ඨධම්මයෙහි (මේ අත්බැව්හිම) සසංඛාර පරිනිබ්බායී පුද්ගලයා නම් මෙසේයි- මහණෙනි! යම්කෙනෙක් හොඳ සිහිනුවණින් යෙදී කායපිළිබඳ කුණප කොටස් අසුභ වශයෙන් සිහිකරමින් සිටීද්ද, ආහාරය පිළිබඳව අනිත්‍යාදි වශයෙන් සිතා පිළිකුල් කරත්ද, සියලු ලෝකය කෙරෙහි නොඇලීම් සංඥා ඇත්තේවේද, සියලු සංස්කාරයන් කෙරෙහි අනිත්‍ය වශයෙන් අනුව දකීද, මරණ සංඥව, මැරෙනබව ඔහුතුල මොනවට සපිරව පවතීත්ද, හෙතෙම සද්ධා, හිරි, ඔත්තප්ප, විරිය, පඤ්ඤා යන පස්වැදෑරුම් ශෛක්‍ෂබල ඇසුරුකරමින් වසත්ද, එම පුද්ගලයාහට සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන පඤ්චේන්ද්‍රියයන් අධිකමාත්‍ර වශයෙන් පහළවෙත්ද, ඔහට මෙම පරමෛශ්වර ඉන්ද්‍රිය ධර්ම පස අධිකමාත්‍ර වශයෙන් පහලවන බැවින්ම, ඉහාත්ම බැව්හිම (දිට්ඨධම්මයෙහිම) සසංඛාර පිරිනිවන් භාවය ඇතිවේ. හෙවත් සංස්කාරයන් සහිත සම්පූර්ණ සැනසීම, සංසිඳීම, නැවත ජාත්‍යාදි දුකකට නොපැමිණීම, නිවන් ලැබීම ඇතිවන්නීවේ. මෙසේ සසංඛාර පරිනිබ්බායී ප්‍රථම පුද්ගලයා දතයුතුයි.

2 මහණෙනි! මරණින් මතු (මේ කරජකාය බිඳීමෙන් පසු) සසංඛාර පරිනිබ්බායී පුද්ගලයා නම් කවරේද? මහණෙනි! මේ සස්නෙහි යම් භික්ෂුවක් ශරීරය පිළිබඳව අසුභ වශයෙන් සිහිකරමින් වෙසේද, ආහාරය පිළිබඳව පිළිකුල් කිරීම් වශයෙන් වාසය කරයිද, සකල ලෞකික ලෝකය කෙරෙහි නොඇලීම් සංඥාවෙන් වසයිද, සියලු සංස්කාර ධර්මයන් කෙරෙහි අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දකිමින් වසත්ද, මරණ සංඥාව ඇතුලත මොනවට පිහිටා තබාගනිමින් වසත්ද, හෙතෙම ශෛක්‍ෂබලයයි කියනලද සද්ධා, හිරි, ඔත්තප්ප, විරිය, පඤ්ඤා යන පඤ්චබල ඇසුරුකරමින් වසත්ද, එලෙසම මෙම පඤ්චේන්ද්‍රියයන් මෘදුවශයෙන් පහලවෙත්ද, එනම්, සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන පසයි. හෙතෙම මෙම පසිඳුරන්ගේ පහළවීම් ඉතා මෘදු බැවින් කායභේදයෙන හෙවත් මරණින් මතු සසංඛාර පරිනිබ්බායී භාවයට පැමිණේ. හෙවත් මරණින්මතු සම්පූර්ණ දුක්වලින් මිදී සම්පූර්ණ නිදහසට පැමිණේ. මේ දෙවෙනි කායභෙදයෙන් සසංඛාර පරිනිබ්බායී පුද්ගලයායි.

3 මහණෙනි! ඉහාත්මයෙහිම (දිට්ඨධම්මයෙහිම) පුද්ගලතෙම අසංඛාර පරිනිබ්බායීවේද, මහණෙනි මේ සාසනයෙහි භික්ෂුතෙම කාමයන්ගෙන් වෙන්වී, සියලු අකුසල ධර්මයන්ගෙන් වෙන්වී, විතර්ක සහිතවූ, විචාර සහිතවූ, විවේකයෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසයකරයිද,

නැවතද, මහනතෙම විතක්ක විචාර සංසිඳුමා ඇතුලත මොනවට ප්‍රසාදය ඇතිව එකඟුතුවූ සිතින් විතර්ක විචාර රහිතව සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති විතීයධ්‍යානයට පැමිණ වසත්ද-

නැවතද මහණතෙම ප්‍රීතිය කෙරෙහිද නොඇල්මෙන් උපෙක්ෂකව (මැදහත්ව) වාසය කරයි. සිහිඇත්තේද යහපත් ප්‍රඥාඇත්තේ සැපයද කයින් විඳියි. යම්හෙයකින් ආර්‍යයෝ මධ්‍යස්ථව සිහිඇතිව සැපසේ වෙසේයයි කියත්ද, එලෙසවූ තෘතීයධ්‍යානයට පැමිණ වසත්ද–

නැවතද මහණතෙම, සැපයද පහකොට, දුකද පහකොට පෙරටුවම සොම්නස් දොම්නස් දෙක නැතිකොට දුක්නැති, සැප නැති මධ්‍යස්ථ පිරිසිදු සිහිය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වසත්ද හෙතෙම මෙම සද්ධා, හිරි, ඔත්තප්ප, විරිය, පඤ්ඤා යන පස් වැදෑරුම් ශෛක්‍ෂබල ඇසුරුකොට වාසය කරයිද, ඔහට මේ සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන පස් ඉන්ද්‍රියයන් අධිකමාත්‍ර වශයෙන් පහළවෙත්ද හෙතෙම මේ පඤ්චේන්ද්‍රියන්ගේ අධිකමාත්‍ර පහළවීම් ඇති හෙයින් දිටුදැම්යෙහිම (ඉහාත්මභාවයෙහිම) අසඞ්ඛාර පරිනිබ්බායී භාවයට පැමිණේ. හෙවත් සම්පූර්ණ සැනසීමට පැමිණේ. මහණෙනි! මේ ආකාරයෙන් තුන්වන පුද්ගලතෙම දිටුදැම්යෙහිම අසඞ්ඛාර වශයෙන් සම්පූර්ණ (නිදහසට) සැනසීමට පැමිණේ.

4 කෙසේ නම් මහණතෙම ශරීරයාගේ බිඳීමෙන් (මරණින්) අසංඛාර පරිනිබ්බායී භාවයට පැමිණේද? මහණෙනි! මේ සස්නෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව –පෙ– පෙර කියනලද පරිදි, ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ ධ්‍යානයට සම්වැද වාසයකරයි. හෙතෙම මේ සද්ධා, හිරි, ඔත්තප්ප, විරිය, පඤ්ඤා යන පස්වැදෑරුම් ශෛක්‍ෂබලවලට පැමිණ වසයිද, ඔහට මේ සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන පඤ්චින්ද්‍රියය මෘදුවශයෙන් පහළමෙත්ද හෙතෙම මේ පඤ්ඤින්ද්‍රියයන්ගේ මෘදුභාවය නිසා කායභෙදයෙන් අසඞ්ඛාර පරිනිබ්බායී භාවයට පැමිනේ. හෙවත් කායභෙදයෙන් සම්පූර්ණ සැනසීමට පැමිණේ. මහණෙනි! මෙලෙසින් සතරවන පුද්ගලතෙම කායභෙදයෙන් අසඞ්ඛාර වශයෙන් සම්පූර්ණ සැනසීමට පැමිණේ.

මෙකී පුද්ගලයන් සතරුකාරයකින් සම්පූර්ණ සැනසීමට දුක් කෙළවර කිරීමට පැමිණෙන පඤ්චෙන්ද්‍රියයන් පිළිබඳ මෙකී කෙටි විස්තරය දැන උගෙන හැකිපමණ පුහුණු කිරීමට උත්සාහ කරණ ලෙසද, මේ ආදී උසස් ධර්මයන් ශ්‍රවනය කිරීමෙන් ලැබෙන පුණ්‍ය ඵලයෙන් සියලු දුකින් මිදුනු ලොකොත්තර නිර්වාන ධාතුව ප්‍රාර්ථනා කරගන්නා ලෙසද සිහිපත් කරවමු.

සාධු! සාධු!! සාධු!!!

සියලු සතුන්හට නිවන්සිරි සැදේවා.

# සමාධින්ද්‍රිය.

මොරටුමුල්ලේ තපසරාරාමාධිපති
ආචාර්ය මොරටුවේ ශ්‍රී පේමරතන මහාස්ථවිරපාදයන්
වහන්සේ විසින් ලියනලදී.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

**"කතමං තස්මිං සමයෙ සමාධින්ද්‍රියං හොති? යා තස්මිං සමයෙ චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මා සමාධි සමාධිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං ඉදං තස්මිං සමයෙ සමාධින්ද්‍රියං හොති."**

මේ ප්‍රකාශකරණලද "ධම්මසඞ්ගණී" ප්‍රකරණාගත දේශනා පාඨය වනාහි අප භාග්‍යවතුන් වහන්සේ විසින් සමාධින්ද්‍රිය විස්තරකරලීම් වශයෙන් වදාරණ ලද්දකි.

එහි අදහස නම්, යම් සමයෙක්හි කාමාවචර කුසල් සිතක් උපදී නම් එසමයෙහි සමාධින්ද්‍රිය යනු කවරක්වේද? එසමයෙහි කුශල චිත්තයාගේ එක අරමුණෙක්හි සිටීමක් වේද, මනාකොට සිටීමක් වේද, කුසල් අරමුණට බැසගෙණ සිටීමක් වේද, උඩඟුකම සැකය යන මොවුන්ගේ වශයෙන් සිතේ ඔබමොබ යැමක් නොවේද, නොයෙක් අරමුණුවල වැටීමක් නොවේද, එහාමෙහා නොදුවන සිත් ඇතිබවක් වේද, සමථයක් වේද, සමාධින්ද්‍රියක් වේද, සමාධිබලයක් වේද, සම්‍යක් සමාධියක් වේද, සමාධි සම්බොජ්ඣඞ්ගයක් වේද, මාර්ගාඞ්ගයක් වේද, මාර්ගයට ඇතුලත්වූවක් වේද, මෙය එසමයෙහි සමාධින්ද්‍රිය වේයි යනු එහි සාමාන්‍ය අදහසයි.

සමාධීන්ද්‍රිය දක්වීමට සමානාර්ථවත් වචන රාශියක් මෙහි යොදා තිබේ. දේශනාවෙහි නොයෙක් තැන්වල සමාධිය දක්වීමට ඇවිත් තිබෙන වචන එයින් දතහැක්කේය.

සමාධීන්ද්‍රිය යන නන්හි "සමාධි" ය "ඉන්ද්‍රිය" ය කියා පද දෙකකි. එයින් "සමාධි" යනුවෙන් කුසල් සිතේ එකාග්‍රබවත් "ඉන්ද්‍රිය" ශබ්දයෙන් අධිපති බැව් කිරීමය යන අර්ථයත් දතයුතුය. එවිට සමාධිය චිත්තසන්තානයෙහි අධිපතිබැව් කරණ ධර්මයක් බව සිතාගත හැක්කේය.

සමාධියෙහි ලක්ෂණ රසාදිය මේ ධර්මපුස්තක මාලාවෙහිම සමාධිය විස්තරකළ තැන්වල සඳහන්ව ඇත. එබැවින් එම විස්තරය හැර සමාධිය ගැන කරුණු ස්වල්පයක් දක්වමි.

මුළු බුද්ධධර්මය ශීල, සමාධි, ප්‍රඥා කියා කොටස් තුනකින් යුක්තය. එවිට බුද්ධධර්මයෙන් තුනෙන් එක පංගුවක් සමාධියට ඇතුළත් වන්නේය. කය, වචන දෙකේ හික්මීම ශීලයෙනුත් සිතෙහි හික්මීම සමාධියෙනුත් නුවණෙහි හික්මීම ප්‍රඥාවෙනුත් දක්වාතිබේ. විශේෂයෙන් සමාධිය උවමනා කරන්නේ සිත හික්මවා ගැනීමටය. එය ඉතා අමාරු දෙයකි. සත්ත්වයින්ගේ සිත් අනාදිමත් කාලයක සිට පවත්නේ රූපාදී පස්කම් විෂයෙහි දුවමින්ය. අමාරුවෙන් නමුත් ඒ සිත එක අරමුණක නවතාගතහොත් මහත් වැඩ සිදුකරගත හැක්කේය. පළමුකොට සමාධිය වඩන්නා පිරිසිදු සිල්වතෙක් විය යුතුය. දුශ්ශීලව සිටියහොත් ඔහුගේ සිතේ පවත්නා විපිළිසර භාවය නිසා සිත එකඟකර ගැනීමට මහත් දුෂ්කරකම් ඇතිවන්නේය. සිත ලෙඩව තිබේනම් ඔහුට කිසිසේත් සමාධිය වඩාගනුනම් මිනිසෙක් වශයෙන් වත් ජීවත්විය නොහැක්කේය. සමාධිය දියුණුකර ගන්නාතුළ සිතේ සුවය තිබිය යුතුය. චිත්ත සුඛය සමාධියට ආසන්න කාරණයයයි කියන ලද්දේ එහෙයිනි.

ආකාර වශයෙන් බලනවිට සමාධිය අවික්ෂේප ලක්ෂණයෙන් නම් එක් ආකාර වන්නේය. අවික්ෂේපය නම් උද්ධච්චය විචිකිච්ඡාවය යන මොවුන්ගේ වශයෙන් සිත නිස්සෙම එහාමෙහා දිවීමයි. සමහර මිනිසුන්ට බණ ඇසීමේදී පවා ටිකවෙලාවක් එකතැනක හිඳගෙණ සිටිය නොහැක්කේය. එසේවන්නේ සිත එක අරමුණක නවතාගත නොහැකිවීමෙනි. සිතේ චපලබවට බෙහෙවින් හේතු වන්නේ උද්ධච්චය හා විචිකිච්ඡාවය. උද්ධච්චය නම්? සිතෙහි යෙදෙන නොසන්සුන් බවයි. අලු ගොඩකට ගල්ගැසීමක් මෙනි. සුළඟට සෙලවෙන ධවජයක් මෙන් උද්ධච්චයෙන් යුත් තැනැත්තාගේ සිත නිතරම චංචලවන්නේය. එබැවින් ඔහුගේ සිතෙහි තැන්පත්කමක් ඇති නොවේ. විචිකිච්ඡාව නම් අරමුණ නිශ්චයකරගැනීමෙහි අසමර්ථතායෙන් පිළියම්කළ නොහැකි රෝගයක් මෙන් සුව කළ නොහැකි සැකකිරීමයි. ඒ වනාහි බුදුන්, දහම්, සඟ යන තෙරුවන්හිද, ශික්ෂාවන්හිද, හෙතුප්‍රත්‍යය ධර්මයන් කෙරෙහිද සංසාරය පිළිබඳ පූර්ව කෙළවරෙහිද, අපර කෙළවරෙහිද, පූර්වාපර කෙළවර දෙක්හිද කරුණු ලබන සැකයයි. සේ වනාහි නීවරණ විචිකිත්සාය ප්‍රතිරූපක විචිකිත්සායයි දෙයාකාරය. නීවරණ විචිකිත්සාව මේ කියනලද බුද්ධාදී අටතැන්හී උපදියි. ප්‍රතිරූපක විචිකිත්සාම වනාහි සර්වඥ නොවූ අන්‍යයන්හට මේ කිමෙක්දැයි මේ

කොයේදැයි යනාදී ආකාරයෙන් තම තමන්ට අභිමත අරමුණෙහි ලා උපදී. කුශලාකුශල ක්‍රියා චිත්තජ වශයෙන් එහි ප්‍රභෙද ඇත්තේය.

මෙකියනලද උද්ධච්චය හා විචිකිච්ඡාව යන දෙකින් සිත ඔබ මොබ යාමනොදී නවතා ගැනීම් සඞ්ඛ්‍යාත අවික්ෂෙපයාගේ වශයෙන් සමාධිය එක් ආකාරබැව් දතයුතුයි.

උපචාර අර්පණා වශයෙන් සමාධියෙහි විස්තර දතයුත්තේය. එහි උපචාර සමාධිය නම් රූපාවචර අරූපාවචර ලොකොත්තර ධ්‍යානයන්ට මුලින් ඇතිවන සිතේ එකාග්‍රතාවයයි. ධ්‍යානයක් උපදවන්නහුතුල ඇතිවන චිත්තවීථියෙහි චිත්තක්ෂණ සතළොස අතුරෙන් මුල්එක භවාඞ්ග වශයෙන්ද, දෙක භවාඞ්ග චලන වශයෙන්ද, තුන භවඞ්ගුපච්ඡෙද වශයෙන්ද හතර මනොද්වාරාවර්ජන වශයෙන්ද, ඊටපසු ජවන්සිත් නමුත් ධ්‍යානචිත්තවීථිය නිසා පහ පරිකර්ම වශයෙන්ද, හය උපචාර වශයෙන්ද, හත අනුලොම වශයෙන්ද, අට ගොත්‍රභූ වශයෙන්ද, නවය ධ්‍යාන වශයෙන්ද, ඉතුරු අට භවාඞ්ග වශයෙන්ද උපදියි. අරමුණක් නොගෙණ සිටිකල්හී සිත නිතරම භවාඞ්ග වශයෙන් පවතියි. යම්කිසි අරමුණක් දැනුන හැටියේම සිතේ එම භවාඞ්ග ගතිය සෙලවෙයි. හෙවත් අමුතු වෙයි. පූර්වභවාඞ්ගයට විසදෘශව උපදනා භවාඞ්ගයම භවාඞ්ගචලන යයි කියනු ලැබේ. ඊටපසු ඒ භවාඞ්ග ශ්‍රොතස සිඳීයයි. නුමුත් එයත් භවාඞ්ග චිත්තයක් මැයි. ඉක්බිති මනොද්වාරයට ලැබුන අරමුණ පරීක්ෂාකරලීමක් වශයෙන් මනොද්වාරාවර්ජනය ඇතිවෙයි. ඉක්බිති මනොද්වාරික චිත්තවීථියක් නම් ජවන්සිත් හතක් උපදියි. පරිත්තවීථිය නම් කාමාවචර චිත්තවීථියයි. අර්පණා චිත්තවීථියෙහිදී මනොද්වාරාවර්ජනයට පසුව උපදින්නේ පරිකර්ම චිත්තයයි. ඊලඟට උපචාර අනුලොම ගොත්‍රභූ යන සිත්තුන ඉපිද ඉක්බිති ධ්‍යානසිත උපදී. අනතුරුවත් ජවනසිත් නොඉපිද ඉතුරු චිත්තක්ෂණ අටත් භවාඞ්ග වශයෙන්ම පවතියි.

මෙහි කියනලද පරිකර්ම චිත්තය නම් ධ්‍යාන මාර්ගඵල සඞ්ඛ්‍යාත අර්පණාව සකස්කරණ චිත්තයයි. හෙවත් ප්‍රථම ජවනයයි. අර්පණා යනු විතර්කයට කියන නමකි, සම්ප්‍රයුක්තවූ චිත්තය අරමුණට පමුණුවන හෙයින් ඊට අර්පණායයි ව්‍යවහාර කෙරෙත්. උපචාරය යනු අර්පණාවට සමීපයෙහි හැසිරෙන චිත්තයයි. එය ඉතා ආසන්නත් නොවී ඉතා දුරත් නොවී පවතී. එය දෙවන ජවනය වෙනුවට උපදින සිතයි. තුන්වන ජවනය අර්පණා උපදීමට විරුඬ ධර්මයන් නැතිකර යොග්‍යාකාරයෙන් පවතින හෙයින් අනුලොම නම් වේ. ඊලඟට ගොත්‍රභූ චිත්තයයි. එය ධ්‍යානයට පූර්වභාගයෙහි

කාමාවචර ගෝත්‍රය මැඩපවත්වන හෙයින්ද මහග්ගත හෝ ආර්‍ය්‍ය ගෝත්‍රය දියුණු කරණ හෙයින්ද ගෝත්‍රභූ නම්වෙයි. ඒලඟට ධ්‍යාන සිත ඉපිද ඉක්බිති ජවන්සිත් ගතෙන් ඉතුරු දෙකත් ජවන්නොවී ඒ සිත් දෙක හා අනික් ගැයත් දිගටම භවාඞ්ගවී පවතියි. චිත්තවීථි ගැන ඉගෙණීමෙන් මේය පහසුවෙන් දැනගත හැකියි.

මේ ධ්‍යානයන් උපදවන්නාවූ තැනැත්තා විපාකාවරණ, කර්මාවරණ, කෙලශාවරණ සඞ්ඛාත ආවරණත්‍රයයෙන් මූවහනොවූ කල්‍යාණ පෘථග්ජනයෙක් වියයුතුයි. කර්මාවරණ නම් පඤ්චානන්තර්‍ය්‍ය කර්මයයි. නොයෙක් හේතුසම්පත් ඇතිව සිටියත් පඤ්චානන්තර්‍ය්‍යයට අසුවූ කෙනෙකුට ඒ ජාතියේදී ධ්‍යානයක් හෝ මාර්ගඵලයක් ලැබිය නොහැක්කේය. කෙලශාවරණ නම් නියත මිථ්‍යා දෘෂ්ටියයි. මිථ්‍යාදෘෂ්ටිගත් තැනැත්තා ඒ දෘෂ්ටිය හැරදමා දෙවනු සම්‍යක්දෘෂ්ටිකයෙක් වුවහොත් ඔහුට ධ්‍යානාදිය ලැබිය හැක්කේය. විපාකාන්තරාය නම් අහේතුක විහේතුක ප්‍රතිසන්ධියයි. ත්‍රිහේතුක පුද්ගලයෙකුට මිස අන්‍යයෙකුට එම ජාතියේදී ධ්‍යාන, මාර්ග, ඵල ලැබිය නොහැක්කේය. අහේතුක විහේතුක පුද්ගලයෝ නම් අකුශල කර්මයෙන් හා දුබල කුශල කර්මයෙන් ප්‍රතිසන්ධි ලැබූවෝය. මෙසේ සමාධිය වඩන්නා පිරිසිදු සිල්ඇති ත්‍රිහේතුක පුද්ගලයෙක් වියයුතුය.

සමාධි භාවනාව සඳහා කර්මස්ථාන සතළිසක් නියමකරතිබේ. එනම් දස කසිණය, දස අසුභය, දස අනුස්මෘතීහුය. සතර අප්‍රමාණ්‍යයෝය, සතර ආරූප්‍යයෝය, ආහාරයෙහි ප්‍රතික්කූල සංඥාවය, චතුධාතු වවත්ථානය යන සතළිසයි.

එයින් දසකසිනය නම්? පඨවි කසිණ, ආපොකසිණ, තෙජෝ කසිණ, වායොකසිණ, නීලකසිණ, පීතකසිණ, ලොහිතකසිණ, ඔදාතකසිණ, ආකාසකසිණ, ආලෝකකසිණ යන දසයයි.

දස අසුභය නම්? මෘතශරීරයේ අවස්ථා දහයක්වූ උද්ධුමාතක, විනීලක, විපුබ්බක, විච්ඡිද්දක, වික්ඛිත්තක, හතවික්ඛිත්තක, ලොහිතක, පුළුවක, අට්ඨික යන දසයයි.

දස අනුස්මෘති නම්:- බුද්ධානුස්මෘති, ධර්මානුස්මෘති, සඞ්ඝානුස්මෘති, ශීලානුස්මෘති, ත්‍යාගානුස්මෘති, දෙවතානුස්මෘති, උපසමානුස්මෘති, මරණානුස්මෘති කායගතාසති, ආනාපානසති යන දසයයි.

අප්‍රමාණ්‍ය සතර නම්:- මෛත්‍රිය, කාරුණ්‍යය, මුදිතාය, උපෙක්ෂාය යන සතරයි. අප්‍රමාණ සත්වයන් කෙරෙහි පැතිරවිය යුතු බැවින් අප්‍රමාණ්‍යයෝයයි කියනු ලැබෙත්.

ආරූප්‍ය සතර නම්:- ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන යන සතරයි. ආහාර ප්‍රතිකකූල සංඥාව නම්:- ආහාරයෙහි පවත්නා පිළිකුල් බව සැලකීමයි. චතුධාතු වවත්ථානය නම්- පඨවි, ආපො, තෙජො, වායු යන ධාතුසතර ව්‍යවස්ථාකර බලන භාවනාවයි.

තම තමන්ගේ චරිතානුරූප වශයෙන් මේ භාවනා යොදාගත යුතුයි. චරිත වශයෙන් ලෝවැසි සත්වයෝ රාගචරිතය, ද්වෙෂචරිතය, මොහචරිතය, ශ්‍රද්ධාචරිතය, බුද්ධිචරිතය, විතර්කචරිතය කියා චරිත සයකින් යුක්තවෙති. ඇතැම්විට සමහරු මේ චරිත කීපයකින් යුක්තවද සිටිති.

භාවනා වනාහි පරිකර්ම භාවනාය, උපචාර භාවනාය, අර්පණා භාවනායයි ත්‍රිවිධ වෙති.

පරිකර්ම භාවනාව නම්:- සමසතළිස් කර්මස්ථාන අතුරෙන් කිසිවක් ඉගෙණ ප්‍රතිභාග නිමිත්ත ලැබෙනතෙක් සිත සකස්කරණ භාවනාවයි. ඒ වනාහි සතළිස් කර්මස්ථාන විෂයෙහිම ලැබෙන්නේය.

උපචාර භාවනාව නම්:- තදඞ්ග ප්‍රහාණයෙන් පඤ්චනීවරණ යන් දුරුකොට ප්‍රතිභාගනිමිත්ත ලැබූන කල්හි එය අරමුණුකොට ධ්‍යානය ලැබෙනතාක් වඩන්නාවූ කාමාවචර භාවනාවයි. එයත් සමසතළිස් කර්මස්ථානයෙහිම ලැබෙන්නේය. අර්පණා භාවනාව නම් මහද්ගත භාවයට පැමිණි හෙවත් රූපාවචර අරූපාවචර භාවයට පැමිණි භාවනාවයි. එය සැම කර්මස්ථානයන්හිම නො ලැබේ.

බුද්ධානුස්සති, ධම්මානුස්සති, සඞ්ඝානුස්සති, සීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති, උපසමානුස්සති, මරණානුස්සති යන අනුස්සති අටෙහිද ආහාර පටිකකූලසඤ්ඤා, චතුධාතු වවත්ථානයන දෙක්හිද යන දශ කර්මස්ථානයෙහි නො ලැබේ.

ගුණ ගැඹුරු බැවින් හා අනන්ත බැවිනුත් බුද්ධ, ධර්ම, සඞ්ඝ, සීල, ත්‍යාග, දෙවතා යන සත්තන්හිද සවභාව ධර්මයක් බැවින් හා සංවෙග කටයුත්තක් බැවිනුත් මරණානුසමෘතියෙහිද සවභාව ධර්ම බැවින් හා ගැඹුරු බැවින්ම ආහාර ප්‍රතිකකූල සංඥවෙහි හා චතු ධාතු වවත්ථානයෙහිද අර්පණා නොලැබෙන බැව් දතයුතුයි.

භාවනා වැඩීමට ඇතිකරගතයුතු නිමිතිද තුනකි. එනම්:- පරිකර්ම නිමිත්ත, උද්ග්‍රහ නිමිත්ත, ප්‍රතිභාග නිමිත්ත යන තුනයි.

පරිකම් නිමිත්ත නම්:- යම්කිසි භාවනාවක් අරමුණු කොට සිත තැන්පත්කරගණු පිණිස ඇතිකර ගන්නාවූ නිමිත්තයි, හෙවත් පුරුදුවීම පිණිස පලමුවෙන් කරන්නාවූ භාවනාවයි.

උද්ග්‍රහ නිමිත්ත නම්:- ඇසින් බලා වැඩූ අරමුණ සිතට පෙණෙන්නවීම උද්ග්‍රහ නිමිත්ත නම් වේ. පරිකම් නිමිත්ත දෙස බලා සියදහස්වර භාවනාකල කල්හි යම් නිමිත්තක් සිතට අරමුණු වේද, ඇස පියා බැලුවත් වෙන දිසාවක් බැලුවත් යම් නිමිත්තක් සිතට පෙණෙන්ට මෙන් වේද, එය උද්ග්‍රහ නිමිත්තයයි කියනු ලැබේ.

ප්‍රතිභාග නිමිත්ත නම්:- උද්ග්‍රහ නිමිත්ත අරමුණු කොට භාවනාකරණ කල්හි කසිණදොෂයන්ගෙන් මිදී ඊට වඩා සියදහස් ගුණයෙන් පිරිසිදු වශයෙන් පහලවන නිමිත්තයි.

මෙසේ මේ නිමිති ඇතිකරගෙණ භාවනා වඩන්නවුන් විසින් තම තමන්ගේ චරිතවලට අනුරූප භාවනා පුරුදුකර ගතයුතුය. ඔවුනොවුන්ගේ චරිත දැනගැණීම පහසු නොවේ. සතරඉරියව් වෙන් හා කටයුතුවලින්ද ආහාරයෙන්ද බැලීම්ආදියෙන්ද සවභාව පැවතුමෙන්ද මෙතෙම මෙබඳු චරිතයෙන් යුක්තයයි දැනගත් නේය. රාගචරිත පුද්ගලයාගේ කුසල් සිතක් පවත්නා කල්හි ශ්‍රද්ධාව බලවත්වේ, කුමක් හෙයින්දයත්? ශ්‍රද්ධාව රාගයට ආසන්න ගුණ ඇති බැවිනි, එහෙයින් ශ්‍රද්ධාචරිතයා රාගචරිතයාට සමාන වෙයි. ඉරියව් වශයෙන් වනාහී රාගචරිත පුද්ගලතෙම පියවි ගම නින් යන්නේ සෙමින් සමව පාතැබීමද සමව පාතැගීම හා ලීලා වට යැමද කරයි, මැද කීම නොවදින පා ඇත්තේ වෙයි. හමදින විට මනාව මූස්න අල්ලාගෙන යුහුසුළු නොව වැලි නොවිසුරුවමින් නිකමල් ඇති රියක් අතුරන්නාසේ පිරිසිදුව හමදී, ආහාර ගැණීමේදී සිනිඳු මිහිරි ආහාරයට ප්‍රියවෙයි, අනුභව කරන්නේද ඉතා මහත් නොකොට වටකොට බත්පිඩගෙණ රස විඳිමින් යුහුනොව අනුභව කරයි, කිසි මිහිරි දෙයක් ලැබ සතුටුවෙයි, මදකුදු සිත් කළුවූ රූපයක් දැක විසම්තවූවාක් මෙන් බොහෝ වේලාවක් බලා සිටියි, මද ගුණයෙහිදු ඇලෙන්නේ දෝෂය නොගණියි. ඇති දොස් වසන මායාවය, නැතිගුණ පහලකරණ සාඨෙය්‍යය, මානය, මහිච්ඡතාය, ලදදෙයින් සතුටු නොවීමය, චපල බවය යනාදී සවභාවයෝ බහුලව පවතිත්. මේ සතලිස් කම්සථාන අතුරින් රාග චරිතයානට දශ අසුභ කම්සථානයෝද කායගතාසතියද යන එකොළොස අනුකූල වෙත්.

ද්වේෂ චරිත පුද්ගලයාගේ කුසල් සිතක් පවත්නා කල්හි ප්‍රඥාව
බලවත් වෙයි, කුමක් හෙයිනයත්? ප්‍රඥාව ද්වේෂයට ආසන්නවූ
ගුණ ඇති හෙයිනි, එහෙයින් ද්වේෂචරිත පුද්ගලයාහට බුද්ධිචරිත
පුද්ගලතෙමේ සමානවේ, ද්වේෂචරිත පුද්ගලතෙම පතුල් අගින්
බිම කණින්නක්හු මෙන්යයි වහාම බිම පයතබයි, වහාම නගා
ගණියි, පා බිමතබනකල ඇද තබයි, ගමදිනවිට තරයේ මුස්න
ගෙණ පුහුපුළුවූයේ දෙපාශ්වයෙහි වැලිනගමින් කෲරගතින් ගම
දියි, රළු ඇඹුල් ආහාර කැමැත්තේ වෙයි, අනුභව කරන්නේද
මුවපුරා බත්පිඩ ගෙණ රසවිඳීමක් නොමැතිව අනුභව කරයි, අමි
හිරක් ලැබුනවිට දෞම්නස පහලකරයි, මදකුදු අමනොඥ රූපයක්
දූක වෙදයව පැමිණියක්හු මෙන් බොහෝ වේලාවක් නොබලයි,
මද දෝෂයෙක්හිදු ගැවෙයි, ඇති ගුණයද නොදනියි, යන්නේද
ඒ රූපය මුදනු කැමැතිව අපෙක්ෂා රහිතවයෙයි, ක්‍රොධය බද්ධ
වෛරය, අනුන් ගුණ මැකීමය, අනුන්ගේ ගුණ හිස්කොට කථා
කිරීමය, ඊර්ෂ්‍යාවය, මසුරුබවය යනාදී ස්වභාවයෝ බහුලව පවතිත්
ද්වේෂ චරිතයාහට සතරබ්‍රහ්මවිහාරයෝද වර්ණ කසිණ සතරද යන
අට අනුකූලවෙත්.

නූපන්නාවූ කුසල් ඉපදවීමට වෑයම් කරන්නාවූ මෝහචරිත
යාහට බොහෝ සෙයින් ඊට අනතරාය කරන්නාවූ විතර්කයෝ උප
දිත්, කුමක් හෙයිනයත්? විතර්කයත්, මෝහයත් ආසන්න ලක්ෂණ
ඇතිහෙයිනි, එහෙයින් මෝහචරිතයාහට විතර්කචරිත පුද්ගල
තෙමේ සමානවෙයි. මොහචරිත පුද්ගලතෙම කැලඹුනු ගතියෙන්
යයි තැතිගත් අයකුමෙන් පා තැබීමද, නැගීමද කරයි, විලුඹින් හා
අක් පතුලින් වහා පාදය එසවෙයි, ගමදිනවිට ලිහිල්කොට මුස්න
අල්වාගෙණ වැලි පෙරල පෙරලා වැලි හා කසල අලලමින් අපිරි
සිදුව විෂමව ගමදියි, මොහචරිත පුද්ගලයාහට අසවල් දෑ රුචියයි
නියම නැත. අනුභව කරන්නේද බත්පිඩ වටනොකොට කුඩා
කොට ගෙණ භාජනයෙහිත් දමමින් මුහුනෙහිත් තවරමින් වික්
ෂිප්ත සිත්ඇත්තේ ඒ ඒ දේ සලකමින් අනුභව කරයි. යම්කිසි
රූපයක් දූක අනුන් නින්දාකරන්නා අසා තෙමේත් නින්දා කෙරෙයි,
ප්‍රශංසා කරන්නා අසා තෙමේද් ප්‍රශංසා කෙරෙයි. මොහ චරිත
යාගේ කය සිත දෙක්හී මැලිබවය, නොසන්සුන් බවය, විපිළිසර
බවය, සැකය, නුනුවතින් ඒ ඒ දේ දූඩිව ගැණීමය, ගන්නාලද
මිථ්‍යාග්‍රහණය දුරුකරවනු නොහැකි බවය යනාදී සවභාවයෝ
බහුලව පවතිත්. මොහචරිතයාහට හා විතර්කචරිතයාහට එකාම
ආනාපාණ සතිය අනුකූලවෙයි.

රාගචරිතයාගේ සිටීමද දක්නවුන් සතුටුඑලවන ආකාර ඇත්
තේ වෙයි, ද්වේෂ චරිතයාගේ සිටීම කෲරආකාර ඇත්තේවෙයි,

මෝහ චරිතයාගේ සිටීම කැලඹුනු ආකාර ඇත්තේවෙයි, ඉඳීමෙහිද මේ ක්‍රමයවෙයි, නිදීමෙහි රාගචරිත පුද්ගලතෙම් හුහුසුලුනොව සමව යහන පණවා සෙමින් වැදහෙව අගපසග නොවිසිර පිහිටුවා දුටුවන් පහදින ආකාරයෙන් නිදයි. නැගිටුවනු ලබන්නේද වහා නැගිට සිටියි, සැක ඇත්තක්හු මෙන් සෙමින් ප්‍රතිවචනදෙයි, වෙෂචරිත පුද්ගලතෙමේ යන්තමකින් යහන පණවා අවසනයක් හුසේ හෙලතලද ශරීර ඇතිව මූහුන හකුළුවා ගෙණ සයනය කෙරෙයි, නැගිටුවනු ලබන්නේද වහා නැගිට කිපියාක්හුමෙන් පිළිතුරුදෙයි, මොහචරිත පුද්ගලතෙම නොමනාව යහනපණවා ඒ ඒ තැන හෙලූ අත්පා ඇත්තේ බොහෝ සෙයින් මුහුනින්හෙව නිදයි, නැගිටුවනු ලබන්නේද කෙඳිරිගාමින් සෙමින් නැගීසිටියි.

ශ්‍රද්ධා චරිතයාහට බුද්ධානුස්මෘති ධර්මානුස්මෘති සඞ්ඝානුස්මෘති ශීලානුස්මෘති, ත්‍යාගානුස්මෘති, දෙවතානුස්මෘති යන සය අනුකූල වෙත්. බුද්ධිචරිතයාහට මරණානුස්මෘති, උසමානුස්මෘති චතුර්ධාතු ව්‍යවස්ථාන ආහාරයෙහි ප්‍රතිකකූල සංඥව යන සතර අනුකූල වෙත්. සතර ආරූප්‍යයෝද පෘථිවිකසිණ, ආපොකසිණ, තෙජොකසිණ, වායොකසිණ, ආලොකකසිණ, පරිච්ඡින්නාකාශකසිණ යන මොහුද සියලු චරිතයන්හට අනුකූලවෙත්.

මෙහි රාගචරිතයාහට කියනලද ඉරියව් ආදිය වෙෂචරිතයාත් කරණු හැක්කේය. එහෙයින් මෙකියනලද ලක්ෂණ පමණකින් මේ පුද්ගලතෙම මෙබඳු චරිත ඇත්තේයයි පිරිසිඳීම දුෂ්කරය, එතකුදු උවත් මේ ක්‍රමයෙන් ඒ ඒ පුද්ගලයන්ට තම තමන්ගේ චරිත මේ මේ යයි පිරිසිඳුනු හැක්කේය. එසේ පිරිසිඳ දැන ඒ ඒ චරිතයන්ට නියමිතවූ සෙනාසනාදියද කර්මස්ථානයන්ද දැන සමාධිය වැඩිය යුතුය.

භාවනාවන් අතුරෙන් සියළු සමසතලිස් කර්මස්ථානයෙහිම පරිකර්ම භාවනාව සුදුසුය.

කසිණ භාවනාව වඩනුවන් විසින් පළමුකොට තමන්ගේ සිල් පිරිසිදුකරගත යුතුය, ඉක්බිති කසිණ මණ්ඩලයක් තනාගතයුතුය, ඒ සඳහා කාවේරි ගංගාවෙහි මැටි යොග්‍යයයි වර්ණනාකර තිබේ. වෙන යම්කිසි තැනෙක හෝ හටගත්තාවූ අරුණුවන් මැටියෙන් එක්වියත් සාඟුල් ප්‍රමාණවූ පෘථිවිකසිණ පරිකර්ම නිමිත්ත ඉදිකර ගෙණ සුදුසුවූ සෙනසුනෙක්හි පද්මාසනයෙන් වැඩහිඳ තමාගේ ජීවිතය බුදුන්ට පුද තමාගේ සමීපයෙන් වියදණ්ඩක් පමණ දුරින් ඒ කසිණ පරිකර්මනිමිත්ත තබාගත යුතුය.

පඨවිකසිණ යන්නෙහි තේරුම:- පඨවිනම් පෘථිවිය, කසිණ නම් සියල්ලය, අරුණුවන් මැටි බඟා එක්වියත් සතරඟුල් කෙමිය වක පමණව බෙරඇසක්සේ ඔපමට්ටම්කොට වටා වෙන පැහැය කින් පරිච්ඡේදකොට ගතයුතුය. එසේ සාදාගත්තාලද පෘථිවිය ඒකදේශයක්නොව මුළුල්ලම අරමුණු කළයුතු බැවින් පඨවිකසිණ යයි කියනුලැබේ. එසේ සාදාගත් කසිණමණ්ඩලය ඉදිරියෙහි තබා ගෙණ ඒ දෙසම බලමින් "පඨවි පඨවි" කියා භාවනා කරන්නේය. එවිට ඔහුගේ කසිණාරම්මණයට පරිකර්ම නිමිත්තයයිද, භාවනාවට පරිකර්ම භාවනාවයයිද කියනු ලැබේ. තවත් නම් ඇතත් ප්‍රකට හෙයින් මේ ශබ්දය එසේ භාවනා කරන්නහු කලෙක ඇස් දල්වා නිමිත්ත ග්‍රහණවශයෙන් මඩලය බලාද, කලෙක ඇසපියා යම් ආකාරයකින් ඇසදල්වා බලා නිමිත්ත ගන්නාලදද ඒ ආකාර යෙන් ආවර්ජනා කටයුතු. යම්තාක්කල් උද්ග්‍රහනිමිත්ත නූපදීද ඒතාක්කල් සියක්වරකුදු දහස්වරකුදු ඉන්වැඩිය කුදු මේ ක්‍රම යෙන් භාවනා කටයුතුය. මෙසේ බවුන් වඩන්නාවූ ඒ යෝගා වචරයා යම්කලෙක ඇසපියා සිහිකරද්ද එවිට ඇස දල්වූවිටමෙන් මනොවාරාවජ්ජන චිත්තයට හමුවේ, එකල්හි ඒ ආරම්මණයට උද් ග්‍රහනිමිත්තයයිද භාවනාවට පරිකර්ම භාවනායයිද කියනු ලැබේ. ඒ උද්ග්‍රහ නිමිත්ත උපන්තැන්සිට එහි නොහිඳිය යුත්තේය. කුමක්හෙයිනයත්? උද්ග්‍රහනිමිත්ත උපන්කල නැවතත් කසිණ මඩුල්ල ඔළ බලා භාවනා කළහොත් ප්‍රතිභාග නිමිත්ත නූපද නේය. කසිණ මඩුල්ල ලඟසිටිකවිට නොබලා සිටින්විද නොහැ කිය. එහෙයින් එහි නොහිඳ තමා වසනතැනට වැද එහිහිඳ භාවනා කටයුත්තේය. මෙසේ බවුන්වඩන ඒ යෝගාවචරයාහට නීවරණයෝ එබීයන්නාහුය. රාගාදී කෙලශයෝ යටබස්නා හුය. ශ්‍රද්ධාදී ඉඳුරන් තියුණුවීමෙන් හා අශ්‍රද්ධාදිය දුරුවීමෙන්ද විතර්කාදී කාමාවචර ධ්‍යානාඞ්ගයෝ පහලවන්නාහුය. ඔවුන්ට විරුඬ කාමච්ඡන්දාදී පාපධර්මයෝ දුරුවන්නාහුය. මෙසේ ඒ උග්ගහ නිමිත්ත අරමුණුකොට පරිකර්ම භාවනාවෙන් භාවනාකරණ කල්හි සඳපලානැගි ආලෝකයක්සේ උග්ගහනිමිත්ත පලාගෙණ මෙන් ආලෝකයක් පහලවන්නේය. එවිට ඒ ආරම්මණයට පටිභාග නිමිත්තයයිද භාවනාවට උපචාර භාවනායයිද කියනු ලැබේ. මේ භාවනාවෙන් කාමච්ඡන්දාදී නීවරණ පහවූකල්හි උපචාර සමාධිය ඇතිවේ. උපචාර ධ්‍යානයෙහි අඞ්ගයෝ ශක්තිඇත්තාහු නොවෙති එබැවින් තවදුරටත් වඩනකල්හි අරමුණ විශෙෂකොට බලන්නාවූ විතර්කවිචාර ප්‍රීතිසුඛ එකාග්‍රතා ධ්‍යානාඞ්ගයන්ගෙන් යුත් ප්‍රථම ධ්‍යානය පහල වන්නේය.

ආපොකසිණය වැඩීමෙහි දින් මෙසේ සිහිකළ යුතුය. ආපො නම් ජලය, කසිණනම් සියල්ලය, පාත්‍රයක හෝ කොණ්ඩියක හෝ පිරිසිදු වතුර මුවවිටතෙක් පුරා ගතයුතුය, වැව් පොකුණු ආදියෙහි පියවි ජලයද වරදක් නැත. එයද එකදේශයක්නොව මුළුල්ලම අරමුණු කළයුතුය.

තෙජෝකසිණය:-මෙහිද තෙජෝයනු ගින්න, කසිණනම් සියල්ලය, සිතිඳු හරඇති දර රුක්මුලකට හෝ වෙන විවේක තැනකට හෝ ගෙණගොස් දල්විය යුතුය. කලාලෙක හෝ සම්පටෙක හෝ වස්ත්‍රයක හෝ එක්වියත් සතරඟුල් පමණ වන සිදුරක්කොට එය ඉදිරියෙහි තබා සිදුරින් ඒ ගිනිදල්දෙස බැලිය යුතුයි. එහි වර්‍ණය හෝ උෂ්ණය හෝ අරමුණු නොකොට ගින්නම් අරමුණුකළ යුතුයි. ප්‍රකෘති ගින්න අරමුණුකළ යුතුද මෙසේය. මෙද එක දේශයක් නොවැ සියල්ල අරමුණු කළයුතු බැවින් තෙජෝකසිණ යයි කියනු ලැබේ.

වායොකසිණය- මෙහිද වායු නම් සුළඟය, කසිණ නම් සියල්ලය, වායුද දිට්ඨවායු ඵුට්ඨවායු යයි දෙවැදෑරම්වේ. උක්, උණ ආදී ගසෙක අග හෝ, හිසෙක කෙස් හෝ යම් වායුවකින් සැලේනම් ඒ දිට්ඨවායුය, සුළං කවුළුවකින් හෝ බිත් සිදුරෙකින් හෝ හමා යම් වායුවෙක් ඇඟ වැදගණීද ඒ ඵුට්ඨවායුය, එද සියල්ල අරමුණු කළයුතු බැවින් වායොකසිණ නම්, පඨවි ආදී මේ සතර භූත කසිණයි.

නීලකසිණය- මෙහි නීල නම් නිල්පැහැය කසිණ නම් සියල්ලය, නිලුපුල් ගින්නේරිය ආදී නිල් මල්පෙති වලින් බඳුනක් පුරා ගතයුතුය, භාජනයක මුවවිට හෝ නිල් කඩෙකින් බැන්ද යුතුය, වටාවෙන පැහැයකින් පරිච්ඡෙද කළයුතුය. මල්ගස්වල හෝ මල් අපුත්ගී ප්‍රකෘති නීලය හෝ බිත්තියෙහි එක්වියත් සතරඟුල් වට ආලෙපකළ නිල් සායම හෝ සියල්ල අරමුණු කළයුතු බැවින් නීල කසිණයයි.

නීලකසිණයට කීපරිදි කහපැහැ ගත්කල පීතකසිණයද, රත් පැහැ ගත්කල ලොහිත කසිණයද, සුදුපැහැ ගත්කල ඕදාතකසිණ යද වේ.

ආලොක කසිණය- මෙහි ආලොක නම් එළිය, කසිණ නම් සියල්ල, මෙහි එළිය යන්නෙන් බිත්ති සිදුරින් හෝ සුළං කවුළු ආදියෙන් හෝ බිමට වැටුණු සූර්‍ය්‍යාලොක චන්ද්‍රාලොක මණ්ඩල ගතයුතුය. කලයක්තුළ පහනක් දල්වා මුවවසා කලයේ පසෙක මණ්ඩලාකාර සිදුරක්කොට ඒ සිදුරින් බිත්තියටවැටෙන ආලොක මණ්ඩලය හෝ සියල්ල අරමුණු කළයුතු බැවින් ආලොක කසිණයි.

ආකාශ කසිණය– මෙහි ආකාස නම්, අහසය, කසිණ නම් සියල්ලය, මෙහි අහස යන්නෙන් භිත්ති සිදුරින් සුළං කවුළුවෙන් හෝ පෙණෙන අහස ගතයුතුය. ප්‍රතිච්ඡන්න මණ්ඩපාදියක හෝ එක්වියත් සතරඟුල් සිදුරක් කොට එයින් පෙණෙන අහස හෝ ගෙණ "ආකාසො ආකාසො" යනුවෙන් බවුන් වැඩිය යුතු.

මෙකියනලද කසිණයන් අතුරෙන් තමන්ට සුදුසු කසිණයක් වඩා පෘථිවී කසිණයෙහිදී කී පරිදි ප්‍රථම ධ්‍යානය ලබාගෙණ එය ආවජ්ජන සමාපජ්ජන අධිඨාන වුඨාන පච්චවෙක්ඛණ යන පස්වූ වශිතාවන්ගේ වශයෙන් වශයෙහි පවත්වාගත යුතුය.

ආවජ්ජන වශිතාව නම්– ධ්‍යානාඞ්ගයන් ආවර්ජනා කිරීමෙහි නොහොත් තමන් පිළිවිදි ගුණය මෙනෙහි කිරීමෙහි පොහොසත් බවයි.

සමාපජ්ජන වශිතාව නම්– ධ්‍යානයට සමවැදීමේ පොහොසත් බවයි.

අධිට්ඨාන වශිතාව නම්– භවාඞ්ග පරම්පරාව සිඳ සිතින් නියම කරගත් කල් මුලුල්ලෙහි ධ්‍යානචිත්තය ඉපදවීමෙහි පොහොසත් බවයි.

උඨාන වශිතාව නම්– සිතාගත් නියමය නොයික්මවා ධ්‍යාන යෙන් නැගීසිටීමෙහි පොහොසත් බවයි.

පච්චවෙක්ඛණ වශිතාව නම්– මතු මතු ධ්‍යානාඞ්ග ප්‍රත්‍යවේක්‍ෂා කිරීමෙහි පොහොසත් බවයි.

මෙසේ ප්‍රථමධ්‍යානයට පැමිණි යොගාවචර තෙම මේ ප්‍රථම ධ්‍යාන සමාපත්ති නොමෙර් ආසන්නවූ නීවරණ නමැති කෙලෙස් සතුරන් ඇත්තීයයි විතර්ක විචාරයන් ඖදාරික බැවින් අඞ්ග දුර්වල යයි එහි දොස් දැක ද්විතීයධ්‍යානය ශාන්තවශයෙන් මෙනෙහිකොට ප්‍රථම ධ්‍යානයෙහි ආලය දුරුකොට ද්විතීයධ්‍යානය ලැබීම පිණිස උත්සාහ කටයුතුය. එසේ ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා හට විතර්ක විචාරයෝ ඖදාරික වශයෙන් වැටහෙත්. ප්‍රීතිය සුඛය හා සිතේ එකඟ බවත් ශාන්තවශයෙන් වැටහෙයි. එවිට ඒ සඳහා "පඨවි පඨවි" යයි නැවත නැවතත් මෙනෙහිකරන්නාහට ද්විතීය ධ්‍යානය සම්පාදනය වෙයි. ඉක්බිති තව්දුරටත් බවුන් වඩන්නේ ප්‍රීතිය ඉක්මවීමෙන් උපෙක්‍ෂාව හා සිහිනුවණ ඇතිව නාම කයින් සුවවිඳිමින් බුඬාදී ආර්‍යයෝ සිහිඇත්තෙක, සැපවිහරණ ඇත්තෙ කැයි යම් ධ්‍යානයකින් යුත් පුද්ගලයකු ගැන පසසද්ද ඒ තෘතීය ධ්‍යානය ලබාගණියි. ඉක්බිති නැවතත් බවුන් වඩන්නේ කාය පිළි

බඳ සුවදුක් දෙක දුරුකිරීමෙන් හා සිත පිළිබඳ සොම්නස් දොම්නස් දෙක නැසීමෙනුත් සුවදුක් රහිතවූ උපෙක්‍ෂාවෙන් හටගත් සමාධිය හෝ පිරිසිදු බැව් ඇති චතුර්ථධ්‍යානය ලබාගනීයි.

කසිණ පිළිබඳ දීර්ඝ විස්තර ඇතත් මේ දක්වන ලද්දේ සුළු විස්තරයකි. කසිණ වඩන්නවුන් විසින් පවා පළමුකොට මෛත්‍රී විහරණයෙන් යුක්තවිය යුතුයයි උගන්වා තිබෙන හෙයින් මීළඟට මෛත්‍රී භාවනාව පිළිබඳව කරුණු සවල්පයක් දක්වන්නෙමි. මෛත්‍රී භාවනාව සීමාසම්භේදය, අනෝධිසෝ ඵරණය, ඔධිසෝ ඵරණය, දිශාඵරණයයි කොටස් සතරකින් යුක්තය.

සීමා සම්භේදය නම්- තමා මුල්කොට ඉතා ප්‍රිය පුද්ගලයන් කෙරෙහිද මධ්‍යස්ථ පුද්ගලයන් කෙරෙහිද වෛරී පුද්ගලයන් කෙරෙහිද යන මේ සතර කොටස කෙරෙහි මෛත්‍රී වැඩීමයි.

අනෝධිසෝ ඵරණය නම්- ස්ත්‍රී පුරුෂයන් වශයෙන් හෝ උත්පත්ති වශයෙන් හෝ මායිම් නොකොට වෙන් වෙන් නොකොට කරණ මෛත්‍රියයි.

ඔධිසෝඵරණය නම්- ස්ත්‍රී පුරුෂාදී වශයෙන් වෙන්කොට පතුරුවන මෛත්‍රියයි.

දිසාඵරණය නම්- දසදිසාවෙහි පැතිරීම් වශයෙන් වඩන මෛත්‍රියයි.

මෙය වඩන්නහු විසින් ද්වේෂයෙහි ආදීනවයද, ක්ෂාන්තියෙහි අනුසස්ද දතයුතුය. එමෙන් මෙත් වැඩියයුතු පුද්ගලයෝද දත යුත්තාහුය. මේ මෛත්‍රිය වනාහී අප්‍රිය පුද්ගලයා කෙරෙහිද ඉතා ප්‍රිය පුද්ගලයා කෙරෙහිද, මධ්‍යස්ථ පුද්ගලයා කෙරෙහිද වෛරී පුද්ගලයා කෙරෙහිදයි මේ සතරදෙනා කෙරෙහි පළමුකොට නො වැඩිය යුතුය. ස්ත්‍රියක් පුරුෂයකු කෙරෙහි හෝ පුරුෂයෙක් ස්ත්‍රියකු කෙරෙහි හෝ සමූහ වශයෙන් මුත් එක් අයක් නියමකොට ගෙණ නොවැඩිය යුතුය, මළ අය කෙරෙහි නොවැඩිය යුතුය, සියල්ලට පළමු තමාකෙරෙහි වැඩිය යුතුය, ඒ කෙසේදයත්?

“අහං අවෙරො හොමි, අබ්‍යාපජ්ඣො හොමි, අනීඝො හොමි සුඛී අත්තානං පරිහරාමි” යනුවෙන් මම මට සතුරු නොවීම් වශයෙන් වෛර නැත්තේ වෙමි, දොම්නස් දුරුකිරීම් වශයෙන් නිදුක් වූයේ වෙමි, නිරුපද්‍රව වූයේ වෙමි, සැප ඇත්තේ වී තමන් පෝෂණය කෙරෙමියි මෙසේ සැලකීමෙන් නැවත නැවත තමා කෙරෙහි මෙත් සිත වැඩියයුතු. ඉක්බිති තමන් සාක්ෂිකොට ගෙණ තමහට

ප්‍රියවූ ආචාර්‍ය්‍ය උපාධ්‍යාය මවුපිය ආදීන් අතුරෙන් කෙනෙකු කෙරෙහි වැඩිය යුතුය, මෙසේ මෙත් වඩන්නාහට අර්පණාසමාධිය උපදී, ඉක්බිති ඉතා ප්‍රිය සහායයන්හු කෙරෙහිද ඉක්බිති මධ්‍යස්ථයන්හු කෙරෙහිද, ඉක්බිති වෛරී පුද්ගලයන්හු කෙරෙහිද වැඩිය යුතුය. ඉදින් වෛරී පුද්ගලයා කෙරෙහි සිත එලවනවිට ක්‍රෝධය උපදීනම් එකල්හී ඉතා ප්‍රිය පුද්ගලයා කෙරෙහි හෝ මධ්‍යස්ථයකු කෙරෙහි නැවත නැවත මෛත්‍රියව සමවැද නැගීසිට නැවත නැවත ඒ වෛරී පුද්ගලයා කෙරෙහි මෛත්‍රී කරන්නහු විසින් ක්‍රෝධය දුරුකටයුතුය, මෙසේ කොපින් සතුරු කෙරෙහි මෙත් පැතිරවිය නොහැකිවේනම් තමහට මෙසේ අවවාද කටයුතුය. කොල කිපෙන පුරුෂය! බුදුරජ විසින් කියනකිහ් සොරු සියසිරුර කපනවිට ඔවුන් කෙරෙහි තමුත් සිත දූෂ්‍යකෙරේ නම් හෙතෙම මාගේ අවවාදය නොකරන්නෙනැයි වදාරණ ලද්දේ නොවේදැයි යනාදී වශයෙන් ක්‍රෝධයෙහි දෙස් සිතා සතුරු කෙරෙහි උපන් ක්‍රෝධය සංසිඳුවා ඔහු කෙරෙහිද ප්‍රියයන්හු කෙරෙහි මෙන් මෙත්සිත් වැඩිය යුතුය. මෙසේ තමන් කෙරෙහිද ප්‍රියවූවන්හු කෙරෙහිද මධ්‍යස්ථවූවන්හු කෙරෙහිද, සතුරු කෙරෙහිද, මෛත්‍රිය ඉපදවීමෙන් සීමාසම්භේද මෛත්‍රිය හෙවත් සතරදෙනා කෙරෙහිම පවත්නා මෙත් සිත එක ඉමකින් සමකටයුතුය. මෙයින් ප්‍රථම, ද්විතීය, තෘතීයධ්‍යාන උපදවාගතහැක. චතුර්ථධ්‍යානය පිණිස අනොධිසොඵරණ මෙත්තා චෙතො විමුත්තිය සහ ඔධිසොඵරණ මෙත්තා චෙතො විමුත්තියත් වැඩිය යුතුය.

අනොධිසොඵරණ මෙත්තා චෙතොවිමුත්තිය වැඩීමෙහිදී සබ්බෙ සත්තා අවේරා අව්‍යාපජ්ඣා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු, සබ්බෙපාණා අවෙරා –පෙ– පරිහරන්තු. සබ්බෙභූතා, අවෙරා –පෙ– අත්තානං පරිහරන්තු සබ්බෙ පුග්ගලා අවෙරා –පෙ– අත්තානං පරිහරන්තු, සබ්බෙ අත්තභාව පරියාපන්නා අවෙරා –පෙ– අත්තානං පරිහරන්තු යනු අනොධිසොඵරණ මෙත්තා චෙතො විමුත්තියයි. මෙහි ආකාර පසක්වූයේ සත්තා, පාණා, භූතා, පුග්ගලා, අත්තභාව පරියාපන්නා යන නාමපස වශයෙනි, මේ පසෙහිම තේරුම අවිශෙෂයෙන් සත්වයෝ යනුයි. ඊට වෙනස් අර්ථයක් නොසලකා, සකල සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා, නිදුක් වෙත්වා, නිරුපද්‍රත වෙත්වා, සැප ඇත්තාහු ආත්මය පොෂණය කෙරෙත්වායි මෙත් කටයුතුය. සෙසු පද සතරෙහිද තේරුම මෙසේම දතයුතු, මෙසේ ලිඞ්ගවශයෙන් හෝ උත්පත්ති වශයෙන් හෝ සත්වයන් ඉම් නොකොට වඩන මෛත්‍රිය අනොධිසොඵරණ චෙතොවිමුත්තියයි දතයුතුයි.

ඔධිසොඵරණ මෙත්තා චෙතොවිමුත්තිය සත්වැදෑරුම්වේ. "සබ්බා ඉත්ථියො අවෙරා අව්‍යාපජ්ඣා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු. සබ්බෙ පුරිසා අවෙරා -පෙ- අත්තානං පරිහරන්තු, සබ්බෙ අරියා අවෙරා -පෙ- අත්තානං පරිහරන්තු, සබ්බෙ අනරියා -පෙ- අත්තානං පරිහරන්තු, සබ්බෙ දෙවා අවෙරා -පෙ- අත්තානං පරිහරන්තු, සබ්බෙ මනුස්සා අවෙරා -පෙ- අත්තානං පරිහරන්තු, සබ්බෙ විනිපාතිකා අවෙරා -පෙ- අත්තානං පරිහරන්තු යනුවෙන් සියලු ස්ත්‍රීහු, වෛර නැත්තියෝ දුක්නැත්තියෝ උවදුරු නැත්තියෝ සැපඇත්තියෝ තමන් පොෂණය කෙරෙත්වා. සියලු පුරුෂයෝ, සියලු ආර්‍ය්‍යයෝ, සියලු අනාර්‍ය්‍යයෝ, සියලු දෙවියෝ, සියලු මනුෂ්‍යයෝ, සියලු අමනුෂ්‍යයෝ, සියලු විනිපාතිකයෝ, වෛරනැත්තෝ නිදුක්වූවෝ නිරුපද්‍රතවූවෝ සැපඇත්තෝ තමන් පොෂණය කෙරෙත්වායි මෙත්සිත් වැඩියයුතු. මෙහි ස්ත්‍රී පුරුෂයයි ලිඞ්ගවශයෙන්ද, ආර්‍ය්‍ය පෘථග්ජනයයි ගුණවශයෙන්ද, දිව්‍යමනුෂ්‍ය විනිපාතයයි උත්පත්ති වශයෙන්ද, සත්ආකාරයකින් සත්වයන් ඉම්කොට වඩන මෛත්‍රිය ඔධිසොඵරණ මෙත්තා චෙතොවිමුත්තියයි දතයුතුයි. මින් චතුර්ථධ්‍යානයද උපදවා මේ ප්‍රථමාදි ධ්‍යාන අතුරෙන් එක්තරා ධ්‍යානයකගේ වශයෙන් මෛත්‍රීසහගත සිතින් පූර්වාදි දශදිශාවන් අරමුණුකොට වාසයකළ හැක්කේය.

දශවැදෑරුම්වූ දිශාඵරණ මෙත්තා චෙතො විමුත්තිය නම්- පළමු අනොධිසොඵරණ මෙත්තා චෙතොවිමුත්තියෙහි දක්වනලද "සබ්බෙ සත්තා යනාදිවූ නාමපසද, ඔධිසොඵරණ මෙත්තා චෙතො විමුත්තියෙහි දක්වනලද "සබ්බා ඉත්ථියො" යනාදී සතද යන දොළොස අතුරෙන් පළමු දක්වූ සත්තා යන නාමය ගෙණ මෙහි දක්වනලද "සබ්බෙ පුරත්ථිමාය දිසාය සත්තා" සියලු පූර්වදිශාවෙහිවූ සත්වයෝ "අවෙරා අව්‍යාපජ්ඣා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු" වෛර නැත්තාහු, නිදුක්වූවාහු, නිරුපද්‍රතවූවාහු, සැප ඇත්තාහු, තමන් පොෂණය කෙරෙත්වායි යන මේ ක්‍රමයෙන් පූර්වදිශාවශයෙන්ද, එසේම පශ්චිමදිශා වශයෙන්ද, උතුරුදිශා වශයෙන්ද, දකුණුදිශා වශයෙන්ද, පූර්වානුදිශා වශයෙන්ද, පශ්චිමානුදිසා වශයෙන්ද, උතුරු අනුදිශා වශයෙන්ද, දකුණු අනුදිශා වශයෙන්ද, යටදිශා වශයෙන්ද, උඩදිශා වශයෙන්ද යොදා සැලකිය යුතුයි.

මෙහි අනොධිසොඵරණ මෙත්තා චෙතොවිමුත්තියෙහි "සබ්බෙ සත්තා අවෙරා හොන්තු" යන මේ එක් අර්පණාවකි. "අව්‍යාපජ්ඣා හොන්තු" යනුද එකකි, අනීඝා හොන්තු" යනුද එකකි, "සුඛී අත්තානං පරිහරන්තු" යනුද එකකි. එහෙයින් මේ පදයන් අතුරෙන් යම් යම් පදයක් ප්‍රකටව වැටහේ නම් ඒ ඒ පදවශයෙන්

වෙත් පැතිරවියයුතු. මෙසේ සත්තාදි පද පසෙහි එකි එකී පදයකට සතර සතර බැගින් මේ අනොධිසොඵරණ මෙත්තා චේතොවිමුක්තියෙහි අර්පණා විස්සකි. ඔධිසො ඵරණයෙහි සත්ආකාරයට එක එක වශයෙන් අර්පණා විසිඅටකි, දිශාඵරණයෙහි "සබ්බෙ පුරත්ථිමාය දිසාය සත්තා" යනාදි ක්‍රමයෙන් එකි එකී දිශාවකට විස්ස බැගින් කොට අර්පණා දෙසියයකි. "සබ්බා පුරත්ථිමාය දිසාය ඉත්ථියො" යනාදි ක්‍රමයෙන් එකි එකී දිශාවකට "අර්පණා" විසිඅටක් කොට දෙසිය අසූවක්දූයි අර්පණා සාරසිය අසූවකි, මෙසේ සියලු අර්පණා ගණනින් පන්සිය අටවිස්සකි. මෙසේ මේ අර්පණාවන් අතුරෙන් යම්කිසිවක් වශයෙන් මෙත්තා චේතො විමුක්තිය වඩා යොගාවචරතෙම. මෛත්‍රියෙහි අනුසස් වශයෙන් වදාළ "සුඛං සුපති" සුවසේ නිදයි යනාදී එකොළොස් ආනිසංසයන් ලබන්නේය.

අනික් භාවනා ගැන ලියන්ට යෑමෙන් ලිපිය දික්වන නිසා මෙයින් නවතිමි. එබැවින් සියලු දෙනාම මෙහි මුලින් දක්වනලද සමසතළිස් කර්මස්ථාන අතුරෙන් තමන්ට සුදුසු එකක් තෝරා ගෙණ නිතර භාවනාවක යෙදෙන්ට පුරුදුවිය යුතුය. මෙකල සමථවිදර්ශනාදිය ලබන්ට බැරියයි දුබල නොවිය යුතුය. හැකිපමණින් වත් භාවනාවක් නිතර වැඩීම සමාධිය ලබාගැණීමට හේතුවකි. එබැවින් සමාධීන්ද්‍රිය ඇතිකර ගැණීමෙන් ලොවි ලොවුතුරු සැප ලබන්ට උත්සාහවත්විය යුතුයි.

# පඤ්ඤින්ද්‍රිය.

කොළඹ දෙමටගොඩ ජයශෙඛරාරාමවාසී
**තලල්ලේ පණ්ඩිත ධම්මානන්ද ස්වාමීන් වහන්සේ විසිනි.**

**"තත්ථ කතමං පඤ්ඤින්ද්‍රියං? යා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණං උපලක්ඛණං පච්චුපලක්ඛණං පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරිමෙධා පරිනායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි ඉදං වුච්චති පඤ්ඤින්ද්‍රියං."**

**පින්වත්නි!**

අද අපේ ධර්මදෙශනායට නියමිත මාතෘකාව පඤ්ඤින්ද්‍රියයි. මේ කාලයතුළ හැකිනාක් එය විස්තර කොට දීමට මහත් සිදරමු. හැමකල්හි ලොකයට ධර්මය අවශ්‍යයි. ධර්මඥානයෙන් තොරව කල් පනාකරණ මනුෂ්‍යයාගේ හැඟීම් නිවැරදි නොවේ. ඔහුට සුදුසු මාර්ගයෙහි ගමන්කළ නොහැකියි, මිනිසෙකුට ඇස් අවශ්‍යයි, ඇස් නැති තැනැත්තාට මග නොමග නොපෙනේ, දෙපා ඇති බැවින් ඔහු ගමන් කරයි, ඇස් නොමැතිව තරන ගමනක් හෙයින් මගින් මෙන්ම නොමඟින්ද යන්නට සිදුවේ ඇතැම්විට කණු කටු ආදි යෙහිද හැපේ, කඳු හෙල් ආදියෙහිද වැටේ, සිදුවෙන කරදර බොහෝය, ජීවිතයට පවා සිදුවෙන හානි අපමණය, ඇස් නැතිව යන ගමන එතරම්ම අමාරුවෙන් කළයුතුවන බැවිනි.

හැමදුක් ගෙවා නිවී සැනසී ලැබියයුතු නිර්වාණ මෙන යන තෙරක් නොපෙණෙන සසර කතරෙහි ගමන්ගත් අපිදු පියවින් පෙණෙන ඇස් ඇතත් බෙහෙවින්ම දහම් ඇස් ඇත්තෝ නො වෙමු. දහම් ඇසේ පෙණුම ඇති ඇතී පමණට දුක්සහිත සසරෙහි පවා ගමණ ද පහසුය, යායුතු මඟද පැහැදිලිය, සම්පූර්ණ සැනසීමවූ නිර්වාණද ඔහුට දුරනොවේ. දහම් ඇස් නැතියනට මේ පහසුව නැතිය, යායුතු මගද නොපෙනේ, අපාය ආදීවූ මහාඅගාධ ප්‍රපාත යන්හිද වැටේ, අප අතුරෙන් කාවරෙකුට හෝ එබඳු අසරණකමක් ඇතිවූවහොත් කෙතරම් දුකක්ද? අපි ඒ අසරණකමට පත්වීමට නොකැමැත්තමෝ නම් දහම් ඇස් ලබාගැනීමට උත්සාහ දරමු.

මනුෂ්‍යයාට ධර්මය අවශ්‍යවන්නේ මේ අනාථ බැවින් මිදීමටය, අපේ ප්‍රකෘති ඇස්වලටද වඩා අපට පිහිටවන්නේ ධර්මයයි. ප්‍රකෘතිඇසින් ප්‍රයෝජන ලැබෙන්නේ එක ජීවිතයකදී පමණයි. අන්ධවීම් ආදී ආබාධ නිසා එක ජීවිතයකදීද ප්‍රයෝජන ගැනීම ඇතැම්විට දුෂ්කරය.

දහම් ඇස මෙසේ නොවේ. සසර ගමන්කරන තුරුම අපට මග- නොමග පෙන්වන්නේ අපතුළ ඇතිකරගන්නා දහම් ඇසයි. එබැවින් අපි අපේම සැපත සඳහා අන් සියල්ලටම වඩා ධර්මයට ප්‍රියකරමු. ධර්මය ඉගෙනීමට මහන්සි දරමු, උගත් ධර්මයට අනුව ජීවිතය ද සකස්කර ගනිමු, මේ සඳහාම අපේ මේ හොඳ පින්වතුන් මේ ධර්මය කෙරෙහිම සිත් මෙහෙයා බණ අසා දැහැමිව සුවපත්විය යුතුයි.

දැන් අපේ මාතෘකාව දෙසට හැරෙමු, මාතෘකාව පඤ්ඤින්ද්‍රියයයි. එහි ඇත්තේ වචන දෙකකි, පඤ්ඤා යනු එකකි, ඉන්ද්‍රිය යනු අනිකයි, අප මුලින්ම මාතෘකා පාඨයක් වශයෙන් දැක්වූයේ ඉන්ද්‍රිය විභඞ්ගයේ අභිධම්ම භාජනියෙහි එය විස්තර කොට ඇති අයුරුයි, දැන් අපි ඒ පාඨයේ අදහස කුමක්දැයි බලමු.

එහි "පඤ්ඤින්ද්‍රිය" යනු කුමක්ද? යම් ප්‍රඥාවක් තොමෝ හාත්පසින්ම නිවැරදිවූ හැඟීම් ඇත්තීද, යහපත හා අයහපත හෙවත් හොඳ නරක මේ මේ යයි වෙන් වෙන් දැනීම් ඇත්තේ එහි ලක්ෂණ මේ මේ යයි හඟීද, එම ධර්ම විෂයෙහිවූ පණ්ඩිත බව දක්ෂබව නිපුණ බව හා වෙසෙසින් එහිවූ සුදුසුබව දන්නී සිතීම් පිරික්සීම් ආදී බුද්ධි විෂයක විදර්ශනා ප්‍රඥාව ගවයෙකු යහමගෙහි යොදවන කෙවිටක් මෙන් වේනුයි පතොද නම්ද, හැමලෙසින්ම නිවැරදි හැඟීම් ඇති කෙරේනුයි පඤ්ඤා නම්ද, අධිපති වශයෙන් බෙහෙවින් බලපවත්නා බැවින් පඤ්ඤින්ද්‍රිය නම්ද, අකුශල නමැති සතුරන් විනාශකරලන බැවින් පඤ්ඤාබල නම්ද, පව් නමැති සතුරන් කපාහරනා බැවින් පඤ්ඤාසත්ථ නම්ද, අවට මැනවින් පෙනෙන මහල්සුත් පහයක් මෙන් උස්වන බැවින් පඤ්ඤාපාසාද නම්ද, දසදිගුන්ම එළිය කොට ඉතා සියුම්දේ පවා බැලියහැකි එළියක්වැනි බැවින් පඤ්ඤා ආලෝක- පඤ්ඤාඕභාස- පඤ්ඤාපජ්ජෝත නම්ද, හැමදෑයටම වඩා වටිනා බැවින් පඤ්ඤාරතන නම්දවූ අවිද්‍යා විනාසන්නාවූ ධම්විචෙකී ඒ සම්‍යක්දෘෂ්ටි තොමෝ "පඤ්ඤින්ද්‍රිය" නම් වන්නීය.

මේ දැක්වූයේ අප විසින් මාතෘකා කළ පාඨයේ කෙටි අදහසයි. මේ හැම වචනයකින්ම ප්‍රඥාවේහි ස්වභාවය හා එහි ඇති වටිනාකමත් පැහැදිලිය. දැන් අපි පඤ්ඤා- ඉන්ද්‍රිය යන මේ වචන

දෙකින් ඉන්ද්‍රිය යන්නෙහි අදහස කුමක්දැයි බලමු. අපේ ශරීරයෙහි ඇති ඇස්- කන්- නාසා- දිව- ශරීර යන මේ අවයවයනටද අපි ඉන්ද්‍රිය යයි කියමු. ඉන්ද්‍ර යනු අධිපතියායි. නරයින්ගේ හෙවත් මිනිසුන්ගේ අධිපතියාට හෙවත් රජුට නරේන්ද්‍රයයි කියති. මේ අධිපති බව හෙවත් ඉන්ද්‍රත්වය පවත්වන අවයවද ඉන්ද්‍රිය නම්. ශරීරය පිළිබඳ සම්පූර්ණ ආධිපත්‍යය පවත්වන්නේ චක්ෂුරාදී ඉන්ද්‍රියයෝයි. සිත පිළිබඳව දැඩිසේ බලපාන්නෝ සද්ධා- විරිය- සති- සමාධි- පඤ්ඤායි. ප්‍රධාන වශයෙන් පසක් නමුත් ඉන්ද්‍රිය නාමය ලබන්නෝ නම් බාවීසතින්ද්‍රියයි ඉන්ද්‍රියයෝ දෙවිස්සෙක්ම වෙති. මෙසේ ආධිපත්‍ය පවත්වන්නෝ ඉන්ද්‍රියයෝ යයි කියති.

ඉන්ද්‍රවූ තථාගතයන් වහන්සේ විසින් දෙශිත බැවිනුදු යන මේ ආදී තවත් නොයෙක් අර්ථයනුදු ඇතත් ඉන්ද්‍රියයනු කුමක්ද යන්න පිළිබඳ විස්තරය අපි මෙපමණකින් නවතමු. මීලඟට පඤ්ඤා යනු ඉන්ද්‍රිය යක්වූයේ කෙසේදැයි දතයුතුය. පඤ්ඤාවද ඇතවූයන මග ගෙනයාමේදී සම්පූර්ණ ආධිපත්‍යය දරණ ධර්මයකි. එබැවින් ප්‍රඥාවෙහිද සිත පිළිබඳව බලපාන ආධිපත්‍යයක් ඇති බැවින් පඤ්ඤින්ද්‍රිය යයි කියනු ලැබේ.

දැන් මීලඟට මේ 'පඤ්ඤා' යනු කුමක්දැයි විමසා දැනගතයුතුව තිබේ. එහිලා දතයුතු කරුණු බොහෝය, කළයුතු විස්තරය දිගය එලෙසින්ම ගැඹුරුද වන්නේය. එබැවින් හැමදෙනම සාවධානව ඒ පිළිබඳව ඕනෑකමින් සිත් යොමුකළ යුතුයි. සියළු සම්බුද්ධධර්මය ප්‍රධාන වශයෙන් කොටස් තුනකි, ඒවාට අපි සීල- සමාධි- පඤ්ඤායි කියමු. සීලය මුලයි, සමාධිය මැදයි, පඤ්ඤාව අගයි, සීල, සමාධි දෙකම අපට අවශ්‍යවන්නේ පඤ්ඤාව ලබාගැනීම සඳහායි. සීලය නම් වැඩිවශයෙන් ඇස්- කන්- නාසා- දිව- ශරීර යන මේ පසිඳුරන් හික්මවාලීමෙහිලා ප්‍රයොජනවත්ය. සමාධිය නම් සිතෙහි ඇතිවන එකඟකමයි, ඒ එකඟකමෙහි අරමුණද මෛත්‍රී ආදී කුශල චිත්තෝත්පාදයට හේතුවූවක් විය යුතුයි. එසේ ඇතිවෙන සිතේ එකඟකමට සීලය කොතරම් උපකාරදැයි සිතා බලන්න, සිත කලබලවන්නේ ඇස්- කන්- නාස- දිව- සිරුර යන මේ පසිඳුරන්ගෙන් ඇතුළට වැද්දගත් රූප- ශබ්ද- ගන්ධ- රස- ස්පර්ශ යන මේ කාමී අරමුණු නිසයි. ශීලයෙන් ඒ චක්ෂුරාදී ඉන්ද්‍රියයන් සංවරණය කරගනී, රූපාදිය නිසා කලබලයකට නොපැමිණේ. එබැවින් සිත නිශ්චලය, එකඟය, එහි කිසිඳු කලබලයෙක් නැති, ශීලය සමාධියට උපකාරවූ හැටි දැන් පැහැදිලිය.

මේ එකඟවූ සිත හෙවත් සමාධිය නොමැති නම් ප්‍රඥාව කෙසේවත් නොලැබේ. සිත මඩ බොර ආදියෙන් කැලැත්වූ අපිරිසිදු

ජලයක් මෙනි. එහි කැලැත්වීම නම් චංචලකමයි, මඩ බොර ආදිය නම් රූපාදී කාම වස්තූයි, අප මේ හිත නැමැති කැලැත් ජලය පහ දවාගත යුතුයි, කිලිටි ජලය ශුද්ධකරගැනීමට ඉඟිනිඇට දමයි, එයින් මඩ බොර යටගැසේ, ජලය පිරිසිදුවේ.

මේ සිත නමැති ජලයෙහි චංචලබවයත්, මඩ බොර ගතියත් නැතිවීමට ශීලය නමැති ඉඟිනිඇට දැමියයුතුයි. ශීලයෙන් සංවර ණයවූ විට රූප- ශබ්ද ආදී මඩ- බොර යටගැසේ, වැටීතිබෙන රූපාදී මඩ බොර යටගැසෙන අතර අමුතුවෙන් රූපාරම්මණාදී මඩ- බොර සිත නමැති ජලයට නොවැටෙන නිසා තිබෙන රොඩු පොරොඩු යටගැසෙන අතරම ජලයද නිශ්චලවේ. එසේ නො සැලෙන පිරිසිදු පැහැදිලි හිතට සමාධියෙන් යුත් සිතයයි කියති.

ප්‍රඥාව නම් සත්‍ය දර්ශනයයි, ඇත්ත ඇතිහැටියට පෙනීමයි. මඩ බොර සහිතව කැලැත්වූ ජලයෙහි පතුළ නොපෙනේ. ඒ පතුළේ ඇති නිසරු වූ සිප්පිකටු- බෙලිකටු මේය, වටිනා රන් රුවන් මුතු මැණික් ආදිය මේයයි වෙන්කොට නො බැලිය හැකියි. මඩ යට ගැසී ජලය පැහැදුනුවිට එබඳු කරදරයෙක් නැති, ජලයෙහි නිශ්චලකමත් පැහැදීමත් නිසා ජල පතුළද පෙනේ. නිසරු වූ සිප්පිකටු බෙලිකටු ආදියද වටිනා රන්රුවන්ද සජීවී මස් කැසුබු ආදී සත්තුද මැනවින් පෙනේ. ඒවායේ සරු- නිසරුකම වටිනා- නොවටිනාකම් සිතින් තීරණය කරගත හැකිදවේ. ජලය කැලැත්ව ඇතිකල්හි අමාරුවෙන් ඕනෑකමින් ජලපතුල බැලූවත් එහි ඇතුලත ඇති දෑයෙහි පෙනුමද අමුතුය, ඇතැම්විට නිසරු සිප්පිකටු- වටිනා මුතුඇටමෙන් වෙනස්ව පෙනේ. වටිනා රන් රුවන් නොවටිනා කැටකැබිලිති වැනිවද පෙනේ. මේ විපරීත දර්ශනය සත්‍යය නොවේ. බොරුවක් හා මුලාවක්ම වන බැවිනි. මේ බොරුව හා මුලාව නිසා ඇතිවූ විපරීත දර්ශනය හුදෙක් ජලයේ කැලැත්බව නිසාම ඇතිවිය.

මඩබොර යටගැසී ජලය පැහැදුනුකල මඩ බොරවී කැලැත් ජලයෙහි පෙනුනා සේ විපරීත පෙනුමක් වැරදී දැකීමක් නැති, කැටකැබිලිති කැටකැබිලිති හැටියටත්, රන්- රුවන්- මුතුකැට ආදී වටිනාදෑය ඒ හැටියටත් ඇති ඇති පරිදි නිවැරදිව පෙනේ. ඒ දර්ශනයෙහි කිසි මුලාවක් හෝ වැරදීමක් නැත. ඇත්තේ ඇති හැටියටම පෙණෙන බැවිනි.

ප්‍රඥාවද චිත්තසමාධිය නමැති නිශ්චලවූ හා පිරිසිදු වූ ජලයේ විනිවිද පෙණෙන අවස්ථාව මෙනි. යමක් පරීක්ෂාකිරීමේදී විනිවිද පෙනෙන නිශ්චල ජලයෙන් පතුළෙහිවූ දෑය නිවැරදිව පෙනෙන්නා

සේම පරීක්ෂණයට ලක්වූ දෑයෙහි සරු නිසරුකම් හා වටිනා නොවටිනාකම් මැනවින්ම පෙනේ. එයින් පැහැදිලිවන්නේ සමාධියෙන් නොසැලෙන බවට පත් එකඟවූ නිශ්චල සිතකටම නොවරදිනසේ කරුණු- නොකරුණු- හොඳ- නරක- දහම්- නොදහම් හරිහැටි විනිශ්චය කරගැනීමේ බුද්ධිය ලැබෙන බවයි. මෙයින් නොවරදින සේ කාරණා කාරණ විනිශ්චය කරගැනීමේ බුද්ධිය ප්‍රඥාවයයි දැන් මෙහිදී පැහැදිලිව වටහා ගතයුතුයි.

එය සමාධියෙන් නිශ්චල සිතකටම ඇතිවන්නක් බැවින් සමාධිය නිසාම ඇතිවන්නක් බවද මෙනෙහි කළයුතුවේ. දැන් ප්‍රඥාව නම් නිවැරදිලෙස කරුණුනොකරුණු විනිශ්චය කරගැණීමේ බුද්ධිය බවත් සීල- සමාධි දෙකටම වඩා එය වටිනා බව හා සීලය හා සමාධිය යන දෙකම අපට උවමනා කරන්නේ ප්‍රඥාව ලබාගැනීමේ ප්‍රයොජනයම සළකා බවත් දැන් අපට පැහැදිලිය.

ප්‍රඥාව යනු කුමක්ද? නොවරදින සේ කාරණා- කාරණ විනිශ්චය කරගැනීමේ බුද්ධිය ප්‍රඥාවයයි. ඉතා කෙටි කථාවක් ලෙස පලමුවෙන් කීමි. දැනීමෙහිද කොටස් බොහෝය. එහි මේ අප විසින් කියනු ලබන ප්‍රඥාව ලෙස ගැනෙන්නේ හැමලෙසින්ම සම්පූර්ණවූ නිවැරදි හැඟීම බව මෙහිදී මතක තබාගත යුතුයි. දැන් අප කරන විස්තරයෙහිදී එය මැනවින් පැහැදිලිවේයයි සිතමු.

කාපඤ්ඤා? "කුසලචිත්ත සම්පයුත්තං විපස්සනාඤාණං පඤ්ඤා" කුශල චිත්තයන් සමග යෙදුනාවූ විදර්ශනා ඥානයට ප්‍රඥාව යයි කියති. කාමාවචර-රූපාවචර-අරූපාවචර-ලෝකෝත්තර වශයෙන් කුශල් සිත් බොහෝ වෙති. එහෙත් ඒ සිත් අතුරෙන් ශුද්ධවූ ප්‍රඥාව මිශ්‍රව ඇත්තේ ලෝකෝත්තර සිත්වල පමණී. කාමාවචරාදී අනික් කුශල් සිත්වල ප්‍රඥාව යෙදෙන්නේ සංස්කාර ලෝකයන් පිළිබඳ නිවැරදි සත්‍යය වූ අනිත්‍ය- දුඃඛ- අනාත්ම යන මේ ත්‍රිලක්ෂණයන් සිහියට නගා සිතා බලන විදර්ශනා ඥානය තදඞ්ග වශයෙන් හෝ සිත්හි පහළවෙන අවස්ථාවන්හිදී පමණකි. සාමාන්‍යයෙන් යම් යම් දේ කරගැනීමට පහළවන ඥානමාත්‍රය ප්‍රඥාව නොවන බව මෙයිනුදු පැහැදිලිය. වර්තමාන ලෝකය පරමාණුව දක්වාම දැන් ශාස්ත්‍රඥානයෙන් දියුණුය. පොළොවෙහි මෙන්ම අහසෙහි හා දිය යටද ගමන්යාමේ ක්‍රම පවා නිපදවා තිබේ. එහෙත් ඒ ඥානය ප්‍රඥාව නොවේ. තියුණු අවිද්‍යාවෙන් ප්‍රබෝධිත ඥානය ක්‍රියාකාරීවීමේ අරුම පුදුම බලයකි. එය ප්‍රඥාවෙන් නිපන් ඥානයෙහි කැලඹීමක් නැති, අසමගියක්, විප්ලවයක් හෝ ලේ වැගිරවීමක් ද නැති, නොමැරෙන්නවුන් ලෙස තාවකාලික ලෝකයම

පමණක් දැනැමින් හෝ නොදැනැමින් වචා- වඩා ගැනීමට යත්න දරන්නෝද නොවෙති. ප්‍රඥව ඇති තැන සත්‍යදර්ශනය ද ඇත. මූලාව ගිය උම්තුවගත් සිහියෙන් ශක්තිය බලයකොට ගෙන ලොව ගිනිලෑමේ අදහස් ප්‍රඥව හා මිශ්‍රවූ අදහස්හි නොවේ. ප්‍රඥාව විනිශ්චයෙහිදී මෙය තවදුරටත් පැහැදිලිවෙනවා ඇත.

කෙනට්ඨෙන පඤ්ඤා? කිනම් අර්ථයකින් ප්‍රඥවයයි කියනු ලැබේද? පජානනට්ඨෙන පඤ්ඤා; හාත්පසින්ම හැමදෙයක්ම තත්වූ පරිදි නිවැරදිලෙස දැනගනීය යන අරුතින්වූ ප්‍රජානනාර්ථයෙන් පඤ්ඤායයි කියනු ලැබේ.

පජානනය හෙවත් ප්‍රඥවෙන් දැනගැනීම නම් යම්දෙයක් පිළිබඳව එකාදේශයකින් යන්තමින් දැනීමක් නොවේ. එය සංජානන නම් වූ යන්තමින් දැනුමද විජානන නම්වූ එයට වැඩි දැනුමද ඉක්මවා හැමතතු නොවරදවා වටහාගැනීමේ ශක්තිය ඇති පජානනයෙන් ඇතිකරගන්නා බුද්ධියයි. මේ බුද්ධිය පිළිබඳ සංජානන- විජානන- පජානන තත්වයන් තේරුම් ගැනීමේ පහසුව සඳහා දැන් අපි උපමාවක් කියමු. සංජානන- විජානන- පජානන යන මේ හැඟීම් තුණ ඇතිවන්නේ සඤ්ඤා- විඤ්ඤා- පඤ්ඤා යන මේ චිත්තාවස්ථා තුණෙනි.

අපි රන්කාසියක් ගැන සිතමු. මේ රන්කාසිය පරීක්ෂාකර බලන්නෝ තිදෙනෙක් වෙති. පළමුවැන්නා නොඉඳුනු නුවණ ඇති බාල දරුවෙකි, දෙවැන්නා ගමෙහි හැදී වැඩී ගිය පුරුෂයෙකි, තෙවැන්නා නම් රන්කරුවායි. මේ තිදෙනාම පරීක්ෂා කරන්නේ එකම රන්කාසිය නමුත් ඒ පිළිබඳව තිදෙනාට පහළවෙන අදහස් වෙනස්ය, ළදරුවා රන්කාසිය බලයි, සටහනද රවුන්වූ පෙතළි එකතැයි දැනගනී, පැහැපත්ලෙස ඇති සවර්ණමය දීප්තියද හඳුනයි, එහෙත් ඔහු එය රන්ය කියා හෝ මෙතෙක් වටිය කියා හෝ නොදනී, මේ ළදරුවාගේ රන්කාසිය පිළිබඳ දැනුම සඤ්ඤා යයි කියමු. දෙවැන්නා ගැමි මිනිසායි, ඔහුට මේ රන්කාසිය ළදරුවාට මෙන් සටහන් වශයෙන් හා පාට වශයෙන් පමණක් නොව මෙය රන් කාසියක, මෙහි මෙතෙක් වටිනාකම ඇත යනාදී වැඩි තොරතුරුද සිතියහැකි, එය ළදරු හැඟීමට වඩා උසස් වුවත් සම්පූර්ණ දියුණු කල්පනාව නොවේ. එබැවින් ඒ ගැමියාගේ රන් කාසිය පිළිබඳ හැඳිනීමට "විඤ්ඤාණ" යයි කියමු. තෙවැන්නා රන්කරුවායි, ඔහු පැමිණේ. කාසිය ගෙන බලයි, ඔහුගේ හැඟීම ළදරුවා මෙන් සටහන හා පාට පමණක් ගැන නොවේ. ගැමි මිනිසාමෙන් සටහන පාට වටිනාකම හා රුවන් බව යන මේ පිත

ගැන පමණක්ද නොවේ. ඔහු මේ කාසිය පිළිබඳව ඒ දෙදෙනාටම වැඩි දැනුමක් ඇත්තෙකි, මේ රන්කාසියෙක, මේ රන් අසවල් ප්‍රදෙශයේ අසවල් ආකරයේ රන්ය, මේ කනිකරම රන්ය, නැත හොත් මෙහි මේ මේ ලෝහවර්ග මෙපමණ මෙපමණ කලවම්කොට මනා සාදගත්තෙක යනාදී රන්කාසිය පිළිබඳ දතයුතු තාක් හැම දෙයම නිවැරදිලෙස රන්කරුවා දැනගනී. මේ දැනුම ළදරුවාගේ හා ගැමියාගේ දැනුම ඉක්මගිය සම්පූර්ණ දැනුමකි. එබැවින් රන් කරුවාගේ රන්කාසිය පිළිබඳ දැනුමට "පඤ්ඤා" යයි කියති. මේ උපමාවෙන් පජානනාවූ ප්‍රඥාවෙන් ඇතිකරගන්නා දැනුම සාමාන්‍ය හැඟීමකට වඩා කොතරම් උසස් හා නිවැරදි වූවක්දැයි දැන් මෙ පින්වතුන්හට පැහැදිළි විය යුතුය.

### ප්‍රඥාව හැඳින ගැනීමට ඇති ලකුණු මොනවාද?

ධම්මසභාව පටිවෙධලක්ඛණා පඤ්ඤා; ඒ ඒ ධර්මයන්ගේ ස්වභාවය මේ මේ යයි නිවැරදිව අවබෝධවීම ප්‍රඥාවෙහි ලක්‍ෂණයයි. ප්‍රඥාවෙන් තොරව කල්පනා කිරීමෙන් කිසිදු දෑයක් හෝ ධර්මයක් පිළිබඳව හරිවැටහීමක් ඇති නොවේ. එසේ නොව යමක් පිළිබඳව නිවැරදි හරි වැටහීමක් ඇතිවේනොත් ඒ වැටහීම ඇතිවන්නේ ප්‍රඥාවෙන්යයි ඇත්ත ඇතිනැතියට වැටහීම ම හෙවත් සත්‍ය දර්ශන යම ප්‍රඥාව හැඳින ගැනීමේ ලකුණ වන්නේය.

### ප්‍රඥාවෙන් කැරෙන කෘත්‍යය (රස) කුමක්ද?

"ධම්මානං සභාව පටිච්ඡාදක මොහන්ධකාර විද්ධංසනරසා" ඒ ඒ ධර්මයන්ගේ ඇති සත්‍ය ස්වභාවය නොපෙනෙනසේ මුවහ කොට ලන මොහාන්ධකාරය විධ්වංසනය කිරීම හෙවත් වනසා දැමීම ප්‍රඥාවෙන් කෙරෙන කටයුත්තයි.

### ප්‍රඥාවෙන් වැටහීම් වශයෙන් තමාට ඇතිවෙන යහපත කුමක්ද?

"අසම්මොහ පච්චුපට්ඨානා" මුළානොවන තත්ත්වයට පත්වීමයි. හෙවත් වැටහෙන කාරණය වන්නේ මුළා නොවීමයි.

### ප්‍රඥාව ඇතිවීමට ප්‍රධාන වශයෙන් උපකාර වන්නේ කුමක්ද?

"සමාධි තස්සා පදට්ඨානං" ඒ ප්‍රඥාවගේ ඇතිවීමට ප්‍රධාන වශ යෙන්ම උපකාර වන්නේ සමාධියයි හෙවත් කුසල් සිත්හිවූ එකග තාවයි. මිනිසුන්ගේ ජීවත්වීමට මහපොළොව යම්සේ උපකාරද ප්‍රඥාවගේ පැවැත්මට සමාධියද එසේම උපකාරවේ.

## ප්‍රඥාව කී වැදෑරුම්ද?

මේ ප්‍රශ්නයෙහිදී විශේෂයක්ම සාවධානව සිතා බැලිය යුතුයි. ප්‍රඥාවෙහි ප්‍රභේද බොහෝ වෙති. ප්‍රඥාව වනාහි–

1 ධර්මස්වභාව ප්‍රතිවේධ ලක්ෂණ වශයෙන් එකක්වේ.

| | | | |
|---|---|---|---|
| 2 | i | ලෞකිය පඤ්ඤා | |
| | | ලෝකුත්තර පඤ්ඤා | |
| | ii | සාසව | පඤ්ඤා |
| | | අනාසව | ,, |
| | iii | නාම වවත්ථාන | ,, |
| | | රූප වවත්ථාන | ,, |
| | iv | සෝමනස්ස සහගත | ,, |
| | | උපෙක්ඛාසහගත | ,, |
| | v | දස්සනභූමි | ,, |
| | | භාවනාභූමි | ,, යි |

මොවුන්ගේ වශයෙන් දෙක දෙක බැගින් බෙදීගිය කොටස් පසෙකි.

| | | | |
|---|---|---|---|
| 3 | i | චින්තාමය | පඤ්ඤා |
| | | සුතමය | ,, |
| | | භාවනාමය | ,, |
| | ii | පරිත්තාරම්මණ | ,, |
| | | මහග්ගතාරම්මණ | ,, |
| | | අප්පමාණාරම්මණ | ,, |
| | iii | ආයකොසල්ල | ,, |
| | | අපායකොසල්ල | ,, |
| | | උපායකොසල්ල | ,, යි |

මොවුන්ගේ වශයෙන් තෙවැදෑරුම්වූ කොටස්ද වෙති.

| | | | |
|---|---|---|---|
| 4 | i | දුක්ඛසච්චඤ්ඤාණගත | පඤ්ඤා |
| | | සමුදයසච්චඤ්ඤාණගත | ,, |
| | | නිරෝධසච්ච ඤ්ඤාණගත | ,, |
| | | මග්ගසච්ච ඤ්ඤාණගත | ,, |
| | ii | අත්ථ පටිසම්භිදා | ,, |
| | | ධම්ම පටිසම්භිදා | ,, |
| | | නිරුත්ති පටිසම්භිදා | ,, |
| | | පටිභාණ පටිසම්භිදා | ,, යි |

මොවුන්ගේ වශයෙන් සිව්වැදෑරුම්වූ කොටස්ද වෙති. මෙසේ ප්‍රඥාවෙහි විවිධ විභාග බොහෝය. ඒවා තේරුම් ගැනීමෙහි දී ඇති වියයුතු නුවණද සියුම් විය යුතුය. අපි හැකිතාක් කොටින් තිබෙන කාලයේ පමණට ඒවා විස්තර කිරීමට බලාපොරොත්තුවෙමු.

ධර්මයන්ගේ ස්වභාවය නිවැරදිසේ අවබෝධ කරගැනීමේ ඤාණය මුලින්ම ප්‍රඥාවයයි කියනලදී. ලෞකික ලෝකෝත්තර වශයෙන් දැක්වූ ද්විවිධ ප්‍රඥාවෙහි ලෞකික කුශලකර්ම කරණයෙහිදී ලෞකික මාර්ග සම්ප්‍රයුක්තවන්නේ ලෞකික ප්‍රඥාවයි. ලෝකෝත්තරමාර්ග සම්ප්‍රයුක්තව සෝවාන් ආදී ලෝකෝත්තර සිත්හි යෙදෙන ප්‍රඥාව ලෝකෝත්තරවේ. කාමාදී ආශ්‍රවයන්ගේ අරමුණු වශයෙන් පවත්නේ සාසව පඤ්ඤායයි කියනු ලැබේ. එයද ලෞකිකය. එසේ ආශ්‍රවයන් අරමුණුකොට නැති පිරිසිදුවූ බුද්ධිය අනාසව පඤ්ඤායයි කියති. මෙද ලෝකෝත්තරය.

පඤ්චස්කන්ධයෙන් ඇසට පෙණෙන්නේ රූපයයි, එය රූපස්කන්ධය නම්. සෙසු ස්කන්ධ සතර හෙවත් වේදනා- සඤ්ඤා- සඞ්ඛාර විඤ්ඤාණ යන මොහු ඇසට නොපෙණෙන චිත්ත- චෛතසික ධර්මයෝ වෙති. එබැවින් ඒවායේ ඇත්තේ නම් පමණකි. මේ යයි අත දිගුකොට ඇසට පෙන්වියහැකි දෙයක් එහි නැත. මෙසේ ඒ වේදනාදි කඳුහතරම හඳුනා ගැනීමට ඇති නාමමාත්‍ර මුත් ඇසින් බැලියහැකි සටහන් නොමැති බැවින් නාමස්කන්ධයයි කියති.

මේ වූ පරිදි මේ නාමය- මේ රූපය මෙහි මේ මේ කොටස්ය, එහි අනිත්‍ය දුක්ඛ අනාත්මතාවන් මෙසේ මෙසේ යයි වටහාලන ප්‍රඥාව නාම වවත්ථාන පඤ්ඤා හා රූපවවත්ථාන පඤ්ඤායයි කියනු ලැබේ. කාමාවචර කුසල සිත් දෙකෙහිද සොළොස් වැදෑරුම්වූ හෝ පඤ්චකනය වශයෙන් චතුෂ්කධ්‍යානික මාර්ග චිත්තයන්හිවූ ප්‍රඥාව සෝමනස්ස සහගතය, එසේම කාමාවචර කුශලසිත් දෙක්හිද සිවුවැදෑරුම්වූ පඤ්චමධ්‍යානික මාර්ගචිත්තයන්හිද යෙදුන ප්‍රඥාව උපෙක්ඛා සහගතයයි. මෙසේ සෝමනස්ස සහගතවූ හා උපෙක්ෂා සහගතවූ ප්‍රඥාව දතයුතුය. සෝවාන් මාර්ගයෙහිදී ලැබෙන ප්‍රඥාව පළමුවෙන් නිවනපිළිබඳ ප්‍රත්‍යක්ෂාවබෝධය ඇතිවෙන තැන බැවින් දස්සනභූමිපඤ්ඤා නම්. අවශේෂ මාර්ගත්‍රයෙහි යෙදෙන ප්‍රඥාව භාවනා භූමියි, මෙලෙසින් දෙවැදෑරුම්වූ ප්‍රඥාවන් පිළිබඳව දැනගතයුතුවේ. දැන් ත්‍රිවිධ වශයෙන් දැක්වූ ප්‍රඥාවන් ගැන විමසා බලමු. එහි පළමුවෙන් දක්වන ලද්දේ චින්තාමය ප්‍රඥාවයි. එය අනුන්ගෙන් අසා හෝ වෙන ක්‍රමයකින් පිටතින් දැනගත්තක් නොව තමාගේම බුද්ධිය මෙහෙයා තමා විසින්ම නිපදවා ගන්නා ප්‍රඥාවයි. තමාගේ අදහස් වශයෙන්ම අභිනවයෙන් නිපදවා ගන්නා බැවින් එයට චින්තාමය පඤ්ඤායයි කියනු ලැබේ. මෙසේ තමාගේ බුද්ධියෙන්ම සිතා මිතා නොව නැණැතියන්ගේ කථා ඇසීමෙන් හෝ පත පොත කියවීමෙන් හෝ ඇතිකරගන්නා ප්‍රඥාව සුතමය පඤ්ඤා නම්. ඒ ඒ භාවනාවන්හි යෙදීමෙන් නිපදවා ගන්නා අර්පණාප්‍රාප්ත ප්‍රඥාව භාවනාමය පඤ්ඤායි.

මෙසේම කාමාවචර ධර්මයන් අරමුණු කොට පවත්නා ප්‍රඥාව පරිත්තාරම්මණය, රූපාවචර අරූපාවචරයන් අරමුණුකොට ඇත්තේ මහග්ගතාරම්මණය, මේ පරිත්ත මහග්ගත දෙක්හිම ලැබෙන්නේ ලෞකික විපස්සනායි, නිර්වාණ අරමුණු කොට පවත්නා ප්‍රඥාව අප්පමාණාරම්මණයයි දතයුතුවේ. එසේම අප්පමාණාරම්මණ ප්‍රඥාව ලෝකෝත්තරද වන්නේයි.

ආයකොසල්ල ප්‍රඥාව යනු අභිවෘද්ධිය ලබාගන්නේ මේ මේ අයුරින්යයි සිතන නුවණයි. එය ඇතිකර ගැනීමේ ක්‍රම දෙකකි. එනම් අනභිවෘද්ධිය පිණිස පවත්නා දෑය බැහැර කිරීම හා අභිවෘද්ධිය පිණිස පවත්නා දෑය ඇතිකර ගැනීමත්ය. අපායකොසල්ලය නම් එයට ප්‍රතිවිරුද්ධ දැනුමයි හෙවත් අනභිවෘද්ධිය ඇතිවන්නේ මෙසේය අභිවෘද්ධිය නැතිවන්නේ මෙසේයයි මැනවින් දැනගැනීමවේ.

මෙසේවූ ඇවැඩ සිදුවීමය, වැඩ සිදුනොවීමය යනාදිය සිදුවන විට ස්ථානෝචිතව තැනට සුදුසුසේ සිතාමතා එයින් ගැලවී තමාගේ දියුණුව රැකගැනීමෙහි දක්ෂබව පිළිබඳ ඥාණය උපායකොසල්ල ඥාණයයි කියනු ලැබේ. තවද තමාගේ පස්කඳ පිළිබඳව අනිත්‍යාදී වශයෙන් මෙනෙහිකිරීම අජ්ඣත්තාභිනිවේසා පඤ්ඤා නම්ද අනුන් පිළිබඳවූ පස්කඳ ගැන විදසුන් වැඩීම බහිද්ධාභිනිවේසා පඤ්ඤා නම්ද තමන්ගේත් අනුන්ගේත් යන දෙපසෙහිමවූ පඤ්චස්කන්ධයන් පිළිබඳ විදසුන් වැඩීම අජ්ඣත්ත බහිද්ධාභිනිවේසාපඤ්ඤා නම්ද වන්නීය.

චතුෂ්කනයෙහි දුක්ඛසත්‍යය අරමුණුකොට පවත්නේ දුඃඛ ඥානයයි. දුඃඛසමුදයවූ තෘෂ්ණාව පිළිබඳව පවත්නා ඥාණය දුඃඛ සමුදය ඥානයයි. නිරොධයවූ නිර්වාණ පිළිබඳව පවත්නේ නිරෝධ ඥාණයද මාර්ගයවූ ආර්‍ය්‍යාෂ්ටාංගික මාර්ගය පිළිබඳව පවත්නේ මග්ගපඤ්ඤා හෙවත් මග්ගඥාණ නම්ද වන්නේය.

මෙසේම සිව්පිළිසිඹියාවන් පිළිබඳ දැනුමද දතයුතුයි. සිව්පිළිසිඹියා නම් චතුපටිසම්භිදායි. එනම් අත්ථ- ධම්ම- නිරුත්ති- පටිභාණ යන මේ සතරයි. මේ එකක් එකක් පිළිබඳව දන්නා නුවණ අත්ථපටිසම්භිදා පඤ්ඤා ආදී වශයෙන් දතයුතුයි. එහි අත්ථපටිසම්භිදා ආදිය අපි ඉතා සැකෙවින් මෙහි විස්තර කරමු.

අත්ථ- ධම්ම- නිරුත්ති- පටිභාණ යන ධර්මචතුෂ්කය සිව්පිළිසිඹියාවෝ නම්වෙති. හෙද මනසට (සිතට) ගොචරවූ ඥාණවිශෙෂ සතරක්මය. මේ ඥාණයන් සෝවාන් ආදී මාර්ගඵලාවස්ථාවන්හිදී පවා ලැබෙන්නේ ඉතා තීක්ෂණ නුවණ ඇති උතුමන්ට පමණක්. නො එසේ නම් එය බොහෝ විටම ලබාගතහැකි වන්නේ අතීත්

ඵලයට පත්වීමෙනි. එසින්ම එම ධර්මයන්ගේ ගැඹුරුකම හා සියුම් කමත් පුහුදුන්ගේ මනසට වටහාගැනීමේ දුෂ්කරකමත් හැඟියයුතුය. නුවණ මෙහෙයා උනන්දුවෙන් විමසා බලන්නෙකුට අනුමාන ඥානයෙන් වුවද තරමක හැඟීමක් ලබාගැනීමට බැරිනොවේ. එය අවබෝධකර ගැනීමට වෙහෙසීම සිව්පිළිසිඹියාවන් සහිත අර්හත්ඵලය පසක්කර ගැනීමට බලවත් හේතුවක්ව එම පුරුද්ද උපනිශ්‍රය වශයෙන් උපකාරවන බැවින් ඕනෑකමින් ඒ ධර්ම තේරුම් ගැනීමට වෑයම් කළයුතුයි.

**අත්ථ පටිසම්භිදා**- ඵල ධර්මයන් පිළිබඳ දැනීම අත්ථපටිසම්භිදායි (අත්ථෙ ඤාණං අත්ථ පටිසම්භිදා) අත්ථ පටිසම්භිදා යනු අත්ථ නාමයෙන් හඳුන්වන ඵල ධර්මයන් පිළිබඳ දැනීම බව දතයුතුවේ. මේ අත්ථ ශබ්දයෙන් කියවෙන්නේ හේතුවක් නිසා ඇතිව පවත්නා ඵල රාශියයි.

“කිරි වලින් ගිතෙල් සෑදේ” මෙහි හේතුව කිරියි, ගිතෙල් සෑදීමට එය හේතුවූ බැවිනි, ගිතෙල් යනු ඵලයයි. කිරි නමැති හේතුව නිසා නිපන් දෙය වන බැවිනි. හේතුව හා ඵලය කෙබඳුදැයි එම උපමාවෙන් හැඟේ. හේතුවෙහි අනුසාරයෙන් ඵලය නිවැරදිසේ අවබෝධකර ගැනීමද අත්ථ නම් වේ. (=හෙතුඵලං හි යස්මා හෙතු අනුසාරෙන අරීයති, අධිගම්යති සම්පාපුණීයති තස්මා අත්ථොති වුච්චති.) ආර්යයන් වහන්සේලා ඒ අත්ථපටිසම්භිදා ඤාණ බලයෙන් අවබෝධ කරගන්නා ශ්‍රේෂ්ඨ ධර්ම පසකි. එනම්: කාම, රූප, අරූප යන තුන්ලෝකයෙහිම ඇතිවාක් හෙතු ප්‍රත්‍යයන් නිසා උපන් ඵල ධර්මද, කුශල- අකුශල විපාකද සහෙතුක- අහෙතුක ක්‍රියා සිත්ද නිර්වාණයද ශබ්දයන් නිසා පහළකරන අර්ථද යන මේ පඤ්චධර්මයෝ වෙති.

“යංකිඤ්චි පච්චයුප්පන්නං—විපාකා ච ක්‍රියා තථා
නිබ්බානං භාසිතත්ථොති—පඤ්චෙතෙ අත්ථ සඤ්ඤිතා”

මේ අත්ථ පටිසම්භිදාව පිළිබඳ දැනුම අත්ථ පටිසම්භිදා පඤ්ඤා නම්.

**ධම්මපටිසම්භිදා**- ධම්මපටිසම්භිදා නම් හේතූන් පිළිබඳ දැනුමයි. අත්ථ පටිසම්භිදාවෙන් ඵලයන්ගේ තත්වය හරිහැටි දැනගනී. ධම්මපටිසම්භිදාවෙන් හේතූන්ගේ තත්වය හරිහැටි දැනගනී. (ධම්මො'ති සඞ්ඛෙපතො පච්චයස්සෙතං අධිවචනං) ධර්මය යනු සැකෙවින් හේතු ප්‍රත්‍යයන්ට කියන නමකි. යමක්- යමක් හේතුකොට ගෙන යමක්, යමක් පවතී නම් හෝ යමකාට, යමකාට පැමිණේ නම් ඒ පැවතීමට හා පැමිණීමට හේතුවූ දෙය හෙතුප්‍රත්‍යය

වශයෙන් දතයුතුයි. (පච්චයොහි යස්මා තං තං දහති, පවත්තෙති, සම්පාපුණිතුං වා දෙති, තස්මා ධම්මොති වුච්චති) මෙසේ ආර්‍ය්‍යයන් වහන්සේලා විසින් විශේෂයෙන් අවබොධ කරගන්නා හෙතුප්‍රත්‍ය ධර්මද පසෙකි. එනම්:

කාම- රූප- අරූප යන ත්‍රෛභූමික ධර්මයන් උපදවාලන හෙතුව ද ආර්‍ය්‍යමාර්ගය ද අර්ථයට පිහිටව සිටින ශබ්දයද ඒ ඒ විපාකයන් උපදවාලන කුශලකර්ම හා අකුශලකර්ම දෙකදූයි යන මෙකී පඤ්ච ධර්මයෝයි.

("ඵලනිබ්බානතො හෙතු-අරියමග්ගො ච භාසිතං
කුසලා කුසලඤ්චෙති-පඤ්චෙතෙ ධම්ම සඤ්ඤිතා ')

නිරුත්ති පටිසම්භිදා- ශබ්දයන්ගේ නිවැරදිවූ අර්ථය ගැනීමට දන්නා නුවණ නිරුත්ති පටිසම්භිදා නම් වේ. පළමුකී අත්ථධම්ම පටිසම්භිදාවන් විස්තරකොට දක්වූ පාලිභාෂාවෙහි යම් යම් ශබ්ද සමූහයක් ඇද්ද ඒ ශබ්දයන්ගේ නොයෙක් නොයෙක් අර්ථ ඇතත් එකී ධර්ම තත්වාකාරයෙන් තේරුම් ගැනීමට, සුදුසු තැනට යොග්‍ය නියම අර්ථයම තෝරා ගැනීමට සමත් නුවණ තිබිය යුතුයි. මුලින් කී 'අත්ථ' නම්වූ පස්වැදෑරුම් ඵල විෂයෙහිද ධර්ම නම්වූ පස්වැදෑරුම් හෙතු විෂය යෙහිද විස්තර ප්‍රකාශිත ශබ්දයන්ගේ තැනට සුදුසු නියම් අර්ථය ගැනීමෙහි ප්‍රභෙදගත ඥානය නිරුත්ති පටිසම්භිදා නම් වේ.

("තස්මිං අත්ථෙ ච ධම්මෙ ච යා සභාව නිරුත්තිතු
නිරුත්ති තිච නිද්දිට්ඨා-නිරුත්ති කුසලෙනසා")

පටිභාණ පටිසම්භිදා- පටිභාණ නම් වැටහීමයි. යටකී අත්ථ, ධම්ම, නිරුත්ති යන තුන් ඥානය අරමුණු කොට ගෙන පිරික්සා බලන්නහුට අත්ථපටිසම්භිදා මෙතෙක්ය, ධම්මපටිසම්භිදා මෙතෙක් ය එය ප්‍රකාශිත වචනයන්ගේ අර්ථගැනීමේ ක්‍රම නම්වූ නිරුත්ති පටිසම්භිදා මෙතෙක් යයි ඥතා පැහැදිලිව නුවණට වැටහේ නම් එය පටිභාණ පටිසම්භිදායි.

(ඤාණෙසු ඤාණං පටිභාණ පටිසම්භිදා)

("ඤාණමාරම්මණං කත්වා-තිවිධං පච්චවෙක්ඛතො
තීසු ඤාණෙසු යං ඤාණං-පටිභාණන්ති තං මතං")

මෙ මේ සිවුපිළිසිඹියාවින් පිළිබඳ දැනීම ශ්‍රේෂ්ඨ ප්‍රඥාවයි.

ප්‍රඥාව කෙසේ වැඩිය යුතුද?

ඛන්ධ, ධාතු, ආයතන, ඉන්ද්‍රිය, සච්ච, පටිච්චසමුප්පාදාදී භේද ගත ධර්මයෝ මේ ප්‍රඥාවෙහි ප්‍රතිෂ්ඨාව හෙවත් භූමියයි. ප්‍රඥාව පිහිටන්නේ එම ධර්මයන් ඇතිකල්හිම වන බැවිනි. ශීලවිශුද්ධිය හා චිත්තවිශුද්ධිය ප්‍රඥාවෙහි මූලයි. දිට්ඨිවිසුද්ධිය කඞ්ඛාවිතරණ විසුද්ධිය මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධිය, පටිපදාඤාණදස්සන විසුද්ධිය, ඤාණදස්සන විසුද්ධිය යන මේ පඤ්ච විශුද්ධීහු ප්‍රඥාවෙහි ශරීරය වෙති, මෙසේ හෙයින් ප්‍රඥාවෙහි පිහිටීමට භූමිය වැනි ඛන්ධාදී ධර්ම ඉගෙන ප්‍රඥා නමැති ගසේ මුල් වැනි විවිධ විශුද්ධීන් දැන ප්‍රඥාගසේ මහ කඳ වැනිවූ පඤ්ච විශුද්ධීන්ද අවබෝධ කිරීමෙන් ප්‍රඥාව වැඩිය යුතුයි. මෙහි විස්තර විභාග බොහෝ බැවින් හා අපට නියමිත කාලයෙහි එතරම් ගැඹුරු ධර්ම රැසක් විස්තර කිරීමෙහි අමාරුකම නිසාත් ඒවා පිළිබඳව මෙහිදී මීට වැඩියමක් කිරීමට ඉඩ නොලැබේ. විස්තර කැමතියන් විසින් ධර්මධරයන් වෙතින් හෝ දහම්පොත් කියවීමෙන් හෝ දතයුතුයි.

දැන් මෙතෙක් දක්වූ කරුණු වලින් කන් අයුරින් හෙදහීන් නව පවත්නා ප්‍රඥාව නම් ධර්ම ස්වභාවය හරිහැටි හඳුනාගන්නා තත්වඥානය බව සිහිකළ යුතුයි. ලෞකිකවූ සංස්කාරයන් විෂයෙහි පරමාර්ථයට නැඹුරුව ලැබෙන තත්වඥානය හෙවත් ප්‍රඥාව වූකලි අනිත්‍ය- දුඃඛ අනාත්ම සංඛ්‍යාත සත්‍යයන් ගෙන් තොරව පහළ නොවන්නකි. සංස්කාරයන් අනිත්‍ය- දුඃඛ- අනාත්ම ලක්ෂණයන් හා නිරතුරුම එකාබද්ධ බැවිනි. මේ තරම් එකීභාවයකින් හෙවත් කිට්ටු සබඳකමකින් සතරදම් (සංස්කාරධර්ම) ඇසුරු කරන තිලකුණු (අනිත්‍ය- දුඃඛ- අනාත්ම) ලෞකිකවූ දැය ගැන සිතීමේදී කෙනෙකුට නොපෙනෙතොත් ඔහුට හරි වැටහීම හෙවත් තත්වඥානය හෝ ප්‍රඥාව නොමැතියයි නිගමනය කළයුතුය. මක්නිසාද? සංස්කාර ධර්මයන් පිළිබඳ එකාබද්ධව ඇති අනිත්‍ය- දුඃඛ- අනාත්මතාවන් එසේ ඇති කල්හිත් ඇති සැටියට නොපෙනුන බැවිනි.

යමෙකුට මෙසේ සංස්කාර ධර්මයන් පිළිබඳව අනිත්‍ය- දුඃඛ- අනාත්ම වශයෙන් පවත්නා තත්වඥානය ඇතිවන්නම ඔහුගේ ප්‍රඥාව වද තියුණුවේ. සත්‍යදර්ශනය ඇතිවන්නේ ප්‍රඥාවෙන්ම වන බැවිනි. මේ කී කරුණු අනුව ත්‍රිලක්ෂණ ඥානයම උත්කෘෂ්ට ප්‍රඥාව ලෙස සැලකිය යුතුයි. ලෞකික දෙය ගැන පුහුදුන් ජනයාගේ සාමාන්‍ය හැඟීම තත්වඥානයෙන් හෙවත් ප්‍රඥාවෙන් තොරය. එබැවින් ඔව්හු සංස්කාරයන්ගේ තත්වය අනිත්‍ය- දුංඛ-අනාත්මතාවන් බව සත්‍ය යම පවතිද්දීම විපරීත දර්ශන වශයෙන් තත්වඥානයවූ ප්‍රඥාවෙන් තොරව මේවායේ වෙහෙස්වීමක් ඇත. වෙහෙස්වෙන සුළු නිසාම කිසිදු සැපතක් නැති දුකක. දුක්නිසාම එය තමාගේ යයි සිතිය නොහැක යන මේ සත්‍යයන් අමතක කරති.

නිත්‍යදේ ලෙස සිතමින් සැපහැටියට පතමින් තමාගේ යසි බඳුගනිති. මේ වැරදි කල්පනාව තත්ත්වඥානයෙන් තොරය, ප්‍රඥා විරහිතය, ඒ අදහසින් නිපදවන ශනානු සූත්‍ර ආදී පූදම දෙසින් හෝ වේවා. ධන- නිල- බල ආදියෙන් හෝ වේවා, සැපතක් ඔහුට නැති. ලෝකයටම බැඳී ආශාවෙන් කරන දුය බැවින් සංසාර විමුක්තියද බොහෝ දුරය. ලෝකයේ ඇතිවන නාස් තෘෂ්ණාව මුල්කොට නැගී පවත්නා භයානක සටන් ජාති- ගොත්‍ර- රාෂ්ට්‍රාන්තර ආදී වශයෙන් නැගී ආ භේද-අසමාදාන ආදී හැමෙක කටම මූල මේ සත්‍ය දර්ශයෙන් හෙවත් ප්‍රඥාවෙන් තොරව කල්පනා කිරීම බව දැන් පැහැදිලිවිය යුතුය.

මේ තත්ත්වඥානය හෙවත් දියුණුවූ විදර්ශනාව පිළිවෙළින් අවස්ථා නවයකදී නවමහා විදර්ශනා නාමයෙන් දක්වයි.

එනම්:
1 උදයව්‍යය ඥානය
2 භංග ,,
3 භය ,,
4 ආදීනව ,,
5 නිබ්බිදා ඥානය
6 මුඤ්චිතුකාම්‍යතා ,,
7 පටිසංඛ්‍යාන ,,
8 සඞ්ඛාරුපෙක්ඛා ,,
9 අනුලෝම ඥානය යන මොවුන්ගේ වශයෙනි.

උදයව්‍යය ඥාණය:- සියලු සංස්කාර ධර්මයන් අනිත්‍යාදී තිල කුණට නගා මෙනෙහි කරණහුට උපදනා සංස්කාරයන්ගේ ඇතිවීම හා නැතිවීම දක්නා නුවණයි.

භඞ්ග ඥාණය:- දියමතුපිට නැගි-නැගී බිඳි-බිඳී යන දිය බුබුලු මෙන් සංස්කාරයෝ වහ- වහා බිඳීයන්නාහයි සංස්කාරයන්ගේ භඞ්ගය හෙවත් බිඳීම දක්නා නුවණයි.

භය ඥාණය:- සියලු සංස්කාරයෝ බිඳෙත්- බිඳෙත් යී දක්නා හට කාම- රූප-අරූප යන තුන්භවය පිළිබඳ හැමදූය ජීවත්වෙනු කැමති බියසුළු පුරුෂයෙකුට සිංහ- ව්‍යාඝ්‍ර- යක්ෂ- රාක්ෂසාදීන් මෙන් භය වශයෙන් වැටහෙන නුවණයි.

ආදීනව ඥාණය:-භයඥානය පුරුදු කරන්නාහට සියළු සංස්කාර ධර්මයන් විෂ මිශ්‍ර භොජනාදියක් මෙන් උපද්‍රවාකාරයෙන් වැටහෙන නුවණයි.

නිබ්බිදා ඥාණය:-විත්‍රකූට පර්වතයෙහි වාසයකරන ස්වර්ණහංස රාජයෙකු සැඬොල්ගම්දොර අපවිත්‍ර ගවර වළෙහි ඇලී නොවසන් නාසේ ආදීනව වශයෙන් දුටු සංස්කාරයන් විෂයෙහි නිර්වේද (කලකිරීම) වශයෙන් පවත්නා නුවණයි.

මුඤ්චිතුකම්‍යතා ඤාණය:- දැලබැඳි මසෙකු හෝ සර්පමුඛයට පැමිණි මඩුවෙකු මෙන් නිර්වේදයට පැමිණි සංස්කාරයන්ගෙන් මිදෙන්නට කැමති ලෙසින් පැවති නුවණයි.

පටිසඞ්ඛානු ඤාණය:- සර්පයෙකු අතින් ගත් පුරුෂයෙකු ඉන් මිදීමට උපාය සොයන්නාක් මෙන් සංස්කාරයන් ගෙන් මිදීමට උපාය වශයෙන් ඔවුන් පිළිබඳ අනිත්‍යාදී ලක්ෂණයන් නැවත නැවතත් මෙනෙහි කිරීම් වශයෙන් පැවති නුවණයි.

සඞ්ඛාරුපෙක්ඛා ඤාණය:- ගින්නට දැමූ කුකුළු පියාපතක් ආපසු හැරකැවෙනු විනා ගිනිදෙසට නොයනු මෙන් නැවත නැවතත් අනිත්‍යාදි වශයෙන් නුවණින් සැලකූ සංස්කාරයන් කෙරෙහි භීතිය හා ඇල්ම දුරුකිරීම් වශයෙන් මැදහත් ලෙසින් දක්නා නුවණයි.

අනුලෝම ඤාණය:- අධිකරණ නායකයන් අටදෙනෙකු කළ යුක්ත විනිශ්චයක් අසා ඡන්දාදියෙන් අගතියට නොගොස් මැදහත්වූ අධිකරණ නායකයන් අටදෙනාටද පූර්ව රජධර්මයටද අනුකූලව විනිශ්චය කළපරිදි ඉතා මැනවැයි අභිමත කරණ ධාර්මික රජෙකුමෙන් යටකී උදයව්‍යය ඤාණාදී අටවැදෑරුම් විදසුන් නුවණටද මතු ලැබියයුතු සත්තිස්බොධිපාක්ෂික ධර්මයන්ටද අනුකූලව පවත්නා නුවණයි.

මෙසේ පැවති ඤාණයන් පිළිබඳ අවබොධය ඇත්තෝ ධර්මෞජස් ප්‍රඥාවෙන් යුක්තයෝයයිද විදර්ශනා ප්‍රඥාවෙහි කෙළපැමිණියෝයයිද පටිපදාඤාණදර්ශනය කුළුගැන්වූවෝයයිද යෙති. ඔවුන්ගේම පඤ්ඤින්ද්‍රියය මුහුකුරු ගියේයයිද මෙනෙහිකළ යුතුයි. එසේ මුහුකුරුගිය පඤ්ඤින්ද්‍රිය හේතුවෙන්ම ඤාණදර්ශන විශුද්ධියෙන් පරමවිශුද්ධත්වයවූ අර්හත්වයද පසක් කරති

දැන් මෙසේ වඩා දියුණුකරගත් ප්‍රඥාවෙහි අනුසස් මොනවාදැයි බලමු. ප්‍රඥා භාවනාව වනාහි නොයෙක් අනුසස් ඇත්තකි. එහි මෙපමණ අනුසස් ඇතැයි බොහෝ කලක් කියා හෝ විස්තර කිරීම පහසුනැත. සංක්ෂිප්ත වශයෙන් එහි අනුසස් මෙසේ දක්වයි.

1 නානා කිලෙස විද්ධංසනං--නන් අයුරින් සිත්හි පවත්නා කෙලෙස් නටබුන්කොටලීමෙහි ශක්තිය ප්‍රඥාවෙහි තිබේ.

2 අරියඵල රසානුභවනං-- ප්‍රඥාව මැනවින් වඩන තැනැත්තේ ලෞකික වශයෙන් ලැබියහැකි හැම දියුණුව ලබා සොවාන් ආදී මාර්ගඵල පසක්කිරීම් වශයෙන් ශාන්ත සැපයටද පත්වේ.

3 නිරෝධසමාපත්ති සමාපජ්ජන සමත්ථතා- නිරෝධසමාපත්තියට සමවැදීමෙහි හැකිකම් ඇත්තෙක් වේ. එනම් අනුපූර්ව නිරෝධ වශයෙන් චිත්තචෛතසික ධර්මයන්ගේ නොපැවැත්ම හෙවත් අෂ්ටසමාපත්තිලාභීව අනාගාමිබවට හෝ රහත්බවට පත් උතුමන්ගේ ලෞකික ධර්මයන් කෙරෙන් චිත්තචෛතසික ධර්මයන් වෙන්කොට නිවන කෙරෙහිම රදවා විසීමයි. මේ සමවතට සම වැදීම පුහුදුන්ට හෝ සෝවාන්- සකෘදාගාමීන්ට හෝ, සුක්ඛවිපස්සක නයින් අනාගාමි හෝ රහත්බවට පත් උතුමන්වද කළ නොහැකියි.

4 ආහුනෙය්‍ය භාවාදිසිද්ධි- දෙවියන් සහිත ලෝකයාගේ අසහාය පූජ්‍යත්වයට සුදුසු ආහුණෙය්‍යතාදි ගුණ ලබාදීමෙහිද ප්‍රඥව සමත්වේ.

මෙසේ අනුසස් ඇති ප්‍රඥව දියුණුකොට හැමදෙනාම
නිවන්සුව පසක් කෙරෙත්වා!

# ස ධා බ ල ය.

මොරටුවේ ඉදිබැද්දේ සුධර්මරත්නාරාමාධිපති අතිගරු ආභිධම්මික
මොරටුවේ ශ්‍රී ශාසනධජ මහාස්ථවිර ස්වාමිපාදයන්
වහන්සේ විසින් පවත්වනලද ධර්මදෙශනාව.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

**තත්ථ කතමං සද්ධාබලං? යා සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදො සද්ධා සද්ධින්ද්‍රියං සද්ධාබලං, ඉදං වුච්චති සද්ධා බලං.**

ශ්‍රද්ධාවන්ත සත්පුරුෂ භවතුනි! සිරි අරියවංස ගුණානුස්මරණ සභාව මගින් පවත්වාගෙන යනු ලබන සත්තිස්බොධිපාක්ෂික ධර්ම දෙශනා පුණ්‍යකාමීයන්ට ඇතුළත් "ශ්‍රද්ධාබලය" යන්න මාතෘකා කොට ධර්මදෙශනා කිරීම අද අපට පැවරී තිබේ. ධර්ම මාතෘකාව විස්තර කිරීමට ප්‍රථම මේ පුණ්‍යායතනය පිළිබඳව වචන ස්වල්පයක් කීම අප යුතුකමබැව් පෙණේ.

මීට දෙවර්ෂයකට කලින් අපවත්වී වදාළ "සිරි ඤාණාභිවංස ධම්මාධාර වංසපාල විනයාලඞ්කාර මොරටුවේ සිරි අරියවංස මහාස්ථවිර ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ගුණානුස්මරණය කොට පුණ්‍යානුමෝදනාත්මක මෙවැනි උසස් ප්‍රතිපත්තීන්හි පිහිටීම සැබවින්ම ප්‍රශංසනීයයි. අපවත්වී වදාළ අරියවංස මහාස්ථවිර ස්වාමීන්ද්‍රයන් වහන්සේ සුපේශල ශික්ෂාකාමී ධර්මගරුක උතුමෙකි. නොයෙක් පළාත්වල විහාරස්ථාන ඇතිකිරීමෙන් හා ශිෂ්‍ය දායක දායිකාවන් සුචරිත මාර්ගයෙහි යෙදවීමෙන් දිවා රෑ දෙක්හි වෙහෙස නොබලා සම්බුද්ධ ශාසනය දියුණුව සඳහා ක්‍රියාකළ වීරොදාර චරිත ශ්‍රියකින් බැබලුන නියම බුද්ධපුත්‍රයෙකි. දූරදර්ශී නුවණින් ක්‍රියාකළ උන්වහන්සේ තමන් වහන්සේගේ ඇවෑමෙන් පසුව ක්‍රියාකිරීම සඳහා උගත් ශිෂ්‍යපිරිසක්ද ඇතිකළහ. ඒ ශිෂ්‍ය මුක්තාවලියෙහි මිලකළ නොහැකි ශ්‍රෙෂ්ඨ මුතුඇටයක් තිබේ. එනම් මොරටුවේ මොරටුමුල්ලේ සුධර්මාරාමය ආදී විහාරස්ථාන පසක ආධිපත්‍යය දරණ මෙම අරියවංස ගුණානුස්මරණ සභාව ඇතුළු නොයෙක් සමිති සමාගම්හි ගරු අනුශාසකත්වය දරමින් අප්‍රතිහත ධෛර්ය්‍යයෙන් ක්‍රියාකරන අප මිත්‍ර මොරටුවේ ශ්‍රී ශාසනවංස මහාස්ථවිර පාදයන් වහන්සේය. උන්වහන්සේගේ අනුශාසනාපරිදි කටයුතු

කරන සියලුම දුගත භවතුන්ගේ ඓහලෞකික පාරලෞකික අභිවෘද්ධිය සිද්ධවෙන අතර ශාසනෝද්දීප්තියද ඇතිවෙන බැව් නොමසුරුව ප්‍රකාශ කරනු කැමැත්තෙමු.

එබැවින් ආගමට රටට දයට හිතැති සත්පුරුෂ භවතුන්ගේ උත්සාහය තවතවත් වැඩේවායි සුබපතමින් අපේ ධම්මමාතෘකාව විස්තර කිරීම සඳහා ආරම්භ කරමු.

මෙහි මුලින් සඳහන් කළ පාලිපාඨය විභඞ්ගප්‍රකරණයෙහි ඇතුලත්වූවකි. එහි සාමාන්‍ය තේරුම නම්–

ශ්‍රද්ධාබලය නම් කවරේද? යම් ඇදහීමක් වේද? බුදුන් දහම් සඟ යන තෙරුවන පිළිබඳ ගුණ විශ්වාස කිරීමක් වේද? එසේ විශ්වාසකොට බැසගැනීමක් වේද? අතිශයින් පැහැදීමක් වේද? ශ්‍රද්ධා චෛතසිකයක් වේද? ශ්‍රද්ධෙන්ද්‍රියයක් වේද? ශ්‍රද්ධාව ශක්තිය කොට ගැන්මක් වේද? එය ශ්‍රද්ධාබලයයි කියනු ලැබේ. යනුයි.

ශ්‍රද්ධා යන්නෙහි තේරුම– සද්දහන්ති, සද්ධා බුද්ධ ධම්ම සඞ්ඝ යන රත්නත්‍රය විශ්වාස කෙරේනුයි, කර්ම කර්මඵල විශ්වාස කෙරේනුයි සද්ධා නම් වේ. "සද්දහන්ති සත්තා එතායාති සද්ධා" යනු නිර්වචන හෙයින් යම් ස්වභාව ධර්මයක් කාරණකොටගෙන සත්ත්වයෝ බුද්ධ, ධර්ම, සඞ්ඝ, කර්ම, කර්මඵල යන අරමුණෙහි පහදිත්ද විශ්වාස කෙරෙත්ද ඒ ස්වභාවධර්ම තොමෝ ශ්‍රද්ධානම් වන්නීය" යනුයි. සද්ධා එව බලං= සද්ධාබලං, ශ්‍රද්ධාවම බලයකොට ශක්තිය කොට ඇත්තී සද්ධාබල නම්.

ශ්‍රද්ධාව සෝභන චෛතසිකයෙකි, එසේම සප්තාර්‍ය ධනයන්ට ඇතුළත් ආර්‍ය ධනයෙකි, එසේම දෙවිසි ඉන්ද්‍රියධර්මයන්ට ඇතුළත් ඉන්ද්‍රිය ධර්මයෙකි.

"සද්දහන ලක්ඛණා සද්ධා පසාදනරසා අකාලුසිය පච්චුපට්ඨානා සද්ධෙය්‍ය වත්ථු පදට්ඨානා" ඒ ශ්‍රද්ධාවගේ ලක්ෂණය, රත්නත්‍රය කර්ම කර්මඵල සංඛ්‍යාත ශ්‍රද්ධෙය්‍ය වස්තූන් විශ්වාස කිරීමයි. කෙලෙස් කහටගති පහකොට තමා හා යෙදෙන ධර්මයන් පැහැදවීම ශ්‍රද්ධාවගේ කෘත්‍යයයි. සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ කෙලෙස් බොර රහිතබව වැටහීම කොට ඇත්තීය. රත්නත්‍රය කර්ම කර්මඵල සංඛ්‍යාත ඇදහියයුතු වස්තූන් ආසන්න කාරණය කොට ඇත්තීය.

ශ්‍රද්ධාවගේ ප්‍රභේද නම්– ලෞකික ලෝකෝත්තර වශයෙන් ප්‍රධානකොට දෙවැදෑරුම්වේ. ලෞකික සිත්හි යෙදෙන ශ්‍රද්ධා චෛතසිකය ලෞකික නම් වේ. මාර්ගඵල සිත් සමග යෙදෙන ශ්‍රද්ධා චෛතසිකය ලෝකෝත්තර ශ්‍රද්ධා නම් වේ. 'සද්ධාබලං' යි කීතැන විශේෂයෙන් ලෝකෝත්තර ශ්‍රද්ධාවම ගැනේ.

සම්ප්‍රසාදන, සම්ප්‍රස්කන්‍දන, සද්දහන, ඔකප්පන, ආගම, අධිගම වශයෙන් සඩාකාර වේ. සම්ප්‍රසාදන ලක්‍ෂණ ශ්‍රද්ධා නම්– ස්වකීය සන්තානයෙහි හටගත් රාගාදි පව්වූවේතනා යටපත්කොට අරමුණු විෂයෙහි සිත පැහැදීම ලක්‍ෂණකොට ඇත්තී සම්ප්‍රසාදන ශ්‍රද්ධා නම් වේ. මොහොමෝ සක්විතිරජුගේ උදකප්‍රසාද මාණික්‍යය මෙන් සිත පහදවයි. සක්විති රජුගේ උදකප්‍රසාද මාණික්‍යය බොරවූ ජලයකට බහාලූකල ජලයෙහි තිබෙන දියපරඬල් සෙවෙල් මඩගති ආදිය බැහැරවී ජලය පහදවන්නේ යම්සේ නම් එසේම මේ ශ්‍රද්ධාව පහලවූ සන්තානයේ කාමච්ඡන්‍දාදි නීවරණයන්ගේ පහල වීම නැතිකොට සිත පැහැදවීම ඇතිකරයි. එවිට ප්‍රසන්න සිත් ඇත්තේ දන්දීම, සිල්රැකීම, භාවනා කිරීම කරයි.

සම්ප්‍රස්කන්‍දන ලක්‍ෂණ ශ්‍රද්ධා නම්– කුසල් කිරීම සඳහා ඉදිරියට පැනයන ස්වභාව ඇති මේ ශ්‍රද්ධාව සංග්‍රාමසූර යොධභටයෙකු හා සමානය. කිඹුල් දුතිමෝරු ආදී චණ්ඩසතුන්ගෙන් ගහණවූ ගංගාවක් වෙත පැමිණි බියසුළු පිරිසක් සතුන්ට බයේ ගඟට නොබැස බලාසිටිනවිට, කඩුවක් අතටගත් යුද්ධයෙහි දක්‍ෂ සූරභටයෙක් නොබියව මා පසුපස එව්යයි ගඟදියට බැස ඉදිරියට එන කිඹුල් දුතිමෝරු ආදී සතුන් වලක්වමින් එගොඩසිටියවුන් මෙගොඩටත් මෙගොඩ සිටියවුන් එගොඩටත් පමුණුවන්නේ යම්සේ නම් එසේම දානාදී කුසල් කිරීමට ඉඩනොදී පමාවී සිටින ලොභාදි අකුසල ධර්මයන් යටපත් කරමින් දාන සීල භාවනාදී කුසල කරන යෙහි යෙදී පෙරටුව ගමන්කරන චෛතසිකය සම්ප්‍රස්කන්‍දන ලක්‍ෂන ශ්‍රද්ධා නම් වේ.

සද්දහන ලක්‍ෂණ ශ්‍රද්ධා නම්:– බුදුන් දහම් සංඝ යන රත්නත්‍රය කෙරෙහි කිසි සැකයක් නූපදවමින් ඇදහීම ලක්‍ෂණ කොට ඇත්තී සද්දහන ලක්‍ෂණ ශ්‍රද්ධා නමි.

ආගම ශ්‍රද්ධාව නම්:– බුද්ධ පසේ බුදු මහරහත් යන ත්‍රිවිධ බොධිය පතා එන මහා බොධිසත්වයන් වහන්සේගේ සන්තානයෙහි පහලවන ශ්‍රද්ධාව ආගම ශ්‍රද්ධා නමි. කම් කම්ඵලාදිය සහ බුද්ධකාරක ධර්මයන් පිළිබඳව හවයෙන් භවයට පුරුද්දක් වශයෙන් මහාබොධි සත්වයන් වහන්සේලාගේ සන්තානයෙහි පැවතෙන යහපත් විශ්වාසය ආගම ශ්‍රද්ධාවයි.

ඔකප්පන ශ්‍රද්ධාව නම්:– රතනත්‍රය විෂයෙහි තමසිත හටගත් විශ්වාසය දෙව මාර බ්‍රහමාදී කිසිවෙකුට කිසිම ක්‍රමයකින් නොසෙල්වීය හැකිසේ ස්ථිරව පවතින ශ්‍රද්ධාව ඔකප්පන නම් වේ.

අධිගම ශ්‍රද්ධා නම්:- සතර මාර්ගයෙන් කටයුතු කෘත්‍යයන් අවසන් කොට අර්හත්වයට පැමිණි මහරහතන් වහන්සේ තමන් වහන්සේම අවබෝධ ඥානයෙන් ඇතිකරගත් රත්නත්‍රය කෙරෙහි පවතින විශ්වාසයත් කර්ම කර්මඵලාදිය ගැන විශ්වාසයත් අධිගම ශ්‍රද්ධා නම්.

මිලඟට ශ්‍රද්ධාදී ගුණධර්මයන්ගේ ආනිසංස මෙසේ දතයුතු.

“ඉධ භික්ඛවෙ භික්ඛු සද්ධාය සමන්නාගතො හොති සීලෙන -පෙ- සුතෙන- චාගෙන පඤ්ඤාය සමන්නාගතො හොති, අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ඛත්තිය මහාසාලානං සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති, සො තං චිත්තං දහති තං චිත්තං අධිට්ඨාති, තං චිත්තං භාවෙති, තස්ස තෙ සඞ්ඛාරා ච විහාරා ච එවං භාවිතා එවං බහුලීකතා තත්‍රූපපත්තියා සංවත්තන්ති.”

එහි තේරුම- මහණෙනි! යමෙක්හට ශ්‍රද්ධා ශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥා යන පංච ධර්මයෝ ඇත්ද? හෙතෙම ක්ෂත්‍රිය මහාසාර කුලයෙහි උපදිම්යි සිතුව හොත් එහි උපදී. එපමණෙක් නොවේ. බ්‍රාහ්මණ මහාසාර කුලයෙහි ගෘහපති මහාසාර කුලයෙහි චාතුර්මහාරාජික, තාවතිංස, යාම, තුෂිත, නිර්මාණරති, පරනිර්මිත වශවර්ති දෙවියන් කෙරෙහි උපදිම්යි සිතුව ඔවුන් කෙරෙහි උපදී. එම පංච ධර්මයෙහි සිට රූපාවචර ධ්‍යාන උපදවා සහශ්‍රී ලෝකධාතුව ආලෝකස්ඵරණයට සමර්ථවූ සහශ්‍ර බ්‍රහ්මයා කෙරෙහි උපදිම්යි සිතුව එහි උපදී. එපමණෙක්ද නැත. ද්විසහශ්‍රී, ත්‍රිසහශ්‍රී, චතුස්සහශ්‍රී, පංච සහශ්‍රී, දශසහශ්‍රී, ශතසහශ්‍රී ලෝකධාතුවල ආලෝකස්ඵරණයට සමර්ථවූ ශතසහශ්‍රී බ්‍රහ්මයා කෙරෙහි උපදිම්යි සිතුව එහි උපදී.

පරිත්තාභ- අප්‍රමාණාභ- ආභාස්වරයන් කෙරෙහි උපදිම්යි සිතුව ඔවුන් කෙරෙහි උපදී.

පරිත්ත සුභ- අප්‍රමාණශුභ- ශුභ කෘත්ස්නයන් බෘහත්ඵලයන් කෙරෙහි උපදිම්යි සිතුව ඔවුන් කෙරෙහි උපදී. එහෙයින්ම එම පඤ්ච ධර්මයෙහි සිට සමාපත්ති පදස්ථාන විදර්ශනා වඩා අනාගාමි ඵල ප්‍රත්‍යක්ෂකොට අවිහාදී පංච ශුද්ධාවාසතලයන් අතුරෙන් එකක උපදිම්යි සිතුව එහි උපදී. එම පංච ධර්මයෙහි සිට අරූපධ්‍යාන උපදවා ආකාසානඤ්චායතනාදී සතර අරූප භවයෙන් එක්තරා භවයක උපදිම්යි සිතුව එහි උපදී. එම පංචධර්මයෙහි සිට රහත් වෙමියි සිතුව උපරිමාර්ග භාවනාකොට ආශ්‍රවක්ෂය කිරීමෙන් රහත් වේ. ශ්‍රද්ධාබලය නිසා තුනුරුවන් කරා එළඹෙයි, එළඹ පරියුපාසනය කෙරෙයි, ළඟ ආශ්‍රයට පැමිණියේ කන් යොමුකරයි, යොමු කළ කන් ඇත්තේ ධර්මය අසා දරා පරීක්ෂාකොට විදර්ශනා වඩා පිළිපැද ලොව් ලොවුතුරු සැප සිද්ධකර ගනියි.

මට සාධක වශයෙන් මහාකප්පිණ කථාවස්තුව දක්වමු. අප භාග්‍යවත් සම්බුද්ධරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවාසය කරන සමයෙහි එක් ප්‍රත්‍යන්තයක කුක්කුටවතී නම් නුවර මහාකප්පිණ නම් රජෙක් දැහැමින් රාජ්‍යය කෙරෙති. ඒ රජහට බලය බලවාහනය, පුෂ්පය, පුෂ්පවාහනය, සුපත්තයයි අශ්වයෝ පස්දෙනෙක් වූහ. රජතෙම සුපත්ත නම් අශ්වයාපිට නැගී, අනික් අශ්වයන් ඇමතිවරුන් සතරදෙනෙකුට දී "බුදුන් දහම් සංඝ යන රත්නත්‍රය පහළවූ බවක් දූතගෙන එවුයයි සතර වාසලින් පිටත්කරයවා තෙමේද නුවර සිසාරු යොදුනක් තැන් ඇවිද සොයා බලා දිනපතා ආරංචි සොය සොයා කල්ගෙවයි.

කල්යනවිට එක්දිනක් රජතෙම අසුපිටව පැනනැගී ඇමතියන් දහස පිරිවරා උයනට යනුයේ කල්‍යාණතවූ ස්වභාව ඇති පන්සියයක් වෙළඳුන් නුවරට වදනවුන් දැක මොව්හු මාර්ගකල්‍යාණතව එති, එතානනයෙන් මොවුන්ගෙන් යහපත් අස්නක් අසමියි සිතා "තෙපි කොහි සිට එවුදැයි" විචාළේය. "දෙවයන් වහන්ස! මෙයට එක්සිය විසියොදුනකට ඔබ්බෙහි ශ්‍රාවස්ති නම් නුවරක් ඇත. එහි සිට එමුයි කීවෝය. තොපගේ දේශයෙහි එතැනි අමුතු උපන් අස්නක් ඇත්දැයි විචාළේය. දෙවයන් වහන්ස! අනික් කිසිවක් නැත. සම්‍යක් සම්බුද්ධරජතෙම උපන්සේකැයි කීවාහුය. රජ්ජුරුවෝ ඒ අස්න අසා එකෙණෙහි පස්වණක් ප්‍රීතීන් පිණාගිය සිරුර ඇතිව කිසිවක් සලකාගත නොහී මොහොතක් කල්යවා දරුවෙනි කුමක් කියවුදැයි විචාළේය. දෙවයන් වහන්ස! බුදුන් ලොව පහළවූසේකැයි කීහු. රජතෙම දෙවනුවත් තුන්වෙනුවත් එසේම කල්යවා සතරවෙනි වාරයෙහි දරුවෙනි කුමක් කියවුදැයි විචාරා දෙවයන් වහන්ස! බුදුන් උපන්සේකැයි කීකල්හි දරුවෙනි මේ වචනයට තොපට ලක්ෂයක් දෙමියි කියා අනිකුදු කිසි අස්නක් ඇත්දැයි විචාළේය. දෙවයන් වහන්ස! ඇත ධර්මය උපන්නේයයි කීහු, ඒ අසාද රජතෙම පළමුසේම තුන්වරක් කල්හැරපියා සතරවෙනි වාරයෙහි ධර්මය යන පදය කී කල්හිද මේ වචනයට තොපට ලක්ෂයක් දෙමි කියා දරුවෙනි අනික් අස්නකුත් ඇත්දැයි විචාළේය. දෙවයිනි ඇත සඞ්ඝරත්නය පහළවූයේයයි කීහු. පළමු පරිද්දෙන් තුන්වරක්ම ප්‍රීතීන් මත්ව කල්යවා සතරවෙනි වර සඞ්ඝයාය යන පදය කී කල්හි මේ පදය කීවාටද තොපට ලක්ෂයක් දෙමි කියා ඇමතියන් දහස බලා දරුවෙනි තෙපි කුමක් කරවුදැයි විචාළේය. දෙවයන් වහන්ස! නුඹ වහන්සේ කුමක් කරන සේක්දැයි විචාළාහුය, දරුවෙනි, මම බුදුන් උපන් සේක, ධර්මය උපන්නේය, සංඝයා උපන්නේය යනු අසා නැවත නොනවතිමි, බුදුන් උදෙසා ගොස්

උන්වහන්සේ ලඟ පැවිදිවෙමියි කීය. අපිදු දෙවයිනි! නුඹ වහන්සේ සමඟම පැවිදිවම්හයි කීවෝය.

රජ්ජුරුවෝ රන්පතෙක අකුරු ලියවා වෙළඳුන්ට මෙසේ කීහ, අනෝජදේවී තොපට තුන්ලක්ෂයක් දෙති, දේවිය වෙත ගොස් මෙසේ කියවූ. රජු විසින් වනාහි තොපට ඓශ්වර්‍යය හරන ලද්දේය, සිත්වූ පරිද්දෙන් සමපත් වළඳවයි කියවු. ඉදින් තොප ගෙන් අපගේ රජ්ජුරුවෝ කොහිදැයි විචාළෝ නම් බුදුන් උදෙසා පැවිදිවීමට ගිය සේකැයි කියව්. ඇමතියෝද තම තමන්ගේ භාර්‍යාවන්ට මෙසේම හසුන් යවූහ.

රජතෙමේද වෙළඳුන් හැරපියා ඇමතියන් දහස පිරිවරා එකෙණෙහිම නික්මුණාහ. අපගේ ශාස්තෲන් වහන්සේද එදවස් අලුයම් වේලෙහි ලොව බලා වදාරනසේක්, පිරිවර සහිත මහාකප්පින රජු දැක මේ මහාකප්පින රජ වෙළඳුන් ගෙන් තුණුරුවන් උපන් බව අසා ඔවුන්ගේ වචනයට තුන්ලක්ෂයකින් පුදා, රාජ්‍යය හැර ඇමතියන් දහස පිරිවරා පැවිදිවනු කැමතිව මා උදෙසා සෙට නික්මෙයි. සපිරිවරින් හෙතෙම පිළිසිඹියා හා සමග අර්හත්වයට පැමිණෙයි, ඔහට පෙරගමන් කෙරෙමියි දෙවෙනි දින කුඩා ගම් දෙටුවක්හට පෙරගමන් යන සක්විති රජක්හු මෙන් තමන් වහන්සේම පාසිවුරු ගෙන එක්සිය විසිගොදුන් මග ගෙවා පෙරගමන් කොට චන්‍ද්‍රභාගා නම් ගංතෙර නුගරුකක් මුල ෂඩ්වර්ණ ඝන බුදු රශ්මි මාලාවන් විහිදුවමින් වැඩහුන්සේක.

රජ්ජුරුවෝද එමින් එක් ගංතෙරකට පැමිණ මේ ගඟ කිනම් දැයි විචාළේය. දෙවයන් වහන්ස! අරවච්ඡා නමැයි කීහු. මෙහි ප්‍රමාණය කෙතෙක්දැයි විචාළෙව්ව, දෙවයන් වහන්ස ගැඹුරෙන් ගව්වෙක පුළුලෙන් දෙගවුවකැයි කීහු. මෙහි එතරවන්ට නැව් පඬවු ඇත්තේදැයි විචාළෙව්ව, නැතැයි කීහු. නැව් ආදිය බලා ඉන්නාවූ අප ජාතිජරාවටද, ජරාව මරණයටද පමුණුවන්නේය. මම වනාහි විමතියක් නැතිව රත්නත්‍රය උදෙසා හටගත් බලවත් ශ්‍රද්ධාවෙන් නික්මුණෙම් වෙමි. ඒ තුණුරුවන් ආනුභාවයෙන් මේ වතුර මට වතුර නොවේවයි තුණුරුවන්හි ගුණ ආවර්ජනාකොට "ඉතිපිසො භගවා අරහං සම්මා සම්බුද්ධො" යනාදීන් බුදුගුණ සිහිකරමින් අමාත්‍යයන් දහස හා දියපිටට පැණපීහ. ගල්තලක් උඩට පැන්නාක් මෙන් අශ්වයෝ පැන්නාහ, කුරඅග අග පමණක් තෙමුනාහ. මෙසේ ඒ ගඟින් එතරව ඉදිරියෙහි අනෙක් ගඟක් දැක මේ ගඟ කවරනම් ගඟක්දැයි පිළිවිසී. දෙවයන් වහන්ස! නීලවාහිනී නමැයි කීහු. මේ ගංගාමගේ ගැඹුර පුළුල කොපමණදැයි ඇසුවිට ගැඹුරෙන්ද පළලෙන්ද දෙගව්වකැයි කීහ. (සෙස්ස පෙරකී ලෙසින්

දන්නේය) ඒ ගඟින්ද "ස්වාක්ඛාතො භගවතා ධම්මො" යනාදීන් ධර්මගුණානුස්මරණය කොට පැන්නේය. පෙරකීලෙසින්ම ඒගඟින් එතරව යන්නේ අනික් ගඟක් දැක මේ ගඟ කිනම් දැයි විචාළේය. දෙවයන් වහන්ස! චන්ද්‍රභාගා නමැයි කීහු. මේ ගංගාවේ ගැඹුර පළල කොපමණදැයි විචාළවිට දෙවයන් වහන්ස! ගැඹුරෙන් හා පළලින් යොදුනකැයි කීහු. (සෙස්ස පෙරකී ලෙසින් දන්නේය.) මේ ගඞ්ගාවට "සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො" යනාදීන් සංඝ ගුණානුස්මරණය කොට පැන්නේය. ඒ ගංගාවද ඉක්මවා යන්නේ බුද්ධ ශරීරයෙන් නික්මෙන්නාවූ ෂඩ්වර්ණ ඝන බුඩරශ්මීන් දුටුවේය. තුඟරුක ශාඛාවටප පත්‍ර ස්වර්ණමය වූවාහුය. ඒ දුටු රජ තෙම මෙසේ සිතී. මේ ආලෝකය චන්ද්‍රාලෝකයකුත් නොවෙයි. සූර්‍ය්‍යාලෝකයෙකුත් නොවෙයි, දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණාදීන් අතුරෙන් එක්තරා එකෙකුගේ ආලෝකයකුත් නොවේ, තමන් වහන්සේ උදෙසා එන්නාවූ මං ඒකාන්තයෙන් ඒ ගෞතම බුදුන් විසින් දක්නා ලද්දෙයෙමියි සිතා ඒ රජතෙම එකෙණෙහිම අසුපිටින් බැස නැමී නැමී ගොස් බුඩරශ්මි අනුසාරයෙන් බුදුන්කරා එළඹ වැඳ එකත්පස්ව හුන්නේය.

ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ අනුපූර්වී කථායෙන් බණ වදාළසේක. ධර්මදේශනාවගේ කෙළවර පිරිවර සහිත රජතෙම සෝවාන් ඵලයෙහි පිහිටියේය. ඉක්බිති සියලු දෙනම හුන්තැනින් නැගිට වැඳ පැවිද්දීමට යාඥා කළාහුය. ශාස්තෘවූ බුදුරජාණන් වහන්සේ මේ කුලපුත්‍රයන්ට සෘද්ධිමය පාත්‍ර සිවුරු ලැබේද්දෝ නො ලැබෙද්දෝහෝයි දිවසින් බලා මොව්හු පසේබුදුන් දහසකට සිවුරු දහසක් දුන්හ, කාශ්‍යප බුදුන් කල විසිදහසක් භික්ෂූන්ට විසිදහසක් සිවුරු දුන්හ, එහෙයින් මොවුන්ට සෘද්ධිමය පාසිවුරු ලැබීම ආශ්චර්‍ය්‍ය නොවෙයි දැන දකුණු අත දිගුකොට "මහණෙනි මෙහි එවූ, දුක් කෙළවර කරගැනීම පිණිස මනාකොට බ්‍රහ්මචරියාවෙහි හැසිරෙවුයයි වදාළසේක. ඔවුහු එකෙණෙහිම අෂ්ටපරිෂ්කාරධාරී සියක්වස් ගිය මහතෙරුන්සේමවී අහසට නැග පසුව අහසින් බැස බුදුන් වැඳ එකත්පස්ව හුන්නාහ.

යටකී වෙළෙන්දෝද රාජකුලයට ගොස් රජහු විසින් එවනලද අස්න කියා යවා දෙවීන් වහන්සේ විසින් එන්වකී කල්හි ප්‍රවේශවව එකත්පස්ව සිටියෝය. ඉක්බිති දෙවීන් වහන්සේ, දරුවෙනි! කුමට අවුදැයි විචාළාය. රජහු විසින් අපව නුඹවහන්සේකරා එවන ලද්දෝ වෙමු. අපට කහවණු තුන්ලක්ෂයක් දුන මැනවැයි කීහු. දරුවෙනි ඉතා බොහෝ ඉල්ලන්ට තොප විසින් රජ්ජුරුවන්ට කුමක් කරණලදද? තොපව රජ්ජුරුවෝ කවර කටයුත්තකට

පැහැදුනාහු මෙපමණ ධන දෙවනසේක්දැයි විචාළාය. දෙවින් වහන්ස! අන් කිසි කථාවෙක් නැත, රජ්ජුරුවන් වහන්සේට අපි එක් අස්නක් කීම්හයි කීහු. දරුවෙනි! ඒ අස්න මටත් කියන්ට හැකිදැයි විචාරා පිළිවනැයි කීහු. දෙවීන් වහන්ස! බුදුන් ලොව උපන්හයි කීහු. දෙවියද ඒ වචනය අසා රජ්ජුසේම තුන්යලක් ප්‍රීතීන් පිනාගිය ශරීර ඇතිව කිසිවක් සලකාගත නොහී සතරවැනි වර බුදුන් යන මේ පදය අසා මීට රජ්ජුරුවන් විසින් තොපට කුමක් දෙනලද්දැයි විචාරා කහවණු ලක්‍ෂයකැයි කීකල්හි දරුවෙනි මෙබඳු දුලීභවූ අස්නක් අසා තොපට ලක්‍ෂයක් දුන් රජ විසින් සුදුස්සක් නොකරන ලද්දේය. මම තොපට මාගෙන් දුප්පත් පඬුරක් කොට කහවණු තුන්ලක්‍ෂයක් දෙමියි කියා අනික් කවර අස්නක් තොප විසින් රජ්ජුරුවන්ට කියනලද්දැයි විචාළ කල්හි මේ මේ යයි කියා අනික් අසුන් දෙකත් කීවාහුය. දේවිය! පෙර පරිද්දෙන්ම තුන්තුන්වර ප්‍රීතින් පිණාගිය ශරීර ඇතිව කිසිවක් සලකා ගත නොහී සතරවෙනි වාරයෙහි එසේම අසා තුන් තුන් ලක්‍ෂය දෙව්වාය. මෙසේ ඒ වෙලෙන්දෝ දොළොස් ලක්‍ෂයක් ලැබූහ. ඉක්බිති දේවිය වෙළඳුන් ගෙන් රජ්ජුරුවන් බුදුන් උදෙසා පැවිදි වීම සඳහා ගිය බැව් අසා දූත රාජ්‍යසම්පත් දෙවියට පැවරූබැවිද අමාත්‍ය පිරිසත් රජු සමග පැවිදිවීමට ගිය බැව්ද ඇසීමෙන් බලවත් ශ්‍රද්ධාවෙගයෙන් මඬනාලද්දුව අමාත්‍යයන්ගේ භාර්‍යාවරුන් පිරිවරාගෙන රථ දහසකින් රජ්ජුරුවන් ගිය මාර්ගයෙහිම ගොස් යටකී ගංගාවන්ගෙනුත් තුණුරුවන් ගුණ බලයෙන්ම එතරව සම්ඳුයන් වහන්සේ කරා පැමිණ සිය මහරජ්ජුරුවන් කොහිදැයි විචාරා, මෙහි හිඳිවූ මෙහි හුන්නවුන්ට රජ සහ ඇමැති පිරිස දක්ක හැකියයි වදාරා අනුපූර්වී කථායෙන් ධර්මදෙශනා කළසේක. ඒ බණ අසා අනොජා දේවිය ප්‍රමුඛ පිරිස ශ්‍රොතාපත්ති ඵලයට පැමිණියාය. මහාකප්පින සථවිරතුමා ඇතුළු පිරිස සිවුපිළිසිඹියාපත් රහත්විය. මහාකප්පින තෙරුන් ඇතුළු පිරිස නොපෙනෙනලෙස අධිෂ්ඨානකළ බැවින් ඒ දෙපිරිසම ඔවුනොවුන් දකා ගත්තේ මාර්ගාධිගමයෙන් පසුවය. යම්හෙයකින් ඔවුහු ආවේලෙහිම කාෂාය වස්ත්‍ර ධාරීව හිසමුඬුවූ තම තමන්ගේ ස්වාමීන් දුටුවාහු නම් සිත් එකග නොවන්නේය. එහෙයින්ම මාර්ගඵලාදිගම නොවන්නේය. එබැවින් ශ්‍රොතාපත්තිඵල ලැබ අචල ශ්‍රද්ධාවෙහි පිහිටි කල්හි රහත් බවට පැමිණියාවූ ඒ භික්‍ෂූන් ඔවුන්ට දක්වූසේක.

ඔවුහුද ඒ භික්‍ෂූන් දක පසගපිහිටුවා වැඳ ස්වාමීන් වහන්ස! නුඹ හන්සේලාගේ ප්‍රව්‍රජිත කෘත්‍යයන් මස්තකප්‍රාප්තවීයයිකියා ශාස්තෘවූ බුදුන් වැඳ එකත්පස්ව සිටියාහු පැවිදි ඉල්වූහ. ශාස්තෘන්

වහන්සේ ඒ උපාසිකාවරුන්ට සැවැත්නුවරට ගොස් මෙහෙණවරදී පැවිදිවවු කියා වදාළසේක. ඔවුහු අනුක්‍රමයෙන් පාගමනින්ම එක්සිය විසියොදුන් මග ගෙවා ගොස් මෙහෙණවරදී පැවිදිව අර්හත්වයට පැමිණියාහුය. මේ කථාවස්තුවෙහි ආ මහාකප්පින රජතුමා ඇතුළු අමාත්‍ය පිරිසත්, එම දේවිය වන අනෝජාව ඇතුළු මෙහෙණිකා පිරිසත් ශ්‍රද්ධාබලය නිසාම ඒසා දරුණු මුවරු කිඹුල් ආදී සතුන්ගෙන් ගඟණ ගඞ්ගාවන්ගෙන් කිසියම් පීඩාවක් නොමැතිව එතරවූ බැව් සිතා ශ්‍රද්ධා චෛතසිකය ප්‍රබල අන්දමට දියුණුකර ගන්ට උත්සාහ කටයුතුය.

ජීවමානවූ බුදුරජාණන් වහන්සේ කෙරෙහිවූ ප්‍රසාදයෙන් මහා කප්පින රජ ඇතුළු පිරිස ආනිසංසලත් බව ආශ්චර්ය නොවේ. බුදුන් පිරිනිවි කල්හි චෛත්‍යය උදෙසා ජීවිතය පරිත්‍යාගකොට සියලු ශරීරයෙහි පහන් දල්වා තුන්යම්රාත්‍රිය මුළුල්ලෙහි චෛත්‍යය ප්‍රදක්ෂිණා කරන්නාවූ මඞ්ගල නම් බෝධිසත්ත්වයන්ගේ ශරීරය නොදැවීමෙන් ලැබූ ආනිශංසය මෙයට වඩා ආශ්චර්යයි. එහි විස්තර කථාව මෙසේ දතයුතු.

මඞ්ගල බෝධිසත්ත්වයන් වහන්සේ කල්ප ලක්ෂයක් අධිකකොට සොළසාසඞ්ඛ්‍යයක් කප් මුළුල්ලෙහි පාරමිතා පුරා සසර සැරි සරන්නේ එක් බුදුකෙනෙකුන්ගේ චෛත්‍යයක් දැක මේ බුදුන්ට මාවිසින් ජීවිත පරිත්‍යාග කරන්ට වටනේයයි සිතා විලක්කුවක් වෙළන්නාසේ මුළු සිරුර තෙල්රෙදිවලින් වෙළා රියනක් පමණ ගැඹුර ඇති ලක්ෂයක් වටිනා රන්තලියක් සුවඳ ගිතෙල් පුරවා එහි වැටි දහසක් දල්වා ඒ රන්තලිය හිසැඳ තබාගෙන සියලු ශරීරය ගිනිදල්වා චෛත්‍යය ප්‍රදක්ෂිණා කරමින් රාත්‍රිය ඉක්මවූයේය. මෙසේ අරුණ නැගෙනතැන් දක්වා වීර්ය කරන්නාවූ ඒ බෝසතාණන්ගේ රෝමකූප මාත්‍රයකුදු උෂ්ණ නොගත්තේය. පියුම්ගැබක ඇතුළත වැදහුන් කලක් මෙන් ශීතලවීයයි කියා තිබේ. මේ කුමන බලයක්ද? ශ්‍රද්ධා චෛතසිකයේ බලමහිමය නොවේද?

ශ්‍රද්ධාබලය ඇතිවෙන හැටි මෙසේ සඳහන්වේ.

යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති, සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං රූපාරම්මණං වා සද්දාරම්මණං වා ගන්ධාරම්මණං වා රසාරම්මණං වා ඵොට්ඨබ්බාරම්මණං වා ධම්මාරම්මණං වා යං යං වා පනාරබ්භ තස්මිං සමයෙ ඵස්සො හොති. -පෙ- සද්ධින්ද්‍රියං හොති. -පෙ- සද්ධාබලං හොති.

මෙහි තේරුම- යම් සමයෙක්හි සොම්නස් සහගත ඤාණසම්ප්‍රයුක්තවූ කාමාවචර ප්‍රථම කුසලචිත්තය රූපයක් අරමුණුකොට

හෝ ශබ්දාලම්බනව හෝ ගන්ධාලම්බනව හෝ රසාලම්බනව හෝ ස්පර්ශාලම්බනව හෝ චෛතසික ධර්මාලම්බනව හෝ යම් යම් ඉෂ්ට අරමුණක් අරමුණුකොට උපන්නේ වේද එසමයෙහි තිකති ආදී යෙහි ස්පර්ශකරන ඉරුරැස්මෙන් අරමුණෙහි වැදගන්නා ස්පර්ශය වන්නේය. -පෙ- උදකප්‍රසාද මාණික්‍යයක් මෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් ප්‍රසන්න කිරීමෙහි ආධිපත්‍යය කරන සද්ධින්ද්‍රියය වන්නේය. අශ්‍රද්ධාවෙන් කම්පා නොවන ශ්‍රද්ධාබලය වන්නේය යනුයි.

කාමාවචර කුසල් කිරීමෙහිදී ඇතිවන කාමාවචර කුසල් සිත් සමග යෙදෙන ශ්‍රද්ධා චෛතසිකය කාමාවචරයි, රූපාවචර- අරූපාවචර- කුසල්සිත් සමග යෙදෙන ශ්‍රද්ධා චෛතසිකය- රූපාවචර අරූපාවචර- ශ්‍රද්ධා හැටියට ගණන් ගැනේ.

මාර්ගඵල සිත් සමග යෙදෙන ශ්‍රද්ධා චෛතසිකය ලෝකෝත්තර ශ්‍රද්ධායයි දත්නේය. එයම ශිඛාප්‍රාප්ත ශ්‍රද්ධාබල නමැයි දතයුතු. ශ්‍රද්ධාව උත්තම ධනයකි. "සද්ධ විත්තං" යන්නෙන් ඒබව ප්‍රකාශ වේ. ලොව හිරණ්‍ය සුවර්ණාදී ධනය ඇති තැනැත්තා ඒ ධන හේතුකොටගෙන ලෞකික තමාට උවමනා කරන සියලුම උපභෝග පරිභෝග සැප විඳියි. ක්ෂුධා පිපාසාදී දුකක් නොවිඳියි. දිළිඳුකමින් නොපෙළී සිතුඉද් කරයි, මුතු මැණික් ආදී රත්නයන් ලබාගනී, ලොකයෙහි උසස් තත්වයක් ලැබ, නැතහොත් ගණන් ගන්නා ප්‍රසිද්ධ පුද්ගල සංඛ්‍යාවට ගැනෙයි. එසේම ලෞකික ලෝකෝත්තර ශ්‍රද්ධාධනය ඇති තැනැත්තා එම ශ්‍රද්ධාධනය නිසා තෙරුවන් ගුණ සලකා කර්ම කර්මඵල විශ්වාසකොට දන්දී සිල්රක භාවනාකොට එහි විපාක වශයෙන් ලෞකිකවූද ලෝකෝත්තරවූද විපාකසැප ලබා සතුටුවෙයි. ජාති- ජරා- මරණාදී සියලු දුක් නසා අමරණීය සැප ලබාගනී. ශ්‍රද්ධා ධනයෙන් යුක්තවූ තැනැත්තා ගුණවත් හැමදෙනා ප්‍රිය කරන පූජනීය කෙනෙක් වෙයි. ශ්‍රද්ධාව නිසා සමාධිය සම්බොධ්‍යඞ්ගාදී උතුම් ආර්ය ධන ලබා ආර්ය ගුණධාරී මහරහත් බෝධියලත් උතුමෙක් වේ, නැතහොත් පසේ බුදුබව ලැබ ප්‍රත්‍යෙක බුද්ධ උතුමෙක් වේ, නැතහොත් සකලඥෙය ධර්මයන් ස්වයම්භූඥානයෙන් අවබෝධ කොට අසංඛ්‍යගණන් සංසාරගත සත්වයන් සසර බැම්මෙන් නිදහස් කොට අප්‍රමාණ දිව්‍ය බ්‍රහ්ම නරනාගාදීන්ට හිතසුව සලසා ධර්මාලෝකයෙන් ලෝකය එකාලෝක කොට සියලු බුද්ධකෘත්‍යයන් නිමවා පිරිනිවෙන තිලෝවට තිලකවූ ශාන්තිනායකවූ සර්වඥ උතුමෙක් වේ.

**සද්ධාය තරතී ඔඝං-** ශ්‍රද්ධා තොමෝ සක්කාය දෘෂ්ටි නමැති ඔඝයෙන් (සැඩ ජලපහරින්) එතරවී සොතාපත්ති මාර්ග නමැති ක්ෂෙම භූමිය කරා පමුණුවයි. ඒ කාන්තයෙන් අචල ශ්‍රද්ධාවන්ත යෙක් වේ. සුප්‍රබුද්ධ කුෂ්ඨියා මෙනි.

**සද්ධාබද්ධනි පාථෙය්‍යං-** ශ්‍රද්ධාතොමෝ සසර ගමනට මාර්ගෝප කරණ බැඳ දෙයි. ධර්මාශෝක, අජාසත්, දුටුගැමුණු, පැරකුම්බා ආදී නරපතීහු ශ්‍රද්ධා බලය නිසා අප්‍රමාණ වෙහෙර විහාර දාගැබ් ප්‍රතිමා කරවීම් ආදියෙන් ඉතිහාසය බබුළුවන තරම් ආගමික ජීවි තයේ අග්‍රස්ථානයන් ගෙන කටයුතු කළෝය. එද අපේ නරශ්‍රෙෂ් ඨයෝ කීවරක් ලංකාරාජ්‍යය රත්නත්‍රයට පිදූවෝද? කාවන්තිස්ස, භාතිය, සද්ධාතිස්ස රජවරුන්ගේ ජීවිත කථාවලින් ශ්‍රද්ධාව කොතරම් දුරට මූර්තිමත්ව පෙන්වයිද? බුද්ධකාලයේදී අජාසත් රජතුමා තරම් ශ්‍රද්ධාවන්තයෙක් පුහුදුන් ලොව සිටියේ නැත. බුදුරජාණන් වහන්සේගේ පිරිනිවීම පිළිබඳ ආරංචිය ඇසූ රජතුමා තුන්වරක් මූර්ඡාවී වැටුනෙන් පිරිසුදු ගිතෙල් ඔරුවක බස්වා සිහිය ගන්නා ලද බව කියා තිබේ. මේ ප්‍රවෘත්තීන් ගෙන් එකල ඒ රජතුමා බුදුන් කෙරේ කොතරම් ශ්‍රද්ධාවකින් ආදරයකින් සිටියේද යනු වටහා ගතහැක.

දරුණුකම නිසා "චණ්ඩාශෝක" නමින් ප්‍රසිද්ධව සිටි ඒ රජ තුමා නිග්‍රොධ සාමණේරයන් වහන්සේගේ සාමාන්‍යදර්ශන මාත්‍ර යෙන්ම පැහැදී නියම ධර්මාශෝක යන අන්වර්ථ නාමයෙන් පසුව ප්‍රකටවූයේ සම්බුද්ධ ශාසනස්ථිතිය සඳහා කරනලද වැඩ සටහන ගෙන බලන්නෙකුට පවා කොතරම් ප්‍රීතියක් ශ්‍රද්ධාවක් උපදීද කියා බලනු මැනවි. රජතුමාගේ ශ්‍රද්ධාව දියුණුවූයේ නිකම්ම නොවේ. ආරංචියෙන්ම නොවේ බුදුරජාණන් වහන්සේ පිළිබඳ ගුණසම්පත් තිය අසා පැහැද සිටිය රජහට රූපසම්පත්තිය පිළිබඳ නිසැකභාවී මක් ඇතිකරගනුවස් සිත් පහල විය. ඊට උපාය දත් රජතුමා නාරජකු ගෙන්වා නිර්මිත කරවා බලා සත්දිනක් ඇසිපිය නො හෙලා බලාගෙන සිට සේසතින් නිර්මිත බුද්ධරූපයන්ට පූජා කෙළේය. අහෝ ශ්‍රද්ධාවක බලය.

**සුඛා සද්ධා පතිට්ඨිතා-** ශ්‍රද්ධාවෙහි පිහිටියා සැප ලබාදෙයි. මට්ඨකුණ්ඩලියා බුදුන්ට කිසිවක් පූජාකළේ නැත. සිත පැහැදවීම පමණකි කළේ. එපමණකින්ම දෙව්ලොව දිව්‍යාත්මභාවයක් ලැබූ වේ ශ්‍රද්ධාව නිසා නොවේද? එකසාටක බමුණා වස්ත්‍ර පූජාකිරීමෙන් මෙලොවදීම කොතරම් ධනවත් වීද? ඒ කුමක් නිසාද? ශ්‍රද්ධාබලයේ ආනිශංසය නිසාය. පූර්ණ දසයා සැරියුත් තෙරුන්ට දනැවි

පැන් දී ස්වකීය භාර්‍යාව දුන් දානය සතුටින් අනුමෝදන්වී එම ආත්මයේදීම මහාධන සිටුතනතුරු ලැබ ඉතා උසස් ජීවිතයක් ගතකළේ ශ්‍රද්ධාබලයේ මහිමය නිසා නොවේද? මල්ලිකාව දිළිඳු කුලස්ත්‍රියකි. ඈ අප බුදුරජනන් වහන්සේට අගගලා පූජාකළාය. ඒ පිණින් මල්ලිකාව කොසොල් රජහුගේ අග්‍ර මෙහෙෂිකාබවට පැමිණියාය. මේ විධියේ නොයෙක් සාධක කථා දක්විය හැක. ඒ සියල්ලක් ලිවීමට නොවෙහෙසෙමු.

මේ ශ්‍රද්ධාවත් පිරිස ආගමික ශ්‍රද්ධාව දියුණුකර ගැනීමෙන් දුර්ලභවූ මනුෂ්‍යාත්මය සඵලකරගෙන දානසීලාදී කුශල ධර්මයන් පුරා සියලු බුදු පසේබුදු මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළ අජරමර සංඛ්‍යාත නිර්වාණ සම්පත් ලබාගැනීම සඳහා ප්‍රාප්ත භාගී වෙත්වා.

ආකාස සින්ධු වන පාදප පබ්බතට්ඨා
භූමි සිඛරූ ගිරි කන්දර සාගරට්ඨා
ඉච්චේව මාදිසු නිවාසිත භූතසෙට්ඨා
පුඤ්ඤානුමෝදථ සදෙව ගණාපහට්ඨා.

සාධු! සාධු!! සාධු!!!

නමො තස්ස සම්මා සම්බුද්ධස්ස.

කොළඹ උබයසේකරපුර අභිනවාරාමාධිපති
මොරටුවේ සිරි සාසනවංස මහාස්ථවිරයන් වහන්සේ විසින්
පැල්පොල ඉසිපතනාරාම විහාරස්ථානයේදී
දේශනාකරණලද මෙම දේශනාව ලියනලදී.

# විරිය බලය.

**කතමං තස්මිං සමයෙ විරියබලං හොති? යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො, ධිති අසිථිල පරක්කමතා අනික්ඛිත්ත ඡන්දතා අනික්ඛිත්ත ධුරතා ධුර සම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො ඉදං තස්මිං සමයෙ විරියබලං හොති.**

පින්වතුනි! මෙම අභිනව දෙමහල් ධර්මශාලාවෙහි දේශනා කරන්ට නියම විරිය බලය පිළිබඳව පැවසූ දේශනයද, දේශකයන් වහන්සේ රෝගයකින් පීඩාවිඳින නිසා ලිවීම අපවෙත පැවරුණ බැවින් අර්ථවෙකත්වය නොසලකා එය ඉටුකරලීමට කල්පනා කරමු.

විරිය බලය හොඳහැටි තේරුන් ගැණීමට උපකාරවන පරිදි ලොවුතුරු බුදුරජානන් වහන්සේ විසින් දේශනාකරණලද ධර්මපාඨයක් අපි මුලින් පැවසීමු. එය විස්තර කරදීමට ප්‍රථම ධර්මානිසංස වශයෙන් යමක් ලිවීම අවශ්‍ය නමුත් මේ දේශනා පෙළෙහි එබඳු දේ විස්තරව ඇති බැවින් ඊට ප්‍රමාදවීමට නොසිතමු. හොඳ සිහියෙන් ඇසිය යුතුවූ මෙම දහම්පෙළ නොපිරිහෙළා ඇසීමෙන් සඟමොක් සාධාගන්නාලෙස සිහිකරවමු.

මීලඟට අපි මුලින් ප්‍රකාශකළ ධර්මපාඨයෙහි අදහස තේරුන් ගන්න- "කතමං තස්මිං සමයෙ විරියබලං හොති?" විරිය බලය, යන මේ වචනය යම් වේලාවක බුදුමුවින් පිටවූවා නම්- එහිදී කී එම විරිය බලය යන්නෙහි අදහස නම් කුමක්ද?

"යො තස්මිං සමයෙ චෙතසිකො විරියාරම්භො" -පෙ- එසම යෙහි යම්බඳු චෛතසික වීර්‍ය්‍යාරම්භයක් වේද, නැතිනම්- වීර්‍ය්‍ය අරඹන චෛතසිකයක් (සිතිවිල්ලක්) වේද- කුසීතභාවය හැර නික්මීමක් වේද, පරාක්‍රමයක් වේද, නැඟීසිටීමක් වේද, වෑයමක්

වේද, උත්සාහයක්වේද, වීර්‍ය ඉසිලීමක් වේද, කතුවක්මෙන් ස්ථිර වීර්‍යයක් වේද, ධෛර්‍යයක් වේද, ලිහිල් නොවී දැඩිවම නැගීසිටි පරාක්‍රමයක් වේද, බහා නොතබා දරණ වීර්‍යයක් වේද, ගත් වෙර නොහැර ගෙනයෑමක්වේද, ගත්වෙර මොනවට ගෙණයෑමක්වේද, වීර්‍යයක් වේද, ශ්‍රෙෂ්ඨ වීර්‍යයක් වේද, වීර්‍යබලයක් වේද, යහපත් වෑයමක් වේද, මෙය එසමයෙහි ප්‍රකාශකළ වීර්‍යබලය නමැයි දතයුතුයි.

මෙසේ පරියාය (සමාන) වචන රැසකින් දක්වූ විරියබලය, කම්පාකරණ විරුද්ධ ස්වභාවය කුසීතකමයි. ඒ බව– "කොසජ්ජෙ න කම්පතීති විරියබලං" යනුවෙන් පැහැදිලිවේ. වීර්‍යය, බලයට පැමිණියේ නම්, ඔහු කුසීතබව හේතුකොට ගෙණ කම්පානොවේ. වීර්‍යය දුබල කරණ ධර්මය කුසීතකමබව තේරුන්ගත යුතුයි. කුසීතයාහට නූපන් අකුසල් උපදින බවත්, උපන්කුසල් පිරිහෙන බවත් මෙසේ දෙශනාකර තිබේ.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ කොසජ්ජං කුසීතස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති යනුවෙනි.

මෙහි අදහස– මහණෙනි! මේ කුසීත භාවය නමැති ස්වර්ග මොක්ෂ ආවරණය කරණ අන් එකම ස්වභාවයක්වත් මගේ බුදු ඇසට නොපෙනෙයි. ඒ මොන ආකාර කුසීත භාවයක්ද, යම් කුසීත (කම්මැලි) කමකින් නූපන් අකුසල් උපදීත්ද, උපන් කුසල් පිරිහෙත්ද, (විනාශවෙත්ද) එසේවන එකම ධර්මය (ස්වභාවය) කුසීතකමයි. එබඳු කුසීත ස්වභාවය යමෙකුට පිහිටා තිබේ නම්, ඔහුට නූපන් අකුසල් උපදීත්, උපන් කුසල් පිරිහෙත්යයි තේරුන් ගතයුතුයි. මෙහිදී කුසල් අකුසල් පිළිබඳව හොඳ අවබොධයක් ඇතිකරගත යුතුයි. එය දැනගැණීමට මෙම පොත් පඩක්තිය බැලීමෙන් හැකිවෙත්.

මෙකී කුසීතභාවයට ප්‍රතිවිරුද්ධවූ කුසීතභාවය මැඩලන්නාවූ කුසීතභාවයෙන් කම්පාකළ නොහැකිවූ වීර්‍යාරම්භයෙහිද බොහෝ අනුසස් ඇතිබව බුදුන් වහන්සේම මෙසේ පැවසූසේක.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ විරියාරම්භො ආරද්ධ විරියස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුශලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා ච අකුශලා ධම්මා පරිහායන්තීති යනුවෙනි.

මහණෙනි! මේ වීය\u0dcaයාරම්භය පමණ ප්‍රබල සම්පන්න ධර්මයක් මට නොපෙනෙයි. කුමක් සඳහාද? නූපන් කුසල්, වචා වඩා වශී කරගන්වත්, උපන් අකුසල් නසා, දමා වනසාලන්වත්, සමණ ධර්මය, පවත්ගත් වීර්යයගේ බලමහිමයයි, නැතිනම් වීර්යාරම්භයයි පවත්ගත් වීර්ය ඇත්තාහට නූපන් කුසල් උපදීත්, වැඩෙත්, සම්පූර්ණවෙත්. උපන් අකුසල් නැසෙත්, මැඩෙත්, වැනසෙත්, මෙලෙසින් වීර්යයගේ බලය බුදුන් වහන්සේ වර්ණනාකර තිබේ.

කුසීතභාවය දුරලීමට බොහෝකොට බොහෝ තැන්වල ගුණ කීමෙන් බුදුන් වහන්සේ අපට උගන්වා වදාළේ කුසීතභාවය නිසා සියලුම සත්වසන්තතිය දුර්භාග්‍යයට, දුර්ගතියට, පිරිහීමට, ස්වර්ග මොක්ෂාවරණයට, ප්‍රපාතයට, බසින බැවිනි. එබැවින් භාග්‍යයට සුගතියට, වැඩීමට, ස්වර්ගමොක්ෂලාභයට, උන්නතියට සතුටු සැමපින්වතුන් වීර්යාරම්භයෙන් වීර්යබලයෙන් ප්‍රබලසම්පන්න විය යුතු බව තරයේ සිත තබාගත යුතුයි.

මෙහිදී කුසීත භාවයේ ආදීනවය අවබෝධ කරගැණීමට හා වීර්යාරම්භයේ අනුසස් දැනගැණීමට නිදර්ශන (උදාහරණ) දෙකක් පෙන්වමු.

කුසීතභාවයේ දෝෂය මෙසේ සිතාගන්න! අපගේ ලොවුතුරු බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩවෙසෙමින් පස්කෙළකට අධික සැදැහැවත් පින්වතුන්ට බණකියමින් නිවන්සිරි සැධාදෙන කාලයෙහි බණ අසා පැහැදයන්නෝ මුව නොපෝනාතරම් ගුණකියමින් ප්‍රීතිවෙමින් බොහෝකොට කථා බස් කරත්. මේ අතර කාලයෙහි "කාල" නම් ගැමියෙක් බඩරැක ගැණීමට අදහස්කොට මහතාවී මෝඩපාහේ උපාසිකාවක් පහදවා ගෙණ අම්මාය කියමින් කපටි අදහසින් මව්නනතුරේ තබාගෙණ එ ගෙදරින්ම තමන්ට අවශ්‍ය ආහාරපානාදිය ලබාගණිමින් බණ භාවනාවන්හි කුසීතව අදහමින් බඩවඩා ගණිමින් වසත්. මෙසේ කල්යවන අතර මෙකියන උපාසිකාවගේ නිවසට ආසන්න අසල් වැස්සෝ බුදුබණ අසාවිත් කරණ ගුණවැනුම් සතුටින් අසා තමන්ගේ කුළුපග- කාල ස්වාමීන් වහන්සේ කරා පැමිණ- ස්වාමීනි! බුදු බණ මිහිරියයි බොහෝ දෙන බොහෝ ගුණ කියත්, මමද එබණ ටිකක් අසනු කැමැත්තෙමි. හෙටවත් බණඅහන්ට යන්ටඕනැයයි කීවාය. ඒ ඇසූ කාල ස්වාමීතෙම, හා හා උපාසිකාව, ඒ බණ ඇසීමෙන් වැඩක් නෑ යන්ට එපා යන්ට එපායයි කියා නැවැත්වූයේය. (මෙවැනි ශ්‍රමණයෝත් දිවමන් බුදුන් සමයෙහි සිටියා නම් අද බුදුන්ට එරෙහිවූ ශ්‍රමණයන්ගේ වැසීම පුදුමයක් ලෙස නොසිතන්න. සසුන් සුරකින උතුම් ශ්‍රමණයන් වහන්සේ කෙරෙහි එරෙහි

නොවන්න) දෙතුන්විටක්ම තම කාල ශ්‍රමණයන් වහන්සේගේ කන්තලව්වට බණ අසන්ට නොගොස් සිටි උපාසිකාව නොකියාම බණ අහන්ට යන්ට ඕනෑයයි සිතා දිනක් තම දුවට කථාකොට මම අද බුදුබණ අසන්ට යමි, අපේ ස්වාමින් වහන්සේ වැඩියාම හොඳට දන්දී සලකා හරුබුහුමන් කරන්නැයි පවරා බණ ඇසීමට දෙව්රම්වෙහෙරට ගොස් බුදුසිරි බලබලා සැදැහැයෙන් බණඅසන්ට වන්නීය. මේ අතර දන්වැළඳීමට උපාසිකාවගේ ගෙට වැඩි කාළු හිමියෝ උපාසිකාව නොදැක කොහේ ගියාදැයි දුවගෙන් ඇසූහ්යය, බණ අහන්ට දෙව්රම් වෙහෙරට ගියායයි කී ඇගේ වචනය ඇසූ ඇසිල්ලෙහි හැදුනු බඩදැවිල්ලෙන්ම මට වැරදුනා, මගේ බත අදින් ඉවරයි ආදි වශයෙන් කියමින් සිතමින් ගත් දැහයෙන් දුවි දුවීම බුදුන් වහන්සේ ලඟටම දුවගොස් වැඳපුදගන්ට වත් සිහිනැතිව මෙසේ දොඩන්ට වනී. අනේ බුදුහාමුදුරුවනේ! මේ මෝඩ අම්මාට මොහොතුත් තේරුමක් නැත. සියුම් බණ කීමෙන් වැඩක් නැත, මැව ස්කන්ධ ධාතු ආයතනාදී ධර්ම කියන්ට එපාය, ඔබතුමන් වහන්සේ බණක් කියනවා නම් දන්දෙන්ටය කියා හෝ සිල්රකින්ටය කියා හෝ එබඳු යමක් කියන්ටයයි නොඉවසිලි ලෙස කීවේය. මෙබස් ඇසූ බුදුරදුන් මේ ශ්‍රමණයා මෝඩ බැවින් මටද බණකියන අයුරු උගන්වන්ට තැත්කරයි. මාගේ සස්නෙහි පැවිදිව වියසී චඛා රහත්බව අත්කරගන්නවා වෙනුවට ප්‍රමාදව මැලිව නිද තම අද හස්වල ඇති වැරදි ස්වභාව සිහිනොකර කුසීතව බතටම වහල්ව නිද බුඬානුශාසනාවලට විපක්ෂව කථාකරයි. තමන්ම තමන්ව නැතිකර ගැණීමට වෑයම් කරයි යනු ප්‍රකාශකොට මෙසේ දෙශනා කළසේක.

යො සාසනං අරහතං අරියානං ධම්ම ජීවිනං
පටික්කොසති දුම්මෙධො දිට්ඨිං නිස්සාය පාපිකං
ඵලානි කණ්ඨකස්සෙව අත්තඝඤ්ඤාය ඵල්ලතී'ති යනුවෙනි,

මෙහි අදහස- සියළු කෙලෙසුන් නැසූ ධාර්මිකව ගෙන යන ජීවිකාවෘත්තියක් ඇති ආර්‍ය්‍ය උතුමන්ගේ යම් යහපත් අවවාද අනුශාසනා ඇද්ද, එම යහපත් ඔවාබස් නුවනමද මෝඩයෝ නපුරු වැරදි පාපී අදහස් ගෙන එනිසා නොපිළිගෙණ එම යහපත් අවවාදදියට ආක්‍රොශ කරයි, බැනවදී, දොස් දක්වා කියයි, එය ඔහුගේම විනාශයට ඔහු තුළින්ම බිහිකරවන වැරද්දකි. ඉන් එබඳු මෝඩ පාපී පුද්ගලයාම වැනසෙත්. කෙසේද? උන, බට ආදියෙහි හටගන්නා මල් ආදිය නිසා එම ගස් විනාශයට පැමිණෙන්නාක් මෙනි මේ දේශනාව අවශානයෙහි ඒ සැදැහැවත් උවැසිය සෝවාන් ඵලයට පැමිණියාය. එම උවැසියගෙන් සත්කාර ලැබ සිල්

රැකි, ප්‍රත්‍යයව තිබුව වීර්‍යයෙන් තුරන්ව කුසීතව ප්‍රමාදව සිටි කාළ හිඟණුව දුකින් මිදීමට නොහැකි විය. මින් ප්‍රමාදව කුසීතව කාත බොහෝ දෙයෙහි ඇලී වැසීමේ දෝෂය අවබෝධ කරගතයුතුයි.

මීලඟට වීර්‍යාරම්භයේ අනුසස් තේරුම් ගතයුතුයි.

සකල ලොකවාසීන්ට හිතවැඩ සාධාදුන් බුදුන් වහන්සේ ඇතුළු යම් සත්ත්වසන්තතියක් (සමූහයක්) සසර දුක් නසා නිවන්සිරි සාධාගන්නා ලද්දහුද, ඒ සියලු පිනැත්තෝම වීර්‍යාරම්භයේ මහිමයෙන්ම නිවන් දුටහ. බුඩාදී උතුමන්ගේ වීර්‍යාරම්භය ගැණ ගුණ කීමෙහි ප්‍රමාදවීමට අපි නොවෙහෙසෙමු. එම සපිරුණ පිනැතියන්ගේ අදහස් වීර්‍යයෙන් පමණක් නොව සැම අයුරකින්ම මුදුන්පමුණුවාලීමට සපිරුණ පින් ඇතිසේක්මය. එනමුත් සවල්පයක් නමුදු වීර්‍යාරම්භය අවශ්‍යමැයි. බුඩකාලයක නොඉපද කාරණ ලද දෘඪවීර්‍යයන් පිළිබඳවද දෙතහැකි ධර්මකථා බොහෝ තිබේ. ඉන් එකක කෙටි අදහසක් මෙහිදී ප්‍රකාශ කරමු. ඒ මෙසේයි.

පෙර අප මහබෝසතානන් වහන්සේ රජකුලයක උපන්හ. එම රජහුගේ පුරෝහිත බමුණුහටද පුතෙක් උපන්හ. ඒ දෙදෙනාහට අරින්දම, සොනක යයි නම්කළහ. මේ පින්වත් දෙපල ක්‍රමයෙන් වැඩී සියලු ශාස්ත්‍ර ධර්ම හා චාරිත්‍රාදිය උගෙන ගම් නියම් ගම් රාජධානිවල ඇවිදින්ව වන්හ. පා ගමනින්ම බරණැස්නුවරට වත් මොව්හු මඟුල් උයනෙහි රෑ ගතකොට උදෑසන නුවරට එන්නේ බමුණන්ට ලෑස්තිකරණලද බතක් ලැබ වැළඳීමට හිඳගත. අසුන් දෙකට යොදා තිබුන සුදු රතු වස්ත්‍ර දෙක දුටම පුරෝහිත පුත්‍ර සෝනක සුදු වස්ත්‍රය එලූ අසුනේ හුන් මගේ මිත්‍ර රාජකුමාරයාට අද මේ රටේ රජකමද, මට සේනාපති කමද ලැබෙන්නේයයි දූන වළඳා උයනට ගොස් දෙදෙනම හිසවසා පොරවා නින්දට වන්හ. මෙදින බරණැස් රජ නැසී සත්වන දිනට පැමිණි බැවින්ද රජහුගේ රට රැකීමට පුත්‍රුවනක් නැති හෙයින්ද, පැරණි සිරිත් පරිදි මඟුල් රථය සරසා යැවිය. රථය පෙළහරින් මඟුලුයනටවන් විගස සොනක කුමරු සිතනුයේ අරිඳම රජකුමරුට අද බරණැස් රට ලැබෙයි. ඔහු මා සෙනෙවිරත් ධූරයෙහි පිහිටුවයි, මට ඉන් කම්නැත, මම මහනව වීර්‍යවඩා ධ්‍යාන ලබාගනිමියි සිත් සාධාගෙන සැඟවුනු තැනකටවී භාවනාකරන්ට විය. අරින්දම කුමරුහට ඇමත්තෝ රට පාවාදුන් බැවින් රජකම්ව පත්ව සතලිස් වර්ෂයක් ගතවී ගියාට පසු තම සෝනක නම් මිතුරා සිහිවිය. භාවනාවෙහි යෙදුන ඔහු කෙලෙසුන් නසා පසේබුදුබවට පත්ව මා වීර්‍ය කොට සියලු දුක් නසා කෙලෙස් සතුරන් මැඩ ජයලද්දෙමියි ප්‍රීති වාක්‍ය කියමින් නන්දමූලක ගල්ලෙනට වැඩියේක. සතලිස් වසකට

පසු සිහිහල මිත්‍රයාව දස වර්ෂයක් සොයා එම සොනක නම් පසේ බුදුන් වහන්සේ විසින්ම කුඩා දරුවෙකුට ඉගැන්වූ ගාථාවක් රජ තුමා ඇසීමෙන් නුවර වැස්සනුත් කැටිව පෙළහරින් මඟුලුයනට පැමිණ පසේබුදුන් වහන්සේ හමුව කථාවෙහි යෙදුණෝ- පසේ බුදුන් වහන්සේ විසින් දෙසූ සදහම් අසා සියලු රජසිරි හැර සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව වීර්‍ය්‍යාරම්භයෙහි යෙදුනාහුය මෙලෙසින් නුවනැත්තෝ වීර්‍ය්‍යවැඩීමෙන් කෙලෙස්මල උදුරාහැර සුවයට පැමිණි බැව් සැලකිය යුතුයි.

මීලඟට අපි වීර්‍ය්‍ය බලයෙන් කෙලෙස්මැඩ තමහට වැඩ සිදුකර ගන්නා අයුරු කියමු.

ඡහි භික්ඛවෙ සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛං විහරති අවිඝාතං අනුපායාසං අපරිළාහං කායස්සභෙදා පරම්මරණා සුගති පාටිකඞ්ඛා, නෙක්ඛම්මවිතක්කෙන, අව්‍යාපාද විතක්කෙන අවිහිංසා විතක්කෙන, නෙක්ඛම්මසඤ්ඤාය, අව්‍යාපාදසඤ්ඤාය, අවිහිංසා සඤ්ඤාය -පෙ- යනුවෙන් සසර බිය දැක සසුන් වැද සැනසුමක් ලැබීමට බලාපොරොත්තු ඇති වීර්‍ය්‍යසම්පන්න භික්ෂුව සය ආකාරවූ නොපසුබස්නා සංකල්පනාවකින් වැසිය යුතුයි. එම ආකාර සය නම්- නෛෂ්ක්‍රම්‍ය විතර්කය, අව්‍යාපාද විතර්කය, අවිහිංසා විතර්කය, නෛෂ්ක්‍රම්‍ය සංඥාවය, අව්‍යාපාද සංඥාවය, අවිහිංසා සංඥාවය යන සයයි. මෙකීයන සංඛ්‍යාකාර සංකල්පනාවන්ගෙන් සනස්වූ වීර්‍ය්‍යසම්පන්න භික්ෂුව මෙලොවදීම සැපසේ වාසය කරයි. ක්‍රෝධය මැසීලා කරුණා මෛත්‍රී ගුණයෙන් පිරී වාසය කරයි. බලවත් සිත්තැවීමට නොපැමිණ ප්‍රීතිසහගත සිතින් වසයි. ලොභාදී කෙලශ දූකයන්ට වහල් නොවී ඉන් සිත් තවා ගන්නේ නැතිව අටවැදෑරුම් ලොකධර්මයන් මැදහත් සිතින් මැන බලා වීර්‍ය්‍යයෙන් සැහැල්ලුකොට වසයි. මෙලෙසින් ඉහාත්මභාවය ගතකොට සුවසේ සිට මරණින් මතු සුගතියට සැපයට පැමිණෙයි.

මෙහි 1 නෛෂ්ක්‍රම්‍ය විතර්කය නම්- ගිහිගෙයි ආදීනව දැක නුවණින් සිහිකොට ඉන්මිදීමේ වීර්‍ය්‍ය පෙරටුකර ගිහිගෙයින් නික්මී ශ්‍රමණ වෙශධාරීව වැස කෙලෙසුන් මඩිමින් සැපයකටපත් වෙමියි යනාදී යම්කිසි සිතිවිලි රැසක් සිතතුල බලපවත්වා එය ක්‍රියාවෙහි යොදත් නම්, නැතිනම් ගිහිගෙය අතහැර මහණවෙස් ගෙන දිරි වඩත් නම් එයයි. රට්ඨපාල, ඛදිරවනිය, රෙවත ආදී උතුම් පිනැති යන්ගේ ජීවිත කථා මීට වඩිනා නිදර්ශනයි. අප බෝධිසත්වයන් වහන්සේ හා යශෝධරා දේවින් වහන්සේත් රාහුල කුමාරයාත් උත්පලවර්ණා ස්ථවිරියත් පෙර කුම්භකාර වංශයෙහි ඉපිද ගිහිගෙයි

දෙස්දූක කරණලද අභිනිෂ්ක්‍රමණය අද්භූත සිද්ධියකි. විදර්ශනාබල යෙහි මහත්වය විදහාදෙන මෙම ධර්මකථාව නුවණින්යෙදී අසනු මැනවි. මෙම කථාව බුදුමුවින් පිටවන්ට කාරණය නම්— දෙව්රම් වෙහෙර විසූ පැවිදිවූ පන්සියයක් තරුණ භික්ෂූහු එක් රැයකදී කෙලෙශ වසඟයට පැමිණ රාගාග්නියෙන් තැවී කිළුටු ස්වභාවයට පත් වූහ. අළුයම දිවැස් පැතිරවූ බුදුන් වහන්සේ එය දක්නාලදින්, එය දෙස් දක්වා එකාවිටම කීමෙන් සිත් බියවැද මා කියන ධර්මය සිත් නොවදිත්යයි අනඳ මහතෙරුන් වහන්සේ කැඳවා භික්ෂූන් රැස්කරවා අවවාද කරන්නේ මහණෙනි! යම්හෙයකින් රාගචිත්තය උපන්නේවීනම් එය දළුදමා වැඩෙන්ට ඉඩනොදී විදර්ශනායෙන් කෙලෙසුන් මැඩ නැසිය යුත්තේය. පෙර නුවණැත්තෝ යම්තම් අරමුණක් දැක උපන් කෙලෙස් සිඳලා නිවන් ලබාගත්තෝ වේදැයි මේ අතීත කථාව ගෙණහැරපෑහ. පෙර මහබෝසතානෝ කුම්භකාරයෙක්ව ඉපිද තරුණ වයසට පැමිණ ලබාගත් සිය බිරිඳ සමඟ කල්යවන්නේ දූ පුත් යුවලක් ලැබ සතුටින් විසූහ. එකල කාලිඟු රට දන්තපුරනුවර කරණ්ඩක නම් රජ මඟුලුයනට යන්නේ උයන දොරටුව අසල ඉදුනු ඵලබර අඹරුකක් දැක ඉන් අඹයක් කා ගියහ. පසුව ආ සෙසු පිරිසද එම අඹකාන්නෝ සියලුම අඹ පමණක් නොව අතුරිකිළි ආදියද සිඳබිඳ දමා අඹගස පාලුකර දැමූහ. උයනට ගොස් එන රජු අඹගස දැක කළකිරී සම්පත් වැඩී ගිය කාටත් වන්නේ මේ අඹගසටවූ දෙයමය. කිසිවක් ගැණ බලා පොරොත්තු නැති තවුස් භාවයට මෙබඳු කරදර බියනැත. මෙලෙසින් බලනකල සියල්ල අනිත්‍යය, දුකය, අනාත්මයයි තිලකුණු මෙනෙහිකොට විදර්ශනාබල මහිමයෙන් සියලු කෙලෙසුන් මැඩ එනසා එවලේම පසේබුදුබවට පැමිණිසේක. පසේබුදුව මින්පසු මෙබඳු දුක්ඇති උත්පත්තියක් නැත, මේ කුණුකය මේ ඇටසැකිල්ලට ඇති ආලය මෙදූම හැරපීමියි සතුටුවී නන්දමූලනම් ගල්ලෙනට වැඩ සැනකී ගියහ.

එලෙසම, ගන්ධාරරට තක්සලා නුවර නග්ගා නම් රජු කුඩා කොල්ලකගේ අත ලා තුබූ රන්වලලු යුවල හැපි හැපී නාදවනුදැක මේ වලලු දෙකක්වීම නිසා හැපි හැපී නාදවෙත්, සම්පත් ලැබී ගිජුව විසීමෙන් මෙමලෙසම කරදරයක් මිස සැපයක් නම් නැත. සසර ඇවිදිනා අඥ බාලයන්ට විනා සසරබිය දක්නාවුන්ට සුදුසුවූවක් නොවෙයි, මේ සියල්ල අනිත්‍යය, දුකය, අනාත්මයයි තිලකුණු වඩා පසේබුදුබවට පැමිණ කෙලෙස් ගින්නෙන් මිදී නිවී එම ගල් ලෙනටම වැඩීසේක.

තවද මිහුලුනුවර වේදෙහරට නිමි නම් රජු මස් විකුණන්නන් ගිය කොල්ලකගේ පැසින් උකුස්සෙක් මස්කැටියක් ගෙනගත්හ.

ඒ උකුසුගෙන් තවෙකෙක්ද, තවෙකෙක්දැයි ගසාගනු දැක මේ මස් වැදැල්ල හැරපූ උකුසුට ගැහැටක් නැත, ලත් ලත් උන්වම ගැහැවය, පඤ්චකාමයෙහි ඇල්මත් මෙලෙසමය, කාමසැපට ඇලුන ඇලුනහටම ගැහැටය, එම කාමසැපය හැරියාහට ගැහැටක් නම් නොමැතැයි තිලකුණු වඩා එනහදීම පසේබුදුවැ හඳමුල ගල් ලෙන බලා වැඩම්වීය.

තවද පඤ්චාලරට උත්තරපඤ්චාල නුවර දුර්මුඛ නම් රජු වීථියේ සිටි දෙනකට නැගෙන්වූ ගොනෙකුට ඊට බලඇති අන් ගොනෙක් දිවඅවුත් උෟට ඇන බඩපලා මරු ඒ දෙනපිට නැන්ගේය ඒ දැක පඤ්චකාමයෙහි ඇලීමෙන් සිදුවූ විපත සලකා අනිත්‍යාදිය සිහිකොට පසේබුදුබවට පැමිණ එම පව්වටම වැඩිසේක. මෙම පසේබුදුන් වහන්සේලා සතරදෙනම යටකී කුම්භකාර වංශයෙහි උපන් මහබෝසතාණන්ගේ ගෙදොරට පිඬුසිඟා වැඩිසේක. බෝධිසත්වයෝ එම පසේබුදුවරු සිව්දෙන ගෙයි අසුන් පනවා වඩාහිඳුවා දන්වළඳවා අවසන, ස්වාමීනි ඔබවහන්සේලා සතරනමගේ ඉරියව් ඉතා ප්‍රසන්නය, කවර අරමුණු දැක මෙම උතුම් පසේබුදුබව් ලබාගත්හු ලද්දහුදැයි ඇසීය. උන්වහන්සේලාද එකරුණු සිදුවූලෙසම කුම්භකාර උපාසක මහතාට හා සිය බිරින්දටද දෙශනාකොට පස්නම් සැපතෙහි දොස් පෙන්වා වැඩිසේක. අනතුරුව බෝසතානන් වහන්සේ තම බිරිඳට අමතා භද්‍රාව, ඒසාවිශාල රාජසම්පත් හැර පැවිදිවෙස්ගෙන පසේබුදුබවට පැමිණි ඒ උතුමෝ ගැණ අපි සිහිකොට අපිදු පැවිදිව වසතමෝනම් සුදුසු නොවේද? එනිසා මමද පැවිදිවෙස් ගණිමියි කීවේය. ඊට ඇද සතුට ප්‍රකාශකරන්නේ භග්ගව ගෝත්‍රයෙහි උපන් කුම්භකාරයන් වහන්ස! සිතුදේ යහපත, ඊට අපි බාධානොකරමුයි කීය. තමා ඊට ප්‍රථම තවුස්වෙස් ගණිම්යයි සිතා අවසර ඉල්වී නම් නොදෙන, නොකියාම යායුතුයයි සිතා වතුරට යනසේ කලය ගෙන ගෙන් නික්මගොස් තවුස්වෙස් දරුගත්තාය. බෝසතුන්ද ලදරුවන් වැඩීගියකල යෙමියි සිතා දරු යුවලට යම්තම් දියදර අහර සපයා ගැණීමට තරම්වනකල පැවිදිවෙස් දරුගත්හ. මෙම දෙපල එකවරක් වීථියෙහිදී හමුව දරුවන් ගැණ අසා වෙන්වී ගොස් දිවිහිමියෙන් විශිෂ්ටවඩා පින් රැස්කොට ගෙණ කම්වූපරිදි මියගියහයි දෙශනාව නිමවා කුම්භකාරයෝ තමන් වහන්සේබවත් බිරිඳ යශෝධරා දේවිය බවත්, පුත්‍රයා රාහුල කුමරු බවත්, දුව උපුල්වන් මෙහෙන බවත් දක්වා වදාළ සේක.

මේ නැතමතුන්ගේ සසර නිසරු බැව් දැනුමයි. ස්වල්ප සලකුණකින් (පාඩමකින්) සසර දොස් දැක ඉන් මිදීමට හැකිවූයේ

නුවණින් සලකා ඊට අවශ්‍ය වීර්‍ය්‍යාරම්භ කිරීමේ බලයෙහි. එනිසා වීර්‍ය්‍යයේ බලය වටහාගෙන කුසීත ස්වභාවය දුරලීමෙන් නිවන් සැප සාධාගැණීමට උත්සාහවත් වියයුතු බව මතක්කරමු.

මීලඟට 2 අව්‍යාපාද විතර්කය තේරුම්ගත යුතුයි. ව්‍යාපාදය නම්- නපුරු ද්‍රෝහී සිතයි, පලිගැණීමේ කටුක අදහසයි, එම අදහස එම සිත තමන්වම නමා විනාශකරගන්නා සුලුවේ. එම ද්‍රෝහී ස්වභාව ඉතා සුලු කාරුණෙකින්ද සිතට නැගේ. මෙය යෞවන මදැදී මදයන්ගෙන් මත්ව වසන්නන්ට බොහෝ කොට බලපවත්වන අකුශලයකි, ඉන් මිදීම වෙන්වීම අව්‍යාපාදයයි. ව්‍යාපාද-නපුරු ද්‍රෝහී අදහස් වලින් වෙන්වී කාරුණ්‍ය ගුණයෙන් විසීම වැඩදායකයි, නිතර මෙනෙහි කිරීමෙන් වැසීමට පුරුදුවීම අව්‍යාපාද විතර්කයයි, මෙකී ද්‍රෝහී අදහස් සිතින් උදුරාදමා, අස්කරදමා, කාරුණ්‍ය, මෛත්‍රී, මුදිතා, උපෙක්ෂා අදහස් වලින් යුක්තව වසන ගුණවතුන්ට මෙලොවදීම සැපසේ විසීමට ලැබේ. ඇසුරුකරන්නන් සමග ආඝාත නොබැඳ, දුක් කරදර ආදියට නොබැඳී, ක්‍රෝධ දැහයෙන් පිපාසිත නොවී සැපසේම කල්යවනහැක. මරණින්මතු සුගතියකම උත්පත්තිය ලබනහැක.

3 අවිහිංසා විතර්කය මීලඟට තේරුම්ගත යුතුයි. විහිංසාව නම්- අනුන්හට හිංසා පීඩා කිරීමයි. කයින් අන්‍යයන් තලාපෙලා දැමීම, වචනයෙන් දශවිධ ආක්‍රෝශ වචනයෙන් නිගාකිරීම, සිතින් අන්‍යයන්හට වෙහෙස වන විපත්වන අයුරු සිත් යෙදීම, මෙය නපුරකි, නුසුදුසුයි සිතා එම විහිංසාවෙන් තුරන්ව එහි ආදීනව දෙස් දැක එය දුරලා අවිහිංසාවෙන් යුක්ත වීම අවිහිංසාවයි. අවිහිංසාව ශ්‍රේෂ්ඨ ගුණධර්මයක්ය, එය මෙසේ වැඩිය යුතුය, මෙසේ පිරිය යුතුය, මෙසේ රැකගත යුතුය, මෙය මෙසේ සංසිඳවිය යුතුය, මෙය මෙසේ දියුණුකරගත යුතුය යනාදී වශයෙන් සියලුදෙනා කෙරෙහි ගුණසීල පතුරුවා සිත සිතා පිරිසිදු අදහස් වඩාගැණීම, අවිහිංසා විතර්කයයි. ඉන් ලබන ආනිසංසද මුලින් කී අයුරුමයි. මෙලෙසම නේක්ඛම්මසඞ්කප්ප, අව්‍යාපාදසඞ්කප්ප, අවිහිංසාසඞ්කප්ප යන තුනද සලකාගත යුතුයි. මෙකී අංග සය අධික වීර්‍ය්‍යයෙන් වඩාගැන්මෙන් ඉහාත්ම සම්පත හා සම්පරාය සුගතියද සැලසේ.

මෙසේ වීර්‍ය්‍යබලය හේතුකොට ඉහාත්ම සැපවිඳීමද, පරලොව සුගති ලාභයද සිදුවන බව සලකා එකී ව්‍යාවෘතවන අතර එම වීර්‍ය්‍යයෙන්ම සංසාරවිමුක්තියද ලබනා අයුරු මෙසේ සලකාගත යුතුයි.

ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛසොමනස්ස බහුලො විහරති, යොනිචස්ස ආරද්ධා

හොති ආසවානං ඛයාය කතමෙහි ඡහි? ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මාරාමො හොති, භාවනාරාමො හොති, පහානාරාමො හොති, පවිවෙකාරාමො හොති, අව්‍යාපජ්ඣාරාමො හොති, නිප්පපඤ්චාරාමො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දිට්ඨෙව ධම්මෙ සුඛසොමනස්ස බහුලො විහරති, යොනිචස්ස ආරද්ධා හොති ආසවානං ඛයායාති.

මෙහි අදහස සයආකාර ධර්මයකින් යුක්තවූ භික්ෂුව ඉහාත්ම යෙහිම සැපත් හා සොම්නසින් ඔදවැඩි සිත්ඇතිව වාසය කරයි. ඔහුගේ නුවණද කාමාදී ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම සඳහා වීර්‍ය්‍යාරම්භ කරවයි, ඒ කාමාදී (ආශ්‍රවයන්) කෙලෙසයන් (ක්ෂයකිරීමට) වැනසීමට නුවණින් ආරම්භකරණ වීර්‍ය්‍ය සය නම් කුමක්ද? 1 ධර්මයෙහි අලේද, 2 භාවනාවෙහි ඇලේද, 3 (කෙලෙසුන්) ප්‍රහාණය කිරීමේ ඇලේද, 4 ප්‍රත්‍යශී විවේකයෙහි ඇලේද, 5 අව්‍යාපාදයෙහි ඇලේද, 6 නිෂ්ප්‍රපඤ්චයෙහි ඇලේද මෙකී සය ආකාර ධර්මයන්හි යුක්තවූ භික්ෂුව ඉහාත්මයෙහිම සැපසොම්නසින් යුක්තව වසයි. ඔහුගේ නුවණද කාමාදී ආශ්‍රවයන් ක්ෂයකිරීම පිණිස පටන්ගත් වීර්‍ය්‍යයෙන් යුක්තවෙයි.

මෙහි 1 ධම්මාරාමතාවය- නම් කුමක්ද ධර්මයෙහි ඇලීමයි. හේ මෙසේයි. "ධම්මෙ මෙ රමතීමනො" මාගේ සිත අලෙන්නේ ධර්මයෙහිමයි, (දහම්සොඩ මහරජ) "ධම්මොති වචනං සෙට්ඨං, උත්තමං, තෙන සමං සොතරසායනං අඤ්ඤං නත්ථි" ධම්ම යන වචනය ශ්‍රේෂ්ඨයි, උත්තමයි, ඒහාසමාන කනට මිහිරි වචනයක් (ලෝකය) නවත් නැත. "ධම්මං විනානත්ථි පිතාච මාතා" ධර්මයෙන් වෙන්වූ වහුට මව්පියන් නැත, මව්පියන් ගෙන් ලබන්ට නොහැකි පිහිට ධර්මයෙන් ලබන්ට හැකිහෙයිනි, ධර්මය පිළිබඳව තර්කානුකූලව සල කන්නෙකුව මෙලෙසින් ධර්මය තමාකරා අලවා ගණීත්- කෙසේද?

ඉමෙ ධම්මෙ මනසිකරොතො අනුප්පන්නා චෙව අකුසලා ධම්මා න උප්පජ්ජන්ති උප්පන්නා ච අකුසලා ධම්මා පහීයන්ති ඉමෙ වා පන ධම්මෙ මනසිකරොතො අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා චෙව කුසලා ධම්මා භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා සංවත්තන්ති.

මෙහි අදහස- මේ බණ සිහිකරණකොට නූපන් අකුසල් නූප දිත්, උපන් අකුසල් වැනසෙත්, මේ මේ බණ සිහිකරණකොට නූපන් කුසල් උපදිත්, උපන් කුසල් බෝවෙත්, පැතිරී මහත් වෙත්, සිහිකිරීමෙන් පිරී ඉතිරියෑමට පැමිණෙත්, මෙලෙසින් ධර්මය පිළිබඳව නුවණින් වීර්‍ය්‍යාරම්භ කරන්නහුට ධර්මයෙහි ඇලෙන්නහු හට සියලු කිළිටි කෙලෙසුන් වැදී සුපරිසුද්ධ නිර්වාණධාතුව ලැබෙයි.

2 **භාවනාරාමතාවය**- කසිනභාවනා, අසුභකම්මට්ඨාන්, කෙලෙස් ධ්‍යානාඞ්ග, ඡ අනුස්සති ආදී භාවනාවන්හි ඇලුනු මහනහු මෙලොවදී සැපසොම්නස් බහුලවම වාසය කරත්, නුවණින් වැඩී ගිය එම මහනහු විදර්ශාරම්භ කිරීමෙන් සියලු කෙලෙසුන්ද උදුරාලත් ඊට නිදසුනකි මේ. මෙම ලක්දිව බොහෝ පින්වතුන් වහන්සේලා මෙම භාවනාරාමතාවයෙහි ඇලී වාසයකර තිබෙනබව පොතපතින් පෙනේ. අනුරාධපුරයෙහි බුඩකාලයක මෙන් ශ්‍රී සමෘඩියෙන් බබලන අවදියෙහි කුලපුත්‍රයන් දෙදෙනෙක් ථූපාරාමයට පැමිණ මහනවිය. ඉන් එකකමක් උභයමාතිකාව දැන උගෙන උපසම්පදාවී වස්පහක් ගියාවපසු නුවරින් නැගෙණහිර පෙදෙසකට වැඩමවා බොහෝ කල්ගොස් මහාතෙරකෙනෙක් වූවාවපසු මෙසේ සිතුයේය. මෙතන බණ භාවනා කිරීම ආදී සියල්ලටද, ආහාරපාන ආදියටද හොඳයි. එය මගේ යහළු තෙරුන්ටද කිව යුතුයයි සිතා ථූපාරාමයට වැඩියේය. එය දුටු මිත්‍ර තෙරුන් පෙර ගමන් කොට පාසිවුරු ගෙණ වත්පිළිවෙත් කොට පසුව දුන් අසුනෙහි වැඩඋන් (ආගන්තුග) තෙරුන් සිතනවා මගේ මිත්‍ර තෙරුන් දුන් මට ගිතෙල් හෝ මී හෝ වෙන වතුර ජාතියක් හෝ පිළිගන්වනවා ඇත. නමුත් එළිවනතුරු යමක් ලැබුනේ නැතුව සිට උදේ සිතනවා දැන් දායකවරු කැඳ බත් ගෙනේවි නේද, එසේද යමක් ගෙනාවේ නැත, නෙවාසික තෙරුන් පුරුදුලෙස ආගන්තුග තෙරුන්වත් කැඳවා ගෙණ පිණ්ඩපාතේවැඩ මුලු වීථියකම ඇවිද ලැබුනේ කැඳ සුඟක් පමණයි, එය ආසන ශාලාවේහිද දෙදෙනා වහන්සේම වළඳා අවසන ආගන්තුග තෙරුන් සිතුවේ උදේට වැඩි බලාපොරොත්තුවක් නැතිහෙයින් මෙහෙම වෙන්ට ඇති, දවාලට තමයි රසමසවුලෙන් ලැබෙන්නේ, නමුත් දවාලවත් දෙදෙනා වහන්සේ පිඩුසිගාවිත් ලැබුනු පමණින් සතුටුවී ආගන්තුග තෙරුන් අසනුයේ, ස්වාමිනි! හැමදාම මෙහෙමද? නෙවාසික තෙර, එහෙමයි ඇවැත්නි! ස්වාමිනි මම නිවින පැත්ත මිටවඩා පහසුයි, (පාචීනඛණ්ඩරාජිය) ට වඩිමු එහෙ, තෙරුන් නුවරින් නික්ම කුම්භකාරගම මැදින් වඩින්ට විය. එවිට ආගනතුගතෙර- ස්වාමිනි මේ යන්නේ කොහේද? ඇයි ඇවැත්නි! ඔබ මට යන්ට කථාකලානේද? මම මේ එහෙයන්නයි යන්නේ- ඇයි ස්වාමිනි! මෙපමණ කලක් සිටිනැන ගෙනයන්ට කිසිදෙයක් නැද්ද- ඒවා තබාලද යන්නේ, එහෙමයි ඇවැත්නි, ඒ තිබෙන බඩු සාංඝිකඒවානොවැ ඒවා තැන්පත් කරලයි තිබෙන්නේ, වෙන මට අයිති යමක් නැ, අනේ ස්වාමිනි! මගේ බඩුවගයක් තිබේ. ඒ මොනවද? හැරමිටිය, තෙල්ගුලාව, සෙරෙප්පු දෙක ආදිය දාගන්න පසුම්බිය, එහෙම්ද ඇවැත්නි! ඔබතුමා එක දවසක් සිට ඔපමණ බඩු තබා ආවද?

ආගන්තුග තෙරුන් වහන්සේ පැහැදී මිත්‍ර තෙරුන් වහන්සේට වැඳ නමස්කාර කොට ස්වාමීනි ඔබවහන්සේ වැනි උතුමන්ට ආරණ්‍යවාසය සියලු කල්හිම සුදුසුය, නමුත් සතර බුදුවරයන්ගේ ධාතුචෛත්‍යය වන මේ ථූපාරාමය වැඳීමටද- ලෝවාමහපායෙහි නිතර බණ්දෙශනා ඇසීමටද, මහාසෑය වැඳීමටද, තෙරුන්වහන්සේලා දැකීමටද හැකිවෙයි. බුධකාලයක්මෙන් මෙම අනුරාපුර බබලයි. නුඹවහන්සේ වැනි උතුමෝ මෙහිම වැඩහිඳීම හොඳය, මම උන්නෙතනවම යම්සි ස්වකීය පන්සලටම වැඩියේය. ප්‍රත්‍යාපෙක්ෂාවක් නැතිව භාවනාරාමතාවයන්හී යෙදුන මෙබඳු උතුමෝ ඉහාතම යෙහි ප්‍රීතියෙන් සිල්රැකසැපි මෙම කථාවෙන් මොනවට වැටහේ. (අද වැඩසිටින පින්වතුන් වහන්සේලාටද මෙය ආදර්ශයක්මවේවා) මෙබඳු වීර්‍ය්‍යාරම්භයකින් සිතසාධාගෙණ වැසීම නොපමණ ආශ්වර්‍ය්‍යයද- මෙම නැනවතුන් පමන්ගත් වීර්‍ය්‍යයක් වෙත් නම් එය සියලු ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීම පිණිසම පවතිත්.

3 ප්‍රහාණාරාමතාවය- මෙය සම්පූර්ණ වීර්‍ය්‍යයෙන්ම වීර්‍ය්‍යබලයෙන්ම කළයුතුවේ. පෙර අප ලක්දිව විසූ උතුම් තෙරවරු ප්‍රහාණාරාමතාවයෙහි යෙදී හැවහැත්තෑ වර්ෂයන් ගතකොට කෙලශ ප්‍රහාණය කොට ප්‍රීතිවීතිබේ. ඊවද නිදර්ශන බොහෝයි. ප්‍රහාණාරාමතාව යයි කියන්නේ, තම සිත්තුල උපදින කෙලෙසුන් සම්පූර්ණයෙන් වැනසීමට දරණ උත්සාහය බිඳහෙළෙන්ව නොදී එහි අගය අගය කොට ඇලී සම්පූර්ණ කෙලෙස් සතුරන් වනසාලනතුරු උත්සාහ වත්ව නොපසුබැස සියලු දුක් ගැහැට ප්‍රීතියෙන් විඳ දරා වැසීමයි.

4 පවිවෙකාරාමතාවය- මෙයද වීර්‍ය්‍යයෙන් කළයුත්තකි. පවිවෙකය නම්, නගර ග්‍රාමයන්ගෙන් වෙන්ව සිව්පසය ගැන අපෙක්ෂාවක් නැතිව ආරණ්‍ය සෙනසුන්වල කල්ගතකිරීමට ඇලීමයි. එය බොහෝවිට බොහෝ දෙනෙකුට කලනොහැකි කරුණකි. එලෙසම එම විවේකය ලැබීමට පැමිණි තැනැත්තාහට සිව්පසය නොලැබීමෙන් වන ගැහැට නොතකා ආජීවපාරිසුද්ධිය සම්පූර්ණ කරගැනීම මහත් දුෂ්කර කරුණකි. ඒ සැම අවස්ථාව කදී විවේකය සැපයක් කොට එය උතුම් කොට සිතා ප්‍රීතිවෙත් නම් එය වීර්‍ය්‍යයෙන් කරගතයුතු ආශ්වර්‍ය්‍යමත් කරුණකි. මෙහිදී අවශ්‍යයෙන්ම කිවයුතු කරුණකි. (අද ලක්දිව ආරණ්‍ය සෙනසුන් එමට තිබේ. එය සකස්කර තිබෙන ගිහිපැවිදි දෙකොටසම මෙකී යන පවිවෙකාරාමතාවය සලකා ක්‍රියා සංවිධානය කරමින් පවිවේකය විඳින්නෝ නොවනබව කනගාටුවෙන් මෙහිලා සිහිපත් කර වමු) මෙ හැර පවිවේක රාමතාවයක්ද තිබේ, එය කෙලෙස්සැම

පිසදමූ රහතන් වහන්සේ සමාපත්ති සුවයෙන් කල්යවන පවිවේකාරාමතාවයි, ලොවුතුරු බුදුන් වහන්සේගේ සිට සියලු රහතුන් වහන්සේලාට මෙම පවිවේකය අතිශය ප්‍රීතිජනක අවස්ථාවකි.

5 අව්‍යාපජ්ඣාරාමතාවය– අව්‍යාපජ්ඣ– යන වචනයෙහි අදහස් කීපයකි. කරදරවලින් මිදුන, කරුණාගුණ පිරුණ, හිංසාවෙන් තොර, නිවන යනුයි. මින් කරුණාගුණ පිරුන අදහස්වල ඇලී වැසීම, අව්‍යාපජ්ඣාරාමතාවයයි, නැතිනම් නිවන් ප්‍රත්‍යක්ෂ කරගැනීමේ ආසාවෙන් කල්ගතකිරීමයි. මෙම ගුණයද මිනිසෙක් තුල නිධන්ව තිබියයුතු ගුණයකි. මිනිසා රකුසෙක් ලෙසද, තිරිසනෙක් ලෙසද, මිනීමරුවෙක් ලෙසද, ප්‍රේතයෙක් ලෙසද හැසිරවීමට නිතරයොදවන්නේ තමන්සිතතුල බාහිරවූ හෝ අභ්‍යන්තරවූ කෙලෙශයන් නිසා හටගන්නා ක්‍රොධාදී ගින්නයි. එම ක්‍රොධයට අමුතුම ධෛර්යයක් උපදවන සහාය ධර්මද එමට තිබේ. ප්‍රාණඝාතය, සොරකම, පරස්ත්‍රීසෙවුම, බොරුකීම, රහමෙරපීම ආදියයි. මේ පාපධර්මයන්ගේ සහායත්වය ලබන ක්‍රොධය, තම ජීවිතයද, අනාථයෙහි හෙලා ගනිමින් ඇසුරුකරන්නවුන්ටද අසල්වැසියනටද මහත්වූ ව්‍යසන පමුණුවමින් අපායගාමී වෙයි, මෙලෙසින් මහ බලැති ක්‍රෝධය, ප්‍රබලසම්පන්න වීර්යබලයෙන්ම මැඩ කරුණා හරිත අවිහිංසා අදහස්වල යොදවා කය, සිත, වචනය, හසුරුවා සිල්වත්ව ගුණවත්ව වැසීම, වැසීමට සිත අලවාගැනීම පහසු කරුණක් නොවේ. එම පහසුකම කෙසේ තිබුනත් ඒ සියල්ල ආරබ්ධ වීර්යයෙන් මැඩ කරුණාගුණ පිරූ බඳුනක් මෙන් සිත සාධා ක්‍රියා කිරීම, මෛත්‍රී නමැති ජලයෙන් සිත පවිත්‍රකර වැසීම, එම පුද්ගලයාහම ඉහාත්ම යෙහිම සැප ඵලවිපාක ලබාගැනීමටද, එබඳු හැඩි දූඩි සිත සාධාගැනීමේ නුවණ ඇත්තහුට සකල කෙලෙශයන් නසා ලබන ආශ්‍රවක්ෂය ඥානය අවබොධ කරගැනීමටද හැකිවන්නේ ආරබ්ධ වීර්යබලයේ මහිමයෙනි.

මෙම අව්‍යාපජ්ඣාරාමතාවයෙන් යුක්තවීමට කොපමණ ප්‍රබල සම්පන්න වීර්යයක් ඕනෑද යනු මෙම ධර්මගාථාව ශ්‍රවණය කිරීමෙන් තේරුන් ගන්න.

කොධං ජහෙ විප්පජහෙය්‍ය මානං
සඤ්ඤොජනං සබ්බමතික්කමෙය්‍ය
තං නාමරූපස්මිං අසජ්ජමානං
අකිඤ්චනං නානු පතන්ති දුක්ඛා' ති.

මෙහි අදහස නොයෙක් රූපාදී අරමුණු ගැනීමෙන් සිතතුල හටගන්නා ඇවිලෙන ගිණි හා සමාන ක්‍රොධයද, නවාකාර මාන්න

යද, කාමරාග සංයෝජනය ආදී දශආකාර සංයෝජනද ඉක්මවා නාමරූප දෙක්හි නොලැග- ලැගීම නම්, සත්‍වයා- මේ මගේ රූපය, මේ මගේ වේදනාමය නැතිනම්- මේ මගේ සැපසම්පත්ය යනාදී වශයෙන් එහි ලැග සැපයට ලොල්වෙත්. එලෙස එම මමය මාගේයයි කියන අදහස වෙනස්කරමින් සිදී බිඳී ගිය කල්හි සෝක කරයි, විලාප කියයි, මෙලෙසින් නාමරූපයන්හි ලැගීමයි. යම් කෙනෙක් මෙසේ නොඇලී නාමරූප ධර්මයන්ගේ අනිත්‍ය දුක්ඛ අනාත්මාදිය සිහිකොට නොඇලේද නොලගීද ඒ හේතුවෙන් ඔහුව රාගාදී දුක් නොම තවත් ඔහු සියලු කෙලෙස් නසා නිවන්පුර සිරි සලසාගණීත්. මෙම ගාථාවේ අදහස විමසා බලන්නෙකුට නාමරූප පිළිබඳව නැග එන ක්‍රොධමානාදිය මැඩ මැඩ අවිහිංසා ගුණයන්හි නිරත වෙමින් එහි ඇලෙමින් ඉහාත්ම සැපය විඳීමට කොතරම් කෙලෙස් තවන වීර්‍යබලයක් අවශ්‍යද, එම අමන්‍ය වීර්‍ය බලයගේ බලපැවැත්මෙන් යමෙක් අවිහිංසා කරුණාගුණ ඇස පිරුමෙහි ඇලේද, ඔහු ඉහාත්මයෙහිම සැපයට සොම්නසට පැමිණෙත්, එම නුවනින් වැඹිගිය තැනැත්තනු ආරබ්ද වීර්‍යහේතු කොටගෙණ කෙලශයන්ගේ මූල්සිදීමද සිදුකර ගනීත්.

6 නිප්පපඤ්චාරාමතාවය- එනම්, අප්‍රමාද භාවයෙහි ඇලීමයි. අප්‍රමාදය නම්, නොඉවසිළිවත්ලෙස කරගෙණයන ක්ෂණික වීර්‍යයයි, ප්‍රමාදයෙහි වීර්‍ය නොකිරීමෙහි දෝෂ බුදුන්වහන්සේ නොයෙක්තැන පැවසූසේක. එසේ අප්‍රමාදයෙහි වීර්‍යය නොයෙක් තැන වැනූයේ අප්‍රමාදයෙහි ඇලී වැසීම වපී. වීර්‍යාරම්භයෙහි යෙදී වැසීම වපී යනුවෙන් සිතීම යෙදීම නිප්පපඤ්චාරාමතාවයයි.

මෙහි නිප්පපඤ්ච ස්වභාවය මෙසේ දතයුතුයි. නැගීසිටි වීර්‍යයෙන් යුක්තවීම, හොඳ සිහිනුවනින් කල්යැවීම, දෙෂනැති, අපරාධවලින් තොරවූ, කායකර්ම- වාක්කර්ම- මනොකර්මයන් ගෙන් සම්පූර්ණව රොගයක් පරීක්ෂාකරණ නානාගසන වෛද්‍යවරයෙක් මේ ලෙඩ වාතය කිපීමෙන්ය, මෙය පිත් සෙම් කිපීමෙන්ය, මෙය සහජයෙන් ඇණිවූවක්ය ආදී වශයෙන් නිධන්ගතව තුබූ රෝගපවා දැක දැන ඊට නිසි පිළියම්කොට රොග සංසිඳුවන්නේ යම්සේද එසේම මේ සිත කිළිටිවූයේ රූපකාමයෙන්ය, මෙම කිළිටිවීම ශබ්දකාමයෙන්ය, මෙය රසකාමයෙන්ය, මෙය ක්‍රොධයෙන්ය, මෙය ලොභයෙන්ය යනාදී වශයෙන් නිප්පපඤ්චාරාමයෙහි යුක්ත යෝගියා ඒ ඒ කිළිටිවන සිතට සරිලන අනිත්‍යාදී ත්‍රිලක්ෂණද, බුද්ධානුස්මෘති ආදී සය අනුස්සතිද යොදා එම කෙලෙස් රොග සුවකොට සම්පූර්ණ සුවය ලබාදීම කායසංයම, වාක්සංයම, මනොසංයම යනාදියෙහි

කිසිවරදක් පලුද්දක් සිදුරක් නැතිසේ ධර්මයෙන් ජීවත්වීම- ධර්ම ජීවිතය නම්- ගිහිගෙයි වසන්නහු නම් වෙළහෙළඳාම් වලදී හොර පඩිද, බර කිරීමේදී වංචාඅදහස් වලින්ද, වංචාසහගත සැපයීම් වලින්ද, සතුන් විකිනීම, මස්විකිනීම, විෂවිකිනීම, ආවුධ විකිනීම, මත්පැන් විකිනීම ආදියෙන්, දිවිතොරතුරු සිසෑම්, ගවයන් නැනීම් ආදිය ධාර්මික ජීවිකාවයි. පැවිද්දන්ට වෙදකම් කිරීම් පනිවිඩ කියමින් ඇවිදීම් ආදියෙන් වෙන්ව දැහැමින් සෙමෙන් සිවුපසය ලබා වළඳා වැසීම ආදිය ධාර්මික ජීවිකාව මෙලෙසින් දැහැමි ජීවිකා වන්නෙන් යුක්තවීම යන මෙයින් ප්‍රමාදනොවූ පින්වතාගේ යශෝ ඝෝෂාව වෙසෙසින් වැඩියයි. එනිසාම ඔහු මෙලොවදීම සැප සොම්නස් විඳියි. තුවනින් නැගි එම වීර්‍ය්‍යාරම්භයෙන් කෙලෙසුන්ද වනසා සම්පූර්ණ සැපයට පැමිණෙයි.

මෙම තිපපපඤ්චාරම්භාවය දියුණුතර ගැණීමෙන් මෙසේ නිර්වාණ ප්‍රදීපය දල්වා සම්පූර්ණ දීප්තිය ආලෝකය පතුරුවයි. ඒ කෙසේද?

උට්ඨානෙනප්පමාදෙන- සඤ්ඤමෙන දමෙන ච
දීපංකයිරාථ මේධාවී- යං ඔඝෝනාභි කීරතී ති යනුවෙන්

සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යය, විරියිද්ධිපාදය, විරියින්‍ද්‍රියය, විරිය බලය, වීර්‍ය්‍යසම්බොජ්ඣඞ්ගය, සම්‍යක් ව්‍යායාමය යනාදී නැගීසිටි වීර්‍ය්‍යයන්ගේ බලවත්වීමයෙන්ද සිහිමුලාකර නොගැණීම දක්වාලන සතරසතිපට්ඨාන- චිත්තිද්ධිපාද- සතින්ද්‍රිය- සතිබලය- සතිසම්බොජ්ඣඞ්ගය, සම්මාසතිය යන අප්‍රමාද භාවයෙන්ද, ප්‍රාතිමොක්ෂසංවර සීලය, ඉන්ද්‍රියසංවර සීලය, ආජීවපාරිසුද්ධිසීලය, ප්‍රත්‍යයසංනිශ්‍රිත සීලය යන සතරපිරිසිදු සීලසංයමය නරණකොටගෙණද- ඇස්, කන්, නාසා, දිව, කය, සිත යන සවැදෑරුම්වූ ඉන්ද්‍රියයන් දමනය කිරීමෙන්ද යන අතිශයින් යථාතත්වයට ගෙණ ආ නොහැකි බැරෑරුම් මේ සතරාකාරය ධර්මයෙහි ඔදවැඩිව ගිය මහාප්‍රඥාවෙන් යුක්තවූ සියුම් නුවනැත්තේ මේ අතිශය දුෂ්කරවූ කොපමණ ගිලාබැස් සත් සපිරව නැවතීමට පයගැසීමට ප්‍රතිෂ්ඨාස්ථානයක් කීමක් නැති ඉතා ගැඹුරු සංසාර සාගරයෙහි ගිලානොබැස තමාට සපිරි ප්‍රතිෂ්ඨාස්ථානයවූ හෙවත්, නොබසින කළුගල්තලාවක් බඳුවූ අර්හත්ඵල නමැති බිමෙහි සිට නිර්වාණ නමැති ප්‍රදීපය පහන දල්වන්නේය, දල්වන්ට හැකිවන්නේය, කොයි ආකාර පහනක්ද පහන් තනුවක්ද- යම්බඳු කාමෞඝ- භවෞඝ- දිට්ඨෞඝ- අවිජ්ජෞඝ යන සතර මහා ඕඝයන්ගෙන් ගසාගෙනයන්ට, විසුරුවාලන්ට, විනාශකරලන්ට, නිවාලන්ට නොහැකිවන අන්දමින් දල්වාලන පහනයි.

අහීත්ඵල නමැති පහන්කනුව ගසාගෙනයෑමට ඔසාහත් කිසිසේත් සමර්ථ නොවේ. මෙලෙසින් විස්තර වශයෙන් පෙන්නුම්කල සය ආකාර ධර්මයන්හි ඇලී ව්‍යාශයකරණ පින්වතුන්ට ඉහාක්ම සැප සොම්නසද, නුවනින් රුදුන වීර්‍යාරම්භයෙන් කෙලශ ප්‍රහීනයද සිදුකව හැකිවෙත්.

"ඡහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අග්ගං ධම්මං අරහත්තං සච්ඡිකාතුං, කතමෙහි ඡහි? ඉධ භික්ඛවෙ භික්ඛු, සද්ධො හොති, හිරිමා හොති, ඔත්තාපී හොති, ආරද්ධ විරියො හොති, පඤ්ඤවා හොති, කායෙ ච ජීවිතෙ ච අනපෙක්ඛො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ ඡහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අග්ගං ධම්මං අරහත්තං සච්ඡිකාතුං' ති.

මෙහි අදහස සයආකාර ධර්මයකින් යුක්තවූ පැවිද්දහු අග්‍ර ධර්ම යයි කියනලද රහත්බව ලබාගැණීමට සමර්ථවෙයි. කවර ධර්ම සයක්ද? මහණෙනි! මගේ සාසනයෙහි මහනනු- ශ්‍රද්ධාවෙන් යුක්ත වේද- ලජ්ජාවෙන් යුක්තවේද- භයින් යුක්තවේද- පටන්ගත් නොපසුබස්නා වීර්‍යයෙන් යුක්තවේද- නුවනින් යුක්තවේද- ශරීරය කෙරෙහිද, ජීවිතය කෙරෙහිද, බලාපොරොත්තු රහිතවේද මෙකියන සයආකාර ධර්මයන් ගෙන් යුක්තවූ මහණතෙම අග්‍ර ධර්ම යයි කියනලද රහත්ඵලයට පැමිණෙන්ට සමර්ථ වෙයි.

මෙම ධර්ම සිහිකරන්නෙකුට සතරවන ආරබ්ධවිරියද-හයවන කාය ජීවිත අනපෙක්ෂක භාවයද- වීර්‍යබලයෙන්ම සකස්කරගත යුතු ධර්ම බව වැටහෙනවා ඇත. මෙකරුණු සය පිළිබඳවද කෙටි විස්තරයක් කරලීම වීර්‍යබලය තේරුන් ගැණීමට උපකාරවනු ඇත. මෙහි සද්ධාව නම්- රත්නත්‍රය කෙරෙහි ඇති බලවත් විස්වාස යයි ඇදහීමයි. මෙම ශ්‍රද්ධාව ප්‍රභෙද වශයෙන් විස්තරකිරීම මෙහිදී බිනැනොකෙරේ. නොසෙල්වෙන දෙදරා නොයන ශ්‍රද්ධාව මෙහිදී ප්‍රකාශවේ. සසරබිය දුරලීමට කරුණු විස්තරකර දෙන්නෙත්- එතර තිවන් සැප අහීත්ඵල විමුක්තියෙන් ලබාගැණීමට මාර්ගය වසා පෙන්වා දෙන්නෙත්, ධර්මයෙන්මයි. එබඳු ධර්මය ඇදහීමෙන් සසරින් මිදීම කළහැකි බැවින් අහීත්ඵල නමැති අග්‍ර ධර්මලාභයට ශ්‍රද්ධාව අතිශය උපකාරී ධර්මය බව පළමුකොට වදාළසේක.

එසේම ලජ්ජාව හා බියද, අනතුරුව දෙශනාකළේ ආරක්ෂා ධර්ම වශයෙනි. සසර බිය දුකද, ලජ්ජා බිය දෙකින් තොරවූවහුව ඉන් එල ගැණීමට ආරක්ෂාවක් නොමැති වෙත්. ලජ්ජා බිය දෙක කෙසේද කිවොත්- සසර බියදුටු සැදැහැවතාට වචපිට නොපෙනෙනසේ දෙපසින් කැනු ප්‍රාකාර දෙකක් හා සමානය.

නොහික්මුනු සඝ ආහාර ඇස් කන් නාසාදී ඉන්ද්‍රියයන්ට ගොචර ධර්ම බැලු බැලු අතේ පෙනෙන්ට වුනිනම්- විලිබිය පහවී මාර්ගාමර ණය විය හැකියි. එසේ නොව ෂඩ්දුරන් විලිබිය ප්‍රාකාරවලින් වසාගත් ශ්‍රද්ධාවන්තයාට බාහිර උවදුරු වලින් වැලකී ප්‍රවේසම්විය හැකියි.

එසේ ප්‍රවේසම්වූවහුව ආරබ්ධවීර්‍ය්‍යය ඊලඟට ප්‍රකාශකලේ ඉන් අර්හත්වය ලබා ගැණීමට උත්සාහ දැරීම අවශ්‍යනිසයි. ශ්‍රද්ධාවෙන් මෙහෙයවනලද යෝගියා විලිබිය නිසා නිසිසේ ශිෂ්ටාචාරව පාප යන්හී නොඇලී සිට වීර්‍ය්‍යය කරගෙණයෑමෙන් අර්හත් ඵලයට පැමිණිය හැකියි. හැබැයි එම වීර්‍ය්‍ය (යථාස්ථානයට) අර්හත්ඵලයට යනතුරුම පසුනොබැස කුසීතභාවයට වහල් නොවීම තිබියයුතුයි.

මීලඟට ප්‍රඥාව ප්‍රකාශකලේ වීර්‍ය්‍යයේ දුර්වල ස්ථානයන් පෝෂණය කිරීමටය. සෑම ක්‍රියාවකම යෙදුන වීර්‍ය්‍යවන්තයෝ පසුබස්නේ ප්‍රඥාව නමැති කල්‍යාණ මිත්‍රයාගේ දුර්වලකම නිසයි. ප්‍රඥාව නිසිසේ ඇත්නම් සියලු ආකාරයෙන්ම වීර්‍ය්‍යය පෝෂණය කොට ජයස්ථම්භයවූ අග්‍රධර්මයවූ අර්හත්ඵලයට යනතුරුම නොනැවතී දුවයෙත්. මීලඟට කායජීවිත දෙකේ අනපේක්ෂකත්වය සයවෙනි කාරණය වශයෙන් ප්‍රකාශකරණලදී.

ඒ මන්ද? කොපමණ ශ්‍රද්ධාව තිබුනත්, කොපමණ ලජ්ජා බිය වලින් ආරක්ෂාව ලබාගත්තත්, පටන්ගත් වීර්‍ය්‍යාරම්භය කොසිඳ පැවතුනත්, ප්‍රඥාවෙන්ද කිසිද අඩුවක් නැතත්, සක්කායදෘෂ්ටිය මමය මාගේය යන හැඟීම ලොභය තුනීකිරීම අතිශයින්ම දුෂ්කර බැවින් කල්ප කොටිගනනකම සිට නොසිඳී නොකැඩී එකම රූහැනක්සේ ආහෙයින් එය සිඳලීම අතිෂය දුෂ්කර කරුණකි. එනිසාම අසංඛ්‍ය කල්පගනන් පෙරුම්පිරූ මහබෝසතුන් වහන්සේලා පවා අර්හත්ඵල විමුක්තියට පැමිණෙන අවස්ථාවෙහිදී පලක්බැඳ වැඩහින්නේ කාය ජීවිත අපේක්ෂාවෙන් නොවේ. මගේ ඇඟමස් ලේ දියවී ගොස් ඇට පමණක් ඉතුරුව සිටියේ නමුදු මේ ආසනයෙන් නැගිටින්නේ අර්හත්ඵල විමුක්තියට පැමිණමයි. ආදීවශයෙන් අධිෂ්ඨාන කරගෙණයි. මුහුකුරාගිය සියලු පින් ඇති ඒ මහෝත්තමයෝද එලෙස නම් අප වැන්නන් අර්හත්වයට පැමිණිය යුතු අවස්ථාවන්හිදී කාය ජීවිත දෙකගැණ බලාපොරොත්තු වෙන් වීර්‍ය්‍ය වැඩීම කෙසේනම් සරියාද- නොසරිවේමැයි. එනිසා දෘඪතම වීර්‍ය්‍යබලයෙන් අධිෂ්ඨාන කරගෙණ කාය ජීවිත දෙක අඑයම් ඉවතලන කෙලපිඩක් පමණකුදු ආලයක් නොකර මොනවට වීර්‍ය්‍යවඩනුයේ නම් අග්‍රධර්ම නමැයි කියන අර්හත්ඵලයට පැමිණීමට

හැකිබව නබව විශ්වාස කටයුතුයි. මෙලෙසින් ශ්‍රද්ධාවේගිව කායජීවිත අනපේක්ෂකත්වයට යනතුරු ආකාර සයකින් සකස්කොට අර්හත් වය ලබාගැණීමට සරිලනසේ ප්‍රකාශකර සූත්‍රදේශනාවෙන් වීර්‍ය යෙහි ඇති වටිනාකම ඉතාම හොඳින් අවබෝධ වෙනවා ඇත. නවදුරටත් වීර්‍යය පිළිබඳව සියක්වර කරුණු කියන්ට හැකි නමුදු අපගේ මේ ලිපිය මෙතෙකින් නැවැත්වීමට අදහස් කරමු. වීර්‍යය පිළිබඳව මෙම පොත් පඞ්ක්තියේ 1, 2 පොත්වලද මාතෘකා අනුව ඉතා ලිහිල්ව ඉතා ගැඹුරුවද මධ්‍යස්ථවද කරුණු පහදාදී තිබේ. එනිසාද මෙය ප්‍රමාණයයි අපි සිතමු.

මෙම වීර්‍යබලය කථාවස්තු කීපයකින් හා සූත්‍රධර්ම කීපය කින්ද යුක්තකොට ලිවීමට අදහස් කලේ සාමාන්‍යයෙන් කරුණු අවබෝධකරගැණීමේ ශක්තිය ඇති පින්වතුන්ට ප්‍රයෝජනයක් වේය යන අදහසිනි. එනමුදු මෙම ධර්මයන් ලිහිල් අඳමින් ලිවීමට අවසරයක් නම් නොමැතියි. ප්‍රයෝජනයක් මින් ලැබීමට ඉඩසැල සෙන්නේ පහසු අවබෝධයක් ලැබුනොත් නිසා මෙලෙසින් ලිඛැව සැලකිය යුතුයි. මෙපමණ වේලාවක් අපි විසින් ලියා අවබෝධකර වන්ට අදහස් කරණලද වීර්‍යබලය පිළිබඳ කරුණු නැනවතුන් භාවිතා කිරීමෙන් අග්‍ර ධර්මයයි කියනලද අර්හත් ඵලයට පැමිණී මෙන් නිවන් පුරයට ඇතුල්වීමට උත්සාහවත්වන සේක්වා.

නිවන් සැප ලැබේවා.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

# ස ති බ ල ය.

මොරටුමුල්ලේ තපසරාරාම විහාරාධිපති
ආචාර්ය මොරටුවේ ශ්‍රී පෙමරතන මහාස්ථවිර
පාදයන් වහන්සේ විසින් ලියනලදී.

**කතමං තස්මිං සමයෙ සතිබලං හොති? යා තස්මිං සමයෙ සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අසම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ගපරියාපන්නං ඉදං තස්මිං සමයෙ සතිබලං හොති.**

ධම්මසඞ්ගණී ප්‍රකරණයෙහි ආ මේ පාඨය භාග්‍යවතුන් වහන්සේ විසින් සතිබලය විස්තරකරලීම් වශයෙන් වදාරණ ලද්දේය. එහි අදහස නම්:-

සතිබලය නම් කුමක්දැයි ප්‍රශ්නකරණ ලදුව එය විසඳන්නාවූ තථාගතයන් වහන්සේ-

එසමයෙහි යම් සිහියක්වේද, නැවත නැවත සිහිකිරීමක්වේද, අභිමුඛකොට සිහිකිරීමක් වේද, සිහිකිරීම් සඞ්ඛ්‍යාත සරණතාවක් වේද, ඇසූ පිරූ තැන් දරණබවක් වේද, ඉල්පීනොගොස් අරමුණට පිවිසෙන ගතියක් වේද, බොහෝකල් කරණලදදේ අමතක නොවන ගතියක් වේද, සමෘතියක් වේද, සතින්ද්‍රියක් වේද, සතිබලයක් වේද, සම්මාසතියක් වේද, සතිසම්බොජ්ඣඞ්ගයක් වේද, මාර්ගාඞ්ගයක් වේද, මාර්ගයට ඇතුලත්වූවක් වේද, මේ එසමයෙහි සතිබලය නම්වේයයි වදාළසේක.

සිහිමුළා බැව් සඞ්ඛ්‍යාත ප්‍රතිපක්ෂ ධර්මය මැඩලන බැවින් සතිය සතිබල නම් වේ. එහි ලක්ෂණාදිය-

**සරන්ති තාය, සයං වා සරති, සරණමත්තමෙව වා එසාති= සති, සා අපිලාපන ලක්ඛණා, අසම්මොහරසා, ආරක්ඛ පච්චුපට්ඨානා, විසයාභිමුඛභාව පච්චුපට්ඨානා වා ථිරසඤ්ඤා පදට්ඨානා කායාදි සතිපට්ඨාන පදට්ඨානා වා ආරම්මණෙ දළ්හපතිට්ඨිතත්තා පන එසිකාවිය චක්ඛුද්වාරාදි රක්ඛණතො දොවාරිකො විය ච දට්ඨබ්බා.**

මේ කරණකොට ගෙණ සිහිකරත්, තොමෝ හෝ සිහිකරයි, සිහිකිරීම මාත්‍රයම හෝ මෝතොමෝනුයි. සිහි නමවේ යනු කරණ කාරක කර්තෘ කාරණ භාවකාරක යන කාරක ලක්‍ෂණ වශයෙන් අර්ථ කී සැටිය.

ඔතොමෝ නොඉල්පීම (ගසාගෙණ නොයාම) ලක්‍ෂණකොට ඇත්තීය, නුමුලාවීම කෘත්‍යකොට ඇත්තීය, රැකගැණිම වැටහීම් කොට ඇත්තීය, අරමුණට අභිමුඛවනබව හෝ වැටහීම්කොට ඇත්තීය, ස්ථිර සංඥාව ආසන්න කාරණකොට ඇත්තීය, කායාදි සතිපට්ඨාන හෝ ආසන්න කාරණකොට ඇත්තීය, අරමුණෙහි තදව පිහිටි බැවින් එසිකාස්තම්භයක් (එළිපතක්) මෙන්ද චක්‍ෂුරාදි දොරටු රකිණ හෙයින් දොරටුපාලයකු මෙන්ද දතයුත්තීය, යනු මේ විසුද්ධිමාර්ගයෙහි විස්තර කළහැටිය මේ සිහියෙහි ලක්‍ෂණදෙකක් බොහෝ තැන්වල දක්වන ලද්දේය. ඒ දෙක නම් "අපිලාපනය" හා "උපගණ්හන" යයි.

අපිලාපනය නම්:- සක්විති රජක්හට කුදුමහත් කටයුතු සිහි කරදෙන භාණ්ඩාගාරිකයක්හු මෙන් චිත්ත චෛතසිකයන්ට අර මුණ සිහිකරවා දෙන ලක්‍ෂණයයි. "උපගණ්හනය" නම්- සක්විති රජක්හට හිතාහිත ජනයන් මතක්කර දෙන්නාවූ වැඩ අවැඩ සිහි කොට දෙන්නාවූ පරිනායක (පුත්‍ර) රත්නය මෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් සහිතවූ චිත්තයට අරමුණ පරීක්‍ෂාකරදෙන ලක්‍ෂණයයි. තමා විසින් කළාවූද කළයුතුවූද සුචරිත ධර්මයන් කල්පනාවන්නේ සිහිය ඇතිවිටමය, බුද්ධගුණාදී ධර්මත් පමාහැතිව වැටහෙන්නේ එවිටය, ඒ සිහිය සම්‍යක් සමෘතිය මිථ්‍යා සමෘතිය කියාත් දෙවැදෑරුම් වන්නීය. සම්‍යක් සමෘතිය නම්- මෙහි විස්තර කළාවූ සමෘති චෛතසිකයයි. මිථ්‍යා සමෘතිය නම්- කළාවූද කළයුතුවූද පාප කර්මයන් පමාහැතිව අරමුණු කිරීම් වශයෙන් පවත්නාවූ සමෘතිය වැනිවූ චිත්තෝත්පාද මාත්‍රයෙක් වේ.

සමෘති චෛතසිකය තෙම සකල කෘත්‍යයන්හි නියුක්ත මහා මාත්‍යයකුමෙන් සර්වාර්ථ සිද්ධියට කාරණා වන්නේය. එහෙයින් සියළු අකුශල ධර්මයන් කෙරෙන් චිත්ත චෛතසිකයන් ආරක්‍ෂා කර හැණීමටත් සියළු කුශල ධර්මයන් හා ගළපා ගැණීමටත් හැකි වන්නේ සිහිය ඇති කල්හිය.

බුද්ධාදී රත්නත්‍රයෙහි ගුණරාසිය හා නාමරූප ධර්මයන්ගේ අනිත්‍යාදි ස්වභාවයන් සිහිකරගත හැකිවන්නේ සමෘති චෛත සිකයේ බලයෙනි. ලෝවැසි සත්වතෙම රූපාදී පඤ්චකාමයෙහි ඇලීම නිසා ලොභ ද්වෙෂ මොහයන් ගෙන් මූවහවනලද සිත් ඇත් තේ තමා විසින් රැස්කළ විරූ කුශල කර්මාදියෙහි මූලාවෙයි,

එබැවින් පස්කම් සැපතටම ඇලියනු මිස සීලාදී ගුණධර්ම නොසොයයි, නාමරූපධර්මයන්හි පවත්නා අනිත්‍යාදී ලක්ෂණ සිහි නොකරයි.

සමෘති චෛතසිකය තෙම ශිලාලෙඛන ස්තම්භයකට බඳු උපමා ඇත්තේය, ශිලාලෙඛනයෙහි පිහිටුවනලද සන්නස් ලෙඛනාදි නොනැසී පවත්නේය, එමෙන් සමෘති චෛතසිකය ස්ථිරවශයෙන් ඇති පුද්ගලයාහට ළදරුකාලයෙහි ඉගෙන ගන්නා ලද්දාවූ ශිල්පශාස්ත්‍රාදිය මුළානොවී පවතිත්, ඒ සමෘති චෛතසිකය පඤ්චමධ්‍යානයෙහි ආරොපණය කොට වැඩූ කල්හි අතීත ජාතියෙහි උන්හිපිතැන් ආදී පැවැති කරුණු පවා සිහිකළ හැකිවෙයි. බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ ආර්‍ය්‍ය ශ්‍රාවකයන්ගේ පෙරවිසූ කඳපිළිවෙළ සිහිකරන්නාවූ සිහියද අතිශයින් උත්කෘෂ්ට භාවයට පැමිණියාවූ සමෘති චෛතසිකයයි.

තවද මේ සමෘති චෛතසිකය මහාගී දොරටු සයක් ඇත්තාවූ ගෘහයක දොරටුපාලයෙකුට බඳු උපමා ඇත්තේ වෙයි. දොරටු සයක් ඇති ගෘහය රක්නා දොරටුපාල තෙමේ ඒ දොරටු සයෙන්ම සොර සතුරන්ට ඇතුල්විය නොදී ආරක්ෂා කරන්නාක් මෙන්ම චක්ෂුරාදී ෂඩ්වාරයකින් යුක්තවූ මේ ආත්මභාව නමැති ගෘහයට පාපධර්ම නමැති සොරුන් වැද්දනොදී ආරක්ෂා කරන්නාවූ දොරටු පාලයා නම් මෙම සමෘති චෛතසිකයයි. මේ සමෘති චෛතසිකය කොහෙත්ම නැත්තාවූද ටිකක් ඇත්තාවූද හොඳටම තිබෙන්නාවූද පුද්ගලයෝ තුන්දෙනෙක් බුදුරජාණන් වහන්සේ විසින් වදාරණ ලදහ.

ඒ තිදෙන නම් අවකුජ්ජප්‍රාඥ පුද්ගලයාය, උච්ඡඞ්ගප්‍රාඥ පුද්ගලයාය, පුථුප්‍රාඥ පුද්ගලයාය යන තිදෙනයි. අවකුජ්ජප්‍රාඥ පුද්ගලයාට බණදෙසීම කලයක් මුනින් නවා වතුර වක්කරන්නාක් මෙනි, හෙතෙම නිතර බණ අහන්ට යන්නේත් වෙයි, බණඅහන්ට හිඳගන්නේත් වෙයි, ඔහුට භික්ෂූහු මුල මැද අග යන තුන්තැන්හි කල්‍යාණවූ අර්ථ බ්‍යඤ්ජන සහිතවූ ඒකාන්තයෙන් පරිපූර්ණවූ පිරිසිදු බඹසර දක්වමින් දහම් දෙසත් හෙතෙම එහි හුන්නේ ඒ කථාවෙහි මුල සිහිනොකරයි, මැද සිහිනොකරයි, අග සිහිනොකරයි, ඒ ආසනයෙන් නැගිටියේ කෙසේනම් සිහිකරන්නේද?

ඇතැම් කෙනෙක් භික්ෂූන් සමීපයෙහි ධර්මශ්‍රවණයට යන්නේ වෙයි. ඔහුට භික්ෂූහු ත්‍රිවිධ කල්‍යාණ ධර්මය දෙශනාකරයි, හෙතෙම ඒ ආසනයෙහි හුන්නේ ඒ කථාවෙහි මුලද සිහිකරයි, මැදද සිහිකරයි, අගද සිහිකරයි, නුමුත් අසුනෙන් නැගිට්වේ ඒ කිසිත්

නොදනිසි, ගන්නාලද්ද මූලාමෙයි, යම්සේ පුරුෂයෙකුගේ ඔඩොක් කුවෙහි නොයෙක් කැවිලිජාති පලතුරු තබාගෙණ සිට නැගිටින් නේ අමතකව ඒ සියල්ල ඇකයෙන් වැටී විසිරයන්නේද එමෙන් ඒ පුද්ගලයා අසාගෙණ සිටි ධර්මය අසුනෙන් නැගිට්විට කිසිත් නොදන්නේ වෙයි.

ඇතැම් පුද්ගලයෙක් ධර්මශ්‍රවණය පිණිස නිතර භික්ෂූන් සමී පයට යන්නේ වෙයි. ඔහුට භික්ෂූහු ත්‍රිවිධ කල්‍යාණ ධර්මය දෙශනා කරති. හෙතෙම එම අස්නෙහි හුන්නේ එම කථාවෙහි මුලද මැදද අගද සිහිකරයි. අසුනෙන් නැගිට ගියේද එසේ සිහිකරයි. යම්සේ කලයක් උඩුකුරුව තබනලද්දේ වේද එහි දිය වක්කරණලද්දේ පිහිටා සිටියි. පිට නොහැලෙයි, එමෙන් ඒ පුද්ගලයා බණ අසන විටත් නැගිට ගියවිටත් ධර්මය ඉගෙණ සිතින් දරු ශ්‍රෙෂ්ඨ සඞ්කල්පනා ඇතිව ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි පිළිපන්නේ දුක් කෙළවර කර ගණීසි.

මෙහි මුලින් සඳහන්කළ තැනැත්තාට බණදෙසීම දියෙහි අඳින රේඛාවක් මෙනි. කලයක් යටිකුරුකොට තබා නොපැරම් දිය වක්කළත් එහි නොපිරෙයි, එබන්දුව බණ දෙසීම යටිකුරු කොට තබනලද කලයට දිය වක්කරන්නාක් මෙනි, අසුනෙහිඳ ඉගෙණගන්ට අසමර්ථ කාලය වතුර පිටහැලී යන්නාක්මෙනි. නැගිට ඒ ගැන නොසලකන කාලය දිය නොපිහිටන්නාක්මෙනි.

බිමෙහි ඇඳි ඉරකට සමානකළහැකි දෙවෙනිව කී පුද්ගලයා නානාප්‍රකාර බුඩවචන නමැති කැවිලි පෙවිලි පලතුරු ඇකයෙහි තබා කමින් සිටි කාලය අසුනෙහි හිඳ බණ ඉගෙණගත් කාලය මෙන් දතයුතුය. නැගිටි විට කැවිලි පලතුරු ආදිය හැලීගිය කාලය මෙන් ආසනයෙන් නැගිටයනවිට ඉගෙණගත් ධර්මය නො සලකන කාලය දතයුතුය.

ගල්ටැඹක කෙටූ සන්නසකට සමානකළහැකි තුන්වෙනිවකී පුද්ගලයා උඩුකුරුකොට තබනලද කලය මෙන් බණ අසන්ට හිඳ ගණීසි. දෙශනාව ලබාගත් කාලය දියවක්කරණ කාලයමෙනි, ඉගෙණගන්නා කාලය දිය පිහිටා සිටින කාලයමෙනි, දිය පිටහැලී නොයන්නාක් මෙන් නැගිට යන විටත් අමතක නොවන කාලය දතයුතුය.

හීනවූ ගම්වැසියන් අතරෙහිම බලපවත්වන්නාවූ පෘථජ්ජන යන්ට අයත්වූ අනායීවූ අනර්ථය පිණිස පවතින්නාවූ පස්කම් සැපතෙහි ඇලී ගැලී මූසපත්ව සිටින්නෝ සදුපදෙශ ශ්‍රවණයෙහි

කන් යොමු නොකරති. 'අස්සවණතා ධම්මස්ස පරිහායන්ති''යි වදාළ හෙයින් ශ්‍රවණය නොකරණ හෙයින් ධර්මයෙන් පිරිහෙති. බුදුබණ ගැන සලකනවිට ඇසියයුතුදේ කොතරම් තිබේද? හැමදාම ලිහිල් බණකියන්නෙයි කිය කියා ආරාධනා කරමින් ගැඹුරු බුදු බණ අස්සේ සිත නොයොදවා කම්සැපම ගරුකරමින් සිටින්නෝ බොහෝය. ඒ පින්වත්හු බුද්ධොත්පාදකාලයක අගය නොසලකති, විසිතුරුදේ හැමකල්හිම ඇත්තේය, නෛර්‍යාණික ධර්මය බුද්ධොත්පාද කාලයකම ලබාගත යුතුය. නවලොවුතුරු දහම්සැප මුල්කොට ඇති සැම සැපයක්ම ලබාගැණීමට ධර්මශ්‍රවණය හේතුභූතවේ. වයර්ලස් බණ අසනවිට පවා දිග හාන්සිපුටුවල දිගාවී හිඳීම ධර්මයට කරණ අගෞරවයකි, බණ අසනවිටවත් කය හික්මවා ගතයුතුය. ධර්මයක් අදහනවා වෙන්නේ එවිටය, නොයෙක් කටයුතුවල යෙදෙමින් බණ ඇසීම නුසුදුසුය. ධර්මය නම් අපව දුකින් එතරකරණ මාර්ගයයි. සංසාරදුක ඉතා කටුකය සිහිකළ පමණින් ලොමුඩැහැගන්වයි, අටමහනිරය ප්‍රේතලොකය තිරිසන් අපාය අසුරනිකාය ගැන කල්පනාකර බැලිය යුතුයි. ඒවායේවැටී ඉන්නා සත්‍වයෝ කොතරම් දීර්ඝකාලයක් දුක්විඳිද්ද ලේශමාත්‍ර සැනසීමක්වත් ඔවුන්ට තිබේද?

“ඉදින් මිනිසත් බවක් ලැබුනහොත් කිසිකලෙක පවක් නොකරමියි'' තිරිසනා ශොකකරයි, දස්කම්පපා වණ්ඩිකාමට කළ පව් එදාට සිහිවෙයි, එතරම් කම්කටුළු රාශියකින් අපට ගැලවීගතහැකි වන්නේ ධර්මයේ මාර්ගයෙනි, ධර්ම දේශනාකරණ කාලය බුදුවරයෙක් ඉදිරියෙහි ඉන්නා කාලය මෙන් සිතාගත යුතුය. ලොවුතුරු බුදුවරයකු ඉදිරිපිට අගරුලෙස ඉරියව් පවත්වන්නේ කවුද?

ධර්මශ්‍රවණයෙන් ඵල ලබන්ට නම් එළඹසිටි සිහිඇතිබවක් තිබිය යුතුය. අප්‍රමාදය යනුවෙන් තෙවලා බුදුවදන්හි බොහෝ තැන වර්ණනා කරන්නේ ඒ එළඹසිටි සිහිඇති බවටය. ප්‍රමාදවූවහුට නම් සතර අපායයෝ සිය ගෙවල් හා සමාන වෙති. එබැවින් හැමකල්හිම අප්‍රමාදයෙහි පිහිටා සිටිය යුතුය. මුළු ත්‍රිපිටක බුද්ධ වචනය ගෙණ කියනු ලබන්නේ අප්‍රමාද පදයටම බසියි.

“සෙය්‍යථාපි භික්ඛවෙ යානිකානිචි ජඞ්ගමානං පාණානං පද ජාතානි සබ්බානිතානි හත්ථිපදෙ සමොධානං ගච්ඡන්ති හත්ථිපදං තෙසං අග්ගමක්ඛායති, යදිදං මහන්තත්තෙන ඒවමෙව ඛො භික්ඛවෙ යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ අප්පමාද මූලකා අප්පමාද සමොසරණා අප්පමාදො, තෙසං ධම්මානං අග්ගමක්ඛායති''.

යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් මහණෙනි! යම්සේ ජඞ්ගම (ඇවිදින) සත්ත්වයන්ගේ පාසටහන් වෙද්ද ඒ සියලු පාද ජාතයෝ ඇත්පියවරෙහි ඇතුළත්වන බවට යෙති. (මක්නිසාදයත්) ඇත් පියවර ඒ සියළු පා සටහන්වලට වඩා අග්‍රය එනම් මහත් බැවිනි, එමෙන් මහණෙනි! යම්කිසි කුශල ධර්මයෝ වෙද්ද ඒ සියලු කුසල ධර්මයෝ අප්‍රමාදය මුල්කොට ඇත්තාහුය. අප්‍රමාදයට බැසගැණීම් කොට ඇත්තාහුය. (මක්නිසාදයත්) අප්‍රමාදය තෙම ඒ ධර්මයන්ට අග්‍රයයි වැවණේ. (එහෙයිනියි) වදාරණ ලද්දේය.

එලඹ සිටි සිහිය අමෘතයට කාරණවේ. අමෘතය නම් නිර්වාණයයි, එය ඉපදීමක් නැති හෙයින් නොදිරයි, නොමැරෙයි, අමෘතයට කාරණවූයේ හෙවත් අධිගමුපායවූයේ අමෘත පදයයි, එනම් අප්‍රමාදයයි, මුළාවූ සිහිය මරණයට කාරණවේ. ප්‍රමත්ත පුද්ගල තෙමේ ජාතිය (ඉපදීම) නොයික්මවයි, උපන් තැනැත්තේ දිරන්නේත් වෙයි, මැරෙන්නේත් වෙයි, ප්‍රමාදය මරණයට කාරණවේයයි කීයේ එහෙයිනි. ඒ බැව් නොසලකන්නෝ ඉපදීම සැපයයි කියමින් කෙළෙසුන් දියුණුවනයේ පිනුම් පනිති.

සිහියෙන් යුක්තවූවෝ අප්‍රමත්ත පුද්ගලයෝය, ඔව්හු නොමියත්, එසින් ඔව්හු නොමැරෙන්නෝය, අජරාමරයෝයයි නොසැලකිය යුත්තාහුය. කිසියම් සත්ත්වයෙක් අජරාමරවූවෙක් නම් නැත. නමුත් පමාවූවනට සසර මායිමක් නැත, කොතරම් කලක් උපදින්ට වේදැයි සීමාවක් නැත, නමුත් අප්‍රමත්ත පුද්ගලයාට නම් භවය පිරිසිඳින ලද්දේය. එනම් මෙතරම් කලකින් භවදුකින් නිදහස් වන්නේයයි කියහැක. සෝවාන්වූ පුද්ගලයා නම් සත්වරකට වඩා භවයෙහි උපදින්නේ නැත, සත්වෙනි ජාතියේදී හෝ ඉන්මෙහාදී රහත්වී නිවන් දක්නේය, සකෘදාගාමි පුද්ගලයා භවයෙහි උපදින්නේ එක්වරකි, එසින් හෙතෙම භවය කෙළවර කරන්නේය, සසර දුකින් මිදෙන්නේය. අනාගාමි පුද්ගලයා නම් මේ කාමලෝකයට ඉපදීම් වශයෙන් නොපැමිණ බ්‍රහ්මලෝකයේදීම රහත්වී නිවන් දකින්නේය. රහත්වූ පුද්ගලයා ඉම් ජාතියේදීම අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිමන් පාන්නේය, මෙසේ අප්‍රමාද ප්‍රතිපදාවෙහි පිහිටීමේ මරණය පිටුදකින්නාහුය.

නමුත් පමාවූවෝ ජාති ආදියෙන් නොමිදුන බැවින් ජීවත්ව සිටියත් මළාහුම නම්වෙති. නොපමාවූවෝ වනාහි අප්‍රමාද ලක්ෂණය වඩා වනා මගපල සාක්ෂාත්කොට දෙවෙනි තුන්වෙනි ආත්මභාවයන්හි මුලින්කී පරිදි නූපදිත්, එබැවින් ඔව්හු ජීවත්ව සිටියත් මළත් නොමැරෙන්නෝ නම් වෙති. යම් සත්ත්ව කෙනෙක් පමාවූ

වාහු වෙද්ද ඔව්හු ප්‍රමාද මරණයෙන් මළහෙයින් ජීවිතින්ද්‍රියයෙන් තුරන්වී හිතෙන් තොරව දුවකඩක් මෙන් හොත්තාවූ මලවුන් හා සමානය. එසේ මලවුන් හා සමානවූ ගිහියන්ට වනාහී දන්දෙන්නෙමු, සිල් රකින්නෙමු, පෙහෙවස් සමාදන් වන්නෙමු කියා සිතක් වත් නූපදියි. පැවිද්දන්ට වනාහී ආචාර්ය උපාධ්‍යාය වත් ආදිය පුරන්නෙමු, ධුතාඞ්ගාදිය සමාදන් වන්නෙමු, භාවනා වඩන්නෙමු යයි සිතක්වත් නූපදියි, එවිට මලවුන් හා අමුත්ත කුමක්ද? මලත් නොමල කෙනෙක් හා සමාන වන්නේ සිහිය රැකගැණීමෙනි, සිහිය හරිහැටි නොතිබුන හොත් තමන්ට හිතපිණිස කියන ලද්ද අඩුවශයෙන් හෝ වැඩිවශයෙන් හෝ විපරීත වශයෙන් හෝ ගන්ට වෙයි. එයින් නිසිපල නොලැබේ. ධර්මාර්ථයන් අවිපරීත කොට තබාගැණීමට අක්ෂරයන්හි හා පාදයන්හි නුමුළා බව තිබිය යුතුය. වචනාර්ථයාගේ යහපත් අවබොධය ඇතිවන්නේ එවිටය, හරි අවබොධය ඇත්තහුටමය, නිසිලෙස පිළිපැදියහැකි වන්නේ, එසේ යහපත් පැවැත්ම සඳහා ශ්‍රවණ සම්පත්තියෙහි පිහිටනු කැමැතියන් විසින් ඇසියයුත්තේ රාග ද්වෙෂාදිය සංසිඳීමට හෙතු වන කාරුණ්‍යය. රාගාදි නිශ්‍රිත වචන ඇසීමෙන් කෙලෙස් උත්පන්න වෙති. එවිට තමන්ගේ සිත තමහටම නවතාගත නොහැකිවෙයි. ඇසීමකින් පවා ඵලය ලැබෙන්නේ සිහිය හොඳින් තිබෙන තැනැත්තාටය. සියලුම වචන රසයෙන් යුක්තව කියනු ලැබුවත් වික්ෂිප්ත සිත් ඇත්තේ නොවටහා ගණියි, නැවතත් කියනු මැනවැයි ආරාධනා කරයි, එකඟවූ සිතින් යුක්තවම අසන තැනැත්තේ බහුශ්‍රැතයෙක් වෙයි. ඇසූදෙය අමතක කරගතහොත් මාවිසින් ඔබන්දක් මීට ඉහත අසා නැතැයි කියයි. වචනාර්ථාවබොධයට ප්‍රඥාව හා සමෘතිය තිබිය යුතුයි.

"තස්ස පඤ්ඤා පුබ්බඞ්ගමාය සතියා බ්‍යඤ්ජනාව ධාරණ සමත්ථා සති පුබ්බඞ්ගමාය පඤ්ඤාය අත්ථපටිවෙධ සමත්ථා" යනුවෙන් නුවණ මුල්කොට ඇති සිහියෙන් අක්ෂරාව ධාරණයෙහි සමර්ථ බවද, සිහිය මුල්කොට ඇති නුවණින් අර්ථාවබොධයෙහි සමර්ථ බවද ලැබිය යුතුබව පෙණේ.

මේ සිහිය වනාහි ධර්මවිෂයෙහි බොහෝ තැන්වල යෙදෙන්නකි. සත්තිස්බොධිපාක්ෂික ධර්මයන් අතුරෙහි අටතැනකම සතිය ඇවිත් තිබේ.

සිත නොයෙක් අරමුණුවල දුවන්නට ඉඩනොදී එකම අරමුණක බැඳමෙන් පවත්වන ධර්මවශයෙන් සතිපඨාන සතරෙහිමද, අරමුණ වටහා ගැණීමෙහි සහජාත ධර්මයන්ට ඊශ්වර භාවය කරයි

යන අර්ථයෙන් ඉන්ද්‍රිය ධර්මයන් කෙරෙහිද සිහිමුලා බැව් සඞ්ඛ්‍යාත ප්‍රතිපක්ෂ ධර්මයන් මැඩලන හෙයින් බල ධර්මයන් කෙරෙහිද, කාය, වෙදනා, චිත්ත, ධර්ම යන සිවුවැදෑරුම් අරමුණෙහි යොදා වඩමින් පිළිවෙළින් ප්‍රමාදපක්ෂය ජයගෙණ අප්‍රමාද පක්ෂය පුරා සිවුමග නුවණයයි කියනලද සම්බොධිය නංවාලන හෙයින් බොජ්ඣඞ්ග ධර්මයන් කෙරෙහිද නිවන් කැමැතියවුන් සෙවනය කළයුතුසේ අවිපරීත කොට දෙන හෙයින් ආර්ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ග ධර්මයන් කෙරෙහිද ඇතුළත්වී පවත්නේය.

එසේම මේ සිහිය දශඅනුස්මෘති ධර්මයන්හිද එන්නේය. එනම්:- බුද්ධානුස්මෘතිය- බුදුරජාණන් වහන්සේ අරමුණුකොට ඇතිකරගන්නා සිහිය බුද්ධානුස්මෘතිය නම් වේ. එය කෙටියෙන් සිහිකරන්නේ මෙසේය. මාගේ ස්වාමිවූ බුදුරජාණන් වහන්සේ රහසින්වත් පව්නොකරණ හෙයින්ද, කෙලෙස් සතුරන් නැසූ හෙයින්ද, සංසාර චක්‍රයෙහි අරකැපූ හෙයින්ද, සියලු පූජාවන්ට සුදුසුවූ හෙයින්ද අර්හං නම්වන සේක.

සංස්කාර විකාර ලක්ෂණ නිර්වාණ ප්‍රඥප්ති යන සර්වධර්මයන් සර්වාකාරයෙන් දැන වදාළ හෙයින් සම්මා සම්බුද්ධ නම් වන සේක.

පූර්වේනිවාසානුස්මෘති ඥානය, දිව්‍යචක්ෂුර්ඥානය, ආශ්‍රවක්ෂයකරඥානය, විදර්ශනා ඥානය, මනොමය ඍද්ධිය, ඍද්ධිවිකුර්වණඥානය, දිව්‍යශ්‍රොත්‍ර ඥානය, චෙතොපරිය ඥානය යන අෂ්ටවිද්‍යාවන්ගෙන් සහ ශීලය, ඉන්ද්‍රියසංවරය, ආහාරයෙහි පමණ දැනීම, නිදි දුරු කිරීම, ශ්‍රද්ධාව, ලජ්ජාව, පවට බියවීම, බහුශ්‍රැතබව, වීර්ය්‍යය, ස්මෘතිය ප්‍රඥාව, ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ ධ්‍යාන යන පසළොස්චරණ ධර්මයන් ගෙන්ද යුක්තවන බැවින් විජ්ජාචරණ සම්පන්න නම් වන සේක. සොභන ගමනින් නිවණට වැඩවදාළ බැවින් සුගත නම් වන සේක.

සත්වලොක, සංස්කාරලොක, අවකාශලොක යන ලොකත්‍රයම දැන වදාළ හෙයින් ලොකවිදූ නම් වන සේක.

අසමවූ බුදුවරයන් හා සමවූ අනන්ත ගුණයෙන් අනුත්තරවූ සේක්, දැමියයුතු පුද්ගලයන් දමනයකළ බැවින් අනුත්තර පුරිස දම්ම සාරථී නම් වන සේක.

දෙවිමිනිසුන්ට අනුශාසනා කරණ හෙයින් සත්ථා දෙවමනුස්සානං නම් වන සේක.

චතුරාර්ය්‍ය සත්‍ය ධර්මයන් පරොපදෙශ විරහිතව අවබොධකර වදාළ හෙයින් බුද්ධ නම් වන සේකැයි මෙසේ බුදුගුණ සිහිකිරීම බුද්ධානුස්මෘතිය නම්වේ.

ධම්මානුස්සතිය- භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසනලද ධර්මය මනාකොට වදාළ බැවින් "ස්වාක්ඛාත" නම් වන සේක. තමන් විසින්ම දතයුතු හෙයින් "සන්දිට්ඨික" නම් වන සේක. කල්නොයවා විපාක දෙන හෙයින් "අකාලික" නම් වනසේක. එව බලවයි කිමට සුදුසු හෙයින් "එහිපස්සික" නම් වන සේක, තම සිත්හි අරමුණු කිරීමට යොග්‍ය හෙයින් "ඔපනයික" නම් වන සේක. නුවණවතුන් විසින් තම තමන් කෙරෙහි එලවා දතයුතු බැවින් "පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි" නම් වන සේකැයි මේ ගුණ සය සිහිකිරීම ධම්මානුස්සතියයි.

සඞ්ඝානුස්සතිය- අප භාග්‍යවතුන් වහන්සේගේ ඖරසපුත්‍රවූ ශ්‍රාවක සඞ්ඝතෙම මනාව පිළිපන් හෙයින් "සුපටිපන්න" නම් වන සේක, සෘජුව පිළිපන් හෙයින් "උජුපටිපන්න" නම් වන සේක, නිවන් පිණිස පිළිපන් හෙයින් "ඤායපටිපන්න" නම් වන සේක, පිළිසඳර කිරීමට සුදුසු හෙයින් "සාමීචි පටිපන්න" නම් වන සේක, යම් මේ පුරුෂයුග සතරක් හා ආර්‍ය්‍ය පුද්ගලයෝ අටදෙනෙක් වෙද්ද, භාග්‍යවතුන් වහන්සේගේ ඒ මේ ශ්‍රාවක සඞ්ඝතෙම දුරසිට පවා ගෙණවුත් දෙන සිවුපසයට සුදුසු හෙයින් "ආහුණෙය්‍ය" නම් වනසේක, ආගන්තුක සත්කාරයට සුදුසු හෙයින් "පාහුණෙය්‍ය" නම් වන සේක, දක්ෂිණාවට සුදුසු හෙයින් "දක්ඛිණෙය්‍ය" නම්වන සේක, නමස්කාරයට සුදුසු හෙයින් "අඤ්ජලිකරණීය" නම් වන සේක, ලෝකයාගේ පින් නමැති බිජු වැපිරීමට සුදුසු හෙයින් "නිරුත්තරවූ පුණ්‍යක්ෂෙත්‍ර වන සේකැයි මේ ගුණ නවය සිහිකිරීම සඞ්ඝානුස්සතියයි.

සීලානුස්සතිය- ශීලයාගේ පිරිසිදුබව සිහිකිරීමයි, ගඞ්ගා, යමුනා, සරභූ, මහී, සරස්වතී යන පඤ්චමහා ගඞ්ගාවන්ගේ ජලයෙන් සත්‍වයා පිරිසිදුකළ නොහැකිවූවත් සිල නමැති ජලයෙන් පිරිසිදුකළ හැක්කේය.

ස්වර්ගයට නැගීමට ශීලය හා සමාන හිණක් නැත්තේය, නිවන් පුරයට පැමිණීමේ දොරටුවද සීලය නම් වේ.

සීල නමැති පලඳනාවෙන් හොබනාවූ යතිවරුන් මෙන් සිවු සැට අබරණින් සැදුම්ලත් රජවරුද නොහොබිත්.

සීලය තෙමේ ආත්මානුවාදදී භයද දුරුකරයි, කීර්තිය හා සතුටද එලවයි, මෙසේ ගුණ සලකා තමාගේ සීලයෙහි පිරිසිදු බව සිහිකිරීමයි.

ත්‍යාගානුස්සතිය- මෙය වඩනු කැමැත්තහු විසින් ස්වභාවයෙන්ම දන්දීමෙහි අදහස් ඇත්තෙකු වියයුතුයි. පිළිගන්නකු

ඇති කල්හි බත්පිඩක්වත් නොදී අනුභව නොකරන්නෙමියි ඉවං ගෙණ ගුණවත් ප්‍රතිග්‍රාහකයන් කෙරෙහි ශක්ති පමණින් දන්දී මටවූයේ මහත් ලාභයෙක, මසුරුමලින් මඩනාලද මිනිසුන් අතර පහවූ මසුරුමල ඇත්තෙක්ව වසමියි තමන්ගේ ත්‍යාගය සිහිකට යුතුයි. මේ ත්‍යාගානුස්මෘතිය සිහිකරණ තැනැත්තේ බොහෝ සෙයින් ප්‍රීතිප්‍රමොද්‍ය බහුලව වාසයකරයි.

පෙර එක් ගමෙක ගොවියෙක් සිටියේය, දිනක් හෙතෙම කුඹුරක් කොටන්ට ගියේය, උදළු තලය යමක හැපුණේය, කුමක්දැයි පරීක්ෂාකලවිට රන්කඳකි, පෙර එතන සිටුවරයෙකුගේ මාලිගයක් විය, ඒ රන්කඳ වනාහී ඒ සිටුවරයා විසින් නිදන්කරණ ලද්දකි. ගොවියා උස්සාගන්ට මහන්සිගත් නමුත් නොහැකිවිය. ඉක්බිති හෙතෙම මෙසේ සිතුවේය. මේ රන්කඳ මම සතරකට බෙදමි, එයින් කොටසක් ජීවිකාව පිණිස ගණිමි, කොටසක් නිදන්කර තබමි, කොටසක් රැකීරක්ෂාවන්හි දියුණුවට යොදමි, කොටසක් දානාදී පින්කම් පිණිස යොදමි යි මෙසේ කුසල් සිතක් උපදවාගත් කල්හී නිරායාසයෙන් රන්කඳ ඔසවාගත හැකිවිය. සැබෑඅදහසින් දන්දෙමියි ඉටාගත් පමණින් මනුෂ්‍යයාහට සැප ලැබේ.

දෙවතානුස්මෘතිය– මෙය වඩන තැනැත්තා ශ්‍රද්ධාදී ගුණයන් ගෙන් යුක්තව මෙසේ සිතිය යුතුය. උඩ දෙව්ලෙව්හි චාතුර්මහාරාජිකාදී දෙවියෝ ඇත්තාහුය, ඒ දෙවතාවෝ යම් ශ්‍රද්ධාවකින් යම් ශීලයකින් යම් ත්‍යාගයකින් යම් ප්‍රඥාවකින් යුක්තවූවාහු මෙයින් චුතව එහි උපන්නාහුද මවත් එබඳු ශ්‍රද්ධාදිය ඇත්තේයයි මෙසේ දෙවියන් සාක්ෂිස්ථානයෙහි තබා තමාගේ ශ්‍රද්ධාදී ගුණ සිහිකට යුතුය.

මරණානුස්මෘතිය– මෙහි මරණය නම්– එක් භවයකට අයත් ජීවිතෙන්ද්‍රිය සිඳීයෑමයි, ජීවිතෙන්ද්‍රිය නම් චිත්ත චෛතසිකයන් ප්‍රාණවත්ව පවත්වන ධර්මස්වභාවයි, තහවුරුව පවත්නා ජීවිතෙන්ද්‍රියයක් නැත, නමුත් පරම්පරා වශයෙන් බෑසයන මහගඟ වතුරක් සෙයින් ක්ෂණ ක්ෂණයෙහි ඇති නැතිවී පෙළසැදී පවත්නා මේ ජීවිතෙන්ද්‍රිය චිත්ත චෛතසිකයන් රකිමින් ස්කන්ධ පරිනිර්වාණය දක්වා පවතියි, එක් භවයකට ඇතුලත් ජීවිතෙන්ද්‍රියයාගේ සිඳීයෑම මරණයයි. හේ වනාහී චුතිචිත්තය සමග ජීවිත රූපයාගේ අභාව යයි. ඒ මරණය කාලමරණය අකාල මරණයයි දෙවැදෑරුම්. කාල මරණය පින් ගෙවීයෑමෙන් හෝ ආයු ක්ෂයවීමෙන්ද අකාලමරණය උපච්ඡේදක කර්ම වශයෙන්ද වෙයි.

කර්මක්ෂය මරණය නම්– ඒ ඒ ලොකයට නියමිත ආයුෂ ඉතිරිව තිබියදී ප්‍රතිසන්ධිය දුන් කර්මශක්තිය ගෙවීමෙන් වන මරණයයි

ආයුක්ෂය මරණය නම්– ප්‍රතිසන්ධියදුන් කර්මය ඉදිරියටත් ජීවිතය පවත්වන්ට සමර්ථවුවත් තමන් ඉපිද සිටින ලෝකයට නියම ආයුෂ ගෙවීමෙන් සිදුවන මරණයයි. උභයක්ෂය මරණය නම්– ඒ ඒ සත්ත්ව කොටස්වලට නියම ආයුෂ හා ප්‍රතිසන්ධිය ගෙණදුන් කර්මශක්තියත් එකවිට සිඳීයාමෙන් සිදුවන මරණයයි. උපච්ඡේදක මරණයනම්– නියම ආයුෂ ඉතිරිව තිබියදීත් ප්‍රතිසන්ධියදුන් කර්මශක්තිය ඉතිරිව තිබියදීත් පෙර හෝ මේ අත්බැව්හි උපඝාතක කර්මයකින් සිදුවන මරණයයි.

මනොපදොසික දෙවියෝ සිත දුෂ්‍යකර ගැණීමෙන්ද ඛිඩ්ඩා පදොසික දෙවියෝ පමාබැව් හෙතුවෙන්ද සමහර මිනුෂ්‍යයෝ නොයෙක් විපත්වලින්ද මැරෙත්. එවැනි මරණ උපච්ඡේදක කර්මවලින් සිදුවෙත්. දූසීමාර, කලාබු රජ, නන්ද යක්ෂ, නන්ද මානවකාදීහුද මෙවැනි උපච්ඡේදක කර්මවලින් මැරුණාහ.

මේ මරණානුස්මෘතිය වඩන්නහු විසින් ‘මරණං මෙ භවිස්සති’ ‘ජීවිතින්ද්‍රියං උපච්ඡිජ්ජිස්සති’ යනුවෙන් මරණය මට වන්නේය, ජීවිතෙන්ද්‍රිය සිඳීයන්නේය කියා හෝ “මරණං මරණං” යනුවෙන් මරණය මරණය කියා හෝ නුවණින් මෙනෙහි කටයුතුය. නුනුව ණින් මෙනෙහි කරන්නාහට ප්‍රියවූවකුගේ මරණය සිහිකිරීමේදී ශොකය උපදී. වැදූ මවහට ප්‍රිය පුත්‍රයාගේ මරණය සිහිකිරීමේදී මෙනි. අප්‍රියවූවහුගේ මරණය සිහිකිරීමේදී සතුට උපදී. සතුරෙකුට සතුරෙකුගේ මරණය සිහිකිරීමේදී මෙනි. මධ්‍යස්ථවූවකුගේ මරණය සිහිකිරීමේදී සංවෙගය නුපදී. මෘතශරීර දකීමේදී මිනී දවන්නාට මෙනි. තමන්ගේ මරණය සිහිකිරීමේදී තැතිගැණීමක් උපදී ඔසවනලද කඩුගත් අත් ඇති පුරුෂයකු දක බියසුල්ලාට මෙනී, මේ සියල්ලටම සිහිය, සංවෙගය, ඥාණය යන මොවුන්ගේ නොරවීමෙන් වෙයි. යමෙක් මේ මරණය උපන්නහුට නියතයයි සිහිනොරේ නම් ඔහට සංවෙගය උපදී. ඥනයද ඇතීවේ, ඉෂටජන යන්ගේ මරණාදිය නිසා ශොකාදිය නැතිවේ. එබැවින් ඒ ඒ තත්හී මල සතුන්බලා පෙරවිසූ සැපැතියන්ගේ මරණද සිහිකොට සිහියද සංවෙගයද නුවණද එලවා මරණය වන්නේය යනාදි ක්‍රමයෙන් මෙනෙහි කටයුතුයි. මෙසේ වඩන්නාවූ තියුණු ඉඳුරන් ඇති නුවණැතියාහට පඤ්චනිවරණයෝ යටපත්වෙති. මරණය අරමුණු කොට සිහිය පිහිටයි, කාමච්ඡන්ද උපචාර ධ්‍යානයට පැමිණෙයි. මෙය වැඩීමෙන් ජීවිතමදය නැතිව පරලොව දුගතියෙන්ද මිදිය හැක්කේය, පෙරකීලෙස මරණය ගැන සිහිකර බැලීමේදී උපචාර ධ්‍යානය උපදවාගත නොහැකි නම් ඔහු විසින් යතුරකු එලඹසිටීම් වශයෙන්ද සම්පත්ති විපත්ති වශයෙන්ද අනුන්ගේ මරණ හා

තමන්ගේ මරණය එලවා බැලීමෙන්ද ශරීරය බොහෝ දෙනාට සාධාරණ වශයෙන්ද, ජීවිතයාගේ දුර්වලභාව වශයෙන්ද මරණයට නියම නිමිති රහිතබැව් වශයෙන්ද කාලපරිච්ඡේද වශයෙන්ද ක්ෂණයාගේ ස්වල්ප බැව් වශයෙන්ද යන මේ අට ආකාරයෙන් මරණය සිහිකට යුතුයි.

යම්සේ මොහුගේ හිස සිඳින්නෙමියි කඩුවක් ගෙණ බෙල්ල ලඟ හැසිරෙන්නාවූ වධකයෙක් එළඹසිටියේ වේද, මෙසේ මරණයද එළඹසිටියේයයි සිහිකට යුතුයි. කුමක්හෙයින්දයත් උත්පත්තිය සමග ආ හෙයින් ජීවිතය පැහැරගන්නා හෙයිනි. යම්සේ හතු කැකුළු මුදුනෙන් පස්ගෙණම නැගේද එසේම සත්වයෝ ජරා මරණ දෙක ගෙණම උපදිත්, ඒ සත්වයන්ගේ පිළිසිඳගන්නා සිත ඉපදීමට අනතුරුවම ජරාවට පැමිණ කඳු මුදුනකින් වැටෙන ගලක් මෙන්, තමන් සමග යෙදෙන අනිකුත් ස්කන්ධයන් සමගම බිඳේ. මෙසේ පළමුකොට ක්ෂණික මරණය උත්පත්තිය සමග ආයේය, උපන් සත්වයා අවශ්‍යයෙන් මැරෙණ බැවින් මෙහි අදහස් කරනලද ජීවිතේන්ද්‍රිය සිඳීයාමෙන් වන මරණයද උත්පත්තිය සමගම ආයේය. එහෙයින් මේ සත්වතෙම උපන්කල් පටන් යම්සේ නැංගාවූ හිරුතෙමේ බැසීමට අභිමුඛව යේද ගිය ගිය තැනින් මඳකුත් නොනවතීද එමෙන් මරණයට අභිමුඛවූයේ වෙයි.

මෙසේ උත්පත්තිය සමග ආ මේ මරණය කඩුව ගෙණ පිටිපස සිටින වධකයා මෙන් දිවිනසාමියි වධකයකු එළඹ සිටීම මෙන් මරණය සිහිකට යුතුයි. මිනිසකුට සම්පත් වශයෙන් ගතයුතු ප්‍රධාන කරුණු තුනකි, එයින් නිරෝගී බව ව්‍යාධි නමැති සතුරු පැහැර ගණියි, තරුණ බව ජරා නමැති සතුරු පැහැර ගණියි, ජීවිතය මරණ නමැති සතුරු පැහැර ගණියි.

මහාසම්මතාදී රජවරුද ජෝතිය ජටිලාදී මහපිණැති සිටුවරුද වාසුදේව බලදේවාදී මහබලැතියෝද යම්සේ මළාහු නම් සියලු සත්වයෝම එසේ මරණයට පැමිණෙත්නාහ. මමද මරණයට පැමිණෙන්නෙමි.

මේ කාය අසූකුලයක පණුවන්ට සාධාරණ වන්නේය, ඔවුන්ගේ ප්‍රසූතිකාගාරයත් ආරෝග්‍ය ශාලාවත් මැසිකිළියත් සොහොන් භූමියත් මේ ශරීරය මය, ඒ පණුවන්ගේ ප්‍රකෝපයෙන්ද මරණය පැමිණිය හැකිය.

සත්වයන්ගේ ජීවිතය ආශ්වාස ප්‍රශ්වාසාදිය පිළිබඳව පවත්නා හෙයින් ඔවුන්ගේ යම පැවතුම් ඇතිබව ලබන්නේම දිවි පවතියි. නිපුණු හැටියේ මරණය පැමිණේ.

මෙතෙක්කල් ජීවත්විය යුතුය, අසවල් රෝගයෙන්ම මැරෙන්නේය, යනාදී වශයෙන් මරණයට නියම ව්‍යවස්ථානයක්ද නැත්තේය.

ජීවිත කාලයාගේ දූන් පිරිසිඳීමක් නැත, කාලපරිච්ඡේදය කුඩු නැත්තේය, යමෙක් වැඩිකල් ජීවත්වන්නේ නම් අවුරුදු සියයක් හෝ ඊට අඩුවැඩි කාලයකි, පරමාර්ථ වශයෙන් සත්වයන්ගේ ජීවත්වන ක්‍ෂණය ඉතා ස්වල්පය, එක් සිතක් පවත්නාතල් පමණවේ. ඊට උපමාවක්ද නැත, එතරම් සියුම්ය, මෙසේ ක්‍ෂණය ස්වල්ප බැවින්ද මරණය සිහිකටයුතුය, මේ ආදී වශයෙන් මරණානුස්මෘතිය වැඩීම දුකින් එතරවීමට හෙතුවේ.

**කායගතාසතිය**– මේ භාවනාව බුද්ධෝත්පාද කාලයකම ලැබිය යුතුය, එබැවින් බුදුරජානන් වහන්සේ විසින් "අමතං තෙ භික්ඛවෙ පරිභුඤ්ජන්ති, යෙ කායගතාසතිං පරිභුඤ්ජන්ති" යනුවෙන් යම් කෙනෙක් කායගතාසති ධ්‍යානයට සමවැදීමෙන් වළඳත්ද, ඔව්හු අමෘතය වළඳත්යයි වදාළසේක.

එම භාවනාව– "අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං න්හාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සුවසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තන්ති".

මෙහි අදහස– මාගේ මේ ශරීරයෙහි කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර, ඇට, ඇටමිදුළු, වකුගඩු, හදවත්, අක්මා, දලබුව, බඩදිව, පපුමස, අතුණු, අතුණුබහන්, උදරිය, කසල, පිත, සෙම, සැරව, ලේ, ඩහදිය, මේදතෙල්, කඳුළු, වුරුණුතෙල්, කෙල, සොටු සදමිදුළු, මූත්‍ර යන මේ කුණපයෝ ඇත්තාහ.

මෙහි වනාහී "මත්ථලුඞ්ගං" යනුවෙන් දක්වනලද හිස්මොළ "අට්ඨිමිඤ්ජා" යනුවෙන් දක්වනලද ඇටමිදුලෙහි ඇතුළත් කරණලද්දේය.

මෙය වඩන්නහු විසින් කල්‍යාණ මිත්‍රයකු කරා එළඹ කීම් වශයෙන්ද සිතීම් වශයෙන්ද වර්‍ණවශයෙන්ද සටහන් වශයෙන්ද දිශා වශයෙන්ද අවකාශ වශයෙන්ද පිරිසිඳීම් වශයෙන්දැයි මෙසේ සත් ආකාරයකින් උග්ගණ්හීමෙහි දක්‍ෂභාවය ඇතිකර ගතයුතුයි.

අනුපූර්‍ව වශයෙන්ද, ඉතා ඉක්මන් නොවීමෙන්ද, ඉතා සෙමින් නොවද වික්‍ෂෙප නොවීමෙන්ද, පැණවීම් ඉක්මවීමෙන්ද, අනුපූර්‍වයෙන් හැරීමෙන්ද අර්පණා වශයෙන්ද, සූත්‍රාන්ත තුන දැයි මෙසේ දශආකාරයකින් මෙනෙහි කිරීමෙහි දක්‍ෂබවද අසා තමටහත් ගතයුතුය.

මේ කෙශාදී දෙතිස් කුණපයෝ "පිත්තං" යන පදය වෙනුවට "මත්ථලුඞ්ගං" යනපදය යොදා පිළිවෙළින් පස පස බැගින් කොටස් සතරකටද, "පිත්තං" යන පදය "සෙම්හං" යන පදයට මුලින් යොදා ඉතිරි දෙළොස සය සය බැගින් දෙකොටසකටද බෙදන ලද්දාහුය. ඒ ඒ කොටස්වල අග පෙණෙන කුණපයාගේ නාම වශයෙන්ද ඒ ඒ කොටස්වල නාමයෝ යෙදෙත්. එනම්:- "කෙසා ලොමා නඛා දන්තා තචො" යන මේ පඤ්චකයෙහි අගපෙණෙන තචො යන නාමය වශයෙන් මේ පඤ්චකයට තච පඤ්චකයයි කියති. සෙසු කොටස්වල නම්ද මෙසේ දතයුතු.

ඉගෙණීමේ දක්ෂභාවය ඇතිකරගතයුතු සත් ආකාරය- මෙය වඩන කල්හී ත්‍රිපිටකධාරීයා විසිනුදු ප්‍රථමකොට වචනයෙන් සජ්ඣායනා කටයුතුය. එයද අනුලොම ප්‍රතිලොම වශයෙනි. හේ කෙසේදයත්.

"කෙසා ලොමා නඛා දන්තා තචො" යන මේ තච පඤ්චකය කියා නැවත ආපසු 'තචො දන්තා නඛා ලොමා කෙසා' යයි කියයුතු. ඉක්බිති දෙවන පඤ්චකයේ මුලපටන් 'මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං' යන මේ පස කියා නැවත ආපසු 'වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරු මංසං තචො දන්තා නඛා ලොමා කෙසා'යි අවශානය දක්වා කියයුතුය. මේ පිළිවෙළින් සියල්ල කියන පරිදි මෙසේය.

### තච පඤ්චකය.

(අනුලොමය) කෙසා ලොමා නඛාදන්තා තචො,

(ප්‍රතිලොමය) තචො දන්තා නඛා ලොමා කෙසා,

### වක්ක පඤ්චකය.

(අනුලොමය) මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං,

(ප්‍රතිලොමය) වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරු මංසං, තචො දන්තා නඛා ලොමා කෙසා,

### පප්ඵාස පඤ්චකය.

(අනුලොමය) හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං,

(ප්‍රතිලොමය) පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං, වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරු මංසං, තචො දන්තා නඛා ලොමා කෙසා.

### මත්ථලුඞ්ග පඤ්චකය.

(අනුලොමය) අන්තං අන්තගුණං උදරියං කරීසං මත්ථලුඞ්ගං.

(ප්‍රතිලොමය) මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං, පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං, වක්කං අට්ඨි මිංජ අට්ඨි නහාරු මංසං, තචො දන්තා නඛා ලොමා කෙසා.

### මෙදෙ ඡක්කය.

(අනුලෝමය) පිත්තං සෙම්හං පුබ්බං ලෝහිතං සෙදෙ මෙදෙ.
(ප්‍රතිලෝමය) මේදෙ සෙදෙ ලොහිතං පුබ්බං සෙම්හං පිත්තං, මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං, පප්ඵාසං පිහකං කිලෝමකං යකනං හදයං වක්කං, අට්ඨිමිංජං අට්ඨි නහාරු මංසං, තචො දන්තා නඛා ලෝමා කෙසා.

### මුත්ත ඡක්කය.

(අනුලෝමය) අස්සු වසා ඛෙලො සිංඝාණිකා ලසිකා මුත්තං.
(ප්‍රතිලෝමය) මුත්තං ලසිකා සිංඝාණිකා ඛෙලො වසා අස්සු මෙදෙ සෙදෙ ලොහිතං පුබ්බං සෙම්හං පිත්තං මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං පප්ඵාසං පිහකං කිලෝමකං යකනං හදයං වක්කං අට්ඨිමිංජං අට්ඨි නහාරු, මංසං තචො දන්තා නඛා ලෝමා කෙසා.

මෙසේ සිය දහස් ලක්‍ෂ වාරයන්හි වචනයෙන් සජ්ඣායනා කටයුතුය. (පාඩම් කළයුතුය.) එවිට කම්ටහන් පෙළ ප්‍රගුණවෙයි. ඈත මෑත සිත නුදුවයි, පඤ්චකාදී කොටස් ප්‍රකටවෙති, වචනයෙන් පාඩම් කිරීම සිතින් මෙනෙහි කිරීමට පිහිටවෙයි, සිතින් මෙනෙහි කිරීම ලක්‍ෂණ ප්‍රතිවේධයට පිහිටවෙයි, එවිට සිතීමෙහි දක්‍ෂබව ඇතිවීයයි දතයුතු.

කෙසාදී කුණප කොට්ඨාසයන්ගේ වර්ණය නියමකොට ගැන්ම වර්ණවශයෙන් සැලකීමේ දක්‍ෂභාවයයි. එම කෙසාදීන්ගේ සටහන් නියමකොට ගැන්ම සටහනෙහි දක්‍ෂබවයි. ශරීරයාගේ නැබෙන් උඩකොටස උඩදිසාවයයිද, නැබෙන් යට කොටස යටදිසාවයයිද ඒ දෙදිසාවෙන් අසවල් දිසාවෙහි මේ කුණප කොටස පිහිටියේයයි දිසාව වෙන්කොට ගැන්ම දිසාවෙහි දක්‍ෂබවයි. මේ කුණප කොටස අසවල් අවකාශයෙහියයි මෙසේ ඒ ඒ කොටස් පිහිටි අවකාශයන් කොට ගැන්ම අවකාශයෙහි දක්‍ෂබවයි, මේ කුණප කොටසට යටින්ද උඩින්ද සරසින්ද ඉම මේ මේ යයි ඉම පිරිසිඳ ගැන්මද කෙශයෝ ලොම නොවෙති, ලෝමයෝද කෙශයෝ නොවෙත්යයි මෙසේ ඒ ඒ කුණපයන් අමිශ්‍රකොට පිරිසිඳ ගැන්ම පිරිසිඳීමෙහි දක්‍ෂබවයි, මෙසේ සත්වැදෑරුම් උගෙණීමෙහි දක්‍ෂභාවය දතයුතුයි.

මෙනෙහි කිරීමෙහි දසවැදෑරුම් දක්‍ෂබැව්– මේ කර්මස්ථානය පුහුණු කිරීමෙහි පටන් පිළිවෙළින් අතරතුර එක එක නොහැර මෙනෙහි කටයුතුය, ඉතා ඉක්මණින් මෙනෙහි නොකටයුතුය. මේ කර්මස්ථානය හැර අනික් අරමුණක සිතෙහි විසිරීම වැළැක්විය යුතුය, කෙශයෝය, ලෝමයෝය යන නම් සිහිනොකර පිළිකුල්ය

යනු සිත තැබිය යුතුය. යම් යම් කොටසක් නොවැටහේ නම් ඒ ඒ කොටස දුරුකොට මෙනෙහි කටයුතුය, කේසාදී එකී එකී කොටසෙහි අර්පණා සමාධිය උපදනේයයි දතයුතුයි, වීර්‍ය්‍යය හා සමාධිය සමව යොදනු පිණිස "අධිචිත්ත සූත්‍රාන්තය, සීතිභාව සූත්‍රාන්තය සහ බොජ්ඣඞ්ගකොසල්ල සූත්‍රාන්තය" දැයි යන මේ සූත්‍ර තුන දතයුත්තානුය.

**අධිචිත්ත සූත්‍රාන්තයෙහි අදහස**- සමථ විදර්ශනා චිත්තයෙහි යෙදුනු භික්ෂුව නිමිති තුනක් සැලකිය යුතුය. එනම් කලින්කල සමාධිය වීර්‍ය්‍යය හා මධ්‍යස්ථභාවය මෙනෙහි කටයුතුය, සමාධියම මෙනෙහි කළොත් සිත කුසිත බව පිණිස පවත්නේය, වීර්‍ය්‍යයම මෙනෙහි කළහොත් සිත උඩඟුවේ. මධ්‍යස්ථ භාවයම මෙනෙහි කළහොත් සිත එකඟ නොවේ. එසේ නොකොට වරින්වර තුනම මෙනෙහි කළහොත් සිත මොළොක්ද වෙයි, ක්‍රියාවට යොග්‍යද වෙයි, පිරිසිදුද වෙයි, ක්‍රියාවට නැමීමෙන් නොබිඳේ, ආශ්‍රවයන්ගේ ක්ෂයවීම පිණිස මනාව එකඟවෙයි.

**සීතිභාව සූත්‍රාන්තයෙහි අදහස**- කරුණු සයකින් යුත් භික්ෂුතෙම නිවන් සාක්ෂාත්කිරීමට යොග්‍යවෙයි. එනම්- සිත නිග්‍රහ කටයුතු කල්හි නිග්‍රහ කිරීමට වැඩියයුතුකල්හි වඩා ගැණීම සතුටු කළයුතු කල්හි එසේ කිරීම මැදහත් කළයුතු කල්හි එසේ තබා ගැණීම මාර්ගඵල ලැබීමෙහි අදහස් ඇතිව විසීම, නිර්වාණෙහි ඇලීම යන සයෙන් යුත් භික්ෂුතෙමේය යනුයි.

**බොජ්ඣඞ්ග කොසල්ලය**- සිත යම්කලෙක ලිහිල්ව සැඟවී ගියේ නම් එකල ධම්මවිචය, වීරිය, පීති යන සම්බොජ්ඣඞ්ගයන් වැඩීමෙන් ඊට නිග්‍රහ කටයුතුය. යම්කලෙක සිත උඩඟුවූයේ නම් එකල පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන සම්බොජ්ඣඞ්ගයන් වැඩීමෙන් ඊට නිග්‍රහකටයුතුය යනාදී වශයෙන් බොජ්ඣඞ්ග ධර්මයන් වැඩීමේ දක්ෂභාවයයි.

**උපසමානුස්සතිය**- රාග ද්වේෂ මෝහාදී කෙලෙසුන්ගේ සංසිඳීයාම සිහිකරලීමයි, වත් පිළිවෙත් වශයෙන් හෝ ධුතාඞ්ග සමාදාන වශයෙන් හෝ ධ්‍යාන සමාපත්ති වශයෙන් හෝ විදර්ශනා වශයෙන් හෝ ස්වසන්තානයෙහි පැවැති කාමරාගාදීන්ගේ ව්‍යුපශමය, තමා විසින් ප්‍රතිවේධ කරණලද නිර්වාණය හෝ සිහිකිරීම උපසමානුස්සතිය නම්වේ.

එබැවින් මෙහි දක්වූ පරිදි සතිබලය දියුණුකර ගැණීමෙන් ලොවී ලොවුතුරු සැප ලැබීමට උත්සාහවත් වියයුතුයි.

**නමො සම්මා සම්බුද්ධස්ස.**

---

නාගෙනහිර පස්යොදුන්කෝරළේ රත්මලේ
**සිරි අරියවංසාරාමාධිපති මොරටුවේ සිරි සාසනවංස**
මහා ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ විසින්
ලියනලද ධර්මදේශනාව.

---

# ස මා ධි බ ල ය.

---

**කතමං සමාධිබලං? උද්ධච්චෙන න කම්පතීති සමාධිබලං, සහජාතානං ධම්මානං උපත්ථම්භනට්ඨෙන සමාධිබලං 1, කිලෙසානං පරියාදානට්ඨෙන සමාධිබලං 2, පටිවෙධාදි විසොධනට්ඨෙන සමාධිබලං 3, චිත්තස්ස අධිට්ඨානට්ඨෙන සමාධිබලං 4, චිත්තස්ස වොදානට්ඨෙන සමාධිබලං 5, විසෙසාධිගමට්ඨෙන සමාධිබලං 6, උත්තරි පටිවෙධට්ඨෙන සමාධිබලං 7, සච්චාභිසමයට්ඨෙන සමාධිබලං 8, නිරොධෙ පතිට්ඨාපනට්ඨෙන සමාධිබලං 9, ඉදං සමාධිබලං.**

පින්වතුනි! සත්තිස්බොධිපාක්ෂික ධර්ම පිළිබඳ එක්විසිවන සමාධිබලයද හදිසියෙන් අපට ලියන්ට සිදුවීම ගැණ ප්‍රීතිවෙමි. එහෙත් අනවකාශභාවය නිසා වැඩි විස්තර සසඳා ලිවීමට අපහසුබව කියමි. විසිදෙවෙනි දේශනායද අප විසින් ප්‍රකාශකර තිබෙන බැවින් එයද ලිවීම අපටම පැවරී තිබීමද, අවිවේකයට එක් කාරණකි. මේ සියලු අවහිර අප තුලින් ඉවත්වී මෙය ලිවීමට ප්‍රොත්සාහිවන්නේ බොධිපාක්ෂික ධර්ම පිළිබඳව හදපත්ලෙන් පැනනගින බුද්ධාලම්බන ප්‍රීතිය මැයි. එනිසා මෙයද ලිවීම අපට ඉමහත් ප්‍රීතිසොම්නසකි. අතිගම්භීර මෙම ධර්මයන් නමැති මධුරපානය අනුභවකොටම සකල ජනතාව සංසාර දුකින් නිදහස්විය යුතුමයි. එසේද නමුත් මිහිරි රසයක් බුදින්නාසේ මෙය ලෙහෙසි කාරණක් නම් නොවේ. මෙම ධර්ම සියස්වර අසාද තේරුන් ගැණීමට දුෂ්කර වෙත්. මන්ද? අලපතෙහි ඇති බූව නිසා දිය රඳවන්ට තබා සවල් පයකුදු තවරන්ටවත් නොහැක. එලෙසම පෘථග්ජනයාගේ සිත් නමැති අලපතෙහි පැතිරී සිහින්ව තිබෙන කාමපිපාසාදී කෙලෙස් බූව නිසා ධර්ම නමැති, ජලය තවරන්ටවත් රඳවන්ටවත් නොම හැකිවෙත්. සාමාන්‍ය ධර්ම එලෙස නම් අතිගම්භීර බොධිපාක්ෂික ධර්ම කෙසේ නම් අලවාලිය හැක්කේද නොහැකි මැයි. එසේද

නමුත් සසර බියෙන් ත්‍රස්තව සිටින්නෙකුට නම් මෙම ධර්මයන් අවබෝධකර ගැණීමට නොව විශේෂ වශයෙන් තේරුන්ගෙන පින් රැස්කර ගැණීමට මාර්ග යොදාගැණීම අපහසු නොවේ. එසේ තේරුන් ගැණීමද කණින් අසාම නොහැකි බැවින් මෙම ධර්මයන් දේශනාකල අයුරින්ම පොත්කොට පිසුරුවා හැරීමට අදහස්කර තිබේ. ඒ ඉතා ශ්‍රේෂ්ට ක්‍රියාවකි. එබැවින් මෙ පොත් භාවිතා කිරීමෙන් මෙම ධර්මයන් අවබෝධකර ගන්නාලෙස සිහිපත් කරවමු.

ධර්මශ්‍රවණය කිරීමේ බලාපොරොත්තුවෙන් සිටින මෙම පින්වතුන්ට ධර්මාවවාදයක් වශයෙන් යහපත් අදහසක් කියා කර දුන්හොත් දූනට ශ්‍රද්ධාව පෙරටුව තිබෙන ප්‍රීතිසිත උකටලීනොවී මැලිනොවී නියම වේලාව අවසන්වන තුරුම නිදනොවැටී සිහියෙන් බන අසන්ටම හැකිවෙනවා ඇත. එනිසා පලමුකොට ධර්මාවවාද වශයෙන් යමක් කියමි.

සුගතො වා භික්ඛවෙ ලොකෙ තිට්ඨමානො සුගත විනයො වා තදස්ස බහුජනහිතාය, බහුජනසුඛාය, ලොකානුකම්පාය, අත්ථාය, හිතාය සුඛාය දෙවමනුස්සානං යනුවෙන් ධර්මය දරු සිටින්නන්ගේ මහෝපකාරී භාවය මනාදහැටි ප්‍රකාශවේ. එහි අදහස මෙසේයි. මහණෙනි! මේ ලෝකය දුකින් මුදවා සුවපත්කර වීමට, සියලු ලෝකසත්ත්වයාම නිර්වාන සම්පත්තියෙන් සතුටුකරවාලීමට– තථාගත සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ හෝ, උන්වහන්සේ විසින් නිවන්සැප ලබාගැණීමට දේශනාකරණලද ශ්‍රී සද්ධර්මය දූන උගෙන දේශනා කිරීමෙහි සමර්ථ සුගත විනයයෙක් හෝ– හෙවත් තථාගත ශ්‍රාවකයෙක් හෝ වියයුතුයි. උන්වහන්සේලා ඒකාන්තයෙන්ම සියලු ජනයාට හිතවැඩ පිණිසද, බොහෝ ජනයාට උපදි නිරුපදි සැප පිණිසද, සකල ලෝකයට අනුකම්පා පිණිසද, දෙව් මිනිස් ආදී සියලු සතුන්ට හිතවැඩ පිණිසද, සැප පිණිසද පවතිත්. මෙය තවදුරටත් සිතා බලමු. තථාගතයන් වහන්සේලාද, ශ්‍රාවකයන් වහන්සේලාද, ජීවමානව වැඩසිටින කාලවලදී නම් උන්වහන්සේලා දූක සියතින් උපස්ථාන කිරීම් ආදියෙන් පින් රැස්කරගෙණ ත්‍රිවිධසැප සාධාගැණීමේ උත්සාහය ඇතිකර ගත හැකියි. ඒ අනුව සිතාබලනකල දූන් අපට එබඳු යහපතක් සැලසීමක් දුකින් මිදීමක් ඇතිකරගන්ට තිබෙන්නේ උන්වහන්සේලා දෙසූ ශ්‍රී සද්ධර්මයයි. එය උන්වහන්සේලා ජීවමානව සිටින්නාසේ අසා සිත්හිදරා පිළිපැද්ද යුතුයි. බුදුන්වහන්සේද, ධර්මය බුදුවරයෙක් වැඩඉන්නාලෙස සලකන්ටයයි අපට දේශනාකර තිබේ. හේ මෙසේයි–

"ධම්මො වො භික්ඛවෙ මමච්චයෙන සත්ථා" යනුවෙනි. මහණෙනි! භික්ෂු භික්ෂුණී, උපාසක, උපාසිකා යන සතර පිරිසට මා පිරිනිවන් පෑමෙන් පසු ධර්මය තෙම ශාස්තෘන් වහන්සේයයි ප්‍රකාශකොට තිබේ එසේ ප්‍රකාශකාලේ සියලු ලොවී ලොවුතුරු සැප සම්පත් සාධාගැණීමට ඇති සියලුම අභිවෘද්ධිය ධර්මයෙහි සම්පූර්ණව ප්‍රකාශවන බැවිනි. මෙනිසා ජීවමාන බුදුවරයෙකුට පවත්වන සම්පූර්ණ ගෞරවාදර භක්තියඋපදවා මෙම බොධිපාක්ෂික ධර්ම සියල්ල අසා නැවත නැවත භාවිතාකර ත්‍රිවිධ සම්පත් සාධාගන්නාලෙස කාරුණ්‍ය පෙරටුව මතක්කරමි.

මෙතැන්සිට අපි මුලින් දෙසනා කරන්ට යෙදුන සමාධිබලය පිළිබඳව ඉතාම ලුහුඬු විස්තරයක් කරන්ට අදහස් කරමු. පළමු වෙන් මා මාතෘකාපාඨය වශයෙන් ප්‍රකාශකරන්ට යෙදුනේ පටිසම්භිදා මාර්ගයෙහි සමාධිබලය විස්තරකරන්ට පටන්ගත් දේශනා පාඨයයි. එහි අදහස ක්‍රමයෙන් මෙසේ තේරුන් ගතයුතුයි.

"කතමං සමාධිබලං?" සමාධිබලයයි කියන්නේ කවර නම් බලයකටද? "උද්ධච්චෙ න කම්පතීති සමාධිබලං" උද්ධච්චයෙහිදී (උඩගුබව නිසා) කම්පාකරන්ට, සොලවාලන්ට, විපිළිසරභාවයට පමුණුවන්ට නොහැකිවන ලෙස් සිතෙහි එක අරමුණක එල්බසිටීම සමාධිබලය නම් වේ. මෙකියන සමාධිය නව ආකාරයකින් බලයට පැමිණේ. එය විස්තර කරන්ට ප්‍රථම– සමාධි, බල යන වචනදෙක තේරුන්කරගත යුතුයි.

"සමාධි– එකාරම්මණෙ සමං ආධීයති ඨපෙති චිත්තන්ති සමාධි නාමාති අත්ථො" නොයෙක් අරමුණු ඔස්සේ දුවපනිමින් විසමස්ථානයන්ම සෙවනය කරණ එළෙසම පළපුරුදු සිත දැඩි ධෛර්‍යයෙන් එක්අරමුණක සමව තබාගෙණ එහි රඳවාගණීක්නුයි සමාධි නම් වේ යන අර්ථයි. සපිරසේ කුශලසහගත සිතක නොසැලෙන අයුරින් පිහිටීම සමාධි නම් වේ. "බලං අනභිභවනීයතො අකම්පියට්ඨෙන බලං" යටකරලීමට නොහැකි හෙයින්ද, උද්ධච්චාදි සිත් වලින් සොලවාලිය නොහැකි බැවින්ද බල නම් වේ. එතකොට සමාධි බල යන වචන දෙක එක්කළවිට අදහස අන්කිසි අකුසලයකින් කම්පාකරන්ට නොහැකිවන පරිදි එක් අරමුණක එල්බ ගිය බලපරාක්‍රමයෙන් යුක් සිතට සමාධිබලයයි කියනු ලැබේ.

මෙහි සමාධි යන වචනය තවදුරටත් තේරුන්කරගත යුතුයි. සමාධි යන වචනයෙහි සම්පූර්ණ විස්තරයක් කිරීමට පටන්ගැන් මෙන් බලාපොරොත්තු ප්‍රතිඵල නොලැබී අඩුලකටම පැමිණෙන්ට වෙයි. මන්ද? ඉතා විස්තර බැවිනි, එනිසා අපි සමාධි බලයට අදාල

මත අයුරු සමාධියේ විස්තර විසඳා තේරුම්කර ගණිමු. සමාධියයි කීවේ- එක්අරමුණක චිත්ත චෛතසික ධර්මයන් සමසේ නොවිසිරී යනසේ තැබීමයි.

මෙම සමාධියෙහි ලක්ෂණාදි සතර තේරුම්ගත යුතුයි. සමාධියේ ලක්ෂණය (ස්වභාව) අවික්ෂෙප ලක්ෂණයයි- හෙවත්, කලබල භාවයෙන් වෙන්ව සිටි සංසුන් ස්වභාවයයි. සමාධියේ රසය (කෘත්‍යය) නම්- විපිලිසර භාවයන් නැතිකර ලෑමයි, අවුල් වියවුල් සිත් නැතිකිරීමයි, ප්‍රත්‍යුපස්ථානය හෙවත් වැටහෙන කාරණය නම්- කම්පානොවී නොසෙල්වී එක අරමුණකම පැවැත්මයි. ආසන්න කාරණය නම්- සැපයයි, සුවපත් තැනැත්තාගේ සිත මහා සමාධිමේයි- කී බැවින් සැපය ආසන්න කාරණය ලෙස සිතා ගතයුතුයි.

සමාධිය කොටස් වශයෙන් බොහෝයි. උපචාර- අර්පනා-සුඛ- උපෙක්ෂා- සප්පීතික- නිප්පීතික- හීන මජ්ඣිම පණීත- ආදී වශයෙන් නානාප්‍රකාර වේත්. මෙහි නොයෙක් ආකාර විස්තර- සමාධි ඉන්ද්‍රිය- සමාධි බොධ්‍යඞ්ග ආදියෙහි විස්තරකර තිබේ. එය මෙම පොත්පෙළේ 1, 2, කාණ්ඩවලින් බලා දැනගත යුතුයි. මෙතැන් සිට සමාධිය බලයට පැමිණෙන නවාකාරය පිළිබඳව විස්තරයක් ප්‍රකාශ කරමි.

1 ''සහජාතානං ධම්මානං උපත්ථම්භනට්ඨෙන සමාධිබලං= සො සහජාතෙ උපත්ථම්භෙති'' එක අරමුණක එල්බසිටි කුශල අව්‍යාකෘත චිත්ත චෛතසික ධර්මයන් සැලෙන්ට විසිරෙන්ට ඉඩ නොදී උපකාරවන අර්ථයෙන්ද සමාධිබල නම් වේ. එම බලය එකමුතුබව හා යෙදුන චිත්ත චෛතසිකයන්ට උපකාරව ක්‍රියා කරත්- මෙය පළමුවැනි සමාධි බලයයි.

2 කිලෙසානං පරියාදානට්ඨෙන සමාධිබලං, අත්තනො පටිපක්ඛ කිලෙසෙ පරියාදියති'' කුශල චෛතසික ධර්මයන්ට ප්‍රතිවිරුද්ධවූ කාමාදී ආශ්‍රවයන් ඉතුරු නොකොට විනාශයට පමුණුවන අර්ථයෙන්ද සමාධිබල නම් වේ. නැතිනම් සංසාර විමුක්තිය පතා සිතාගත් අධිෂ්ඨානයට ප්‍රතිවිරුද්ධවූ කෙලෙසුන් විනාශයට පමුණුවන බැවින් දෙවැනිවූ සමාධි බලයයි කියනු ලැබේ.

3 ''පටිවෙධාදි විසොධනට්ඨෙන සමාධිබලං, පටිවෙධස්ස ආදිභූතං සීලං දිට්ඨිංච විසොධෙති'' දුක්ඛ, සමුදය, නිරොධ, මග්ග යන චතුරාර්‍යසත්‍යාවබොධයට ප්‍රථම වඩමින් සම්පූර්ණකරණ සීල, දෘෂ්ටි ආදිය පිරිසිදු කරණ අර්ථයෙන්ද සමාධි බල නම් වේ. චතුස්සත්‍ය ප්‍රතිවෙධයට (ආදිභූතවූ) මුලින් ඇතිවන්නාවූ සීල දෘෂ්ටි ආදිය පිරිසිදුකරණ බලය තුන්වැනි සමාධි බලයයි කියනු ලැබේ.

4 "චිත්තස්ස අධිට්ඨානට්ඨෙන සමාධිබලං- චිත්තං ආරම්මණෙ පතිට්ඨාපෙති" කුසල චිත්තයන් ස්ථිරභාවයට, නිශ්චයට පමුණුවන අදහසින්ද හෙවත් සිතින් යහපත් අරමුණෙහිම එල්බ සිඳහැලෙන් වෙනොදී ස්ථිරත්වයකටම පමුණුවන අර්ථයෙන්ද සමාධිබල නම් වේ. සිත එක් අරමුණක තබා ක්‍රියා කිරීම අතිදුෂ්කර කරුණකි. එසේම ඒ දුෂ්කරවූ කාරණය යමෙකුට කරන්ට නොහැකි නම් ඔහුට සසරින් මිදීමට කිසිමකලක නොහැකි වෙත්. සිත එක අරමුණක තබාගැණීමට සමාධිය- සමාධිබලය නිතර පුහුනුකළ යුතුයි. සමාධි බලයගේ පුහුනු කිරීමෙන්ම සිතෙහි චංචල භාවය දුරලා ගෙන එකඟකරගත යුතුයි. ගං හෝ මූදු ජලය නිතරම චංචලවන් නාක් මෙන් සිතද ඇසිල්ලකුදු එක අරමුණක නොසැදී චංචලවම හැසිරෙත්. ගම්බදව හැසිරෙන හැඳෙන හැඩදූති වනවර කොල් ලෙකුට සිත උපමා කරත හැක. මෙකියන කොල්ලාගේ කික්මීම් සවභාවයක් නම් කොයිම ඉරියව්වකදී වත් දකින්ට නොලැබෙත්. උන්හිටිතැන හෝ වේවා කනබොන කථාබස් කරණ තැන හෝ වේවා සියලු තන්හිම සියලු ක්‍රියාවකදීම සංසුන් සවභාවයක් නැති වාගේ අන්ධ බාල පෘථග්ජනයාගේ සිතද කිසිදවිටක කිසිද තැනක සංසුං සවභාවයක් නම් නැත්තේමය, එය සංසුං කිරීමටනම් සමාධි බල නමැති ඇදුරුම උත්සාහ කළයුතුයි. මක්නිසා සිත එකතැන් කරන්ට අපහසුද- විටක රූපයටද- විටක ශබ්දයටද- විටක සුවඳ ටද- තවත් විටක රසයටද- විටක ස්පර්ශයටද- විටක ලොභයටද- විටක ක්‍රොධයටද- විටක මොහයටද ආදී වශයෙන් දහසක් මෝස් තර වලට පෙරලෙමින් ඒ ඒ දේ ලබාගැණීමේ පිපාසයෙන් නිතරම මදි ඔවම අඩුපාඩු බවම පවසමින් තෘප්තියකට සෑහීමකට නොපැ මිණම යකුන් මැදට වන් බියසුලු නරයෙකුසේ වික්ෂිප්තවම හැසි රෙත්, එනිසාම බුදුන් වහන්සේ මෙසේ දෙසූසේක.

ඵන්දනං චපලං, චිත්තං, දුරක්ඛං දුන්නිවාරයං, ඵන්දනං, දිය රැළිමෙන් නිතර සැලෙන සුලු; චපලං, උස් පහත් තැන නො තැන හොඳනොහොඳ, කුල මල ආ කිසිවක් නොතකා නොසො යා, මස්වැද්දල්ලක්සේ සැමතැනටම ලොල්කරණ සැම තැනම ඇලෙන චපලගති ඇති සිත ආරක්ෂා කරන්ට දුෂ්කරය, ආවරණයකර හසුරුවාගන්ට දුෂ්කරය, එබැවින් නුවනැත්තෝ සමාධි බලකනු වෙහිම බැඳ තබා ඉතා අමාරුවෙන් නික්මවා ගණිත්.

තිල්තන දුටු බඩසගින් පීඩිතවූ ගොනෙක් මෙන්ද- අසූචි ගඳිය දුනගත් නිලමැස්සෙකු දුවයන්නාක් මෙන්ද, ගිණිදුටු පල ගැටියන් මෙන්ද, ජලයෙහි සිසිල ලැබූ රාසොඩෙක් මෙන්ද, පැණියට වන් මැස්සෙකු මෙන්ද, ඇස් කන් ආ සතුටුකරන්වම

තැත්තරමින් දුවපැන අනර්ථයටම අවැඩටම, විනාශයටම පමුණුවන බැවින් සිතදුන්තිවාරය වලකා ගැන්මට ආරක්ෂාකර ගැන්මට අතිෂයින්ම දුෂ්කරය. එබැවින් සිතම අධිපතිවීමෙන් සසරබිය දුරලා නිවන් සිරි සාධාගතයුතු බැවින් පහලවීමෙහිදී ප්‍රභාස්වරවූ යහපත් සිත නුවනැතියෝ සමාධි නමැති වැබෙහි බැඳ රැකගෙන සමාධි බලයෙන්ම හික්මවා මිදීමට උත්සාහ වැඩිය යුතුයි.

5 "චිත්තස්ස වොදානට්ඨෙන සමාධිබලං චිත්තං පභස්සරං කරොන්තො වොදපෙති" සිත පිරිසිදු කරණ හෙයින්ද සමාධි බල නම් වේ. සිත මූලාවස්ථාවෙහිදී ඉතාම පිරිසිදුයි, ප්‍රභාස්වරයි, චක්ෂුර් ද්වාරාදීයෙන් ඇතුල්වන රූපාලම්බනාදිය නමැති කිලුටු ධූලිතැවරී සිතෙහි ඝනව බැදීමෙන් මුලින් තිබූන ප්‍රසාදකර පැහැය දුරුවී කිළුටුව පැමිණෙත්. භවයක් අනනැර තැවරෙන මේ කෙලශ ධූලිය නිසා සිත වැඩෙත් වැඩෙත්ම පිරිසිදු කරලීම බොහෝ දුෂ්කර කරුණකි. මේ බව සලකා සම්බුද්ධ ධර්මය දැන උගෙණ පිළිපදිමින් ශ්‍රද්ධා වීර්‍ය්‍ය ආදී බලයන් ගෙන් කෙලෙස් ධූලි සුඩකොට සොදනැර සමාධි නමැති යෝධයාලවා සිත ඔපදමා නැවත අපිරිසිදු නොවන අයුරින් ධ්‍යාන විදසුන් නමැති ගෙයි තැන්පත් කොට සමාධි භාවනාදිය නමැති බුරුසුවෙන් වරින්වර පිසදමමින් ආර්‍ය්‍යමාර්ග ඥාණාලොකය ලබාදිය යුතුයි. කල්ප දහස්ගනන් අනනැර එන මේ අපරිසුඩ කෙලෙස් කසට ඝන බහල ආවරණය සැස සුරා, මැද, පිරිසිදු කිරීමට සරිලන සමාධිබල ආදියක් අසන්ටවත් ලැබෙන්නෙ කල්ප ලක්ෂ ගනනකින් මාරයක බැවින් සමාධි බල නමැති යොධයාගේ නාමය දැන දැනගැණීමට ලැබූන මෙම වාසනාවනත ආත්මභාව යෙහිදී තම තමන්ගේ සිත්සතන්වල සංසාරගතම බැදී වැඩී ආ කෙලෙස් කසට දුරලා ගැණීමට යහපත් නැනානුවන යොද සමාධි යෙහි අනුසස් දැන උගෙණ ඇසුරින් සමාධිබල යොධයා සමග මිත්‍ර භාවය දියුණුකරගත යුතුයි, නැතිනම් සමාධි බලය මේ අත්බැව් හිදී තමන්ට හැකිපමණ වඩා දියුණුකරගත යුතුයි.

"ජාති ආදීනි අනොලොකෙත්වා ලභිතබ්බා ලභිතබ්බ යුත්තා යුත්තට්ඨානෙසු යත්ථකත්ථචි නිපතන්ත සීලං චිත්තං රක්ඛථ" යනුවෙන් ජාති කුල ගොත්‍ර ආදියක් නොබලා ලබන්ට බැරි පුලුවන් බවද නොසලකා යුතු අයුතු සැමතැනම දුවපැන කැතවන සිත රැකගැණීම. කී අවවාදය හොඳින් සිතතබාගෙණ සිත ආරක්ෂා කරගන්නාලෙස සිහි කරම්.

6 විසෙසාධිගමට්ඨෙන සමාධිබලං, වසිං පාපෙන්තො විසෙසං අධිගමාපෙති- විශෙෂයෙන් අවබොධකර ගැණීමට පැමිණෙත්

හෙයිද සමාධිබල නම් වේ. සමාධිය නමැති නමාගේ වශගයට පමුණුවා විශෙෂ අවබොධයට අවසාන දනීමට පත්කරණ හෙයින්ද සමාධි බල නම් වේ. විශෙෂාවබෝධය පිළිබඳව උපමාවක් පවසමු. විශෙෂ අවබෝධයක් නැති භික්ෂුව සමාධිගතව- කාමයෙහි ආදීනව නිසිසේ මෙනෙහි නොකොට කාමච්ඡන්දය හොඳහැටි විනාශ නොකොට කය කෙලෙසුන් ගෙන් සැහැල්ලු කිරීම් වශයෙන් කයෙහි නොමිනා බව හොඳහැටි සැහැල්ලුකර නොගෙණ ආරම්භ ධාතු මෙනෙහි කිරීම් වශයෙන් කය සිත දෙකේ මැලිබව ගිලන්බව දුරුකර නොගෙණ සමථ නිමිත්ත මෙනෙහි නොකර මෙනෙහිකළ යුතු සමථ නිමිත්තෙහි මොනවට නොහැසිරී උද්ධච්ච කුක්කුච්චය සමූහනය නොකොට අනිකුත් සමාධියට හිතකර මාර්ග විශෙෂයෙන් අවබෝධකර නොගෙණ සිත මෙහි අධොභාගිය ධර්මයන් ගෙන් හොඳහැටි සොදා නොගෙන ධ්‍යානයකට සමවදීද හෙතෙම අසුබ දුර්ගන්ධ මල්උයනට ගිය බමරෙකු මෙන්ද අපිරිසිදු උයනට ගිය රජෙකු මෙන්ද වහාම නැගිට පිටවීයෙත්- යමෙක් වනාහී සමාධි මාර්ගයට හිතකර ධර්මයන් මොනවට පිරිසිදු කරගෙණ හෙවත් කාමච්ඡන්ද, ථිනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච ආදී ධර්මයන් මොනවට පිරිසිදු කරගෙණ ධ්‍යානයට සමවදීද හෙතෙම සුගන්ධ පුෂ්පයන්ගෙන් යුත් මල්උයනට පැමිණි බමරෙක් මෙන්ද, සුපරිසුද්ධ උයනට පැමිණි රජෙක් මෙන්ද සියලුම දවල් කාලයම හෝ වේවා සියලුම රාත්‍රි කාලය හෝ වේවා සමාපත්ති සුවයෙන්ම කල්ගත කරති. එසේ හැකිවීමට හේතුව විශෙෂාවබොධයෙන් යුත් සමාධි බලයගේ මහිමයයි. එහෙයින් පැරණී උතුමෝ මෙසේ කීහ.

කාමෙසු ඡන්දං පටිඝං විනොදයෙ
උද්ධච්චමිද්ධං විචිකිච්ඡ පඤ්චමං,
විවෙක පාමොජ්ජ කරෙන චෙතසා
රාජාව සුද්ධන්ත ගතො තහිං රමෙ-ති.

මෙහි අදහස- කාමච්ඡන්ද නීවරණය- පටිඝ- උද්ධච්ච- ථිනමිද්ධ විචිකිච්ඡා යන පඤ්චනීවරණයන් පහකොට විවේකයෙන් ප්‍රමොදවූ සිතින් විදර්ශනා වැඩීමට සමාධිගතවූ මහනතෙම අති රමණීය පිරිසිදු මල්උයනට ගිය රජෙක් මෙන් ඒ විදර්ශනා නමැති මල් උයනේ ඇලී වාසයකරත් යනුයි. මින් සිත සම්පූර්ණ පිරිසිදු භාවයට පමුණුවා ගැණීමේ අගය පැවසේ.

1 "උත්තරි පටිවෙධයෙන සමාධිබලං- උත්තරිං පාපෙන්තො උත්තරි පටිවෙධං කරෙති" මතුමත්තෙහි ප්‍රතිවෙධකර ගැණීමට හැකිවේයයි කියනු ලබන අර්ථයෙන්ද සමාධිබල නම් වේ. මතු

මතු ප්‍රතිවේධය නම්- ප්‍රථමධ්‍යාන සමාධි බලයෙන් ද්විතීයධ්‍යාන සමාධි බලයටද, ඉන් තෘතීයධ්‍යාන සමාධි බලයටද, ඉන් චතුර්ථ ධ්‍යාන සමාධි බලයටද, ඉන් ආකාසානඤ්චායතන සමාධි බලයටද ආදී වශයෙන් ප්‍රතිවේධ කරගැණීමට උපකාරවන බැවින්ද සමාධි බල නම් වේ. උසස් උසස් තැනට පමුණුවමින් ඒ පැමිණි උසස් උසස් ස්ථානවල අගය අවබොධකර දෙන්ය යන අදහසින්ද සමාධි බල නම් වේ.

8 "සච්චාභිසමයට්ඨෙන සමාධිබලං- කාමෙන අරියමග්ගං පාපෙත්වා සච්චාභිසමයං කාරෙති" චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ කර ගැණීමට උපකාරවන අර්ථයෙන්ද, සමාධිබලයයි කියනු ලැබේ. ක්‍රමයෙන් එකිනෙකට පමුණුවමින් සොවාන් මාර්ගයෙන් සකෘදගාමි මාර්ගයටත්, ඉන් අනාගාමි මාර්ගයටත්, ඉන් රහත් මඟටත් පමුණුවමින් දුක්ඛ, සමුදය, නිරොධ, මග්ග යන චතුස්සත්‍යාවබෝධය සලසවාදීමට ප්‍රතිෂ්ඨාස්ථානය වන බැවින්ද සමාධිබල නම්වේ. මෙකී ආර්‍ය්‍යමාර්ගාදිය පිළිබඳව එකකට පැමිණිවිට එය පසුනොබසින්නේ සමාධි බලයාගේ මහිමයෙනි, සොවාන්මගටවන් විට නැවත පසුබැස්මක් නොමැතියයි ප්‍රකාශව තිබෙන්නේ, සොවාන් මාර්ගස්ථයාගේ සමාධිය මුලින් කී අඞ්ග සතකින්ම ප්‍රබල භාවයට පැමිණ උද්ගතව සිටි බැවිනි.

9 "නිරොධෙ පතිට්ඨාපනට්ඨෙන සමාධිබලං- ඵලප්පත්තියා නිරොධෙ පතිට්ඨාපෙති" නිරොධයෙහි පිහිටුවාලන බැවින්ද සමාධි බලයයි කියනු ලැබේ. හෙවත් සියලු දුක් සහමුලින්ම වැනසීමෙන් ලබන නිර්වාණසැපතෙහි පිහිටුවන අර්ථයෙන්ද සමාධිබලයයි කියනු ලැබේ. අර්හත් ඵලයට පැමිණීමෙන් නිරොධයෙහි (නිර්වාණ ප්‍රතිලාභයෙහි) පිහිටුවාලන බැවින් මේ නිරොධයෙහි පිහිටුවාලීම සමාධියගේ නවවැනි අඞ්ගයයි. මෙලෙසින් සමාධිය අඞ්ග නවයකින් එකින් එක ප්‍රබලවන බැවින් සමාධි බලයයි කියනු ලැබේ. මෙකී අඞ්ග නවයකින් සම්පූර්ණ සමාධිබලය වැඩීමෙන් පුරුදු කිරීමෙන් සියලු කෙලෙසුන් වනසාදමා නිරොධය (නිර්වාණය) අවබොධ කරගත යුතුයි. සමාධිබලය පිළිබඳව උපමාවක් පවසමු. හේ මෙසේයි:-

සංග්‍රාමයෙහි (යුධයෙහි) සූරයෝධයෙක් සෙබලෙකුට අයත් සියලු සන්නාහයන් ගෙන් සැරසී දුනු හී ඈ සියල්ල ගෙණ සිය හිතමිතුරන් සිව්දේනෙක් සමග යුදබිමට පැමිණ කඳවුරු බල සම්පන්න ලෙස බැඳ තරකොට ගෙණ පරසතුරන් පලවා හැරීමට සතුරන් මැදට පැණ යුධකරණාතර බඩගිණි පිපාසාදියකින් විඩාවට පැමිණ හෝ සංග්‍රාමයෙහිදී අතතුබුන දුනු හී ආදිය අවසන්වී

ගියේ හෝ නැතිවී ගියේ හෝ නැවත යුධකිරීමේ ආශාව ඇතද, ඒවා දුරුකිරීම් ආදියට වහා පැමිණ ලඟි ලඟියේ තා බී අවි ආවුද රැගෙන පරම ස්ථිර අධිෂ්ඨානයෙන් ඒවා දුරුකරමින් ප්‍රමාදනොවී වහා සතුරන්මැදටපැන යුධකිරීමෙන් සතුරන් අතටපත් පෙදෙස් නැවත අල්වාගෙන රැකවල් තබා අළුත් අළුත් පෙදෙස් අල්වා එයද රැකගෙණ සතුරන්ද යටපත්කොට තම වසඟයට ගෙණ විජයශ්‍රීයෙන් ප්‍රමෝදයට පැමිණ වසත්ද, එලෙසම දන්දීම් සිල්රැකීම් භාවනා කිරීම් ආදී පළපුරුද්දෙන් සූරභාවයට පැමිණි යොගාවචරතෙම තමන්ගේ සමාධියට එකාග්‍රතාවයට විමුක්තියට බාධාකරණ කෙලෙසුන් විසින් තමන්ට සතුරුව නැගීසිටිනබව නුවණින් සලකා ඔවුන් වනසාලීමේ අදහස මූල්කරගෙණ ඔවුන් හා යුද්දකරන්ට විවේකස්ථානය නමැති යුද්දබිමට පැමිණ ධ්‍යාන විදර්ශනා නමැති ප්‍රබල කඳවුරු බැඳ කමටහන් නමැති සන්නාහ සන්නද්ධව සද්ධාවීරිය සති පඤ්ඤා යන මිතුරන් සිව්දෙනාත් සමග සමාධිබල නමැති යොධයා කෙලෙස් නමැති සතුරු පිරිස මඩිනා තුර ජයග්‍රහනයක් නොලැබ නැවත කඳවුරට පැමිණ වහා ඒවා හැර නැවත යුද්දබිමට යන්නාසේ යම්කිසි ධ්‍යාන විදර්ශනාදී අධිගමයකට නොපැමිණම පෙරලා පැමිණ ආහාරපානාදිය ගෙණ සාපිපාස දුරලාගෙන නැවත කමටහන් මෙනෙහි කරමින් කෙලෙස් සතුරුමුල නොතබා වනසමියි දැඩි අධිෂ්ඨානයෙන් යුක්තව සමාධි චිත්තබලය වඩනුයේ අතනැරිගිය ධ්‍යාන විදර්ශනා ලබාගැණීමටත් අළුතෙන් ලබාගත් මාර්ගාදිය රැකගැණීමටත් කටයුතු සලසා සියලු කෙලෙස් මුලින්ම විනාශකොට අර්හත්ඵලයෙන් විමුක්තියට පැමිණ විජයශ්‍රීයට පත්වන්නේය. හෙවත් නිර්වාණ රසාස්වාදයෙන් විවේක සැප විඳීමට පැමිණෙන්නේය යනු මෙහි අදහසයි. මෙම උපමාව සංසන්දනය කිරීමෙන් සමාධි ආදී බලයන්ගේ මහිමය සලකා එය වඩාගැණීමට උත්සාහ කළයුතුයි.

නැවත අපි මේ සමාධිබලය ගැණ සිතයොදු. මෙහි සමාධියම නොව අපි අපේ බාහිර කටයුතු පිළිබඳවද මේබඳු සමාධියක් අවශ්‍යද යනු සලකා බැලිය යුතුයි. ඇත්ත වශයෙන් පින්වතුනි! සැම කරුණකදීම අතනැර පිළිපැදියයුතු සමාධිය සිතෙහි එකඟකම සංසුන්කම පුරුදුනූන කිසිම සමතෙකුට ලොකොත්තර සමාධියකට පැමිණෙන්න කොයි ක්‍රමයකටවත් නොහැකිමයි. ඉන් නිසා මෙම දහම් අසා දැන උගෙන අද අපට අවශ්‍ය සමාධිබලයට පැමිණීමට කල්පනා කරමු. මෙහිදී සිතෙහි එකඟ බව හෝ එකමුතු සිත සමාධියයි කියනලදී. ඒ එකමුතුකම බල සහිතව ඇතිනම්, වෙන මොන ක්‍රමයකින්වත් විසිර නොයානම් එය සමාධිබලයයි

සිහියේ තබාගන්න. එසේ එක්තැන්වූ සිතක් පුරුදුකළ තැනැත්තාගේ මේ ලකුණු පෙනෙන්ට තිබේ. කථාව ඉතාම සාන්තයි, අනුන් අසනකොටම ප්‍රියයි, නුවනට හුරුයි, නැනවතුන් ඇසීමට සතුටුයි, ඔහුගේ ඒ පුරුදු කථාව නොඅසාම ගුණ කියයි, අසා සතුටුවෙයි, සෑම පින්වතුන්ගෙන්ම ආශිර්වාදය ලැබෙයි, එනිසාම ඔහුව පිළිගැණෙයි, ඉන් දියුණුවෙයි, ගුණවතෙක් නැනවතෙක් ධනවතෙක් ප්‍රභූන් ඇසුරුකරන්නෙක් වෙයි. එලෙසම ක්‍රියාවද සිතද සමාධියෙන් ඔපදමාගත් අය ක්‍රියාව කිළුටුකර නොගනිත්. සතුන් මැරීම් සොරකම් කිරීම් ආදියට සිතෙහි සංසුං සවභාවයක් ඇති තැනැත්තා යතැයි ඔබ සිතන්නෙහිද, එය නොසිතිය හැක්කකි. ඔහු කයින් යහපතක්ම කරයි, අයහපතින් මිදෙයි, කුසලක්ම කරයි, අකුසලින් මිදෙයි, වැඩක්ම කරයි, අවැඩින් මිදෙයි, මෙලෙ සින් වැඩුන තැනැත්තාගේ ආශ්‍රය, භජනය එක්ව විසීම සියලු පින්වතුන්ම සතුටින් බලාපොරොත්තුවෙයි, මිත්‍රයන් වැඩි එම පින්වතා හොඳ මිත්‍රයන්ගේ ඇසුරත් නරක මිත්‍රයන් ගෙන් වෙන් වීමත් කොට වහා දියුණුවට පත්වෙයි, සිතින් කරණ සියල්ලද එලෙසම පවිත්‍රවෙයි. මෙලෙසින් කය සිත වචනය යන තුන්දෙරම චිත්ත සමාධියගේ බලයෙන් සංසුන්වන බැවින් එබඳු පින්වතා මෙලොවදීම සියලු බාහිර දියුණුවෙන් දියුණුවට පත්වෙයි. මේ සමාධි සිතින් සිටි අය ලොකෝත්තර අභිසිඩියට පමණක් නොව මෙලොව යසඉසුරටද පත්වී තිබෙන අවසථා ගැණ නිදශීන බොහෝ පොතපතින් පෙනෙන්ට තිබේ. කිංචිසංසා නම් පින්වත් සත්‍රියක් සත්දිනක් එකසිත්සිතා ඉටාගෙණසිටි බලයෙන් සක්දෙව් රජ පවා විසමයට පැමිණ මෙම සිරිලක් පොළොවෙහි රුහුනු පෙදෙසට අධිපති කුමාරියක්වූ බව පොතපතින් පෙනේ. මෙනිසා සෑම පින්වතුන්ම සමාධිබල උගෙණ පිහිටවන්නේ නිවන්දකින කොට නේදූයි විමතිඅදහස් ඇතිකර නොගෙණ අපමේහිදී ප්‍රකාශ කරණ අදහස් සිතා බලා මෙලොව් හික්මීමෙන් උසස් දියුණුවක් ලබා ගැණීමට උත්සාහවත් වියයුතුයි. එබඳු පින්වතාට පරලොව සහ අවසානයෙහි නිවන්සිරි සැපද සැලසෙන බව සිතාගත යුතුයි.

මිලඟට අපි ප්‍රකාශ කරන්නේ බල අටසැට පිළිබඳ ඉතා ලුහුඩු විස්තරයකි. එම හැටඅටක් ප්‍රභෙද බල සංඛ්‍යාව නම් පමණින්වත් දැන උගෙනීම මැනවි. එහි විස්තර දැනගනු කැමතියන් විසින් ධම්ධරයන් වහන්සේලා වෙතින් අසා දැනගත යුතුයි. මෙහි සංක්‍ෂෙප විස්තරයක්වත් ලියන්ට යෑමෙන් ලිපිය දික්වෙයි. බල ප්‍රභෙද හැටඅට මෙසේයි.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | සද්ධා | බලය | 10 | අනවජ්ජ | බලය |
| 2 | විරිය | ,, | 11 | සංගහ | ,, |
| 3 | සති | ,, | 12 | ඛන්ති | ,, |
| 4 | සමාධි | ,, | 13 | පඤ්ඤත්ති | ,, |
| 5 | පඤ්ඤා | ,, | 14 | නිජ්ඣත්ති | ,, |
| 6 | හිරි | ,, | 15 | ඉස්සරිය | ,, |
| 7 | ඔත්තප්ප | ,, | 16 | අධිට්ඨාන | ,, |
| 8 | පටිසංඛාන | ,, | 17 | සමථ | ,, |
| 9 | භාවනා | ,, | 18 | විපස්සනා | ,, |

10 දස සෙඛ බලය
10 දස අසෙඛ ,,
10 දස ඛීණාසව ,,
10 දස ඉද්ධි ,,
10 දස තථාගත ,, යනුයි.

| | දස සෙඛබලය | | දස අසෙඛ බල | |
|---|---|---|---|---|
| 1 | සම්මාදිට්ඨි සෙඛ | බලය | හික්මවූ සම්මාදිට්ඨි අසෙඛ | බලය |
| 2 | සම්මා සංකප්ප | ,, | ,, සම්මා සංකප්ප | ,, |
| 3 | සම්මා වාචා | ,, | ,, සම්මා වාචා | ,, |
| 4 | සම්මා කම්මන්ත | ,, | ,, සම්මා කම්මන්ත | ,, |
| 5 | සම්මා ආජීව | ,, | ,, සම්මා ආජීව | ,, |
| 6 | සම්මා වායාම | ,, | ,, සම්මා වායාම | ,, |
| 7 | සම්මා සති | ,, | ,, සම්මා සති | ,, |
| 8 | සම්මා සමාධි | ,, | ,, සම්මා සමාධි | ,, |
| 9 | සම්මා ඤාණ | ,, | ,, සම්මා ඤාණ | ,, |
| 10 | සම්මා විමුත්ති | ,, | ,, සම්මා විමුත්ති | ,, |

මෙහි සෙඛබලයයි කීයේ සම්මාදිට්ඨි ආදී දශබලය ප්‍රත්‍යක්ෂ කිරීමට උත්සාහ කරණ පුද්ගලයාගේ දසබලයටයි. අසෙඛ බලයයි කීයේ- සම්මාදිට්ඨි ආදී බලදශය ප්‍රත්‍යක්ෂකර අවසන්කල පුද්ගලයාගේ බලදශයටයි. මෙහි සම්මාදිට්ඨි ආදී අෂ්ටබල මේ පොත්පෙලේ සතරවන පොතෙහි පළකරවමි.

සම්මාඤාණ බලය නම්- ප්‍රත්‍යවෙක්ෂා ඥානයයි, එය ලෞකික වශයෙන් පහලවන නුවනකි.

සම්මාවිමුත්ති බලය නම්- සම්මාදිට්ඨි බල ආදී අටහැර බලසම්ප්‍රයුක්ත බලයෙන් හටගත් අවසෙස සියලු බල ධර්මවලටයි, සමහර උතුමන්ගේ අදහස මෙසේයි. ලෝකෝත්තර විමුක්තිය හැර අන් සියලු විමුක්තියක්ම (මිදීමක්ම) සම්මා විමුක්තියට ඇතුලත්ය

කියායි. එය සෙඛයන් පිළිබඳව හික්මවීමේ බලයද, අසෙඛයන් පිළිබඳව හික්මවා අවසන් කිරීමේ බලය දැයි සැලකිය යුතුයි. සෙඛයා නම්– රහත්වීමට වෑයම් කරන්නා. අසෙඛයා නම් රහත්වූ තැනැත්තා–

මිලගට දස ක්ෂීණාශ්‍රව බල ප්‍රකාශකරමි.

1 තථාගත සම්බුද්ධ සාසනයෙහි දස සෙඛ දස අසෙඛ බලාදී යෙන් සපිරුණ ක්ෂීණාශ්‍රව කළ භික්ෂුව සියලු සංස්කාරයෝ අනිත්‍ය වශයෙන් තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් මොනවට දක්නා ලද්දේ වේද, යම්හෙයකින් සියලු ආශ්‍රවයෝ ක්ෂයකරණ ලදැයි තථාකාරයෙන් යහපත් ප්‍රඥාවෙන් දැකීම, ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ ප්‍රථම ක්ෂීණාශ්‍රව බලයයි.

2 එලෙසම මේ සස්නෙහි ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම යම්කිසි බලය කට පැමිණ සියලු කාමාදී ආශ්‍රවයන්ගේ ක්ෂයවීම වෙසෙසින් දනීද හේ කෙසේද? “ඛීණාමෙ ආසවාති” මාතුල සියළු කාමාදී ආශ්‍රව යෝ ක්ෂයවූමාය– යනුවෙන් දනීද, නැවතද ඛීණාසව භික්ෂුව එම ක්ෂයකල ආශ්‍රවයන් අඟුරුවලකට උපමාකොට බලාද, හේ කෙසේද? මේ කාමයෝ ගිණිගෙණ දිළියෙන අඟුරු පිරුණ වලක් හා සමානය, එම කාමයන් විඳින තැනැත්තා එම අඟුරුවලෙහි වැටී දැ පිළිස්සී දුකසේ වාසය කරන්නෙක් බඳුය. ක්ෂීණාශ්‍රවයන් වහන්සේ අඟුරුවළෙන් ගොඩවී සැපයට පැමිණි අයමෙන් කාමාදී ආශ්‍රවයන්ගෙන් මිදී ගියේයයි මෙලෙසින් විශිෂට නුවනින් දකීද, මේ අංකාර ආශ්‍රවයන්ගේ ක්ෂය සවභාවයද, ආශ්‍රවයන්ගේ ආදීනව යද නුවනින් සම්පූර්ණ දැකීම ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ දෙවෙනි ක්ෂීණාශ්‍රව බලයයි.

3 එලෙසම මේ සස්නෙහි ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම යම් බලය කට පැමිණ කාමාදී සියලු කෙලෙසුන්ගේ විනාශ සවභාවය දැන ගණීද, සියලු කෙලශ නමැති ආශ්‍රවයෝ මාතුල ක්ෂයවී විනාශවී ගියායයි දැනගණීද නැවතද එම ක්ෂීණාශ්‍රව භික්ෂුවහට තමන්ගේ සිත කෙලෙසුන් ගෙන් වෙන්වී විවේකයට නැමුණේය. විවේක යෙහි ගිලුනේය, විවේක භාරයට හැරුණේය, සම්පූර්ණ විවේක ගතවීය. නෛෂ්ක්‍රම්‍යයෙහි නිරුතුරු ඇලුනේය, සියලු ආශ්‍රව යන්ට ඇති මූලාවස්ථාවන් විනාශකර දමන ලද්දේය. මෙලෙසින් සියලු ආශ්‍රවයන් ක්ෂයකොට සියලු ආශ්‍රවයන් මුලින් උදුරා අස් කොට සම්පූර්ණ විවේකයට නැමී හැරී එහි පිහිටා වීසීම නම් යම් බලයකට පැමිණියේද එයද ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ තුන්වන ක්ෂීණාශ්‍රව බලයයි.

4 එලෙසම මේ සස්නෙහි ක්ෂීණාශ්‍රව භික්ෂුතෙම යම්බලය කට පැමිණ ආශ්‍රවයන්ගේ විනාශය හොඳහැටි දනීද මාතුල සියලු කෙලෙසුන් වැනසී ගියායයි දැනගණීද, නැවත එම ක්ෂීණාශ්‍රව භික්ෂුව කායානුපස්සනා- වේදනානුපස්සනා- චිත්තානුපස්සනා- ධම්මානුපස්සනා යන සතර සතිපට්ඨාන භාවිතාකරණ ලද්දේවේද- මොනවට භාවිතාකරණ ලද්දේවේද- මෙසේ ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් හා සතිපට්ඨාන භාවිතා කිරීමෙන් යම්කිසි බලයක් ඇද්ද එයද ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ සතරවන බලයයි.

5 එලෙසම ආශ්‍රවයන් ක්ෂයකල ක්ෂීණාශ්‍රවයන් වහන්සේ නූපන් අකුසල් නූපදවීම, උපන් අකුසල් නැතිකිරීම, උපන් කුසල් වැඩීම, නූපන් කුසල් වැඩීමට වෑයම්කිරීම යන සම්‍යක්ප්‍රධන් වීර්‍ය්‍ය සතර වඩනලද්දේ වේද, මෙලෙස ආශ්‍රවයන් ක්ෂයකොට සතර සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍ය වඩාගැණීමෙන් යම් බලයකට පැමිණ වසත්ද, එයද ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ පස්වැනි ක්ෂීණාශ්‍රව බලයයි.

6 එලෙසම සියලු කාමාදී ආශ්‍රවයන් ක්ෂයකිරීමෙන් නැවත ඡන්දිද්ධිපාද, චිත්තිද්ධිපාද, විරියිද්ධිපාද, වීමංසිද්ධිපාද යන සතරාකාර ඍද්ධිපාදයන් වඩන ලද්දේ වේද, මෙලෙස ආශ්‍රවයන් ක්ෂයකොට සතර ඉර්ද්ධිපාදයන් වඩාගැණීමෙන් බලයව පැමිණ වසත්ද- එයද ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ සයවන බලයයි.

7 එලෙසම සියලු කාමාදී ආශ්‍රවයන් ක්ෂයකිරීමෙන් නැවත සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන පස් ඉඳුරන් වඩාගන්නාලද්දේ වේද- මෙලෙස ආශ්‍රවයන් ක්ෂයකොට පස්ඉඳුරන් අවබොධ කොට වඩමින් බලයට පැමිණ වසත්ද එයද ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ සත්වන බල මහිමයයි.

8 එලෙසම සියලු කාමාදී (කෙලෙශ) ආශ්‍රවයන් ක්ෂයකල භික්ෂුතෙම නැවත සද්ධාබල, විරියබල, සතිබල, සමාධිබල, ප්‍රඥාබල යන පඤ්ච බලයන් වඩාගන්නාලද්දේ වේද, මෙලෙස කෙලෙසුන් වනසා පඤ්චබලය වඩා අවබොධකොට බලයට පැමිණ වසත්ද, එයද ඛීණාශ්‍රවයන් වහන්සේගේ අටවැනි ක්ෂීණාශ්‍රවබලයයි.

9 එලෙසම සියලු කාමාදී ආශ්‍රවයන් ක්ෂයකල භික්ෂුතෙම නැවත සතිසම්බොජ්ඣඞ්ග, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය යන සප්තබොධ්‍යඞ්ගයන් වඩාගන්නා ලද්දේවේද- මෙලෙසින් කෙලෙස් වනසා සප්තබොධ්‍යඞ්ගය වඩා අවබොධකොට බලයට පැමිණ වසත්ද- එයද ඛීණාශ්‍රවයන් වහන් සේගේ අටවැනි ක්ෂීණාශ්‍රව බලයයි.

10 එලෙසම සියලු කාමාදී ආශ්‍රවයන් ක්ෂයකළ භික්ෂුව නැවත සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි යන ආර්‍ය්‍යමාර්ගයන් වඩාගන්නා ලද්දේ වේද- මෙලෙසින් කෙලෙස් වැනසීමෙන් හා ආර්‍ය්‍යමාර්ගී අව වඩා අවබෝධකොට බලයට පැමිණීමෙන් වසත්ද- එයද ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ දසවැනි ක්ෂීණාශ්‍රව බලයයි.

මෙහි දක්වනලද ක්ෂීණාශ්‍රව බල දශය පිළිබඳව ඇති ප්‍රභේද සක්ද මෙලෙසින් සලකාගත යුතුයි. අනිච්චතො සඞ්ඛා -පෙ- යනාදි වශයෙන් ප්‍රකාශකළ පළමුවෙනි ක්ෂීණාශ්‍රව බලයෙන් දුක්ඛ සත්‍යය පිළිබඳ සම්පූර්ණ අවබෝධයද, අඞ්ගාරකාසූපමා -පෙ- ආදි වශයෙන් ප්‍රකාශකළ දෙවෙනි ක්ෂීණාශ්‍රව බලයෙන් සමුදය සත්‍යය පිළිබඳ සම්පූර්ණ අවබෝධයද, විවෙකනින්නං චිත්තං -පෙ- යන තුන්වන බලයෙන් නිරොධ සත්‍යය පිළිබඳ සම්පූර්ණ අවබොධයද, සතර සතිපට්ඨාන- සතර සම්‍යක්ප්‍රධාන, සතර ඉද්ධිපාද-පඤ්ච ඉන්ද්‍රිය- පඤ්චබල- සප්තබොධ්‍යඞ්ග- ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ග යන සප්තබලයෙන් මාර්ගසත්‍යයද යන චතුරාර්‍ය්‍ය සත්‍යාවබෝධය ඇති කරගැනීම ප්‍රකටතර පෙන්වනලදී.

මෙලෙසින් දස ක්ෂීණාශ්‍රව බලයද එහි වෙන්කොට අවබොධ කරගතයුතු චතුස්සත්‍යයද තේරුන්ගෙන ධර්මධරයන් අතින් විමසා විස්තරාවබොධය ඇතිකොටගෙණ ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ උසස් තත්වය කෙරෙහි අතිශය සතුටව පැමිණ එම තනතුර පතා පින්රැස්කර සසර දුක් ගෙවා එතර නිවන්සිරි සාධාගත යුතුයි.

මිලගට දශ ඍද්ධිබල නම් වශයෙන් මෙසේයි.

අධිට්ඨානා ඉද්ධි, විකුබ්බනා ඉද්ධි, මනොමයා ඉද්ධි, ඤාණවිප්ඵාර ඉද්ධි, සමාධිවිප්ඵාර ඉද්ධි, අරියා ඉද්ධි, කම්මවිපාකජා ඉද්ධි, පුඤ්ඤවතො ඉද්ධි, විජ්ජාමයා ඉද්ධි, තත්ථ තත්ථ සම්මාපයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි මේ දස ඉද්ධිබල නම් වේ. මෙහි කෙටි විස්තරයක් මෙම පොත් පෙළේ (බාරස ධර්මය) යන දෙවෙනි කාණ්ඩයෙහි විමංසිද්ධිපාදයේ විස්තරව ඇත. විසුද්ධිමාර්ග, පටිසම්භිදාමාර්ග ආදීයෙන් විශෙෂ විස්තර විභාග දැනගත යුතුයි.

මෙතැන්සිට තථාගත බල දශය ගැණ ලුහුඬු විස්තරයක් කරමි. තථාගත බලයයි කියනු ලබන්නේ අන්කිසි දෙව බ්‍රහ්ම මාරාදී කිසිවෙකුට සාධාරන නොවූ කිසිම බලමහිමයකට සම්කළ නොහැකි සියලු බලමහිමයෙන්ද එය හැදූරූ සැම සත්වයන්ද මැඩ මුදුන් මල්කඩක් මෙන් උද්ගතව බබලන බලපරාක්‍රමයකටයි. එය ඇතිවන්නේ තථාගත සම්මා සම්බුද්ධරජානන් වහන්සේලාට මයි.

තථාගත බල යන්නෙහි අදහසද, අන් කෙනෙකුට අසම තථාගත වරයන්ටම සම බලයටයි. පෙර බුදුවරයන් වහන්සේලා විසින් සම්පූර්ණ කරනලද දසපාරමිතාදී බුද්ධකාරක ධර්මයන් සවල්පයකුදු අඩුනොකොට අපේ බුදුපියානන් වහන්සේද සම්පූර්ණකර බැවින් තථාගත නම් වන සේක. ඒ සියලු අතීතයෙහි වූ තථාගතයන් වහන්සේලාට ඇතිව තුබූ දසබලය අප තථාගත සම්බුද්ධරජානන් වහන්සේටද ඇති හෙයින් තථාගත නම් වන සේක. මෙසේ ප්‍රකාශ වන දස තථාගත බලය මෙලෙසින් අවබෝධ කරගත යුතුයි.

මේ තථාගත බලය, කායබලය, ඤාණබල යයි දෙපරිදිවෙත්. ඉන් කායබලය දශ ඇත්කුල වශයෙන් තේරුන්ගත යුතුයි. ඒ මෙසේයි.

**කාලාවකඤ්ච ගංගෙය්‍යං-පණ්ඩරං තම්බ පිඞ්ගලං**
**ගන්ධ මඞ්ගල හෙමඤ්ච-උපොසථ ඡද්දන්තිමෙ දසා-ති.**

මින් දස ඇත්කුල කියත්. කාලාවක, ගංගෙය්‍ය, පණ්ඩර, තම්බ, පිඞ්ගල, ගන්ධ, මඞ්ගල, හෙම, උපොසථ, ඡද්දන්ත යනු දශ ඇත්කුලයයි.

දශ ඇත්කුලයන්ගේ බල හා තථාගත කායබලය
පුරුෂ ප්‍රමාණයෙන් මෙසේ දතයුතුයි.

| | | | | |
|---|---|---|---|---|
| කාලාවක | ඇතෙක් | මධ්‍යම පුරුෂයන් | 10 කගේ | බලයට සමවේ. |
| ගංගෙය්‍ය | ,, | ,, | 100 | ,, |
| පණ්ඩර | ,, | ,, | 1000 | ,, |
| තම්බ | ,, | ,, | 10000 | ,, |
| පිංගල | ,, | ,, | 100000 | ,, |
| ගන්ධ | ,, | ,, | 1000000 | ,, |
| මඞ්ගල | ,, | ,, | 10000000 | ,, |
| හෙම | ,, | ,, | 100000000 | ,, |
| උපොසථ | ,, | ,, | 1000000000 | ,, |
| ඡද්දන්ත | ,, | ,, | 10000000000 | ,, |
| තථාගතයන් වහන්සේගේ බලය | | | 100000000000 | |

දසදහස්කෝටියකි. මේ තථාගතයන් වහන්සේගේ කායබලයයි.

තථාගත ඤාණබලය නම්- දසබල ඤාණය (මජ්ඣිමනිකායෙහි විස්තරවේ) චතුවෛශාරද්‍ය ඤාණය, අකම්පන ඤාණය, චතුයෝනි පරිච්ඡේද ඤාණය, පඤ්චගති පරිච්ඡේද ඤාණය (සංයුත් සඟියෙහි විස්තරවේ) සැත්තෑතුනක් ප්‍රභේද ඤාණ, සැත්තෑසතක් ප්‍රභේද ඤාණ, මේ හැර නොයෙක් දහස් ගනන් ඤාණ විශේෂ සියල්ලම්

ඥාණබලයට ඇතුලත් වෙත් ඥාණය කම්පාකරන්ට නොහැකිය යන අර්ථයෙන්ද සියළු දුඃඛ මැඩලීමට උපකාරවන අර්ථයෙන්ද බලයයි කියනු ලැබේ.

1 තථාගත බලය "ඨානඤ්ච ඨානතො අඨානඤ්ච අඨානතො යථාභූතං පජානාති" මෙම තථාගත බලයට පැමිණි භාග්‍ය වතුන් වහන්සේ "ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති, ආසභං ඨානන්ති සෙට්ඨානං, උත්තමට්ඨානං, පටිජානාතීති, උපගච්ඡති, න පච්චක්ඛති අත්තනි ආරොපෙති" මෙයින් විස්තර කරන්නේ ආසභං ඨානං කියන්නේ ශ්‍රෙෂ්ඨ ස්ථානයමයි, උතුම් ස්ථානයමයි, පටිජානාති යන්නෙන් කියන්නේ පැමිණෙයි, ප්‍රතික්ෂෙප නොකරයි, තමා කෙරෙහි ආරොපනය කරයි, එනකොට එමවචන එක්කොට තේරුන් ගතයුත්තේ ශ්‍රෙෂ්ඨ ස්ථානයට පැමිණෙයි, එසේ පැමිණ කියනදෙය ප්‍රතික්ෂෙප කරන්ට නොහැකිවෙයි. එම වචනගෙන වාදරොපනය කරන්ට නොහැකිවෙයි, දෙශනා කරණලද්ද එකහෙළා සියලුදෙනා විසින්ම පිළිගත යුතුයි- යනුයි.

ආසභං යනුවෙන් වෘෂභයෙකුගේ සිටීමට බඳු නිශ්චල ප්‍රතිඨාවක් උපමාකරයි. ඒ මෙසේයි- අති ශ්‍රෙෂ්ඨ වෘෂභ බලමහිමයකින් යුක්ත වෘෂභරාජයෙක් සතර පියවර සන පොළෙවෙහි ඔබා බල සහිතව සිටිකල වෘෂභයන් දහස් ගනන කිනුදු සොලවාලිය නොහැක්කාසේ තථාගතයන් වහන්සේද දසවැදෑරුම් බල මහිමයෙන් යුක්තව සතර විශාරද ඥාණනමැති පියහතර අටපිරිස් නමැති බිමඇන දෙවියන් සහිත සකල ලොකයා අතර බ්‍රහ්මාදී ප්‍රබල සම්පන්න පසමිතුරන් පැමිණ ප්‍රශ්න ඇසීම් ආදියෙන් සොලවන්ට නොහැකි බැවින් කම්පා නොවන නොසෙල්වෙන අන්දමින් ස්ථිරාධිෂ්ඨානයෙන් සිටින්නුයි- තථාගත බල නම් වේ.

පරිසාසු සීහනාදං නදති- පරිසාසු, අටපිරිස්මැද; සීහනාදං නදති- සෙට්ඨනාදං අභීතනාදං සිංහනාදය වැනි නාදකරන්නෙහිය. සිංහයා සවකීය තේජස උසුලමින්ද, අන් තෙද වනසමින්ද, නාදකරන්නේය. එසේම තථාගතයන් වහන්සේ අටලෝදහම් උසුලමින් පවසමින් දෙසැටක් පරවාද මඩිමින් වසත්ද, එනිසා තථාගතයන් වහන්සේ සිංහයෙක් බඳුය, මෙකියන තථාගත සිංහරාජයාගේ දෙශනාව සිංහනාදයයි. අභීතනාදයයි.

බ්‍රහ්මචක්කං පවත්තෙති- ශ්‍රෙෂ්ට උත්තම විශිෂ්ට අනාසක පවත්වන්නේය යනුයි. මෙහි චක්ක ශබ්දය විස්තරයි. (මැදුම්සඟි අටුවාවෙන් විස්තර දතයුතුයි) නොසෙල්වෙන අයුරු සිංහනාද

පතුරුවමින් ශ්‍රේෂ්ඨ දේශනා චක්‍රය පවත්වන තථාගතයන් වහන් සේ බල දශයකින් යුක්ත ඒ නිර්භීත දේශනයන් පවත්වනු ලැබේ යනු එහි අදහසයි.

මෙතැන්සිට පළමුවෙනි තථාගත බලය පිළිබඳව කී ඨානා ඨානාදිය විස්තර කරමු. ඨානාඨාන නම් කාරණා කාරණයයි. එය මෙසේ කල්පනාවට ගන්න, යම් කරුණක් උඩ ඵලය පිහිටයිද ඒ පිහිටි ඵලයාගේ වැඩීමෙන් ඉපදීමද පැවැත්මද වෙත්. එනිසා ඨාන යයි කියනු ලැබේ. යම් යම් ධර්මයෝනෙක් යම් යම් ධර්මයන්ගේ හේතුවෙන් සම්භවණීයි, යම් යම් ධර්ම ඒ ඒ ධර්මයන්ගෙන් හටනොගනිත්, ආදී වශයෙන් ඇත්තලෙසම දැනගැනීම ඨාන- අඨාන දැන ගැනීමයි. මෙලෙසින් කී ක්‍රමය තතුසේ දැනගැනීම ප්‍රථම තථාගත බලයයි. මේ ආදී දසබලයම උන්වහන්සේ ආසභං ඨානං -පෙ- කී වචනවල අදහස් ලෙසම ප්‍රකාශ කරත්. ඉන්නිසා දසබලය ප්‍රකාශකරණ තැන් දශයෙහිම ඒ මේ වචනවල අදහස් එක්තර ගතයුතුයි. මෙතැන් සිට ඒ ඒ බල පමණක් කීයම්.

2 තථාගත බලය- අතීතානාගත පච්චුප්පන්නානං කම්ම සමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති” යනුවෙන් අතීත- අනාගත- වර්තමාන යන තුන්කාලයෙහිම සත්ව යන් විසින් කරණලද කුසල අකුශල කර්මවිපාක වාරයෙහිදී හෝවත් විපාකදෙනකොට මේ මේ ගතිවල මේ මේ හේතු නිසා ඉපිද මෙප මන කාලයක් දුක් හෝ සැප මෙසේ විඳින්ට සිදුවෙයි යන ක්‍රමයට වෙනස් නොවන ලෙස කිසිවෙකුට වෙනස් කරන්ට බැරිලෙස දේශ නා කරයි. මෙය දෙවෙනි තථාගත බලයයි.

3 තථාගත බලය- සබ්බත්ථ ගාමිනී ප්‍රතිපදාව, සබ්බත්ථ ගාමිනී පටිපදන්ති, සබ්බගති ගාමිනිං ච අගතිගාමිනිංච මග්ගං සියලු ගති අගතිගාමී මාර්ග ඇත්තලෙස ප්‍රකාශ කිරීමයි. නිදසුනක් මිනිසුන් රැශියක් එක්ව එක සතෙක් මැරූවිට මේ එකම අකුශල කර්මයාගේ විපාකදෙන අවස්ථාවෙහිදී සමහරෙක් නරකයෙහි මේ මේ ස්ථානවල උපදිනවා, සමහරු ප්‍රේතයෝනියෙහි මේ මේ ආකාර යෙන් උපදිනවායයි ඔවුනොවුන් ඒ අකුශලය පිළිබඳ කාය සිත වචනය යෙදූ යෙදූ සිතූ සිතූ කිව් කිව් අයුරු දැන ඒ ඒ ක්‍රියාවන්ට අනුව මේ මේ අපායාදියෙහි ඉපිද මේ මේ විපාක මේ මේ ලෙසින් දෙනවාය, කුසලයන් පිළිබඳවද එලෙස විස්තර වශයෙන් සිදුවන නාවූ සැප ආදිය විදහා විසඳ නිවැරදිව දේශනාකරන්ට හැකිබව තුන්වැනි තථාගත බලයයි.

4 තථාගත බලය- අනෙකධාතු, නානාධාතුලොක, දර්ශන බලය. අනෙකධාතු නම්- චක්ඛුධාතු, චක්ඛුවිඤ්ඤාණධාතු, රූප

ධාතු ආදීයද, කාමධාතු ආදීයද, අනෙකධාතු නම්. චක්ඛුධාතු ආදීන්ගේ නොයෙක් නොයෙක් විස්තර විභාග නානාධාතු නම්. ලොකං යනු සකන්ධ ධාතු ආයතන ආදී ලොකයි. මෙකී අනෙක ධාතු නානාධාතූන්ගේ ලොකත්වය උපදින ක්‍රමය, පවතින ක්‍රමය, වැඩෙන ක්‍රමය, වැනසෙන ක්‍රමය, දළුවද, සියුම්වද, ඉතා සියුම්වද, සකන්ධ ධාතු ආයතන ලොකයන්හි පහළවන අයුරු කිසිද තර්කය කින් බිඳින්ටබැරි පරිදි දෙශනාකරලීම සතරවන තථාගත බලයයි මේ බල දසයෙහිම බොහෝසේ විස්තරව ඇත්තේ අභිධර්ම පිටක යේයි.

5 තථාගත බලය– සත්වයන්ගේ නානාධිමුත්තිකා බලය– එනම්– සත්වයන් පිළිබඳව හීනව ඉපදීම, මධ්‍යමව ඉපදීම, උත්කෘෂ්ටව (ප්‍රණීතව) ඉපදීම, එලෙසම පෙරළී වැනසී නැවත ඒ ඒ අයුරින් හීනාදී වශයෙන් ඇතිවීම් ආදිය දෙශනා කිරීම, පස්වන තථාගත බලයයි.

6 තථාගත බලය– පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රිය පරොපරියත්තං යනුවෙන් ප්‍රධාන සත්වයන්ගේද, හීනසත්වයන්ගේද සිත්තුළ ඇතිවන ශ්‍රද්ධා විරිය ආදී ඉන්ද්‍රියයන්ගේ පරභාවය අපරභාවයද ඇතිවීම්ද නැතිවීම්ද යන ආදී ක්‍රම දහස්ගනනින් සත්වයන්ගේ ඇතිවීමද වැනසීමද දැනගණීද මෙය සවැනි තථාගත බලයයි.

7 තථාගත බලය– "ඣාන විමොක්ඛ සමාධි සමාපත්තීනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති" යනුවෙන් 'ඣාන' ප්‍රථමධ්‍යානාදී ධ්‍යාන සතරද, 'විමොක්ඛ' රූපී රූපානි පස්සති ආදී අටවැදෑරුම් විමෝක්ෂද, 'සමාධි' සවිතක්ක සවිචාරාදී තුන් ආකාර සමාධීද, සමාපත්තීනං ප්‍රථමධ්‍යාන සමාපත්ති ආදිය හා නවවැදෑරුම් අනුපුබ්බ සමාපත්තියද යන මේ ආදීන්ගේ කෙලෙසීම වන ක්‍රමද නොහොත් විනාශයට පැමිණෙන ක්‍රමද, පිරිසිදුවන නැගිසිටින ක්‍රමද නොහොත් වැඩීම සිදුවන ක්‍රමද, සුදුසු පරිදි නොවරදින පරිදි යථා ස්වභාවයෙන්ම දැන දෙශනාකිරීම සත්වැනි තථාගත බලයයි.

8 තථාගත බලය– පුබ්බෙනිවාසානුස්සති ඥාණය– එනම්, අනෙකවිධ පූර්වේනිවාසානුස්මෘති ඥාණය සිහිකරයි. හේ මෙලෙසයි එක ආත්මභාවයක දෙකක තුනක ආදී වශයෙන් ආත්මභාව ලක්ෂයක නොයෙක් සංවට්ට විවට්ට කල්පගනනින් සිහිකරයිද, මොහු ඒ ආත්මයෙහි ඉපිද මෙනම් ඇතිවිය, මෙනම් කුලයක උපන, මේ පාටය, මෙසේ කනබොනලදී, මෙසේ සැපදුක් විඳින

ලදී, මෙපමන ආයුෂ කාලයක් ජීවත්විය, එසේ සිට ඔහු එතනින් චුතව ඔහු මෙහි උපනි, මෙහි උපන්නේ මෙලෙස මේ නම ඇතුවය මේ ගෝත්‍රයෙහිය, මේ පාටය, මෙසේ කාකබොන ලදී, මෙසේ සැප දුක් දෙක විඳිනලදී, මෙලෙසින් ආයුෂ කෙළවිය. මෙසේ ආකාර සියල්ලද කී කළ හැටිද නොයෙක් ආකාරයෙන් පෙර විසූ ක්‍රම නුවනින් සිහිකර නොවරදිනසේ දැක දැන දෙශනාකරත්ද මෙය තථාගත සම්මා සම්බුදුන් වහන්සේගේ අටවැනි තථාගත බලයයි.

තථාගත බලය– දිබ්බචක්ඛුඤාණය, එනම්– කිසිද කෙනෙකුගේ මසැසට හා පැනැසට විෂය නොවන ඉතා පිරිසිදු දිවැසින් මෙලෙසින් සත්ත්වයන් දකිත්. ඒ කෙසේද? මැරෙන්නාවූ සතුන් උපදින්නාවූ සතුන් හීන අය, ප්‍රණීතඅය, (දළඅය සියුම් අය) වර්ණ සම්පන්නයෝ, දුර්වර්ණයෝ, කර්මානුරූපව සුගති දුර්ගතීවල උපදින අය දකියි. තවද මේ සත්ත්වයෝ කායදුශ්චරිතකළ අයය, මේ වචනයෙන් දුශ්චරිත කළ අයය, මේ සිතින් දුශ්චරිතයෙහි හැසුරුණු අයය, මේ ආර්යයන්ට අපහාසකළ අයය, මිසදිටුවෝය, මිසදිටුකම් පුරුදුකල අයය, මොවුන් මරණින්මතු සැපයෙන් වෙන්වූ නපුරු ගතිඇති නිතර දුක් ගලන්නාවූ නරකවල උපදිත්. එසේම යහපත් ක්‍රියා වචන සිතිවිලි ඇති පින්කළ පින්වතුන් සුගතීවල උපදිත්. මෙලෙසින් දිවැසින් දැක දැන නොවරදින අයුරින් දෙශනා කිරීම නවවැනි තථාගත බලයයි.

10 තථාගත බලය– ආසවක්ඛය ඤාණය, එනම් සියලු කාම භව දිට්ඨි අවිජ්ජා ආදී සියලු ආශ්‍රවයන් (කෙලෙස් කසට) විනාශ කොට ආශ්‍රවයන්ගෙන් සම්පූර්ණයෙන්ම වෙන්වූ සිතින්ද නුවනින්ද ඉහාත්මයෙහි තමන්ම විශිෂ්ට ප්‍රඥාවෙන් දැන ඊට මොනවට පැමිණ වාසය කරයිද මේ තථාගතයන් වහන්සේගේ ඉමහත් දශවැනි තථාගත බල පරාක්‍රමයයි.

මේ තථාගතයන් වහන්සේගේ දශබල මහිමයයි. මෙම බලයන්ට පැමිණි දශබලධාරී තථාගත සම්මා සම්බුදුන් වහන්සේ ඕනෑම පිරිසක් මැදට පැමිණ නිර්භීත භාවය විදහා පා කථාකරයි. සියලු සතුන් යටපත් කර සිංහනාද වැනි අභීත බුද්ධනාදය පතුරුවයි, ශ්‍රෙෂ්ඨතම ධර්මචක්‍රය පවත්වයි

පුදුමයකි! මෙබඳු උතුම් කිසිවෙකුට නොපිහිටන බලමහිමයන් දශයකින් සමස්ත ලොකයම දුක්බරින් සැහැල්ලුකර පරම ශාන්තිය සාධාදෙන අපගේ සම්මා සම්බුදුන් වහන්සේ පිළිබඳව කාලත්‍රයෙහිම පහළවන සවල්ප නුවනක් සවල්ප දැනුමක් ඇති පණ්ඩිතමානීහු ඉමහෙමද කියත්. ශ්‍රමන භවත් ගෞතමයන්ට

මිනිස් ස්වභාවයට වඩා වැඩි ධර්ම ස්වභාවයක් නැත, ආයතීඥාණ දර්ශන විෂය නම් කොහෙත්ම නැත. තර්කතර ඉන් උපුටාගත්ත ක්‍රම අනුව බන දෙසනවාය, ඔහුගේ වැටහීම් විමංසනය අනුව හැසිරීම් ආදිය සෙවීමෙන් ලබාගත් එකකි යනුවෙන් කියත්. යම්හෙයකින් මෙසේ කියන නුමන ඇස අඳවූ අසජ්ජනයන් ඇත්නම් ඔවුන් මේ වචන අත්නොහැර මේ සිත් අත්නොහැර මේ මිථ්‍යා දෘෂ්ටි ආදිය සම්පූර්ණයෙන් ඉවත නොදමා, මෙලොත් මැරීගිය වහාම නරකාදී සතර අපායෙහිම උපදිත්. විපාකාදීම මෙසේ බැවින් දශබලධාරී තථාගත සම්මා සම්බුද්ධරජානන් වහන්සේ කෙරෙහිද ශ්‍රී සද්ධර්මය කෙරෙහිද උතුම් සඞ්ඝරත්නය කෙරෙහිද සැකනොසිතා ඒකාන්ත විශ්වාශය තබාගෙන ඇදහීමෙන් ස්වර්ගමොක්ෂ සම්පත් සාධාගත යුතුයි.

මේකී දශබල ඥාණයෙන් හා සර්වඥතාඥාණයෙන්ද සතරවිශාරද ඥාණයෙන්ද පරිපූර්ණ භාග්‍යවතුන් වහන්සේ අටපිරිස් මැදව පැමිණ අචින්ත්‍ය බලමහිමයෙන් සකල ලෝකයම විසමයප්‍රාප්ත කරවමින් ශාන්තිදූතය කොට වදාලසේක. මෙලෙස උත්තරීතර අන් ශාස්තෘවරයෙක් ලොව නූපන්සේක. ඉපිද නැතිසේක. නූපදිනසේක. තථාගතයන් වහන්සේලාම මෙලෙසින් පහලවනසේක. එනිසා සියලු සත්ව සමූහයා පරම ශාන්තිය බලාපොරොත්තුවෙන් ශ්‍රී සම්බුද්ධ ධර්මය හාවිතා කටයුතුයි, ඇදහිය යුතුයි.

මෙලෙසින් සමාධිබලය පිළිබඳව කරන්ට යෙදුන දෙශනාව ලිවීමට අපවෙත පැමිරුණ නිසා ප්‍රීතියෙන් සංක්ෂෙපයෙන් ලියා අවසන් කෙළෙමු.

සාධු! සාධු!! සාධු!!!

නමො මහෙසිනො.

කළුතර පැල්පොල ඉසිපතනාරාමාධිපති
මොරටුවේ සිරි සාසනවංස මහාස්ථවිර ස්වාමිපාදයන්
වහන්සේ විසින් පවත්වනලද ධර්මදෙශනාව.

# පඤ්ඤා බලය.

තත්ථ කතමං පඤ්ඤාබලං? අවිජ්ජාය න කම්පතීති පඤ්ඤාබලං

1 සහජාතානං ධම්මානං උපත්ථම්භනට්ඨෙන පඤ්ඤාබලං
2 කිලෙසානං පරියාදානට්ඨෙන පඤ්ඤාබලං
3 පටිවෙධාදි විසොධනට්ඨෙන පඤ්ඤාබලං
4 චිත්තස්ස අධිට්ඨානට්ඨෙන පඤ්ඤාබලං
5 චිත්තස්ස වොදානට්ඨෙන පඤ්ඤාබලං
6 විසෙසාධිගමනට්ඨෙන පඤ්ඤාබලං
7 උත්තරිපටිවෙධට්ඨෙන පඤ්ඤාබලං
8 සච්චාභිසමයට්ඨෙන පඤ්ඤාබලං
9 නිරොධෙ පතිට්ඨාපනට්ඨෙන පඤ්ඤාබලං ඉදං පඤ්ඤාබලං

**ගුණවත් පිණැතියෙනි,**

අද අපට නියම මාතෘකාව පඤ්ඤාබලයයි, එය මෙම දෙශනා වාරයේ අවසාන දෙශනාවයි. බොධිපාක්ෂික ධර්ම (31) තිස්හතට ඇතුලත් ධර්මකොට්ඨාස ඉන්ද්‍රිය ධර්ම පසකුත්, බලධර්ම සතරකුත් යන දෙශනා නවයක් පිළිවෙළින් දෙශනාකොට අද පස්වැනි බල ධර්මයවූ පඤ්ඤාබලය අවශාන දෙශනාව වශයෙන් දෙශනා කිරීමට අපට පැවරී තිබේ. කාලය ලැබෙනා අයුරු එම පඤ්ඤාබලය පිළිබඳව ඉතාම ලුහුඬු තේරුමක් දීමට අපි බලාපොරොත්තුවෙමු. ඊට ප්‍රථම මේ දෙශනාව අවසාන දෙශනාව බැවින් කිවයුතු කාරණා ස්වල්පයක්ද තිබේ, එයද මෙහිදී ප්‍රකාශ කිරීමට සුදුසු නිසා අමතක නොකරමු. මෙම අභිනව ධර්ම මන්දිරය අවසන්කොට මෙම පුණ්‍යාත්මවයන් සිදුකරණ මේ ස්ථානයේ දායකපිරිස ඉතාම ස්වල්ප දෙනෙකි. සමගියේ අසහාය බලය විදහා පෙනෙනා පින් කම් මෙපමණක් නොව මීට කිසිසේත් නොදෙවෙනි අතිකුත් කර තිබෙන පින්කම් දෙසද බලනවිට මෙහි දායක දායිකාවන් මහත් ගෞරවයකට පාත්‍රවනබවද මේ සත්ක්‍රියා අන් හැම දෙනෙකුටම ආදර්ශයක්වන බවද කියනු කැමැත්තෙමු. වත්කම් අතින් අඩු

මෙම පින්වතුන්තුළ විද්‍යමාන ධනය බුදුන් වහන්සේගෙන් අවසර ලැබුන ශ්‍රද්ධා ධනය පමණක්ම බැව් අපි දනිමු. ශ්‍රද්ධා වීර්‍ය්‍ය දෙකින් නොඅඩු මෙම පින්වතුන්ගේ සමගිය මෙසා විශාල පින් රැසක් කර ගැණිමට අවසර ලබාදුන්බව සලකා එම සමගිය දිවිහිමියෙන් වනසා නොගන්නාලෙස අපි හරයේ අවවාද කරමු.

මීලඟට බණඇසීමට සිත් යොමුකරවීම සඳහා අවවාදයක් කරමු. පින්වතුනි! බණ අසා දැන පිළිපැදීම දෙලොව වැඩ සාධා ගැණිමට උපකාරවන ක්‍රියාවක් බවත් බොහෝ කලක් ධර්මය රැඳීමට උපකාරවන ක්‍රියාවක් බවත් මෙසේ දේශනාකර තිබේ. මහණෙනි! යම් සැදැහැවතෙක් මම දේශනාකරණ ආකාර පස දැන උගෙන පිළිපැද්දෙත් මාගේ ශ්‍රී සද්ධර්මය සචිරවම පවතීත්, අවුල් නොවෙත්, විනාශ නොවෙත්. ඒ පස කවරේද?

1 දේශනා කරණ ධර්මය, පදයක්වත් අකුරක්වත් අතනැර එකින්එක අමුනා සකස්කරණ මුතුපටක්සේ පිළිවෙළින් අසත්ද, 2. ඒ ඇසූ පරිදි එම බණ එලෙසම පුහුනු කරත්ද, නැවත නැවත සිහිකරමින් අමතක නොවනසේ සිතෙහි දරාගණිත්ද, 3. එලෙසම බොහෝකල් ගියේ නමුදු අතරතුර ටික ටික මතකනැති නොවන ලෙස දරාගණිත්ද, කෙසේද? රන් බඳුනක බහාතැබූ සිංහතෙලක් මෙනි, රන් බඳුනේ තැන්පත්කල සිංහතෙල කල්ගියේ නමුදු නොසිඳේ, සුරක්ෂිතවම තිබේ. කල්යාමෙන් අගයද වැඩේ, එමෙන්ම ශ්‍රද්ධාවෙන් ඇදූමු නැනවතාගේ සිතෙහි බැසගත් මිටිනා ධර්මයද නොසිඳෙයි, නොනැසෙයි, කල් යත්යත්ම එහි වටිනාකමින් ත්‍රිවිධ සැපයද සාධාදෙයි.) 4. එසේ දරාගත් ධර්මය විවේක ලැබෙන අවස්ථාවන්හිදී අර්ථය පරීක්ෂා කිරීමෙහි යෙදේද, 5. එසේ පරීක්ෂාවෙන් වටහාගත් ධර්මයෙහි අර්ථයදැන ධර්මයදැන ධර්මානුධර්ම ප්‍රතිපත්තීන්හි නිරතව හැසිරෙත්ද, යන මේ පස් ආකාරයට ධර්මය පිළිබඳව පිළිපදිත්නම් එබඳු තැනැත්තාහට බණඅසන තැනැත්තාය, බණරකින තැනැත්තාය, බණවඩන තැනැත්තාය, බණදැන මෙලොවදීම සැපසම්පත් සාධාගන්න තැනැත්තායයි කියනහැක, එසේනම් බණාසන්ට පැමිණි මේ පිරිස මෙකී කරුණුපස සම්පූර්ණ කිරීමට සිතාගත යුතුයි. නැතිනම් බණ ඇසුවානම් නොවේ. ඉන් ප්‍රයෝජන ලැබුවානම් නොවේ, ගෙවල්වලට ගොස් අපි බණ ඇසුවාය, බණ හොඳය කියා වාසිබස් දෙඩුවාට ඔහුගේ එම ඇසීමෙන් බලාපොරොත්තු ප්‍රතිඵල නොලැබේ. මෙනිසා සැමදෙනෙක්ම මෙම අවවාදය පිළිගෙණ නුවණ මෙහෙයා ප්‍රඥබලය පිළිබඳව අපි කියන විස්තරය අසා දරා ඉන් ප්‍රයෝජනගෙන මෙලොව නුවණින් කල්යවා පරලොවද යහපත සලසාගෙණ අවසාන අත්බැව්හිදී නිවන්සිරි සාධාගන්නාලෙස අවවාද කරමු.

මෙතැන්සිට පඤ්ඤාබලය පිළිබඳව ඉතා කෙටි විස්තරයක් පවසමු. සාවධානව ඇසිය යුතුයි. "තත්ථ කතමං පඤ්ඤාබලං?" එහි ප්‍රඥා බලය නම් කවරීද? අවිජ්ජාය න කම්පතීති පඤ්ඤාබලං? අවිද්‍යාවෙන් නැතිනම් මෝඩකමින් කම්පාකරන්ට සොලවන්ට බිඳ දමන්ට නොහැකි නිසා පඤ්ඤාබලයයි කියනු ලැබේ.

මෙහිදී අපි පළමුකොට "පඤ්ඤා" යන වචනයෙහි අදහස තේරුම් ගනිමු. ත්‍රිපිටකධාරී බුද්ධඝොෂ මහාරහතන් වහන්සේ එම පඤ්ඤා යන වචනය විස්තර කරන්ට ගෙණ ප්‍රථම යෙන් දේශනාකළේ "සංව අතිසංඛෙප දෙසිතත්තා විඤ්ඤාතුම්පි කා වනසුකරා පගෙව භාවෙතුං" යනුවෙනි. ඉන් කියන්නේ ත්‍රිපිටක යේම මෙම ප්‍රඥාව ගැණ විස්තරකර තිබෙන්නේ ඉතා ස්වල්ප වශයෙන්ය. එනිසා ප්‍රඥාව තේරුම් ගැණීම පවා අපහසුය. එසේ තේරුම් ගැණීමට අපහසු ප්‍රඥාව වඩාගැනීම කරන්ට අපහසුයයි කියන්ට ඕනෑ නොකරත් යුතුයි. නුවණින් අඟතැන් පැමිණි උතුමෝ ප්‍රඥාව දැන වඩාගැන්ම අපහසුයයි කියත්. එය සැබෑවකි. නමුත් එම අපහසු කාරණය ගැණ මැලිවී එය දැනනොගෙන නො වඩා අතනැරිය යුතුයි. මන්ද– ප්‍රඥාවෙන් තොරවූ පුද්ගලයා මිනි සෙක් නොව මිනිසුන් මැද හැසිරෙන තිරිසනෙක් මෙනැයි නැණ වතුන්ගේ පිළිගැණීම බැවිනි. එනිසා කොපමණ අමාරු අපහසු වුවද ප්‍රඥාව දැන වඩාගත යුතුයි. ප්‍රඥාව පින්වතුන්ට අවබොධකර දීමට මාද වෙහෙසෙන්ට නැත්කරන්නේ මුලින් කී බුද්ධඝොෂ මහා රහතන් වහන්සේගේ වචනය සිහිකරමිනුයි. මෙම ප්‍රඥාව විසඳීමට සෑම අතකින්ම අපොසත් මට උපකාර වන්නේ ඒ උතුමන්ගේ ප්‍රකාශයි. විස්තර කරණලද එබඳු ස්ථාන තිබෙන බැවින් අපට වැටහෙන අයුරින් එය විසඳන්ට උත්සාහ කරමු. මේ පින්වතුන්ද නිදිබර ඇ. දුර්ලා එය අසා දැන වැඩීමට උත්සාහවත් වියයුතුයි. ප්‍රඥාව අපි තෝරා ගනිමු.

කාපඤ්ඤා? කුසල චිත්ත සම්පයුත්තං විපස්සනා ඤාණං පඤ්ඤා" ප්‍රඥාව නම් කවරීද? කුසල් සිත සමග එක්ව යෙදුනු විදර්ශනා ඥානය (විශෙෂ වශයෙන් නුවණින් දැකීම) ප්‍රඥාවයි.

"කෙනට්ඨෙන පඤ්ඤා? පජානනට්ඨෙන පඤ්ඤා– කිමිදං පජානනං නාම? සංජානන විජානනාකාර විසිට්ඨං නානප්පකාර තො ජානනං" කවර අර්ථයක් ගෙනදෙන නිසා ප්‍රඥාවයයි කියත්ද? විශෙෂයෙන් දැනගැණීම කරණ අර්ථයෙන් ප්‍රඥාවයයි කියනුලැබේ. විශෙෂ දැනගැණීම නම් කුමක්ද? සංජානන විජානනාදී වශයෙන් විශිෂ්ට වශයෙන් නානාප්‍රකාර වශයෙන් දැනගැණීම ප්‍රඥාවයි. මෙහි කී සංජානන විජානනාදිය නම් කුමක්ද, එය තේරුම්කරදීමට

අපි මැණිකක් ගෙණ බලමු. කුඩා ළදරුවෙක් අතට අපි ලක්‍ෂණ මැණිකක් දෙමු. එයගත් ළදරුවා අර දුත් මැණිකේ පාට ලක්‍ෂණ බලා සතුටුව අතේ තබාගණිත් – ඒ දැනගැණීම සංජානනයයි. එම මැණික අපි පිටිසරබද මිනිසෙකුට දෙමු. ඔහු එය මැණිකක් බවත් වටිනා එකක් බවත් සලකා ප්‍රවේසම්කර මැණික් අඳුනන්නන් සොයා එහි අගය දැනගෙණ විකුට මිල ලබාගණිත් – ඒ දැනීම විජානනයයි. නැවත එම මැණික මැණික් අඳුනන රන්කරුවෙකුට දෙමු. ඔහු එය ලැබුනු වහාම පෙරලා බලා දිවලා රස බලා එක ඇසක් වසා බලා, එළියට එල්ලකර බලා, මේ මැණික අසවල් පළාතේය, අසවල් පැත්තේ ආකාරයකය, මෙය මෙපමණ වටිනාවය, මෙය මේලෙස කැපුවොත් මෙපමණ වටීය ආදී වශයෙන් සියලු විස්තර දැනගණී, එම දැනගැණීම පජානනයයි. මෙලෙසින් විසඳ පිරිසිඳ අන් සියලු දේ තෙරෙසීම දැනගැණීමේ ඤාණයට පඤ්ඤාසයි කියනු ලැබේ.

යමෙක් පිළිබඳව ඇති සංඥවත් විඤ්ඤාණයත් යන දෙආකාරයෙන් යමක් බෙදා වෙන්කොට පිරිසිඳ දැනගැණීමක් කරන්ට නොහැකි වෙත්. ඒ දෙකින් පමණක් යමක් දැනගැණීමේදී මේ දැනගැනීම සංඥව පමණක්ය, මේ දැන ගැණීම විඤ්ඤාණය පමණක්ය, මේ දැනීම ප්‍රඥව නිසා දැනීමය, ආදී වශයෙන් වෙන්කොට සියුම් දැනීමක් කරගන්ට නොහැකිවෙත්. එසේ නොව ප්‍රඥවගේ දැනගැණීම ඉතා සියුම් එකකි, දැකීමට දැනීමට දුෂ්කර දෙයද දැනගැණීමට ප්‍රඥව ප්‍රබලවෙත්. ඒ ප්‍රඥවගේ මහිමය අවබෝධකරවන්ට නාගසෙන මහරහතන් වහන්සේ මිලිඳු මහරජතුමාට මෙසේ වදරා තිබේ. මහරජ බුදුරජාණෝ බොහෝම දුෂ්කර වැඩක්ය මේ කළේ=(මිලිඳුරජ) ස්වාමීනි නාගසෙනයන් වහන්ස, බුදුරජාණෝ කරපු ඒ දුෂ්කර වැඩේ කුමක්ද? මහරජ බුදුරජාණෝ රූපවශයෙන්වත් ද්‍රව්‍යවශයෙන්වත් පෙන්වන්ට බැරි චිත්ත චෛතසික ධර්ම සමූදය එක අරමුණක වැටෙනා ආකාරය වෙන්කොට නියම වශයෙන් දෙශනාකළසේක. මේ ස්පර්ශය, මේ වේදනාවය, මේ සංඥවය, මේ චේතනාවය, මේ සිතය යනාදී වශයෙන් වෙන්කොට වදාළසේක. තවද එම ප්‍රඥවගේ ලක්‍ෂණය මේයය, රශය මේකය, පච්චුපට්ඨානය මේයය, පදට්ඨානය මේයය කියා වෙන්කොට දෙශනා කළසේක. එනිසා මහරජ බුදුරජාණෝ දුෂ්කරවූ දෙයක්ම කොට වදාළසේක. මහානුවනැති මහරජ තෙමේද එය එසේම පිළිගන්නා ලදී ප්‍රඥවගේ ලක්‍ෂණාදී සතර මීලඟට අවබෝධකරගත යුතුයි.

"ධම්මසභාව පටිවෙධලක්ඛණා පඤ්ඤා" ප්‍රඥවගේ ලක්‍ෂණය නම්= සියලුම ධර්මයන්ගේ සියලු සවභාවයන්ගේ යථාසවභාවය, නියමවිධිය, අවබෝධකර ගැණීමයි.

ධම්මානං සභාව පටිච්ඡාදක මොහන්ධකාර විධංසනරසා= මෙම ප්‍රඥාවගේ රසය නම් හෙවත් ප්‍රඥාව කරණ කටයුත්තනම්- රූපාදී ධර්මයන්ගේ වැනසෙන, සැලෙන, පෙරළෙන සවභාවය මෙසේ නුවනැසට නොපෙණ්වා එම රූපාදිය, සුභය, සැපය යනාදී වශයෙන් කල්පනා කරණ මෝඩ අදහස් මෝහ නමැති අඳුර නසා ප්‍රඥාලෝකයෙන් රූපාදීන්ගේ විනාශවන සවභාවය හැඳින ගැණීම හැකිනම් මෝඩකම වළකාරලීම ප්‍රඥාවගේ (කටයුත්තයි) රසයයි.

අසම්මොහ පච්චුපට්ඨානා- ප්‍රඥාවගේ එළඹසිටි කාරණයනම්, මුලානොවන බවයි. රූපාදීන්ගේ අනිත්‍යාදී සවභාවය නියම වශයෙන් දැන විනාශකරණලද මෝහය ඇතිකල්හී එය නැවත වෙනස් නොවනසේ මුලානොවන සවභාවය ප්‍රඥාලෝකයට එළඹ සිටි කාරණයයි. සමාහිතො යථාභූතං පජානාති පස්සතීති වච නතො පන සමාධිතස්සා පදට්ඨානං- ප්‍රඥාවගේ පදස්ථානය ලංවූ කාරණය සමාධියයි, හැකිනම් සිතේ එකඟ බවයි. සිත එකමුතුවූ වාම රූපාදීන්ගේ යථාසවභාවය දැනගැණීමට හැකිවෙයි, දැන ගණී යනු කීහෙයින් සමාධිය සිතේ එකඟබව ප්‍රඥාවගේ ලංවූ කාරණයයි. මේ ලක්ෂණ, රස, පච්චුපට්ඨාන, පදස්ථාන යන විධි සතර සැම බණපදයකම ඇති බැවින් එය නුවන මෙහෙයා දැනගැණීම ඉතාම වැදගත් කරුණකි. මෙකී ක්‍රම සතර දැනගත් ධර්මධරයා වටිනා කෙනෙකි. සියලු දෙනාම මේ ක්‍රම සතර දැනගැණීමට මහන්සිගත යුතුයි. ධර්මධරයන්ගෙන් විමසා පිරිසිඳුව තේරුන්ගත යුතුයි.

මීලඟට ප්‍රඥාවගේ ප්‍රභේද කියමු. ප්‍රඥාව කොටස්කර බලන කලද තේරුන් ගැණීමට පහසුකම් ලැබේ. සියලුම ධර්මයන්ගේ තත්ත්වාකාරය අවබොධකර ගැණීම ප්‍රඥාවෙන්ම කළයුතු බැවින් ප්‍රඥාව ඇත්තාහටම සියලු ධර්මාවබෝධය සිදුකළහැකි හෙයින් ප්‍රඥාව එක් ආකාරයකි, හෙවත් එකක්මය. ඒ එකක්මවූ ප්‍රඥාව ලෞකික ප්‍රඥාවය, ලෝකෝත්තර ප්‍රඥාවයයි දෙකකට බෙදනහැක. මේ ලෞකික ලොකෝත්තර ප්‍රඥාව මෙම පොතෙහි විස්තරවතිබේ. කෙටි වශයෙන් මෙසේ සලකන්න, "ලොකියමග්ග සම්පයුත්තා ලොකියා, ලොකුත්තරමග්ග සම්පයුත්තා ලොකුත්තරා" ලෞකිකමාර්ගයන් හා යෙදුන ප්‍රඥාව ලෞකිකයි, ලොකෝත්තර මාර්ගයන් හා යෙදුන ප්‍රඥාව ලොකෝත්තරයි. තවද මේ ප්‍රඥාව දෙකටබෙදුන තැන් කීපයක්. සාසව, අනාසව, නාමරූප වවත්ථාන, සොම්නස, උපෙක්ෂාසහගත ආදිවශයෙනි. එහි විස්තරද කිරීමට නොවෙහෙසෙමු, විසුද්ධිමාර්ගය භාවිතා කිරීමෙන් හා ධර්මධරයන් විසඳීමෙන් දැනගතයුතුයි.

ප්‍රඥව තුනටද බෙදනහැක, හේ මෙසේයි චින්තාමයපඤ්ඤා, සුතමයපඤ්ඤා, භාවනාමයපඤ්ඤා වශයෙනි. මෙහි චින්තාමය ප්‍රඥව නම්- අන් කෙනෙකුගෙන් නොඅසා නොදැන තමන්ම ලබාගත් නුවණ තමන්ම සිතා නිපදවා ගන්නාලද හෙයින් චින්තාමය ප්‍රඥව යයි කොටසකටද, අන් අයගේ ඇසුරින් අසාදැන නිපදවාගත් හෙයින් සුතමය ප්‍රඥාවයයි කොටසකටද, භාවනා මගයෙන් යම් යම් ආකාරයකින් නිපදවාගත් අභිඥාවට පැමිණි ප්‍රඥාව භාවනාමය ප්‍රඥාවයයි කොටසකටද කියා තුන් කොටසකට ප්‍රඥාව බෙදේ. හෙද විසුද්ධිමාර්ගයෙන් සවිස්තරව දතහැක. තවද ප්‍රඥාව තුන් කොටසකට බෙදේ. ඒ කෙසේද- පරිත්ත මහග්ගත අප්පමාණාරම්මණ වශයෙන පරිත්ත ආරම්මණ ප්‍රඥවය, මහග්ගතාරම්මණ ප්‍රඥාවය, අප්පමාණාරම්මණ ප්‍රඥවය කියායි. මෙහි පරිත්තාරම්මණ ප්‍රඥාව නම් සදිව්‍යලෝකය, මිනිස්ලොව, සිව්අපාය යන එකොළොස් ආකාර කාමාවචර භූමින් අරබයා පවත්නා ප්‍රඥාව පරිත්තාරම්මණ ප්‍රඥාවයි. රූපාවචර අරූපාවචර විසිආකාර භූමින් පිළිබඳව පවත්නා ප්‍රඥාව මහග්ගතාරම්මණ ප්‍රඥාවයි. ඕ ලෞකික විදර්ශනා ප්‍රඥාවයි, නිර්වාණය අරමුණුකොට පවත්නා ප්‍රඥාව අප්පමාණාරම්මණ ප්‍රඥාවයි, මෙසේද ප්‍රඥාව තුන්ආකාර වෙයි. තවද ආයකොසල්ල ප්‍රඥාවය, අපායකොසල්ල ප්‍රඥාවය, උපායකොසල්ල ප්‍රඥාවයයි කියාද තුන්කොටසකි. මෙහි ආයකොසල්ල ප්‍රඥාව නම්, ආයකියන්නේ වැඩි දියුණුවටයි, වැඩිදියුණුවෙහි දක්ෂලක්ෂණය ආයකොසල්ල ප්‍රඥාවයි, හේ මෙසේයි. යමෙක් මෙසේ සිතත්, මම මේදේ සිතින් සිහිකරණකොට නූපන් අකුසල් නූපදිත්, උපන් අකුසල් වැනසෙත්, නූපන් කුසල් උපදිත්, උපන් කුසල් වැඩෙත්, මෙසේ වැඩීමෙන් මෝඩකම නැතිවෙත්, සඬ්මීය වැඩෙත්, සම්‍යක්දෘෂ්ටිය දියුණුවේ, මේ ආකාරයෙන් වැඩීයෑම ආයකොසල්ල ප්‍රඥවයි. අපාය නම් පිරිහීමයි, පිරිහීමේ දක්ෂභාවයට අපායකොසල්ලයයි කියනු ලැබේ මුලින් කී ආකාරයට විරුද්ධ ආකාරයයි. නූපන් අකුසල් උපදවා ගැන්මත්, උපන් අකුසල් වඩාගැන්මත්, උපන් කුසල් නැතිකරගැන්මත්, නූපන් කුසල් නූපදවාගැන්මත් සඳහා නුවණ යොදවා ක්‍රියාකරත් නම් එම පිරිහීමට අපායකොසල්ල ප්‍රඥාවයයි කියනු ලැබේ. උපායකොසල්ල ප්‍රඥාව නම්- "සබ්බාපි තත්‍රූපායා පඤ්ඤා උපායකොසල්ලං" සියලුම ක්‍රමයෙන් යොදන උපාය උපායකොසල්ල ප්‍රඥවයි.

මෙම ප්‍රඥව සතරාකාරවද මෙසේ බෙදී පවතී. ජාති, ජරා, ව්‍යාධි, මරණ, අප්‍රිය සම්ප්‍රයෝග, ප්‍රිය විප්‍රයෝග, ඉච්ඡා අලාභය, පඤ්චස්කන්ධය පිළිබඳ දුක යනාදී දුක්ඛසත්‍යය පිළිබඳව පවත්නා

ඥාණයට දුකෙහි තතු දන්නා ඥාණයයි කියාද, කාම- භව- විභව- තෘෂ්ණා වශයෙන් දුක්හටගැණීම පිළිබඳව පවත්නා ඥාණයට දුක්ඛසමුදය ඥාණයයි කියාද, මෙකී තුන් ආකාර තණ්හාවගේ සම්පූර්ණ නිරුද්ධකිරීමක් වේද, හැරීමක් වේද, ඉවතලෑමක්වේද, එම තණ්හාවෙන් මිදීමක් වේද, ආලය නොකිරීමක් වේද, එය දුක්ඛ නිරෝධ පිළිබඳව පවත්නා ඥාණයයි කියාද, සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි යන ප්‍රතිපදාවන් අට අරභයා පවත්නා ඥාණයට දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපදා ඥානයයි කියාද ප්‍රඥාව සතරාකාරයකට කොටස්වේ.

අත්ථ, ධම්ම, නිරුත්ති, පටිභාන වශයෙන්ද ප්‍රඥාව සතරකට බෙදේ. අර්ථ (අදහස්) දැනගැණීමේ නුවණ අර්ථ ප්‍රතිසම්භිදා ඥාන යයි, ධර්ම දැනගැනීමේ නුවණ ධර්ම ප්‍රතිසම්භිදා ඥාණයයි, අර්ථ, ධර්ම, නිරුක්ති දැනගැනීමේ ප්‍රඥාව නිරුක්ති ප්‍රතිසම්භිදා ඥානයයි. ඥාන යන් දැනගැණීම ප්‍රතිභාන ප්‍රතිසම්භිදා ඥානයයි, මෙසේ අර්ථාදිවශයෙන් සතරකට බෙදෙන ඥාණය දතයුතුයි. මෙකී සතරාකාර ප්‍රතිසම්භිදාඥාණය සෛඛභූමි, අසෛඛභූමි වශයෙන් දෙපරිදිවේ. සෛඛයෝ නම් සෝවාන් සකෘදාගාමි අනාගාමි මාර්ගලාභී පුද්ගලයෝයි, අසෛඛභූමි නම් රහත්මගට පැමිණි පුද්ගලයෝයි. සෝවාන් ආදී මාර්ගත්‍රයට පැමිණියහුගේ ඥාණය සෛඛඥානයයි, රහත්මගට පැමිණි ඥාණය අසෛඛ ඥානයයි, එම දෙආකාර භූමියද පස් ආකාරවේ. එනම්- අධිගම, පරියත්ති, සවණ, පරිපුච්ඡා, පුබ්බයෝග යනුවෙනි. මෙහි රහත්බවට පැමිණීම අධිගමයයි, ත්‍රිපිටක බුද්ධවචනය පුහුනු කිරීම පරියත්තියයි, අර්ථ විමසමින් දැන සකස්කර බණ ඇසීම සවනයයි, පාලි අර්ථ කථාදියෙන් ගැටලු ස්ථාන විනිශ්චය කිරීම් ආදිය පරිපුච්ඡාවයි, පෙර බුදුවරයන් වහන්සේලාගේ සස්නෙහි ඉපිද පුරුදුකල භාවනා ඒ පුරුදුලෙස මෙම සස්නෙහිද විදර්ශනාදී යෝගයන්හි යෙදීම පුබ්බයෝගයයි. මෙම ප්‍රතිසම්භිදාඥාන සතර කොතෙක්මද කියනවානම් බුදුන් වහන්සේලාට දශබලය යම්සේද අග්‍රශ්‍රාවකයන් වහන්සේලාට සිවුපිළිසිඹියා ඥානයද එසේය. මින් කියන්නේ සිව්පිළිසිඹියා ප්‍රඥාව නොමැති අග්‍රශ්‍රාවකයන් වහන්සේ අසම්පූර්ණ බවයි.

මෙසේ ප්‍රඥාවගේ ප්‍රභේද සැකෙවින් දැන උගෙන මීලගට ප්‍රඥාව වඩාගන්නා ආකාරය තේරුන් ගතයුතුයි. ප්‍රඥාව වඩාගන්නට සතුටු පින්වතුන් ප්‍රඥාවගේ භූමිය තේරුන් ගතයුතුයි, මූල තේරුන්ගත යුතුයි, ශරීරය තේරුන්ගත යුතුයි.

ප්‍රඥාවගේ භූමිය නම්– ස්කන්ධ– ආයතන–ධාතු– ඉන්ද්‍රිය– සච්ච පටිච්චසමුප්පාද ආදිවශයෙන් කොටස් කරනලද ධර්මසමූහයයි. ප්‍රඥාවගේ මූලනම්, සීලවිසුද්ධි, චිත්තවිසුද්ධි යන දෙකයි. ප්‍රඥාවගේ ශරීරය නම් දිට්ඨිවිසුද්ධි, කඞ්ඛාවිතරණවිසුද්ධි, මග්ගාමග්ග ඤාණදස්සනවිසුද්ධි, පටිපදාඤාණ දස්සනවිසුද්ධි, ඤාණදස්සනවිසුද්ධි යන පස් ආකාර විසුද්ධියි. එනිසා ප්‍රඥාව වඩාගන්නන් විසින් මේ භූමි සඞ්ඛ්‍යාත ස්කන්ධාදී ධර්මයන් දැන උගෙන විසඳගෙන ඤාණයවැඩීමට පුරුදු කරගෙන මූලවූ විසුද්ධිදෙක සම්පාදනයකර ශරීරය හා සමාන පස් ආකාර විසුද්ධි සම්පූර්ණකර ගැණීමට උත්සාහ වැඩිය යුතුයි.

මෙය මෙපමණකින් පහසුවෙන් තේරුම්ගන්ට නොහැකි බැවින් මදක් විස්තරකර කියමු. මෙහි භූමිවශයෙන් දතගතයුතු කරුණු අතර ස්කන්ධපිළිබඳ දතගැණීම පළමුවැන්නයි, එහි ස්කන්ධ කීවේ පසකටයි. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පඤ්චස්කන්ධයටයි. මෙහිදී පළමුකොට රූපස්කන්ධය තේරුම් කරගතයුතුයි. සීත උෂ්ණ ආදියෙන් මොහොතින් මොහොත කැඩි කැඩී බිඳිබිඳී වෙන්වෙන් ස්වභාවයට පෙරළෙන සුළු ස්වභාව සමූහය රූපයි, ඒ රූප සියල්ල එක්කොටගත්කළ රූපස්කන්ධයයි එම රූප නිතරම විකාරවන පෙරළෙන ස්වභාව වශයෙන් ගත්කළ එක ආකාරයකි, නමුත් භූතරූපය උපාදාය රූපයයි දෙකොටසකටද බෙදී පවතියි. ඉන් භූතරූප සතරකි, පඨවි, ආපෝ, තෙජෝ වායෝ යනු වෙති. උපාදායරූපය විසිඅතර ආකාරයකි. ඇස, කන, නැහැය, දිව, කය, රූපය, ශබ්දය, ගඳ, රස, ස්ත්‍රීන්ද්‍රිය, (ස්ත්‍රී ලිංගය) පුරිසින්ද්‍රිය (පුරුෂ ලිංගය) ජීවිතින්ද්‍රිය, හෘදයවස්තුව, කායවිඤ්ඤත්තිය (කයින් කරණ ඇඟවීම්) වචීවිඤ්ඤත්තිය (වචනයෙන් කරණ ඇඟවීම්) ආකාශධාතුව, රූපයාගේ ලහුබව, රූපයාගේ මෘදුබව, රූපයාගේ කර්මන්‍යබව, (වැඩට සුදුසු රූපස්වභාවය) රූපයාගේ රැස්කිරීම, රූපපරම්පරාව, (නොකඩවා පැවති රූපය) දිරණසුලු රූපය, පෙරළෙනසුලු රූපය, කබලිංකාරාහාරය, (පිඩු කොට බුදින ආහාරය) මිනිස් තිරිසන් ඈ සියලු දෙනාගේ ආහාරය යන විසිසතර ආකාරය උපාදාය රූපයි. මේ රූපස්කන්ධයයි. මේ සූවිස්සෙන් ඇස ගැන පමණක් කියමු, එය මෙසේ පෙන්වා තිබේ.

යෙන චක්ඛුප්පසාදෙන–රූපානි මනුපස්සති
පරිත්තං සුඛුමං එතං–ඌකාසිර සමූපමනති.

මින් කියන්නේ ලොව ඇතිතාක් රූප සියල්ලම වෙන් වෙන් වශයෙන් දැකීමට ශක්තිය ඇති උකුණු හිසක් පමණ ඉතා සුළු

ඉතා සියුම් යම් චක්ෂු ප්‍රසාදයක් ඇද්ද එය ඇසයි. එකක් පාසා විස්තර කියන්ට යෑමෙන් දෙශනාවට දීර්ඝකලක් ගතවියෙන්. එබැවින් මෙතෙකින් පමාවෙමු. මේ ඇස ආදී සූවිසි උපාදාය රූපාදීන්ගේ ලක්ෂණාදි සතරකාරයද ස්වභාවයන්ද විසුද්ධිමාර්ගයෙහි විස්තරව පෙනේ. මෙතෙකින් රූපස්කන්ධය පිළිබඳ විස්තරය නවතමු. වේදනාස්කන්ධය යම්කිසි විඳීම් ස්වභාවයක් ඇද්ද එය වෙදනාවයි එම විඳීම් සියල්ලම එක්ගොඩක්කර සලකාබැලූවාම වෙදනාස්කන්ධයයි. එලෙසම හැඳින ගැනීම් සියල්ල සංඥස්කන්ධයයි. යම් පමණ සකස්කිරීමක් ඇතිකිරීමක් පිළිවෙළ කිරීමක් වෙත් නම් ඒ සියල්ල සංස්කාරස්කන්ධයයි, යම්පමණ දැනගැනීම් රැසක් වෙත් නම් ඒ සියල්ල විඥානස්කන්ධයයි, මේ විඥානස්කන්ධය හොඳට තේරුන්ගත්තාම අනික් සියල්ලම පහසුවෙන්ම තේරුන් ගතහැකියි, එනිසා විඥානස්කන්ධය හොඳහැටි තේරුන්කර ගනිමු.

සංඛිත්තෙන විජානන ලක්ඛණං සබ්බනතං එකතො කත්වා විඤ්ඤාණක්ඛන්ධො වෙදිතබ්බො–ති යනුවෙන් යම්පමණ දැන ගැනීම් ලක්ෂණ (විධි) ඇද්ද ඒ සියල්ලම එක්කොට සලකාගත් තාම ඒ සියල්ල විඥානස්කන්ධයයි දැනගන්නවාය, දැනගත්තාය ආදි වශයෙන් කාරණ කාරණාවට අනුරූපවූ දැනීම විජානනයයි හෙවත් විඥානයයි. විඥානය චිත්ත මනස යන වචන අදහස් වශයෙන් එකම අදහසයි, නමුත් දැනගැනීම් ස්වභාව තුන්ආකාරයි. කුසල, අකුශල, අව්‍යාකෘත යනු ඒ තුන් ආකාරයයි. ඉන් කුසලය භූමිවශයෙන් සතරනම් බෙදේ. කාමාවචර, රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර යනු ඒ සතරාකාර භූමියි. ඉනුත් කාමාවචරභූමිය සෝමනස්සසහගත ඥාණසම්ප්‍රයුක්ත අසංඛාරය 1, සසංඛාරය 2, සෝමනස්ස සහගත ඥාණවිප්‍රයුක්ත අසංඛාරය 3, සසංඛාරය 4, උපෙක්ඛාසහගත ඥාණසම්ප්‍රයුක්ත අසංඛාරය 5, සසංඛාරය 6, උපෙක්ඛාසහගත ඥාණවිප්පයුත්ත අසංඛාරය 7, සසංඛාරය 8 යයි කියා අටකට බෙදේ. එහි විස්තර මෙම පොත් පෙළේ දෙවෙනි කොටසේ සම්‍යක් ප්‍රධානයන්හි විස්තරකර ඇත.

දෙවෙනි රූපාවචර භූමිය පස්ආකාරයි. විතර්කවිචාර, පීති, සුඛ, එකාග්‍රතා සහිත එකෙක, විචාරපීතිසුඛ එකාග්‍රතා සහිත එකෙක, පීතිසුඛ එකාග්‍රතාසහිත එකෙක, සුඛ එකාග්‍රතා සහිත එකෙක, උපෙක්ෂා එකාග්‍රතාසහිත එකෙකැයි ධ්‍යානාංග වශයෙන් රූපාවචර භූමිය පසකට බෙදෙන්.

අරූපාවචර භූමිය– ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය යන ධ්‍යානසම්ප්‍රයුක්ත භෙද සතරක් වෙත්.

ලෝකෝත්තර භූමිය- සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් වශයෙන් සතරමාර්ගය සමග යෙදුන භෙද සතරක් වෙත්. මෙකී සතරාකාර භූමිය විසිඑක් ආකාරයකට බෙදා දක්වෙනුයේ කුසල යයි, මිලඟට අකුශලය තේරුන්ගත යුතුයි.

“අකුසලං පන භූමිතො එකවිධං කාමාවචරමේව” අකුසලය භූමිවශයෙන් කාමාවචර භූමියෙහි පමණක්ම වෙත්. මූලවශයෙන් තුන්ආකාරයකි- ලෝභමූල, ද්වේසමූල, මෝහමූල වශයෙනි. එම තුන් ආකාරයෙන් ලෝභමූල අකුසලය අට ආකාරයි. එනම්-

සෝමනස් සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත අසංඛාරිකය 1, සසංඛාරිකය 2, සෝමනස් සහගත දෘෂ්ටිගත විප්‍රයුක්ත අසංඛාරිකය 3, සසංඛාරිකය 4, උපෙක්ෂා සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත අසංඛාරිකය 5, සසංඛාරිකය 6, උපෙක්ෂා සහගත දෘෂ්ටිගත විප්‍රයුක්ත අසංඛාරීකය 7, සසංඛාරිකය 8 කියා අටවැදෑරුම් වෙත්. මෙහි දෘෂ්ටිගත යන්නෙහි අදහස තේරුන්ගන්න. “නත්ථිකාමේසු ආදීනවොති ආදීනා නයෙන මිච්ඡාදිට්ඨිං පුරක්ඛත්වා හට්ඨතුට්ඨො, කාමෙවා පරිභුඤ්ජන්ති” යනුවෙන් කාමසම්පත් විඳිමේ වරදක් පාපයක්නැත. එය විඳ සැප ලබාගැන්මම යහපත්ය ආදීවශයෙන් (මිථ්‍යා) වැරදි දැකීම්වලින් යුක්තව තුටුපහටුවූයේ කාමයන්හි ඇලී වසත්ද, දුටු දෙය මඞ්ගලය, ඇසූදෙය මඞ්ගලය, ආඝ්‍රහනය කලදෙය මඞ්ගලය යනාදී වශයෙන් අසාරවූවක් සාරවශයෙන් ගණිත්ද ඊට දෘෂ්ටිගත යයි කියත්. එම දෘෂ්ටිය එම මිථ්‍යා අදහස ඉතා සතුටින් තමන්ගේම අදහස පරිදි සිදුකරත්නම් පළමුවැනි අකුසල් සිත උපදිත්1, අනිකෙකු විසින් මෙහෙයන ලදුව සිදුකරත්නම් දෙවෙනි අකුසල් සිත උපදිත් 2, එසේම ඉතා සතුටින් මිථ්‍යාඅදහස් වලින් වෙන්ව තමන්ගේ කැමැත්ත පරිදි අකුසල්හි යෙදෙත් නම් එය තෙවැනි අකුසල්සිත යයිද 3, ඉතා සතුටින් මිථ්‍යා අදහස් වලින් වෙන්ව අනිකෙකුගේ මෙහෙයීමෙන් අකුසල්හි යෙදෙත් නම් එය සතරවැනි අකුසල්සිතයයිද 4 වෙත්. එමකී සතරාකාරය ලෙසම සෝම්නසහැර උපෙක්ෂාවෙන් යුක්තව අකුසල් කරත් නම් එලෙසද සතරකැයි අකුසල් සිත් අටකි, මේ අකුසල් අට ලෝභමූලවෙත්. ද්වේසමූල අකුසල් දෙකකි. එනම්- දෝම්නසින් හෙවත් අපිරිසිදු කිළුටු සිතින් ක්‍රෝධය සමග යෙදී ක්‍රෝධයෙන් තැවි තැවී තමන්ගේ කැමැත්තෙන් කරණ අකුසලය එකකි, අනුන්ගේ උත්සාහයෙන් කෙරෙන අකුසලය එකකැයි දෙකකි, මේ දෙක ද්වේෂමූල වෙත්. මෝහමූල අකුසල්ද දෙකකි. එනම්- විචිකිච්ඡාව හා යෙදුන මෝහමූලික සිතය, උද්ධච්චය සමග යෙදුන මෝහමූලික සිතයයි දෙකකි, මේ දෙක මෝහමූල වෙත්. මෙලෙසින් අකුසල විඥානය දොළොස් ආකාර වෙත්.

මීලඟට අව්‍යාකෘතය තේරුන්ගත යුතුයි.

**"අව්‍යාකතං ජාතිභෙදතො දුවිධං විපාකං ක්‍රියංච"** අව්‍යාකෘතය ජාතිභේද වශයෙන් දෙකකි. විපාකය, ක්‍රියාය යන දෙකයි එහි විපාක අව්‍යාකෘතය භූමි වශයෙන් සතරකි, කාමාවචර රූපාවචර, අරූපාවචර, ලෝකෝත්තර යන සතරයි. එහි කාමාවචරය දෙආකාරයි, කුසල විපාකය, අකුසල විපාකය කියායි, එහුදු කුසල විපාකය අහේතුකය, සහේතුකය කියා දෙආකාරයි. එහි අලෝභාදි විපාකහේතු විරහිතවූයේ අහේතුකයි, එයද චක්ඛුවිඤ්ඤාණය සෝතවිඤ්ඤාණය, ඝාණවිඤ්ඤාණය, ජිව්හාවිඤ්ඤාණය, කායවිඤ්ඤාණය, සම්පටිච්ඡන කෘත්‍යය සිදුකරණ මනොධාතුවය, සන්තීරණ කෘත්‍යය ඇති මනොවිඤ්ඤාණධාතු දෙකයයි අටආකාරයි, අහේතු රූව සංඝාතුක කුසල විපාකය දූනගත යුතුයි.

**"අලොභාදි විපාකහෙතු සම්පයුත්තාපන සහෙතුකං"** අලෝභ, අදෝස, අමෝහ යන විපාකහේතු සමග යෙදුන කුසලය සහේතුකයි, එයද අට ආකාරයි, එය කාමාවචර කුසල් සිත් අට මෙනි, එනමුදු කුසලය දන්දීම් ආදිවශයෙන් සය ආකාර අරමුණෙහි පවතිත්. මේ අව්‍යාකෘතය එසේ නොවේ. අව්‍යාකෘත විඥානය ප්‍රතිසන්ධි, භවාඞ්ග, චුති, තදාරම්මණ වශයෙන් සවල්ප විශයෙන් ඇතුලත් ධර්මයන් සයාකාර අරමුණුවල පවතීත්. මෙලෙසින් කුසලාකුසල අව්‍යාකෘතයන් පිළිබඳ සංක්ෂෙප විස්තරය දතයුතුයි.

මෙකී රූපාදී පඤ්චස්කන්ධය අවබෝධකර ගැණීම ප්‍රඥව පිළිබඳව සලකනකල භූමිය හා සමානයි. ප්‍රඥබලය වඩන්නන් විසින් පළමුකොටම තම ශරීරය පිළිබඳව ඇති සියලු කරුණු අසා දූන උගෙණ ගතයුතුයි, එහි සිට එහි පිහිටා වැඩිදුරටත් ප්‍රඥව බලයට පමුණුවා ගතයුතුයි, ඉන්නිසා පඤ්චස්කන්ධයේ විස්තර විභාග දූනගැණීම දියුණු කිරීම ප්‍රඥව සිටුවා ගැණීමට ආධාරවන බැවින් එය බිම හා සමානයයි ප්‍රකාශ කරණලදී.

තවද ආයතන ධාතු පිළිබඳව දූනගැණීම සකන්ධ දූනගැණීම හා සමානය හෙවත් ප්‍රඥවගේ බිම දූනගැණීම හා සමානය, හෙද සවල්පයක් විස්තර කරමු.

"ආයතනානීති මාදසායතනානි" ආයතන දොළසකි-චක්ඛායතනය, රූපායතනය, සෝතායතනය, සද්දායතනය, ඝාණායතනය, ගන්ධායතනය, ජිව්හායතනය, රසායතනය, කායායතනය, ඵොට්ඨබ්බායතනය, මනායතනය, ධම්මායතනය යන දොළසයි. ප්‍රඥව දියුණුකරගන්ට සතුටු පින්වතුන් මේ වචනවල අදහස් හොඳින් තේරුන්ගතයුතුයි.

මෙහි චක්ඛායතන කීතැන චක්ඛු- ආයතන මේ විධියට මේ දෙලොස් වචනයන්ම දෙකට කඩාගත්ත එතකොට ආයතන යන සියල්ලම පසුව තේරුම් කරගතහැක. මුල් වචන තේරුම්කරමු. චක්ඛු, මෙහි තේරුම පෙන්වාදෙන නිසා චක්ඛු නම් වේ; මොන වාද- රූප, රූප පෙන්වාදී එකී රසය එහි හැඩහුරුකම් ආදී විසන රය පෙන්වාදෙන නිසා චක්ඛු කියත්. ඊලගට රූප, එකී තේරුම- නානාප්‍රකාර පාටින් නානාප්‍රකාර හැඩහුරුකමින් සිතට එල්ලකර හෘදයඞ්ගමකර ප්‍රකාශකරදෙන බැවින් රූපයයි. අස්වන නිසා සොතය කියත්, හඬදක්වන නිසා ශබ්දයි, ඇදගෙන විදීනුයි, ඝානයි, (නාසය) ඇදගන්නා ගඳ සුවඳ ගන්ධයයි, තම ස්වභාවය ඉසෙදත්නුයි ගන්ධ නම්දවේ, ජීවිතය ගෙනදෙන නිසා දිව කියයි සත්වයා විඳගනිත්. සත්වයා එඩත් යන අර්ථයෙන් රස නම්වේ. "ආයෝති උප්පත්තිදෙසො" ආය කියන්නේ උපදින ප්‍රදේශය ටයි. කු, කියන්නේ නින්දිත (ආශ්‍රව) කාමාදී කෙලෙශයන්ටයි. කු- ආය- දෙක එක්උනාම කාය- නැතිනම් කාය- එහි අදහස, නින්දිත පාපයන් උපදින තැන, කය- කය හොඳට තවාපොවා හැදුවාට අදහස මේ හැටියි. කය එබඳුම් නුසුදුසු නොමනා දෙය පහස ලබත්, එම පහසට ෆොට්ඨබ්බයයි කියත්, දැනගණීනුයි, මනස නම්වේ. තම තමාගේ ස්වභාවය දරානුයි ධර්ම නම් වේ.

"අවිශෙසසතො පන ආයතනතො, ආයානං තනනතො ආයතස්ස ච නයනතො ආයතනං" මෙපමණය කියා මිම්මක් නැතිව දිග්ගස්සන බැවින්ද, දිග්ගැසීම වැඩි වැඩිය කාරණ බැවින්ද, තව තවත් උපාය සොයමින් දිග්ගස්වන බැවින්ද ආයතන නම් වේ. ඇහැට රූපයද, කනට හඬද, නැහැයට ගඳ සුවඳද එල්ලකරමින් සිත්ද සිතිවිලිද නානා ආකාරයෙන් උපද්දවමින් ඒ ඒ ආකාරවල යෙදෙමින් හැටෙමින් ලගිත්ද, නැගෙත්ද, වදීත්ද, වැයම්කරත්ද, එනිසා ආයතනයයි කියත්. මෙසී ඇස රූප ආදී වැඩිවන දික්වන ධර්මයන් කෙරෙහි ඉතිරී පැතිරී පවතිත්නුයි හෝ ආයතන නම්වේ. මේ අගක් මුලක් නැති දුකින් පිරුණු සංසාරයෙහි මැරි මැරී ඉපදී ඉපදී අවසානයක් නොවී ඉතාම දිගුකලක් දිග්ගැහෙමින් දුක් ගැහැට විදීමට හේතුවෙත්නුයි හෝ ආයතන නම්වේ. මෙසේ සිය ලුම මේ ස්වභාවයන් දිග්ගස්සවන බැවින්ද කෙලශ ධර්මයන් පෝෂණය කාරණ වඩන හෙයින්ද, නිතර සසර මරව මරවා ඉපදවීමෙක් ගතකිරීමට උපාය ඇතිකරණ බැවින්ද ආයතනයයි කියනු ලැබේ මෙලෙසින් ආයතන යන පදයේ තේරුම් දැනගත යුතුයි.

තවද මෙම ආයතන ධර්ම දෙළොස 'නාවත්ව' වශයෙන් හෙවත් එම ස්වභාව වශයෙන්ද විසඳ බලා දැනගත යුතුයි. චක්ඛු, රූප,

සොත, ඝාන යනාදී මේ දොළොස් ආයතනයෝම ධම්මායතනනාමයි. එසේනම්– ධම්මායතනය පමණක් කියා නොසිට දොළොස් ආයතනයක් කීවේ මන්ද? ඊට කාරණය නම්– චක්ඛුවිඤ්ඤාණ, සොතවිඤ්ඤාණ, ඝානවිඤ්ඤාණ, ජිව්හාවිඤ්ඤාණ, කායවිඤ්ඤාණ, මනොවිඤ්ඤාණ යන සය ආකාර විඤ්ඤාණකාය උපදින දොරටු සය අරමුණු ගැණීම සිදුකරණ අයුරු වෙන් වෙන් වශයෙන් පෙන්වාදීම පිණිසයි. මෙහි මෙකී සයආකාර විඤ්ඤාණ කායයන්ගේ දොරටු බැවින්ද, අරමුණු ගැණීම වෙන් වෙන්ව කරණ බැවින්ද, මේ දොළොස් ආකාර භෙදය ප්‍රකාශකරණලදී. චක්ඛුවිඤ්ඤාණ වීථියට බැසගත් විඥනකායට චක්ෂුරායතනයම (ඇසම) උප්පත්තිවාරයයි සොතාදීන්වද එලෙසමයි. සවැනි දොරටුවවූ මනොවාරය පිළිබඳව "ජවනස්ස පන භවඞ්ගමන සංඛාතො මනායතනෙකදෙසොව උප්පත්තිවාරං" යනුවෙන් රූපාදී අරමුණක් නොගන්නාවිට ඉපදී මේදී ඇතිවූ මුල්සිතට මනොවාරයෙහි එක් පෙදෙසක්ම උත්පත්තිවාරයවන බැවින් ධම්මායතනය අන් ආයතනයන් සමඟ සාධාරණව නූපදීත්. මෙලෙසින් 'තාවතා' වශයෙන් දොළොස් ආයතනයන්ගේ විභාගය තේරුම් ගතයුතුයි.

මෙම දොළොස් ආයතන ක්‍රමවශයෙන්ද, සංඛිප විස්තර වශයෙන්ද ආදිවශයෙන් නොයෙක් ක්‍රමයෙන් තේරුන්කර දියයුතුයි එනමුදු කාලය නොමැති බැවින් ආයතන කථාව නවතමු. අපි රූපයක් බලනවිට, ශබ්දයක් අහනවිට, ගඳ සුවඳ දනගන්නාවිට, රශ විඳිනවිට, කයට සැප පහස ගන්නවිට, සිතට තේරුන්ගන්නවිට කෙසේ නම් සිඞවේදැයි සැලකිය යුතුයි. ඇස නිසාත් රූපය නිසාත් චක්ඛුවිඤ්ඤානය උපදිත්. ඒ ඇසත් රූපයත් විඥනයත් යන තුන එකට හැපීමෙන් එල්ලවීමෙන් රූපය දකියි, ඇසින්ම පමණක් රූප දකින්ට නොහැකියි, සබ්දාදියද එලෙසයි. මෙකී තුන්ආකාරය එක්වී හැපී ස්ඵර්ශය හටගණී, එම ස්ඵර්ශයෙන් වේදනාව හටගණී, එම වේදනාව නිසා තණ්හාව හටගණී, තණ්හාව නිසා දැඩිකොට ගැණීම වෙයි. එම වැරදි ගැණීම නිසා භවය ඇතීවෙයි, භවය ලැබුනාම උපදී, ඉපදීම නිසා දිරීම මරණය සොකය විලාපය දුක දොම්නස දැඩිසුසුම්ලෑම හටගණී. මෙලෙසින් දොළොස් ආයතනයන්ගේ හැපීමෙන් දුක් රැස්කොට භවදුක ඇතිකර දිග්ගස්වන බැවින් චක්ෂුරාදීන්ට ආයතන යන නාමය ව්‍යවහාරවෙත්.

ආයතනයන්ට අනතුරුව 'ධාතු' පිළිබඳව විස්තර සවල්පයක් කියමු. ධාතු යන වචනය (18) දහඅටකට කොටස්කර තිබේ. එනම් "චක්ඛුධාතු, රූපධාතු, චක්ඛුවිඤ්ඤාණධාතු, සොතධාතු, සද්දධාතු, සොතවිඤ්ඤාණධාතු, ඝානධාතු, ගන්ධධාතු, ඝානවිඤ්ඤා

ණධාතු, ජිව්හාධාතු, රසධාතු, ජිව්හාවිඤ්ඤාණධාතු, කායධාතු, ඵොට්ඨබ්බධාතු, කායවිඤ්ඤාණධාතු, මනොධාතු, ධම්මධාතු, මනොවිඤ්ඤාණධාතු" යනුවෙනි. මෙහි එකබු සොතාදී නාමයන්ගේ විස්තරය මුලින්කී ආකාර දතයුතුයි. මෙහි ධාතුයන වචනය හොඳින් තේරුම් ගතයුතුයි.

ඇස් කන් නාසාදී එක එක සවභාවයන් හටගත් පරිදි නානාකාරයෙන් වෙන්කොට විදහා පෙන්වන බැවින්ද ඒ ඒ සවභාවයන් දරණ හෙයින්ද ධාතු නම් වේ.

ලෝකයෙහි සිරියල් මනොසිල ආදී විසිතුරු ගල්ආදිය ධාතු යයි කියනු ලැබේ. ඒ වගේම මේ රූපාදියද විසිතුරු බැවින් ධාතු වැනි නුසි ධාතු නම් වේ.

සිරියල් මනොසිලාදිය නානාප්‍රකාර වර්ණ සටහන් වලින් යුක්තද, එනිසා ඊට ධාතුයන වචනය ව්‍යවහාර කරත්. එසේම රූපාදියද නානාප්‍රකාර වර්ණසටහන් වලින් යුක්තවෙත්. එබැවින් ඊට ධාතු යන නම ව්‍යවහාර කරනු ලැබෙත්. මෙලෙසින් ධාතුයන වචනයෙහි නානාප්‍රකාර අදහස් ඇති බව සලකාගත යුතුයි, මෙහිදී ධාතු වශයෙන් කොටස් දහඅටක් කී නමුත් ආභාධාතු සුභාධාතු ආකාසානඤ්චායතන ධාතු -පෙ- ආදි වශයෙන් නොයෙකුත් ධාතු විද්‍යමානවෙත්. එසේඇතිවූයේ නමුදු ඒසියලුම ධාතුසංඛ්‍යාව මෙම රූපධාතු ආදී දහඅට කොටසට ඇතුලත්කොට දෙශනාකර තිබේ. එනිසා මෙම දහඅට ක්‍රමය ප්‍රධාන වශයෙන් ප්‍රකාශකොට තිබේ. මෙහි විස්තරාදියද මෙතෙකින් නවතමු.

මීලඟට ඉන්ද්‍රිය පිළිබඳව යමක් කියයුතුව තිබේ. හෙද විස්තර හෙයින්ද මෙහි දේශනා පසකම ඒ පිළිබඳ විස්තර ඇති හෙයින්ද නොවෙහෙසෙමු.

අනතුරුව කිවයුතුව තිබෙන්නේ සත්‍යය ගැනයි. සත්‍ය සතරකි, දුක්ඛ- සමුදය- නිරොධ- මග්ග- යන සතරයි. මෙම සත්‍ය සතර විස්තර කිරීම ඉතාම දිගු වැඩකි, එය ක්‍රමයෙන් විසඳ දෙත් නම් විභාග, නිර්වචන, ලක්ෂණ ආදී වශයෙන් නොයෙක් ක්‍රමයෙන් පිළිවෙලින් කිවයුතුව තිබේ. නුවන මෝරවා ගැණීමට මෙම සත්‍ය සතර බිම හා සමාන බැව් සැලකිය යුතුයි. දුක්ඛ සත්‍යයයි කියනු ලබන්නේ උත්පත්තිය, දිරීම, ලෙඩ, මරණ ආදී දුක්වලටයි. සමුදය සත්‍යය නම් කාම භව විභව යන ත්‍රිවිධාකාර තෘෂ්ණාවයි, නිරොධ සත්‍යය නම් දුක්වැනසීමෙන් ලබන නිවනයි. මාර්ගසත්‍යයයි කියන්නේ සම්‍යක්දෘෂ්ටි ආදී මාර්ග අටටයි, මෙහි විස්තරද බොහෝයි.

මීලඟට ප්‍රඥාවට භූමිවූ පටිච්චසමුප්පාද ධර්මයද සැකෙවින් සිහිකටයුතුයි, මෙහි පටිච්චසමුප්පාද නම් අවිජ්ජාදී ධර්මයි, අවිජ්ජා

(නොදැන්ම) සංකාර, විඤ්ඤාණ, නාමරූප යනාදී ධර්ම පළමු අවිද්‍යාව නිසා දෙවෙනි සංස්කාරද එනිසා තුන්වැනි විඤ්ඤාණයද යනාදී වශයෙන් එකක් නිසා එකක් උපදින බැවින් පටිච්ච සමුප්පාදයයි කියනු ලැබේ. මෙසේ මෝහනම නිසා සංස්කාරත්, සංස්කාර නිසා විඥානයත්, විඥානය නිසා නාමරූපත් උපදින බැව් නුවණින් දැන ගතයුතු බැවින් දැකගතයුතු බැවින් ඒ පටිච්චසමුප්පාද ධර්මයන් දැනගැණීම නුවණ වඩාගැණීමට භූමිය පිහිටා සිටුවා ගතයුතු ස්ථානය සාධාගත්තා නම්වේ. මෙහි ආදි ශබ්දයෙන් පටිච්චසමුප්පන්න ධර්ම ප්‍රකාශ වෙත්. බුදුරජානෝ මෙසේ එය දෙශනාකාරණලදී. “ජරා මරණං භික්ඛවෙ අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛය ධම්මං වයධම්මං විරාගධම්මං නිරොධ ධම්මං” මහණෙනි ජරාමරණා දිය අනිත්‍යයයි, යම්හේතුවකින් හටගත් එකකි, එනිසා උපන් එකකි, ක්‍ෂයවන සවාව ඇත්තකි, විනාශවන්නකි, නොඇලිය යුත්තකි, නිරුද්ධවන ධර්මයකි, එසේම ජාති ආදියද සලකාගත යුතුයි, මෙලෙසින් ප්‍රකාශවනුයේ පටිච්චසමුප්පන්න ධර්මයි, කෙටි වශයෙන් මෙසේ සලකාගත යුතුයි.

මෙලෙසින් ස්කන්ධ, ආයතන, ධාතු, ඉන්ද්‍රිය, සච්ච, පටිච්චසමුප්පාද ආදි ශබ්දයෙන් පටිච්චසමුප්පන්න යනාදී ධර්මයන් ප්‍රඥාවට භූමි වන බැව් සලකාගත යුතුයි.

මීලඟට ප්‍රඥාවට මුල්වූ ධර්මවන සීලවිසුද්ධි චිත්තවිසුද්ධි දෙක පිළිබඳව ඉතාම කෙටි විස්තරයක් කියමු. “සීලවිසුද්ධි නාම සුපරිසුද්ධං පාතිමොක්ඛසංවරාදි චතුබ්බිධං සීලං” මෙහි සීලවිසුද්ධිය නම් ඉතාම පිරිසිදු අන්දමින් ආරක්‍ෂාකර ගන්නාලද ප්‍රාතිමොක්‍ෂසංවර සීලය, ඉන්ද්‍රියසංවර සීලය, ආජීවපාරිසුද්ධි සීලය, ප්‍රත්‍යයසංනිශ්‍රිත සීලය යන සතරාකාර සීලයයි. මෙහි සතරාකාර සීලයන් අතුරෙන් ප්‍රාතිමොක්‍ෂසංවර සීලය නම් කුමක්ද? “පාතිමොක්ඛන්ති සික්ඛාපද සීලං” ප්‍රාතිමොක්‍ෂයයි කියන්නේ ශික්‍ෂාපද අනුව හික්මීමයි. (නැති නම්) පොරොන්දු අනුව වාසය කිරීමයි. අපාය භය ආදියට හේතුවූ අනාචාර ගති සිරිත් පාලනය කරයිද ආරක්‍ෂාකර ගණීද ඒ නරක ගතිවලින් මිදේද එනිසා එම ආරක්‍ෂාවීම් ආදියට ප්‍රාතිමොක්‍ෂයයි කියනු ලැබේ. සංවරයයි කියන්නේ කාය වචනය දෙක හික්මවා ගැණීමටයි, වචනදෙක එක්කළුවිට අපායාදී දුක් නැතිකර ගැණීමට දේශනාකළ ශික්‍ෂාපද කාය වචන යන දෙකින් ඉක්මවන්නේ නැතිව හොඳින් පිරිසිදුව ආරක්‍ෂාකර ගැණීමයි.

ඉන්ද්‍රියසංවර සීලය නම්– ඇස, කන, නාසය, දිව, ශරීරය, සිත යන දොරටු සය හික්මවා ගැණීමයි. ඇසට රූපයක් දුටුවිට එම රූපයේ ලක්‍ෂණය හිතට නොගනී නම් එම රූපයේ හැඩහුරුකම්

එක එක අවයව ලමෝස්තර හිතට නොගනී නම් එම රූපයෙම් වනදෙය විනාශවීයෑමයයි සිතවගණී නම් එය අනිත්‍යය, දුකය, අනාත්මයයි මෙනෙහි කරත් නම් එය රූප ඉන්ද්‍රිය පිළිබඳව සංවර සීලයයි. ශබ්ද ගන්ධාදියද, කනට ඇසට එල්ලවූවිට එලෙසම සිතත් නම් එසේ සිතා සංවර වෙත් නම් එය ඉන්ද්‍රිය සංවර සීලයයි.

ආජීව පාරිශුද්ධි සීලය නම් පිරිසිදු යහපත් ජීවිකාවයි, එය සය ආකාර ශික්ෂාපදයි, ජීවිකාව රැකගැණීමට අදහස්කොට පාපයට කැමතිව එහියෙදී නැතිගුණ බොරුවෙන් අඟවා රවමුලාකර තමා උසස් හැටියට පෙන්වා උත්තරි මනුෂ්‍ය ධර්මය ඇතැයි යන හැඟීම ලොවපුරා පතුරවයිද එලෙස විෂම කපටිකම් කිරීමෙන් පැමිණෙන පාරාජිකා ආපත්තිය පළමුවැන්නයි. ජීවිකාව නිසා ගිහියන්ගේ වැඩ පනිවිඩ ආදියෙහි යෙදෙත්ද එහිදී පැමිණෙන සංඝාදිශෙෂ ආපත්තිය දෙවැන්නයි. ජීවිකාව කරගැණීමට ඒ ඒ අය සතුටු භික්ෂූන්ගේ ගුණකියා ඉන්නාබවකියා දායකයින් සතුටුකර ගැණීම් ආදිය කරත්ද, එහිදී පැමිණෙන ථුල්ලසි නම් ආපත්තිය තුන්වැන්නයි. ජීවිකාව කරගැනීමට සිතා ලෙඩක් දුකක් නැතිව රසවත් ප්‍රණීත ආහාර කියා ගෙන්වාගෙන කාබී සැපෙන් වසත්ද එහිදී පැමිණෙන පචිති නම් ඇවත සිව්වැන්නයි. එලෙස භික්ෂුණියක් අගිලන්ව තමන් සඳහා යම්කිසි ප්‍රණීත භොජනාදියක් ගෙන්වා වළඳත් නම් එහිදී පැමිණෙන පාටිදෙශනීය ඇවැත පස්වැන්නයි. එලෙසම නොගිලන්ව වතුර වැජන් ආදිය ගෙන්වාගෙන වළඳත් නම් එහිදී දුෂ්කාවාපත්ති ඇවතට පැමිණෙයි, එය සවැන්නයි, මෙකී සය ආකාර ශික්ෂාපද රැකගැණීම ආරක්ෂාකොට පිරිසිදුව ජීවිකාව ගෙනයෑම ආජීවපාරිසුද්ධි සීලයයි.

ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලය නම්–සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන් පස යන සතර පසය පිළිබඳව එය පාවිච්චිකරණ වේලාවලදී සිහියෙන් යුක්තව සිහි එලවා මෙම සිව්පසය පිළිගන්නේ ශරීරකලාන්තය දුරලීමටය, මදවැඩීමට නොවේය යනාදී වශයෙන් සිහිකරමින් වැසීම ප්‍රත්‍යයසන්නිශ්‍රිත ශීලයයි. බොහෝ ප්‍රභෙද ඇති බොහෝ විස්තර ඇති මේ සතරසංවර ශීලයද දන උගෙන වැඩීම ප්‍රඥාවගේ මූල දනගැණීමයි, නැතිනම් ප්‍රඥාව මුල්බැස්වා ගැණීමයි, මූල හොඳට පොෂණය වීම කඳවැඩීමට හේතුයි, හොඳින් කද වැඩීමෙන් ඵල නොවරදිනවා ඇත, එනිසා ප්‍රඥාවට මුල්වූ ශීලය පිරිසිදුව දන වඩාගත යුතුයි.

චිත්තවිසුද්ධිනාම සඋපචාරා අට්ඨසමාපත්තියො" ප්‍රශ්නාවට මුල්වූ දෙවැනි කාරණය නම් චිත්තවිසුද්ධියයි, උපචාර සමාධි සහිත අටආකාර සමාපත්තියි. එනම්- ප්‍රථමධ්‍යානය, ද්විතීයධ්‍යානය, තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානය, ආකාසානඤ්චායතනය, විඤ්ඤණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය යන අට හා උපචාර සමාධිය යන නවයට චිත්තවිසුද්ධියයි කියනු ලැබේ. කුසල් සිතේ එකමුතුබව අවුල් නැතිබව නොවිසිර පවත්නාබව සමාධියයි, එම සමාධිය චිත්තවිසුද්ධියයි. එම චිත්ත විසුද්ධි සංඛ්‍යාත සමාධියගේ ලක්ෂණය අවුල් ස්වභාවයෙන් මිදී නිරවුල්ව සංසුන්ව පැවතීමයි. එහි රසය (කෘත්‍යය) විපිළිසර භාවයන් නැතිකරණබවයි, වැටහෙන කරුණනම් කම්පා නොවන නොසෙල්වෙන ස්වභාවයි, ආසන්න කාරණය නම්- සැපයයි, සැපයට පැමිණියහුගේ සිත සමාධිගතවෙයි යනුකීහෙයින් මෙකී ලක්ෂණාදී සතරින් පෙන්වන සමාධිය දසආකාරයි. මෙහි මුලින් කී එම දසාකාර අර්පනාවන්ගේ පූර්වභාග සිත්වල එකඟබව එකමුතුබව උපචාර සමාධියයි, අවශේෂ කාමස්ථානයන් පිළිබඳ සිතේ එකඟබව අර්පනා සමාධියයි, මෙසේ අර්පනා උපචාර යන දෙආකාරයෙන් සමාධිය වඩන ලද්දේ නම් වඩාගත්තා නම්වේ. සිත පිරිසිදුකලා නම් වේ.

වැඩියයුතු ක්‍රම සවිස්තරව විසුද්ධිමාර්ගයෙහි දක්වාතිබේ. මෙසේ ලියන කුඩා ලිපියකින් එය විස්තරකරදීම අපහසු කරුණකි.

මෙහි ආනිසංස සලකනවිට කෙටියෙන් මෙසේ සිතන්න, ආනිසංස ඉහාත්මයෙහි සැපසේ විසීම් ආදි වශයෙන් පස්ආකාර වෙත්. ඒ මෙසේයි- රහතන් වහන්සේලා එකඟසිතින් සැපසේ දවසක් වසම්යි සමාධිය වඩාද උන්වහන්සේලාගේ අර්පනා සමාධි භාවනාව නම්වූ එය ඉහාත්මයෙහි සැපසේ විසීමයි. මෙසේ සමාධියෙන් කල්යැවීම කෙලෙස් තුනීකිරීම නොවේ. ඉහාත්මභාවයෙහිම සැපවිඳීමයයි දතයුතුයි. සෙඛ- ප්‍රථග්ජනයෝ සමවතින් නැගිට සංසුන් සිතින් වෙසමින් දකිම්යි වඩන්නහුගේ සමාධිය විදර්ශනාවම් ආසන්න හෙයින් අර්පනා සමාධි භාවනාවද ඉතා අමාරුවෙන් අධිගමයට අවකාශ ලබාගැණීමයයි කියන උපචාර සමාධි භාවනාවද, විදර්ශනානිසංසයයි. ඒබව- මහණෙනි සමාධිය වඩව්, සමාහිතවූ භික්ෂුවට සියලුදේ තත්වාකාරයෙන් වැටහේයයි වදාලසේක.

(යමෙක්) අටසමවත් උපදවා අභිඥාපාදක ධ්‍යානයට පැමිණ සමවතින් නැගිට එකෙක්වී බහුක්වීද, බහුක්වී එකෙක්වද ආදිවශයෙන් දක්සයුතුයයි අභිඥා උපදවා ගණීද එම අර්පනා සමාධි භාවනාව අභිඥානිසංසයයි.

යමෙක් සමාධිභාවනාව පුරුදු කරණුයේ අධිගමයක් නොලැබුවත් ධ්‍යානය නොපිරිහුනී නම් බ්‍රහ්මලෝක උත්පත්තිය ලබන හැකියි සිතා සමාධිය වඩත් නම් පෘථග්ජන භූමියෙන් නොමිදුන ඔහු නොපිරිහුන ධ්‍යාන ඇත්තේ බඹලොව උපදනා බැවින් එය භව විශෙෂානිසංසයි. උපචාර සමාධි භාවනාවද කාමාවචර සුගති භව ලබාදෙත්. යම්හෙයකින් අටසමවත් උපදවාගත් ආර්‍යයින් වහන්සේලා නිරොධ සමාපත්තියට සමවැද සිත්පිත් නැති දර කඩක්සේ සත්දිනක් විවේක සැපවිඳ සමාධිය වඩත්ද ඔවුන්ගේ අපිනා සමාධි භාවනාව නිරොධානිසංසයයි, මෙලෙසින් ශුභාත්ම යෙහිම සමාධිභාවනාවේගේ ආනිසංස පසක් ලැබේ. එනිසා කෙලෙස් මලකඩ සෝදාහැරීමට නොයෙකුත් ආනිසංස නමැති ජලය ගලාඑන සමාධි භාවනාව වැඩීමට නුවනැත්තෝ ප්‍රමාද නොවෙත් වා, මෙසේ චිත්තවිසුද්ධිය පිළිබඳ ආනිසංසද උගෙන වැඩීමට නැති නම සිත පිරිසිදුකර ගැණීම නමැති ප්‍රඥාවගේ මූල සකස්කර ගැණීමට උත්සාහවත්විය යුතුයි.

මීලඟට අපි තේරුන්කරදෙන්ට යන්නේ ප්‍රඥාවගේ ශරීරය සාධාගන්නා ආකාරයයි. එය දිට්ඨිවිසුද්ධි ආදී විසුද්ධිපස අවබෝධකර ගත්විට ප්‍රඥාවගේ ශරීරය නම මෙයයි තේරුන්ගත්තා නම්වේ. එම පස්ආකාර විසුද්ධියද නාම මාත්‍රයෙන් පමණක් මෙහිලා දක්වමු.

තත්ථ නාමරූපානං යථාව දස්සනං දිට්ඨිවිසුද්ධි නාම– මෙහිදී දෘෂ්ටි විසුද්ධියයි කියන්නේ නාමරූපයන්ගේ නියම විධිය නාමරූප දෙක පිළිබඳ නියම දැකීමයි. ඒ මෙලෙසයි– නෙවසඤ්ඤා නාසඤ්ඤායතන හැර සෙසු සියලු රූපාවචර අරූපාවචර ලොකෙදක්හි යම්තාක් අරමුනු ගැණීම් ඇද්ද, එමඅරමුණු ගැනීමේදී ඊට නැමෙන හෙයින් නාම නම්වේ. ඊට උපමාවක්– තම ගෙට වන් සජියෙක් දුටු ගෙහිමියා එම සජියා පන්නායන අතර සුඹසකට වදීද, එදුටු මිනිසා සජියා සුඹසට වනැයි දැනගණී, එලෙසම රූපාවචර අරූපාවචර ලොක නමැති ගෙට්වන් නාම නමැති සජියා උපන් සත්වයා විසින් පන්නාගෙන යන්නේ සිත් නමැති ගුහාවට ඇස්, කන්, නාස් ආදී සිදුරුවලින් වැදුනකල්හි දැනගණී, එලෙස සැමදෙයක් කෙරෙහිම නැමී නැමී පැමිණ අදහස අවබොධ කරදෙන හෙයින් නාම නම වේ. අදහස අනුව නැමෙන සියල්ල නාමයයි. රූපය නම් කුමක්ද? නාමය තේරුන් ගැණීමේ ශක්තිය තිබෙන්නේ හෘදය වස්තුවෙයි. හෘදයවස්තුව ඇතිවන්නේ සතරමහා භූතයන් ගෙනුයි, එම මහාභූත සතර උපාදාය රූප සකස්කරයි, රූප උප දින්නේ මෙසේයි, රූප යන වචනයේ තේරුම නිතර වැනසෙන

සුළුය, නිතර වෙනස්වෙන සුළුය යනුයි. මෙසේ නැමෙන නිසා නාමයත්, වැනසෙන නිසා රූපයත්, වන බව තේරුම් ගන්න. මෙකියන නාමරූප දෙක අතිසම්ර බැව් සලකා මූලානොවී නියම පිරිසිදු දැකීමෙන් යුක්තවෙත් නම් එය දෘෂ්ටි විසුද්ධියයි.

කාංක්ෂාවිතරණ විසුද්ධිය දෙවැන්නයි– "නාමරූපස්ස පච්චය පරිග්ගහණෙන තීසු අද්ධාසු කඞ්ඛාවිතරිත්වා ඨිතං ඤාණං කඞ්ඛාවිතරණ විසුද්ධි නාම" අතීත, අනාගත, වර්තමාන යන තුන්කාලයෙහි හෙතුප්‍රත්‍යය දෙකින් හටගන්නා නාමරූප දෙක පිළිබඳව පසළොස් ආකාරයකින් උපදිනසැකය, නුවණින් මැනබලා එම සැකය දුරලා ගැණීම කාංක්ෂාවිතරණ විසුද්ධියයි, රෝගය සොයාගත් වෙද මහතා ඊට නිසිබෙහෙත සකස්කරන්නාසේද, පාරක් අද්දර වැටී සිටි ළදරුවෙක් දුටු මිනිසෙක් මොහුගේ මව්පියෝ කවුදැයි සොයන්නාසේද, නාම රූප දෙකේ උපත හා විපත සොයා ඊට නිසි ප්‍රතිකාර වහා කොට එහි සැක දුරලා චිත්තවිසුද්ධිය ඇතිකර ගතයුතුයි. නාමය හා රූපය මැවූ කෙනෙක් නැත, ඊට දෙවියෙක් නැත, ඒ දෙකට දෙවියා ඒ දෙකමය, මේ දෙක හටගන්නේ හෙතුප්‍රත්‍යය බලයෙන් මය, මේ දෙක උපුල් පියුම් හෙල්මැලි ආදී මල්වලින් හටගන්නවා නොවේ, මුතු මැණික් ආකර වලින් හටගන්නවාත් නොවේ, මේ දෙක හටගන්නේ මවුකුස අමු ආහාර බොක්කටත් පැසුනු ආහාර (අසුචි) බොක්කටත් අතර බඩවැල් වලින් වෙළුන ඉතාමත් අපිරිසිදු ඉතාම දුගඳ විහිදෙන කැතමකැත කැනක කැතම් කැත සතෙක් අසුචියක පැසෙන පණුවෙක්මෙන් උපදිත්. ඒ උපදින්නේ අවිද්‍යා, තෘෂ්ණා, උපාදාන, කර්ම යන හේතු සතරින් හා ආහාර නමැති ප්‍රත්‍යයේ උපකාරයෙනි. එම හැදෙන සිරුරට අවිද්‍යා, තෘෂ්ණා, උපාදාන යන තුන මව් වැනිය, කර්මය– පියා වැනිය, ආහාරය– කිරි මව් වැනියයි මෙලෙස රූපකාය දැනගණිද, ඇසත් රූපයත් නිසා චක්ෂුර්විඥාණය උපදින්යයිද එම තුන එකට හැපීමෙන් වෙදනාව හටගනිද –පෙ– ආදී වශයෙන් පෙන්වාදී තිබෙන ආකාර නාමකායද, හෙතු ප්‍රත්‍යය දෙකින් සිදුවන බව දැනගණිද, එලෙසම ඒ නාම රූප දෙක පිළිබඳව කාලත්‍රය ගැණ සිතා පසළොස් තැනක ඇතිවන සැක දුරලා සිත පිරිසිදුකර ගණිනම් එය කාංක්ෂාවිතරණ විසුද්ධියයි,

මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධිය තුන්වැන්නයි–අයං මග්ගො අයං නමග්ගොති එවං මග්ගං ච අමග්ගං ච ඤත්වා ඨිතං ඤාණං –පෙ– ඤාතපරිඤ්ඤා තීරණපරිඤ්ඤා පහානපරිඤ්ඤා යන තුන්

ආකාර ප්‍රඥාවගේ වශයෙන් මේ මගය මේ නොමගයයි මග නොමග දැන සිටි ඤාණය මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධියයි, මෙහිදු විස්තර බොහෝයි.

පටිපදා ඤාණදස්සන විසුද්ධිය සිව්වැන්නයි. උදයබ්බයානුපස්සනා ඤාණං- භඞ්ගානුපස්සනා ඤාණං- භයතූපට්ඨාන ඤාණං- ආදීනවානුපස්සනා ඤාණං- නිබ්බිදානුපස්සනා ඤාණං- මුඤ්චිතුකම්‍යතා ඤාණං- පටිසඞ්ඛානුපස්සනා ඤාණං- සංඛාරුපෙක්ඛා ඤාණං- සච්චානුලෝමික ඤාණන්ති- නවවිධං- මෙහි විස්තර පැවසීමට නොවෙහෙසෙමු.

ඤාණදස්සන විසුද්ධිය පස්වැන්නයි. සෝවාන්මාර්ගය, සකෘදාගාමී මාර්ගය, අනාගාමි මාර්ගය, අර්හත් මාර්ගය යන මේ සතර මාර්ගයන් පිළිබඳ දැනගැනීම ඤාණදස්සන විසුද්ධියයි.

මෙලෙසින් ඉතාම සැකෙවින් දක්වූ ප්‍රඥාවගේ භූමියද, මූලද, ශරීරයද අවබෝධකොට ගෙණ මෙලෙසින් සවිස්තර විසිතුරු ප්‍රඥා බලය මෙලොවදී ස්වල්ප වශයෙන් දියුණුකරගන්වත් ආත්මයෙන් ආත්මය එය දියුණුවන අයුරු කුශලයන්හි යෙදෙන්වත් අවසාන අත්බැව්හිදී මෙම ප්‍රඥාවගේ බලය තමනුදු අවබෝධකොට ගෙන ඉන් ලෝසතනවද වැඩසලසා සියලු කෙලෙසුන් උපුටා පරිසුද්ධ භාවයට පැමිණ නිවන්සැප සාධාගන්නාපලස මෛත්‍රී පෙරටුව සිහිපත් කරවමු.

සාධු! සාධු!! සාධු!!!

# දැන්වීමයි.

---

වර්ෂයක් පාසා සිරි අරියවංස ගුණානුස්මරණ සමිතිය මගින් සකස්කරවා පළකරවනු ලබන ආර්යවංශ ධර්මපුස්තක මාලාවේ අංක 1, 2, 3, දරණ සප්තබොධ්‍යඞ්ගය, බාරස ධර්මය, ඉන්ද්‍රිය බල ධර්ම යන පොත් ඕනෑ පින්වතුන් අප වෙත වහා දන්වන්න.

බොධිපාක්ෂික ධර්ම සතිස ඉතා පහසුවෙන් අවබොධකර ගැණීමට මෙබඳු පොත් පෙළක් තවත් නොමැතිසි. දානමානාදි යෙහිදී පිදීමට ඉතාම යොග්‍යයි. ඔබ නිතර භාවිතා කරන්නෙහි නම් එලෙසම දූපුත්‍රාදීන් ලවා කියවන්නෙහි නම් ස්වල්ප කලකදී වටිනා ධර්මාවබොධයක් ඇතිවේ.

**එක පොතක මිල රු: 2-50 යි**

**තැපැල් ගාස්තුවක් නොමැතිසි.**

සමිතියට බැඳී නොවැම්බර් මාසයේදී පමණක් සාමාජික මුදල වන රු. 2-50 ගෙවීමෙන් වර්ෂයක් පාසා පොත් සහ සාමාජික පින්වතුන්ගේ නම් ගම් ඇතුලත් කොට පළකරණ සිරි අරියවංස ලිත් ද ජනවාරි මාසයේදී ඔබ අතට ලැබේ.

එකවර රු: 7-50 ක් ගෙවීමෙන් දැනට පළවී තිබෙන පොත් තුන සහ 1951 දී පළකරණ "අරි අටඟි මග" යන පොතද ලිත් ද එවනු ලැබේ.

**පූජ්‍ය කටයුතුවලදී පූජා සඳහාද**
**පොත් වෙළඳුන්ටද මිල පහසුයි.**

මුදල් සමග මෙසේ ඉල්ලන්න.

ඩී. ඒ. කුලතිලක,
සිරි සුධර්මාරාමය- මොරටුමුල්ල.

# අෂ්ටාර්ය මාර්ගය.

——: (ඍ) :——

## ආර්යවංශ ධර්ම පුස්තක මාලා

අංක 4.

මොරටුමුල්ලේ සිරි සුධර්මාරාමාධිපති

මොරටුවේ සිරි සාසනවංස

මහා ස්ථවිර ස්වාමි පාදයන් වහන්සේ

——: විසින් :——

සම්පාදිතයි.

---

සිරි අරියවංස ගුණානුස්මරණ සභාව

——: විසින් :——

පිළියන්දල
ශ්‍රී ලංකා මුද්‍රණාලයෙහි මුද්‍රාපිතයි.

---

ශ්‍රී බු: ව: 2495
ක්‍රි: ව: 1951

මිල රු: 2. 50 ශ.

# හැඳින්වීම.

ආර්යවංශ ධර්ම පුස්තක මාලාවේ අංක 4 දරණ අවශාන කොටස "අෂ්ටාර්ය මාර්ගය" නමින් හැඳින්වේ. බොධිපාක්ෂික ධර්ම සතිසෙහි අවසාන අට ආර්ය මාර්ග අටයි. බොධිපාක්ෂික ධර්ම මිනිස් තත්වයේ උසස්ම තැනට පාතැබීමට අවශ්‍ය උපාය ධර්ම සමුදායයි. මිනිසා උසස් කෙනෙකි. එසේම වඩ වඩාත් උසස් වීමට නිතර ප්‍රිය කරන්නෙකි. අපෙක්ෂිත ඔවුනගේ උසස්ම තැන ගැණීමට අවශ්‍ය ක්‍රම (ධර්ම) සතිස් සමුදායට බොධිපාක්ෂික ධර්මයයි පැවසේ.

එම සතිස් ධර්මය සිව් කොටසක්කොට දෙශනා ක්‍රමයෙන් පොත් කරවා ප්‍රකාශයට පැමිණ වීමට අපගේ අවවාද පරිදි ප්‍රොත්සාහීවූ සිරි අරියවංස ගුණානුස්මරණ මහා සභාව දැඩි උත්සාහයකින් එය එලෙසම වර්ෂයක් පාසා නොකඩවා කරලීමෙන් බෞද්ධ ලෝකයාගේ ගෞරවයට පාත්‍රවිය. එය සමිතියට බැඳී සවකීය යුතුකම් කොටස ඉටුකළ නා නා පළාත්වල නා නා ගම්වල සැදූහැතියනට ආඩම්බරයකි. අනල්ප කුශලයකි. ඉන් අත්බවක් පාසා ඤාණාලොකය උසස් අඳමින් ලැබෙන බැව් සැලකිය යුතුයි.

බොධිපාක්ෂික ධර්මයන් දෙස පැතැසින් බලන්නෙකුට බුද්ධත්වයේ විශාරදත්වය මොනවට වැටහේ. කිසිද ශාස්තෘවරයෙකුට විශය නොවන මෙම ධර්ම සතිස බුදු මුවකින්ම පිටවනතුරු සකල ලොකයටම සැම ශාස්තෘවරයනටම ගුප්ත සවර්ණාකාරයකි. මරණය නමැති පරම දුක වනසා අමරණීය අමරපුර වැදීමට ඔවා දුන් එකම ශාස්තෘන් වහන්සේ අඞ්ගිරශ ශාක්‍යමුනීන්ද්‍ර සර්වඥයන් වහන්සේම පමණයි. අමරණීය ස්ථානය (නිවන) නොම දුටු දෙශකයන්ගේ අනුශාසනයන් පරදින සුලු තර්කයට නොවැටෙන නිපුනත්වයෙන් බැහැර අබල දුබල ප්‍රහේලිකා මාලාවකි. සංසාර ගත අවසින්හි රැස්කර ගත් යම් යම් අඩු පාඩු දුප්පත් කර්ම ශක්තීන්ගේ බලයෙන් අධිපතීත්වය ලත් අත්බවක ලොකය මැද ශාස්තෘවරයන් ලෙස යම්කිසි කාල සීමාවක් දීප්තිමත් වූවත් නියම ශාස්තෘත්වයක් නම් ඔවුනට නැත. ඒ ඒ සමයන්හි සමාජයට සරිලන කියුම් කෙරුම්වලින් යම් ඒ නිවට පිරිවැජ්ජෝ ලොක සම්මානයට උරුමක්කාරයෝ වූවද බුදුවරයෙකුසේ වෛසාරිත්වයක් ලබා තම නිදහස් අදහස් රජ රාජ මහා ඇමතියන් මැද හා දෙව් බඹ මරුන් ඈ අතර දෙසීමට තරම් වන බලයක් ඔහුනට

කෙසේනම් ලැබේද? නොලැබේමය! මන්ද සසර සැරි සැරීමෙහිදී සකස් වියයුතු කිසිද අත්හදා බැලීමක් ඔවුනට නැති හෙයින්ද? මරණයෙන් ත්‍රසථවන හෙයින්ද? පරහස්තගතව මරුමුවට පැමිණෙන හෙයින්ද? බැවිනි සීමාන්තික කාලයක් හුරු පුරුදු විය යුතු සසර දෙස් මැඩීමේ හා ගුණවැඩීමේ බාරදූර ක්‍රියාවට බැසගත් බෝධිසත්ත්වවරයෝ පවා අසඞ්ඛ්‍ය කල්ප ගණන් පෙරුම්පුරාද බුඩ රාජ්‍යයට පැමිණෙන අවසාන තත්පරය දක්වා මහත් දුක් විඳම තෘෂ්ණා ක්ෂයකිරීමෙන් මරණයෙන් මිදෙත්. තෘෂ්ණාවගේ ඝන බහලත්වය ඉන් යස රහට ඔප්පුවේ. මහ පොළොව, මහ සමුදුර, මහමෙර ඈ මහා වස්තූන්ගේ ඝන බහල උස් ගැඹුරු ඈ සඞ්ඛ්‍යා වශයෙන් දෙසූ උන්වහන්සේලා පවා මේ තෘෂ්ණාවගේ විශාලත්වය මැනීමේ හා ගිණීමේ තත්පර නොවී ක්ෂයකිරීමේ ප්‍රධන් වීර්‍ය්‍යයට බැස එය වැනසූසේක. එබන්දක් කාරණවා තබා සිතන්ටද බැරි අන් නිවටුන්ගේ ශාස්තෘත්වය උදෑවනුසේම අසත්‍යද හතිකම වෙත්. බැසගත් වලෙන් ගොඩ එනු නොහැකිව සමත්කම් දෙඩවන්නාසේද, අමෝරා ගත් අසිපතින් සිය ගෙල සිඳගන්නාසේද සසර තොරතුරු නොදන්න එතරමේයයි දෙසන්ට තැත්කරණ ශාස්තෘවරයෝ මෙතෙරම රැඳී නිහඬවෙත් වැනසෙත්. ඉන් බොදු ඔබ නොරැවටී මේ බුදු බණ අවබෝධකොට ගෙණ දහමට ලොල්වී සසර දුක් මැඩ එතර නිවන් සැප සාධා ගැණීමට උත්සාහවත් වන්න.

මේ සතිස් දහම සැම සත්‍වනටම අමරණීය ස්ථානයට බැස ගැන්මට අත්‍යුදාර සදුපායයි.

මෙම පොත් පෙළ සපුරා කරලීමට තුටු පහටුවූ සමිතිය උද්‍යොගමත් කිරීමට යත්න දැරූ අනුශාසක හිමිවරයන්ට පසසනාතර අප ශිෂ්‍ය අළුත්වල උත්තමවංස භික්ෂු නමගේ දැඩොත්සාහය වෙසෙසින් පැසසිය යුත්තකි.

මෙම පොත කලට වේලාවට අච්චුගැසීමට බාරදීමට අපට ඇතිවූ ප්‍රමාදයන් ගැණ නොතකා සවකීය වැඩක්සේ සලකා කර දුන් පිළියන්දල සුප්‍රසිඬ "ශ්‍රී ලංකා මුද්‍රණාලය" අයිති මහත්මාට හා දක්ෂ කොම්පොසිටර් මහතාටද තෘත්‍ය සම්පාදක පිරිසටද ප්‍රසංසා කරන්නේ අවඞ්කාධ්‍යාශයෙනි.

සියලු පින්වතුන්ම තම තමන් අයත් අවවුවැඩ නිවැරදිව, නිබොරුව, අවඞ්කව කරගැණීමට මෙම යන්ත්‍රාලයට පැමිණීම වටී.

මෙම ඉතාම ගැඹුරු ධර්ම සන්නිස සියලු පිනැතියන්ගේම අවබෝධය සලකා ලිහිල්ව හා කෙටියෙන් ලියන අවස්ථාවන්හිදී ඇතිවීගිය (ද්වේෂදර්ශණයවූ) අවස්ථාවන්හිදී උරණ නොවී ධර්මාලම්බනයෙන් අප වෙතින් විමසන්න. ඒ සැම ප්‍රශ්නයකටම කාරුණාවෙන් පිළිතුරු සපයමු.

දෘඪ සදුත්සාහයකින් ව්‍යාප්ත කරවන්ට යෙදුන මෙම පොත් පෙළ මනාව භාවිතා කිරීමෙන් ඔබගේ පරමාර්ථය වන නිවන් සැප සාධා ගැණීමට ප්‍රෝත්සාහී වන්න.

මෙම සප්ත බොධ්‍යඞ්ගය, අංක 1. බාරස ධර්මය, අංක 2. ඉන්ද්‍රිය බල ධර්ම, අංක 3. අෂ්ටාර්‍ය මාර්ගය, අංක 4. යන පොත් සතරෙහි අයිතිය හා නැවත මුද්‍රණය කිරීම් ආදියෙහි සම්පූර්ණ බලය සම්පාදකාවූ අපගේ ඇවෑමෙන් අපගේ ශිෂ්‍ය **අළුත්වල උත්තමවංස භික්ෂූ** නමට අයත් බව සැලකිය යුතුයි. අපගෙන් හෝ අපගේ ඇවෑමෙන් **අළුත්වල උත්තමවංස භික්ෂූ** නමගෙන් හෝ බලයක් නොලැබ මෙම පොත් වෙන වෙනම හෝ එකාබද්ධව අන් කෙනෙක් අච්චුගැසීමෙන් නීත්‍යානුකූල වරදට බැඳෙන බැව් සැලකිය යුතුයි.

**නිවන් සැප ලැබේවා!**

මෙසේ හඳුන්වන්නේ,

හිත සැප කැමති,

**මොරටුවේ සාසනවංස මහා ස්ථවිර.**

2495<br>
—— සිරි සුධර්මාරාමය,<br>
1951 මොරටුමුල්ල.

# ශුද්ධි පත්‍රය.

---

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 3 | 24 | ● | දීම |
| 4 | 9 | වෙන් | මෙන් |
| 10 | 19 | තෘත්‍යය | කෘත්‍යය |
| 12 | 15 | අනාගාමී | අනාගාමි |
| 17 | 19 | ඝදෙණත | ඝෘදෙණත |
| 20 | 14 | වුචම සාවුසො | වුචචතාවුසො |
| 24 | 20 | වචීතය | වචතය |
| 49 | 20 | අකරුණං | අකරණං |
| 76 | 14 | ආජීවීය | ආජීවය |
| 86 | 36 | අංවුචචති | අයංවුචචති |
| 118 | 36 | ශ්‍රොතාදී | ශ්‍රොතාදී |
| 120 | 15 | ප්‍රධමධ්‍යානය | ප්‍රථමධ්‍යානය |
| 121 | 9 | වොසසගය | වොසසග්ගය |
| 154 | 4 | සමාධීය | සමාධිය |
| 165 | 1 | ශීෂ්‍යයෙක් | ශිෂ්‍යයෙක් |
| 168 | 7 | සමසවී ග්‍රහයි | සමාස විග්‍රහයි |

තවද මේ හැර දීඝ ඉස්පිලි කතිපයක්ද විද්‍යමාන වෙත්.

# දෙශනා පිළිබඳ දායකත්වය දැරූ පිනැතියෝ.

1 ඩබ්ලිව්. ඇම්. ලීලාවතී මැනිකේ මහත්මියට පින් පැමිණවීම සඳහා සිය ස්වාමි පුත්‍ර ඇම්. ඒ. ඩේවිට් ප්‍රේරා මහත්මයා, උබයසේකරපුර.

2. ඩබ්ලිව්. මාටින් මල්ලි මහත්මයා, ජස්මින් කොඩිතුවක්කු මහත්මයා, උබයසේකරපුර.

3. එච්. ඒ. කල්දේරා නෝනා මහත්මිය, වැලිකඩ, අයි. මුතුමැනිකා කල්දේරා නෝනා මහත්මිය, තුඩුව.

4. උබයසේකරපුර අභිනවාරාමස්ථ ශ්‍රී සඞ්ඝමිත්තා කුලඟන සමිතිය.

5. ජී. මැන්ඩිස් මහතා, රත්මලේ, ටී. මාටින් මහතා, නවගමුව, ජී. එච්. පී. ජොතිපාල මහතා, උබයසේකරපුර.

6. ඇම්. ජී. පීටර් සිඤ්ඤෝ, කේ. ඒ. පියසේන මහතා, ටී සී. දැවිත් සිඤ්ඤෝ, ඇස්. ඩී. බර්ටි විජයගුණවර්ධන මහතා, උබය-සේකරපුර. බී ඒ. මැන්දිස් මහත්මයා නො 4 ලේන් රාජගිරිය, එච්. රොමියෙල් ප්‍රනාන්දු මහතා, මහයාල.

7. ඇන්. ඇලන්නෝනා මහත්මිය, ආර්. ඒ. සෝමවතී මහත්මිය, සීලවතී ජයවර්ධන මහත්මිය, පී. ඇම්. හේරත් මැනිකේ මහත්මිය, ඩබ්ලිව්. කේ. මාග්‍රට් නෝනා මහත්මිය, කේ. සෙල්ලම්මා මහත්මිය, උබයසේකරපුර.

8. ජී. ජී. පීටර් සිඤ්ඤෝ මහතා, ඇම්. ඩබ්ලිව්. ඩී සයිමන් අප්පුහාමි, ඩී. ජේම්ස් සිල්වා මහතා, ආර්. ජේ. පීරිස් මහතා, ඩී. ඒ. සෝමවීර මහතා, ඩබ්ලිව්. ඇම්. පොඩිඅප්පුහාමි, උබයසේකරපුර.

එච්. ඇම්. කල්දේරා මහත්මයා.

පී. ඩී. අබයසිංහ හාමිනේ, ඇම්. ඩේවිට් ප්‍රනාන්දු මහතා (නැසීගිය) ටී. එච්. චාලට් නෝනා මහත්මිය, ටී. එච්. සියාමිස් සිල්වා මහතා, බී. ආතර් මැන්දිස් මහතා, එමී චාලට් ගුණසේකර මහත්මිය.

එච්. ආරොන් ප්‍රේරා මහතා, ඒ. විල්ප්‍රැට් අප්පුහාමි, ඇන්සලින් මෙරායා මැන්දිස් මහත්මිය, පී. ඩී. පුංචිහාමිනේ, එච්. ජී. විල්සන් ප්‍රේරා මහත්මයා.

# අෂ්ටාඞ්ග මාර්ගය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන්හි ආචාර්ය **පලන්නොරුවේ පණ්ඩිත ශ්‍රී සිද්ධාර්ථ විමලධර්මාභිධාන** කොළඹ නවකෝරළේ නායක මහා ස්ථවිර පාදයන් වහන්සේ විසින් ශ්‍රී බුද්ධ වර්ෂ 2494 ක්වූ උඳුවප් මස අව එකොළොස්වක් ලත් ගුරු දින **කොළඹ උභයශේඛර පුර අභිනවාරාමයෙහිදී** පවත්වන ලද ධර්මදේශනාව,

## සම්මාදිට්ඨි.

**කතමා තස්මිං සමයෙ සම්මාදිට්ඨි හොති? යා තස්මිං සමයෙ පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්ම විචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභබ්‍යා චින්තා උපපරික්ඛා භූරිමෙධා පරිනායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤා සත්ථං පඤ්ඤා පාසාදො පඤ්ඤා ආලොකො පඤ්ඤා ඔභාසො පඤ්ඤා පජ්ජොතො පඤ්ඤා රතනං අමොහො ධම්ම විචයො සම්මාදිට්ඨි, අයං තස්මිං සමයෙ සම්මාදිට්ඨි හොතී ති.**

**සාධුනි,**

සම්‍යග් **දෘෂ්ටිය** විස්තර කරමින් **සර්වඥයන්** වහන්සේ මේ ධර්ම පාඨය වදාළ සේක. මේ ධර්ම පාඨයේ වචනයක් පාසා විස්තර කරන්නට මත්තෙන් සම්මාදිට්ඨිය පිළිබඳ කරුණු ටිකක් විමසා බලමු. සෑම මනුෂ්‍යයාටම තමා අපේක්ෂා කරන අර්ථය සිදු කර ගැනීමට ඥානය අවශ්‍යයි. ඥානය නැති නම් කවර අර්ථයක් වුවද සිදුකර ගත නොහැකිය. මෙහි අර්ථය යන්නෙන් කියැවෙනුයේ වෘද්ධියයි. නැතහොත් මෙලොව්හි ද පරලොව්හි ද අභිවෘද්ධියයි. මනුෂ්‍යයාගේ වෘද්ධිය ලෙස සැලකිය හැක්කේ ඔහු අනුක්‍රමයෙන් උසස් වීමයි. උසස් බව සිදුකර දෙන ධර්ම (ස්වභාව) අතුරෙහි ඥානය උසස් තැනෙක සිටී. මනුෂ්‍යයා අපේක්ෂා කරන සම්පූර්ණ අර්ථසිද්ධිය කරන්නුයේ **සම්‍යග්** ඥානයයි. **සම්පූර්ණ** අර්ථසිද්ධිය **නම්** අභිවෘද්ධියේ අන්තිම කොටසයයි නොහොත් උසස්වීමේ **අන්තිම** කෙළවරය මෙසේ කල්පනා කරමු. මනුෂ්‍යයා දෙවියකුවීම, බ්‍රහ්මයකුවීම, ඔහුගේ අභිවෘද්ධිය ලෙස කිව හැකිය. **එහෙත්** ඔහු

අපේක්ෂා කරන්නේ කිසිදු දුකක් නැති ධර්මයක් නම් දෙව් බවට පත්වීමෙන්, බ්‍රහ්ම බවට පත්වීමෙන් ඔහුගේ අපේක්ෂාව මුදුන්පත් වන්නේ නොවේ. එහිදු ඔහු නොකැමති සංසාරික දුක් ඇති බැවිනි. එහෙයින් සම්පූර්ණ අර්ථසිද්ධිය නම් දුඃඛයෙන් සම්පූර්ණ-යෙන් නිදහස් වීමයි. එය සිදුකරන්නේ සම්‍යග් ඥානයයි. ලෝකයෙහි සියලු තත්ත්වයන්ද ලෝකෝත්තර ධර්මයන්ද හරි හැටි අවබෝධ කරවන බැවිනි. ඒ සම්‍යග් ඥානය සම්මාදිට්ඨිය මැයි. මෙය විස්තර කිරීම සඳහා වචන රාශියක්ම දේශනා කළසේක.

යම් ක්ෂණයෙක්වූ කුසල් සිතක් උපදීද, ඒ ක්ෂණයෙහි ඒ චිත්තය සමග සම්ප්‍රයුක්ත වන සම්‍යග් දෘෂ්ටිය කවරේද? ඒ ක්ෂණයෙහි යම් ප්‍රඥාවක් ඒ චිත්තයෙහි සම්ප්‍රයුක්ත වේද එය සම්‍යග් දෘෂ්ටියයි.

මෙයින් ප්‍රඥාව සම්‍යග් දෘෂ්ටිය බව දේශිතය. ප්‍රඥා නම් කුමක්ද? පජානාතීති-පඤ්ඤායි දක්වූ බැවින් හැම අයුරකින්ම කිසිදු තත්ත්වයක් නොහැර දනීනුයි ප්‍රඥා නමි. කුමක් ප්‍රකාරයෙන් දනීද? බුදුරජාණන් වහන්සේ මෙසේ දෙසති. "ඉදං දුක්ඛන්ති යථා භූතං පජානාති, අයං දුක්ඛ සමුදයොති යථා භූතං පජානාති, අයං දුක්ඛ නිරොධොති යථා භූතං පජානාති, අයං දුක්ඛ නිරොධ ගාමිනී පටිපදාති යථා භූතං පජානාති." මෙයින් දේශනාකොට වදාළේ දුඃඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරොධ සත්‍යය, දුඃඛ නිරොධ ගාමිනී ප්‍රතිපදා සත්‍යය යන චතුරාර්‍ය්‍ය සත්‍යය හැම පසින්ම දනියි. එහෙයින් ප්‍රඥායි. විභඞ්ග දෙසනාවේ සුත්තන්තභාජනීයෙහි සම්මාදිට්ඨි නාමයම යොදා මෙය වදාළහ. "තත්ථ කතමා සම්මාදිට්ඨි? දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං. දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛ නිරොධගාමිනියා පටිපදාය ඤාණං, අයං වුච්චති සම්මාදිට්ඨි" යනු ඒ වදාළ ධර්ම පාඨයයි. චතුරාර්‍ය්‍ය සත්‍යය පිළිබඳ ඥානය සම්මාදිට්ඨිය බව එයින් කියැවේ. අර්ථ කථාචාර්‍ය්‍යවරයෝ 'පඤ්ඤපෙතීති පඤ්ඤා'යි නිර්වචන දක්වා 'පණවාතු'යි ප්‍රඥා නමැයි වර්ණනා කෙරෙති. කුමකැයි පණවාද? සියලු සංස්කාරයන්ගේද, සියලු ධර්මයන්ගේද, අනිත්‍ය, දුඃඛ, අනාත්ම යන පැණවීම කරන්නේ ප්‍රඥාවයි.

මේ ප්‍රඥාව වනාහි ආලෝක කිරීම ලක්ෂණකොට ඇත්තේය. නොහොත් ප්‍රඥාවේ ලක්ෂණය එළිය කිරීමයි. ප්‍රසාක්ෂියෙන් දනීම හෝ ප්‍රඥාවේ ලක්ෂණයයි.

රාත්‍රි කාලයෙහි සිවුරියන් ගෙයක් තුළ දීප්තිමත් ආලෝකය ඇති පහනක් දල් වුවහොත් එහි අන්ධකාරය නැතිවී ආලෝකය පහළ වෙයි. ඒ පහනමෙන් ප්‍රඥාවෙ ස්වභාවය එළිය කිරීමයි. ප්‍රඥා ලෝකය තරම් ආලෝකයක් කොහිවත් නැත. ප්‍රඥා ඇත්තා හට එක් අසුනක වාඩිවී සිහි කළ විට දස දහසක් සක්වළ එකාලෝක වෙයි. ඥානයෙන් බැලිය හැකි බැවිනි. එහෙයින් නාගසෙන මහතෙරහු වදාළහ. 'මහරජානනි, යම්කිසි පුරුෂයෙක් අඳුරු ගෙයකට පහනක් ඇතුල් කරන්නේද, ඒ පිවිසි පහන අඳුරු දුරු කරයි. ඔභාසය උපදවයි. ආලෝකය පතුරුවයි. එහි තිබෙන රූප ප්‍රකට කරයි. එමෙන්ම ප්‍රඥාව උපදින්නේ මොහ නමැති අන්ධකාරය දුරු කෙරෙයි. විද්‍යා නමැති ඔභාසය උපදවයි. ඤාණාලෝකය පතුරුවයි. චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකට කෙරෙයි. මෙසෙයින් ප්‍රඥාව ආලෝක කිරීම ලක්‍ෂණකොට ඇත්තේය.

ප්‍රඥාව දැනීම ලක්‍ෂණකොට ඇත්තේය යන අර්ථයෙහි; එය දක්‍ෂ වෛද්‍යවරයකු සමානය. දක්‍ෂ වෛද්‍යවරයා තමා වෙත පැමිණෙන රොගියා ප්‍රශ්න කිරීම, ස්පර්ශකිරීම් ආදියෙන් හොඳට පරීක්‍ෂාකොට රොගය හැඳින එයට සුදුසු බෙහෙත් මෙයයි දැන ගණියි. ඔහුට සත්ප්‍රාය භොජන, අසත්ප්‍රාය භොජන දනියි. එසෙයින්ම ප්‍රඥාව උපදින්නේ මෙය පවය, මෙය පිණය, මෙය සෙවනය කළ යුතුය, මෙය සෙවනය නොකළ යුතුය, මෙය හීනය, මෙය පණීතය, යනාදි ක්‍රමයෙන් සියලු ධර්මයන් දැනගණී. මෙසේ හෙයින් ප්‍රඥාව ප්‍රජානනය ලක්‍ෂණකොට ඇත්තේය.

තවද ක්‍රමයකින්: ප්‍රඥාව ධර්මයන පවත්නා තත්ත්වය කිසිදු අඩු ලුහුඬුවක් නොකොට ඇති සැටියෙන් අවබොධකොට ලක්‍ෂණකොට ඇත්තේය. එහි කෘත්‍යය ෂඩ්ද්වාරයන්ට ගොචර වන ආලම්බනය ආලොක කිරීමය. එයින් මේ ආපාථගත වූයේ මෙබඳු ආලම්බනයකැයි දක්වයි. අරමුණෙහි නොමුළාවන බව ප්‍රත්‍යුපස්ථානයයි හෙවත් වැටහෙන-එළඹ සිටින කාරණයයි. මේ වනාහි පඤ්ඤානාමයෙන් සම්මාදිට්ඨිය විස්තර කළ අයුරුය. **පජානනා** යන්නෙන් දෙසනා කෙළේ දැනීම් බවය. එහි සියලු විස්තරය 'පඤ්ඤා' පදයට කළ විස්තරය මෙනි.

අරමුණක් පාසා අනිත්‍යය දුඃඛය අනාත්මය සොයන බැවින් විචය, පවිචය නමින්ද, චතුරාර්‍ය්‍ය සත්‍යයන් සොයන බැවින් ධම්මවිචය නමින්ද, අනිත්‍යාදි ලක්‍ෂණ සලකන බැවින් සල්ලක්ඛණා, උපලක්ඛණා, පච්චුපලක්ඛණා යන නම්වලින්ද, පණ්ඩිත ස්වභාවය, කුශල ස්වභාවය, නිපුණ ස්වභාවය සම්මාදිට්ඨිය බැවින් පණ්ඩිච්ච,

කොසල්ල, නෙපුඤ්ඤ යන නම් වලින්ද, අනිත්‍යාදිය විභාවනය චින්තනය පරීක්ෂණය කරණ බැවින් වෙභව්‍යා, චින්තා, උපපරික්ඛා යන නම් වලින්ද පොළොවමෙන් පැතිරෙණ බැවින් හෝ භූතාර්ථ-යෙහි රමණය කරණ බැවින් හෝ භූරි නමින්ද, කෙලශයන් නසන බැවින් මෙධා නමින්ද, ලක්ෂණාවබොධයෙහි පුරොගාමී බැවින් පරිණායිකා නමින්ද, සාමාන්‍ය දැකීමට වෙනස් අනිත්‍යාදි වශයෙන් ධර්මයන් දකින බැවින් විපස්සනා නමින්ද, අනිත්‍යාදි ධර්මයන් දැන ගන්නා බැවින් සම්පජඤ්ඤ නමින්ද, මගින් ඉවත්ව යන අශ්වයන් මගට හරවනු පිණිස තළන කෙවිටක්වෙන් නොමග දුවන නොදැමුනු සිත වීථියට නංවනු පිණිස කෙවිටි කරණ බැවින් පතොද නමින්ද, මනැසින් ධර්මයන් දැකීමෙහි ඊශ්වරත්වය කරණ බැවින් පඤ්ඤින්ද්‍රිය නමින්ද, අවිද්‍යා මහාන්ධකාරයෙන් කම්පිත නොවන බැවින් පඤ්ඤා බල නාමයෙන්ද, කෙලෙස් සිඳින බැවින් පඤ්ඤාසත්ථ නාමයෙන්ද, ඉතා උස් පහයකට නැගී කල්හි අවට තිබෙන සියල්ල හොඳ හැටි පෙණෙන්නාක්මෙන් ඉතා උස් බැවින් ප්‍රඥාව ප්‍රාසාද වැනියි යන අරුතෙන් පඤ්ඤාපාසාද නමින්ද, මහා ආලොකයක් මහා ඕභාස-යක් මහ පන්දමක් වැනිය යන අර්ථයෙන් පඤ්ඤා ආලොකො, පඤ්ඤා ඕභාසො, පඤ්ඤා පජ්ජොතො යන නම් වලින්ද, දුර්ලභවූ පහලවීම් ඇති බව ආදි අර්ථයෙන් පඤ්ඤාරතන නමින්ද, අරමුණෙහි නුමුළාවන අර්ථයෙන් අමොහ නමින්ද දෙශනා සොළේ සම්මාදිට්ඨිය මය ධර්මය අවබොධ කරණ පුද්ගලයන්ගේ අදහස්-වලට ගැළපෙනු පිණිස හෝ දෙශනා විලාස වශයෙන් හෝ මෙසේ පද රාශියකින් මේ ධර්මය හඳුන්වන ලදී.

සම්මාදිට්ඨිය කවර සිතෙක උපදී දැයි සොයා බලමු. යථාව-නියයාණිකා කුසල දිට්ඨි සම්මා දිට්ඨියයි කියූ බැවින් අපෙක්ෂිත සුඛයට පමුණුවන කුශල දෘෂ්ටිය සම්‍යග් දෘෂ්ටියයි. එහෙයින් සියලු ඥාන සම්ප්‍රයුක්ත කුශල චිත්තයන්හි මෙය උපදියි. ලෞකික-ලොකොත්තර යන ප්‍රභෙද දෙකද, කම්මස්සකතා සම්මා දිට්ඨි, විපස්සනා සම්මාදිට්ඨි, සච්චානුලොමිකා සම්මාදිට්ඨි, මග්ගසම්ප යුත්තා සම්මාදිට්ඨි, ඵල සම්පයුත්තා සම්මාදිට්ඨි යන පඤ්චවිධ ප්‍රභෙදයද ලැබෙනුයේ මේ ඥාන සම්ප්‍රයුක්ත කුශල චිත්තයන්හි උපදනා බැවිනි. වෙදයිත සුඛලාභය සඳහා ලෞකික සම්මා දිට්ඨියද, අවෙදයිත සුඛය ප්‍රත්‍යක්ෂ කරණු පිණිස ලොකොත්තර සම්මාදිට්ඨියද සම්ප්‍රයුක්ත ධර්මයන් සමග ක්‍රියා කරණ බැවින් මේ පිළිබඳ විස්තර දැනීම ඵලදායක වේ.

කර්මය කර්මඵලය විශ්වාස කිරීම සුචරිතය කිරීමට අතිශයින්ම උපකාර වන්නේය. ප්‍රාණඝාතාදි අකුශලයක් කළහොත් එය

තමාට අයත් බවද එහි විපාකය තමා විසින් විඳිය යුතු බවද සලකන්නා හට පහළවන දර්ශනය කම්මස්සකතා සම්මාදිට්ඨියයි. අනිත්‍ය දුඃඛ අනාත්ම යන ත්‍රිලක්ෂණය මෙනෙහි කරන්නා හට උපදින ප්‍රඥාව විපස්සනා සම්මාදිට්ඨියයි. චතුරාර්ය සත්‍යය දක්නා අවස්ථාවේ උපදින ප්‍රඥාව සච්චානුලෝමික සම්මාදිට්ඨියයි. මේ තුන්වැදෑරුම් සම්මාදිට්ඨියම ලෞකික චිත්තයෙක පහළ විය හැකි බැවින් ලෞකික සම්‍යග් දෘෂ්ටි නම්. සෝතාපත්ති ආදි සිවු මග සිත්හි උපදින ප්‍රඥාව මග්ග සම්මාදිට්ඨියයි. ඒ සිවුපල සිත්හි උපදින සම්මාදිට්ඨිය ඵල සම්මාදිට්ඨියයි. එය ලෝකෝත්තරයි.

මෙසේ පහළ වන සම්මාදිට්ඨිය සත්වයා නොයෙක් දුකට හෙළන මිථ්‍යාදර්ශන අතුරුදහන් කෙරෙයි. මේ මිථ්‍යාදර්ශනය නාස්තික-ආස්තික වශයෙන් දෙවැදෑරුම් වේ. සියල්ල නැතැයි ඇතිවන දෘෂ්ටිය නාස්තික දෘෂ්ටියයි. දුන් දෙයෙහි විපාක නැත. යාග සංඛ්‍යාත දානයෙහි විපාක නැත. ආහුතියෙහි විපාක නැත. පින් පව්වල විපාක නැත. මවු නැත නොහොත් මවුම්කරණ උපස්ථානයෙහි විපාක නැත. පියා නැත නොහොත් පියාට කරණ උපස්ථානයෙහි විපාක නැත. මෙලොව නැත. පරලොව නැත. ඖපපාතික සත්වයෝ නැත. මෙලොව පරලොව දත් මනාසේ පිළිපන් මහණ බමුණෝ නැතැයි උපදින දසවැදෑරුම් නාස්තික දෘෂ්ටිය සත්වයා නිරය ආදි දුකට හෙළන්නේය. වැරදි අතුරෙහි අතිශයින්ම භයානක වරද මිථ්‍යාදෘෂ්ටියයි. එයින්ද නාස්තික දෘෂ්ටිය වචනයෙන් කිය නොහැකි තරම් බරපතළය. නාස්තික දෘෂ්ටිකයා නිරයට පැමිණෙන බැවිනි. සියල්ල ඇතැයි දැකීමද දෘෂ්ටියෙකි. එහෙත් එය නාස්තිකදෘෂ්ටිය තරම් බරපතළ නොවේ. එය ස්වර්ගමාර්ගය නොවළක්වන බැවිනි. නිවණ අවබොධ කර ගැණීමට මේ දෘෂ්ටි දෙකම ප්‍රහීණ කළ යුතු වේ. එය සිදු කරන්නේ ප්‍රඥාවයි.

මෙසේ හෙයින් නිවන් පසක්කොට සංසාර දුකින් එතෙරවනු කැමති පින්වතුන් විසින් තමන් කරණ සෑම ක්‍රියාවකදීම. සම්‍යග් දෘෂ්ටිය ඉදිරිපත්කොට ගෙණ ක්‍රියා කළ යුතුය. එයින් ඔවුනට මෙලොවද පරලොවද අභිවෘද්ධිය සිදුවන්නේය. අපායන්හි සියලු දුකින් නිදහස් ශාන්ත නිර්වාණ සම්පත්තිය ප්‍රත්‍යක්ෂ වන්නේය.

**ආරොග්‍ය පරමා ලාභා, නිබ්බානං පරමං සුඛං**
**අට්ඨංගිකොච මග්ගානං, ඛෙමං අමත ගාමිනනති**

**සින්වතුනි,**

මෙම ග්‍රන්ථයෙහි අඩංගු ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය පිළිබඳව එක එක මාර්ගාඞ්ගයක් පාසා ඒ ඒ දේශකයන්වහන්සේලා විසින් ලියන ලද ධර්‍ම මෙහි අඩංගු වෙතත් මෙහිලා ආර්‍ය්‍යමාර්ගාඞ්ග අටම පිළිබඳව ඉතාම කෙටි විස්තරයක් ආරම්භයෙහිදී ලිවීම සුදුසුයයි අපට වැටහුන බැවින් එය මෙසේ පවසමු.

**ආරොග්‍ය පරමා ලාභා** යන ගාථාවේ කෙටි අදහස:– නීරෝග බව පරම ලාභයකි. නිර්‍වාන සැපය පරම සැපයකි. අභයස්ථානයට අමෘත පදයට යෑමට ඇති එකම මාර්ගය අඞ්ග අටකින් සමන්විත ආර්‍ය්‍ය මාර්ගයමයි. ඉතා කෙටියෙන් කියන ලද මෙම ගාථාවේ අදහස විස්තර හෙයින් මෙසේ දතයුතුයි.

**ආරොග්‍ය පරමා ලාභානි, යෙකෙචි ධන ලාභාවා, යස ලාභාවා, පුත්ත ලාභාවා ආරොග්‍යං තෙසං පරමං උත්තමං, නත්ථි තතො උත්තරිතරො ලාභො** යනුවෙන් නීරෝග භාවයෙහි වටිනාකම විස්තර වෙත්. යම් කිසිවෙකුට යම්කිසි රන් රිදී මසු කහවනු මිල මුදල් වතුපිටි ගේදොර ඉඩකඩම් ආදී වස්තු ලාභයක් ඇතිවේද, යසස් කීර්ති ප්‍රශංසා තනතුරු සම්මානාදී ලාභයක් ලැබී ප්‍රමෝදයට පැමිණේද ඒ සියල්ලට වඩා අගනා දූ, පුත්‍ර පුණ්‍ය නිධානයන් පහළවී අතිෂය ප්‍රීතියට පැමිණේද, ඒ සියලු ලාභයන්ට වඩා තම ජීවිතය කාසස්වාසාදී රෝගයන්ගෙන් වෙන්ව නිරතුරුව සැපසේ කල් යවන්ට ලැබෙත් නම් ඊට වඩා පරමතර උත්තම තම ලාභයක් නැත්තේමය. නීරෝගීව තම ජීවිතය ගෙණ යාමට ලැබීම සියලු ලාභයන්ට වඩා පරමෝත්කෘෂ්ට ලාභයම බැව් සැලකිය යුතුයි.

**නිබ්බාණං පරමං සුඛනති, යංකිඤ්චි ඣානසුඛංවා මග්ග සුඛංවා ඵලසුඛංවා අත්ථි, නිබ්බානං තත්ථ පරමං, නත්ථි තතො උත්තරිතරං සුඛනති, නිබ්බානං පරමං සුඛං** යනුවෙන් පරමතර සැපය වන නිර්‍වාන සැපය පෙන්වත්. වස්තු, රූපාදී ලෞකික සැප පිළිබඳව කිසිම ක්‍රමයකින් සැපයක් ලෙස කථා කරන්ට නොහැකි බැවින් අනිස්ථිර පළිබෝධ සහිත ග්‍රාම්‍ය එම සැප ගැණ වචනය කුදු කථා නොකොට එය පහත්ම සැපය ලෙස සලකා සැපයයි කියන්ට හැකි ධ්‍යානාදී සැපයන්ගෙන ඉන් නිර්‍වාන සැපය වෙන්කොට වර්‍ණනා කරනුයේ.

යම්කිසි ප්‍රථම ධ්‍යානාදී ධ්‍යාන සැපයක් හෝ සෝවාන් මාර්ගාදී මාර්ග සැපයක් හෝ එසේම ඵල සැපයක් හෝ ඇද්ද, එම නිරාමිස සැප අතුරෙන් නිර්වාන සැපය පරම උත්කෘෂ්ට සැපයකි. මෙම නිර්වාන සැපයට වඩා උත්තරීතර සැපයක් නැත්තේමය. එබැවින් නිර්වානය පරමතර සැපයකි ප්‍රකාශිතයි. මෙහිලා වසතු කාමාදී සැප නොසැලකීමට කරුණු කිමයත් :– **නිච්චසාර ධුවසාර අත්ත සාර විරහිතතාකාරිතතා නළන අජ්ජිතගෙහතබ්බා නත්ථි තුච්ඡ මුට්ඨිති වුත්තො මුට්ඨිනාම තුච්ඡේති වුත්තං හොති යස්සපන අබ්භන්තරෙ කිඤ්චි නත්ථි. සො වුච්චති තුච්ඡො** යනුවෙන් වසතු කාමාදීන්ගේ හිස්බවම ප්‍රකාශ වෙත්. වසතුකාම කෙලශකාමාදීන්ගේ කථා කළයුතු සැපයක් නම් නැත. නිත්‍ය වශයෙන් ගත යුතු හරයක් නැත. ස්ථිර වශයෙන් ගතයුතු හරයක් නැත. ආත්ම (තමන්ගේය කියා) වශයෙන් ගතයුතු හරයක් නැත. එබඳු හරසර නැති බැවින් හිස් බොල් කාමයෝ සැප වශයෙන් ආර්යයෝ නොසලකත්. යම් හෙයකින් මේ වසතු ආදී කාමයන්ගේ ඇතුලත ගතයුතු දෙයක් නැත. හිස් මිටය කීකළ මිටක් නැති බවම වැටහිය යුතුයි. මන්ද හිස් මිටෙහි ඇතුලත කිසිවක්ම නැති හෙයිනි. එලෙසම වසතු රූපාදියෙහිද ගතයුතු හරයක් නොමැති බැවින් මෙහිලා කථා නොකළහ. වැලිදු මෙම වසතු ආදී කාමයන්ට මුසා මායා, බාලලාපනා, මාරධෙය්‍ය ආදී නම්ද අන්වර්ථ වශයෙන් යෙදෙනවා විනා සැපය යන වචනයක් නම් යෙදෙන්නේම නැත. වසතු ආදී කාමයන්ට 'මුසා' නම් කෙසේ යෙදේද.

**මුසාති නස්සනකා මොසධම්මාති නස්සන සභාවා ඛෙත්තං විය, වත්ථුං විය හිරඤ්ඤ සුවණ්ණං විය ච පඤ්ඤායිත්වාපි කතිපාහෙ නෙව සුපිනකෙ දිට්ඨා විය නස්සන්ති න පඤ්ඤායන්ති මතන වුත්තං මොස ධම්මාති** මුසා යන්නෙන් නැසෙන සුළුදේ අඟවත් මොස ධම්මා යනුවෙන්ද නැසෙන සවභාව දේම හඟවත්. වසතු කාමාදිය සලකන කළ කුඹුරක්ය මෙය වතුපිටි ආදියය මේ රත්රන් රිදී ආදී මිළ මුදල්ය කියා අඥ බාල ප්‍රථග්ජනයාට පෙන්වා ඔහුට එය සැපයක් හැටියට අඟවා මුළාකොට කීප දිනකින් සිහිනයක් පෙන්නුවාසේ වනසත් ප්‍රකට නොකරත්. එය වඩා දියුණුකර නොදෙත්. එනිසා මේ වසතු ආදී කාමයෝ මොස ධර්මයෝ වෙත්. එහෙයින් මුසා නම්වේ.

මේ කාම සැපයන්ට මායානම් කෙසේ යෙදේද? **යථා මායාය උදකං මණීති කත්වා දස්සිතං, බදරිපණ්ණං කහාපණොති කත්වා දස්සිතං** යනාදී ක්‍රමයෙන් යම්කිසි මායාකාරයෙක් දිය

බින්දු මැතික්මෙන් පෙන්නුම් කරත්ද, ඩෙබර කොළ කහවනුසේ පෙන්වත්ද, වෙන අන් දේවල් මායාවෙන් අන් නා නා දේ විලස කොට පෙන්වත්ද, ඒ පෙන්වන සියල්ලම ඒ පෙන්වන ස්ථාන-යෙහිදීම එලෙස පෙනෙත්. එම ස්ථානයෙන් බැහැරට ගියකල ජලය ජලයම්සේද, ඩෙබර පත එලෙසමද පෙනෙත්. එසේම කාමයෝද දැකීම අනුව වැටහී යන හෙයින් සැප්යක් ලෙස සලකා ස්වල්ප වේලාවක් සතුටු වත්නේ නමුදු මායාවක්මෙන් පෙරලෙන මැනසෙන සුලු බැවින් කාමයෝද මායාකාරයාගේ මායාවක් වැනි නිසා කාමයන්ට මායා යන නම යෙදේ.

නවද කාමයන්ට බාලලාපනා යයිද නමකි. හේ කෙසේ නම් යෙදේද, **බාලලාපනාති** මයහං **පුත්තා** මයහං **ධීතා** මයහං **හිරඤ්ඤ සුවණ්ණන්ති එවං බාලානං ලාපනතො බාලලාපනං** කාම සැපයයි යමෙක් කථා කරත් නම් එය මෝඩ කථාවකි. මෝඩයෝ මගේ පුත්‍රාය, මගේ දූවය, මගේ අමුරන්ය, මගේ රත්රන්යයි කථා කරත්. එම කථාව එසේ කථා කරන්නේ මෝඩයෙක්ම විනා නැනවතෙක් නම් නොවේ. එනමුදු පෘථග්ජන ද්‍රෂය නිසා මෙය කොයිහැටි කීවත් මෝඩයෝ මගේය යන වචනය කාමාදි සම්පත් පිළිබඳව නොහැරම කථා කරත්. එබැවින් මේ කාමාදියට බාලලාපනා යන නම අන්වර්ථ වශයෙන් යෙදේ.

වැලිදු මාරධෙය්‍ය නමුදු කාමයන්ට නමෙකි. හේ කෙසේද? **කාමාච කාම සඤ්ඤාච උභයම්පි මාර ධෙය්‍යං, යෙහි උභය මෙතං ගහිතං තෙසංහි උපරි මාරොවසං වත්තෙතීති** යනුවෙන් ප්‍රකාශ වෙත්. රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ යන මිනිසුන් විඳින පස්කම් සැප කාමයෝයි. **මානුස්සකෙ කාමෙ ආරබ්භ උප්පන්න සඤ්ඤා කාම සඤ්ඤා** එම පස්කම් සැප පිළිබඳව උපදින හැඟීම් සියල්ල කාම සඤ්ඤාවෝයි. මෙකී කාම–කාම සඤ්ඤා දෙකම මාරධෙය්‍යයි. මේ දෙවැදෑරුම් කාමයෝ යමෙක් ගත්තා නම් එහි යෙදුනා නම් ඔහු මරුගේ වසඟයට ගියා නම්වේ. උපමා වශයෙන් මෙසේ සලකා ගන්න. රූපාදී පස්කාම් සැප මනුෂ්‍ය නමැති සත්වයින්ට ඉතා ලොල්කරණ ආහාර හා සමානය. එම ආහාර මාරයා විසුරුවමින් ඇවිදිත්. එය දකින සත්ව සමූහයා එයට ලොල්ව පැහැර ගණිත්. ඒ ගත් ගත් සැමදෙනෙක්ම මරුගේ වසඟයට යත්. යම්සේ ඇතෙක්–අසවයෙක්–ගවයෙක් යම් එඬේරෙකුගේ වසඟයට යටතට ගියාද එමෙනි. ඇත්–අස් –ගව ආදී සතුන් වසඟයට ගත් එඬේරා තමන් සතු සියලු වැඩෙහි දිවා රෑ දෙක්හී යොදා වැඩ ගණීද එමෙන් මරු වසඟයට ගිය

සත්වයින්ට සිවු අපා දුක් ඈ දෙමින් සසරම හසුරුවමින් ජාත්‍යාදී දුක්ම ගෙණ දෙත්. එබැවින් කාමයන්ට මාරධෙය්‍ය නමුදු ව්‍යවහාර වෙත්. කාමාදිය මෙලෙසින් තුච්ඡං, (හිස්) මුසා, මායා ආදී නම්වලින් සලකන බැවින් එහි සැපය යන්නක් කිවනොහැක. එනිසා ආර්ය්‍යයෝ භවගාමී කාමාදිය සැපයයි නොකියා ධ්‍යාන, මාර්ග, ඵල, නිර්වාණ යන්ම සැපයයි කථාකොට ඉන් නිර්වාණ සැපය පරමොත්කෘෂ්ට සැපයයි නිරණය කළහ. ඉන්නිසා සැම සැදැහැති යෝම නිර්වාණ සැපය බලාපොරොත්තුව කුසල රැස්කළ යුතුයි.

**අරියං චට්ඨංගිකං මග්ගං ඛෙමං අමතගාමිනන්ති අරියොති තං තං මග්ගවජ්ඣ කිලෙසෙහි ආරකත්තා අරියභාවකරත්තා අරිය ඵල පටිලාභ කරත්තාච අරියො** මෙහි අරියං චට්ඨඞ්ගිකං කී තැන අරිය යනු මෙසේ සැළකිය යුතුයි. අරිය නම් කවරේද? සොවාන් ආදී ඒ ඒ මාර්ගවලින් වදකළයුතු-නැසියයුතු කෙලෙසුන් කෙරෙන් දුරුවූ හෙයින්ද කාමාදී කෙලශයන් දුරලීමෙන් මුල් ඉදිරීමෙන් ආර්ය්‍ය භාවයට පැමිණීය යුතු හෙයින්ද එසේ කළ බැවින්ද ආර්ය්‍ය ඵලයන්ට විශෙෂයෙන් පැමිණ එම ඵල ලාභයට ඇතුළත්වූ හෙයින්ද ආරිය නම්වේ. **අට්ඨඞ්ගිකං** අට්ඨඞ්ගානි අස්සාති-අට්ඨඞ්ගිකො මෙකී ආර්ය්‍ය භාවයට ඇතුළත්වීමට අඞ්ග අටක්ම ඇත්තේනුයි—අට්ඨඞ්ග නම්වේ. එය සිවුරඟ සෙනග කීතැන සේනා සතරක්ම බවද, පසඟ නාදය කීතැන නාද පසක්ම බවද වැටහෙත් වැඩි අඩු නොවෙත් එලෙසම අටඟ කීතැන අඞ්ග අටක්ම ගැනෙත් වැඩි අඩු නම් නොවෙත්. මීළඟට,

**අඞ්ග මත්ත මෙව මග්ගො අඞ්ග විනිමුත්තො නත්ථීති දස්සෙතත්තා - සම්මාදිට්ඨි-පෙ-සම්මා සමාධිනි ආදිමාහ** — ආර්ය්‍ය මාර්ගය අඞ්ග අටකින්ම යුක්ත බවත් අඞ්ගයන්ගෙන් මිදුනු ආර්ය්‍ය මාර්ගයක් නැතිබවත් අවබොධ කරගැණීමට **සම්මාදිට්ඨි - සම්මා සංකප්ප-සම්මාවාචා-සම්මාකම්මන්ත-සම්මා ආජීව-සම්මාවායාම -සම්මාසති-සම්මාසමාධි** යන අෂ්ටාඞ්ගය දෙශනා කරණ ලදි. මෙහි මනාකොට දැකීම ලක්‍ෂණකොට ඇත්තේ සම්‍යක් දෘෂ්ටියයි. එසේ දක්නා ලද සිත යහපත් කල්පනාවල යොදවා අරමුනට නන්වන ලක්‍ෂණකොට ඇත්තේ සම්‍යක් සංකල්පනාවයි. එසේ අරමුණට නැන්වූ සිත විමසීම ලක්‍ෂණකොට ඇත්තේ සම්‍යක් වචනයයි එසේ විමසා ගත් අරමුණ මොනවට නැගිටුවීම වැඩීම ලක්‍ෂණකොට ඇත්තේ සම්‍යක් කර්මාන්තයයි. එසේ නැගිටුවාලීම වැඩීම කරගත් සිත පිරිසිඳු කිරීම ලක්‍ෂණකොට ඇත්තේ සම්‍යක් ආජීවයයි. එයේ පිරිසිඳු කරණ ලද සිත දැඩි උත්සාහයෙන් වැටෙන්ට නොදී ඔසවා තැබීම ලක්‍ෂණකොට ඇත්තේ සම්‍යක්

ව්‍යායාමයයි. එසේ ඔසවා තබන ලද සිත පිළිබඳව මනා වැටහීම් ලක්ෂණකොට ඇත්තේ සම්‍යක් සතියයි. එසේ මනා වැටහීම් ලක්ෂණකොට ඇති සිත නිශ්චල කිරීම එක් තැන් කිරීම ලක්ෂණ කොට ඇත්තේ සම්‍යක් සමාධියයි. මෙලෙසින් එක අඞ්ගයකට අනතුරුව ඇති අනික් අඞ්ගය. සිත ක්‍රම ක්‍රමයෙන් පෝෂණය කරමින් සදමින් වඩමින් නිර්වාණාධිගමයට පමුණුවත්ද, එනිසා මෙම අඞ්ග අටින් සමන්විත මග, ඛෙම සඞ්ඛ්‍යාත අභයස්ථානයට, අමත සංඛ්‍යාත මිහිරි නම ප්‍රමුදිත ස්ථානයට යෑමට ඇති එකම මාවත බැව්ද දෙවැන්නක් නැති බවද නිසැකව අවබෝධ කටයුතුයි.

**තෙසු ඒකෙකස්ස තීණි තීණි කිච්චානිහොන්ති** යනුවෙන් මෙකී ආර්‍ය්‍ය මාර්ගාඞ්ග අටට එකකට කෘත්‍ය තුන බැගින් සුවිස්සක් වෙත්. ඒ මෙසේයි :–

1. සම්‍යක් දෘෂ්ටියේ–ත්‍රිවිධකෘත්‍යය– 1. සම්‍යක් දෘෂ්ටිය පළමුකොට අනිකුත් තමහට විරුඬ කෙලෙසුන් සමග මිථ්‍යා දෘෂ්ටිය අතහරියි. 2. නිර්වානය අරමුනු කරයි. 3. ඒ සම්‍යක් දෘෂ්ටිය හා යෙදුනු ධර්‍මයන්ද දකියි. එම සම්‍යක් දෘෂ්ටිය වසා දමන මොහයන් නැතිකිරීමෙන් මූලානොවී සිටියි.

2. සම්‍යක් සංකල්පනාවේ–ත්‍රිවිධ කෘත්‍යය– 1. සම්‍යක් සංකල්පනා–වද අනිකුත් තමහට විරුඬ කෙලෙසුන් සමග මිථ්‍යා කල්පනා අතහරියි. 2. නිර්වාණයම අරමුණු කරයි. 3. විශෙෂ වශයෙන් වනාහී සම්‍යක් සංකල්පනාව තමා හා යෙදුනු ධර්‍මයන්හී (අරමුණුවල) මොනවට තන්වා තබයි.

3. සම්‍යක් වචනයේ–ත්‍රිවිධ කෘත්‍යය– 1. සම්‍යක් වචනයද අනිකුත් තමහට විරුඬ කෙලෙසුන් සමග මිථ්‍යා වචන අත හරියි. 2. නිර්වාණය අරමුණු කරයි. 3. විශෙෂ වශයෙන් සම්‍යක් වචනය තමා හා යෙදුනු අරමුණු විමසීම් සහිතව පිළිගණියි.

4. සම්‍යක් කර්මාන්තයේ–ත්‍රිවිධ කෘත්‍යය– 1. සම්‍යක් කර්මාන්තයද අනිකුත් තමහට විරුඬ කෙලෙසුන් සමග මිථ්‍යා කර්මාන්ත අතහරියි. 2. නිර්වාණය අරමුණු කරයි. 3. වෙසෙසින් සම්‍යක් කර්මාන්තය තමා හා යෙදුනු අරමුණු වැඩීම නැගිටුවීම සිදු කරයි.

5. සම්‍යක් ආජීවයේ-ත්‍රිවිධ කෘත්‍යය-1. සම්‍යක් ආජීවයද අනිකුත් තමහට විරුඬ කෙලෙසුන් වඳ හරමින් මිථ්‍යා ආජීවයද වනසයි. 2. නිර්වාණයම අරමුණු කරයි. 3. වෙසෙසින් සම්‍යක් ආජීවය හා යෙදුනු අරමුණු කිළිටි නොවනා අයුරු ක්‍රම ක්‍රමයෙන් යොදා හරියි. පවිත්‍ර කරයි.

6 සම්‍යක් ව්‍යායාමයේ-ත්‍රිවිධ කෘත්‍යය- 1. සම්‍යක් ව්‍යායාමයද අනික් අනික් තමහට ප්‍රති විරුඬ කෙලෙසුන් වනසමින් සියලු මිථ්‍යා ව්‍යායාමයන් මුල් සුන් කරයි. 2. නිවනම අරමුණු කරයි. 3. විශෙෂ වශයෙන් සම්‍යක් ව්‍යායාමය හා යෙදුනු අරමුණු වැටෙන්ට නොදී දැඩිකොට ඔසවා තබයි.

7. සම්‍යක් සතියේ-ත්‍රිවිධ කෘත්‍යය- 1. සම්‍යක් සතියද තමහට විරුඬ අනිකුත් කෙලෙසුන් වනසමින් මිථ්‍යා සමාධියද විනාශ කරයි. 2. නිවණ අරමුණු කරයි. 3. විශෙෂයෙන්ම සම්‍යක් සතිය හා යෙදුනු ධර්මයන් පිළිබඳව මනා වැටහීම් ඇති කරයි.

8. සම්‍යක් සමාධියේ-ත්‍රිවිධ කෘත්‍යය- 1. සම්‍යක් සමාධියද අනික් අනික් තමහට ප්‍රති විරුඬ කෙලෙසුන් මුල් සිඳිමින් මිථ්‍යා ඒකාග්‍රතාවයද විනාශ කරයි. 2. නිර්වාණයම අරමුණු කරයි. 3. විශෙෂ වශයෙන්ම සම්‍යක් සමාධිය හා යෙදුනු අරමුණු එක් තැන් කරයි. නිශ්චල කරයි. මෙලෙසින් ආර්ය මාර්ග අට සූවිසි කෘත්‍යයක් සිදු කරයි.

අපි වෙසා සම්මාදිට්ඨි නාම පුබ්බ භාගෙ නානාක්ඛණා නානාරම්මනා හොන්ති-පෙ-වැළිදු සම්‍යක් දෘෂ්ටිය පූර්වභාගයෙහි හෙවත් සොවාන් මාර්ගයට පැමිණෙන්ට ප්‍රථම නානා ක්ෂණ නානා අරමුණු ඇති වෙත්. මාර්ගාවස්ථාවෙහි එකක්ෂණ එකාරම්මන ලබත්. කෘත්‍ය වශයෙන් දුක පිළිබඳව අවබොධ කරගත් ඥාණය දුක හට ගැණීම පිළිබඳව අවබොධකරගත් ඥාණය දුක නැතිකිරීම පිළිබඳව අවබොධ කර ගත් ඥාණය දුක නැතිකිරීමේ මාර්ගය පිළිබඳව අවබොධකරගත් ඥාණයයයි නම් සතරක් ලබත්. සම්මා සඞ්කප්ප-සම්මාවාචා-සම්මා කම්මන්ත-සම්මා ආජීව-සම්මා වායාම-සම්මාසති යන ෂඩාඞ්ගයෝද මාර්ගාධිගමයට පූර්වභාගයෙහි නානාක්ෂණ නානා

රම්මන ලබත්. මාර්ගාධිගම අවස්ථාවෙහි එක ක්ෂණ එක අරමුණුම ලබත්. සම්‍යක් සඞ්කල්පනාව කෘත්‍ය වශයෙන් නෙක්ඛම්ම සංකල්පය අව්‍යාපාද සංකල්පය අවිහිංසා සංකල්පයයි නම් තුනක් ලබත්.

සම්මා වාචා–සම්මා කම්මන්ත–සම්මා ආජීව යන මාර්ගාඞ්ග තුන පූර්ව භාගයෙහි මිථ්‍යා වචන–මිථ්‍යා කර්මාන්ත–මිථ්‍යා ආජීව යන මෙයින් වෙන්වද සිතීම් පමණ කුදු වෙත්. මාර්ග ක්ෂණයෙහි සම්පත්තාදි විරතීහුම වෙත්.

සම්‍යක් ව්‍යායාමය සතර සම්‍යක් ප්‍රධානයන්ගේ වශයෙන් නම් සතරක්ම ලබත්. සම්‍යක් සතිය–කාය–වේදනා–චිත්ත–ධම්ම යන සතර සතිපට්ඨාන නම් ලබත්. සම්‍යක් සමාධිය වනාහි මාර්ගාධිගම–යට පූර්ව භාගයෙහිද මාර්ගාධිගම අවස්ථාවෙහිද එක අරමුණම වෙත් හෙවත් සම්‍යක් සමාධියම වෙත්. මෙසේ මේ අෂ්ටාඞ්ග ආර්‍ය්‍ය ධර්මයක් භාග්‍යවතුන් වහන්සේ විසින් සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් යන සතර මාර්ග සතරඵලාවබෝධයෙන් නිර්වාණාධි–ගමයට පිළිපදින යෝගාවචරයා හට බොහෝ උපකාර බැවින් පළමුකොට සම්‍යක් දෘෂ්ටිය දේශනා කළසේක.

**පඤ්ඤා පජ්ජොතො පඤ්ඤා සත්ථන්තිවචනතො තස්මා එතාය පුබ්බභාගෙ විපස්සනා ඤාණ සංඛාතාය සම්මාදිට්ඨියා අවිජ්ජන්ධකාරං විධමිත්වා කිලෙස චොරෙ ඝාතෙන්තො ඛෙමෙන යොගාවචරො නිබ්බාණං පාපුණාති තස්මා පඨමං සම්මාදිට්ඨි දෙසිතා.** මේ සම්‍යක් දෘෂ්ටිය ප්‍රඥා නමැති පහන් කනුවයයිද ප්‍රඥා නමැති ශස්ත්‍රයයිද වදාරණ ලදි. එහෙයින් මේ සම්‍යක් දෘෂ්ටි නමැති ප්‍රඥා ප්‍රදීපස්ථම්භයෙන් ප්‍රඥා ශස්ත්‍රයෙන් පූර්ව භාගයෙහි විදර්ශනා ඥාණ සංඛ්‍යාත සම්‍යක් දෘෂ්ටියෙන් අවිද්‍යා අන්ධකාරය අවිද්‍යා වන ලැහැබ විධ්වංශනයකොට (විනාශකොට) කෙලෙස් සොරුන් ඝාතනය කරමින් (මරමින්) නිර්භයාකාරයෙන් යෝගාවචර තෙම නිර්වාණයට පැමිණේයිද එනිසා පළමුකොට සම්‍යක් දෘෂ්ටිය නමැති මාර්ගාඞ්ගය දේශනා කරණ ලදි. සම්‍යක් සංකල්පනාව එම සම්‍යක් දෘෂ්ටිය නමැති ප්‍රඥා ප්‍රදීපය දල්වීමට ප්‍රඥා ශස්ත්‍රය මුවහත් කිරීමට බොහෝ උපකාර බැවින් සම්‍යක් දෘෂ්ටියට අනුවම දේශනා කරණ ලදි. සම්‍යක් දෘෂ්ටියට සම්‍යක් සංකල්පනාව කෙසේනම් බොහෝ උපකාරවේද, යම්සේ රන්කරුවෙකු අතටවන් රුවන් දැක රුවන් යයි හැඳින එය ඒ මේ අත පෙරළමින් ඇසින් බලමින් මේක හොඳය, මේක නරකයයි දනියි. එසේම යෝගාවචරයාද පූර්වභාග යෙහිදී තර්කකොට විතර්කකොට විදර්ශනා ප්‍රඥාවෙන් බලනුයේ මේ

ධර්මයෝ (ස්වභාවයෝ) කාමාවචරය, මෙය රූපාවචරය, මෙය අරූපාවචරය, මෙය ලෝකොත්තරයයි දනියි. යම්කිසි පුරුෂයෙක් ඇද ලීයක් ගෙනැවිත් වඩුවෙකුටදී කොනකින් අල්වාගෙන ඇද ඇද තැන් පෙරළ පෙරළා පෙන්වත්ද වඩු තෙම වෑයගෙණ පෙන්වන පෙන්වන ඇද තැන් සැස දමත්ද, එසේ සැස ලීය ඇද හැර බඩු සාධා ගණිත්ද, එසේම යෝගාවචරයෙක් හමුවූ චක්ෂුරාදියට ගොචරවූ ලී දඬු නමැති රූපාදී අරමුණු ලැබ (ගෙණ) එය සම්‍යක් සංකල්පනාවෙන් තර්කකොට සිතා බලා සම්‍යක් දෘෂ්ටි නමැති ප්‍රඥා ප්‍රදීපය හෙළියකොට බලා මින් මෙය කාමාවචරය, මෙය රූපාවචරය, අරූපාවචරය, ලෝකෝත්තරයයි දැන හැඳින ඒ ඒ ධර්මයන් ක්‍රියාවේ යොදා නිර්වාණාවබොධය කරගණිත්ද එනිසා සම්‍යක් දෘෂ්ටියට අනතුරුවම සම්‍යක් සංකල්පනාව දේශනා කරණ ලදි. ඒ වාගේම සම්‍යක් වචනයද සම්‍යක් කර්මාන්තයද ක්‍රමයෙන් සම්‍යක් දෘෂ්ටියට ආසන්නව උපකාර වෙත්. එනිසා ඊළඟට දේශනා කළසේක. එහෙයින් කියන ලදි.

පුබ්බෙ ඛො ගහපති විතක්කෙත්වා විචාරෙත්වා පච්ඡාවාචං භින්දති. ගෘහපතිය, යම්කිසි යොගාවචරයෙක් සම්‍යක් දෘෂ්ටිය ගෙණ එය තර්කකොට, විතර්කකොට විචාරු නැතිනම් සංකල්පනාවෙන් විමසා ඊට අනතුරුව වචනය පිටකරයි වචනය ගෙණ හැර දක්වන්නේ කල්පනා කර බලා අනතුරුවයි. ඉන්නිසා සම්‍යක් වචනය තුන්වෙනුව දේශනා කරණ ලදි. සම්‍යක් වචනය සම්‍යක් දෘෂ්ටියට ප්‍රඥා ලෝකයට දෙවැනි උපකාර කාරයායි. යම් හෙයකින් යමක් කරන්ට පටන්ගත් කෙනෙක් දැන් අපි කරන්නේ මේ මෙවාය. ඒ දේ කොට ඊළඟට මේ මේ දේ කළයුතුයයි මුලින් කථාකර අනතුරුව ක්‍රියාවෙන් සිදුකරත්ද එලෙසම සම්‍යක් දෘෂ්ටිය තහවුරු කර ගැණීමට අවශ්‍ය ධර්ම කථාකොට අනතුරුව සම්‍යක් කර්මාන්තයෙන් එය තහවුරු කරගැණීම සිදු කටයුතු බැවින් සම්‍යක් කර්මාන්තය සම්‍යක් වචනයට අනතුරුව දේශනා කළහ. වචනය කායින් කරණ කර්මයට ආසන්නම උපකාරය බැවිනි. මුසාවාද, පිසුනාවාච, ඵරුෂවාච, සම්ඵප්පලාප යන සතරාකාර වචී දුශ්චරිතයද, ප්‍රාණඝාත, සොරකම, කාමමිථ්‍යාචාරය යන තුන් ආකාර කාය දුශ්චරිතයද පහකොට ඉන් සම්පූර්ණයෙන් වෙන්ව එය කාය, වාක් වාර දෙකේ සුචරිතය සම්පූර්ණ කරණ කල්හිම ආජීවාෂ්ටමක සීලය සම්පූර්ණවේද, අන් විධියකින් අන් කෙනෙකුට එම සීලය සපුරන්ට නොහැකිම වෙත්ද එනිසා සම්‍යක් වචනයට හා සම්‍යක් කර්මාන්තයට අනුව සම්‍යක් ආජීවය දේශනා කරණ ලදි.

මෙසේ මේ මාර්ගාඞ්ග පසින් සම්පූර්ණව මගේ දර්ශනයද, කල්පනාවද, වචනයද, ක්‍රියාවද, ජීවිකාවද පිරිසිදුය, හොඳය, නොකිළිටිය කියා සිතා සතුටුව වාසිබස් බනිමින් නිදගත් කෙනෙකුමෙන් වාසය කිරීම යුතු නොවේ.

**අථඛො සබ්බ ඉරියාපථෙසු ඉදං විරිය මාරභිතබ්බන්ති දුක්ඛස්සන්තං කාදන කාතරං සම්මා වායාමො බ්‍රූහෙතා** එසේ නොවෙයි. ඒ සම්‍යක් දෘෂ්ටි ආදී අඞ්ග පසින් ත්‍රිවිධ වාරය (කය සිත වචනය) පවිත්‍ර කරගෙණ ප්‍රඥ ප්‍රදීපය නමැති සම්මා දෘෂ්ටි ඇස දල්වා සියලු ඉරියව්වලින්ම සතර සම්‍යක් ප්‍රධන්වීර්‍ය්‍යය දැඩිව පටන් ගත යුතුයයි දැක්වීමට අනතුරුව සම්‍යක් ව්‍යායාමය දෙශනා කළහ එසේ ප්‍රධන්වීර්‍ය්‍ය වඩත් වඩත්ම කාය–වෙදනා–චිත්ත–ධම්ම යන සතර වස්තූන් කෙරෙහි සිහිය පිහිටුවා ප්‍රඥ පහන දල්වා ක්‍රියා කළ යුතු බැවින් සම්‍යක් ව්‍යායාමයට අනතුරුව සම්‍යක් සතිය දෙශනා කළසේක. යම් හෙයකින් වනාහි මෙසේ සතරකාර සතිය මොනවට පිහිටුවා සමාධියට නැතිනම් එකාග්‍රතාවයට උපකාර අනුපකාර ධර්මයන්ගේ ගති මොනවට සොයා අනුපකාර ධර්මයන් දුරලා උපකාරි ධර්මයන්ගේ සහයෝග සාධාලීම සිහියෙන් කොට සිත සමාධිය පමුණුවාලිය හැකි බැවින්ම සතියට අනතුරුව සමාධිය දෙශනා කළසේක. මෙලෙසින් යෝගාවචරයාට නිර්වාන සැපය කරා බාධා විරහිතව යැමට ඉතාම සුදුසු ආකාරයෙන් එකිනෙක අඞ්ගයට එකිනෙකක් මොනවට උපකාර වන අයුරු මෙම ආර්‍ය්‍ය මාර්ගාඞ්ග අට දෙශනා කළසේක. මේ අඞ්ග අට විනා අන් මගක් සසර සියලු දුක් නසා ලබනා නිවන් පුර යැමට නැත්තේමය.

මෙම ආර්‍ය්‍ය මාර්ගාඞ්ග අටින් කරණ කෘත්‍යය චතුරාර්‍ය්‍ය සත්‍යය සාක්ෂාත් කිරීමයි. චතුරාර්‍ය්‍ය සත්‍යයෙන් සතරවැනි මාර්ග සත්‍යයට මෙම අඞ්ග අට ඇතුළත්ව පවතින්. ඉන්නිසා චතුරාර්‍ය්‍ය සත්‍යය පිළිබඳවද ඉතා කෙටි විස්තරයක් මෙහිලා කිවයුතු වෙත්.

**දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරොධ සත්‍යය, මාර්ග සත්‍යය** යන සතර චතුරාර්‍ය්‍ය සත්‍යයයි. **තත්ථ පුරිමානි ද්වෙ සච්චානි වට්ටං පච්ඡිමානි ද්වෙ විවට්ටං** මෙහි මෙකී සතරකාර සත්‍යයන් ගෙන් මුල් දුක්ඛ, සමුදය සත්‍ය දෙක වට්ට සංඛ්‍යාත සසර ඇසුරු කරත්. පසුව කී නිරොධ මාර්ග සත්‍ය දෙක විවට්ට සංඛ්‍යාත නිර්වානය සාක් කරත්. දුක්ඛ සමුදය සත්‍ය දෙක දැන හැඳින මෙය සසරෙහි දෘශ්‍යමාන (පෙනෙන) දුක් හා දුක් හට ගැණීමේ උපායයයි. අවබොධකොට ගෙණ කම්ස්ථානයන් පුරුදු පුහුනු

කාරමින් මුත සංඛ්‍යාත සසරෙහි ලැග වසත්. විවට්ට නම් ලද නිර්වාණයෙහි එබඳු ලැගීමක් ප්‍රමාදයක් නම් නැත. එනිසාම විවට්ටයයි ප්‍රකාශිතය.

මුල් **දුක්ඛ සමුදය** සත්‍ය දෙක මෙසේ සලකන්න. **පඤ්චක්ඛන්ධා දුක්ඛං, තණ්හා සමුදයො** පඤ්චස්කන්ධය දුකයි. නැතිනම් දුක්ඛ සත්‍යයයි. තෘෂ්ණාව (තණ්හාව) සමුදයයි හෙවත් සමුදය සත්‍යයයි. මෙකී සත්‍ය දෙක උගෙන නැවත නැවත තේරුන් ගෙන මෙහි ඇති ආදීනව සලකමින් ක්‍රියාකරයි. ඒ අනුව සමුදය සත්‍යය දශීණීයය, කාමණීයය, මනවඩන්නීය. මාර්ග සත්‍යයද දශීණීයය, කාමණීයය, මනවඩන්නීයයි අසා එය ලබා ගැණීමට උත්සාහ වඩයි. එසේ යම්කිසි යොගාවචරයෙක් ක්‍රියා කරත්ම චතුරාර්‍ය්‍ය සත්‍යයම එකම ප්‍රතිවෙධ ඥණයෙන් ප්‍රතිවෙධ කර ගණියි. එකම අවබොධ ඥණයෙන් අවබොධ කර ගණියි.

දුක්ඛ සත්‍යය–දැනගත යුතුය–අවබෝධකර ගත යුතුයයි–
තේරුන් ගත යුතුයි.

සමුදය සත්‍යය–ප්‍රහාණය කළ යුතුය–වැනසිය යුතුය–
නැතිකළ යුතුයයි–තේරුන් ගත යුතුයි.

නිරොධ සත්‍යය–සාක්ෂාත් කටයුතුය–ප්‍රත්‍යක්ෂ කටයුතුය–
පැමිණිය යුතුයයි–තේරුන් ගත යුතුයි.

මාර්ග සත්‍යය–භාවනා කිරීමෙන්–වැඩීමෙන්–ප්‍රයත්නයෙන්
කටයුතුයයි–තේරුන් ගත යුතුයි

මෙසේ දුක්ඛ සමුදය සත්‍ය දෙක පූර්වභාගයෙහි (මුල් අවස්ථායෙහි) උද්ග්‍රහණය (ඉගෙණ ගැණීම) පරිපුච්ඡාව (නැවත නැත විසඳ දැන ගැණීම) ශ්‍රවනය (ධම්ධරයන් වෙතින් ඇසීම) ධාරණ (ඒ අසාගත් අයුරු මතක තබාගැණීම) සම්මශීනය (විමසාබැලීම) ආදි වශයෙන් ප්‍රතිවෙධ කටයුතු වෙත්. නිරොධ මාර්ග සත්‍ය දෙක ඇසීම ප්‍රතිවෙධ කිරීම් පමණක්ම වෙත්. (අසා පිළිපැද ප්‍රත්‍යක්ෂ කර ගැන්ම පමණකි) අපර භාගයෙහි හෙවත් සත්‍යාවබෝධයට ආසන්න භාගයෙහි දුක්ඛ, සමුදය, මග්ග යන තුන් තන්හි කෘත්‍ය වශයෙන් ප්‍රතිවෙධයම පමණකි. නිරොධ සත්‍යය අරමුණු ගැණීම පමණී. මෙහි සියල්ලම දුක්ඛය, සමුදය, නිරොධය, මාර්ගය යන සතර සත්‍යයම ප්‍රතිවෙධ කරණ ඥණය ලෝකෝත්තරයි. මේ සත්‍යයන් පිළිබඳව ඇසීම්, දැරීම්, විමසීම් ඥණය ලෞකිකයි. කාමාවචරයි. මින් නිරොධ මාර්ග සත්‍ය දෙක දුද්දසයි. හෙවත් පැහැසින් දැකීමට දුෂ්කරයි. දැකීමට දුෂ්කර බැවින් අවබෝධ

කරගැණීමද දුෂ්කරයි. එනිසාම ගැඹුරුයි තර්කානුකූලව තීරණයකට බැස ගත නොහැකියි. දුක්ඛ සත්‍යය උපන්දා පටම ඉබේටම වැටහේ. අත්පා ආදී අවයව කනු මුල්වල හැපීමෙන්ද කටු ආදිය ඇනීමෙන්ද අහෝ දුකයි, අනේ දුකයි යන බස් එකැවරටම මුවින් පිටවෙත්. එනිසා දුක්ඛ සත්‍යය ප්‍රකටයි. සමුදය සත්‍යයද එසේම ප්‍රකටයි. සමුදය සත්‍ය නම් තණ්හාවයි, ආසාවයි, කැමැත්තයි. කන්ට කැමැත්තෙමි, බොන්ට කැමැත්තෙමි ආදී වශයෙන් නිතර භාවිතා වන තණ්හාව ඇති බැවින් සමුදය සත්‍යයද ප්‍රකටයි. අනික් නිරොධ මාර්ග සත්‍ය දෙක එසේ නොවේ දකින්ට අවබෝධ කරන්ට අපහසුයි ගැඹුරුයි කෙසේදයත් අත දික්කර භවාග්‍රය අල්ලන්ට ලැස්තිවන්නාසේද අව්විය රස්නෙද කියා බලන්ට පය දික්කරන්නාසේද සියක්වර පලාගත් ලොම්ගසක දෙකොන ගෙණ එකට පහන්න උත්සාහ කරන්නාක්මෙන්ද අතිශය අමාරු දුෂ්කර වැඩකි. එසේ දුද්දස බැවින්ද දුරනුබොධ බැවින්ද ගැඹුරු බැවින්ද පූර්ව භාගයෙහි ඥාණය උපදවා ගැණීම සඳහා මෙය දුක පිළිබඳ ඥාණය මෙය දුක හටගැණීම පිළිබඳ ඥාණය මෙය දුක නැතිකර ගැණීම පිළිබඳ ඥාණය මෙය දුක නැතිකරලීමේ මාර්ගය පිළිබඳ ඥාණයයයි. පූර්ව භාගයෙහි වෙන්කොට දෙශනා කරණ ලදි. ඒ සියල්ල පූර්ව භාගයෙහි ලෞකිකයි. ප්‍රතිවෙධ ක්ෂණයෙහි මෙය එකම ප්‍රතිවෙධ ඥාණයම බැවින් එය ලොකොත්තරයි.

මෙහිලා අනික් ක්‍රමය කුදු ඇත.

**චතුබ්බිධං සච්චසු ඤාණං—සුතමය ඤාණං—වවත්ථාන ඤාණං—සම්මසන ඤාණං—අභිසමය ඤාණන්ති** චතුරාර්‍ය සත්‍යාවබෝධ ඥාණය සතරාකාර වේ. එනම් :- ශ්‍රැතමය ඥාණය, ව්‍යවස්ථාන ඥාණය, සම්මර්ශන ඥාණය, අභිසමය ඥාණය යන සතරයි.

1. සුතමය ඥාණය— **කතමං සුතමය ඤාණං? සංඛිත්තෙන වා විත්ථාරෙන වා චත්තාරි සච්චානි සුත්වා ජානාති ඉදං දුක්ඛං අයං දුක්ඛ සමුදයො අයං දුක්ඛ නිරොධො අයං මග්ගොති ඉදං සුතමය ඤාණං** එහි සුතමය ඥාණය කුමක්ද? සංක්ෂෙප වශයෙන් හෝ (ලුහුඬු අදහසින් හෝ) විස්තර වශයෙන් හෝ චතුරාර්‍ය සත්‍යය අසා දැනීද මෙය දුකය මේ දුක් හටගන්නා විධියය. මේ දුක් නිරුද්ධවන ක්‍රමයය. මේ ඊට මාර්ගය යනාදී ක්‍රමයට සංක්ෂෙප වශයෙන් හෝ විස්තර වශයෙන් හෝ අසා දැන ගැණීම ශ්‍රැතමය ඥාණයයි.

2. වවත්ථාන ඥාණය— **කතමං වවත්ථාන ඤාණං? සො සුතානං අත්ථං උපපරික්ඛති ධම්මතොච ලක්ඛණතොච ඉමෙ ධම්මා**

**ඉමෙසං යෙව පරියායෙන ඉමස්ස සච්චස්ස ඉදං ලක්ඛණන්ති සන්නිට්ඨානං කරොති ඉදං වවත්ථානෙ ඤාණං** වවත්ථාපන ඥානය නම් කවරිද? හෙතෙම සුතමය ඥානයෙන් ඇසූ දෑ අර්ථ වශයෙන් නැවත නැවත පරීක්ෂා කරයිද, ධර්ම වශයෙන් හා ලක්ෂණ වශයෙන් පරීක්ෂා කරයිද මේ ධර්මයෝ මේ සත්‍යයෙහි අන්තර්ගතය. මේ සත්‍යයාගේ මෙබඳු ලක්ෂණ ඇතිවෙත්. ආදි වශයෙන් ලකුණු කර ගණීත්ද, සනිටුහන් කරත්ද මෙලෙසින් කරණ සලපනාව වවත්ථාන ඥානයයි.

3. සම්මර්ශන ඥානය– **කතමං සම්මසනෙ ඤාණං? සො එවං යථානු පුබ්බං චත්තාරි සච්චානි වවත්ථපෙත්වා අථ පුබ්බමෙව– ගහෙත්වා යාවගොත්‍රභු ඤාණං අනිච්චතො දුක්ඛතො අනත්ත– තො සම්මසති ඉදං සම්මසනෙ ඤාණං.**

ඒ යොගාවචර තෙම සුතමය ඥානයෙන් වවත්ථාන ඥානයෙන් කී පිළිවෙළින් චතුරාර්‍ය සත්‍යයන් ව්‍යවස්ථාපනයකොට වෙන්–කොට නැවත දුකම ගෙණ ගොත්‍රභූ ඥානය දක්වා අනිත්‍ය වශයෙන්ද දුක් වශයෙන්ද අනාත්ම වශයෙන්ද සම්මර්ශණය කරයිද සිහිකරයිද මෙය සම්මසන ඥානයයි දත යුතුයි.

4. අභිසමය ඥානය– කතමං අභිසමය ඤාණං? ලොකුත්තර මග්ගක්ඛණෙ එකෙන ඤාණෙන චත්තාරි සච්චානි අපුබ්බං අචරිමං අභිසමෙති දුක්ඛං පරිඤ්ඤාභි සමයෙන සමුදයං පහානාභි සමයෙන නිරොධං සච්ඡිකිරියාභි සමයෙන මග්ගං භාවනාභි සමයෙන අභිසමෙ තීති ඉදං අභිසමය ඤාණං අභිසමය ඥානය නම් කවරිද? ලොකොත්තර මාර්ග ක්ෂණයෙහි එකම ඥානයකින් චතුරාර්‍ය සත්‍යයම පෙර පසු නොවී අවබෝධවේද දුක දැනගැණීම් ඥාන–යෙන්ද සමුදය ප්‍රහාණය කිරීම් ඥානයෙන්ද නිරෝධය සාක්ෂාත් කිරීම් ඥානයෙන්ද මාර්ගය භාවනා කිරීම් ඥානයෙන්ද අවබෝධ කර ගණිත්නුයි මෙය අභිසමය ඥානය නම්වේ.

ආර්‍ය මාර්ගාඞ්ග අට පිළිබඳව හා එම අඞ්ග අටම ප්‍රකාශිත චතුරාර්‍ය සත්‍යය පිළිබඳවද ඉතාම ලුහුඬු විස්තරයක් වෙසෙසින් මෙහිලා අතිරේක වශයෙන් අපි සිහිකෙළෙමු. විස්තර යෙසින් බොහෝවූ මෙම ධර්මයන් පිළිබඳව එකක් පාසාද ප්‍රමාණවත් ප්‍රදේශ–යක් පළවෙනවා ඇත. ඉන්ද සෑහේයයි අපි නොසිතමු. කෙසේ විස්තරයක් ලිවත් මෙබඳු ලුහුඬු ග්‍රන්ථයකින් කිසිසේත් නොදැක්විය හැකි මෙම ගාම්භීර ධර්මයන්ගේ අදහස් තව බොහෝ පත පොත බැලීමෙන් හා ධර්මධරයන් සෙවීමෙන් තේරුන්කර ගැණීමට හා පිළිපැද සසර බිය දුරලීමට ප්‍රොත්සාහී වන ලෙස සිහිපත් කරවමු.

**සියළු සත්වයෝ නිදුක් වෙත්වා!**

# සම්මා සඞ්කප්පය.

## (සම්‍යග් සඞ්කල්පය මාතෘකා කොට)

**අතිගරු මොරගල්ලේ සිරි ඤාණොභාසතිස්ස ස්වාමීන්ද්‍රයන්**
වහන්සේ විසින් පවත්වන ලද

## ධර්මදේශනාව.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

**කතමො චාවුසො සම්මා සඞ්කප්පො**
**නෙක්ඛම්ම සඞ්කප්පො**
**අව්‍යාපාද සඞ්කප්පො**
**අවිහිංසා සඞ්කප්පො**
**අයං වුච්චතාවුසො සම්මා සඞ්කප්පො.**

**සැදැහැවත් පින්වත්නි,**

අද දින ධර්මදේශනාව සඳහා අපට ආරාධනා පිළිගන්වා තිබෙන්නේ **ආර්‍ය්‍ය අෂ්ටාංගික** මාර්ගයෙහි දෙවන ආර්‍ය්‍ය මාර්ගය වූ **"සම්මා සඞ්කප්පය"** (=සම්‍යග් සඞ්කල්පය) පිළිබඳවයි. ඒ මාතෘකාව යටතේ මෙහි දැක්වූ පාළි පාඨය විස්තර කරදීමට මත්තෙන් කරුණක් මතක් කිරීමට අදහස් කරමි.

වර්ෂයක් පාසා ඒ ඒ ස්වකීය ස්ථානයන්හි කරගෙන එන පින්කම් පඞ්ක්තියක් මේ වර්ෂයෙහි **උඩයසේකරපුර** මේ **අභිනවා-රාමයෙහි** පවත්වන්නේ ශාසනාභිවෘද්ධියෙහි නිරතව වැඩ විසූ ගරු කටයුතු **මොරමුවේ සිරි අරියවංසාභිධාන** මහා ස්ථවිර පාදයන් වහන්සේගේ ගුණානුස්මරණය පිණිස බව සඳහන්ව තිබේ. උන් වහන්සේගේ උගත් ශිෂ්‍යවරයෙක්වූ **මොරමුවේ සිරි සාසනවංස** ස්ථවිර තුමන්ගේ අනුශාසකත්වයෙන් ඇරඹුන මේ උසස් පින්කම් පඞ්ක්තිය බොහෝදෙනාට දෙලෝ හිත-සැප පිණිස පවත්නා බව සතුටින් මතක් කරමි.

ධර්මශ්‍රවණය සම්බන්ධයෙන්ද දැන් වචන ස්වල්පයක් කිවයුතුව තිබේ. ඒ සියලු ධර්මදේශකයන් වහන්සේගෙන්ම ඉටුවිය යුතු කමකි. ධර්මශ්‍රවණය කරනු කැමැතිව පැමිණි බණ පිරිසගේ සිත් ධර්මයට අවනත කරවීම ධර්මදේශකයන් වහන්සේ විසින්ම කටයුතු

වෙයි. යම් බණ පිරිසක් ධර්මශ්‍රවණයෙහි අනුසස් සලකා සැදැහැයෙන් බණ අසතොත් ඔවුන්ගේ සිත් ධර්මයෙහි ඇලෙත්. දහම් අසන්නෝ-දහම් අවබෝධකරගන්නෝ-දහමට අනුව පිළිපදින්නෝ ඔහුමය.

බුදුරජාණන් වහන්සේ පවා දහම් වදාරන කල්හි බණ පිරිස ශ්‍රවණය කරනු ලබන ධර්මයට අවනත කරවා සිතැලවීම සඳහා **"තං සුණාථ සාධුකං මනසිකරොථ"** යනුවෙන් දහම් දෙසුමට පෙරු අවවාද දී වදාළසේක. එහි තේරුම **"ඒ දහම් අසන්න, මොනවට මෙනෙහි කරන්න"** යනුයි. එයින් පෙනෙන්නේ බණ පිරිසගෙන් ඉටුවිය යුතුවූද ධර්මශ්‍රවණය මුදුන් පමුණුවා ගත යුතුවූද වැදගත් කරුණු දෙකකි. බණ **ඇසීමත් හොඳට මෙනෙහි කිරීමත්ය.**

බණ ඇසීම **නම්** ශ්‍රවණය කරනු ලබන ධර්මයට ගරුකොට එකඟ සිතින් ආදරයෙන් කන් නතුකිරීමයි. මෙනෙහි කිරීම නම් ඒ ධර්මය සිත්හි දරා නැවත නැවත මෙනෙහි කිරීමයි. සිත්හි දරා පිළිපැදීමෙන් කල් යැවීමයි. **"යොනිසො මනසිකාර"** කියනු ලබන්නේ එයට මැයි. එහි තේරුම **"නුවණින් මෙනෙහි කිරීම"** යනුයි. නුවණින් මෙනෙහි කරන සැදැහැවතුනට ධර්මය වැටහෙයි. මොනවට අවබෝධ කරගත හැකිවෙයි. ධර්මයට අනුව පිළිපැදීමද ඒ සැදැහැවතුන්ගෙන්ම සිදුවෙයි. ධර්මශ්‍රවණයෙන් නියම ඵල ලබන්නෝ ඒ සැදැහැවත්හුමය.

මේ පහත දැක්වෙන කරුණු පස ධර්මශ්‍රවණයෙහි ආනිශංස වශයෙන් සැලකිය යුතුයි.

**අස්සුතං සුණාති**
**සුතං පරියොදපෙති**
**කඞ්ඛං විතරති**
**දිට්ඨිං උජුං කරොති**
**චිත්තමස්ස පසීදති**

නො අසන ලද (නොඑක්) ධර්ම මාර්ගී ඇසීමය. අසන ලද ධර්මය පිරිසිදු කිරීමය. මොනවට තේරුම් ගැනීමය. (යම් යම් දේ ගැන ඇතිවූ) සැක දුරු කිරීමය. (තුනුරුවන් කෙරෙහි විශ්වාසයයි සැලකෙන) දෘෂ්ටිය සෘජුකිරීමය. බණ අසන්නාගේ සිත (වඩ වඩා) පැහැදීමය. සැදැහැ සිත දියුණුවීමය.

යන මේ කරුණු පස ධර්මශ්‍රවණයෙහි අනුසස් වශයෙන් සැලකිය යුතුයි. ධර්මය ආදරයෙන් මනාව ශ්‍රවණයකොට සිත දරාගෙන ඒ ධර්මයට අනුව පිළිපදින පින්වතුන්ට දෙව් මිනිස් සැප හා අමාමහ නිවන් සැප සිද්ධකර ගැනීමට හැකිවෙයි එහෙයින් මේ බණ පිරිසට ඉතා හොඳින් ධර්මශ්‍රවණයකොට ඒ ධර්මයට අනුව පිළිපදින ලෙස කරුණාවෙන් දැනුම් දෙමි.

අප දැන් අදහස් කරන්නේ "**සම්මා සඞ්කප්පය**" ගැන මේ සැදැහැවත් පින්වතුන්ට කරුණු සවල්පයක් තේරුම් ගත හැකි පරිදි දේශනා කිරීමටයි.

**කතමො චාවුසො සම්මා සඞ්කප්පො**
**නෙක්ඛම්ම සඞ්කප්පො**
**අබ්‍යාපාද සඞ්කප්පො**
**අවිහිංසා සඞ්කප්පො**
**අයං වුච්චතාවුසො සම්මා සඞ්කප්පො**

මේ බණ පිරිසට ධර්මදේශනා කිරීමට මාතෘකා වශයෙන් තබා ගන්ට යෙදුනේ සූත්‍ර පිටකයෙහි **සච්ච විභඞ්ග** සූත්‍රයෙහි වදාළ පාළි ප්‍රදේශයකි.

ඒ වනාහි දුඃඛ සත්‍ය–දුඃඛ සමුදය සත්‍ය–දුඃඛ නිරෝධ සත්‍ය –දුඃඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදාර්‍ය සත්‍ය යන චතුරාර්‍ය සත්‍ය ධර්මද ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහි සම්‍යග් දෘෂ්ටියද වදාරා අනතුරුව "**සම්මා සඞ්කප්ප**" දේශනාව සඳහා වදාළ පාඨයයි. ඒ දේශනා පාඨය විස්තර කරදීමට පළමු මේ බණ පිරිස විසින් විශේෂයෙන් දැනගත යුතු කරුණු සවල්පයක් සැකෙවින් කියාදීමට අදහස් කරමි.

අප භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්සේ **බරණැස් නුවර මිගදාය** නම් ලද **ඉසිපතනාරාමයෙහි** වැඩ වාසය කරන කල්හි එක් දවසක හික්ෂූන් වහන්සේට ආමන්ත්‍රණයකොට මෙසේ වදාළසේක.

**තථාගතෙන භික්ඛවෙ අරහතා සම්මා සම්බුද්ධෙන බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මිං. යදිදං චතුන්නං අරිය සච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං.**

මහණෙනි! අභීත්වූ සම්‍යග් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ විසින් බරණැස් නුවර මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහිදී ලොකයෙහි ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහමණයකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහමයකු විසින් හෝ අන් කිසිවකු විසින් හෝ (නැවත) නොපැවැත්විය හැකිවූ යම් මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ ප්‍රකාශ කිරීමය. දේශනා කිරීමය. පැණවීමය. තැබීමය. විස්තර කිරීමය. විභාග කිරීමය. අති ප්‍රකට කිරීමය යන ශ්‍රෙෂ්ඨවූ ධර්මචක්‍රය පවත්වන ලද්දේයයි වදාළසේක.

**දුක්ඛ–සමුදය–නිරොධ–මග්ග** යන ආර්‍ය්‍ය සත්‍ය ධර්ම සතර පිළිබඳවම මෙපරිද්දෙන් වදාරා අනතුරුව මෙසේ වදාළසේක.

**සෙවෙථ භික්ඛවෙ සාරිපුත්ත මොග්ගල්ලානෙ භජථ භික්ඛවෙ සාරිපුත්ත මොග්ගල්ලානෙ පණ්ඩිතා භික්ඛූ අනුග්ගාහකා සබ්‍රහ්මචාරීනං සෙය්‍යථාපි භික්ඛවෙ ජනෙත්ති එවං සාරිපුත්තො සෙය්‍යථාපි ජාතස්ස ආපාදෙතා එවං මොග්ගල්ලානො සාරිපුත්තො භික්ඛවෙ සොතාපත්තිඵලෙ විනෙති මොග්ගල්ලානො උත්තමත්ථෙ විනෙති.**

මහණෙනි! **සාරිපුත්ත–මොග්ගල්ලාන** යන දෙනම (චතුරාර්‍ය්‍ය සත්‍ය හා ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ග ධර්මයන්ගේ දැනගැන්ම හා අවබෝධය පිණිස) සේවනය කරන්න. මහණෙනි! සාරිපුත්ත–මොග්ගල්ලාන දෙනම (චතුරාර්‍ය්‍ය සත්‍ය හා ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ග ධර්මයන්ගේ දැනගැන්ම හා අවබෝධය පිණිස) භජනය කරන්න. බඹසර ඇත්තවුන්ට පණ්ඩිතවූ භික්ෂූහු (ආමිස සංග්‍රහ–ධර්ම සංග්‍රහ යන දෙකින්) අනුග්‍රහ කරන්නාහුය. මහණෙනි! වැදූ මව් යම්සේද සැරියුත් තෙරද එබඳුමය. උපන්නා හට යම්සේ පෝෂ්‍ය කරන්නාහුද මුගලන් තෙරද එබඳුමය. මහණෙනි! සැරියුත් තෙර සෝවාන් ඵලයෙහි (සත්ත්වයන්) හික්මවයි. මුගලන් තෙර අර්හත් ඵලයෙහි (සත්ත්වයන්) හික්මවයි.

මෙසේ බුදුරජාණන් වහන්සේ චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන්ගේද ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ග ධර්මයන්ගේද දැනගැන්ම හා අවබෝධය පිණිස **සාරිපුත්ත–මොග්ගල්ලාන** යන දෙනම සේවනය කරන්න. භජනය කරන්න. පණ්ඩිතයයිද වැදූ මවු බඳුයයිද (රැස්වූ) භික්ෂූන් වහන්සේට විශේෂයෙන් ඒ දෙනම හඳුන්වා වදාරා විහාරයට වැඩිසේක.

බුදුරජාණන් වහන්සේ විහාරයට වැඩි පසු සැරියුත් මහ තෙරුන් වහන්සේ දහම් අස්නෙහි වැඩහිඳ පළමුකොට භික්ෂූන්ට චතුරාය්‍ය සත්‍ය ධර්මය විස්තරකොට දේශනාකොට අනතුරුව ආය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග දේශනාව පටන්ගෙන එහි පළමු වැන්නවූ සම්‍යක් දෘෂ්ටිය දේශනා කිරීම සඳහා **"කතමා චාවුසො සම්මාදිට්ඨි"** (ඇවැත්නි! සම්‍යග් දෘෂ්ටිය කවරිද?) යනුවෙන් සම්‍යග් දෘෂ්ටිය විස්තරකොට වදරා අනතුරුව දෙවැන්නවූ **"සම්මා සඞ්කප්ප"** දේශනාව සඳහා **"කතමො චාවුසො සම්මා සඞ්කප්පො"** යනාදි පාළි ප්‍රදේශය වදාළසේක.

අප විසිනුදු අදදින දෙවැනිවූ ආය්‍ය මාර්ගය වන **"සම්මා සඞ්කප්පය"** දේශනා කිරීමට මාතෘකා වශයෙන් දක්වන ලද්දේ ඒ පාළි ප්‍රදේශය මැයි.

**"කතමො චාවුසො සම්මා සඞ්කප්පො"** "ඇවැත්නි! සම්‍යග් සඞ්කල්පය කවරේද?" යනුවෙන් ඒ දේශනාව සාරනු කැමැතිව පටන් ගැණීමට වදාළ වචනයි. අනතුරුව ඒ සම්‍යග් සඞ්කල්පය **නෙක්ඛම්ම–අව්‍යාපාද–අවිහිංසා** වශයෙන් කොටස් තුනකට බෙදා වදාළසේක.

## නෙක්ඛම්ම සඞ්කප්පො.

නෙක්ඛම්ම සඞ්කල්පය නම් කෙලෙස් මැඩ දුරලනු සඳහා ගිහිගෙන් නික්ම යාමේ යහපත් කල්පනාව(=සිතුවිල්ල)යි. පඤ්ච-කාම සේවනයෙන් බැහැර යාමෙහි පවත්නා මනා අදහස නෛෂ්ක්‍රම්‍ය සංකල්පනාවයි.

## අව්‍යාපාද සඞ්කප්පො.

අව්‍යාපාද සඞ්කල්පය නම් අනුන් කෙරෙහි ක්‍රොධ නොකොට වෛර නැතිව විසීමේ යහපත් කල්පනාවයි. "සියලු සත්හු සැපසේ ජීවත් වෙත්වා. නිදුකින් වැඩෙත්වා" යන මනා සිතුවිල්ල අව්‍යාපාද සඞ්කල්පනාවයි.

## අවිහිංසා සඞ්කප්පො.

අවිහිංසා සංකල්පය නම් සතුන්ට හිංසා පීඩා නොකොට වැළකීමේ යහපත් කල්පනාවයි. සුලු වසයෙන් හෝ දරුණු වසයෙන් කෙරෙන සත්ත්ව හිංසාවෙන් දුරුව විසීමට ඇතිවන මනා අදහස අවිහිංසා සංකල්පනාව වශයෙන් සැලකිය යුතුයි.

**"ආවුසො අයං සම්මා සඞ්කප්පො වුච්චති"** ඇවැත්නි! මේ සම්‍යග් සංකල්පයයි කියනු ලැබේ.

මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහි දක්වෙන්නේ විශේෂයෙන් මැනවින් පිළිපැදිය යුතු උතුම් ධර්ම කොටස් වෙත්.

දුඃඛ සත්‍යයද, දුඃඛ සමුදය සත්‍යයද, දුඃඛ නිරොධ සත්‍යයද පිළිපැදිය යුතු ධර්ම නොවෙත්. මැනවින් අවබෝධ කටයුතු ධර්ම වෙත්. දුඃඛ සත්‍යයෙන් ජාති–ජරා–මරණ (=ඉපැදීම්, දිරීම්, නැසීම්) ආදි දුක් කොටස් මැනවින් තේරුම් ගැන්මද, දුඃඛ සමුදය සත්‍යයෙන් දුක් ඉපැද්මට මුල් හේතුන් මැනවින් තේරුම් ගැන්මද, දුඃඛ නිරොධ සත්‍යයෙන් නිර්වාණයෙහි අවබෝධය මැනවින් තේරුම් ගැන්මද කටයුතුය.

දුඃඛ නිරොධ ගාමිනී ප්‍රතිපදායයි සත්‍යයම භාවිතා කටයුතු-පිළිපැදිය යුතු උතුම් ධර්ම වෙත්. ඒ මාර්ගාඞ්ග අටකින් යුක්තය.

එනම් :—

| | |
|---|---|
| **සම්මා දිට්ඨි,** | **සම්මා ආජීව,** |
| **සම්මා සඞ්කප්ප,** | **සම්මා වායාම,** |
| **සම්මා වාචා,** | **සම්මා සති,** |
| **සම්මා කම්මන්ත,** | **සම්මා සමාධි,** |

යන මේ අටයි.

මේ මාර්ගාඞ්ග අට මැනවින් භාවිතා කිරීමෙන් හා පිළිපැදීමෙන් සියලු සතුනට දිව්‍ය–මනුෂ්‍ය සම්පත් හා අති ප්‍රශස්තවූ නිර්වාණ සම්පත්තියද සිද්ධ කරගත හැකි බව සැලකිය යුතුයි.

මේ සම්‍යග් සඞ්කල්පය දෙවැනි මාර්ගය වූවත් මාර්ගාඞ්ග අටේම මනා පැවැත්මට බෙහෙවින් උපකාර වෙයි. ඒ ඒ මාර්ගයන්හි භාවිතයට ඉතා ප්‍රයෝජන වෙයි. පිළිපැදුම මොනවට තහවුරු කෙරෙයි.

**සම්මා දිට්ඨි** (=මනාකොට දක්ම හෝ යහපත් ලබ්ධිය) නඟා සිටුවන කල්පනාව (=සිතුවිල්ල) වැරැදී ගියොත් **සම්‍යග් දෘෂ්ටිය** **පවා** කෙලෙසීමට පැමිණ බිඳ වැටේ. කල්පනාව නොමගයාම නිසා මිසදිටු විය හැකිය. එහෙයින් **සම්‍යග් දෘෂ්ටිය** තහවුරු කර ගැනීමට හා ස්ථිරව පවත්වා ගැනීමට **සම්මා සඞ්කප්පය** උපකාර වෙයි.

**සම්මා වාචා** (=යහපත් වචන කීම) කෙරෙන්නේ මනා කල්පනාවෙන් යුක්තවමය. කථාකරන වචනවල බොහෝදෙන රුචි කරන ඇලුම් කරන මනොඥතාවය රඳා පවත්නේ යහපත් කල්පනාව උඩ කරන වචනවලටය. එහෙයින් සම්‍යග් වච්නය තහවුරු කරගැනීමට හා ස්ථිරව පවත්වා ගැනීමට සම්මා සඞ්කප්පය උපකාර වෙයි.

**සම්මා කම්මන්ත** (=යහපත් ක්‍රියාවලට) මනා කල්පනාව අවශ්‍යමය. කල්පනාවෙන් කෙරෙන වැඩවල ප්‍රතිඵල අනන්ත බැවිනි. එහෙයින් සම්‍යග් කර්මාන්තය තහවුරු කරගැනීමට හා ස්ථිරව ගෙනයාමට සම්මා සඞ්කප්පය උපකාර වෙයි.

**සම්මා ආජීව** (=යහපත්ව දිවිපෙවෙත පැවැත්වීමට) මනා කල්පනාව අවශ්‍යමය. කල්පනාවෙන් තොරව කෙරෙන දිවි පැවත්ම නිසරු බවට කාලකණ්ණි බවට හා දුකට පමුණුවයි. එහෙයින් සම්‍යග් ආජීවය තහවුරු කරගැනීමට හා ස්ථිරව පවත්වා ගැනීමට සම්මා සඞ්කප්පය උපකාර වෙයි.

**සම්මා වායාම** (=යහපත්ව කරන වීර්‍ය්‍යී) මනා කල්පනාවෙන් කළ යුතුමය. කල්පනාවෙන් තොරව කරන වීර්‍ය්‍යීය නිසරු වීමෙන් (වැඩකට නැතිව යාමෙන්) නියම ප්‍රතිඵල (බලාපොරොත්තු ප්‍රයෝජන) නොලැබිය හැකි වෙයි. එහෙයින් සම්‍යග් ව්‍යායාමය තහවුරු කරගැනීමට හා ස්ථිරව ගෙනයාමට සම්මා සඞ්කප්පය උපකාර වෙයි.

**සම්මා සති** (=යහපත් සිහිය) මනා කල්පනාවෙන් ඇතිකර ගත යුතුමය. හොඳ කල්පනාවක් නැතිව යහපත් සිහියක් කිසිවකුට ලැබිය නොහැක. කල්පනාව නැති කලැ සිහිය විකලවී කළයුත්ත පවා අමතක වේ. එහෙයින් සම්‍යග් ස්මෘතිය තහවුරු කරගැනීමට සම්මා සඞ්කල්පය උපකාර වෙයි.

**සම්මා සමාධි** (=යහපත්ව සිත්හි ඇතිවන එකඟ බව) මනා කල්පනාවෙන් ලැබිය යුත්තකි. හොඳ කල්පනාවක් නොමැතිව සිත්හි යහපත් එකඟ කමක් නොලද හැකිය. එහෙයින් සම්‍යග් සමාධිය තහවුරු කරගැනීමට හා ස්ථිරව පවත්වා ගැනීමට සම්මා සඞ්කල්පය උපකාර වෙයි.

මේ මාර්ගාඞ්ග සතම මනොඥ ලෙස නඟා සිටුවීමටත් වඩ වඩා දියුණු කරගැනීමටත් ඉතා උපකාර වන්නේ සම්මා සංකල්පයම බව මෙහි සැකෙවින් දක්වුනා පරිද්දෙන් මේ සැදැහැවතුන් තේරුම් ගන්ට ඇතැයි සිතමි.

**"තීහි පි චෙතනාහි යථා පටිපාටියා නෙක්ඛම්ම සඤ්ඤා-අව්‍යාපාද සඤ්ඤා-අවිහිංසා සඤ්ඤාති-ඉමා තිස්සො සඤ්ඤා යො හොන්ති"**

"අලොභ-අදොස-අමොහ යන තුන් කුසල් මුල් හේතුකොටම පිළිවළින් නෛෂ්ක්‍රම්‍ය සංඥවය – අව්‍යාපාද සංඥවය – අවිහිංසා සංඥවය යන මේ ත්‍රිවිධ සංඥවෙන්" යනු එහි අදහසයි.

## නෙක්ඛම්ම සඤ්ඤාව.

නෛෂ්ක්‍රම්‍ය සංඥව නම් කම්සැප හැර ගිහිගෙන් නික්මෙන හැඟීමයි. එය හට ගැනෙන්නේ අලොභ චෙතනාව මුල්වමය. පස්කම් සැප පිළිකුල්කොට වස්තුකාම කෙලශකාමයන් දුරුකොට වනයට හෝ පැවිද්දට තපස් රැක්ම සඳහා නික්මීමට ඇතිවන යම් කිසි හැඟීමක් වේනම් ඒ නෛෂ්ක්‍රම්‍ය සංඥවයයි දතයුතු.

බෝසත් **මඛාදෙව රජකුමාට** අපමණ රජ සැප හැර දමා වනයට ගොස් පැවිදිව තපස්කිරීමට නෛෂ්ක්‍රම්‍ය සංඥව ඇතිවූයේ ආලොභ චෙතනාව මුල්වමය. ඒ හිසෑ එකම නර කෙසක් (=පැසුණු කෙස් ගසක්) දැකීමෙන්ය. එක නරකෙසක් තබා මුළු ඔලුවම පුලුන්සේ නර කෙස් (=සුදු) වුව ඒ ගැන නොසලකා නොබලාත් අඹු-දරු-ගේදොර - ඉඩකඩම්-රන්-රිදී-මුතු-මැණික් ආදි නොඑක් ඉසුරට මසුරුව සිට මරණයට පත් වෙතත් වනයට ගොස් හෝ පැවිද්දට පැමිණ තපස් රැක්මට සංඥවක් (=හැඟීමක් -කල්පනාවක්) මෙකල කිසිවෙකුට ඇති බව නොපෙනේ.

**රේවත කුමරුට** නෛෂ්ක්‍රම්‍ය සංඥව ඇතිවූයේ විවාහ මඟුල්ද සිය පෙම්වත් කුමරි සමඟ අත්හත ගෙන සිටි අවස්ථාවෙහිදීමය. ඒ කථා ප්‍රවෘත්තිය බොහෝදෙන ඇසීමට කැමැති ඇති බැවින් සැකෙවින් දක්වමු.

රජගහනුවරට නුදුරුව පිහිටි උපතිස්ස බමුණු ගමැ දෙවූ බමුණු-බැමිණියන්වූ **උපතිස්ස-සාරී** යන දෙමාල්ලනට **උපතිස්ස -චුන්ද-උපසේන-රේවත** යන කුමරුන් සිවුදෙනෙක් හා **චාලා උපචාලා-සිසූපචාලා** යන කුමරියන් තුන්දෙනෙක්ද වූහ. දෙවූ කුමරු බුදුසස්නෙහි මහණව (පියා නමින්) උපතිස්සයයිද (මවු නමින්) සාරිපුත්තයයිද පසිදු විය. බොහෝවිට **සාරිපුත්ත** නමින්ම හැඳිනුණ ඒ අගසවු තෙරුන්ගේ උවදෙස් ඇසුරු කළ **චුන්ද -උපසේන** යන සොහොයුරෝද **චාලා-උපචාලා-සිසූපචාලා** යන

සොහොයුරියෝද පැවිදිව රහත් වූහ. පවුලේ සත් අසූකෙළක් පමණවූ මහ ඉසුරට හිමිවූයේ ඒ පවුලෙන්ම බාල රේවත කුමරු පමණකි.

ඒ පවුලේ මෑණියෝ රේවත කුමරුත් මහණ වුවොත් පරපුරත් ඉසුරුත් නැසෙයි සිතා ඒ කුමරුට උසස් කුලවත් කුමරියක් සරණ කරදීමට සූදානම් වූහ. රේවත කුමරු වයසින් කුඩා වුවත් වැඩුණු නුවණැත්තෙකි. විවා මඟුල් සිදුකළ වේලෙහි දෙපස නෑයෝ උදන් අණමින් ''මේ කුමර–කුමරියෝ මේ මුත්තණු–මුත්තණියන්සේ දිගාසිරි විඳිත්වා''යි කීහ. ඒ නෑණවත් කුමරු නෙත් කොණින් බලා ''මුහුණ රැළි ගැසී හොකු හැකිළී දත් වැටී හිස පැසී පුලුන් ගොඩක්සේ වී ඇඟ සැම්තැන රැළිගැසී ගිය වකු ගැසුණු වෙවුලන සිරුරු හා හිස ඇති මේ මුත්තණු–මුත්තණියන්සේ සිටීමට මටත් ආසිරි වඩති''යි සිතා මුළු ගිහිගෙටම කලකිරී ගිහි සැප හැරයාමට නෛෂ්ක්‍රම්‍ය සංඥව එකෙණෙහි පහළ විය.

''මාගේ දෙටු සොහොයුරු සොහොයුරියෝ එහි රහස දැන එයින් මිදුණහ. උතුම් මිදුම ජරාවෙන් මිදුම''යයි සිතා ගති. ඔවුන්ගේ ඒ ආසී මඟුල් වදන් රේවත කුමරුට සසර ගැලවුමට බණක් මෙන්ද ජරාවෙන් වැහිරුණු සිරුරු දැක්ම නෛෂ්ක්‍රම්‍ය සංඥවට පෙර නිමිත්තක් මෙන්ද විය. එතැන් සිට රේවත කුමරුට ඇතිවූයේ බලවත් කලකිරුමකි. විවාපත් යුවල එකම මඟුල් රියක එකට හිඳ අන් රියවලින් පිරිවැරුණු නෑ පිරිස් සමඟ මඟුල් උළෙලෙන් මාළිගය කරා එන කලැ කුමරු කාම්රස රිසියෙන් නෙත් කොණින්වත් කුමරි දෙස නොබැලීය.

**රේවත කුමරු** මඟුල් රියෙන් පැනයාමට ඉඩකඩ හා වේලාව සොයමින් මඟ දෙපස පිරික්සා බලයි. එක් වන පෙදෙසක අතරැ මඟැ මඟුල් රිය නවතා සිරුරු කිස සඳහා රියෙන් බැස යන ගමනක්සේ හඟවා රියෙන් බැස වන මැදින් පලා ගියේ මහත් වේගයෙනි. බොහෝදුර ගිය පසු තිස් නමක් පමණ භික්ෂූන් භාවනාවෙහි යෙදී වෙසෙන තැනක් දැක ඉතා සතුටින් එතැන්හි පැමිණ මහණකම අයැදීය. කුමර ඇඳුමෙන් (මඟුලට) සැරැසී සිටි ඒ කුමරුගේ විලස් දුටු ඒ භික්ෂූහු ''රජ කුමරෙකැයි හෝ සිටු කුමරෙකැ''යි සිතා ඒ අයැදුම ඉටු නොකළ හැකි බව දැන්වූහ. ඒ තෙරන්ගේ බියසුලුකම දුටු කුමරු ''මා මහණකිරීමට මැලිවෙත් නම් මාගේ දෙටු සොහෝයුරුවූ **සාරිපුත්ත** තෙරුන් වෙත යවනු මැනව''යි කීයේය. ඒ ඇසූ ඒ භික්ෂූහු ''සැරියුත් මහ තෙරුන්

විසින් රේවත කුමරු පැවිදිවීමට කැමැත්ව අයදුවොත් පැවිදි කළ යුතුය''යි කලින් කරන ලද නියමය ඉතක්වී මහණ කළහ. එතැනින් කිහිරි වනයට වැඩ විදර්ශනා භාවනා වඩා රහත් වූහ. නෛෂ්ක්‍රම්‍ය සංඥව ඇතිවූ කල්හි නුවණැති අය කලකිරී මේ අන්දමින් සිය අදහස් මුදුන් පමුණුවා ගනිති. නුවණ මඳ අයට ඒ හැඟීම් දියුණු කරගත නොහැකිය.

## අව්‍යාපාද සඤ්ඤව.

අව්‍යාපාද සංඥව නම් ද්‍රෝහ (දරුණු) සිතිවිලිවලින් දුරුවන හැඟීමයි. එය ඇතිවන්නේ අවෛෂ චේතනාව මුල්වය. "සියලු සත්හු නිදුක්–නිරෝගි–සුවපත් වෙත්වා'' යනුවෙන් මෙත් සිත් වැඩීම සිත්හි දියුණුකොට වයිර නොකොට විසීමේ යම් හැඟීමක් ඇතිවේද ඒ අව්‍යාපාද සංඥව බව දතයුතුයි.

ක්‍රෝධ චේතනාවෙන් දුරුවූ යම්කිසි හැඟීමක් ඇතිවේනම් ඒ අවෛෂයයි. මෛත්‍රි–කරුණා–මුදිතාදි ගුණ හා ප්‍රඥවත් දියුණු වන්නේ අවෛෂ සංඥී පුද්ගලයාහටමය. වෛෂ සඥී පුද්ගලයාගේ ක්‍රෝධයද එනිසා හටගත් වයිරයද පළිගැනීම්ද දියුණු වෙයි. භවයක් භවයක් පාසා ඒ ක්‍රෝධය ගෙනයයි. ආතම සිය දහස් ගණනකදී–ත් ඒ ක්‍රෝධය අත නොහැරීම නිසා එහි අති දරුණු විපාක විඳීමට සිදුවන බව පෙනේ. වෛෂ (–ක්‍රෝධ) ය සියලු අපරාධයන්ට ආකරයකි. "**නත්ථි දොස සමො කලි**'' "වෛෂය හා සමවූ අපරාධයෙක් නැතැයි යන බුඩ වචනයෙන්ද එ බැව් පැහැදිලි'' වේ.

එහෙයින් ක්‍රෝධ ශීලී පුද්ගලයා බලවත් අපරාධකාරයකු වන බවද දරුණු විපාකවලට මුණපාන්නකු වන බවද දතයුතුයි. දෙව්දත්තෙර බලවත් අපරාධකාරයකු වූයේත් දරුණු විපාකවලට මුණපාන්නකු වූයේත් ක්‍රෝධ ශීලිත්‍වයම නිසයි. අප මහ බෝසත් තුමා බුදුකුරු දහම් පුරණ කල්හිම දෙව්දත්තෙර අනුවණකම්–කොට වයිර බැඳ ගත්තෙත් වෛෂ සංඥවෙනි. බුදුබවට පැමිණ වදාළ පසුත් බුදුසසුන පැවිදිවත් ඒ වෛෂය සංසිඳුවා ගත නොහැකිව දරුණු අපරාධයන්ට පත්වූ සැටි දක්නා ලැබේ.

ඒ දෙව්දත්තෙර – සුප්‍රබුඩශාක්‍ය රජතුමාගේ පුත්‍රයෙකි බිම්බාබිසොවුන් (–යශෝධරා දේවීන්) ගේ සොහොයුරුය. ගිහි කාලමෙන් බුජරජාණන් වහන්සේට මස්සිනාය. දෙව්දත්තෙර කවදත් ලාබ ලෝබ කැමැත්තෙකි. බුදුකුරුදම්'පුරණ කල්හි පවා බෝසතුන් සමඟ වයිර බැඳගෙන ක්‍රෝධ කිරීමට පටන් ගත්තේ

ලාබ ලෝබකම් නිසාමය. මේ අත්බැව්හි බුදුසසුනේ සම වයස් ඇති අන් කැත් කුමරුන් සමඟ මහණ විය. බුදුරජාණන් වහන්සේ සියලු කල්හිම දෙව්දත් හට සොළේ මෛත්‍රියමය. නමුත් ඔහුගේ වෛෂය මෛත්‍රී නමැති ජලයෙන් සෝදා හැරිය නොහැකි විය. ශ්‍රද්ධාවත්හු දිනපතා බුදුරදුන් හා දෑගසවුවන් අසූ මහ සවුවන් ගරු සැලකිලි දක්වමින් පුදති. දෙව්දත් තෙරුන්ට එසේ කරන කෙනෙක් නැත. තමන්ගේ තනතුරය තේරුම් නොගත් ඒ තෙර ක්‍රෝධයෙන් බැදී පළිගැනීමට සිතුයේ බුදුරදුන් ගෙන් හා අසූ මහ තෙරුන්ගෙන්ය.

**අජාසත්** කුමරු පොළඹවා ගෙන ඒ කුමරුගේ පියාවූද බුදුරදුන්ගේ මහා දායකවූද **බිම්බිසාර මහ රජු** මරවා රජකම කුමරුට ගැනීමටත් බුදුරදුන් නසා තමා (දෙව්දත්) බුදුවීමටත් කුමරු සමඟ ගිවිසගත. මේ ගිවිසුමට ඒ කුමරු බැඳුනේ දෙව්දත් සේම දරුණු ළයැති බැවිනි. අජාසත් කුමරු පියරජු මරා රජය ලත් බැවින් එක් අදහසක් ඉටුවිය. දෙව්දත්හු බුදුවීම සඳහා බුදුරදුන් නැසීමට වැයම් කෙරෙත්. උපා යොදත්. **අජාසත්** රජුගේ නියෝගයෙන් බුදුරදුන් නැසීමට එක්තිසක් පමණවූ රණසූර සෙබල මුළක් පවා යැවී. එය සපල නුවූ කල්හි දෙව්දත් තෙරම **ගිජ්ඣකූළ** පවුවට නැඟී බුදුරජාණන් වහන්සේගේ හිසට ගලක් පෙරළීය. එයින් නැගි ගල්පට්කාව (–ගල් පතුර) කින් බුදුරදුන්ගේ සිරුරෙහි ලේ සෙල්වීමෙක් විය. එයින්ද තෘප්තියකට නොපැමිණ මහ බලැති නාලාගිරි ඇත්රජු පොළඹා එවරත් අදහස ඉටු නොවූ නිසා වෛෂයම බලපවත්වන්ට විය.

මේ කළ හැම්දෙයකින්ම ළහාවූයේ තමන්ගේ පිරිහීමය. නවත් කළ හැකි දෙයකට පෙනුනේ සඟ පිරිස හෙදකිරීම් පමණකි. සඞ්ඝයා හෙදකොට තමාට අවනත පිරිසක් ඇතිකර ගත් නමුත් ඒ පිරිස දේවදත්ත තෙරුන් හැර දැම්මේ වැඩිකල් නොගොස්ය. දෙව්දත් තෙර අසරණ වූයේය. බුදුරජාණන් වහන්සේගෙන් පිළිසරණ සොයන්ට සිතුනේ නවමසක් පමණ බලවත්ව රෝදුකින් පෙළෙන අතරය. ලෙඩ ඇඳේ වැතිරගෙන දවසක් "මට බුදුරදුන් දක්වන්න" යයි නිතර මුවින් පිටවන්ට විය. ඒ බලවත් කැමැත්ත ඉටුකරනු කැමැති අතවැසි කීපදෙනෙක් ගිලන් ඇඳක හොවා ඔසවාගෙන දෙවුරම් වෙහෙර කරා ගෙනගියහ.

දෙවුරමට නුදුරුව පොකුණ ළඟ ඇඳ තබා ඒ අතවැසියෝ පාදෝවනය සඳහා පොකුණට ගියහ. ඒ අතර දෙව්දත් තෙර නැගිට දෙවුරම් වෙහෙර බැලීමට බිම පා තැබූ කල්හි පොළොව

විවර කරගෙන අවීචි මහා නිරයෙහි පතිත විය. වෛෂ සංඥී පුද්ගලයා කවරෙක් හෝ වේවා ඔහු දෙලොවම පිරිහෙන්නකි. වහා දුකට පැමිණෙන්නෙකි. ඒ බැව් උසස් ශාක්‍ය රජකුමාර-යෙක්වූ මේ දේවදත්ත කථාවෙන් පැහැදිලි වේ. මෙලොව නැවෙමින් පිරිහීමත් පරලොව නිරය දුකට පත්වීමත් නොවැළකිය හැකිය. ක්‍රෝධයෙන් යුක්තවීම හා පළිගැනීමට තැත්කිරීම තරම් අශිෂ්ට ගතියක් නොමැත. එහෙයින් මනුෂ්‍ය සන්තාන-යෙන් නොඑක් දරුණු ගති පහළ කරන ක්‍රෝධ සිතිවිලිත් පළි ගැනීම් වසයෙන් හට ගැනෙන සියලු නින්දිත අදහසුත් දුරුකර ලැමට නුවණැතියන් විසින් තරයේ සිතට ගත යුතුයි.

## අවිහිංසා සඤ්ඤාව.

අවිහිංසා සංඥව නම් සතුන් වෙහෙසීම්–හිරිහැර කිරීම්–මැරීම් යන මෙයින් වැළකෙන හැඟීමයි. එය ඇතිවන්නේ අමෝහ චේතනාව මූල්වය. සියලු සතුන් කෙරෙහි කුලුණු–මෙත් සිත් උපදවා හිංසායෙන් වැළකීම සඳහා ඇතිවන හැඟීම අවිහිංසා සංඥවයි.

**සුඛ කාමානි භූතානි**
**යො දණ්ඩෙන න හිංසති**
**අත්තනො සුඛමෙසානො**
**පෙච්ච සො ලභතෙ සුඛං**

සිය කයේ හා සිතේ සැප බලාපොරොත්තු වන යමෙක් නමාසේම (කය සිත දෙකේ සැප කැමැති නොඑක් සතුන් අත්පා -ගල්–දඬු–මුගුරු–සැත් ආදියෙන් හිංසාවට (–වෙහෙසීමට හෝ මැරීමට) නොපමුණුවන්නේ නම් ඒ තැනැත්තා පරලොව සැප ලබන්නේයයි බුදුරජාණන් වහන්සේ වදාළේ ළමා පිරිසකටය.

සැවැත් නුවරදී ළමා පිරිසක් එක්ව තැතිගැනීම් සහිතව සතකුට හිංසා පීඩා කෙරෙති. එදා ඒ වේලාවේ දෙවුරම් වෙහෙර සිට බුදුරජාණන් වහන්සේ පිඬු පිණිස වඩනා අතර මඟදී ළමයින් පිරිසක් එක්ව තැති ගැන්මකින් නොසන්සුන්ව හැසිරෙන බැව් දුටුහ. එතැනට වැඩි බුදුරදුන්ට දකින්ට ලැබුනේ සමහර ළමයි දඬු–මගුරු ගත් අත් ඇතිව සමහර ළමයි ගල්–මුල් ගත් අත් ඇතිව සතකුට කරන තැළීම්–පෙළීම් හිංසාය.

බුදුරදු:— ළමයිනි! ඔය මොකෙක්ද?
ළමයි :— මග දූව කලු නයෙක්

බුදුරදු:— ඔය නයාට දඬු-මුගුරු-ගල්-මුල්වලින් පළන්නේ ඇයි?

ළමයි :— අපව කනවා, කැවොත් විසපත්තුවී මැරෙනවා, ඒ නිසා මේ නයා මරන්ට ඕනෑ.

බුදුරදු:— ළමයිනි! ගෙවලට යන්න. නයාට නොතළන්න. ඔය ළමයින් නොකා නයා කැලයට යාවි.

ළමයි :— බුදුරජාණන් වහන්සේ දෙස ඇස් හෙළා බැලූහ.

බුදුරදු:— ළමයිනි! තුඹලාගේ ඇඟට අතින්-පයින් හෝ දඬු-මුගුරු-ගල්-මුල්වලින් හෝ ගසා පෙළා තළනවාට වේදනා ඇති කරනවාට තුඹලා කැමැතිද?

ළමයි :— නෑ, නෑ, අප කැමැති නෑ.

බුදුරදු:— ඒ ඇයි?

ළමයි :— අපට දුක් වේදනා ඇතිවන නිසා කැමැති නෑ.

බුදුරදු:— තුඹලා දුක් විඳින්න කැමැති නෑ. එසේම මේ සතාත් දුකට කැමැති නෑ. හිරිහැර වේදනා විඳින්ට කොහෙත්ම කැමැති නෑ. තුඹලාසේම සියලු සතුන්ගේ බලාපොරොත්තුව ශරීරයට තැළීම්-පෙළීම් ආදියෙන් කරදරයක් හිරිහැරයක් වේදනාවක් නැතිව සැප විඳින්නයි. එහෙයින් තමන්සේම අන්‍ය සතුනටත් සැප සැලසීම මිනි-සුනට අයිති උතුම් ගතියයි. සත්පුරුෂ කමයි.

බුදුරජාණන් වහන්සේගේ මේ උතුම් අවවාදය මුදුනෙන් පිළිගත් ළමෝ සන්සුන් වූහ. සත්ත්ව හිංසාවෙන් දිවිහෙත්ම වැළකුණාහ.

තවද මිථ්‍යා සංකල්පනාවය, සම්‍යග් සංකල්පනාවයයි දෙකකි. එයින් මිථ්‍යා සංකල්පනාව ගොදුරුකොට ගත් අය ලෞකික-ලෝකෝත්තර ධර්ම සාරය නොලබන බවත් සම්‍යග් සංකල්පනාව ගොදුරුකොට ගත් අයම ඒ ලෞකික-ලෝකෝත්තර ධර්ම සාරය මොනවට ලබන බවත් සඤ්ජය පිරිවැජියා නිමිතිකොට මේ ගාථා දෙකෙන් වදාළසේක.

**අසාරෙ සාරමතිනො**
**සාරෙ චාසාර දස්සිනො**
**තෙ සාරං නාධි ගච්ඡන්ති**
**මිච්ඡා සඞ්කප්ප ගොචරා**

නිසරු දෑයෙහි සරුය යන අදහස් ඇත්තාවූ සරු දෑයෙහි නිසරුය යන අදහස් ඇත්තාවූ වැරදි කල්පනා ගොදුරුකොට ඇත්තාවූ ඒ අනුවණ අය ලෞකික-ලෝකෝත්තර සාර ධර්මයට නොපැමිණෙත් යනු ඒ පළමුවන ගාථාවේ තේරුමයි

**සාරං ච සාරතො ඤත්වා**
**අසාරං ච අසාරතො**
**තෙ සාරං අධිගච්ඡන්ති**
**සම්මා සඞ්කප්ප ගොචරා**

සරු දෑය සරු වශයෙන්ම දැන නිසරු දෑය නිසරු වශයෙන්ම දැන වසන්නාවූ යහපත් කල්පනා ගොදුරුකොට ඇති ඒ නුවණැත්තෝ ලෞකික-ලෝකෝත්තර සාර ධර්මයට පැමිණෙත් යනු දෙවන ගාථාවේ අදහසයි.

මේ ගාථා දෙකෙන් වදාළේ වැඩකට නැති යම් යම් දේ උසස්කොට සලකන අනුවණ ස්ත්‍රී-පුරුෂයෝ වැරදි කල්පනාවෙන් යුතු අය හෙයින් ඔවුනට කිසි ලෙසකින් යහපත් දියුණුවක් හෝ උසස් සැපතක් නොලැබිය හැකි බවය. නුවණැති යම් කෙනෙක් යම් යම් උසස් දේ උතුම්කොට සලකා යහපත් කල්පනාවෙන් යුක්ත වෙත්නම් ඒ ස්ත්‍රී-පුරුෂයෝ මහෙශාක්‍ය වශයෙන් ලබන දිව්‍ය-මනුෂ්‍ය සම්පත් හා අමෘත මහා නිර්වාණ සම්පත්ති ප්‍රතිලාභයෙහි හිමිකාරයෝ වන බවය.

මේ සම්මාසඞ්කප්පය නෙක්ඛම්ම-අව්‍යාපාද-අවිහිංසා වශයෙන් මෙහි විස්තරවූ පරිද්දෙන් දතයුතුයි. නෙක්ඛම්ම සඞ්කප්පය (-නෛෂ්ක්‍රම්‍ය සඞ්කල්පනාව) ගැන හැඟීම් පවත්නේදැයි සැළකිය යුත්තකි. ගිහිගෙය වසන්නවුන් අතර කම්සැප නිසරුකොට සලකන-කම්සැප පිළිකුල් කරන-කම්සැප හැරයාමට තැත්කරන කෙනෙක් සොයා ගැනීම ඉතා දුෂ්කරය. එබඳු යමෙක් වේනම් සියදහස් ගණනකින් බොහෝ කලකින්ය. හැමදෙනකුගේම බලවත් උත්සාහය නිතරම වස්තුකාම-ක්ලෙශකාමයන් දියුණුකර ගැනීමට හා තරකර ගැනීමටය. නාකිවී හොඳටම මහලුවී ගියත් එහි ගිජුකම-ලොල්කම නොහරී. මේ ඇත යන සැහීමෙක් නැත. මෙසින් වැඩෙක් නැත යන හැඟීමෙක් නැත. පරලොව යාමෙක් ඇත යන සැළකීමෙක් නැත. පරලොව ගමන සිහිවනවිට කිසි දවසක එහි නොයන්නෙක්සේ ඒ ගමන අමතක කරදමයි. ස්ථිර තත්ත්වයක් නැති පෙරළීම් ස්වභාවය ඇති මේ සිරුර ළමාවියේ හෝ තරුණවියේ හෝ මහලුවියේ හෝ නැසෙයි. මහලුවිය ඉක්මවා

නැවත මේ අත්බැවේ ළමාවියක් හෝ තරුණවියක් නොලැබිය හැකිය. එහෙයින් මහලුවියේදී තමන් සතු වස්තුකාම කෙලෙශ කාමයන් බලා සුසුම්ලා අනේ අපොයි කියා හෝ සිතා මැරීමට සිදුවෙයි.

මාර මුඛයෙහිවූ අපට කාමයෙහි මොන ඇල්මෙක්ද? සිතන කාටවූවත් ළමාවියදී හෝ තරුණවියදී කාමාසාව හීනවෙයි. කලකදී නිසරු බව වැටහෙයි. නෛෂ්ක්‍රම්‍ය සංඥව දියුණුවීමට ඒම මහ වෙයි. කාමයෙහි නිසරුකම වැටහීමට හොඳ අවස්ථාව මහලු කලය. කම් සුවයෙහි කොතරම් ගිජුව වෙසෙතත් මහල්ලාට මෙලොව වැඩිකල් විසීමෙක් නැත. පරලොව යායුතුමය. එහෙයින් ළමාකලත් තරුණකලත් කාමාසාවෙන් වෙන්කොට රැකගත නොහැකිවූ කුණපයෙන් යුතු මේ ආත්මය මහලු අවස්ථාවෙහිදීවත් නෛෂ්ක්‍රම්‍ය හැඟීම්වලින් යුතුව කුසලින් මනාව පෝෂණය කර ගැනීමට උත්සාහ කටයුතුය. තමන් ලත් ආත්ම භාවයෙන් මිනිසුනට නියම පල ලබා ගැනීමට හැකිවන පරිදි වදාළ ගාථාවක් මෙහිදී මතක් විය.

**අත්තානං චෙ පියං ජඤ්ඤා**  
**රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං**  
**තිණ්ණං අඤ්ඤතරං යාමං**  
**පටිජග්ගෙය්‍ය පණ්ඩිතො**

තමාට තමා ප්‍රියතම් ඒ තමා හෙවත් ආත්මය (ළමා–තරුණ –මහලු වයස්හි) ඉතා හොඳින් රැක ගත යුතු බවත් නුවණැති තැනැත්තා (ළමා කල–තරුණ කල–මහලු කල යන) තුන් අවස්ථා අතුරෙන් එක් අවස්ථාවකදීවත් කුසලින් තරකොට තමා පෝෂණය කරන බවත් වදාළේ ඉතා දුකසේ ලබාගත් මිනිසත් බැවින් නියම පල අත්පත් කරගනු සඳහාය.

එබැවින් ළමා කල හා තරුණ කල වත්කාම–කෙලෙස්කාම්හි ගිජුකම හැරලීමට නොහැකිවූ කාටවූවත් මහලු අවස්ථාවෙහි පහසුවේ එහි ලාමකත්වය හොඳින් වැටහෙන බැවිනි. නෛෂ්ක්‍රම්‍ය සංඥව එකවරකම ඇතිකරගත නොහැකිය. එය ක්‍රමයෙන් ඇතිකර ගැනීමට දියුණුකර ගැනීමට මෙහි දක්වුණ කරුණු වටහා ගැනීමෙන් පිළිපැදීමෙන් සියලුදෙන විසින් උත්සාහ වැඩිය යුතුය.

**අව්‍යාපාද සඞ්කප්පය** (–ද්‍රෝහ සිතුවිලිවලින් වැළකීමේ මනා කල්පනාව) සැම මනුෂ්‍යයකු විසින්ම ඇතිකරගත යුතුය. මනුෂ්‍ය සන්තානයෙන් රැකගත යුතු පිළිපැදිය යුතු ගුණ ධර්ම බොහෝ

වෙති. එයිනුත් ප්‍රධාන වශයෙන් ගැනෙන්නේ කාරුණාව හා මෛත්‍රියයි. ඒ ගුණ ධර්ම දෙක සම්පූර්ණයෙන් දියුණුකර ගැනීමට රැකගැනීමට අව්‍යාපාද සඞ්කල්පනාව හේතුවේ. මනුෂ්‍ය සන්තානය ගිනි පුපුරුසේ රෞද්‍ර භාවයට පමුණුවන ව්‍යාපාද සිතුවිලිවලින් වැළකීම යහපත් කල්පනාවෙන් හා නුවණින් කළ යුත්තකි. මිනිසාගේ හිරි-ඔතප් නසා පළිගැනීම්-දරුණු අපරාධ කිරීම් -නැසීම් යන මේ ලාමක ක්‍රියාකිරීමට පොළඹවන්නේ ව්‍යාපාද සිතයි.

ව්‍යාපාද සිතින් නැඟී සිටියකුට බොහෝකල් පෙම්වත්ව විසූ බිරිඳගේ හා දරුවන්ගේ ඝාතනය පවා දුෂ්කර නොවේ. මොහොතකදී කළ හැකිය. එබඳු සිදුවීම් ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් නිතර දක්නට ලැබේ. සිතේ සන්සුන්කම දියුණුකර ගැනීම හා තදගති රළුගති නැතිකර ගැනීම සැමවිටකම ගෙදෙර ප්‍රධානයන්මෙන් ගැනෙන මව්පියන් විසින් ඉතා ඕනෑකමින් ඇතිකර ගත යුතුය. ව්‍යාපාදයට හේතුවන කිසිවක් ඔවුන් අතර ඇතිකර නොගත යුතුය. ගෙදෙර මව්පියන් අතර හෝ බොහෝ පිරිස් ඇසුරු කරන ප්‍රධානයන් අතර හෝ සිතේ මොළොක්කම හා වචනයේ ශාන්ත භාවය පවතී නම් ක්‍රියාවේ තදගති රළුගති නොපවතී නම් ඒ දරුවනටද රටවැසියනටද ආදර්ශයකි. නැණ්පත්වූ උසස් ජීවිත ගතකිරීමට මුල්වන්නේ අව්‍යාපාද සඞ්කල්පනාවමය. සියලු දෙන සුඛිත-මුදිත බවට පමුණුවන ඒ අව්‍යාපාද සඞ්කල්පනාවෙන් යුත් හැඟීම් ඇතිව “හැම සත්හු සුවපත් වෙත්වා, නිදුක්-නිරෝගි වෙත්වා” යන මෛත්‍රී සහගත අදහස් ඇතිව වාසය කිරීමට කල්පනා කටයුතුය. එසේම උත්සාහ කටයුතුය.

අවිහිංසා සඞ්කප්පය (=සතුන් පෙළීමෙන් හිංසා පීඩා කිරීමෙන් වැළකීමේ යහපත් කල්පනාව) යමෙකුට ඇතිනම් ඒ තැනැත්තා සත්පුරුෂයෙකි කාරුණා ගුණයෙන් කල් යවන්නෙකි. අසරණ සතුනට පිළිසරණ විය යුතු තැනැත්තා මනුෂ්‍යයෙක්මය, හැම ලෙසින්ම පිළිසරණ වියයුතු සතුනට හිංසා පීඩාකිරීම හෝ කරවීම මනුෂ්‍යයකු විසින් නොකටයුතු ලාමකවූ නින්දිත ක්‍රියාවකි. නිරයේ පැසීමටත් සියගණන් අත්බැව්හි දරුණු විපාක විඳීමටත් හේතුවේ.

පෙර සීසෑම් කරන ගොවියෙක් සීසෑමෙහි යොදවන සිය සරකුන් අතුරෙහි වැඩට අලසව නිතර වැටී නිදන සරකකු දැක මෙසේ සැමදම නිදවයි කියා ඒ සරකා පිදුරුවලින් වෙලා ගිනිතබා

නැසී. ඒ ලාමක ක්‍රියාව ඒ ගොවියාට නිරය දුක් විඳීමටත් සියක් අත්බැව්හි කවුඩුව ඉපැද සියක් වරක්ම ගින්නෙන් දා නැසීමටත් හේතුවිය.

සෙල්ලම් පිණිස වුවත් කරන සත්ත්ව හිංසාව පවා දුක් විපාක ගෙන දෙයි. එබැව් දක්වෙන කරුණු බොහෝය. පෙර ගොපලු දරුවන් සත්දෙනෙක් කැලෑවල සරකුන් කවන අතර ඒ කැලයෙහි තලගොයින් වසන තුඹසක තලගොයින් පිටව යනෙන සිදුරු සතක් දැක ඒ ළමයි සත්දෙන එක එක කොළ ගුටි හරිගස්සා සිදුරු සතේ තදකොට ගසා වසා පසුදා ඇවිත් කොල ගුටි ඉවත් කිරීමට සිතා ගියහ. නැවත ඒ ළමයනට ඒ කැලයට සරකුන් කැවීමට පැමිණීමට සිදුවූයේ සත්දවසකට පසුවය. එදා කොල ගුටි දැක වහා ඉවත් කළ කල්හි ආහාර නැතිව පෙළෙමින් සිටි තලගොයි ආහාර සොයා දුකසේ ඇදී ගියහ. ඒ ගොපලු දරුවෝ ඒ සතුන් දිවි නොනැසූ හෙයින් නිරය දුකට නොපැමිණියහ. එහෙත් මනුෂ්‍යව උපන් දහහතර වරක්ම ආහාර නැතිව සත්දවස බැගින් කුසගින්නේ පෙළෙමින් යාම් ඊම් කිරීමට මඟක් නොමැතිව දුක් විඳි බව පෙනේ.

මෙහි දැක්වුණු කරුණු මැනවින් තේරුම්ගෙන මේ සම්‍යග් සඞ්කල්පනාව අනුව ජීවිත හැඩ ගැසුණොත් ඒ භවත්හු තමන් ලත් මිනිසත් බැවින් ඵල ලබන්නෝ වෙති. ජීවිතයේ හැමදෙයකටම යහපත් කල්පනාව මුල්වේ. දාන–ශීල–භාවනාදි පින්රැස් කිරීමට පමණක් නොව ප්‍රතිපත්ති පූරණයටද සිත් යොමු කෙරේ. ස්වර්ග මෝක්ෂ සම්පත්ති ප්‍රතිලාභයට ඒ සම්‍යග් සඞ්කල්පනාවම හේතුවේ. එහෙයින් ඒ සඞ්කල්පනාව මැනවින් දියුණුකර ගැනීමට උත්සාහ කටයුතුයි.

**මොරමුවේ ඉඳිබැද්දේ සුධර්මරත්නාරාමාධිපති ආභිධම්මික මොරමුවේ සාසනධජ මහ ස්ථවිරයන් වහන්සේ විසින්**

ක්‍රි: ව: 1950 ජනවාරි 6 වෙනි දින

උබයසෙබරපුර අභිනවාරාමයෙහිදී පවත්වන ලද

## ධර්මදෙශනාව,

# සම්‍යග් වචනය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

**තත්ථ කතමා සම්මාවාචා මුසාවාදා වෙරමණී, පිසුණාය වාචාය වෙරමණී, ඵරුසාය වාචාය වෙරමණී, සම්ඵප්පලාපා වෙරමණී, අයං වුච්චති සම්මාවාචා.**

පුණ්‍යකාමී සත්පුරුෂ භවතුනි,

සිරි අරියවංස ගුණානුස්මරණ සභාව මගින් පවත්වාගෙන යනු ලබණ සත්තිස් බොධි පාක්ෂික ධර්මදේශනා පුණ්‍යකර්මයන්ට ඇතුළත් "සම්‍යක් වචනය" මාතෘකාකොට ධර්මදෙශනා කිරීම අද මාවෙත පැවරී තිබේ. ධර්ම මාතෘකාව විස්තර කරදීමට කලින් මේ පුණ්‍යොත්සවය පිළිබඳව කරුණු ස්වල්පයක් කියාදීම අප යුතුකම බැව් හඟිමු.

මීට වර්ෂ තුනකට කලින් අපවත්වී වදාළ **"ශ්‍රී ඥාණාභිවංශ ධම්මාධාර වංශපාල විනයාලඞ්කාර මොරමුවේ ශ්‍රී ආයඍවංශ මහා ස්ථවිර ස්වාමීන්ද්‍රයන් වහන්සේ** ප්‍රතිපත්ති ගරුක සුපෙශල ශික්ෂාකාමී අප්‍රතිහත ධෛර්‍ය්‍යයෙන් යුත් වීරොදාර චරිත ශ්‍රියකින් හෙබි උතුම් බුඩ පුත්‍රයාණ කෙනෙකි.

අර්ධ ශතවර්ෂයකට පෙර මොරටුව ක්‍රිස්තියානි බලකොටුවක්ව පැවතුනේය. එකල ශ්‍රද්ධාබුද්ධි සම්පන්න මොරටු පුත්‍රයෙක් පූර්වොපචිත කුශලය විසින් මෙහෙයන ලදුව බාලවිය ඉක්ම තරුණ වයසට පැමිණෙත්ම බෞද්ධාගමට සිදුවේගන යන විපත දැක ආගමාලය උපදවා නියම නෛෂ්ක්‍රම්‍ය චෙතනාවෙන් සසුන් ගතව බුරුම රට සිට වන්දනාව පිණිස පැමිණි බුරුම මහා ස්ථවිරයන් වහන්සේලා කීපනමක් සමග බුරුම රටට වැඩමවා එහිදී ලබණ ලද උපසම්පදාව සහ ශාසනික වත් පිළිවෙත්හි මහා පටුත්වයක් ඇතිව

උග්‍ර තපෝ ගුණයෙන්හිද ධූතාඞ්ග සමාදානයෙහිද යෙදී ගැලී ප්‍රගුණවූ නියම සන්‍යාහසන්‍යාඩ යොධ හටයෙකුමෙන් පෙරළා සිය ගම රටට පැමිණීසේක.

නිසඟීයෙන්ම අල්පේච්ඡ නිරහංකාරවූ ඒ **අරියවංස ස්ථවිර පාදයන් වහන්සේ** නොබෝ කලකින්ම සවඥාති වගීයාගේ සිත් දිනාගෙන **මොරමුල්ලේ සිරි සුධම්මාරාමය** ඇතිකොටගෙන බොහෝ කුලදරුවන් සසුන් ගතකොට ශාසන දියුණුව සඳහා අනල්ප උත්සාහයෙන් ක්‍රියාකර නොයෙක් පළාත්වල ආරාම පන්සල් තැනවීමෙන් හා බෞද්ධ ප්‍රතිපත්ති කියා කර දීමෙන් සිද්ධ කරන ලද මෙහෙය මෙවැනි ලිපියකින් කෙසේ කියමුද? උන් වහන්සේගේ සදුත්සාහය නිසා පහළවූ අප මිත්‍ර **"මොරමුවේ ශ්‍රී සාසනවංස මහා ස්ථවිරයන් වහන්සේ"** මෙම ගුණානුස්මරණ සභාවේ අනුශාසකත්වය දැරීම නිසා මහත් ලොකශාසනාභිවෘද්ධියක් සිදුවෙන බව නොම්සුරුව කිවහැක. ඒ මේ සියල්ලක් ක්‍රමානුකූල පරිදි මහත් වියදම් දරා නොකඩවා කරගෙන යැමට ආධාර කරන දායක භවතුන්ගේ උත්සාහය පන්දහසක් කල් සම්ඳ ශාසනය පැවතීමට ඉවහල්වනු ඇත. දැන් ඉතින් ශ්‍රද්ධාවෙන් යුක්තව යොනිසො මනසිකාරයෙන් යෙදී බණ අසන ලෙසත් ඒවූ පරිදි පිළිපදින ලෙසත් දැනුම් දෙමි.

මෙහි මා විසින් මාතෘකා වශයෙන් දැක්වූයේ විභඞ්ග ප්‍රකරණ-යෙහි ආවාවූ පාඨයකි.

තත්‍ථ, එහි; සම්මාවාචා, සම්මාවාචා නොමෝ; කතමා, කවරීද; මුසාවාදා, මුසවායෙන්; වෙරමණී, වෙන්වීමක් ඇද්ද; පිසුණාය වාචාය, පිසුණු බසින්; වෙරමණී, වෙන්වීමක් ඇද්ද; ඵරුසාය වාචාය, ඵරුස වචනයෙන්; වෙරමණී, වෙන්වීමක් ඇද්ද; සම්ඵපප-ලාපා, සම්ඵප්ප්‍රලාපයෙන්; වෙරමණී, වැලකීමක් ඇද්ද; අයං, මෝනොමෝ; සම්මාවාචා, සම්‍යග් වචන නමැයි; වුච්චති, කියනු ලැබේ; යනු පදඅියි. මෙහි සාමාන්‍ය තේරුම නම්:- ආය්‍යී අෂ්ටාඞ්ගික මාගී අතුරෙන් සම්‍යග් වචනය නම් කුමක්ද? බොරු කීමෙන් වැලකීමය. කේලාම් කීමෙන් වැලකීමය. සැඩ පරුෂ වචන කීමෙන් වැලකීමය. නිෂ්ප්‍රයෝජන කථාවෙන් වැලකීමය යන විරති චෛතසිකයක් ඇද්ද එය සම්‍යග් වචන නම්වේ. සම්මා වදනති එතායාති සම්මාවාචා යන නිර්වචනයේ හැටියට යමක් හේතුකොටගෙණ ශොභනවූ මනොඥවූ කථා කරත් නම් එවැනි කථා කිරීමට හේතුවූ ධම්ය සම්‍යග් වචන නම්වෙයි.

සම්‍යක් වචන යන්නෙන් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහි එක් මාර්ගාඞ්ගයක් කියවේ. අෂ්ටාඞ්ගික මාර්ගය–ලෞකිකය ලොකොත්තරය කියා දෙයාකාරවේ. එහෙයින් කිහ. **"එසො ලොකුත්තරො මග්ගො සහ ලොකියෙන මග්ගෙන දුක්ඛ නිරොධ ගාමිනී පටිපදාති සඞ්ඛං ගතො"** ඒ ලොකොත්තර මාර්ගය තෙම ලෞකික මාර්ගය සමග දුඃඛ නිරොධ ගාමිනී ප්‍රතිපද යන සඞ්ඛ්‍යාවට ගියේය යනු එහි තේරුමයි.

එසේම **"ලොකිය මග්ගෙ සබ්බානෙව මග්ගඞ්ගානි යථානුරූපං ඡසු ආරම්මණෙසු අඤ්ඤතරාරම්මණානි හොන්ති, ලොකුත්තර මග්ගෙ පන චතුසච්ච පටිවෙධාය පවත්තස්ස අරිය සාවකස්ස නිබ්බාණාරම්මණානි, අවිජ්ජානුසය සමුග්ඝාටකං පඤ්ඤාචක්ඛු සම්මාදිට්ඨි–පෙ–තථා පස්සන්තස්ස විතක්කනස්ස ච තං සම්පයුත්තා චතුබ්බිධ වචී දුච්චරිත සමුග්ඝාටකා මිච්ඡාවාචා විරති සම්මාවාචා, තථා විරමන්තස්ස තං සම්පයුත්තාව මිච්ඡාකම්මන්ත සමුච්ඡෙදිකා තිවිධ කාය දුච්චරිත විරති සම්මා කම්මන්තො, තෙසං යෙවස්ස වාචා කම්මන්තානං වොදාන භූතා තං සම්පයුත්තා ච කුහනාදි සමුච්ඡෙදිකා මිච්ඡා ආජීවා විරති සම්මා ආජීවො, ඉමිස්සා සම්මාවාචා කම්මන්තාජීව සඞ්ඛාතාය සීල භූමියා තිට්ඨමානස්ස ච අනුරූපො තං සම්පයුත්තො ච කොසජ්ජ සමුච්ඡෙදකො අනුප්පන්නුප්පන්නානං අකුසල කුසලානං අනුප්පාදප්පහාණ උප්පාදට්ඨිති සඞ්ඛාතො විරියා–රම්භො සම්මා වායාමො, එවං වායමන්තස්ස තං සම්පයුත්තා ච මිච්ඡා සති විනිද්ධුනනකො කායාදිසු කායානුපස්සනාදි සඞ්ඛා–තො ච චෙතසො අසම්මොසො සම්මාසති, ඉති අනුත්තරාය සතියා සුවිහිතාරක්ඛස්ස තං සම්පයුත්තා ච මිච්ඡා සමාධි සමුග්ඝාටකා චිත්තෙකග්ගතා, සම්මා සමාධීති එසො ලොකුත්තරො අට්ඨඞ්ගිකො මග්ගො"** මේ පාඨයෙන් ලෞකික ලොකොත්තර මාර්ගද්වය ප්‍රකාශ කෙරේ. එහි තේරුමනම් ලෞකික මාර්ගයෙහි මේ සියළුම මාර්ගාඞ්ගයෝ රූපාදී ෂඩාරම්මණයන් අතු–රෙහි සුදුසු පරිද්දෙන් යම් යම් වස්තු අරමුණුකොට ඇතිවෙත්.

ලොකොත්තර මාර්ගයෙහි වනාහි චතුස්සත්‍යය ප්‍රතිවෙධය පිණිස පැවැත්තාවූ ආර්‍ය්‍ය ශ්‍රාවකයා හට සියලුම මාර්ගාඞ්ගයෝ නිර්වාණය අරමුණුකොට ඇතිවෙත්. නිවන් අරමුණුකොට පැවැත්තාහුගේ අවිද්‍යානුශය නසන්නාවූ ප්‍රඥා චක්ෂුස සම්‍යග් දෘෂ්ටි නම්. එසේම සම්‍යක් දෘෂ්ටියෙන් යුක්තවූ ඔහුගේ එම සම්‍යග් දෘෂ්ටිය සමග පැවැත්තාවූ ත්‍රිවිධ මිථ්‍යා සඞ්කල්පය නසන්නාවූ සිත පිළිබඳ නිර්වාණ පදයට මනාකොට බැස ගැනීම සම්‍යක් සඞ්කල්ප

නම්. එසේ දක්නාවූද සිතන්නාවූද ඔහුගේ එයින් යුක්තවූ සිව් වැදෑරුම් වචී දුච්චරිතය නසන්නාවූ මිථ්‍යාවචන විරතිය සම්‍යක් වචන නම්වේ. එසේ වෙන්වන්නාවූ ඔහුගේ එයින් සම්ප්‍රයුක්තවූම ප්‍රාණඝාතාදී ත්‍රිවිධ මිථ්‍යා කර්මාන්තය නසන්නාවූ තුන්වැදෑරුම් කාය දුශ්චරිත විරතිය සම්‍යක් කර්මාන්ත නම්වේ. එම වාග් කර්මාන්තයන්ගේ පිරිසිදු බව කරන්නාවූ තත් සම්ප්‍රයුක්තවූම කුහක බැව් ආදිය සිඳින්නාවූ මිථ්‍යා ආජීව විරතිය සම්‍යග් ආජීව නම්වේ මෙසේ දක්වන ලද සම්‍යග් වචන කර්මාන්ත ආජීව සංඛ්‍යාත ශීල භූමියෙහි සිටියහුගේ ඊටම සුදුසුවූ එයින් සම්ප්‍රයුක්තවූම කුසීත බැව් නසන්නාවූ, නූපන්නාවූද, උපන්නාවූද අකුශල කුශල කර්මයන්ගේ නොඉපදීමය. ප්‍රහාණ කිරීමය. ඉපදවීමය. පැවැත්වීමයයි කියන ලද සතරෙහි පවත්නා වීර්‍ය්‍යාරම්භය සම්‍යග් ව්‍යායාම නම්වේ. මේ අනුමට උත්සාහ කරන්නහුගේ එයින් යුක්තවූම මිථ්‍යාස්මෘතිය දුරුකරන්නාවූ කායාදී සාරමුණෙහි කායානුපස්සනාදී සංඛ්‍යාතවූ චිත්තය පිළිබඳ නුමුළා බව සම්මාසති නම්වේ. මෙසේ උතුම් සිහියෙන් මනාකොට යොදන ලද ආරක්ෂාව ඇත්තහුගේ එයින් යුක්තවූම මිථ්‍යාසමාධිය නසන්නාවූ සිත පිළිබඳ එකඟ බව සම්‍යක් සමාධි නම්වේ. මේ ලොකොත්තර අෂ්ටාඞ්ගික මාර්ගයයි. සම්‍යක් වචනය ඒ මාර්ගාඞ්ගයන් අතුරෙන් තෙවැනි අඞ්ගය ගනී. ලෞකික සම්‍යක් වචනය නානාරම්මණ ඇතිව උපදී. මාර්ගක්ෂණයෙහිදී නිර්වාණාරම්මණය ගෙන එකම කුශල විරතියක් උපදී. ඒ බැව් මෙසේ දක්වී. **මග්ගක්ඛණෙ පන මිච්ඡාවාචා සඞ්ඛාතාය අකුසල දුස්සීල්‍ය චෙතනාය තදුපච්ඡෙදනො අනුප්පත්ති සාධනවසෙන මග්ගං පූරයමානා එකාව සම්මාවාචා සඞ්ඛාතා කුසල වෙරමණී උප්පජ්ජති අයං සම්මාවාචා නාම.**

එම විරතිය **සම්පත්ත විරති, සමාදාන විරති, සමුච්ඡෙද විරති** යයි තෙවැදෑරුම් වේ. සමාදන් වීමක් නැතිව මුසාවාදාදී පවක් කිරීමට වුවමනාවක් ඇති කල්හි පවා ඒ පාපය නොකොට වැලකීම සම්පත්ත විරති නම්. ශික්ෂාපද සමාදන්වීමෙන් පව්වලින් වැලකීම සමාදාන විරති නම්වේ. ආර්‍ය්‍ය මාර්ගයෙන් මුල්සිඳ දමා පවින් වැලකීම සමුච්ඡෙද විරති නම්වේ. මුසාවාදයෙන් වෙන්වීම – ඵරුස වචනයෙන් වෙන්වීම – පිසුණා වචනයෙන් වෙන්වීම – සම්ඵප්පලාපයෙන් වෙන්වීම යන සතර සම්පත්ත විරති ආදී තුණෙන් වැඩිකර ගත්කල විරති දොළසක්වේ. එහෙත් සමුච්ඡෙද විරතිය ලොකොත්තර පක්ෂයෙහි මුත් ලෞකික විරති පක්ෂයෙහි නොයෙදේ.

මීළඟට **මුසාවාද වෙරමණී-පිසුණාවාචා වෙරමණී-ඵරුසා වාචා වෙරමණී-සම්ඵප්පලාපා වෙරමණී** යන සතර පිළිබඳ විස්තරයක් දක්වමි.

මුසාවාදය නම්:- ඇත්ත නැතිකොට නැත්ත ඇතිකොට කීමයි. (හෙවත් බොරු කීමයි) මුසාවාදයක් වීමට අඞ්ග සතරක් සම්පූර්ණ විය යුතුය. එනම්: බොරුවක්වීමය, රැවටීම සඳහා සිතා කීමය. ඊට සුදුසු උත්සාහය ඒ වචනාර්ථ දැනගැනීමය. බොරු කීම මහා වරදෙකි. බොරු කියන්නා හට නොකළ හැකි පවෙක් නම් නැත. ඒ බැව් මෙසේ දැක්වී.

**ඒකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස ජන්තුනො**
**විතිණ්ණ පරලොකස්ස නත්ථිපාපං අකාරියං**

වාක් සත්‍යයයි කියන ලද එකාම ධර්මය ඉක්මවූ බොරු කියන ස්වභාව ඇති, හරණ ලද පරලොව ඇති සත්ත්වයා විසින් නොකළ හැකි පාපයක් නම් නැත්තේය යනු භාවයි. බොරුකීම මහාසාවද්‍ය පාපයක් හැටියටද පෙනේ. සඞ්ඝභෙදය සහ මිථ්‍යාදෘෂ්ටිය වාගේ දුශ්චරිතයට ඇතුළත් වේ. එයද බොරුකීම නිසාම සිඩ වන්නකි.

චෙතිය රජතුමා පළමුවැනි බොරුකාරයෙකි. ඒ බොරුව කීම හා සමග සෘඞි බලයත් නැතිවී පොළව පලාගෙන නරකයෙහි වැටුන බව දහම් පොත් පත්හි සඳහන්ව තිබේ.

(ඒ බැව් ලෝවැඩ සඟරාවෙහි දැක්වූයේ මෙසේය.)

ලැ දි ව රජෙක් බොරු බස් කී විගසක යා
නැ ති ව ඉද්දි බලයත් මේ මිනිස් ක යා
පො ළ ව පලාගෙන ගොස් වැටුනි නරක යා
මෙලොව සතුනි ඉන් බොරු කීම නරක යා

බොරුවට දිවිරීමෙන් ප්‍රෙත අපායවල දුක් විඳින හැටි පඤ්ච පුතන බාදක-සතන පුතන බාදක-කාණී මුණ්ඩ ප්‍රේති ආදීන්ගේ කථා වස්තු කියවීමෙන් දැනගත හැක.

**මුසාවාදො භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරය සංවත්තනිකො හොති පෙත්ති විසය සංවත්තනිකො හොති තිරච්ඡානයොනි සංවත්තනිකො හොති යො සබ්බ-ලහුසො මුසාවාදස්ස විපාකො මනුස්සභූතස්ස අභූතබ්භක්ඛාන සංවත්තනිකො හොති.**

මෙහි තේරුම නම්:– මහණෙනි! මුසාවාදය ආසෙවිත භාවිත බහුලීකෘත කරණ ලද්දේ නිරයෙහි ඉපදීම පිණිස පවත්නේය. ප්‍රෙත යොනියෙහි ඉපදීම පිණිස පවත්නේය. තිරිසන් අපායෙහි ඉපදීම පිණිස පවත්නේය. මුසාවාදය පිළිබඳ හැමටම කුඩාවූ සැහැල්ලුවූ යම් විපාකයෙක් වේනම් එය අසත්‍යවූ දෙයින් දොෂාරොපන ලබන්ට සිදුවීමය. යනුයි.

මේ අනුමට බොරු කියන්නා සතර අපායෙහි නොයෙක් කෙළ ලක්ෂ ගණන් අවුරුදු දුක් විඳ මිනිස් පියක් ලදුයේ නම් මුසාවාදයාගේ සැහැල්ලුවූ ශෙෂ කර්මයෙන් නොයෙක් සියදහස් ගණන් ජාතිවලදී තමා විසින් නොකී නොකළ දේ තමාට පිට ආරූඪව එයින් දුක් විඳින්ට සිදුවේ. හීන දීන වේ. ජඩවේ. නුවණ නැතිවේ. ගොළුවේ. සියලුදෙනාට අප්‍රිය වේ. දිවි නැතිවේ. දුගීන්ධ මුඛවේ. දරුවන් නැතිවේ. නැතහොත් ගෑණු දරුවන් ලබයි. බොහෝදෙනා අවිශ්වාස කරන්නෙක් වේ. එබැවින් මෙවැනි ඝොරවූ වාග් දුශ්චරිතයක්වූ මුසාවාදයෙන් වැළකී සත්‍ය වචනයම පුරුදු කරගත මැනවි.

**පිසුණාවාචා නම්**:— කේලාම් කීමය, තමන් කෙරෙහි ප්‍රිය බව ඇතිකරගනු කැමැත්තෙන් හෝ ඔවුනොවුන් අතර පවත්නා සමගිය නැතිකරන අටියෙන් හෝ මේ කේලාම් කීම කරණු ලැබේ. මේ කේලාම් කීමද බර පාප කර්මයකි. ස්වාධීන සිංහල ජාතිය පර සතුරන් අතට පත්වූයේ කේලාම් කීමේ හේතුවෙනි. කේලාම් කියන්නා මෙන්ම කේලාම් බස් අසන්නාද මහත් ව්‍යසනයන්ට පත්වේ. එබැවින් භෙදකර කේලාම් කියන්නවුන් දුටු තැන වසුරුමෙන් පිළිකුල් කටයුතුය.

කසුප් බුදුන් කල එක් පාපී භික්ෂුවක් සමගි සම්පන්නව එක් විහාරයෙක විසූ භික්ෂූන් දෙනමක් භෙදකොට ඒ අරමින් නෙරපා හැර තමන් ඒ විහාරයෙහි වැස මිය ගොස් ඒ පවින් අවීචිමහා නරකයෙහි ඉපිද බුඩාන්තරයක් දුක් විඳ එයින් මිදී අප බුදුන් දවස ප්‍රේතව උපන්නේය. ඒ ප්‍රේතයාගේ ශරීරය රන්වන් වුවත් මුඛය කුණුවී දුගඳ වහනය වෙයි. පණුවන්ගෙන් ගැවසිණ. පණුවෝ මුඛය විද කති. මෙසේ දුක් විඳින ප්‍රේතයා නාරද ස්ථවිරයන් වහන්සේ දැක එම්බල ප්‍රේතය! තෝ කුමණ පාප කර්මයක්කොට මේසා මහත් දුකක් විඳිනෙහිදැයි ඇසූකල තමන් කළ පාපය ප්‍රකාශකොට අනේ ඔබ වහන්සේ මා දෙස බලා කිසිකලෙක කේලාම් නොකිව මැනව වාග් දුශ්චරිතයෙහි නොහැසුරුන මැනවැයි අවවාද කොළේය. පෙර අත්බැව මහණදම් පිරූ

කුශලයෙන් ශරීරය රන්වන් විය. කේලාම් කී පාප හේතුවෙන් මුඛය කුණුව දුර්ගන්ධය වහණය වන පණු කැදුල්ලක්මෙන් විය. එබැවින් මේ නපුරු පාපයෙන් වැලකී වාග් සුචරිතය පිරිය යුතුය.

**එරුස වචනය නම්**:—කර්කශෝර වචනයි. කියන තමන්ද අනුන්ද රළු බවට පමුණුවන වචන කථාකිරීම එරුස වචන නම්. කොටින් කියතොත් අනුන්ගේ සිත රිදෙන වදනින් කථාකිරීම එරුස වචන කීම නම්. විනය පිටකයෙහිදී **"ඔමසවාදෙ පාචිත්තියං"** යී උපසම්පන්න භික්ෂූන්ට එරුස වචනය පිළිබඳව ශික්ෂා පදයක් පණවා තිබේ. එහි ඔමසවාදය මෙසේ විස්තර කර තිබේ. ජාතියෙන්ද, නාමයෙන්ද, ගොත්‍රයෙන්ද, කර්මයෙන්ද, සිල්පයෙන්ද, ආබාධයෙන්ද, ලිඞ්ගයෙන්ද, කෙලශයෙන්ද, ඇවතින්ද, ආක්‍රොශයෙන්ද ගටා බැණීමයයි දශවිධ වේ.

ජාතියෙන් ගටා බැණීම දෙයාකාර වේ. හීන උත්කෘෂ්ඨ වශයෙනි. හීන ජාති නම් සැඩොල්-කුළුපොතු-මූවවැදි-සම්කරු ආදීහුයි. උත්කෘෂ්ඨ ජාති නම් ක්ෂත්‍රිය බ්‍රාහමණාදීහුයි. මේ දෙවැදෑරුම් ජාතීන්ටම කෙනෙකුට සිත රිදෙන්ට බැණීම කරන්ට පුළුවන.

ගොත්‍රද හීන - උසස් ගොත්‍ර වශයෙන් දෙ ආකාරයෙකින් දක්වේ. කොසිය-භාරවාජ ආදී ඒ ඒ රටවල පහත්කොට සලකන ගොත්‍ර හීන නම්. ගෞතම කාත්‍යායන-මෞගල්‍යා යනාදී ගොත්‍ර උසස්කොට සලකන බැවින් උසස් ගොත්‍ර නම්. මේ අන්දමට කර්මාන්තද, ශිල්පද, රෝගද, ලිඞ්ගද, (හැඩහුරුකම) කෙලශද, ඇවැත්ද, ආක්‍රොශද, විප්‍රභෙද වේ.

මේ කෙබඳු ක්‍රමයකින් හෝ අනුන්ගේ සිත් රිදෙන පරිද්දෙන් කථා කිරීමෙන් එරුස වචන කීමේ අකුශලය සිද්ධවේ. අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීම පෙරටුකොට ජාති ආදියෙන් ගටා බැණීමෙන් වැරැද්දක් සිද්ධනොවේ. සමහරෙකුට පෙර ආත්මවල පුරුද්ද (වාසනාව) නිසා එරුස වාග් චෙතනාව නැතිවද එරුස වචන කියැවේ. පිළින්දිවච්ඡ නම් රහත් මහ තෙරුන්ට මෙනි. නමුත් රහතන්ට අකුශල් චෙතනා පහළ නොවේ.

මවුපිය ගුරුවරයෝ සිය දරු ශිෂ්‍යයන්ට රළු වචනයෙන් තරවටු කරති. නපුරු වචනයෙන් බණිති. වචනයෙන් රළුවුවත් සිතින් මොළොක් මෘදු සිතින් කියන එබඳු වචන එරුස වචන හැටියට නොගැණේ.

සමහරවිට කෙනෙකුට අනර්ථ කරවනු කැමැත්තෙන් (මරවනු) කැමැත්තෙන් "මොහු සැපසේ නිදිකරව" යනාදීන් මෘදු වදනින් කියමින් අනර්ථ කරවත්නම් ඒ වචන කණට මෘදුවුවත් රළු සිතින් කිවූ බැවින් ඵරුස වචන හැටියටම ගැණේ.

ඵරුස වචන කියන්නා ලෝවැසියන්ට අප්‍රිය කෙනෙක් වේ. ලෝවැස්සෝ ඔහු පිළිකුල් කරත්. මිනිස්සු පමණක් නොව තිර්-සන්නු පවා ඵරුස වචනයට අකැමැති වෙත්.

ප්‍රිය මනාප මෘදු මොලොක් බස් ඇති තැනැත්තා සැමදෙනාටම ප්‍රිය කෙනෙක් වේ. කොපමණ සිල්වතෙක් ගුණවතෙක් උවත් අන්‍යයන්ට කණ්කටෝර අමනොඥ බසින් කථා කෙරේ නම් ඔහු ලොවට නොරුස්සන්නෙකුවීම පුදුමයක් නොවේ. පිඞගල රජ තුමා ලෝකයට අප්‍රිය රජෙක් වූයේ ඔහු චණ්ඩ ඵරුස ජීවිතයක් ගතකිරීම නිසා බැව් පෙනේ. බුධ කාලයෙහි ඡබ්බග්ගිය නම් භික්‍ෂු පිරිසක් නොහික්මුණු දුමරිකයින්මෙන් අනික් සුසිල්වත් සුපෙශල භික්‍ෂූන්ට ආක්‍රොශ පරිභව බෙණෙමින් කල් ගෙවූහ. ඒ බව දැනගත් භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ගෙන්වා අවවාද කරණ සේක් මහණෙනි! ඵරුෂ වචනය නම් තිරිසන් ගතයන්ට පවා අමනාප වන්නේය. පෙර එක් තිරිසන් ගත සත්‍වයෙක් තමාට ඵරුස වචනයෙන් බණින්නෙකුට කහවණු දහසක් පරාජය කර වූයේ යයි දෙශනාකොට නන්‍දිවිසාල ජාතකය ගෙණ හැර දැක්වූ සේක.

අතීතයෙහි ගන්‍ධාර රට තක්සලා නුවර ගන්‍ධාර නම් රජෙක් විය. එකලැ බෝසත් ගවයොනියෙහි ඉපිද නන්‍දිවිසාල නමින් ප්‍රකට විය. ගව හිමියා බ්‍රාහමණයෙකි. ගවයාට ඉතා ආදරයෙන් කැඳ බත් ආදියෙන් සංග්‍රහ කරණ ගව හිමියා පුත්‍ර සෙනහ උපදවා පොෂ්‍යය කරයි. දිනක් වැඩි වයසට පත් බෝසත්තුමා මෙමසේ සිතී. මේ බ්‍රාහමණයා විසින් ඉතා දුක් විඳ මා පොෂ්‍යය කළේය. මේ දඹදිව මාවැනි ජවබල කායබල සම්පන්න ගවයෙක්ද වෙන නැත. මෙතෙක් කල් මාරැකි බ්‍රාහමණයාට ප්‍රත්‍යුපකාර වශයෙන් යම්කිසි මිළක් (මුදලක්) ලබාදුන්නෝ විනම් ඉතා යහපතැයි සිතා බ්‍රාහමණයාට මෙසේ කීය.

බ්‍රාහමණය! ගව හිමි සිටුවරයෙක් සමග කහවණු සියයක් තබා "ගල් පටවනු ලද ගැල් සියයක් අදවන්ට කථාබස් කරගෙන එවයි කීය. බ්‍රාහමණයාද සිටුවරයෙක් සම්මුඛවී කථාබස්කොට ගෙන දින නියම කරගෙන අවුත් ගල් වැලි පුරවන ලද ගැල් සියය

පෙළට තබා නන්දිවිශාල නම් ගවයා නහවා සුවඳ ගල්වා ගෙලෙහි මල් පළඳවා පළමු ගැලෙහි යොදා තෙමේ ගැල්හි හිඳ කැවිට ඔසවා ගෙන අංජනකූටය උසුලවකූලයි කීය. බොධිසත්ව ගව තෙම "අකුළුවූ මට කුළුවාදයෙන් ගටා බෙණෙයයි සිතා සතර පය ටැඹක්මෙන් නිශ්චලව තබාගත්වනම සිටියේය. සිටානෝ එකෙණෙහිම බ්‍රාහමණයාගෙන් කහවණු දහස ගෙන්වා ගත්තේය. බ්‍රාහමණයා කහවණු දහසින් පැරදී ගෙට ගොස් ශොකයෙන් මඩනා ලදුව හොත්තේය. නන්දිවිශාලයා තණ කා ආමයේ ශොකයෙන් වෙලී ඉන්නා බ්‍රාහමණයා දැක සමීපයට එළඹ බ්‍රාහමණය කුමක් හෙයින් ශොකයෙන් නිදන්නෙහිදැයි ඇසීය. කහවණු දහසකින් පැරදුන මට නිද්‍රාවක් නම් කොයින්දැයි කීය. බ්‍රාහමණය මෙපමණ කලක් තොපගේ ගෙයි වසන්නාවූ මා විසින් කිසි භාජන බිඳීමක් හෝ කිසිවක් මැඩ මිරිකීමක් හෝ නුසුදුසු තැනක මලමූත්‍ර බැහීමක් හෝ කරණ ලද විරිදැයි ඇසීය. පුත්‍රය එවැනි දෙයක් නැත්තේයයි කීය. එසේනම් මට කවර කාරණයකින් කුළුවාදයෙන් කීයෙහිද? මේ තොපගේ දෝෂය නිසාම කහවණු දහසින් පැරදුනෙහිය. මා අත දෝෂයක් නැත්තේය. යව ඒ සිටාණන් හා කහවණු දෙදහසකින් ඔට්ටු තබා අවුත් අකුළුවූ මට කුළුවාදයෙන් කථා නොකරවයි කියා යැවීය. බ්‍රාහමණයාද බෝසතානන් කීපරිද්දෙන් කහවණු දෙදහසක් ඔට්ටු තබා ගැල් සියය එකාබඩ කොට බැඳ නන්දිවිශාල නම් වෘෂභයා සරහා පළමු ගැල් වියෙහි යෙදුයේය. යොදා බ්‍රාහමණ තෙම ගැලෙහි හිඳ නන්දිවිශාලයාගේ පිට පිරිමැද අදුන්වන් යහපත් මාගේ පුත්‍රවූ වෘෂභය මේ ගැල් යෙහෙන් උසුලවයි කීය.

බෝසත් තෙම එකාබඩව බඳිනා ලද ගැල් සියය එක වේගයෙන්ම ඇද පසුව සිටි ගැල අබිමුවෙහි ගැල් පිහිටි තැන තිබූය. ඒ වාරයෙහි සිටානෝ පැරදී බ්‍රාහමණයාට කහවණු දෙදහසක් දෙවූයේය. අනිකුත් මනුෂ්‍යයෝද බොධි සත්වයන් වහන්සේට බොහෝ වස්තු පරිත්‍යාග කළෝය ඒ සියළු වස්තුව බ්‍රාහමණයා හටම අයිති වූයේය. මේ ජාතක කථාවෙහි දැක්වෙන බ්‍රාහමණයා නම් ධර්ම භාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයන් වහන්සේ බවත් නන්දිවිශාල වෘෂභව උපන්නේ තිලෝගුරු බුදුරජානන් වහන්සේ බවත් දෙශනා කළහ.

පින්වතුනි, එබැවින් පරුෂ වචනය නම් තිරිසන් ගත සතුන් පවා ප්‍රිය නොකරන බසක් බව සලකා චතුර්දෝෂ විරහිතවූ මිහිරිවූ මනාපවූ මට සිලුටු මෘදු මොලොක් බසක්ම දෙඩන්නට පුරුදු විය යුතුය. සම්ඵප්පලාප නම්:- නිරර්ථක හිස් ප්‍රලාප දෙඩීම මෙයින්

අදහස් කෙරේ. නිකරුණේ ඉන්නා අය අතර මෙය බෙහෙවින් දක්නා ලැබේ. අර්ථ ශූන්‍ය වචන කීමෙන්ද අකුශල් සිදුවෙන බැව් බොහෝදෙන නොසලකන බැව් පෙනේ. තමුත් මේ හේතුවෙන් ඇතිවන හිරිහැර කරදර ඉමක් කොණක් නැති බැව් පෙනේ. ඒ සම්බන්ධ විස්තර මෙහි නොලියන්නේ ලිපිය දීර්ඝවන බැවිනි.

සම්‍යක් වචනය යන පදයට ඇතුළත් ධර්ම මොනවාදැයි ප්‍රශන කළහොත් ඊට පිළිතුර වාග් සුචරිත සතරය යනුයි. ඒ මෙසේ සඳහන් වේ.

**“සම්මාවාචා පදෙසෙන චත්තාරි වචී සුචරිතානි සඞ්ගහිතානි”** මෙහි මාර්ගාඞ්ග අට අතුරෙන් තුන්වැනි මාර්ගාඞ්ගය වන සම්‍යක් වචනය චරණ ධර්මයන්ටද, සමථයානයටද, සීලස්කන්ධයටද, අධිශීල ශික්ෂාවටද ඇතුළත් වේ.

නිවන් සුව ලබනු කැමැත්තහු විසින් හුදෙක් මෙම සම්‍යක් වචන නමැති මාර්ගාඞ්ගය පමණක් නොව ඒ මාර්ගාඞ්ග අටම සම්පූර්ණ කළ යුතු බැව් සැලකිය යුතුය. ඒ මෙසේ සඳහන් වේ.

**යෙන සමන්නාගතො අරියසාවකො දස්සන සමත්ථෙහි චක්ඛූහි ගමන සමත්ථෙහි පාදෙහි සමන්නාගතො අද්ධිකො විය විජ්ජාචරණ සම්පන්නො හුත්වා විපස්සනා ඤාණෙන කාමසුඛල්ලිකානුයොගං සමථ ඤාණෙන අත්තකිලමථානුයොගන්ති අන්තද්වයං පරිවජ්ජෙත්වා මජ්ඣිම පටිපදං පටිපන්නො පඤ්ඤාක්ඛන්ධෙන මොහක්ඛන්ධං පදාලෙන්තො අධිපඤ්ඤා සික්ඛාය පඤ්ඤා සම්පදං අධිසීල සික්ඛාය සීල සම්පදං අධිචිත්ත සික්ඛාය සමාධි සම්පදන්ති තිස්සො සම්පත්තියො පත්වා අමතං නිබ්බාණං සච්ඡිකරොති.**

මේ පාඨයේ තේරුම නම්:— යම් ආර්‍ය්‍ය මාර්ගයකින් යුක්තවූ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම දැක්මට සමර්ථවූ ඇසින්ද, ගමනට සමර්ථවූ පාවලින්ද යුක්තවූ මාර්ගිකයෙකුමෙන් විද්‍යා ඇසින් හා චරණ පාදයෙන්ද යුක්තව විදර්ශනා ඥානයෙන් කාමසුඛල්ලිකානු යෝගයද සමථ ඥානයෙන් ආත්මක්ලමථානු යෝගයද යන අන්තද්වය හැර පියා මධ්‍යම ප්‍රතිපදාවට පිළිපන්නේ ප්‍රඥා ස්කන්ධයෙන් මෝහ ස්කන්ධයද සීල සමාධි ස්කන්ධ දෙකින් ලෝභ ස්කන්ධයද පළා දමා අධි ප්‍රඥා ශික්ෂාවෙන් ප්‍රඥා සම්පත්තියද අධිශීල ශික්ෂාවෙන් ශීල සම්පත්තියද අධිචිත්ත ශික්ෂාවෙන් සමාධි සම්පත්තියද යන ත්‍රිවිධ සම්පත්තියට පැමිණ අමා මහ නිවන් සැපය අවබොධ කරයි.

# සම්මා කම්මන්තෝ.

නමො මහෙසිනො

කොළඹ උභයසේකර පුර අභිනවාරාමාධිපති
මොරටුවේ සිරි සාසනවංස මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ
විසින් පවත්වන ලද

## ධර්මදේශනාව.

# සම්‍යග් කර්මාන්තය.

**තත්ථ කතමො සම්මා කම්මන්තො? යා තීහි කාය දුච්චරිතෙහි ආරති විරති පටිවිරති වෙරමණී අකිරියා අකරණං අනජ්ඣාපත්ති වෙලා අනතික්කමො සෙතුඝාතො සම්මා කම්මන්තො මග්ගඞ්ගං මග්ග පරියාපන්නං අයං වුච්චති සම්මා කම්මන්තො.**

සකල ලොකනායක අංගීරස ශාක්‍ය මුනීන්ද්‍ර තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ සකල විනෙය ජනතාව වෙත පතල මහා කරුණා ගුණයෙන් තමන් වහන්සේ ලබාගත් විමුක්තිරසය සුන්දර සුරතල් සුකොමල දරුවණට සිය ගනවන් රක්ත රුධිරය ශුභ්‍රක්ෂීරාර්ණවයක්කොට එහි හොවා එය පොවා සාපවස් දුක් උතුරවා හැර ප්‍රීති සුවයෙන් ඔදවැඩි කරවා සනහා සන්තුෂ්ට කර වන්නේ යම්සේද එසේම අෂ්ට සුගන්ධයකින් සුමිහිරි කරණ ලද අෂ්ටාඞ්ගික මාර්ග නමැති සුවිසුද්ධ ක්ෂීරය චතුස්සත්‍ය නමැති අර්ණවයෙහි වත්කොට එහි හොවා එය පොවා අවිද්‍යා තෘෂ්ණා දෘෂ්ටි සංඛ්‍යාත කෙලෙස් ගිනි නිවා ජාත්‍යාදී දුක් උතුරවා හැර රාගාදී සාපවස් නිවා සවුපදිශෙෂ නිර්වාණ ධාතුවෙන් ඔදවැඩි කරවා සමවත් සුව පහස් සයනෙහි සතපපවා ආයුක්ෂයෙන් නිරුපධිශෙෂ පරිනිර්වාණයට ප්‍රවිෂ්ට කරවූ සේක. මෙසේ ලෝසතුන් සැනහූ තමන් වහන්සේ ලබාගත් විමුක්ති සැපය වර්ෂ පන්දහක් පවතින ගෞතම සර්වඥ සාසනය භාරධාරී භික්ෂු භික්ෂුනී උපාසක උපාසිකා යන සිව්වනක් පිරිසට ඉදිරි ඉදිරියෙහිද ලබාදෙනු වස් පරම ආයුෂයෙන් පහෙන් සතර භාගයක්ම වළඳා පරිනිර්වාණයට ප්‍රවිෂ්ට වන බුද්ධ චාරිත්‍රානුකූලව අප බුදුරජාණන් වහන්සේද අසූවස් පිරීමෙන් සිරිත් විධි වෙනස් නොකොටම පිරිණිවන් පා වදාරණ සමයෙහි.

**ධම්මො වො භික්ඛවෙ මමච්චයෙන සත්ථා**- යනාදී සුවර්ණමය ධර්ම පාඨය වදාළසේක. මාගේ ඇවෑමෙන් තොපට ධර්මය බුදුන්සේ

අනුශාසනා කරණවා ඇත. ඉන්නිසා තොපට නිර්වාන ලාභයට කිසිද බාධාවක් නැත. යන මේ කාරුණා ගුණ පූර්වා දෙසූ දෙශනායෙහි **ධම්ම** යන්නෙන් ත්‍රිපිටක බුධ වචනය ගැණේ. එම ත්‍රිපිටක ධර්මයම චතුරාර්‍ය්‍ය සත්‍යයෙහි ගැබ්වී තිබේ. එකී චතුරාර්‍ය්‍ය සත්‍යයෙහිද—

**දුක්ඛ-සමුදය**— සත්‍ය දෙක දැනගැණීම්, හැඳින ගැණීම්, තේරුන් ගැණීම් පමණෙකි.

**නිරොධ සත්‍යය**— ප්‍රත්‍යක්ෂ කර ගැණීම්, විමුක්ති සුවය විඳීම් මාත්‍රයෙකැයි තේරුම් ගැණීම පමණකි.

**මාර්ග සත්‍යය**— එසේ නොව සියලුම පිළිපැදීම්, පුරුදු කිරීම්, හික්මවීම්, නැවතීම්, පැවතීම් ඈසින් පුහුදුන් සිත, කය, වචනය සඳ වඩා ආර්‍ය්‍ය මාර්ගයෙහි ගමන් කරවා ආර්‍ය්‍ය භූමියට යවා සනහා ශාන්ත සැපය සාධාගැණීමට මහත් පරිශ්‍රමයක් දැරීමට යොදවන උපාය උගන්වත්. එනිසා දැකීමට-දැනීමට-යෙදීමට දුෂ්කරවෙත්. එසේ වුවද සසර දුක් නසා ලබණ නිර්වාන සුවය ලබාගැණීමට මෙම මාර්ග සත්‍යයෙහිම ගැලී-ගිලී-ගැටී ගමන් කළයුතු බැවින් අමාරුය, අපහසුය කියා අතනෑරිය යුතුයි. එහෙයින් මෙම මාර්ග සත්‍යයෙන් උගන්වන ආර්‍ය්‍ය මාර්ගාඞ්ග අට දෘඪතම සදුත්සාහයකින් අවබෝධ කටයුතුයි. මෙම මාර්ගාඞ්ගයන් දැක දැන අවබෝධ කරගැණීමට ඇති උසස්තම ධර්ම ග්‍රන්ථයන් අතර අපේ උත්සාහයෙන් කැරෙණ මෙම ධර්ම ග්‍රන්ථ මාලාවද චතුස්සත්‍යාවබෝධයෙහි නැතිනම් සත්තිස් බෝධිපාක්ෂික ධර්මාවබොධයෙහිලා මහඟු බැව් කිවයුතු නොවේ.

**සිරි අරියවංස ගුණානුස්මරණ මහා සභාව**— ඉටාගත් නොනැසෙන ගෞරවයකට භාජනව පවතින මෙම ග්‍රන්ථ මාලාවේ අවසාන කාණ්ඩය දක්වාම කරගෙණ යෑමට ලැබීම මහත් ප්‍රීතියකි. අපටද එසේමැයි. නිස්සාර දෙයට දහස් ගනන් ලක්ෂ ගනන් ධනය වියදම් කරණ අප බෞද්ධ ජනතාව වෙත සිහිපත් කළ යුතු කාරුණු මෙහිදී අවබෝධ වෙතත් අපේ ධර්ම මාතෘකාව අනුව කිවයුතු කාරුණු බොහෝ බැවින් සියලු සැදැහැවත් බෞද්ධ ජනතා-වටම නුවනින් සලකා සිය ධනය ශාසනාභිවෘද්ධියට යොදවන ලෙස සිහිපත් කරවමින් අපේ මාතෘකාව අනුව ලුහුඬු විස්තරයක් මේ ශ්‍රවණාභිලාෂී සැදැහැවතුනට කියාදීමට සිත යොමු කරමු. එය අසාදන පිළිපැද ත්‍රිවර්ග සැප සාධාගන්නා ලෙස මතක් කරමු. සිරිත් පරිදි ධර්මානිසංස වශයෙන් යමක් කියාදීමට මෙහිදී අවශ්‍ය නමුත් ඒ පිළිබඳවද වැඩි යමක් කියා කාලය ගතකරන්ට අපි නොසිතමු. බණ හොඳින් අසන්ටත්, එම අසන බණ වික්ෂිප්ත

නොවී සිත තබාගන්වත්, සිත තබාගත් පරිදි නිවැරදි ලෙස හැසිරෙන්වත් සිතාගෙණ බණ අසන ලෙස කරුණාවෙන් මතක් කරමු. මෙම පොත් පෙලේ ආ දෙශනාවන් කියවන්නන්ට ධර්මානිසංස විස්තරව දකින්ට ලැබෙනවා ඇත.

දැන් අපි අපේ මාතෘකාව දෙසට සිත් යොමු කරමු.

අපේ අද දෙශනාව සම්‍යග් කර්මාන්තය අඳුන්වාදීම සඳහා කරන්නකි. එනිසා ප්‍රථමයෙන් සම්‍යග් කර්මාන්තය යන වචනයේ අදහස සොයමු. මෙහි **සම්මා** යන වචනයෙන් යහපත් හොඳ, මනා යන අදහස් ගෙණදෙත්. **කම්මන්ත** යන්නෙන් කර්මාන්තය, ක්‍රියාව, ව්‍යාපාරය යන අදහස් ගෙණදෙත්. පද දෙක එක්කල විට යහපත් කර්මාන්තය, හොඳ ක්‍රියාව, මනා ව්‍යාපාරය යන අදහස් දෙත්. මෙහිදී **සම්මා කම්මන්තය** කියන්නේ අනායර්‍යයා ආයර්‍ය භාවයට පත්කරවන පිළිපැදිය යුතු අෂ්ටාඞ්ග ආයර්‍ය ධර්මයන්ගෙන් සතර වන අඞ්ගය වන ප්‍රාණවධ, අදත්තාදාන, කාමමිථ්‍යාචාර යන මිථ්‍යාකර්මයන්ගෙන් වෙන්ව ඉන් සම්පූර්ණයෙන් වැලකීමයි.

**සම්මා කරොති සම්මා වා තෙන කරොන්ති**
**පසත්‍ථං සුන්දරං වා කම්මන්ති සම්මා කම්මං**
**සම්මා කම්ම මෙව සම්මා කම්මන්තො**
**මිච්ඡා කම්මන්ත විරතියා එතං නාමං**

සම්‍යග් දෘෂ්ටිය ආදී මාර්ගාඞ්ගයන්සේ මොනවට ත්‍රිවිධ මිථ්‍යා කර්මාදිය නැතිකරයිද ඒ සම්‍යග් කර්මාන්තය විසින් හෝ මිථ්‍යාකර්ම මොනවට දුරු කරයිද ප්‍රශස්තවූ සුන්දරවූ කර්මයයිද **සම්‍යග් කර්ම** නම්. එම සම්‍යග් කර්මයම-සම්‍යග් කර්මාන්ත නම් සම්‍යග් කර්මාන්තය කියන්නේ මිථ්‍යා කර්මාන්තයන්ගෙන් වෙන් වීමටයි. ඊට කියන හොඳම වචනයද සම්‍යග් කර්මාන්තය යන්නයි. එසේ නම් මිථ්‍යාකර්මාන්තය දැනගෙණ ඉන් මිදුනාම වෙන්වූවාම සම්‍යග් කර්මාන්තයයි. එනකොට මිථ්‍යා කර්මාන්තය හොඳහැටි පිරිසිඳ දැනගත යුතුයි. මිථ්‍යා කර්මාන්ත තුනකි. ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය. යන තුනයි. එම තුනින් නැගිටුවා යහපත් කර්මාන්තයෙහි පිහිටුවන බැවින් **සමුට්ඨාන** යයිද සම්‍යග් කර්මාන්තයට ව්‍යවහාර වෙත්.

සම්‍යග් කර්මාන්තයේ ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථානද මීලඟට තේරුන් ගතයුතුයි— **තථා විරමන්තො තං සම්පයුත්තනාව මිච්ඡා කම්මන්ත සමුච්ඡෙදිකා පාණාතිපාතාදි විරති සම්මා කම්මන්තො නාම සම්මාදිට්ඨි-සම්මාසඞ්කප්ප-සම්මාවාචා** යන තුන් මාර්ගාඞ්ගයන්ගෙන් මිථ්‍යා දෘෂ්ටි-මිථ්‍යා සඞ්කල්ප-මිථ්‍යා වචන වෙන්

කරමින් වැඩෙන මාර්ග චිත්තය සමග යෙදුන මිථ්‍යා කර්මාන්තයයි කියන ලද ප්‍රාණවධ, සොරකම, කම්සෙවුම, ශවන්කරමින් ඒ හා සමග යෙදුන සියලු මිථ්‍යාකර්ම සහමුලින් සිඳ ප්‍රාණවධාදී ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන් වෙන්වීම සම්‍යග් කර්මාන්තයයි.

**සො සමුට්ඨාන ලක්ඛණො** යහපත් කර්මාන්තයන් නගා සිටුවීම හටගැණීම සම්‍යග් කර්මාන්තයේ ලක්ෂණයයි. **විරමනරසො** මිථ්‍යා කර්මාන්තයන්ගෙන් වෙන්වීම එහි රසයයි (කෘත්‍යයයි) **මිච්ඡා කම්මන්තප්පහාන පච්චුපට්ඨානො** මිථ්‍යා කර්මාන්තයන්ගේ සමූලඝාතනය විනාශ කරලීම ප්‍රහාණය කිරීම සම්‍යග් කර්මාන්තයේ වැටහෙන කාරණයයි.

මෙලෙසින් සම්‍යග් කර්මාන්තය තේරුන්ගෙණ ඒ පිළිබඳව අප විසින් මාතෘකා පාඨය වශයෙන් ප්‍රකාශ කරණ ලද විභඞ්ග ප්‍රකරණයෙහි අභිධම්මභාජනියෙහි ආ දෙශනා පාඨයෙහි අදහස තේරුන් ගතයුතුයි.

මෙතැන් සිට කියන්නේ ඒ වචනයන් පාඨ අදහසුයි. **කතමො සම්මා කම්මන්තො** ඒ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය ප්‍රකාශ වන තන්හි සම්‍යග් කර්මාන්තය කියන්නේ කුමකටද? **යාතිහි දුච්චරිතෙහි** යම් ඒ ප්‍රාණඝාතය, සොරකම, කාමයෙහි වරදවා හැසුරුමයයි කියන ලද තුන්වැදෑරුම් දුශ්චරිතයන්ගෙන් නැතිනම් ඒ කයින් සිදුවන දුශ්චරිත තුන හා සමග **ආරති** නොඇලීමක්වේද **විරති** වෙන්වීමක්වේද **පටිවිරති** ප්‍රකාශී වෙන්වීමක්වේද (හොඳටම ඈත්වීම) **වෙරමණී** සම්පත්ත සමාදාන සමුච්ඡෙද යන ත්‍රිවිධාකාර විරමනයක් (වෙන්වීමක්) වේද **අකිරියා** නොවීමක්වේද **අකරණං** නොකිරීමක්වේද **අනජ්ඣාපත්ති** පුරුදු නොකිරීමක්වේද නොකැඳවීමක්වේද උගෙණ නොගැන්මක්වේද **වේලාඅනතික්කමො** සම්‍යග් කර්මාන්ත නමැති ඉම සීමාව වෙරළ බිඳ ඉක්ම නොයෑමක් වේද **සෙතුඝාතො** හෙය බිඳීමක්වේද හෙවත් මිථ්‍යා කර්මාන්ත නමැති ඒ දණ්ඩ පාලම බිඳ කඩාදමාද **සම්මා කම්මන්තො** යහපත් කර්මාන්තයෙහි යෙදුනේවේද **මග්ගඞ්ගං** දුක්ඛ සමුදයාර්‍ය්‍ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කිරීමට දුක් නිරුද්ධ කිරීමට ගමන් කරණ අෂ්ටාඞ්ග මාර්ගයෙහි අඞ්ගයක්වේද **මග්ග පරියාපන්නං** එම දුක් ප්‍රහාණය කිරීමට පිළිපන් මාර්ගාඞ්ගයන් සමග යෙදුන අඞ්ගයක්වේද **අයං වුච්චති සම්මා කම්මන්තො** මෙලෙසින් කියා තේරුන් කරණු ලබන්නේ සම්‍යග් කර්මාන්තයයි.

මෙම **සම්‍යග් කර්මාන්තය** හඳුන්වා ලීමට වචන රාශියක්ම දෙශනාවෙහි පෙනේ. එසේ ප්‍රකාශව තිබෙන්නේ ඒ ඒ සත්ත්වයන්ගේ නුවනට එල්ලවන පරිදි ඔවුනට ගැලපෙන යම්කිසි වචනයකින් සම්‍යග් කර්මාන්තය අවබෝධ කරලීමට යසිද සිතත හැක. නැතිනම් දෙශනා විලාශයෙන් අන්කිසිම ශාස්තෘ කෙනෙකුට නොසම ශාස්තෘවූ බුදුපියානන් වහන්සේලාගේ දෙශනා කෞශල්‍යය මහත් බව නිසාදවෙත්. මිථ්‍යාකර්මාන්තයන් පිරීමෙන් ලොකයෙහි සත්ත්වයන් හට තම ජීවිත බොහෝ ඉක්මනින් අතිසම්ර සැප සම්පත් බහුල කරගැණීමට හැකිවෙත්. එසේ කළහැකි බැවින් ඔවුන් නිරන්තරයෙන් මිථ්‍යා කර්මාන්තයන්හි ඇලී බොහෝ පව් රැස්කරගෙණ කල්ප කෝටි ගනන් මහත් දුක්වලට පැමිණෙත්. ඉන්නිසා එම මිථ්‍යාකර්මයන්ගෙන් දුරලවා ගැණීමට සම්පූර්ණයෙන් වෙන්කර ගැණීමට ආරති. විරති, පටිවිරති, වෙරමණී යන පරියාය නම් දෙශනා කරන ලදි. මිථ්‍යා කර්මාන්තයන්ගෙන් වෙන්වීමට නොයෙක් අයුරින් අධිෂ්ඨාන කරගෙණ සිටියේ නමුදු ඒ සඳහා පෙළඹෙන, පොළඹවන තර්ජනය කරණ දඬ තබා අනදෙන තමහට වඩා ප්‍රබලයන් රාජ රාජ මහාමාත්‍යාදීන් නිසා බියෙන් හෝ ජීවිතාලයෙන් හෝ මිථ්‍යා කර්මාන්තයන්හි යෙදීමට අවස්ථා පැමිණෙන බැවින් ඉන් දෘඪ වීර්යයෙන් වෙන්වී සිටීමට හා ආර්ය මාර්ගාවබෝධය ආවරණය නොකර ගැණීමට **අකිරියා-අකරණං-අනජ්ඣාපත්ති-වෙලාඅනතික්කමො-සෙතුඝාතො** යනාදී පද දෙශනා කළසේක. මිථ්‍යා කර්මාන්තය අනාර්ය පැවැත්මක් බැව් ග්‍රාම්‍ය හීන අඥ බාලයන් අතින්ම සිදුවෙන්නක් බැව් අවබෝධ කිරීමට සම්මා කම්මන්ත යනු කීහ. ආර්ය ධර්මය අවබෝධ කර ගැණීමට හා නිර්වාණ රශය විඳ ගැණීමට අවයවයක්ම බැවින්ද නැතිනම් අඞ්ගයක්ම බැවින්ද එම මග ගොස්ම එම නිර්වාන සැපය සාධා ගතයුතු බැවින්ද **මග්ගඞ්ගං මග්ගපරියාපන්නං** යනු කීහ. මෙලෙසින් නා නා අර්ථ ගෙනහැර දක්වීමට සම්‍යග් කර්මාන්තයට අර්ථවත් වචන රැසක්ම දෙශනා කළසේක.

මෙසේ වචනාර්ථ තේරුන්ගෙණ අනතුරුව සම්‍යග් කර්මාන්තය වඩා ගැණීමට කරුණු අසාගත යුතුයි. එය වඩා ගැණීමට මිථ්‍යා කර්මාන්ත මොනවාදැයි තේරුන් ගෙණ ඉන් වෙන්විය යුතු. **තිවිධකාය දුච්චරිතෙහි ආරති** යනුවෙන් දෙශනා කළේ එනිසායි.

**ත්‍රිවිධකාය දුශ්චරිත- ප්‍රාණ ඝාතය- අදත්තා දානය- කාම-මිථ්‍යාචාරය**=මින් පළමුව ප්‍රාණඝාතය ගැණ කරුණු පවසමු. **පාණස්ස අතිපාතො පාණාතිපාතො පාණවධො පාණඝාතොති**

**වුත්තං හොති** ප්‍රාණියෙකුගේ එම ප්‍රාණය හෙළීම වැනසීම ප්‍රාණඝාතයි. ප්‍රාණවධය, ප්‍රාණඝාතය යසිද ඊට ව්‍යවහාර වෙත්. **පාණොති චෙත්ථ වොහාරතො සත්තො – පරමත්ථතො ජීවිතින්ද්‍රියං** මෙහි ප්‍රාණියයි කියන්නේ ව්‍යවහාර වශයෙන් සත්ත්වයකුටය. මනුෂ්‍ය, තිරිසන්, දෙවඅසුර ආදී කෙනෙකුටය. පරමාර්ථ වශයෙන් ජීවිතෙන්ද්‍රියටය. පරමාර්ථ වශයෙන් සත්ත්වයෙක්යයි කිව නොහැක්කේ මන්ද? පරමාර්ථය කියන්නේ වෙනස් නොවී නොපෙරළී පවත්නා නිසයි. ජීවිතෙන්ද්‍රිය වටා වැඩෙන අත් පා ඇස් කන් නාස ශරීරාදී අවයව මොහොතින් මොහොත වෙනස් වෙමින් පැවතී සහමුලින්මද වැනසෙත්. එසේ වැනසෙන තැනැත්තා මනුෂ්‍යයෙක් නම් එම මනුෂ්‍යයාට අයත්ව තිබුන අත් පා ආදිය වැනසී නැවත ආත්මයක් ලබනුයේ අන් තිරිසනෙක් හෝ වෙන අන් සතෙක්ව ඉපිද වෙන අන් ක්‍රමයකින් අත් පා ආදී අඞ්ගයන් වැඩීයෙත්. එම අත්බව වැනසී අනික් අත්බවක් ලැබුවේද හෙද එලෙසම වෙනස් වෙවී පවතිත්. ජීවිතෙන්ද්‍රියය එසේ වෙනස් නොවෙත්. එනිසා පරමාර්ථ යන වචනය ජීවිතෙන්ද්‍රියයට මිස සත්ත්වයෙකුට භාවිතා කළ නොහැකිසි. **පරමත්ථොති නිබ්බාණස්ස සබ්බ ධම්ම මුත්තම සභාවො—** පරමාර්ථයයි කියන්නේ නිර්වාණයටයි. සියලු ධර්මයන්ට උතුම්ය යන අර්ථයෙන් නිර්වාණයටද පරමාර්ථයයි කියවේ.

ප්‍රාණඝාතය සිදුවීමට අඞ්ග පසක් වෙත්.

**පාණෝ පාණ සඤ්ඤිනො ජීවිතින්ද්‍රියුපච්ඡෙදක උපක්කම සමුට්ඨාපිකා කායවචී ද්වාරානං අඤ්ඤතර ද්වාරප්පවත්තා වධක චෙතනා පාණාතිපාතො–** යම්කිසි පණ ඇති සතෙකුගේ පණ ඇතැයි යන බව දැන එම ප්‍රාණය (ජීවිතය) වැනසීමට උපක්‍රම කිරීම් වශයෙන් කයින් හෝ වචනයෙන් සිදුකරණ (පැවති) වධ කිරීමේදී ඇතිවන මරණ චේතනාව ප්‍රාණඝාතයයි. මෙහිදී ප්‍රාණ වධ අකුශලය සිදුවීමට කරුණු පසක් එකතු විය යුතු බව පෙනේ

එනම් :—

**1. ප්‍රාණියෙක්වීම, 2. ප්‍රාණියෙක් බව තමා දැන සිටීම,**
**3. එම ප්‍රාණය නැතිකරන්ට ඕනෑයයි සිතීම,**
**4. ඊට කරණ උපක්‍රමය,**
**5. එම උපක්‍රමාදියෙන් එම ප්‍රාණය නැති කිරීම.**

මෙකී අඞ්ගපස පිරීමෙන්ම ප්‍රාණඝාත අකුශලය සිදුවේ. මෙම ප්‍රාණවධයෙන් සිදුවන අකුශලය අල්ප ශාවද්‍යය, මහා ශාවද්‍යය යයි දෙපරිදි වෙත්. එම දෙයාකාරය සිදුවන්නේ තිරිසන් සතුන්

පිළිබඳව නම් ගුණවත් තිරිසනුන් මැරූකල මහා සාවද්‍යයි. ගුණ හීණ තිරිසනුන් මැරූකල අල්පසාවද්‍යයි. ගුණ ප්‍රයෝජන නැති මූව, උඟුරු, සිවල් ආදී සතුන් නම් ශරීරයේ ප්‍රමාණයට සැලකිය යුතුයි. කුඩා ශරීරයක් ඇති සතෙක් මැරූකළ අල්ප සාවද්‍යයි. මහා ශරීරයක් නම් මහා සාවද්‍යයි. මන්ද, ප්‍රයෝග මහත් බව නිසයි. ප්‍රයෝග මහත් බවය කීවේ කුඩා සතෙක් මරන්ට කරණ උත්සාහය සවල්පයි. එනිසා අල්පසාවද්‍යයි. මහා ශරීරයක් ඇති සතෙක් මරණ කල ගන්න උත්සාහය බොහෝයි. එනිසා මහා සාවද්‍යයි. ගුණ හා ප්‍රයෝජන ඇති තිරිසන් සතුන් මැරූකළ (ගව, අසව, ඇත් ආදීන්) මහා සාවද්‍යයි. ඔවුන්ද ගුණ ප්‍රයෝජන අඩුකල අල්පසාවද්‍යයි. මෙහිදී ප්‍රයෝග කීවේ මරන්ට කරණ උත්සාහයන්ට හෝ උපායන්ටයි. මිනිසුන් අතරද එලෙසමයි. සවල්ප ගුණ ප්‍රයෝජන ඇති මිනිසුන් මැරූකල අල්පසාවද්‍යයි. මහා ගුණ ප්‍රයෝජන ඇති මිනිසුන් මැරූකළ මහා සාවද්‍යයි. ඔවුනතරද සිල්වත් වන්ට වන්ට මහා සාවද්‍යවේ. මෙහිදී මනුෂ්‍ය ඝාතනය අල්පසාවද්‍යයයි තේරුන් ගෙණ ගුණ හීනයන් මැරීමට යමෙක් සිතාත් නම් එය වරදවා තේරුන් ගැණීමකි. අල්පසාවද්‍ය මහා සාවද්‍ය දෙක මෙහිදී කිවේ පාපය බරපතල භාවය අඩු වැඩි බව තේරුන් කිරීමටයි. එය ලෝකයා අතරද සම්මත එකකි. රා, අරක්කු, ක්‍රීඩා, හොරමැරකම් කරණ තදබද මිනිසුන් මැරූකළ ලෝකයා අතර සියයට අනූවක්ම ඒ ගැණ කනගාටුව පහළ නොකරත්. නමුත් කිසිවෙකුට හිංසාවක් නැති සිල්වත් ගුණවත් කෙනෙක් මැරූකළ එසේ නොව සියල්ලෝ අනුකම්පාව දක්වමින් අනේ අපොයි මෙය මහා බරපතල වරදකැයි යනු පවසත්. ධර්‍මයෙහිද එලෙසයි. මේ ප්‍රාණඝාත අකුශලය මහත් බරපතල එකකි. **කිලෙසානං උපක්කමානඤ්ච මුදුතාය අප්පසාවජ්ජා තිබ්බතාය මහා සාවජ්ජාති වෙදිතබ්බා** යනාදී ධර්‍ම පාඨවලින් ප්‍රාණඝාතයෙහි වරද තේරුන් ගන්ට නියමකර තිබෙන බැවින් මෙසේ විස්තරයක් කෙළෙමු. ලොභ, ද්වෙස, මොහාදී අකුසලයන් නුවන මද බැවින් මොලොක් අන්දමින් ඉතා සුළු කරුණෙහිද සිත තුල වැඩෙත්ද එබඳු අය මැරීමේදී හෝ වැඩි දැඩි උත්සාහයක් නැතිව මැරීමේදී හෝ අල්පසාවද්‍යය එම කෙලෙසුන් ඉතා සියුම් ලෙස නැතිනම් ලොකුම කරුණකදී වැඩෙන කෙනෙකු මැරීමේදී හෝ උත්සාහයන් බොහෝකර මහන්සිවී මැරීමේදී හෝ එම මනුෂ්‍යයා මැරීම පිළිබඳව ඇතිවන අකුශලය මහා සාවද්‍යය මේ ආදී ක්‍රම දැන ගැණීම සඳහා ප්‍රකාශව තිබෙන බැවින් මේ බරපතල සාපරාධ අකුශලය පිළිබඳව බියෙන් තවදුරටත් මෙසේද කල්පනාවට ගෙණ ලජ්ජා බිය උපදවා සංවර වියයුතුයි. ගුණ ඇත්තන් අතර

සීලවන්ත ධ්‍යාන ලබාගත් සොවාන් ආදී මාර්ග ඵලවලට පැමිණි තැනැත්තන් පිළිබඳ මරණයක් යමෙක් සිදුකළහොත් ඔහට ලැබෙන කටුක විපාක ගැණද සිහිකළ යුතුයි. මෙසේ සිතීමෙන් කය වචනය සංවර කරගෙණ උකුණු, මකුණු, මැසි, මදුරු ආදී කුඩා සතෙකුගේ නමුදු දිවි තොරකිරීමෙන් වැලකීමට කරයේ ඉටාගත යුතුයි.

ප්‍රාණඝාත අකුශලයන් සිදුවීමට පහළවන සිත්වල රළු කටුක භාවය අනුවම විපාක බරපතල් වන බවද සැලකිය යුතුයි. ප්‍රාණ-ඝාතය–වෙෂමූලික දෙසිතෙන් උපදින්. ඒ දෙක නම්:—

දෞම්නස් සහගත පටිඝ සම්ප්‍රයුක්ත අසංසකාරික සිතය
දෞම්නස් සහගත පටිඝ සම්ප්‍රයුක්ත සසංසකාරික සිතය
යන දෙකයි.

මේ සිත් දෙකෙන් ප්‍රාණඝාතය, ඵරුෂ වචනය, ව්‍යාපාදය යන අකුශලකර්ම උපදින් මෙහි පටිඝ යනු ක්‍රෝධයට නමකි. එම ක්‍රෝධය ඉපදීමට වස්තු නවයකි. ඊට නව ආඝාත වස්තුයයි කියත්. ඒ නවය මෙසේ දතයුතුයි. තමා නිසා තුනකි. තමාගේ හිත මිත්‍රයන් නිසා තුනකි. තමාගේ සතුරන් නිසා තුනකි.

පේ පිළිවෙළින් මෙසේයි :—

1. මොහු මට අතීත ජාතිවලත් නින්‍දා ගර්හාකළ එකෙක.
2. මොහු මට දැනුත් නින්‍දා ගර්හාකරත්.
3. මොහු මතු මත්තෙහිත් මට නින්‍දා ගර්හාකරණවා ඇත. සිතා වෛර බඳිත්.
4. මොහු මගේ හිත මිතුරන්ට අතීතයෙහිත් නින්‍දා ගර්හා කොළේය. පිරිහීමට වැඩ සැලසුවේය.
5. මොහු මගේ හිත මිතුරන්ට දැනුත් නින්‍දා ගර්හා හා පිරිහෙළන්ට වැඩ කරත්.
6. මොහු මගේ හිත මිතුරන්ට පසු පසුවත් නින්‍දා ගර්හා ආදිය කරණවා ඇත. සිතා වෛර බඳිත්.
7. මොහු මගේ සතුරන්ට සතුති ප්‍රසංසාකොට දියුණු කරමින් පෙරත් වැඩකළ එකෙක.
8. මොහු මගේ සතුරන්ට සතුති ප්‍රසංසා කරමින් දියුණු කරමින් දැනුත් වැඩ සලසති.
9. මොහු මගේ සතුරන්ට සතුති ප්‍රසංසා කරමින් මතු මත්තෙහිද දියුණුවට වැඩ කරණවා ඇතැයිද වෛර බඳිත්.

මෙකියන නව වැදෑරුම්වූ (පටිඝ) ආඝාත වස්තු දෞර්මනස් සිතින් අසංසකාරිකවද සසංසකාරිකවද (තමා විසින්ම හෝ අනිකෙක් මෙහෙයවා හෝ) උපදවා අකුසල් සිදුකර ගණිත්. මෙකියන අකුශල් සිත් දෙක කිනැත— ඉමානිවෙ'පි, කියා, පි, යන්න යෙදුවේ. මේ දෞර්මනසින් හා වෛරයෙන් අනන්ත අපරිමාන කෙලෙස් උපදින බැවිනි. හේ මෙසේ සැලකිය යුතුයි.

මේ දෞර්මනස් සහගත පටිඝ සම්ප්‍රයුක්ත සිත අසංසකාරිකය, සසංසකාරිකය කියා දෙකකි. ඒ දෙක ප්‍රාණවධ, පරුෂ වචන, ව්‍යාපාද යන අකුශල කර්ම පථ තුනින් වැඩිවූවාම සයකි. ඒ සය අතීත, වර්තමාන, අනාගත යන තුනින් වැඩිකළාම දහඅටකි ඒ දහඅට තමන් සිත තුල උපදින අකුසල්ය. අනුන්ගේ සිත් තුල උපදින අකුසල්ය කියා දෙකොන් වැඩිකළ කල තිස්හයකි.

ඒ **තිස්හය**— රූප, ශබ්ද, ගන්ධ, රශ, ස්පර්ශ, ධර්ම යන සයින් වැඩි කළාම දෙසිය දහසයකි. එය නගර-ජනපද යන දෙකින් වැඩි කළාම හාරසිය දෙතිසකි. මෙලෙසින් වැඩෙන සිත් පරම්පරාව **එක සත්වයෙක්** විසින් තමන් සසර උපනුපන් ආත්මවලදී ගණන් වශයෙන් එකතුකර කිව නොහැක. සතර මහා සාගරය අඹ පියල්ලකින් මැන ගණන හැදුවත් මහා පොළොව අබ ඇට තරමට ගුලිකර ගණන හැදුවත් පහසු වැඩකි. එක සත්වයෙක් මෙම අග්මුල් නැති සසර උපනුපන් ආත්මවල සිත තුල උපදින ප්‍රාණවධාදී අකුසල් සිත්වල ගනන එකතු කිරීමට අතිශයින්ම දුෂ්කරය. මෙසේ ඇතිවන අනන්තාපරිමාන පටිඝ සිත් නිසා එම **සත්වයා පැමිණ** සතර අපා දුක් විඳින ආකාරද සලකා ප්‍රාණවධාදී අකුශල චෙතනාවන්ගෙන් මිදීමට සිත්වලට ගත යුතුයි.

මේ ප්‍රාණවධයට ප්‍රයෝග සයකි. **සාහත්ථිකො-ආණත්තිකො-නිස්සග්ගියො-ථාවරො-විජ්ජාමයො-ඉද්ධිමයො** යනුවෙනි.

1. සාහත්ථිකය—**සාහත්ථිකොති සයං මාරෙන්තස්ස කායෙන වා කාය පටිබද්ධෙන වා පහරණං** තමා විසින් යමෙක් මරණ කල සිය අත්පා ආදී අවයවයකින් හෝ අත්පා ආදියෙන් ගත් කැති, පොලු. කඩු, කිනිසි, ගල්මුල් ආදී යමකින් හෝ මැරීම සාහත්ථික නම්වේ.

2. ආනත්තිය— **ආනත්තිකොති අඤ්ඤං ආනාපෙන්තස්ස එවං විජ්ඣිත්වා වා පහරිත්වා වා මාරෙහීති ආනාපණං** යම්කිසි සතෙක් මරණු කැමැත්තේ අනිකෙක් අතවා (නියමකොට) මේ විධියට විදලා හෝ මේ මේ විධියට පහරදී හෝ මරවයි අනදී ප්‍රාණවධ කරන්ද එය ආනත්තියයි.

3. නිස්සග්ගිය— **නිස්සග්ගියොති දූරට්ඨිතං මාරෙතුකාමස්ස කායෙන වා කාය පටිබද්ධෙන වා උසු සත්ති යන්ත පාසාණාදීනං නිස්සජ්ජනං** දුර සිටින කෙනෙක්ව මරණු කැමති කල්හි කයින් හෝ කය පිළිබඳ නැතිනම් අත්පා ආදියෙන් ගත් ඊතල, කඩු, යන්ත්‍ර, ගල් ආදිය විසිකර ගසාවිද මරත්ද එය නිස්සග්ගියයි.

4. ථාවරය— **ථාවරොති අසංහාරිමෙන උපකරණෙන මාරෙතුකාමස්ස ඔපාතං අපස්සෙනං උපනික්ඛිපනං භෙසජ්ජ සංවිධානං** ඒ මේ අත ගෙණයන්ට බැරි විසිකිරීම් ආදිය කරන්ට බැරි උපකරණයකින් හෙවත් බොරුවළ් කපා හෙළා හෝ හේත්තු වන (ඇන්ද) පුවරු ආදිය අඩමානෙ තබා හෝ විෂ බෙහෙත් ආදිය යෙදූ ආහාරපානාදිය යොදා තබා හෝ මරවා නම් එය ථාවරයයි.

5. විජ්ජාමය— **සඞ්ඛෙපතොහි මාරණත්ථං විජ්ජාපරිජප්පනං විජ්ජාමයො පයොගො** සංක්ෂෙප වශයෙන් මරණ අදහසින් ශාස්ත්‍ර උගෙණ ජප කිරීම් ආදියෙන් මැරීම විජ්ජාමයයි.

6. ඉද්ධිමය— **කම්මවිපාකජාය ඉද්ධියා පයොජනං ඉද්ධිමයො පයොගො** පූර්ව කර්මානුරූපව ලබන ලද ඉර්ධිබලයෙන් යමෙක් මරත් නම් එය ඉද්ධිමයයි.

මෙකී සය ප්‍රයෝගයන්ගෙන් මුලින් කී සතර තේරුම් ගැණීමට පහසුයි. විජ්ජාමය, ඉද්ධිමය දෙක ගැණ තව සවල්ප විස්තරයක් කරමු.

**කතමො විජ්ජාමයො පයොගො අථබ්බණිකා අථබ්බණං පයොජෙන්ති නගරෙ වා රුද්ධෙ සංගාමෙ වා පච්චුපට්ඨිතෙ** -පෙ- ඉන්ද්‍රජාලකාරයෝ හෝ හදිහූනියම් අඬගං පිල්ලි කරන්නෝ හෝ ලවා මරවත්ද මරත්ද නුවරදී හෝ ආවරණයවූ මරණයට යෝග්‍ය තැනදී හෝ යුද්ධ භූමියෙහිදී හෝ සතුරු සෙනග ඉදිරියෙහි එළඹ සිටි කල්හි හෝ උපද්‍රව, රෝග, අජීර්ණ, වමන ආදී විපත්ති උපදවා මරත්ද යන්ත්‍ර මන්ත්‍රාදි බලයෙන් මරත්ද මේ ඈ සියල්-ලෙන් ප්‍රාණවධ කිරීම විජ්ජාමයයි.

**කම්මවිපාකජිද්ධිනාමෙ සා නාගානං නාගිද්ධි සුපණ්ණානං සුපණ්ණිද්ධි යක්ඛානං යක්ඛිද්ධි දෙවානං දෙවිද්ධි රාජානං රාජිද්ධි බහුවිධා** කර්ම විපාකජ ඉර්ධිය-ඉර්ධිමය ප්‍රයෝගයයි. කර්ම විපාකජ කීවේ කරණ ලද කුශලා කුශල කර්ම බලයෙන් ලබාගත් ඉර්ධියයි. නයින්ගේ ඉර්ධිය-සුපර්ණයන්ගේ ඉර්ධිය-යකුන්ගේ-දෙවියන්ගේ -රජුන්ගේ ඉර්ධියයි බොහෝ ඉර්ධිවෙත්. මේ ඉර්ධි ඔදුනොවුන්

කරණ ලද කර්මානුරූපව ලැබෙන ඉර්ධිවෙත්. මේ ඉර්ධි බලයෙන් නමුත් ප්‍රාණඝාත කරත්නම් අකුසල් සිදුවේ. නාගිර්ධිය නාගයන් දුටුවිට දෂ්ට කළවිට ඇග නැවරුණවිට අන්‍ය ප්‍රාණීන් මැරෙත්. එබඳු විෂ ඇති බඹ දෙසියය තුන්සියය තරම් දිග හා ඊට සරි මහත ඇති නාගයන් රැගෙණ ඉගිලී යන්ට ශක්තිය ඇති ගුරුලන් සිටිත්. ඒ සුපර්ණ ඉර්ධියයි. යක්ෂයන් යන එන කිසිවක් හෝ ශරීරය හෝ නොදැකම ඔවුන් ගසා මැරෙත්. ඒ යකුන්ගේ ඉර්ධියයි. වෛශ්‍රවනවරම් රජ නයනාවුධයෙන් රවා බලා කුම්භාණ්ඩයන් මැරූ ගනන් නිම්හිම් නැත. (සොවාන් වන්ට පෙර) ඒ දෙවිඩියයි. සක්විති රජුහට, ධර්මශොකාදී රජවරු හට ලැබුණු ඉර්ධිය රාජිර්ධියයි මෙකී මොනම ඉර්ධියකින් නමුදු ප්‍රාණවධ කරත්නම් ඒ සියල්ල ඉඩිමයයි. යම්කිසි ශ්‍රමණ බමුණු ආදියෙක් බැව්මෙන් සිත් වසඟ කර ගත්තේ අනිකෙකුගේ කුසෙහි හෝ හටගත් ප්‍රාණියෙක් හෝ (හෙලන) නසන අදහසින් එම ගැබ වැනසී යෑමට එම ප්‍රාණියා සැපසේ නොම ඉපදීමට අධිෂ්ඨාන කරන්ද (සිතත්ද) එලෙසම එම ගැඹ නැසීයෙත්ද එය භාවනාමය ඉර්ධියයි.

එම භාවනාමය ඉර්ධියෙන් ප්‍රාණවධ කලොත් ප්‍රාණවධ සිදුවන කොටම එම ඉර්ධියද ඔහුට නැතිවී යත්. ගේ කෙසේද ගිණි ගෙණ දෑ පිලිස්සී විනාශවී යන ගෙයක් තුල තිබුණ වතුර කළද වැනසී යන්නා මෙනි. මන්ද ඉර්ධිය සිතින් පුරුදු කල ඊප්සා මාත්‍රයක් බැවිනි. **එම ඊප්සා මාත්‍රය කෙසේනම නැසේද?**

**කුසල-අකුසල-විතක්ක සවිතක්කාති කොහි නසමෙකී** මේ භාවනාමය ඉර්ධිය කුශල-අකුශල-අව්‍යාකෘත යන ත්‍රිවිධ විපාක සිත්වලද සැප-දුක්-මධ්‍යස්ත යන වේදනා තුනෙහිද විතක්ක විචාර -අවිතක්ක අවිචාර-සවිතක්ක සවිචාර යන ත්‍රිවිධ විතර්ක සිත්වලද පරිත්ත-මහග්ගත-අප්පමාන යන ත්‍රිවිධ සිත්වලද කුසල් අකුසල් සමවනු පදිත්. භාවනාමය ඉර්ධිය කුශල අව්‍යාකෘත සිත්වලද, ප්‍රාණඝාතය අකුසල් සිතෙහිද, එසේම දුක් වේදනා සිතෙහිද, සවිතක්ක සවිචාර සිතෙහිද, පරිත්ත සිතෙහිද ප්‍රාණාතිපාතය වෙන්වම සිදුවෙත්.

එබැවින් අකුශලකර්මයට හිත අකුශල් සිත් පහලවනවිට කුශල කර්මයට හිත සිත් දුරුවන බැවින් භාවනාමය ඉර්ධිය මුල් සුන්වී යෙත්. මෙසේ අකුසලයෙන් වැනසෙන්නේ ලෞකික ඉර්ධියයි. මෙසේ මේ සය ආකාර ප්‍රයෝගයන් පිළිබඳව දී තිබෙන විස්තර මෙබඳු සුළු වේලාවක් කරණ දෙශනාවකින් කියා අවසන් කරන්ට නොහැකියි.

මීලඟට සාහත්ථික ප්‍රයෝගයෙන් ප්‍රාණවධය ගිහිපැවිදි හැම දෙනෙකුටම සිදුවන ආකාරයක් කෙටියෙන් කියා දෙමි.

යම් කෙනෙක් එලුවෙක් මරන්ට සිතා එම එලුවා ලගින තැන ලකුණු හොඳට දවාලේ බලාගෙන රාත්‍රියෙහි මරන්ට යනවිට එලු ලැගි තැන ඔහුගේ මව් හෝ පියා හෝ රහතන් වහන්සේ නමක් හෝ වෙන අන්කෙනෙක් හෝ සිට නොදැනම මරණ චේතනාවෙන් පහරදී මරත්ද මරණයට පැමිණියේ මව්පිය රහත් කෙනෙක් නම් ආනන්තරිය පාපයද, අන්කෙනෙක් නම් ප්‍රාණඝාත අකුශලයද සිදුවේ. පැවිද්දෙක් නම් පාරාජිකාවේ එතන යක්ෂ ප්‍රේතාදී අන්ප්‍රාණියෙක් සිට පැවිද්ද විසින් මැරුවා නම් ප්‍රාණඝාත අකුශලය සිදුවේ.

මව් පියාදීන් මරණවාය කියා අන් සතෙක් මරණ ලද්දේ නම් ආනන්තරිය කර්මයට හා ප්‍රාණවධයටද පැමිණෙත්. පාරාජිකා පත්තියටද පැමිණෙත්. අන් මිනිස් ආදි කෙනෙක් හෝ යක්ෂ ප්‍රේතාදී කෙනෙක් හෝ මරමියි සිතා වෙන අන්කෙනෙක් මරයිද ප්‍රාණඝාතයද මිනිසෙක් වීනම් පැවිද්දට පාරාජිකා පත්තියද අන් කෙනෙක් නම් ප්‍රාණඝාතයද සිදුවෙත්. මෙම ප්‍රාණඝාතයෙහිදී ඉතාම දරුණු වශයෙන් සැලකිය යුත්තේ සිත තුළ හටගන්නා චේතනාසි. සිතිවිලි අනුවම පාපකර්මය දරුණුවෙත්. හේ මෙසේයි.

නැවරුණ ලේ ඇති කඩු පිහි ආදියක් ලේ පිස හැරීමට පිදුරු බිස්සකට ගසයිද එහි සිටි මව්පිය, රහතන් ආදී යමෙක් මලේ නමුදු ඉන් වධක චේතනාවක් නැති බැවින් කර්මපථය නොසිදුවේ ව්‍යවහාර වශයෙන් ප්‍රාණඝාතකයායයි නම් පමණක් වෙත්. යමෙක් නොදැන පිදුරු බිසි ආදියට කඩු පිහි ආදියෙන් ගසන කල එහි තුළ යමෙක් ඉන්නා බව දැන ඔහු මැරේවා යන වධක චේතනාවෙන් ගසා මරත්ද ඉන් මුලින් කීලෙස ආනන්තරිය ආදී අකුසල් පිළිවෙළින් වෙත්. මෙසේ සාහත්ථික ප්‍රයෝගයෙන් ප්‍රාණඝාතය වන ආකාර දතයුතුයි.

**ආනත්තිකය**

**වත්ථුං කාලංච ඔකාසං – ආවුධං ඉරියා පථං**
**තුලසිත්වා පඤ්ච ඨානානි – ධාරෙය්‍යත්ථං විචක්ඛණො**

මින් ප්‍රකාශ කරන්නේ ආනත්තික ප්‍රයෝගයයි. වත්ථු–කාල –ඔකාස–ආවුධ–ඉරියව් යන පස් ස්ථානයෙහිදී මරවයි අනදී එලෙසම මැරුවොත් නියම කාල අයට හා මැරූ අයටද ප්‍රාණඝාතය සිදුවේ. එම නියම වෙනස්වී මැරුවහොත් මැරූ තැනැත්තා හට පමණක් ප්‍රාණඝාත අකුශලය සිදුවේ. අනදුන් අයට පව් සිදුවේ.

මරණ තැනැත්තා නියම කිරීම වස්තුවයි. උදේ සවස බාල මහළු ආදී කාලය නියමකිරීම කාලයයි. ගමේදී-කැලේදී-ගෙදරදී ආදී තැනක් නියම කිරීම ඔකාසයයි. කඩු-කැති-පිහි ආදී ආවුදයක් නියම කිරීම ආවුදයයි. යාම්, ඊම්, ඉඳීම්, සිටීම් ආදී ඉරියව්වකදි මරන්ට නියම කිරීම ඉරියා පථයයි. මෙලෙසින් ඉතා දීඝී විස්තරයක් ප්‍රාණඝාතය පිළිබඳව ප්‍රකාශව තිබෙන්නේ ප්‍රාණවධය ට ගිජුවූ සත්වයන් බහුල බැවිනි. ඔවුන් ප්‍රාණවධ කිරීමට නොයෙක් උපක්‍රම් යොදා ඉන් තම අදහස ඉටුකරගෙණ තමා වරදට නොබැඳුන අයුරු නා නා ක්‍රම කථා කරණ බැවිනි. එසේ මූලාවට පැමිණ කපටි උපාමාරු යොදා ප්‍රාණවධයකොට නිදහසක් නම් කොයින් ලබන්ද ලොව සත්පුරුෂයන් විසින් ඉතා පහත් නීච ක්‍රියාවක් ලෙස සැලකූ මෙම ප්‍රාණවධය ගැණ සිතා බලා ඊට ලජ්ජා බිය උපදවා එම ප්‍රාණවධය තමහට යමෙක් සිදුකලොත් ඇතිවන සංවේගයද සිතා ඉන් සම්පූර්ණයෙන් විදීමට ඉටාගත යුතුයි.

මෙලෙසින් කෙටි විස්තරයක් කියන්ට යෙදුන ප්‍රාණ ඝාතය පිළිබඳව පෙර සිදුවූ අපූරු පුවතක්ද මේ පිරිසට සිහිපත් කරවන්ට අදහස් කරමූ. ඉන් කුඩා නමුත් ප්‍රාණවධය කටුක විපාක දෙන බව සලකා ගත හැකියි. අල්පසාවද්‍යය කියා කුඩා සතුන් මැරීමට බිය ලජ්ජා නැති බවද මේ කථාව ඇසීමෙන් ඇතිකොට ඉන් මිදී සිටීමටද කල්පනාවට ගත හැකියි.

මේ ඒ ප්‍රවෘත්තියයි:— පෙර වත්සර රට කොසඹෑ නුවර දීප-මණ්ඩප නම් බමුණු කුමරුවන් දෙපලක් පස්කමෙහි දොස් දැක තම සතු සියලු ධන රාශිය පරණට දන්දී වන වැද තපස් කරනුයේ වස් සාරමස ලුනු බුදිම්පි නගරයට පැමිණ ගිහිකල සිට හිතමිත්ව සිටි මණ්ඩපප නම් මිත්‍ර කෙළඹියෙක් කරා පැමිණියහ. තවුස් දෙපල දුටු කෙළඹියා ආදරයෙන් උපස්ථානකොට තම නිවසට ආසන්න තැනක පන්සලක්කොට සාරමස නවතා ගත්හ. එහි සිටි තවුස් දෙපලෙන් මණ්ඩප තවුසා බැහැර තුබූ සොහොනකට වැද තවුස්කම් කරති. මේ අතර නුවර ගෙයක් බිඳ බඩු පැහැර ගෙණ යන ශසාරුන් දුටු ගෙහිමියො ලුහුබැඳ සොරුන් පන්නා ආහ. ඒ දුටු සොරුන් පැහැර ගෙණ ආ බඩු සොහොන මැද දමා පැන ගියහ. බඩු දුටු බඩු හිමියෝ වටපිට සොරු සොයනුයේ නිරපරාධ මණ්ඩප තාපසයන් දැක දවල් සිල් රැක රෑ මේ කරණ නිවකම්යයි ඵරුෂ බස් කියා තලා මරු මේ සොරුයයි බඩුත් සමග රජහට දැක්වීන. තවුසා දුටු රජ කෝපයට පැමිණ උල තැබීමට අනදුන්හ. වධකයෝ වද දෙමින් උල තබන තැනට

පමුණුවා කිහිරි උලක් ගෙණ කසලම්මග ඇනපීහ. එම සිහින් රළු කිහිරි උල නොඇනී නැමී ගියහ. නැවත කොසඹ හුලක්ද යහුලක්ද ඇනපීහ. හෙද නැමී ගියහ එය දුටු සිල්වත් තවුස් තෙම හුල නැඹීමට වන් කර්මයත් හුල නැනෙන්ට හේතුත් සිතනුයේ පෙර කළ පාපකර්මය දුන (ජාතිස්මරණ ඥාණය පහළව) පෙර තමන් වඩුවෙකුගේ පුතෙක්ව උපන් කළ කොබෝලීල ලී පතුරකින් උලක්කොට මැස්සෙක් අල්වා කසලම්මග එම හුල ඇනිකල හුල කොන කැඩී මැස්සා ඉගිලී ගිය බවත් එම මැසි නොමැරී ජීවත්වූබවත් එම කර්මයට සසර කීපවර විපාක වශයෙන් උල හිඳින්ටවූ බවත් මේ වාරයෙහිද එම හුලම ඉඳින්ට වන බවත් සලකා වධකයින්ට කථාකොට මා උල තබන්ට කොබෝලීල ලීයකින් සාදන උලකින්ම හැකිවන බව කීවේය. එය ඇසූ වධකයෝ එම ලීයකින් උලක් සාදා තවුසාගේ කසලම්මග ඇන උල තබා ගියහ. කීපදිනකින් මිතුරු තවුසාගේ සුව දුක් තොලක් හෙයින් දීප තවුසා සොයාගොන බලා එන්නේ උල ඇනී සිටි මිතුරු මණ්ඩප තවුසා දුන කරුණු අසා විචාරණුයේ සිල්වත් තවුසානනි, මේ විපතට පත්කළ වධකයන් කෙරෙහිත්, රජු කෙරෙහිත්, බඩු හිමියන් කෙරෙහිත් ක්‍රොධ සිත් පහළ කෙළෙහිදැයි ඇසීය. නැත මිත්‍ර දීප තවුසානනි, මා කළ කර්මයට මා විපාක විඳිනා විනා අන් අය කෙරෙහි ක්‍රොධ කිරීමෙන් වැඩක්දැයි ඇසීය. එම යහපත් බසැසූ දීප තවුසානෝ මෙබඳු සිල්වත් මිතුරන් සමගම මිය යෑම යහපතැයි හුල මුල ලේ ගොඩෙහිම හොත්තාහ. ඒ දුටු පුර-වැස්සෝ මෙපුවත් රජුට දන්වා රජු වහා පැමිණ හුල තැබූ තවුසානන් වඩා හිඳුවා වහා හුලගැලවීමට උත්සාහ කළහ. එනමුදු ඇනි හුල ගැලවීමට නම් නොහැකිවිය. මන්ද පෙර කළ මැස්සාට ඇනි හුල උඟ ඇඟතුලම තුබූ බැවින් හුලගලවන්ට නොහැකි බවත් ඇතුලට ඇනුන පෙදෙස ඉතුරුවන්ට හැර සම ලඟින් කපන්ටයයි තවුසානන් කීබස අසා එසේකොට තවුසානන් සමා කරගෙණ හුල ඇනී ගිය වනයට පිළියම් කළහ තවුස් තෙම මියනතුරුම එම හුල ඇඟෙහිම විය. මේ පුවත අසන ඔබ හැමදෙනෙකුටම සතුන්ට හිංසාකිරීමේ හා සතුන් මැරීමේ වරද සුළු එකක් නොවන බවත් ඊට සසර විපාක දෙන වාරයේදී කුඩා සතාය කියා අත නොහැරෙන බවත් සලකා ගත හැකියි. මේ ආදී ධර්මකථා ඇසී-මෙන් පරපන වැනසීම බරපතල පවකැයි සිත්වලට ගෙණ ප්‍රාණ වධයෙන් වැලකීමයයි කියනලද සම්‍යග් කර්මාන්තය සපුරු කෙලෙස් කසට සෝදා හැර සසරින් මිදීමට උත්සාහවත් වියයුතුයි.

මීළඟට අදින්නා දානය පිළිබඳව කෙටි විස්තරයක් කියාදීමට කල්පනා කරමු.

**අදින්නා දානය— අදින්නස්ස ආදානං අදින්නාදානං පරස්සහරණං ථෙය්‍යං චොරිකාති වුත්තං හොති.** නුදුන් දෙය සොර සිතින් ගැණීම අදින්නා දානයයි. පරසන්තක දෙය සොරාගැන්ම සඟවාගැන්ම හොරකම් කිරීම නමැයිද කියනු ලැබෙත්. මෙහි අදින්න නම් පරසතු දෙයයි. ඔහු විසින් නුදුන්න වස්තුයි. යමෙක් යම්කිසි සාධාරණ ධාර්මික ක්‍රමවලින් සපයා ගත් වස්තු ආදියක් ඇද්ද ඒ වස්තු ආදිය මේ මේ දේ ඒ ඒ අය සතු දේවල්ය. මේවා මම පැහැරගන්නේ සොර සිතින්ය යනාදිය සිතමින් ඒ අනුව උපක්‍රම යොදමින් සඟවා පැහැර ගනිත්ද එය අදින්නා දානයයි.

**තංහිනෙ පරසන්තකෙ අප්පසාවජ්ජං පණීතෙ මහාසාවජ්ජං** ඒ මිල මුදල් ආදී වස්තුව අයිතිකරු හීන ක්‍රියා ඇති අයෙක් නම් ඔහු සතු වස්තුව හොරා ගැන්මෙන් අල්පසාවාද්‍ය වශයෙන් අදත්තාදාන අකුසලයද යහපත් ක්‍රියා ඇති අයෙක් නම් මහා සාවාද්‍ය වශයෙන් අදත්තාදාන අකුසලයද සිද්ධවෙත්.

**වත්ථු සමත්තෙසති ගුණාධිකානං සන්තකෙ වත්ථුස්මිං මහාසාවජ්ජං** ධාර්මික වස්තු සෙවීම සමව ඇති කල්හි යහපත් ගුණයන්ගේ අඩු වැඩි අනුමින් අල්පසාවාද්‍ය මහා සාවාද්‍ය අදත්තාදාන අකුසල් සිද්ධවෙත්. මෙසේ ක්‍රමයෙන් ඔවුනොවුන්ගේ ගුණසීලාදී මහත්වය සලකා අදත්තාදාන අකුසලය බරපතල් වන බැව් දැන අල්පසාවාද්‍ය මහා සාවාද්‍ය ක්‍රම දෙකින්ම දුරුව හොරකමෙහි දොස් දැන දැක එය නීතීනයන් විසින් කරණ ම්ලේච්ඡ නින්දිත ක්‍රියාවකැයි සලකා ඉන් වෙන්වී සිටීමට ඉටාගත යුතුයි.

මෙකියන අදත්තා දානයටද අඞ්ග පසක් සම්පූර්ණ විය යුතුයි. එනම් :-

1. අනුන් සතු වස්තුවක්වීම,
2. එම වස්තු අනුන්ගේ බව තමා දැන සිටීම,
3. හොරකම් කරමියි යන සිත,
4. ඊට කරණ උපක්‍රම,
5. ඉන් පැහැරගැන්ම යන පසයි.

ප්‍රාණ ඝාතයටමෙන් මෙම අදත්තා දානයටද ප්‍රයෝග සයකි. එනම් :-

**සාහත්ථිකය-ආනත්තිය-නිස්සග්ගිය-ථාවර-විජ්ජාමය-ඉද්ධිමය** යනුයි. ඒ සය වැදෑරුම් ප්‍රයෝගයන්ද එකිනෙක කෙටියෙන් විස්තර කර කියමු.

1. අන්සතු දෑ සිය ගතින් හෝ අතින් සොර සිතින් පැහැර ගෙණ තමන් අයිතියට ගතිත්නම් එය සාහත්ථිකයි.

2. අන්සතු වස්තු, අසවල් දෙය, අසවල් ක්‍රමයට අසවල් උපායෙන් ගනුවයි කෙනෙකුට නියමකොට සොරකම් කරවා තමන් සතු කර ගතිත්ද එය ආණත්තියයි.

3. යම් අන්සතු දෙයක් තුබූ තැනින් අන්තැනකට විසිකර එතැනින් සොරා තමන් සතු කරගැන්ම නිස්සග්ගියයි.

4. යම් කිසිවෙකු සතු වස්තුවක් තිබෙන තැනින් වෙනස් කරන්ට බැරි නිසා ලකුණු තබා විත් එම සලකුණු කියා වෙන් කරවා හෝ ලැබුනු කාලකදී එම ලකුණු අනුසාරයෙන් පැහැර ගැන්ම හෝ ථාවරයයි.

5. යම් කිසිවක් හොරකමින් ගන්ට අපහසු වූවිට ජපමන්ත්‍ර හදිහූනියම්කොට අයිතිකාරුගේ සිහිමුලාකරවා පැහැර ගෙණයැම විජ්ජාමයයි.

6. යම්කිසි වස්තුවක් සොරාගැන්මට අපහසු වූවිට ඒ ඒ නාග සුපර්ණ දෙව යක්ඛ රාජාදීන්ගේ ඉර්ද්ධි මහිමයෙන් ගන්වා ගන්ට ඕනෑයයි සිතා ඔවුන් වසඟකොට ඉන් තමන් උසස් බවට පැමිණ පැහැර ගැන්ම ඉර්ද්ධිමයයි. මෙකී සය ආකාර ප්‍රයෝග මෙසේ දැනගෙණ නැවත අදත්තා දන අකුසලයට අයත් අවහාර විසි පහක්ද දතයුතුයි. එම පස්විසි අවහාරයද ඉතා කෙටියෙන් මෙසේ සලකා තේරුන් ගන්න.

1. **නානා භණ්ඩ පඤ්චය**, 2. **ඒක භණ්ඩ පඤ්චය**, 3. **සාහත්ථික පඤ්චය**, 4. **පුබ්බපයොග පඤ්චය**, 5. **ථෙය්‍යාවහාර පඤ්චයයි**. අවහාර පස පස බැගින් විසිපහකි. හෙවත් සොරාගෙණ යැම් පස්විස්සකි.

1–5. **නානා භණ්ඩ පඤ–ආදියෙය්‍ය–හරෙය්‍ය–අවහරෙය්‍ය –ඨානා චාවෙය්‍ය–ඉරියාපථං විකොපෙය්‍ය** අනුන් සතු බඩු තමා පැහැර ගණීද, අනුන් ලවා ගෙන්වා ගණීද, ආරක්ෂාවට තිබූ බඩු ඉල්ලූවිට තමා ගත්තේ නැත කියා නොදී ගණීද, සවිඤ්ඤාණක (පන ඇති) අවිඤ්ඤාණක (පන නැති) වස්තු සිටි තැනින් තුබූ තැනින් වෙන්කර පැහැර ගණිත්ද, තිබුන තැනින් වෙන්කොට තබා පසුව විත් ගෙණයත්ද යන පස් ආකාරයෙන් නොයෙක් බඩු සොරාගෙණ යැම නානා භණ්ඩ පඤ්චකයයි (පසයි.)

මින් සිදුවන අකුසල් පැවිද්දාට **ආදියෙය්‍ය** අන්සතු බඩුගෙන ගමනට සැරසෙනවිට දුෂ්කට ආපත්ති වේ. බඩු අයිතිකාරුට

මෙතන තිබුන මගේ බඩු නැත යන විමතිය උපදිනකොට ථුලසි ඇවත් සිදුවේ. බඩු නැතිවූවායයි අයිතිකරු ආලය අතහරින කොටම පාරාජිකා ඇවතට පැමිණේ.

**හරණය** — අනිකෙක් ලවා අන්සතු දෙය හොරකම් කර වන්නේ අන්සතු වස්තුව ගන්ට හොරහිතින් අත තබනකොට දුෂ්කට ඇවත් සිදුවේ. තුබූ තැනින් සොලවාද ථුලසි ඇවත්වේ. කඳට ගණිද පාරාජිකා වේ.

**අවහරණය**— ආරක්ෂාවට තැබූ බඩු ඉල්ලූ කල මා ගත්තේ නැත කියාද දුෂ්කට ඇවැත් වේ. දෙනුන්වර ඉල්වන කල නොලැබේයයි සිතේද ථුලසි ඇවැත් සිදුවේ. බඩු ලැබෙන්නේ නැත කියා අයිතිය හැරයාද පාරාජිකා ආපත්තියට පැමිණේ.

**ඉරියව් විකොපනය**— බඩු සහිත ගෙණ යන්නහු සොර සිතින් පළමු පියවර තබවත්ද ථුලසි ඇවැත්වේ. දෙවෙනි පියවර තබවත්ද පාරාජිකා වේ.

**ඨානා චාවනය**—යම් තැනක තුබූ බඩු සොරසිතින් අල්වත්ද දුෂ්කට ඇවැත්වේ. සොලවත්ද ථුලසි ඇවැත්වේ. එතැනින් වෙනස් කරත්ද පාරාජිකාවේ. මේ පාරාජිකා ඇවත සිදුවීමට වටිනාකමද තිබිය යුතුයි.

2–5. එක භණ්ඩ පඤ්චකයද— **ආදියෙය්‍ය- පෙ ඉරියාපථං විකොපෙය්‍ය** යන නා නා භණ්ඩ පඤ්චකයට කී පස් අවහාරයමයි. වරද සිදුවීමද එලෙසමයි. සතරවන **ඉරියව් විකොපනය** ඉරියව් වෙනස් කිරීම් අවහාරයෙහිදී සවිඤ්ඤාණක (පන ඇති) වස්තු පමණක් ගත යුතුයි. මේ එක භණ්ඩ පසයි.

3–5. **සාහත්ථික පස—සාහත්ථිකො-ආණත්තිකො-නිස්සග්ගි-යො-අත්ථසාධකො-ධුරනික්ඛෙපො** අනුන් සතු බඩු සියතින් හොරාගෙණ යෑම සාහත්ථිකයි. අසවල් බඩු ගෙණ එවයි සොරෙන් ගෙන්වා ගැන්ම ආණත්තිකයි. අයබදු නොගෙවා තමා සොර සිතින් ඒ ඒ පෙදෙස්වලට ගොස් මග හැර සිටීම නිස්සග්ගිකයි. අසවල්නම් බඩු යම් දවසක පැහැර ගන්ට ලැබෙත්. එදාට ගනුවයි අනකාර සොර සිතින් ගෙන්වා ගැන්ම අත්ථ සාධකයි. ප්‍රවේසමට තැබූ බඩු නොදී සොර සිතින් ගෙණ පොරොන්දු කඩකිරීම ධුරනික්ඛේපයයි. මේ සාහත්ථික පසයි.

4–5. **පුබ්බපයොග පස — පුබ්බපයොගො - සහපයොගො - සංවිදාවහාරො-සංකෙතකම්මං-නිමිත්තකම්මං කලින් නියම කර**

කුඹු බඩු සොර සිතින් ගෙන්වා ගැණීම පුබ්බපයොගයයි. තිබුන තැනින් උපායෙන් වෙන්කොට සොරා ගැන්ම සහපයොගයයි. සංවිධානයකොට එපරිදි සොරාගැන්ම සංවිදාවහාරයයි. සලකුනු තබා විත් එය අඟවා සොරකම් කරවීම සංකේත කර්මයයි. මේ මේ ළප සලකුණු ඇති බඩුයයි නිමිති කියා සොරකම් කරවා නම් නිමිත්ත කර්මයයි. මේ පුබ්බයෝග පසයි.

5–5. **ථෙය්‍යාවහාර පස— ථෙය්‍යාවහාරො-පසය්හාවහාරො-පරිකප්පාවහාරො-පටිච්ඡන්නාවහාරො-කුසාවහාරොති** සොර සිතින් කුසපත් දැමීමෙන් පැහැර ගැන්ම ථෙය්‍යාවහාරයයි. බලහත්කාරයෙන් සොරාගැන්ම පසය්හාවහාරයයි. වැරදි අදහසින් සිතා එය වෙනස් නොකොට වැරදිසේ සොරා ගැන්ම පරිකප්පාවහාරයයි. සඟවාගෙණ සොර සිතින් ගැන්ම පටිච්ඡන්නාවහාරයයි. කුසපත් වෙනස්කොට සොර සිතින් ගැන්ම කුසාවහාරයයි. මේ ථෙය්‍යාවහාර පසයි. මෙසේ අවහාර පස්විස්ස දත යුතු පාප විපාකාදිය පැවිද්දෙකුට නම් මූලින් ත්‍රා තා භණ්ඩ පසට කී ආකාර සලකා ඒ අනුසාරයෙන් දතයුතුයි. ගිහියෙකුට නම් අදත්තාදාන අකුසලය වස්තු ගුණ සීල මහත්වාදිය අනුව අංග සම්පූර්ණවීමෙන් අල්පසාවද්‍යව හෝ මහා සාවද්‍යව ලැබෙත්. අඞ්ග අසම්පූර්ණ-වීමෙන් සිතිවිලි අනුව වැරදි සිදුවෙත්.

මෙම අදත්තාදාන පාප කර්මයෙන් සසර අසරණව, නිසරුව, දුගීව, බැගෑව, දුප්පත්ව, විලිවසා ගැන්මට රෙදිකඩක් පවාවත් බඩපුරා ගැන්මට කෑදිත්තක්වත් නොලැබ දුක් විඳිනා අතර දුටුවන්ට අසූචිමෙන් පිළිකුල්වූ ඇසුවන්ට කරදරවූ විරූප දුගීබව ගත් ලබා කල් යවා මරණින් මතු සතර අපා දුගතීන්හි උපදින බව සලකා අදත්තාදාන පාපයෙන් වැලකී සම්‍යක් කර්මාන්තය සපුරා සග පවග සැප සාධාගත යුතුයි.

මීලඟට තුන්වන මිථ්‍යා කර්මාන්තය වන කාමයෙහි වරදවා හැසිරීම පිළිබඳව ඉතාම කෙටි විස්තරයක් දීමට බලාපොරොත්තු වෙමු. සසර මිනිස් තිරිසන් ඈ සෑම සතෙකුටම කටුකතම දුර්විපාක උපනුපන් ආත්මයක් පාසා ගෙණදේ මේ කාමමිථ්‍යා-චාර අකුසලය මිනිසත් බව ලත් සෑම කෙනෙක්ම සෑම ක්ෂණයක දීම නුවන මෙහෙයා බලා මේ ඉමහත් වරදකැයි සිතට ගෙණ ඉන් වෙන්වී සිටීමට තරයේ අධිෂ්ඨාන කරගත යුතුයි. ලොව සියලුම විපත්තිවලට හා මිනීමැරීම්, ලේ සෙලවීම් ආදී විෂම පාපයන්ට මහා සාවද්‍ය අකුසලයන්ට ඇතුල්වන එකම මරු කපොල්ලක් වැනි මෙම පහත් නින්දිත වරද ගැණ නොසලකා ක්‍රියාකරන්නන්

හට නියම මිනිසත් බවක් ලබාගැන්ම නම් කෙසේ නම් කළ හැකිද කල්ප ලක්ෂ ගණනකිනුදු ලබාගත නොහැක. ඉන්නිසා මෙවරද තම සාපරාධ පාපය හොඳින් තේරුන් ගත වැලකීමට උත්සාහ කරණ ලෙස බලවත් සත්වානුකම්පාවකින් කරුණා මෛත්‍රී පෙරටුව සිහිපත් කරවමු.

3. කාමයෙහි වරදවා හැසිරීම — **එත්ථ පනකාමෙසූති මෙථුන සමාචාරෙසු** මෙහිදී කාමෙසු යන්නෙන් මෛථුන සමාචාරය කියත්. ස්ත්‍රී පුරුෂ දෙදෙනෙක් එක්ව කාමයෙහි හැසිරීමයි. වයන්වය සමාපත්තියයිද මීට නම්වේ. **මිච්ඡා චාරොති එකන්ත නින්දිතො ලාමකාචාරො** ඒකාන්තයෙන් නින්දිතවූ ලාමක පහත් හැසිරීම මිච්ඡාචාරයයි. **ලක්ඛණතො පන අසද්ධම්මාධිප්පායෙන කායද්වාරප්පවත්තා අගමනීයට්ඨාන වීතික්කම චෙතනා කාමෙසුමිච්ඡාචාරො** කාමයෙහි වරදවා හැසිරීමේ ලක්ෂණය නම් ලොකධර්මය ඉක්මවා වැරදි අදහසින් නොයෑ යුතු ස්ත්‍රීන් කරා යමින් කුලධර්ම ගුණධර්ම වනසා කයින් කරණ වැරදි ක්‍රියා අනුව පවත්නා සිත කාමයෙහි වරදවා හැසිරීමයි මෙහිදී.

**අගමනීයට්ඨාන** නොයෑ යුතු තැන් දතගත යුතුයි. ස්ත්‍රීවරු විසි දෙනෙකි. මාතුරක්ඛිතාදි දස දෙනෙක්ද, ධනක්කීතාදී දස දෙනෙක්ද වශයෙනි. ඒ මෙසේයි.

**මාතුරක්ඛිත, පිතුරක්ඛිත, මාතුපිතුරක්ඛිත, භාතුරක්ඛිත, භගිනිරක්ඛිත, ඤාතිරක්ඛිත, ගොත්තරක්ඛිත, ධම්මරක්ඛිත, සාරක්ඛා, සපරිදණ්ඩාති, මාතුරක්ඛිතාදයො දස.**

මව් රකින ස්ත්‍රිය, පියා විසින් රකින ස්ත්‍රිය, මව් පිය දෙපල ආරක්ෂාකරණ ස්ත්‍රිය, සහෝදරයන් රකිනා ස්ත්‍රිය, සහෝදරියන් රකින ස්ත්‍රිය, නෑයන් ආරක්ෂා කරණ ස්ත්‍රිය, කුලය විසින් රකිනා ස්ත්‍රිය, ධර්මය විසින් (ධර්මය අනුව හැසිරෙන) ආරක්ෂා කරණ ස්ත්‍රිය, ආරක්ෂා තබා රකින ස්ත්‍රිය, දඩුවම් තබා රකින ස්ත්‍රිය කියා දසදෙනෙකි.

**ධනක්කීතා, ඡන්දවාසිනී, භොගවාසිනී, පටවාසිනී, ඔදපත්තකිනී, ඔභතචුම්බටා, දාසීචභරියා, කම්මකාරීචභරියා, ධජාහටා, මුහුත්තිකාති, එතා ධනක්කීතාදයො දසාති විසතිත්ථියො.**

මිලදී ගත් ස්ත්‍රිය, කැමැත්තදී වසන ස්ත්‍රිය, වංගෙඩි මෝල් ආදී ගෘහභාණ්ඩ දී ලබාගත් ස්ත්‍රිය, හඳිනා වස්ත්‍රාදිය දී ලබාගත් දුප්පත් ස්ත්‍රිය, දිය භාජනයෙහි ස්ත්‍රීපුරුෂ දෙපල දෙඅත් දමා මේ දියමෙන්

**එක්ව** වසමූයසි පොරොන්දුවී ගත් සත්‍රිය, හිසෙහි දරණුවක් හෝ චුම්බටකයක් (හිසින් දර ආදිය ගේනවිට හිස ප්‍රවේසමට තබාගත් කොට්ටය) හිස තබා දරදිය අදින තැනැත්තියක් භාර්‍ය්‍යාභාවයට ගිවිසගත් කළ එම සත්‍රිය, දාස භාවයට ගෙනැවිත් භාර්‍ය්‍යා කරගත් සත්‍රිය, සිය භාර්‍ය්‍යාවට වැඩකරගැනීමට ගෙන්වා ගෙන පසුව භාර්‍ය්‍යා භාවයට ගත් සත්‍රිය, යුද්ධයෙහිදී පැරදී ගිය සතුරන්ගෙන් අල්වා ගත් සත්‍රිය, ඉතාම සුලු වේලාවකදී ස්වාමි භාවයට ගිවිස ගත් සත්‍රිය **මේ දසදෙනාත්** සමග සත්‍රීන් විස්සකි. මේ සත්‍රීවරු විසිදෙනා කරා ගොස් කාමයෙහි වරදවා හැසිරීමෙන් පුරුෂයන්ට කාමමිථ්‍යාචාර අකුශලය සිදුවෙත්. මුලින් කී මාතුරක්ඛිතාදී සත්‍රීවරු අටදෙන පුරුෂයෙක් හා ගියකල කාමමිථ්‍යාචාරය ඔවුන් අටදෙනාට සිදු නොවෙත්. සාරක්ඛ–සපරිදණ්ඩ යන දෙදෙනාට හා ධනක්කීතාදී දසදෙනාටද යන දොළොස්දෙනාට කාමමිථ්‍යාචාරය සිදුවෙත්. මුලින් කී මාතුරක්ඛිතාදී සත්‍රීන් අටදෙනාට කාමමිථ්‍යාචාරය සිදු නොවන්නේ මන්ද? **තාසු ගතානං පුරිසානමෙව මිච්ඡාචාරො හොති මාතාදිහිරක්ඛිතත්තා** මාතුරක්ඛිතාදී සත්‍රීන් අටදෙනා හා සමග මිථ්‍යාචාරයෙහි හැසිරීමෙන් පුරුෂයන්ට පමණක් කාම මිථ්‍යාචාර අකුසලය සිදුවෙත්. මන්ද මව්පියාදීන් ඔවුන් රක්නා බැවින් ඔවුනට රහසිව එම වරද කළ බැවිනි.

සත්‍රීන් අටදෙනට නොවන්නේ මන්ද? **න ඉතරා අත්තනො ඵස්සස්ස සයං සාමිකත්තා** එම සත්‍රීන් අටදෙනාගේ පහසට මව්පිය ආදීන් උරුමක්කාරයෝ නොවන බැවිනි. ඔවුන්ගේ පහස පුරුෂයන්ටම අයිති බැවිනි. එසේම ඔවුන් දෙවැනි පුරුෂයන් සමග ගියතැන් සිට කාමමිථ්‍යාචාරය සිදුවෙත්. මෙලෙසින් අගමනීය ස්ථාන දැනගත යුතුයි.

**සොපනෙස මිච්ඡාචාරො සීලාදි ගුණ රහිතෙ අගමනීයට්ඨා-නෙ අප්ප සාවජ්ජො සීලාදී ගුණ සමන්නාගතෙ මහා සාවජ්ජො** මෙලෙසින් කී කාමමිථ්‍යාචාරය නොයෑ යුතු සීලාදී ගුණ විරහිත තැන්වලට යෑමෙන් අල්පසාවද්‍ය අකුශල්ද නොයෑ යුතු සීලාදී ගුණ සම්පන්න තැනැත්තියන් කරා යෑමෙන් මහාසාවද්‍ය අකුශල්ද සිදුවෙත්.

මෙම කාමයෙහි වරදවා හැසිරීම සිදුවීමට අඞ්ග සතරක් සම්පූර්ණ විය යුතුයි. එනම්:—

1. අගමනීය වස්තුවක්වීම, 2. ඔවුන් කෙරෙහි කාමසේවන සිත, 3. කාමසේවනයට කරණ ප්‍රයෝග, 4. මාර්ගයෙන් මාර්ගය යෙදීම ඉවසීම යන සතරයි.

මෙහි මාර්ගය තීවේ (**වච්චමග්ග-පස්සාවමග්ග-මුඛ** මලමාර්ගී, මූත්‍රමාර්ගී, මුඛය යන තුනටයි.)

මෙම කාම සේවනයට ප්‍රයෝග **එකකි. එකොපයොගො සාහත්ථිකොයෙව** සියඅතින්ම කළයුතු බැවින් එකම ප්‍රයෝගයෙකි.

මේ හැර කාමයෙහි හැසිරීම් බොහෝ වෙත්. ඒ බාහිර හැසිරීම්වලින් මෛථුන ධර්ම පාපය සම්පූර්ණ නොවෙත්. සිතෙහි හටගත් කෙලෙශයන් අනුව තමන්ගේ ධාතු පහකරගන්නා බොහෝ දෙන සිටිත්. ඉන් අකුසල් නම් සිදුවෙත්. නියම කාරණ ලද මාර්ගීවලින් පිටත් අන්ක්‍රමවලින් යෙදීමෙන් පහළ වන සිත් අනුව සුලු වශයෙන් පව් ඇතිවනවා මිස මෛථුන ධර්ම පාපය නොසිදුවේ. එනමුදු තම සිත් කීකරු කරගැනීමේ ශක්තිය ඇති කරගැනීම තමන්ට අයත් කරුණකි. සිතෙහි පහළ වන වැරදි අදහස්වලට පාපයෝ නම් සිදුවෙත්. ඉන් අපාය භය ගෙණදෙත්. ඉන්නිසා කාමසේවනය මොන ක්‍රමයෙන් වුවද ග්‍රාම්‍ය නීච ක්‍රියාවක් බව සලකා බිය ලජ්ජා උපදවා ඉන් ප්‍රවේසම්වීමෙන් යහපත් අඳුමින් ක්‍රියාකළ යුතු බව සිහිපත් කරවමු.

මෙකී අදත්තාදාන, කාමමිථ්‍යාචාර යන අකුශලයන් ලොභ මූලික සිත් අටෙහි උපදිත්. එම සිත් අටනම්:—

**1. සොමනස්ස සහගතං දිට්ඨිගත සම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං**
**2. සොමනස්ස සහගතං දිට්ඨිගත සම්පයුත්තං සසඞ්ඛාරිකමෙකං**
**3. සොමනස්ස සහගතං දිට්ඨිගත විප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං**
**4. සොමනස්ස සහගතං දිට්ඨිගත විප්පයුත්තං සසඞ්ඛාරිකමෙකං**
**5. උපෙක්ඛා සහගතං දිට්ඨිගත සම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං**
**6. උපෙක්ඛා සහගතං දිට්ඨිගත සම්පයුත්තං සසඞ්ඛාරිකමෙකං**
**7. උපෙක්ඛා සහගතං දිට්ඨිගත විප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං**
**8. උපෙක්ඛා සහගතං දිට්ඨිගත විප්පයුත්තං සසඞ්ඛාරිකමෙකං**
**ඉමානි අට්ඨපි ලොභ සහගත චිත්තානි නාම.**

අදහස :—

1. සොම්නස සමග ගිය සාස්වත උච්ඡේද මිථ්‍යාදෘෂ්ටි හා මොන-වට යෙදුන අභීකකුගේ මෙහෙයීම් ආදියක් නොමැති එක් ලොභ මූලික සිතෙක.

2. සොම්නස සමග ගිය මිථ්‍යාදෘෂ්ටිය හා මනාව යෙදුන අනිකෙ-කුගේ මෙහෙයීමෙන් ඇතිවන එක් ලොභ මූලික සිතෙක.

3. සොම්නස සමග ගිය මිථ්‍යාදෘෂ්ටියෙන් වෙන්වූ තමන් තුලම හටගත් එක් ලොභ මූලික සිතෙක.

4. සොම්නස සමග ගිය මිථ්‍යාදෘෂ්ටියෙන් වෙන්වූ අනිකෙකුගේ මෙහෙයීමෙන් හටගත් ලොභ මූලික සිතෙක.

5. උපෙක්ෂාව (මැදහත් බව) සමග ගිය සාසවත උච්ඡේද මිථ්‍යා දෘෂ්ටි හා මොනවට යෙදුන තමන්ගේම සිතින් හටගත් එක් ලොභ මූලික සිතෙක.

6. උපෙක්ෂාව සමග ගිය මිථ්‍යාදෘෂ්ටිය හා මනාසේ යෙදුන අනි-කෙකුගේ මෙහෙයීමෙන් උපන් එක් ලොභ මූලික සිතෙක.

7. උපෙක්ෂාව සමග ගිය මිථ්‍යාදෘෂ්ටියෙන් වෙන්වූ තමන් තුලම හටගත් එක් ලොභ මූලික සිතෙක.

8. උපෙක්ෂාව සමග ගිය මිථ්‍යාදෘෂ්ටියෙන් වෙන්වූ අනිකෙකුගේ මෙහෙයිමෙන් උපන් එක් ලොභ මූලික සිතෙකැයි ලොභ මූලික සිත් අටක් මෙසේ අකුසල් වශයෙන් උපදිත්. මේ අටවැදෑරුම් ලොභ සහගත සිත්වලින් අනන්ත අප්‍රමාණ අකුසල් සිත් ගොඩගැසෙත්. (උපදිත්) හේ මෙසේයි.

අදත්තාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, පිසුනාවාච, සම්ඵප්ප-ලාප, අභිද්‍යා, මිථ්‍යාදෘෂ්ටි යන කර්මපථ සතෙහි මෙකී අකුසල් සිත් උපදනා බැවින් එම අකුසල් සිත් අට මේ කර්මපථ සතෙන් වැඩිකල යුතුයි. එතකොට පනස් හයකි. (56) ඒ පනස් හය අතීත, වර්තමාන, අනාගත කාලත්‍රයෙහි උපදනා බැවින් තුනෙන් වැඩිකල යුතුයි. එවිට එකසිය හැට අටකි. (168) එම ගණන තමන්ගේ සිත් තුල උපදින අකුසල්ය. අනුන්ගේ සිත්වල උපදින අකුසල්-යයි දෙකින් ගුණ කළ යුතුයි. එවිට තුන්සිය සතිසකි. (336) ඒ සංඛ්‍යාව රූප, ශබ්ද, ගන්ධ, රශ, ස්පර්ශ, ධර්ම යන අරමුනු සය අනුව පවත්නා බැවින් හයෙන් වැඩිකල යුතුයි. එවිට දෙදහස් එක්සිය සොළසකි. (2116) ඒ සංඛ්‍යාව නගර ජනපද වශයෙන් දෙකකින් වැඩිවේ. එවිට සාරදහස් දෙසිය දෙතිසකි. (4232) මේ ලොභ මූලික අකුසල් සිත් අට මෙසේ ගනන් වශයෙන් කීවත් අතීතානාගත වර්තමාන යන කාලත්‍රය වශයෙන් උපදින අකුසල් සිත්වල ප්‍රමාණයක් නම් කියන්ට සමතෙක් නැත්තේ මැයි.

මේ ලොභ සහගත අකුසල් සිත් අට ලොභ-මොහ යන මූල හේතු දෙකකින් යුක්තයි. නමුත් මෙහිදී මොහ මූලිකත්වය නොකීවේ මොහය සියලු අකුසල්වලටම සාධාරණ නිසයි. මොහය

මේ සිත් අටේම යෙදෙත්. මේ අකුසල් සිත්වල සොමනස්ස, උපෙක්ඛා, දිට්ඨිගත සම්ප්‍රයුක්ත, විප්‍රයුක්ත, අසංස්කාරික, සසංස්කාරික යන වචන තේරුන් ගැනීමට ඒවා ඉපදීමට හේතු අඞ්ග මෙසේ සැලකිය යුතුයි.

**සොමනස්සය** වීමට හේතු තුනකි. සොමනස්ස සහගත සිත් සතරින් එකකින් ඉපදීම ඉෂ්ට (යොග්‍ය) ආලම්බනයක්වීම ගැඹුරු නැති නුවන පහළවීම.

**උපෙක්ෂා සහගත** වීමට හේතු තුනෙකි. උපෙක්ෂා සහගත අකුසල් සිත් සයදෙනා අතුරෙන් යම්කිසි සිතකින් ඉපදීමය. මධ්‍යස්ථ වශයෙන් යම් අරමුණක් ලැබීමය. ගැඹුරු නුවනින් යුක්තවීමය.

**දිට්ඨිගත සම්ප්‍රයුක්ත** වීමට හේතු දෙකකි. තමනුත් සිත් විපිළිසරව සාස්වත උච්ඡේද දෘෂ්ටි ගත්තෙක් වේද, එබඳුම සිත් විපිළිසරවූ මිසදිටු මිතුරන් ඇසුරු කරත්ද.

**දිට්ඨිගත විප්‍රයුක්ත** වීමටද හේතු දෙකකි. තමන් සිත් විපිළිසර කර නොගෙණ මිථ්‍යාදෘෂ්ටියෙන් වෙන්වීම එබඳු සම්‍යක් දෘෂ්ටි ගත් මිතුරෙකු ඇසුරු කිරීම.

**අසඞ්ඛාරික** වීමට හේතු පසකි. අසංස්කාරික වීමට නෙවත් තමන්ව අනිකෙක් නොමෙහෙයා තමන්ගේම අදහස් සකස්වීමට සෘතුගුණ ලැබීම, ඊටම යෝග්‍ය වාසස්ථානයක් ලැබීම, ඊටම යොග්‍ය ආහාර ලැබීම, ඊට ගැලපෙන සිවුරු වස්ත්‍රාදිය ලැබීම, ඊට ගැලපෙන මිත්‍රයන් ඇසුරු කිරීමට ලැබීම.

**සසඞ්ඛාරික** වීමටද හේතු පසයි. මේ අසංස්කාරිකයට කී හේතු පසම හීනව ලැබීමෙන් සසංස්කාරික බව යෙදේ. මේ සිත් අට යෙදෙන අවස්ථාවන්ද මිලඟට කියමු

1. **සොම්නස් සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංස්කාරික සිත**= උපදනාකාරය, අන්සතු මුතු මැණික් ආදී වස්තුවක් දුටුවිට සොම්නස උපදියි. ඒ වස්තුව සොරකම් කරන්ට සිතා මොහු මගේ වස්තු පෙර ආත්මවලදී සොරකම් කරන්ට ඇති. එනිසා තමයි මට මොහුගේ වස්තුව සොරාගන්ට සිතුනේ. එනිසා මම මේ ගන්නේ පෙර මගෙන් ගත් ඒවාට නයය සිතා සොරා ගත්තොත් දිට්ඨිගත සම්ප්‍රයුක්ත වේ. තමන්ගේම කල්පනාවෙන් සොරා ගත් බැවින් අසංස්කාරික වේ. මෙසේ පළමුවන ලොභ සහගත අකුසල් සිත උපදිත්.

2. **සොමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත සසංස්කාරික සිත**= මේ දෙවෙනි සිත උපදින්නේ මුලින් පළමුවන සිතෙහි පිළිවෙළින් ඇතිවූ අදහස් අන් කෙනෙක් විසින් කියා කරදී ඒ අනුව හැසිරීමෙනි.

3. **සොමනස්ස සහගත දිට්ඨිගත විප්‍රයුක්ත අසංස්කාරික සිත**= අන්සතු මුතු මැණික් ආදී සිත ප්‍රිය කරණ වස්තු දැකීමෙන් සොමනස්ස උපදින්. එය සොරාගන්ට සිතා අන් වස්තුව හොරකම් කිරීමෙන් පව් සිදුවේ නමුත් මොහුට බොහෝ වස්තුව තිබේ. මගේ අඹුදරුවන් රැකීමටයි. මම මේ වස්තු සොරකම් කරන්නේ මෙය සොරකම් නොකර මට ජීවත් වන්ට බැ කියා සිතා සොරාගනිත්ද එකල්හී දිට්ඨි විප්‍රයුක්ත වේ. අනිකෙකුගේ මෙහෙයීම් ආදියක් නැතිකල්හි අසංස්කාරික වේ.

4. **සොමනස්ස සහගත දිට්ඨිගත විප්‍රයුක්ත සසංස්කාරික සිත**= තුන්වෙනි සිතමෙන් ඒ සියල්ල සිතන්නේ කරන්නේ අනිකෙකුගේ මෙහෙයීම අනුවයි. එනිසා සසංස්කාරිකයි.

5, 6, 7, 8 සිත්වල මීට වඩා වෙනස නම් උපෙක්ෂා සහගත යන වචනයයි. උපෙක්ෂා සහගත වීමය කියන්නේ අනුන් සතු මුතු මැණික් ගව මහීසාදී ප්‍රණීත සිත් ගන්නා වස්තු දැක ඒ ගැණ සොම්නස් නොවී මැදහත් අදහස්වලින් මුලින් කී අඩග සම්පූර්ණව පැහැර ගැන්මයි. මධ්‍යස්ත අදහස් ඇතිකර ගැන්ම උපෙක්ෂා සහගත වීමයි. මෙසේ ලොභ මූලික සිත් අටේ ක්‍රම දතයුතුයි.

මීලඟට **දොමනස්ස සහගතං පටිඝ සම්පයුත්තං අසංඛාරික මෙකං සසංඛාරිකමෙකං** යයි ද්වේෂ මූලික සිත් දෙක ගැණද යමක් දතයුතුයි. මේ සිත් දෙක ප්‍රාණඝාත, එරුෂ වචන, ව්‍යාපාද යන අකුශල කර්ම පථයන්හි උපදින්. මෙහි දෞර්මනස, ප්‍රතිඝය (ක්‍රොධය) යන දෙසිත නිතරම එකට හැසිරෙන සිත් දෙකකි. මින් එක් සිතක් ඇතිවූවිට අනිකද ඒ සමගම යෙදෙත්.

මේ සිත් දෙක ඉපදීමට හේතු දෙකකි. තමන්ට නොකැමැති අරමුණක් ලැබීම නව ආඝාත වස්තුවෙන් එකක එල්වීම යන දෙකයි. වැඩි විස්තර ප්‍රාණඝාත විස්තරයෙහිදී මුලින් කියාදී ඇත. මීලඟට මොහ මූලික සිත් දෙකද කිවයුතු වේ.

**උපෙක්ඛා සහගතං විචිකිච්ඡා සම්පයුත්ත මෙකං–උපෙක්ඛා සහගතං උද්ධච්ච සම්පයුත්ත මෙකං** උපෙක්ෂාව (මධ්‍යස්ත බව) සමග ගිය විචිකිච්ඡාව සමග මනාසේ යෙදුන සිතය. එසේම

උඬච්චය සමග මනාසේ යෙදුන සිතය කියා මොහ මූලික සිත් දෙකකි. මෙකී සිත් දෙකින් උඬච්ච සිත සියලු අකුසල් සිත්වලටම සාධාරණ එකකි. ඒ නිසා එම සිත කීවේ මන්දැයිද ප්‍රශනයකි. එය ප්‍රකාශකළේ අකුසල් සිත් එකොළොසෙහි උඬච්චය අප්‍රධානවම යෙදෙත්. එසේ යෙදුනේ නමුදු ප්‍රධානවද යෙදීමට ඉඩ තිබෙන බැවින් උඬච්චයද වෙන් වශයෙන් දොළොස් වන සිත් වශයෙන් දේශනා කරණලදි. . විචිකිච්ඡා–උඬච්ච යන වචන දෙකෙහි විස්තර බොහෝයි. එලෙසම බොහෝ තැන්වලද විද්‍යමාන වෙත්. එහි විස්තරයක් දීමට අනවකාශ බැව් කියමු.

මෙලෙසින් මිත්‍යා කර්මාන්තය තුන් ආකාරය බැව් සලකා ඉන් මිදී එහි නොඇලී සම්‍යක් කර්මාන්තයන් සපුරා භව විභව සැප සාධාගත යුතුයි. මෙසේ විස්තර වන සම්‍යග් කර්මාන්තය සුගතිය සාධාදෙන බවත් මිත්‍යාකර්මාන්තය දුගතිය සලසන බවත් තේරුන් ගැණීමට විපාකාවස්ථාවන් ගැණ මදක් මේ පින්වතුන්ට සිහිපත් කරවමු.

**පඤ්ච ගහපති භයානි වෙරානි අප්පහාය දුස්සීලො ඉති වුච්චති – නිරයඤ්ච උපපජ්ජති කතමානි පඤ්ච – පාණාතිපාතං –අදින්නාදානං–කාමෙසුමිච්ඡාචාරං–මුසාවාදං–සුරාමෙරය මජ්ජ– පමාදට්ඨානං** දිනක් අප බුදුපියාණෝ හමුවන්ට ගිය අනේපිඬු සිටුතුමා බුදුන් වැඳ ඇඳිලි බැඳ එකත්පස්ව සිටි වේලෙහි මේ බණ දෙසූසේක. ගෘහපතිය මේ පස්වැදෑරුම් භය, මේ පස්ආකාර වෛරය අතනැර කරගෙණ යන සත්වයෝ දුස්සීලයයි කියමි. ඔවුහු නරකයෙහිම උපදී. කවර පසක්ද? සතුන් මැරීම, සොර–කම් කිරීම, කාමයෙහි වරදවා හැසිරීම, බොරුකීම, මත්පැන් බීම යන පසයි. මේ පස කරණ තැනැත්තෝ මෙලොව බියෙන්ද, වෛරයෙන්ද කල් යවත්. දුස්සීලව වැස මරණින් පසු නරක–යෙහිම උපදිත්. මේ ප්‍රාණවධාදී පස්පවින් ලැබෙන කටුක විපාක බව සැලකිය යුතුයි.

එසේම මෙම පස්පව් හැර යහපත් කර්මාන්තයන්හි නියැලිව වෙසෙත් නම් භයක් හෝ වෛරයක් නම් කොයින්ද භය වෛර–යන්ගෙන් වෙන්ව සිල් ගුණයෙන් වැජඹී මරණින් මතු ස්වර්ගයට ඒකාන්තයෙන්ම පැමිණිය හැකි බැව්ද දෙශනාකළසේක. එබැවින් ප්‍රාණවධාදියෙන් වෙන්වී සම්‍යක් කර්මාන්තයන්හි නිරත විය යුතුයි.

යොපාණං අති පාතෙති මුසාවාදංච භාසති
ලොකෙ අදින්නං ආදියති පරදාරංච ගච්ඡති
සුරාමෙරය පානංච යොනරො අනුයුඤ්ජති
අප්පහාය පඤ්ච වෙරානි දුස්සීලො ඉති වුච්චති
කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සොපපජ්ජති ති

යමෙක් ප්‍රාණවධ කරත්ද, බොරු කියත්ද, අන්සතු වස්තුව පැහැර ගණිත්ද, පරස්ත්‍රී පරපුරුෂයන් සේවනය කරත්ද, (එම කාම මිත්‍යාචාරයටම අයත්) රහමෙර බොත්ද හෙතෙම පස් ආකාර මෙම වෛරයන් හා බිය අතනෑර සපුරා දුස්සීලයයිද මෙලොවිනුත් නින්දා ලැබ එම දුෂ්ප්‍රාඥයා (මෝඩයා) මරණින් මතු නොවරදවා නරකයෙහි උපදියි.

යොපානං නාතිපාතෙති මුසාවාදං නභාසති
ලොකෙ අදින්නං නාදියති පරදාරං න ගච්ඡති
සුරාමෙරය පානඤ්ච යොනරො නානුයුඤ්ජති
පහාය පඤ්ච වෙරානි සීලවා ඉති වුච්චති
කායස්ස භෙදා සප්පඤ්ඤො සුගතිං සොපපජ්ජති ති

යමෙක් ප්‍රාණවධ නොකරත්ද, බොරු නොකියත්ද, සොරකම් නොකරත්ද, පරස්ත්‍රී පරපුරුෂ සෙවුමෙන් වලකිත්ද, රහමෙර නොබොත්ද එකී පස්වැදෑරුම් භය වෛරයන් ඔහු අතහැර සිල්වතෙක්යයි මෙලොව ප්‍රකට වෙත්. එම යහපත් නුවනැති තැනැත්තේ මරණින් මතු සුගතියෙහිම උපදිත්.

දිනක් සංගාරව නම් බමුණෙක් බුදුන් වහන්සේ කරා පැමිණ සතුටු සාමීචිව කථාකොට එකත්පස්ව හිඳ මෙසේ ප්‍රශ්නයක් අසන ලදි.

**කිංනුඛො භො ගොතම ඔරිමං තීරං කිංපාරිමං තීරනති? භවත් ගෞතමයන් වහන්ස මෙතෙර (මෙගොඩ) කියන්නේ කුමකටද එතෙර (එගොඩ) කියන්නේ කුමකටද?** බුදුපියානෝ ඊට මෙසේ පිළිතුරු දෙසූසේක.

**පාණාතිපාතො ඛො බ්‍රාහ්මණ ඔරිමංතීරං පාණාතිපාතා වෙරමණී පාරිමංතීරං අදින්නාදානං ඛො බ්‍රාහ්මණ ඔරිමංතීරං අදින්නාදානා වෙරමණී පාරිමංතීරං කාමෙසුමිච්ඡාචාරො ඔරිමං තීරං කාමෙසුමිච්ඡාචාරා පාරිමංතීරං–පෙ–**

සංගාරව බමුණ! මෙතෙරනම්! ප්‍රාණවධකිරීම, සොරකම්කිරීම, කාමයෙහි වරදවා හැසිරීම, බොරුකීම, රහමෙර බීම යන පස්පව්

කිරීමය. මෙකියන පස්පව් කරන්නන්ට එතරයයි කියන ලද නිර්වානයට යෑමට කිසිද දිනක නොලැබෙන බැවින්ද මෙතෙරයයි කියන ලද සතර අපා දුකෙහිම එරී සිටුවන බැවින්ද පස් පව්වලට මෙතෙරයයි දෙසූසේක. එසේම එම පස් පවින් මිදී වෙන්වී වැසීමෙන් සම්‍යක් කර්මාන්තයයි කියන ආර්ය මාර්ගය සම්පූර්ණ වන බැවින් ඉන් වැලකීම එතෙර (පරතෙර) යයි දෙශනා කළසේක. එබැවින් මෙම සසර සයුරෙහි මෙතෙර සිට දුක් නොවිඳ එතරවී සැප විඳීමට පස් පවින් වැලකී ක්‍රියාකළ යුතුයි.

එසේම ශසර බිය නොසිහැටි කියාකර දුන්නත් ඒ අනුව පිළිපදින්නන් අඩු බැවින් සසර සයුරින් එතර වන්නෝ ස්වල්ප බැව් මෙසේ දෙශනාවේ :—

1. අප්පකාතෙ මනුස්සෙසු යෙජනා පාරගාමිනො
අථායං ඉතරා පජා තීරමෙවානු ධාවති
2. යෙචඛො සම්ම දක්ඛාතෙ ධම්මෙ ධම්මානු වත්තිනො
තෙජනා පාර මෙස්සන්ති මච්චු ධෙය්‍යං සුදුත්තරං
3. කණ්හං ධම්මං විප්පහාය සුක්කං භාවෙථ පණ්ඩිතො
ඔකා අනොකං ආගම්ම විවෙකෙ යත්ථ දූරමං
4. තත්‍රාභිරති මිච්ඡෙය්‍ය හිත්වා කාමෙ අකිඤ්චනො
පරියොදපෙය්‍ය අත්තානං චිත්ත ක්ලෙසෙහි පණ්ඩිතො
5. යෙසං සම්බොධි අඞ්ගෙසු සම්මා චිත්තං සුභාවිතං
ආදාන පටිනිස්සග්ගෙ අනුපාදාය යෙරතා
ඛීණාසවා ජුතී මන්තො තෙ ලොකෙ පරිනිබ්බුතා, ති.

එහි අදහස් :—

1 මෙලොව උපදින මිනිසුන් අතර සසර දුක් දුරලා පරතෙරට (නිර්වාණයට) පැමිණ සැප විඳින්නෝ ඉතාම ස්වල්ප දෙනෙකි. අනික් ඉතිරි වන බොහෝදෙන මෙතරම (සසරම) ඉපදීම්, නතරවීම්, මැරීම් යන තුන් අයුරින් හැසිරෙත්. මන්ද? ප්‍රාණවධාදී පස් පවෙහි ගිජුව අකුසල්ම රැස්කරණ බැවිනි.

2. එතර වීමට නොහැකි (දුෂ්කර) මාරයාගේ සීමාව වන සසර කුහරයෙහිම මූලාව හැසිරෙන්නන් අතර ප්‍රාණඝාතාදී මිථ්‍යාකර්ම පුරමින් සිටින්නන් අතර නුවනින් සලකා නිර්වාණාභිමුඛකොට මොනවට දේ සිත ධර්මයෙහි හැසිරෙමින් ආර්ය මාර්ගයෙහි සුපිළිපන් ස්වල්පදෙනෙක්ම මාරධෙය්‍ය සංඛ්‍යාත සසර තරණයකොට එතෙර වෙත්.

3. අත්‍ථි භික්ඛවෙ කණ්හං කණ්හ විපාකං–පෙ–යනාදී දෙශනා පාඨයන් අනුව ප්‍රාණවධ, සොරකම, කාමයෙහි වරදවා හැසුරුම් ආදී කළු ධර්ම, කිළිටි ධර්ම, නැතිනම් පව්කම් සම්පූර්ණයෙන්ම විනාශ-කොට වඳකොට සුකල ධර්මයයි කියන ලද ප්‍රාණවධයෙන් වැලකීම සොරකමින් වැලකීම, කාමමිථ්‍යාචාරයෙන් වැලකීම ආදී සුදු ධර්ම පිරිසිදු ධර්ම වඩාගෙණ පුරුදුකර වාසය කළයුතු, වාසය නොකළ යුතු ස්ථාන දැක දැන විවේක සැපය ඇති දූර ස්ථානයන්ට පැමිණ පරතෙරට යනු කැමැත්තේ එහි ඇලී සතුටින් වසත්.

4. එලෙස විවේක සැපයට අතිශයින් ආසාකරණ පණ්ඩිත තෙම පස්කාමෙහි නොගැලී නොබැඳී කෙලෙස් මලෙහි නොම තැවරී එම කෙලෙස් වනසා තමන්ගේ ආත්ම භාවය ලොභාදී අකුශල් කුණු සෝදා හැර පිරිසිදු කරගෙණ පරතෙර දැක විවේක සැපයෙහිම ඇලී වසත්.

5. යම් හෙයකින් සම්බොධිය ලැබීමට අඩගවූ සත්තිස් බොධි පාක්ෂික ධර්මයන්හි මොනවට සිත වඩාගෙණ සසර බිය අතහැර දමා කෙලෙසුන්ගෙන් වෙන්ව තෘෂ්ණාදියෙහි නොඇලී වසන දෑ රශ්මීණක්සේ දීප්තිමත් පිරිසිදු භාවයක් ඇති කාමාදී ආශ්‍රවයන් ක්ෂයකල රහතන් වහන්සේ ලොකයා අතර සම්පූර්ණයෙන් නිවී ගියේ වේ.

**පින්වතුනි,**

සම්‍යක් කර්මාන්තය විස්තර කරණ අපට නියමිත කාලය අවසාන වේගෙන යෙත්. එබැවින් ප්‍රාණවධාදියෙන් දුරින්ම දුරුවී සිටීමට එම ප්‍රාණවධාදිය කිරීමෙන් ලැබෙන කටුක විපාක ස්වල්පයක් කියා අපේ දෙශනාව අවසාන කිරීමට බලාපොරොත්තු වෙමු.

**කතමො ච සො භික්ඛවෙ සංසප්පනිය පරියායො ධම්ම පරියායො** මහණෙනි, ඒ සංසප්පනිය ක්‍රමය නම් ධර්මක්‍රමය කවරේද? **කම්මස්සකා භික්ඛවෙ සත්තා කම්මදායාද කම්මයොනි කම්ම බන්ධූකම්ම පටිසරණා යං කම්මං කරොන්ති කල්‍යාණං වා පාපකං වා තස්ස දායාද භවන්ති** මහණෙනි, සත්වයෝ කර්මයෙන්ම හටගැණින. කර්මයමයි ලබාගත් වස්තුව ඉපදීමත් කර්මය අනුවමයි. නෑදෑ වන්නේත් කර්මයමයි. තමාට උපකාර පිණිස පවත්නේත් කර්මයමයි. තමා යම් කර්මයක් කරත්ද ඒ කර්මය යහපත් හෝ අයහපත් හෝ වේවා. ඒ ආකාරම දායාදයක් යහපතක් හෝ අයහපතක් තමාට ලැබෙනවා ඇත.

**ඉධ භික්ඛවෙ එකච්චො පාණාතිපාතී හොති ලුද්දො ලොහිත පාණී හතපහතෙ නිවිට්ඨො අදයාපන්නො සබ්බපාණ භූතෙසු සො සංසප්පති කායෙන සංසප්පති වාචාය සංසප්පති මනසා තස්ස ජිම්හං කායකම්මං හොති ජිම්හං වචීකම්මං ජිම්හං මනොකම්මං ජිම්හා ගති ජිම්හූපපත්ති ජිම්හගතිකස්ස ඛො පනාහං භික්ඛවෙ ජිම්හූපපත්තිකස්ස ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි යෙ වා එකන්ත දුක්ඛා නිරයා යෙ වා සංසප්පජාතිකා තිරච්ඡානයොනි.**

අයහපත් කර්ම විපාකය මෙලෙසින් දතගත යුතුයි. මහණෙනි, මෙලොව යමෙක් ප්‍රාණඝාත කරන්නේවේද රෞද්‍රද ලේ තැවරුණ අතින් යුක්තද සත්වහිංසාවෙහි නිතර ඇලේද සියලු ප්‍රාණීන් කෙරෙහි දයාබර ගතියක් නම් නැත්තේම වේද එබඳු තැනැත්තා කයින්ද (බඩගාමින්) යටත් පහත් වෙයි. නැති ගැණෙයි. වචනයෙන්ද යටත් පහත් වෙයි. නැති ගැණෙයි. සිතිනුදු යටත් පහත් වෙයි. නැති ගැණෙයි. ඔහුගේ කාය කර්මද වක්වෙයි. (වකුටුවෙයි.) වචීකර්මද වක්වෙයි. මනොකර්මද වකුටුවෙයි. වක්වූ වරද ඇති ගතියක්ම ලබයි වකුටුවූ ඇදවූ උත්පත්තියක්ම ලබයි. ඇද වක් ගති ඇති උත්පත්ති ඇති තැනැත්තාට ඉපදීමට නියම ස්ථාන දෙකකි. ඒ දෙතැන නම් ඒකාන්ත දුක් ඇති නරකය හෝ බඩගාගෙණ යන යටත් පහත් වක් ගති ඇති තිරිසන් යෝනිය හෝ යන දෙගතියයි.

**කතමා ච සා භික්ඛවෙ සංසප්පජාතිකා තිරච්ඡානයොනි?** මහණෙනි, සංසප්පජාතිකයයි කියන ලද බඩගා යන වෙදුලමින් වකුටුවෙමින් යන තිරිසන්යොනි නම් කවරේද? **අහි, විච්ඡිකා, සතපදී, නකුලා, බිළාරා, මූසිකා, උලූකා, යෙවාපන අඤ්ඤෙපි තිරච්ඡාන යොනිකා, සත්තා මනුස්සෙ දිස්වා සංසප්පති** සර්ප, ගෝනුසු, පත්තෑ, මූකටි, බලල්, මී, බකමූනු ආදී තිරිසන් යොනිවල උපදිත්. මනුෂ්‍යයන් දැක ඔවුන් නැති ගැණෙත්. වෙවුලත්. බඩගා වක්වී පැනයෙත්. මහණෙනි. මෙලෙසින් ප්‍රාණවධ කළ සත්වයන් තමා කරණ ලද පහත් අකුසල කර්මයට අනුරූපව කර්මය ස්පර්ශකරත්. එම අකුශල කර්මය ස්පර්ශකිරීමෙන් මෙබඳු දුකට පැමිණෙත්. එය එසේ සිදුවන බැවින් මහණෙනි, මවිසින් සත්වයෝ තමා කරණ ලද කර්මය තමාටම දායාද වන බව දෙශනා කරමියි වදාළසේක. අදත්තාදාන, කාමමිථ්‍යාචාරාදී අකුසල් පිළිබඳවද මෙලෙසින් සිතා දතගත යුතුයි. —පෙ—

මෙලෙසින් කටුක රළු විපාක විඳින මිථ්‍යා කර්මාන්තාදියෙන් සම්පූර්ණයෙන් වෙන්වී සම්‍යක් කර්මාන්තයන්හි නිඇලී ආර්ය මාර්ගාවබොධය කරගැණීමේ අදහසින් යහපත් කර්ම සපුරා ලොව් ලොව්තුරා සැප සාධාගන්නා ලෙස මතක් කරමු.

**සියලු ප්‍රාණීහුම සැපසේ වෙසෙත්වා!**

# සම්‍යක් ආජීවය.

මොරටුමුල්ලේ තපසරාරාමාධිපති ආචාර්ය
මොරටුවේ ශ්‍රී පේමරතන මහා ස්ථවිර පාදයන් වහන්සේ
විසින් ලියන ලදී.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

**"කතමො තස්මිං සමයෙ සම්මා ආජීවො හොති? යා තස්මිං සමයෙ මිච්ඡා ආජීවා ආරති විරති පටිවිරති වෙරමණී අකිරියා අකරණං අනජ්ඣාපත්ති වෙලා අනතික්කමො සෙතුඝාතො සම්මා කම්මන්තො මගගඞගං මගග පරියාපනනං අයං තස්මිං සමයෙ සම්මා ආජීවො හොති"** මේ ප්‍රකාශ කරණ ලද්දේ අද ධර්මදේශනාව සඳහා "ධම්ම ස**ඞ්ගණී** ප්‍රකරණ" යෙහි ආවාවූ පාඨයකි.

මොරටුමුල්ලේ ශ්‍රී සුධර්මාරාමාධිපතිව වැඩවිසූ **ගෞරවාර්හ ඇම්. සූ. අරියවංශ** මහා ස්ථවිර පාදයන් වහන්සේගේ ගුණානුස්මරණය කිරීම් වශයෙන් උන්වහන්සේගේ ශිෂ්‍ය උගත් **මොරටුවේ සිරි ශාසනවංශ** ස්ථවිර පාදයන් වහන්සේ විසින් ප්‍රචාරය කරගෙණ යන පොත් පඞ්ක්තිය අතුරෙන් සවන වරට මා අතින් ලියවෙන ධර්මකොට්ඨාසය මෙයයි. මෙහි මුලින් ප්‍රකාශ කරණ ලද ධර්ම පාඨයෙහි අදහස නම් :—

එසමයෙහි සම්‍යක් ආජීවය නම් කවරේද? එසමයෙහි යම් වරද ජීවිකාවෙන් වෙන්වීමක් වේද, තුරන්වීමක් වේද, දුරුවීමක් වේද, වැළැක්මක් වේද, නොකිරීමක් වේද, අකරණයක් වේද, ඇතුල් නොවීමක් වේද, යහපත් ජීවිකාව නමැති වෙරළ නොයික්ම වීමක් වේද, මිථ්‍යා ආජීවයාගේ මුලසුන් කිරීමක් වේද, ජීවිකාව හෙතුවෙන් යහපත් වැඩ කිරීමක් වේද, මාර්ගාඞ්ගයක් වේද, මාර්ගයට ඇතුළත්වූවක් වේද මේ සම්‍යක් ආජීවයයි කියනු ලැබේ.

සම්‍යක් ආජීවය නම් වැරදි ජීවිකාවෙන් වෙන්වීමයි.

වීර්‍ය විරති වශයෙන් මේ සම්‍යක් ආජීවය දෙවැදෑරුම් වෙයි. ගිහියන් විසින් ස්වභාවයෙන් නිවැරදිවූ සීසෑම්, වෙළහෙළඳම් ආදිය හෝ පැවිද්දන් විසින් භික්ෂාටනාදිය හෝ කොට ජීවිකාව කරණු ලැබේද උඨාන වීර්‍යයයි කියන ලද ඔවුන්ගේ ඒ ව්‍යායාමය

වියදී සම්‍යක් ආජීවය නම්වේ. ආජීව ශුද්ධිය අපෙක්‍ෂාකොට තමන්ගේ ආජීව ශීලයට විපත්ති කාරණවූ කාය වාග් දුශ්චරිතයන් දුරු කරන්නා හට පාප විරමණාකාරයෙන් චිත්තයාගේ යම් පැවැත්මෙක් වේද ඒ වනාහි විරති සම්‍යගාජීවය නම්වේ. හේ මෙහි අභිමතයි. එහි ලක්‍ෂණාදිය, **"සො වොදන ලක්ඛණො ඤායා ජීවප්ප වත්තිරසො මිච්ඡා ජීවප්පහාණ පච්චු පට්ඨානො"** යනුවෙන් සම්‍යක් ආජීවය පිරිසිදු බව ලක්‍ෂණකොට ඇත්තේය. න්‍යායට අනුව දිවි පැවැත්වීම කෘත්‍යකොට ඇත්තේය. මිථ්‍යා ජීවය ප්‍රහාණය කිරීම වැටහීම්කොට ඇත්තේය.

**සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව** යන විරති තුන අතුරෙන් එකිනෙක සම්ප්‍රාප්ත විරති, සමාදාන විරති, සමුච්ඡේද විරති වශයෙන් ත්‍රිවිධවේ. යම් විරතියක් සිකපද සමාදන් නොව හෝ සමාදන්වූ ශික්‍ෂා පදයන් අපෙක්‍ෂා නොකොට හෝ හුදෙක් හිරි ඔතප් බලයෙන්ම සම්ප්‍රාප්ත වස්තුව නොයික්ම වන්නා හට උපදනේ වීනම් සම්ප්‍රාප්ත විරති නම්වේ. ඕතොමෝ වර්තමාන අරමුණක් ගෙණ පවත්නීය.

යම් විරතියක් ශික්‍ෂාපද සමාදන් වන්නා හට හෝ ඉටා ගන්නා හට හෝ සමාදන්වූ පරිද්දෙන් ඉටාගත් පරිද්දෙන් හොඳින් ආරක්‍ෂාකරමියි සම්ප්‍රාප්ත වස්තුව නොඉක්මවන්නා හට උපදනේද ඕතොමෝ සමාදාන විරති නම්වේ. ඕතොමෝ ප්‍රත්‍යුත්පන්නා ලම්බනික අනාගතා ලම්බනික වේ. මාර්ග ක්‍ෂණයෙහි වනාහි සියලු දුසිරිත් මුල් සිඳීම් වශයෙන් උපදනේ සමුච්ඡේද විරති නම්වේ. ඕතොමෝ නිර්වාණ ලම්බනිකවේ. ඔවුනතුරෙන් ලෞකික විරතීහු ජීවිතෙන්ද්‍රියාදී ව්‍යතික්‍රමිතව්‍ය වස්තූන් අරමුණුකොට ප්‍රාණඝාතාදී විරචිතව්‍ය වස්තූන් දුරු කෙරෙමින් උපදනාහ. ලොකොත්තර විරතීහු නිවන් අරමුණුකොට ප්‍රාණඝාතාදී විරචිතව්‍ය වස්තූන් දුරු කෙරෙමින් උපදනාහ.

ඒ මෙසේ වදාරණ ලදී.

**"සම්මා ආජීවාහං භික්ඛවෙ! ද්වයං වදාමි අත්ථි**
**භික්ඛවෙ සම්මා ආජීවො සාසවො පුඤ්ඤ භාගියො**
**උපධි වෙපක්කො, අත්ථි භික්ඛවෙ! සම්මා ආජීවො**
**අරියො අනාසවො ලොකුත්තරො මග්ගඞ්ගං"**

කාමාදී ආශ්‍රව ධර්මයන්ට අරමුණුවූ පුණ්‍ය කොට්ඨාසයෙහිවූ ස්කන්ධොපධියෙහි පිහිටා විපාක දෙන සුළුවූ සම්‍යක් ආජීවයක් ඇත්තේය. එනම් ලෞකික සම්‍යක් ආජීවයයි. අතිපරිශුද්ධවූ

ආශ්‍රව ධර්මයන්ට අරමුණු නොවූ පඤ්චොපාදාන සක්ඛ ලොකයෙන් එතර වනුයෙන් ලොකොත්තරවූ මාර්ගාඞ්ගවූ සම්‍යක් ආජීවයක් ඇත්තේය. එනම් ලොකොත්තර සම්‍යක් ආජීවයයි.

මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහි විරති වශයෙන් අඞ්ග තුනක් වෙති. එනම් සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන තුනයි. එයින් චතුර්විධ වාග් දුශ්චරිතයෙන් වැළකීමේදී සම්මා වාචාවද, ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන් වැළකීමේදී සම්මා කම්මන්තයද, ආජීවය ගැන බලාපොරොත්තුවෙන් ත්‍රිවිධ කාය දුශ්චරිතයෙන් හා චතුර්විධ වාග් දුශ්චරිතයෙනුත් වැළකී මෙහිදී සම්‍යගාජීවයද උපදී. එය ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහි පස්වෙනි අඞ්ගයයි.

ශීල, සමාධි, ප්‍රඥා යන සකන්ධත්‍රයයකින් හෙබියාවූ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහි ශීල සකන්ධ පුරණු කැමැතියන් විසින් මේ විරති තුන ආරක්ෂා කරගත යුතුයි.

ආජීවය පිරිසිදුකරගැණීම බුඩාදී උත්තමයන් වහන්සේලාගේ ප්‍රධාන ගුණාඞ්ගයකි. ගිහියන් විසිනුත් පැවිද්දන් විසිනුත් විශෙෂයෙන් ආජීවය පිරිසිදු කරගත යුතුයි.

ලොකවාසී මනුෂ්‍යයෝ දිවා රෑ දෙක්හි තන් අයුරින් වෙහෙසෙන්නෝ ආජීවය අපෙක්ෂා කරමිති. සමහර ගෘහස්ථයෝ දිවි රැකගන්නා අදහසින් තමන් සන්තක දූ දරු ආදීන් පවා විකොට ජීවත් වෙති. සමහරු සත්ව ඝාතනය කරණ අවි ආයුධ, කරක්, කොමෙන්, දැල් අතංගු, දුනු ආදිය විකොට ජීවත් වෙති. සමහරු මස් පිණිස කුකුල්, හූරු, එළු, බැටළු ආදී සතුන් පොෂ්‍යයකොට විකුණා ජීවත් වෙති. සමහරු අබිං, කංසා, රා, අරක්කු ආදී මද්‍ය ද්‍රව්‍ය විකොට ජීවත් වෙති. සමහරු පාසානම් ආදී වස විෂ වර්ග තනා විකොට ජීවත් වෙති. මේ සියල්ලම වැරදි ජීවිකාවට අයත් වේ. අධර්මයෙන් ජීවත් නූනාට ඔනෑතරම් ධර්මිෂ්ඨ ක්‍රියා මාර්ගයන්ගෙන් මිනිසුන්ට දිවි රැකගත හැක්කේය. එබැවින් දූදරුවන් විකිණීම ආදී අධර්ම වෙළඳම් පසින් හා කළු කඩ පාවැන් කීම් ආදී මොනයම් පවිටු ක්‍රියාවකින්වත් දිවි රැක ගන්ට මාන නොබලා පිරිසිදු ජීවිකාව ඇතිකර ගැණීමට සිතට ගත යුතුය.

සම්‍යක් ආජීවය කෙතරම් තරඳට බුදුරජානන් වහන්සේ විසින් දෙශනාකර තිබේදැයි කියතොත් භික්ෂූන්ගේ සතර සංවර ශීලයෙන් එක් කොටසක් ආජීව පාරිශුඩි ශීලය නමින් දෙශනා කරණ ලද්දේය. ආජීවය හෙතුකොට ගෙණ ශික්ෂාපද පසක් පණවා තිබේ.

ලාමක ආශා ඇති යම්කිසි උපසම්පන්න භික්ෂුවක් සිවුපසය ලබාගණු කැමැතිව ආජීව හෙතුවෙන් තමා තුළ නැති ධ්‍යාන මාර්ග ඵලාදිය තමා කෙරෙහි ඇතැයි කියා නම් ඒ භික්ෂු තෙම පාරාජිකා පත්තියට පැමිනෙණයි.

යම් උපසම්පන්න භික්ෂුවක් ආජීව හෙතුයෙන් ස්ත්‍රී පුරුෂ දෙදෙනෙකු පිළිබඳ සඞගමය පිණිස ඔවුනොවුන්ගේ පණිවිඩ ගෙණ හැර පා නම් ඒ භික්ෂු තෙම සංඝාදිසෙසා පත්තියට පැමිණෙයි.

යම් උපසම්පන්න භික්ෂුවක් ප්‍රත්‍යය ආශාවෙන් "තුඹගේ විහාරයෙහි වසන භික්ෂුනම රහත් කෙනෙකැයි" තමා උදෙසා අනියමෙන් කියානම් ඒ භික්ෂුතෙම ථුලසි නම් ඇවතට පැමිණෙයි.

යම් උපසම්පන්න භික්ෂුවක් ගිලන් බවක් නොමැතිව ආජීව හෙතුයෙන් කිරි ආදී ප්‍රණීත භොජන තමා පිණිස පනවා ගෙණ වළඳ, නම් ඒ භික්ෂු තෙම පාචිත්තියා පත්තියට පැමිණේ.

යම් උපසම්පන්න භික්ෂුණියක් නොගිලන්වූවා මැ තමා පිණිස ප්‍රණීත භොජන විනවාගෙණ වළඳ, නම් ඒ භික්ෂුණී පාටිදෙසනීයා පත්තියට් පැමිණෙයි.

යම් උපසම්පන්න භික්ෂුණියක් නොගිලන්වූවා මැ සූප හෝ ඕදන හෝ තමා පිණිස පනවාගෙණ වළඳ, නම් ඒ භික්ෂුණී දුකුළා ඇවතට පැමිණෙයි. මේ සිකපද ඉක්ම වන්නවුන්ගේ ආජීවය අපිරිසිදු වෙයි. කුහනාදී වශයෙන් ජීවත්වීමද ආජීවය අපිරිසිදු-වීමට හෙතුවෙයි.

භික්ෂුන්ගේ ආජීවය අයථා ක්‍රමවලින් දිවිරැක ගැණීමට යෑම නිසා කිලිටිවේ. ඒ සඳහා විභඞග පාලියෙහි දක්වා තිබෙන කාරැණු මෙසේයැ.

කුහනා,

**"තත්ථ කතමා කුහනා? ලාභ සක්කාර සිලොක සන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පච්චය පටිසෙවන සඞ්ඛාතෙනවා සාමන්ත ජප්පිතෙන වා ඉරියාපථස්සවා අට්ඨපනාඨපනා සණ්ඨපනා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, අයං වුච්චති කුහනා"**

එහි කුහනා නම් කිම? ලාභ සත්කාර කීර්ති පතන්නාවූ ලාමක අදහස් ඇත්තාවූ ලොභයෙන් මඩනා ලද්දාවූ භික්ෂුවගේ

ප්‍රත්‍යය වැළකීමයයි කියන ලද කුහක කමින් හෝ ප්‍රත්‍යය දායකයන්ගේ කණට කොඳුරා කීමෙන් හෝ ඉරියව් තැබීම් වශයෙන් හෝ මුහුන හැකිලවීම් වශයෙන් හෝ යම් කුහක බවක් වේනම් එය කුහනායයි කියනු ලැබේ.

අත්‍රිච්ඡතා, පාපිච්ඡතා, මහිච්ඡතා, අප්පිච්ඡතායයි ආශාවෝ සතරදෙනෙක් වෙති. තමන් ලත් දෙයෙහි තෘප්තියකට නොගොස් අනුන්ගේ දෙය ගැනත් ප්‍රාර්ථනා කිරීම අත්‍රිච්ඡතා නම් නැති ගුණ හැඟවීම හා පිළිගැණීමෙහි පමණ නොදැනීම පාපිච්ඡතා නම්. ඇති ගුණ විදහා දැක්වීම හා පිළිගැණීමෙහි පමණ නොදැනීම මහිච්ඡතා නම්. ඇති ගුණ සැඟවීමත් පිළිගැණීමෙහි පමණ දැනීමත් අප්පිච්ඡතා නම්.

අත්‍රිච්ඡ පුද්ගලයාහට තමා විසින් ලත් ප්‍රණීතවූ දෙයත් ලාමක වූවක් ලෙසද, අනුන් විසින් ලත් ලාමක දෙය ප්‍රණීත වූවක් ලෙසත් වැටහේ. එක බඳුනෙහි උයන ලද කැඳ හෝ බත් හෝ කැවුම් හෝ තමාගේ පාත්‍රයෙහි ලූකල බාල ඒවාමෙන්ද අනුන්ගේ පාත්‍රයෙහි ප්‍රණීත වූවාමෙන්ද වැටහේ මේ අත්‍රිච්ඡතාව පැවිද්දන්ටද ගිහියන්ටද තිරිසනුන්ටද තිබේ.

එක් කෙළෙඹියෙක් භික්ෂූන් තිස් නමකට ආරාධනාකොට කැවුම් සහිත බත් පිළිගැන්වීය. සංඝ ස්ථවිර තොමෝ සියළු භික්ෂූන්ගේ පාත්‍රවල කැවුම් පරිවර්තනය කරවා නැවත තමන් ලත් දෙයම වැළඳුවාය. බරණැස් රජ තෙම ගිනි අඟුරුවලින් පිසින ලද මස් බුදින්නෙමියි දේවිය සමග වනයට පිවිසියේ එක් කිඳුරියක් දැක දේවිය හැර ඈ අනුව ගියේය. දේවී තොමෝ නැවතී අසපුවට ගොස් කිසුණු පිරියම්කොට අෂ්ට සමාපත්ති පඤ්චාභිඥා උපදවාගෙණ හුන්නී රජු එනු දැක අහසට පැන නැගී ගියාය. සඳකිඳුරිය පතමින් රජ බිසවගෙන් පිරිහුනු රජුමෙන් අත්‍රිච්ඡ පුද්ගලයාද අතිලොභයෙන් පිරිහේ.

කසුප් බුදුන් කල මිත්ත වින්දකනම් සිටුපුත්‍රයෙක් විය. කිසිම ශ්‍රද්ධාවක් ඔහු තුළ නැත්තේය. දිනක් මව විසින් පුත අද පෙහෙවස් සමාදන්වී විහාරයෙහි සර්වරාත්‍රික ධර්මදේශනාව අසව. තට දහසක් දෙමියි කියන ලද්දේ ධන ලොභයෙන් අටසිල් ගෙණ විහාරයට ගොස් මෙතන කිසි භයක් නැති තැනෙකැයි සලකා ධර්මාසනය යටටවී මුළු රැය නිදා ගෙදර ගියේය. මවු තොමෝ උදේන්ම පිස තිබූ කැඳ එළවූවාය. මසු දහස ගෙණම හෙතෙම කැඳ බීවේය. ඉක්බිති ධන ආශාව ඔහුට වැඩිවී මුහුදින් එතර

යන්නෙමියි පිටත්ව මව විසින් වළක්වන ලද්දේ මවටත් පහරදී ගොස් නැව් නැගී යනවිට සත්වන දින මුහුද මැද නැව සිටියේය. එහි සිටි මිනිස්සු මෙහි පව්කරුවෙක් ඇතැයි කුසපත් ඇද තුන්වරම ඔහුට පෙරළුන හෙයින් පහුරක්දී ඔහු මුහුදට දැමූහ. හෙතෙම එක් දිවයිනකට ගොස් විමාන ප්‍රේතියන් සමග සම්පත් අනුභව කරමින් ඇලා විසින් ඉදිරියෙහි නොයවයි කියන ලදුවත් ඊට වඩා දෙගුණයක් සම්පත් බලන්නේ පිළිවෙළින් ඛුරචක්‍රයක් දරන්නාවූ එක් පුරුෂයෙකු දිටී. ඔහුට ඒ චක්‍රය පියුමක්මෙන් වැටහුණේය. හෙතෙම ඔහුට මෙසේ කීය. පින්වත, තා විසින් පළඳනා ලද පියුම මට දෙවයි. ස්වාමීනි මෙය පියුමක් නොවෙයි මේ ඛුරචක්‍රයයි. හෙතෙම තෝ නොදෙනු කැමැතිව මා වඤ්චා කරන්නෙහියයි කීය. මෙ තෙමේත් මා මෙන් පවුකොට එහි විපාකය විඳින්ට වූවෙකැයි සිතූ හෙතෙම මෙහි එවයි ඔහුගේ හිස මත චක්‍රය තබා පලා ගියේය.

මහිච්ඡ පුද්ගල තෙම ස්වල්පමාත්‍රවූද තමාගේ සීලය හෝ ග්‍රන්ථය හෝ ධූත ගුණය හෝ යටත් පිරිසෙයින් අරණ්‍යවාස මාත්‍රය පවා මහාජනයාට හඟවා නැවත ගැල්වලින් ප්‍රත්‍ය ගෙණැවිත් ගොඩ ගැසුවත් ඇතැයි නොකියා පිළිගණියි

තුන්දෙනෙක් පුරවන්ට නොහැක්කාහ. කෙතරම් දර දැම්මත් ගින්නද කෙතරම් ජලය ගලාගෙණ ගියත් මුහුදද කෙතරම් ප්‍රත්‍යය දුන්නත් මහිච්ඡ පුද්ගලයාද යන තිදෙනයි. එහෙයින් වදාළහ.

**අග්ගික්ඛන්ධො සමුද්දො ච මහිච්ඡො චාපි පුග්ගලො**
**බහුකෙ පච්චයෙ දෙන්තෙ තයො පෙතෙ න පූරයෙ**

මහිච්ඡ පුද්ගල තෙම වැදූ මවගේද සිත ගත නොහැක්කේ වෙයි. උපස්ථායකයන් ගැන කියනුම කවරේද?

එක් ළදරු භික්ෂුවක් පිටි කැවුම් ගැන ප්‍රිය කරයි. ඔහුගේ මවු තොමෝ ප්‍රතිපත්තිය විමසනු කැමැත්තී ඉදින් මාගේ පුත්‍ර තෙම පිළිගැණීමෙහි පමණ දනීනම් සියළු තුන් මාසය කැවුම්-වලින්ම උපස්ථාන කරන්නෙමියි. වස් එළඹෙන දිනයෙහි එක් කැවුමක් දුන්නීය. එය තිමි කල්හි දෙවන්නක්ද එය තිමි කල්හි තෙවන්නක්දැයි දුන්නීය. ළදරු තෙම ඇතැයි නොකියා දුන් තරම් සියල්ලම කෑවේය. මවු තොමෝ ඔහුගේ අමාත්‍රඥ භාවය දැන මාගේ පුත්‍රයා විසින් සියළු තුන්මාසයේ කැවුම් අදම කන ලදැයි දෙවන දින පටන් එකක්වත් නුදුන්නීය.

තිසස මහරජ තෙමේද දවසක් පාංසා සැපව්වෙහි බික් සඟනට දන් දෙන්නේ මහරජ තුමනි, එක් තැනකටම දෙන්නේ කුමක් හෙයින්දැයි දනව් වැස්සන් විසින් කියන ලද්දේ දෙවන දින අනුරාධපුරයෙහි මහා දනයක් දෙවූයේය. එක භික්ෂුවක්වත් පිළිගැණීමෙහි පමණ නොදත්තේය. එක එක නම විසින් පිළිගත් කැපුතු බුදිය යුතු දේ දෙතුන්දෙනෙකු විසින් එසවිය හැකි තරම් විය. රජු තෙම දෙවන දින සැපව්වෙහි බික් සඟනට ආරාධනා-කොට රජ ගෙදරට පැමිණි කල්හි පාත්‍ර දුන මැනවැයි කිය මහරජ සාම්නැත. තමන්ට උවමනා පමණින් භික්ෂාව ගන්නාහුයයි එක භික්ෂුවක්වත් පාත්‍රය නුදුන්නේය. සියල්ලෝම උවමනා තරමට පිළිගත්හ.

ඉක්බිති රජ තෙම තොපගේ භික්ෂූන් අතරෙන් එක නමක් වත් පමණ නොදනියි. ඊයේ කිසිවක් ඉතිරි නුවූයේය. අද ගන්නා ලද්දේ ටිකය. බොහොමයක්ම ඉතිරි වීය. උන්වහන්-සේලාගේ මාත්‍රඥ භාවය ගැන සතුටු වූයේ පමණ නොදත් අන්‍ය භික්ෂූන් ගැන කලකිරුනේය.

**පාපිච්ඡතාව**

ලාමක ඊප්සා ඇති භික්ෂුතෙම සැදැහැ නැත්තේම ජන තෙමේ මා සැදැතියෙකැයි දනීවායි සිතයි. සැදැහැ නැත්තේ ශ්‍රද්ධාව ඇති ආකාරයක් දක්වයි. දුශ්ශීලාදීහු සීලවනතාදීන්ගේ ආකාර දක්වති. කෙසේදයත් සැදැහැ නැත්තේ මහොත්සව දිනයෙහි මිනිසුන් විහාරයට එන වේලාවෙහි ඉදල ගෙණ විහාරය හමදියි. කුණු කසල හැර දමයි. මිනිසුන් විසින් දක්නා ලද බව දැන වෙහෙර මලුවටයයි. එහි වැලි සමකරයි. අසුන් සෝදයි. බෝධි-යෙහි දිය ඉසියි මිනිස්සු දැක විහාර පිළි දැගුම් කරණ අන්‍ය භික්ෂුවක් නැත. මෙ තෙමේම විහාරය පිළි දැගුම් කරයි. සැදැහැති සඵ්විර නමකැයි නිමන්ත්‍රණයකොට යති.

දුශ්ශීල භික්ෂු තෙම වනාහී උපසථායකයන් හමුවෙහි විනය-ධරයකු කරා එළඹ සවාමීනි, මා යන කල්හි ගොණෙක් කුලප්පු විය. දුවන්නාවූ ඔහු විසින් තණ සිඳින ලද්දැහුය. මා හමදින විට තණකොල ඉගිලෙයි. මා සක්මන් කරණ විට සත්තු මැරෙති. කෙල ගසන විට අවනතව තණ මත්තේ වැටෙයි. එහි කවර ඇවැත් සිදුවේදැයි විචාරයි. ඇවැත්ති සිහිනොකර නොදැන කළහුට ඇවැත් නැතැයි කී කල්හි මට බරක්මෙන් වැටහෙයි. හොඳ හැටි විමසනු මැනවැයි කියයි. ඒ අසා මිනිස්සු අපේ

හාමුදුරුවෝ මෙපමණ සුළු දෙය ගැනත් කුකුස්කරයි. ලොකු දෙයක් ගැන කෙසේ නොකරන්නේද මූන්වහන්සේ සමාන සිල්වතෙක් නැතැයි පහන්ව සතකාර කරති.

අල්ප ශ්‍රැත භික්ෂු තෙමේද උපස්ථායකයන් වැද හුන්නේ අසවල් ත්‍රිපිටකධාරී භික්ෂුතෙම මාගේ අතැවැසියෙක මා සමීපයෙහි ඔවුන් විසින් ධර්මය උගන්නා ලදැයි කියයි. මනුෂ්‍යයෝ අපේ ස්වාමීන් වහන්සේ සමාන බහුශ්‍රැතයෙක් නැත. මූන්වහන්සේ සමීපයෙහි අසවල්ලූ අසවල්ලූ ධර්මය උගත්ගයි පහන්ව සතකාර කරති.

සඞගණිකාරාම තෙමේද (සමූහයා හා එක්ව කැටිව වසනු කැමැති භික්ෂු තෙමේද) මහොත්සව දිනයෙහි දික් පුටුවක් ගෙන්වා ගෙණ විහාර පසෙක ගසක් මුල දවල් කාලය ගත කරයි. මිනිස්සු අවුත් ස්ථවිර තෙම කොහිදැයි අසත්. ගැටකාරයෝ මෙවැනි කල්හි හාමුදුරුවෝ මෙහි නොහිඳිති. ගහක් මූල සක්මන් කරතියයි කියති. ස්ථවිර තෙමේත් දවල් කාලය ගෙවා තලලෙහි මකුළු දැල් හුවාගෙණ දික් පුටුවත් ගෙන්වාගෙණ අවුත් පිරිවෙන් දොරටුවෙහි හිඳියි. මිනිස්සු ස්වාමිනි කොහි ගියහුද අපි නුදුටුවෙමුයි කියති. උපාසකවරුනි ඇතුල් විහාරයෙහි ජනයා බොහෝය. සැටරියන් සක්මනෙහි දවල් කාලය හුන්නෙමුයි. විවේකයෙහි නියැලි බව දක්වයි.

කුසීත තෙමේද උපස්ථායකයන් මැද හුන්නේ උපාසකවරුනි තොප විසින් උල්කාපාතය දක්නා ලදදැයි කියයි. නැත ස්වාමීනි රෑ කියට විතර වූයේදැයි විමසන ලද්දේ අප සක්මන් කරණ වෙලාවෙහියයි කියා භූමිකම්පාව ඇසුනේදැයි විචාරයි. නැතැයි කීවිට අප මැදුම්යම ආලම්බන ඵලකය ලඟ සිටි විටයයි කියා මහා ආලෝකයක් විය. එය දිටුවේදැයි අසා නැතැයි පිළිතුරු දුන්විට අප සක්මනින් බසිනවිටයයි කියයි. මනුෂ්‍යයෝ අපේ ස්වාමි පාදයෝ තුන් යමෙහිම සක්මනෙහිය. උන්වහන්සේ සමාන වීර්‍ය්‍ය වඩන්නෙක් නැතැයි සලකති.

මුළාවූ සිහි ඇති නැනැත්තේද දායකයන් මැද මා විසින් අසවල් කාලයෙහි දික්සඟිය උගන්නා ලද්දේය. මැදුම් සඟිය, සංයුත් සඟිය, අංගුත්තර සඟිය ඉගෙණ ගත්තායින් පසු නැවත බැලීමක් නැත. ඕනෑ තැනකින් පාළි පාඨ කිවහැක. මේ අනිත් භික්ෂූහු එලුවන්මෙන් මූව සලමින් වසත්යයි කියයි. මනුෂ්‍යයෝ අපේ තෙරණුවන් සමාන එළඹ සිටි සිහි ඇත්තෙක් නැතැයි සැලකිළි කරති.

සමාධි රහිත තැනැත්තේද උපස්ථායකයන් හමුවෙහි අටුවා ඇදුරන් කරා එළඹ පැණ විචාරයි. ස්වාමීනි කසිණය කෙසේ වඩන්නේද? කෙතෙකින් නිමිති උපදින්නේද? කෙතෙකින් උපචාරය වේද? අර්පණාව වේද? ප්‍රථම ධ්‍යානයට අඞ්ග කෙතෙක්දැයි විචාරයි. ඇදුරන් විසින් දත් පමණින් කීකල්හී සිනා පහළ කොට ඇවැත්නි කිව එසේ නොවේදැයි ඇසූ කල්හී ස්වාමීනි ඇතැයි තමන්ගේ සමාපත්තිලාභී භාවය පවසයි. මිනිස්සු අපේ ආර්‍ය්‍යයන් වහන්සේ සමාධිලාභීයයි පැහැදී සත්කාර කරති.

නූගත් භික්ෂු තෙමේද උපස්ථායකයන් මැද හුන්නේ මධ්‍යම නිකායයෙහි ප්‍රශ්න තුනක් බලද්දී මට සෘද්ධියක් සමග මාර්ගය ලැබුනේය. පර්‍ය්‍යාප්තිය නම් අපට දුෂ්කර වූවක් නොවේ. පර්‍ය්‍යාප්තියෙහි ව්‍යාවෘත වූයේ දුකින් නොමිදේයයි පර්‍ය්‍යාප්තිය විසඳන්නෙමුයයි යනාදිය කියමින් තමන් මහා නුවණැතියෙකැයි දක්වයි. මෙසේ කියන්නේ වනාහි බුදුසස්නට පහර දෙන්නෙක් වෙයි. ඕනු හා සමාන මහ සොරෙක් නම් නැත. පර්‍ය්‍යාප්තිධරයා දුකින් නොමිදින්නේ නොවෙයි.

රහත් නොවූ භික්ෂු තෙමේද ගම් දරුවන් දැක තොපගේ මව්පියවරු අප ගැන කුමක් කියද්දැයි රහතුනැයි කියති. ස්වාමීනියි. ගෘහපතියෝ දක්ෂයෝය රවටන්ට නොහැකියයි තමන්ගේ රහත් බව දක්වයි. මෙහි අන්‍යවූද චාටි අරහන්ත පාරොහ අරහන්තාදී–හුද දත යුත්තාහ.

එක් කුහකයෙක් ඇතුල් ගැබෙහි සැළියක් වලලා මිනිසුන් එනවිට ඊට පිවිසෙයි. මිනිස්සු ස්ථවිර තෙම කොහිදැයි විචාරති. ඇතුල් ගැබෙහිමයයි කීකල පිවිස පරීක්ෂා කරන්නාහු නොදැක නික්ම අවුත් ස්ථවිර තෙම නැතැයි කියති. ස්ථවිර තෙම ඇතුල් ගැබෙහිමයයි කීකල්හී නැවත පිවිසෙති. ස්ථවිර තෙම සැළියෙන් නික්ම පුටුවෙහි හුන්නේ වෙයි. ඉක්බිති ඔවුන් විසින් ස්වාමීනි අපි මුලින් නොදැක නික්මුනෝ වෙමු කොහි ගියහුදැයි කීකල්හී ශ්‍රමණයෝ නම් තමන් කැමැති කැමැති තැනකට යතියයි කියා තමන්ගේ රහත් බව දක්වයි.

අන්‍යවූද කුහකයෙක් එක් පර්වතයෙක්හී පන්සලක වසයි. පන්සල පිටිපස එක් නුගරුකෙක් ඇත. එහි නුග අරළු ගොස් එහා භූමියෙහි පිහිටියේය. මනුෂ්‍යයෝ මාර්ගයෙන් අවුත් නිමන්ත්‍රණය කරති. හෙතෙම පාසිවුරු ගෙණ අරළුවෙන් බැස මිනිසුන් එන්ට කලින් ගමට ගොස් තමන් දක්වයි. ඉක්බිති

මිනිසුන් විසින් පසුව අවුත් කවර මාර්ගයකින් ආවහුදැයි විචාරණ ලද්දේ ශ්‍රමණයන් ආ මග විමසන්ට නොවටියි. තමන්ට කැමැති කැමැති තැනකින් එතියයි වචනයෙන් රහත් බව දක්වයි. එක් අමාරුකාරයෙක් ඒ කුහකයා ගැන දැන පරීක්ෂා කරන්නෙමියි එක් දිනක් නුග අරළුවෙන් බසින්නහු දැක පසුව එය කපා යන්තමකින් තැබුවේය. හෙතෙම නුග අරළුවෙන් බසින්නෙමැයි. යං කියා වැටුනේ මැටි පාත්‍රය බිඳුනේය. එපමණකින්ම හෙතෙම පලාගියේය.

ප්‍රත්‍යය වැළැක්මය, ගුණ දක්වා කථා කිරීමය, ඉරියව්වෙන් විස්මය පත්කිරීමයයි කුහන වස්තු තුනක් මහා නිර්දේශයෙහි දක්වා තිබේ.

ප්‍රත්‍යය ප්‍රතිෂේධනය

මිනිස්සු භික්ෂුවකට චීවරාදියක් පුදති. භික්ෂුතෙම ඊට කැමැති නමුත් වැඩියෙන් ගණු කැමැතිව මෙසේ කියයි. මහණුන්ට අනගි සිවුරු කුමටද ඔවුන්ට වටනේ සොහොනින් හෝ කසල ගොඩින් හෝ රෙදි කැබිලි අවුලා මසාගෙන පොරවන්ටය. මහණුන්ට ප්‍රණීත පිණ්ඩපාතය කුමටද? ඔවුන්ට වටනේ සිඟාගෙණ වළඳන්ටය. මේ ආදී වශයෙන් කියා එය පෙන්වන්ට රූක්ෂවූ චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පස බෙහෙත් පිරිකර පරිභෝග කරයි. ඒ දක්නා ගෘහපතියෝ මූන්වහන්සේ අල්පෙච්ඡයයි වඩ වඩා සතුටුව සිවුපසයෙන් පෙරැත්ත කරති. එවිට ඒ භික්ෂු තෙම ශ්‍රද්ධා, දෙය්‍ය ධර්ම, ප්‍රතිග්‍රාහක යන තුන් වස්තූන්ගේ සම්මුඛවීමෙන් සැදැහැති කුලපුත්‍රයෝ පින්රැස්කර ගණිති. තොපට ශ්‍රද්ධා හා දියයුතු දැන වස්තු ඇත්තේය. මම වූකලී ප්‍රතිග්‍රාහක වෙමි. ඉදින් මම නොපිළි ගත්තෙම් නම් තොපි පිනින් බැහැර වන්නහුය. මට මෙයින් ප්‍රයොජන නැතත් තොපට අනුකම්පා සඳහා පිළිගණිම්'යි මෙසේ කියා ඉන්පසු ඕනෑතරම් පිළිගණියි.

### සාමන්තජප්පන කුහනාව.

ලාමක ආසා ඇති භික්ෂුවක් "මෙසේ කථා කළ කල්හි මට මහාජනයා බුහුමන් කරති" යි සලකා ආර්‍ය්‍ය ධර්ම නිශ්‍රිතකොට කථා කරයි. යමෙක් මේ නියා සිවුරු දරානම් මෙබඳු පාත්‍රාදිය දරානම් ඒ මහණ මහෙශාක්‍යය. යමෙකුට මෙබඳු ආචාර්‍ය්‍ය උපාධ්‍යායවරයෝ ඇත්නම් යමෙකු මෙබඳු මිත්‍රයෝ වෙත්නම් ඒ මහණ මහෙශාක්‍යය යමෙක් මෙබඳු විහාරයක වෙසේනම් ඒ මහණ මහෙශාක්‍යය'යි කියයි. තවද හැකිළැ හැකිළැ මූහුණ හකුළ

හකුලා කුහක කුහකවූ ප්‍රලාප දෙඩ දෙඩා කටින්ම අනුන් විසින් සම්භාවනා කරණ ලද්දේ මේ මහණ මෙබඳු ශාන්ත විහාර සමා-පත්තීන් ලැබ සිටින්නේයයි හැඟෙනසේ ඊට සරිලන ගැඹුරු, ගූඪ, සියුම්, ප්‍රතිච්ඡන්න ශූන්‍යතායෙන් යුක්ත ලෝකෝත්තර කථා කෙරෙයි. මේ සාමන්තජප්පන සංඛ්‍යාත කුහක වස්තුවයි.

## ඉරියා පථ සන්නිස්සිත කුහනාව.

පාපේච්ඡවූ භික්ෂුවක් "මෙසේ කළ කල්හී මහාජනයා මට බුහුමන් කෙරේ" යයි සලකා ගමන් කරයි. සයනය කරයි. තමා උතුරු මිනිස් දහම් ඇතියෙකැයි දුටුවන්ට වැටහෙනසේ යයි සිටියි ඉඳියි හොවියි. ධ්‍යානලාභියෙකැයි භගවත්නෙක් වෙයි. මෙය ඉරියා පථ සංඛ්‍යාත කුහක බවයි.

## ලපනා.

**තත්ථ කතමා ලපනා? ලාභ සක්කාර සිලොක සන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පරෙසං ආලපනා ලපනා සල්ලපනා උල්ලපනා සමුල්ලපනා උන්නහනා සමුන්නහනා උක්කාචනා සමුක්කාචනා අනුප්පියභාණිතා චාටුකම්‍යතා මුග්ග සූප්‍යතා පාරභට්ටතා අයං වුච්චති ලපනා.**

ලාභ සත්කාර කීර්ති පතන්නාවූ ලෝභයෙන් මැඩීගත් භික්ෂු-වකගේ විහාරස්ථානයට පැමිණියවුන් දැක කිම? ආරාධනාවකට අවුද? හොඳ! යන්න. මම පසුව එන්නෙමි'යි මෙසේ පළමුකොටම කථාවට අල්ලා ගැණීමයයි කියන ලද හෝ නොහොත් මම තමා ... ......... කියන්නේ රජ්ජුරුවෝ අසවල් රාජ මහා මන්ත්‍රීවරු මා කෙරෙහි ප්‍රසන්නයයි මෙසේ තමා උසස් තැන තබා කථාකිරීමයයි කියන ලද ආලපනාවක් වේද.

විතාළ කෙනෙකුට එසේයයි කියන ලපනාවක් වේද.

දායකයන් කලකිරීමෙහි බයින් ඔවුන්ටත් ඉඩ හරමින් කථා කිරීමයයි කියන ලද සල්ලපනාවක් වේද.

මෙතුමාය මහා ධනපතියා, මෙතුමාය මහ නැවියා, මෙතුමාය දානපතියා යනාදීන් දායකයා උසස් තන්හි තබා කථාකිරීමයයි කියන ලද උල්ලපනාවක් වේද.

සම්ප්‍රකාරයෙන්ම දායකයා උසස්කොට කථා කිරීමක්වූ සමුල්ලපනාවක් වේද.

උපාසකවරුනි! ඉස්සර නම් මේ කාලයේ අලුත් දන් දුන්නහුය. දූන් කුමක් හෙයින් නොදෙන්නහුදැයි' විචාරා හෙතෙම "ස්වාමීනි! දැනුදු දෙන්නෙමි අවකාශ නැතියෙන් පමා වන්නෙමි" යි යම්තාක් කියයිද ඒ තාක් වේලා=ලීමවූ නොහොත් උක්දණ්ඩක් අතේ ඇතිව ආ උපාසකයකු දැක 'උපාසකය මේ කොහින්දැයි විචාරා කෙතින්' යයි කීකල 'කිමෙක එහි උක් මිහිරිදැ' යි කාලා දතයුතුය' යි කීකල්හි උපාසකය භික්ෂූන්ට උක් දිය යුතුය' යි කියන්ට නොවටනේයයි කියමින් මෙසේ දායකයා අවුලේලා කථාකිරීමවූ උන්නහනාවක් වේද.

සම්ප්‍රකාරයෙන් අවුලේලා කථාකිරීමවූ සමුන්නහනාවක් වේද.

මේ ගෙහි වැසියෝ ඉදින් මා හඳුනත් නම් මෙහි සියලු දෙයෘ ධර්මය මටම දෙතියි උද්දීපනය කරණ උක්කාවනාවක් වේද.

සම්ප්‍රකාරයෙන් මෙසේ උද්දීපනය කරන්නාවූ සමුක්කාවනා-වක් වේද.

සත්‍යයට හෝ ධර්මයට අනුකූල බවක් නොසලකා නැවත නැවත ප්‍රිය කථා කිරීමයයි කියනලද අනුප්පිය භාණිතාවයක් වේද.

තමා දායකයාට වඩා පහත්ව පැවැත්මයයි කියන ලද චාටු කාම්‍යතාවක් වේද.

මුං තැම්බූ කල කොටසක් පැසී කොටසක් නොපැසී තිබෙන්නාසේ කොටසක් බොරුව කොටසක් සත්‍යව කථා කරණ ස්වභාවයවූ මුග්ගසූපපතාවක් වේද.

කිරි මවුන්මෙන් කුලදරුවන් ඇකයෙන් කරින් වඩාගැන්මවූ පාරිභටටතාවක් වේද. මේ ලපනායයි දතයුතු.

## නෙමිත්තිකතා.

**තත්ථ කතමා නෙමිත්තිකතා? ලාභ සක්කාර සිලොක සන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස යා පරෙසං නිමිත්තං නිමිත්තකම්මං ඔභාසො ඔභාස කම්මං සාමන්ත ජප්පා පරිකථා අයං වුච්චති නෙමිත්තිකතා.**

ලාභ සත්කාර කීර්ති කැමැති ලාමක ආශා ඇති තෘෂ්ණාවෙන් මඩනා ලද භික්ෂුවගේ ප්‍රත්‍යය දීම සඳහා මෙරමා හට සිත් උපදවන කාය වාක් කර්ම නම්වූ යම් නිමිත්තක් වේද, කැමක් ගෙනයන්නවුන් දැක කිම? කැමක් ලැබුවහුදැයි යනාදි නියායෙන් නිමිති කිරීම

නම්වූ නිමිත්ත කර්මයක් වේද, ප්‍රත්‍යය පිළිබඳ කථාකිරීම නම්වූ යම් ඕභාසයක් වේද වසු පල්ලන් දක "කිම මොහු කිරි වස්සෝද වෙඩරු වස්සෝදැ"යි විචාරා සවාමීනි කිරි වස්සෝයයි කීකල්හී "මොවුන් කිරි වස්සන් වුව නොහැක. ඉදින් කිරිවස්සෝ නම් භික්ෂුහුද කිරි ලබන්නාහුය"යි මේ ආදී නියායෙන් කියා කුඩා දරුවන් ලවා ඔවුන්ගේ මවු පියන්ට දන්වා කිරි දෙවවා ගැණීම් ආදීවූ යම් ඕභාසකර්මයක් වේද කුලූපග භික්ෂුමෙන් ආසන්නකොට කියන සාමන්ත ජප්පාවෙක් වේද එය නෙමිත්ති කතායයි කියනු ලැබේ.

එක් කුලූපග භික්ෂුවක් වළඳනු කැමැතිව ගෙයකට පිවිස වැඩ හුන්නේය. එය දක නොදෙනු කැමැති ගෘහිණී තොමෝ සහල් නැතැයි කියමින් සහල් ගෙණෙනු කැමැත්තියක්මෙන් අසල ගෙදරකට ගියාය. භික්ෂු තම ගෙය තුළට පිවිස බලන්නේ දොරමුල්ලේ උක්ගසද භාජනයෙක සකුරුද පැසෙක ලුණු මාලුද සැළියෙක සහල්ද කළයෙක ගිතෙල්ද තිබෙනු දක නික්ම අවුත් කිසිත් නොදන්නා ලෙස වැඩ හුන්නේය. ගෘහිණී තොමෝ සහල් නොලදිමි'යි කියා ගෙණ ආවාය. භික්ෂු තෙම "උපාසිකා-වනි! අද දන් නොලැබෙන බව මගදී දුටු පෙර නිමිත්තෙන් දන ගතිමි"යි කීවේය. කිමෙක්ද? සවාමිනි! යි අසන ලද්දේ උපාසිකා-වනි! දොරමුල්ලේ උග්ගස බඳු සර්පයකු දුටුවෙමි. උඹට ගසන්නෙමියි අවා බලන්නේ බඳුනෙහි සකුරු කැට වැනි ගල්කැටද පහර ලත් සර්පයා විසින් කරණ ලද පැසෙහි ලුණු මාලු පෙතිමෙන් දක්වූ පෙනයද කැටගල් ඩහන්නට වන් සර්පයාගේ සැළියෙහි සහල් වැනි දත්ද කුපිතවූ සර්පයාගේ මුඛයෙන් නික්මුණු කළයෙහි ගිතෙල් බඳු විෂ මිශ්‍ර කෙළද දුටුවෙමි'යි යළිත් කීවේය. ඒ උපාසිකා තොමෝ මේ මුඩු මහණා රවටනු නොහැකිය'යි උක්ගස කපා පිළිගන්වා බත් පිස ගිතෙල් සකුරු හා මස් සමග පිළිගැන් වූවාය. මෙසේ ආසන්නකොට කිණීම සාමන්තජප්පා නමැයි දතයුතුයි.

යම්සේ කථා කළවිට එය ලැබේ නම් එසේ පෙරළ පෙරළා කථාකිරීම පරිකථා නම්වේ.

## නිපෙපසිකතා.

**තතථ කතමා නිපෙපසිකතා? ලාභ සකකාර සිලොක සනනිසසිතසස පාපිචඡසස ඉචඡාපකතසස යා පරෙසං අකෙකා-සනා වමභනා ගරහණා උකෙඛපණා සමුකෙඛපණා ඛිපනා සංඛිපනා පාපනා සමපාපනා අවණණ හාරිතා පර පිටඨි මංසි කතා අං වුචචති නිපෙපසිකතා.**

### එහි නිප්පෙසිකතා නම් කිම.

ලාභ සත්කාර කීර්ති කාමීවූ-පාපෙච්ඡවූ-ආසාවෙන් මඩනා ලද්දාවූ භික්‍ෂුවගේ පරහට දශ ආක්‍රොශ වස්තුයෙන් ආක්‍රොශ කිරීම යයි කියන ලද අක්කොසනාවෙක් වේද, බැණ දෙඩීමයයි කියන ලද වම්භනාවෙක් වේද, සැදැහැ නැත්තා අප්‍රසන්නයා යනාදී වශයෙන් ගැරහීමක් වේද, කටවහගනු යනාදි වශයෙන් ඔසවා දැමීමක් වේද, නොදෙන්නෙකුට අනේ දානපතිය! යනාදීන් වචනයෙන් මොනවට උසස් කිරීම නම්වූ සමුක්කම්පනාවක් වේද, බිජුවට කන මොහුගේ ජීවිතය කිම්දැයි කාවටකම් කිරීම්වූ ඛිපනාවක් වේද, මොහුට නොදෙන්නායයි කුමට කියත්ද ඇම කල්හි මෙතෙම නැත යනු දෙන්නේයයි කියා වඩාලාත් කාවටකම් කිරීම්වූ සංඛිපනාවක් වේද, නොදෙන බව නොහොත් නුගුණ සැමතැන පැමිණවීමක් වේද, සර්‍වප්‍රකාරයෙන් එසේ පැමිණවීමයයි කියන ලද සම්පාපනාවෙක් වේද.

"දෙස් කීමට බියෙන්වත් දෙන්නේය" යි සිතා ගෙන් ගෙට ගමින් ගමට දනව්වෙන් දනව්වට නුගුණ ගෙණයාමයයි කියන ලද "අවණ්ණහාරිතා" වක් වේද, සම්මුඛයෙහි මිහිරිසේ ගුණ කියා අසම්මුඛයෙහි නුගුණ කීමවූ ඉදිරිපිටදී බැලීම් මාත්‍රය කුදු නොකොට පිටු පෑවිට පිටු මස් කෑම වැනි පරපිට්ඨිමංසිකතාවක් වේද.

මේ අක්කොසනාදිය වනාහී හුණ පතුරෙන් ඇඟ සූරා පිස දමන්නාසේ මෙරමාගේ ගුණ සූරා පිස දමන්නේය. නැතහොත් සුවඳ ද්‍රව්‍ය සුණුකොට සුවඳ ආඝ්‍රාණය කරන්නාසේ මෙරමා ගුණ සුණුකොට ලාභ සොයා ගන්නේය. එබැවින් නිප්පෙසිකතායයි කියනු ලැබේ.

### ලාභෙන ලාභං නිජිගිංසනතා.

**තත්‍ථ කතමා ලාභෙන ලාභං නිජිගිංසනතා? ලාභ සක්කාර සිලොක සන්නිස්සිතො පාපිච්ඡො ඉච්ඡාපකතො ඉතො ලද්ධං ආමිසං අමුත්‍ර හරති අමුත්‍ර වා ලද්ධං ආමිසං ඉධ හරති යා එව රූපා ආමිසෙන ආමිසස්ස එට්ඨි ගවෙට්ඨි පරියෙට්ඨි එසනා ගවෙසනා පරියෙසනා අයං වුච්චති ලාභෙන ලාභං නිජිගිංසනතා'ති.**

එහි ලාභයෙන් ලාභය සෙවීම නම් කිම? ලාභ සත්කාර කීර්තිකාමී-පාපෙච්ඡ-ඉච්ඡාවෙන් මඩනා ලද භික්‍ෂු තෙම මේ ගෙයින් ලත් ආමිෂය අනෙක් ගෙයකට ගෙණයයි. ඒ ගෙයින්

ලත් ආමිෂය මේ ගෙට ගෙණ එයි. මෙබඳුවූ ආමිෂය පිළිබඳ යම් කැමැත්තෙක් සෙවීමෙක් නැවත නැවත සෙවීමෙක් වේද එය ලාභයෙන් ලාභය සෙවීමයයි කියනු ලැබේ.

**යථාවා පනෙ භො භොනෙතා සමණ බ්‍රාහමණා සධා දෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡාන විජ්ජාය මිච්ඡා ජීවෙන ජීවිකං කප්පෙනති.**

මේ ලෝකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් සැදැහැවතුන් දුන් බොජුන් වළඳ මෙබඳුවූ තිරශ්චීන විද්‍යායෙන් මිත්‍යාජීවයෙන් ජීවත් වෙති. යනුවෙන් බ්‍රහමජාල සූත්‍රයෙහි දක්වන ලද පාප ධර්ම අනෙක විධය.

ඔව්හු මෙසේ දත යුත්තාහ.

අත්පා ආදිය පරීක්‍ෂාකර බලා මෙබඳු අවයවයන්ගෙන් යුක්ත තැනැත්තේ දීර්ඝායුෂ ලබන්නේය. කීර්තිමත් වන්නේය. යනාදි වශයෙන් පවත්නා අඞ්ග ශාස්ත්‍රය. 1.

පඬු රජතෙම මුතු ඇට තුනක් මිට මොලවා ගෙණ මාගේ අතේ කිමෙක්දැයි නිමිති ශාස්ත්‍රය දන්නකු විචාළේය. හෙතෙම ඔබමොබ බැලී. ඒ අවස්ථාවෙහි හූනකු අතින් මැස්සෙක් මිදුනේය. එබැවින් නෛමිත්තකයා මුත්තා (මුතු) යයි කීය. නැවත කීයක්දැයි විමසන ලද්දේ කුකුළකු තුන්වරක් හඬලනු අසා තුනකැයි කීය. මේ ආදී වශයෙන් දක්වනු ලබන නිමිත්ත ශාස්ත්‍රය. 2.

නක්‍ෂත්‍ර පීඩා ආකාශ ගර්ජිතා උල්කාපාතාදීන්ගේ ඇතිවීම් දැක ඒ නිසා මේ මේ දෙය වන්නේයයි ප්‍රකාශ කරණ උත්පාද ශාස්ත්‍රය. 3.

යමෙක් පෙරයම හීනයක් දක්කොත් මෙබඳු විපාක ඇත්තේ වෙයි. මෙනම් දෙයක් දුටහොත් මෙබඳු දෙයක් වන්නේයයි පවසන ස්වප්න ශාස්ත්‍රය. 4.

මෙවැනි ලක්‍ෂණයෙන් යුක්තවූයේ රජවෙයි. මෙසේ නම් යුවරජ වෙයි යනාදි වශයෙන් දෙහ ස්වභාවයන් සලකා කියන්-නාවූ ලක්‍ෂණ ශාස්ත්‍රය. 5.

පාවිච්චි කළ නොකළ වස්ත්‍ර මීයන් කෑමෙන් වන අවැඩ ප්‍රකාශ කරන්නාවූ මූසිකච්ඡින්න ශාස්ත්‍රය.

මෙවැනි දර දමා ගින්නෙහි මෙසේ හෝම කළ කල්හී මෙබන්දක් වේයයි පවසන අග්නිහොම. 6. 7. දබ්බිහොම ශාස්ත්‍රයන්ද.

මෙබඳු හැන්දකින් මෙවැනි දහවියා. 8. 9. කුඩු, 10. සහල්, 11. ගිතෙල් ආදිය දමා හොමකළ කල්හී මෙසේ වන්නේයයි දක්වන ශාස්ත්‍රද.

අඹ ආදිය මුඛයෙන් ගෙන ගින්නෙහි දැමීමය විද්‍යා ජපකොට පිදීමයයි කියන ලද "මුඛසොම" ශාස්ත්‍රයද දකුණු ජතු (අංසන්ධි) ලොහිතාදියෙන් යාගකරණ ලොහිතසොම ශාස්ත්‍රයද. 8.

ඇඟිලි ඇට බලා විද්‍යා ජපකොට මෙතෙම කුල පුත්‍රයෙක්ද නැද්ද සිරිමතෙක්ද නැද්දැයි යනාදි වශයෙන් ප්‍රකාශ කරණ අඞ්ග විද්‍යාවද. 9.

ගෘහ වස්තු ආරාම වස්තු ආදීන්ගේ ගුණ දෝෂද මැටි ආදියේ ස්වභාවද බලා විද්‍යා ජපකොට යට පෘථුවියෙහි තිස් රියනක් හරි-යෙහිද අහසෙහි අසූරියනක් හරියෙහිද ප්‍රදෙශයෙහි ගුණ දෙස් පවසන වස්තු විද්‍යාවද. 10.

වැඞිකල් ජීවත් විය හැකි පරිදි අත පය ක්‍රියා කරවන හරඹ උගන්වන ක්‍ෂත්‍ර විද්‍යාවද. 11.

සොහොනෙහි වැස සාන්තිකර්ම කරන්නාවූ සිව විද්‍යාවද. 12.

භූත වෛද්‍ය මන්ත්‍රාදිය ඇතුළත් භූත විද්‍යාවද. 13.

භූරි ගෘහයෙහි වසන්නහු උගත යුතු මන්ත්‍ර ඇති භූරි විද්‍යාවද.

සර්පයන් දෂ්ට කළවුන්ට කරණ පිළියම් හා සර්පයන් ලඟට ගෙන්වීම කරවන අහි විද්‍යාවද.

පැරණි විෂ රක්නාවූද අලුත් විෂ ඇතිකරන්නාවූද විස තන්ත්‍රාත්මක විෂ විද්‍යාවද.

ගෝනුස්සන් විසින් දෂ්ට කරණ ලදුව පිළියම් ප්‍රකාශිත විච්ඡික විද්‍යාවද.

එසේම මීයන් පිළිබඳ මූෂික විද්‍යාවද.

පියාපත් ඇත්තාවූද නැත්තාවූද දෙපා ඇත්තාවූද සිවු පා ඇත්තාවූද සතුන්ගේ හඬින් හා ගමනින් තොරතුරු කියන්නාවූ සකුණ විද්‍යාවද.

කපුටින්ගේ නාදයෙන් කරුණු කියන්නාවූ වායස විද්‍යාවද දැන් මෙතෙම මෙතෙක් කල් ජීවත් වන්නේය. මෙතෙම මෙතෙක් කල්යයි පවත්නා දැනීමෙන් යුත් පක්‍ෂ ධ්‍යානයද.

තමන් මත්තෙහි නොඑන පරිදි සවරය රක්‍ෂා කරන්නාවූ සවර පරිත්‍රාණයද.

සියළු මෘග පක්ෂීන්ගේ හඬ දැනගන්නා මෘග පක්‍ෂ නම් ශාස්ත්‍රයද.

**මාණික්‍ය ලක්‍ෂණය, වස්ත්‍ර ලක්‍ෂණය, දණ්ඩ ලක්‍ෂණය, අසි ලක්‍ෂණය, උෂු ලක්‍ෂණය, ධනු ලක්‍ෂණය, ආවුධ ලක්‍ෂණය, ස්ත්‍රී ලක්‍ෂණය, පුරුෂ ලක්‍ෂණය, කුමාර ලක්‍ෂණය, කුමාරී ලක්‍ෂණය, දාස ලක්‍ෂණය, දාසි ලක්‍ෂණය, අශ්ව ලක්‍ෂණය, මහිෂ ලක්‍ෂණය, වෘෂභ ලක්‍ෂණය, ගව ලක්‍ෂණය, අජ ලක්‍ෂණය, මෙණ්ඩ ලක්‍ෂණය, කුක්කුට ලක්‍ෂණය, වට්ටක ලක්‍ෂණය, ගොධා ලක්‍ෂණය, කර්ණිකා ලක්‍ෂණය, කච්ඡප ලක්‍ෂණය, මෘග ලක්‍ෂණය යන ශාස්ත්‍රද.**

මේවා පිළිබඳ වනාහී මෙබඳු මැණික ප්‍රශස්තය. මෙය ප්‍රකාශය ගීතය මෙය පැළඳීමෙන් නිරෝගීවේ. යස ඉසුරු සැප සම්පත් ලැබේ. යනාදි වශයෙන් මැණික්වල වර්ණය සටහන ගුණය යනාදිය දැක්වීමයි. වස්ත්‍රාදිය පිළිබඳවද එසේය.

එක් විහාරයක සිත්තරෙක් ගොයකු ගිනි ගොඩකට පිඹිමින් සිටින ආකාරය සිතියම් කොළේය. එදා පටන් භික්‍ෂූන් අතර මහා විවාද හට ගත්තේය. එක් ආගන්තුක භික්‍ෂුවක් ඒ දැක මැකෙව්වේය. එතැන් පටන් විවාද නැති විය.

මෙසේම රජුන් පිළිබඳ ජය පරාජය ප්‍රකාශ කිරීම චන්ද්‍රග්‍රහණ, සූර්යග්‍රහණ, නක්‍ෂත්‍රග්‍රහණ, චන්ද්‍ර, සූර්ය, නක්‍ෂත්‍රයන්ගේ නියම මග යැම හා නොමග යැමද, උල්කාපාත, දිශාවන්ගේ ගිනිසිළු, දුම්සිළු ආදියෙන් ආකුල බව, භූමිකම්පා, ශුෂ්ක වලාහක ගර්ජනා, සඳ, හිරු, තාරකාවන්ගේ උදාව අස්තය පිරිසිදු බව අපිරිසිදු බව මේ කරුණු නිසා ලොකයා හට මේ මේ දේ වේයයි පැවසීම.

වර්ෂාව ඇති නැති බව, ආහාරපාන සුලභත්වය, දුර්භික්‍ෂය, නිර්භීය භාවය, බියට කරුණු, රෝග හටගැණීම, නීරෝගි භාවය, හස්තමුද්‍රාව, අච්ඡිද්‍රක ගණනාව, යම්කිසි ගසක් දැක මේ ගසේ පත්‍ර මෙපමණ වෙති. ඵල මෙපමණ වෙතියයි කිවහැකි සංඛ්‍යාන ශාස්ත්‍රය චින්තා කවි, ශ්‍රුත කවි, අර්ථ කවි, ප්‍රතිභාණ කවි යන සිවු

කිව්වරයන්ගේ වශයෙන් තමන්ගේ චින්තා වශයෙන් හෝ වෙසසන්තර නම් රජෙක් වූයේයයි අසා ශ්‍රැත වශයෙන් හෝ මෙහි අර්ථය මෙසේය. එය මේ හා යොදන්නෙමියි මෙසේ අර්ථ වශයෙන් හෝ කිසිවක් දැක ඒ හා සමාන කරන්නෙමියි තැනට සුදුසු වාටනීම් වශයෙන් හෝ ජීවිකාව පිණිස යොදා ගන්නා කාව්‍ය ශාස්ත්‍රය ලොකායත නම්වූ විතණ්ඩ ශාස්ත්‍රය හෝ මේ කුමරුවා හට අසවල් කුලයෙන් අසවල් නැකතින් කුමරියක් පාවා දෙව්යයි ආවාහ කරණය.

මේ තරුණිය අසවල් කුමරුවා හට අසවල් නැකතින් දෙමි. වැඩි දියුණුව වන්නේයයි මෙසේ විවාහ කරණය, අද නැකත හොඳය අදම සමගිවව් මෙසේ නොපගේ වියොගය නොවේයයි සමගියෙහි පිහිටුවන සංවදනය ඉදින් වෙන්වෙනු කැමැති නම් අදම වෙන්වෙනු. එවිට නොපගේ නැවත එක්වීමක් නොවන්නේ යයි මෙසේ වියොගය සිදුකරණ විවදනය නොප විසින් දෙනලද ණය අදම එක්කර ගණිව්. අද එකතුකර ගන්නා ලද්දේ තහවුරු වේයයි මෙසේ ධන රැස්කර වන්නාවූ "සංකිරණය" ඉදින් පොලියට දීම් ආදි වශයෙන් මුදල් වැඩි කරගණු කැමැත්තහු නම් අදම එසේ යොදවව්. අද යොදවන ලද්දේ දෙගුණ සිවුගුණ වන්නේයයි ධනය යොදවන විකිරණය ප්‍රිය මනාප බැව් ඇතිකර වන්නාවූ සුභග කරණය ඊට විපරිත වශයෙන් දුභීග කරණයද ගර්භයේ නැසීම කරන්නාවූ විරුඪ ගර්භ කරණය නැවත විනාශ නොවනු පිණිස ඖෂධ යෙදීම ගර්භය වනාහි වාතයෙන් හෝ ප්‍රාණීන්-ගෙන් හෝ කර්මයෙන් හෝ යන කරුණු තුනින් නැසේ. වාතයෙන් නැසෙන කල්හි නිගාධනියවූ ශීතල බෙහෙත් දෙයි. ප්‍රාණීන්ගෙන් නැසෙන කල්හි ඊට ප්‍රතිකර්ම කරයි. කර්මයෙන් නැසෙන ගර්භය බුදුවරයෝවත් ප්‍රතිබාහනය කරන්ට නොහැකි වෙත්.

මන්ත්‍රයෙන් දිව තද කරන්නාවූ ජිව්හා නිත්ථම්භනය මුව බැඳුනු පමණින් යම්සේ හණු සොලවන්ට නොහැකිවේද එසේ තද කරන්නාවූ හණු සංහණනය. හස්තපරිවර්තනය කරණ මන්ත්‍ර ජප කරන්නාවූ හත්ථාභි ජප්පනය. ඒ මන්ත්‍රය සත් පියවරෙක්හි සිට ජපකළ කල්හි අනිත් තැනැත්තේ අත් පරිවර්තනයවී වැටෙයි. කණින් ශබ්දය නොඇසිය හැකිසේ විද්‍යා ජපකරන්නාවූ කණ්ණ ජප්පනය. එය ජපකොට විනිශ්චය ස්ථානයෙහි යමක් කැමැති නම් එය කියයි. සතුරු තැනැත්තේ එය නොඅසයි. කැඩපතෙහි දෙවියන් බස්වා ප්‍රශ්න විචාරන්නාවූ ආදාස ප්‍රශ්නය. කුමාරිකාවගේ ශරීරයෙහි දෙවියන් ආරූඪ කරවා ප්‍රශ්න විචාරන්නාවූ කුමාරික ප්‍රශ්නය දෙව දාසියගේ ශරීරයෙහි දෙවියන් ආරූඪ කරවා ප්‍රශ්න

විචාරන්නාවූ දෙව ප්‍රශ්නය දිවිරැක ගැණීම පිණිස හිරු පිදීම කරන්නාවූ ආදිත්‍යොපස්ථානය එසේ මහබඹු පුදන්නාවූ මහත ප්‍රස්ථානය මන්ත්‍රයෙන් මුවින් ගිනිදැල් නිකුත්කරණ අබ්භුජ්ජලනය ශ්‍රිය! මෙහි එව මාගේ හිසෙහි පිහිටුවයි කියන් ශ්‍රී සම්පත් කැඳවන සිරව්හායනය.

දෙවාලයට ගොස් ඉදින් මට මේ කටයුත්ත හරි ගියහොත් තමුන්නාන්සේට මෙසේ මෙසේ උපකාර කරන්නෙමියි කිව්ස්නා ශාන්තිකර්මය එය සමෘධවූ කල්හි කරන්නාවූ ප්‍රණිධි කර්මය භූර ගෘහයෙහි වැස ගත් මන්ත්‍රය ප්‍රයොග කරන්නාවූ භූරි කර්මය පණ්ඩකයකු පුරුෂයකු කරන්නාවූ වස්ස කර්මය. පුරුෂයකු පණ්ඩකයකු කරන්නාවූ වොස්සකර්මය. එය කරන්නේ අචඡින්දික භාවයට පමණක් පමුණුවයි. ලිඞ්ගය අන්තර්ධාන කරන්ට නොහැකි වෙයි. අකෘත වස්තුවෙහි ගෙවල් පිහිටු වන්නාවූ වස්තු කර්මය. මේ මේ ද්‍රව්‍ය ගෙණ එව්යයි කියා බිලියම් කරන්නාවූ වස්තු පරිකිරණය. දියෙන් මුඛ සුද්ධිය කරන්නාවූ ආචමනය. අන්‍යයන් නහවන්නාවූ නහාපණ කර්මය. ඔවුන් උදෙසා අග්නිහොම කරන්නාවූ ජුහණ කර්මය. ඖෂධ යොග දනයකොට වමන කරන්නාවූ වමනකර්මය. එමෙන්ම විරෙචන කර්මය. ලය විරෙකය සිදුකරන්නාවූ උඩ විරෙචන කර්මය. හිසේ දෙස් පහකරන්නාවූ ශිරො විරෙචන කර්මය. කන් වැඩීම පිණිස හෝ වණ හැරීම පිණිස හෝ බෙහෙත් තෙල් පිසන්නාවූ කර්ණ තෛලය. ඇස් ආරක්‍ෂා කිරීම සඳහා කරන්නාවූ නෙත්‍ර තර්පණය නරක්වූ සෙම පහකිරීම සඳහා කරන්නාවූ නශ්‍යකර්මය. පටල දෙකක් තුනක් බැහැර කිරීමෙහි සමත් කාරම් බෙහෙත් යොදන්නාවූ අඤ්ජන කර්මය. වැඩිය යුතු සිහිල් බෙහෙත්වලින් අඳුන් ලන්නාවූ පච්චඤ්ජන කර්මය. උල්වලින් කරන්නාවූ සාලාකිය කර්මය. ශල්‍යකර්තෘ වෛද්‍යකර්මය. ළදරුවන් වැඩීම සඳහා කරන්නාවූ දරක තිකිත්සා විධිය. මුල් බෙහෙත් යෙදීමෙන් කරණ වෛද්‍යකර්මය. කාරම් ආදිය යොදා ඊට සුදුසු කාලය ගිය කල්හි එය පහකරන්නාවූ පටිමොක්ඛ කර්මය.

යන මේ විද්‍යාවන්ගෙන් දිවිරැකීමෙන් ආජීව පාරිසුද්ධිය අපෙක්‍ෂා කරණ භික්‍ෂුව වැළකී සිටිය යුතුය.

### සැරියුත් මාහිමියන්ගේ ආජීව පාරිසුද්ධිය.

දිනක් උන්වහන්සේ මුගලන් තෙරණුවන් සමග අරණ්‍ය සෙනසුනෙක්හි වසන සේක්. වාතාබාධයකින් පෙළෙන්ට වූහ. සවස් වේලෙහි මුගලන් තෙරණුවෝ උපස්ථානයට පැමිණ වැද

හෝ තා උන්වහන්සේ දූක කරුණු විමසා පෙර කවර පිළියමකින් සුව වීදැයි ඇසූහ. ඇවැත්නි! ගිහිකල මාගේ මෑණියෝ ගිතෙල් මී සකුරු යොදා පැන් නුවූ සූකිරි බත් දුන්හ. එයින් පහසු වීයයි කීසේක. සක්මන් කෙළවර වෘක්ෂයෙහි වුසූ දෙවතා තොමෝ මෙය අසා තෙරුන්ගේ උපස්ථායක කුලයෙහි වැඩි මහලු පුත්‍රයා හට ආවිෂ්ටව තෙරුන් වහන්සේ පිඩු පිණිස වැඩිවිට එබඳු කිරි බතක් පිළිගන්වතොත් ඔහු මුදාලනබව කීවාය. එකී පරිදි මුගලන් තෙරණුවන් පිඩු පිණිස වැඩිකල්හි ඔව්හු උන්වහන්සේටද කිරිබත් වළඳවා තව පාත්‍රයක් පුරා කිරිබත් පිළිගැන් වූහ. මුගලන් තෙරණුවෝ මෙය ගෙණවුත් සැරියුත් තෙරණුවන්ට පිළිගැන්වූහ. අදහස් කළ පරිද්දෙන් පිළියෙළ කරණ ලද ඒ කිරිබත කෙසේ ලැබුනේදැයි විමසන සේක්. තමාගේ වචනය අසා සිටි දෙවතාවා නිසා ලැබී තිබෙන බැව් දැන තමන් වහන්සේගේ පරිශුඬ ආජීවයට කිලුටකැයි සලකා නොපිළිගත් සේක. නමුත් උන්වහන්සේගේ වාතාබාධය එකෙණෙහිම සුවපත් විය. එතැන් පටන් එම ආබාධය සාළිස් අවුරුද්දක් තුළ හට නොගත්තේය. මෙහිදී උන්වහන්සේ,

**යදිපි මෙ අන්ත ගුණං – නික්ඛමිත්වා බහිචරෙ**
**නෙව භින්දෙය්‍ය මාජීවං – චජමානොපි ජීවිතං**

යනුවෙන් ඉදින් මාගේ අතුණු බැහැරට නික්ම පිටත ඇවිදී නමුදු ජීවිතය හරනේ නමුදු ආජීවය නොම බිඳින්නෙමි' යනුවෙන් උදන් ඇනූහ.

## දූහැමි තිස්ස මහරජු

පෙර අනුරාධ පුරයෙහි දූහැමි තිස්ස නම් මහ රජාණන්ට වටුමස් කෑමෙහි තෘෂ්ණාවක් උපන ඒ මහ රජ තෙම ඉදින් මම මේ බව අනිකක් හට කිවහොත් මෙනුවර සතර දිග යොත්නෙක පමණ සරියෙහි වටුවන් නසන්නාහු වෙතියි තෘෂ්ණාව ඉවසමින් තුන් හවුරුද්දක් ගත කෙළේය එයින් කෘෂීන් සැරව පෙරෙන්ට වන. ඒ රජතෙම එකෙකු අතින් විචාරනුයේ එම්බා සගය! අපට පිරිවරව සිටිනා අයගෙන් පන්සිල් රක්නා එකෙක් ඇද්දැයි විචාළේය. එබසට ඒ පුරුෂ තෙම කියනුයේ නොකඩවා පන්සිල් රක්නාවූ තිස්ස නම් පුරුෂයෙක් ඇතැයි කීයේය. රජතෙම පරීක්ෂා කරණු පිණිස ඔහු ගෙන්වීය. හෙතෙම අවුත් රජු වැඳ සිටියේය. රජ තොප තිස්ස නම් ඇත්තෝ දැයි විචාළේය. එසේය දෙවයන් වහන්සැයි කීය. රජු ඔහුට යන්ට අවසරදී කුකුළකු ගෙන්වා පුරුෂයකුටදී මෙසේ කීය. මේ කුකුළා

තිස්සයාටදී ඔහු අතින්ම මරවා ව්‍යංජන තුනක්කොට පිසූ ගෙණෙන්ට කියවයි කීය, හෙතෙමේද ගොසින් එසේ කීය. ඒ උපාසක තෙම කියනුයේ මේ මළ කුකුළෙක් වීනම් මම දන්නා ලෙස පිස ගෙණෙන්නෙමි. නුමුත් නොමළ කුකුළා මරන්ට මට නොහැකියයි කීයේය. මෙහෙවර කී පුරුෂ තෙම රජහට එපවත් සැළකෙළේය. රජ නැවතත් ගමන් කරවීය. හෙතෙම එම්බ යහළුව රජවරුන්ට උපස්ථාන කිරීම බැරෑරුම්ය. සිල් රැකීම පසුවත් පුළුවන. එබැවින් මොහු මරා පිසවයි කීය. එවිට උපාසක තෙම කියනුයේ එම්බල පුරුෂය! රජහු විසින් නොමැරුවත් උපන්නහුගේ මරණය නියමය. එබැවින් තිර නැති ජීවිතය නිසා ප්‍රාණවධයක් නොකරමියි කීය. රජ තුන්වන වරටත් එසේම කරවා ප්‍රාණඝාතයට නොකැමැති තිස්ස නම් උපාසකයා ලඟට කැඳවා තෙමේත් විචාළේය. රජුටත් එසේම උත්තරදුනි. එකල්හී රජතෙම රාජ පුරුෂයන් කැඳවා මෙතෙම රජ අණ ඉක්ම වන්නේය. මොහු සොරුන් මරණ තැනට ගෙණ ගොස් දන්ගෙඩියේ හිස හොවා ඔහු අතට කුකුළා දෙවයි අණ කෙළේය. රාජපුරුෂයෝද ඔහු ගෙණගොස් දන්ගෙඩියේ හිස හොවා ඔහු අතට කුකුළා දුන්හ. ඒ උපාසක තෙම කුකුළා ළෙහි හොවා මගේ දිවි තට දුන්නෙමි තගේ දිවි මම ගත්තෙමි. තෝ භය නොවෙයි කියා කුකුළා හැරියේය. කුකුළ තෙම හඬා පියා අහසින් ගොස් තුග රුකක උන්නේය. ඒ කුකුළාට අභය දුන් තැන කුකුළ ගිරි නම් විය. රජ ඒ අසා උපාසකයා කැඳවා සර්වාභරණයෙන් සරසවා එම්බා පුරුෂය! තා පරීක්ෂා කරණු පිණිස මම මෙසේ කෙළෙමි. වටු මස් කන්ට කැමැතිවූ මට දැන් තුන් අවුරුද්දක් ඉක්ම ගියේය. ඇසීමෙන්වත් දැකීමෙන්වත් හැඟීමෙන්වත් අප උදෙසා මරන්ට ඇතැයි වැටහෙන මසක් අනුභව කිරීම සුදුසු නොවන්නේය. ත්‍රිකොටි පරිසුඬවූ මත්ස්‍ය මාංශයම බුදුරජු විසින් අනු දන්නා ලද්දේය. එබැවින් එබඳුවූ වටු මස් සපයා දිය හැකිදැයි විචාළේය. එබසට උපාසක තෙම මෙය අප විසින් කටයුතු දෙයකැයි උදෑසනම නුවරට ගොස් වටුවන් තුන්දෙනෙකු මරාගෙන එන පුරුෂයකු දැක මුදල්දී ගෙණවුත් පියාපත් සිඳ සුඬකොට දුරු ආදියෙන් සුවඳ කවා උයා ගෙනවුත් රජහට දුන්නේය. රජ තෙමේ මතු මහල් තලයෙහි හිඳ එක් වටුවකු ගෙන අතින් මදක් කඩා මුඛයෙහි තැබීය. එකෙණෙහිම ඒ රසය සද්දහසක් රස නහරයෙහි පැතිරී සිටියේය. එකෙණෙහි රජතෙම භික්ෂු සඞ්ඝයා සිහිකොට පෘථිවීශ්වරවූ මට පවා වටු මස් කනු කැමැතිව තුන් අවුරුද්දක් ඉක්ම ගියේය. සඞ්ඝයා වහන්සේලා කෙසේ ලබත සේක්දැයි මුඛයෙහි තිබූ මස්කඩ බිමට දැමීය. ඒ කාරණය උපාසක

තෙම දූත දණ දෙක බිම තබා වැඳ මහරජ මේ මස් කිසි දෙසක් නැත අනුභව කළ මැනවැයි යාඥ කෙළේය. මහා සඞ්ඝයාට දන්දී අනුභව කරන්ට උවමනා නිසා දැමූයෙමැයි කියා සෙසු මස් රක්‍ෂාකර තබන්ට කීයේය. දෙවන දවස් රජගෙයි සිඟා වළඳන තෙරුන් වහන්සේ සිතා වැඩිසේක. උපාසක තෙම උන්වහන්සේ දූත පාත්‍රය ගෙන රජ ගෙට කැඳවාගෙන ගියේය අලුත මහණවූ මහණෙක් නොවිචාරාම තෙරුන් වහන්සේ කැටුව රජ ගෙට එන. තෙරුන් වහන්සේද රජහු විසින් කැඳවන ලද මහණෙකැයි සිතූසේක. උපාසකයා තෙරුන් වහන්සේගේ අතැවැසි මහණෙකැයි සිතීය. ඒ දෙදෙනම වඩා හිඳුවා කැඳ පිළිගැන් වූහ. රජ පළමු දවස් රක්‍ෂාකොට තිබූ වටුවන් දෙන්නෙකු ගෙනවුත් තෙරුන්වහන්සේට පිළිගැන්වීය. තෙරුන්වහන්සේ එක් වටුවකු පිළිගත් සේක. මහලු මහණ ළඟටද ගෙන ගියේය. ඒ මහණද එක් වටුවකු පිළිගත. ඉතිරිව තිබූ වටු කෑබැල්ල අනුභව කරණු කැමැතිව නොවිචාරා අනුභව කිරීම සුදුසු නොවන්නේයයි සිතා මහ තෙරුන් ළඟට ගෙණ ගොස් විචාළේය. මහ තෙරණුවෝ අතින් පාත්‍රය වසා ගත්හ. මහලු මහණ ළඟට ගෙණ ගියේ ඒ මහණ පිළිගත රජ නොසතුටුවූ සිත් ඇතිව දන් වළඳා අවසන්වූ තෙරුන් වහන්සේගේ පාත්‍රය ගෙන පසුපස්සේ යන්නේ තෙරණු-වන්ට කියනුයේ වහන්ස! ගිහි ගෙට සිඟා එන භික්‍ෂූන් විසින් වත් දන්නාවූ මහණුන් කැන්දා ආයුත්තේයයි කීයේය. තෙරුන් වහන්සේ එකෙණෙහිම මහලු මහණ තෙම රජහු විසින් කැඳවූ මහණෙක් නොවේයයි දැනගත්හ. දෙවෙනි දවස් වඩනා සේක් තමන් වහන්සේට උපස්ථාන කරණ සාමණේරයන් වහන්සේ කැඳවා ගෙන වැඩිසේක. රජ එදවස් වටුවන් තුන්දෙනෙකු ලැබ කැඳ වළඳා අනන්තයෙහි තෙරුන් වහන්සේට එළවීය. තෙරණුවෝ එක් වටුවකු පිළිගත්හ. සාමණේරයන් වහන්සේ ළඟට ගෙන ගියේය. උන්වහන්සේ වටුවකු නොපිළිගෙන ඇඟිල්ල සොලවා වටුවා මැදින් බිඳුවා භාගයක් පිළිගත්සේක. නැවත රජු තෙරුන් වහන්සේ ළඟට ගෙන ගියේය. තෙරුන් වහන්සේ නොපිළිගත් සේක. සාමණේරයන් වහන්සේ ළඟට ගෙන ගියේය. උන් වහන්සේත් නොපිළිගත් සේක. රජ වටුවකු හා භාගයක් ලැබ වත් දන්නා මහණුන් නිසා මෙපමණක් ලදිමියි සතුටුව අනුභව කෙළේය. එකෙණෙහි පූවා වැගිරෙන කාණ සුව විය. රජතෙම මුව සෝදා සාමණේරයන් වහන්සේ වෙතට අවුත් වහන්ස! නුඹ වහන්සේට මම ප්‍රසන්න වීමි. නුඹ වහන්සේ ඇතුළුවූ අට දෙනෙකුන් වහන්සේට නිති බත් දෙමියි කීහ. ඒ සාමණේරයන් වහන්සේ මහරජ ඒ නිති බත් අට මාගේ උපාධ්‍යායයන් වහන්සේට

දෙමියි කීසේක. ඒ යහපත නුඹ වහන්සේට නැවත තිති බත් අටක් දෙමියි කීය. සාමණේරයන් වහන්සේ ඒ බත් අට ආචාර්‍ය්‍ය-යන් වහන්සේට දෙමියි කීසේක. රජ නැවතත් බත් අටක් දෙමියි කීය. එය සඞ්ඝයා වහන්සේට දෙමියි කීසේක. නැවතත් බත් අටක් දෙමියි කීය. ඒ ඉවසූ සේක.

මෙයින් පෙර රජවරු පවා ආජීව පාරිශුද්ධිය කෙතරම් ගරු කොට සලකා තිබෙත්ද යනු සිතා ගත හැක.

මිථ්‍යා ජීවිකාවෙන් වෙන්වීම ආජීව පාරිසුද්ධිය අපෙක්‍ෂා කරණ සියලු දෙනාගේම යුතුකමකි. බුද්ධාදී උතුමන් විසින් පසස්නා ලද ගුණයකි. එබැවින් ආජීව පාරිශුද්ධි ශීලයට විපත්ති කාරණවූ කාය වාග් දුශ්චරිතයන් දුරුකරමින් පිරිසිදු ජීවිතයක් ගතකොට ඒ හේතුවෙන් ලොවී ලොවුතුරු සැප ලබන්ට උත්සාහ-වත් විය යුතුයි.

ය

**නමො විජ්ජාචරණ සම්පන්නස්ස.**

**මොරමුල්ලේ සිරි සුධර්මාරාමාධිපති**
**මොරටුවේ සිරි සාසනවංස මහා ස්ථවිර පාදයන් වහන්සේ**
විසින් පවත්වන ලද

## ධර්මදේශනාව.

වර්ෂ 1951 ජනවාරි 9.

# සම්මා වායාමො.

**තත්ථ කතමො සම්මා වායාමො? ඉධ භික්ඛු සම්මා වායාමං භාවෙති විවෙක නිස්සිතං විරාග නිස්සිතං නිරොධ නිස්සිතං වොස්සග්ග පරිණාමිං අයං වුච්චති සම්මා වායාමො.**

**සිනතිමෙනි,**

සත්තිස් බෝධි පාක්ෂික ධර්ම සමුදාය ලක්දිව උසස් උගත් ධර්ම කථිකයන් වහන්සේලා ලවා දේශනා කරවා එම දේශනයන් පොත්කර විසුරුවා හැරීමට තරයේ අධිෂ්ඨාන කරගත් **"සිරි අරියවංස ගුණානුස්මරණ මහා සභාව"** ආරම්භ වර්ෂ පහක් ඇතුළත තම අදහස් මුදුන් පමුණුවා ගැනීම වටිනා ආගමික සේවයක් ඉටු කිරීමෙහිලා පැසසිය යුත්තකි. ආරම්භය මහත්සේ පටන්ගෙණ ඒවතම හෝ මසකින් හෝ වසකින් ඇදහැලෙන්ට නොදී සිතා ගත් අදහස සම්පූර්ණ වනතුරුම ක්‍රියාකාරී වන සභා ලක්දිව ඇත්තම් ඉතාමත් ටිකකි. ඒ හොඳ අදහසින් පටන් ගන්නා සභා කොටසට මෙම සභාවද ඇතුළත්ව එම ගෞරවයට පාත්‍රවීම පැසසිය යුත්තකි. අධ්‍යය සම්පූර්ණ වනතෙක් පටන්ගත් උත්සාහය අතනොහැරීම පෞරුෂත්වයේ නියම ලක්ෂණය බැව් මෙහිදී සිහිකරමු.

මීළඟට මේ බණ ඇසීමට ලොල්ව සිටින පුණ්‍යකාමී පිරිස වඩා උනන්දු වන අයුරු යමක් කීමට අදහස් කරමු. බොහොමත්ම ඕනෑකමින් බණ ඇසීමට බලාපොරොත්තුව සිටිතත් නොසරු නොහික්මුණු හැඩදැඩි සිත යහපතට එල්ලකර තබාගැනීම අසීරුම කරුණකි. ගත එකතැන් කරගෙණ සිටිතත් සිත ක්ෂණය කුදු එකතැන් කිරීම අපහසු වැඩකි. මන්ද ඇස් කන් නාසාදී කපොළු

සය සාරා පැමිණ නීතර මාන බලන්නේ බඩසයින් පීඩිතයෙක් ලෙසටයි. බඩසයින් පීඩිතයා ආහාර තෘප්තියෙන් ඊට ගිජුව හැකිතරම් පහත් නින්දිත ක්‍රියාවක් නමුදු කර දහසක් අපහස වචන නමුදු අසා සාගින්න නිවාගැණීමටම උත්සාහ කරත් එලෙසම සිතද රූපාදී අරමුණු නොලැබීමේ පිපාසයෙන් එක තැනක නොසිට ඒ මේ අත දුවමින් දහසක් කරදර ලක්ෂයක් නින්දා විඳද එම සා පිපාස දුරලා ගැණීමටම දඟලත්. අපූරුව නම් කුමක්ද? සාගිණි ඇති තැනැත්තා බඩපුරා කාබී අවසන්වූවාම සුඛිත වෙත්, මුදිත වෙත්. අරමුණු අහර බලාපොරොත්තු සිතට නම් එසේ ඇතිවීමක් නම් නොවීමයි. එනිසාම සිත තීකරු කර ගත නොහැකියි. එනමුත් මේ පිරිස නුවනැත්තෝ නම් ඒ හැඩ දූඩි සිතද තීකරු කරගත හැකියි. එසේ නුවනින් සිත සංසුංකර ගත්විට කාය වචනයද සංසුන්වේ. තිදොරම සංසුන් වූවෙකුට බණ ඇසීමද, සිත තබාගැණීමද පහසු වැඩකි. එසේ ඕනෑකමින් බණ අසන්නා පිළිපැදීමටද නොමැලි වෙත්. එහෙයින් සිත කාය වචනය හික්මවා ගෙණ බණ අසා දරා පිළිපැද සසර දුක් ගෙවා නිවන් සිරි සාධාගත යුතුයි.

බණ අසනු රිසි සැදැහැතියෙනි! මෙතැන් සිට අපට නියමවී තිබෙන ආර්‍ය්‍ය මාර්ග අටෙන් හයවෙනි අඞ්ගය වන **සම්‍යග් ව්‍යායාමය** ගැණ කාලය ලැබෙනා ආකාර ඉතාම කෙටි විස්තරයක් දෙශනා කරමු. මේ සම්‍යග් ව්‍යායාමය බෝධි පාක්ෂික ධර්ම තිස් හතෙන් නවයකදීම ප්‍රකාශිතව තිබේ. ඒ නව ස්ථානය නම් සම්‍යග් ප්‍රධන් වීර්‍ය්‍ය සතරෙහිද, විරිසිඩි පාදයෙහිද, විරියින්ද්‍රියයෙහිද, විරිය බල-යෙහිද, විරිය සම්බොධ්‍යඞ්ගයෙහිද, සම්මා වායාමයෙහිද යනුවෙනි.

හේ එසේ නමුදු විස්තර හෙයින් නා නා ප්‍රකාරව ප්‍රකාශිත බැවින් කිවයුතු ඇසිය යුතු උගෙන ගතයුතු දේ බොහෝයි. මෙම සම්‍යග් ව්‍යායාමය නව ස්ථානයකම විද්‍යමාන වන්නේ ව්‍යායාමයෙන් තොර කිසිද යමක් සිදුකළ නොහැකි බැවිනි. එසේම සම්‍යග් ව්‍යායාමය නොමැත්තා හට තම දිවි පෙවෙත පවා ධාර්මිකව පාලනය කරගත නොහැකි බව රහසක් නොවේ.

සම්‍යග් ව්‍යායාම් සතරකි.

1. **නූපන් පවිටු අකුශල ධර්ම සිතට වැද්ද නොගැන්මට ව්‍යායාම් කිරීම.**
2. **උපන් පවිටු අකුශල ධර්ම සිතෙන් අස්කර ගැණීමට ව්‍යායාම් කිරීම.**

**3. නූපන් කුසල ධර්ම උපදවා ගැණීමට කැමැත්ත හා ව්‍යායාම කිරීම.**

**4. උපන් කුසල ධර්ම නොම විසුරුවා බොහෝ කර ගැණීමට ව්‍යායාම කිරීම.**

අට වාරයක්ම මේ පොත් පෙළේ මේ ව්‍යායාම් සතර පිළිබඳව කුසල් සිත් අකුසල් සිත් හා චෛතසිකයන් විස්තාරව ලියවී තිබෙන බැවින් අපි සම්‍යග් ව්‍යායාම් කතිපයක් මෙහිදී ප්‍රකාශ කරමු. ලොභාදී අකුසල ධර්මයන්ට යටපත්වී කුසීතව නිසරු සසර ගැණ නොසිතා ප්‍රමාදව සිටින මිථ්‍යා අදහස්වලින් පිරුණු සිත පිසදමා නැගී සිටි වීර්‍යයෙන් සීලාදී ගුණ සපුරා ඉන්ද්‍රියන් දමනය කර අධොභාග ධර්ම වඳකරමින් ප්‍රථමාදී ධ්‍යාන වඩා නිරොධය අවබොධ වනතුරු ව්‍යායාම් කිරීම සම්‍යග් ව්‍යායාමයයි. මෙකියන සම්‍යග් ව්‍යායාමයෙන් තොරව සසර දුක් ගෙවා සථිර සැපයක් ලැබීමට සිතත් නම් අහසේ රූප ඇඳ පෙන්වීමටද බැරිකමක් නැත. දුක් පීඩා විඳීමට සහජයෙන්ම අසතුටු අපි කළ යුත්තේ සම්‍යග් ව්‍යායාමය මයි. **මිච්ඡා වායාමො අධම්මො, සම්මා වායාමො ධම්මො, යෙච මිච්ඡා වායාම පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති අයං අනත්ථො, සම්මා වායාම පච්චයා ච අනෙකෙ කුසලා ධම්මා භාවනා පාරි පූරිං ගච්ඡන්ති අයං අත්ථො,** දිනක් බුදුපියාණෝ සිවු පිරිසට කථාකොට පින්වතුනි, තුඹලා අනර්ථය කුමක්ද කියා තේරුම් ගත යුතුයි. ධර්මය කුමක්ද කියා දැනගත යුතුයි. අනර්ථය කුමක්ද සොයා දැනගත යුතුයි. අර්ථය කුමක්ද සොයා දැනගත යුතුයි. ප්‍රකාශකොට උන්වහන්සේම පිළිතුරු සපයන්නේ මෙසේ වදාරයි. මිථ්‍යා ව්‍යායාමය (සතුන් මැරීම් ආදී වැරදි උත්සාහයන්) අධර්මයකි. (අපාය භය එලවන්නකි) සම්‍යග් ව්‍යායාමය ධර්මයකි. (අපායෙන් ගොඩ ගන්නකි) මන්ද? මිථ්‍යා ව්‍යායාම් නිසා පාපයෙන් පිරුණු නින්දනීය අකුසල ධර්ම හටගණිත්. මෙසේවීම අනර්ථයකි. අවැඩකි. සම්‍යග් ව්‍යායාම නිසා නොයෙකුත් කුසල් දහම් වැඩෙත්. එම කුසල් දහම් නැවත නැවත භාවනා වශයෙන් වැඩීමෙන් පිරී ඉතිරී යෙත්. මෙසේවීම අර්ථයකි, වැඩකි, යහපතකි, සැපතකි. මෙසේ අධර්ම ධර්ම හා අනර්ථ, අර්ථ දූ අධර්මයෙන් වෙන්ව ධර්මයෙහි හැසිර අනර්ථයෙන් දුරුව අර්ථය සිඬකරගත යුතුයි.

මේ ප්‍රධන්වීර්‍ය සතර නැතිනම් සම්‍යග්ව්‍යායාමය වැඩෙන්නේ කෙබන්දෙකුටද, කෙබඳු ගුණ දහම් පුරන්නෙකුටද? **ආරද්ධ විරියස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුශලා ධම්මා උප්පජ්ජන්ති**

**උප්පන්නාච අකුසලා ධම්මා පරිහායන්ති** පටන් ගන්නා ලද විය්‍යීය ඇති පින්වතාට නූපන් කුසල් දහම් වැඩෙත්. උපන් අකුසල් දහම් පිරිහෙත්. වැනසෙත්.

මහිච්ඡ පුද්ගලයාහට (තණ්හාව මහත්සේ ඇත්තාට) නූපන් අකුසල් උපදිත්. උපන් කුසල් පිරිහෙත්.

අල්පෙච්ඡ පුද්ගලයාට (ආසාව අඩු අයට) නූපන් කුසල් උපදිත්. උපන් අකුසල් වැනසියෙත්.

අසන්තුට්ඨයාට (ලැබුන හැටියට සතුටු නොවන්නාට) නූපන් අකුසල් උපදිත්. උපන් කුසල් පිරිහෙත්.

සන්තුට්ඨයාට (ලද දේසින් තුටුවන්නාට) නූපන් කුසල් උපදිත්. උපන් අකුසල් වැනසෙත්.

නුනුවනයාට (මෝඩයාට) නූපන් අකුසල් උපදිත්. උපන් කුසල් පිරිහෙත්.

නුවනැත්තාට (ඥාණවන්තයාට) නූපන් කුසල් උපදිත්. උපන් අකුසල් පිරිහෙත්.

පාප මිත්‍රයන් ඇසුරු කරන්නාට නූපන් අකුසල් උපදිත්. උපන් කුසල් වැනසෙත්.

කල්‍යාණ මිත්‍රයන් සේවනයකරන්නාට නූපන් කුසල් උපදිත්. උපන් අකුසල් වැනසෙත්.

මේ ආදී ක්‍රමයෙන් මිත්‍යා අදහස් ඇත්තාට අකුසල් වැඩෙන බවත් කුසල් මැඩෙන බවත් සම්‍යග් ව්‍යායාම් ඇත්තා හට අකුසල් මැඩෙන බවත් කුසල් වැඩෙන බවත් සලකා මිත්‍යා ක්‍රියා මිත්‍යා වචන මිත්‍යා සිත් මිත්‍යා මිතුරන් ඇසුර මිත්‍යා දෘෂ්ටි ගැන්ම දුරලා යහපත් ක්‍රියා වචන සිත් මිතුරන් දෘෂ්ටි ඇසුරු කර ආය්‍යී මාර්ගයෙහි ගමන්කොට නිවන් සැප සාධාගැණීමට මේ පින්වතුන් උත්සාහවත් විය යුතුයි.

සම්‍යග් ව්‍යායාමය වඩාගැණීමට මූලික බාධාකර ධර්මය මිත්‍යා දෘෂ්ටියයි. මිත්‍යා දෘෂ්ටිකයා හට සම්‍යග් ව්‍යායාමය නොවැඩෙත්. හේ මෙසේ දෙශනාවෙහි පෙනේ.

**නාහං භික්ඛවෙ අඤ්ඤං එක ධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නාවා අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නාවා අකු-**

**සලා ධම්මා භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති-පෙ-යථයිදං භික්ඛවෙ මිච්ඡා දිට්ඨි** මෙහි අදහස, දිනක් බුදුරජානෝ භික්ෂූන්ට අමතා මහනෙනි, මගේ බුදු ඇසට බුඩඥණයට පෙනෙන වැරදි අතර ඉතාම ලොකු බරපතල වරද නම් මිථ්‍යා දෘෂ්ටියයි. මොන මොන වැරදි නිසා මිථ්‍යා දෘෂ්ටිය ;එපමණ ලොකු සාපරාධ වරදක්ද? මිථ්‍යා දෘෂ්ටිකයා හට නූපන් අකුසල් සියල්ලම වැඩෙයි. උපන් අකුසල් සියල්ල බෝවෙයි. නූපන් කුසල් නූපදිත්. උපන් කුසල් වැනසෙත්. මෙසේ අකුසල් වැඩී කුසලින් පිරිහී ගිය සත්වයා හට කුමක්වේද?

**කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති** කාය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ හෙයින් අපාය නම්වූ දුක්වූ ගති ඇති බැවින් දුගීති නම්වූ නිතරම දුක් පතිත වන වැඟිරෙන හෙයින් විනිපාත නම්වූ නරකායෙහි උපදිත්.

**මිච්ඡා දිට්ඨිකස්ස භික්ඛවෙ පුරිස පුග්ගලස්ස යඤ්චෙව කාය කම්මං යථා දිට්ඨි සමත්තං සමාදින්නං යඤ්චෙව වචීකම්මං** -පෙ- **යඤ්චෙව මනොකම්මං යථා දිට්ඨි සමත්තං සමාදින්නං** -පෙ- මහනෙනි, මිථ්‍යා දෘෂ්ටිකයා විසින් යම් බඳු කායින් කරණ කර්මයක් වේද එම කර්මය තමන් ගත් දෘෂ්ටිය අනුව කරයි, පුරයි, පුරුදු කරයි. යම් වචනයෙන් අඟවන කර්මයක් වේද ඒ සියල්ල තමන් ගත් මිථ්‍යා දෘෂ්ටි ජාලයටම පැටලී කියයි. යම්සේ සිතින් සිතන කර්මයක් වේද ඒ සියල්ලද තමන් ගත් මිථ්‍යා මොහ පටලයටම යටවී සිතයි. මෙනෙහි කරයි. මෙකියන කාය, වාග්, මනඃ. කර්ම අනුව යම් පැතීමක් වේද යම් ප්‍රණිධියක් වේද (පිහිටුවීමක්) යම් සංසකරණයක් වේද (එක් රොක් කිරීමක්) ඒ සියලුම කීම්, කිරීම්, සිතීම්.

**අනිට්ඨාය, අකන්තාය, අමනාපාය, අහිතාය, දුක්ඛාය, සංවත්තන්ති** අනිෂ්ට විපාක පිණිසද, මන නොවඩන විපාක පිණිසද, අසතුට ගෙණදෙන විපාක පිණිසද, අහිත කරවන විපාක පිණිසද දුක් උපදවන විපාක පිණිසද පවතිත්. ඊට හේතුව කුමක්ද? දෘෂ්ටිය මිථ්‍යා (වැරදී) අදහස්වලින් පිරී තිබෙන බැවිනි.

ඊට උපමා මෙසේ සලකා ගන්න. යමෙක් කොසඹ ඇටයක් හෝ තිත්ත වැටකොළු ඇටයක් හෝ තිත්ත ලබු ඇටයක් හෝ තෙත් සහිත බිමෙහි සිටවූවිට එම බීජය, පඨවි, ආපෝ ආදී ධාතු කොටස් ගෙණ වැඩෙත්ද නමුත් එම ධාතු කොටස්ම ගෙණ එම බිමෙහිම සැදෙන මිදි ඵලමෙන් රශවත් නොවී තිත්තම වෙත්.

කටුකම වෙත්. විරසම වෙත්. ඒ මන්ද? රෝපනය කළ බීජ වර්ගය තිත්ත කටුක බව නිසයි. එසේම තිත්ත ඇට වැනි මිථ්‍යා දෘෂ්ටිය සිත් නමැති නෙත් බිමෙහි කුසලාකුසල කර්ම නමැති පාථුවි රශාදිය රැගෙණ වැඩුනත් ඉන් වැඩෙන සියලු කායකර්ම, වාග්කර්ම, මනඃකර්ම අහිත පිණිස අවැඩ පිණිස දුක් පිණිසම පවතිත්.

එබැවින් සතරාකාර සම්‍යග් ව්‍යායාම වඩා සසර ජාත්‍යාදී ඝෝර දුක් වනසා ගැණීමට සතුටු සෑම පින්වතුන්ම පරම හලාහල විසක් බඳු මිථ්‍යා දෘෂ්ටිය දුරින් දුරලා ගතයුතුයි මෙම මිථ්‍යා දෘෂ්ටිකයා හට ලැබෙන කටුක විපාක සේම සම්‍යග් දෘෂ්ටිකයා හට නැතිනම් කය වචනය සිත යහපත් ක්‍රියාවලින් පිරුණ පිනැති-යනට සැප සම්පත් ඉෂ්ට ඵල විපාකද බොහෝයි. සුගති භවයන්හි උත්පත්තිය ලබාදී පමණ නොකළ හැකි නොගිණිය නොමිණිය හැකි සැප සාධාදෙත්.

මෙලෙසින් මිථ්‍යා දෘෂ්ටියෙහි හා සම්‍යග් දෘෂ්ටියෙහි විපාක ඵල දැන උගෙණ සම්‍යග් ව්‍යායාමයෙහි යෙදී දෘෂ්ටිය ඍජුකරගෙණ කෙලෙසුන් නවන නැගී සිටි වීර්‍යයෙන් සසර දුක් කෙළවර කර ගැණීමට උත්සාහවත් විය යුතුයි සතරාකාර වීර්‍යයන් සතරු-කාරයකින්ම උත්සාහවත්වී සකස්කර ගත යුතු බැව් දෙශනාවේ නියමව තිබේ. හේ මෙසේයි.

**චත්තාරි මානි භික්ඛවෙ පධානානි කතමානි චත්තාරි? සංවරප්පධානං, පහානප්පධානං, භාවනප්පධානං, අනුරක්ඛ-නප්පධානං** මහනෙනි, ප්‍රධන් වීර්‍ය සතරකි. (යහපත් ව්‍යායාම) හේ කවර සතරක්ද යත්? සංවර ප්‍රධන් වීර්‍යය, පහාන ප්‍රධන් වීර්‍යය, භාවනා ප්‍රධන් වීර්‍යය, අනුරක්ඛණා ප්‍රධන් වීර්‍යය යන සතරයි.

1. **සංවර ප්‍රධන් වීර්‍යය, කතමඤ්ච භික්ඛවෙ සංවරප්පධානං? ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති ඉදං වුච්චති භික්ඛවෙ සංවරප්පධානං** මහනෙනි. සංවර ප්‍රධන් වීර්‍යය කවරේද? මේ සස්නෙහි මහන තෙම නූපන් ලාමක අකුසල් දහම් නූපදීමට ඡන්දය උපද-වත්ද (කැමැත්තෙන් උත්සාහ කරත්ද) වෑයාම් කරත්ද වීර්‍ය වඩත්ද සිත දැඩිකොට ගණිත්ද සිත පිහිටුවා ගණිත්ද මහනෙනි, සංවර ප්‍රධන් වීර්‍යය නම් මෙයයි. නූපන් අකුසල්වලින් වෙන්වී සිතට වැද්ද නොදීමට චිත්ත ද්වාරය ආවරණය කර ගැණීමයි. වසා ගැණීමයි.

**2. පහාන ප්‍රධන් වීර්‍යය, කතමඤ්ච භික්ඛවෙ පහානප්පධානං? ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති-පෙ- ඉදං වුච්චති භික්ඛවෙ පහානප්පධානං** මහණෙනි, ප්‍රහාන ප්‍රධන් වීර්‍ය නම් කවරේද? මහණෙනි, මේ සස්නෙහි මහණ තෙම උපන් අකුසල් ධර්‍ම ප්‍රහාණය කරලීම පිණිස ඡන්දය උපදවාද ව්‍යායාම් කෙරේද වීර්‍ය්‍යාරම්භ කරයිද සිත දැඩිව ගණීද සිත පිහිටුවා ගණීද මහණෙනි, ප්‍රහාන ප්‍රධන් වීර්‍යය නම් මෙයයි. උපන් අකුසල් සියල්ල නැතිකර ලීමට සිත් දෙර හැර පලවා හැරීම ප්‍රහාන ප්‍රධන් වීර්‍යයයි.

**3. භාවනා ප්‍රධන් වීර්‍යය, කතමංච භික්ඛවෙ භාවනප්පධානං? ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදාය ඡන්දං -පෙ- ඉදං වුච්චති භික්ඛවෙ භාවනප්පධානං** මහණෙනි, භාවනප්පධාන වීර්‍යය කුමක්ද? මෙහි මහණ තෙම (මාගේ සාසනයෙහි පැවිදිවූ තැනැත්තා) නූපන් කුසල් දහම් උපදවාගැනීම සඳහා ඡන්දය උපදවාද, ව්‍යායාම් කරත්ද, වීර්‍ය්‍යාරම්භ කරත්ද, සිත දැඩිව ගනිත්ද, සිත වීර්‍යයෙහි පිහිටුවත්ද, මෙලෙසින් සිත සකස්කර බැවීම නැතිනම් උත්සාහය වඩ වඩා සිහියෙන් නගාසිටුවීම භාවනප්පධානයයි. මා තුල නූපන් කුසල් මොනවාදැයි සිතා එය වඩා ගැණීමට මහත්සේ උත්සාහය දරත් නම් එය භාවනප්පධානය යනුයි.

**4. අනුරක්ඛන ප්‍රධන් වීර්‍යය, කතමඤ්ච භික්ඛවෙ අනුරක්ඛණප්පධානං? ඉධ භික්ඛවෙ භික්ඛු උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යොභාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං -පෙ- ඉදං වුච්චති අනුරක්ඛණප්පධානං** මහණෙනි, අනුරක්ඛනප්පධානය කවරේද? යම් ශ්‍රමණයෙක් තමන් තුල උපන් කුසල් දහම් ස්ථිරකර ගැණීම පිණිස මෝඩ කමින් එම කුසල් වැනසෙන්ට නොදී නොමුලාව රැකගැණීම පිණිස බොහෝ කරගැණීම පිණිස විපුල භාවයට පමුණුවා ගැණීම පිණිස නැවත නැවත බැවීමෙන් සිහිකිරීමෙන් පරිපූරණය කර ගැණීම පිණිස ඡන්දය උපදවාද වීර්‍ය්‍යාරම්භ කරත්ද සිත දැඩිකර ගණීත්ද ප්‍රධන් වීර්‍ය කරත්ද ඒ කුසල් අනුව ආරක්‍ෂා ගොපනය කරන්නක් බැවින් අනුරක්ඛනප්පධානයයි. උපන් කුසල් ඒ අනුව තව තවත් වඩා ගැන්මයි.

මේ සතරාකාර වීර්‍යයෙන් අකුසල් වැනසීමත් කුසල් වඩා ගැණීමත් උගන්වයි. වැඩිදුරටත් මෙසේද පැවසේ.

සංවරොච පහානංච භාවනා අනුරක්ඛණා
එතෙපධානා චත්තාරො දෙසිතාදිච්ච බන්ධුනා
යෙහි භික්ඛු ඉධාතාපී ඛයං දුක්ඛස්ස පාපුණේ'ති

මෙහි තේරුම,

නූපන් අකුසල් වැද්ද නොදීමට සදොර (ඇස්, කන්, නාසා, දිව, සරීරය, සිත යන දොරටු සය) වසා හික්මවා ගෙණ වැද්ද ගත් අකුසල් වැනසීමට උත්සාහ වඩා එම අකුසල් විනාසකොට නූපන් කුසල් ලබාගැණීමට භාවනාවෙහි යෙදී උපන් කුසල් දියුණු කර ගැණීමට ඒ අනුව ආරක්ෂා සංවිධානය කරමින් මේ ප්‍රධන් වීර්ය සතර යහපත් ව්‍යායාම් සතර ආදිච්චබන්ධුවූ තථාගතයන් වහන්සේ ශ්‍රී මුඛයෙන් දෙශනා කළ සේක්යයි සිතා යම් භික්ෂුවක් කෙලෙසුන් මඩින සම්‍යග් ව්‍යායාමයෙන් යුක්තවේද එම පින්වත් තැනැත්තා සියලු දුක් ක්ෂයකොට විනාසකොට නිර්වාණ පුරයට පැමිණෙන සේක. මේ සම්‍යග් ව්‍යායාමයෙන් නිවන් සිරි අත්කර ගැන්මට හැකි එක් ක්‍රමයක් බැව් සැලකිය යුතුයි.

මෙම ධර්ම කොට්ඨාසයෙහිදී සම්‍යග් ව්‍යායාමය උපදවා ගැන්ම කුසල් වඩාගන්ටත් අකුසල් වනසා ගන්ටත් ඕනෑ බව හොඳට අවබෝධවේ. එසේ සිදුකර ගැන්මට ඡන්දය ඇතිකර ගන්නය, ව්‍යායාම් කරන්නය, වීර්ය කරන්නය, ධෛර්ය වඩන්නය කියා කීපවිටක් කීප ක්‍රමයකින් හඳුන්වා කියත්. මෙලෙස එකම කාරණය කීපවිට කීමෙහිදී නුවණැත්තන් විසින් සැලකිය යුත්තේ නම් හැකි පමණ එහි යෙදී බැදී උත්සාහයෙන් ක්‍රියා කිරීමයි. ලොකයෙහි හැටිනම් අනර්ථයක් අවැඩක් පාපයක් කිරීමට නම් මෙපමණ වාර ගණනක් නොව එක වරක්ම කීමෙන් සම්පූර්ණ කර ගැණීමට ප්‍රොත්සාහීවීමයි. එනිසාම '**අක්ඛාතො අහං ලොකො**' යනු දෙසූසේක.

මෙම කුසල් අකුසල් දෙක ඒ කී භූත ධර්මයන් නොවේ. යුග ලක්ෂණ ධර්මය කුදු නොවේ. ඔවුනොවුන්ට ප්‍රතිවිරුද්ධ ධර්ම වෙත්. රසට තිත්තසේද, එගොඩ මෙගොඩසේද, ගුණ අගුණසේද, සතුරු මිතුරුසේද, ඔවුනොවුන්ට විරුද්ධ ධර්ම වෙත්. එනමුදු මේ යහපත අයහපත දෙකම උපදින්නේ එකම සිතෙහිය. එනිසා උපන් සත්වයන් විසින් දුර්ගතිවලින් මිදීමට නිතර සිත රැකගත යුතුයි. නිතර සිත රැකගැන්මට අපහසු කරුණු බොහෝයි. මන්ද පුහුදුන් සතා තමන් තුල කුණු කසලගොඩ ගැසී තිබෙද්දී උත්සාහවත් වන්නේ අනුන්ගේ ඇද කුද සොයමින් හුරු බුහුටි කථාවෙන් කල් යවන්ටයි. මේ බව බුදු ඇසින් දුටු තථාගතයන් වහන්සේ භික්ෂූන් අමතා මෙසේ දේශනාකොට තිබේ.

දිනක් සතර පිරිස මැදට වැඩි බුදුපියාණෝ පිරිසට කථාකොට මෙසේ දෙශනා කරයි. මේ ලොව වසන බොහෝදෙනා විවේක වේලාවලදී කථා කරන්නේ අනුන්ගේ හැටි සවභාවයන්ය. අනුන්ගේ ශරීරයේ ඇද හැඩනුරුකම් වචනයේ ඇද දෙඩමළුකම් හිතේ ඇද සිහිසන් නැතිකම් ආදියය. නමුත් එම ඇද බොහෝ-මයක්ම තිබෙන්නේ තමන් තුල බව නම් නොපෙනේ. යම් පින්වතෙක් පින්වතියක් තමන් තුල ඇති ඇද කුද සාධා ගැණීමට සුපුරුදු වෙනවා නම් තමන්ගේ සිත, කය, වචනය මොන මොන ක්‍රමයට ක්‍රියාකාරී වෙනවාද මොන මොන යහපතින් වෙන්ව ක්‍රියාකරණවාද යනු සෙවීමෙන් යුක්තවෙනවා නම් තමාගේ නිදොර සම්‍යග් ව්‍යායාමයෙහි යෙදවීමට කරණ එම යහපත් අදහසම යොග්‍ය බැව් මෙසේ දෙසූසේක.

**නොචෙ භික්ඛවෙ භික්ඛු පරචිත්තපරියාය කුසලොහොති අථ සචිත්තපරියාය කුසලො භවිස්සාමීති එවංහි වො භික්ඛවෙ සික්ඛිතබ්බං** (භික්‍ෂු භික්‍ෂුණී උපාසක උපාසිකා යන පිරිස් සතරටම බණ දෙසන බුදුපියාණෝ නිතර අමතන්නේ භික්‍ෂූන්ටමයි. මන්ද ඉඳිරියෙහිම සිටින නිසත් ගුණයෙන් හා නුවණින් වැඩි නිසත්ය. එසේ ආමන්ත්‍රනය වූවද තම තමන්ටම දෙසූ ධර්මයක්සේ සිව් පිරිසම සලකා ගත යුතුයි.) එම පාළි පාඨයෙහි අදහස මහනෙනි, නුඹලා අනුන්ගේ සිත්වල පිළිවෙල සොයා බලමින් කථා කිරීමට දක්‍ෂයෝ වන්ට එපා. එසේ නොවෙයි, තමන්ගේ සිත්වල උපදින කුසල් අකුසල් ආදියෙහි ඇද සාධා ගැණීමට පුරුදු විය යුතුයි. එසේම හික්මිය යුතුයි.

ඊට උපමා මෙසේ සිතියට ගන්න යම් ස්ත්‍රියක් හෝ පුරුෂ-යෙක් හෝ ලමයෙක් හෝ තරුණයෙක් හෝ තරුණියක් හෝ තමන්ගේ මූහුන ලක්‍ෂණට ඔප දමාගන්ට කන්නාඩියක් ලඟට හෝ පිරිසිදු දිය බඳුනක් ලඟට හෝ පැමිණ මුහුණ බලයි. එවිට ඒ තැනැත්තාට මුහුණේ ඇති කුණු කැලල් කබ සොටු ආදිය පෙනේ. ඒ දුටු වහාම ඔහු ජලය ගෙණ සුවඳ සුනු හා සෝද හැර නැවත කැඩපතින් හෝ දිය බඳුනෙන් හෝ බලයි. ඒවර කුණු කැලැල් ආදිය නැති බැව් දැන මූහුනේ ඔප මට්ටම හා පිරිසිදු භාවය දැක ඉතා රුවයයි ප්‍රීතිවෙයි නැවත නැවත දකිමින් මාගේ මූහුන දැන් දුටුවන් ප්‍රියකරණ සුලුය. මට වූයේ ලාභයක මෙබඳු මූහුනක් ලැබීම මගේ පුණ්‍ය බලයක්ය යනාදිය සිතා සතුටු වෙත්ද **එව මෙව ඛො භික්ඛු පච්ච වෙක්ඛණා බහුකාරා හොති කුසලෙසු ධම්මෙසු** එසේම මහනෙනි, යමෙක් කුසල් දහම් කෙරෙහි සිහි

කිරීම් බහුලව නුවනින් යෙදී මුහුනේ කැලැල් දුරලා ගන්නාසේ තම සිත් තුල හටගත් කැලැල් වැනි අකුසලයන් දුරලා ගැණීමට සුහුසුළුවෙමින් කුසල් සම්පූර්ණ කරගෙණ දීප්තිමත් මුහුන දැක තුටුවන්නාසේ වැඩුනු කුසල් දැක මෙලොවද ප්‍රීතිවෙමින් මට වූයේ මහත් ලාභයක මම මෙලොවදීත් ජය ගත් සේක. පරලොව යනවිටද මාර්ගෝපකරණ සාධා ගත් සේක. මට සුගතිය නියමය පරලොවදී අනල්ප සැප සම්පත් මට විඳිත හැක කියා ප්‍රීතිවේත් තම් අනුන්ගේ සිත් සොයා දිවැස් බලමින් සිටීමට වඩා අතිශයින් යෝග්‍ය බැව් සලකා තම සිත සාධාගැණීමේ සම්‍යග් ව්‍යායාමයෙහි යෙදිය යුතුයි.

සිත තුල හැදෙන කුණු කැලැල් මොනවාද?

1. අභිජ්ඣාලූනුඛො බහුලං විහරාමි, අනභිජ්ඣාලූනුඛො බහුලං විහරාමි
2. ව්‍යාපන්න චිත්තොනුඛො බහුලං විහරාමි, අව්‍යාපන්න චිත්තොනුඛො බහුලං විහරාමි
3. ථීනමිද්ධ පරියුට්ඨිතොනුඛො බහුලං විහරාමි, විගත ථීනමිද්ධොනුඛො බහුලං විහරාමි
4. උද්ධතොනුඛො බහුලං විහරාමි, අනුද්ධතොනුඛො බහුලං විහරාමි
5. විචිකිච්ඡොනුඛො බහුලං විහරාමි, තිණ්ණවිචිකිච්ඡොනුඛො බහුලං විහරාමි
6. කොධනොනුඛො බහුලං විහරාමි, අක්කොධනොනුඛො බහුලං විහරාමි
7. සංකිලිට්ඨ චිත්තොනුඛො බහුලං විහරාමි, අසංකිලිට්ඨ චිත්තොනුඛො බහුලං විහරාමි
8. සාරද්ධකායොනුඛො බහුලං විහරාමි, අසාරද්ධකායොනුඛො බහුලං විහරාමි
9. කුසීතොනුඛො බහුලං විහරාමි, ආරද්ධ විරියොනුඛො බහුලං විහරාමි
10. අසමාහිතොනුඛො බහුලං විහරාමි, සමාහිතොනුඛො බහුලං විහරාමී ති.

මේ දසාකාර කැලැල් නිතර සිත තුල වැඩෙයි. ඒවා සෝදා හැරීමට සම්‍යග් ව්‍යායාමයෙන් යුක්ත විය යුතුයි.

**1. විසම ලොභය.** මෙම අනුන්ගේ සම්පත් දැක වැඩෙන විසම ලොභය සිතෙහි වඩමින් මා වාසය කළ යුතුද නැද්ද යනු සලකා එහි දොස් දැක මෙය සිතට (නැතිනම් මට) වරදක්ය. මින් සිදුවන්නේ විපතක්මය. ලොභොබියෙක් කොතෙක් වස්තු සැපයුවත් ඉන් බිඳ කුදු රැගෙණ යැමක් නම් කොයින්ද මෙය වහ වහා සිතින් දුරලා විසම ලෝභයෙන් දුරුව වාශය කළ යුතුයයිද ඊට හොඳ සිහිය යොදා ව්‍යායාම් කළ යුතුයයිද සැළකිය යුතුයි. පරහට තමන් ලත් දෙයින් බිඳ කුදු නොදී අනුන්ගේ සම්පත් මටම වේවායි පතමින් විසම ලොභයෙන් නැවෙන්නා බඩපුරා නොකා ඉනපුරා නොහැඳ අතපුරා නොදී මනුෂ්‍ය ප්‍රේතයෙක් මෙන් වැස මිය ගොස්ද ප්‍රේතව ඉපිද දුක් විඳිත්. මේ අනර්ථයෙන් මිදීමට නම් කළ යුත්තේ විසම ලොභයෙහි දොස් මේ ආදී ක්‍රමයෙන් දැක සිහිකර යහපත් ව්‍යායාමයකින් කල් යැවීමයි.

**2. වෛර කිරීම.** සිත තුළ උපදින මෙම අකුසලයද විසම එකකි. අන්‍යයන්ගේ යස ඉසුරු රූප සම්පත් හා තමාම ඇතිකරගන්නා අසථාන ක්‍රෝධ (වැඩකට නැති වැරදි) ගැණ සිතා ඔවුන් නැසිය යුතුයි. ඔවුන්ට පහර දියයුතුයි. ඔවුන්ගෙන් පලිගත යුතුයි. යනාදී නොයෙකුත් අනුන්ට හිංසා පීඩා කිරීමේ වෛර අදහස්වලින් සිටිමුද නැතිනම් එබඳු අදහස් දුරලමුද යනු කල්පනාකොට එබඳු වෛර අදහස්වලින් සිත වහා මුදවා ගත යුතුයි. මෙම වෛරයද මිනිසෙකු තුළ හටගන්නා කටුක ගින්නකි. වෛර නැමැති ගිණි ඇවිලගත් කල මිනිසාගේ ලේ මස් නහර වියලී දුර්වර්ණවී ඇතුලත රුජා හටගෙණ කාශ ස්වාසාදී රෝගාබාධ සෑදී ක්ෂුපිපාසිකා ප්‍රේතයන්මෙන්වී විෂ සහිත අදහස්වලින් කල් යවා මැරුණොට පසු බළු හිවල් ආදී සතුන්වී දුක් විඳිත්. එබැවින් මෙම ව්‍යාපන්න චිත්තය දුරලා සම්‍යග් ව්‍යායාම- යෙන් යුක්තව මෛත්‍රී සහගත සිතින් කල්යැවිය යුතුයි.

**3. ථීන මිද්ධය.** මෙයද කය සිත නිතර මැලිකරවා යහපත වසා තබන පාප ධර්මයකි. සියලු ක්‍රියාවක දීම දිවස් කියමින් සෑම යහපතක්ම කල් දමමින් කය සිත හකුළුවා ගෙණ කල්යැවීම ථීනමිද්ධයයි. මිනිසෙක් මේ ස්වභාවය අත්හළ යුතුද නැද්ද යනු සිතන්ටම ඕනෑකරත්. මන්ද මේ අලස භාවය ඇති සත්වයාට යටත් පිරි සෙයින් ඉන බඩ රැකගැණීමවත් කළ නොහැකියි. රැකීරක්ෂාවෙහි යෙදීමේදී උදේ වැඩියයිද, දවල්වී- යයිද, වහීාවයයිද, තද පෑවීමයයිද, අද නපුරු දවසකැයිද, අද අරිෂට නැකැත් දිනකැයිද ආදී වශයෙන් සලකා කය සිත හකුළුවා

වසමින් සිටින තැනැත්තාහට සැපතක්නම් කොයින්ද මෙලෙසින් කය සිත ලෙඩ කරගත් රෝගියාට බඩපුරා කැදිත්තක්වත් කවරෙක්නම් දේද මෙලෙසින් පිනම්ඩය ගැණ නරුණු සලකා තම සිතින් ත්‍රිවර්ගී සම්පත් කාමැති රත්රුවන් සාර ගොඩලා ගැණීමේ ශක්තිය ඇති සම්‍යග් ව්‍යායාමය ආවරණය කරණ මෙම වරදින් මිදීමට උත්සාහ දැරිය යුතුයි.

4. **උඩච්චය.** මෙම පාප ධර්මයද මිනිසාගේ සියලුම භාග්‍යය වසාගෙණ සිටින දූෂි අසත් ගුණයකි. මෙබඳු උඩච්ච ගතියෙන් මම වෙන්වී සිටිමුද, ඒ හා යෙදී සිටිමුද යනු තමා සිතින්ම තීරණයට බැසගත යුත්තකි. සච්චක බකබ්‍රහ්ම රාහු අසුරිඳුමෙන් තමන් මතිහ්ට මිම්මක් නවත් ලොව නැතැයි මමම පණ්ඩිතය, මමම ශ්‍රෙෂ්ඨය, මමම තේජවන්තය, බලවන්තය ආදි වශයෙන් සිතුවාසේ ලොව බොහෝදෙන තම පමණ නොමදැන උඩගුව වසත් එබන්දන් ගැණ කථා කළ යුත්තේ මිනිස් වෙස් දැරූ තිරිසනුන්ය යන බසිති. අපේ හැඟීම පැත්තක තබා උඩච්ච මහනෙකුට බුදුන් වහන්සේ දුන් උපමාවක් අපි මෙහිදී සිහිකරමු.

**1. බහුම්පි චෙ සහිතං භාසමානො න තක්කරො හොති**
**නරොපමත්තො**
**ගොපොව ගාවො ගණයං පරෙසං න භාගවා**
**සාමඤ්ඤස්සහොති**

**2. අප්පම්පි චෙ සහිතං භාසමානො ධම්මස්සහොති අනුධම්මචාරී**
**රාගංච දොසංච පහාය මොහං සම්මප්පජානො**
**සුවිමුත්තචිත්තො**
**අනුපාදියානො ඉධවා හුරංවා සභාගවා සාමඤ්ඤස්සහොති**

මේ ගාථා ධර්මයන් පුදුමාකාර ලෙස උඩගුකම ගත් පණ්ඩිත-යෙකුට දෙශනා කරණ ලද්දකි එහි අර්ථ කීමට ප්‍රථම කථා ශරීරය කෙටියෙන් මෙසේ දතයුතුයි.

සැවැත්නුවර වැසි කුලපුත්‍ර දෙපලක් බුදු බණ අසා පස්කම් සුව හැර මහණවී නොනෙක් විදර්ශනා වඩන්ටත් නොනෙක් ග්‍රන්ථ හදාරන්ටත් සිතා බුදුරජුගෙන් කමටහන් කියවා ගත් විදර්ශනාවට තුටු සිල්වත් තෙරුන් වනයට වැද භාවනාකොට සිව්පිළිසිඹියාත් සමග රහත් ඵල ලත් සේක. අනික් භික්ෂුව බණ දහම් උගෙන විචිත්‍ර කථිකයෙක්ව ස්වල්ප කලකින්ම පන්සියයක් ගෝලයන් පිරිවරා ගත් සුප්‍රකට පැවිද්දෙක් විය. නමුත් ඔහුම කරණ රහත් බවෙන්නම් පහත් විය. දිනක් ධර්මකථිකයානෝ වඳින්ට ආ මිත්‍ර

රහතන් වහන්සේගේ ගෝලයෝ නුඹ වහන්සේට වදින්ට අපේ ගුරු හාමුදුරුවෝ අපට නියම කළායයි වදිමින්ම කිහ. පුදුමයකි. ගුරුවරයාට ගුරුවරයාය කී විගසම මේ පණ්ඩිත විචිත්‍ර තිපිටකයාට දොම්නස් විය. එහිදී උඩඟු බස් කියනුයේ තොපගේ මොන ගුරුවරයෙක්ද එහේ මහනවූද සිට පාංසුකූල සිවුරක් පොරවා කැලෑ වැදුනා. සතරපදයක ගාථාවක් නූගත් ඔහු තොපට කුමක් නම් ගුරුකමක් කළාද, සම්භවූදට ගුරුකම තේරුන් ගන්ට දෙක තුනක් මම අහන්නන්. මෙසේ උඩඟු බස් බිනූ චිත්‍ර තිපිටකයාට තම මිත්‍ර රහතුන්.වහන්සේ හමුව ප්‍රශ්න අසන්ට ලෑස්ති වෙද්දී සකල සත්ත්වයන් වෙත පතල කරුණාව ඇති අපේ බුදුපියා එවේලෙහි ඉදිරිපත්ව ඒ උගත් අහංකාර මෝඩ තෙරව නිරයට යානොදී බේරා ගන්නා ලදී. හේ කෙසේද මේ පණ්ඩිතයා අහංකාරකමින් රහතන් වහන්සේගෙන් ප්‍රශ්න අසන්ට ගොස් උන්වහන්සේට යම් අසතුටු බසක් කීවා නම් උරුම වන්නේ නරකයයි.

ඉන් මුදවා ඔහුගේ හැටි තේරුන් කරදුන් බුදුපියානෝ ඒ තෙරට විසඳ ගන්ට බැරි ප්‍රශ්න සතරක්ම රහතන් වහන්සේ ලවා තේරුන් කරවාදී තිබේ ඒ දුටු චිත්‍ර තිපිටකයාගේ ගෝලයෝ බුදුපියානන් වහන්සේට උරණවූ බැවින් ඒ උඩඟු ගුරුවරයාගේ හැටි උඩඟු ගෝලයන්ට කියාදීමට යටකී ගාථා දෙක දෙසූසේක. වැඩි විස්තර ධම්මපදට්ඨ කථාවෙන් බලා දතයුතුයි.

**ගාථාවන්ගේ අදහස්**– 1. තුන්පිටකයම උගෙණ අනුන්ට දෙශනා කළත් ශිෂ්‍යයන් හැදුවත් ලොව ප්‍රකට වූවත් තමා ගැණ නොසිතා කුකුලෙක් පියාපත් ගසන පමණ කුඩා වේලාවක් අනිත්‍ය දුඃඛ අනාත්ම යන ත්‍රිලකුණු නොසිතා ප්‍රමාදවන පුද්ගලයා ගෙරින් රකින එඬේරෙක් වගේය. ගවයන් රකින එඬේරා ගවයන් ගාලෙන් ගෙන තණ පැන් කවා පොවා නැවත ගාලට ඇතුල්කොට පඩිය ලබාගෙන යමක් කා ජීවත්වෙනවා මිස පස්ගෝරස නම් කවදාවත් ලැබේද ඒ වගේ දහම් දැන උගෙන දෙසිමෙන් හා උගැන්වීමෙන් ලබන ලාභ බුදිනවා මිස සදහම් සිහි නොකරන උඩඟු නැනැත්තාට පස්ගෝරස වැනි නිර්වාණ සැපය කෙසේ නම් ලැබේද, නොලැබේමය.

2. තෙවලා බණ ස්වල්පයක් දැන ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි හැසිරී රාග, ද්වේෂ, මෝහ දුරලා යහපත් නුවණින් අනිත්‍ය දුඃඛ අනාත්මාදිය සලකා රාගාදී කෙලෙසුන්ගෙන් සිත මුදවා ගත් නැනැත්තේ හෙවත් **තදඞ්ග–වික්ඛම්භන–සමුච්ඡේද–පටිප්පස්සද්ධි**

**නිස්සරණ** යන පස් වැදෑරුම් මිදීම්වලින් සිත මුදවා ගත් තැනැත්තේ මෙලොව හෝ පරලොව හෝ පැවැත්මද ඇතුළත පිටත කෙලශ ධර්මයන්ගේ පැවැත්මද ස්කන්ධ, ආයතන ධාතූන්ගේ සන්තතියද කාම, භව, දිට්ඨි, අවිජ්ජා යන සතරාකාර උපාදානයන්ගේ සැඩ භාවයද සමූලඝාතනයකොට ශෙෂ නොකට වනසා මහා ක්ෂිණාශ්‍රව භාවයට පැමිණි රහතන්වහන්සේ ශ්‍රාමණ්‍යභාවයයි කියන ලද මාර්ග ඵලාවබෝධයට උරුමක්කාරයෙක් වේමය. කෙසේද ගවයන් හිමියා පස්ගෝරසයට හිමිකාරයා වන්නාක් මෙනි. මේ කථාවෙන් හා ගාථාවලින් උගත් උඩගු මහණහු එඬේරෙක් ලෙසටත් සිල්වත් රහතන් වහන්සේ පස්ගෝරස බුදින ගව හිමියා හැටියටත් දෙසූසේක. උඩගුවීම නිසා මෙසේ පහත් උපමාවකට (තත්වයකට) පැමිණි බැව් සලකා උඩගුකමින් සිත මුදවා ගැනීමට උත්සාහවත් විය යුතුයි.

**5. විචිකිච්ඡාව.** මෙම සැකකිරීම සිතට මහත් සාපයකි. බුද්ධාදී ස්ථාන අටක සැක කරමින් සිත එක අරමුණක නොපිහිටා කරණ විමතියකි. මෙය සිත තුළ නිධන් කර තබා ගණිමුද නැතිනම් එම සැකය දුරලා හරිමුද යනු සිතිය යුතුයි එසේ සිතන්නෙකුට බුදුන්, දහම්, සඟුන් ලොකත්‍රයෙහිම අතිශයින් පූජ්‍යවස්තුය මෙහි සැක කටයුත්තෙක් නම් කොයින්ද මේ සැකය වෘක්ෂයක බඳින පිළිලක් එම රුක නසා දමන්නාසේ මා සිත උපන් මේ සැකය මගේම වැනසීමට ඉලක්කවෙනවා ඇත. එබැවින් මෙම සැකය දුරලා පිරිසිදු අදහසින් එම අට තැනම ස්ථිර සාර ගුණ සමුදායෙන් යුක්තමයයි විචිකිච්ඡාව දුරලීමෙහි ප්‍රොත්සාහී විය යුතුයි. සාමාන්‍යයෙන් මනුෂ්‍යයා සැක කරණ කෙනෙක් නම් බොහෝ සම්පත්වලින් පිරිහෙත්. කිසිවිටෙක ඥාති මිත්‍රයන් ආශ්‍රය කරන්ට නොපිළිවන. සිය ගෙදෙරෙහි හෝ සැප–යෙන් වසන්ට නොපිළිවන. අසල්වැසියා සමග කිසිද විටක හොඳින් සිටීමට නොපිළිවන. සැක කරන්නා හට සිය අත් පා ආදියද විටක තමහටම දෙස් නොකියත්. විචිකිච්ඡා සහගත පුද්ගලයා උපනුපන් ආත්මවල පිළිනොගත යුතු බුද්ධියෙන් පිරිහුනු ස්ථිර පැවතුම් නැති සිතනදේ මුවින් පිටකරන්ට බැරි මූස මූස කාලකන්නියෙක්වම උපදිත්.

**6. ක්‍රොධය.** මෙම පාපය මිනිස් ලොව විද්‍යමාන නරකාග්නිය–වේ. මෙම ක්‍රොධය සිතින් වඩමුද සිතින් මඩිමුද යනු විමසිය යුත්තකි. ඇත්ත වශයෙන්ම සම්‍යග් ව්‍යායාමයෙන් එය මැඩ දුරින්ම දුරු කළ යුතුයි. ක්‍රොධය හලාහල විෂයකි. විෂ ඝොර සර්පයෙකි. සත්ව හිංසාවෙහි තියුණු මුවහත් කඩුවකි.

මෛත්‍රිය වැනසීමෙහි රකුසෙකි. සාමයට හෙන පහරකි. දියුණුව හලුකරණ ගින්නකි. මිත්‍රයන් නසන දමරියෙකි. ඥාතීන්ගේ පස මිතුරෙකි ඇදහීමට සාපයකි. කෙලෙසුනට යෝධයෙකි. පාපයට හිත මිතුරෙකි. ලජ්ජා බිය වනසන ගදා යුධයකි. මේ ආදී ගුණ දහමට පටහැනි අගුණයනට හිතැති පව්කාමෙහි සිත වැඩූ තැනැත්තෝ විරූපව, වියරුව, පිළිකුල්ව, දුගඳව, දුර්මුඛව, බැගෑව, හීනව, දීනව සසර ගෙවනුයේ කලප සිය දහසකිනුදු මිදීමක් නම් කෙසේ ලැබේද මෙම පාපකාරී ක්‍රෝධයෙන් මඩනා ලද්දේ සිය ඇඟ මස් කෑමටද, සුරතල් දරුවන් කෑමටද, රුධිර පානයටද, සියලු පාපයන් වැඩීමටද බියෙක් නම් ලජ්ජාවෙක් නම් කොයින්ද නැත්තේමය. ඉන් නිසා සසර සුව ලැබ එතරවනු රිසි පැනැතියන් මෙම ක්‍රෝධය මැඩීමට වීර්‍යය වැඩිය යුතුයි.

**7. කිළිටි සිත.** මේ පාපය චපල එකකි. ගිහි පැවිදි උභය පක්ෂයම මේ කිළිටි සිත සුඩකටයුතුද නොකට යුතුදැයි සැලකිය යුතුයි. බොහෝ සෙයින් සිත කිළුටු කරන්නේ ඇස්, කන්, නාසා, දිව, කය යන දොරටු අසන්වර වීමෙනි. සිත කොපමණ ප්‍රසන්නව පැවතුනත් මේ දොරටු පසින් ඇතුල් වන රූපාදී අරමුණු ගැටීමෙන් කැළඹියෙත්. කොපමණ ප්‍රසන්න ජලාසයක් නමුදු නිතර නිතර කීපදෙනෙක් එක්ව කලතනවා නම් එහි ප්‍රසන්න භාවයක් නම් නොලැබේ. එලෙසම සිතද කොපමණ ප්‍රසන්නවූවත් රූපයෙන් කැලතෙනවා නම් ශබ්දයෙන් සුවඳින් රශයෙන් පහසින් කැලතෙනවා නම් කෙසේ ප්‍රසන්නවේද නොවේමය. කිළිටි සිත් ඇති පුද්ගලයාට ආර්‍ය මාර්ගය ආවරණය වේ. සොහොනෙහි රුක්මුල අවකාස ස්ථානයෙහි අරණ්‍යයෙහි ප්‍රාන්ත සෙනසුනෙහි ඇලී වැසීම නොකළ හැකියි. කිළුටු වස්ත්‍රයක්සේ පිළිකුල්කරණ බැවින් ආර්‍ය ධර්මයට කිසිසේත් නොයෙදේ. මෙසේ හෙයින් සුඩිය කැමති සැමදෙනෙක්ම සිත පවිත්‍ර කර ගැණීමට උත්සාහවත් වියයුතුයි. සදොර වසා හික්මවා ගතයුතුයි. රූපාදී අරමුණුවල නොම එල්ලී එහි අනිත්‍යාදිය මෙනෙහි කළ යුතුයි.

**8. සාරබ්ධකාය.** සාරබ්ධකාය නම් දහයෙන් යුක්ත ශරීරයයි. සිත සනසා ගනු කැමැති තැනැත්තා මම දහ සහිත කයින් වාසය කළ යුතුද? දහයෙන් වෙන්වූ කයින් යුක්තව වාශය කළ යුතුද යනු විමසිය යුත්තකි. මෙහි දහය නම් තෘෂ්ණා දහයයි. මේ තෘෂ්ණා දහය බොහෝවිට ෂඩාලම්බනයන් මුල්කර ගෙණ පවතිත් ඇසට රූපයක් එල්ලවූවිට තෘෂ්ණා කෙලශ දහය හටගණීත්. එහිදී නුවන හීනවී ගියේ නම් දහය වැඩි දියුණුවේ,

එයට ආසාකිරීමෙන් එය නොලැබී ගියේනම් ශරීරය පුළුස්සන්-නාක්මෙන්වී උම්මත්තකයෙක්වේ. එම උමතු භාවයෙන් කථා කරණ සියල්ලත්, කරණ වැඩත්, සිතන සිතිවිලිත්, පුදුම ගෙණ දෙන දේත් දකින්නන්ට කෙළිකවටකම්වන අතර නුවනැතියන්ට මහත්වූ සංවේගයට කරුණුවෙත්. ශබ්ද, ගන්ධාදියවද තෘෂ්ණාව ඇතිවීමෙන් එසේම කෙලශ දැහය ඇතිවෙත්. රශයට වහල්වූ තැනැත්තා එය ලබාගැණීමේ ආශාවෙන් නොයෙක් හොරමැරකම් කරත්. ඉන් රජදණ්ඩනයට යටපත්වූයේ දෙතිස් වධ බන්ධන-යන්ට ගොදුරුව දැහ සහිත වේදනා සහිත ශිරුරින් දුක් සම් කමොලු විඳින්ට සිදුවෙත්. කාමාදී තෘෂ්ණා දැහය සැදුනවිට විලිකිය දුරුවෙත්. අන්ධයන්මෙන් බිහිරන්මෙන් තිරිසනුන්මෙන් ක්‍රියා කරත්. සසර මින් ලබන විපාකද නටුකවෙත්. චපලවෙත්. එසේ හෙයින් මෙම සාරම්භකාය ස්වභාවයෙන් සිත මුදවාගෙණ අසාරම්භකායෙයන් යුක්තව යහපත් ව්‍යායාම්වල යෙදීමට උත්සාහවත් විය යුතුයි.

**9. කුසීත බව.** මෙහි කුසීත භාවය නම් හැකුළුනු ගතියයි. මෙම කුසීත භාවය ගැණ සලකා ඉන් වෙන්වී වීර්‍යාරම්භයෙහි යෙදිය යුතුයි. බොහෝදෙන මෙසේ සිතත් මෙසේ කියත්. අපි දුප්පත්ව, මෝඩව, දුබීලව උපන් අයයි. අපට මොන පින්ද ලැබිච්ච දෙයක් කරණවා එය පින් හෝ වේවා පාපය හෝ වේවා අපට වගක් නෑ. පින් පව් සොයන්නේ කාල බීලා නොවැ. තියෙන අයට නම් ඕවා සොයා වැඩ කරන හැකි අපට පින් පව් සොයන්ට ගියොත් කුසගින්නේ මැරෙන හැකි. මේ කුසීතයාගේ එක්තරා සිතීම් පැතීම් ක්‍රමයකි. මෙලෙසින් සිතන ඔහු කුසීත කමින්ම වැසී වෙලී සිටින බැවින් ගත් ගත් අදහස්වල වරද මෙනෙහි නොකරත්. එසේ නොව කුසීත බව දුප්පතාට දුබීලයාට නපුරු මිත්‍රයෙක් සමානය. නැති බැරි අපිම කුසීතකම දුරලා නැගී සිටිය යුතුයි. එසේ නැගී නොසිට කුසීතවීමෙන් අපට සසරින් නිදහසක් නැත. පින්කළ යුත්තෝද අපිමය. සිල් රැකිය යුත්තෝද අපිමය. භාවනා වැඩිය යුත්තෝද අපිමයයි නුවනින් සලකා කුසීත බව දුරලා සතරාකාර වීර්‍යයෙන් අරඹා කුසල් වඩා අකුසල වනසා සිත සාධාගත යුතුයයි සැලකිය යුතුයි.

**10. අසමාහිත භාවය.** සන්සුන් භාවයට සමාහිත සිතයයි කියති. මේ ගුණයෙන් තොර කිසිවෙක් හට වැඩෙක්නම් නොවේ. අසමාහිත භාවයයි කියන්නේ නොසන්සුන් කමයි. නොසන්සුන් තැනැත්තා හට නිර්වාණාලම්බනයන්හි යෙදී ගමනක් නම් නොලැබේ. මන්ද? මෙම සාසනයෙහි සියලු

ප්‍රතිපදාවන් පුරුදු කරන තැනැත්තා සන්සුන් විය යුතුයි. එසේ වීමට ශික්ෂාපද දෙශනාකර තිබේ. එහි හික්මීම සෑම කුසලයක්ම සෑම භාවනාවක්ම සපුරාගත යුතුයි. අසමාහිතයා හට ප්‍රඥාව නොපිරේ. ප්‍රඥාව නොපිරූ තැනැත්තාට මාර්ගඵල ලාභය කොසේනම් ලැබේද නොලැබේමය. මෙනිසා සිත සන්සුන් කර ගැනීම ඉතාම අවශ්‍යකරුණකැයි සාලපනා කළයුතුයි. මෙලෙසින් කැලැල් කුණු ගැවසුන මුහුන සුඩකර බලා සතුටු වන්නාසේ මෙකී දස,භාකාර අකුසල් නමැති කැලැල් කුණු සෝදා හැර සිත සාධා මාර්ගඵල ලාභයෙන් ප්‍රමුදිතව ලාභයක් වූවාය. යහපතක් ලැබුවා-යයි සතුටු විය යුතුයි. මෙලෙසිනුදු සම්‍යග් ව්‍යායාමය පේරුන් ගත යුතුයි. මේ දසහාකාර අකුසලයන් පිළිබඳව කදිම කථා ප්‍රවෘත්ති දෙශනාවෙහි බොහෝ ඇතත් මෙහිදී එය කියාකර දීමට කාලයක් නැත.

මෙපමණ වේලා අපි කුසල් අකුසල් කීප ආකාරයකට වැඩෙන සැටිත් නැසෙන සැටිත් නසන සැටිත් ඊට කර්මානුරූපව ලැබෙන ඵල විපාකත් සංක්ෂෙපයෙන් දෙශනාව අනුව ප්‍රකාශ කෙළෙමු. මීලඟට මා අදහස් කරන්නේ යම්කිසි පින්වතෙක් මව් කුසින් බිහිවූවාට පසු මරණයට යනතුරු කළයුතු හා කෙරෙණ කරණ වැඩ සටහනක් පිළිබඳව බුදු මුවින් වදාළ දෙශනයක් ප්‍රකාශ කරන්ටයි ඉන් මනුෂ්‍යයෙක් සිය ජීවිතය මුලාව ගෙන යන කාලයත් නුවන මුහුකුරා ගියාටපසු පිළිපැදියයුතු ක්‍රමයත් යහපත් ව්‍යායාමයෙන් කෙලෙසුන් නසා නිර්වාණය සාධාගන්නා ආකාරයත් හොඳින් වැටහේ.

**ශේ මෙසේ කල්පනාවට ගත යුතුයි.**

ළදරු වියෙහි සිට ධර්මා ලම්බණය (බණ දහමට ඇල්ම) වන අවස්ථාව වනතුරු මිනිසා සතුටු වන ස්ථාන.

මවුකුසින් ඉපිද මදක් ලේ මස් වැඩී උඩුකුරුව දඟලන කළ ස්වකීය මලමූත්‍ර සිටි තැනම පහරා කෙළි ලොලින් ගතින් හා මොලකැටි දෙඅත් දෙපයින් තලමින් ශබ්ද නගමින් ප්‍රීතිවෙත්. මෙය දකින කාහට නමුත් ළදරුවාගේ ප්‍රීතිවීමේ ආකාරයද අසූචි බව නොදැනම මූලාව කරණ සෙල්ලමක් නොව එය ලෙල්ලමකැයි මවිතවන බවද ඇත්තකි. නමුත් ළදරුවාට ඒ කිසිවක් නොතේරී ප්‍රීතිජනක ක්‍රීඩාවක් වැයමක් වනු ඇත. සමහරවිට මව්පියාදීන් එම මලමූත්‍ර ගොඩෙන් වෙන්කර ගන්නා කල්හිදු තමාට හැකි මහ බලය වන හඩා වැලපී එහිම ලැගීමට තැත්කරණවා ඇත. මේ මොකද නොදන්නාකම, නුවන මදකම, මුලාබව මෙලෙසින් වුවද වැඩුනු දරුවා දස දොළොස් වියට පැමිණිවිට.

ක්‍රීඩාසමයට පත්ව බිලිබෑම, කල්ලි ගැසීම, රූංපෙති ගැසීම, රෝද ගැසීම, දුනු විදීම ආදී නා නා ක්‍රීඩාවන්ට පෙළෙඹෙමින් එහි යෙදෙත්. එම ක්‍රීඩා මුලින් කී ළදරු ක්‍රීඩාවට වඩා සිත් ගන්නා සුලුයි. ප්‍රිය කරයි. නමුත් එය දකින වෘද්ධයෝ සිතනුයේ මේ ළමයි සෙල්ලමෙහිම යෙදී තම ජීවිත මතු මත්තෙහි හිස් කරගෙණ ගෘහ ජීවිතය දීනකර ගන්නවායයි ගිහිගෙය වඩා ගැණීමට අනුපකාරයක් වන බවම සලකා කලකිරී කථාකරති සිතයි. නමුත් ඔවුන් සසර විමුක්තියක් මින් කෙසේ ලබමුදැයි සිතත්ද නැත. මන්ද නොදැනීම නිසයි. මෙහිදී නුවනැත්තෝ කොල්ලන්ගේ සෙල්ලමටත් මහල්ලන්ගේ සිතිවිලි රූසටත් කළකිරෙත්. නමුත් මිනිස් ජීවිතය පිළිබඳව මෙයද මූලාව ක්‍රියාකරණ සමයකි.

මෙසේ කුමාර වියෙන් මිදි තරුණ භාවයට පැමිණ ඇස් කන් නාසාදිය සතුටු කිරීමේ යුහුසුලුවී විලිබිය දුරලා ක්‍රියාකරණාතර පඤ්චකාම සම්පතට ඇතුලත්ව පස්කම් කෙළිලොලින් කල් යවත්. එම ප්‍රීතිජනක ක්‍රීඩා සමය මුලින් කී ක්‍රීඩාවන්ට වඩා සිත් ගන්නා සුලුය. ප්‍රමෝදකරය. අතිශයින්ම ප්‍රීතිය ගෙණ දෙන්නේය. එහෙත් එය දකින නැනවතුන් හට මිනිසා මෙම ක්‍රීඩාවේ ඇලී වසන්නේ මූලාවීමෙන්ය. පස්කම් සුව රශවත් මුත් එය අධිකව විදීමෙන් රූස්වන්නේ පව්කම්ය. මෙහි ලොල්ව වැසීම මෝඩකමෙකැයි සිතත්. මෙලෙසින් මේරූ නුවනැත්තන් පස්කමෙහිද දෙස් දැක මෙකී ප්‍රමාදයට හිත කෙළි සෙල්ලම් දුරලා සසර බිය දැක දැන වසනාතර.

ලෝක තත්වය විදහා පෙන්වීමට සමත්වූ තම තථාගතයන් වහන්සේ ලොව පහළවන සේක. තථාගතයන් වහන්සේ නම් කවරෙක්දැයි ලෝක සත්වයා සොයන්නේ මෙසේ හඳුන්වා ගණියි.

ත්‍රිවිධ ලෝකයම හිස්කොට සලකන රහසිවද කිසිද පාපයක් නොකරණ ලොකත්‍රයෙහි දැනගත යුතු සියල්ල සවකීය නුවනින්ම දැක දැනගත් ප්‍රථමාදී විද්‍යා අටකින් හා චරණ පසළොසකින් යුක්තවූ යහපත් ගති ඇති බුදුන් වහන්සේව යටත් කිරීමට නොව ඒ හා සමුවූවෙක්ද ලොව නැත්තාවූ බ්‍රහම, දෙව, මාර, යක්ෂ, නාග, සුපණී, මනුෂ්‍ය, හස්ති ඈ සියල්ලන් ක්ෂණයකින් දමනය කිරීමේ ඉර්ඩි මහිමක් ඇති දෙව් මිනිස් මැද ශ්‍රෙෂ්ඨ අනුශාසකයෙක්වූ කාලත්‍රය දැක්කාවූ රාගාදි කෙලෙසුන් හා සසර ගමන හෙළුවාවූ මහා උත්තමයානන් වහන්සේ තථාගතයයි දැනගණී.

උන්වහන්සේ ලෝසතුන් කෙරෙහි අනුකම්පා පෙරටුව දෙන අවවාද (ධර්ම) මුලත් යහපත්ය, මැදත් යහපත්ය, අගත් යහපත්ය අර්ථ සහිතය. (අදහසක් ඇතුලුවය) ව්‍යඤ්ජන සහිතය (කල්පනා කිරීමට විස්තර ඇත.) සියල්ලම සම්පූර්ණ ප්‍රයෝජන අදහස්ය. පිරිසිදුය. සසරින් එතරවීමට නිසි මග බඹසර හැසිරීමට සුදුසුසේ දෙශනා කරයි

තම දිවි පෙවෙත් මුල සිටම ක්‍රීඩා ලොලින් ගෙනැවිත් පස්කම් සැපෙහි දෙස් දුටු පිනැතියෝ බුදුන් වහන්සේ දැක වැඳ පුදා බණ අසා බලවත් භක්ති ශ්‍රද්ධාව ඇතිකර ගණියි. එම ශ්‍රද්ධාවම ඔහුගේ විමුක්තිය ඇතිකරයි. හේ කෙසේද?

ශ්‍රද්ධා භරිතයා ගිහිසැපය. ක්‍රීඩාව, ප්‍රමෝදය ලඝුකොට සලකයි. එසේ සැලකීමෙහිදී ගිහිගෙය කෙරෙහි කලකිරෙයි. **සම්බාධො ඝරාවාසො රජාපථො අබ්භොකාසො පබ්බජ්ජා** ගිහිගෙයි වැසීම සම්බාධකරයි. අතිශයින් පීඩා ගෙනදෙයි. නිතර කාම සැප නමැති රජස් (ධූලි) නැවරෙයි ඉන් සිත කිළිටිවෙයි. ශ්‍රද්ධාවීර්‍යාදී ඔපමට්ටන් මැකී කැලැල් සෑදී සිත නීවරණ ධර්මයන්ගෙන් වැසීයයි පැවිදි බව එසේ නොවේ බොහෝම විවේකයි, සිත සැදෙයි, ශ්‍රද්ධාව වැඩෙයි, පව් නැසෙයි, කුසල් වැඩෙයි, දුක්මැඩෙයි යනු සිතයි. නැවත,

ධර්මයවූ පරිදි පිළිපැදීමට ගිහිගෙය නුසුදුසුයි. ඒකාන්තයෙන් පිරුණු, පිරිසිදු, බ්‍රහ්මචර්‍යය නම් ගිහිගෙයි සිට පුරන්ටම නොහැකියි. එනිසා ගිහිවෙස් හැර පැවිදි විය යුතුයයි නිශ්චයකර ගණියි. මෙලෙසින් තීරණයට බැසගත් පින්වතා තමන් සතු වස්තුව ස්වල්ප දෙයක් නමුදු මහත්වූ වස්තු සම්භාරයක් නමුදු සුලු නෑ පිරිසක් නමුදු විශාල ඥාති සමූහයක් නමුදු අතහැරලා පැවිදි වෙත්.

ඉතිබ්බෙහි එම භික්ෂුව භික්ෂු භාවයට යෝග්‍ය ශික්ෂා (හික්මීම්) දැන උගෙන පිළිපදිති ජීවිකාවද යහපත් අඳමින් ගෙණයයි. මෙසේ ඉන බඩ සකසුරුවමින් සඳ වඩනාතර සිත සන්සුන් කර ගැණීමට කෙලෙසුන්ගෙන් මුදවා ගැණීමට ව්‍යායාම් කරයි. එය, පින්වතෙක් විසින් ක්‍රමානුකූලව සිහියෙන් වැඩිය යුත්තකි.

පළමුකොට අකුසල් මැඩීමටත් කුසල් වැඩීමටත් ආරම්භ කරයි. හේ මේ ක්‍රමයෙනි.

**පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණ**

**භූත හිතානුකම්පී විහරති,** ප්‍රාණවධය හැර ඉන් වෙන්වී වසයි. සතුන් මැරීමේ දඬු, කඩු නොගනියි. ප්‍රාණවධයට ලජ්ජා වෙයි. සතුන් වෙත දයාබර සිත ඇතිකරයි. (අඞ්ගුලිමාල මහ තෙරනුවන් මෙනි.) සියලු ප්‍රාණීන් කෙරෙහි සත්ත්වයන් කෙරෙහි හිතවත්ව අනුකම්පා උපදවමින් වාසය කරයිද.

**අදින්නා දානං පහාය අදින්නා දානා පටිවිරතො හොති දින්නාදායී දින්න පාටිකංඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති** අදත්තාදානය (සොරකම) හැර ඉන් සම්පූර්ණයෙන් වලකීද දුන් දෙය පිළිගැන්මෙහිද දුන් දෙය කෙරෙහිම සතුටු වීමෙහිද සොර සිත්වලින් දුරුව පිරිසිදුවූ සිතින්ම තම දිවි පෙවෙත රැක වාසය කරයිද

**අබ්‍රහ්ම චරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී විරතො මෙථුනා ගාම ධම්මා** කාමසෙවනය හැර බ්‍රහ්මචර්‍ය්‍යයෙන් යුක්ත වේද කාම් සෙවුමෙන් බොහෝ ඈත්ව මෛථුනය ග්‍රාම්‍ය පහත් සිරිතැකැයි කල්පනා කරමින් වසයිද.

**මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස** මුසාවාදය හැර මුසාවාදයෙන් වෙන්වේද ලොකයාට සත්‍යවාදීව සත්‍යයෙන් සත්‍යයම ගලපා කථාකරණ ඇදහිය යුත්තෙක්ව විශ්වාස කටයුතු අඳුමින් වසන්නෙක්ව බොරු නොකියන්නෙක්ව වචනය සංවර කරමින් වසයිද.

**පිසුණං වාචං පහාය පිසුනාය වාචාය පටිවිරතො හොති න ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය අමුත්‍රවා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය** කේලාම් කීම හැර කේලාම් කීමෙන් වෙසෙසින් වෙන්වේද මොවුන්ගේ සමගිය දියුණුව වනසා හෙදකිරීමට මෙතනින් යමක් අසා ගොස් එතන කීමෙන් වැලකී සිටීමද ඔවුන් හෙදකිරීමට එතනින් යමක් අසා විත් මෙතන කීමෙන් වැලකී සිටීමද යුතුයයි සලකා කේලාම් බස්වලින් වැලකී වචනය සංවර කරමින් වසයිද.

**ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති යා සා වාචා නෙලාකණ්ණ සුඛා පෙමණීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථාරූපිං වාචං භාසිතා හොති** රළු ඵරුෂ වචන කීම අතහැර ඵරුෂ වචනයන්ගෙන් වෙන්වේද යම්බඳු වචනයන් මට සිළුටුද, කනට මිහිරිද හෘදයාඞ්ගමද (සිතට

වදිනකොට ප්‍රීතිය උපදීද) නගර බද කථාවසේ ප්‍රිය උපදවාද බොහෝදෙනාට කමනීයද (සිත්කළුද) බොහෝදෙනාට මන වඩන්නීද එබඳු වචන කියමින් වචනය සාධා වසයිද.

**සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථ සංහිතං** සම්ඵප්‍රලාපය හැර නිෂ්ඵල බස් මාලාවෙන් වෙන්වේද කාලයට සුදුසු වචනකීම ඇත්තක්ම කීම අදහස් ඇති වචන කීම ධර්මය අනුව කථාකිරීම විනය අනුව කථාකිරීම අගමුල ඔපසු කරන්ට හැකි කථාකිරීම කාලය ලැබෙන අඳුමට කථාකිරීම දිගට නොදෙඩා කොටියෙන් කාරණය අවබෝධ වනසේ කථාකිරීම අර්ථය (ප්‍රයෝජනය) ඇතුලත් කථාකිරීම නිෂ්ඵල බසින් වෙන් වීමයි තම වාසනාවන්ත කාලය නිකරුණේ කා දමන මෙම පුහුබස්වලින් දුරුව වචනය හික්මවා වසයිද.

**සො බීජගාම භූතගාම සමාරම්භා පටිවිරතො හොති එක-භත්තිකො හොති** -පෙ- මෙකී සත් ආකාරයකින් කය වචනය හික්මවාගෙණ යහපත් ව්‍යායාම් සුපුරුදු කර පිරිසිදුව සිල්වත්ව වසන භික්‍ෂුව ඇටවගී පැලවගී වැවීම්වලින් තොරව දිනකට එක් වේලක්ම ආහාර ගණිමින් රාත්‍රි භොජනය අතහැර විකාල භොජනය දුරලා නැටීම්, ගීකීම්, වැයීම්, විසුලු දැකීම්වලින් ඉතා දුරව මල් සුවඳ, සුවඳ සුනු ආලේපන (සුවඳ සැන් පියර ආදිය) දැරීම සැරසීම වෙසෙසින් නෙත් සිත් පිනවන අයුරින් අලඞකාරවීම එසේම මඞගලශ්‍රියෙන් සොභාමත් තැන් සොයා ගොස් වැස තුටු පහටුවීම යනාදී නොයෙක් මණ්ඩනයට හිතකර දෙයින් දුරුව වෙන්ව වාශය කරත්ද.

**උච්චාසයන මහාසයනා පටිවිරතො හොති** උස් අසුන් (රියනකට වඩා උස ආසන) රක්ත කම්බල, සෙවත කම්බලාදී මහානඝී (බොහෝ වටිනා) ආසන පිළිගැණීම්, පරිභොග කිරීම් ආදියෙන් වෙන්ව ආරණ්‍ය වෘක්‍ෂමාලාදියෙහි ඇලී වසත්ද.

**ජාත රූප රජත පටිගගහනා පටිවිරතො හොති** -පෙ- රන් රිදී මසු කහවනු ඈ පිළිගැණීමෙන් වෙන්වී වසයිද අමු ධාන්‍ය, අමු මස් මාංස, ස්ත්‍රීන්, කුමාරියන්, දැසියන්, දැසයන්, එළු, තිරළු, කුකුළ්, ඌරූ, ඇත්, ගව, අස්, කොටළු, කුඹුරු, වතුපිටි ආදිය පිළිගැණීමෙන් වෙන්වී වසත්ද.

දූත ගමන් (පනිවිඩ ගෙනයෑම්) වෙළඳාම්, තරාදි, පඩි ආදී මැනීම් ආදී කූට උපාය ක්‍රමවලින් වෙන්වී වසත්ද, යුතුකම් යටකොට අයුතු අඳමින් ක්‍රියාකිරීම, වංචාකිරීම, කපටිකම් කිරීම, ප්‍රයෝගකිරීම ආදී නින්දිත ක්‍රියාවලින් දුරුව වසත්ද හෙතෙම කාය පරිහරණයට යොග්‍ය සුදුසු සිවුරු පාවිච්චි කරත්ද, කුසට සරිලන ලෙස පිඩුසිඟා ගණිමින්ද, ඉත බඩ නිසිසේ රැක වසත්ද, ඉගිලෙන පක්ෂියාමෙන් සිය පිරිකර දරාගෙණම හැසිරෙත්ද මෙසේ නිරවද්‍ය ප්‍රීතියෙන් වසත්ද.

**සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති** හෙතෙම මෙ කී ආකාර ආයර්‍යයන් වහන්සේලා ආරක්‍ෂා කරණ ලද සීලස්කන්ධයෙන් (සිල් රැශියෙන්) යුක්ත වූයෙ වේද, ඇතුලත (සිත) නිවැරදි අඳමින් පරිහරණය කර බලා කිසිද වරදක් නැති බව දැන එම සැපය එම ප්‍රීතිය විඳිසිද මෙලෙසින් කාය, වචනය, සිත යන තමන්ගේ වාරත්‍රය සුපිරිසිදු කරගත් සිල්වත් ගුණවත් නැනවත් භික්‍ෂුව **සො චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති,** ඇසින් රූප දැක එම රූපයන්හි නිමිති නොගනිත්ද සිත්කාලඟ සොභාමත් දුටුවන් මන වඩන්ය. නෙත් පිණවන ශ්‍රී දෙහයක්ය යනාදී වශයෙන් නිමිති නොගනිත්ද අනුව්‍යඤ්ජන නොගනිත්ද හෙවත් කෙශ කළාපය නිලවණී වළාකුලක් බඳුය. නලල අඩ චන්ද්‍රයා බඳුය දෙබැම දේදුනුසේ කාන්තිමත්ය. දෙඇස නීලමාණික්‍ය යුවලක් බඳුය. යනාදී ශරීරය පිළිබඳ අවයව බලා නිමිති නොගනිත්ද යම් හෙයකින් ඇසට පෙනී ගිය රූප පිළිබඳව විනිශ්චය කර තීරණය කරණ අවස්ථා-වෙහිදී චක්‍ෂු ප්‍රශාදය අසංවරව විහරණය කරත්ද එහිදී තීරණයට බැසගන්නේ විසම ලොභය දෞම්නස ආදී ලාමක අකුසල්වල ගැටී වෙලී එබඳු පාපයන් වගුරුවන්ටය. එනිසා එම චක්‍ෂු ප්‍රශාදය සංවරකර ගැණිම පිණිස පිළිපැදිය යුතුයි. සිතා චක්‍ෂු ප්‍රසාදය රැක ගණියි. සංවර භාවයට පමුණුවයි.

එසේම සොත,ඝාන,ජිව්හා,කාය,මනස යන පස්දොරින්ද ඇතුල් වන ශබ්ද, ගන්ධ රශ, ස්ප්‍රශ්, ධර්ම යන ආයතනයන්හී වැරදි අඳමින් නිමිති නොගෙණ ඒ ශ්‍රොතාදී වාරයන්ද සංවර කරගෙණ වසත්ද.

**සො ඉමිනා අරියෙන ඉන්ද්‍රිය සංවරෙන සමන්නාගතො**-පෙ- හෙතෙම මේ ආකාර ආර්‍ය්‍යයන්ට අයත් ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වූයේ ෂඩෙන්ද්‍රියයන් හික්මවා ගත්තේ සෙක්ෂ නොවන සැපය මේයයි තේරුන්ගෙණ වසත්ද.

**සො අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති සම්මිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති** හෙතෙම හුන් තැනින් පැනී යන කල්හිද පෙරළා නැවත එන කල්හිද යහපත්සේ නුවනින් සලකාම ක්‍රියාකරත්. ඉදිරි බලන කල්හිද, යට බලන කල්හිද, ශරීරය හකුළුවන කල්හිද, අත්, පා, කය දිගහරින කල්හිද, දෙපට සිවුර, පාත්‍රය, අනිකුත් චීවර වස්ත්‍ර දරණ කල්හිද, ආහාර පැන් කන බොන කල්හිද, මල මූත්‍ර පහකරණ කල්හිද, යන කල්හිද, සිටින කල්හිද, හිඳින කල්හිද, සයනය කරණ නිදිනැතිව හිඳින කථාකරණ කල්හිද, නිශ්ශබ්දව සිටින කල්හිද, යහපත් නුවනින් හා සිහියෙන් යුක්තවේද මෙසේ සියලු ඉරියව්හී සිහි එළවා ස්මෘති සම්පජඤ්ඤයෙන් යුක්තව වසන භික්ෂුව යහපත් ව්‍යායාමෙහි අනුසස් දැක දැකම වෙසෙසි. ප්‍රීතිවෙයි. විවේකීව සැපසේම වසයි.

**සො ඉමිනාච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනාච අරියෙන ඉන්ද්‍රිය සංවරෙන සමන්නාගතො ඉමිනාච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො විවිත්තං සෙනා-සනං භජති** -පෙ- ඒ බුඩිමත් භික්ෂුව මෙකී ආර්‍ය්‍යයන්ට අයත් කාය වචනය සංවර කරගැණීම නම්වූ සීලස්කන්ධයෙන් යුක්තවූයේ මෙකී ආර්‍ය්‍යමයවූ චක්ෂුරුදී ෂඩෙන්ද්‍රියයන් සංවර කරගැණීමෙහි සමර්ථ වූයේ මෙකී ආර්‍ය්‍යයන්ට යොග්‍යවූ සිහිනුවනින් යුක්තවූයේ තමන් තුල විද්‍යමාන සීල සංවර ස්මෘති ඥාණයන් මෝරවා ගැණීම පිණිස එමගින් විමුක්තිය අපෙක්ෂා කරනුයේ (බලාපොරොත්තු නුයේ) විවේක සෙනසුනක වැසීමට පැමිණෙයි.

**විවෙක සෙනසුන් ආරණ්‍ය, රුක්මුල්, පර්වත, කඳුරැලි, ගල්ලෙන්, සොහොන්, වනප්‍රාන්ත,** (මහා කැලෑ මැද) **අභ්‍යවකාශ ස්ථාන,** (පිටට්නි) **පලාලපුඤ්ජ** (පිදුරු ගොඩවල්) මෙකී සෙනසුන් සීලාදී ගුණ සපුරා ගුණ නුවණින් වැඩුනු සිතැති භික්ෂුවට ඉදිරි-යෙහිද භාවනාවන් කිරීමට යොග්‍ය ස්ථාන වෙත්. එබැවින් මෙකී සෙනසුනකට පැමිණී එම භික්ෂුව දෙපා හකුළුවා පලක් බැඳ කය ඍජුකොට තබා සිහිනුවනින් යෙදී භාවනාවෙහි යෙදෙත්. එසේ බැවීමෙන් **සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති** -පෙ- හෙතෙම

සිත තුල විසම ලොභය ඇති බව දැන එම විසම ලොභය හැර සිත එම ලොභයෙන් දුරලාගෙණ වාසය කරයි. සම්‍යග් ව්‍යායාමයෙන් අභිද්‍යා කුණු සෝද හැර සිත සුඛකරයි. ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච, කුක්කුච්චය, විචිකිච්ඡාව යන පස් වැදෑරුම් අධොභාගිය ධර්ම දුරලා එම කුණුසසල පාපයන් සෝද හැර සිත පිරිසිදුකර තබාගණියි.

**සො ඉමෙ පඤ්ච ණීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ පඤ්ඤාය දුබ්බලීකරණෙ විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි-සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති තං කිං මඤ්ඤසි නතවායං විහාරො පුරිමෙහි විහාරෙහි අභික්කන්ත තරොච පණීත තරොචාති** මෙතෙම සිත නොයෙක්වර කෙලසන්නාවූ නුවන දුර්වල කරන්නාවූ මේ පඤ්ච ආවරණ ධර්මයන් අතහැර කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන් ගෙන් වෙන්ව.

විතර්ක සහිතවූ, විචාර සහිතවූ, විවෙකයෙන් හටගත්තාවූ පීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට වැද වාසය කරයි. මෙම සැප විහරණය ළදරු, කුමාර, තරුණ ක්‍රීඩාවන්ට වඩා ශ්‍රමණ භාවයට පැමිණ සීලසංවර, ඉන්ද්‍රියසංවර, සතිසම්පජඤ්ඤ ආදියෙන් ප්‍රීතිවන අවස්ථාවන්ටත් වඩා මනවඩයි. ප්‍රණීතයි. ප්‍රණීතකරයි. එතමුදු තැනවත් සම්‍යග් ව්‍යායාමයෙන් යුත් මහන තෙම මින් සතුටට පැමිණ නතර නොවෙයි. මන්ද තමා බලාපොරොත්තු නිර්වාණයට නොපැමිණි බැවිනි.

මෙලෙසින් ක්‍රම ක්‍රමයෙන් **ද්විතීයධ්‍යානයටද, තෘතීයධ්‍යානයටද, චතුර්ථධ්‍යානයටද,** ආකාසානඤ්චායතනයටද, විඤ්ඤාණඤ්චායතනයටද, ආකිඤ්චඤ්ඤායතනයටද, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයටද පැමිණ ප්‍රීතිවෙයි. එම ප්‍රීතිය මුලින් මුලින් කී ප්‍රීතිවලට වඩා අතිශයින් මනඃකාන්තයි. ප්‍රණීත තරයි. මෙයිනුදු අනුප්පත්ත සදර්ථ නොවන බැවින් ව්‍යායාම් කළ යුතුයි. මීට අනතුරුව සියලු නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට වැද වසයි. නුවනින්ද එය දැන සියලු ආශ්‍රවයෝ ක්‍ෂය කරණ ලද්දේද වෙත්. මෙහිදී එම යෝගී භික්‍ෂුව අනුප්පත්ත සදර්ථයට පැමිණියේ වේ. නිර්වාණයට පැමිණියේ වේ.

පින්වතුනි, අපි මෙතෙක් වේලා මේ පින්වතුන් හට මිනිසත් බව ආරම්භකර තැන සිට නිවන්සිරි ලබන තෙක් සම්‍යග් ව්‍යායාමය අවශ්‍ය බැව් තේරුන් ගැණීමට කරුණු රැසක්ම ප්‍රකාශ කෙළෙමු. මීලඟට සම්‍යග් ව්‍යායාමය කියා දෙන්ට ආරම්භ කරපු අපි මාතෘකා පාඨය වශයෙන් තැබූ ශ්‍රී මුඛ පාඨය කෙටියෙන් කියාදී අපේ දෙශනාව නැවැත්වීමට අදහස් කරමු.

**තත්ථ කතමො සම්මා වායාමො? ඉධ භික්ඛු සම්මා වායාමං භාවෙති විවෙක නිස්සිතං විරාග නිස්සිතං නිරොධ නිස්සිතං වොස්සග්ගපරිනාමිං අයං වුච්චති සම්මා වායාමො**

අපි මාතෘකාවට තැබූ මේ පාඨයෙහි අදහස:– **තත්ථ,** එහි; (ආර්‍ය්‍ය මාර්ගාඞ්ග අට ප්‍රකාශිත ස්ථානයෙහි) **සම්මා වායාමො,** සම්‍යග් ව්‍යායාමය; **කතමො,** කවරේද? **ඉධභික්ඛු,** මේ සාසනයෙහි භික්ෂුව; **විවෙක නිස්සිතං,** විවේක නිශ්‍රිතවූ; **විරාග නිස්සිතං,** විරාගය නිශ්‍රිතවූ; **වොස්සග්ග පරිනාමිං,** වොස්සගය පරිනාමිතවූ; **සම්මා වායාමං,** සම්‍යග් ව්‍යායාමය; **භාවෙති,** වඩයි; **අයං,** මේ; **සම්මා වායාමො,** සම්මා වායාමයයි; **වුච්චති,** කියනු ලැබේ.

සම්‍යග් ව්‍යායාමය අවබොධ කරවන බුදුපියානෝ ආර්‍ය්‍ය මාර්ග අට දෙසූ තැන කියාදෙනු රිසියෙන් අසනුයේ එහි සම්‍යග් වායාමය කුමක්ද? මාගේ සාසනයෙහි භික්ෂුව විවේකය ඇසුරු කරමින් විරාගය ඇසුරු කරමින් නිරොධය ඇසුරු කරමින් වොස්සග්ග පරිනාමිතව සම්‍යග් ව්‍යායාමය වඩත් නම් එය සම්‍යග් ව්‍යායාමයයි කියනු ලැබේ. මේ වාක්‍යයෙහි විවෙක, විරාග, නිරොධ, නිස්සිත, වොස්සග්ග, පරිනාම යන වචන හොඳට තේරුන් ගත්තාම සම්‍යග් ව්‍යායාමය එක් ක්‍රමයකින් තේරුන් ගත හැකියි.

**නිස්සිත** යනු ආශ්‍රය කිරීම, එහි යෙදීම, ඉන් යුක්තවීම යන අදහස් දෙයි. එතකොට විවේකයෙන් යුක්තවීම, විරාගයෙහි යෙදීම, නිරොධය ඇසුරු කිරීම කියා තේරුන් ගන්න.

**විවේකය විවෙකොති විවිත්තතා** විවේකය නම් හුදකලාව වැසීමයි. තනියම කල් යැවීමයි.

**විවෙක නිස්සිතං ති තදඞ්ග විවෙක සමුච්ඡෙද විවෙක නිස්සරණ විවෙක නිස්සිතං** විවේක නිස්සිතං කීවේ කාය සිත දෙක හුදකලාව තබා ගැනීමයි. එය මෙසේයි. තදඞ්ග, සමුච්ඡෙද, නිස්සරණ යන ක්‍රම තුනින් යුක්තවීමයි. ඊට තමන් හුදකලාව හිඳ නැතිනම් කිසිවෙක් නැති ආරණ්‍යාදි සෙනාසනයකටවී සිත තනිකර ගැණීමට උත්සාහ කිරීමයි. තමන් කොපමණ ප්‍රාන්තයකටවී මහ සන වන ලැහැබකටවී තනිවූවත් සිත තනිකරන්ට නම ලෙහෙසි නොවේ. මන්ද සිතට ඕනෑතරම් නපුරු කටුක පව් පින් චෙතනා නමැති මිතුරෝ එමට සිටිත්. ඒ සිත්වලින් විවේක කර

ගෙණ මාර්ගඵල චිත්තය තනිකර ගැන්ම සිතේ විවේකයයි. මෙය කිරීමට ඉතාම දුෂ්කර දෙයකි. සම්‍යග් ව්‍යායාමය කලප ගතන් පුරන්නෙකුටම සිත විවේක කරගත හැකිවේ. එසේ නැති කෙනෙකුට නම් නොහැකිම වේ.

**අයංහි අරියමග්ග භාවනානුයුත්තො යොගී විපස්සනාක්ඛණෙ කිච්චතො තදඞ්ග විවෙක නිස්සිතං අජ්ඣාසයතො නිස්සරණ විවෙක නිස්සිතං මග්ගක්ඛණෙ කිච්චතො සමුච්ඡෙද විවෙක නිස්සිතං ආරම්මණතො නිස්සරණ විවෙක නිස්සිතං භාවෙති.** මේ වාක්‍යයෙහි අදහස

යොගියෙකු තේරුන් ගැණීමට මම මුලින් දීඝී විස්තරයක් කර ඇත. එම යෝගියා නැතිනම් යෝගී භික්ෂුව මේ ආය්‍ර්‍ය මාර්‍ග අට අනුව භාවනා කරණුයේ සියලු සාමාන්‍ය දැකීම් ආදිය විනාශ කරමින් සිත ක්‍රම ක්‍රමයෙන් කෝටි ගනන් පාප සිත්වලින් වෙන්වී අවුත් විදර්ශනා ක්ෂණයට පැමිණේ. විදර්ශනාව නම් ලෝකයා අතර සැම දර්ශනයන්ට වඩා නිර්වාණාලම්බනව දකින විශිෂ්ට දර්ශනයයි. එම දැකීමේදී සිතෙහි ක්‍රියාකාරිත්වය අනුව නැතිනම් කෘත්‍ය වශයෙන් තාවකාලිකව සිත විවේකය ඇසුරු කරයි. එසේ තාවකාලිකව ලැබෙන විවේකය නැවත නැවත සිත් පහළවීමෙන් විවේකය නැතිවන්ටද පුළුවන. නමුත් යෝගියාගේ බලවත් ව්‍යායාමය තිබෙන බැවින් අදහස් වසයෙන් සිත නිස්සරණ විවේකය ඇසුරු කරයි. නිස්සරණ විවේකයයි කීවේ නිර්වාණයට යෑම සසරින් ගැලවීම කෙලෙසුන්ගෙන් නිදහස්ව යෑම යන අදහසයි. විදර්ශනා ක්ෂණයෙහි එසේවුවද (විශිෂ්ටව දකින ක්ෂණයෙහි) මාර්ග ක්ෂණයෙහි හෙවත් නිවන් මගට ඇතුල් වන මොහොතෙහි කෘත්‍ය වශයෙන් සියළු කෙලෙසුන් මුලින් උදුරා දැමීම් වශයෙන් ලබන විවේකය ඇසුරු කරත්. සිත සහමුලින්ම කෙලෙස් සිඳ විවේකය ලබත්. අරමුණු ගැණීම් වසයෙන් සසරින් දුරව නික්මී නිර්වාණයට පැමිණීමයයි කියන ලද චිත්ත විවේකය ඇති කරත්. එම විවේකය වැඩෙයි.

**විරාග නිස්සිතයද, නිරොධ නිස්සිතයද** විවේක යටකී ක්‍රමයෙන්ම දතයුතුයි. එම දෙයාආකාරයද **තදඞ්ග, සමුච්ඡෙද, නිස්සරණ** යන තුන් ආකාරයට ගලපා තේරුන් ගත යුතුයි වචනාර්ථ වශයෙන් මෙසේ සැලකිය යුතුයි.

**විවෙකො යෙවහි විරජ්ජනට්ඨෙන විරාගො** විවේකය නම් කෙලෙසුන් වැනසීමෙන් සිතට ලැබෙන විවේකයයි. එම විවේකය සේම කෙලෙසුන් සමග සිත නොඇලෙන අර්ථයෙන් විරාගයයි. එම නොඇල්ම ඇසුරු කෙලේනම් විරාග නිස්සිතයයි.

**නිරොධෙන නිරොධො** එම කෙලෙසුන් නිරුද්ධකර මරා වනසා දමා සිත නිදහස් කර ගන්නා අර්ථයෙන් නිරොධයයි. එම නිරුද්ධය ඇසුරු කෙලේනම් නිරොධ නිස්සිතයයි.

**වොස්සජ්ජනෙන වොස්සග්ගො** වොස්සජ්ජනය නම් පරිත්‍යාග කිරීමයි. අයිතිය අතහැරීමයි. කෙලෙසුන් තමන් සතු ධනයක්මෙන් සිත ඒකාධිපතිව අයිතිවාසිකම් කියා ආ නමුත් එහි දෙස් දැක කාලකිරුණු යොගියා එය අස්කර සසරටම පරිත්‍යාගකොට සිත විවේක කරගෙණ වෙන්වූවාය යන අර්ථයෙන් වොස්සජ්ජනයයි කියනු ලැබේ.

තවද, **1. කිලෙසෙහි විවිත්තත්තා විවෙකො, 2. කිලෙසෙහි විරත්තත්තා විරාගො, 3. කිලෙසානංච නිරුද්ධත්තා නිරොධො, 4. කිලෙසානංච පරිච්චත්තත්තා විස්සට්ඨත්තා වොස්සග්ගො.**

1. කෙලෙසුන් කෙරෙන් වෙන්ව තනිවූ හෙයින් විවේකයයි.
2. කෙලෙසුන් හා නොඇලී වසන බැවින් විරාගයයි.
3. කෙලෙස් නැතිකර බැවින් නිරොධයයි.
4. කෙලෙස් පරිත්‍යාග කළ බැවින් හැර දැමූ බැවින් වොස්සග්ගයයි.

**වොස්සග්ගො පන විදුධො, පරිච්චාග වොස්සග්ගොච පක්ඛන්දන වොස්සග්ගොච** වොස්සග්ගය දෙවිධියකි. කෙලෙස් පරිත්‍යාගයෙන් අයිතිය හැර දැමීම කෙලෙසුන් විසිකර දමා නිර්වාණය තුලට ඇතුල්වීම යනුවෙනි.

**තත්ථ පරිච්චාග වොස්සග්ගොති විපස්සනාක්ඛණෙ තදඞ්ගවසෙන මග්ගක්ඛණෙ සමුච්ඡෙදවසෙන කිලෙසප්පහාණං** එහි පරිත්‍යාග වොස්සග්ගය කියන්නේ විදර්ශනා ක්ෂණයෙහි (සංසාර විමුක්තිය **දර්ශනය** වන මොහොතෙහි) තාවකාලික වශයෙන් කෙලෙස් පරිත්‍යාගය (අයිතිය සිඳීම තම සිතින් බැහැර කිරීම) වෙයි. මාර්ග ක්ෂණයෙහි (සොවාන් ආදී නිර්වාණ මාර්ගයට පිළිපන් ක්ෂණයෙහි) මුල් සිඳීම් වශයෙන් (සහමුලින් වැනසීම් වශයෙන්) කෙලෙසුන්ගෙ ප්‍රහාණය සිදුවේ.

**පක්ඛන්දන වොස්සග්ගොති විපස්සනාක්ඛණෙ තන්නින්න භාවෙන මග්ගක්ඛණෙ ආරම්මණ කරණෙන නිබ්බාණ පක්ඛන්දනං** එහි පක්ඛන්දන වොස්සග්ගය විදර්ශණා ක්ෂණයෙහි **එම දර්ශනයටම** නැමෙන ස්වභාවයෙන් කෙලෙසුන් අතහරියි. **මාර්ග ක්ෂණයෙහි** අරමුණුකිරීම් වශයෙන් අතහැර නිර්වාණය තුලට ඇතුල්වෙයි.

**තදූභයම්පි ඉමස්මිං ලොකිය ලොකුත්තර මිස්සකෙ අත්ථ-වණ්ණනානයෙ වට්ටති** මෙකී පරිච්චාග, පක්ඛන්දන වොස්සග්ග දෙකම මේ ආර්‍ය්‍ය මාර්ගාඞ්ග අට පිළිබඳ අර්ථ වර්ණනා කරණ ස්ථාන-යන්හිදී ලෞකික ලොකෝත්තර මිශ්‍රක වශයෙන් ප්‍රකාශ කිරීම වටී. මෙහිදී එහි දීර්ඝ විස්තරයක් කිරීමට අවස්ථාව නොවේ. මේ **සම්‍යග් දෘෂ්ටිය, සම්‍යග් සංකල්පනාව, සම්‍යග් වචනය, සම්‍යග් කර්මාන්තය, සම්‍යග් ආජීවය, සම්‍යග් ව්‍යායාමය, සම්‍යග් සතිය, සම්‍යග් සමාධිය** යන ආර්‍ය්‍යාෂ්ටාඞ්ගික මාර්ගයන් එක එක මාර්ග ධර්මයක් කියන ලද ප්‍රකාරයෙන් කෙලශයන් පරිත්‍යාග කරයි. අයිතිය අස්කරයි. එහිදී පරිච්චාග වොස්සග්ගයයි. නිර්වාණයට පැන ගණියි. එහිදී පක්ඛන්දන වොස්සග්ගයයි.

**වොස්සග්ග පරිණාමින්ති ඉමිනාපන සකලෙන වචනෙන වොස්සග්ගත්ථං පරිණාමිතං පරිණතංච පරිපක්කංචාති වුත්තං හොති** වොස්සග්ග පරිණාමිං යනාදීවූ මේ සියලු වචනවලින් පරිත්‍යාගය සඳහා අතහැර ලැම සඳහා කෙලෙසුන් නියමකොට දේදැ, පවරුදේද, මෝරවාදේද එසේ ලැබ අතහැර ලැම වොස්සග්ග පරිණාමයයි. මේ ඈ ක්‍රමයෙන් ආර්‍ය්‍යමාර්ග භාවනාවෙහි පිළිවෙළින් යෙදුනු භික්ෂුව යම් ඒ සම්‍යග් දෘෂ්ටි ආදී ආර්‍ය්‍ය මාර්ග අටෙහි එක එක මාර්ග ධර්මයක් කිලේස පරිත්‍යාගයෙන් අතහැර ලැමේ අදහසින්ද, නිර්වාණයට පැන ගැණීම් වශයෙන් අතහැර ලීමේ අදහසින්ද මෝරවාලයි. යම් ආකාරයකින් පැසුනු පැසුනු ගෙඩිය ඇද හැලේද එලෙසම පැසුනු පැසුනු පිළිකුල් කරණලද කෙලෙසුන් ඇද හැලෙත්. එලෙස එම විදර්ශනික යොගියා බවුන් වඩත්. එම වැඩීමෙන් පැසවාගත් කෙලෙසුන්ගේ ඇදහැලීම අවසන්වූ විගස නිර්වානයට පැන යත්.

**නිස්සය කී වචනයද මඳක් විස්තර කරමු. පුබ්බභාගෙ උප්පන්නක විවෙකානං උපනිස්සයත්තා නිස්සයානාම** මාර්ග චිත්තයට පූර්වභාගයෙහි උපදින සතරාකාර විවෙකයන්ට උපනිශ්‍රය වන බැවින් නිස්සය නම්වේ. හෙවත් තදඞ්ග විවෙකය, සමුච්ඡේද විවෙකය, පටිප්පස්සද්ධි විවෙකය, නිස්සරණ විවෙකය යන සතර විවේකයන්ට මූලාධාර වන බැවින් නිස්සය නම්වේ. මේ නිශ්‍රය දෙළසකි.

එනම්, ඡන්දනිස්සය, සද්ධානිස්සය, චිත්තනිස්සයයයි තුනෙකි. එම තුන උඩින් කී සතරාකාර විවේකයන්ගෙන් වැඩිවූ කල දෙළසකි. මේ නිශ්‍රය දෙළස මාර්ගී අවබෝධ කර ගැණීමේ ව්‍යායාමයෙන් යුක්ත යෝගාවචරයා මොනවට පිහිටුවා ගත යුතුයි. මෙසේ පිහිටුවීමෙන් මූලාධාරවී නිර්වාණ ලාභයට මන් සැලසේ. මෙසේ විස්තර කරන්ට යෙදුන සම්‍යග් ව්‍යායාමය මේ පින්වතුන් හොඳින් ශ්‍රවනය කළේ නමුදු සිත දරා ගැණීම අපහසු කරුණකි. එනිසා පොත් කරණ මෙම දෙශනයන් නැවත නැවතත් බලා අඩු තැන් ධර්මධරයන් වෙතින් අසා දැන උගෙන විවේකය ඇසුරු කර බවුන් වඩා සියලු කෙලෙසුන් නැතිකිරීමෙන් නිවන් පුර සාධා ගැණීමට උත්සාහවත් විය යුතුයි. නිවන් සිරි ලැබේවා!

**නී රෝ ග වෙ ත් වා!**

# සම්මා සති.

කොළඹ දෙමටගොඩ ජයශෙඛරාරාම මහා විහාරාධිවාසී
තලල්ලේ පණ්ඩිත ධම්මානන්ද ස්වාමින් වහන්සේ විසිනි.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

**"තත්ථ කතමා සම්මා සති? ඉධ භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං, වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං, චිත්තෙ චිත්තා'නුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං, ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දොමනස්සං, අයං වුච්චති සම්මා සති."**

**පින්වතුනි!**

අද ධර්මදෙශනය සම්මා සතිය පිළිබඳවයි. එහි විස්තරය දිග එකකි. එසේම එහි අදහස් සියුම්ද වේ. මේ නිසා හොඳින් බණ ඇසිය යුතුයි හොඳින් ඇසූ පමණට එහි අදහස් තේරුම්ගැනීමද පහසුයි. දැන් අපි අපේ මාතෘකාව දෙසට හැරෙමු. මාතෘකාව සම්මා සතියයි. සම්මා සති යනු කුමක්ද? මේ ප්‍රශ්නයට බුදුරජාණන් වහන්සේ පිළිතුරු සපයා තිබේ. අප විසින් මුලින් ප්‍රකාශ කළ පාඨය උන්වහන්සේ එය විසඳූ අයුරු දක්වයි. එහි අදහස කුමක්දැයි අපි බලමු. දිගු විස්තර අඩුකොට එහි කෙටි අදහස් මෙසේයි.

එහි **සම්මා සතිය** යනු කවරක්ද? මේ සසුනෙහි නිවන් ලබනු කැමති භාවනාවෙහි යෙදෙන භික්ෂු තෙමේ කෙලෙසුන් තවන වීර්‍ය්‍ය ඇතිව නුවණින් යුක්තව කය පිළිබඳව ඇති අශුභතාවන් දක්නා සිහියෙන් යෙදී කය (=ශරීර) නමැති ලොකයෙහි ආසා වශයෙන් ඇතිවන කාමච්ඡන්දයත් ගැටීම් වශයෙන් ඇතිවෙන ව්‍යාපාදයත් අනිත්‍යාදී නොයෙක් ආදීනව සිතීමෙන් සන්සිඳුවාගන කය අනුව බලමින් කායගතා සති භාවනාව සිහිකරමින් වාසය කරන්නේය. එසේම වෙදනාව අනුව බලමින් වෙදනානු පස්සීවද, සිත අනුව බලමින් චිත්තානු පස්සීවද, පඤ්චස්කන්ධාදී ධර්මයන් අනුව බලමින් ධම්මානු පස්සීවද වාසය කරන්නේය.

මෙකී කරුණු අනුව බලන සිහිය සම්මා සති නම්වේ. සතිය නම් කුමක්ද? තත්වූ පරිදි යමක් සිහිකිරීමට උපකාර වන්නේ සතියයි. තෙමේම සිතානුසි හෝ නැතහොත් සිහිකිරීම් මාත්‍රයම හෝ වුවද මේ සතිය මැයි. ඒ සති තොමෝ **ලක්ඛණ රස පච්චුපට්ඨානාදීන්**ගේ වශයෙන් මෙසේ දතයුතුයි.

**“සා අපිලාපන ලක්ඛණා, අසම්මෝස රසා, ආරක්ඛ පච්චුපට්ඨානා, විසයාභිමුඛ භාව පච්චුපට්ඨානා වා, ථිරසඤ්ඤා පදට්ඨානා, කායාදි සතිපට්ඨාන පදට්ඨානා වා, ආරම්මණෙ දළ්හ පතිට්ඨිතත්තා පන එසිකා විය, චක්ඛුද්වාරාදි රක්ඛණතො දොවාරිකො විය ච දට්ඨබ්බා.”**

ඒ සති තොමෝ ‘අපිලාපන’ ලක්ෂණකොට ඇත්තීය. සිහිය හැඳින ගැනීමට තිබෙන ලක්ෂණය, සටහන, අඩයාලම අපිලාපනයයි. පිලාපනය නම් පාකොට යැවීමයි. දියට ලූ සැහැල්ලු දෙයක් පාවී යන්නාක්මෙන් සිතින් ගත් අරමුණු විස්මෘත (=අමතක කිරීමද පිලාපනයයි කියනු ලැබේ. එසේ පිලාපනය නොකිරීම හෙවත් සිතින් ගත් අරමුණු පාකොට යවන්නාක්මෙන් නොකොට සිත තබාගැනීම අපිලාපනයයි. බොහෝ පෙර කළ කී දෑය පවා සිහිකරන්නට හැකිවන්නේ අපිලාපන ලක්ෂණ ස්මෘති බලයෙනි.

එය වනාහි උපමා වශයෙන් සක්විති රජුගේ භාණ්ඩාගාරිකයා මෙනි. සක්විති රජුගේ දශවිධ රත්නයන් රක්නා ඔහු දිනපතා උදේ සවස දෙවයන් වහන්ස, ඔබගේ ඇත්තු මෙපමණය. අස්සු මෙපමණය. රන් රිදී මෙපමණය. සකල සම්පත්තිය මෙපමණය යන ආදීන් සිහිකරවනුමෙන් අපිලාපනය ලක්ෂණකොට ඇති සිහියද පෙර කළ කී දෑය හෝ සතිපට්ඨාන, සම්මප්පධාන ආදී ධර්මයන් සිහිකරවයි. වාචොද්ගත කළ (=කටපාඩම් කළ) පත පොත නැවත පිරුවාලන්නට පාඩම් කියන්නට හැකිවන්නේ මේ අපිලාපන ලක්ෂණය ඇති බැවිනි. මෙසේම සතියෙහි උපගණ්හන ලක්ෂණයද තිබෙන බව සිහිකළ යුතුයි.

උපගණ්හනය නම් උපකාරක ධර්මයන් සිතට ළංකොට ගැනීමයි. එයින් මේ ධර්මය යහපත්ය මේ ධර්ම අයහපත්යයි විමසා දැනීමට හා එයින් යහපත් ධර්ම ගෙන අයහපත් ධර්ම අතහැර දැමීමටත් පුළුවන්කම ඇතිවේ. උපමා වශයෙන් උපගණ්හන ලක්ෂණය සක්විති රජුගේ පරිනායක රත්නයමෙනි. ඔහු රජහට හිතාහිතයන් විමසා දැන අහිතවතුන් දුරුකොට හිතවතුන් ළංකොට ගන්නාක්මෙන් උපගණ්හනය ලක්ෂණකොට ඇති ස්මෘති-

යද කාය දුශ්චරිතාදී අහිතකර ධර්මයන් දැන දුරුකොට හිතකර ධර්මයන් විමසා දැන ලංකොට ගනිති. මෙසේ බැවින් ස්මෘති චෛතසිකය එකාන්ත කුශල චෛතසිකයකි.

සතියෙහි රසය කුමක්ද? මෙහි රසය යනු සතියෙන් කරන කෘත්‍යයයි. අසම්මොස රසා, සතියෙන් හෙවත් සිහියෙන් කරනුයේ ස්මෘති විප්‍රවාසය අමතකවීම නැතිකිරීමයි. සිහිය මැනවින් ඇති තැනැත්තා හට අමතකවීමක් නම් නොවන්නේය. සතියෙහි පච්චුපට්ඨානය වැටහෙන කාරණය කුමක්ද? ආරක්ඛ පච්චුපට්ඨානා, විසයාභිමුඛ භාව පච්චුපට්ඨානා වා සිත වැරදි අරමුණුවලට යානොදී රැකගැනීම හෝ අරමුණුවලට අභිමුඛවීම සතියෙහි පච්චුපට්ඨානයයි.

එහි පදට්ඨානය හෙවත් සතිය පිහිටා තිබෙන්නේ කවර පදනමකද? **ථිරසඤ්ඤාපදට්ඨානා, කායාදි සතිපට්ඨාන පදට්ඨානා වා,** හිතෙහි ස්ථිර බව පදනම්කොට ඇත්තේ සතියයි. නිතර වෙනස් වෙන චපල අදහස් ඇතියෙකු හට සම්මා සතිය ඇතිකර ගැනීම අමාරු දෙයකි. එබැවිනි සතිය ස්ථිරත්වය පදනම්කොට ඇත්තේ. එසේම කාය ආදී සතිපට්ඨාන ධර්මයන් අනුව බැලීමෙන්ද සම්මා සතිය ඇතිවේ. එබැවින් සතිපට්ඨාන ධර්ම්ය තුඩු සතිපදට්ඨානයන් ලෙස සැලකිය යුතුයි.

යහපත් සිහිය හොඳ අරමුණෙහි ස්ථිරව නොසැලී සිටින බැවින් එසිකාසථම්භයක්-ඉන්ද්‍රඛීලයක්-එලිපතක්මෙන් නිශ්චලය. චක්ඛුද්වාරාදියෙන් රූපාදී අරමුණු නුණුවන ලෙස ගැනීමට ඉඩ නොදෙන බැවින් ද්වාරාරක්ෂකයෙකු-දොරටුපාලයෙකු මෙනැයිද කිය හැකියි. සතිය වනාහි හැම කුසල චෛතසිකයක් සමගම යෙදෙන්නකි. ලුණු හැම ව්‍යඤ්ජනයකටම අවශ්‍ය වන්නාසේ සතිය හැම කුසලයකටම අවශ්‍යයි. මෙසේ හෙයින් හොඳ කුසල් අදහස් ඇතිකර ගැනීමට සතිය කෙතරම් උවමනාදැයි කල්පනා කර බැලිය යුතුයි. දැන් සම්මා සතියට පදට්ඨානව පවත්නා අත්තිවාරම් වශයෙන් ඇතිවිය යුතු ඒ සතිපට්ඨාන ධර්මයන් දෙසට හැරෙමු. කලක් මුළුල්ලෙහි නොයෙක් නරක දෙයට පුරුදුව ඇති අපේ සිත කැලෙන් බැඳගත ආ කුළු ගොණෙකුසේ නිතරම හොඳ අරමුණු දෙසට වඩා නරක අරමුණු දෙසට ඇදීයයි. කැලෙන් ගෙනා කුළු ගොනා නැවත කැලයට යා නොහැකි වනසේ රැහැනකින් බැඳ එලිමහනට ගෙනවුත් සවි ශක්තිය ඇති කණුවක බැඳ උගේ කුළුගතිය නැතිවී හේ වනතුරු ආහාරද නොදී තැබිය යුතුයි.

එසේම මේ රූපාදී අරමුණු කෙරෙහි කාමාසාදිය උපදවමින් එයටම පැන යන සිත සති නමැති රැහැනින් බැඳ ගෙන වුත් කායානුපස්සනා ආදී සතිපට්ඨාන ධර්මයක බැඳ ටික කලක් හේ වන-තුරු තැබිය යුතුවේ. එසේ සතිපට්ඨාන ධර්මයනට මැනවින් පුරුදුවූ සිත කුලෑටිකම නැතිවී හේ වූ ගවයා නැවත ඕනෑකමින් කැලයට ඇරියත් එහි නොරඳන්නාසේ රූපාදී අරමුණු කරා ගියත් එහි නිසරු බව දැක නැවත සතිපට්ඨාන ධර්ම නමැති කණුව වෙතටම පැමිණේ.

දැන් මේ සිත දමනය කරගැනීම සඳහා සිත නමැති කුළුවස්සා සති නමැති රැහැනින් සතර සතිපට්ඨාන ධර්ම නමැති ටැඹෙහි බැඳිය යුතු බව අපි දනිමු. ඒ සතිපට්ඨාන ධර්ම යනු මොනවාදැයි සිතා බලමු. සතිපට්ඨාන යනු කුමක්ද? "තෙසු ආරම්මණෙසු ඔක්කන්දිත්වා පක්ඛන්දිත්වා උපට්ඨානතො උපට්ඨානං සතියෙව උපට්ඨානං සතිපට්ඨානං" ඒ ඒ කාය ආදී ආරම්මණයන් කෙරෙහි පණිමින් මෙන් එළඹ සිටීම හෙවත් ඒ අරමුණුවලට ලංව සිටීම උපට්ඨාන නම්. සතියම ඒ අරමුණු වෙත එළඹ සිටීම් සඞ්ඛ්‍යාත උපට්ඨානය කරන බැවින් 'සතිපට්ඨාන' නම්වේ. එනම් කාය, වේදනා, චිත්ත, ධම්ම යන මේ සිව් වැදෑරුම් ධර්ම කෙරෙහි උපදවා ගත් සිහි ඇතිවීම 'සතිපට්ඨාන' නමැයි සිහි තබාගත යුතුයි.

මීලඟට ඒ සිහි උපදවා ගනිමින් බැලිය යුතු කාය, වේදනා, චිත්ත, ධම්ම යන කරුණු සතර වෙන වෙනම ගෙන බලමු. පළමු-වෙන්ම ඇත්තේ කායානුපස්සනා සතිපට්ඨානයයි. එනම් එළඹ සිටි සිහියෙන් යුක්තව කය අනුව බැලීමයි. මෙහි 'කාය' නම් සත්වයන් පිළිබඳව පවත්නා චක්ෂුරින්ද්‍රියයට ගොචරවූ හෙවත් ඇසට පෙණෙන රූප කායයයි දතයුතුවේ. 'කාය' යන වචනයේ සාමාන්‍ය අදහස 'සමූහය' යනුයි. ඇතුන්ගේ සමූහයට 'හස්තිකාය' කියාද, රථ පිළිබඳ සමූහයට 'රථකාය' කියාද ව්‍යවහාර වන්නේ එහෙයිනි. එලෙසින්ම අපේ මේ රූප කායයද ගොනුවක් ලෙස එක ගොඩක් වශයෙන් බලනවිට එකක් වුවද ගොනුව ලිහා (ඝන විනිර්භෝගකොට) බලනවිට රූප ධර්ම සමූහයකගේ එක රුසි-තාවක් එක් රැස්වීමක් මෙහි තිබේ. ඒ හැම රූපයක්ම පිරිසිදු දේද නොවේ. ඉතා පිළිකුල් කටයුතු රූප කොටස්ය. කරත්තය-කැයි කියන්නේ රෝද, බෝඹු, තට්ටු, අඹරු ආදී කොටස් රැශියක් එක්ව ඇති වාහනයකටයි. එසේම 'කාය' යයි කියන්නේ කෙස්, ලොම්, නිය, දත් ආදී දෙතිස් කුණප කොටස් රැසක් එක්ව පවත්නා දේහයකටයි.

එබැවින් **"කුච්ඡිතානං හි පරම ජෙගුච්ඡානං සො ආයො 'ති' පි කායො"** යනුවෙන් ඉතා පිළිකුල් කටයුතු කුණප රැසක එක්ව පැවත්ම හෙවත් කුණපයන්ගේ සමූහය 'කාය' යි දතයුතුයි. 'සති' යෙන් යුක්ත තැනැත්තේ මේ කය දෙස බැලිය යුත්තේ නිත්‍ය-සුභ-සුඛ ගති ඇති වටිනා ලබාගත යුතු රසවත් දෙයක් ලෙසින් සිතා නොවේ. සිහිය ඇති තැනැත්තා කය දෙස බැලිය යුතු අයුරු කායානුපස්සනා සතිපට්ඨානයෙහි පෙනේ. මෙසේ කය අනුව ගිය සිහිය ඇත්තා විසින් සත්වයෙක-පුද්ගලයෙක කියා හෝ ස්ත්‍රියක, පුරුෂයෙක කියා හෝ රූපය දෙස නොබලයි. ඔහු ඒ රූපය සෑදී ඇති ඒ පිළිබඳව පවත්නා ගොනුව ලිහා (=ඝන විනිර්භෝගයකොට) බලයි. රථයක රෝද (රථචක්‍ර) ආදිය වෙන්-කොට දක්නා තැනැත්නා හට රථයකැයි දෙයක් නොපෙනේද රථ චක්‍රාදී අවයව ගොඩක් පෙනේද එසේම ඝන විනිර්භෝගයකොට ගොනුව ලිහා බලන්නා හට ස්ත්‍රියක-පුරුෂයෙක කියා යමෙක් නොපෙනේ. කෙස්-ලොම් ආදී කුණප සමූහයක්ම පෙනේ. එසේ දක්නා තැනැත්තේ ඒ කුණප රැශිය පිළිකුල් ලෙස හා අනිත්‍ය, දුඃඛ, අනාත්ම පරිදි සළකා බලයි මෙසේවූ කායානු-පස්සනා සතිපට්ඨානයෙහි පළමුවෙන් කය පිළිබඳව පවත්නා ආශ්වාස ප්‍රශ්වාස කාය (හුස්ම ඉහළ පහළ ගැනීම) ගැන සිතයි එසේ හුස්ම ඉහළ පහළ ගැනීම පිළිබඳ නුවණින් යුක්තව සළකා බැලීමට ආනාපාන සති භාවනාවයයි කියමු.

මේ ආනාපාන සති භාවනාව හිත එකඟකර ගැනීමට ඉතා පහසු භාවනා ක්‍රමයකි. එය සියළුදෙනා විසින්ම දිනකට අඩු ගණනේ මිනිත්තු කීපයක්වත් වැඩීමට උත්සාහ දැරිය යුතුයි. මෙසේ භාවනාවක යෙදෙන තැනැත්තාට විවේක ස්ථානයක් අවශ්‍යයයි. පහසුවෙන් හිත එකඟ කරගත හැකිවුත් වික වේලාවක් සිටීමට පහසුවූත් ඉරියව්වක්ද උවමනා කෙරේ. එබැවින් තථාගතයන් වහන්සේ එයට සුදුසු තැන හා ඉරියව්ව දක්වීම සඳහා **"ඉධ භික්ඛවෙ භික්ඛු අරඤ්ඤගතො වා රුක්ඛ-මූලගතොවා සුඤ්ඤාගාරගතොවා නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා"** යන ආදීන් එසේ භාවනා කරණු කැමති යොගී (=මහණ) තෙමේ ජනයාගෙන් විවේකවූ මහ වනයකට හෝ, ගසක් මූලකට හෝ, හිස් ගෙයකට ගොස් බඩපයිඹකයෙන් කය සෘජුව කෙලින් තබාගත සිහි උපදවා ගත යුතු බව දක්වා වදාළහ. විශෙෂයෙන් මෙසේ බඩපයිඹක-යෙන් සිටින යොගියාගේ කය කෙලින් තබාගත යුතුවාක්මෙන්ම දෙනෙත්ද නාසිකාව අග බලනසේ නාසිකාග්‍රය දෙස දෘෂ්ටිය හෙළිය යුතුයි. ඇස් පියා ගතහොත් නිදිමත හෝ හොඳව

දෙනෙත් හැර ඇත පෙණෙනසේ සිටියහොත් නොයෙක් අරමුණු පෙණී සිත වෙනස්වීමට හෝ පැමිණිය හැකි බැවිනි. දැන් මෙසේ සිටි යොගියා තමා විසින් පිටට හෙළන්නාවූද ඇතුළට ඇදගන්නාවූද ආශ්වාස ප්‍රශ්වාසය ගැන මෙනෙහි කළ යුතුයි. ගණන් වශයෙන් හුස්ම පිට කරනවිට එකයි කියාද ඇතුළට ඇදගන්නාවිට දෙකයි කියාද යන ආදී නයින් දහය දක්වා ගැණිය යුතුයි. දහයෙන් එහා ගණන දික්කළ යුතුද නැත. දහයට ගැණීමෙන් පසු නැවත එකේ සිට ගැණීම කළ යුතුවේ. මෙසේ මේ භාවනාව කරනවිට සිහියෙන් යුතුවම දීඝීව හෝ හ්‍රස්වම ආශ්වාස ප්‍රශ්වාස කරනවිට ඒ බව මෙනෙහි කරමින්ම සියළු ආශ්වාස ප්‍රශ්වාස කායය ගැන සළකා බලමින් කායදරථ (=කාය පිළිබඳ කලාන්තය) එයින් සන්සිඳෙන බව සිතමින් ආශ්වාස ප්‍රශ්වාස කළ යුතුයි. මෙසේ තමාගේ කයෙහි මෙන්ම අනුන්ගේ කයෙහි පවත්නා ආශ්වාස ප්‍රශ්වාසයන් ගැන සිතන්නේය. මේ ආශ්වාස ප්‍රශ්වාස කායයාගේ ඇතිවන අයුරු හා එය නැතිවී යන අයුරු සිතන්නේය. මේ ආශ්වාස ප්‍රශ්වාසයන් නිසා පවත්නා ජීවිතයක් වුත් සත්වයෙක්, පුද්ගලයෙක් නැතැයි සිතන්නේය.

මෙසේ සිතීම ඔහුගේ ඥාණය හා සිහිය වැඩීම පිණිස වේ. ඔහු තෘෂ්ණා-මාන-දෘෂ්ටි වශයෙන් ගෙන සත්ව ලොකයෙහි කිසි රූපාදියක් ආත්මාදී වශයෙන් වරදවා නොසිතති. මේ ආනාපාන සතිය කය පිළිබඳව සිහියෙන් යුක්තව බැලීමේ එක ක්‍රමයකි.

මෙසේම කායානුපස්සනා සතිපට්ඨානය වඩන තැනැත්තේ ඔහු විසින් පවත්වන ගමන් කිරීම්, සිටීම්, හිඳීම්, සයනය කිරීම් යන හැම ඉරියව්වකදීම සිහියෙන් යුක්ත වෙයි. එසේ සිහියෙන් යුක්තව ඉරියව් පැවැත්වීමද කායානුපස්සනා සතිපට්ඨාන ක්‍රමයකි.

මෙලෙසින්ම ඔහු ඉදිරි පසු ගමන් කිරීම්, ඉදිරි බැලීම් හා අවට බැලීම්, අත් පා නැවීම්, දිග හැරීම්, පා සිවුරු දැරීම්, කෑම්, පීම්, රස විඳගැනීම්, මල මූත්‍ර පහකිරීම්, යාම, සිටීම, හිඳීම, නිදීම්, නොනිදීම්, කථා කිරීම්, කථා නොකිරීම් ආදී හැම කෘත්‍යයක්ම ප්‍රඥාවෙන් දැන සිහියෙන් යුක්තවම කරන්නාහ. එයද කායානුපස්සනා සති-පට්ඨාන ක්‍රමයකි.

නවත් අයුරකින් මෙසේ කය අනුව බලන යොගී තෙමේ එය කුමකින් සම්පූර්ණව ඇති දෙයක්දැයි විමසන්නේය. එවිට ඔහුට කෙසානතයෙහි පටන් අපාදනතය දක්වා මේ සිරුර නන් අයුරුවූ කුණපයන්ගෙන් පිරී ඇති බව පෙනෙන්නේය. මේ කයෙහි

කෙස්, ලොම්, නිය, දත්, සම, මස, නහර, ඇට, ඇට මිදුළු, වකුගඩුව, හෘදය, කෑවුන, දලබුව, බඩදිව, පපුමස, බඩවැල, අතුණුබහන, නොපැසුන පැසුන ආහාර පිත, සෙම, සැරව, ලෙය, ඩහදිය, මෙදතෙල, කඳුළු, වුරුණුතෙල, කෙල, මුකුණු හෙවත් සොටු, සඳමිදුලු මූත්‍ර යන මේ දෙතිස් කුණු කොටස් මිස ස්ත්‍රියක, පුරුෂයෙක යනාදී හැඟීම්ද ඔහුට පහළ නොවේ.

දෙපැත්තේම මුවවිට (කට) ඇති මල්ලක හැල් වී, මුං, මෑ, තල, සහල් ආදිය දමා දෙපැත්තෙහිමවූ කටවල් බැඳ තිබෙනු දුටු පුරුෂයෙක් ඒ කටවල් ලිහා අර වී ආදී ධාන්‍ය බිමට හලා මේ වීය, මේ මුං, මෑ, තල ආදියයයි වෙන වෙනම දක්නේ යම්සේද මෙසේ කාය දෙස බලන යොගියාටත් සත්ව, පුද්ගල, ස්ත්‍රී, පුරුෂ, හතුරු, මිතුරු යනාදී හැඟීම් නැතිව කාය නමැති මල්ල ඇතුලෙහි ඇති දෙතිස් කුණප වෙන වෙනම පෙනේ.

මෙසේ තමාගේ කායමෙන්ම අනුන්ගේ කායක් දෙතිස් කුණපයෙන් යුතුය. ඇතිවීම හා නැතිවීම සවභාවකොට ඇත්තේයයි කාය පිළිබඳව සිතයි. මේ කුණපයන්ගෙන් යුත් කායක් ඇත්තේයයි ඔහුගේ සිහියට වැටහෙන්නේය. ඒ සිහිය ඤාණයාගේ හා සිහියෙහි වැඩීම පිණිසම වන්නේය. එබඳු කාය දෙස තෘෂ්ණා, මාන, දෘෂ්ටි වශයෙන් නොබලන්නේය. ආත්ම වශයෙන් ගැන්මක්ද නැත්තේය. මෙසේ කාය පිළිබඳව ඇති දෙතිස් කුණු කොටස් ගැන සිතා බැලීමද කායානුපස්සනා සතිපට්ඨානය වඩන ක්‍රමයකි.

කායානුපස්සනාව වඩනා යොගියා මේ කාය සතර විනිභෝගයකොට (ගොනුව ලිහා) බලයි. එහිදී ඔහුට මේ කාය ස්ත්‍රී, පුරුෂාදීන් ලෙස නොව තද ගතිය (=පඨවි) වැගිරෙන ගතිය (ආපො) උෂ්ණය (තෙජො) වාතය (=වායො) යන මේ ධාතූන්ගේ සංයොගයක් එක්වීමක් ලෙස පෙණෙයි. ගවයන් මරන්නෙක් ගවදෙනක් ගෙන ගොස් සතරමං සන්ධියකදී මරා ඇයගේ මස් විකිණීම සඳහා ගොඩවල් සතරකට වෙන්කර තබාගන සිටියොත් එහි පැමිණෙන මිනිස්සු ඒ වෙන්කර ඇති කොටස්වලට මස් ගොඩවල්යයි කියති. ගව දෙනයයි නොකියති. එසේම මේ කාය ධාතු වශයෙන් පඨවි, ආපො, තෙජො, වායො යන සිවු කොටසට බෙදා බලන යොගියාහට ඒ සිරුර පිළිබඳ ධාතු කොටස් මිස ස්ත්‍රී, පුරුෂ සංඥවන් ඇති නොවේ. මෙසේ තමාගේ කාය මෙන්ම අනුන්ගේ කායත් ධාතු වශයෙන් බලමින් ඇතිවීම්, නැතිවීම් දෙක හෙවත් උදයව්‍යය යුකත බව බලමින් සිටින යොගි තෙමෙ මෙය ධාතූන්ගේ එක්

වීමෙන් ඇතිවූ කයය යන සිහිය ඇත්තේ ඒ සිහියම ඤාණයාගේ හා සිහියෙහි නව නවත් දියුණුව සඳහා යොදන්නේ මේ ලොක-යෙහි තෘෂ්ණා මාන දෘෂ්ටි වශයෙන් නොබැඳී ආත්මයක් ඇතැයි නොසිතා වාසය කෙරෙයි. මෙය කායානුපස්සනාව ධාතු වශයෙන් වඩන අයුරුයි.

එසේම මේ යොගී තෙමේ මරණයෙන් පසු මේ කාය පිළිබඳව ඇති අශුභතාව සිවථික වශයෙන් බලයි. සිවථික යනු සොහොනට නමකි අමු සොහොනක දමා ඇති මලමිණියක් ගැන දවස් පතා වෙනස්ව යන අයුරු සිතීම මෙහි සිවථික යන්නෙන් අදහස් කරයි. හේ සොහොනක දමූ මල මිණියක් දෙසට තම සිත යොමු කරයි. එය මැරී එක දිනක් දෙකක් හෝ තුණක්වූ ඉදිමී නිල්ව ගිය නට ගත් සැරව ඇති සිරුරකි. එය බලා ඔහු මෙසේ සිතයි මේ කුණුව යන සිරුර යම්සේද මගේ මේ සිරුරත් මේ සවභාවයම ඇත්තේය. මේ අයුරින්ම වන සුළුය. මේ ගතිය නොඉක්ම වූවකි. මගේ මෙන්ම අන් හැමදෙනාගේ සිරුරුද මේ අයුරටම පත්වෙත්. ඇතිවීම හා නැතිවීම සවභාවකොට ඇත්තාහ. කය කැයි කියනත් එය කුණපයකි. එසේ පහළවන සිහිය ඔහුගේ ඤාණයේත්, සිහියෙත් දියුණුව පිණිසම පවතී. තෘෂ්ණා, මාන, දෘෂ්ටිනට ගොදුරු නොවී ලොකය අනාත්ම වශයෙන් සලකා වාසය කෙරේ. මේ අයුරින් කවුඩු, උකුසු, ගිජුලිහිණි, බලු, හිවල් ආදී නා නා ප්‍රකාර ප්‍රාණීන් විසින් කනු ලබන සොහොනෙහි දමූ සිරුරක් දැක ඒ දෙවෙනි සිවථිකයද, මස්, ලේ සහිතවූ නහර වැල් වලින් එකට සම්බන්ධවූ ඇටසැකිල්ලක් දැක ඒ තෙවන සිවථිකයද, මස් දියවී ගිය ලේ වැකුණු නහර වැලින් එකට සම්බන්ධවූ ඇට සැකිල්ලක් දැක ඒ සිවුවන සිවථිකයද, සම්පූර්ණයෙන් දියව වියලී ගිය මස් ලේ ඇති නහර වැලින් එකට බැඳුනු ඇටසැකිල්ලක් දැක ඒ පස්වෙනි සිවථිකයද, සම්බන්ධයන්ගෙන් ගැලවී ගිය එහෙයින්ම වෙන්වූ ඇට ඇති අත් ඇට පසෙකද, පා ඇට පසෙකද, කෙණ්ඩා ඇට හා කලවා ඇටද, උකුල් ඇටය, කොඳු ඇටය හා හිස් කබල ආදී වෙනම තැනින් තැන විසිරී ගිය සිරුරක් දැක ඒ සවෙනි සිවථිකයද සක්මෙන් සුදුවූ ඇට ඇති සිරුරක් දැක ඒ සත්වෙනි සිවථිකයද බොහෝ පරණවූ සුණුව කැපිවී ගිය සිරුරක් දැක ඒ අටවෙනි සිවථිකයද කුණුවූ සුණුව ගිය ඇට දැක ඒ නවවෙනි සිවථිකයදැයි මෙසේ සොහොනෙහිවූ ශරීරයක් ඒ ඒ අවස්ථාවන් හිදී වෙනස්වී යන අයුරු බලමින් තමන්ගේ සිරුරද ඒ සවභාවය නොඉක්මවන ලදයයි තමා වෙතද ඒ හැම තත්වයක්ම ආරෝපණය කර බලයි. අන්හැමදෙනාගේ සිරුරුද එලෙසින්ම වෙනස්වේයයි

සිතයි. මෙසේ ඇතිවීම හා නැතිවීම ගැන සළකා බලන්නේ සත්ව පුද්ගල සංඥවක් ඇතිකර නොගනී. මේ කියන ලද අයුරින් කාය පිළිබඳව සිහියෙන් යුක්තව සිතන තැනැත්තා කායානුපස්සනා සතිපට්ඨානයෙන් යුක්තය. ඔහුගේම සම්මාසතිය යහපත්ය.

මීලඟට ඇත්තේ වේදනානුපස්සනාවයි. එය සුඛ වේදනා, දුක්ඛ වේදනා හා උපෙක්ඛා වේදනායී ත්‍රිවිධය. අදුක්ඛ මසුඛ වේදනා යනුද උපෙක්ඛා වේදනාවටම කියන අනික් නමකි. එසේම ගිහිගෙය පිළිබඳව විඳින්ට සිදුවන්නේ සාමිස වේදනායි නෛෂ්ක්‍රම්‍යය මුල්කොට විඳින්ට සිදුවන්නේ නිරාමිස වේදනායි. මේ අයුරින් සුඛ-දුක්ඛ-උපෙක්ඛා-සාමිස සුඛ දුක්ඛ උපෙක්ඛා-නිරාමිස සුඛ දුක්ඛ උපෙක්ඛා වේදනාවන් විඳිනවිට මේ විඳින්නේ මෙනම් වේදනාවයයි සිහියට නගා ගනීද, තමා මෙන්ම අනුන් පිළිබඳවද ඒ වේදනාව එසේමයයි සළකාද උදය ව්‍යය සිතමින් වේදනාවක් ඇතැයි ඔහුගේ හැඟීම ඤාණයාගේ හා සිහිය පිළිබඳ දියුණුව සඳහාම වේද, තෘෂ්ණා දෘෂ්ටි විරහිත හේ කිසිවක් ආත්ම වශයෙන් නොගනී මේ අයුරින් සිතන තැනැත්තා වේදනානුපස්සනා සතිපට්ඨානයෙන් යුක්තය.

තවද යෝගී භික්ෂුව චිත්තානුපස්සනා භාවනාවෙහිද යෙදෙයි. චිත්තානුපස්සනා යනු සිත හැසිරෙන තත්වය අනුව සළකා බැලීමයි. තමාගේ සිත සරාගී වනවිට හා වීතරාගී වනවිටද, ද්වේෂ (=තරහ) සහිත වනවිට හා ද්වේෂ විරහිත (=තරහ නැති) වනවිටද, මෝහ (=මෝඩ) යෙන් යුක්ත වනවිට හා අමෝහයෙන් යුක්ත වනවිටද සංඛිත්ත හෙවත් කලබල නොවනවිට හා වික්ෂිප්ත හෙවත් කලබල වනවිටද, මහග්ගත හෙවත් රූපාවචර අරූපාවචර චිත්තය හා අමහග්ගත හෙවත් කාමාවචර චිත්තය දැයි මේ ආදී වශයෙන් සිත පවත්නා අයුරු වෙන වෙනම සිතා බලයි. තමාගේ මෙන්ම අනුන්ගේ සිත්ද පවත්නා ක්‍රමය එසේ බව සිතයි. සිත පිළිබඳ උදයව්‍යය දකියි. මෙසේ සිහියෙන් යුක්තව සිත දැකීම ඔහුගේ ඤාණය හා සිහිය වැඩීම පිණිසවේ. තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ගෙන ආත්ම වශයෙන් කිසිවක් ගැන නොසළකයි. මෙසේ බැලීමෙන්ද සතිය දියුණුවේ. එසේම එය චිත්තානුපස්සනා සතිපට්ඨානයයි.

මෙසේම සම්මාසතිය දියුණු කරගනු කැමති යෝගී තෙමේ ධම්මානුපස්සනා සතිපට්ඨානයද මෙනෙහි කරයි පළමුකොට කාමච්ඡන්ද – ව්‍යාපාද– ථීනමිද්ධ – උද්ධච්ච– කුක්කුච්ච– විචිකිච්ඡා යන පඤ්ච නීවරණයන් අතුරෙන් මේ මේ නීවරණය තමාගේ සිත්හි පහළවූ නොවූ බව සළකමින් ඒ නීවරණ බැහැර කර නැවත

නොඉපදනා පරිදි දැන ගන්නේය. එය පෙර කියනලද අයුරින්ම අධ්‍යාත්මික බාහිර වශයෙන් හා උදයව්‍යය වශයෙන්ද බලන්නේය. ඒ සිහිය තමාගේ දැනීම පිණිස හා සම්මාසතිය දියුණුවීම පිණිස පවත්වා ගනිමින් තෘෂ්ණා දෘෂ්ටි විරහිතව ආත්ම සංඥාවෙන් තොරවද වසන්නේය.

එසේම රූප–වේදනා–සංඥා–සංස්කාර–විඥාන යන පඤ්චස්කන්ධයද ඇතිවීම, ඇතිවීමේ හේතුව නැතිවීම හා නැතිවීමේ හේතුවද බලයි එලෙසින්ම චක්ඛු–සෝත–ඝාණ–ජිව්හා–කාය–මන යන ආයතනයන් හා රූප–ශබ්ද–ගන්ධ–රස–ස්පර්ශ–ධර්ම යන ආයතනයන්ද ඒවායේ සුදුසු පරිදි ගැටීමෙන් ඇතිවෙන සංයෝජනයන්ද ඒ සංයෝජන ප්‍රහාණයද දැනගනී.

නැවත සති–ධම්ම විචය–විරිය–පීති–පස්සද්ධි–සමාධි–උපෙක්ඛා යන සප්තබොධ්‍යඞ්ගයන්ද ඒවා තමාගේ සිත්හි ඇති නැති අවස්ථාවන්ද ඇතිවූ බොධ්‍යඞ්ග දියුණුකර ගන්නා අයුරු හා නැතිවූ බොධ්‍යඞ්ග ඇතිකර ගන්නා අයුරුද දැනගනී. එසේම දුක්ඛ–සමුදය–නිරොධ–මාර්ග යන චාතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් තත්වූ පරිදි දැනගනී. මෙසේ මේ ධර්ම සිහියට නැගෙන්ම ඔහුගේ ඥාණයද සම්මාසතියද දියුණුවේ. තෘෂ්ණා, දෘෂ්ටි දෙකින් කරණ කල්පනා නැතිවේ. ආත්ම සංඥාව දුරුවේ මේ අයුරින් දැක්වූ සතිපඨාන භාවනාව නිසා සම්මාසතිය සිත්හි වැඩෙන බව සැලකිය යුතුයි. මේ දැක්වූයේ සම්මාසතියට අත්‍යවශ්‍යවාරම වශයෙන් පවත්නා පදඨාන ධර්ම සඞ්ඛ්‍යාත සතර සතිපඨාන ධර්ම වෙති. මෙතෙක් අප විසින් දක්වන ලදුයේ බොහෝ විස්තර විභාග දැක්විය යුතු දහම් කොටස් රැසක ලෙශමාත්‍රවූ හැඳින්වීමකි. සම්මාසතිය දියුණුකර ගනු කැමැත්තෝ තව තවත් ඒ පිළිබඳව කාරුණ්‍ය විමසා දැන ඒවූ පරිදි පිළිපැදීමෙන් ශාන්තවූ නිවන් සුව පසක් කර ගනිත්වා!

# සම්මා සමාධිය.

රන්දෙණිබේ ශික්ෂාලඞ්කාර විද්‍යාලයාධිශ්වර කහවේ සිරි ශොභනාරාමාධිපති සිරි සද්ධම්ම වංශාලඞ්කාර විසුද්ධාචාර කවිධජ විනයාචරිය හක්මන සිරි සංඝතිස්ස නායක මහා ස්ථවිර පාදයන් වහන්සේට කොළඹ උබයසේකරපුර අභිනවාරාමයෙහි නියමිත ධර්මදේශනාව තච්ඡිෂ්‍ය හක්මන හේමානන්ද ආයුෂ්මතුන් විසින් පැවැත්වීන.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

තත්ථ කතමො සම්මා සමාධි? යා චිත්තස්ස ඨිති සම්මා සමාධි සමාධි සම්බොජ්ඣඞ්ගො මග්ගඞ්ගං මග්ග පරියාපන්නං අයං වුච්චති සම්මා සමාධි.

සින්වත්නි,

දැන් මා මාතෘකා කළේ පැසසිය යුතු ගුරු භක්තියක් ඇති මොරටුවේ උගත් සිරි සාසනවංස ස්ථවිරයන් වහන්සේගේ සදුප දේශයෙන් ශික්ෂාකාමී සවකීය ආචාර්‍ය ශ්‍රී අරියවංශ මහා ස්ථවිර පාදයන් වහන්සේගේ ගුණානුස්මරණය කරණු වස් පිහිටුවන ලද ශ්‍රී ආර්‍යවංශ ගුණානුස්මරණ සමිතිය විසින් දේශනා කරවනු ලබන ධර්මදේශනා පඞ්ක්තියෙන් අවසාන දේශනාව වන සම්මා සමාධිය විස්තර කිරීමටයි. දැන් මාතෘකා කළ මේ පාඨය විස්තර කර දීමට පළමුව ධර්මානිසංශයක් කියාදීම යුතුවූවද මේ පිරිස දිනපතා ප්‍රසිද්ධ ධර්මදෙශකයන්ගෙන් නොයෙක් අවවාද අසා තිබෙන බැවින් ඒ ගැන දීඝී කථාවක් නොකරමි.

මේ කාලයෙහි මා අසනීපයෙන් පසුවන බැවින් පහසු ලැබුනු විටක ධර්ම කොපිය ලියා දෙන අදහසින් අප ශිෂ්‍ය හක්මන හේමානන්ද තැනට මේ ධර්මදේශනාව කරන්න නියම කෙළෙමි.

සත්තිස් බෝ පැකි දහම් දේශනා කරවා ඒ දේශනාවන් ධර්ම දේශකයන් ලවා සැකෙවින් ලියවා ගෙන මුද්‍රණ ද්වාරයෙන් ලෝකයා අතට දීම මේ සමිතිය මගින් කරණ මහගු සේවයකි.

දැන් මේ සම්මා සමාධිය පිළිබඳව ඉතා සැකෙවින් කැරෙන විස්තරය සාවධානව ඇසිය යුතුයි.

මුලින් මාතෘකා කළ පාඨය අප බුදුරජාණන් වහන්සේ විසින් වදාල "විජම් පෙළේ" විභඞ්ග ප්‍රකරණයට අයත් මාර්ග විභඞ්ග ගත පාඨයෙකි.

යථොක්ත මාතෘකා පාඨයෙහි පදගතාර්ථ මෙසේය. එහි සම්‍යක් සමාධිය කවරේද? සිතේ යම් පැවැත්මක්වේද, අරමුණෙහි සිත මනාකොට පිහිටුවාද, සමාධි සම්බොධ්‍යඞ්ගයක්වේද, මාර්ගාඞ්ග-යක්වේද, ඇතුලත්වේද මේ සම්‍යක් සමාධියයි කියනු ලැබේ.

මේ සම්‍යක් සමාධිය ඉතා සියුම් දුරවබෝධ ධර්මයෙකි. එහෙයින් ලෝකෝත්තර ආර්‍ය්‍ය මාර්ගාඞ්ග අට අතුරෙන් එකක්වූ මේ සම්‍යක් සමාධිය ව්‍යඤ්ජනච්ඡායා වශයෙන් අර්ථගෙන රූපා රූප භවයන්හි ප්‍රතිසන්ධිය දෙන්නාවූ ලෞකික මහද්ගත සමාධියක් හෝ කාමාවචර ක්‍ෂණික සමාධි මාත්‍රයෙකැයි හෝ වරදවා තේරුම් නොගත යුතුවේ.

පාලි භාෂාවෙන් සම්මා සමාධි කියාද, සංස්කෘත භාෂාවෙන් සම්‍යක් සමාධි කියාද මෙය ව්‍යවහාරයි. මෙය සංස්කාර ස්කන්ධයට ඇතුලත් චෛතසික ධර්මයකි. එනම් එකාග්‍රතා චෛතසිකයයි. සිංහලයෙන් එකඟ බවයයි කියනු ලැබේ. මේ සම්‍යක් සමාධිය විතර්කාදී ප්‍රතිපක්‍ෂ ධර්මයන්ගෙන් දුරවූ අවිතර්කාදී අඞ්ග පසකින් යුක්තාවිය යුතුය.

**"එහෙයින් බුදුරජාණන් වහන්සේ"**

**"තත්‍ථ කතමො සම්මා සමාධි? ඉධ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති විතක්ක විචාරණං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොධි භාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උප සම්පජ්ජ විහරති පීතියාච විරාගා උපෙක්ඛකොච විහරති සතොච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියං ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛ විහාරීති තති-යජ්ඣානං උපසම්පජ්ජ විහරති සුඛස්ස චපහාණා දුක්ඛස්ස චපහාණා පුබ්බෙව සොමනස්ස දොමනස්සානං අත්‍ථගාමං අදුක්ඛ මසුඛං උපෙක්ඛා සති පාරිසුද්ධිං"**

**"චතුත්‍ථජ්ඣානං උපසම්පජ්ජ විහරති අයං වුච්චති සම්මා සමාධි"** යනු වදාළහ

එහි සම්‍යක් සමාධිය කවරේද? මේ ශාසනයෙහි යෝගාවචර භික්‍ෂුතෙමේ පඤ්චකාමයන්ගෙන් වෙන්වම පඤ්චනීවරණ සඞ්ඛ්‍යාත අකුශලයන්ගෙන් වෙන්වම විතර්ක (යම්කිසි අරමුණක සිත් නැඟීම් සවභාව) සහිතවූ විචාර (සිත එහි හැසිරවීම්) සහිතවූ (නීවරණයන් ගෙන් සිත දුරුවීමෙන් හුදකළාවූ) විවේකයෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැප ඇති ප්‍රතිමධ්‍යානයට ඉපදවීම් වශයෙන් පැමිණ වාසය කෙරේද, විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් විතර්ක රහිතවූ විචාර රහිතවූ සිත එකඟ කිරීමවූ සමාධියෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැප ඇති විතීය ධ්‍යානයට පැමිණ වාසය කෙරේද? ප්‍රීතියෙන් නොඇල්මෙන් උපෙක්‍ෂා ඇතිව සිහි ඇතිව සම්‍යක් ප්‍රඥ ඇතිව වාසය කෙරේද? කයින් සැපයද විඳිසි. යම් ධ්‍යානයකට පැමිණි පුද්ගලයෙකු සඳහා මෙතෙම උපෙක්‍ෂා ඇත්තෙක සිහි ඇත්තෙක සැප විහරණ ඇත්තෙකැයි ආර්‍ය්‍යයෝ කියත්ද? ඒ තෘතීය ධ්‍යානයට පැමිණ දූත වාසය කෙරේද? කයෙහි හටගත්තාවූ සැපය පහකිරීමෙන්ද? පූර්වයෙහි සොම්නස්-දොම්නස් දෙදෙනාගේ දුරලීමෙන් දුක් නුවූ සැප නුවූ උපෙක්‍ෂා සමෘති දෙදෙනාගේ පිරිසිදු බැව් ඇති චතුර්ථ ධ්‍යානයට පැමිණ දූත වාසය කෙරේද? මේ සම්‍යක් සමාධියයි කියනු ලැබේ. යනු මේ පාඨයේ සාමාන්‍ය අදහසයි. මේ පාඨය පුද්ගලාධිෂ්ඨාන වශයෙන් වදාරණ ලද බවත් පළමු මාතෘකා පාඨය ධර්මාධිෂ්ඨාන වශයෙන් වදාළ බවත් තේරුම් ගත යුතුයි.

මෙහි චතුර්විධ ධ්‍යාන කුශල චිත්තය පිළිබඳ උපදනා සමාධිය සම්‍යක් සමාධියයි ප්‍රකාශිතය. හේ මාර්ග චිත්තයෙන් පූර්වභාග-යෙහි උපදනා සමාධියයි.

චතුර්විධ ධ්‍යානයෝ නම්:- ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානය, තෘතීය ධ්‍යානය, චතුර්ථ ධ්‍යානය යන සතරයි. මොවු'නතුරෙන් ප්‍රථම ධ්‍යානය නම් පළමුවන ධ්‍යානයයි.

### "පච්චනීක ධම්මෙ ඣාපෙතීති ඣානං"

ප්‍රතිපක්‍ෂ විරුද්ධ) ධර්මයන් දවානුය ඣානනම්. මෙහි ප්‍රතිපක්‍ෂ ධර්ම නම්:- කාමච්ඡන්ද ව්‍යාපාද. ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන පඤ්චනීවරණ ධර්මයි. ප්‍රථම ධ්‍යානයෙන් මෙකී පඤ්චනීවරණයන් ප්‍රහීණ කරණ බැවින් ප්‍රථම ධ්‍යානය පඤ්චාඞ්ග විප්‍රහීනයයි කියන ලදී. විතර්කාදී අඞ්ග පසකින් යුක්ත බැවින් ප්‍රථම ධ්‍යානය පඤ්චාඞ්ග සමන්විතද වේ. ඒ අඞ්ග පස නම්:- විතර්කය, විචාරය, ප්‍රීතිය, සුඛය, එකාග්‍රතාය යන පසයි.

**“විතක්කනං විතක්කො ඌහනන්තිවුත්තං හොති”** විතර්කණය (අරමුනු කල්පනා කිරීම) විතර්ක නම්. සිත අරමුන කරා එළවීමයයි කියන ලදී. ඒ විතර්කය තෙමේ අරමුනෙහි සිත නගන බැවින් ආරොපනය ලක්‍ෂණකොට ඇත්තේය. අරමුණෙහි ගැටීම කෘත්‍ය-කොට ඇත්තේය. අරමුණට සිත එළවීම ඵලයකොට ඇත්තේය. **“විචරණං විචාරො”** යනු නිර්වචන බැවින් අරමුණෙහි සිත හැසිරවීම විචාර නම්. නැවත නැවත හැසිරවීම යන අදහසයි. විචාරය තෙමේ අරමුණු පිරිමැදීම ලක්‍ෂණකොට ඇත්තේය. ඒ අරමුණෙහි තමා හා එක්ව උපදනා ධර්මයයි. නැවත නැවත හැසිරවීම් වශයෙන් යෙදීම කෘත්‍යකොට ඇත්තේය. අරමුණෙහි චිත්ත චෛතසික ධර්මයන් වෙන් නොකිරීමකමෙන් පැවැත්ම ඵලයකොට ඇත්තේය. ඒ විතර්ක විචාරයන්ගේ කිසිතැනක නොවෙන්ව පැවැත්මක් ඇති කල්හිදු විචාරයට වඩා ප්‍රකට බැවුනුදු පූර්වඞ්ගම බැවිනුදු ඝණ්ඨාවකා පළමු පහළ ශබ්දයකමෙන් පළමු-කොට සිත අරමුණෙහි වැටීම විතර්ක නම්. ඒ විතර්කයට වඩා සියුම් බැවිනුදු අරමුණ පිරිමදින බැවිනුදු ඝණ්ඨාවට ගැසූ ශබ්ද-යෙන් ඇතිවූ අණුරාවයමෙන් පසු පසුව අරමුණෙහි වැටීම විචාර නම්. අහසට නගිනු කැමති පක්‍ෂියකු පියාපත් ගැසීමක් මෙන්ද සුවඳෙහි ඇළුණු බමරෙකුගේ පියුමට අභිමුඛව වැටීමක් මෙන්ද පළමු උපදනා කල්හි සිත පොපියන්නාක්මෙන් පැතිරී ඇති බව විතර්කයයි. අහසට නැඟි පක්‍ෂියා පියාපත් විදහා නොසොල්වා යන්නාක් මෙන්ද, පියුමට අභිමුඛව වැටුනු බමරා පියුම මතුයෙහි පරිභ්‍රමණය (කැරකීම) මෙන්ද, සිත අතිශයෙන් නොපොපියා සන්සුන්ව පැවැත්ම විචාරයයි. මල බැඳුනු ලෝහලියක් එක් අතකින් තරකොට අල්වාගෙන අනික් අතින් සුනු තෙලින් යුත් සුඹුළුවෙන් පිරිමදින්නහුගේ දැඩිව අල්වා ගත් අතවැනි වූයේ විතර්කයයි. විචාරය පිරිමදිනා අත බඳුය. එසේම දණ්ඩෙන් ගසා කුඹල්සක කරකවා සැළි වලන් ඉදිකරණ කුඹල් කරුගේ මැටි පදන් කිරීම මෙන් විතර්කය දතයුතුය. මැටි පිඩෙහි ඔබ්බෙනොබ යන අතමෙන් විචාරය දතයුතුය. ලොහෝ බඳුන් ආදියෙහි කව තබන්නහු මැද ඔබාගෙන සිටි කටුව මෙන් අරමුණට සිත නගන විතර්කයද පිටත කවකටුමෙන් විචාරයද දතයුතුය.

**“පීණයතීති පීති”** කය සිත පිණවානුයි ප්‍රීතිනමු. නාමකාය සඞ්ඛ්‍යාත වේදනාදී සකන්ධත්‍රයද සිතද පිණවන අර්ථයෙන් ප්‍රීතියයි දතයුතුය. ප්‍රීතිය සර්වචිත්ත සාධාරණ චෛතසික ධර්මයෙකි. ප්‍රීති තොමෝ අරමුණු සවභාවය ප්‍රියකිරීම ලක්‍ෂණකොට ඇත්තීය. මේ ප්‍රීතිය කාරණකොට ගෙණ සිතද නාම කයද් පිණවීම මේ ප්‍රීතිහුගේ සවභාවයි. ඊට මතු දැක්වෙන මේ උපමාව දතයුතුයි.

කාන්තාර මාර්ගයෙහි යන්නාවූ පුරුෂයෙක් තෙමේ අතිශයින් පිපාසිතව වෙහෙසට පත්ව ජලය සොයමින් යනුයේ ඉදිරි මාර්ගයෙහි එන්නාවූ පුරුෂයෙකු දැක 'එම්බා මිතුර?' ජලය කොතැන්හි ඇත්තේදැයි විචාල කල්හි පින්වත! තොප මේ යන්නාවූ මාර්ගයෙහි මදක් දුර ගිය කල්හි පස් පියුමෙන් සැදුම් ලත් සිහිල් දියෙන් පිරී ගියාවූ පොකුණක් ඇතැයි කියයි. වහ වහා යනුයේ ඒ මගියා කී පරිද්දෙන් ඒ පොකුණ දක්නේය පවසින් පෙනුනාවූ ඒ මගියා හට ඒ පොකුණ දැකීමෙන් ඔහුගේ සිතේ යම් ස්වභාවයක් උපදනේය. ඕ ප්‍රීතියයි සැලකිය යුතුය. මේ ප්‍රීතිය වූකලී සම්ප්‍රයුක්ත චිත්තයෙහි උපන් කල්හි සිහින්වූ කපු පුළුන් පටලයක තලතෙල් වත්කළාක් වැනිවේ. මේ ප්‍රීති තොමෝ ඛුද්දිකා පීති, ඛණිකා පීති, ඔක්කන්තිකා පීති, උබ්බෙගා පීති, ඵරණා පීතියයි පස් ආකාරය. ඔවුන් අතුරෙන් ලොමු දැහැ ගැනීම් මාත්‍රයක් හෙවත් ලොම් නගා සිටුවීම් පමණක් කරන්නී ක්ෂුද්‍රිකා පීතිනමු. විදුලිය ගසන්නාක්මෙන් ක්ෂණයෙහි ශරීරයෙහි ලොමු දැහැ ගැනීම් උපද වන්නාවූ ප්‍රීති තොමො ක්ෂණිකා පීති නම්වේ මුහුදෙහි රළ පතර මේලාන්තයෙහි බිඳි බිඳී යන්නාසේ මුළු සිරුරෙහි පැතිර යන්නාවූ ප්‍රීති තොමෝ ඔක්කන්තික ප්‍රීතියවේ. වාත වේගයෙන් අහසට නගන්නාවූ කපු පුළුන් පෙදක්මෙන් ප්‍රීතිවේගය කරණකොට ගෙණ චතුර්ථ ධ්‍යානය නොලැබම තමා කැමති තැනට අහසින් ගෙන ගොස් සිටුවීම කරන්නාවූ ප්‍රීති තොමො උබ්බෙග ප්‍රීති නම් වෙයි. මහත්වූ ගංවතුරක් ගලා අවුත් ස්වල්ප විල් පොකුණු පුතුරුවාගෙන යන්නාක්මෙන් සුළුන් පිරූ මයිනහමක්මෙන් මුළු සිරුරෙහි පැතිර යන්නාවූ ප්‍රීති තොමෝ ඵරණ ගිරිභණ්ඩ සෑය ප්‍රීති නම් වන්නීය. උබ්බෙග ප්‍රීතියට උදාහරණ වශයෙන් ගිරිභණ්ඩ සෑය වඳිනු පිණිස මවුපියන්ගේ පැමිණීමට මත්තෙන් ගැබිනියකගේ පැමිණි කථාව දතයුතුයි.

ලක්දිව ගිරිභණ්ඩ වෙහෙර සමීපයෙහි වත්තකාලක නම් ගමෙක් විය ඒ ගමෙහි එක් කුලයක සැදැහැවත් අඹු සැමි දෙදෙනෙක් වූහ. එක් දිනක් ඒ දෙදෙන ගිරිභණ්ඩ සෑය වඳිනු පිණිස යන්ට සූදානම් වනවිට ඔවුන්ගේ ගැබ් බරව සිටි දුවක්ද යන්ට කැමති බව කීවාය. එවිට මවුපියෝ නුඹ ගැබ් බර ඇත්තෙනිය. එහෙයින් යා නොහැකිය. නුඹට පින්අනුමෝදන් කරවම්හයි කීහ. එහෙයින් නුඹ ගෙයි රඳවයි කියා ගියහ. ඕතොමෝ මවුපියන්ගේ කීම ඉක්මවාලිය නොහෙන්නී ගෙයි නැවතුනාය. ඇ ගෙයි සිට සඳපානේ ගිරිභණ්ඩ වෙහෙරෙහි සෑ මිදුල බලමින් සිටියාය. සෑ මළුවෙහි පහන් දැල්වීමද සුවඳ මල් ආදියෙන් පූදා පැදකුණු කරණ සිවු පිරිසද භික්ෂූන් වහන්සේගේ ගණ ස්වාධ්‍යායනා ශබ්දයද තමන්

ලගමමෙන් ඇයට වැටහුණේය. යමෙකුට මෙබඳු මහොත්සවය-කට යාහැකි වීනම් හෙතෙම මහා පිණැත්තෙකැයි සිතූ ඇගට උවෙග ප්‍රීතිය උපන්නීය.

එකල්හි ඕතොමෝ අහසින් ගොස් මවුපියන්ටත් පළමුව සෑ මළුවෙහි පිහිටියාය. ඉක්බිති එහිවත් මවුපියෝ බණ අසමින් සිටි ඇය දැක නුඹ කිනම් මගකින් මෙහි ආවෑදැයි විචාළහ. මම අහසින් ආමි. මගකින් නොවේයයි කීවාය. අහසින් රහතන් වහන්සේ මිස අන්‍යයන්ට යාතොහැකිය. නුඹ කෙසේ ආයෙහි-දැයි ඇසූහ. මම සඳපානේ සෑය බලමින් සිටියෙමි. එයින් බලවත් ප්‍රීතියක් ඇතිවිය. එහෙයින් අහසින් එවූනාං මිස අනිකක් නොදනිමියි කීවාය. මෙසේ උවෙග ප්‍රීතිය අහසින් යන තරම් බලවත් වේ.

මේ පස් වර්ණක් ප්‍රීතිය ඉපදීමෙන් කාය සිත දෙක සංසිඳෙන බව තේරුම් ගත යුතුය. එසේ සංසිඳීමෙන් චිත්ත චෛතසික සැපය ලැබේ. සැපත් වූයේ ක්‍ෂණික උපචාර අර්පණා යන සමාධි ලබයි. එහෙයින් ප්‍රීතිය මහත් වැඩදායකය. ප්‍රීතිය සාමිෂ ප්‍රීතිය, නිරාමිෂ ප්‍රීතියයි දෙයාකාරය. ඉන් මෙහි නිරාමිෂ ප්‍රීතියම අභිමතය. මේ පස් වර්ණක් ප්‍රීතීන් අතුරෙන් ස්ඵුරණ ප්‍රීතිය උපන් කල්හි මුළු සිරුර සුළං පිඹ පිරූ විතක්මෙන්ද, මහ දිය වතුරක් ඇතුලටවත් පර්වත කුක්ෂියක්මෙන්ද හාත්පසින් සියළු ශරීරය ස්පර්ශීකරණ ලද්දේ වෙයි. ඒ මේ පස් වර්ණක් ප්‍රීතිය කෙලෙස් සන්සිඳුවීමට කාරණා වශයෙන් ගැබ් ගන්වන්නී මුකුරුවන්නී.

කායික සැපය චෛතසික සැපය යන දෙයාකාර සැපය ගැබ් ගන්වමින් මුකුරුවමින් ක්‍ෂණික සමාධිය, උපචාර සමාධිය, අර්පණා සමාධිය යන තුන් ආකාර සමාධිය පුරන්නේයි. ඒ තුන්වැදෑරුම් සමාධීන් අතුරෙන් අර්පණා සමාධියට මුල්ව පූර්වභාගයෙහි උපන් උපචාර සමාධිය හා සම්ප්‍රයුක්තව පිළිවෙලින් වඩනා අර්පණා සමාධිය හා එක්වන් බවට නියාවූ යම් ස්ඵුරණ ප්‍රීතියක් වේද? ඒ මේ ප්‍රීතිය මේ අර්ථයෙහි ප්‍රීතියයි දතයුත්තීය.

**“සම්පයුත්ත ධම්මෙ සුඛයතීති සුඛං තං ඉට්ඨානුභවන ලක්ඛනං”** තිඅවන බැවින් තමා හා එක්ව යෙදෙන චිත්ත චෛතසික ධර්මයන් සුවපත් කෙරෙයි යන අර්ථයෙන් සුඛ නම්වේ. ඒ සුවය යහපත් බොජුනක් රසවිඳ ගන්නාවූ රජෙකුමෙන් කැමති අරමුනු අනුභව කිරීම ලක්‍ෂණකොට ඇත්තේය.

**"සුඛ නාම් සුඛො සුට්ඨුවා ඛාදති කාය චිත්තාබාධං ති සුඛං තං සාත ලක්ඛණං සම්පයුත්තානං උපබ්‍රෑහන රසං අනුග්ගහ පච්චු පට්ඨානං"** යනු අටුවා බැවින් සුවපත් කිරීම සුවනම නොහොත් නාමකාය චිත්තකාය දෙදෙන සම්බන්ධ විධාව මනාකොට භක්ෂණය කරණ (කා දමන) අර්ථයෙන් හෝ කණනාර්ථයෙන් හෝ සුවනම්වේ. එ සුවය ශීතල මධුර සවභාව ලක්ෂණ කොට ඇත්තේය. තමා හා එක්ව යෙදුනාවූ චිත්ත චෛතසිකයන් වැඩීම කෘත්‍යකොට ඇත්තේය. එම සම්ප්‍රයුක්ත ධර්මයන්ට උපකාරවීම ඵලයකොට ඇත්තේය. ප්‍රථම ධ්‍යානාදී ඇතැම් සිතෙක මේ ප්‍රීති, සුඛ දෙදෙනා වෙන්නොව පවත්නෙහිදු තමා කැමති අරමුණු ලැබීම් වශයෙන් උපදනා සතුට ප්‍රීතිනම ලබන ලද ඒ අරමුණු රස විඳගැණිම සුඛනම විතර්කය විචාරය හා සමග යෙදී පවත්නාක්මෙන් යම් සිතෙක ප්‍රීතිය ඇත්තී විනම් සුඛයද එම සිතෙහි පවත්නේය. එතකුදු වුවත් සුඛ සහගත කාය විඥ්ඥාණය පචකනයෙහි චතුර්ථ ධ්‍යානය යන දෙසිතෙහි ප්‍රීතියෙන් තොරව සුඛය තනිව පවත්නා හෙයින් යම් තැනෙක සුඛය ඇත්තේ වීනම් එහි නියම .වශයෙන්ම ප්‍රීතිය නොයෙදෙන්නීයි මේ ප්‍රීති සුඛ දෙදෙනාගේ වෙනස වනාහී ප්‍රීතිය සංසකාර සකන්ධයටද සුඛය වේදන සකන්ධයටද ඇතුලත්වේ. තවද රුක් සෙවන හා පැන් නැති කාන්තාරාදී දීර්ඝ මාර්ගයෙක පිපාසයෙන් පෙළුනු පුරුෂයෙකුට වන රෙඛා පැන් දකීමෙන් හෝ ඇසීමෙන් හෝ උපදනා චිත්ත සවභාවමෙන් ප්‍රීතියද එම පුරුෂයාගේ රුක් සෙවනට පැමිණීමෙන් හෝ පැන් පීමෙන් හෝ උපදනා චිත්ත සවභාවමෙන් සුඛයද දතයුතු. කැමති අරමුණක් ලබන කල්හිද, වන රේඛා පැන් පොකුණු දුටු කල්හිද, සුවය ඇත්තේ නමුත් ඊට වඩා ප්‍රීතිය බලවත් වන හෙයින්ද, කැමති අරමුණු රස විඳ ගන්නා කල්හිද, ඡායාව ජලය වැළඳ ගන්නා කල්හිද, ප්‍රීතිය ඇත්තී නමුත් ඊට වඩා සුවය බලවත් වන හෙයින්ද, මේ උපමාව කියන ලදූයි සැළකිය යුතුය. මෙසේ කියන ලද අර්ථයෙන් යුක්තවූ මේ ප්‍රීතියද, මේ සුවයද, මේ ධ්‍යානයට ඇති බැවින් හෝ ප්‍රීති සුඛ ධ්‍යානයයි කියන ලද්දේයි.

කාය විවේක චිත්ත විවේක දෙකින් හටගත්තාවූ ප්‍රීති සුවය මේ ධ්‍යානයට හෝ මේ ධ්‍යානයෙහි ඇත්තේනුයි කියා හෝ මෙසේද ප්‍රීති සුඛය විවේකයෙ හටගත්තේයයි තේරුම්ගත යුතුයි. යම්සේ ධ්‍යානය විවේකයෙන් හටගත්තේද එපරිද්දෙන්ම මේ ධ්‍යානයෙහි ප්‍රීති සුඛය විවේකයෙන් හටගත්තේ වෙයි. ඒ ප්‍රීති සුඛයද මේ ධ්‍යානයට ඇති හෙයින් අළුප්ත සමාස බැවින් විවේකයෙන් උපන් ප්‍රීති සුවයයි.

**"නා නා ලම්බන විකෙඛප පහාණෙන එකං ආරම්මණං අග්ගං ඉමස්සාති එකග්ගං චිත්තං තස්ස භාවො එකග්ගතා සමාධි සො අවික්ඛෙප ලක්ඛණො"** යන්නෙන් නොයෙක් අරමුනෙහි වික්ෂේපයක් (විසිර පැවැත්මක්) නැති බැවින් එක් අරමුණක් අග්‍රවූයේ මේ සිතට නොයි ඒකාග්‍රනම් ඒ චිත්තයාගේ ප්‍රවෘත්ති නිමිත්ත ඒකග්‍රතා නමු. එනම් සමාධියයි. ඒ සමාධිය නොවිසිර පැවැත්ම ලක්ෂණකොට ඇත්තේය.

තවද පස් අඟකින් වෙන්වූ පස් අඟකින් යුක්තවූ ධ්‍යානය මෙසේ දතයුතුයි. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධ, උද්ධච්ච, කුක්කුච්ච, විචිකිච්ඡා යන මේ පඤ්චනීවරණ ධර්මයන් දුරුකිරීම් වශයෙන් පස් අඟින් වෙන්වූ බව දතයුතුයි. මේ පඤ්චනීවරණයන් ඔබාගැනීම් වශයෙන් ප්‍රහීන නොකොළ කල්හි ධ්‍යාන මුළුල්ලම නොඋපදනේද එහෙයින් පඤ්චනීවරණ ධර්මයො මේ ධ්‍යානයාගේ ප්‍රහාණාඞ්ගයෝයයි කියන ලද්දූහ. කිසිසේත් ධ්‍යාන ක්ෂණයෙහි ලෝභාදි සෙසු අකුශල චිත්තොපාදාදී පාප ධර්මයෝද නොපවත්නාහුමය. එතකුදු වුවත් මේ කාමච්ඡන්දාදී පඤ්චනීවරණයෝම විශේෂයෙන් ධ්‍යානයට අන්තරාය කරවූ ධර්මයෝයි. ඒ එසේ මැයි කාමච්ඡන්දය (කාම තෘෂ්ණාව) හේතුකොට ගෙන නොයෙක් අරමුණෙන් පොළඹවන ලද සිත පෘථිවි කසිණාදී එකෙකි. ස්වභාවාලම්බනයක හෝ එකඟ බව එළවන වෙන අරමුණක හෝ නොපිහිටන්නේ වෙයි. ඒ කාම තෘෂ්ණාවෙන් මඩනා ලද සිත රූප ශබ්දාදී නොයෙක් අරමුණෙන් මුළාවූ කාම ලෝකය ඉක්මීම පිණිස පවත්නාවූ ධ්‍යාන ප්‍රතිපත්තියට හෝ නොපැමිණෙන්නේයි. ව්‍යාපාද සංඛ්‍යාතවූ ක්‍රොධයෙන් මඩනා ලද සිත අරමුණෙහි ගැටෙමින් වික්ෂෙපයෙන් අතුරක් නැතුව එකඟ නොව පවත්නේය. ථිනමිද්ධ සංඛ්‍යාතවූ චිත්ත චෛතසිකයන්ගේ අකර්මන්‍යතාවයෙන් මඩනා ලද සිත භාවනා කර්මයට සුදුසු නොවන්නේය. ඖද්ධත්‍ය කෞකෘත්‍ය දෙකින් මඩනා ලද සිත එකඟ නොව හාත්පස පරිභ්‍රමණය කරන්නේය. විචිකිත්සාවෙන් මඩනා ලද සිත තථාගතයන් වහන්සේ සම්‍යක් සම්බුඩ වේද්‍ද හෝ නොවේද්‍ද හෝ පෘථිවි කසිණාදිය මෙනෙහි කිරීමෙන් ධ්‍යානය උපදීද්‍ද හෝ නූපදීද්‍ද හෝයි යනාදීන් පැවති සැකයෙන් මඩනා ලද බැවින් ධ්‍යානාධිගමය සිඬකරන්නාවූ ප්‍රතිපත්තියට නොනැගෙන්නේයි. මෙසේ විශෙෂයෙන්ම සමාධි ආදීන්ට ඉඳුරා විරුද්ධ බැවින්ද ධ්‍යානයට අන්තරාය කරණ හෙයින්ද මේ කාමච්ඡන්දාදීහුම ප්‍රහාණාඞ්ගයෝයයි කියන ලද්දූහ. යම් හෙයකින් විතර්කය අරමුණෙහි සිත නඟාද විචාරය අරමුණෙහි සිත බිදීද ඒ ධ්‍යානයට පැමිණීමට කරුණුවූ විතර්ක විචාර දෙකින් වික්ෂෙප නොවන පිණිස නිපදවන ප්‍රයෝග

ඇත්තහුගේ සිත පිළිබඳවූ යථොක්ත භාවනානුයෝග සෑමැති ප්‍රයෝගයෙන් උපන් ප්‍රීතිය හා සුවය භාවනා වශයෙන් සිත පිණවීම හා වැඩීම කරන්නේයි. ඉක්බිත්තෙන් සෙසු ස්පර්ශාදී සම්ප්‍රයුක්ත ධර්ම සහිතවූ ඒ චිත්තය අරමුණට නැගීමය. අරමුණෙහි හැසිරීමය. පිණවීමය. වැඩීමය යන මොවුන් විසින් අනුග්‍රහ කරණ ලද එකාග්‍රතාව එකම අරමුණෙක ඉඳුරන්ගේ සමබව පිළිබෙලකොට මනාව පිහිටුවන්නේයි. එහෙයින් විතර්කය, විචාරය, ප්‍රීතිය, සුවය, චිත්තෙකාග්‍රතාව යන මේ අඞ්ගයන් පස්දෙනාගේ උත්පත්ති වශයෙන් ධ්‍යානය පසඟින් යුක්ත බව දත යුත්තේයි. එහෙයින් මේ පඤ්චධර්මය උපන් කල්හිම ධ්‍යානය උපන්නේ නම් වන්නේයි. එබැවින් මේ විතර්කාදී අඞ්ගයන් පස්දෙන ධ්‍යානය හා එක්ව යෙදෙන අඞ්ගයෝයයි කියන ලද්දුහ.

මේ ධ්‍යානාඞ්ග පඤ්චකය කිසිසේත් උපචාර ධ්‍යානයෙහි කාමාවචර චිත්තයට වඩා අතිශයින් බලවත්වූ විතර්කාදී අඞ්ගයෝ ඇත්තාහ. මේ ධ්‍යාන චිත්තයෙහි උපචාරයටද වඩා අතිශයින් බලවත්වූ රූපාවචර ලක්ෂණයට පැමිණියාවූ විතර්කාදී අඞ්ගයෝ ඇත්තාහ. මේ පඤ්චාඞ්ගය අතුරෙන් විතර්කය කෙලෙසුන් කෙරෙන් මිදුනු බැවින් ප්‍රකටවූ ආකාරයෙන් අරමුණෙහි සිත නංවමින්ද විචාරය අතිශයින් අරමුණ පිරිමදිමින්ද උපදනාහුය.

චිත්තෙකාග්‍රතාව කරඬුවෙක උඩු පියන යටි පියනෙහි මනාසේ ස්පර්ශකොට වැදගන්නාක්මෙන් අරමුණ මොනවට ස්පර්ශකොට ගෙන උපදනේය.

ධ්‍යානය වනාහී ත්‍රිවිධ කල්‍යානයෙන්ද, දශලක්ෂණයෙන්ද යුක්තය. ඒ මෙසේය. ආදිය, මධ්‍යය, කෙළවරය යන තුන් තැන්හි යහපත් බව හා ලක්ෂණ වශයෙන් දශලක්ෂණයෙන් යුක්ත බවද දතයුත්තේය. ඒ කෙසේදයත්, ධ්‍යාන සිතට පූර්ව උපදනා ගොත්‍රභූ චිත්තය අවසන්කොට ඇති පූර්වභාගිකවූ භාවනාව කාමාදී සතුරන්ගෙන් පිරිසිදු කරණ හෙයින් ප්‍රතිපදා විසුද්ධි නම්. ඒ ප්‍රතිපදා විසුද්ධිය ප්‍රථම ධ්‍යාන චිත්තයාගේ උත්පාද ක්ෂණයෙහි ලැබෙන බැවින් ඒ උත්පාද ක්ෂණය ආදිය වන්නේය. නැවත කෙලෙසුන්ගෙන් පිරිසිදුකර යුක්තක් නැති බැවින් ධ්‍යානාඞ්ගයන්ට ඇතුලත්වූ උපෙක්ෂාව ධ්‍යානය නිපදවීම උපකාර වන බැවින් අනුබෲහනණම ඒ අනුබෲහණ සංඛ්‍යාතවූ වැඩීම ධ්‍යාන චිත්තයාගේ ස්ථිති ක්ෂණයෙහි ලැබෙන හෙයින් මධ්‍යය නම් වන්නේය. ඒ ධ්‍යාන චිත්තයෙහි යෙදුනු විතර්කාදී ධර්මයන් නොඉක්මවීම් ආදිය සිද්ධකරන්නාවූ ක්ෂණය පිරිසිදු කිරීම ධ්‍යාන

චිත්තයාගේ භඞ්ගක්ෂණයෙහිම ප්‍රකට වන හෙයින් ඒ පිරිසිදු බව කෙළවර නම් වන්නේයි. ඒ ධ්‍යානයාගේ ආදියෙහි ලක්ෂණ තුනක් වෙති. ඔහු කවරහුදයත්: ඒ ධ්‍යානයට යම් කෙනෙක් සතුරු වූවාහු නම් ඒ සතුරු ධර්මයන්ගෙන් සිත පිරිසිදුකොට මධ්‍යම සමථයට පිළිපන් හෙයින් ඒ මධ්‍යම සමථ නිමිත්තයෙහි සිත ඇතුල් වන්නේය.

ඒ ධ්‍යානයට සතුරු ධර්මයන්ගෙන් සිත පිරිසිදු වීමය. සිත පිරිසිදුවූ බැවින් මධ්‍යම සමථ නිමිත්තට පිළිපැදීමය. එසේ පිළිපන් බැවින් එහි සිත බැඳීමය යන මේ ත්‍රිවිධාකාරය ප්‍රථම ධ්‍යානයාගේ ආදියෙහි උත්පාද ක්ෂණයාගේ අභිඥාවට පැමිණි ලක්ෂණයෝ වෙති. එහෙයින් ප්‍රථම ධ්‍යානය ආදියෙහි පිරිසිදු ප්‍රතිපත්ති ඇති බැවින් ආදි කල්‍යාණය නමුදුවෙයි. යථෝක්ත ත්‍රිවිධ ලක්ෂණයෙන් යුක්ත බැවින් ලක්ෂණ සම්පන්න නමුදු වෙයි. කියන ලද්දේයි. ප්‍රථම ධ්‍යානයාගේ උපෙක්ෂාවෙන් වැඩීමයයි කියන ලද මධ්‍යයෙහි ස්ථිතික්ෂණ සංඛ්‍යාත මධ්‍යයාගේ ලක්ෂණයෝ කෙනෙක් දෙනෙක්ද යත්? ඒ මධ්‍යයාගෙ ලක්ෂණයෝ තුන් දෙනෙක් වෙති ඔහු කවරහුද යත්? ප්‍රතිපත්ති බලයෙන්ම පිරිසිදුවූ සිත නැවත පිරිසිදු කටයුත්තක් නැති බැවින් මැදහත්ව බලන්නේය. කෙලෙස් සන්සිඳුවීමට පැමිණීමෙන් නැවත සංසිඳුවීමක් නැති බැවින් ඒ සංසිඳීමට පැමිණි සිත මැදහත්ව බලන්නේය. කෙලෙස් සංසිඳීමට පැමිණීමෙන් කෙලස සංසර්ගය හැර එකඟවූ බැවින් වැටහුනු සමාධිය එකඟ බවට පැමිණවීමෙහි උත්සාහ නැති බැවින් මැදහත්ව බලන්නේය. මෙසේ ප්‍රතිපත්ති බලයෙන් පිරිසිදුවූ සිත මැදහත්ව බැලීම කෙලෙස් සංසිඳීමට පැමිණි සිත මැදහත්ව බැලීමය. ඒකත්වයෙන් වැටහුනු සිත මැදහත් බැලීමය. යන මේ ත්‍රිවිධාකාරය. ප්‍රථම ධ්‍යානයාගේ උපේක්ෂාවෙන් වැඩීමයයි කියන ලද මධ්‍යයෙහි ස්ථිතික්ෂණ සංඛ්‍යාත මධ්‍යයාගේ ලක්ෂණයෝ වෙති එහෙයින් ප්‍රථම ධ්‍යාන මධ්‍යයෙහි උපෙක්ෂාවෙන් වැඩීම් ඇති බැවින් මධ්‍ය කල්‍යාණ නමුදුවෙයි. යථෝක්ත ත්‍රිවිධ ලක්ෂණයෙන් යුක්ත බැවින් ලක්ෂණ සම්පන්න නමුදුවෙයි කියන ලද්දේයි. ප්‍රථම ධ්‍යානයාගේ ඒ ඒ ධර්ම නොඉක්මවීම ආදිය ප්‍රඥාවගේ කෘත්‍යය නිස්පත්ති වශයෙන් ලැබිය යුතුවූ අවසානයෙහි භඞ්ග ක්ෂණයයි කියන ලද අවශානයාගේ ලක්ෂණයෝ කෙනෙක් දෙනෙක්ද යත් :- ඒ අවසානයාගේ ලක්ෂණයො සතර දෙනෙක් වෙති. ඔහු කවරහුද යත්? ඒ ධ්‍යානය හා එක්ව උපන් සමාධි ප්‍රඥා සංඛ්‍යාත යුගනද්ධ ධර්මයන් නොඉක්මෙන බැවින් සතුටු වීමය.

ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන් නොයෙක් කෙලෙසුන්ගෙන් මිදුනු බැවින් විමුක්ති රසයෙන් එක රස හෙයින් ඒ නොඉක්මෙන බවට හා එක රස බවටද සුදුසුවූ වීර්‍ය්‍ය පවත්වන හෙයින් සතුටුවීමය. නැවත නැවත සේවනය කාරණ හෙයින් සතුටු වීමය. යන මේ සතරුකාරය ප්‍රථම ධ්‍යානයාගේ අවශානයෙහි හෙවත් භඞ්ග ක්‍ෂණයයි කියන ලද කෙලවර ලක්‍ෂණයෝ වෙති. එහෙයින් ප්‍රථම ධ්‍යානය පරියෝසාන කල්‍යාණ නමුදු වෙයි. යථොක්ත සතර ලක්‍ෂණයෙන් යුක්ත බැවින් ලක්‍ෂණ සම්පන්න නමුදු වෙයි කියන ලද්දේයි.

මේ ධ්‍යාන උපදවා ගනු කැමති යෝගාවචරයා විසින් ආදියෙහි ප්‍රාතිමොක්‍ෂ සංවරාදී චතුපාරිසුද්ධි සීලය පිරිසිදුකොට ආවාසාදී දශවිධ පලිබොධ දුරු කටයුතුය.

ඒ දශපලිබොධ නම්:—

"ආවාසො ච කුලං ලාභො ගණොකම්මඤ්ච පඤ්චමං
අද්ධානං ඤාති ආබාධො ගන්ථො ඉද්'ධීති තෙ දසා' ති"

යන්නෙන් කියන ලද ආවාසය ඤාති ආදී කුලය සිවුපස ලාභය ගණයාද පස්වනුව නව කර්මාන්තයද මාර්ග ගමනය ආචාර්‍ය්‍ය උපාධ්‍යායාදී නෑයෝය රෝගාබාධය පර්‍ය්‍යාප්ති ඉගෙණීම පෘතජ්ජන ඍද්ධිය යන මේ දශ පලිබොධයෝයි. මේ දශ පලිබෝධයන් පසිද ප්‍රියගුරු භාවනීයාදි ගුණයෙන් යුක්තවූ කල්‍යාණ මිත්‍රයකු සමීපයට එළඹ තමාගේ චරිතයට යෝග්‍යවූ කර්මස්ථානයක් ගෙන,

"මහා වාසං නවා වාසං
ජරාවාසඤ්ච පන්ථනිං
සොණ්ඩිං පණ්ණඤ්ච පුප්ඵඤ්ච
ඵලං පත්ථිත මෙවච"

"නගරං දාරුණා සොණ්ඩිං
විස භාගෙන පට්ටනං
පච්චන්ත සීමා සප්පායං
යත්ථ මිත්තො න ලබ්භති"

"අට්ඨාර සෙතානි ඨානානි
ඉති විඤ්ඤාය පණ්ඩිතො
ආරකා පරි වජ්ජෙය්‍ය
මග්ගං පටිභයං යථාති"

යන්තෙන් දක්වෙන මහා විහාරය, අළුත් වෙහෙරය, මහා මාගී ඇසුරු කළ වෙහෙරය, පැන් තොම් ඇති වෙහෙරය, පලා කොළ ඇති වෙහෙරය, කුදු මහත් එල ඇති වෙහෙරය, බොහො-දෙනා විසින් කැමතිවෙනලද විහාරය, නුවර ඇසුරුකළ වෙහෙරය, දර දව දඹු ඇති වෙහෙරය, කෙත් ඇසුරුකළ වෙහෙරය, විසභාග භික්‍ෂූන් වසන වෙහෙරය, පටුනු ගම් හෙවත් සුංකස්ථාන ඇසුරු කළ වෙහෙරය, පසල් දනවු ඇසුරු කළ වෙහෙරය, රාජ්‍යසීමා ඇසුරු කළ වෙහෙරය, නොසැප වෙහෙරය, කල්‍යාණ මිත්‍රයන් නොලැබිය හැකි වෙහෙරය යන මේ අටළොස් තැන් දුරුකොට ගොදුරු ගමට ඉතා ලංනුවූද ඉතා දුරනුවූද ගමනා ගමනට පහසුවූද දහවල් සමූහයාගෙන් ගැවසී නොගත්තාවූද රෑ නිශ්ශබ්ද වූද මැසි මදුරු ආදින් නැත්තාවූද සුදුසු සෙනසුනක වසමින් කුඩා පලිබොධ සිඳිය යුතුය. ඒ කුඩා පලිබෝධ නම් දික්වූ කෙස්, ලොම්, නිය සිඳිය යුත්තාහුය. දිරාගිය සිවුරෙහි දැඩිකම් (කඩලීම) හෝ ගෙත්තම් හෝ කටයුතුය. කිලිටි සිවුරු රැඳිය යුත්තාහුය. ඉදින් පාත්‍රයෙහි මල තිබේනම් පය පිසිය යුතුය. ඇඳ පුටු ආදිය පිරිසිදු කටයුතුය. යන මේ කුඩා පලිබෝධයන් පසිඳ එක්වියත් සතරඟුල් පළල ඇති වටවූ කිසුණු මඬුල්ල අභිමුඛකොට දෙරියන් සමාරක පමණ තන්හි මනාකොට පැනවූ එක්වියත් සතරඟුල් පමණ උස ඇති අස්නෙහි සුවසේ හිඳ කාමයෝ මඳ ආශ්වාස ඇත්තාහ. යනාදීන් කාමයෙහි දෝෂ සියළු දුක් දුරු කිරීමට කාරණවූ නෛෂ්ක්‍රම්‍යයෙහි හටගත් රිසි ඇතිව තුනුරුවන්ගේ ගුණ සිහිකිරීමෙන් ප්‍රීතිප්‍රමෝද්‍යය උපදවා සියළු බුදු පසේබුදු මහ රහතුන් විසින් පිළිපැද්දවූ ප්‍රතිපත්තියයි හටගත් ගෞරව ඇතිව ඒකාන්තයෙන් මේ ප්‍රතිපත්තියෙන් විවේක සැපයෙහි රස විඳ ගැන්මට පැමිණෙන්නෙමියි මෙසේ උත්සාහ උපදවා සමවූ අයුරෙන් ඇස දල්වා කිසුණු මඬුල්ලෙහි වර්ණය මෙනෙහි නොකොට උත්සද වශයෙන් ප්‍රඥප්ති ධර්මයෙහි සිත පිහිටුවා එකඟවූ සිතින් "පඨවී පඨවී" යනාදීන් ඒ ඒ භාවනානුක්‍රමයෙන් පෘථිවි කසිණා-දියෙහි නිමිත්තගෙන භාවනාකටයුතුයි.

මෙහි යටකී පරිද්දෙන් නිමිත්ත ග්‍රහණයකොට භාවනා කරණ යොගාවචරයා විසින් කලෙකින් ඇස දල්වා කලෙකින් ඇස පියාලා ආවර්ජනාකොට උද්ග්‍රහ නිමිත්තය ඉපදවිය යුතු උද්ග්‍රහ නිමිත්තය යම්තාක් කල් නොඋපදීද ඒතාක් කල් කාල ශතය කුදු කාල සහශ්‍රය කුදු ඒට වඩාද මෙම ක්‍රමයෙන් භාවනා කටයුතුයි. එසේ භාවනා කරන්නාහට යම් කලෙක්හි ඇස පියා ආවර්ජනය කරණ විට ඇස දල්වූ කල්හිමෙන් අරමුණ මනොද්වාරයට වැටහේද? එකල්හි උද්ග්‍රහ නිමිත්ත උපන්නා නම්වේ. එ උද්ග්‍රහ නිමිත්ත

ලද තැන් පටන් එතැන නොහිඳ තමා වසන තැනට වැද එහිදීද භාවනා කටයුතුයි. ඉදින් තරුණවූ සමාධිය කිසි අසප්පායෙකින් නටුයේ වීනම් නැවත ඒ ස්ථානයට ගොස් ප්‍රතිභාග නිමිත්ත උපදවා නැවත අවුත් සුවසේ හිඳ නැවත නැවත බැවිය යුතුයි. මෙසේ බවන්නාවූ යෝගාවචරයා හට පිළිවෙළින් කාමච්ඡන්දාදී නීවරණයෝ යටපත් වෙති. කෙලශොත්පත්තිය නොවන්නීය. උපචාර සමාධින් චිත්තය මනාව පිහිටන්නේය. ප්‍රතිභාග නිමිත්තද උපදනේයි. එහි උද්ග්‍රහ නිමිත්ත ප්‍රතිභාග නිමිත්ත-යන්ගේ වෙනස මෙසේ දතයුතු. උද්ග්‍රහ නිමිත්තයෙහි කිසුණෙහි ඇති දෙස් පෙනෙන්නේය. ප්‍රතිභාග නිමිත්ත වනාහී පසුම්බි-යෙන් මෑත්කොට මදනා ලද දර්‍ශණ තලයක්මෙන්ද මනාව ධෝවනය කළ සකක්මෙන්ද වලාගැබකින් නික්මුණු පුන්සඳ මඬලමෙන්ද උද්ග්‍රහ නිමිත්ත ප්‍රදලනයකොට නික්මුණාක්මෙන් එ උද්ග්‍රහ නිමිත්තයට සියක් ගුණයෙන් දහස් ගුණයෙන් ඉතා පිරිසිදුව වැටහෙන්නේය. ඒ ප්‍රතිභාග නිමිත්ත පටන් යොගා-වචරයා හට පඤ්චනීවරණයෝ විෂ්කම්භිත වූවාහුම වෙති. කෙලසයන්ගේ උත්පත්තියද නොම වන්නීය. උපචාර සමාධින් චිත්තය සමාහිත වන්නේයි. එහි සමාධි තෙමේ උපචාර සමාධිය අර්පණා සමාධියයි දෙවදෑරුම්වේ. ඒ උපචාර සමාධිහුගේ ප්‍රතිලාභ-යෙහි පඤ්චනීවරණයන්ගේ ප්‍රහානියෙන් චිත්තය සමාහිත වන්නේය. අර්පණා සමාධි ප්‍රතිලාභයෙහි විතර්කාදී අඞ්ගයන්ගේ පහළවීමෙන් චිත්තය සමාහිත වන්නේය. සමාධි දෙදෙනා අතු-රෙහි උපචාර සමාධියෙහි අඞ්ගයෝ ස්ථිර පවත්නාහු නොවෙති.

අර්පණා චිත්තයෙහි අඞ්ගයෝ ස්ථිරව පවත්නාහ. එසේ හෙයින් අර්පණා චිත්තය දවසක් මුළුල්ලෙහිත් සිටී. එහි උපචාර සමාධිය හා සමග යම් ඒ ප්‍රතිභාග නිමිත්තයෙක් උපන්නේවේද ඒ යෝගාවචරයාඑම පලඟින් ඒ ප්‍රතිභාග නිමිත්තය වඩා අර්පණාවට පැමිණෙන්නට ඉදින් සමර්ථ වීනම් යහපත ඉදින් අසමර්ථ වීනම් සක්විති ගැබක්මෙන්ද දුර්ලභ රතනයක්මෙන්ද නිරන්තරයෙන් අප්‍රමාදව රක්ෂා කටයුතුය. මෙසේ දශවිධ අර්පණා කෞශල්‍යය සපයන්නාවූ යොගාවචරයා හට ප්‍රතිලබ්ධවූ ප්‍රතිභාග නිමිත්තය විෂයකොට අර්පණා පවත්නේය. ඉදින් මෙසේ අර්පණාව නොඋප-දනේ වීනම් නුවනැත්තාවූ යෝගාවචර තෙමේ තමාගේ සිත පැවති ආකාරය සලකා නැවත නැවත වීර්‍ය්‍යයාගේ සම බව යොදන්නේය. අතිශයින් පටන් ගන්න ලද වීර්‍ය්‍යය හැර ලීනොද්ධත භාවයෙන් සිත මුදා සමකොට පවත්වා ප්‍රතිභාග නිමිත්තාභිමුඛකොට සිත මෙහෙයන්නේය. ප්‍රතිභාග නිමිත්තට හමුකොට සිත මෙහෙයන්නා හට දුන්ම අර්පණා සමාධි උපදනේයයි

කී සමයෙහි භවාඞ්ග චිත්තය සිඳගෙන එම ප්‍රිථිවි කසිණය අරමුණු කොට මනොවාර වීථියෙහි මනොවාර වර්ජන චිත්තය උපදී. ඊට අනතුරුවූ එම අරමුණු විෂයකොට ජවන් සතරක් හෝ පහක් හෝ උපදනාහ. ජවන් සතර උපදනා වාරයෙහි පළමු ජවනය අභිඥාවට පරිකර්ම්ව සිටි හෙයින් පරිකර්මයයි කියාද සමීපව පවත්නා හෙයින් උපචාරයයි කියාද කියනු ලැබේ. දෙවන සිත පූර්වභාගයෙහි පරිකර්ම චිත්තයන්ටද මත්තෙහි අභිඥාවටද අනුකූල බව ඇති හෙයින් අනුලෝම නම්වෙයි. තුන්වන සිත පරිත්ත ගොත්‍රය කාමාවචර ගොත්‍රයද අභිභවනය කරණ සෙයින් මහද්ගත ගොත්‍රයද වඩන සෙයින් ගොත්‍රභූ නම්වෙයි. සතරවැනිව අභිඥා චිත්තය උපදී. ජවන් පසක් උපදනා වාරයෙහි පළමු ජවනය යටකී පරිද්දෙන් පරිකර්ම නම්වෙයි. දෙවන සිත උපචාර නම් වෙයි. තුන්වන සිත අනුලෝම නම්වෙයි. සතරවන සිත ගොත්‍රභූ නම්වෙයි. පස්වැනිව අභිඥාව උපදී.

මෙසේ අභිඥා චිත්තය සතරවැනිව හෝ පස්වැනිව මුත් සවැනිව හෝ සත්වැනිව හෝ නුඋපදනේයි. කුමක් හෙයින්ද යත්, යම්සේ අලබ්ධවූ ආසේවන ඇති අනුලෝම චිත්තය ගොත්‍රභූ චිත්තය උපදවන්නට අසමර්ථවූයේවේද, ලබ්ධවූ ආසේවන ප්‍රත්‍ය ඇත්තේද සවැනිව සත්වැනිව භවාඞ්ගයට ආසන්න බැවින් ප්‍රපාතාසන්න පුරුෂයාමෙන් අභිඥා වශයෙන් පිහිටන්නට අසමර්ථ වේද එසේ හෙයින් සතර වන්නෙන් මෑත හෝ පස්වන්නෙන් මත්තෙහි හෝ අභිඥා නොවන්නේයයි දතයුතු.

ඉන් මත්තෙහි එම පළමු දැහැන ආවර්ජනා වශිතාය. සමාපජ්ජනා වශිතාය. ව්‍යුත්ථාන වශිතාය. අධිෂ්ඨාන වශිතාය ප්‍රත්‍යවෙක්ෂා වශිතාය යන මේ පඤ්ච වශිතායෙන් වශී ප්‍රාප්ත කටයුතුය.

මෙහි විතර්කාදී ධ්‍යානාඞ්ගයන් අතුරෙන් එකක් එකක් අරමුණු කොට උපන්නාවූ ආවර්ජනය හට අනතුරුව ජවනයන් සතර පස්දෙනෙකු කෙරෙන් භවාඞ්ග සිත් කීපයකින් මත්තට නොගොස් නැවත නැවත ධ්‍යානාඞ්ගයන් ආවර්ජනය කරන්නට සමර්ථ බව ආවර්ජනා වශිතා නම්වේ. ධ්‍යානයට සම වදිනා කැමති සිතට අනතුරුව කීප භවාඞ්ගයකින් මත්තට නොගොස් උපන් ආවර්ජනයට ඉක්බිතිව ධ්‍යානයට සම වදනට සමර්ථ බව සමාපජ්ජනා වශිතා නම්වේ පිරිසිඳ ගන්නා ලද කාලය නොයික්මවා ධ්‍යානයෙන් නැගෙන්නට සමර්ථ බව ව්‍යුත්ථාන වශිතා නම්වේ. ශීඝ්‍ර ජල ප්‍රවාහ ඇති නදියගේ ජල ප්‍රවාහය රඳවා සිටි සේතුබන්ධයක්

(පාලම් බැම්මක්) මෙන් භවාඞ්ග වේගය සිඳ අසූරු සතක් පමණ කලක් හෝ දශ අසූර සතක් පමණ කලක් හෝ ධ්‍යාන චිත්තය පිහිටුවන්නට සමර්ථ බව හෙවත් භවාඞ්ග පාතයෙන් රක්‍ෂණයට යෝග්‍ය බව අධිෂ්ඨාන වශිතා නම්වේ. නොහොත් යථා පරිච්ඡින්න කාලයෙන් මත්තට නොයාදී ධ්‍යානය පිහිටුවන්නට සමර්ථ බව අධිෂ්ඨාන වශිතා නම්වේ. විතර්කාදී අඞ්ගයන් විෂයකොට ශීඝ්‍රව ඉපදවූ ආවර්ජනානන්තරව ප්‍රත්‍යවෙක්‍ෂා ජවනයන් ලඝුකොට පවත්නට සමර්ථ බව ප්‍රත්‍යවෙක්‍ෂා වශිතා නම්වේ.

මෙහි ආවර්ජනාදී පඤ්ච වශිතාවෙහි වශීභූතයා විසින් ප්‍රගුණවූ ප්‍රථම ධ්‍යානයෙන් නැඟීමේ සමාපත්ති තොමෝ ආසන්න නීවරණ සංඛ්‍යාත ප්‍රතිපක්‍ෂයන් ඇත්තීයයිද විතර්කයාගේ ඖදාරිකත්වයෙන් අඞ්ග දුර්වලයයිද ඒ ප්‍රථම ධ්‍යානයෙහි දෝෂ දැක ද්විතීය ධ්‍යානය ශාන්ත හෙයින් මෙනෙහිකොට ප්‍රථම ධ්‍යානයෙහි නිකාන්තිය දුරුකොට ද්විතීය ධ්‍යානාදිගමය පිණිස භාවනායෝග කටයුත්තේය.

ඉක්බිති ප්‍රථම ධ්‍යානයෙන් නැඟී සමෘති සම්‍ප්‍රජ්ඥානයෙන් යුක්තවූ ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාවූ ඒ යෝගාවචරයා හට යම් කලෙක්හි විතර්කය ඖදාරික හෙයින් වැටහේද විචාර ප්‍රීති සුඛද චිත්තෛකාග්‍රතාවද යන මොහු ශාන්ත හෙයින් වැටහෙද්ද එසමයෙහි ඔහට ඖදාරිකාඞ්ග ප්‍රහාණය පිණිස ශාන්තාඞ්ග ප්‍රතිලාභය පිණිසද එම ප්‍රතිභාග නිමිත්තය "පඨවි පඨවි" යි නැවත නැවත මනසකාර කරන්නාම ද්විතිය ධ්‍යානය උපදනේයයි යන සමයෙහි භවාඞ්ගය සිඳගෙන එම පෘථිවි කසිණය අරමුණුකොට මනොද්වාර වර්ජනය උපදනේය. ඉක්බිති එම අරමුණ නිමිත්ත-කොටගෙන යටකී පරිද්දෙන් සතරපස් ජවන කෙනෙක් පරිකර්මාදී නාමයෙන් උපදිති. ඔවුන්ගේ අවසානයෙහි විතර්ක වර්ජිතවූ විචාර ප්‍රීති සුඛ චිත්තෛකාග්‍රතායෙන් යුක්තවූ එකම රූපාවචර ද්විතීය ධ්‍යානය උපදනේය. සෙස්ස යටකී පරිද්දෙන් දත යුත්තේයි.

යම්සේ ප්‍රථම ධ්‍යානයාගේ උපචාර ක්‍ෂණයෙහි නීවරණයෝ ප්‍රහීන වෙද්ද එපරිද්දෙන් ද්විතීය ධ්‍යානයාගේ උපචාර ක්‍ෂණයෙහි විතර්කය ප්‍රහීන වන්නේ නොවෙයි. අර්පණායෙහිම විතර්ක රහිතවූ විචාරාදි ධ්‍යානාඞ්ගයෙන් යුක්තවූ ද්විතීය ධ්‍යානය උපදනේයි. මෙසේ ද්විතීය ධ්‍යානය අධිගත කල්හි යටකී පරිද්දෙන්ම ආවර්ජනාදී පඤ්චවශිතායෙහි කරන ලද පරිචය ඇති යෝගාවචරයා විසින් ප්‍රගුණවූ ද්විතීය ධ්‍යානයෙන් නැඟීමේ සමාපත්ති තොමෝ ආසන්න විතර්ක සංඛ්‍යාත ප්‍රතිපක්‍ෂයා ඇත්තීයයිද විචාරයාගේ ඖදාරිකත්ව-යෙන් අඞ්ග දුර්වලයයිද ඒ ද්විතීය ධ්‍යානයෙහි දෝෂ ඇත. තෘතීය

ධ්‍යානය ශාන්ත හෙයින් සලකා ද්විතීය ධ්‍යානයෙහි නිකාන්තිය දුරුකොට තෘතීය ධ්‍යානාධිගමය පිණිස භාවනාවෙහි යෙදිය යුත්තේය එහි යෙදෙන්නාවූ සමෘති සම්ප්‍රජනයෙන් යුක්තවූ යෝගාවචරයා හට ද්විතීය ධ්‍යානයෙන් නැගී ධ්‍යානාඞ්ගයන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නම විචාරය ඖදාරික හෙයින් වැටහේ. ප්‍රීති සුඛද චිත්තෛකාග්‍රතාවද ශාන්ත හෙයින් වැටහේ එ සමයෙහි ඖදාරිකාඞ්ග ප්‍රහාණය පිණිස ශාන්තාඞ්ග ප්‍රතිලාභය පිණිසද එම ප්‍රතිභාග නිමිත්ත "පඨවී පඨවී" කියා නැවත නැවත මනස්කාර කරන්නා හට තෘතීය ධ්‍යානය උපදී. මේ ආදී නයින් යට ප්‍රථම ධ්‍යානයෙහි කී පරිද්දෙන් විචාරයෙන් තොරවූ ප්‍රීති සුඛ චිත්තෛකාග්‍රතා වශයෙන් තුන් අඟක් ඇත්තාවූ තෘතීය ධ්‍යානයද එසේම යටකී පරිද්දෙන් ප්‍රීතියෙන් තොරවූ සුඛ චිත්තෛකාග්‍රතා-යෙන් යුක්තවූ චතුර්ථ ධ්‍යානයද සැපයෙන් තොරවූ උපෙක්ෂා චිත්තෛකාග්‍රතායෙන් යුක්තවූ පඤ්චම ධ්‍යානයද උපදී. මෙහිදු ප්‍රීත්‍යාදී ඖදාරිකාඞ්ගයන්ගේ ප්‍රහාණය උපචාර ක්ෂණයෙහි නොව අර්පණා ක්ෂණයෙහි වේයයි දතයුතුයි.

මේ රූපාවචරධ්‍යාන ලැබූ යොගාවචර තෙම ඉදින් අරූපාවචර ධ්‍යාන උපදවනු කැමැත්තේ නම් රූපය නිසා දණ්ඩාදාන ශස්ත්‍රාදාන කලහ විග්‍රහ විවාද යන මොවුන්ගේද චක්ෂුශ්ශ්‍රොත්‍ර රෝගාදී ආබාධ සහශ්‍රයන්ගේද වශයෙන් කරජ කායයෙහි ආදීනව දැක මෙකී ආදීනව ආරූප්‍යයෙහි සර්වප්‍රකාරයෙන් නැතැයි රූපයාගේ සමතික්‍රමණය පිණිස පරිච්ඡින්නාකාස කසිණය හැර පඨවි කසිණාදිවූ නව කසිණයන් අතුරෙන් එක්තරා කසිණයෙක්හි චතුර්ථ ධ්‍යාන උපදවා ඒ ධ්‍යානයට අරමුණුවූ කසිණ රූපයෙහි උවෙග ඇතිව ඒ එයින් දුරුවනු කැමැත්තේ පස්වැදෑරුම් අයුරෙන් පුරුදු කරණ ලද වශිතා ඇතිව ප්‍රගුණවූ රූපාවචර චතුර්ථ ධ්‍යාන-යෙන් නැගී මා විසින් කලකිරෙණ ලද මේ රූපය අරමුණු කරන්නේයයි කියාද ආසන්න සෞමනස්‍ය සංඛ්‍යාත ප්‍රතිපක්ෂයා ඇත්තේයයි කියාද ශාන්ත විමොක්ෂ හෙයින් ඖදාරිකයයි කියාද ඒ ධ්‍යානයෙහි ආදීනවය දකී. දැක එහි කාන්තිය දුරුකොට ආකාසානංචායතනය ශාන්ත හෙයින් මෙනෙහිකොට ඒ කසිණ චක්‍රවාටය පර්‍යන්තකොට හෝ තමා කැමති යම් සාට්ටලයකට හෝ පතුරුවා එයින් ස්පෘෂ්ටවූ ආකාශය අරභයා "ආකාසො ආකාසො" සිද "අනන්තො ආකාසො අනන්තො ආකාසො" සිද නැවත නැවත මෙනෙහි කරන්නා හට නීවරණයෝ ප්‍රහීණ වෙති. උපචාරය හා සමග චිත්තය මනාකොට පිහිටන්නේය. එම නිමිත්තය නැවත නැවත ආසේවණය කරන්නා හට පඨවි කසිනා-දියෙහි රූපාවචර නිමිත්තයමෙන් ආකාශය විෂයකොට ආකාසා

නංචායතන චිත්තය පිහිටයි. මෙබඳු පූර්‍වභාගයෙහි කාමාවචර චිත්තයෝ පරිකර්‍මාදී නාමයෙන් තුන්දෙනෙක් හෝ සතරදෙනෙක් හෝ උපෙක්‍ෂා වෙදනා සම්ප්‍රයුක්‍ත වූවාහුම වෙති. සතරවැනිව හෝ පස්වැනිව අරූපාවචර චිත්තය උපදී. සෙස්ස පඨවි කසිණ-යෙහි කී පරිද්දෙන් දතයුතුය. මේ වනාහී වෙනසයි. මෙසේ අරූපාවචර චිත්තය උපන් කල්හි ඒ යොගාවචර තෙමේ පූර්‍වයෙහි කසිණ මණ්ඩලය ධ්‍යාන චක්‍ෂු සින් බලමින් වැස "ආකාසො ආකාසො" යන පරිකර්‍ම මනස්කාරයෙන් ඒ නිමිත්තය වහා දුරු කරණ ලද කල්හි ආකාශයම බලමින් වසයි.

මෙහි විඤ්ඤාණංචායතනධ්‍යානය උපදවනු කැමති යොගාවචර තෙම පස් ආකාරයකින් ආකාසානංචායතන සමාපත්තියෙහි පුරුදු කරණලද වශිතා ඇත්තේ මේ සමාපත්ති තොමෝ ආසන්න රූපාවචර ධ්‍යාන සංඛ්‍යාත ප්‍රතිපක්‍ෂයන් ඇත්තීයයිද විඤ්ඤාණ-නංචායතනයමෙන් නොම ශාන්තයයි කියාද ආකාසානංචායතන-යෙහි ආදීනව දැක එහි නිකාන්ති දුරුකොට විඤ්ඤාණංචායතන ශාන්ත හෙයින් මෙනෙහි කෙරෙයි. ඒ ආකාශසඵරණයකොට සිටියාවූ විඤ්ඤාණය "විඤ්ඤාණං විඤ්ඤාණං" යි කියා නැවත නැවත චිත්තය හසුරුවන්නා හට නීවරණයෝ විෂ්කම්භිත වෙති. සමාධිය එහිම පිහිටන්නේය. උපචාරය හා සමග චිත්තය සමාහිත වන්නේය. එම නිමිත්තය නැවත නැවත ආසේවන වශයෙන් බහුල කරන්නා හට ආකාශය විෂයකොට ආකාසා-නංචායතනයමෙන් ආකාශයෙහි පතලාවූ විඤ්ඤාණය විෂයකොට විඤ්ඤාණංචායතන චිත්තය පිහිටන්නේයි අර්‍පණා ක්‍රම පෙරකී පරිද්දෙන් දතයුත්තේයි.

මෙහි තෘතීයා රූප්‍යය උපදවනු කැමැත්තාවූ යොගාවචර තෙමේ යටකී පරිද්දෙන් පචවශිතා ප්‍රාප්ත වූයේ මේ සමාපත්ති තොමෝ ආසන්න ආකාසානංචායතන සංඛ්‍යාත ප්‍රතිපක්‍ෂයන් ඇත්තීයයිද ආකිංචඤ්ඤායතන සමාපත්තියමෙන් ශාන්ත නොවන් නීයයි කියාද විඤ්ඤාණංචායතනයෙහි ආදීනව දක්නේය. දැක එහි නිකාන්තිය දුරුකොට ආකිංචඤ්ඤායතන ශාන්ත හෙයින් මනස්කාරකොට විඤ්ඤාණංචායතනයට අරමුණුවූ ආකාසානංචා-යතන විඤ්ඤාණයාගේ අභාවය "නත්ථි නත්ථි" කියා හෝ "සුඤ්ඤං සුඤ්ඤං" කියා හෝ "විවිත්තං විවිත්තං" කියා හෝ නැවත නැවත මෙනෙහි කරන්නාට ඒ නිමිත්තයෙහිම සිත හසුරුවන්නා හට නීවරණයෝ යටපත්වෙති. සමාධිය එහිම පිහිටයි. උපචාරය හා සමග සිත සමාහිතවේ. මෙම නිමිත්තය. නැවත නැවත ආසේවනය කරන්නා හට බහුල කරන්නා හට ආකාශයෙහි

පතලාවූ මහග්ගත විඤ්ඤාණයෙහි විඤ්ඤාණංචායතනය මෙන් ආකාශය ඵරණකොට ප්‍රවෘත්තවූ මහද්ගත විඥාණයාගේ සුඤ්ඤ ධිවිත්තය නාස්තිභාවය විශයකොට ආකිංචඤ්ඤායතන චිත්තය පිහිටයි. එහි අර්පණා චිත්තය උපන් කල්හි ඒ යෝගාවචර තෙමේ චිතීයා රූප්‍ය විඥාණයාගේ අප ගම සංඛ්‍යාතවූ අභාවයම දකිමින් වසයි.

නැවත නැවත ආවර්ජනා කරන්නා හට එම නිමිත්තයෙහි චිත්තය නැවත නැවත හසුරුවන්නා හට නීවරණයෝ යටපත් වෙති. එහිම සමෘතිය පිහිටයි. උපචාරය හා සිත සමාහිත වෙයි. මෙසේ ඒ නිමිත්ත ආසේවනය බහුලී කරණය කරත් කරත් විඤ්ඤාණාපගමය විෂයකොට උපන් ආකිංචඤ්ඤායතනය මෙන් ආකිංචඤ්ඤායතන සංඛ්‍යාත චතුඃස්කන්ධ විෂයකොට **"නෙවසඤ්ඤ නාසඤ්ඤ"** යනන චිත්තය පිහිටයි.

යමෙක් මෙසේ ධ්‍යානයන් උපදවා වෙසේද? ඒ සම්මා සමාධි- යයි වදාළසේක.

මෙතැන් පටන් අටුවායෙහි ආක්‍රමයෙන් සමාධිය පිළිබඳ විස්තරය දක්වමි.

සමාධිය නම් කුමක්ද? කුසල චිත්තෙකග්ගතා සමාධි නිරවද්‍ය සුඛ විපාක ලක්ෂණවූ කුශල චිත්තයාගේ කුශල චිත්ත චෛතසික- යන් අරමුණෙහි මනාකොට පිහිටුවීම සමාධියයි.

කවර අර්ථයකින් සමාධි නම්වේද?

**"ඒකාලම්බනෙ සුට්ඨු ආධානං සමාධි"** යනු විග්‍රහ බැවින් එක අරමුණක මනාකොට සිත යොමුකරණ එකාග්‍ර බව සමාධි නම්. නහන සුණු ආදියට ජලය එකතු කළ විට ඒ මේ අත නොවිසිරී එකට බැඳී පවතින්නාක්මෙන් චිත්ත චෛතසික ධර්මයන් නොයෙක් අරමුණුවල වැටිය නොදී එකම අරමුණකට යොමු කරන්නාවූ හෝ පිඩුකරන්නාවූ සවභාව ධර්මය සමාධියයි.

**"නිවාතෙ දීපච්චිනං ඨිතිවිය"** සුළං නැති තැන දැල්වූ පහන් සිලමෙන් සිත ඒ මේ අත සෙලවිය නොදී එක අරමුණෙහි පවතී- යයි දතයුතුයි.

ඒ සමාධිහුගේ ලක්ෂණය, කෘත්‍යය, ඵලය, ආසන්න කාරණය යන මොහු කවරහුද? සමාධිය නොයෙක් අරමුණෙහි චිත්ත චෛතසිකයන් නොවිසුරු වන බව ලක්ෂණකොට ඇත්තේය.

නොහොත් **"පාමොක්ඛ ලක්ඛණොච" සමාධි "අවික්ඛෙප ලක්ඛණොච සමාධිය"** ප්‍රමුඛ ලක්‍ෂණකොට ඇත්තේද වේ. අවික්‍ෂෙප විසිර (නොයාම) ලක්‍ෂණකොට ඇත්තේද වේ. යම්කිසි කුශල ධර්ම කෙණෙක් වෙද්ද ඒ සියළු කුශල ධර්මයෝ සමාධිය ප්‍රධානකොට ඇත්තාහුය. අනික් කුශල ධර්මයෝ සමාධියට මිටි වන්නාහුය. සමාධියට අනුව යන්නාහුය. සමාධියට නැමී සිටින්නාහුය.

යම්සේ උඩුමාල කූටාගාරයාගේ යම්කිසි ගොණැස් කෙණෙක් වෙද්ද? ඒ සියල්ලෝම කුලට මිටිව කූළටම නැමී බැස කුලටම සම්බිය වැද ගියාහුද? ඒ ගොණැස්වලට කුලම අග්‍රයයි කියනු ලැබේද? එසේම යම්කිසි කුශල ධර්ම කෙනෙක් ඇද්ද? ඒ සියළුම කුශල ධර්මයෝ සමාධිය ප්‍රමුඛකොට ඇත්තාහුය. සමාධියට ගෙණවූවාහු වෙති. සමාධියට නැමී සිටින්නාහුය.

යම්සේ කිසි රජෙක් සිවුරඟ සෙනඟ හා සමඟ යුධයට බසිද ඇත්, අස්, රිය, පාබල යන ඒ සේනාවම ඒ රජම ප්‍රධානකොටම ඇත්තාහුද, ඒ රජුටම නැඹුරුවාහුද, ඒ රජටම අවනත වන්නාහුද, ඒ රජුම ප්‍රාග්භාරකොට ඇත්තාහුද, ඒ රජහු පිරිවරා ගන්නාහුද? එපරිද්දෙන්ම සියළු කුශල ධර්මයෝ සමාධියට නිම්නව සමාධියට අවනතව සමාධියට නැඹුරුව සමාධිය ප්‍රධානකොට ඇත්තාහ. එහෙයින් සමාධිය ප්‍රමුඛ ලක්‍ෂණ වන්නේය.

සමාධිය වික්‍ෂෙපයයි කියන ලද නොයෙක් අරමුණෙහි චිත්ත චෛතසිකයන් ගෙන ගොස් බහාලන බැවි නැසීම කෘත්‍ය හෝ සම්පත්කොට ඇත්තේය. ඖද්ධත්‍යයෙන් චිත්ත චෛතසිකයන් විසිර යා නොදෙන බව එලකොට ඇත්තේය. සුවපත් පුද්ගල තෙම සිත එකඟකෙරේයයි වදල බැවින් පස්කම් සුවයෙන් වෙන්වූ නිරාමිෂ සුවය මේ සමාධියට ආසන්න කාරුණ වේ

යලිදු සමාධියෙහි අන්‍ය ධර්මයන්ට වඩා වෙනස නම් **"සෙවායි මම්හී සමුග්ග පටලෙ උපරිමං සමුග්ග පටලං විය ආරම්මණෙ සුළුඝසිතා හුත්වා උපපජ්ජති"** යනුවෙන් කරඬුවෙක උඩු පියන යටි පියනෙහි මනාසේ ස්පර්ශකොට වැද ගන්නාසේ අරමුණ මොනවට ස්පර්ශකොට ගෙන උපදියි.

සමාධිය කී වැදෑරුම් වේද යත් නොයෙක් අරමුණෙහි චිත්ත චෛතසිකයන් නොයාම් විසිර නොයාම් ලක්‍ෂණයෙන් එක් ප්‍රකාරය. තමා හා එක්ව යෙදුනාවූ චිත්ත චෛතසිකයන් විතර්කය නිසා අරමුණු කරා පමුණුවන්නාසේ පවත්වන හෙයින් විතර්ක

ප්‍රධාන අර්පණා සමාධිය ඒ විතර්ක නූපදනා උපචාර සමාධිය යන දෙදෙනාගේ වශයෙන්ද එජ්ජන පළිජ්ජනාර්ථයෙන් ලෝක නම්වූ භවය ඇසුරු කල සමාධිය ඒ ලෝකයෙන් එතරවූ හෙයින් ලොකොත්තර නම්වූ මාර්ග ඵලයන් ඇසුරු කළ සමාධිය යන දෙදෙනාගේ වශයෙන්ද ප්‍රීතිය හා එක්ව යෙදුනාවූ සමාධිය, ප්‍රීතිය හා නොයෙදුනාවූ සමාධිය යන දෙදෙනාගේ වශයෙන්ද, සුඛ වේදනාව හා එක්ව යෙදුනාවූ සමාධිය, උපෙක්ෂා වේදනාව හා එක්ව යෙදුනාවූ සමාධිය යන දෙදෙනාගේ වශයෙන්ද, සමාධිය ද්විප්‍රකාරය සවභාව වශයෙන් හෝ ප්‍රත්‍ය වශයෙන් හෝ ඵල වශයෙන් හෝ හීනවූ සමාධිය මධ්‍යමවූ සමාධිය ප්‍රණීතවූ සමාධිය යන තුන්දෙනාගේ වශයෙන් තුන් ප්‍රකාරය. එසේම විතර්ක සහිත සමාධිය, අවිතර්ක විචාර මාත්‍ර සමාධිය, අවිතර්ක අවිචාර සමාධිය යන තුන්දෙනාගේ වශයෙන්ද, පරිත්ත සමාධිය, මහග්ගත සමාධිය, අප්පමාණ සමාධිය යන තුන්දෙනාගේ වශයෙන්ද තුන් ප්‍රකාරය.

තවද "**දුක්ඛා පටිපදා, දන්ධාභිඤ්ඤා ප්‍රතිපදා**" වන්ගේ වශයෙන්ද, පරිත්ත පරිත්තාරම්මණාදී වශයෙන්ද, චතුර්ධ්‍යානාඞ්ග වශයෙන්ද, හාණභාගියාදී වශයෙන්ද, කාමාවචරාදීන්ගේ වශයෙන්ද, අධිපතිධර්මයන්ගේ වශයෙන්ද, සිව් වැදෑරුම්වේ. පඤ්චක ක්‍රමයෙහිලා පඤ්ච ධ්‍යානාඞ්ගයන්ගේ වශයෙන් පස්වැදෑරුම් වේ.

ඔවුන් අතුරෙහි එකවිධාදී ක්‍රමයෙහි එක් ප්‍රකාර කොටස නොගැඹුරු අර්ථ ඇත්තේයි. උපචාර සමාධිය, අර්පණා සමාධිය යන දෙවැදෑරුම් කොටසෙහි බුද්ධානුස්මෘති, ධර්මානුස්මෘති, සංඝානුස්මෘති, ශීලානුස්මෘති, ත්‍යාගානුස්මෘති, දේවතානුස්මෘති යන කර්ම ස්ථාන සයද මරණානුස්මෘති කර්ම ස්ථානය, උපසමානුස්මෘති කර්ම ස්ථානය, ආහාරයෙහි ප්‍රතික්කූල සංඥා කර්ම ස්ථානය, චතුර්ධාතු ව්‍යවස්ථානය යන මේ දශ කර්ම ස්ථාන භාවනා කිරීම් වශයෙන් ලබන ලද සිත එකඟ බවද අර්පණා සමාධියට පළමු උපදනා සිත එකඟ බවද යන මේ දෙවැදෑරුම් සමාධිය උපචාර සමාධිය නමි.

ප්‍රථම ධ්‍යාන වීථිහුගේ පරිකර්ම චිත්තය ප්‍රථම ධ්‍යාන සිතට අනන්තර ප්‍රත්‍යයෙන් උපකාරවේයයි ප්‍රස්ථාන මහා ප්‍රකරණයෙහි වදාල බැවින් ගොත්‍රභූ සංඛ්‍යාත පරිකර්ම සිතට අනතුරුව උපදනා ප්‍රථම ධ්‍යාන සිත හා සමග පවත්නා එකාග්‍රතා චෛතසිකය අර්පණා සමාධි නම්වේ.

පළමුවන දැහැන උපදවනු කැමති යොගාවචර පුද්ගලයා කමටහන් මඩනා කල්හි ධ්‍යානය උපදන විට මනොද්වාරාවර්ජනයට අනතුරුව ජවන් පසකින් යුත් චිත්ත වීථිය උපදී.

ඉන් පළමුවන සිත පරිකර්මයයිද දෙවන සිත උපචාරයයිද, තුන්වන සිත අනුලෝමයයිද, සතරවන සිත ගොත්‍රභූයයිද, පස්වන සිත ධ්‍යානයයිද කියනු ලැබේ. ඉන්පසු තදාලම්බන නොඉපද භවාංග වෙයි. මෙහි ජවන් පසින් දෙවෙනි උපචාර නම්වූ චිත්ත ක්‍ෂණය හා එක්ව යෙදුනාවූ ඒකාග්‍රතා චෛතසිකය උපචාර නම්වේ. සතරවන ගොත්‍රභූ සිතට අනතුරුව උපදනා ධ්‍යාන චිත්තය හා එක්ව යෙදුනාවූ ඒකාග්‍රතා චෛතසිකය අර්පණා සමාධි නම්වේ.

පට්ඨානයෙහි වනාහී ප්‍රථම ධ්‍යානයට අනන්තර ප්‍රත්‍යයෙන් උපකාර වන සිත ධ්‍යානයට පරිකර්ම බැවින් පරිකර්ම නාමයෙන් වදාළ නුමුත් ඒ සිත කාමාවචර ගොත්‍රය මැඩ පැවැත්වීමට හේතුව උපදනා හෙයින් ගොත්‍රභූයයිද ව්‍යවහාරයි. ධ්‍යානය ළඟ හැසිරෙන හෙයින් උපචාර සමාධියයිද කෙලෙස් ඔබාගැනීමට පමුණුවන හෙයින් අර්පණා සමාධියයිද යන දෙදෙනාගේ වශයෙන් මේ සමාධිය දෙවැදෑරුම්වේ. දෙවන දුකයෙහි සප්තකාම සුගතියෙහිද, සොළොස් රූ තෙලෙහිද, සතර අරූ තෙලෙහිද යන තුන් භවයෙහි වසන සත්වයන් විසින් උපදවන ලද ධ්‍යාන කුශල චිත්තය හා එක්ව යෙදුනු ඒකාග්‍රතා චෛතසිකයෝ ලෞකික සමාධි නම්. එම භූමි ගතවූ සත්වයන් ධ්‍යානලාභීව එම ධ්‍යානය පාදකකොට හෝ අනිත්‍යාදී වශයෙන් සම්මර්ශනයකොට හෝ සෝවාන් ආදී සතර ආර්‍ය්‍ය මාර්ගයන් උපදවන කල ඒ ධ්‍යාන මාර්ග සිත පිළිබඳවූ ඒකාග්‍රතා චෛතසිකය ලොකොත්තර සමාධි නම්. මෙසේ සමාධිය ලොවිලොවුතුරු විසින් දෙවැදෑරුම්.

තුන්වන දුකයෙහි චතුස්කනය වශයෙන් ධ්‍යාන සතරකට ප්‍රභේද වීමෙහි පළමු වන දෙවන ධ්‍යාන චිත්ත වීථියෙහිද, පඤ්චක නය වශයෙන් ධ්‍යානය පසකට ප්‍රභේද වීමෙහි පළමුවන, දෙවන, තුන්වන ධ්‍යාන චිත්ත වීථියෙහිද එක්ව යෙදුනාවූ ඒකාග්‍රතා චෛතසිකයන් ප්‍රීති චෛතසිකය හා සමග යෙදුනු බැවින් සප්‍රීතික සමාධි නම්. සෙසු චතුෂ්ක ක්‍රමයෙහිලා තුන්වනු, සතරවනු වූද, පඤ්චක ක්‍රමයෙහිලා සතරවනු, පස්වනු වූද, ධ්‍යාන චිත්ත වීථිය හා යෙදුනු ඒකාග්‍රතාවෝ සහජාතවූ ප්‍රීති චෛතසිකය නැති බැවින් ප්‍රීතික සමාධි නම්. එතකුදු වුවත් සියළු සප්‍රීතික හෝ නිෂ්ප්‍රීතික හෝ විය හැකි වන්නේය. ඒකාවර්ජන වීථියෙහි සප්ත ජවනයන්ගේ වේදනා චෛතසිකය නොපෙරෙළෙන බැවින් ප්‍රථම ද්විතීය ධ්‍යානයන්ගේ උපචාර සමාධිය නිෂ් ප්‍රීතිකාමවේ.

සතර වන දුකයෙහි චතුෂ්ක ධ්‍යාන ක්‍රමයෙහිලා ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ යන සතර ධ්‍යාන වීථියෙහිද යෙදුනු ඒකාග්‍රතා

චෛතසිකය සුඛ (වේදනාංව) හා එක්ව යෙදුනු බැවින් සුඛ සහගත සමාධි නම්වේ. සෙසු චතුෂ්ක ක්‍රමයෙහිලා චතුර්ථ ධ්‍යානයෙහිද පඤ්චක ක්‍රමයෙහිලා පඤ්චක ධ්‍යාන වීපියෙහිද සම්ප්‍රයුක්තවූ එකාග්‍රතා චෛතසිකය උපෙක්ෂාවේදනාව හා එක්ව යෙදුනු බැවින් උපෙක්ෂා සහගත සමාධි නම්වේ එහිම උපචාර සමාධියට කී ක්‍රමයෙන් සුඛ වේදනා සහගතද වෙයි උපෙක්ෂා වේදනා සහගතද වෙයි.

ත්‍රිකයන් අතුරෙන් පළමුවන ත්‍රිකයෙහිලා ලබන ලද පමණක්ම වූ හෙවත් පළමුකොට ලබන ලද සමාධිය හාත්පසින් දුර්වල බැවින් හීනය.

අතිශයින් භාවිතා නොවූ සමාධිය මධ්‍යමය. මනාකොට ප්‍රගුණ කරණ ලද වසඟ බවට පමුණුවන ලද සමාධිය ප්‍රණීතය.

දෙවන දුකයෙහි උපචාර සමාධිය හා ප්‍රථම ධ්‍යාන සමාධියද විතර්ක විචාරයන් හා සමග යෙදී පවත්නා හෙයින් සවිතර්ක සවිචාර නම්වේ. පඤ්චක ක්‍රමෙහිලා ද්විතීය ධ්‍යාන සමාධිය විතර්ක නැත්-තාවූ විචාරය පමණක් ඇත්තාවූ සමාධි නම්වේ.

යම් යෝගාවචරයෙක් විතර්කයෙහි පමණක් දෙස් දැක විචාර-යෙහි දෙස් නොදැක හුදෙක් විතර්ක ප්‍රමාණය පමණක් කැමති වෙමින් ප්‍රථම ධ්‍යානය ඉක්මවාද හෙතෙම අවිතර්ක අවිචාර මාත්‍ර සමාධිය ලබයි. ඒ සමාධිය සඳහා අවිතර්ක විචාර මාත්‍ර සමාධිය යන මේ දෙවන පදය දක්වන ලදී.

චතුෂ්කණයෙහිලා ද්විතීය ධ්‍යාන, තෘතීය ධ්‍යාන, චතුර්ථ ධ්‍යාන යන තුනෙහිද, පඤ්චකනයෙහිලා තුන්වන, සතරවන, පස්වන යන ධ්‍යාන තුනෙහි යෙදුනු එකාග්‍රතා චෛතසිකය විතර්ක විචාර නැති බැවින් අවිතර්ක අවිචාර සමාධි නම මෙසේ සවිතර්ක සවිචාරාදී වශයෙන් සමාධිය තුන් ප්‍රකාරය.

තුන්වන ත්‍රිකයෙහි චතුෂ්ක ක්‍රමයෙහි පළමුවන. දෙවන, තුන් වන යන තුන් දැහැනෙහි සම්ප්‍රයුක්තවූ එකග්‍රතා චෛතසිකය ප්‍රීතිය සහගත සමාධි නම. එම චතුෂ්ක පංචක ක්‍රමයෙහිලා තුන් වන, සිවුවන ධ්‍යානයන්හි සම්ප්‍රයුක්තවූ එකාග්‍රතාව සුඛ වේදනාව හා යුක්ත බැවින් සුඛ සහගත සමාධිනම. මේ දෙකෙහිම කෙළවර සතරවන, පස්වන ධ්‍යානයෙන් හා යෙදුනු එකාග්‍රතාව උපෙක්ෂා වේදනාව හා එක්ව යෙදුනු බැවින් උපෙක්ෂා සහගත සමාධි නම. මේ දෙතන්හිම උපචාර සමාධිය ප්‍රීති සුඛ දෙකින්ම හෝ යුක්ත වෙයි. මෙසේ ප්‍රීති සහගතාදී ධ්‍යානයන්ගේ වශයෙන් තුන් වැදෑරුම්වේ.

සතරවන ත්‍රිකයෙහි උපචාර ධ්‍යානය හා එක්ව යෙදුනු සිතෙහි එකාග්‍රතාව කාමාවචර බැවින් පරිත්ත සමාධි නම්. රූපාවචර කුශල චිත්තයන් හා සම්ප්‍රයුක්තවූ එකාග්‍රතාවද, අරූපාවචර කුශල චිත්තයන්හි යෙදුනු එකාග්‍රතාවද, මහද්ගත සමාධි නම. ආයර්‍ය මාර්‍ග හා සම්ප්‍රයුක්තවූ එකාග්‍රතාව අප්‍රමාණ සමාධි නම්. මෙසේ පරිත්ත මහද්ගත අප්පමාණ වශයෙන් සමාධිය තුන් වැදෑරුම්ය.

චතුෂ්කයන් අතුරෙන් පළමුවන චතුෂ්කයෙහිලා දුක්වූ ප්‍රති-පත්ති හා අප්‍රකට ඥුවන ඇත්තාවූ සමාධියෙක්ද ඇත්තේය. සුවවූ ප්‍රතිපත්ති හා තියුණු නුවණ ඇත්තාවූ සමාධියෙක්ද ඇත. ඔවුන් අතුරෙන් ප්‍රතිපදා නම් කුමක්ද? අභිඥා නම් කුමක්ද? ධ්‍යාන භාවනා කරණ යෝගාවචරයාගේ පුළෙර්, කිසුණු ආදියෙන් කරණ පළමු භාවනාව පටන් ඒ ඒ ධ්‍යානයාගේ උපචාර සිත තෙක් පැවති සමාධි භාවනාව ප්‍රතිපදා නම්. ඒ උපචාර චිත්ත ක්‍ෂණය පටන් අර්පණ චිත්ත ක්‍ෂණය තෙක් මේ අතුරෙහි උපන් තාක් ප්‍රඥාවෝද, අර්පණා චිත්ත සම්ප්‍රයුක්තවූ ප්‍රඥාවද අභිඥා නම් වෙති. ඒ මේ ප්‍රතිපදාවට නීවරණ, විතර්ක, විචාරාදී විරුඬ ධර්මයන්ගේ බහුලත්වයක් නැති බැවින් සුව වන්නීය.

අභිඥාවද ඇතැම් යෝගාවචරයෙකුට මදවෙයි. යුහුසුළු නොවූ පැවතුම් ඇතිවෙයි. ඇතෙමකුට තියුණුවේ. යුහුසුළු පැවතුම් ඇතිවෙයි.

ඒ ප්‍රතිපදා අභිඥාවන් අතුරෙන් යම් සැප නොසැප සෙනසුන් ආදීන්ද, පළිබොධයන් සිඳීම් ආදියද භාවනා විධානයාගේ නොපිරිසීම් ආදී පූර්වකෘත්‍යයන්ද අර්පණා කෞශල්‍යයන්ද, මතු-වණීනා කරන්නමෝද ඔවුන් අතුරෙන් යමෙක් නොසැපවූ ආවාසාදිය සේවනය කෙරේද ඕහට දුක්වූ ප්‍රතිපත්ති වන්නීය. අප්‍රකටවූ අභිඥාද වන්නීය.

සැපවූ ආවාසාදිය සේවනය කරන්නහුට සුවවූ ප්‍රතිපත්තිද වන්නීය. තියුණුවූ අභිඥාවද වන්නීය. යමෙක් පළමුකොට සැප ආවාසාදිය සේවනයකොට පසුව නොසැපවූ ආවාසාදිය සේවනය කෙරේද, ඕහට සුවවූ ප්‍රතිපත්තිද, අප්‍රකටවූ අභිඥාද වන්නීය. පළමුකොට නොසැප ආවාසාදිය සේවනයකොට පසුව සැප ආවාසාදිය සේවනය කරන්නහුට දුක්වූ ප්‍රතිපත්තිද, තියුණුවූ අභිඥාද වන්නීය. මෙසේ ප්‍රථම චතුෂ්කයන් හා ද්විතීය, තෘතීයන්ගේ මිශ්‍ර බව දතයුතුයි. තවද පලිබොධ සිඳීම් ආදී පූර්වකෘත්‍ය නොසපයා භාවනාවෙහි යෙදුනා හටද සතුරන් ඇති බැවින් දුක්වූ

ප්‍රතිපත්ති වන්නීය. පළිබොධ සිඳීම් ආදී පූර්ව කෘත්‍ය සපයා භාවනා කරන්නා හට සතුරන් නැති බැවින් සුවවූ ප්‍රතිපත්ති වන්නීය.

තවද දශවැදෑරුම් **අර්පණා** කෞශල්‍යයන් නොසපයා භාවනා කරන්නා හටද අප්‍රකටවූ අභිඥා වන්නීය. ඒ දශවිද අර්පණා කෞශල්‍යයන් සපයන්නා හට තියුණුවූ අභිඥා වන්නීය. තවද තෘෂ්ණා, අවිද්‍යා දෙදෙනාගේ මැඩ පැවැත්වීමය. උත්සන්නාවීමය යන දෙයාකාරයෙන්ද සමථ විදර්ශනායෙහි පූර්ව ජාති වාසනා වශයෙන්ද මොවුන්ගේ ප්‍රභේද දතයුත්තේය. ඒ එසේ මැයි.

තෘෂ්ණාදිකයා හට තෘෂ්ණාව සමාධියට විරුඬ බැවින් දුක්වූ ප්‍රතිපතති වන්නීය. මැඩ පැවැත්වූ තෘෂ්ණා ඇත්තා හට සුවවූ ප්‍රතිපතති වන්නීය. අවිද්‍යාධිකයාහට අවිද්‍යාව ප්‍රඥාවට විරුඬ හෙයින් අප්‍රකටවූ අභිඥා වන්නීය. යමෙක් පෙර ජාතියෙහි සමථ භාවනාවෙහි නොයෙදුනේද, ඕහට දුක්වූ ප්‍රතිපත්ති වන්නීය. යමෙක් පෙර ජාතියෙහි විදර්ශනා භාවනා පුරුදු නොකෙළේද, ඕහට අප්‍රකටවූ අභිඥා වන්නීය. කරණලද පුරුද්ද ඇත්තාහට තියුණුවූ අභිඥා වන්නීය.

කෙලෙසුන්ගේද ඉඳුරන්ගේද වශයෙනුත් මොවුන්ගේ ප්‍රභේද දතයුතුවේ හේ කෙසේදයත් :- තියුණුවූ රාගාදී කෙලෙස් හා මෘදුවූ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන් ඇත්තාහටද දුක්වූ ප්‍රතිපතති වන්නීය. අප්‍රකටවූ අභිඥාද වන්නීය. එම ඉන්ද්‍රියයන් තියුණුවූවා හට තියුණුවූ අභිඥා වන්නීය. මඳවූ කෙලෙස් හා මෘදුවූ ඉඳුරන් ඇත්තා හටද සුවවූ ප්‍රතිපත්ති වන්නීය. අප්‍රකටවූ අභිඥා වන්නීය. තියුණුවූ එම ඉඳුරන් ඇත්තාහට තියුණුවූ අභිඥා වන්නීය. මෙසේ මේ ප්‍රතිපත්ති අභිඥාවන් අතුරෙන් යමෙක් දුක්වූ ප්‍රතිපත්තියෙන්ද අප්‍රකටවූ අභිඥාවෙන්ද සමාධියට පැමිණියේද ඔහුගේ ඒ සමාධිය දුක්වූ පිළිවෙත් හා අප්‍රකට අභිඥාද ඇත්තියයි කියනු ලැබෙයි. සෙසු තුන් තැන්හිද මෙම ක්‍රමය දතයුතුයි.

මෙසේ **“දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා”** ආදී වශයෙන් සමාධිය සතරාකාර වන්නේයි.

දෙවන චතුෂ්කයෙහිලා නුපුරුදුවූ නොවැඩූ අරමුනු ඇති සමාධියෙක්ද ඇත. පුරුදුවූ වැඩූ අරමුනු ඇති සමාධියෙක්ද ඇත්තේය. මනාකොට පුරුදු කරණ ලද වැඩූ අරමුනු ඇති සමාධියෙක්ද ඇත.

ඒ චතුෂ්කයෙහි යම් සමාධියක් වසඟ බවට නොපමුණුවන ලදද, මතු ධ්‍යානයන්ට උපකාර වන්නට අසමර්ථවේද, ඒ සමාධිය ස්වල්පානු භාව ඇති බැවින් පරිත්ත නම. යම් සමාධියක් මනාකොට නොවැඩූ අරමුණෙහි පවතීද, ඒ සමාධිය පරිත්තා රම්මණ සමාධි නම. යම් සමාධියක් මනාකොට පුරුදු කරණ ලද්දේ වේද, මතු ධ්‍යානයන්ට උපකාරවීමට පොහොසත් වේද, ඒ සමාධිය අප්‍රමාණ නම. යම් සමාධියක් මනාකොට වැඩූ අරමුණෙහි පැවැත්තේද, ඒ සමාධිය අප්‍රමාණාරම්මන සමාධි නම. එසේම පළමුවන, සතරවන සමාධීන්ට කියන ලද ලක්‍ෂණයන්ගේ මිශ්‍ර වීමෙන් ව්‍යමිශ්‍රනයද දතයුතුයි.

මෙසේ පරිත්ත පරිත්තාරම්මණාදී වශයෙන් සමාධිය සතරාකාරවේ.

තුන්වන චතුෂ්කයෙහි නවත්වනලද පංචණීවරණයන් ඇත්තාවූ විතර්කය, විචාරය, ප්‍රීතිය, සුඛය, එකාග්‍රතාව යන අඞ්ග පසක් ඇති ප්‍රථම ධ්‍යානය ඊට අනතුරුව සංහුන් විතර්ක විචාර ඇත්තාවූ අඞ්ග තුනක් ඇති තුන්වන ධ්‍යානය ඉන් මතු ප්‍රහීණවූ සුඛ වේදනා ඇති උපෙක්‍ෂා වේදනා යුක්ත සමාධිහුගේ වශයෙන් දෙඅඟක් ඇති සතරවන ධ්‍යානය මෙසේ මේ සතර ධ්‍යානයන්ට අඞ්ගවූ සමාධීහු සතරක් වෙත්. මෙසේ සතර ධ්‍යාන අඞ්ගයන්ගේ වශයෙන් සතර අයුරුවේ.

සතරවන චතුෂ්කයෙහි පිරිහීම් සෙවුනාවූ සමාධියෙක්ද ඇත. විශෙෂ සෙවුනාවූ සමාධියෙක්ද ඇත නිබ්බිදානු පස්සනාව සෙවුනාවූ සමාධියෙක්ද ඇත. ඒ සතරදෙනා අතුරෙන් ඒ ඒ ධ්‍යානයට විරුඩ නීවරණ විතර්ක විචාරාදීන්ගේ පැවැත්ම වශයෙන් සමාධිහුගේ වැනසීම සෙවිනා බව දතයුතුයි. ඒ ඒ ධ්‍යානයට යොග්‍යවූ සමෘතිය පිහිටුවීම් වශයෙන් සිටීම සෙවුනා බව දතයුතුයි. ඒ ධ්‍යානයෙන් මත්තෙහි මාර්ග ඵලාදි ගම ලැබීම් වශයෙන් විශෙෂ සෙවුනා බව දතයුතුයි. නිබ්බිදානු පස්සනා ඥණයද එක්ව යෙදුනාවූ සංඥ මනස්කාරයන්ගේ (නොහොත්) එම වීථියෙහි ජවන් සිත් හා ආවර්ජන චිත්තයාගේ වශයෙන් නිර්වේදය (හෙවත්) නිර්වානාවබෝධය සෙවුනා බව දතයුතුයි.

පළමුවන ධ්‍යානය කාමාස්වාදයෙන් කාමය අරමුණුකොට ඇති සංඥ මනස්කාරයෝ හෙවත් ජවනා වර්ජනයෝ පවතිත්ද ඒ ධ්‍යාන ප්‍රඥව පිරිහිම සෙවුනී නම්වේ. ඒ ප්‍රථම ධ්‍යානලාභී තෙමේ ඒ ධ්‍යානයට අනුරූපවූ සිහිය පිහිටුවාද ඒ ධ්‍යාන ප්‍රඥව ස්ථිතිය

සෙවුනී නම්වේ. අවිතර්කවූ දෙවැනි ධ්‍යානය කෙසේ උපදවම්දෝ හෝයි අවිතර්කාලම්බනවූ සංඥ මනස්කාරයෝ හෙවත් ජවනා වර්ජනයෝ පවතිත් නම් ඒ ධ්‍යාන ප්‍රඥව මතු ධ්‍යානාදිගමයට ආසන්න කාරණ වන බැවින් විශෙෂ සෙවුනී නම්වේ. එම ප්‍රථම ධ්‍යානලාභිහුගේ සත්‍ය ප්‍රතිවේධය සමග පැවැත්තාවූ සංඥ මනස්කාරයෝ බලවත් විදර්ශනාව හා යුක්තවූවාහු නම් ඒ ධ්‍යාන ප්‍රඥව නිර්වේදය (නිවන) සෙවුනී නම්වේ. ඒ ප්‍රඥව හා යෙදුනු සමාධියද සතරුකාර වන්නේයි. මෙසේ මේ සමාධිය හානභාගියාදී වශයෙන් සතරුකාරය

පස්වන චතුෂ්කයෙහි කාමාවචර සමාධිය රූපාවචර සමාධිය අරූපාවචර සමාධිය ලොකොත්තර සමාධියයි සතර වැදෑරුම්වේ. ඒ සතරදෙනා අතුරෙන් සියළු උපචාර ධ්‍යාන චිත්තය හා එක්ව යෙදුනු ඒකාග්‍රතාව කාමාවචර සමාධි නමි රූපාවචර ධ්‍යාන සිත හා යුක්තවූ ඒකාග්‍රතාව රූපාවචර සමාධිනමි. යෙදුනු ඒකාග්‍රතාව අරූපාවචර සමාධි නමි. ලොකොත්තර ධ්‍යාන සිත හා යුක්තවූ ඒකාග්‍රතාව ලොකොත්තර සමාධි නමි. මෙසේ සමාධිය කාමාවච-රාදී වශයෙන් සතර ප්‍රකාරය.

සවන චතුෂ්කයෙහිලා ඉදිම් යම් මහණෙක් ඡන්දය අධිපති-කොටගෙන යම් සමාධියක් ලබාද මේ ඡන්ද සමාධියයිද, වීර්‍ය්‍ය අධිපතිකොටගෙන යම් සමාධියක් ලබාද ඒ වීර්‍ය්‍ය සමාධියයිද, යම් මහණෙක් සිත අධිපතිකොට සමාධියක් ලබාද ඒ සමාධිය චිත්ත සමාධියයිද, යම් මහණෙක් ප්‍රඥව අධිපතිකොටගෙන සමාධිය ලබාද මේ වීමංසා සමාධියයිද කියනු ලැබේ. මෙසේ සමාධිය අධිපතීන්ගේ වශයෙන් සතරුකාරය.

පඤ්චකණයෙහිලා චතුෂ්ක වශයෙන් දැක්වූ ප්‍රභෙදයෙහි යම් ද්විතීය ධ්‍යානයක් කියන ලදද ඒ ධ්‍යානය විතර්කය පමණක් ඉක්මීම් වශයෙන් දෙවන ධ්‍යාන නම්වේ විතර්ක, විචාර දෙදෙනාගේ ඉක්මීමෙන් තෘතීය ධ්‍යාන නම් වෙයි මෙසේ දෙකක්කොට බිඳ පඤ්ච ධ්‍යානයෝ දතයුත්තාහුය. ඒ පඤ්ච ධ්‍යානයන්ට අඞ්ගවූ විතර්කාදිවූ පස සමාධි නම් වෙත්නුයි. මෙසේ පංච ධ්‍යානාඞ්ග-යන්ගේ වශයෙන් සමාධිය පස් ප්‍රකාරවේ.

ඒ සමාධිහුගේ කෙලෙසීම කවරේද යත් :- **"සංකිලෙසනති හානභාගියො ධම්මා"** යි වදාළ බැවින් සමාධියගේ කෙලෙසීම නම් නුපුරුදුවූ ප්‍රථම ධ්‍යානාදියෙන් නැගිට කාම සැප පිළිබඳ සංඥ මනස්කාර හෙවත් ජවනා වර්ජනයන්ගේ පැවැත්මයි කියන ලද ධ්‍යානයෙන් පිරිහීම සෙවුනා ධර්මයි.

සමාධිහුගේ පිරිසිදුකම කවරේද යත් :- **"වොදානනති විසෙස භාගියො ධම්මොති"** යි වදාළ බැවින් සමාධිහුගේ පිරිසිදු බව නම් පුරුදුවූ ප්‍රථම ධ්‍යානාදියෙන් නැගී ද්විතීය ධ්‍යානාදිය කෙසේ උපදවන්නෙම්දෝහෝයි යන සංඥ මනස්කාරයන්ගේ හෙවත් ජවනාවර්ජනයන්ගේ පැවැත්මයයි කියන ලද මතු විශෙෂාධිගමටය හේතුවූ ධර්මයි. එහි අප්‍රගුණවූ ප්‍රථම ධ්‍යානයෙන් නැගී යෝගාවචරයා කාම අරමුණු පිළිබඳ සංඥ මනස්කාරයෝ පෙළත්ද ඔහුගේ ධ්‍යාන ප්‍රඥව පිරිහීම සෙවුනා නම්වෙයි. මේ ආදී ක්‍රමයෙන් සියළු ධ්‍යානයෙහිම පිරිහීම සෙවුනා ධර්ම දතයුතුයි. ප්‍රගුණවූ පළමුවන දූහැණෙන් නැගී යෝගාවචරයා අවිතර්ක සමාධි සහගතවූ සංඥ මනස්කාරයෝ පෙළත්ද, ඒ ප්‍රථම ධ්‍යාන ප්‍රඥව විශෙෂවූ දෙවන ධ්‍යානාදීන් ඉපදවීමට ආසන්න කාරණා වන බැවින් සෙසු ධ්‍යානයෙහිද විශෙෂ භාගිය ධර්ම දතයුතුයි.

සමාධිය කෙසේ වැඩිය යුතුද යත් :- පළමුකොට යම් මේ සමාධියෙක් ලෞකික ලෝකොත්තර වශයෙන් දෙවැදෑරුම්වේයයි යනාදියෙහි යම් ආර්‍ය්‍ය මාර්ග සම්ප්‍රයුක්ත සමාධියෙක් කියන ලදද, ඒ ආර්‍ය්‍ය මාර්ග සමාධිය වඩනා ක්‍රමය ප්‍රඥ භාවනා ක්‍රමයෙන්ම සංග්‍රහ කරණ ලදහ. ප්‍රඥ වැඩූ කල්හි ඒ සමාධිය ප්‍රඥව හා එක්ව යෙදුනු හෙයින් වඩනා ලද්දේමය. එහෙයින් ඒ ආර්‍ය්‍ය මාර්ගය සඳහා මෙසේ භාවනා කටයුතුයි. ප්‍රඥ භාවනාවෙන් වෙන්කොට නොකීයේයි.

යම් ලෞකික සමාධියෙක්වේද, ඒ සමාධිය පිරිසිදු ශීලයෙහි පිහිටියහු විසින් යටකී නියායෙන් සියළු භාවනා විධි නොපිරිහෙළා භාවනා කටයුතුයි. මෙසේ භාවනා කරන්නා හට යටකී ක්‍රමයෙන් ලෞකික ධ්‍යානයෝ උපදිත්. උපෙක්ෂා සමෘතීන්ගේ පිරිසිදු භාවය ඇති චතුර්ථ ධ්‍යානය උපදවා ගත් යොගාවචර තෙම ඍද්ධිවිධාදී අභිඥද උපදවයි. උපෙක්ෂා එකාග්‍රතා යන අඞ්ග දවයෙන් යුත් චතුර්ථ ධ්‍යානලාභී තෙමේ සමාධියෙහි අනුසස්වූ අභිඥ ලබයි.

තවද දශ වැදෑරුම් උපෙක්ෂා අතුරෙන් **"කති සඞ්ඛාරුපෙක්ඛා සමාධිවසෙන උප්පජ්ජන්ති"** යන මෙහි සමාධි වශයෙන් කොතෙක් සංස්කාරොපෙක්ෂාවෝ උපදනාහුද **"අට්ඨ සඞ්ඛාරුපෙක්ඛා සමාධි වසෙන උප්පජ්ජන්ති"** අෂ්ට සමාපත්තිය එකක් එකක් පාසාම සමාධි වශයෙන් උපදී. තුන් භවයන්හි සියලු සංස්කාරයන් පිළිබඳව සිත උපෙක්ෂාවක්ව හෝ පිළිකුල් බව හෝ පිහිටයි. (එහෙයින්) ඔහුට සංස්කාරොපෙක්ෂා ඥණය උපන්නා නම්වේ. ඉදින් නිවන ශාන්ත වශයෙන් දකීද සියලු සංස්කාරවල

පැවැත්ම හැර නිවනට ප්‍රස්කන්දනය කෙරෙයි. ඉදින් නිවන ශාන්ත වශයෙන් නොදකීද නැවත නැවත සංස්කාරම අරමුණු-කොට පවතියි. කෙසේදයත් :—

මුහුදු වෙළඳුන්ගේ කවුඩකු මෙනි. යම්සේ මුහුදු වෙළෙන්දෝ වෙළඳාම් පිණිස නැවු නැගෙන්නාහු (කුඩා කාලෙහි පටන් හික්මවා පුරුදු) දිසා කවුඩන් ගනිත්ද, එසේ ගෙන යන කල යම් දවසක් නැව සුළඟින් ගසා යන ලද්දී විදේශයකට වැටේද, ගොඩක් නොපෙනේද, එකල ඒ දිසා කවුඩා යවත්. කවුඩා කූඹගසෙන් ආකාශයට පියාඹා සියළු දිසානු දිසාවලට නැවත පියාඹා (ගොඩක්) ඉවුරක් දකීද, ඊට හමුව පියා විදහායෙයි. ඉදින් ගොඩක් නොද-කීද නැවත නැවත අවුත් කූඹගෂස්ම ඇලී සිටියි. එමෙන්ම ඉදින් මේ සංස්කාරොපෙක්‍ෂා ඥාණය සන්ති පද සංඛ්‍යාත නිවන ශාන්ත වශයෙන් දකීද, සියළු සංසාර ප්‍රවෘත්තය හැර නිවනටම ඇතුල් වෙයි. ඉදින් නොදකීද නැවත නැවතත් සංස්කාරයන් අරමුණු-කොට පවතියි.

"ලීන උද්ධත භාවෙහි මොචයිත්වාන සබ්බසො
එවං නිමිත්තාභි මුඛං මානසං පටිපාදයෙ"

"ඊසකම්පි ලයං යන්තං පග්ගණ්හෙ ථෙව මානසං
අච්චාරද්ධං නිසෙධෙත්වා සමමෙව පවත්තයෙ"

"රෙණු ^ෑ^ උප්පලදලෙ සුත්තෙ නාවාය නාලියා
යථා මධුකරාදීනං පවත්ති සම්ම වණ්ණිතා"

සිත හැකිලීම උද්දහස යන දෙකෙන් සිත මුදා ප්‍රතිභාග නිමිත්ත අභිමුඛව මෙහෙයන්නේය. සිත පිහිටවිය යුතු අයුරු සෝදාහරණ වශයෙන් මෙසින් පැහැදිලියි. කෙසේදයත් :—

සවල්ප මාත්‍රවූ හැකිලීමකට පැමිණෙන්නාවූ සිත එසේ හැකිලිය නොදී උත්සාහවත් කරන්නේමය. එපරිද්දෙන් ඉතා උද්ධතවූ සිත ඖද්ධත්‍යයෙන් වළකා සමකොට වන්නේය.

1. මල් රෙණ්ය, 2. මහනෙල් මල් පෙතිය, 3. මකුළුහුසක, 4. නැව්,ය 5. තෙල් නලය යන මෙහි මීමැස්සාය, සල්ලවෛද-ශිෂ්‍යයාය, මකුළුහුය ගන්නා පුරුෂයාය, නැව පදින්නාය, තෙල් වත්කරණ ශිෂ්‍යයාය යන මොවුන්ගේ පැවැත්ම අටුවායෙහි යම්සේ උපමා වශයෙන් කියන ලදද එපරිද්දෙන්ම හැකිලෙන බවය, උද්දහස් බවය යන මෙසින් සම්ප්‍රකාරයෙන් මුදා නිමිත්තට යොමුකොට සිත මෙහෙයන්නේය.

මෙහි උපමා උපමේය සැසඳීම මෙසේ දතයුතුය. යම්සේ ඉතා සුර මීමැස්සෙක් අසවල් රුකෙහි මල් පිපුනේයයි දැන තියුනු වේගයෙන් දිවන්නේ ඒ රුක ඉක්ම ගොස් ආපසු හැරී එන්නේ සුලන් ආදියෙන් මල් රොන් ක්‍ෂයව ගිය කලම පැමිණෙන්නේය. අනික් අදක්‍ෂවූ මීමැස්සෙක් මඳ වේගයෙන් දිවන්නේ කල් ඉක්මීමෙන් මල් රොන් ක්‍ෂයව ගිය කල්හිම පැමිණෙන්නේය. දක්‍ෂවූ මීමැසි වනාහි තියුණු නොවූ නොමඳවූ සම වේගයෙන් දිවන්නේ සැපසේම වෘක්‍ෂ ශාඛාවන්හි පිපියාවූ මල් රසට පැමිණ කැමති තාක් මල් රොන්ගෙන මී බැඳ මධුරස අනුභව කරන්නේය.

යම්සේ ශල්‍යකර්‍ම (කැපුම් විදුම්) දන්නා වෛද්‍යාචාරීන් ලඟ දිය තැටියෙහි තුබූ මහනෙල් පතෙහි නහර විදුම් ආදී ශාස්ත්‍ර කර්‍මයෙහි හික්මෙන්නාවූ අතවැස්සන් අතුරෙන් එක්තරා අතිදක්‍ෂවූ අතවැස්සෙක් තියුණු වේගයෙන් ශස්ත්‍ර එලන්නේ මහනෙල් පත දෙබෑකොට පලන්නේ හෝ වේයි, දියෙහි ගැලෙන්නේ හෝ වේයි අනික් අදක්‍ෂවූ අතවැසියෙක් මහනෙල් පත කැපීයේද්‍ෙ හෝ ගැලීයේද්‍ෙ හෝ යි යන භයින් ශස්ත්‍ර ලන්කරන්නටද සමර්ථ වන්නේය. දක්‍ෂවූ අතවැසි වනාහි තියුණු නොවූ නොමඳවූ සම්ප්‍රයෝගයෙන් ඒ මහනෙල් පතෙහි ශස්ත්‍ර පද දක්වා පිරිසිදු ශිල්ප ඉගෙන එබඳු සැත්කම් කටයුතු තන්හි ශැත්කම් (උපරේෂන්) කොට ලාභ ලබන්නේය.

තවද යම්සේ කිසිවෙක් සතර බඹ ප්‍රමාණ මකුළුහුයක් ගෙනාහු නම් හෙතෙමේ සාරදහසක් වස්තු ලබන්නේයයි රජ විසින් අණබෙර ලැවූ කල්හි අතිදක්‍ෂවූ යම් පුරුෂයෙක් තියුණු වේගයෙන් මකුළුහුය අදනාහු ඒ ඒ තැන සිඳිනේම වෙයි. අනික් අදක්‍ෂවූ පුරුෂයෙක් සිඳෙයි යන භයින් අතින් අල්වන්නටද අසමර්ථ වෙයි. දක්‍ෂවූ පුරුෂයා වනාහි තියුණු නොවූ නොමඳවූ සම්ප්‍රයෝගයෙන් කෙලවර පටන් අල්වා දණ්ඩෙහිම වෙලා මකුළුහුය ගෙන හැරදී ලාභ ලබන්නේයි.

තවද යම්සේ අතිදක්‍ෂවූ නැවියෙක් බලවත් සුළඟෙහි රුවල පුරා සුළං ගන්වන්නේ නැව විදේශයට පමුණුවන්නේ වෙයි. අනික් අදක්‍ෂවූ කප්පිත්තෙක් මඳ සුළඟෙහි රුවල නගන්නේ නැව එතනම සිටින්නේ වෙයි. දක්‍ෂවූ නැව් පදින්නා වනාහි මඳ සුළඟෙහි රුවල පවතින් අරවන්නේ තද සුළඟෙහි අඩ රුවල ගසන්නේ සැපසේ කැමති තෙනට පැමිණෙන්නේ වෙයි.

තවද යම්සේ යමෙක් තෙල් නොවිසුරුවා තෙල් නළ පුරාඑයේ වීනම් හෙතෙම මෙතෙක් ලාභ ලබන්නේයයි ආචාර්‍ය්‍යයා විසින්

අතවැස්සන්ට කීකල අතිදක්ෂවූ එක්තරා ශිෂ්‍යයෙක් තියුණු වේගයෙන් තෙල් නල පුරලන්නේ තෙල් විසුරුවන්නේයි. අනික් අදක්ෂවූ අතවැස්සෙක් තෙල් විසිරේද්‍යෙහෝයි යන භයින් තෙල් වත්කරන්නටද අසමර්ථවෙයි දක්ෂවූ අතවැස්සා වනාහි තියුණු නොවූ නොමඳවූ සම්ප්‍රයෝගයෙන් තෙල් නල පුරා වත්කොටදී ලාභ ලබන්නේ වෙයි. මේ උපමාවයි. උපමේය වශයෙන් සලකන කල එපරිද්දෙන් එක් යෝගාවචරයෙක් ප්‍රතිභාග නිමිත්ත උපන් කල්හි වහාම අර්පණා සමාධියට පැමිණෙමියි සිතා දැඩිතර වීර්ය කෙරේද ඒ යෝගාවචරයාගේ සිත දැඩිතර වීර්ය කාරණකොට ගෙන උඩඟු බැවුහි වැටීමෙන් අර්පණාවට නොපැමිණිය හැකි වන්නේය. ඇතැම් යෝගාවචරයෙක් ඉතා දැඩි වෙර කිරීමෙහි දොස් දැක අර්පණා සමාධියෙන් මට කවර ප්‍රයෝජනද මේ ලබන ලද ප්‍රතිභාග නිමිත්තම රකිමියි වීර්ය පිරිහෙළා නම් ඒ යොගිහුගේ සිත හැකුළුනු වීර්ය ඇති බැවින් කුසීත බැවුහි වැටෙන්නේයි. එබැවින් ඒ යෝගාවචරයාද අර්පණා සමාධියට නොපැමිණිය හැකිවේ. යම් යෝගියෙක් මඳ කුදු හැකුළුනාවූ සිත ඒ හැකිලීමෙන්ද උඩඟුවූ සිත ඒ උඩඟු බැවින්ද මුදා සම්ප්‍ර යොගයෙන් ප්‍රතිභාග නිමිත්තට අභිමුඛකොට මෙහෙයා නම් ඒ යෝගාවචරයාම අර්පණා සමාධියට පැමිණෙන්නේයි. එහෙයින් යථොක්තාකාරයෙන් හැකිලීමෙන් හා උදහසින් සිත මුදා භාවනා කටයුත්තේයි. මේ අර්ථය සඳහා මල් රෙණ්ය, මහතෙල් මල් පතය යනාදීන්ගේ පැවැත්ම අටුවායෙහි උපමා වශයෙන් කියන ලදී.

තවද මොවුන්ගේ අධිගම පටිපාටි දක්වනු පිණිස මේ ක්‍රමයද දතමනාවේ.

එක් ඇමතියෙක් රාජොපස්ථානය පිණිස දනවුවෙන් නුවරට පැමිණ රජුන් දැක යනුයේ මත්පැන් බීම හේතුකොටගෙන සියළු සම්පත් රාසිය විනාශ කළේය. එක් දිනක් සුරා පීමෙන් සිහිමුළාවූ ඒ ඇමතියාව සුරා සැලේ (තැබෑරුමේ) වසන්නහු සියළු ආභරණ මුදාගෙන මාළු කඩක් හඳවා සුරා සැලෙන් පහ කළාහුය. ඒ අසල කුණුගොඩක වැටී නිදන්නාවූ ඔහු එක් සාමුද්‍රිකා ශාස්ත්‍රය දත් නුවණැති පුරුෂයෙක් දැක මේ පුරුෂ තෙම බොහෝදෙනාට ආධාර කරන්නෙක් වන්නේයයි මොහු (පිළිදැගුම්) කටයුතුයයි සනිටුහන්කොට මැටිඋළා නහවා දළරෙදි සඟලක් හඳවා පොරවා සලිත් සුවඳපැනින් නහවා සියුම් දුහුල් සළු සඟලක් අඳවා පහයකට නන්වා රසවත් බොජුන් අනුභව කරවා විධාන කරණසේක්:— මෙහි වරෝ මොහුට මෙහ කරව්යයි, අත් පා මේවර කරන්නවුන් කැමති කරවායෙයි. නැවත ඒ ඇමතියාට සත්කාර පිණිස

යෙදුණු අය ඒ ඇමතියාව සැප පහසු යහනාවකට නංවා නැවත නැඟිටුවීමට යැම වලක්වන අදහසින් පළමුකොට සතරදෙනෙක් ලෑස්තිව ඉන් එකෙක් අත් මඩියි. එකෙක් පා මඩියි එකෙක් (අවාන) විජිනිපතක් ගෙන පවන් සලයි. එකෙක් වීණා වාද්‍ය කරමින් ඉඳියි (මෙසේ ඇතිකල) ඒ ඇමතිතෙම නිද්‍රාවට පැමිණීමෙන් පහව ගිය විඩාව හෙවත් මත්පැන් පීමෙන් විඩාව ඇත්තේ මදක් කල් නිදා පිබිදියේ අත් පා මැඩීම නොඉවසමින් කවරෙක් මාගේ අත් පා පෙළයිද? පහව යවයි. තර්ජනය කෙරෙයි. අත් මඩින්නා එකෙණෙහිම පහව ගියේය. නැවතත් මදක් කල් නිද්‍රාවට පැමිණ පිබිදියේ පා මිරිකීම නොඉවසමින් කවරෙක් මාගේ පා මඩිද? ඉවත්ව යවයි කියයි. හෙතෙමේද එකෙණෙහිම ඉවත්ව යෙයි.

යළිත් මද කලක් නිදා නැගිට්යේ සුළං සහිත තල්වැට පවන් සැලීම නොඉවසමින් මේ කවුද? පහව යවයි කියයි. හෙතෙමේද ඉවතයෙයි. ඇමතියා නැවතත් නිදා පිබිදියේ කනේ ඇති යවුලක් වැනි ගී හඬ නොඉවසමින් වෙණ වයන්නා හට තර්ජනය කළ ඉක්බිති හෙතෙමේද එක වචනයෙන්ම ඉවත් වූයේ නැවත මෙසේ පිළිවෙළින් පහව ගිය කලාන්ත පීඩා අත් පා මැඩීම් සිහිල් සුළං වැදීම් ගීත වාද්‍ය ශබ්දෝපද්‍රව ඇති හෙයින් සුවසේ නිදා නැගිට රාජෝපස්ථානයට ගියේය. රජ තෙමේද ඔහුට මහත් ඉසුරු දුන්නේය. නැවත ඒ ඇමති තෙමේ මහජනයාට ආධාරකරු වූයේය.

මේ උපමාවෙන් අඟවන උපමේය නම්:-මද්‍යපාන ව්‍යසනයෙන් පිරිහීමට පත් ඇමැත්තාමෙන්. ඥාතිව්‍යසන, භොගව්‍යසන, රොග ව්‍යසනාදී නොයෙක් ව්‍යසනවලින් පිරිහී ගිය ගෘහස්ථයා දතයුතුයි. සාමුද්‍රිකා ශාස්ත්‍රය දත් පුරුෂයාමෙන් බුදුන් වහන්සේ දතයුතුයි. මොහු මහජනයාට හිතව වන්නෙකැයි මොහුට ආරක්ෂා කිරීම වටියයි සිතාගැන්මමෙන් මොහු ආත්මාර්ථ පරාර්ථකරු වන්නේය. මේ කුල පුත්‍ර තෙම පැවිදිවීමට සුදුසුයයි බුදුන් වහන්සේ සනිටුහන් කිරීමවේ. නැවත ඒ ඇමතියා මැටි පමණක් උලා නැහැවීමමෙන් ඒ කුලදරුවාගේ ප්‍රව්‍රජ්‍යා ප්‍රතිලාභය දතයුතුයි. නැවත ඔහුට දළ රෙද්දක් අඳවන්නාක්මෙන් පැවිදිවූවහුටද දසසිල් නැමැති සළුව හැඳවීම දතයුතුයි. නැවත ඔහු සුගන්ධෝදකයෙන් නැහැවීමෙන් මේ ප්‍රව්‍රජ්‍යා දශසීලය ඇත්තාහු හොරණ ප්‍රාතිමොක්ෂ සංවරාදී සුගන්ධෝසකයෙන් නැහැවීම දතයුතුයි. නැවත ඔහුට දුහුල් කොමු පිළියුවලක් ඇඳවීමමෙන් මොහුටද යට කියන ලද ශීල විසුද්ධි සම්පත් සංඛ්‍යාත දුහුල් ඇඳවීම දතයුතුයි. දුහුල් අඳවන ලද ඔහුව වනාහී ප්‍රාසාදයට නැංවීමමෙන් ශීල විසුද්ධි සංඛ්‍යාත දුහුල්

ඇන්දවූ මොහුගේද සමාධි භාවනා නැමැති ප්‍රාසාදයට නැගීම දතයුතුයි. නැවත ඔහුගේ මියුරු යහපත් බොජුන් අනුභව කිරීමමෙන් මේ යෝගාවචරයාගේද සමාධියට උපකාරවූ සමෘති සම්ප්‍රජඤ්ඤාදී ධර්මාමෘතය පරිභොග කිරීම දතයුතුයි. අනුභව කරණ ලද භොජන ඇත්තාවූ ඔහු වනාහී හාත්පස හසුරුවන්නහු විසින් සයණයට ආරෝපණය කරන්නාක්මෙන් මේ යෝගාවචරයාගේද විතර්කාදියෙන් උපචාර ධ්‍යානයට ආරෝපණය කිරීම දතයුතුයි. නැවත ඒ ඇමතියා පානාගාරයට යැම වලක්වන පිණිස අත්පා මැඩීම් ආදියෙහි යෙදුනු පුරුෂයන් සතරදෙනමෙන් පිළිවෙළින් මේ යෝගාවචරයාගේද කාම සංඥාවට අභිමුඛව යැම වළක්වනු සඳහා අරමුණෙහි සිත පෙළන්නාවූ නෛෂ්ක්‍රම්‍ය සංකල්පනාව දතයුතුයි. ඔහුගේ පාමඩින පුරුෂයාමෙන් මේ යෝගාවචරයාගේද අරමුණෙහි සිත පිරිමදින විචාරය දතයුතුයි. ඒ ඇමතියාට තල්වැට සලන පුරුෂයාමෙන් මේ යොගාවචරයාගේද සිතට අනුගන්වනු සොම්නස දතයුතුයි. ඔහුගේ කනට අනුග්‍රහ කරන්නාවූ ගන්ධර්වයාමෙන් මේ යොගාවචරයාගේද සිතට අනුගන්වන්නාවූ සොම්නස දතයුතුයි. නිදීමට පැමිණීමෙන් පහව විඩාව ඇති ඒ ඇමතියා නැවත මඳක් නිද්‍රෝප ගතවීමමෙන් මේ යෝගාවචරයාගේද උපචාර ධ්‍යාන සංනිශ්‍රයෙන් පහව ගිය පඤ්චනීවරණ කලානත ඇත්තේ ප්‍රථම ධ්‍යානයට පැමිණීම දතයුතුයි. නැවතත් නිදා පිබිදියහුගේ අත්පා මැඩීම නොඉසීමෙන් අත්පා මඩිනාවුන්ට නැතිගන්වා පලවා නැවතත් ඇසිල්ලක් නිද්‍රාවට පැමිණීමමෙන් මේ යෝගාවචරයාගේද ප්‍රථම ධ්‍යානයෙන් නැගිටියහුගේ සිත පෙළෙන විතර්කය නොඉවසීමෙන් විතර්කයෙහි දොස් දැකීම දතයුතුයි. විතර්කයාගේ ප්‍රහාණයෙන් නැවත අවිතර්ක විචාර මාත්‍රවූ ද්විතීය ධ්‍යානයට පැමිණීම දතයුතුයි. නැවත නැවත නිදා පිබිදියහුගේ යට කියන ලද ක්‍රමයෙන් ඒ ඒ අයගේ පහවී යැම කරණකොටගෙන නැවත නැවතත් මඳක් නිද්‍රාවට පැමිණෙන්නාක්මෙන් මේ යෝගාවචරයාගේද නැවත නැවත ද්විතීය ධ්‍යානයෙන් නැංගාහුට යථොක්ත දොෂ ඇති විචාරාදීන්ගේ නොඉසවීමෙන් පිළිවෙළින් විචාරාදී දොස් දැකීම ඒ ඒ ප්‍රහාණයෙන් නැවත නැවත අවිතර්ක අවිචාර නිෂ්ප්‍රීතික ප්‍රහාණ සොම්නස් ඇති ධ්‍යානොපගමණය දතයුතුයි. සයනයෙන් නැගිට රජහුගේ සමීපයට ගියාවූ ඒ ඇමතියා හට වනාහී ඉසුර සම්පත් ලැබීමමෙන් මේ යෝගාවචරයාගේද පඤ්චම ධ්‍යානයෙන් නැංගාහුගේ විදර්ශනාධිගමයට උපගතව අභීත් බවට පැමිණීම දතයුතුයි. ඉසුරු සම්පත් ලැබ ඒ ඇමතියා බොහෝ ජන සමූහයාට අවශ්‍යවූවාක්මෙන් අභීත් බවට පැමිණීමේ යෝගාවචරයාද ලොවි ලොවුතුරු අවශ්‍ය බැව් දතයුත්තේය.

මෙසේ ධ්‍යාන සමාපත්තියෙහිවූ සමාධිය ස්ථිරවේ. එහෙත් අප මාතෘකා කළ දේශනා පාඨයෙහි සිතේ යම් ස්ථිර පැවැත්මක් වේද ඒ සමාධියයි වදාරණ ලදී. මිථ්‍යා සමාධිය දුරුකරණ හෙයින් සම්මාසමාධි නම්වේ. සම්බොජ්ඣඞ්ගා යනු ඊට පර්යාය නාමයකි. එහි සං යනු සුන්දර ප්‍රශස්ථ යන අර්ථ වාචී උපසර්ගයෙකි. **"බොධි ඣහොධි යාවා අඞ්ගා බොජ්ඣඞ්ගා පසත්ථා සුන්දරාවා බොජ්ඣඞ්ගා"** යනු සමසවිග්‍රහයි. චතුෂ් සත්‍යය අවබෝධ කෙරේනුයි. ආර්‍ය්‍යශ්‍රාවක තෙම බොධියයි කියන ලදී. මේ කාරණ කොටගෙන අවබොධ කෙරේනුයි යන අර්ථයෙන් සතරමාර්ග ඥානයද බෝධියයි කියනු ලැබේ. එහෙයින් සමාධිය අවබෝධ කාරණ පුද්ගලයාගේ අඞ්ගය හෝ චතුෂ්සත්‍යාවබොධයට ඉවහල්වූ ධර්ම සමුදායගේ අවයවය යන අර්ථයෙන් හෝ බොධ්‍යඞ්ග නම්. පසස්නා ලද්දාවූ හෝ සුන්දරවූ හෝ බොධ්‍යඞ්ගය සම්බොධ්‍යඞ්ග නම්වේ. මේ සම්මා සමාධිය අවබොධ කාරණ පුද්ගලයාගේ අඞ්ගයක් බවත් අවබොධ කර ගැනීමට උපකාරවූ ධර්ම සමූහයගේ අවයවයක් බවත් තේරුම් ගත යුතුයි. ඒ සමාධි සම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීම පිණිස අධ්‍යාත්මික බාහිර වස්තූන් පිරිසිදු කර ගැනීමය. පොළෝ පිසුනු ආදී නිමිත්තෙහි දක්ෂබවය. ශ්‍රද්ධාදී පස්ඉඳුරන්ගේ සම බව පිළියෙළ කිරීමය සුදුසු කල්හි සිතට නිග්‍රහ කරන බවය, භාවනාස්වාද රහිත චිත්තය ශ්‍රද්ධා වශයෙන් හා සංවේගයෙන් සතුටු කාරණ බවය, හැකිළීම් උදහස් ආදියකට නොපැමිණි සමව පවත්නා භාවනා චිත්තය මැදහත්ව බැලීමය. නොසන්හුන් පුද්ගලයන් දුරුකරණ බවය, සන්හුන් පුද්ගලයන් සෙවුනා බවය, ප්‍රථමාදී ධ්‍යානයන් හා ත්‍රිවිධ විමොක්ෂයන් පස්විකීමය. ඒ සමාධි සම්බොධ්‍යඞ්ගයට නැමී පවත්නා බවය යන මේ එකොළොස් කාරුණු සමාධි සම්බොධ්‍යඞ්ගය ඉපදීම පිණිස පවතිත්.

එහෙයින් ආදි කර්මික කුලපුත්‍රයා විසින් ඒ සමාධිය උපදවා එයම ධුරකොට අභිනිවේශය පටන්ගෙන අනුක්‍රමයෙන් අර්හත් ඵලයට පැමිණිය යුත්තේය. **"මග්ගඞ්ගං මග්ග පරියාපන්නං"** යන වචන දෙකද සමාධියට පර්යාය වචන දෙකකි.

මෙයින් මේ සම්මා සමාධිය කාමාවචර කුසල් සිත්හි යෙදෙන සමාධියයි හෝ රූපා රූප භවයන්හි ප්‍රතිසන්ධි යෙදෙන්නාවූ මහද්ගත සමාධිය හෝ නොවනබව තේරුම් ගතයුතුයි. එහෙයින් මෙහි අදහස් කළ සම්‍යක් සමාධිය සෝවාන් මග සිතය, සෙද ගැමි මග සිතය, අනගැමි මග සිතය, රහත් මග සිත යන ලෝකොත්තර ආර්‍ය්‍ය මාර්ගයන්හි යෙදෙන සමාධියමයයි තේරුම් ගත යුතුයි.

ඒ සතරාර්‍ය්‍ය මාර්ගයෙහි ඒකක්ෂණයෙහි උපදින අඞ්ග අතින් සම්‍යක් සමාධියද එකක් බැවින් "මග්ගඞ්ගං" යනු වදාළේය. ඒ මාර්ගාඞ්ග අට නම් ලෝකොත්තරවූ සතර ආර්‍ය්‍යමාර්ග චිත්තයෙහි යෙදුණාවූද නිවන් අරමුණුකොට ඇත්තාවූද අවිද්‍යානුශය නසන්නාවූද ප්‍රඥා චෛතසිකය සම්මාදිට්ඨියයිද මිථ්‍යා සංකල්පය නසන්නාවූද සම්ප්‍රයුක්තවූ ඒ මාර්ග චිත්තය නිර්වාණාලම්බනයෙහි නගන ස්වභාවය ඇත්තාවූද විතර්ක චෛතසිකයම සම්මා සංකප්ප චතුර්විද වාග් දුශ්චරිතයන් මුල් සිඳින්නාවූ මිථ්‍යාවචනයෙන් වැලකීම් වශයෙන් ලැබෙන්නාවූ විරති චෛතසිකය සම්මාවාචායයිද, ත්‍රිවිද කාය දුශ්චරිතයන් මුල් සිඳින්නාවූ ප්‍රාණඝාතාදියෙන් වැළකීම් වශයෙන් ලැබෙන්නාවූ විරති චෛතසිකයම සම්මා කම්මන්ත අඞ්ගයයිද, කුහන ලපනාදිය මුල් සිඳින්නාවූද, මිථ්‍යා ජීවයෙන් වැළකීම් වශයෙන් ලැබෙන්නාවූ විරති චෛතසිකය සම්මා ආජීවයයිද, කුසීත බව මුල් සිඳින්නාවූ වීර්‍ය්‍ය චෛතසිකය සම්මා වායාමයයිද, මිථ්‍යාස්මෘතීන් මුල්සිඳින්නාවූ ස්මෘති චෛතසිකය සම්මාසතියයිද, මිථ්‍යා සමාධීන් මුල් සිඳින්නාවූ ඒකාග්‍රතා චෛතසිකය සම්මා සමාධියයිද දතයුතුවේ.

මෙසේ මේ අඞ්ග අට ඒකක්ෂණයෙහි එක සිත්හි නිර්වාණයම අරමුණුකොට ගෙන පහළ වන්නාහුය. නිවන් කැමැත්තවුන් විසින් සෙවිය යුතු වන බැවින් හෝ නිර්වාණය සොයන බැවින් හෝ නිවන් අරමුණු කරන්නන්යයි සොයා යන බැවින් හෝ කෙලෙසුන් සමුච්ඡේද ප්‍රහාණ වශයෙන් මරමින් නිවන් අරමුණුකොට පවත්නා හෙයින් හෝ මාර්ග නම්වේ. ඒ සතර මාර්ගයන්ගේ අඞ්ග බැවින් මාර්ග අඞ්ගයයි මේ ධර්ම සමුදායටම නමි.

ඒ සතර මාර්ගයට ඇතුළත් බැවින් **'මග්ග පරියා පන්න'** යයි වදාළසේක. සම්මා සමාධිය පිළිබඳ විස්තර විසුද්ධි මාර්ග විභඞ්ග අටුවා, පිළිසිඹියා අටුවා ආදියෙන් දතයුතු මේ සම්මා සමාධිය මාර්ගයට අනතුරුව ඵලය දෙන හෙයින් ආනන්තර්ක සමාධියයි රුවන් සුතුරෙහි වදාළේය. ඒ මාර්ග සමාධිය හා ශ්‍රෙෂ්ඨවූ අනික් සමාධියෙක් නම් නැත. එහෙයින්,

**"අච්ඡරා සඞ්ඝාත මත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු සම්මා සමාධිං භාවෙති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරිත්තජ්ඣානො විහරති, සත්ථු සාසන කරො ඔවාද පති කරො අමොඝං රට්ඨ පිණ්ඩං භුඤ්ජති, කොපනවාදො යෙනං බහුලී කරොන්ති"**

යන දේශනාවෙන් යම් මහණෙක් ඉදින් අසුරුසනක් ගසන පමණ කුදු සම්මා සමාධිය වඩාද මේ මහණ තෙම නොසිස් ධ්‍යාන ඇත්තෙක්ව ශාස්තෘන් වහන්සේගේ අනුශාසනයෙන් කරන්නේයයිද, අවවාද කරන්නෙක්ව වෙසේයයිද, නොසිස්වූ රටවැස්සා විසින් දෙන ලද ශ්‍රද්ධාපිණ්ඩය වළඳයයිද කියනු ලැබේ. යම් කෙනෙක් ඒ සම්‍යක් සමාධිය බහුලව වශයෙන් වඩත්ද ඔවුන්ට ලැබෙන අනුසස් කියනුම කවරේද? යන දේශනාවද මෙනෙහිකොට සම්‍යක් සමාධිය ස්වසන්තානයෙහි උපදවා ගැනීමට උත්සාහවත් වියයුතුයි.

ඒ ඒ බෝධියට නියමිත කාලයන් තුළ පිරූ පෙරුම් ඇති තීක්ෂණෙන්ද්‍රිය සත්වයන් විසින් සීලවිසුද්ධිය, චිත්තවිසුද්ධිය, දෘෂ්ටි විසුද්ධිය. කාංක්ෂා විතරණ විසුද්ධිය, මාර්ගා මාර්ග ඥාණ දර්ශන විසුද්ධිය, ප්‍රතිපද් ඥාණ දර්ශන විසුද්ධිය යන ෂඩ් විසුද්ධීන් උපදවා ඔවුන්ගේ වශයෙන් නොයෙක්වර ලබන ලද පූර්වභාග මාර්ග ඇතිව "**චූලල සෝතාපන්න**" යයි කිය යුතු බවට පැමිණ සත්වන විසුද්ධියවූ ඥාන දර්ශන විසුද්ධි අවස්ථාවෙහි මිශ්‍රක මාර්ග නම්වූ ලොකොත්තරවූ ආර්ය්‍ය මාර්ගය අවබෝධ කටයුතුවේ. ඒ ආර්ය්‍ය මාර්ග සම්ප්‍රයුක්තවූ සම්‍යක් සමාධිය මිථ්‍යා සමාධිය නැසීමය. නිවන් අරමුණුකොට උපදනේය. එහෙයින් සාසනයාගේ මධ්‍යයේ කල්‍යාණයයි කියන ලද මේ සමාධි භාවනාව වැඩීමෙන් අජරවූ අමරවූ නිවන් පසක් කටයුත්තේය.

සාධු! සාධු!! සාධු!!!

—: නිමි. :—

# දැන්විමයි.

**"ආයස්මංශ ධර්ම පුස්තක පඞ්ක්තිය" මුද්‍රණය කර අවසානයි.**

බොධිපාක්ෂික ධර්ම තිස්හත සවිස්තරව මෙහි ඇතුළත්වේ.

වර්‍ෂ සතරකදී පිළිවෙළින්ම පොත් සතර පළකරවන්ට හැකි වූයේ
එහි ඇති වටිනාකම නිසයි.

බොධිපාක්ෂික ධර්ම සවිස්තරව ලෙහෙසියෙන් තේරුන් ගැණීමට
තදිම ශ්‍රෙෂ්ඨ මෙබඳු පොත් පෙළක් තවත් නොමැතියි.

**ලොවුතුරා බුදුපියානන්ගේ විසිතුරු බුධ ඤාණය**
:: :: **මෙහි පැහැදිළිව විස්තර කර තිබේ.** :: ::

ඔබ හොඳින් බණ දහම් තේරුන් ගැණීමට සතුටු නම්
මෙම පොත් පෙළ භාවිතා කරන්න.

බෞඬවූ ඔබේ ගෙදර මෙම පොත් පෙළ උස් තැනක තබා වැඳීම්
පිදීම් කිරීමට පවා සුදුසු ධර්ම රත්නයකි.

මේ ඒ පොත්පෙළ:—

| | | |
|---|---|---|
| **සප්ත බොධ්‍යඞ්ගය** | **අඞ්ක** | **1** |
| **බාරස ධර්මය** | ,, | **2** |
| **ඉන්ද්‍රිය බල ධර්ම** | ,, | **3** |
| **අෂ්ටාර්‍ය මාර්‍ගය** | ,, | **4** |

**එක පොතක මිල රු. 2-50 සි. පොත් සතරම රු. 7-50 සි.**

ඔබගේ නිවසෙහිදී කාරණ පින්කම්වලදී
මෙම පොත් ගෙණ පිදීමට සිත තබාගන්න.

ඒ අවස්ථාවන්හිදී අපවෙත පැමිණීමෙන් පහසුමිලට ලබාගත හැක.
තැපෑලෙන් එවනවිට වැඩිපුර අයකිරීමක් නැත.

පළමුවරට මුද්‍රණය කළේ කොපි ස්වල්පයකි.

**නොපමාව ලබාගන්න.**

මෙසේ ඉල්ලන්න,

**ඩී. ජ්. කුලතිලක.**
**සිරි සුධර්මාරාමය-මොරටුමුල්ල.**

*"Wherever the Buddha's teachings have flourished,*

*either in cities or countrysides,*

*people would gain inconceivable benefits.*

*The land and people would be enveloped in peace.*

*The sun and moon will shine clear and bright.*

*Wind and rain would appear accordingly,*

*and there will be no disasters.*

*Nations would be prosperous*

*and there would be no use for soldiers or weapons.*

*People would abide by morality and accord with laws.*

*They would be courteous and humble,*

*and everyone would be content without injustices.*

*There would be no thefts or violence.*

*The strong would not dominate the weak*

*and everyone would get their fair share."*

~THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF
THE MAHAYANA SCHOOL~

## Taking Refuge with a mind of Bodhichitta

In the Buddha, the Dharma and the Sangha,
I shall always take refuge
Until the attainment of full awakening.

Through the merit of practicing generosity
and other perfections,
May I swiftly accomplish Buddhahood,
And benefit of all sentient beings.

## The Prayers of the Bodhisattvas

With a wish to awaken all beings,
I shall always go for refuge
To the Buddha, Dharma, and Sangha,
Until I attain full enlightenment.

Possessing compassion and wisdom,
Today, in the Buddha's presence,
I sincerely generate
the supreme mind of Bodhichitta
For the benefit of all sentient beings.

"As long as space endures,
As long as sentient beings dwell,
Until then, may I too remain
To dispel the miseries of all sentient beings."

## GREAT VOW
## BODHISATTVA EARTH-TREASURY
## ( BODHISATTVA KSITIGARBHA )

" Unless Hells become empty,
I vow not to attain Buddhahood;
Till all have achieved the Ultimate Liberation,
I shall then consider my Enlightenment full !"

Bodhisattva Earth-Treasury is
entrusted as the Caretaker of the World until
Buddha Maitreya reincarnates on Earth
in 5.7 billion years.

Reciting the Holy Name:
NAMO BODHISATTVA KSITIGARBHA

Karma-erasing Mantra:
OM BA LA MO LING TO NING SVAHA

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

**✻ The Vows of Samantabhadra ✻**

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

**✻ The Vows of Samantabhadra Avatamsaka Sutra ✻**

## DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.

May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

**NAMO AMITABHA**

南無阿彌陀佛

《斯里蘭卡文：四念住・四無量心・七覺支・八正道》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website:http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

Printed in Taiwan

4,000 copies; April 2013

SR060 - 11187